බුද්ධජයන්තිත්‍රිපිටකග්‍රන්ථමාලා: 35

සූත්‍රාන්තපිටකයෙහි

27 වන ග්‍රන්ථය

# මහානිද්දෙසපාළි

## ඛුද්දකනිකාය

**එකාදශභාගය**

ලඞ්කාබෞද්ධමණ්ඩලයෙහි ආරාධනයෙන්

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙණෙහි උපප්‍රධානාචාර්‍ය්‍ය

පණ්ඩිත

ලබුගම ලඞ්කානන්ද ස්ථවිරයන් වහන්සේ

විසින් කරනලද

සිංහල පරිවර්තනයෙන් යුක්තයි.

බු. ව. 2557
ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 35

The Twenty-seventh Book in the

**Suttanta-Pitaka**

**Khuddaka-Nikāya (10)**

**27**

# MAHĀNIDDESA PĀLI

With the Sinhala translation by

**The Venerable Pandita Labugama Lankānanda Thera**

Vice Principal of the Pravacanodaya Pirivena,

Molligoda, Wadduwa

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කුඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රැ මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතෙ කරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපිතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

***තෙරුවන් සරණයි.***

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

2557 / 2013

**බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ**

**බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය**

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක**
**වී.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි**
**තායිවානයේ ප්‍රධාන සංඝනායක**

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි

## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

**මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.**

- ❈ පූජ්‍ය අත්තුඩාවේ ඤාණානන්ද නාහිමි
- ❈ පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ❈ ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ❈ ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාසද්ධාකිත්ති හිමි
- ❈ දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ❈ ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ❈ ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- ❈ පූජ්‍ය බබරැන්දේ ධම්මසිරි හිමි
- ❈ පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- ❈ මිලිනා සුමතිපාල මැතිණිය
- ❈ ජගත් සුමතිපාල මැතිතුමා
- ❈ ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- ❈ දොස්තර අරුණ රබෙල් මහත්මා
- ❈ සුජිත් මොහොට්ටි මහත්මා
- ❈ රංජිත් අමරසිංහ මහත්මා
- ❈ ගාමිණී කාරියවසම් මහත්මා
- ❈ අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ❈ ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- ❈ මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- ❈ සිරිසේන හේරත් මැතිතුමා
- ❈ විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

# සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

## එකාදසමො භාගො

# සූත්‍රාන්තපිටකයෙහි

# ඛුද්දකනිකාය

## එකාදශභාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො" -

"මහණෙනි,, තථාගතයන්වහන්සේ විසින් දෙශනා කරණලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො ම බබලයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන

# CONTENTS


| | |
|---|---|
| | පිටුව |
| සංස්කාරක නිවේදනය | XXI |
| සංඥාපනය | XXIII-XXXIV |
| සඞ්කේත නිරූපණය – Abbreviations | XXXV |
| පාළිහෝඩිය – Pali Alphabet | XXXVI |
| විෂයසූචි | XXXVII |
| පෙළ හා පරිවර්තනය | 2-731 |
| ගාථාදිපද සූචි | 733-738 |
| නිද්දිට්ඨපද සූචි | 739-759 |

# සංස්කාරකනිවේදනය

ත්‍රිපිටකපාළියෙහි සුත්‍රාන්තපිටකාන්තර්ගත ඛුද්දකනිකායෙහි එකාදශාංගය වශයෙන් සිංහල පරිවර්තනය සමග සකස් වූ මේ මහානිද්දෙසපාළිය බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාවෙහි සඞ්ඛ්‍යා වශයෙන් තෙතිස් වන - සූත්‍රාන්තපිටක ග්‍රන්ථසඞ්ඛ්‍යාවෙන් සත්විසිවන ග්‍රන්ථය වේ.

තථාගතප්‍රවේදිත ධර්මාර්ථඥතාවයෙහි කොටිප්‍රාප්ත ප්‍රථම අග්‍රශ්‍රාවක වූ ශාරිපුත්‍ර මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ විසින් ලෞකික - ලෝකෝත්තරසර්වාර්ථසිද්ධිකර අර්ථපද - ව්‍යඤ්ජනපද සමායෝගයෙන් සමන්තභද්‍ර කොට නිදෙසූ ධර්මාර්ථවිභාවනාවක් වශයෙන් සඞ්ගීතිකාරක මහරහතුන් විසින් සම්භාවිත වූ මහානිද්දෙසපාළිය ත්‍රිපිටකබුද්ධවචන විෂයයෙහි ප්‍රණීත වූ මහා ශබ්දකෝෂයක් වැනිය.

තථාගතෝද්දිෂ්ට එකපදාර්ථයක් මුත් ප්‍රකාශ කිරීමෙහි දී තථ, අවිතථ, අනඤ්ඤථ වශයෙන් එහි බැඳී ඇති යථාර්ථය ම ප්‍රකට කර ලීම සඳහා තථාගතයන් වහන්සේ විසින් ම අනුශිෂ්ට වූ ආනවච්පදසමුදය දේශනා ඥානානුකූලවන සේ එක්රැස් කොට යොදා ශාස්තෘකල්ප මහාප්‍රාඥයන් වහන්සේ විසින් නිර්දිෂ්ට වූ මහානිද්දෙසපාළිය සිංහලභාෂාවෙන් ව්‍යාඛ්‍යාන (සන්න) කිරීම ධර්මවිනය - ශබ්දශාස්ත්‍ර විෂයෙහි නිපුණ වූ අලාමක ප්‍රාඥයෙකු විසින් ම කටයුතු බව මෙහි අමුතුව ලා කිය යුතු නො වේ.

ලඞ්කා බෞද්ධමණ්ඩලයෙහි අයැදුම් පිළිගෙණ මේ දුෂ්කර කාර්යයෙහි ප්‍රීතිමත් ව උද්‍යුක්ත වූ ලබුගම ලඞ්කානන්ද, මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය පණ්ඩිත ස්ථවිරයන් වහන්සේ නෛසර්ගික කාර්යක්ෂම ඥානශක්තිය මෙහෙයවමින් ආගතභාරය මැනැවින් උසුලා තිබෙන බව ග්‍රන්ථය කියවනුවන්හට ම පසක් වනු ඇත.

සිංහල, පාළි, සංස්කෘත භාෂාසාහිත්‍යයෙහි ද ධර්මවිනයපර්යාප්තියෙහි ද හසල බුද්ධිමහිමයෙන් ස්වතන්ත්‍ර වූ ප්‍රතිභාඥාන ඇති ගුරුශුශ්‍රෑෂාදි සිගුණ යුත් නිහතමාන නිරහඞ්කාර පණ්ඩිත ස්ථවිරයන් වහන්සේ විසින් මේ මහානිර්දෙශව්‍යාඛ්‍යානයෙහි දී පාළිවශයෙන් සුබෝධපදයනට ගූඪාර්ථකථනය, දුර්බෝධපදයනට සරලාර්ථකථනය, අර්ථ සුගම් නැති තන්හි අතිරේකාර්ථ දැක්වීම ආදි - පුරාතනාචාර්ය වරයන්ගේ ව්‍යාඛ්‍යාස්වරූප අනුගමනයෙන් පාලිපදාර්ථ නිරූපණය පමණක් නොව ආධුනිකානුග්‍රහය ද සිංහලසාහිත්‍ය පෝෂණය ද අපේක්ෂා කොට ඇති බව පෙණේ.

ග්‍රන්ථය හඳුන්වමින් සංක්ෂිප්තස්වරූපයෙන් උන්වහන්සේ විසින් ලියූ උපෝද්ඝාතයෙන් ග්‍රන්ථාශය විදහා ලමින් තදනුගත පර්යේෂණයන් පිණිස දක්වා ඇති උත්සාහයත්, ඇතැම් විචාරකයන් විසින් මහානිද්දෙසපාළිය පිළිබඳ කොට පහළ කරණ එල්ගුමත කරුණු සහිතව නිරාකරණය කෙරෙමින් ග්‍රන්ථගෞරවය යථා ස්ථානයට පමුණුවා තිබෙන සැටිත් පැසසිය යුතු ම ය.

පරිවර්තන කර්තෘන් වහන්සේ විසින් ම සැපයූ ගාථාදිපදසූචි ආදියෙන් යුත් මේ ග්‍රන්ථයෙහි ශෝධ්‍යපත්‍ර බැලීමෙහි පණ්ඩිත ශලගම ධම්මික ස්ථවිරයන් වහන්සේ ද, පණ්ඩිත කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ ද සහාය වූහ.

අපගේ අවසාන සංස්කරණයෙන් මුද්‍රණයට පැමිණි මේ මහනීය ධර්මග්‍රන්ථය සම්බන්ධයෙන් ස්වායත්තකාර්‍ය්‍ය කරණයෙහි යෙදුනු ත්‍රිපිටකසංශෝධක මණ්ඩලයෙහි ස්ථවිරයන් වහන්සේ ද ලංකාරජයේ සාංස්කෘතික කාර්‍ය්‍යාංශයෙහි අධිකාරීහු ද මහාබෝධි මුද්‍රණාලයෙහි පාලනාධිකාරීන් හා ආයුක්ත පිරිස ද ධර්මදානමය පුණ්‍යමහිමයෙන් සුඛභාගී වෙත්වායි ආශංසනය කරම්හ.

පරවාහැර වජිරඤාණ ස්ථවිර
ත්‍රිපිටක පරිවර්තන කාරකසභාවෙහි ද
සංස්කාරකමණ්ඩලයෙහි ද
සම්පාදක.

ත්‍රිපිටක කාර්‍ය්‍යාලය, ධර්මදූතාශ්‍රම විද්‍යාලය,
දෙමටගොඩ, කොළඹ 9.

# සංඥාපනය

යො පබ්බජි ජාතිසතානි පඤ්ච
පහාය කාමානි මනොරමානි,
තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං
පරිනිබ්බුතං වන්දථ සාරිපුත්තං.

**මහානිද්දෙස:**

අප බුදුන් බුදු වැ ධම්සක් පවත්වා පිළිවෙළින් ඉසිපතන වේළුවන ජේතවන ආදි විහාරයෙහි වෙසෙමින් උත්තම පාත්‍රයන්ගේ වශයෙන් වදාළ ගම්භීර වූ අර්ථ - ව්‍යඤ්ජන සම්පන්න සූත්‍රපදයන්ගෙ උත්තානීකරණය සඳහා සවුපැරුම්නැණ කෙළ පැමිණි ධම්සෙනෙවි **සැරියුත්** මහරහතුන් වහන්සේ විසින් දේශනා කළ ධර්මවිභාගය **නිද්දෙස** නම් විය.

"පාඨො විසිට්ඨො නිද්දෙසො තන්නාමවිසෙසිතො ච" යි එ නිද්දෙස නම් කිමැයි දක්වති: බ්‍යඤ්ජනපාඨ අර්ථපාඨ යයි දෙ ලෙසින් සිටි පාඨ විස්තර විසින් එළවා දක්වනු නිද්දෙස නමි. නිද්දෙස සඟහා කළ ග්‍රන්ථය ද උපචාර විසින් 'නිද්දෙස' නම් වී.

එහි බ්‍යඤ්ජනපාඨ'අක්ඛර - පද - බ්‍යඤ්ජන - ආකාර - නිරුත්ති - නිද්දෙස' යැයි සයෙකි. අර්ථපාඨ 'සඞ්කාසන - පකාසන - විවරණ - විභජන- උත්තානීකරණ - පඤ්ඤත්ති' යැයි සයෙක් වේ.

එහි ද පරිපූර්ණපදය හෝ, පදාවයව වූ වර්ණය හෝ, ඒකාක්ෂරපදය හෝ අක්ෂර යැ. විභක්ත්‍යන්ත වූ අර්ථද්‍යොතක අක්ෂරසමුදාය පද යැ. පදය ව්‍යක්ත කොට පළ කරනුයෙ ව්‍යඤ්ජන යැ= වාක්‍ය යි. ඒ පදයෙන් අවියුක්ත වෙ. වාක්‍යසඞ්ඛ්‍යාත බ්‍යඤ්ජනය නන් අයුරින් විභාග කරනු 'ආකාර' නමැ. ආකාරාභිහිතපදයාගෙ නිර්වචනය නිරුත්ති නමු. නිරවශේෂ කොට විස්තර කරනු නිද්දෙස නමි.

සවැදෑරුම් අර්ථපාඨයෙහි සැකෙවින් අරුත් දක්වනු සඞ්කාසනා යැ. මිතුයෙහි කියැයුතු අරුත් පළමු කොට දක්වනු පකාසනා යැ. සැකෙවින් කී අරුත් විස්තර කොට කියනු ද, වරක් කියන ලද්ද වටාලා කියනු ද විවරණ නමැ. ඒ විවරණය විභාග කොට දක්වනු විභජන නමැ. විවෘත වූ අර්ථ විස්තර කරනු, උපමා එළවා දක්වනු උත්තානීකරණ නමැ. දහම් අසනුවන් සොම්නස් දනවා නොසියුම් නුවණැතියන් නුවණ තියුණු කරනුයෙ පඤ්ඤත්ති නමු.

පාඨය වැලින් සඞ්ඛායභාසිත බ්‍යඤ්ජනභාසිතාදි විසිතුරු, අර්ථය පාඨාර්ථ සවභාවාර්ථ න්‍යායාර්ථාදි විසිතුරු අනේකප්‍රකාර යැ. ඒ ඒ පාඨාර්ථ මැනැවින් දැන සිටියේ පරවාදීන් විසින් අනභිභවනීය වෙ. මෙසේ අර්ථ ව්‍යඤ්ජන සම්පන්න කොට වදාළ හෙයින් 'මහාපඨවි, මහාසමුද්‍ර' සෙයින් මහත් වූ නිද්දෙස නුයි **මහානිද්දෙස** නම් වී. තෙළ මහානිද්දෙසය ධම්සෙනෙවි සැරියුත්මහතෙරණුවන්ගෙ ප්‍රඥාමහිමයෙන් පහළ වූයේ වෙයි.

බුදුන් යමාමහපෙළහර පෑ තව්තිසාහෙහි පඬුඇඹුල්සලස්නෙහි වැඩහිඳ විජම්වලා වදාරා සඞ්කස්සපුර දෙරට බට කල්හි, සැරියුත් මහරහතුන් හැමට පළමු කොට බුදුන් වැඳ සිටියන්ගෙ ප්‍රඥනුභාවය පෘථග්ජන පඤ්චකාදි ප්‍රශ්න විසඳීමෙන් පැසිරැගියෙන් එ අභිනිෂ්පත්ති විසිනුදු, එහි මැ බුදුහු 'පෙරත් ශාරීපුත්‍රයෝ පඤ්චජාතිශතයෙහි නවුස් පැවිද්දෙන් පැවිදි වැ මහාප්‍රාඥ වූහ'යි ආගමිත විසිනුදු, ප්‍රඥයෙහි චිණ්ණවශිතායෙනුදු, ගුණාතිරෙක හෙයිනුදු "එතදග්ගං භික්ඛවෙ, මම සාවකානං භික්ඛූනං පඤ්ඤවන්තානං යදිදං සාරිපුත්තො"යි තෙරුන් අග්‍රස්ථානයෙහි තැබූහ.

"ගඞ්ගාය වාලුකා ඛීයෙ උදකං ඛීයෙ මහණ්ණවෙ
මහියා මත්තිකා ඛීයෙ ලක්ඛෙත මම බුද්ධියා"යි

ඥානගම්භීරා කිරීමෙහි සමර්ථ වූ තෙරණුවෝ "සාරිපුත්තො භික්ඛවෙ මයා පවත්තිතං ධම්මචක්කං අනුපපවත්තෙති" යි බුදුන් විසින් පසස්නා ලදහ. යම්සෙ සක්විති රජක්හු විසින් පවත්වන ලද ආඥචක්‍රය පරිණායක-පුත්‍රරත්නය අනුප්‍රවර්තන කරනුයෙ සේනාපරිණායක වෙ ද, එසෙයින් සද්ධර්මචක්‍රවර්තීන් විසින් පවත්වන ලද ධර්මචක්‍රය අනුප්‍රවර්තන කරනුයෙන් සැරියුත් තෙරණුවො ධර්මසේනාපති වූහ.

"සෙවෙථ භික්ඛවෙ, සාරිපුත්තමොග්ගල්ලානෙ, භජථ භික්ඛවෙ, සාරි-පුත්තමොග්ගල්ලානෙ" යනාදීන් බුදුහු භික්ෂූන් අමතා සැරියුත් මහ මුගලන් දෙ තෙරණුවන් සෙවන භජන කරන සේ විධාන කොට "ඔබ පණ්ඩිත වූහ. සබ්‍රම්සරුන්හට අනුග්‍රාහකයහ. ශාරීපුත්‍රයො ජනනිය බඳු වූවාහු සෝවන් පෙළෙහි හික්මවනුවහ. මෞද්ගල්‍යායනයො ජනයිතෘ බඳු වූවාහු උත්තමාර්ථයෙහි හික්මවන්නාහ යි"ද, යළි වෙසෙසින් සැරියුත් තෙරහු චතුරාර්යසත්‍ය විස්තර හෙයින් දේශනා කරන්නට පොහොසත්හ'යි ද වදාළහ. මෙසෙයින් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සෙ බුදුන් විසින් අනේක ස්ථලයෙහි පසස්නා ලදහ.

සංයොජනපරියාය ධම්මදායාද අනඞ්ගණ සම්මාදිට්ඨි ධාතුක්ඛානි සච්ච-විභඞ්ග සඞ්ගීතිපරියාය දසුත්තර ආදි සූත්‍රාන්ත දේශනායෙහි ද සැරියුත් මහරහතුන්ගෙ යසඟී දෙව්මිනිසුන් කෙරෙහි පතළේ යැ. අර්ථ- ධර්ම - නිරු-ක්ති - ප්‍රතිභානප්‍රභෙද වූ ප්‍රතිසංවිද්ධර්මයනට උපායභූත පටිසම්භිදාමග්ගය ද තෙරණුවන්ගෙ අසම වූ ධම්සෙනෙවිරුව නිසා පහළ විය. ඒ මහා ප්‍රාඥ වූ ශාස්තෘකල්ප වූ ජිනපුත්‍ර ශාරද්වතීපුත්‍ර මහතෙරණුවෝ ධර්මචක්‍රය විභාග කොට විශිෂ්ටපාඨනිර්දේශ වූ මහා නිද්දෙසපාළිය ද වදාළහ. එයින් කීහ අටුවා-ඇදුරු උපසේන මහතෙරණුවො:

"සාරිපුත්තො මහාපඤ්ඤො සත්ථුකප්පො ජිනත්‍රජො
ධම්මචක්කං විභාජෙත්වා මහානිද්දෙසමබ්‍රවී" යි.

තෙල මහානිද්දෙසය අර්ථව්‍යඤ්ජන සම්පන්න යැ. ධර්මාර්ථ හෙයින් ගම්භීර යැ. මුඛ්‍ය විසින් ලොකොත්තරාර්ථප්‍රකාශ කරනු වෙයි. ශූන්‍යතා-ධර්මප්‍රතිසංයුක්ත යැ. ප්‍රතිපත්ති මාර්ග ඵල ඵලවනු වෙයි. ප්‍රතිපත්ති ප්‍රතිපක්ෂයන් වළහනු වෙයි. යොගාවචරයනට නැණරුවන් පහළවන තැන් වෙයි. ධර්මකථිකයනට දම් දෙසුම් විලාසන සඳහා විශේෂ කාරණ වෙයි.

සසරභීත දක්නාවුන්ට නිස්සරණ පිණිස සදුපාය දක්වීමෙන් අස්වැසිලි දනවනු සඳහා ද, තත්ප්‍රතිපක්ෂයන් තෙරනු සඳහා ද, ගම්භීරාර්ථ වූ නොයෙක් සූත්‍රපදයන්ගෙ අර්ථ විවරණයෙන් සජ්ජනහෘදයානන්දජනනය සඳහා ද, සර්ව ජනයන් කෙරෙහි පතළ මහාකරුණාසෙනහ ඇති අප්‍රතිහත සර්වඥතාඥානාවභාස ඇති සම්‍යක්සම්බුද්ධයන් විසින් දල්වන ලද සද්ධර්මප්‍රදීපය තදධ්‍යාශය විකාශන නමැති සෙනහපරිෂේකයෙන් පස්වාදහසක් මුළුල්ලෙහි නො නිවී පවත්නා කැමැති ධම්සෙනෙවි වූ ආයුෂ්මත් සැරියුත් මහතෙරණුවන් විසින් ලෝකානුකම්පායෙන් දෙසන ලද ඒ මහා නිද්දෙස පාළිය ධර්මභාණ්ඩාගාරික අනඳ තෙරුන් අසා ඉගෙන ප්‍රථම සඞ්ගීතිකාලයෙහි ඇසූ සෙයින් සඞ්ගායනාරොපිත විය. අනුසඞ්ගීත ද වී. (සමන්තපාසාදිකා – 16 පිටුව.)

**ග්‍රන්ථතත්ත්වය:**

එහි බුද්ධත්වයෙන් ප්‍රථම බෝධියෙහි ම වදාළ සෙ පෙනෙන කාමසූත්‍රාදි සොළොස් සූත්‍රය ධර්මාර්ථ හෙයින් ගම්භීර වූයෙ උද්ඝටිතඥාදි ප්‍රාඥයනට විෂය වෙයි. ගුහට්ඨක දුට්ඨට්ඨක සුද්ධට්ඨක පරමට්ඨක සූත්‍රයන්ගෙ වශයෙන් 'අට්ඨකවග්ග'යි බුද්ධකාලයෙහි මැ ප්‍රසිද්ධ වැ තුබූයෙ ද වෙයි. මහකසයින් තෙරුන් වෙත පැවිදි වැ සිටි සොණකුටිකණ්ණ තෙරුන් විසින් වත්තෙරුන් සමීපයෙහි ම සූත්‍රනිපාත ඉගෙන බුදුන් හමුයෙහි අට්ඨකවග්ගික සූත්‍රයන් ප්‍රකාශ කළ[1] බව ද මෙ නිදානයෙහි ලා පසු කලෙක බුදුහු සොණතෙරුන් මිහිරිවදන් ඇති භික්ෂූන් කෙරෙහි අගතැන්හි තැබූහයි ද සැලැකිය යුතු ය.

එසෙයින් ම බුදුහු 'ඉදඤ්ච පනෙතං ආනන්ද, සන්ධාය භාසිතං පාරායනෙ පුණ්ණකපඤ්හෙ'[2] යි තෙල සඳහා මා විසින් පාරායනයෙහි මෙ කියන ලදැ'යි අඞ්ගුත්තර – තිකනිපාතයෙහි ආනන්ද – සාරිපුත්ත යන දෙ පුතෙහි ම වදාළ දූයට සාධක සඳහා පාරායනසූත්‍රයෙන් කරුණු ඇර-දක්වා ඇත. ධර්මාර්ථ හෙයින් ගැඹුරු වූ අට්ඨකවග්ග, පාරායනවග්ග ඛග්ගවිසාණසුත්ත යන දේශනායෙහි බැසගෙන සිටි ධර්මචක්‍රය විභාග කිරීම්වශයෙන් අගසවු සැරියුත් තෙරණුවො නිද්දෙසය වදාළහ. එය ප්‍රථමසඞ්ගීතියෙහි මහතෙරුන් විසින් ඛුද්දකනිකායෙහි ලා සඞ්ගෘහීත විය. පිටක විසින් දීඝභාණකයන් අභිධර්ම පිටකයෙහි ගිණූ නමුදු මජ්ඣිමභාණකයො සූත්‍රාන්තපිටකයෙහි ලා ගිණූහ. එහි අට්ඨකවග්ගියනිද්දෙස 'මහානිද්දෙස' යි ද, පාරායනවග්ග – ඛග්ගවිසාණසුත්තනිද්දෙස 'චූලනිද්දෙස'යි ද හඳුන්වති.

දීඝනිකායාදි පස්වැදෑරුම් නිකාය විසින් නිද්දෙසපාළිය ඛුද්දකමහා-නිකායෙහි ගණන්නා ලද්දේ ය. සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භුතධම්ම, වෙදල්ල යන නවඞ්ගසත්ථුසාසනයෙහි නිද්දෙසපාළිය "උභතොවිභඞ්ග නිද්දෙස ඛන්ධකපරිවාරා සුත්තනිපාතෙ මඞ්ගලසුත්ත රතනසුත්ත නාලකසුත්ත තුවටකසුත්තානි අඤ්ඤම්පි ච සුත්තනාමකං තථාගතවචනං සුත්තන්ති වෙදිතබ්බං" යන අටුවාපාඨ ගෙන

---

1. "සොණත්ථෙරො මධුරෙන සරෙන එකවාක්‍යජ්ජනම්පි අවිනාසෙන්තො අට්ඨකවග්ගියානි අභාසි". (මනොරථපූරණී) "අසමාත් පරාභත්තිකයා ගුප්තිකයා උදානාත් පාරායණාත් සත්‍යදෘෂ්ටඃ ශෛලගාථා මුනිගාථාඃ අර්ථවර්ගීයාණි ච සූත්‍රාණි විස්තරෙණ ස්වරෙණ ස්වාධ්‍යායං කරොති" (දිව්‍යාවදාන 12)

2. අඞ්ගුත්තරනිකාය – තිකනිපාත – ආනන්ද සුත්ත.

ටීකාචාර්ය සාරිපුත්‍රමහාසාමීහු සාරත්ථදීපනියෙහි සූත්‍රාඞ්ගයෙහි ඇතුළු වන සේ දක්වූහ. ආචාර්ය ධම්මපාල තෙරණුවන් විසිනු ද නෙත්තිප්පකරණ අටුවායෙහි නිද්දෙසපාළිය සූත්‍රාඞ්ගයෙහි සඞ්ග්‍රහ වන බව කියන ලදි. ඇතැම් ආචාර්ය කෙනෙක් - විශෙෂයෙන් නිද්දෙසඅටුවායෙහි ම ආචාර්ය උපසේන තෙරණුවෝ "යථාසම්භවං ගාථාවෙය්‍යාකරණඞ්ගද්වයසඞ්ගහිතං"යි යථාසම්භවයෙන් ගාථාඞ්ග වෙය්‍යාකරණාඞ්ග දෙක්හි ඇතුළු වේ යයි දක් වූහ. මෙ කරුණු ඉදිරිපත් කොට සාරිපුත්තමාහිමියෝ 'නිද්දෙසයෙහි කිසි තැනෙක ප්‍රශ්නව්‍යාකරණ ලැබෙන හෙයින් ඒකදේසයෙක වෙය්‍යාකරණාඞ්ගසඞ්ග්‍රහයට අවිරුද්ධ වූ නමුදු ගාථාඞ්ගසඞ්ග්‍රහය ප්‍රතික්ෂෙප කෙරෙති. අට්ඨකවග්ගාදියෙහි එන සූත්‍රනිපාතයෙහි ඇතුළු වූ බුද්ධභාෂිත ගාථාවනට ධම්සෙනෙවියන් විසින් නිද්දෙස මතුයෙක් ම වදාරන ලද්දේ ය. අර්ථවිභාග සඳහා එළවූ මූලගාථා සූත්‍රනිපාතයට ඇතුළත් වූයෙන් නිද්දෙස සඞ්ඛ්‍යාවට නොයන හෙයිනි.

**සංරක්ෂණය:**

සඞ්ගීතිත්‍රයට නැඟීගිය ත්‍රිපිටක බුද්ධවචනය නො නැසිය දී ආරක්ෂා කර ගැනීම ලක්දිව මහාවිහාරයට අයත් විය. දඹදිවැදී අටුවා ලියන්නට ඇරඹූ බුද්ධඝොෂ තෙරණුවන් සවකීය උපාධ්‍යාය රේවත තෙරුන් විසින් 'මහාවිහාරයෙහි හෙළටුවා හා ආචාර්යවාද ඇතැ'යි කියා එය ඉගෙන අටුවා ලියන සෙ උපදෙස් දී එවූ සැටි ද සිහිදිය යුතු ය. වළගම්බා රජයෙහි බැමිණිටියාසාය උපන් කල්හි සිංහලභික්ෂූන් වහන්සේ එතෙක් මුඛපාඨයෙන් ම ගෙන ආ තෙවලා දහම් රක්නට යෙදූ පරිශ්‍රමය කෙබඳු ද යනු අටුවා කථායෙන්[1] දත හැකි ය.

එ දුර්භික්ෂයෙහි සියදහස්ගණනින් ජනයා නැසීගිය කල්හි ගම්නියම්ගම් ජනව් ජනශූන්‍ය ව ගිය කල්හි ජනයා නිසා වැටුණු භික්ෂූන් දහස්ගණනින් වැනැසුණු කල්හි මහානිද්දෙසපාළිය පුහුණු කළ භික්ෂූන් කෙරෙහි ශෙෂ වැ සිටියාහු එක් මැ පැවිදි කෙනෙකි. උහු ද ශීලවිපන්න වූහු ල. චතුනෙකායික තිස්ස තෙරුන්ට උපාධ්‍යාය වූ මහාතෙපිටක තෙරණුවෝ ග්‍රහණධාරණයෙහි නිපුණ වූ රක්ඛිත තෙරුන් අමතා 'ඇවැත්නි, තුලුත් වෙත මහානිද්දෙසය පුහුණු කරව'යි කීහ. වහන්සෙ හෙ පාපයෙක, උන් කෙරෙහි නූගන්මි' කීයෙන් 'උගන්ව ඇවැත්නි, මම ද තොප වෙත හිඳිමි' කීහ. මැනැවි වහන්ස, තොප වහන්සෙ හුන් කල්හි උගන්මි' රෑ දවල් අතුරු නො කොට හදාරා නිමැවූහ. පසු වැ බොහෝ මහතෙරහු රක්ඛිත තෙරුන් වෙත ඉගෙන මහානිද්දෙසය පවත්වාලූහ.[2] මෙසෙයින් මහානිද්දෙසය නාමශෙෂ නොවූයෙ ලේශමාත්‍රයෙනි. අලුලෙන ග්‍රන්ථලෙඛන සඞ්ගීතිය කරන ලද්දෙ එයින් මඳ කලෙකින් පසුව ය.

**කාලාන්තරාගත දූෂිතපාඨ:**

මුඛපාඨයෙන් ආ පාළිය ග්‍රන්ථගත වන් ම අනුක්‍රමයෙන් මුඛපාඨයෙහි උත්සාහය නැති වැ යනු සවයංසිද්ධ යැ. මුද්‍රණය ආරම්භ වූ පසු ලිවීමේ අපෙක්ෂාව හැරුපී සැටි මෙහි ලා සාධක යි. නොවියත් ලෙඛකයා අතින් ලියැවුණු ග්‍රන්ථය - මෙසෙයින් ම මහානිද්දෙසපාළිය වැනි අනන්ත විෂය ඇති වෙවචනයෙන් ආඪ්‍ය වූ ග්‍රන්ථයක් දූෂිතපාඨයෙන් ගහන වීම ආශ්චර්යයෙක් නොවේ.

---

1. විභඞ්ග අටුවා - ඤාණවිභඞ්ගවණ්ණනා (314 පිට).
2. සමන්තපාසාදිකා - තිංසකවණ්ණනා (503 පිට).

ග්‍රන්ථලේඛනයෙහි පටන් අටුවා පරිවර්තනය දක්වා මෙ දුතුර ඒ ඒ ඇදුරු පරපුරෙහි නැඟුණු පාඨාන්තර අටුවාවෙහි දක්වා ඇත. “ඉතිහන්ති සීලෙසු අකත්ථමානො” (96 පිටුව) යන තැන්හි ‘ඉදහං’ යන පාඨය මෙනි.* ‘උදකථෙවො – උදකථෙව්වකො’ (186), ‘පරියාපුතං – පරියාපුත්තං’ (198) යනාදිය විමසන්න.

ග්‍රන්ථාන්තරයෙහි දු අසමාන පාඨපතනය බොහෝවිට දක්ක හැකි ය. අත්තදණ්ඩ සූත්‍රයේ අටලොස්වැනි ගය (620 – පිට) නිද්දෙසපෙළෙහි “අතිවඩ්ඪී අනනුගිද්ධො” ආදි විසින් එයි. අටුවාවෙහි “අතිවඩ්ඪීති අතිසුකී, අනුද්ධරීතිපි කෙචි පඨන්ති”[1] සී ‘අතිවඩ්ඪි’ යන පාඨය ගෙන සුත්තනිපාතය පුහුණු කළවුන් සඳහා ‘කෙචි’යයි කියන ලදි. එ ගය ම සුත්තනිපාතයෙහි “අනුද්ධරී අනනුගිද්ධො” ආදි විසින් පෙළ හෙළා එහි අටුවාව “අනුද්ධරීති අතිසුකී, අතිවඩ්ඪීතිපි කෙචි පඨන්ති[2] සී නිද්දෙසය හදෑරනුවන් සඳහා ‘කෙචි’ යයි කීහ.

සුත්තනිපාත – උදයප්‍රශ්නයෙහි හා චූලනිද්දෙසයෙහි එන ‘පහානං කාමච්ඡන්දානං’ යනාදි ගය බුදුරදුන් විසින් ම “ඉදං ච පන මෙතං සාරිපුත්ත, සඞ්ඛාය භාසිතං පාරායනෙ උදයපඤ්හෙ” සී අඞ්ගුත්තර නිකාය – තිකනිපාත සාරිපුත්ත සූත්‍රයෙහි ද වදාරන ලද්දේ ය. අලුවිහාර – ග්‍රන්ථලේඛනයෙහි දී අඞ්ගුත්තර පෙළෑ ලියන ලදුයේ “පහානං කාමසඤ්ඤානං” යනු විසිනි. මේ වෙනස සඳහන් කරන බුදුගොස් ඇදුරෝ “උදයපඤ්හෙ ච එතං පදං පහානං කාමච්ඡන්දානන්ති ආගතං. ඉධ පන අඞ්ගුත්තරභාණකෙහි කාම-සඤ්ඤානන්ති ආරෝපිතං. තත්ථ බ්‍යඤ්ජනමෙව නානං, අත්ථො පන එකො යෙව”[3] සී පාරායනපෙළ හා අඞ්ගුත්තරභාණකයන්ගෙ පෙළ හා ව්‍යඤ්ජ-නයෙන් වෙනස් ව ගිය සැටි දක්වූහ. මෙසේ ඒ ඒ භාණකපරම්පරායෙහි බොහෝවිට ව්‍යඤ්ජනයෙන් වෙනස් ව ගිය පාඨ පමණක් නොව කිසි විටෙක අර්ථයෙන් පවා වෙනස් ව ගිය තැන් දක්ක හැකි ය. එබඳු තැන්හි යුක්ති විචාරණයෙන් බුදුන් වදළ පාඨය නිශ්චය කිරීම සඳහා අටුවාව ප්‍රමාණ කළයුතු වේ.

අටුවා නිපැදවීමෙන් පසුව ද වරින් වර ලිඛිත දෝෂ නිරාකරණයෙන් පෙළ ශුද්ධ කළ සැටි දක්නට ලැබේ. ධාතුසෙන මහරජු (බු: ව: 1004–1022) භික්ෂූන්ට සඞ්ග්‍රහ කොට ත්‍රිපිටකසඞ්ග්‍රයක් කළ බව සඳහන් වෙයි.[4], මේ ත්‍රිපිටක සඞ්ග්‍රහය පාඨශොධනයෙන් සකස් කිරීමක් වියයුතු ය. පටිසම්භිදා අටුවාව කළ මහානාම තෙරුන් වැනි ත්‍රිපිටකධාරී මහපඬිවරුන් එකල වැඩසිටි බව ද සැලකිය යුතු ය. සාරත්ථදීපනී විනයටීකා-යෙහි සතසෝධිත ග්‍රන්ථයක් ගැන සඳහන් වෙයි.[5] මෙ ද භික්ෂූන් සිය-නමක් එක්වැ කළ ත්‍රිපිටකශෝධනයක් වියයුතු ය. මේ ශෝධන කාලය සඳහන් නො වතුදු සාරත්ථදීපනී රචනාවට කලින් මහපැරකුම්බා රාජ්‍ය සමයෙහි මැ හෝ ඊට නුදුරු කාලයෙක විය හැකි ය. මහනුවර රාජ්‍යයේ අවසානභාගයෙහි මොරතොට ධම්මක්ඛන්ධ මහානායක තෙරණුවන්

* අටුවා යෙහි දක්වූ විසදෘශපාඨ මේ සංස්කරණයෙහි පුරාණපාඨ සී ලකුණු කොට ඇත.

1. නිද්දෙස අටුවා - 212 පිට. 2. සුත්තනිපාත අටුවා - 455 පිට.

3 මනොරථපූරණී - තිකනිපාත වණ්ණනා.

4. මහාවංශ - 38 - 44. 5. සාරත්ථදීපනී - (158 පිට).

විසින් අතිශයින් ආකුල වැ තුබූ මහනිද්දෙස්පෙළ ශුද්ධ කරන ලදැ'යි සඳහන් වේ[1]. නිද්දෙසපාළිය ව්‍යාකුල ව ඇති සැටින් නූගතුන් අතින් පොත් ලියැවීමේ අනිෂ්ට විපාකයන් දැනෙනුයෙ මහානිද්දෙස පැරණි පිටපත් බලන කල්හි ය.

තෙවලාපෙලපොත් මුද්‍රණයට වැටෙත් ම නිද්දෙස පාළිය ද නොයෙක් වර මුද්‍රණයෙන් පලවිය. බුරුම අකුරෙන් මුද්‍රණය වූ පැරණි පොත ද, ඡට්ඨසඞ්ගායනායෙන් සංස්කරණය කොට මුද්‍රණය කළ පොත ද, සියම්රට තායි අකුරෙන් මුද්‍රණය වූ පොත ද, එංගලන්තයේ පාළිපොත් සමාගම මගින් සකස් වැ මුද්‍රණය වූ පොත ද මෙ රට සිංහල අකුරෙන් මුද්‍රණය වූ දෙ පොතෙක් ද දක්නට ලැබිණ. මෙයින් ඇතැම් පොතෙක ප්‍රමාණවත් සංස්කරණයෙක් ඇත ද මූලසංගීතියෙන් ඈත් වැ ගියහයි සිතෙන පාඨ බෙහෙවින් දක්නට ඇත.

**සිංහලපරිවර්තනය:**

දෙදහස්පන්සියයෙ බුද්ධජයන්තිය නිමිත්තෙන් පිහිටිවූ බෞද්ධමණ්ඩලය ත්‍රිපිටකය හෙළබසින් පළ කරවන්නට සම්මත කෙළෙන් මහානිද්දෙස පාළිය සිංහලයෙන් නඟාලීමේ බර අපට පැවැරිණ. එහි ලා නිද්දෙසපාළිය ලිහිල් හෙළබසට නඟාලීම මතුයෙක් අභිමත විය. එතෙකුදු වත් නිද්දෙසපාළියෙහි ගැඹුරු අරුත් ඇති බව ද, විෂයමහත්ත්වය ද හේතු කොට පරිවර්තනය පහසු කාර්‍යයෙක් නො වී ය. අප ඇදුරුපාණන් කුළුණුඅමායෙන් මෙ දුෂ්කරයෙහි ශක්ති ලද්මහ'යි සිතමි. පරමපූජ්‍ය රයිගම නාහිමිපාණන්, එල්ලාවල ශ්‍රී සඞ්ඝිච්ච නාහිමිපාණන්, පණ්ඩිත හල්තොට ගිරිමානන්ද මහතෙරපාණන් යන දැනට අපවත් මාගේ ආචාර්‍ය ප්‍රාචාර්‍ය-වරයන් මා සතතැ ම්‍රියමාණ වන්නා බත්දහයි ද ඒ ගුරුප්‍රසාදයෙන් මෙ පරිවර්තනය නිමහම් වී යයි ද සිතමිහ. දැනට ප්‍රවචනෝදය පරිවෙණාධි-පති අසමදෘචාර්‍ය මහානායකමාහිමියන්වහන්සේගෙ කාරුණික අනුග්‍රහය ද මෙහිලා අත්‍යන්තොපකාරී විය. නිද්දෙසපාළි ව්‍යාඛ්‍යානය සෙයින් ම සංස්කරණය ද මහත් ආයාස උපදවන්නෙකි. අප කිසෙයින් වෑයම් කළ ද මෙහි නො පැළව ගිය තැන් නෙළි කොට යථාස්ථානයට පමුණුවාලූවාහු දෙමටගොඩ ධර්මදූතාශ්‍රම විද්‍යාලයාධීශ්වර වූ දර්ශනවිශාරද පරවාහැර ශ්‍රී වජ්‍රඥානාභිධාන උපාධ්‍යායභූත, කොළඹ නවකෝරළයේ ප්‍රධාන සඞ්ඝ නායකස්වාමීන්ද්‍රයන් වහන්සේ යැ. යථාර්ථයෙන් ම දර්ශනවිශාරද වූ ඔබගේ ශාස්ත්‍රශාසනඥනය මේ ව්‍යාඛ්‍යානය එලවත් කළ සේ කියම්හ. ත්‍රිපිටකසංස්කාරකසභායෙහි උත්තරීතරමණ්ඩලයෙහි වූ අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා දක්ෂිණලඞ්කාවේ ප්‍රධානසඞ්ඝනායක ධුරන්ධර විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති සාහිත්‍ය සරස්වතී පණ්ඩිත කෝදාගොඩ ඥානාලෝක ස්ථවිරපාදයන් වහන්සේ හා මෙහි ලා දුෂ්කරස්ථානයෙහි අපට අත් දුන්හයි කෘතඥතාපූර්වක වැ පවසම්හ.

මුද්‍රණ අවස්ථාවට පැමිණි කල්හි මහනිද්දෙස්පෙළ තවදුරටත් ශුද්ධ කළ යුතු සෙ දැනෙන්නට විය. ගාථාපදයන්හි නැඟීගිය දහම්පෙදෙස් විභාග කරනු සඳහා ත්‍රිපිටකයෙහි නානාස්ථානයෙන් අල බුදුවදනින් හා, ධම්සෙනෙවියන් බුද්ධමතානුසාරි වැ තමන් වහන්සෙ මැ වදාළ දහම්නය සියෙන් හා සඞ්කීර්ණ වැ සිටියෙන් කිසි තැනක් යථාස්ථානයට

---

1. මොරතොටවත -

පමුණුවා ගැනීම ඉතා දුෂ්කර විය. 212, 578 පිටුවල දක්නට ලැබෙන 'තිගුම්බං ගච්ඡති' යනපදයෙහි සිට 'වෙත්තාචාරං ගච්ඡති' යන පදය අවසන් කොට ඇති පද පන්තිස ලිඛිත - මුද්‍රිත හැම පිටපතෙක්හි මැ එකිනෙකින් අසමාන වැ අතිශයින් ව්‍යාකූල වැ පැවැතිණ. මෙහි එන ඇතැම් ස්ථාන නාම ජාතක විමානවත්ථු ආදි පාලිපොත්හි ද මත්ස්‍යපුරාණ බෘහත්කථාදි සංස්කෘත සාහිත්‍යයෙහි ද ශබ්දප්‍රයොග දක්වනු සඳහා පාණිනී චාන්ද්‍ර කාත්‍යායන ව්‍යාකරණයන්හි ද දක්නා ලැබේ. මෙය සකස් කිරීම සඳහා ත්‍රිපිටක සංස්කාරකසභාවේ සභාපති වූ විද්‍යොදය විශ්වවිද්‍යාලයාධිපති පණ්ඩිත **වැලිවිටියේ සොරතාභිධාන** නාහිමිපාණන්ගේ හා පුරාවිද්‍යාධිකාරී ආචාර්ය **සෙනරත් පරණවිතාන** මහතාණන්ගේ උපදෙශ ඉවහල් විය. මෙහි දී Sylvain Lévi මහතාගේ (Ptolemée), Le Niddesa et Le Brihat kathā* නමැති ග්‍රන්ථය ද ප්‍රයොජනවත් විය. එහි 'තිගුම්බං ගච්ඡති' යනු පටන් ගෙන 'මූලපදං ගච්ඡති' යන්න දක්වා ඇති සූවිසිපදය රාෂ්ට්‍රනාමයෙන් දක්වූ බව අටුවාවෙහි එයි. එකල්හි 'මරුකන්තාරං' යනුයෙහි පටන් කොට ඇති එකොළොස් පදය මාර්ගනාමයෙන් ගත් සෙ කියයුතු වෙයි. **පරණවිතාන** සූරීහු එ ද ජනපද නාම යයි සලකති. උත්තරාපථ දක්ෂිණාපථ ආදිය මෙනි. 'නාවාය මහාසමුද්දං පක්ඛන්දති' යී මුහුදු තැරැ යන බව කී හෙයින් ද, අග්නිදිග ආසියානු දූපත්වලට ඉන්දියානු වෙළඳුන් ගිය බව පෙනෙන හෙයින්දැ'යි සාධක දක්වති. තවද සියම්රටෙහි මුද්‍රිත පොතෙහි එන හෙයින් ද Lévi මහතාගේ යට දක්වූ ග්‍රන්ථයෙහි නිගමනයන් අනුව ද මේ සංස්කරණයට (212 පිට) ඇතුළුවගිය 'අලසන්දං ගච්ඡති' යනු අස්ථානපතිතයක් බව පසුව පෙනීගියේ ය. සිංහල - බුරුම පොත්වල නො දක්නා ලැබෙන මේ පදය කිසිවකු අමුතුවෙන් එකතු කරන ලද්දෙකි. අටුවාවෙහි කී සූවිසි පදසඞ්ඛ්‍යාව ද මෙයින් විරොධ වනුයෙන් එය හළයුතු සේ කියම්හ.

**පාඨාන්තර:**

ධම්මචක්‍රය විභාග කරනු විසින් නිද්දෙස වදාළ සේ යට කියන ලදි. මහතෙරණුවෝ ත්‍රිපිටකය සාකල්‍යයෙන් අලලා නිද්දෙස වදාළහ. බහුව්‍යාපිත්ව හේතුයෙන් දූරාතීතයෙහි සිට ම මහානිද්දෙසය පාඨාන්තරයෙන් ගහන විය. මෙතෙක් සංස්කරණය නො ලත් පාඨ ද දක්නට ලැබිණි. බුරුම සංස්කරණයෙහි "විරිය, පරිචිත, ථිනමිද්ධ, සෙඛ" ආදි ඇතැම් ශබ්දයෙක් හැම තැනෙක ම "වීරිය, පරිච්චිත, ථීනමිද්ධ, සෙක්ඛ" යනු විසින් පෙළ යොදා ඇත. දෙශනාපාළියෙහි වූ කලී වීර බව 'වීරිය' යී සිපිනු මැනැවි. එහෙත් එක් මැ දේශයෙක උපන් සංස්කෘත මාගධී වැනි භාෂාවන්ගේ ශබ්දරූප සංකලනය නිතැතින් සිදුවන්නෙකි. 'ආර්ය - වීර්ය - ඊර්යාපථ' ආදිය වැනි සංස්කෘතශබ්ද අරිය - විරිය - ඉරියාපථ' ආදි විසින් මාගධී වහරට ආයෙ වන. පරිච්චිත - ථීනමිද්ධ යන ශබ්ද එසේ ව්‍යවහාරයෙහි යුක්තියෙක් මැ නැත. ශෛක්ෂ-සෙඛ - සෙක්ඛ, උපෙක්ෂා - උපෙඛ - උපෙක්ඛ, අනපෙක්ෂ - අනපෙඛ - අනපෙක්ඛ, ආදිය වැනි වෛකල්පික රූප මාගධියෙහි එයි. එහි සිංහල ආචාර්යවරයනට සෙඛ වැනි ශබ්දරූප අභිමත වූ සේ යැ.

'දූරෙ විදූරෙ ... අනාසන්නෙ වවකට්ඨෙ (40 පිට) යන තැන්හි 'විවෙකට්ඨෙ'යි ඡට්ඨසඞ්ගීති සංස්කරණය වෙයි. මෙ 'දූර' නිද්දෙසය වූයෙනුදු ව්‍යවකෘෂ්ට ශබ්දයට අනුරූප හෙයිනුදු 'කායවිවෙකො ච වවකට්ඨකායානං' යනාදි පෙළ හා සැසැඳෙනුයෙන් ද 'වවකට්ඨෙ' යනු මැ ශුද්ධරූපය කොට ගතුම්හ.

---

* පොතේ 215 පිටුවේ 1 අධො ලිපියේ මෙය "Ptalemee Le Middesa Etle Brhat Katha" යි යෙදී තිබෙනුයේ වැරදීමකිනි

මෙහි 62, 164 පිටුවල ‘න ච කෙනචි කොචි හායති’ යනාදි ගයෙ ‘හඞ්ගබ්‍යා’ යන රූපය ‘ගණ්ඩබ්බං’ සී ද, ‘පහවකා’ යනු ‘පනාවිකා’ සී ද සංස්කරණයන්හි එයි. අටුවා බලා ඇපි මෙසේ සකස් කළෙමහ. 30, 650. ‘තස්සායං පච්ඡිමකොටි’ යනාදි ගය ද හැම සංස්කරණයක් හා පිටපතක් හා ව්‍යාකූල වැ එයි. එය නගා ගත් පෙළකුදු නොවූයෙන් අටුවා සැසැඳීමෙන් සංස්කරණය විය.

පසූර සූත්‍රයෙහි දෙවැනි – තුන්වැනි ගාථාවල ‘අපාසදසම්ං අපාසදං’ යන පාඨ බොහෝ සංස්කරණයන්හි ‘අපාහතං, අපාහතසම්ං’ සී ‘හන්’ ධාතුයෙන් උපන් රූපය ශුද්ධපාඨ සේ යොදා ඇත. ඇපි එය ‘දූරුත්තං දුබ්භාසිතනති අපහරනති, යන නිද්දෙස බලා ‘සදධාතුනිෂ්පන්න රූපයක් කොට ගතුම්හ.

අත්තදණ්ඩසූත්‍රයේ තෙවැන්නෙහි ‘සමන්තමසාරෝ ලොකො’ යන පදයාගෙ නිද්දෙසයට පැමිණ නිහර දූ දක්වන තැනැ බුරුම සුද්ධියෙහි ‘සෙත-කමෙජ්ජා’සී රූපයෙක් එයි. ඇතැම් සංස්කරණයෙක ‘සෙතකමෙච්චා, සෙත ගමෙජ්ජා’ යන රූප ද පැනෙයි. හෙලවරණගස කියැවෙන ‘ශෛවතවෘක්ෂ’ ශබ්දයෙක් සකුයෙහි එයි. එය මාගධියෙහි ‘කච්ච, ගච්ඡ’ යන රූපයෙකින් සිටිනු ශබ්දධම් නො වෙයි. එය ප්‍රාකෘතානුරූප වැ ‘සෙතවච්ඡ’ සී යෙදුව මනා සේ ඇපි කියම්හ. හෙලවරණගස යැ යන් අර්ථ යි.

මෙසෙයින් “ව්‍යපීතො (8 – පිටු) පටිබ්බ්‍රූ (42) දූරුඪරා (44) දිට්ඨි-සුද්ධිකා (120) ගපිතා (218) පක්ඛතොෂාසි (264) පටිභාති (318) පතිජ්ජි-යති (324) ලිප්පති (328) පුථුතිත්ථියා (410) මිගවාක්‍යං (528)” යනාදිය ද මෙ සංස්කරණයෙන් සකස් වී ඇත මෙබඳු අන්‍ය පාඨශොධන දූ අධො-ලිඛිත පාඨයෙන් දත්තේ මැනැවි.

**පරවාද:**

ද්විතීය සඞ්ගායනාවෙහි දී ස්ථවිරභික්ෂූන් විසින් බැහැර කරන ලද වැදූරට වැසි දසදහසක් පමණ අධම්වාදී පාපභික්ෂූහු පක්ෂබල ලැබ මහාසංගීති නම් වූ සඞ්ගායනාවක් කළහ. වජ්ජීන් ස්ථවිර භික්ෂූන්ට විපක්ෂ ව ගිය සැටි ශාසන – ඉතිහාසයෙහි එයි: ඒ මහාසඞ්ගීතිකයො බුදුසසුන විලොම කළහ. මහකසුප් ඈ මහරහතුන් කළ මූලසඞ්ග්‍රහය බිඳ අන්‍යත් සඞ්ග්‍රයක් කළහ. මූලසඞ්ගීතියෙහි පිටක – නිකාය – පණ්ණාස – වග්ගාදි විසින් අත් තැනෙක සඞ්ග්‍රහ කළ සූත්‍රය අන් තැනෙක තැබූහ. විනයෙහිත් පඤ්ච නිකායෙහිත් ධම්ාර්ථ බිඳෑලූහ. ආචාර්යපරම්පරායෙන් සුගෘහිත නොවූයෙන් පර්යායදෙශිත යැ නිෂ්පර්යාය දෙශිත යැ නීතාර්ථ යැ නෙයාර්ථ යැ යන මෙ නො දත්තාහු අනෙකක් සඳහා වදාළ කරුණ අන් තැනෙක තබා-ලූහ. උහු ව්‍යඤ්ජනච්ඡායායෙහි සිට බොහෝ පෙළඅරුත් නසාලූහ. ගැඹුරු වූ සූත්‍ර – විනය එක්දෙසක් හැරැ පියා සූත්‍ර – විනය ප්‍රතිරූප වූ අන් දහමක් සඟනාලූහ. පරිවාර යැ අර්ථොද්ධාර (–පදභාජනීය) යැ අභිධම් ෂට්ප්‍රක-රණයෙකැ ප්‍රතිසංවිත් යැ නිර්දෙශ යැ ජාතකයෙන් එකදෙශයෙකැ යන මෙතෙක් දහම් උහු හැරැ පිහ. විශෙෂයෙන් මෙ නිද්දෙසය ද ඔවුනට නො වූ බව මෙහි ලා සැලැකිය යුතු ය. මෙ කියන ලදී:

‘පටිසම්භිදඤ්ච නිද්දෙසං එකදෙසඤ්ච ජාතකං,
එත්තකං විස්සජ්ජෙත්වාන අඤ්ඤානි අකරිංසු තෙ”සී[1].

වජ්ජීන්ගෙ එ සඞ්ගීතියෙහි මූලහෙතුව වූයෙ ස්ථවිර භික්ෂූන් ප්‍රතික්ෂෙප කළ අකප්පිය දශවස්තූන් පිහිටුවාලීම යැ.

1. දීපවංස (5 – 76)

පටිසම්භිදා - නිද්දෙසාදිය හළුයෙ ඔවුන් කෙරෙහි ඒ පුහුණු කළවුන් නො වීම යැ, බුදුසසුන් පිහිටුවාලන සැදැහැ උන්ට නො වී යැ. උහු ප්‍රතිපත්තැ ගරු නො වූහ. දහම් මයසිඳ බුත්හ. මෙ දක්වා විවිධ ධම්ප්‍රතිරූප නැගෙනුයෙ එහෙයිනි.

පෙරදිග බෞද්ධ මුහුණින් පෙනීසිටි ශාසනද්‍රෝහීහු මඳු නො වෙති. සඳකත්පහණ ලුජ්ගල් කළ මලදූත් සෙයින් දහම්රස අගය නො කළ අවරදිග විචාරකයො ද භාෂාලෙශයෙන් ගෙන ත්‍රිපිටකය විවේචනය කරන්නට වූහ. උන් මුතු යයි තකා පෑ බෙලිකටු වැලැඳගත්තා අඳබලුන් සෙයින් බුන් සැදැහැති කාමචාරී බුදුනුවනුදු විසින් අන්‍යයන්ගෙ බස් හුවා පානු දක්නට හැකි ය. අන්‍යයන් සසුනට කෙතෙක් නිගා දුන ද ඉන් වන මහත් හානියෙක් නැති. සසුන්හි වැදූ, එහි මැ ලැගැ, එහි මැ රැකෙනුවන් තමා වරදවා ගත් පෙළ අරුත් ජනයා හමුයෙහි තබනු මහත් වනසෙකි. 'මෙහි මැ උපන්නෙ සසුන් වනසා' යයි වදාල බව ද සිතිය යුතු ය.

1. "මහානිද්දෙස යයි කියනු ලබන්නේ අට්ඨකවග්ගයෙ පරණ අටුවාවට ය.

2. මහානිද්දෙස - චූලනිද්දෙස දෙක සුත්තනිපාතයේ වර්ග දෙකක අටුවාබව හොඳින්ම පැහැදිලිව තිබියදී පෙළපොත්වලට ඇතුළත් කිරීමෙන් පෙනීයන්නේ කුදුගොත් සඟිය පසුකලක පෙළට එකතුකරගත් බවයි.

3. මෙය වනාහි සුත්තනිපාතයේ කොටසකට ලියූ අටුවාවකි.

4. සිංහලඅටුවා ලියන්ටත් පෙර තෘතීය සංගීතියටත් පෙර ලියන ලද්දකි.

5. මෙය අගසව් සැරියුත් මහතෙරුන්ගේ කෘතියකැයි කියන නමුත් ඒකීම පිළිගැනීමට තරම් කරුණු පෙනෙන්නට නැත.

6. මේ පුරාණ අටුවාව පසුකලක කුදුගොත්සඟියේ පෙළට ඇතුළත්කරගත් බැවින් බුද්ධඝෝෂාචාර්යයන් අටුවා ලියූ කාලයේ දී සුත්තනිපාතයට නැවත අටුවාවක් ලියා තිබේ.

7. නිද්දෙසපාලිය සුත්තනිපාතයෙන් ගත් සූත්‍ර කීපයකට අර්ථකථාස්වරූපයෙන් කළ විවරණයෙකි.

8. පටිසම්භිදා - නෙත්තිප්පකරණාදිය අර්ථකථා ස්වරූපයෙන් නො තබා පෙළට එක්කිරීමට ඇති හේතු නොං පැහැදිලිය.

9. දැන් පෙළ පොත්වශයෙන් ගණන් ගෙන තිබෙන පටිසම්භිදාමග්ගයත් මහානිද්දෙසයත් ඒ අටුවාවලින් දෙකක්ය."

මෙ දක්වන ලදුයේ නිද්දෙසපාළියට නගාලන භ්‍රංසන මතුයෙකි. මෙ දක්නා මහතෙරවරුන් 'සසුනට නිගා දෙන ඇදුරෙල් හෙළාදක්නා වරාකයනට අනුකම්පා කටයුතු ය' යි කියතුදු දහම්රිසියන් පසුබස්වන, නවීනයන් නුවණැස අඳුරු කරන, සැදැහැතියන් විසංවාදන කොට පිළිවෙතින් නෙරන මෙ වදන් මහත් වූ අනාගතභයට වැටෙන සේ දක්ක යුතු වෙයි.

මහාසඞ්ගීතිත්‍රයෙහි සඞ්ගීත වූ ත්‍රිපිටකයට බුද්ධානුමත වූ අටුවා ද එකල්හි මැ සඞ්ගීත විය. අටුවා ප්‍රමාණ කොට මෙසේ කියම්හ. තෙවලා පෙළෙහි බුදුන් වදාළ දැය මතු නො වැ සාරිපුත්තාදි මහසව්වන් වදාළ දහම්හු, සූත්‍රකථාදිය සමනා කොට දක්වනු සඳහා සඞ්ගීතිකාරකයන් අළ නිදානකථා ආදිය ද, වෙනත් දේවමානුෂයන්ගෙ බසුදු, දෙවැනි තෙවැනි සඞ්ගීතියෙහි ඇතුළු වැ ගිය සූත්‍රප්‍රදෙශ ද ඇත. බුද්ධදේශිත නොවූ යම් මැ බසෙක් එහි සැඟැහිණි නම් එ හැම 'මේ අසුවල්හු විසින් අසුවල් කරුණු සඳහා කියන ලදැ'යි හෙළි කොට දක්වන අටුවා ඈඳුරන් කුදුගත් සඟියෙ යම් කවර ග්‍රන්ථයක් හෝ නිද්දෙසපාළිය මැ නො පසු වැ රචනා කොට පෙළට ඇතුළු කරන ලද නම්, එ බව නො වළහා කියනු ඇත. නොහොත් යම් කිසි ග්‍රන්ථයෙක් වේවයි සූත්‍රප්‍රදේශයෙක් වේවා'යි අමුතු-වෙන් ගොතා රහසි වැ ත්‍රිපිටකයට ඇතුළු කිරීමෙහි ශක්තියෙක් කවරක් හට තිබිණි ද? සථවිර භික්ෂූන්ට එබඳු කවර අවශ්‍යතායෙක් හො වී ද? යම් කවරක් හු හො 'මේ බුදුදහමැ'යි අළ ද මහාපදෙසයෙහි නොවැටෙ නම්, විනය පිණිස නො පවත්නෙ නම්, ධර්මතායෙහි නො සැසැඳෙ නම්, එ බැහැර ලනු ආචාර්යවංශයෙහි ආ සිරිති. දැන් යට කී බුංසනයන් විමසා බලම්හ.

1. නිද්දෙසපාළිය ධම්සෙනෙවියන් විසින් සූත්‍රනිපාතයෙහි බැස සිටුනා තෙතිස් සූත්‍රයෙකකුත් සඳහා ධර්මචක්‍රය විභාග කෙරෙමින් වදාළ නිද්දෙසයයි කියන ලදී. නිද්දෙසයෙහි හා අට්ඨකථායෙහි හා වෙනස්කම් ඇත: 'බුදුන් වදාළ එ එ දහම්පද නඟාගෙන උද්දෙස නිද්දෙස පටිනිද්දෙස විසින් විභාග කොට, අවසානයෙහි නිගමනය කරනු නිද්දෙසපාළියෙහි ආ දේශනාක්‍රම සි. එ මෙසේ යැ: 'කාමං කාමයමානස්සාති' යනු කාමසුත මුල්පදය උද්දෙස කළ අයුරු යැ. 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථු-කාමා ච කිලෙසකාමා ච' යනු උද්දිෂ්ට පදය නිද්දෙස කළ ආකාර යි. යළි 'කතමෙ වත්ථුකාමා, මනාපිකා රූපා මනාපිකා සද්දා'. යනාදිය එ නිර්දිෂ්ට පදය පටිනිද්දෙස විසින් බෙදූ සැටි යැ. ප්‍රතිනිර්දිශාවසානයෙහි 'ඉති කාමං කාමයමානස්ස'[1]යි නිගමනය වෙයි. නිද්දෙසපාළියෙහි ආ ධර්මවිභාගය මෙසේ දත යුතු ය.

අටුවාව වූ කලි මෙයින් වෙනස් වූ පාළික්‍රමයෙකි. එ ගාථාපදය ම අටුවා කළ සැටි මෙසේ යැ: "තත්‍ථ කාමන්ති මනාපියරූපාදි තෙභූමකධම්ම සඞ්ඛාතං වත්ථුකාමං, කාමයමානස්සාති ඉච්ඡමානස්ස, තස්ස චෙ තං සමි-ජ්ඣතීති තස්ස කාමයමානස්ස සත්තස්ස තං කාමසඞ්ඛාතං වත්ථුං සමි-ජ්ඣති චෙ, සචෙ සො තං ලභතීති වුත්තං හොති"[2]යි. යට දැක්වූ නිද්දෙ පෙළත් මේ සුත්තනිපාත අටුවාවත් විමසන්නකුට නිද්දෙස හා අටුවා හා දෙක්හි ඇති අන්තරය පෙනනු ඇත. තවද අටුවායෙහි කිසි තැනෙක මෙසේ අර්ථ දැක්වීමෙන් නො නැවැතී අර්ථෝද්ධාරය ද කරන ලද්දෙ යැ. එසේ ම අවශ්‍ය තැන නිරුක්ති පදවිභාග හා ලක්ෂණ රසාදිය ද හෙළි කරන ලද වෙයි. මේ කී අට්ඨකථා ස්වරූපය නිද්දෙසපාළියෙහි නො ලැබෙනුයෙන් එය පැරණි අටුවාවක් නොවන බව සැලැකිය යුතු ය. "පෙළ නම් වාචනාමග්ග කොටැ තබන ලදු" යන ධම්පියාටුවා ගැටපද සන්නයෙහි කීයෙන් 'නිද්දෙස'ය වාචනාමග්ගයෙහි සිටියේ නු සි පාළි නමින් මැ ගන්නට නිසි වෙයි. අටුවා ඒ සැටියෙන් නොසිටුනේ වෙයි.

1. නිද්දෙසපාළි - 2 පිට    2. සුත්තනිපාත අටුවා - 414 පිට

2. "ඛුද්දගොත්සඟිය පසුකලෙක පෙලට එකතුකරගත්බව පෙනියත්නේය"යි කියති. ඛුද්දගත්සඟිය ප්‍රථම මහාසංගීතියේ දී මැ සඞ්ගීත වූ සේ තව කෙනෙක් දකිති. අටුවා ඇදුරෝ එ මැ දුටහ. හෙළටුවා ලියූ මිහිඳු අතැවැස්සො හෙළඇදුරෝ ද ද්වීපප්‍රසාදක බුද්ධකල්ප මහාමහීන්ද්‍ර මහතෙර හිමියන් කෙරෙහි එ මැ උගත්හ. ඔබට දු මොග්ගලිපුත්තතිස්ස මහතෙර ණුවෝ උගත්වාලුවාහු ද එ ලෙසින් මැ යි. දෙවන සඟායෙහි මහතෙරුනට පිළිමල් වැ ගිය වජ්ජිහු පවා ඛුද්දගත් සඟිය පළමුසඟායෙහි නැඟීගිය සේ දුටහ. එහෙත් උන් දසදහසක් දෙනා කෙරෙහි නිද්දෙස පටිසම්භිදා හා ඇතැම් ජාතකාදිය හා උගත් එකක්හු පවා නො සිටියෙන් උන්ගෙ සඞ්ගීතියට නො නඟාගත්හ. දත් එකෙක් හෝ වී නම් වරදවා හො තමනට වාසි වන සෙ ලියාගනු නිසැක ය. ඇපි මේ කියන්නමෝ ඇදුරු පරපුර බලා යැ.

ඛුද්දගත්සඟිය පසුකලෙක පෙලට එක්කල බව පෙනීමට හේතු ද දක්වා ලති: "මහානිද්දෙස චූලනිද්දෙස දෙක අටුවාබව හොඳින් ම පැහැදිලි ව තිබියදී පෙළපොත්වලට ඇතුළත් කිරීම" යි. නිද්දෙසය අටුවාවක් වීම ඛුද්දගත්සඟිය පසුව පෙළට ඇතුළත් කළැයි කීමට කෙසේ නම් සාධක විය හැකි ද? තවත් කියති: 'හොඳින් ම පැහැදිලි ව තිබිණැ' යි. ඇදුරන් කෙරෙහි සිට පාඩු බැලී නම් මෙබඳු විපරීතදර්‍ශනයකට අවසර නොලැබෙන්නට තිබිණි.

3. සුත්තනිපාතය සඟහාලන්නට පෙර මැ ධම්සෙනෙවියන් විසින් අට්ඨකවග්ගාදීයෙහි එන තෙතිස් සූත්‍ර කෙනකුන්ට නිද්දෙස වදාරන ලද්දෙ යැ. නිද්දෙසයට විෂය වූ අට්ඨකවග්ගාදිය සූත්‍රනිපාතයෙහි සැඟැහු බව විනා සූත්‍රනිපාතයෙන් කොටසක් නඟාගෙන අටුවාවක් ලියූ කෙනකුන් නැතිබව තරයේ දතයුතු ය.

4. නිද්දෙසයට කාලනිර්ණය කෙරෙති: 'සිංහල අටුවා ලියන්වත් පෙර තෘතීය සංගීතියටත් පෙර'යයි. දෙ පෙරයෙක් කුමට ද? අතීතය දක්වන්නට ඇතීත් තිබෙන හිම ප්‍රමාණ යැ. බුදුන් පිරිනිවෙන්නටත් පෙර නිද්දෙස වදාළ සැටි අටුවා ප්‍රමාණ කොට පෙන්වා දුනුම්හ.

5. 'මෙය (නිද්දෙසය) සැරියුත් මහතෙරුන්ගේ කෘතියකැයි ... කීම පිළිගැනීමට තරම් කරුණු නැතැ'යි කියති. සැබැව, ධම්සෙනෙවි සැරියුත් මහතෙරණුවන්ගේ 'කෘති' යෙකැයි කීමෙක් වේ නම් පිළිගැනීමට කරුණු නැත. විතණ්ඩවාදියකු තමා මැ එසේ කියාගන්නා බව මූත් ථෙරීයවංසයෙහි ඇදුරුවරයන් පවසනුයෙ නිද්දෙසය අගසවු සැරියුත් මහතෙරණුවන් දේශනා කළ බව හා තුන්මහසඟායෙහි සඞ්ගීත වැ, ඇදුරු පරපුරෙන් මුඛපාඨ විසින් ගෙනවුත් අලුලෙනැ දී සිංහල භික්ෂූන් පුස්කොළයෙහි ලියාතුබූ බවය. පරගැති වැ තමන් ගත් දුර්මතියෙන් බෞද්ධ ජනතාව, අනාගත පරපුර විසංවාදන කරනු නොයෙදෙ.

6. 'මේ පුරාණ අටුවාව ඛුද්දගොත්සඟියේ පෙළට ඇතුළත් කරගත් බැවින් බුද්ධඝොෂාචාර්‍ය්‍යයන් සුත්තනිපාතයට වෙන ම අටුවාවක් ලියාගත් බව' කියති. මෙ ද පරවාදීන්ගෙ කපොලකල්පිතයක් විනා බුදුගොස් තෙරුන් දුටු සැටියෙක් නොවෙ. ඔබ දුටුයෙ වෙන් වෙන් ව සංගීතියට නැඟුණු

සුත්තනිපාතය හා නිද්දෙසපාළිය හා නිද්දෙසපාළියට ලියූ හෙළටුවාවෙකි. සුත්තනිපාතයට ලියූ හෙළටුවාවෙක් නම් වූබව නො පෙනේ. නිද්දෙසයට හෙළටුවා තුබුයෙන් සුත්තනිපාතයට හෙළටුවා වෙන ම නො ලියැවිණැයි සිතනු නිසි වෙයි. නිද්දෙසයට හෙළටුවාවක් තුබු සෙ දක්වති උපසෙන තෙරණුවෝ:

“පුබ්බාපරෙපට්ඨකථානයඤ්ච යථානුරූපං උපසංහරන්තො”යි – පූර්වාපර අර්ථකථානය යථානුරූපයෙන් ගෙන නිද්දෙසවර්ණනා කරන සෙ කීයෙන් නිද්දෙසයට පැරණි අටුවාවක් තුබු බවුදු, එ හෙළ ඇදුරන් ලියූ මහඅටුවා බවුදු, එයින් ‘නිද්දෙසස්ස පුරාණඅටුවාව’ යි ගත් විතණ්ඩවාදීන් බස් පලන බවුදු දතයුතු”.

මෙහි 7, 8, 9 වාදයන් ගෙන් ද පැනෙනුයෙ නිද්දෙසය අටුවාවෙකැයි පුන පුනා කියන අයුරු ය. විශේෂයෙක් නම්, මෙහි පටිසම්භිදාමග්ග හා නෙත්තිප්පකරණ හා අටුවාවාදයට ඇදගැනීම යැ. එ දෙ පොත් පිණිස කියැ යුතු මතු යථාකාලයෙහි එන්නෙ යි.

බුද්ධකාලයෙහි දු බුදුනට වාදාරොපණ කළාහු, බුදුදහම්හි දොස් දුටු-වාහු බාහිර දෘෂ්ටිකයෝ මතු නොවූහ. අරිට්ඨ වැනි ශාසනිකයෝ ද වූහ. බුදුන් පිරිනිවි පසු ද දහම් විෂයෙහි පැනැනැගුණු විවිධ වාදයන් ද ශාසනධුරයෙහි සිටි මහතෙරවරුන් ඒ නිරාකරණය කෙරෙමින් තෙවළාදහමට පිටුවහල් වූ සැටි ද ශාසන ඉතිහාසයෙන් හෙළි වෙයි. මෙකල විවේචනය කලාවක් කොට ගත් බාහිර උගතුන්, විවෙචන ආධාරයෙන් තෙවළායෙහි දොස් දක්නවුන් ඇති බව පැහැදිලි ය. පෙළබසෙහි මඳ දැනුමක් ලබා ශබ්දකොෂයෙන් පාළියට අර්ථ දෙන්නට වෑයම් කරන නවීනයනට පෙළදහම කෙළිබිම් වූ සැටියකු දු දක්නට ඇත.

විමුක්තිරසය ම පරම කොට ඇති, රාගවිරාගය සඳහා, මද නිම්මදනය සඳහා දෙසූ දහමක් ලොවට නැබුරුව සිට විවෙචනයට බසුන් නොයෙදෙයි. බුදුදහම්හි චිරප්‍රවෘත්තිය නො රුස්නා විෂමපුද්ගලයන් ගත් මගෙක් දැන් පැහැදිලි වෙයි: බුදුන් වදාළ දහම්පෙදෙස් බුද්ධභාෂිත නො වනසේ දක්වීම එහි මුල් තැන සිටී. ත්‍රිපිටකධර්මයෙහි භාෂාව පුරාණ සූත්‍රවංශයෙන් බෙදීම ද, ඛුද්දකනිකායෙහි ඇතැම් ග්‍රන්ථයෙක් පසුව සංග්‍රහ කරන ලදැයි කීම දැයි මෙවැනි කරුණු උන්ගේ දුර්වාද පිසින් තැබිය යුතුය. යම් මැ දහම්පදයෙක් පසුවැ සංග්‍රහකරන ලදැයි හෝ හෝ සංගීතියට නො නැඟිණැයි හෝ කියනුවන් විසින් ‘එය බුද්ධ භාෂිත නො වේ’යයි කියන ලද වෙයි. “භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙති”යි වදාළ සසුන් නැසීමට කරුණු වූ භෙදකර වස්තුව එහි බැස ගෙන සිටී. එහෙයින් බෞද්ධයෝ විශෙෂයෙන් සිංහල භික්ෂූන් වහන්සේ එබඳු විෂමවාදයනට නො බැස ත්‍රිපිටක පර්‍ය්‍යාප්තිය සුරක්ෂිත කරනු සඳහා උත්සාහවත් වියයුත්තාහ.

ලංකාණ්ඩුවේ සාංස්කෘතික දෙපාර්තමේන්තුව මඟින් සිදුවන ත්‍රිපිටක සිංහලපරිවර්තන කාර්‍ය්‍යය වූ කලී ඉක්මැගිය දෙවාදහස් කාලය තුළ සිදුවූ අද්විතීය ධර්මසාහිත්‍ය සේවාවකි. ශ්‍රද්ධාසම්පන්න වූ සාධූන්ගේ ධර්මඥනය හා ස්වභාෂාඥනය හා අපෙක්ෂායෙන් ලියූ මහානිද්දෙසව්‍යාඛ්‍යානය පරි-ශීලනයෙන් ලොවි – ලොවුතුරු සුව ලබත්වයි ආශංසනය කරම්හ.

ලබුගම ලංකානන්ද ස්ථවිර.

# සඞ්කෙතනිරූපනං

# ABBREVIATIONS

| | | |
|---|---|---|
| සීමු i | —— | 1916 සීහලක්ඛරමුද්දිත මහානිද්දෙසපාළි (පඨමො භාගො). |
| සීමු ii | —— | 1933 සීහලක්ඛරමුද්දිත මහානිද්දෙසපාළි. |
| මනුප | —— | මහනුවර - පත්තිරිප්පුව - රාජකීය පොත්ථකාලයායත්ත තාලපණ්ණපොත්ථකං. |
| සී | —— | (මොල්ලිගොඩ) පවචනොදය පොත්ථකාලය- තාලපණ්ණ පොත්ථකං. |
| කත්ථවි | —— | (පානදුර - වලාන)සිරිසිද්ධත්ථාරාම පොත්ථකාලය- තාලපණ්ණ පොත්ථකං. |
| මඡසං | —— | මරම්ම ඡට්ඨ සඞ්ගීතියා පිටක පොත්ථකං. |
| ස්‍යා | —— | ස්‍යාම - තායිඅක්ඛරමුද්දිත මහානිද්දෙසපාළි. |
| PTS. | —— | Pali Text Society - Mahaniddesa. |
| සු | —— | මුද්දිත සුත්තනිපාතපාළි. |
| සං | —— | ,, සංයුත්තනිකායපාළි. |
| අනි | —— | ,, අඞ්ගුත්තරනිකායපාළි. |
| ස | —— | ,, සද්ධම්මපජ්ජොතිකා - නිද්දෙසට්ඨකථා. |
| ප | —— | ,, පරමත්ථජොතිකා - සුත්තනිපාතට්ඨකථා. |
| වි | —— | ,, විසුද්ධිමග්ගො. |
| පු | —— | (භාණකමතෙනට්ඨකථාගතානි) පුරාතනපාඨන්තරානි. |

# THE PĀLI ALPHABET

## IN SINHALESE CHARACTERS.

## VOWELS

අa ආ ā ඉi ඊī උu ඌū එē ඔō

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| කka | ඛkha | ගga | ඝgha | ඞṅa |
| චca | ඡcha | ජja | ඣjha | ඤña |
| ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa |
| තta | ථtha | දda | ධdha | නna |
| පpa | ඵpha | බba | භbha | මma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යya | රra | ලla | වva | සsa | හha | ළḷa | අංaṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | = | = | = | = | = | = | = |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| කක kka | ජඣ jjha | තථ ttha | බ්‍ර bra |
| කඛ kkha | ඤඤ ñña | ත්‍ර tra, ත්ව tva | මප mpa |
| ක්‍ය kya | ඤහ, ñha | දද dda | මඵ mpha |
| ක්‍රි kri | ඤච, ච ñca | දධ, ධ ddha | මබ, ඹ mba |
| ක්ව kva | ඤඡ ඡ, ñcha | ද්‍ර dra | මභ mbha |
| ඛ්‍ය khya | ඤජ ජ, ñja | දව ව, dva | මම mma |
| ඛව khva | ඤඣ ñjha | ධව dhva | මහ mha |
| ඞක ṅka | ටට ṭṭa | නත nta | යය, ය්‍ය yya |
| ඞඛ ṅkha | ටඨ, ඨ ṭṭha | නථ ntha | යහ yha |
| ගග gga | ඩඩ ḍḍa | නද nda | ලල lla |
| ගඝ ggha | ඩඪ ḍḍha | නධ ndha | ල්‍ය lya |
| ග්‍ර gra | ණණ ṇṇa | නන nna, | ලහ lha |
| ඞග ṅga | ණට ṇṭa | නහ nha | වහ wha |
| ඞඝ ṅgha | ණඨ ṇṭha | පප ppa | සස ssa |
| චච cca | ණඩ, ඬ ṇḍa | පඵ ppha | සම sma |
| චඡ ccha | ණහ ṇha | බබ bba | සව swa |
| ජජ jja | තත tta | බභ bbha | හම hma |

හව hva ළහ ḷha

ා ā ි i ී ī ු u ූ ū ෙ ē ො ō

# විසයසූචි


| විසයා | | පිට්ඨඞ්කා |
|---|---|---|
| කාමසුත්තනිද්දෙසො | | 2 - 30 |
| ගුහට්ඨක | ,, | 32 - 86 |
| දුට්ඨට්ඨක | ,, | 86 - 114 |
| සුද්ධට්ඨක | ,, | 116 - 140 |
| පරමට්ඨක | ,, | 140 - 160 |
| ජරා | ,, | 162 - 190 |
| තිස්සමෙත්තෙය්‍ය | ,, | 190 - 220 |
| පසූර | ,, | 220 - 248 |
| මාගන්දිය | ,, | 248 - 284 |
| පුරාභෙද | ,, | 284 - 344 |
| කලහවිවාද | ,, | 344 - 388 |
| චූළවියූහ | ,, | 388 - 416 |
| මහාවියූහ | ,, | 416 - 464 |
| තුවටක | ,, | 466 - 556 |
| අත්තදණ්ඩ | ,, | 558 - 626 |
| සාරිපුත්ත | ,, | 626 - 730 |
| ගාථාදිපාදසූචි | | 733 - 738 |
| නිද්දිට්ඨපදසූචි | | 739 - 759 |
| ශුද්ධි පත්‍රය | | 760 - 761 |

සුත්තන්තපිටකෙ

ඛුද්දකනිකායෙ

# මහානිද්දෙසපාළි

# මහානිද්දෙසපාළි

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

## 1

## කාමසුත්තනිද්දෙසො

### 1 - 1.

"කාමං කාමයමානස්ස තස්ස චෙ තං සමිජ්ඣති,
අද්ධා පීතිමනො හොති ලද්ධා මච්චො යදිච්ඡති."

**කාමං කාමයමානස්සාති** - 'කාමා'ති උද්දානතො[1] ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච. කතමෙ වත්ථුකාමා? මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා, අත්ථරණා පාපුරණා, දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා, ඛෙත්තං වත්ථු[2] හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරං ච, යං කිඤ්චි රජනීයං වත්ථු[3] වත්ථුකාමා.

අපි ච, අතීතා කාමා, අනාගතා කාමා, පච්චුප්පන්නා කාමා, අජ්ඣත්තා කාමා, බහිද්ධා කාමා, අජ්ඣත්තබහිද්ධා කාමා, හීනා කාමා, මජ්ඣිමා කාමා, පණීතා කාමා, ආපායිකා කාමා, මානුසිකා කාමා, දිබ්බා කාමා, පච්චුපට්ඨිතා කාමා, නිම්මිතා කාමා, පරනිම්මිතා කාමා, අනිම්මිතා කාමා[4], පරිග්ගහිතා කාමා, අපරිග්ගහිතා කාමා, මමායිතා කාමා, අමමායිතා කාමා, සබ්බෙ'පි කාමාවචරා ධම්මා, සබ්බෙ'පි රූපාවචරා ධම්මා, සබ්බෙ'පි අරූපාවචරා ධම්මා, තණ්හාවත්ථුකා තණ්හාරම්මණා කමනීයට්ඨෙන[5] රජනීයට්ඨෙන මදනීයට්ඨෙන කාමා. ඉමෙ වුච්චන්ති වත්ථුකාමා.

---

1. උද්දානතො - ස්‍යා. මජ්සං. 2. වත්ථූ - ස්‍යා. ඡ. 3. රජනීයවත්ථු - ස්‍යා.
4. 'පරනිම්මිතාකාමා'ති - සී. I. පොත්ථකෙ ච. 'අනිම්මිතාකාමා' ති - ස්‍යා මජ්සං. PTS පොත්ථකෙසු ච සද්ධම්මපජ්ජොතිකායං ච න දිස්සන්ති.
5. කාමනීයට්ඨෙන - සී. I. II. ස්‍යා.

සූත්‍රාන්තපිටකයෙහි ඛුද්දකනිකායෙහි

# මහානිද්දේශය

———ඃ———

## ඒ භාග්‍යවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

# 1

# කාමසුත්‍රනිද්දේශය

### 1 - 1.

"වස්තුකාමය කැමැති වන සත්ත්වයාහට ඉදින් ඒ කාමය සමෘද්ධ වේ නම්, එකල්හි සත්ත්ව තෙමේ කැමැති වස්තුව ලැබ ඒකාන්තයෙන් සතුටු සිත් ඇත්තේ වේ."

**කාමං කාමයමානස්ස** – 'කාමං' යනු විස්තර විසින් වස්තුකාමයෝ යැ, ක්ලේශකාමයෝ යැ යි කාමයෝ දෙදෙනෙක් වෙති. වස්තුකාමයෝ කවරහ ?යත්: මන වඩන රූපයෝ යැ, මන වඩන ශබ්දයෝ යැ, මන වඩන ගන්ධයෝ යැ, මන වඩන රසයෝ යැ, මන වඩන ස්පර්ශයෝ යැ, අතුරුණු යැ, පොරෝන යැ, දැසිදස්හු යැ, එළු බැටළු යැ, හූරු කුකුළු යැ, ඇත් අස් ගව වෙළඹහු යැ, කෙත් යැ, වතු යැ, කහවණු යැ, රන් යැ, ගම් නියම්ගම් රජදහන්හු යැ, රට යැ, දනවු යැ, කොෂ යැ, කොටුගෙ යැ, යම් කිසි ඇලුම් කට යුතු වස්තු යැ (යන මොහු) වස්තුකාමයෝ යැ.

තව ද, අතීතකාමයෝ යැ, අනාගතකාමයෝ යැ, වර්තමානකාමයෝ යැ, ආධ්‍යාත්මිකකාමයෝ යැ, බාහිරකාමයෝ යැ, අධ්‍යාත්මබාහ්‍යකාමයෝ යැ, හීනකාමයෝ යැ, මධ්‍යමකාමයෝ යැ, ප්‍රණීතකාමයෝ යැ, සතර අපායයෙහි වූ කාමයෝ යැ, මිනිස්ලොව වූ කාමයෝ යැ, දෙව්ලොව වූ කාමයෝ යැ, එළඹ සිටි කාමයෝ යැ, (අරමුණු මවා රමණය කරන) නිර්මිතකාමයෝ යැ, පරනිර්මිත කාමයෝ යැ, අනිර්මිත (=පියෙවින් පිළියෙළ වූ) කාමයෝ යැ, (මේ මාගේ යැ යි) පිළිගත් කාමයෝ යැ, (එසෙයින්) නො පිළිගත් කාමයෝ යැ, (තෘෂ්ණාවශයෙන්) මේ මාගේ යැ යි ගත් කාමයෝ යැ, (එසේ නො ගත්) අමමායිත කාමයෝ යැ, සියලු මැ කාමාවචරධර්මයෝ යැ, සියලු මැ රූපාවචරධර්මයෝ යැ, සියලු මැ අරූපා-වචරධර්මයෝ යැ, තෘෂ්ණාවට කාරණ වූ තෘෂ්ණාවට අරමුණු වූ (ධර්මයෝ) ප්‍රාර්ථනා කළ යුතු අර්ථයෙන් ඇලීමට යෝග්‍යාර්ථයෙන් (කුලමදාදි) මද ඉපදවිය යුතු අර්ථයෙන් කාමයෝ යි. මොහු වස්තුකාමයෝ යැ යි කියනු ලැබෙත්.

කතමෙ කිලෙසකාමා? ඡන්දො කාමො, රාගො කාමො, ඡන්දරාගො කාමො; සඞ්කප්පො කාමො, රාගො කාමො, සඞ්කප්පරාගො කාමො; යො කාමෙසු කාමච්ඡන්දො, කාමරාගො, කාමනන්දි, කාමතණ්හා, කාමසිනෙහො, කාමපරිළාහො, කාමමුච්ඡා, කාමජ්ඣොසානං, කාමොඝො, කාමයොගො, කාමුපාදානං, කාමච්ඡන්දනීවරණං.

1. "අද්දසං කාම තෙ මූලං සඞ්කප්පා කාම ජායසි,
න තං සඞ්කප්පයිස්සාමි එවං කාම න හෙහිසි[1]" ති

ඉමෙ වුච්චන්ති කිලෙසකාමා.

**කාමයමානස්සාති**[2] - කාමයමානස්ස ඉච්ඡමානස්ස සාදියමානස්ස පත්ථයමානස්ස පිහයමානස්ස[3] අභිජප්පමානස්සාති කාමං කාමයමානස්ස.

**තස්ස චෙ තං සමිජ්ඣතීති** - 'තස්ස චෙ'ති තස්ස ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සස්ස වා සුද්දස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා දෙවස්ස වා මනුස්සස්ස වා, **තන්ති** වත්ථුකාමා වුච්චන්ති: මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා; **සමිජ්ඣතීති** ඉජ්ඣති සමිජ්ඣති ලභති පටිලභති අධිගච්ඡති වින්දතීති තස්ස චෙ තං සමිජ්ඣති.

**අද්ධා පීතිමනො හොතීති** - අද්ධා ති එකංසවචනං නිස්සංසයවචනං නික්කඞ්ඛවචනං අද්වෙජ්ඣවචනං අද්වෙළ්හකවචනං නියොගවචනං අපණ්ණකවචනං අවත්ථාපනවචනමෙතං අද්ධා ති. **පීති** ති යා පඤ්චකාමගුණපටිසංයුත්තා පීති පාමොජ්ජං ආමොදනා පමොදනා හාසො පහාසො විත්ති තුට්ඨි ඔදග්‍යං අත්තමනතා අභිපූරණතා[4] චිත්තස්ස. **මනොති** යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු. අයං වුච්චති මනො. අයං මනො ඉමාය පීතියා සහගතො හොති සහජාතො සංසට්ඨො සම්පයුත්තො එකුප්පාදො එකනිරොධො එකවත්ථුකො එකාරම්මණො. **පීතිමනො හොතීති** පීතමනො[5] හොති තුට්ඨමනො හට්ඨමනො පහට්ඨමනො අත්තමනො උදග්ගමනො මුදිතමනො පමුදිතමනො හොතීති අද්ධා පීතිමනො හොති.

1. හෙහිසි - සීමු. II PTS. 2. කාමං කාමයමානස්සාති කාමං - සී. 1. සීමු. I සං.
3. පිහමානස්ස. - සී. 1. සං. 4. අභිපුරණතා - PTS.
5. පීතිමනො - සීමු. II PTS.

ක්ලේශකාමයෝ කවරහ ? යත්: ඡන්දය කාම යැ, රාගය කාම යැ, ඡන්දරාගය කාම යැ, සඞ්කල්පය කාම යැ, රාගය කාම යැ, සඞ්කල්පරාගය කාම යැ, පඤ්චකාමගුණයෙහි යම් කාමසඞ්ඛ්‍යාත ඡන්දයෙක්, කාමරාගයෙක්, කාමනන්දියෙක්, කාමතෘෂ්ණායෙක්, කාමස්නෙහයෙක්, කාමපරිදාහයෙක්, කාමමූර්ඡායෙක්, කාමයන්හි ඇතුළු වීමෙක්, කාමසඞ්ඛ්‍යාත ඕඝයෙක්, කාමයොගයෙක්, කාමොපාදානයෙක්, කාමච්ඡන්දනීවරණයෙක් වේ ද-

1. කාමය, තා ගේ මුල දිටිමි. කාමය, තෝ සඞ්කල්පය හේතු කොට ගෙන උපදනෙහි. (දුන් මම) තා නො පතමි. කාමය, මෙසෙයින් තෝ නූපදනෙහි යැ යි.

මොහු ක්ලේශකාමයෝය යි කියනු ලැබෙත්.

**කාමයමානස්ස**- කැමැති වන, ආශංසනය කරන, ආස්වාදනය කරන, ප්‍රාර්ථනා කරන, ලබනු කැමැති වන, තෘෂ්ණායෙන් තෘප්තිය උපදවන ඔහුට නු යි 'කාමං කාමයමානස්ස' යනු වේ.

**තස්ස චෙතං සමිජ්ඣති**- 'තස්ස චෙ' යනු: ක්ෂත්‍රිය වූ හෝ බ්‍රාහ්මණ වූ හෝ වෛශ්‍ය වූ හෝ ශුද්‍ර වූ හෝ ගිහි වූ හෝ පැවිදි වූ හෝ දෙවි වූ හෝ මිනිස් වූ හෝ ඔහුට යැ. 'තං' යි වස්තුකාමයෝ කියනු ලැබෙති. මන වඩන රූපයෝ යැ, ශබ්දයෝ යැ, ගන්ධයෝ යැ, රසයෝ යැ, ස්පර්ශයෝ යි. සමිජ්ඣති යනු: නිපැදෙයි, මොනවට නිපැදෙයි, ලැබෙයි, පිළිලැබෙයි, පැමිණෙයි, විඳී නු යි 'තස්ස චෙ තං සමිජ්ඣති' යනු වේ.

**අද්ධා පීතිමනො හොති**- අද්ධා යනු: ඒකාන්තවචන යැ, නිස්සංශය වචන යැ, නිසැකවචන යැ, අද්වෛධවචන යැ, නොදෙගිත් වචන යැ, නියොගවචන යැ, අවිරුද්ධවචන යැ, සනිටුහන් වචනයෙකි. මේ 'අද්ධා' යනු පීති යනු පඤ්චකාමගුණප්‍රතිසංයුක්ත වූ යම් ප්‍රීතියෙක්, ප්‍රාමොද්‍යයෙක්, ආමොදනයෙක්, ප්‍රමොදනයෙක්, හර්ෂයෙක්, ප්‍රහර්ෂයෙක් (=හටුපහටු ආකාරයෙක්), ප්‍රීතිධනයෙක්, සතුටෙක්, ඔද වැඩිබවෙක්, සතුටුසිත් ඇති බවෙක්, චිත්තයාගේ පැතුරුණුබවෙක් වේ ද එය යි. මනො යනු: යම් සිතෙක්, මනසෙක්, මානසයෙක්, හෘදයයෙක්, පණ්ඩර වූ භවාඞ්ගසිතෙක්, මනසෙක්, 'මන'සඞ්ඛ්‍යාත ආයතනයෙක්, මනින්ද්‍රියයෙක්, විඥානයෙක්, විඥානස්කන්ධයෙක්, තදනුරූප වූ (හෙවත් ඒ ස්පර්ශාදිය උපදවන) මනොවිඥානධාතුයෙක් වේ ද, මෙය 'මන' යැ යි කියනු ලැබේ. මේ මනස මේ ප්‍රීතිය හා සහගත වූයේ, සමග උපන්නේ, සංසෘෂ්ට වූයේ, සම්ප්‍රයුක්ත වූයේ, එක් වැ උපන්නේ, එක් වැ නිරුද්ධ වනුයේ, (හදවත් විසින්) ඒකවස්තුක වූයේ, එක් අරමුණෙහි වූයේ වේ. පීතිමනො හොති - ප්‍රීති සහිත සිත් ඇතියේ වෙයි. තුටුසිත් ඇතියේ, හටුසිත් ඇතියේ, පහටුසිත් ඇතියේ, අත්තමන වූයේ, ඔද වැඩි සිත් ඇතියේ, මුදිත වූ සිත් ඇතියේ, ප්‍රමුදිත වූ සිත් ඇතියේ වේ නු යි 'අද්ධා පීතිමනො හොති' යනු වේ.

**ලද්ධා මච්චො යදිච්ඡතීති** - **ලද්ධා** ති ලභිත්වා[1] අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වා; **මච්චොති** - සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[2] ජන්තු ඉන්දගු[3] මනුජො[4]; **යදිච්ඡතීති** - යං ඉච්ඡති යං සාදියති, යං පත්ථෙති, යං පිහෙති[5], යං අභිජප්පති රූපං වා සද්දං වා ගන්ධං වා රසං වා ඵොට්ඨබ්බං වාති 'ලද්ධා මච්චො යදිච්ඡති'.
තෙනාහ භගවා:

"කාමං කාමයමානස්ස තස්ස චෙ තං සමිජ්ඣති,
අද්ධා පීතිමනො හොති ලද්ධා මච්චො යදිච්ඡති" ති.

## 1 - 2

"තස්ස චෙ කාමයානස්ස[6] ඡන්දජාතස්ස ජන්තුනො,
තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධො'ව රුප්පති".

**තස්ස චෙ කාමයානස්සාති** - **'තස්ස චෙ'** ති තස්ස ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සස්ස වා සුද්දස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා දෙවස්ස වා මනුස්සස්ස වා; **කාමයානස්සාති** - කාමෙ ඉච්ඡමානස්ස සාදියමානස්ස පත්ථයමානස්ස පිහයමානස්ස අභිජප්පමානස්ස; අථවා කාම-තණ්හාය යායති නීයති වුය්හති සංහරීයති, යථා හත්ථියානෙන වා අස්සයානෙන වා ගොයානෙන වා අජයානෙන වා මෙණ්ඩකයානෙන වා ඔට්ඨයානෙන වා ඛරයානෙන වා යායති නීයති වුය්හති සංහරීයති. එව මෙවං කාමතණ්හාය යායති නීයති වුය්හති සංහරීයතීති තස්ස චෙ කාමයානස්ස.

**ඡන්දජාතස්ස ජන්තුනොති** - ඡන්දෙ ති යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං කාමච්ඡන්දනීවරණං; තස්ස සො කාමච්ඡන්දො ජාතො හොති සඤ්ජාතො නිබ්බත්තො අභිනිබ්බත්තො පාතුභූතො. **ජන්තුනොති** - සත්තස්ස නරස්ස මානවස්ස පොසස්ස පුග්ගලස්ස ජීවස්ස ජාගුස්ස[7] ජන්තුස්ස ඉන්දගුස්ස මනුජස්සාති 'ඡන්දජාතස්ස ජන්තුනො'

**තෙ කාමා පරිහායන්තීති** - තෙ වා කාමා පරිහායන්ති, සො වා කාමෙහි පරිහායති; කථං තෙ කාමා පරිහායන්ති? තස්ස තිට්ඨන්තස්සෙව තෙ භොගෙ රාජානො වා හරන්ති, චොරා වා හරන්ති, අග්ගි වා දහති[8], උදකං වා වහති, අප්පියා වා දායාදා හරන්ති, නිහිතං[9] වා නාධිගච්ඡති[10], දුප්පයුත්තා වා කම්මන්තා භිජ්ජන්ති, කුලෙ වා කුලඞ්ගාරො[11] උප්පජ්ජති, යො[12] තෙ භොගෙ විකිරති විධමති විද්ධංසෙති, අනිච්චතා එව අට්ඨමී. එවං තෙ කාමා හායන්ති පරිහායන්ති පරිධංසන්ති[13] පරිපතන්ති[14] අන්තරධායන්ති විප්පලුජ්ජන්ති.

---

1. පටිලභිත්වා - ස්‍යා. 2. ජතු - සීමු. I. ජාතු. ස්‍යා. ජගු. මජ්සං. PTS.
3. හින්දගු - පුරාණ. 4. යක්ඛු - ස්‍යා. 5. පිහයි - ස්‍යා.
6. කාමයමානස්ස - සු. ස. 7. ජාතුස්ස - ස්‍යා. ජතුස්ස. මජ්සං. සී. I.
8. දහති. - මජ්සං. 9. නිහිතට්ඨානා. - මජ්සං. 10. විගච්ඡති - මජ්සං.
11 කුළෙ - ස. කුලඝාතකො කුලජ්ඣාපකො - ස්‍යා. 12. සො - සීමු. II.
13. පරිධංසෙන්ති. - ස්‍යා. - සීමු. 14 පරිච්චජන්ති - ස්‍යා.

**ලද්ධා මච්චො යදිච්ඡති** – **ලද්ධා** යනු: ලැබ, පැමිණ, විඳ, ප්‍රතිලාභ කොට; **මච්චො** යනු: සත්ත්ව තෙම, නර තෙම, මානවයා, පුරුෂයා, පුද්ගලයා, ජීවයා, (ච්‍යුතියෙන් ජාතියට යන්නේ නු යි) ජාගු තෙම, ජන්තු තෙම, (ඉන්ද්‍රසඞ්ඛ්‍යාත කර්මයෙන් යේ නු යි) ඉන්දගු තෙම, මනුජ තෙමේ යි. **යදිච්ඡති** යනු: රූපයක් හෝ ශබ්දයක් හෝ ගන්ධයක් හෝ රසයක් හෝ ස්ප්‍රෂ්ටව්‍යයක් හෝ යම් කිසිවක් කැමැති වේ නු යි, යමක් ආස්වාද කෙරේ නු යි, යමක් ප්‍රාර්ථනා කෙරේ නු යි, යමක් (තෘෂ්ණාවශයෙන්) ලබනු කැමැති වේ නු යි, යමෙක (තෘෂ්ණාවශයෙන්) ගුණ කියා නු යි 'ලද්ධා මච්චො යදිච්ඡති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"කාමං කාමයමානස්ස –පෙ– ලද්ධා මච්චො යදිච්ඡති"** යි.

**1 – 2.**

"ඒ වස්තුකාමයන් කැමැති වන්නා වූ උපන් තෘෂ්ණා ඇති ඒ පුද්ගලයාගේ ඒ කාමයෝ ඉදින් පිරිහෙත් නම්, එකල්හි හෙතෙම විෂ පෙවූ ශල්‍යයෙකින් (=ඊතලයෙකින්) විදුනා ලද්දකු සෙයින් පෙළනු ලැබේ."

**තස්ස චෙ කාමයානස්ස** – **තස්ස චෙ** යනු: ඒ ක්ෂත්‍රියයාගේ හෝ බ්‍රාහ්මණයාගේ හෝ වෛශ්‍යයාගේ හෝ ශූද්‍රයාගේ හෝ ගෘහස්ථයාගේ හෝ ප්‍රව්‍රජිතයාගේ හෝ දෙවියාගේ හෝ මිනිසාගේ හෝ යැ. **කාමයානස්ස** යනු: කාමවස්තූන් කැමැති වන්නහුගේ, ඉවසන්නහු (=ආස්වාදනය කරන්නහු)ගේ, ප්‍රාර්ථනා කරන්නහුගේ, ලබනු කැමැති වන්නහුගේ, තෘෂ්ණා–වශයෙන් ගුණ කියන්නහුගේ; නොහොත් කාමතෘෂ්ණාව විසින් යවනු ලැබෙයි, පමුණුවනු ලැබෙයි, වහනය කරනු ලැබෙයි, ගෙනයනු ලැබෙයි; යම් සේ ඇත්යානයෙකින් හෝ අශ්වයානයෙකින් හෝ ගවයානයෙකින් හෝ බැටළුයානයෙකින් හෝ මැඩයානයෙකින් හෝ ඔටුයානයෙකින් හෝ කොටළුයානයෙකින් හෝ යවනු ලැබේ ද, පමුණුවනු ලැබේ ද, වහනය කරනු ලැබේ ද, ගෙන යනු ලැබේ ද, එසෙයින් ම කාමතෘෂ්ණාව විසින් යවනු ලැබෙයි, පමුණුවනු ලැබෙයි, වහනය කරනු ලැබෙයි, ගෙන යනු ලැබේ නුයි 'තස්ස චෙ කාමයානස්ස' යනු වේ.

**ඡන්දජාතස්ස ජන්තුනො** – **ඡන්ද නම්**: පඤ්චකාමගුණයෙහි යම් කාම–සඞ්ඛ්‍යාත ඡන්දයෙක්, කාමතෘෂ්ණායෙක්, කාමස්නේහයෙක්, කාමපරිදාහයෙක්, කාමමූර්ච්ඡායෙක්, කාමයන්හි ගැසගැනීමෙක්, කාමසංඛ්‍යාත ඕඝයෙක්, කාමයෝගයෙක්, කාමෝපාදානයෙක්, කාමච්ඡන්දනීවරණයෙක් වේ ද, ඔහුට ඒ කාමච්ඡන්දය තෙමේ උපන්නේ, මොනොවට උපන්නේ, නිපන්නේ, වෙසෙසින් නිපන්නේ, පහළ වූයේ වේ. **ජන්තුනො** යනු: සත්ත්වයාගේ–නරයාගේ, මානවයාගේ, පුරුෂයාගේ, පුද්ගලයාගේ, ජීවයාගේ, ච්‍යුතියෙන් ජාතියට යන්නහුගේ, ජන්තුහු ගේ, කර්මයෙන් යන්නහු ගේ, මිනිසාගේ, නු යි 'ඡන්දජාතස්ස ජන්තුනො' යනු වේ.

**තෙ කාමා පරිහායන්ති** – වස්තුකාමාදි ඒ කාමයෝ හෝ පිරිහෙති, ඒ පුද්ගල තෙමේ හෝ කාමයන් කෙරෙන් පිරිහේ. කිසෙයින් ඒ කාමයෝ පිරිහෙති ? යත්: ඔහු ජීවත් වැ සිටිය දී මැ ඒ (කාමසඞ්ඛ්‍යාත) භොගයන් රජදරුවෝ හෝ හැරගනිති. සොරු හෝ පැහැරගනිති. ගින්න හෝ දවයි. (ඔඝ ආදි) උදකය හෝ මුහුදට ගෙන යයි. අමනාප වූ දායාදයෝ (=නොහිමියෝ) හෝ හැරගනිති. නිධාන කොට තබන ලදුයේ හෝ නො ලැබෙයි. දුෂ්ප්‍රයුක්ත වූ (=වරදවා යොදන ලද කෘෂිවණිජාදි) කර්මාන්තයෝ හෝ බිඳීයෙති. කුලයෙහි ඒ භොගයන් විසුරුවන, නසන, විධ්වංසනය කරන, කුලඅඟුරෙක් (=කුලඝාතකයෙක්) හෝ උපදී. අනිත්‍යතාව මැ අටවැනි කොට ඇත. මෙසේ ඒ කාමයෝ හෙති, පිරිහෙති, හාත්පසින් වැනැසෙති, වැගිරෙති, අතුරුදහන් වෙති, සුණුවිසුණු වැ යෙත්.

කථං සො කාමෙහි පරිහායති? තිට්ඨන්තෙව තෙ භොගෙ[1] සො චවති මරති අන්තරධායති විප්පලුජ්ජති. එවං සො කාමෙහි හායති පරිහායති පරිධංසති පරිපතති[2] අන්තරධායති විප්පලුජ්ජති.

1. “චොරා හරන්ති රාජානො අග්ගි දහති නස්සති,
අථ[3] අන්තෙන ජහති[4] සරීරං සපරිග්ගහං.

2. එතදඤ්ඤාය මෙධාවී භුඤ්ජෙථ ච දදෙථ ච,
දත්වා ච භුත්වා ච යථානුභාවං,
අනින්දිතො සග්ගමුපෙති ඨානං”ති.

**තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධොව රුප්පතීති** – යථා අයොමයෙන වා සල්ලෙන විද්ධො අට්ඨිමයෙන වා සල්ලෙන දන්තමයෙන වා සල්ලෙන විසාණමයෙන වා සල්ලෙන කට්ඨමයෙන වා සල්ලෙන විද්ධො රුප්පති කුප්පති ඝට්ටියති පීළියති ව්‍යාපිතො[5] දොමනස්සිතො[6] හොති, එවමෙව[7] වත්ථුකාමානං විපරිණාමඤ්ඤථාභාවා උප්පජ්ජන්ති සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා. සො කාමසල්ලෙන ච සොකසල්ලෙන ච විද්ධො රුප්පති කුප්පති ඝට්ටියති පීළියති ව්‍යාපිතො[5] දොමනස්සිතො[6] හොතීති – සල්ලවිද්ධොව රුප්පති.

තෙනාහ භගවා:

“තස්ස චෙ කාමයානස්ස[7] ඡන්දජාතස්ස ජන්තුනො,
තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධොව රුප්පතී” ති.

## 1 – 3

“යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
සො'මං විසත්තිකං ලොකෙ[8] සතො සමතිවත්තතී”.

**යො කාමෙ පරිවජ්ජෙතීති** – යොති යො යාදිසො යථායුත්තො යථාවිහිතො යථාපකාරො යං ඨානං පත්තො යංධම්ම[9]සමන්නාගතො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා; **කාමෙ පරිවජ්ජෙතීති** – 'කාමා'ති උද්දානතො[10] ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා.

**කාමෙ පරිවජ්ජෙතීති** ද්වීහි කාරණෙහි කාමෙ පරිවජ්ජෙති: වික්ඛම්භණතො වා සමුච්ඡෙදතො වා. කථං වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති? “අට්ඨිකඞ්කලූපමා කාමා අප්පස්සාද[11]ට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. “මංසපෙසූපමා කාමා බහුසාධාරණට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. “තිණුක්කූපමා කාමා අනුදහනට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. ‘අඞ්ගාරකාසූපමා කාමා මහාපරිළාහට්ඨෙනා” ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති.

---

1. භොගා - සයා. 2. පරිවච්ජති - සයා. 3. අථො - සයා.
4. අසහන්තෙන ජහති - මජසං. 5. බ්‍යාධිතො - සයා. මජසං. සිමු. I
6. දොමනස්සතො - සිමු. I
7. කාමයමානස්ස - සු. ස. සී. I 8. ලොකං - PTS.
9. ධම්මං - සිමු. I 10. උද්දානතො - සයා. මජසං.
11. අප්පස්සාදන - සිමු. & සී I.

කිසෙයින් හෙතෙම කාමයන් කෙරෙන් පිරිහෙයි ? යත්: ඒ භොගයන් තිබියැ දී මැ හෙතෙම ච්‍යුත වෙයි, මැරෙයි, අතුරුදන් වෙයි, වැනැසේ. මෙසෙයින් හෙතෙම කාමයන් කෙරෙන් හෙයි, පිරිහෙයි, හාත්පසින් වැනැසෙයි, ගිලිහෙයි, අතුරුදහන් වෙයි, සුණුවිසුණු වේ.

1. "සොරු ද රජදරුවෝ ද (භොගයන්) පැහැරගනිති. ගින්න දවයි. උදකාදියෙන් නැසෙයි. යළි (ශෙෂ වූ) භොගයන් සහිත ශරීරය මරණය සමග හැරපියයි.

2. පණ්ඩිතපුරුෂ තෙමේ මෙල භෝගයන්ගේ විනාශය දැන වළඳනුයේ ද දෙනුයේ ද වෙයි. සම්පත් වූ ලෙසින් දී වළඳා අනින්දිත වූයේ දෙව්ලොවට පැමිණේ."

**තෙ කාමා පරිහායන්ති සල්ලවිද්ධොව රුප්පති** – යම් සේ ලොහොමුවා හීයෙකින් හෝ ඇටමුවා හීයෙකින් හෝ දලමුවා හීයෙකින් හෝ සිඟුමුවා හීයෙකින් හෝ දඬුමුවා හීයෙකින් හෝ විදුනා ලදුයේ විසිරේ ද (=විකාරයට පැමිණේ ද), සැලේ ද (=කිපේ ද), ගැටේ ද, පෙළේ ද, පෙළන ලදුයේ හටගත් දොම්නස් ඇතියේ වේ ද, එසෙයින් ම වස්තුකාමයන්ගේ විපරිණාමයෙන් වූ අන්‍යථාභාවයෙන් සෝකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසයෝ උපදිත්. හෙතෙම කාමශල්‍යයෙන් ද ශෝකශල්‍යයෙන් ද විදුනා ලදුයේ විසිරෙයි, සැලෙයි, ගැටෙයි, පෙළෙයි. පෙළන ලදුයේ හටගත් දොම්නස් ඇතියේ වේ නු යි "සල්ලවිද්ධොව රුප්පති" යනු වේ. එයින් වදාළහ බුදුහු:

**"තස්ස චෙ කාමයානස්ස -පෙ- සල්ලවිද්ධොව රුප්පති" යි.**

## 1 – 8.

"යමෙක් වස්තුකාමකෙල්ශකාමයන් (එහි ඡන්දරාගය විෂ්කම්භණයෙන් හෝ සමුච්ඡේදයෙන් හෝ) තමාගේ පයින් සර්පයකුගේ හිස මෙන් දුරු කෙරේ ද, ඒ මහණ ලොව්හි විසත්තිකා සඞ්ඛ්‍යාත වූ මේ තෘෂ්ණාව සමෘතිමත් වැ ඉක්මවයි."

**යො කාමෙ පරිවජ්ජෙති** – **යො** – යම් කිසි, යම් බඳු වූ, යමෙකින් යුක්ත වූ, යම්සේ සිටි, යම් ප්‍රකාර වූ, යම් තනතුරකට පැමිණි, යම් ධර්මයෙකින් යුක්ත වූ ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යි. **කාමෙ පරිවජ්ජෙති**– කාමයෝ නම්: විස්තර විසින් කාමයෝ දෙදෙනෙක් වෙති: වස්තුකාමයෝ ද, කෙලශකාමයෝ ද යි... මොහු වස්තුකාමයෝ යැ යි කියනු ලැබෙත්... මොහු කෙලශකාමයෝ යැ යි කියනු ලැබෙත්.

**කාමෙ පරිවජ්ජෙති** – දෙකරුණෙකින් කාමයන් දුරු කෙරෙයි: විෂ්කම්භණ විසින් හෝ සමුච්ඡේද විසින් හෝ යැ. කෙසේ විෂ්කම්භණ විසින් කාමයන් පරිවර්ජන කෙරේ ද ? යත්: 'අල්පාස්වාද වන බැවින් කාමයෝ ඇටසැකිල්ලක් වැන්නැ' යි නුවණැසින් දක්නේ විෂ්කම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි; බහුසාධාරණ වන බැවින් 'කාමයෝ මාංසපෙශි වැන්නහ'යි නුවණැසින් දක්නේ විෂ්කම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි; 'දහනකෘත්‍යසම්පාදක වන (=හස්තාදිය දවන) බැවින් කාමයෝ තෘණෝල්කා (=තණහුලක්) වැන්නහ'යි නුවණින් දක්නේ විෂ්කම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි.

“සුපිනකූපමා කාමා ඉත්තරපච්චුපට්ඨානට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. “යාචිතකූපමා කාමා තාවකාලිකට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. “රුක්ඛඵලූපමා කාමා සම්භඤ්ජනපරිභඤ්ජන[1]ට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. “අසිසූනූපමා කාමා අධිකුට්ටන[2]ට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. “සත්තිසූලූපමා[3] කාමා විනිවිජ්ඣනට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. “සප්පසිරූපමා කාමා සප්පටිභයට්ඨෙනා”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. “අග්ගික්ඛන්ධූපමා කාමා මහාභි[4]තාපකරට්ඨෙනා[5]”ති පස්සන්තො වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති.

බුද්ධානුස්සතිං භාවෙන්තොපි වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. ධම්මානුස්සතිං භාවෙන්තොපි -පෙ- සඞ්ඝානුස්සතිං භාවෙන්තොපි, සීලානුස්සතිං භාවෙන්තොපි, දෙවතානුස්සතිං භාවෙන්තොපි, ආනාපානසතිං[6] භාවෙන්තොපි, මරණසතිං භාවෙන්තොපි, කායගතාසතිං භාවෙන්තොපි, උපසමානුස්සතිං භාවෙන්තොපි වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. පඨමජ්ඣානං භාවෙන්තොපි වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. දුතියජ්ඣානං භාවෙන්තොපි, තතියජ්ඣානං භාවෙන්තොපි, චතුත්ථජ්ඣානං භාවෙන්තොපි, ආකාසානඤ්චායතනසමාපත්තිං භාවෙන්තොපි, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං භාවෙන්තොපි, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං භාවෙන්තොපි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං භාවෙන්තොපි වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති. එවං වික්ඛම්භණතො කාමෙ පරිවජ්ජෙති.

කථං සමුච්ඡෙදතො කාමෙ පරිවජ්ජෙති? සොතාපත්තිමග්ගං භාවෙන්තොපි අපායගමනීයෙ කාමෙ සමුච්ඡෙදතො පරිවජ්ජෙති. සකදාගාමිමග්ගං භාවෙන්තොපි ඔළාරිකෙ කාමෙ සමුච්ඡෙදතො පරිවජ්ජෙති. අනාගාමිමග්ගං භාවෙන්තොපි අණුසහගතෙ කාමෙ සමුච්ඡෙදතො පරිවජ්ජෙති. අරහත්තමග්ගං භාවෙන්තොපි සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං[7] සමුච්ඡෙදතො කාමෙ පරිවජ්ජෙති.

**යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරොති** – සප්පො වුච්චති අහි. කෙනට්ඨෙන සප්පො? සංසප්පන්තො ගච්ඡතීති – සප්පො; භුජන්තො[8] ගච්ඡතීති භුජගො, උරෙන ගච්ඡතීති උරගො, පන්නසිරො ගච්ඡතීති පන්නගො; සිරෙන සුපතීති සිරිංසපො[9]; බිලෙ සයතීති බිලාසයො; ගුහායං සයතීති ගුහාසයො; දාඨා තස්ස ආවුධොති දාඨාවුධො; විසං තස්ස ඝොරන්ති ඝොරවිසො; ජිව්හා තස්ස දුවිධාති ද්විජිව්හො; ද්වීහි ජිව්හාහි රසං සායතීති ද්විරසඤ්ඤූ; යථා පුරිසො ජීවිතුකාමො අමරිතුකාමො සුඛකාමො දුක්ඛපටිකූලො පාදෙන සප්පසිරං විවජ්ජෙය්‍ය පරිවජ්ජෙය්‍ය අභිනිවජ්ජෙය්‍ය, එවමෙව සුඛකාමො දුක්ඛපටිකූලො කාමෙ වජ්ජෙය්‍ය විවජ්ජෙය්‍ය පරිවජ්ජෙය්‍ය අභිනිවජ්ජෙය්‍යාති – **සප්පස්සෙව පදා සිරො**.

---

1. සම්භජ්ජනපරිභජ්ජන - ස. සම්මජ්ජනපරිමජ්ජන - සී II.
2. අධිකන්තන - සං.
3. සත්තිසිලූපමා - කත්ථචි.
4. මහග්ගි - සං.
5. මහාභිතාපනට්ඨෙන - මජසං. මහාභිතාපණට්ඨෙන - ස.
6. ආනාපානුස්සතිං - සං.
7. අසෙසනිස්සෙසං - ස.
8. භුජන්තො. - සීමු 1.
9. සුපපතීති සරීසපො - මජසං.

'මහාපරිදාහකර වන බැවින් කාමයෝ අඞ්ගාරකර්ෂූ (=අඟුරුවළ) වැන්නහ'යි නුවණින් දක්නේ විෂකම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. 'ඉත්වර වැ (=නො පැමිණ හෝ අල්ප වැ එළඹ) සිටි වන බැවින් කාමයෝ සවප්නයක් වැන්නහ' යි නුවණින් දක්නේ විෂකම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. 'තාවත්කාලික වන බැවින් කාම පිරුළුයෙන් අල දෑයක් වැන්නැ'යි දක්නේ විෂකම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි. 'සම්භඤ්ජනපරිභඤ්ජනකර වන බැවින් කාම වෘක්ෂඵල වැන්නැ'යි නුවණින් දක්නේ විෂකම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. 'අධිකුට්ටනා*ර්ථයෙන් (=සිඳුනා බැවින්) කාම අසිසූනා (=කඩුව හා මස්ලොඹුව) වැන්නැ' යි දක්නේ විෂකම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි. 'විනිවිදුනා බැවින් කාමයෝ සැත්හුලක් වැන්නහ' යි දක්නේ විෂකම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි 'සප්‍රතිභයාර්ථයෙන් කාමයෝ සර්පශීර්ෂ වැන්නහ'යි දක්නේ විෂකම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. 'මහාභිතාපකර වීන බැවින් කාමයෝ වහ්නිස්කන්ධ වැන්නහ'යි නුවණැසින් දක්නේ කාමයන් පරිවර්ජන කෙරේ.

බුද්ධානුස්මෘතිය වඩනුයේ ද විෂකම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. ධර්මානුස්මෘතිය වඩනුයේ ද... සඞ්ඝානුස්මෘතිය වඩනුයේ ද... ශීලානුස්මෘතිය වඩනුයේ ද... ත්‍යාගානුස්මෘතිය වඩනුයේ ද... දෙවතා-නුස්මෘතිය වඩනුයේ ද... ආනාපානස්මෘතිය වඩනුයේ ද... මරණානුස්මෘතිය වඩනුයේ ද... කායගතානුස්මෘතිය වඩනුයේ ද... උපශමානුස්මෘතිය වඩනුයේ ද විෂකම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි; ප්‍රථමධ්‍යානය වඩනුයේ ද විෂකම්භණ හෙයින් කාමයන් දුරු කෙරෙයි. ද්විතීයධ්‍යානය වඩනුයේ ද... තෘතීයධ්‍යානය වඩනුයේ ද... චතුර්ථධ්‍යානය වඩනුයේ ද... ආකාසානඤ්චායතනසමාපත්තිය වඩනුයේ ද... විඤ්ඤාණඤ්චායතනසමා-පත්තිය වඩනුයේ ද... ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය වඩනුයේ ද... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය වඩනුයේ ද විෂකම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරෙයි. මෙසේ විෂකම්භණ හෙයින් කාමයන් පරිවර්ජන කෙරේ.

කෙසේ සමුච්ඡේද වශයෙන් කාමයන් පරිවර්ජන කෙරෙයි ? යත්: ස්‍රොතා-පත්තිමාර්ගය වඩනුයේ ද අපායගමනීය වූ කාමයන් සමුච්ඡේද හෙයින් පරිවර්ජන කෙරෙයි: සකෘදාගාමිමාර්ගය වඩනුයේ ද ඖදාරික වූ කාමයන් සමුච්ඡේද හෙයින් දුරු කෙරෙයි; අනාගාමිමාර්ගය වඩනුයේ ද අණුසහගත වූ කාමයන් සමුච්ඡේද හෙයින් දුරු කෙරෙයි, අර්හත්වමාර්ගය වඩනුයේ ද සියල්ලෙන් සියල්ල සර්වප්‍රකාරයෙන් සියල්ල අශෙෂ කොට නිරවශෙෂ කොට සමුච්ඡේදවශයෙන් කාමයන් පරිවර්ජන කෙරෙයි. මෙසෙයින් සමුච්ඡේද හෙයින් කාමයන් දුරු කෙරේ.

**යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො** - 'සප්ප' යි නාගයා කියනු ලැබෙයි. කවර හෙයෙකින් සර්ප නම් වී ද ? යත්: සංසර්පණ කෙරෙමින් යේ නු සි සර්ප යැ, වක්‍රවක්‍ර වැ යේ නු සි භුජග යැ; උරයෙන් ( ළෙන්) යේ නුසි උරග යැ; නැමූ ශීර්ෂ ඇති වැ යේ නු සි;= පන්නග යැ; සිරසින් හොවී නු සි සිරිංසප යැ; බිලයෙහි හොවී නු සි;= බිලාශය යැ; ගුහායෙහි හොවී නු සි; ගුහාශය යැ; දංෂ්ට්‍රා ඔහුට ආයුධ නු සි දංෂ්ට්‍රායුධ යැ; විෂ ඔහුගේ ඝොර නු සි ඝොරවිෂ යැ; ජිහ්වා ඔහුගේ ද්විවිධ නු සි ද්විජිහ්ව යැ, දෙදිවින් රස විඳිනු සි ද්විරසඥ යැ. යම් සේ ජීවත් වනු කැමැති නො මැරෙනු කැමැති සුව කැමැති දුඃඛප්‍රතිකූල වූ පුරුෂයෙක් පයින් සර්පශීර්ෂය හරනේ ද, වෙසෙසින් හරනේ ද, හාත්පසින් හරනේ ද, දුරින් දුරු කෙරේ ද, එසෙයින් ම සුව කැමැති වූයේ දුඃඛප්‍රතිකූල වූයේ කාමයන් හරනේ යැ, වෙසෙසින් හරනේ යැ, හාත්පසින් හරනේ යැ, දුරින් දුරු කෙරේ නු සි **සප්පස්සෙව පදා සිරො** යනු වේ.

* අතිකුට්ටනා - ධම්මප්‍රදීපිකා

**සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතීති** – "සො" ති යො කාමෙ පරිවජ්ජෙති; විසත්තිකා වුච්චති තණ්හා – යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දි නන්දිරාගො, චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං, ගෙධො පලිගෙධො[1] සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා සඤ්ජනිකා සඤ්ජනනී සිබ්බනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසතා ආයූහනී දුතියා පණිධි භවනෙත්ති වනං[2] වනථො සන්ථවො සෙනෙහො අපෙක්ඛා පටිබන්ධු[3] ආසා ආසිංසනා ආසිංසිතත්තං, රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා[4] පුත්තාසා ජීවිතාසා, ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං, ලොලුප්පං[5] ලොලුප්පායනා ලොලුප්පායිතත්තං, පුච්ඡඤ්ජිකතා[6] සාදු[7]කම්‍යතා, අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සම්පත්ථනා, කාමතණ්හා භවතණ්හා විභවතණ්හා, රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා, රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා, ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබළිසං මාරවිසයො, තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො, අභිජ්ඣා ලොභො අකුසලමූලං.

**විසත්තිකාති** – කෙනට්ඨෙන විසත්තිකා? විසතාති විසත්තිකා; විසාලාති විසත්තිකා; විසටාති විසත්තිකා; විසක්කතීති විසත්තිකා; විසං හරතීති විසත්තිකා; විසංවාදිකා[8] ති විසත්තිකා; විසමූලාති විසත්තිකා; විසඵලාති විසත්තිකා; විසපරිභොගාති විසත්තිකා. විසාලා වා පන සා තණ්හා[9] රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ, කුලෙ ගණෙ ආවාසෙ ලාභෙ යසෙ පසංසායං සුඛෙ, චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ, කාමධාතුයා රූපධාතුයා අරූපධාතුයා, කාමභවෙ රූපභවෙ අරූපභවෙ සඤ්ඤාභවෙ අසඤ්ඤාභවෙ නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ එකවොකාරභවෙ චතුවොකාරභවෙ පඤ්චවොකාරභවෙ, අතීතෙ අනාගතෙ පච්චුප්පන්නෙ, දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු විසතා විත්ථතාති විසත්තිකා.

**ලොකෙති** – අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ.

---

1. රොධො පලිරොධො - කථවි. 2. වාතං - සීමු. 1. මජසං.
3. පටිබන්ධො - සා. PTS. 4. ජනාසා - මජසං. 5. ලොලුප්පා - සා.
6. පුච්ජකතා. - සීමු. I. මුච්ජඤ්ජිකතා - සා. PTS. 7. සාධු - ස; මජසං. PTS.
8. විසංවාදිතා - සීමු. I 9. තණ්හා'ති සාමපොත්ථකෙ න දිස්සතෙ.

**සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතී** – 'සො' යනු: යමෙක් කාමයන් පරිවර්ජන කෙරේ නම් හේ ය. 'විසත්තිකා' යි තෘෂ්ණා කියැවෙයි. යම් රාගයෙක් සංරාගයෙක් (පුනපුනා පමුණුවන හෙයින්) අනුනයයෙක් අනුරෝධයෙක් නන්දියෙක් නන්දිරාගයෙක්, චිත්තයාගේ සංරාගයෙක් (අරමුණු කැමැති වන) ඊජ්සායෙක් (බොල් කෙලෙස් බැමින් මුසපත් කරන) මූර්ඡායෙක් අධ්‍යවසානයෙක්, ගෙධයෙක් පරිගෙධයෙක් (අරමුණෙහි ලැගෙන හෙයින්) සඞ්ගයෙක් (ගැලෙන හෙයින්) පඞ්කයෙක් (ඒ ඒ භවයට ආකර්ෂණ කරන) එජාවෙක් (රවටන හෙයින්) මායාවෙක් (සසරවට උපදවන හෙයින්) ජනිකායෙක් (දුක හා සංයොග කරමින් උපදවන හෙයින්) සංජනනියෙක් (=ච්‍යුති ප්‍රතිසන්ධි විසින් භවයෙහි) මැසීමෙක් ජාලිනියෙක් (සරිත් සදෘශ ව ආකර්ෂණ කරන හෙයින්) නදියෙක් වෙසෙසින් ඇලීමෙක් (බඳනා හෙයින්) හුයෙක් (විස්තෘත වන හෙයින්) විසතායෙක් ආයූහනියෙක් (සහාය වන හෙයින්) ද්විතීයායෙක් ප්‍රණිධියෙක් භවනෙත්තියෙක් (සමුත්ථාපන – ගහන හෙයින්) වනයෙක් (බලවද්භාවයෙන්) වනථයෙක් සන්ථවයෙක් ස්නෙහයෙක් අපෙක්ෂායෙක් ප්‍රතිබන්ධුයෙක් ආශායෙක් ආශංසායෙක් ආශංසිත බවෙක්, රූපයෙහි ආශායෙක් ශබ්දාශායෙක් ගන්ධාශායෙක් රසාශායෙක් ස්පර්ශාශායෙක් ධනාශායෙක් පුත්‍රාශායෙක් ජීවිතාශායෙක්, (ජල්පන කරන හෙයින්) ජල්පායෙක් ප්‍රජල්පායෙක් අභිජල්පායෙක් ජල්පනයෙක් ජල්පිතබවෙක් ලොලුප බවෙක් ලොලුපාකාරයෙක් ලොලුපායිත බවෙක්, නඟුට සලන බවෙක් මධුර අරමුණු කැමැති වන බවෙක්, අධර්මරාගයෙක් විෂමලොභයෙක් නිකාන්තියෙක් නිකාමනයෙක් ප්‍රාර්ථනායෙක් පිහායෙක් සම්ප්‍රාර්ථනායෙක්, කාමතෘෂ්ණායෙක් භවතෘෂ්ණායෙක් විභවතෘෂ්ණායෙක්, රූපතෘෂ්ණායෙක් අරූපතෘෂ්ණායෙක් නිරොධතෘෂ්ණායෙක්, ශබ්දතෘෂ්ණායෙක් ගන්ධතෘෂ්ණායෙක් රසතෘෂ්ණායෙක් ස්පර්ශතෘෂ්ණායෙක් ධර්මතෘෂ්ණායෙක්, ඔඝයෙක් යොගයෙක් ග්‍රන්ථයෙක් උපාදානයෙක් ආවරණයෙක් නීවරණයෙක් (කුසල් දහම් වසන හෙයින්) ඡදනයෙක් බන්ධනයෙක් උපක්ලෙශයෙක් අනුශයයෙක් (උපදනා කුසලචාරය ගත්තා) පරියුත්ථානයෙක් (පරිවෙෂ්ටන කරන හෙයින්) ලතායෙක් (විවිධ වස්තු කැමැති වන හෙයින්) විවිධ විජ්සායෙක් දුඃඛමූලයෙක් දුඃඛනිදානයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබඩිශයෙක් මාරවිෂයයෙක්, තෘෂ්ණානදියෙක් තෘෂ්ණාසඞ්ඛ්‍යාත ජාලයෙක් තෘෂ්ණා සඞ්ඛ්‍යාත ගර්දුල (=ශුනකබන්ධන) යෙක් තෘෂ්ණාසමුද්‍රයෙක්, අභිධ්‍යායෙක් ලොභ අකුශලමූලයෙක් වේ නම් එය යි.

**විසත්තිකා** – කවරහෙයෙකින් (තෘෂ්ණා තොමෝ) විසත්තිකා නම් වූ ද? යත්: විසෘත වන හෙයින් විසත්තිකා යැ; විශාල වන හෙයින් විසත්තිකා යැ; විසෘෂ්ට වන හෙයින් විසත්තිකා යැ; විශෙෂයෙන් සහ්‍ය (=සහනය කළ හැකි) වන හෙයින් විසත්තිකා යැ; වෙසෙසින් සිත හකුළුවන හෙයින් හෝ දුඃඛවිෂය එළවන හෙයින් විසත්තිකා යැ; (අනිත්‍යාදිය) විසංවාදන කරන හෙයින් විසත්තිකා යැ; විෂමූල හෙයින් විසත්තිකා යැ; විෂඵල හෙයින් විසත්තිකා යැ; විෂපරිභොග හෙයින් = විසත්තිකා යැ. යළි විශාල වූ ඒ තෘෂ්ණා තොමෝ රූපයෙහි ශබ්දයෙහි ගන්ධයෙහි රසයෙහි ස්පර්ශයෙහි, කුලයා කෙරෙහි ගණයා කෙරෙහි ආවාසයෙහි ලාභයෙහි යශස්හි ප්‍රශංසායෙහි සුඛයෙහි, චීවරයෙහි පිණ්ඩපාතයෙහි ශයනාසනයෙහි ග්ලානප්‍රත්‍යයයෙහි, කාමධාතුයෙහි රූපධාතුයෙහි අරූපධාතුයෙහි, කාමභවයෙහි රූපභවයෙහි අරූපභවයෙහි සංඥාභවයෙහි අසංඥාභවයෙහි නෛවසංඥානාසංඥාභවයෙහි එකස්කන්ධභවයෙහි චතුඃස්කන්ධභවයෙහි පඤ්චස්කන්ධභවයෙහි, අතීතකාලයෙහි අනාගතකාලයෙහි ප්‍රත්‍යුත්පන්නකාලයෙහි, දෘෂ්ටශ්‍රැතමුතවිඥාතව්‍යධර්මයන්හි විසෘත විස්තෘත වූ යි 'විසත්තිකා' නමු.

**ලොකෙ** – අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි යැ.

**සතොති** - චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; වෙදනාසු-චිත්ත-ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො. අපරෙහිපි චතූහි කාරණෙහි සතො: අසති පරිවජ්ජනාය සතො; සතිකරණීයානඤ්ච ධම්මානං කතත්තා සතො; සතිපටිපක්ඛානං[1] ධම්මානං හතත්තා සතො; සතිනිමිත්තානං ධම්මානං අසම්මුට්ඨත්තා[2] සතො. *[3]අපරෙහිපි චතූහි කාරණෙහි සතො: සතියා සමන්නාගතත්තා සතො; සතියා වසිතත්තා සතො; සතියා පාගුඤ්ඤතාය සතො; සතියා අපච්චොරොපනතාය[4] සතො.* අපරෙහිපි චතූහි කාරණෙහි සතො: සත්තත්තා සතො; සන්තත්තා සතො; සමිතත්තා සතො; සන්තධම්මසමන්නාගතත්තා සතො. බුද්ධානුස්සතියා සතො; ධම්මානුස්සතියා සතො; සඞ්ඝානුස්සතියා සතො; සීලානුස්සතියා සතො; චාගානුස්සතියා සතො; දෙවතානුස්සතියා සතො; ආනාපානසතියා සතො; මරණානුස්සතියා සතො; කායගතාසතියා සතො; උපසමානුස්සතියා සතොති. යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා[5] අසම්මුස්සනතා[6] සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො, අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො හොති සමුපෙතො උපගතො[7] සමුපගතො උපපන්නො සමුපපන්නො[8] සමන්නාගතො. සො වුච්චති සතො.

**සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතීති** - ලොකෙ වෙසා[9] විසත්තිකා; ලොකෙ වෙතං[10] විසත්තිකං සතො තරති උත්තරති පතරති සමතික්කමති වීති[11]වත්තතීති 'සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති'.

තෙනාහ භගවා:

"යො කාමෙ පරිවජ්ජෙති සප්පස්සෙව පදා සිරො,
සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තතී" ති.

**1 - 4**

"ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා ගවාස්සං දාසපොරිසං,
ථියො බන්ධූ පුථූ කාමෙ යො නරො අනුගිජ්ඣති".

---

1. පරිපන්ථානං - සීමු. I. පරිබන්ධානං - මජසං. 2. අපම්මුට්ඨත්තා - ස. සී. II. PTS.
*3. පුප්ඵලක්ඛණන්තරිතො භාගො සාම පොත්ථකෙ න දිස්සතෙ.
4. අපච්චොරොහනතාය - ස. 5. පිලාපනතා - මජසං.
6. අපම්මුස්සනතා - සීමු. II. සං. 7. උපාගතො - සීමු. II. PTS.
8. සම්පන්නො - සීමු. II 9. ලොකෙ - සසා. PTS. සා ලොකෙ වා සා. - මජසං. සීමු. II
10. යා ලොකෙ - සසා. ලොකෙ වා සා. මජසං. සීමු. II. 11. පීති - සීමු. II.

**සතො** – සතර කරුණෙකින් සමෘති ඇතියේ: රූපකායයෙහි කායානුදර්ශීතාසමෘතිප්‍රස්ථානය (=කය අනිත්‍යාදි විසින් පුනපුනා දක්නා සිවටත්) වඩනුයේ සමෘති ඇතියේ යෑ. වෙදනායෙහි – චිත්තයෙහි – ධර්මයන්හි ධර්මානුදර්ශීතාසමෘතිප්‍රස්ථානය වඩනුයේ සමෘති ඇතියේ යි. අනෙකුදු සතර කරුණෙකින් සමෘති ඇතියේ: මුෂිතසමෘතිය දුර ලීමෙන් සමෘති ඇතියේ, සමෘතියෙන් කර්තව්‍ය වූ ධර්මයන් (=සතර මාර්ගයන්) වඩන ලද හෙයින් සමෘති ඇතියේ, (කාමච්ඡන්දාදි) සමෘතිප්‍රතිපක්ෂධර්මයන් නැසූ හෙයින් සමෘති ඇතියේ, සමෘතිනිමිත්ත වූ (කායාදි) ධර්මයන් නො නට හෙයින් සමෘතිමත් වූයේ යෑ. අන්‍ය වූ ද සතර කරුණෙකින් සමෘති ඇතියේ: සමෘතියෙන් සමන්විත වන හෙයින් සමෘතිමත් වූයේ, සමෘතිවශීභාවයට පැමිණි හෙයින් සමෘතිමත් වූයේ, සමෘතියෙහි ප්‍රගුණ බැවින් සමෘතිමත් වූයේ, සමෘතියෙන් අපරිවර්තිත වන (=නො පසුබස්නා) බැවින් සමෘතිමත් වූයේ. අන්‍ය වූ ද සතර කරුණෙකින් සමෘතිමත් වූයේ: සත්ත්ව (=ස්වභාවයෙන් විද්‍යමාන) වන බැවින් සමෘතිමත් වූයේ, ශාන්ත (=නිවුණ වන) බැවින් සමෘතිමත් වූයේ, කෙලෙස් සන්හිඳුවන ලද බැවින් සමෘතිමත් වූයේ, සත්පුරුෂධර්මයන්ගෙන් සමන්විත වන බැවින් සමෘතිමත් වූයේ. බුද්ධානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, ධර්මානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, සඞ්ඝානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, ශීලානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, ත්‍යාගානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, දෙවතානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, ආනාපානසමෘතියෙන් සමෘතිමත් වූයේ, මරණානුසමෘතියෙන් සමෘතිමත් වූයේ, කායගතසමෘතියෙන් සමෘතිමත් වූයේ, උපශමානුසමෘතියෙන් සමෘතිමත් වූයේ යි. යම් සිහියෙක් නැවත නැවත සිහි කිරීමෙක් අභිමුඛ ව මෙන් සිහි කිරීමෙක් සිහියක් සිහි කරන අයුරක් (ශ්‍රැතය) ධරන බවෙක් (අරමුණෙහි) බැසගන්නා බවෙක් (චිරකෘත භාෂිතයන්) ප්‍රමොෂ (=විසමෘත) නොවන බවෙක් සමෘතියෙක් සමෘතීන්ද්‍රියයෙක් සමෘතිබලයෙක් සම්‍යක්සමෘතියෙක් සමෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායනමාර්ගයෙක් වේ ද, මෝ සමෘති නමැයි කියනු ලැබේ. මේ සමෘතියෙන් උපෙත වූයේ සමුපෙත වූයේ උපගත වූයේ සමුපගත වූයේ නොවෙන් වූයේ පරිපූර්ණ වූයේ සමන්වාගත වූයේ වෙයි. හේ **සමෘතිමත්** වූයේ ය යි කියනු ලැබේ.

**සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති** – මේ විසත්තිකා තොමෝ ස්කන්ධලොකයෙහි මැ වෙයි. ස්කන්ධලොකයෙහි මැ පවත්නා වූ මේ විසත්තිකා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව සමෘතිමත් වූයේ (කාමයන් දුරු කෙරෙමින්) තරණය කෙරෙයි. (කෙලශයන් දුරු කෙරෙමින්) උත්තරණය කෙරෙයි. (ඔවුන්ගේ ප්‍රතිෂ්ඨාහෙතුව සිඳිමින්) ප්‍රතරණය කෙරෙයි. (සසර ඉක්මවමින්) සමතික්‍රමණය කෙරෙයි, (ප්‍රතිසන්ධියට අභව්‍යොත්පත්තික කෙරෙමින්) ඉක්මවා නු යි "සො'මං විසත්තිකං ලොකෙ සතො සමතිවත්තති" යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යො කාමෙ පරිවජ්ජෙති** -පෙ- **සතො සමතිවත්තති"** යි.

## 1-4.

"යම් මිනිසෙක් හැල් ආදි කෙත් හෝ ගෙවතු ආදි වතු හෝ අමුරන් හෝ ගවයන් අසුන් හෝ දසුන් කම්කරු පුරුෂයන් හෝ නෑයන් හෝ අන් බොහෝ කාමයනු දු පුනපුනා ප්‍රාර්ථනා කෙරේ නම්"

**ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා** ති – 'ඛෙත්ත'න්ති සාලික්ඛෙත්තං වීහික්ඛෙත්තං මුග්ගක්ඛෙත්තං මාසක්ඛෙත්තං යවක්ඛෙත්තං ගොධුමක්ඛෙත්තං තිලක්ඛෙත්තං; **වත්ථුන්ති**[1] – ඝරවත්ථුං කොට්ඨකවත්ථුං පුරෙවත්ථුං පච්ඡාවත්ථුං ආරාමවත්ථුං විහාරවත්ථුං; **හිරඤ්ඤන්ති** – හිරඤ්ඤං වුච්චති කහාපණොති 'ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා.'

**ගවාස්සං දාසපොරිසන්ති** – 'ගවා'ති ගාවො* වුච්චන්ති. **අස්සාති** පසුකාදයො වුච්චන්ති. **දාසාති** – චත්තාරො දාසා: අන්තොජාතකො දාසො, ධනක්කීතකො දාසො, සාමං වා දාසව්‍යං උපෙති, අකාමකො වා දාසව්‍යං[2] උපෙති.

1. "ආමාය[3] දාසා'පි භවන්ති හෙකෙ
ධනෙන කීතාපි භවන්ති දාසා,
සාමං ච එකෙ උපයන්ති දාසං[4]
භයා පණුන්නාපි භවන්ති දාසා" ති.

**පුරිසාති** – තයො පුරිසා: භතකා කම්මකරා උපජීවිනොති 'ගවාස්සං දාසපොරිසං.'

**ථියො බන්ධූ පුථුකාමෙ'ති** – 'ථියො ති ඉත්ථිපරිග්ගහො වුච්චති. **බන්ධූති** – චත්තාරො බන්ධූ: ඤාතිබන්ධවාපි බන්ධු, ගොත්තබන්ධවාපි බන්ධු, මන්තබන්ධවාපි බන්ධු, සිප්පබන්ධවාපි බන්ධු. **පුථූ කාමෙති** – බහූ කාමෙ; එතෙ පුථූකාමා: මනාපිකා රූපා -පෙ- මනාපිකා ඵොට්ඨබ්බාති 'ථියො බන්ධූ පුථූ කාමෙ.'

**යො නරො අනුගිජ්ඣතීති** – 'යො'ති යො යාදිසො යථායුත්තො[5] යථාවිහිතො යථාපකාරො යං[6] ඨානං පත්තො යංධම්ම[7]සමන්නාගතො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා. **නරොති** – සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[8] ජන්තු ඉන්දගු[9] මනුජො; **අනුගිජ්ඣතීති** – කිලෙසකාමෙන වත්ථුකාමෙසු ගිජ්ඣති අනුගිජ්ඣති පලිගිජ්ඣතීති 'යො නරො අනුගිජ්ඣති.'

තෙනාහ භගවා:

"ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා ගවාස්සං දාසපොරිසං,
ථියො බන්ධූ පුථූ කාමෙ යො නරො අනුගිජ්ඣති" ති.

## 1 – 5.

"අබලා නං බලීයන්ති මද්දන්තෙ නං පරිස්සයා,
තතො නං දුක්ඛමන්වෙති නාවං භින්නමිවොදකං".

---

1. "වත්ථු'න්ති සෘා- PTS. 2. දාසවියං - මජසං. සිමු. I. සි. II PTS.
3. ආමාස - සිමු. I. 4. දාසං - සි. I සිමු. I. සෘා. PTS. 5. යථාවුත්තො - සිමු. I.
6. යථා - සිමු. I. 7. ධම්මෙ - සිමු. I. ස. 8. ජතු - සිමු. I. ජාතු - සෘා.
9. ඉන්දගු. - සිමු. I * 'ගවන්ති ගවා' - සබ්බත්ථ.

**ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා** – 'ඛෙත්ත' නම්: හැල්කෙත යැ, වීකෙත යැ, මුංකෙත යැ, මෑකෙත යැ, යවකෙත යැ, තිරිඟුකෙත යැ, තලකෙත යි.

**වත්ථු** නම්: ගෙවතු යැ, කොටුවතු යැ, ගේ පෙරවූයෙහි වතු යැ, අරම්වතු යැ, වෙහෙරවතු යි. **හිරඤ්ඤ** නම්: කහවුණු හිරණ්‍ය යැ යි කියනු ලැබේ නු යි (මෙසේ) "ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා" යනු වේ.

**ගවාස්සං දාසපොරිසං** – 'ගවා' යි ගවයෝ (=ගෙරිහු) කියනු ලැබෙත්. **අස්සා** යි එළු ආදී සිවුපාහු කියනු ලැබෙත්. **දාසා** යනු: දාසයෝ සතර දෙනෙකි: (ඇතුළුගෙයි දාසියගේ කුසෙහි උපන්) අන්තර්දාසයා යැ, ධන-යෙන් විකොට ගත් දාසයා යැ, තෙමේ මැ හෝ දස්බවට පැමිණියේ යැ, කරමරාහිත (=බැඳ ලා ගැනීමෙන්) නො කැමැත්තෙන් දාසබවට පැමිණියේ යි.

1. "ඇතැම් කෙනෙක් ඇතුළත්හි උපන් දාසයෝ වෙත් මැ ය. ධනයෙන් විකිණිනත් දාසයෝ ද වෙති. තව ද ඇතැම් කෙනෙක් තුමූ ම දාසබවට පැමිණෙති. බියෙන් මඩනා ලද්දාහු ද දාසයෝ වෙත්."

**පුරිසා** යනු: පුරුෂයෝ තිදෙනෙකි: බැලයෝ යැ, කම්කරුවෝ යැ, ඇසුරු කොට ජීවත් වන්නාහු යැ යි "ගවාස්සං දාසපොරිසං" යනු වේ.

**පියො බන්ධු පුථු කාමෙ** – 'පියො' යි ස්ත්‍රීපරිග්‍රහය කියනු ලැබෙයි. **බන්ධු** යනු: සතර බන්ධු කෙනෙකි: මවුපිය දෙපස ඥාති වූ බාන්ධවයෝ ද බන්ධුහු යැ. සමානගොත්‍ර ඇති බාන්ධවයෝ ද බන්ධුහු යැ. (එක් ඇදුරුකුලයෙහි උගත් මන්ත්‍ර ඇති) මන්ත්‍රබාන්ධවයෝ ද බන්ධුහු යැ. (එක් වැ උගත් ශිල්ප ඇති) ශිල්පබාන්ධවයෝ ද බන්ධුහු යි. **පුථු කාමෙ** යනු: බොහෝ කාමයන්; බොහු යැ පුථුකාමයෝ: මන වඩන රූපයෝ යැ . . . මන වඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යි "පියො බන්ධු පුථු කාමෙ" යනු වේ.

**යො නරො අනුගිජ්ඣති** - 'යො' යනු: යමෙක් යම්බඳු වූයෙක්, (නවකම් ආදී) යමෙකින් යුක්ත වූයෙක්, යම්සේ සිටියෙක්, යම් ප්‍රකාර වූයෙක්, යම් තනතුරකට පැමිණියෙක්, යම් ධර්මයෙකින් යුක්ත වූයෙක්, ක්‍ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශුද්‍රයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ යැ. **නරො** යනු: සත්ත්වයෙක්, නරයෙක්, මානවයෙක්, පුරුෂයෙක්, පුද්ගලයෙක්, ජීවයෙක්, ජාතියට පැමිණෙනුයෙක්, ජන්තුයෙක්, කර්මයෙන් යනුයෙක්, මනුජයෙක් යැ. **අනුගිජ්ඣති**- ක්ලෙශකාමයෙන් වස්තුකාමයන්හි ගිජු වෙයි, පුනපුනා පතයි, හාත්පසින් ගිජු වේ නු යි "යො නරො අනුගිජ්ඣති" යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා -පෙ- යො නරො අනුගිජ්ඣති"** යි.

**1 – 5.**

"අබල වූ කෙලෙස්හු ඒ මිනිසා මැඩ ගනිති. යළි ප්‍රකට අප්‍රකට උපද්‍රවයෝ ඒ කාමගිද්ධයා මඩිති. එහෙයින් සිදුරු වූ නැවකට ජලය වදනා සෙයින් ජාත්‍යාදි දුක ඔහු අනුව යේ"

**අබලා නං බලීයන්තීති** - අබලාති අබලා කිලෙසා දුබ්බලා අප්පබලා අප්පථාමා හීනා නිහීනා පරිහීනා ඔමකා ලාමකා ඡත්තකා[1] පරිත්තා. තෙ කිලෙසා නං[2] පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති මද්දන්තීති එවම්පි **අබලා නං බලීයන්ති**. අථවා අබලං පුග්ගලං දුබ්බලං අප්පබලං අප්පථාමකා හීනං නිහීනං පරිහීනං ඔමකා ලාමකා ඡත්තකං පරිත්තං, යස්ස නත්ථි සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං හිරිබලං ඔත්තප්පබලං. තෙ කිලෙසා තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති මද්දන්තීති එවම්පි අබලා තං බලීයන්ති.

**මද්දන්තෙ නං පරිස්සයාති** - **පරිස්සයාති** ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච. කතමෙ පාකටපරිස්සයා? සීහා ව්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා[3] මහිසා හත්ථී අහි විච්ඡිකා සතපදී, චොරා වා අස්සු මාණවා වා කතකම්මා වා අකතකම්මා වා, චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා[4] සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා[5] විතච්ඡිකා ලොහිතපිත්තං[6] මධුමෙහො අංසා[7] පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සා ඉති වා, ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා.

කතමෙ පටිච්ඡන්නපරිස්සයා? කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථිනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං, රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො, සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ අකුසලාභිසඞ්ඛාරා, ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා.

---

1. ස. - ජතුක්කා. සීමු. II, PTS. 2. තං. - සීමු. I, සක.
3. තරච්ඡා කොකා - සීමු. I, ගොමහිසා - PTS. 4 පක්ඛන්දිකා - සීමු. I, සී. II.
5. නඛසා - සීමු. I 6. ලොහිතං පිත්තං. - සක. 7. අරිසා - ස.

**අබලා නං බලීයන්ති** - **අබලා** යනු: කෙලෙස්හු අබලයෝ යැ, දුබලයෝ යැ, අල්පබලයෝ යැ, අල්පශක්ති ඇතියෝ යැ, හීනයෝ යැ, නිහීනයෝ යැ, පරිහීනයෝ යැ, අවමත(අවශ්‍රුත)යෝ යැ, ලාමකයෝ යැ, ප්‍රත්‍යයගිතයෝ යැ, පරිත්තයෝ සි. ඒ කෙලෙස්හු ඒ පුද්ගලයා සහනය කෙරෙති (-මඩිති), හාත්පසින් මඩිති, අභිභවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් අල්වාගනිති, මර්දනය කෙරෙත් නුයි මෙසෙයින් ද අබලයෝ ඔහු මඩිති. නොහොත් ශ්‍රද්ධාබල වීර්‍ය්‍යබල සමෘතිබල සමාධිබල ප්‍රඥාබල හිරිබල ඔත්තප්පබල යමක් හට නැද්ද, (එහෙයින්) අබල වූ දුබල වූ අල්පබල වූ අල්පශක්ති වූ හීන වූ නිහීන වූ පරිහීන වූ අවමත වූ ලාමක වූ ප්‍රත්‍යයගිත වූ පරිත්ත වූ ඒ පුද්ගලයා ඒ කෙලශයෝ සහනය කෙරෙති, හාත්පසින් මඩිති, අභිභවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් ගනිති, මිරිකත් නුයි මෙසෙයින් ද "අබලයෝ ඔහු මඩිත්".

**මද්දන්තෙනං පරිස්සයා** - **පරිස්සයා** යනු: පරිශ්‍රය (උපද්‍රවයෝ) දෙදෙනෙකැ: ප්‍රකටපරිශ්‍රය යැ, ප්‍රතිච්ඡන්නපරිශ්‍රය යැයි. ප්‍රකට උපද්‍රවයෝ කවරහ ? යත්: සිහ යැ, වග යැ, දිවි යැ, වලස් යැ, තරස් යැ, කොක්නා යැ, මියු යැ, ඇත් යැ, සප් යැ, නුහුනු යැ, පත්තෑ යැ, කළ සොරකම් ඇති හෝ කළ සොරකම් නැති හෝ සොරු හෝ සැහැසියෝ යැ; චක්ෂුරොග යැ ශ්‍රොත්‍රරොග යැ ඝ්‍රාණරොග යැ ජිහ්වාරොග යැ කායරොග යැ ශීර්ෂ-රොග යැ කර්ණරොග යැ මුඛරොග යැ දන්තරොග යැ කාශ යැ ශ්වාස යැ පීනස යැ දහ යැ ජ්වර යැ කුක්ෂිරොග යැ මූර්ඡා යැ රක්තාතිසාර යැ ආමශූල යැ විසූචිකා යැ කුෂ්ට යැ ගණ්ඩ යැ කිලාසකුෂ්ට යැ ක්‍ෂය යැ අපස්මාර යැ දද යැ කැසි යැ කස් යැ ව්‍රණ යැ විතච්ඡිකා (-තලරොග) යැ රක්තපිත්ත යැ මධුමෙහ යැ අර්ශස් යැ පොල යැ භගන්දරා යැ පිතින් නැගි ආබාධ යැ සෙමින් නැගි ආබාධ යැ වසින් නැගි ආබාධ යැ සාන්නිපාතික ආබාධ යැ ඍතුපරිණාමයෙන් උපන් ආබාධ යැ විෂම වූ ඊර්‍ය්‍යාපථයෙන් නැගි ආබාධ යැ උපක්‍රමයෙන් උපන් ආබාධ යැ කර්මවිපාකයෙන් උපන් ආබාධ යැ ශීත යැ උෂ්ණ යැ ජිඝත්සා යැ පිපාසා යැ උච්චාර යැ ප්‍රස්‍රාව යැ, මැසි - මදුරු - වා - අව් - දික්දූ යන මොවුන්ගේ පහසින් උපන් පීඩා යැ යන මේ හෝ සි. මොහු ප්‍රකට උපද්‍රවයෝ යැයි කියනු ලැබෙත්.

ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ කවරහ ? යත්: කායදුශ්චරිත යැ වාග්දුශ්චරිත යැ මනොදුශ්චරිත යැ, කාමච්ඡන්දනීවරණ යැ ව්‍යාපාදනීවරණ යැ ථිනමිද්ධ නීවරණ යැ උද්ධච්චකුක්කුච්චනීවරණ යැ විචිකිච්ඡානීවරණ යැ, රාග යැ ද්වෙෂ යැ මොහ යැ ක්‍රොධ යැ උපනාහ යැ ම්‍රක්ෂ (මෙරමා ගුණ මැකීම්) යැ පලාස (යුගග්‍රාහ) යැ ඊර්ෂ්‍යා යැ මාත්සර්‍ය්‍ය යැ මායා (ස්වදෝෂ ගුහන) යැ සාඨෙය්‍ය (අසද් ගුණ ප්‍රකාශ) යැ (ඔවා නො ගන්නා) ස්තම්භ යැ සංරම්භ යැ මාන යැ අතිමාන යැ මද යැ ප්‍රමාද යැ, සියලු කෙලශයෝ යැ සියලු දුශ්චරිතයෝ යැ සියලු දරථයෝ යැ සියලු (කෙලශ) පරිදාහයෝ යැ සියලු (කෙලශ) සන්තාපයෝ යැ සියලු අකුශලාභිසංස්කාරයෝ යැ යන මොහු ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ යැයි කියනු ලැබෙත්.

**පරිස්සයාති** – කෙනට්ඨෙන පරිස්සයා? පරිසහන්තීති පරිස්සයා, පරිහානාය සංවත්තන්තීති පරිස්සයා, තත්‍රාසයාති පරිස්සයා. කථං පරිසහන්තීති පරිස්සයා? තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති[1] පරියාදියන්ති මද්දන්ති. එවං පරිසහන්තීති පරිස්සයා.

කථං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා? තෙ පරිස්සයා කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්තීති. කතමෙසං කුසලානං ධම්මානං? සම්මාපටිපදාය අනුලොමපටිපදාය අපච්චනීකපටිපදාය අවිරුද්ධ-පටිපදාය අන්වත්ථපටිපදාය ධම්මානුධම්මපටිපදාය සීලෙසු පරිපූරකාරිතාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය භොජනෙ මත්තඤ්ඤුතාය ජාගරියානුයොගස්ස සතිසම්පජඤ්ඤස්ස චතුන්නං සතිපට්ඨානානං භාවනානුයොගස්ස චතුන්නං සම්මප්පධානානං භාවනානුයොගස්ස චතුන්නං ඉද්ධිපාදානං භාවනානු-යොගස්ස පඤ්චන්නං ඉන්ද්‍රියානං භාවනානුයොගස්ස පඤ්චන්නං බලානං භාවනානුයොගස්ස සත්තන්නං බොජ්ඣඞ්ගානං භාවනානුයොගස්ස අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගස්ස, ඉමෙසං කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. එවං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා.

කථං තත්‍රාසයාති පරිස්සයා? තත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයා යථා බිලෙ බිලාසයා පාණා සයන්ති, දකෙ දකාසයා පාණා සයන්ති, වනෙ වනාසයා පාණා සයන්ති, රුක්ඛෙ රුක්ඛාසයා පාණා සයන්ති; එවමෙව තත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයාති. එවම්පි තත්‍රාසයාති පරිස්සායා.

වුත්තං හෙතං භගවතා:

"සාන්තෙවාසිකො භික්ඛවෙ, භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු විහරති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරති? ඉධ භික්ඛවෙ, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති යෙ පාපකා අකුසලා ධම්මා සරසංකප්පා සඤ්ඤොජනීයා, ත්‍යස්ස අන්තො වසන්ති අන්වාස්ස වසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකො'ති වුච්චති. තෙ නං සමුදාචරන්ති - සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා සාචරියකොති වුච්චති. පුන ච පරං භික්ඛවෙ, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති යෙ පාපකා අකුසලා ධම්මා සරසංකප්පා සඤ්ඤොජනීයා, ත්‍යස්ස අන්තො වසන්ති අන්වාස්ස වසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකො'ති වුච්චති. තෙ නං සමුදාචරන්ති - සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති තස්මා සාචරියකො'ති වුච්චති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරතී" ති. එවම්පි[3] තත්‍රාසයාති පරිස්සයා.

---

1. අජ්ඣොත්තරන්ති. - සීමු. I. 2. අනවාස්සවන්ති - සී මු I. 3. එවං - සී මු I.

**පරිස්සයා** යනු කවරහෙයින් පරිස්සය වේ ද? යත්: පරිසහනය කෙරෙත් නුයි 'පරිස්සය' නම් වේ, පරිහානයට ංවැටෙත් නුයි 'පරිස්සය' නම් වේ, එහි ආසය ඇත්තාහු නුයි – පරිස්සය නම් වෙත්.

කෙසේ 'පරිසහනය කෙරෙත්' නුයි 'පරිස්සය' නම් වේ ද? යත්: ඒ උපද්‍රවයෝ ඒ පුඟුල්හු සහනය කෙරෙති, පරිසහනය කෙරෙති, මැඩගෙන සිටිති, හාත්පසින් අල්වාගනිති, මිරිකාගනිත්. මෙසේ පරිසහනය කෙරෙත් නුයි 'පරිස්සය' නම් වෙත්.

කෙසේ 'පරිහානයට වැටෙත්' නුයි 'පරිස්සය' නම් වේ ද? යත්: ඒ උපද්‍රවයෝ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පරිහානය (හැරීම) පිණිස පවතිත්. කවර කුශලධර්මයන්ගේ ද යත්: සම්‍යක්ප්‍රතිපත් යැ අනුලොමප්‍රතිපත් යැ අප්‍රත්‍යනීකප්‍රතිපත් යැ අවිරුද්ධප්‍රතිපත් යැ අන්වර්ථ-(අර්ථානුගත)ප්‍රතිපත් යැ ධර්මානුධර්මප්‍රතිපත් යැ ශීලයෙහි පරිපූරකාරිත්ව යැ ඉන්ද්‍රියයන්හි ගුප්තද්වාරතා යැ භොජනයෙහි මාත්‍රඥතා යැ ජාගර්‍ය්‍යානුයොග යැ ස්මෘතිසම්ප්‍රජ්‍ඥත යැ චතුර්විධ ස්මෘතිප්‍රස්ථානයන්ගේ භාවනානුයොග යැ චතුර්විධ ඍද්ධිපාදයන්ගේ භාවනානුයොග යැ පඤ්චෙන්ද්‍රියයන්ගේ භාවනානුයොග යැ පඤ්චබලයන්ගේ භාවනානුයොග යැ සප්තබොධ්‍යඞ්ගයන්ගේ භාවනානුයොග යැ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයාගේ භාවනානුයොග යැ යන මේ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පරිහානය පිණිස වැටෙත්. මෙසේ පරිහානයට වැටෙත් නුයි 'පරිස්සය' නම් වෙත්.

කෙසේ 'එහි ආසය ඇත්තාහු' නුයි 'පරිස්සය' නම් වේ ද? යත්: ඒ ඇත්බැව්හි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසිරි කොට උපදිත්. යම්සේ බිලය ඇසුරු කරන ප්‍රාණීහු බිලයෙහි හොවිත් ද, දිය ඇසුරු කරන ප්‍රාණීහු දියෙහි හොවිත් ද, වනය ඇසුරු කරන ප්‍රාණීහු වෙනෙහි හොවිත් ද, රුක ඇසුරු කරන ප්‍රණීහු රුක්හි හොවිත් ද, එසෙයින් ම අත්බැව ඇසුරු කරන තෙල ලාමක අකුශලධර්මයෝ ඒ අත්බැව්හි උපදිත්. මෙසෙයිනුදු තත්‍රාසය (එහි ආසය) ඇත්තාහු නුයි පරිස්සය නම් වෙත්.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

"මහණෙනි, සන්තෙවාසික වූ සාචරියක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙයි. මහණෙනි, කෙසේ නම් සාන්තෙවාසික වූ සාචරියක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙයි ද? යත්: මහණෙනි, මේ ශාසනයෙහි මහණක් හට ඇසින් රූපයක් දැක සරසංකල්ප (–අරමුණුවල හැසිරෙන හෙයින් සංකල්පනය කටයුතු) වූ සංයොජනයන්ට හිත වූ යම් ලාමක අකුශලධර්ම කෙනෙක් උපදිත් ද, ඒ අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති. සන්තානයට පිවිස වෙසෙති. එහෙයින් 'සාන්තෙවාසික' යයි කියනු ලැබේ. යම් හෙයකින් ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු හසුරුවත් ද, ඔහු කෙරෙහි පවතිත් ද, එහෙයින් 'සාචරියක' යයි කියනු ලැබේ. තවද මහණෙනි, මහණක් හට කනින් ශබ්දයක් අසා... නාසයෙන් ගඳක් අසා... දිවින් රසයක් විඳ... කයින් පහසක් පැහැස... සිතින් දහමක් දැන නානාලම්බනයෙහි හැසිරීම් වශයෙන් පරිකල්පිත වූ සංයොජනීය වූ යම් ලාමක අකුශලධර්ම කෙනෙක් උපදිත් ද, ඒ ලාමක අකුශල ධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති. ඔහුගේ සන්තානයට පිවිස වෙසෙති. එහෙයින් 'සාන්තෙවාසික' යයි කියනු ලැබේ. යම් හෙයකින් ඒ ලාමක අකුශල ධර්මයෝ ඔහු හසුරුවත් ද, ඔහු කෙරෙහි පවතිත් ද, එහෙයින් 'සාචරියක' යයි කියනු ලැබේ. මෙසෙයින් මහණෙනි, මහණ තෙමේ සාන්තෙවාසික වූයේ සාචරියක වූයේ දුකසේ වෙසෙයි, සුවසේ නො වෙසේ යයි. මෙසේත් තත්‍රාසය වෙත් නුයි උපද්‍රව නම් වෙත්.

වුත්තං හෙතං භගවතා:

"තයො මෙ භික්ඛවෙ, අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා. කතමෙ තයො? ලොභො භික්ඛවෙ, අන්තරා මලං අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. දොසො භික්ඛවෙ -පෙ- මොහො භික්ඛවෙ, අන්තරා මලං අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා" ති.

1. "අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

2. ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං[1] තදා හොති යං ලොභො සහතෙ නරං.

3. අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

4. කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං[1] තදා හොති යං කොධො සහතෙ නරං.

5. අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

6. මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති,
අන්ධන්තමං[1] තදා හොති යං මොහො සහතෙ නරං" ති.

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

"තයො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. කතමෙ තයො? ලොභො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. දොසො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. මොහො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය[2]. ඉමෙ ඛො මහාරාජ, තයො පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරායාති.

7. ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,
හිංසන්ති අත්තසම්භූතා තචසාරං'ව සම්ඵල" න්ති.

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

8. "රාගො ච දොසො ච ඉතො නිදානා
අරතී රතී ලොමහංසො ඉතොජා,[3]
ඉතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා[4] ධංකමිවොස්සජන්ති"

---

1. අන්ධතමං - ස්‍යා
2. අඵාසුවිහාරායාති - සීමු. I.
3. ජාතො. ස, PTS. ජාතා - ස.
4. කුමාරිකා - මජසං.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

"මහණෙනි, ඇතුළත මලයෝ ඇතුළත අමිත්‍රයෝ ඇතුළත සතුරෝ ඇතුළත වධකයෝ ඇතුළත පසමිතුරෝ තිදෙනෙක් වෙති. කවර තිදෙනෙක් ද ? යත්: මහණෙනි, ලොභය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍රයෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතුරෙකි. මහණෙනි, ද්වෙෂය... මහණෙනි, මොහය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍රයෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතුරෙකි. මහණෙනි, මොහු තිදෙන ඇතුළත මලයෝ යැ, ඇතුළත අමිත්‍රයෝ යැ, ඇතුළත සතුරෝ යැ, ඇතුළත වධකයෝ යැ, ඇතුළත පසමිතුරෝ' යි.

1 – 2. ලොභය අනර්ථ උපදවන්නේ යැ. ලොභය සිත චලනය කරන්නේ යැ. හේ ඇතුළත (සිත්හි මැ) උපන් භයහෙතුයෙක. ඒ භය බාල මහාජන තෙමේ නො දනී. ලොභී වූයේ (ලෞකිකලොකොත්තර) අර්ථය නො දනී. (අර්ථයට හෙතු වූ) ධර්මය නො දකී. යම් කලෙක්හි ලොභය තෙම මිනිසා මැඩගනී ද එකල්හි බහල වූ අන්ධකාරය වේ.

3 – 4. ද්වෙෂය අනර්ථජනක යැ, ද්වෙෂය සිත චලනය කෙරෙයි. හේ සිත්හි උපන් භය කාරණයෙක. බාලජන තෙමේ එය අවබොධ නො කෙරෙයි. කිපියේ අර්ථය නො දනී. ධර්මය නො දකී. ක්‍රොධය මිනිසා යටපත් කරන කල්හි බහල වූ අන්ධකාරය වේ.

5 – 6. මොහය අනර්ථ උපදවයි. මොහය සිත කලඹයි. හේ සිත තුළ උපදනා භය කාරණයෙක. බාලජන තෙමේ එය අවබොධ නො කෙරෙයි. මූලා වූයේ අර්ථය නො දනී. ධර්මය නො දකී. මොහය මිනිසා මැඩගන්නා කල්හි බහල වූ අන්ධකාරය වේ.

මෙසේත් 'තත්‍රාසය වෙත්' නුයි උපද්‍රව නම් වෙත්.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

"මහරජ, පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනා ධර්මයෝ තිදෙනෙක් අහිත පිණිස දුක් පිණිස අසුඛවිහරණය පිණිස උපදිති. කවර තිදෙනෙක් ද ? යත්: මහරජ, ලොභධර්මය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදී. මහරජ, ද්වෙෂධර්මය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදී. මහරජ, මොහධර්මය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතයට දුකට නො සුවවිහරණයට උපදී. මහරජ, මේ ධර්මයෝ තිදෙන පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනාහු අහිත පිණිස දුක් පිණිස අඵාසුවිහරණය පිණිස උපදිත්.

7. ලොභය ද්වෙෂය හා මොහය ද ස්වසන්තානයෙහි උපන්නාහු ස්වකීය ඵලය ත්වක්සාර (හුණගසක්) මෙන් පව්සිත් ඇති පුරුෂයා නසත්. මෙසෙයිනු ද තත්‍රාසය නුයි උපද්‍රව නම් වෙත්.

වදාරන ලද මැයි මේ බුදුන් විසින්:

8. රාගය ද ද්වෙෂය ද කුශලධර්මයෙහි උත්කණ්ඨාව ද පස්කම්හි ඇලීම හා ලොමහර්ෂය ද මේ ආත්මභාවය නිදාන කොට ඇත්තාහුය. මේ අත්බැවින් උපන්නාහුය. ලාමක වූ මනොවිතර්කයෝ මේ අත්බැවින් ඉපද, කුඩා–දරුවන් දිග හුයකින් පය බැඳ හරන ලද කවුඩකු සෙයින් සිත (බැඳ හවයෙහි) හැර පියත්.

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

**මද්දන්තෙ නං පරිස්සයාති** - තෙ පරිස්සයා තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති[1] පරියාදියන්ති මද්දන්තීති මද්දන්තෙ නං පරිස්සයා.

**තතො නං දුක්ඛමන්වෙතීති** - තතොති[2] තතො පරිස්සයතො තං පුග්ගලං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. ජාතිදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. ජරාදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. ව්‍යාධිදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. මරණදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. නෙරයිකං දුක්ඛං -පෙ- තිරච්ඡානයොනිකං දුක්ඛං -පෙ- පෙත්තිවිසයිකං[3] දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. මානුසිකං දුක්ඛං[4] -පෙ- ගබ්භොක්කන්තිමූලකං දුක්ඛං -පෙ- ගබ්භෙඨිති[5] මූලකං දුක්ඛං -පෙ- ගබ්භවුට්ඨානමූලකං දුක්ඛං -පෙ- ජාතස්සූපනිබන්ධිකං දුක්ඛං -පෙ- ජාතස්ස පරාධෙය්‍යකං[6] දුක්ඛං -පෙ- අත්තූපක්කමං දුක්ඛං -පෙ- පරූපක්කමං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. දුක්ඛදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. සඞ්ඛාරදුක්ඛං -පෙ- විපරිණාමදුක්ඛං -පෙ- චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො[7] ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා[8] විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා සෙම්හසමුට්ඨානා ආබාධා වාතසමුට්ඨානා ආබාධා සන්නිපාතිකා ආබාධා උතුපරිණාමජා ආබාධා විසමපරිහාරජා ආබාධා ඔපක්කමිකා ආබාධා කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සදුක්ඛං -පෙ- මාතුමරණං දුක්ඛං -පෙ- පිතුමරණං දුක්ඛං -පෙ- භාතුමරණං දුක්ඛං -පෙ- භගිනීමරණං දුක්ඛං -පෙ- පුත්තමරණං දුක්ඛං -පෙ- ධීතුමරණං දුක්ඛං -පෙ- ඤාතිව්‍යසනං දුක්ඛං -පෙ- භොගව්‍යසනං දුක්ඛං -පෙ- රොගව්‍යසනං දුක්ඛං -පෙ- සීලව්‍යසනං දුක්ඛං -පෙ- දිට්ඨිව්‍යසනං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොතීති තතො නං දුක්ඛමන්වෙති.

**නාවං භින්නමිවොදකන්ති** - යථා භින්නං නාවං උදකදායිතො[9] තතො තතො උදකං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. පුරතොපි උදකං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. පච්ඡතොපි, හෙට්ඨතොපි, පස්සතොපි උදකං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. එවමෙව තතො තතො පරිස්සයතො තං පුග්ගලං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. ජාතිදුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොති. -පෙ- දිට්ඨිව්‍යසනං දුක්ඛං අන්වෙති අනුගච්ඡති අන්වායිකං හොතීති නාවං භින්නමිවොදකං. තෙනාහ භගවා:

"අබලා නං බලීයන්ති මද්දන්තෙ නං පරිස්සයා,
තතො නං දුක්ඛමන්වෙති නාවං භින්නමිවොදක" න්ති.

## 1 - 6.

"තස්මා ජන්තු සදා සතො කාමානි පරිවජ්ජයෙ,
තෙ පහාය තරෙ ඔඝං නාවං සිත්වාව පාරගූ."

---

1. අජ්ඣොත්තරන්ති - මු. I. 2. තතොති තතො - මු. I. මජසං.
3. පෙතවිසයිකං - සයා. 4. මානුසකදුක්ඛං - සයා. 5. ගබ්භෙඨිති - සීමු. I.
6. පරාධෙය්‍යකං - සීමු. I. මජසං. 7. ඩාහො - මජසං. 8. නඛසා - මු. I.
9. උදකං අන්වායිකං - සයා; උදකංදායකං - සීමු. 1; දකමෙසිං- මජසං.

මෙ පරිද්දෙන් ද තත්‍රාසය නුයි – 'පරිස්සය (–උපද්‍රව)' නම් වෙත්.

**මද්දන්තෙ නං පරිස්සයා** – ඒ උපද්‍රවයෝ ඒ පුහුල්හු සඝනය කෙරෙති, පරිසඝනය කෙරෙති, අභිඝවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් අල්වාගනිති, මිරිකත් නුයි 'මද්දන්තෙ නං පරිස්සයා' යනු වේ.

**තතො නං දුක්ඛමන්වෙති** – තතො යනු: ඒ උපද්‍රව හෙතු කොට ගෙන ඒ පුද්ගලයා කරා දුක එයි, සමීපයට යයි, පැමිණියේ වෙයි. ජාතිදුක අනුව එයි, ළඟට යයි, පැමිණියේ වෙයි. ජරාදුක... ව්‍යාධි දුක .. මරණදුක... සොක – පරිදෙව – දුක්ඛ – දෞමනස්ස – උපායාස දුක අනුව එයි, සමීපයට යයි, පැමිණියේ වෙයි. නිරය දුක... තිරිශ්චීනයොනියෙහි දුක... ප්‍රෙතවිෂයෙහි දුක... මිනිස්ලොවැ (වධබන්ධනාදි) දුක... ගර්භාවක්‍රාන්ති–මූලක දුක... ගර්භස්ථිතිමූලක දුක... ගර්භව්‍යුත්ථානමූලක දුක... උපන්නහු පිළිබඳ්ගත් දුක... උපන්නහු පරා අයත්බැව්හි දුක... ආත්මොපක්‍රම දුක... පරොපක්‍රම දුක අනුව එයි... දුඃඛදුඃඛය... සංස්කාර දුඃඛය... විපරිණාම දුඃඛය... චක්ෂුරොග ශ්‍රොත්‍රරොග ඝ්‍රාණරොග ජිහ්වාරොග කායරොග ශීර්ෂරොග කර්ණරොග මුඛරොග දන්තරොග කාස ශ්වාස පීනස දාහ ජ්වර කුක්ෂිරොග මූර්ඡා ප්‍රස්කන්දිකා ශූල විසූචිකා කුෂ්ට ගණ්ඩ කිලාස ක්ෂය අපස්මාර දද්‍රු කණ්ඩූති කච්ඡු රඛසා විතච්ඡිකා රක්තපිත්ත මධුමෙහ අර්ශස් පිඩකා භගන්දර පිත්තජරොග ශ්ලෙෂ්මජරොග සාන්නිපාතිකාබාධ ඍතුපරිණාමජආබාධ විෂමපරිහාරජආබාධ ඖපක්‍රමිකආබාධ කර්මවිපාකජ ආබාධ, ශීතොෂ්ණ ජිඝත්සා පිපාසා උච්චාර ප්‍රස්‍රාව, මැසි – මදුරු – වා – අව් දිග් දූ පහසින් වූ දුක... මාතෘමරණයෙන් වූ දුක... පිතෘමරණ දුක... භ්‍රාතෘ–මරණ දුක... භගනීමරණ දුක... පුත්‍රමරණ දුක... හීතෘමරණ දුක... ඥාතිව්‍යසනයෙන් වූ දුක... භොගව්‍යසන දුක... රොගව්‍යසන දුක... ශීලව්‍යසන දුක... දෘෂ්ටිව්‍යසන දුක අනුව එයි, සමීපයට යයි, පැමිණේ නුයි 'තතො නං දුක්ඛමන්වෙති' යනු වේ.

**නාවං භින්නමිවොදකං** – යම් සේ බිඳුණු නැවට ඒ ඒ සිදුරෙන් දිය පිවිසේ ද, පිටුපසින් ද යටින් ද දෙපසින් ද ජලය පිවිසේ ද, එසෙයින් ම ඒ ඒ උපද්‍රවයෙන් ඒ පුද්ගලයා කරා දුක පිවිසෙයි, අනුව යෙයි, පැමිණේ. ජාතිදුක පිවිසෙයි... දෘෂ්ටිව්‍යසනයෙන් වූ දුක පිවිසෙයි, අනුව යෙයි, පැමිණේ නුයි 'නාවං භින්නමිවොදකං' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

**"අබලානං බලීයන්ති**–පෙ– **නාවං භින්නමිවොදකං"**යි.

**1 – 6.**

එහෙයින් සත්ත්ව තෙමේ සියලු කල්හි සිහි ඇති වැ කාමයන් දුරු කරන්නේ යැ. මෙසේ ඒ කාමයන් දුරුකොට බිඳුණු නැව දිය ඉසපරතෙර යන්නකු සෙයින් චතුරොඝය තරණය කරන්නේ යි.

**තස්මා ජන්තු සදා සතො'ති** – තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා එතං ආදීනවං සම්පස්සමානො කාමෙසූති තස්මා; **ජන්තූ'ති** සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[1] ජන්තු ඉන්දගු මනුජො; **සදා'ති** සදා සබ්බදා සබ්බකාලං නිච්චකාලං ධුවකාලං සතතං සමිතං අබ්බොකිණ්ණං[2] පොඛානුපොඛං[3] උදකොමිකජාතං අවීචි සන්තති සහිතං ඵුසිතං[4] පුරෙභත්තං පච්ඡාභත්තං පුරිමං යාමං මජ්ඣිමං යාමං පච්ඡිමං යාමං, කාළෙ ජුණ්හෙ වස්සෙ හෙමන්තෙ ගිම්හෙ පුරිමෙ වයොඛන්ධෙ මජ්ඣිමෙ වයොඛන්ධෙ පච්ඡිමෙ වයොඛන්ධෙ; **සතො'ති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තොපි සතො. අපරෙහිපි චතූහි කාරණෙහි සතො -පෙ-* සො වුච්චති 'සතො' ති. තස්මා ජන්තු සදා සතො.

**කාමානි පරිවජ්ජයෙති** – කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච. -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙස කාමා. **කාමානි පරිවජ්ජයෙති** ද්වීහි කාරණෙහි කාමෙ පරිවජ්ජෙය්‍ය: වික්ඛම්භනතො වා සමුච්ඡෙදතො වා. කථං වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙය්‍ය? අට්ඨිකඞ්කලූපමා කාමා අප්පස්සාදට්ඨෙනා'ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙය්‍ය. මංසපෙසූපමා කාමා බහුසධාරණට්ඨෙනා'ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙය්‍ය. තිණුක්කූපමා කාමා අනුදහනට්ඨෙනා'ති පස්සන්තො වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙය්‍ය. -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං භාවෙන්තොපි වික්ඛම්භනතො කාමෙ පරිවජ්ජෙය්‍ය. එවං වික්ඛම්භනතො කාමෙ පිරිවජ්ජෙය්‍ය. -පෙ- එවං සමුච්ඡෙදතො කාමෙ පරිවජ්ජෙය්‍යා'ති කාමානි පරිවජ්ජයෙ.

**තෙ පහාය තරෙ ඔඝන්ති** – තෙති වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ **පහාය** පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා කාමච්ඡන්දනීවරණං පහාය පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, ව්‍යාපාදනීවරණං -පෙ- ථිනමිද්ධනීවරණං -පෙ- උද්ධච්චකුක්කුච්චනීවරණං -පෙ- විචිකිච්ඡානීවරණං පහාය පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා කාමොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරෙය්‍ය උත්තරෙය්‍ය පතරෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍යා'ති – තෙ පහාය තරෙ ඔඝං.

1. ජගු - සීමු. I, සී. I, ජතු - ස්‍යා.
2. අනබ්බොච්ඡින්නං - සීමු. I. අබ්බොකිණ්ණං - ස්‍යා
3. පොඛානුපොඛං - සී. 1 ස්‍යා.
4. ඵුසිතං. සීමු. I.

* 14 වන පිටුව බැලිය යුතු.

**තස්මා ජන්තු සදා සතො** - එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් කාමයන්හි මෙසේ ආදීනව දක්නේ නුයි තස්මා; **ජන්තු** සත්ත්ව - නර-මානව- පුරුෂ-පුද්ගල - ජීව - ජාගු - ජන්තු- ඉන්දගු - මනුජ තෙම්; **සදා** - සියලු දවස්හි, සියලු කල්හි, දවසක් පාසා, අවිච්ඡින්න ව, නිරන්තරෑ, අව්‍යාකීර්ණ ව, පිළිවෙළින් එක් ව, රළවැළක් මෙන් අවිරල ව, නො සිඳෑ, එක් ව, ස්පෘෂ්ට ව, පෙරබත්හි, පසුබත්හි, පෙරයමෙහි, මැදියමෙහි, පසුයමෙහි, අවපසෑ, පුරපසෑ, වසන්හි, සීමන්හි, ගිම්හන්හි, පෙරවියෙහි, මැදිවියෙහි, පසුවියෙහි; **සතො** යනු: සතරකරුණෙකින් සිහි ඇතියේ, කයෙහි කායානුපස්සනා සිහිවටන් වඩමින් සිහි ඇතියේ, වේදනා-වන්හි... චිත්තයෙහි... ධර්මයන්හි ධම්මානුපස්සනා සිවටන් වඩමින් සිහි ඇතියේ; අන්‍ය වූ ද සතර කාරණයකින් සිහි ඇතියේ... *හෙතෙම ස්මෘතිමත් වූයේ සිහි ඇතියේ යයි කියනු ලැබේ නුයි 'තස්මා ජන්තු සදා සතො' යනු වේ.

**කාමානි පරිවජ්ජයෙ - කාමා** යනු: විස්තර හෙයින් වස්තුකාමයෝ ද ක්ලෙශකාමයෝ දැයි කාමයෝ දෙදෙනෙක් වෙති. (වස්තුකාමයෝ නම් මනාපිකරූපාදීහු)... මොහු වස්තුකාමයෝ යැයි කියනු ලැබෙත්. (ක්ලෙශ-කාමයෝ නම් ඡන්දකාමාදීහු)... මොහු ක්ලෙශකාමයෝ යැයි කියනු ලැබෙත්. **කාමානි පරිවජ්ජයෙ** - දෙ කරුණෙකින් කාමයන් දුරු කරන්නේ ය: විෂ්කම්භන හෙයින් හෝ සමුච්ඡෙද හෙයිනැ. කෙසෙයින් විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කරන්නේ ද යත්: අස්ථිකඞ්කාලයක් (ඇටසැකිල්ලක්) වැන්නැ කාමයෝ අල්පාස්වාද හෙයිනැයි දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කරන්නේ යැ. මාංසපෙශියක් වැන්නැ කාමයෝ බහුසාධාරණ වන බැවිනැයි දක්නේ කාමයන් විෂ්කම්භන හෙයින් දුරු කරන්නේ යැ. තෘණොල්කාවක් (තණහුලක්) වැන්නැ කාමයෝ අනුදහන (දහනකිස සපයන) බැවිනැයි දක්නේ විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කරන්නේ යැ... නෛවසංඥානාසංඥායතන සමාපත්ති වඩනුයේ ද විෂ්කම්භන විසින් කාමයන් දුරු කරන්නේ යැ. මෙපරිද්දෙන් විෂ්කම්භන හෙයින් කාමයන් දුරු කරන්නේ යි. (සෝවාන් මග වඩමින් අපායගමනීය කාමයන් සමුච්ඡෙද හෙයින් දුරු කරන්නේ යැ)... මෙසෙයින් සමුච්ඡෙද හෙයින් කාමයන් දුරු කරන්නේ නුයි 'කාමානි පරිවජ්ජයෙ' යනු වේ.

**තෙ පහාය තරෙ ඔඝං** - **තෙ** යනු: වස්තුකාමයන් පරිජානනය කොට ක්ලෙශකාමයන් **පහාය** - (හැර) දුරු කොට විනොදනය කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා, කාමච්ඡන්දනීවරණය හැර දුරු කොට විනොදනය කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා, ව්‍යාපාද නීවරණය... ථිනමිද්ධනීවරණය... උද්ධච්චකුක්කුච්චනීවරණය... විචිකිච්ඡා-නීවරණය... අනභාවයට පමුණුවා, කාමෞඝය භවෞඝය දෘෂ්ට්‍යෞඝය අවිද්‍යෞඝය තරණය කරන්නේය, උත්තරණය, ප්‍රතරණය, සමතික්‍රමණය කරන්නේය ඉක්මවන්නේ නුයි 'තෙ පහාය තරෙ ඔඝං' යනු වේ.

* 15 වන පිටුව බැලිය යුතු.

**නාවං සිත්වාව පාරගූති** – යථා ගරුකං නාවං භාරිකං උදකං සිඤ්චිත්වා ඔසිඤ්චිත්වා ඡඩ්ඩෙත්වා ලහුකාය නාවාය ඛිප්පං ලහුං අප්පකසිරෙනෙව පාරං ගච්ඡෙය්‍ය, එවමෙවං වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, කාමච්ඡන්දනීවරණං-ව්‍යාපාදනීවරණං-ථිනමිද්ධනීවරණං-උද්ධච්චකුක්කුච්චනීවරණං-විචිකිච්ඡානීවරණං පහාය පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා ඛිප්පං ලහුං පාරං අප්පකසිරෙනෙව ගච්ඡෙය්‍ය. පාරං වුච්චති අමතං නිබ්බානං. යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. 'පාරං ගච්ඡෙය්‍යා'ති පාරං අධිගච්ඡෙය්‍ය පාරං ඵුසෙය්‍ය පාරං සච්ඡිකරෙය්‍ය. **පාරගූති** යො'පි පාරං ගන්තුකාමො සො'පි පාරගූ, යො'පි පාරං ගච්ඡති සො'පි පාරගූ, යො'පි පාරං ගතො සො'පි පාරගූ.

වුත්තං හෙතං භගවතා:

"තිණ්ණො පාරගතො[1] ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො"ති ඛො භික්ඛවෙ, අරහතො එතං අධිවචනං. සො අභිඤ්ඤාපාරගූ පරිඤ්ඤාපාරගූ පහාණපාරගූ භාවනාපාරගූ සච්ඡිකිරියාපාරගූ සමාපත්තිපාරගූ; අභිඤ්ඤාපාරගූ සබ්බධම්මානං, පරිඤ්ඤාපාරගූ සබ්බදුක්ඛානං, පහාණපාරගූ සබ්බකිලෙසානං, භාවනාපාරගූ චතුන්නං අරියමග්ගානං, සච්ඡිකිරියා[2]පාරගූ නිරොධස්ස, සමාපත්තිපාරගූ සබ්බසමාපත්තීනං. සො වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සීලස්මිං, වසිප්පත්තො පාරමිප්පත්තො අරියස්මිං සමාධිස්මිං, වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය පඤ්ඤාය, වසිප්පත්තො පාරමිප්පත්තො අරියාය විමුත්තියා. සො පාරගතො පාරප්පත්තො අන්තගතො අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙණගතො ලෙණප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො අච්චුතප්පත්තො අමතගතො අමතප්පත්තො නිබ්බාණගතො නිබ්බාණප්පත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො ගතද්ධො[3] ගතදිසො ගතකොටිකො පාලිතබ්‍රහ්මචරියො උත්තමදිට්ඨිප්පත්තො භාවිතමග්ගො පහීණකිලෙසො පටිවිද්ධාකුප්පො සච්ඡිකතනිරොධො.

1. පාරංගතො – සිමු. I, මජසං. 2. සච්ඡිකිරියාය – මු. I.
3. විගතද්ධො – මජසං.

**නාවං සිත්වාව පාරගූ** - යම්සේ බර වූ බඩු පුරවන ලද නැවක් දිය ඉස, ඉවත් කොට, හැරදමා, සැහැල්ලු වූ නැවින් ශීඝ්‍ර වැ වහා නිදුකින් මැ පරතෙරට යන්නේ ද, එසෙයින් වස්තුකාමයන් තීරණප්‍රඥාවෙන් දූන ක්ලේශකාමයන් (ප්‍රහාණ පරිඥාවෙන්) පරිත්‍යාග කොට හැරදමා විනොදනය කොට ව්‍යන්තීකෘත කොට අනභාවයට පමුණුවා, කාමච්ඡන්දනීවරණය - ව්‍යාපාදනීවරණය - ථීනමිද්ධනීවරණය - උද්ධච්චකුක්කුච්චනීවරණය - විචිකිච්ඡානීවරණය පරිත්‍යාග කොට, හැරදමා, විනොදනය කොට, ව්‍යන්තීකෘත කොට, අනභාවයට පමුණුවා, ශීඝ්‍ර වැ වහා නිදුකින් මැ පරතෙරට යන්නේ යැ. අමෘත වූ නිර්වාණය 'පාර' යයි කියනු ලැබේ. යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් ක්ලේශවිරාගයෙක් දුඃඛනිරොධයෙක් වේ ද, ඒ නිර්වාණයයි. 'පාරං ගවෙසිය්‍ය' යනු: (ඒ නිර්වාණ සඞ්ඛ්‍යාත වූ) පාරය අධිගම කරන්නේ යැ, පාරය (දුහතො වුට්ඨාන මාර්ගඥානයෙන්) ස්පර්ශ කරන්නේ යැ, (ප්‍රත්‍යවෙක්ෂාඥානයෙන්) පාරය ප්‍රත්‍යක්ෂ කරන්නේ යි. **පාරගූ** යනු: යමෙක් පාරයට යනු කැමැති වූයේ නම් හෙ ද 'පාරගූ' නමැ, යමෙක් පාරයට යේ නම් හෙ ද 'පාරගූ' නමැ, යමෙක් පාරයට ගියේ නම් හෙ ද 'පාරගූ' නමි.

මේ වදාළේ මැනු භාගවත්හු විසින්:

**"තිණ්ණො පාරගතො ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො"** යි මහණෙනි, තෙල රහත් හට අධිවචනයෙකි (නමෙකි.) හේ 'අභිඤ්ඤාපාරගූ' යැ, 'පරිඤ්ඤාපාරගූ යැ, 'පහාණපාරගූ' යැ, 'භාවනාපාරගූ' යැ, 'සච්ඡිකිරියාපාරගූ' යැ, 'සමාපත්තිපාරගූ' ද වේ. සියලු (පඤ්චස්කන්ධාදි) ධර්මයන්ගේ අභිඥා (-ඥාතපරිඥා) වෙන් නිර්වාණපාරයට ගියේ වෙයි, සියලු (ජාත්‍යාදි) දුඃඛයන්ගේ තීරණපරිඥාවෙන් පාරයට ගියේ වෙයි, (කායදුශ්චරිතාදි) සියලු ක්ලේශයන්ගේ ප්‍රහාණපරිඥාවෙන් පාරයට ගියේ වෙයි, (ස්‍රොතාපත්ත්‍යාදි) සතර ආර්‍යමාර්ගයන්ගේ භාවනායෙන් පාරයට ගියේ වෙයි, ඵල - නිර්වාණවශයෙන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නිර්වාණයාගේ පාරයට ගියේ වෙයි, (අෂ්ටවිධ රූපාරූප) සියලු සමාපත්තීන්ගේ සමාපත්තියෙන් පාරයට ගියේ වේ. හෙතෙම ආර්‍ය (-උත්තම හෝ නිර්දෝෂ) ශීලයෙහි වශීභාවයට අවසානයට (-නිෂ්ඨාවට) පැමිණියේ, ආර්‍යසමාධියෙහි වශීභාවයට අවසානයට පැමිණියේ, ආර්‍යප්‍රඥායෙහි වශීභාවයට අවසානයට පැමිණියේ ආර්‍යවිමුක්තියෙහි වශීභාවයට අවසානයට පැමිණියේ; හෙතෙම (මාර්ගයෙන්) පාරයට ගියේ, (ඵලයෙන්) පාරයට පැමිණියේ, (මාර්ගයෙන් සංස්කාරලොකයෙහි) අන්තයට ගියේ, (ඵලයෙන්) අන්තයට පැමිණියේ, (මාර්ගයෙන් සංස්කාරයන්ගේ) කොටි - කෙළවරට ගියේ, ඵලයෙන් කෙළවරට පැමිණියේ, (මාර්ගයෙන් ආයතනාදි ලොක) පර්‍යන්තයට ගියේ පර්‍යන්තයට පැමිණියේ, (මාර්ගයෙන් අවසානයට ගියේ, (ඵලයෙන්) අවසානයට පැමිණියේ, ත්‍රාණයට ගියේ ත්‍රාණප්‍රාප්ත වූයේ, ලෙනයට ගියේ ලෙනප්‍රාප්ත වූයේ, සරණ - ප්‍රතිෂ්ඨාවට ගියේ සරණප්‍රාප්ත වූයේ, අභයගත - අභයප්‍රාප්ත වූයේ, අච්‍යුතිගත - අච්‍යුතිප්‍රාප්ත වූයේ, අමෘතගත - අමෘතප්‍රාප්ත වූයේ, (මාර්ගයෙන්) නිර්වාණගත වූයේ (ඵලයෙන්) නිර්වාණප්‍රාප්ත වූයේ; හෙතෙම (දශවිධ ආර්‍යවාසය) වැස නිමවූයේ, (ශීලය හා සමාධියෙහි) චීර්ණවශී වූයේ, සසර අදත්මග ඉක්මවූයේ, (පෙර නො ගිය විරූ) නිවන් දෙසට ගියේ, (අනුපාදිශෙෂ නිර්වාණකොටියට පැමිණ සිටියේ, රක්ෂිත බ්‍රහ්මචරියවාස ඇත්තේ, උත්තම සම්‍යග්දෘෂ්ටියට පැමිණියේ, භාවිතමාර්ග ඇත්තේ, ප්‍රහීණ ක්ලේශ ඇත්තේ, ප්‍රතිවෙධ කළ (අර්හත්ඵලසඞ්ඛ්‍යාත) අකොප්‍යය ඇත්තේ, සාක්ෂාත්කෘත නිරොධ ඇත්තේ වෙයි.

දුක්ඛං තස්ස පරිඤ්ඤාතං, සමුදයො පහීනො, මග්ගො භාවිතො, නිරොධො සච්ඡිකතො. අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං, පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං, පහාතබ්බං පහීනං, භාවෙතබ්බං භාවිතං, සච්ඡිකාතබ්බං සච්ඡිකතං. සො උක්ඛිත්තපලිඝො සංකිණ්ණපරිඛො අබ්බූළ්හෙසිකො නිරග්ගළො අරියො පණ්ණද්ධජො පණ්ණභාරො විසඤ්ඤුත්තො. පඤ්චඞ්ගවිප්පහීනො ඡළඞ්ග-සමන්නාගතො එකාරක්ඛො චතුරපස්සෙනො පනුණ්ණපච්චෙකසච්චො සමවයසට්ඨෙසනො අනාවිලසංකප්පො පස්සද්ධකායසංඛාරො සුවිමුත්ත-චිත්තො සුවිමුත්තපඤ්ඤො කෙවලී වුසිතවා උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො.

සො නෙව ආචිනාති න අපචිනාති අපචිනිත්වා[1] ඨිතො. නෙව පජහති න උපාදියති පජහිත්වා ඨිතො. නෙව සිනෙති[2] න උස්සිනෙති විසිනිත්වා ඨිතො. නෙව විධූපෙති න සන්ධූපෙති විධූපෙත්වා ඨිතො. අසෙඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන සමාධික්ඛන්ධෙන අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො. සච්චං සම්පටිපාදි-යිත්වා ඨිතො, එජං සමතික්කමිත්වා ඨිතො, කිලෙසග්ගිං පරියාදියිත්වා ඨිතො, අපරිගමනතාය ඨිතො. කථං[3] සමාදාය ඨිතො, මුත්තිපටිසෙවනතාය ඨිතො, මෙත්තාය පාරිසුද්ධියා ඨිතො, කරුණාය මුදිතාය උපෙක්ඛාය පාරිසුද්ධියා ඨිතො, අච්චන්තපාරිසුද්ධියා ඨිතො, අතම්මයතාය[4] පාරිසුද්ධියා ඨිතො, විමුත්තත්තා ඨිතො, සංතුස්සිතත්තා ඨිතො, ඛන්ධපරියන්තෙ ඨිතො, ධාතුපරියන්තෙ ඨිතො, ආයතන පරියන්තෙ ඨිතො, ගතිපරියන්තෙ ඨිතො, උපපත්තිපරියන්තෙ ඨිතො, පටිසන්ධිපරියන්තෙ ඨිතො, සංසාර-පරියන්තෙ ඨිතො, වට්ටපරියන්තෙ ඨිතො, අන්තිමෙ භවෙ ඨිතො, අන්තිමෙ සමුස්සයෙ ඨිතො, අන්තිමදෙහධරො අරහා.

1. තස්සායං පච්ඡිමකොටි[5] චරිමොයං සමුස්සයො,
ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති.

නාවං සිත්වාව පාරගූ.

තෙනාහ භගවා:

“තස්මා ජන්තු සදා සතො කාමානි පරිවජ්ජයෙ,
තෙ පහාය තරෙ ඔඝං නාවං සිත්වාව පාරගූ” ති.

**කාමසුත්තනිද්දෙසො පඨමො සමත්තො.**

---

1. සො නෙව පචිනාති නාපචිනාති - මජසං. 2. නෙව සංසිබ්බති - මජසං.
3. කට්ඨං. සා. කටං. - සීමු. I, මජසං.
4. අධම්මස්සසතාය. - සීමු I, අකම්මඤ්ඤතාය. - සා. 5. පච්ඡිමකො - සීමු. II

ඔහු විසින් දුක පරිඥත යැ, සමුදය ප්‍රහීණ යැ, මාර්ග භාවිත යැ, නිරොධය සාක්‍ෂාත්කෘත යි. (ස්වලක්‍ෂණාවබොධයෙන්) අභිඥතව්‍යය - දතයුත්ත අභිඥත යැ, (සාමාන්‍ය ලක්‍ෂණාවබොධයෙන්) පරිඥතව්‍යය- හාත්පසින් දතයුත්ත පරිඥත යැ, ප්‍රහාතව්‍යය ප්‍රහීණ යැ, භාවිතව්‍යය භාවිත යැ, සාක්‍ෂාත්කර්තව්‍යය සාක්‍ෂාත්කෘත යි.

හෙතෙම නගන ලද (උත්ක්‍ෂිප්ත) අවිද්‍යාපරිඝය ඇත්තේ යැ, සංකීර්ණ (විසුරුවන ලද) කර්මාභිසංස්කාරපරිඛා ඇත්තේ යැ, උදුරන ලද තෘෂ්ණා එෂිකා ඇත්තේ යැ, (ඔරම්භාගිය සංයොජන සඞ්ඛ්‍යාත) අර්ගල රහිත යැ, ආර්‍ය්‍ය (නිකෙලශ) යැ, හෙළන ලද මානධ්වජ ඇත්තේ යැ, තබන ලද ස්කන්ධාදි භාර ඇත්තේ යැ, (චතුර්විධ යොගයෙන්) විසංයුක්ත යැ, (කාමච්ඡන්දාදි) පඤ්චාඞ්ගවිප්‍රහීණ යැ, ෂඩඞ්ගාපෙක්‍ෂාවෙන් සමන්විත යැ, (ස්මෘතිසඞ්ඛ්‍යාත) එකාරක්‍ෂා ඇත්තේ යැ, (ප්‍රතිසෙවනාදි) චතුර්විධ අපශ්‍රයන ඇත්තේ යැ, බැහැර කළ ප්‍රත්‍යෙකසත්‍ය ඇත්තේ යැ, මොනවට හරන ලද සියලු එෂණා (-සෙවීම්) ඇත්තේ යැ, අනාවිලසංකල්ප ඇත්තේ ය, සන්හිඳුණු කායසංස්කාර ඇත්තේ යැ, සුවිමුක්තචිත්ත යැ, සිවිමුක්තප්‍රාඥ යැ, පරිපූර්ණ යැ, වුසු බඹසරවස් ඇත්තේ යැ, උත්තමපුරුෂ යැ, පරමපුරුෂ යැ, පරමප්‍රාප්තියට පැමිණියේ යි.

හෙතෙම (කුශලාකුශලවිපාකය) රැස් නො කෙරෙයි. (ඵලයෙහි සිටි හෙයින් විපාක) විධ්වංශනය නො කෙරෙයි. කෙලෙසුන් නසා සිටියේ වෙයි. (අවිද්‍යමාන හෙයින් කෙලෙසුන්) නො මැ දුරු කෙරෙයි. (තෘෂ්ණා - මාන දෘෂ්ටි විසින්) උපාදානය නො කෙරෙයි. (කෙලෙසුන්) දුරු කොට සිටියේ වෙයි. (තෘෂ්ණාවශයෙන්) නො මැ සිවනය (-බැඳීම) කෙරෙයි. (මානවශයෙන්) උත්කර්ෂණය නො කෙරෙයි. තෘෂ්ණාබන්ධනය දුරු කොට සිටියේ වෙයි. (අවිද්‍යමාන හෙයින් කෙලෙස්ගිනි) නො මැ නිවයි. නො ද දල්වයි. විධූපනය කොට (-නිවා) සිටියේ වේ. අශෛක්‍ෂ වූ ශීලස්කන්ධයෙන් සමන්විත බැවින් සිටියේ, අශෛක්‍ෂ වූ සමාධිස්කන්ධයෙන්... අශෛක්‍ෂ වූ ප්‍රඥාස්කන්ධයෙන්... අශෛක්‍ෂ වූ විමුක්තිස්කන්ධයෙන්... අශෛක්‍ෂ වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් සමන්විත බැවින් සිටියේ, චතුස්සත්‍යය ප්‍රතිවෙධ කොට සිටියේ, තෘෂ්ණාව ඉක්මවා සිටියේ, කෙලෙස්ගිනි ගෙවා සිටියේ, නැවත සංසාරයෙහි ගමන් නැති බැවින් සිටියේ, නයග්‍රහණයෙන් ගෙන සිටියේ, විමුක්තිප්‍රතිසෙවනභාවයෙන් සිටියේ, මෛත්‍රීපාරිශුද්ධියෙන් සිටියේ, කරුණා - මුදිතා - උපෙක්‍ෂාපාරිශුද්ධියෙන් සිටියේ, අත්‍යන්ත- පාරිශුද්ධියෙන් සිටියේ, අතම්මයතා (-තෘෂ්ණා - දෘෂ්ටි මානාභාව) පාරිශුද්ධියෙන් සිටියේ, සර්වකෙලශවිමුක්තභාවයෙන් සිටියේ, (යථාලාභාදි) සන්තුෂ්ටභාවයෙහි සිටියේ, ස්කන්ධපර්‍ය්‍යන්තයෙහි සිටියේ, ධාතුපර්‍ය්‍යන්තයෙහි සිටියේ, ආයතනපර්‍ය්‍යන්තයෙහි සිටියේ, ගතිපර්‍ය්‍යන්තයෙහි සිටියේ, උත්පත්තිපර්‍ය්‍යන්තයෙහි සිටියේ, ප්‍රතිසන්ධිපර්‍ය්‍යන්තයෙහි සිටියේ, සංසාර- පර්‍ය්‍යන්තයෙහි සිටියේ, වෘත්තපර්‍ය්‍යන්තයෙහි සිටියේ, අන්තිමභවයෙහි සිටියේ, අන්තිම ශරීරයෙහි සිටියේ, අන්තිමදෙහධර වූයේ, ආරකාදිභාවයෙන් අර්හත් වූයේ වේ.

1. ඒ රහතුන්ගේ මේ පශ්චිම කොටිය (කෙළවර) වෙයි. මේ අන්තිම ශරීරය වෙයි. ජාතිමරණසංසාරය, පුනර්භවය ඔහුට නැත්තේ යි. 'තාවං සිඤ්චාව පාරගූ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"තස්මා ජන්තු සදා සතො -පෙ- තාවං සිඤ්චාව පාරගූ" යනු.

**පළමුවැනි කාමසුත්ත නිද්දේශය සමාප්ත යි.**

---

# 2

# ගුහට්ඨකසුත්තනිද්දෙසො

අථ ගුහට්ඨකසුත්තනිද්දෙසො වුච්චති.

### 2 - 1.

"සත්තො ගුහායං බහුනාභිඡන්නො
තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො,
දූරෙ විවෙකා හි තථාවිධො සො
කාමා හි ලොකෙ න හි සුප්පහායා[1].

**සත්තො ගුහායං බහුනාභිඡන්නොති** – 'සත්තො'ති හි ඛො වුත්තං. අපි ච ගුහා තාව වත්තබ්බා: ගුහා වුච්චති කායො. කායොති වා ගුහාති වා සන්දෙහොති වා නාවාති වා රථොති වා ධජොති වා වම්මිකොති වා නගරන්ති වා නීඩන්ති[2] වා කුටීති වා ගණ්ඩොති වා කුම්භොති වා[3] කායස්සෙතං අධිවචනං.

"සත්තො ගුහාය"න්ති ගුහායං සත්තො විසත්තො ආසත්තො ලග්ගො ලග්ගිතො පලිබුද්ධො. යථා භිත්තිඛිලෙ වා නාගදන්තෙ වා භණ්ඩං සත්තං විසත්තං ආසත්තං ලග්ගං ලග්ගිතං පලිබුද්ධං, එවමෙවං ගුහායං සත්තො විසත්තො ආසත්තො ලග්ගො ලග්ගිතො පලිබුද්ධො.

වුත්තං හෙතං භගවතා:

"රූපෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයුපාදානා[4] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තත්‍ර සත්තො තත්‍ර විසත්තො, තස්මා සත්තොති වුච්චති. [වෙදනාය ඛො රාධ – පෙ– සඤ්ඤාය ඛො රාධ –පෙ– සංඛාරෙසු ඛො රාධ –පෙ– විඤ්ඤාණෙ ඛො රාධ, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයුපාදානා[4] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තත්‍ර සත්තො තත්‍ර විසත්තො, තස්මා සත්තොති වුච්චති] සත්තොති ලග්ගනාධිවචනන්ති."

1. සුප්පහායා-ස, සුප්පජහා - සීමු. I, සී. I
2. නිද්දන්ති - සො. මජසං. නීලං ස. නිඩ්ඩන්ති- මූ. I, PTS.
3. කුම්භොතිවා - සී මු. I. 4. උපායුපාදානා, සී මු. II.
[ ] ලක්ඛණන්තරිතො භාගො සාමපොත්ථකෙ න දිස්සති.

# 2

# ගුහට්ඨකසුත්තනිද්දේසය

ඉක්බිති ගුහට්ඨක සුත්තනිද්දේසය කියනු ලැබේ.

## 2 – 1.

යම් මිනිසෙක් ගුහා සඞ්ඛ්‍යාත ශරීරයෙහි ඇලුණේ බොහෝ රාගාදි කෙලෙසුන් විසින් වැසුණේ රාගාදි වශයෙන් සිටුනේ මොහන සඞ්ඛ්‍යාත පස්කම් ගුණයෙහි දැඩි වැ බැසගත්තේ වේ ද, එබඳු වූ ඒ සත්ත්ව තෙම ත්‍රිවිධ විවෙකයෙන් දුර මැ වෙයි. යම් හෙයකින් සත්ලොවෙහි කාමයෝ සුවසෙන් නො හළ හැක්කාහු ද එහෙයිනි.

**සත්තො ගුහායං බහුනාභිච්ඡන්නො** – 'සත්තො' යනු කියනලද මැය. එතෙකුදු වත් පළමු කොට 'ගුහා' කියැ යුතු යැ. ''ගුහා''යි කය කියනු ලැබේ. 'කාය' යැ හෝ, (රාගාදි ව්‍යාලයන් වෙසෙන හෙයින්) 'ගුහා' යැ හෝ, (රාගාදීන් විසින් දවන හෙයින්) 'දෙහ' යැ හෝ, (ප්‍රමත්ත කරන හෙයින්) 'සන්දෙහ' යැ හෝ, (සසර සැරිසරන හෙයින්) 'නාවා' යැ හෝ, (ඊර්යාපථ ඇති බව හෙයින්) 'රථ' යැ හෝ, (ඉතා උස් වැ නැගි හෙයින්) 'ධජ' යැ හෝ, (කෘමිකුලයනට ආවාස බැවින්) 'වම්මික' යැ හෝ (මනාපාමනාපයන් සංසරන් හෙයින්) 'නගර' යැ හෝ, (රෝගාදීන්ට නීඩ-කැදලි වන බැවින්) 'නීඩ' යැ හෝ, (ප්‍රතිසන්ධියට නිවාසගෘහ වන හෙයින්) 'කුටි' යැ හෝ, (පූතිභාවයෙන්) 'ගණ්ඩ' යැ හෝ, (බිඳෙන හෙයින්) 'කුම්භ' යැ හෝ, කයට මේ අභිවචන යි.

**සත්තො ගුහායං** – කායගුහායෙහි ශක්ත යැ විශක්ත යැ ආශක්ත යැ ලග්න යැ ලගිත යැ පරිබුද්ධ (–නො හැර සිටියේ) යැ. යම් සේ භිත්ති-ඛීලයෙකැ හෝ නාගදන්තයෙකැ හෝ භාණ්ඩයෙක් ශක්ත විශක්ත ආශක්ත ලග්න ලගිත පරිබුද්ධ වේ ද, එසෙයින් කායගුහායෙහි ශක්ත යැ විශක්ත යැ ආශක්ත යැ ලග්න යැ ලගිත යැ පරිබුද්ධ යි.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

''රාධ, රූපයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තෘෂ්ණායෙක් යම් තෘෂ්ණා-දෘෂ්ටි උපයයන් දැඩි කොට ගත්තා අකුශල-චිත්තයට අධිෂ්ඨානාභිනිවෙශ වූ අනුශය කෙනෙක් වෙද්ද, එහි ශක්ත වූයේ (ඇලුණේ) එහි වෙසෙසින් ඇලුණේ වේ ද, එහෙයින් 'සත්ත්ව' යැ යි කියනු ලැබේ. වේදනායෙහි... සංඥායෙහි... සංස්කාරයන්හි... විඥානයෙහි රාධ යැ, යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියෙක් යම් තෘෂ්ණායෙක් යම් තෘෂ්ණාදෘෂ්ටි සඞ්ඛ්‍යාත උපයයන් දැඩි කොට ගත්තා අකුශලචිත්තයට අධිෂ්ඨාන-අභිනිවෙශ වූ අනුශය කෙනෙක් වෙද්ද, එහි (යම්හෙයකින්) ඇලුණේ වෙසෙසින් ඇලුණේ වේ ද, එහෙයින් 'සත්ත්ව' යැ යි කියනු ලැබෙයි. 'සත්ත' යනු වෙසෙසින් ඇලීම ප්‍රකාශ කිරීම යැ'' යි.

**සත්තො ගුහායං බහුනාභිච්ඡන්නොති** - බහුකෙහි කිලෙසෙහි ඡන්නො: රාගෙන ඡන්නො දොසෙන ඡන්නො මොහෙන ඡන්නො කොධෙන ඡන්නො උපනාහෙන ඡන්නො මක්ඛෙන ඡන්නො පළාසෙන ඡන්නො ඉස්සාය ඡන්නො මච්ඡරියෙන ඡන්නො මායාය ඡන්නො සාඨෙය්‍යෙන ඡන්නො ථම්භෙන ඡන්නො සාරම්භෙන ඡන්නො මානෙන ඡන්නො අතිමානෙන ඡන්නො මදෙන ඡන්නො පමාදෙන ඡන්නො, සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බපරිළාහෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසංඛාරෙහි ඡන්නො[1] උච්ඡන්නො ආවුතො නිවුතො ඔවුතො[2] පිහිතො පටිච්ඡන්නො පටිකුජ්ජිතොති 'සත්තො ගුහායං බහුනාභිච්ඡන්නො,

**තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හොති** - 'තිට්ඨං නරො' ති තිට්ඨන්තො නරො රත්තො රාගවසෙන තිට්ඨති. දුට්ඨො දොසවසෙන තිට්ඨති. මූළ්හො මොහවසෙන තිට්ඨති විනිබද්ධො[3] මානවසෙන තිට්ඨති. පරාමට්ඨො දිට්ඨිවසෙන තිට්ඨති. වික්ඛෙපගතො උද්ධච්චවසෙන තිට්ඨති. අනිට්ඨංගතො විචිකිච්ඡාවසෙන තිට්ඨති. ථාමගතො අනුසයවසෙන තිට්ඨති. එවම්පි තිට්ඨං නරො.

වුත්තං හෙතං භගවතා:

"සන්ති භික්ඛවෙ, චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨති. සන්ති භික්ඛවෙ, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා -පෙ- මනොවිඤ්ඤෙය්‍යා ධම්මා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. තඤ්චෙ භික්ඛු අභිනන්දති අභිවදති අජ්ඣොසාය තිට්ඨතී"[a] ති. එවම්පි තිට්ඨං නරො.

වුත්තං හෙතං භගවතා:

"රූපූපයං[4] වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති රූපාරම්මණං රූපපතිට්ඨං[5]. නන්දූපසෙවනං[6] වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජති. වෙදනූපයං[7] වා භික්ඛවෙ -පෙ- සඤ්ඤූපයං වා භික්ඛවෙ -පෙ- සඞ්ඛාරූපයං වා භික්ඛවෙ, විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති සංඛාරාරම්මණං සඞ්ඛාරපතිට්ඨං. නන්දූපසෙවනං වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජතී"[b] ති. එවම්පි තිට්ඨං නරො.

---

1. විච්ඡන්නො - සයා. මජසං. 2. ඔපුතො - සයා. ස. 3. විනිබන්ධො - සයා. ස.
4. රූපුපායං - සීමු. II. සයා. PTS. 5. රූපෙ පතිට්ඨං - සීමු. I.
6. නන්දූපසෙවනං - සයා සී I ස. PTS. 7. වෙදනූපායං - සීමු. II. සයා.

a. සංයුත්ත - ලොකකාමගුණවග්ග - මාරපාසසුත්තං.
b. " ඛන්ධසංයුත්ත - උපයවග්ග - උපයසුත්තං.

**සත්තො ගුහායං බහුනාභිඡන්නො** - බොහෝ කෙලෙසුන් විසින් ඡන්න (වැසුණේ) යැ: රාගයෙන් ඡන්න යැ, ද්වේෂයෙන් මෝහයෙන් ... ක්‍රෝධයෙන් ... උපනාහයෙන් ... ම්‍රක්‍ෂයෙන් ... යුගග්‍රාහයෙන් ... ඊර්ෂ්‍යා-යෙන් මාත්සර්‍යයෙන් මායායෙන් .. ශාඨ්‍යයෙන් ... ස්තම්භයෙන් ... සංරම්භයෙන් මානයෙන් .. අතිමානයෙන් ... මදයෙන් ... ප්‍රමාදයෙන් ඡන්න යැ, සියලු කෙලෙසුන් විසින් සියලු දුශ්චරිතයන් විසින් සියලු දරථයන් විසින් සියලු පරිදාහයන් විසින් සියලු සන්තාපයන් විසින් සියලු අකුශලාභිසංස්කාරයන් විසින් ඡන්න යැ, (පුනපුනා උපදනේන්) උපයූපරි ඡන්න යැ, ආවෘත (වළකන ලද) යැ, නිවෘත යැ, අපවෘත (යටකොට වසනලද) යැ, පිහිත යැ, ප්‍රතිච්ඡන්න යැ, යටිහුරු කොට තබන ලද නුසි 'සත්තො ගුහායං බහුනාභිඡන්නො' යනු වේ.

**තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො** - 'තිට්ඨං නරො' යනු: නර (සත්ත්ව) තෙම සිටුනේ රාගවශයෙන් රත් වූයේ සිටී ද්වේෂවශයෙන් දුෂ්ට වූයේ සිටී. මෝහවශයෙන් මූඪ වූයේ සිටී. මානවශයෙන් නානාලම්බන-යෙහි බැඳී සිටී. දෘෂ්ටිවශයෙන් පරාමෘෂ්ට වැ සිටී. ඖද්ධත්‍යවශයෙන් වික්ෂේපයට පැමිණැ සිටී. විචිකිත්සාවශයෙන් නිෂ්ඨාවට නො පැමිණැ සිටී. අනුශයවශයෙන් ස්ථිර බවට පැමිණියේ සිටී. මෙසේසිටුනේ ද 'තිට්ඨං නරො' යනු වේ.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

“මහණෙනි, චක්ෂුර්විඥානයෙන් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනා-වඩන්නා වූ ප්‍රියස්වරූප වූ කාමයෙන් යුක්ත වූ ඇලුම් කටයුතු වූ රූපා-ලම්බනයෝ ඇත්තාහ. මහණතෙම ඒ අරමුණට තෘෂ්ණාවශයෙන් සතුටු වේ නම්, පසසා නම්, බැසගෙන සිටී නම්; මහණෙනි, ශ්‍රොත්‍රවිඥානයෙන් දතයුතු වූ ... ශබ්දයෝ ඇත ඝ්‍රාණවිඥානයෙන් දතයුතු වූ .. ගන්ධයෝ ඇත ... ජිහ්වාවිඥානයෙන් දතයුතු වූ .. රසයෝ ඇත ... කායවිඥානයෙන් දතයුතු වූ ... ස්ප්‍රෂ්ටව්‍යයෝ ඇත්තාහ ... මනොවිඥානයෙන් දතයුතු වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමූපසංහිත වූ රජනීය වූ ධර්මාලම්බනයෝ ඇත්තාහ මහණතෙම ඒ අරමුණට (තෘෂ්ණාවශයෙන්) සතුටු වේ නම්, පසසා නම්, බැසගෙන සිටී නම්” මෙසේත් 'තිට්ඨං නරො' යනු වේ.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

“මහණෙනි, (තෘෂ්ණා-දෘෂ්ටි උපය විසින්) රූපයට පැමිණි හෝ විඥානය සිටුනේ රූපය අරමුණු කොට ඇතියේ රූපය ප්‍රතිෂ්ඨා කොට ඇතියේ සිටී. (සප්‍රීතික) තෘෂ්ණාජලයෙන් තෙමන ලදුයේ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි. මහණෙනි, (තෘෂ්ණාදෘෂ්ටිවශයෙන්) වේදනාවට පැමිණි හෝ මහණෙනි, සංඥාවට පැමිණි හෝ... මහණෙනි, සංස්කාරයන්ට පැමිණි හෝ විඥානය සිටුනේ සංස්කාරයන් අරමුණු කොට ඇතියේ සංස්කාරයන් ප්‍රතිෂ්ඨා කොට ඇතියේ සිටී. තෘෂ්ණොදකයෙන් තෙමන ලදුයේ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණේ” යයි මෙසේත් 'තිට්ඨං නරො' යනු වේ.

වුත්තං හෙතං භගවතා:

"කබළීකාරෙ චෙ භික්ඛවෙ, ආහාරෙ අත්ථි රාගො, අත්ථි නන්දි, අත්ථි තණ්හා. පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං. යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං, අත්ථි තත්ථ නාමරූපස්සාවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්සාවක්කන්ති, අත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි.[1] යත්ථ අත්ථි සඞ්ඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, අත්ථි තත්ථ ආයතිං ජාති ජරා මරණං. යත්ථ අත්ථි ආයතිං ජාති ජරා මරණං, සසොකං තං භික්ඛවෙ, සදරං[2] සඋපායාසන්ති වදාමී"[a]ති. එවම්පි තිට්ඨං නරො.

"ඵස්සෙ චෙ භික්ඛවෙ, ආහාරෙ -පෙ- මනොසඤ්චෙතනාය චෙ භික්ඛවෙ, ආහාරෙ -පෙ- විඤ්ඤාණෙ චෙ භික්ඛවෙ, ආහාරෙ අත්ථි රාගො, අත්ථි නන්දි, අත්ථි තණ්හා. පතිට්ඨිතං තත්ථ විඤ්ඤාණං විරූළ්හං. යත්ථ පතිට්ඨිතං විඤ්ඤාණං විරූළ්හං, අත්ථි තත්ථ නාමරූපස්සාවක්කන්ති. යත්ථ අත්ථි නාමරූපස්සාවක්කන්ති, අත්ථි තත්ථ සඞ්ඛාරානං වුද්ධි. යත්ථ අත්ථි සඞ්ඛාරානං වුද්ධි, අත්ථි තත්ථ ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති. යත්ථ අත්ථි ආයතිං පුනබ්භවාභිනිබ්බත්ති, අත්ථි තත්ථ ආයතිං ජාති ජරා මරණං. යත්ථ අත්ථි ආයතිං ජාති ජරා මරණං, සසොකං තං භික්ඛවෙ, සදරං[2] සඋපායාසන්ති වදාමී"[a]ති. එවම්පි තිට්ඨං නරො.

**මොහනස්මිං පගාළ්හොති** - මොහනා වුච්චන්ති පඤ්ච කාමගුණා: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා, සොතවිඤ්ඤෙය්‍යා සද්දා -පෙ- ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා -පෙ- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා -පෙ- කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. කිංකාරණා මොහනා වුච්චන්ති පඤ්ච කාමගුණා? යෙභුය්‍යෙන දෙවමනුස්සා[3] පඤ්චසු කාමගුණෙසු මුය්හන්ති පමුය්හන්ති සම්පමුය්හන්ති මූළ්හා පමූළ්හා සම්පමූළ්හා අවිජ්ජාය අන්ධීකතා ආවුතා නිවුතා ඔවුතා පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතා.[4] තංකාරණා මොහනා වුච්චන්ති පඤ්ච කාමගුණා. **මොහනස්මිං පගාළ්හොති** - මොහනස්මිං පගාළ්හා අජ්ඣොගාළ්හා නිමුග්ගොති 'තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො.'

1. වුද්ධිං - මජසං. සීමු. I.
2. සරජං - සීමු. II. සා. PTS.
3. දෙවා මනුස්සා - සීමු. I.
4. තං පටිකුජ්ජිතා - සීමු. I.

a. නිදානසංයුත්ත - මහාවග්ග - අත්ථිරාගසුත්තං.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

"මහණෙනි, ඉදින් කවළීකාරාහාරයෙහි රාගය ඇත්නම්, නන්දිය ඇත්නම්, තෘෂ්ණාව ඇත්නම්, එහි (කර්මය ද්‍රව්‍යං පිළිසඳ ගැනීමට පොහොසත් බැවින්) විඥානය පිහිටියේ වැඩුණේ වෙයි. යම් තැනෙක්හි විඥානය පිහිටියේ වැඩුණේ නම්, එහි නාමරූපයාගේ අවක්‍රාන්තිය ඇත. යම් තැනෙක්හි නාමරූපාවක්‍රාන්තිය ඇත්නම්, එහි සංස්කාරයන්ගේ වෘද්ධිය ඇත. යම් තැනෙක්හි සංස්කාරයන්ගේ වෘද්ධිය ඇත්නම්, එහි මත්තෙහි පුනර්භවාභිනිර්වෘත්තිය ඇත. යම් තැනෙක්හි මතු පුනර්භවයාගේ පහළවීම ඇත්නම්, එහි මත්තෙහි ජාති-ජරා-මරණ ඇත. යම් තැනෙක්හි මත්තෙහි ජාති-ජරා-මරණ ඇත්තම්, මහණෙනි, එය ශොක සහිත යැ, පීඩා සහිත යැ, දුඃඛ ආයාස සහිත යයි කියමි" මෙසේත් 'තිට්ඨං නරො' යනු වේ.

"මහණෙනි, ස්පර්ශාහාරයෙහි... මහණෙනි, මනස්සඤ්චෙතනාහාරයෙහි... මහණෙනි, විඥානාහාරයෙහි ඉදින් රාගය ඇත්නම්, නන්දිය ඇත්නම්, තෘෂ්ණාව ඇත්නම්, එහි ප්‍රතිසන්ධිවිඥානය පිහිටියේ වැඩුණේ වෙයි. යම් තැනෙක්හි විඥානය පිහිටියේ වැඩුණේ වේ නම්, එහි නාමරූපාවක්‍රාන්තිය ඇත. යම් තැනෙක්හි නාමරූපාවක්‍රාන්තිය ඇත් නම්, එහි සංස්කාරයන්ගේ වැඩීම ඇත. යම් තැනෙක්හි සංස්කාරවෘද්ධිය ඇත්නම්, එහි පුනර්භවයාගේ පහළවීම ඇත. යම් තැනෙක්හි පුනර්භවයාගේ පහළවීම ඇත් නම්, එහි මත්තෙහි ජාති-ජරා-මරණ ඇත. යම් තැනෙක්හි ආයති ජාති-ජරා-මරණ ඇත්නම්, මහණෙනි, එය සශොක යැ සදර යැ සඋපායාස යැයි කියමි" මෙසේත් 'තිට්ඨං නරො' යනු වේ.

**මොහනස්මිං පගාළ්හො** - 'මොහන' යැ යි පඤ්චකාමගුණයෝ කියනු ලැබෙත්: චක්ෂුර්විඥෙය වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වරූප වූ කාමොපසංහිත වූ රජනීය වූ රූපයෝ යැ, ශ්‍රොත්‍රවිඥෙය වූ . . . ශබ්දයෝ යැ, ඝ්‍රාණවිඥෙය වූ . . . ගන්ධයෝ යැ, ජිහ්වාවිඥෙය වූ . . . රසයෝ යැ, කායවිඥෙය වූ ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියරූප වූ කාමොපසංහිත වූ රජනීය වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. කුමක් හෙයින් පඤ්චකාමගුණයෝ 'මොහන' යි කියනු ලැබෙති යත්: යම් හෙයකින් බෙහෙවින් දෙවිමිනිස්හු පස්කම්-ගුණයෙහි මුළාවෙත් ද, වෙසෙසින් මුළාවෙත් ද, සම්මොහයට පැමිණෙත් ද, මූඪ වූවාහු වෙසෙසින් මූඪ වූවාහු සම්මොහයට පැමිණියාහු අවිද්‍යායෙන් අන්ධ කරන ලද්දාහු ආවෘත - නිවෘත - අපවෘත පිහිත - ප්‍රතිච්ඡන්න - ප්‍රතිකුබ්ජිත වූවාහු වෙත් ද, එකරුණෙන් පස්කම් ගුණ 'මොහන' යැ යි කියනු ලැබෙත්. **මොහනස්මිං පගාළ්හො**- මොහනයෙහි පිවිසියේ ඇතුළු වූයේ ඇතුලත බැසගත්තේ ගැලුණේ නුයි 'තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො' යනු වේ.

**දූරෙ විවෙකා හි තථාවිධො සොති** - විවෙකාති තයො විවෙකා: කායවිවෙකො, චිත්තවිවෙකො, උපධිවිවෙකො.

කතමො කායවිවෙකො? ඉධ භික්ඛු විවිත්තං සෙනාසනං භජති අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. කායෙන ච විවිත්තො විහරති: සො එකො ගච්ඡති. එකො තිට්ඨති. එකො නිසීදති එකො සෙය්‍යං කප්පෙ[1]ති. එකො ගාමං පිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති. එකො චරති. එකො විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. අයං කායවිවෙකො.

කතමො චිත්තවිවෙකො? පඨමජ්ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං විවිත්තං හොති. දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්කවිචාරෙහි චිත්තං විවිත්තං හොති. තතියජ්ඣානං සමාපන්නස්ස පීතියා චිත්තං විවිත්තං හොති. චතුත්ථජ්ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං විවිත්තං හොති. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. සොතාපන්නස්ස සක්කායදිට්ඨියා විචිකිච්ඡාය සීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. සකදාගාමිස්ස ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අනාගාමිස්ස අනුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අනුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අරහතො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය[2] මානානුසයා අවිජ්ජානුසයා තදෙකට්ඨෙහි ච[3] කිලෙසෙහි බහිද්ධා ච[4] සබ්බනිමිත්තෙහි චිත්තං විවිත්තං හොති. අයං චිත්තවිවෙකො.

කතමො උපධිවිවෙකො? උපධී වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසංඛාරා ච. උපධිවිවෙකොති වුච්චති අමතං නිබ්බානං: යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අයං උපධිවිවෙකො. කායවිවෙකො ච වූපකට්ඨකායානං නෙක්ඛම්මාභිරතානං, චිත්තවිවෙකො ච පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං, උපධිවිවෙකො ච නිරූපධීනං පුග්ගලානං විසංඛාරගතානං.

1. කප්පෙති - සිමු. I. 2. අවිජ්ජා - සිමු. I., සී I. 3. ච - සිමු. I.

**දූරෙ විවෙකා හි තථාවිධො සො** – 'විවෙක' යනු විවෙක තුනෙකි: කායවිවෙක යැ, චිත්තවිවෙක යැ, උපධිවිවෙක යි.

කායවිවෙකය කවරැ යත්: මෙ සසුන්හි මහණ අරණ්‍ය වෘක්‍ෂමූල පර්වත කන්‍දර ගිරිගුහා ශ්මශාන වනප්‍රස්ථ අභ්‍යවකාශ පලාලපුඤ්ජ යන ජනශූන්‍ය වූ සෙනසුනක් ඇසුරු කෙරේ. කයින් ද විවික්ත වැ හිඳී. එකලා වැ හොවී. එකලාවැ ගමට පිඬු සිඟා යෙයි. එකලාවැ පෙරලා එයි. එකලාවැ රහසැ හිඳී. එකලාවැ සක්මන්හි සිටී. එකලාවැ හැසිරෙයි. එකලා වැ වෙසෙයි ඉරියව් පවත්වයි ඉරියව් උපදවයි පාලනය කෙරෙයි යැපෙයි යපනය කරවා. මේ යැ කායවිවෙක නම්.

චිත්තවිවෙකය කවරැ යත්: පළමුවන ධ්‍යානයට සමවන්හුගේ සිත නීවරණයන්ගෙන් වෙන් වෙයි. දෙවැනි ධ්‍යානයට සමවන්හුගේ සිත විතර්ක – විචාරයන් ගෙන් වෙන් වෙයි. තුන්වැනි ධ්‍යානයට සමවන්හුගේ සිත ප්‍රීතියෙන් වෙන් වෙයි. සතරවැනි ධ්‍යානයට සමවන්හුගේ සිත සුවදුක් දෙකින් වෙන් වෙයි. අකාසානඤ්චායතනයට සමවන්හුගේ සිත රූපසංඥා – ප්‍රතිඝසංඥා – නානාත්වසංඥාවෙන් වෙන් වෙයි. විඤ්ඤාණඤ්චායතනයට සමවන්හුගේ සිත ආකාසානඤ්චායතනසංඥාවෙන් වෙන් වෙයි. ආකිඤ්චඤ්ඤායතනයට සමවන්හුගේ සිත විඤ්ඤාණඤ්චායතනසංඥාවෙන් වෙන් වෙයි. නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවන්හුගේ සිත ආකිඤ්චඤ්ඤායතනසංඥාවෙන් වෙන් වෙයි. සෝවන්හුගේ සිත සත්කායදෘෂ්ටියෙන් විචිකිත්සායෙන් ශීලව්‍රතපරාමර්ශයෙන් දෘෂ්ට්‍යනුශයෙන් විචිකිත්සානුශයෙන් හා ඔවුන් සමග එක්වැ සිටි කෙලෙසුන්ගෙන් ද වෙන් වෙයි. සැදගැමිහුගේ සිත ඖදරික කාමරාගසංයොජනයෙන් ප්‍රතිඝසංයොජනයෙන් ඖදරික කාමරාගානුශයයෙන් ප්‍රතිඝානුශයයෙන් හා ඔවුන් සමග එක්වැ සිටි කෙලෙසුන් ගෙන් ද වෙන් වෙයි. අනගැමිහුගේ සිත අණුසහගත (–සියුම් වූ) කාමරාගසංයොජනයෙන් ප්‍රතිඝසංයොජනයෙන් අණුසහගත කාමරාගානුශයයෙන් ප්‍රතිඝානුශයයෙන් හා තදෙකස්ථිත කෙලශයන්ගෙන් ද වෙන් වෙයි රහත්හුගේ සිත රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයයෙන් භවරාගානුශයයෙන් අවිද්‍යානුශයයෙන් තදෙකස්ථිතකෙලශයන්ගෙන් හා බාහ්‍ය වූ සර්වසංස්කාරනිමිත්තයන්ගෙන් ද වෙන් වූයේ වේ. මේ යැ චිත්තවිවෙක නම්.

උපධිවිවෙකය කවරැ යත්: කෙලශයෝත් ස්කන්‍ධයෝත් අභිසංස්කාරයෝත් උපධියි කියනු ලැබෙත්. යම් සර්වසංස්කාරයන්ගේ සන්සිඳීමෙක් සර්වෝපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාවගේ ක්‍ෂය කිරීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේද, ඒ අමෘත නිර්වාණය 'උපධිවිවෙක'යි කියනු ලැබේ. මේ යැ උපධිවිවෙක නම්. ගණසඞ්ගණිකායෙන් වෙන් වූ කය ඇති ප්‍රථමධ්‍යානාදි නෛෂ්කාම්‍යයෙහි අභිරත වූවන්ට කායවිවෙකය ද, පරිශුද්ධ වූ සිත් ඇති උත්තම වොදාන(පරිශුද්ධි) යට පැමිණියවුන්ට චිත්තවිවෙකය ද, උපධිරහිත වූ විසංඛාරගත (=නිවනට පැමිණි) පුද්ගලයන්ට උපධිවිවෙකය ද වේ.

**දූරෙ විවෙකා හීති** – යො සො එවං ගුහායං සත්තො එවං බහුකෙහි ච කිලෙසෙහි ඡන්නො එවං මොහනස්මිං පගාළ්හො, සො කායවිවෙකාපි දූරෙ චිත්තවිවෙකාපි දූරෙ උපධිවිවෙකාපි දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා අනාසන්නෙ වවකට්ඨෙ[1]. **තථාවිධොති**- තාදිසො තස්සණ්ඨිතො තප්පකාරො තප්පටිභාගො; යො සො මොහනස්මිං පගාළ්හොති 'දූරෙ විවෙකා හි තථාවිධො සො'.

**කාමා හි ලොකෙ න හි සුප්පහායාති** – කාමාති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙස කාමා ච. කතමෙ වත්ථුකාමා? මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථු හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරං ච යං කිඤ්චි රජනීයං වත්ථු වත්ථුකාමා.

අපිච අතීතා කාමා අනාගතා කාමා පච්චුප්පන්නා කාමා අජ්ඣත්තා කාමා බහිද්ධා කාමා අජ්ඣත්තබහිද්ධා කාමා හීනා කාමා මජ්ඣිමා කාමා පණීතා කාමා ආපායිකා කාමා මානුසිකා කාමා දිබ්බා කාමා පච්චුපට්ඨිතා කාමා නිම්මිතා කාමා පරනිම්මිතා කාමා අනිම්මිතා කාමා පරිග්ගහිතා කාමා අපරිග්ගහිතා කාමා මමායිතා කාමා අමමායිතා කාමා, සබ්බෙපි කාමාවචරා ධම්මා සබ්බෙපි රූපාවචරා ධම්මා සබ්බෙපි අරූපාවචරා ධම්මා තණ්හාවත්ථුකා තණ්හාරම්මණා කමනීයට්ඨෙන රජනීයට්ඨෙන මදනීයට්ඨෙන කාමා. ඉමෙ වුච්චන්ති වත්ථු කාමා.

කතමෙ කිලෙස කාමා? ඡන්දො කාමො රාගො කාමො ඡන්දරාගො කාමො, සඞ්කප්පො කාමො රාගො කාමො සඞ්කප්පරාගො කාමො, යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං කාමච්ඡන්දනීවරණං–

1. විවෙකට්ඨෙ - සීමු. I. මජ්ඣං. උපකට්ඨෙ - සහ.

**දූරෙ විවෙකා හි** – මෙසෙයින් කායගුහායෙහි ඇලුණු මෙසේ බොහෝ කෙලෙසුන් විසින් වැසුණු මෙසේ පඤ්චකාමගුණමොහනයෙහි ගැලුණු යමෙක් වේ ද, හෙතෙම කායවිවෙකයෙනුදු දුරු වෙයි. චිත්තවිවෙකයෙනුදු දුරු වෙයි. උපධිවිවෙකයෙනුදු දුරු ඉතා දුරු අතිශයින් දුරු නො ලංහි නො හාත්පසැ අනාසන්නයෙහි බැහැර සිටියේ වේ. **තථාවිධො** – තාදෘශ වූයේ තදාකාර වූයේ තත්ප්‍රකාර වූයේ තත්ප්‍රතිභාග වූයේ, ඒ යමෙක් මොහනයෙහි ගැලුණේ වේ ද, එහෙයින් 'දූරෙ විවෙකා හි තථාවිධො සො' යනු වේ.

**කාමා හි ලොකෙ න හි සුප්පහායා** – කාමා යනු: උද්දාන විසින් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාමයෝ ද කෙලශකාමයෝ දැයි. වස්තුකාමයෝ කවරහ: මනවඩන රූපයෝ මනවඩන ශබ්දයෝ මනවඩන ගන්ධයෝ මනවඩන රසයෝ මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ ද, අතුරුණු පොරෝණා දූසිදස්හු එළුතිරෙළුහු කුකුළුහූරහු ඇත්-ගව-අස්-වෙළඹහු කෙත් වත් කහවණු රත් ගම්-නියම්ගම්-රජදහන්හු ද රට දනව් ද කෝස ද කොට්ඨගුළු ද යම් කිසි රජනීය වස්තුවෙක් වේද, මොහු යැ වස්තුකාමයෝ.

තවද අතීත කාමයෝ යැ අනාගතකාමයෝ යැ ප්‍රත්‍යුත්පන්න කාමයෝ යැ අධ්‍යාත්මකාමයෝ යැ බාහ්‍යකාමයෝ යැ අධ්‍යාත්ම-බාහ්‍යකාමයෝ යැ හීනකාමයෝ යැ මධ්‍යමකාමයෝ යැ ප්‍රණීතකාමයෝ යැ ආපායිකකාමයෝ යැ මානුෂිකකාමයෝ යැ දිව්‍යකාමයෝ යැ ප්‍රත්‍යුපස්ථිත (එළැඹ සිටි) කාමයෝ යැ නිර්මිත (මවනලද) කාමයෝ යැ පරනිර්මිත (පරා විසින් මවන ලද) කාමයෝ යැ අනිර්මිත කාමයෝ යැ පරිගෘහීත (තමා අයත් කළ) කාමයෝ යැ අපරිගෘහීත කාමයෝ යැ මමායිත (මාගේ යැයි ගන්නා ලද) කාමයෝ යැ අමමායිත කාමයෝ යැ, සියලු මැ කාමාවචරධර්මයෝ යැ සියලු මැ රූපාවචරධර්මයෝ යැ සියලු මැ අරූපාවචර ධර්මයෝ යැ යන මොහු තෘෂ්ණාවස්තු වූවාහු තෘෂ්ණාලම්බන වූවාහු කමනීය හෙයින් රජනීය හෙයින් මදනීය හෙයින් කාමයෝ යි. මොහු වස්තුකාමයෝ යැයි කියනු ලැබෙත්.

කෙලශකාමයෝ කවරහ ? ඡන්දකාම යැ රාගකාම යැ ඡන්දරාගකාම යැ, සංකල්පකාම යැ රාගකාම යැ සංකල්පරාගකාම යැ, කාමවස්තු විෂයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නේහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ච්ඡායෙක් කාමාධ්‍යවසානයෙක් (බැස ගැනීමෙක්) කාමෞඝයෙක් කාමයොගයෙක් කාමොපාදානයෙක් කාමච්ඡන්දනීවරණයෙක් වේ ද–

1. "අද්දසං කාම තෙ මූලං සංකප්පා කාම ජායසි,
න තං සංකප්පයිස්සාමි එවං කාම න හෙහිසී"[*]ති.

ඉමෙ වුච්චන්ති කිලෙස කාමා.

**ලොකෙති** - අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ. **කාමා හි ලොකෙ න හි සුප්පහායාති** - කාමා හි ලොකෙ දුප්පහායා දුච්චජා[1] දුප්පරිච්චජා[2] දුන්නිම්මදයා[3] දුන්නිවෙඨයා දුබ්බිනිවෙඨයා දුත්තරා දුප්පතරා දුස්සමතික්කමා දුබ්බිනිවත්තාති කාමා හි ලොකෙ න හි සුප්පහායා.

තෙනාහ භගවා:

"සත්තො ගුහායං බහුනාභිඡන්නො
තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො,
දූරෙ විවෙකා හි තථාවිධො සො
කාමා හි ලොකෙ න හි සුප්පහායා"ති.

**2-2**

ඉච්ඡානිදානා භවසාතබද්ධා
තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා,
පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානා
ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං.

**ඉච්ඡානිදානා භවසාතබද්ධාති** - ඉච්ඡා[4] වුච්චති තණ්හා: යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දි නන්දිරාගො චිත්තස්ස සාරාගො ඉච්ඡා මුච්ඡා අජ්ඣොසානං ගෙධො පළිගෙධො[5] සඞ්ගො පඞ්කො එජා මායා ජනිකා සඤ්ජනනී සිබ්බිනී ජාලිනී සරිතා විසත්තිකා සුත්තං විසටා ආයූහනී[6] දුතියා පණිධි භවනෙත්ති වනං වනථො සන්ථවො සිනෙහො අපෙක්ඛා පටිබන්ධු[7] ආසා ආසිංසනා ආසිංසිතත්තං, රූපාසා සද්දාසා ගන්ධාසා රසාසා ඵොට්ඨබ්බාසා ලාභාසා ධනාසා පුත්තාසා ජීවිතාසා, ජප්පා පජප්පා අභිජප්පා ජප්පනා ජප්පිතත්තං ලොලුප්පං ලොලුප්පායනා ලොලුප්පායිතත්තං පුච්ඡඤ්ජිකතා සාධුකම්‍යතා, අධම්මරාගො විසමලොභො නිකන්ති නිකාමනා පත්ථනා පිහනා සම්පත්ථනා, කාමතණ්හා භවතණ්හා විභවතණ්හා රූපතණ්හා අරූපතණ්හා නිරොධතණ්හා, රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා, ඔඝො යොගො ගන්ථො උපාදානං ආවරණං නීවරණං ඡදනං බන්ධනං උපක්කිලෙසො අනුසයො පරියුට්ඨානං ලතා වෙවිච්ඡං, දුක්ඛමූලං දුක්ඛනිදානං දුක්ඛප්පභවො මාරපාසො මාරබලිසං මාරවිසයො තණ්හානදී තණ්හාජාලං තණ්හාගද්දුලං තණ්හාසමුද්දො, අභිජ්ඣා විසමලොභො අකුසලමූලං.

---

1. දුච්චජ්ජා - සීමු. II. මජසං, 2. දුප්පරිච්චජ්ජා - සීමු. II. මජසං.
3. දුන්නිම්මද - සීමු. I. මජසං. 4. ඉච්ඡති - සයා සීමු. I. ස.
5. රොධො පලිරොධො - සක. 6. ආයූහිනී - සීමු. I. මජසං.
7. පටිබන්ධො - සීමු I. සයා. මජසං.

* ජාතකපාළි - අට්ඨකවග්ග - ගඞ්ගමාලජාතකං.

1. "කාමය, තාගේ මුල දිටිමි. කාමය, තෝ සංකල්පයෙන් උපදනෙහි. දැන් මම තා නො පතමි. කාමය, තෝ මෙසෙයින් නූපදනෙහි" යයි.

මොහු කෙලශකාමයෝ යැයි කියනු ලැබෙත්.

**ලොකෙ** – අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි ය; **කාමා හි ලොකෙ න හි සුප්පහායා** – යම් හෙයකින් කාමයෝ ලොව්හි දුකසේ ප්‍රහීණ කළ යුත්තාහු ද දුකසේ හළ යුත්තාහු ද දුකසේ පරිත්‍යාග කළ යුත්තාහු ද දුකසේ තිමිද කළ යුත්තාහු ද දුකසේ මිදිය යුත්තාහු ද දුකසේ විනිර්වෙෂ්ටන කළ යුත්තාහු ද දුස්තර වූවාහු ද වෙසෙසින් දුස්තර වූවාහු ද දුස්සමතික්‍රම වූවාහු ද දුර්විනිවර්ති වූවාහු ද, එහෙයින් 'කාමා හි ලොකෙ න හි සුප්පහායා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සත්තො ගුහායං –පෙ– න හි සුප්පහායා" යි.

2 – 2

කාමතෘෂ්ණාව නිදාන කොට ඇති භවසුඛයෙහි බැඳුණු, යළි අනාගතයෙහි හෝ අතීතයෙහි හෝ වස්තුකාමයන් කැමැති වන, මේ ප්‍රත්‍යුත්පන්න කාමයන් හෝ යට දැක්වූ අතීතානාගතකාමයන් හෝ ප්‍රාර්ථනා කරන ඒ සත්ත්වයෝ දුකසේ මිදියැ යුත්තාහ. අනෙකක්හු විසින් නො මැ මුදනු හැක්කාහු වෙත්.

**ඉච්ඡානිදානා භවසාතබද්ධා** – 'ඉච්ඡා' යි තෘෂ්ණාව කියනු ලැබේ: යම් රාගයෙක් සංරාගයෙක් අනුනයෙක් අනුරොධයෙක් නන්දියෙක් නන්දිරාගයෙක් චිත්තයාගේ සංරාගයෙක් ඉච්ඡාවක් මූර්ඡාවක් අධ්‍යවසානයෙක් ගෙධයෙක් පරිගෙධයෙක් සඞ්ගයෙක් පඞ්කයෙක් එජාවක් මායාවක් (සසර උපදවන) ජනිකාවක් සංජනනියක් සිබ්බනියක් (බැඳීමෙක්) ජාලිනියක් සරිතාවක් විසත්තිකාවක් (බඳනා හෙයින්) සූත්‍රයෙක් (රූපාදියෙහි පතළ හෙයින්) විසතාවක් අයූහනය කරවීමෙක් ද්විතියාවක් ප්‍රණිධියක් භවනෙත්තියක් (ගහනහෙයින්) වනයෙක් වනථයෙක් තෘෂ්ණාසන්ථවයෙක් ස්නෙහයෙක් අපෙක්ෂාවක් (අරමුණෙහි බඳනා හෙයින්) ප්‍රතිබන්ධුයෙක් ආශාවක් ආශංසනාවක් ආශංසිත බවෙක් රූපාශාවක් ශබ්දාශාවක් ගන්ධාශාවක් රසාශාවක් ස්ප්‍රෂ්ටව්‍යාශාවක් ලාභාශාවක් ධනාශාවක් පුත්‍රාශාවක් ජීවිතාශාවක්, (තෘෂ්ණා වශයෙන්) ජල්පනයෙක් ජල්පනාකාරයෙක් ජල්පිත බවෙක් ලොල් බවෙක් ලෞල්‍යාකාරයෙක් ලෞල්‍යසමඞ්ගී බවෙක් පුච්ඡඤ්ජිකා (නගුට සලන = ලාභයෙහි සැලෙන) බවෙක් මධුරකාම්‍යතාවක්, අධර්මරාගයෙක් විෂමලොභයෙක් නිකාන්තියෙක් කැමැතිවන ආකාරයෙක් ප්‍රාර්ථනාවක් පිහායනයෙක් සම්ප්‍රාර්ථනාවක්, කාමතෘෂ්ණාවක් භවතෘෂ්ණාවක් විභවතෘෂ්ණාවක් රූප (භව) තෘෂ්ණාවක් අරූපතෘෂ්ණාවක් නිරොධතෘෂ්ණාවක්, රූප (යෙහි) තෘෂ්ණාවක් ශබ්දතෘෂ්ණාවක් ගන්ධතෘෂ්ණාවක් රසතෘෂ්ණාවක් ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාවක් ධර්මතෘෂ්ණාවක්, (තෘෂ්ණා) ඕඝයෙක් යොගයෙක් ග්‍රන්ථයෙක් උපාදානයෙක් ආවරණයෙක් නීවරණයෙක් ඡදනයෙක් බන්ධනයෙක් උපකෙලශයෙක් අනුශයයෙක් පර්‍ය්‍යුත්ථානයෙක් ලතාවක් විවිධෙච්ඡාවක්, දුඃඛමූලයෙක් දුඃඛනිදානයෙක් දුඃඛප්‍රභවයෙක් මාරපාශයෙක් මාරබලිසයෙක් මාරවිෂයයෙක් තෘෂ්ණානදියෙක් තෘෂ්ණාජාලයෙක් තෘෂ්ණාගර්දුලයෙක් තෘෂ්ණාසමුද්‍රයෙක්, අභිධ්‍යාවක් විෂමලොභයෙක් අකුශලමූලයෙක් වේ ද එය යි.

**ඉච්ඡානිදානාති** - ඉච්ඡානිදානා ඉච්ඡාහෙතුකා ඉච්ඡාපච්චයා ඉච්ඡාකාරණා ඉච්ඡාපභවාති ඉච්ඡානිදානා.

**භවසාතබද්ධාති** - එකං භවසාතං: සුඛා වෙදනා, ද්වෙ භවසාතානි: සුඛා ච වෙදනා ඉට්ඨං ච වත්ථු. තීණි භවසාතානි: යොබ්බඤ්ඤං ආරොග්‍යං ජීවිතං. චත්තාරි භවසාතානි: ලාභො යසො පසංසා සුඛං. පඤ්ච භවසාතානි: මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා. ඡ භවසාතානි: චක්ඛුසම්පදා සොතසම්පදා ඝානසම්පදා ජිව්හාසම්පදා කායසම්පදා මනොසම්පදා. **භවසාතබද්ධාති** - සුඛාය වෙදනාය සත්තා බද්ධා ඉට්ඨස්මිං වත්ථුස්මිං, යොබ්බඤ්ඤෙ බද්ධා, ආරොග්‍යෙ බද්ධා, ජීවිතෙ බද්ධා, ලාභෙ බද්ධා, යසෙ බද්ධා, පසංසාය බද්ධා, සුඛෙ බද්ධා, මනාපිකෙසු රූපෙසු බද්ධා, මනාපිකෙසු සද්දෙසු-ගන්ධෙසු-රසෙසු-මනාපිකෙසු ඵොට්ඨබ්බෙසු බද්ධා, චක්ඛුසම්පදාය බද්ධා, සොතසම්පදාය බද්ධා, ඝාන-ජිව්හා-කාය-මනොසම්පදාය බද්ධා, විබද්ධා ආබද්ධා ලග්ගා ලග්ගිතා පලිබද්ධාති 'ඉච්ඡා නිදානා භවසාතබද්ධා.'

**තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛාති** - තෙ වා භවසාතවත්ථූ දුප්පමුඤ්චා, සත්තා[1] වා එතෙනා දුම්මොචයා. කථං තෙ භවසාතවත්ථූ දුප්පමුඤ්චා[2]? සුඛා වෙදනා දුප්පමුඤ්චා, ඉට්ඨං වත්ථු දුප්පමුඤ්චං, යොබ්බඤ්ඤං දුප්පමුඤ්චං, ආරොග්‍යං දුප්පමුඤ්චං, ජීවිතං දුප්පමුඤ්චං, ලාභො දුප්පමුඤ්චො, යසො දුප්පමුඤ්චො, පසංසා දුප්පමුඤ්චා, සුඛං දුප්පමුඤ්චං, මනාපිකා රූපා දුප්පමුඤ්චා, මනාපිකා සද්දා-ගන්ධා-රසා-ඵොට්ඨබ්බා දුප්පමුඤ්චා, චක්ඛුසම්පදා දුප්පමුඤ්චා, සොත-ඝාන-ජිව්හා-කාය-මනොසම්පදා දුප්පමුඤ්චා, දුම්මොචයා දුප්පමොචයා දුන්නිවෙඨයා දුබ්බිනිවෙඨයා, දුත්තරා දුප්පතරා දුස්සමතික්කමා දුබ්බිතිවත්තා. එවං තෙ භවසාතවත්ථූ දුප්පමුඤ්චා.

කථං සත්තා එතෙනා දුම්මොචයා? සුඛාය වෙදනාය සත්තා දුම්මොචයා, ඉට්ඨස්මා වත්ථුස්මා දුම්මොචයා, යොබ්බඤ්ඤා දුම්මොචයා, ආරොග්‍යා දුම්මොචයා, ජීවිතා දුම්මොචයා, ලාභා දුම්මොචයා, යසා දුම්මොචයා, පසංසාය දුම්මොචයා, සුඛා දුම්මොචයා, මනාපිකෙහි රූපෙහි දුම්මොචයා ,මනාපිකෙහි සද්දෙහි-ගන්ධෙහි-රසෙහි-ඵොට්ඨබ්බෙහි දුම්මොචයා, චක්ඛුසම්පදාය දුම්මොචයා, සොත-ඝාන-ජිව්හා-කාය-මනොසම්පදාය දුම්මොචයා දුප්පමොචයා දුරුද්ධරා[3] දුස්සමුද්ධරා දුබ්බුට්ඨාපයා දුස්සමුට්ඨාපයා දුන්නිවෙඨයා දුබ්බිනිවෙඨයා දුත්තරා දුප්පතරා දුස්සමතික්කමා දුබ්බිතිවත්තා. එවං සත්තා එතෙනා[4] දුම්මොචයාති 'තෙ දුප්පමුඤ්චා.'

**න හි අඤ්ඤමොක්ඛාති** - තෙ අත්තනා පලිපපලිපන්නා න සක්කොන්ති පරං පලිපපලිපන්නං උද්ධරිතුං.

---

1. සත්තො - සීමු. I. 2. 'දුම්මුඤ්චා' ඉති පිදිසෙසු අඤ්ඤත්‍රාපි - සස. මජසං.
3. දුද්ධරා - සීමු. I. සස. මජසං. 4. එතෙහි - සීමු. I.

**ඉච්ඡානිදානා** – ඉච්ඡාව නිදාන කොට ඇත්තාහු ඉච්ඡාව හේතු කොට ඇත්තාහු ඉච්ඡාව ප්‍රත්‍යය කොට ඇත්තාහු ඉච්ඡාව කාරණ කොට ඇත්තාහු ඉච්ඡාව ප්‍රභව කොට ඇත්තාහු නුයි 'ඉච්ඡානිදාන' නම් වෙත්.

**භවසාතබද්ධා** – සුඛවේදනාව එක් භවසාතයෙක, සුඛවේදනාව ද ඉෂ්ටවස්තුව දැයි භවසාත දෙකෙක. යෞවනය ආරෝග්‍යය හා ජීවිතය (ජීවිතෙන්ද්‍රිය පවත්නා බව) දැයි භවසාත තුනෙක. ලාභ යැ යශස් යැ ප්‍රශංසා යැ සුඛ යැයි භවසාත සතරෙක, මනාපික (මනවඩන) රූප යැ මනාපික ශබ්ද යැ මිනාපික ගන්ධ යැ මනාපික රස යැ මනාපික ස්ප්‍රෂ්ටව්‍ය යැයි භවසාත පසෙක, චක්ෂුඃසම්පත් යැ ශ්‍රොත්‍රසම්පත් යැ ඝ්‍රාණසම්පත් යැ ජිහ්වාසම්පත් යැ කායසම්පත් යැ මනස්සම්පත් යැයි භවසාත සයෙකි. භවසාතබද්ධා – සුඛවේදනාවෙන් ඉෂ්ටවස්තුයෙහි සත්ත්වයෝ බඳනා ලද්දූහ, යෞවනයෙහි බද්ධයහ, ආරෝග්‍යයෙහි බද්ධයහ, ජීවිතයෙහි – ලාභයෙහි – යශස්හි – ප්‍රශංසායෙහි – සුඛයෙහි බද්ධයහ, මනාපිකරූපයන්හි බද්ධයහ, මනාපික ශබ්ද – ගන්ධ – රස – මනාපික ස්ප්‍රෂ්ටව්‍යයන්හි බද්ධයහ, චක්ෂුඃසම්පත්හි බද්ධයහ, ශ්‍රොත්‍ර – ඝ්‍රාණ – ජිහ්වා – කාය– මනස්සම්පත්හි බද්ධයහ, වෙසෙසින් බැඳුණාහ. හාත්පසින් බැඳුණාහ, ලග්න වූහ, ලගිත වූහ, පරිබද්ධ වූවාහු නුයි 'ඉච්ඡානිදානා භවසාතබද්ධා' යනු වේ.

**තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා** – භවයෙහි ආස්වාදවස්තු වූ ඒ ධර්මයෝ හෝ දුකසේ හළ යුත්තාහ. සත්ත්වයෝ මැ හෝ තෙල භවසාත වස්තූහු කෙරෙන් දුර්මොචයෝ යි. ඒ භවයෙහි සාතවස්තූහු දුකසේ හළ යුත්තාහු කිසෙයින යත්: සුඛවේදනාව දුකසේ මිදිය යුත්තී යැ, ඉෂ්ටවස්තුව දුකසේ හළ යුතු යැ, යෞවනය – ආරෝග්‍යය – ජීවිතය – ලාභය – යශස් – ප්‍රශංසාව – සුඛය දුකසේ හළ යුතු යැ, මනාපික රූපයෝ දුස්ප්‍රමුච්‍යයෝ යැ, මනාපික ශබ්දයෝ – ගන්ධයෝ – රසයෝ – ස්ප්‍රෂ්ටව්‍යයෝ දුස්ප්‍රමුච්‍යයහ, චක්ෂුස්සම්පද් දුස්ප්‍රමුච්‍ය යැ, ශ්‍රොත්‍ර - ඝ්‍රාණ – ජිහ්වා – කාය – මනස්සම්පද් දුස්ප්‍රමුච්‍ය යැ, දුර්මොච යැ, දුර්නිවෙෂ්ට යැ, දුර්විනිවෙෂ්ට යැ, දුස්තර යැ, දුස්ප්‍රතර යැ, දුස්සමතික්‍රම යැ, දුර්විනිවත් යි. මෙසේ ඒ භවසාත වස්තූහු දුකසේ මිදියැ යුත්තාහ.

සත්ත්වයෝ තෙල වස්තුයෙන් දුකසේ මිදියැ යුත්තාහු කිසෙයින යත්: සුඛවේදනායෙන් සත්ත්වයෝ දුකසේ මිදියැ යුත්තාහ, ඉෂ්ටවස්තූහු කෙරෙන්– යෞවනයෙන් – ආරෝග්‍යයෙන් – ජීවිතයෙන් – ලාභයෙන් – යශසින් – ප්‍රශංසායෙන් – සුවයෙන් දුකසේ මිදිය යුත්තාහ, මනවඩන රූපයෙන් – ශබ්දයෙන් – ගන්ධයෙන් – රසයෙන් – ස්ප්‍රෂ්ටව්‍යයෙන් දුර්මොචයෝ යැ, චක්ෂුස්සම්පත්තියෙන් – ශ්‍රොත්‍ර – ඝ්‍රාණ – ජිහ්වා – කාය – මනස්සම්පත්තියෙන් දුර්මොචයෝ යැ, අතිශයින් නොමිදිය හැක්කාහ, නො නැඟිය හැක්කාහ, අතිශයින් නො නඟා සිටුවිය හැක්කාහ, දුර්නිවෙෂ්ටයෝ යැ, දුර්විනිවෙෂ්ටයෝ යැ, දුස්තාරයෝ යැ, අතිශයින් දුස්තරයෝ යැ, නො ඉක්මවිය හැක්කාහ, නො නැවැත්විය හැක්කාහුයැ. මෙසේ සත්ත්වයෝ තෙල සාතවස්තු කෙරෙන් නො මිදිය හැක්කාහු නුයි 'තෙ දුප්පමුඤ්චා' යනු වේ.

**න හි අඤ්ඤමොක්ඛා** – ඔවුහු තමන් මහමඩෙහි ගැලුණාහු මහමඩෙහි ගැලුණු අනෙකකුහු නඟාසිටුවන්නට නො හැකි වෙත්.

වුත්තං හෙතං භගවතා:

"සො වත චුන්ද, අත්තනා පලිපපලිපන්නො පරං පලිපපලිපන්නං උද්ධරිස්සතීති නෙතං ඨානං විජ්ජති. සො වත චුන්ද, අත්තනා අදන්තො අවිනීතො අපරිනිබ්බුතො[1] පරං දමෙස්සති විනෙස්සති පරිනිබ්බාපෙස්සතීති නෙතං ඨානං විජ්ජතී"[a]ති එවම්පි න හි අඤ්ඤමොක්ඛා. අථවා නාඤ්ඤෙසං කොචි මොචෙති. තෙ යදි[2] මුඤ්චෙය්‍යුං, සකෙන ථාමෙන සකෙන බලෙන සකෙන විරියෙන සකෙන පරක්කමෙන සකෙන පුරිසථාමෙන සකෙන පුරිසබලෙන සකෙන පුරිසවිරියෙන සකෙන පුරිසපරක්කමෙන අත්තනා සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං පටිපජ්ජමානා මුඤ්චෙය්‍යුන්ති එවම්පි න හි අඤ්ඤමොක්ඛා.

වුත්තම්පි හෙතං භගවතා:

1. "නාහං සහිස්සාමි පමොචනාය
කථංකථිං[3] ධොතක කිඤ්චි ලොකෙ,
ධම්මං ච සෙට්ඨං අභිජානමානො
එවං තුවං ඕඝමිමං තරෙසී"[b]ති.

එවම්පි න හි අඤ්ඤමොක්ඛා.

වුත්තං හෙතං භගවතා:

2. "අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති,
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති;
සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤමඤ්ඤො[4] විසොධයෙ"[c]ති.

එවම්පි න හි අඤ්ඤමොක්ඛා.

වුත්තම්පි හෙතං භගවතා:

"එවමෙව ඛො බ්‍රාහ්මණ තිට්ඨතෙව නිබ්බානං තිට්ඨති නිබ්බානගාමී[5] මග්ගො, තිට්ඨාමහං සමාදපෙතා. අථ ච පන මම සාවකා මයා එවං ඔවදියමානා එවං අනුසාසියමානා අප්පෙකච්චෙ අච්චන්තනිට්ඨං නිබ්බානං ආරාධෙන්ති. එකච්චෙ නාරාධෙන්ති. එත්ථ ක්‍යාහං බ්‍රාහ්මණ කරොමි, මග්ගක්ඛායී බ්‍රාහ්මණ තථාගතො. මග්ගං බුද්ධො ආචික්ඛති. අත්තනා පටිපජ්ජමානා මුඤ්චෙය්‍යු"[d]න්ති. එවම්පි න හි අඤ්ඤමොක්ඛාති 'තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා.'

1 අපිරිනිබ්බුතො ච, - සීමු. II. 2. යදි පරං - සීමු I.
3. කථං කථී - සීමු I 4 න අඤ්ඤෙ, අඤ්ඤං සී. I. - සීමු. I. සභා. I.
5 නිබ්බානගාමිනි - සීමු. I.

a. මජ්ඣිමනිකාය - සල්ලෙඛසුත්තං.
b සුත්තනිපාත - ධොතකසුත්තං.
c ධම්මපද - අත්තවග්ග
d. මජ්ඣිමනිකාය - උපරිපණ්ණාසක - ගණකමොග්ගල්ලානසුත්තං.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

"චුන්දය, යමෙක් තෙමේ ගැඹුරු (මඩ) මඩෙහි ගැලුණේ ද හෙතෙම ඒකාන්තයෙන් ගැඹුරු මඩෙහි ගැලුණු අනෙකක්හු නඟාසිටුවන්නේ යැ යන මේ කාරණය නො වෙයි. චුන්දය, යමෙක්තෙමේ නො දැමුණේ නො හික්මුණේ කෙලෙස් පිරිනිවා නිත් නො පිරිනිවියේ ත් වේ නම් හෙතම ඒකාන්තයෙන් අනෙකක්හු දමන්නේ යැ හික්මවන්නේ යැ පිරිනිවන්-නේ යැ යන මෙ කරුණ නො වේ" යයි. මෙසේ ත් අනෙකක් හු විසින් නො මිදියැ හෙන්නාන. නොහොත් මුදවන අන් කිසිවෙක් නැත. ඉදින් ඔහු මිදෙන්නාහු නම්, සවකීය (ඥත) ශක්තියෙන් සවකීය බලයෙන් සවකීය වීර්යයෙන් සවකීය පරාක්‍රමයෙන් සවකීය පුරුෂශක්තියෙන් සවකීය පුරුෂබලයෙන් සවකීය පුරුෂවීර්යයෙන් සවකීය පුරුෂපරාක්‍රම-යෙන් තමා විසින් සම්‍යක්ප්‍රතිපදාවට අනුලෝමප්‍රතිපදාවට අවිරුද්ධ-ප්‍රතිපදාවට අන්වර්ථප්‍රතිපදාවට ධර්මානුධර්මප්‍රතිපදාවට පිළිපදනාහු මිදෙන්නාහු නුයි 'න හි අඤ්ඤමොක්ඛා' යනු වේ.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

1. "ධොතකය, මම් ලොවිහි කාඞ්ක්‍ෂා සහිත වූ කිසිවක්හු මුදන්නට නො හැකි වෙමි. (වෑයම් නොකරමි.) උත්තම ධර්මය විශිෂ්ටඥානයෙන් අවබොධ කෙරෙමින් මෙසේ තෝ මේ චතුරෝඝය තරණය කෙරෙහි" යයි මෙසේ ත් අනෙකක්හු විසින් නො මැ මිදිය හැක්කාන.

මේ වදාරනලද මැයි භාග්‍යවතුන් විසින්:

2. "යමක්හු විසින් තමා මැ පව්කම් කරන ලද ද, හෙතෙම සිවුඅපාදුක් විඳිනුයේ තෙමේ මැ කෙලෙසෙයි. යළි යමක්හු විසින් තමා පව්කම් නො කරන ලද ද, හෙතෙම සුගතියට පැමිණියේ තෙමේ මැ විශුද්ධ වෙයි. කුශලාකුශලකර්මසඞ්ඛ්‍යාත ශුද්ධිය ද අශුද්ධි ය ද කාරකසන්තානයෙහි - තමා කෙරෙහි විවා දනවයි. අනෙකෙක් අනෙකක්හු විශුද්ධ නො කෙරේ" යයි. මෙසේ ත් අනෙකක්හු විසින් නො මැ මිදියැ හෙන්නාහ.

මේ වදාරන ලද මැයි භාග්‍යවතුන් විසින්:

"එසෙයින් මැ බමුණ, අමාමහනිවන ඇත් මැය. (පූර්වභාගවිදර්ශනා-දියෙහි පටන්) නිවනට පමුණුවන ආර්යමාර්ගය ඇත. සමාදන් කරවන (පිළිවෙතැ පිහිටුවන) මම් සිටිම් මැය. එතෙකුදු වුවත් මාගේ සව්වෝ මා විසින් මෙසේ අවවාද කරනු ලබන්නාහු මෙසේ අනුශාසනා කරනු ලබන්නාහු ඇතැම් කෙනෙක් මැ අත්‍යන්තනිෂ්ඨාව වූ නිවන සම්පාදනය කෙරෙති. ඇතැම් කෙනෙක් සම්පාදනය නො කෙරෙත්. මෙහි ලා (මොවුන් කෙරෙහි) බමුණ, මම් කුමක් කෙරෙම් ද, බමුණ, තථාගතයෝ පිළිවෙත් මග කියන සුල්ලහ. බුදුහු මාර්ගය ප්‍රකාශ කෙරෙත්. තුමූ පිළිවෙත්හි පිළිපදිමින් මිදෙන්නාහ" යි මෙසේත් අනෙකක්හු විසින් නො මැ මිදිය හැක්කාහු නුයි 'නෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා' යනු වේ.

**පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානාති** - පච්ඡා වුච්චති අනාගතං. පුරෙ වුච්චති අතීතං. අපි ච අතීතං උපාදාය අනාගතඤ්ච පච්චුප්පන්නඤ්ච පච්ඡා, අනාගතං උපාදාය අතීතඤ්ච පච්චුප්පන්නඤ්ච පුරෙ. කථං පුරෙ අපෙක්ඛං කරොති? එවංරූපො[1] අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවංවෙදනො අහොසිං -පෙ- එවංසඤ්ඤො අහොසිං -පෙ- එවංසංඛාරො අහොසිං -පෙ- එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවම්පි පුරෙ අපෙක්ඛං කරොති. අථ වා- ඉති මෙ චක්ඛු අහොසි අතීතමද්ධානං ඉති රූපාති, තත්ථ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පුරෙ අපෙක්ඛං කරොති. අථ වා-ඉති මෙ සොතං අහොසි අතීතමද්ධානං ඉති සද්දාති -පෙ- ඉති මෙ ඝානං අහොසි අතීතමද්ධානං ඉති ගන්ධාති -පෙ- ඉති මෙ ජිව්හා අහොසි අතීතමද්ධානං ඉති රසාති -පෙ- ඉති මෙ කායො අහොසි අතීතමද්ධානං ඉති ඵොට්ඨබ්බාති -පෙ- ඉති මෙ මනො අහොසි අතීතමද්ධානං ඉති ධම්මාති, තත්ථ ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං. ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පුරෙ අපෙක්ඛං කරොති. අථවා යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිතලපිතකීළිතානි, තදස්සාදෙති තං නිකාමෙති තෙන ච විත්තිං ආපජ්ජති. එවම්පි පුරෙ අපෙක්ඛං කරොති.

කථං[2] පච්ඡා අපෙක්ඛං කරොති? එවංරූපො සියං[3] අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවංවෙදනො සියං[3] -පෙ- එවංසඤ්ඤො සියං[3], -පෙ- එවංසංඛාරො[4] සියං[3] -පෙ- එවංවිඤ්ඤාණො සියං[3] අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවම්පි පච්ඡා අපෙක්ඛං කරොති. අථවා - ඉති මෙ චක්ඛු සියා අනාගතමද්ධානං ඉති රූපාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං පණිදහති. චෙතසො පණිධානපච්චයා තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පච්ඡා අපෙක්ඛං කරොති. අථවා - ඉති මෙ සොතං සියා අනාගතමද්ධානං ඉති සද්දාති -පෙ- ඉති මෙ ඝානං සියා අනාගතමද්ධානං ඉති ගන්ධාති -පෙ- ඉති මෙ ජිව්හා සියා අනාගතමද්ධානං ඉති රසාති -පෙ- ඉති මෙ කායො සියා අනාගතමද්ධානං ඉති ඵොට්ඨබ්බාති -පෙ- ඉති මෙ මනො සියා අනාගතමද්ධානං ඉති ධම්මාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං පණිදහති. චෙතසො පණිධානපච්චයා තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පච්ඡා අපෙක්ඛං කරොති. අථවා - ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වාති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං පණිදහති. චෙතසො පණිධානපච්චයා තදභිනන්දති. තදභිනන්දන්තො එවම්පි පච්ඡා අපෙක්ඛං කරොතීති-පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානා.

---

1. එවරූපො - ස. 2. කථම්පන - සීමු. I. 3. අහොසිං - සීමු. I.
4. එවං සඞ්ඛාරෙ - සීමු. I.

**පච්ඡා පුරෙ චාපි අපෙක්ඛමානා** – ‘පච්ඡා’ යි අනාගතය කියනු ලැබෙයි. ‘පුරෙ’ යි අතීතය කියනු ලැබේ. තවද අතීතය නිසා අනාගතයත් ප්‍රත්‍යුත්පන්නයත් ‘පච්ඡා’ නමැ, අනාගතය නිසා අතීතයත් ප්‍රත්‍යුත්පන්නයත් ‘පුරෙ’ නමැ. කිසෙයින් අතීතයෙහි අපෙක්‍ෂා කෙරෙයි යත්: අතීත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙකිම් වීම් යි ඒ අතීතරූපාරම්මණයෙහි තෘෂ්ණාව එලවයි. මෙබඳු වෙදනා ඇතියෙකිම් වීම් . . . මෙබඳු සංඥා ඇතියෙකිම් වීම් . . . මෙබඳු සංස්කාර ඇතියෙකිම් වීම් . . . මෙබඳු විඥාන ඇතියෙකිම් වීම් අතීත කලැ’ යි එහි තෘෂ්ණාව එලවයි. මෙසේත් අතීතයෙහි අපෙක්‍ෂාව කෙරෙයි. නොහොත් අතීතයෙහි මාගේ ඇස මෙබඳු විය, රූපයෝ මෙබඳු වූහ යි ඒ චක්‍ෂු රූපයන්හි විඥානය (ජවනචිත්තය) ඡන්දරාගයෙන් ඇලුණේ වෙයි. ඒ ජවනවිඥානය ඡන්දරාගයෙන් බැඳුණු හෙයින් ඒ අරමුණට තෘෂ්ණාවශයෙන් සතුටු වෙයි. එය තෘෂ්ණාවශයෙන් අභිනන්දනය කරණුයේ මෙසේත් අතීතයෙහි අපේක්‍ෂාව කෙරෙයි. නොහොත් අතීතයෙහි මාගේ කන මෙබඳු විය, ශබ්දයෝ මෙබඳු වූහ යි . . . අතීතයෙහි මාගේ ඝ්‍රාණය මෙබඳු විය, ගන්ධයෝ මෙබඳු වූහ යි . . . අතීතයෙහි මාගේ දිව මෙබඳු විය, රසයෝ මෙබඳු වූහ යි . . . අතීතයෙහි මාගේ කය මෙබඳු විය, ඵහස්හු මෙබඳු වූහ යි . . . අතීතකාලයෙහි මාගේ මනස මෙබඳු විය, ධර්මයෝ මෙබඳු වූහ යි ඒ මනොධර්මයන්හි ජවනවිඥානය ඡන්දරාගයෙන් බැඳුණේ වෙයි. විඥානය ඡන්දරාගයෙන් බැඳුණු හෙයින් ඒ අරමුණට තෘෂ්ණාවශයෙන් සතුටු වෙයි. ඊට සතුටු වනුයේ මෙසේත් අතීතයෙහි අපේක්‍ෂාව කෙරෙයි. නොහොත් පෙර ඔහුගේ මාගම සමග යම් ඒ හසිතලපිත ක්‍රීඩිතයෝ වූවාහු ද, එය ආස්වාදනය කෙරෙයි. එය කැමැති වෙයි. යළි එයින් සතුටට පැමිණෙයි. මෙසේත් අතීතයෙහි අපෙක්‍ෂාව කෙරේ.

කිසෙයින් අනාගතයෙහි අපේක්‍ෂාව කෙරෙයි යත්: අනාගතකාලයෙහි මෙබඳු රූ ඇති වෙම්ව යි ඒ අනාගතරූපයෙහි තෘෂ්ණාව එලවයි. මෙබඳු වේදනා ඇති වෙම්ව යි . . . මෙබඳු සංඥා ඇති වෙම්ව යි . . . මෙබඳු සංස්කාර ඇති වෙම්ව යි . . . අනාගතයෙහි මෙබඳු විඥාන ඇති වෙම්ව යි එහි තෘෂ්ණාව එලවයි. මෙසේත් අනාගතයෙහි අපේක්‍ෂාව කෙරෙයි. නොහොත් අනාගතයෙහි මට මෙබඳු ඇසෙක් වේවා, මෙබඳු රූපයෝ වෙත්ව යි නො ලැබුණු චක්‍ෂුරූපයන්ගේ ප්‍රතිලාභය පිණිස සිත පිහිටුවයි. සිත පිහිටුවීම හේතු කොටගෙන එය තෘෂ්ණාවශයෙන් අභිනන්දනය කෙරෙයි. එය අභිනන්දනය කරනුයේ මෙසේත් අනාගතාපේක්‍ෂාව කෙරෙයි. නොහොත් අනාගතයෙහි මට මෙබඳු කනෙක් වේවා, මෙබඳු ශබ්දයෝ වෙත්ව යි . . . අනාගතයෙහි මට මෙබඳු ඝ්‍රාණයෙක් වේවා, මෙබඳු ගන්ධයෝ වෙත්ව යි . . . අනාගතයෙහි මට මෙබඳු දිවක් වේවා, මෙබඳු රසයෝ වෙත්වයි . . . අනාගතයෙහි මට මෙබඳු කයෙක් වේවා, මෙබඳු ඵහස්හු වෙත්ව යි . . අනාගතයෙහි මට මෙබඳු මනසෙක් වේවා, මෙබඳු ධර්මයෝ වෙත්ව’ යි නො ලත් අරමුණු ලැබීම පිණිස සිත පිහිටුවයි. චිත්තප්‍රණිධානප්‍රත්‍යයෙන් ඒ අරමුණට සතුටු වෙයි. ඊට සතුටු වනුයේ මෙසේත් අනාගතාපෙක්‍ෂාව කෙරෙයි. නොහොත් මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍යයෙන් හෝ දෙවියෙක් හෝ දේවාන්‍යතරයෙක් වන්නෙමි යි නො ලත් අරමුණු ලැබීම පිණිස සිත පිහිටුවයි. සිත පිහිටුවීම් කරුණෙන් ඊට සතුටු වෙයි. ඊට සතුටු වනුයේ මෙසේත් අනාගතාපෙක්‍ෂාව කෙරේ නුයි ‘පච්ඡා පුරෙ චාපි අපෙක්ඛමානා’ යනු වේ.

**ඉමෙව කාමෙ පුරිමෙව ජප්පන්ති** - "ඉමෙව කාමෙ"ති පච්චුප්පන්නෙ පඤ්චකාමගුණෙ ඉච්ඡන්තා සාදියන්තා පත්ථයන්තා අභිජප්පන්තා. **පුරිමෙව ජප්පන්ති** - අතීතෙ පඤ්චකාමගුණෙ ජප්පන්තා පජප්පන්තා අභිජප්පන්තාති- 'ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං.'

තෙනාහ භගවා:

"ඉච්ඡානිදානා භවසාතබද්ධා
තෙ දුප්පමුඤ්චා න හි අඤ්ඤමොක්ඛා,
පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානා
ඉමෙව කාමෙ පුරිමෙව ජප්ප"න්ති.

## 2 - 3

කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා[1]
අවදානියා තෙ විසමෙ නිවිට්ඨා,
දුක්ඛූපනීතා පරිදෙවයන්ති
කිං සු භවිස්සාම ඉතො චුතා සෙ.

**කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හාති** - "කාමා" ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච - පෙ - ඉමෙ වුච්චන්ති වත්ථුකාමා. -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **ගෙධො** වුච්චති තණ්හා, යො රාගො සාරාගො-පෙ-අභිජ්ඣා ලොභො අකුසලමූලං; කිලෙසකාමෙන වත්ථුකාමෙසු රත්තා ගිද්ධා ගධිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති- කාමෙසු ගිද්ධා. **පසුතාති** - යෙපි කාමෙ එසන්ති ගවෙසන්ති පරියෙසන්ති තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ එසන්ති ගවෙසන්ති පරියෙසන්ති -පෙ- සද්දෙ -පෙ- ගන්ධෙ -පෙ- රසෙ -පෙ- ඵොට්ඨබ්බෙ -පෙ- පරියෙසන්ති තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ පටිලභන්ති -පෙ- ඵොට්ඨබ්බෙ පටිලභන්ති තච්චරිතා -පෙ-තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ පරිභුඤ්ජන්ති-පෙ-ඵොට්ඨබ්බෙ පරිභුඤ්ජන්ති තච්චරිතා-පෙ-තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යථා කලහකාරකො කලහපසුතො, කම්මකාරකො කම්මපසුතො, ගොචරෙ චරන්තො ගොචරපසුතො, ඣායී ඣානපසුතො, එවමෙවං යෙපි කාමෙ එසන්ති ගවෙසන්ති තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා.

1. සම්මූළ්හා - ස

**ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං** – 'ඉමෙව කාමෙ' යනු: ප්‍රත්‍යුත්පන්න පඤ්චකාමගුණයන් කැමැති වන්නාහු ඉච්ඡන්නාහු පතන්නාහු රුචි වන්නාහු වෙසෙසින් ගුණ කියන්නාහු; **පුරිමෙව ජප්පං** – අතීතපඤ්චකාම-ගුණයන් (ගුණවශයෙන්) කියන්නාහු ප්‍රකාරයෙන් කියන්නාහු වෙසෙසින් කියන්නාහු නුයි 'ඉමෙව කාමෙ පුරිමෙව ජප්පං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ඉච්ඡානිදානා -පෙ- පුරිමෙව ජප්පං"යි.

**2 - 8**

ඔහු කෙලෙශකාමයෙන් වස්තුකාමයෙහි ගිජු වූවාහු යෙදුණාහු සම්මොහයට පැමිණියාහු නිරයට යන්නාහු මසුරු වූවාහු හෝ බුද්ධාදීන්ගේ අවවාද නො ගන්නාහු කායවිෂමාදි විෂමයෙහි පිහිටියාහු මරණදුකට පැමිණියාහු 'මෙයින් සැව පරලොව ගියමෝ කුමක් වනුමෝ හො'යි පරිදෙවනා කෙරෙත්.

**කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා** – 'කාම' නම් උදෘත හෙයින් කාමයෝ දෙදෙනෙකි. වස්තුකාමයෝ ද කෙලෙශකාමයෝ දැයි ... මොහු වස්තුකාමයෝ යැයි කියනු ලැබෙත්. ... මොහු කෙලෙශකාමයෝ යැයි කියනු ලැබෙත්. **ගෙධ** යි තෘෂ්ණාව කියනු ලබා; යම් රාගයෙක් සංරාගයෙක් ... අභිධ්‍යාවක් ලොභඅකුශලමූලයෙක් වේ ද, එය යි. කෙලෙශකාමයෙන් වස්තුකාමයන්හි ඇලුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු බැසගන්නාහු ලැගුණාහු එක් වූවාහු හාත්පසින් බැඳුණාහු නුයි 'කාමෙසු ගිද්ධා' යනු වේ. **පසුතා** – යම් කෙනෙක් කාමයන් එෂණ – ගවෙෂණ – පයෙෂීෂණ කෙරෙත් ද, ඒ කාමයන් පිණිස හැසිරෙන්නාහු තද්බහුල වූවාහු තද්ගුරුක වූවාහු ඊට නැමුණාහු ඊට නැඹුරු වූවාහු ඊට බර වූවාහු එහි වැතුරුණාහු එය අධිපති කොට ඇත්තාහු වෙත් නම්, ඔහු ද කාමපසු-තයෝ යැ. යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් එෂණ – ගවෙෂණ-පයෙෂීෂණ කෙරෙත් ද, . . . ශබ්දයන් . . . ගන්ධයන් . . . රසයන් . . . ස්ප්‍රෂ්ටව්‍යයන් එෂණ – ගවෙෂණ – පයෙෂීෂණ කෙරෙත් ද, තච්චරිත තද්බහුල තද්ගුරුක තන්නින්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත වූවාහු තදධිපත්‍ය කොට ඇත්තාහු වෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ. යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් ලබත් ද (අත්පත් කෙරෙත් ද) . . . ස්ප්‍රෂ්ටව්‍යයන් තෘෂ්ණාවශයෙන් ලබත් ද, තච්චරිත . . . තදධිපතිත්ව කොට ඇත්තාහු වෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ; යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් පරිභොග කෙරෙත් ද, ...ස්ප්‍රෂ්ටව්‍යයන් පරිභොග කෙරෙත් ද, තච්චරිත වූවාහු. . . තදධිපතිත්ව කොට ඇත්තාහු වෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ. යම්සේ කලහ කරනුයේ කලහපසුත වේ ද, කර්මාන්ත කරනුයේ කම්මපසුත වේ ද, ගොචරයෙහි හැසිරෙනුයේ ගොචර-පසුත වේ ද, ධ්‍යාන ඇතියේ ඣානපසුත වේ ද, එසෙයින් මැ යම් කෙනෙක් කාමයන් එෂණ ගවෙෂණ පයෙෂීෂණ කෙරෙත් නම්, ඒ පිණිස හැසිරෙත් නම්, එය බහුල කොට එය ගරු කොට ඊට නිම්න ව ඊට ප්‍රවණ ව ඊට බර ව එහි වැතිර එය අධිපති කොට වෙසෙත් නම්, ඔහු ද කාමපසුතයෝ යැ.

යෙපි තණ්හාවසෙන රූපෙ-පෙ-පරියෙසන්ති, සද්දෙ-පෙ-ගන්ධෙ-පෙ-රසෙ -පෙ-ඵොට්ඨබ්බෙ -පෙ- පරියෙසන්ති, තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ පටිලභන්ති, සද්දෙ- ගන්ධෙ- රසෙ- ඵොට්ඨබ්බෙ පටිලභන්ති, තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා. යෙපි තණ්හාවසෙන රූපෙ පරිභුඤ්ජන්ති, සද්දෙ- ගන්ධෙ- රසෙ- ඵොට්ඨබ්බෙ පරිභුඤ්ජන්ති, තච්චරිතා තබ්බහුලා තග්ගරුකා තන්නින්නා තප්පොණා තප්පබ්භාරා තදධිමුත්තා තදධිපතෙය්‍යා, තෙපි කාමපසුතා.

**පමූළ්හාති** - යෙභුය්‍යෙන දෙවමනුස්සා පඤ්චසු කාමගුණෙසු මුය්හන්ති පමුය්හන්ති සම්මුය්හන්ති සම්පමුය්හන්ති, මූළ්හා පමූළ්හා සම්මූළ්හා සම්පමූළ්හා, අවිජ්ජාය අන්ධීකතා, ආවුතා ඔවුතා පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතාති-කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා.

**අවදානියා තෙ විසමෙ නිවිට්ඨාති** - 'අවදානියා'ති අවංගච්ඡන්තී[1]-තිපි අවදානියා, මච්ඡරිනොපි වුච්චන්ති අවදානියා, බුද්ධානං බුද්ධසාවකානං වචනං ව්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං නාදියන්තීති අවදානියා. කථං අවංගච්ඡන්තීති අවදානියා? අවංගච්ඡන්තීති නිරයං ගච්ඡන්ති, පෙත්තිවිසයං ගච්ඡන්ති, එවං අවංගච්ඡන්තීති-අවදානියා. කථං මච්ඡරිනො වුච්චන්ති අවදානියා? පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං; යං එවරූපං මච්ඡරියං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං.[ඝ] අපි ච ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං ගාහො, ඉදං වුච්චති මච්ඡරියං. ඉමිනා මච්ඡරියෙන අවදඤ්ඤුතාය සමන්නාගතා ජනා පමත්තා, එවං මච්ඡරිනො වුච්චන්ති අවදානියා. කථං බුද්ධානං බුද්ධසාවකානං වචනං ව්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං නාදියන්තීති අවදානියා? බුද්ධානං බුද්ධසාවකානං වචනං ව්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං නාදියන්ති න සුස්සූසන්ති න සොතං ඔදහන්ති නාඤ්ඤා චිත්තං උපට්ඨපෙන්ති, අනස්සවා අවචනකරා පටිලොමවුත්තිනො අඤ්ඤෙනෙව මුඛං කරොන්ති. එවං බුද්ධානං බුද්ධසාවකානං වචනං ව්‍යප්පථං දෙසනං අනුසිට්ඨිං නාදියන්තීති අවදානියාති-අවදානියා.

---

1. අවගච්ඡන්ති සීමු. I.

ඝ. විභඞ්ගපාළි - ඛුද්දකවත්ථුවිභඞ්ග.

යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන්... පයේෂණ කෙරෙත් නම්, ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් ... සොයත් නම්, තච්චරිත තද්බහුල තද්ගුරුක තන්නිම්න තත්ප්‍රවණ තත්ප්‍රාග්භාර තදධිමුක්ත වෙත් නම්, එය අධිපති කොට ඇත්තාහු නම්, ඔහු ද කාමපසුතයෝ යෑ. යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් ප්‍රතිලාභ කෙරෙත් නම්, ශබ්ද-ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් ප්‍රතිලාභ කෙරෙත් නම්, තච්චරිත... තදධිමුක්ත වූවාහු තදධිපතිත්‍ව කොට ඇත්තාහු නම්, ඔහු ද කාමපසුතයෝ යෑ. යම් කෙනෙක් තෘෂ්ණාවශයෙන් රූපයන් පරිභොග කෙරෙත් නම්, ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් පරිභොග කෙරෙත් නම්, තච්චරිත තද්බහුල තද්ගුරුක තන්නිම්න තත්ප්‍රවණ තත් ප්‍රාග්භාර තදධිමුක්ත වූවාහු තදධිපතිත්‍ව කොට ඇත්තාහු නම්, ඔහු ද කාමපසුතයෝ යි.

**පමූළ්හා** – දෙවිම්තිස්හු බෙහෙවින් පස්කම්ගුණයෙහි මූළා වෙති, වෙසෙසින් මූළා වෙති, සම්මෝකාරයෙන් මූළා වෙත්. මූඪ වූවාහු ප්‍රමූඪ වූවාහු සම්මූඪ වූවාහු සම්ප්‍රමූඪ වූවාහු අවිද්‍යාවෙන් අන්ධ කරන ලද්දාහු අවුරන ලද්දාහු (ඇවුරුණාහු නැවැතුණාහු) වැතුරුණාහු වැසුණාහු පිළිසන් වූවාහු පිහිකුළු වූවාහු නුයි 'කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා' යනු වේ.

**අවදානියා තෙ විසමෙ නිවිට්ඨා** - 'අවදානියා' යනු: යටට (අපායට) යෙත් නුයි ද 'අවදානිය' නම් වෙත්: මසුරු වූවාහු ද 'අවදානිය' යි කියනු ලැබෙති. බුදුන්ගේ බුදුසව්වන්ගේ වදන වදන්මග දෙසුම අනුසස්න නො ගනිත් නුයි 'අවදානිය' නම් වෙත්. කිසෙයින් අපායට යෙත් නුයි 'අවදානිය' නම් වෙති යත්: 'අවං ගච්ඡන්ති' (අපායට යෙති) යනු: නිරයට යෙති, තිරිසන්යෝනියට යෙති, ප්‍රේතවිෂයට යෙති; මෙසේ අපායට යෙත් නුයි 'අවදානිය' නම් වෙත්. කිසෙයින් මත්සරීහු (=මසුරෝ) 'අවදානිය' යි කියනු ලැබෙති යත්: මාත්සර්‍ය්‍ය පසෙක: ආවාසමාත්සර්‍ය්‍ය යෑ, කුලමාත්සර්‍ය්‍ය යෑ, ලාභමාත්සර්‍ය්‍ය යෑ, වර්‍ණමාත්-සර්‍ය්‍ය යෑ, ධර්‍මමාත්සර්‍ය්‍ය යි. මෙ බඳු වූ යම් මසුරුකමක් මසුරුඅයුරක් මසුරුබවක් සිය සම්පත් සඟවනු කැමතිබවක් අනාර්‍ය්‍ය බවක් කටුක බැවින් සිත හකුළුවන බවක් සිත් නො ගත්බවක් වේ නම්, මෙය මාත්සර්‍ය්‍ය යි කියනු ලැබේ. තවද පඤ්චස්කන්ධයෙහි මසුරුබව ද 'මච්ඡරිය' නම, ධාතුමාත්සර්‍ය්‍යය ද . . . ආයතනමාත්සර්‍ය්‍යය ද 'මච්ඡරිය' නම, ග්‍රාහය ද 'මච්ඡරිය' නමි. මෙය මාත්සර්‍ය්‍ය යි කියනු ලැබේ. මේ මාත්සර්‍ය්‍ය හෙතුවෙන් බුදුවදන් නො දැනීමෙන් යුත් ජනයෝ ප්‍රමත්තයෝ යෑ. මෙසෙයින් මත්සරීහු 'අවදානිය' යි කියනු ලැබෙත්. කිසෙයින් බුදුන්ගේ බුදුසව්වන්ගේ වදන වදන්මග දෙසුම අනුසස්න නො ගනිත් නුයි 'අවදානිය' නම් වෙති යත් ? බුදුන්ගේ බුදුසව්වන්ගේ වදන වදන්මග දෙසුම අනුසස්න නො ගනිති, නො අසනු කැමති වෙති, කන නො නමති, දැනීමට සිත නො එලවති, අවවාද නො අසන්නාහු බස් පිළිගෙන නො කරන්නාහු පිළිලොම් වැ පවත්නාහු මුහුණ වෙනතක නමත්. මෙසෙයින් බුදුන්ගේ බුදුසව්වන්ගේ වදන වදන්මග දෙසුම අනුසස්න නො ගනිත් නුයි 'අවදානිය' නම් වෙත්.

**තෙ විසමෙ නිවිට්ඨාති** – ‘විසමෙ’ති විසමෙ කායකම්මෙ නිවිට්ඨා, විසමෙ වචීකම්මෙ නිවිට්ඨා, විසමෙ මනොකම්මෙ නිවිට්ඨා, විසමෙ පාණාතිපාතෙ නිවිට්ඨා, විසමෙ අදින්නාදානෙ නිවිට්ඨා, විසමෙ කාමෙසු මිච්ඡාචාරෙ නිවිට්ඨා, විසමෙ මුසාවාදෙ නිවිට්ඨා, විසමාය පිසුණාය වාචාය නිවිට්ඨා, විසමාය ඵරුසාය වාචාය නිවිට්ඨා, විසමෙ සම්ඵප්පලාපෙ නිවිට්ඨා, විසමාය අභිජ්ඣාය නිවිට්ඨා, විසමෙ ව්‍යාපාදෙ නිවිට්ඨා, විසමාය මිච්ඡාදිට්ඨියා නිවිට්ඨා, විසමෙසු සඞ්ඛාරෙසු නිවිට්ඨා, විසමෙසු පඤ්චසු කාමගුණෙසු නිවිට්ඨා, විසමෙසු පඤ්චසු නීවරණෙසු නිවිට්ඨා විනිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති– අවදානියා තෙ විසමෙ නිවිට්ඨා.

**දුක්ඛූපනීතා පරිදෙවයන්තීති** – ‘දුක්ඛූපනීතා’ති දුක්ඛප්පත්තා දුක්ඛසම්පත්තා දුක්ඛූපගතා, මාරප්පත්තා මාරසම්පත්තා මාරූපගතා, මරණප්පත්තා මරණසම්පත්තා මරණූපගතා; **පරිදෙවයන්තීති** – ලපන්ති[1] සල්ලපන්ති සොචන්ති කිලමන්ති පරිදෙවන්ති උරත්තාළිං කන්දන්ති සම්මොහං ආපජ්ජන්තීති ‘දුක්ඛූපනීතා පරිදෙවයන්ති.’

**කිං සු භවිස්සාම ඉතො චුතා සෙති** ඉතො චුතා කිං භවිස්සාම? නෙරයිකා භවිස්සාම? තිරච්ඡානයොනිකා භවිස්සාම? පෙත්තිවිසයිකා භවිස්සාම? මනුස්සා භවිස්සාම? දෙවා භවිස්සාම? රූපී භවිස්සාම? අරූපී භවිස්සාම? සඤ්ඤී භවිස්සාම? අසඤ්ඤී භවිස්සාම? නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සාම? භවිස්සාම නු ඛො මයං අනාගතමද්ධානං? න නු ඛො භවිස්සාම අනාගතමද්ධානං? කින්නු ඛො භවිස්සාම අනාගතමද්ධානං? කථන්නු ඛො භවිස්සාම අනාගතමද්ධානං? කිං හුත්වා කිං භවිස්සාම නු ඛො මයං අනාගතමද්ධානන්ති සංසයපක්ඛන්තා[2] විමතිපක්ඛන්තා ද්වෙළ්හකජාතා ලපන්ති සල්ලපන්ති[3] සොචන්ති කිලමන්ති පරිදෙවන්ති උරත්තාළිං කන්දන්ති සම්මොහං ආපජ්ජන්තීති ‘කිං සු භවිස්සාම ඉතො චුතා සෙ.’

තෙනාහ භගවා:

“කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා
අවදානියා තෙ විසමෙ නිවිට්ඨා,
දුක්ඛූපනීතා පරිදෙවයන්ති
කිං සු භවිස්සාම ඉතො චුතා සෙ”ති.

24

තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු
යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ,
න තස්ස හෙතු විසමං චරෙය්‍ය
අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා.

**තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තූති** – ‘තස්මා’ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා එතං ආදීනවං පස්සමානො කාමෙසූති තස්මා; **සික්ඛෙථාති** – තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා.

---

1. ලාලපන්ති – ස්‍යා. මජ්ඣං.
2. පක්ඛන්දන්තා – සීමු. I. පක්ඛන්තා – මජ්ඣං.
3. ලාලපන්ති – ස්‍යා. මජ්ඣං.

**තෙ විසමෙ නිවිට්ඨා** – 'විසමෙ' යනු: විෂම වූ කායකර්මයෙහි පිවිසියාහු, විෂම වූ වාක්කර්මයෙහි පිවිසියාහු, විෂම වූ මනඃකර්මයෙහි පිවිසියාහු, විෂම වූ ප්‍රාණඝාතයෙහි පිවිසියාහු, විෂම වූ අදත්තාදානයෙහි . . . විෂම වූ කාමමිථ්‍යාචාරයෙහි . . . විෂම වූ මෘෂාවාදයෙහි . . . විෂම වූ පෛශුන්‍ය වචනයෙහි . . . විෂම වූ පරුෂවචනයෙහි . . . විෂම වූ සම්පප්‍රලාපයෙහි . . . විෂම වූ අභිධ්‍යායෙහි . .. විෂම වූ මිථ්‍යාදෘෂ්ටියෙහි පිවිසියාහු, විෂම වූ කායාදි සංස්කාරයෙහි ... විෂම වූ පඤ්චකාමගුණයෙහි ... විෂම වූ පඤ්චනීවරණයෙහි පිවිසියාහු වෙසෙසින් පිවිසියාහු පිහිටියාහු ඇලුණාහු පැමිණියාහු පිවිස සිටියාහු බැසගත්තාහු ලැගුණාහු එක් වූවාහු පරිබද්ධ වූවාහු නුයි 'අවදානියා තෙ විසමෙ නිවිට්ඨා' යනු වේ.

**දුක්ඛූපනීතා පරිදෙවයන්ති** – 'දුක්ඛූපනීතා' යනු: දුකට පත් වූවාහු දුකට සැපත් වූවාහු දුකට පැමිණියාහු මරපත් වූවාහු මරසැපත් වූවාහු මාරොපගත වූවාහු මරණපත් වූවාහු මරණසැපත් වූවාහු මරණොපගත වූවාහු. **පරිදෙවයන්ති** යනු: බෙණෙති පුනපුනා බෙණෙති ශොක කෙරෙති වෙහෙසෙති වැලැපෙති ළෙහි පැහැර හඬති මුලාවට පැමිණෙත් නුයි 'දුක්ඛූපනීතා පරිදෙවයන්ති' යනු වේ.

**කිං සු භවිස්සාම ඉතො චුතා සෙ** – 'මෙයින් සැව (=මෙලොවින් චුත වැ) කුමක් වනුමෝ ද, නෙරිසන් වනුමෝ ද, තිරිසන්යෝනියෙහි උපදනුමෝ ද, මිනිස් වනුමෝ ද, දෙවි වනුමෝ ද, රූපභවයෙහි උපදනුමෝ ද, අරූපභවයෙහි උපදනුමෝ ද, සංඥීභවයෙහි උපදනුමෝ ද, අසංඥීභවයෙහි උපදනුමෝ ද, ඇපි අනාගතයෙහි වනුමෝ ද, අනාගතයෙහි නො වන්නමෝ ද, අනාගතයෙහි (ක්‍ෂත්‍රියාදීන් අතුරෙන්) කුමක් වනුමෝ ද, අනාගතයෙහි (දීර්ඝ-හ්‍රස්වාදි සටහන් වශයෙන්) කෙසේ වනුමෝ ද, අනාගතයෙහි ඇපි (ක්‍ෂත්‍රියාදීන් අතුරෙන්) කුමක් වැ (බ්‍රාහ්මණාදීන් අතුරෙන්) කුමක් වනුමෝ ද'යි සැකයට පැමිණියාහු විමතියට පැමිණියාහු හටගත් සැක ඇත්තාහු බෙණෙති පුනපුනා බෙණෙති ශොක කෙරෙති වෙහෙසෙති වැලැපෙති ළෙහි පැහැර හඬති මුලාවට පැමිණෙත් නුයි 'කිං සු භවිස්සාම ඉතො චුතා සෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"කාමෙසු ගිද්ධා –පෙ– ඉතො චුතා සෙ''යි.

## 2 – 4

යම් හෙයකින් සත්ත්ව තෙමේ ලෝකයෙහි යම්කිසි (නිරවශෙෂ වූ) කායදුශ්චරිතාදි විෂමය (විෂම කරන හෙයින්) විෂමයෙකැයි දන්නේ නම්, එහෙයින් ඒ විෂම වූ කායකර්මාදියට හෙතු වූ විෂමයෙහි නො හැසිරෙන්නේ යැ. යම් හෙයකින් ධීරයෝ මේ ජීවිතය අල්ප ය යි කියත් ද, එහෙයින් මේ ශාසනයෙහි මැ ත්‍රිවිධ ශික්‍ෂාවෙහි හික්මෙන්නේ යැ හෙවත් ත්‍රිවිධශික්‍ෂාව සමාදන් වැ පවත්නේ යි.

**තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු** – 'තස්මා' යනු: එහෙයින් ඒ කරුණෙන් ඒ හේතුවෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් පස්කම්හි දොෂ ආදීනවය දක්නේ නුයි **තස්මා** යනු වේ.

**'සික්ඛෙථ'** යනු: අධිශීලශික්‍ෂා යැ, අධිචිත්තශික්‍ෂා යැ, අධිප්‍රඥාශික්‍ෂා යැයි ශික්‍ෂා තුනෙකි.

කතමා අධිසීලසික්ඛා? ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛ-සංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. ඛුද්දකො සීලක්ඛන්ධො මහන්තො සීලක්ඛන්ධො, සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො මොක්ඛං කුසලානං ධම්මානං සමාපත්තියා. අයං අධිසීලසික්ඛා.

කතමා අධිචිත්තසික්ඛා? ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති සතො ච සම්පජානො සුඛං ච කායෙන පටිසංවෙදෙති, යං තං අරියා ආචික්ඛන්ති 'උපෙක්ඛකො සතිමා සුඛවිහාරී'ති තං තතියජ්ඣානං[1] උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං[2] උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති. අයං අධිචිත්තසික්ඛා.

කතමා අධිපඤ්ඤාසික්ඛා? ඉධ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛ-ක්ඛයගාමිනියා. සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති. ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති, අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති, අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනීපටිපදා'ති යථාභූතං පජානාති. අයං අධිපඤ්ඤාසික්ඛා.

---

1. තතියං ඣානං - මජසං. 2. අදුක්ඛමසුඛං - ස.

අධිසීලශික්ෂා කවරැ යත්: මේ සස්නෙහි මහණ ප්‍රාතිමොක්ෂ-සංවරයෙන් සංවෘත වූයේ සිල්වත් වෙයි, ආචාර - ගොචර දෙකින් යුක්ත වූයේ අණුමාත්‍ර වූ ද වරදෙහි භය දක්නාසුලු වූයේ වෙසෙයි. ශික්ෂාපදයන් - ශික්ෂාකොට්ඨාසයන් අතුරෙහි හික්මියැ යුතු සියලු ශික්ෂාව මොනොවට ගෙනැ හික්මෙයි. (සංඝාදිසෙසාදි සාවශෙෂ සඞ්ඛ්‍යාත) ක්ෂුද්‍රශීලස්කන්ධ යැ (පාරාජිකාදි නිරවශෙෂ සඞ්ඛ්‍යාත) මහාශීලස්කන්ධ යැ යන ශීලය චාතුර්භූමකකුශලධර්මයන්ගේ ප්‍රතිලාභයට ප්‍රතිෂ්ඨා යැ ආදි යැ චරණ (-පාද) යැ සංයම යැ සංවර යැ උත්තම යැ ප්‍රමුඛ යි. මෝ අධිසීලශික්ෂා නමු.

අධිචිත්තශික්ෂා කවරැ යත්: මේ සස්නෙහි මහණ වස්තුකාම - ක්ලෙශ-කාමයන්ගෙන් වෙන් ව මැ (ශෙෂනීවරණසඞ්ඛ්‍යාත) අකුශලධර්මයන් ගෙන් වෙන් ව මැ (අරමුණට සිත නගන) විතර්කය සමග පවත්නා වූ (අරමුණෙහි සිත හසුරුවන) විචාරය සමග පවත්නා වූ (නීවරණ විගමයෙන් වූ) විවෙකයෙන් හෝ විවෙකයෙහි උපන් ප්‍රීතිය හා සැපය ඇති පලමුවන දූහැනට පැමිණ වෙසෙයි. විතර්ක විචාර සන්හිඳීමෙන් ස්වකීය අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සමාධිචිත්තයාගේ ශ්‍රෙෂ්ඨ වූ උදය ඇති, හෙවත් (විතර්කවිචාරාභාවයෙන්) එකලා වැ සම්ප්‍රයුක්තධර්මයන් නඟාසිටුවන (භාවනාවෙන් ප්‍රහීණ හෙයින්) විතර්ක - විචාර රහිත වූ ප්‍රථමධ්‍යානසමාධියෙන් හෝ සම්ප්‍රයුක්තසමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවැනි දූහැනට පැමිණ වෙසෙයි. ප්‍රීතිය ද ඉක්මැවීමෙන් විතර්කවිචාරයන් ද සන්හිඳුවීමෙන් ධ්‍යානොපෙක්ෂා ඇති වැ වාසය කරන්නේ ද වෙයි, (සමරණලක්ෂණ) සිහි ඇති වැ (අසම්මොහලක්ෂණ) නුවණ ද ඇති වැ නාමකායසම්ප්‍රයුක්ත වූ සැපය (ධ්‍යානයෙන් නැඟීසිටිය ද) රූපකායයෙන් විඳී, යම් ධ්‍යානයක් හෙතු කොටගෙන 'උපෙක්ෂා ඇත්තේ යැ සමෘතිමත් යැ සුඛවිහරණ ඇත්තේ යැ'යි ආර්යයෝ ප්‍රශංසා කෙරෙත් නම්, ඒ තුන්වැනි දූහැනට පැමිණ වෙසෙයි. පලමු උපචාරක්ෂණයෙහි මැ කායික සැපයත් කායික දුකත් ප්‍රහාණ කිරීමෙන් සොම්නස් දොම්නසුත් (=චෛතසික සැපදුක්) පලමු මැ අතුරුදහන් වීමෙන් දුක් නැති සැප නැති උපේක්ෂාවෙන් උපදවන ලද සමෘතිපාරිශුද්ධිය (පිරිසිදුසිහි) ඇති සිවුවැනි දූහැනට පැමිණ වෙසේ. මෝ අධිචිත්තශික්ෂා නමු.

අධිප්‍රඥ ශික්ෂා කවරැ යත්: මේ සස්නෙහි මහණ උදයව්‍යය ගාමිනී වූ ආර්ය (නිර්දොෂ) වූ නිර්වේදපක්ෂයෙහි වූ මනා සේ නිවනට පමුණු-වන්නා වූ නුවණින් පරිපූර්ණ වූයේ ප්‍රඥවත් වෙයි. හෙතෙම 'මේ දුකැ'යි තතු සේ දැනගනී. මේ දුක්සමුදය යැයි තතු සේ දැනගනී. මේ දුක් නිරොධ යැයි තතු සේ දැනගනී. මේ දුක් නිරොධයට පමුණුවන පිළිවෙතැ'යි තතු සේ දැනගනී. මොහු ආස්‍රවයෝ යැයි තතු සේ දැනගනී. මේ ආස්‍රවසමුදය යැයි තතු සේ දැනගනී. මේ ආස්‍රවනිරොධ යැයි තතු සේ දැනගනී. මේ ආස්‍රවනිරොධයට පමුණුවන පිළිවෙතැ'යි තතු සේ දැනගනී. මෝ අධිප්‍රඥශික්ෂා නමු.

ඉමායො[1] තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො සික්ඛෙය්‍ය, පස්සන්තො සික්ඛෙය්‍ය, පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය, චිත්තං අධිට්ඨහන්තො සික්ඛෙය්‍ය, සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය, විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය, සතිං උපට්ඨපෙන්තො සික්ඛෙය්‍ය, චිත්තං සමාදහන්තො සික්ඛෙය්‍ය, පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය, පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය, ආචරෙය්‍ය, සමාචරෙය්‍ය, සමාදාය වත්තෙය්‍ය.

**ඉධාති** – ඉමිස්සා දිට්ඨියා, ඉමිස්සා ඛන්තියා, ඉමිස්සා රුචියා, ඉමස්මිං ආදායෙ[2], ඉමස්මිං ධම්මෙ, ඉමස්මිං විනයෙ, ඉමස්මිං ධම්මවිනයෙ, ඉමස්මිං පාවචනෙ, ඉමස්මිං බ්‍රහ්මචරියෙ, ඉමස්මිං සත්ථුසාසනෙ, ඉමස්මිං අත්තභාවෙ, ඉමස්මිං මනුස්සලොකෙ, තෙන වුච්චති ඉධාති. **ජන්තූති** – සත්තො නරො -පෙ- මනුජොති ‘තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු.’

**යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙති** – යං කිඤ්චීති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං ‘යං කිඤ්චි’ ති. **විසමන්ති ජඤ්ඤාති** – විසමං කායකම්මං විසමන්ති ජානෙය්‍ය, විසමං වචීකම්මං විසමන්ති ජානෙය්‍ය, විසමං මනොකම්මං විසමන්ති ජානෙය්‍ය, විසමො පාණාතිපාතො විසමොති ජානෙය්‍ය, විසමං අදින්නාදානං විසමන්ති ජානෙය්‍ය, විසමො කාමෙසු මිච්ඡාචාරො විසමොති ජානෙය්‍ය, විසමො මුසාවාදො විසමොති ජානෙය්‍ය, විසමා පිසුණා වාචා විසමාති ජානෙය්‍ය, විසමා ඵරුසා වාචා විසමාති ජානෙය්‍ය, විසමො සම්ඵප්පලාපො විසමොති ජානෙය්‍ය, විසමං අභිජ්ඣං විසමන්ති ජානෙය්‍ය, විසමො ව්‍යාපාදො විසමොති ජානෙය්‍ය, විසමා මිච්ඡාදිට්ඨි විසමාති ජානෙය්‍ය, විසමා සඞ්ඛාරා විසමාති ජානෙය්‍ය, විසමා පඤ්ච කාමගුණා විසමාති ජානෙය්‍ය, විසමාති පඤ්ච නීවරණාති විසමාති ජානෙය්‍ය ආජානෙය්‍ය විජානෙය්‍ය පටිජානෙය්‍ය පටිවිජ්ඣෙය්‍ය; **ලොකෙති** – අපායලොකෙ -පෙ- ආයතනලොකෙති ‘යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ.’

**න තස්ස හෙතු විසමං චරෙය්‍යාති** – විසමස්ස කායකම්මස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස වචීකම්මස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස මනොකම්මස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස පාණාතිපාතස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස අදින්නාදානස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස කාමෙසු මිච්ඡාචාරස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස කාමෙසු මිච්ඡාචාරස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස මුසාවාදස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමාය පිසුණාය වාචාය හෙතු විසමං න චරෙය්‍ය, විසමාය ඵරුසාය වාචාය හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස සම්ඵප්පලාපස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමාය අභිජ්ඣාය හෙතු විසමං න චරෙය්‍ය, විසමස්ස ව්‍යාපාදස්ස හෙතු විසමං න චරෙය්‍ය, විසමාය මිච්ඡාදිට්ඨියා හෙතු විසමං න චරෙය්‍ය, විසමානං සඞ්ඛාරානං හෙතු විසමං න චරෙය්‍ය, විසමානං පඤ්චන්නං කාමගුණානං හෙතු විසමං න චරෙය්‍ය, විසමානං පඤ්චන්නං නීවරණානං හෙතු විසමං න චරෙය්‍ය, විසමාය චෙතනාය හෙතු විසමං න චරෙය්‍ය, විසමාය පත්ථනාය හෙතු විසමං න චරෙය්‍ය, විසමාය පණිධියා හෙතු විසමං න චරෙය්‍ය න ආචරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදාය වත්තෙය්‍යාති–‘න තස්ස හෙතු විසමං චරෙය්‍ය.’

---

1. ඉමා – ස. 2. ආදායෙ – සිමු I.

මේ ත්‍රිවිධ ශික්‍ෂාවන් (වෙන වෙන මැ පුරන්නට) සිතමින් හික්මෙන්නේ යැ, (මේ ශික්‍ෂා යැයි) දනිමින් හික්මෙන්නේ යැ, දක්මින් හික්මෙන්නේ යැ, (දුටු සේ) ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙමින් හික්මෙන්නේ යැ, සිත නො සැලෙන සේ පිහිටුවමින් හික්මෙන්නේ යැ' සැදැහැයෙන් ඇලෙමින් හික්මෙන්නේ යැ, වීර්‍ය්‍ය දැඩි ව ගනිමින් හික්මෙන්නේ යැ, සිහි එළවමින් හික්මෙන්නේ යැ, සිත එකඟ කෙරෙමින් හික්මෙන්නේ යැ, නුවණින් දැනගනිමින් හික්මෙන්නේ යැ, (ස්වභාව ලක්‍ෂණයෙන්) දත යුතු දැය දනිමින් හික්මෙන්නේ යැ, (සාමාන්‍ය ලක්‍ෂණයෙන්) දත යුතු දැය හාත්පසින් දැනගනිමින් හික්මෙන්නේ යැ, හළ යුතු සමුදය දුරු කෙරෙමින් හික්මෙන්නේ යැ, වැඩිය යුතු මඟ වඩමින් හික්මෙන්නේ යැ, පසක් කළ යුතු නිවන පසක් කෙරෙමින් හික්මෙන්නේ යැ, (අධිශීලයෙහි) හැසිරෙන්නේ යැ, (අධිචිත්තයෙහි) මොනොවට හැසිරෙන්නේ යැ, (අධිප්‍රඥව) මොනොවට ගෙන පවත්නේ යි.

**ඉධ** යනු: මේ බුදුරදුන් විසින් දක්නා ලදුයෙහි, මේ ක්‍ෂාන්තියෙහි, මේ රුචියෙහි, මේ ග්‍රහණයෙහි, මේ ධර්මයෙහි, මේ විනයෙහි, මේ ධර්ම - විනයෙහි, මේ ප්‍රවචනයෙහි, මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි, මේ ශාස්තෘශාසනයෙහි, මේ අත්භාවෙහි, මේ මිනිස්ලොවැ; එසින් කියනු ලැබේ 'ඉධ'යි. **ජන්තු** යනු: සත්ත්ව නර... මනුජ නුයි 'තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු' යනු වේ.

**යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ** - 'යං කිඤ්චි' යනු: සියල්ලෙන් සියල්ල සියලු පරිද්දෙන් සියල්ල අශේෂ කොට නිරවශේෂ කොට ගැනීම් වචනයෙකි මේ. 'යං කිඤ්චි' යනු: **විසමන්ති ජඤ්ඤා** - විෂම වූ කායකර්මය විෂම යයි දන්නේ නම්, විෂම වූ වාක්කර්මය... මනඃකර්මය... විෂම වූ ප්‍රාණඝාතය විෂම යයි දන්නේ නම්, විෂම වූ අදත්තාදානය... කාමමිථ්‍යාචාරය... මෘෂාවාදය... පෛශූන්‍යය... පරුෂවචනය... ප්‍රලාපවචනය... විෂම වූ අභිධ්‍යාව... ව්‍යාපාදය... මිථ්‍යාදෘෂ්ටිය... විෂම වූ කායසංස්කාරයෝ... විෂම වූ පඤ්චකාමගුණයෝ... විෂම වූ පඤ්චනීවරණයෝ විෂමයෝ යැ යි දන්නේ නම්, හාත්පසින් දන්නේ නම්, වෙසෙසින් දන්නේ නම්, මොනොවට දන්නේ නම්, ප්‍රතිවෙධ කරන්නේ නම්; **ලොකෙ** අපායලොකයෙහි... ආයතනලොකයෙහි නුයි 'යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ,' යනු වේ.

**න තස්ස හෙතු විසමං චරෙය්‍ය** - විෂම වූ කායකර්මය හෙතු කොට විෂමයෙහි නො හැසිරෙන්නේ යැ, විෂම වූ වාක්කර්මය... මනඃකර්මය හෙතු කොට... විෂම වූ ප්‍රාණඝාතය හේතු කොට විෂමයෙහි නො හැසිරෙන්නේ යැ, විෂම වූ අදත්තාදානය... කාමමිථ්‍යාචාරය... මෘෂාවාදය... පෛශූන්‍යය... පරුෂවචනය... සම්ප්‍රලාපය... අභිධ්‍යාව... ව්‍යාපාදය... මිථ්‍යාදෘෂ්ටිය... විෂම වූ සංස්කාරයන් හේතු කොට... විෂම වූ පඤ්චකාමගුණයන්... විෂම වූ පඤ්චනීවරණයන් හේතු කොට... විෂම වූ චෙතනාව... විෂම වූ ප්‍රාර්ථනාව... විෂම වූ ප්‍රණිධිය හේතු කොට විෂමයෙහි නො හැසිරෙන්නේ යැ, හාත්පසින් නො හැසිරෙන්නේ යැ, මොනොවට නො හැසිරෙන්නේ යැ, මොනොවට ගෙන නො පවත්නේ නුයි 'න තස්ස හෙතු විසමං චරෙය්‍ය' යනු වේ.

**අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා**ති – 'ජීවිත'න්ති ආයු ඨිති යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං; අපිච, ද්වීහි කාරණෙහි අප්පකං ජීවිතං: ඨිතිපරිත්තතාය වා අප්පකං ජීවිතං, සරසපරිත්තතාය වා අප්පකං ජීවිතං. කථං ඨිතිපරිත්තතාය වා අප්පකං? අතීතෙ චිත්තක්ඛණෙ ජීවිත්ථ න ජීවති න ජීවිස්සති, අනාගතෙ චිත්තක්ඛණෙ ජීවිස්සති[1] න ජීවති න ජීවිත්ථ[2], පච්චුප්පන්නෙ චිත්තක්ඛණෙ ජීවති න ජීවිත්ථ න ජීවිස්සති.

1. "ජීවිතං අත්තභාවො ච සුඛදුක්ඛා ච කෙවලා,
එකචිත්තසමායුත්තා ලහුසො වත්තතෙ[3] ඛණො.

2. චුල්ලාසීති සහස්සානි කප්පං[4] තිට්ඨන්ති යෙ මරූ,
න ත්වෙව තෙපි ජීවන්ති ද්වීහි චිත්තෙහි සංයුතා.[5]

3. යෙ නිරුද්ධා මරන්තස්ස තිට්ඨමානස්ස වා ඉධ,
සබ්බෙව[6] සදිසා ඛන්ධා ගතා අප්පටිසන්ධිකා.[7]

4. අනන්තරා[8] ච යෙ භග්ගා යෙ ච භග්ගා අනාගතා,
තදන්තරෙ නිරුද්ධානං වෙසමං[9] නත්ථි ලක්ඛණෙ.

5. අනිබ්බත්තෙන න ජාතො පච්චුප්පන්නෙන ජීවති,
චිත්තභඞ්ගා මතො ලොකො පඤ්ඤත්ති පරමත්ථියා.[10]

6. යථා නින්නා පවත්තන්ති ඡන්දෙන පරිණාමිතා,
අච්ඡින්නධාරා[11] වත්තන්ති සළායතනපච්චයා.*

7. අනිධානගතා භග්ගා පුඤ්ජො නත්ථි අනාගතෙ,
නිබ්බත්තා යෙව තිට්ඨන්ති ආරග්ගෙ සාසපූපමා.

8. නිබ්බත්තානඤ්ච ධම්මානං භඞ්ගො නෙසං පුරක්ඛතො,
පලොකධම්මා තිට්ඨන්ති පුරාණෙහි අමිස්සිතා.

9. අදස්සනතො ආයන්ති භඞ්ගා ගච්ඡන්ත්‍යදස්සනං,[12]
විජ්ජුප්පාදොව ආකාසෙ උප්පජ්ජන්ති වයන්ති චා"ති.

එවං ඨිතිපරිත්තතාය අප්පකං ජීවිතං.

---

1. ජීවිත්ථ1 සීමු. I. 2. ජීවිස්ස – සීමු. I. 3. වත්තති – PTS.
4. කප්පං – වි. 5. සමොහිතා – සීමු. I. සමාහිතා – PTS.
6. සබ්බෙපි – සීමු. II. 7. අප්පටිසන්ධියා – වි. 8. න අන්තරා – ස.
9. වෙසම්මං–ස, PTS. 10. පරමත්ථිති – ස, පරමත්ථියා – වි.
11. අච්ඡින්නවාරා – PTS. * අයං ගාථා විසුද්ධිමග්ගෙ දිස්සති.
12. ගච්ඡන්ති අදස්සනං – සීමු. II.

**අප්පඤ්චිදං ජීවිතං ආහු ධීරා** – 'ජීවිතං' යනු: (අරූපධර්මයන්ගේ) ආයුසය සිටීම යපනය යාපනය (=යැපීම) ඉරියනය පැවැත්ම පාලනය ජීවිතය ජීවිතෙන්ද්‍රිය යි. තවද දෙ කරුණෙකින් ජීවිතය අල්ප වෙයි: ස්ථිතික්‍ෂණය මදබැවින් හෝ ජීවිතය අල්ප යැ, කෘත්‍යලක්‍ෂණ හෝ සම්පත්තිලක්‍ෂණ රසය මදබැවින් හෝ ජීවිතය අල්ප යි. කිසෙසින් ඨිතිපරිත්තතායෙන් ජීවිතය අල්ප වෙයි ? යත්: අතීත චිත්තක්‍ෂණයෙහි ජීවත් විය, ජීවත් නො වෙයි, ජීවත් නො වන්නේ ය; අනාගතචිත්ත-ක්‍ෂණයෙහි ජීවත් වන්නේ යැ, ජීවත් නො වෙයි, ජීවත් නො වී; වර්තමාන චිත්තක්‍ෂණයෙහි ජීවත් වෙයි, ජීවත් නො වී, ජීවත් නො වන්නේ යි.

1. (සංස්කාරස්කන්ධ සඞ්ඛ්‍යාත) ජීවිතය ද, (රූපස්කන්ධ සඞ්ඛ්‍යාත) ආත්මභාවය ද, (වේදනාස්කන්ධ සඞ්ඛ්‍යාත) සුඛදුඃඛයෝ ද, (ධ්‍රැවසුඛ-ශුභාත්මභාව රහිත හෙයින්) කෙවල වූවාහු (විඥානස්කන්ධ සඞ්ඛ්‍යාත) එක් සිතක් සමග යෙදුණාහු (ජීවිතාදීන්ගේ) ක්‍ෂණය අල්පවශයෙන් පවත්නේ යැ.

2. යම් දෙවි කෙනෙක් කප් සුවාසූදහසක් ආයු ගෙන (නෙව-සඤ්ඤානාසඤ්ඤායතනයෙහි) සිටිත් නම්, ඔහු පවා දෙ සිතෙකින් යුක්ත වූවාහු නො මැ ජීවත් වෙති.

3. මෙ ලොවැ මළහු ගේ හෝ ජීවත් වන්නහු ගේ හෝ යම් ස්කන්ධ කෙනෙක් නිරුද්ධ වූවාහු ද, (චුතියෙන් උඩ නිරුද්ධ වූ හෝ ප්‍රවෘත්තියෙහි නිරුද්ධ වූ හෝ) ඒ සියලු මැ ස්කන්ධයෝ සදෘශයෝ ය, (නිරුද්ධ වූ ස්කන්ධයන් පෙරලා අවුත් ගැළපීමක් නැති බැවින්) ගියාහු අප්‍රතිසන්ධිකයෝ යැයි කියනු ලැබෙත්.

4. යම් ස්කන්ධ කෙනෙක් අනන්තර (=අතීත) වැ සිට බිඳීගියාහු ද, යම් අනාගත ස්කන්ධ කෙනෙකුත් බිඳීයන්නාහු ද, ඒ අතුරෙහි නිරුද්ධ වූ වර්තමානස්කන්ධයන්ගේ ලක්‍ෂණයෙහි විෂම බවෙක් (නානාත්වයෙක්) නැති.

5. නූපන් අනාගතස්කන්ධයෙන් නූපන්නේ යැ, ක්‍ෂණප්‍රත්‍යුත්පන්න වූ වර්තමානස්කන්ධයෙන් ජීවත් වෙයි, සත්ත්ව තෙම චිත්තයාගේ බිඳීමෙන් මළේ නමැ, (මළේ යැ යන) ප්‍රඥප්තිය පරමාර්ථ (–චිත්තභඞ්ග)ය ඇසුරු කොට ඇත්තී යැ.

6. ඡන්ද විසින් පරිණාමිත වූවාහු නතු වූ පරිදි පවත්නාහු යැ. ෂඩායතනප්‍රත්‍යයෙන් නුසුන් ධාරා ඇති වැ පවතිත්.

7. බිඳුණු ස්කන්ධයෝ නිධානයට (=රැස් වීමට) නො ගියාහු යැ, අනාගතයෙහි දු ඔවුන් ගේ රැස් වීමෙක් නැති. හිඳීඅගැ අබඇට සෙයින් ස්ථිතික්‍ෂණයෙහි උපන්නාහු මැ සිටිත්.

8. ඉපැද පවත්නාවූ ඒ ස්කන්ධධර්මයන්ගේ ද බිඳීම පෙරටු කරන ලද්දේ යැ. නැසෙන පියවි ඇත්තාහු පැරැණි ස්කන්ධයන් හා අමිශ්‍ර වූවාහු සිටිත්.

9. නො දක්නා තැනින් මැ පැමිණෙති. නැසීමෙන් මතු නො දක්නා බවට මැ යෙති. අහසැ විදුලි කෙටීමක් මෙන් උපදනාහු ද නැසෙන්නාහු ද වෙත්.

මෙසේ ඨිතිපරිත්තතායෙන් ජීවිතය අල්ප වේ.

කථං සරසපරිත්තතාය අප්පකං ජීවිතං? අස්සාසූපනිබද්ධං ජීවිතං, පස්සාසූපනිබද්ධං ජීවිතං, අස්සාසපස්සාසූපනිබද්ධං ජීවිතං, මහාභූතූපනිබද්ධං ජීවිතං, කබලීකාරාහාරූපනිබද්ධං ජීවිතං, උස්මූපනිබද්ධං ජීවිතං, විඤ්ඤාණූපනිබද්ධං ජීවිතං, මූලම්පි ඉමෙසං දුබ්බලං, පුබ්බහෙතූපි ඉමෙසං දුබ්බලා, යෙපි පච්චයා තෙපි දුබ්බලා, යාපි පභාවිකා සාපි[1] දුබ්බලා, සහභූපි[2] ඉමෙසං දුබ්බලා, සම්පයොගාපි ඉමෙසං දුබ්බලා, සහජාපි ඉමෙසං දුබ්බලා, යාපි පයොජිකා සාපි දුබ්බලා, අඤ්ඤමඤ්ඤං නිච්චදුබ්බලා ඉමෙ, අඤ්ඤමඤ්ඤං අනවට්ඨිතා ඉමෙ, අඤ්ඤමඤ්ඤං පරිපාතයන්ති ඉමෙ, අඤ්ඤමඤ්ඤස්ස හි නත්ථි තායිතා, න චාපි ඨපෙන්ති අඤ්ඤමඤ්ඤං ඉමෙ, යොපි නිබ්බත්තකො සො න විජ්ජති.

10. "න ච කෙනචි කොචි හායති භඞ්ගබ්‍යා[3] ච ඉමෙහි සබ්බසො
පුරිමෙහි පහාවිතා ඉමෙ යෙපි පහවකා[4] තෙ පුරෙ මතා,
පුරිමාපි ච පච්ඡිමාපි ච අඤ්ඤමඤ්ඤං න කදාචි මද්දසු" න්ති.

එවං සරසපරිත්තතාය අප්පකං ජීවිතං. අපිච චාතුම්මහාරාජිකානං දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං අප්පකං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ඛණිකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතං. තාවතිංසානං දෙවානං -පෙ- යාමානං දෙවානං -පෙ- තුසිතානං දෙවානං -පෙ- නිම්මාණරතීනං දෙවානං -පෙ- පරනිම්මිතවසවත්තීනං දෙවානං -පෙ- බ්‍රහ්මකායිකානං දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං අප්පකං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ඛණිකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතං. වුත්තම්පි චෙතං භගවතා:

"අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, මන්තාය බොද්ධබ්බං, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං. නත්ථි ජාතස්ස අමරණං, යො භික්ඛවෙ චිරං ජීවති, සො වස්සසතං අප්පං වා භිය්‍යො.

11. අප්පමායු මනුස්සානං හීළෙය්‍ය නං සුපොරිසො,
චරෙය්‍යාදිත්තසීසොව නත්ථි මච්චුස්ස නාගමො.

12. අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති,
ආයු ඛීයති මච්චානං කුන්නදීනංව ඕදකං.[ක]"

---

1. යෙපි . . . තෙපි - සීමු II PTS. 2. සහභූමි පි - සීමු. II. ස.
3. ගන්ධබ්බා - සීමු II ස. මජසං. 4. පහාවිතා .... පහාවිකා - සීමු II. PTS. මජසං.
ක. මාරසංයුත්ත - පඨමවග්ග. මහානිද්දෙස - ජරාසුත්තනිද්දෙස,

කිසෙයින් සරසපරිත්තතායෙන් ජීවිතය අල්ප වෙයි යත්: (නැහැසිදුරින් ඇතුළත පිවිසෙන වාත සඞ්ඛ්‍යාත) ආශ්වාසය නිසා පවත්නේ යැ ජීවිතය, ප්‍රශ්වාසය නිසා පවත්නේ යැ ජීවිතය, ආශ්වාසප්‍රශ්වාස පිළිබඳ යැ ජීවිතය, පෘථිව්‍යාදි මහාභූතයන් පිළිබඳ යැ ජීවිතය, කබලීකාරාහාරය පිළිබඳ යැ ජීවිතය, උණුසුම (=කර්මජතෙජස) පිළිබඳ යැ ජීවිතය, භවාඞ්ගවිඥානය පිළිබඳ යැ ජීවිතය. මේ ආශ්වාසාදීන්ගේ මූලකාරණය (=හෙතුව) ද දුර්වල යැ, මොවුන් ගේ අවිද්‍යාදි පූර්වහෙතුහු ද දුබලයෝ යැ, ආරම්මණාදි සාධාරණ ප්‍රත්‍යයයෝ ද දුබලයෝ යැ, ප්‍රධාන වැ සිට උපදවන ඒ තෘෂ්ණාව ද දුබල යැ, මොවුන්ගේ එක් වැ උපන් රූපාරූපධර්මයෝ ද දුබලයෝ යැ, මොවුන්ගේ එක් වැ යෙදුණු අරූපධර්මයෝ ද දුබලයෝ යැ, මොවුන්ගේ සහජ (= එක් සිතෙහි උපන්) ධර්මයෝ ද දුබලයෝ යැ, ච්‍යුතිප්‍රතිසන්ධි විසින් යොදවන වෘත්තමූලක වූ ඒ තෘෂ්ණාව ද දුර්වල යැ, මොහු ඔවුනොවුන් නිරතුරු දුබලයෝ යැ, මොහු ඔවුනොවුන් අනවස්ථිතයෝ යැ, මොහු ඔවුනොවුන් පිරිහෙළති, ඔවුනොවුන් රැකීමෙක් නැති, මොහු ඔවුනොවුන් නො ද සිටුවති, (මොවුන්ගේ) උත්පාදකධර්මයෙක් ද නැත්.

10. එකෙක් එකක්හුගේ වශයෙන් නො ද පිරිහෙයි, මේ සියලු මැ ස්කන්ධයෝ සර්වප්‍රකාරයෙන් බිඳීමට යා යුත්තාහු යැ, මේ වර්තමානස්කන්ධයෝ පූර්වහෙතුප්‍රත්‍යයන් විසින් උපදවන ලද්දාහු ය, උත්පාදක වූ ඒ පූර්වහෙතුප්‍රත්‍යයයෝ පළමු වැ මළාහු යැ, පූර්වහෙතුප්‍රත්‍යයයෝ ද වර්තමාන ප්‍රත්‍යයසමුත්පන්නයෝ ද ඔවුනොවුන් කිසි කලෙක නො දුටු විරූහ.

මෙසේ සරසපරිත්තතායෙන් ජීවිතය අල්ප වේ.

තවද – චාතුර්මහාරාජික දෙවියන්ගේ ජීවිතය පිණිස මිනිසුන්ගේ ජීවිතය අල්ප යැ, ජීවිතය පරිත්ත යැ, ජීවිතය මඳ යැ, ජීවිතය ක්ෂණික යැ, ජීවිතය සැහැල්ලු යැ, ජීවිතය ඉත්වර (= අදීර්ඝ) යැ, ජීවිතය කල් නො පවත්නේ යැ, ජීවිතය අචිරස්ථායී යැ, ත්‍රයස්ත්‍රිංශත් දෙවියන්ගේ යාමදෙවියන්ගේ – තුෂිතදෙවියන්ගේ – නිර්මාණරතී දෙවියන්ගේ – පරනිර්මිතවශවර්ති දෙවියන්ගේ – බ්‍රහ්මකායික දෙවියන්ගේ ජීවිතය නිසා මිනිසුන්ගේ ජීවිතය අල්ප යැ, පරිත්ත යැ මඳ යැ ක්ෂණික යැ ලහුක යැ ඉත්තර යැ අනවස්ථිතය යැ අචිරස්ථායී වේ. වදාළේ මැ නු භාග්‍යවතුන් වහන්සේ විසින්:

"මහණෙනි, මිනිසුන්ගේ මේ ආයුස අල්ප යැ, පරලොව යා යුත්තේ යැ, නුවණින් දත යුතු යැ, කුසල් කළ යුතු යැ, බඹසර විසියැ යුතු යැ, උපන්හුගේ නො මැරීමෙක් නැති.
මහණෙනි, යමෙක් කලක් ජීවත් වේ නම් හෙතෙම අවුරුදු සියයක් ජීවත්වෙයි.
අධික වූයේ නම් ස්වල්පයක් මැයි.

11. මිනිසුන් ගේ ආයුස අල්ප යැ. සාධුපුරුෂ තෙම ඒ මඳ වූ ආයුසට ලජ්ජී වන්නේ යැ. හිස ගිනි ගත්තකු සෙයින් කුසල්හි හැසිරෙන්නේ යැ. මරහු ගේ නොපැමිණීමෙක් නම් නැති.

12. රෑදවල්හු ඉක්මැ යෙති. ජීවිතෙන්ද්‍රියය අභාවයට යෙයි. කුඩා නදීන්ගේ දියත්තක් සෙයින් මිනිසුන්ගේ ආයුස ගෙවේ.

**අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරාති** - 'ධීරා'ති[1] ධිතිමාති ධීරා, ධිතිසම්පන්නාති ධීරා, ධිකතපාපාති[2] ධීරා. ධී වුච්චති පඤ්ඤා යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා මන්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි[3] තාය පඤ්ඤාය සමන්නාගතත්තා ධීරා. අපිච ඛන්ධධීරා ධාතුධීරා ආයතනධීරා පටිච්චසමුප්පාදධීරා සතිපට්ඨානධීරා සම්මප්පධානධීරා ඉන්ද්‍රියධීරා බොජ්ඣඞ්ගධීරා මග්ගධීරා ඵලධීරා නිබ්බානධීරා. තෙ ධීරා එවමාහු: මනුස්සානං අප්පං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතන්ති එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති 'අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා'ති.

තෙනාහ භගවා:

> "තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු
> යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති ලොකෙ,
> න තස්ස හෙතු විසමං චරෙය්‍ය
> අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා"ති.

**2 - 5.**

> පස්සාමි ලොකෙ පරිඵන්දමානං
> පජං ඉමං තණ්හාගතං භවෙසු,
> හීනා නරා මච්චුමුඛෙ ලපන්ති
> අවීතතණ්හාසෙ භවාභවෙසු.

**පස්සාමි ලොකෙ පරිඵන්දමානන්ති** - 'පස්සාමී'ති මංසචක්ඛුනාපි පස්සාමි, දිබ්බචක්ඛුනාපි පස්සාමි, පඤ්ඤාචක්ඛුනාපි, පස්සාමි, බුද්ධචක්ඛුනාපි පස්සාමි, සමන්තචක්ඛුනාපි පස්සාමි, දක්ඛාමි ඔලොකෙමි නිජ්ඣායාමි උපපරික්ඛාමි. **ලොකෙති** - අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ.

---

1. 'ධීරා'ති ධීරා - සීමු. II.
2. ධිකතපාපානි - සීමු. II. PTS.
3. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

**අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා** – 'ධීරා' යනු: ධෘතිමත් නුයි ධීරයෝ යෑ, ධෘතිසම්පන්න නුයි ධීරයෝ යෑ, ගරහන ලද පව් ඇත් නුයි ධීරයෝ යි. ප්‍රඥාව 'ධී' යයි කියනු ලැබෙයි; යම් ප්‍රඥාවක් දැනීම් ආකාරයෙක් අනිත්‍යාදිය විමසීමෙක් ප්‍රකෘතියෙන් විමසීමෙක් සිවුසස්දහම් විමසීමෙක් අනිත්‍යාදීන්ගේ සැලැකීමෙක් උපලක්‍ෂණයෙක් ප්‍රත්‍යුපලක්‍ෂණයෙක් පණ්ඩිතබවෙක්, කුශල(=දක්‍ෂ)බවෙක් නිපුණබවෙක් විභාවනයෙක් සිතීමෙක් දැනීමෙක් උපපරීක්‍ෂාවක් (විස්තෘත හෙයින්) භූරිසඞ්ඛ්‍යාත ප්‍රඥාවක් කෙලෙසුන් නසන හෙයින් මෙධාවක් (ලක්‍ෂණප්‍රතිවෙධයට පමුණුවන හෙයින්) පරිණායිකාවක් විදර්ශනාවක් සම්ප්‍රජන්‍යයෙක් (නො දැමුණු සිත මාර්ගවීථියට නගන හෙයින්) ප්‍රඥා නැමැති ප්‍රතොදයෙක් (කෙවිටෙක්) ප්‍රඥාවක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාලොකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචය-යෙක් සම්‍යග්දෘෂ්ටියක් වූවා ද, ඒ ප්‍රඥාවෙන් සමන්විත හෙයින් ධීරයෝ යි. තවද ස්කන්ධධීරයෝ යෑ, ධාතු – ආයතන – ප්‍රතීත්‍යසමුත්පාද – සමෘති-ප්‍රස්ථාන – සම්‍යක්ප්‍රදහන – ඍද්ධිපාද – ඉන්ද්‍රිය – බොධ්‍යඞ්ග – මාර්ග – ඵල – නිර්වාණධීරයෝ යෑ. ඒ ධීරයෝ මෙසේ කියති: මිනිසුන්ගේ ජීවිතය අල්ප යෑ පරිත්ත යෑ මඳ යෑ ලහුක යෑ ඉත්වර යෑ අනවස්ථිය යෑ අචිරස්ථායී යෑ යි මෙසේ කීහු. මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ වහරත් නුයි 'අප්පඤ්හිදං ජීවිතං ආහු ධීරා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"තස්මා හි -පෙ- ආහු ධීරා" යනු.

## 2 – 5

කාමාදිභවයෙහි නොහොත් පුනපුනා භවයෙහි අවිගත තෘෂ්ණා ඇති හීන වූ කායාදිකර්ම ඇති සත්ත්වයෝ මරණමුඛයෙහි වැලැපෙති, ලොවැ කාමාදිභවයෙහි තෘෂ්ණායෙන් මඩනා ලද තෘෂ්ණාදිස්පන්දනයෙන් පොපියනු වූ මේ සත්ත්වසමූහයා මම් මසැස් ආදියෙන් දකිමි.

**පස්සාමි ලොකෙ පරිඵන්දමානං** – 'පස්සාමි' යනු: මසැසිනුදු බලමි, දිවැසිනුදු බලමි, පැනැසිනුදු බලමි, බුදුඇසිනුදු බලමි, සමතැසිනුදු බලමි, දක්මි, අවලොකන කෙරෙමි, සිතමි, විමසමි. **'ලොකෙ'** යනු: අපාය ලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි.

**පරිඵන්දමානන්ති** - තණ්හාඵන්දනාය ඵන්දමානං දිට්ඨිඵන්දනාය ඵන්දමානං කිලෙසඵන්දනාය ඵන්දමානං පයොගඵන්දනාය ඵන්දමානං විපාකඵන්දනාය ඵන්දමානං දුච්චරිතඵන්දනාය ඵන්දමානං, රත්තං[1] රාගෙන ඵන්දමානං දුට්ඨං[2] දොසෙන ඵන්දමානං මූළ්හං[3] මොහෙන ඵන්දමානං විනිබද්ධං මානෙන ඵන්දමානං පරාමට්ඨං දිට්ඨියා ඵන්දමානං වික්ඛෙපගතං උද්ධච්චෙන ඵන්දමානං අනිට්ඨාගතං විචිකිච්ඡාය ඵන්දමානං ථාමගතං අනුසයෙහි ඵන්දමානං, ලාභෙන ඵන්දමානං අලාභෙන ඵන්දමානං යසෙන ඵන්දමානං අයසෙන ඵන්දමානං පසංසාය ඵන්දමානං නින්දාය ඵන්දමානං සුඛෙන ඵන්දමානං දුක්ඛෙන ඵන්දමානං ජාතියා ඵන්දමානං ජරාය ඵන්දමානං ව්‍යාධිනා ඵන්දමානං මරණෙන ඵන්දමානං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි ඵන්දමානං, නෙරයිකෙන දුක්ඛෙන ඵන්දමානං තිරච්ඡානයොනිකෙන දුක්ඛෙන ඵන්දමානං පෙත්තිවිසයිකෙන දුක්ඛෙන ඵන්දමානං මානුසිකෙන දුක්ඛෙන ඵන්දමානං ගබ්භොක්කන්ති[4]මූලකෙන දුක්ඛෙන ඵන්දමානං ගබ්භට්ඨිති[5]මූලකෙන දුක්ඛෙන ඵන්දමානං ගබ්භවුට්ඨානමූලකෙන දුක්ඛෙන ඵන්දමානං ජාතස්සූපනිබන්ධකෙන දුක්ඛෙන ඵන්දමානං ජාතස්ස පරාධෙය්‍යකෙන දුක්ඛෙන ඵන්දමානං අත්තූපක්කම[6]මූලකෙන දුක්ඛෙන ඵන්දමානං පරූපක්කම[7]මූලකෙන දුක්ඛෙන ඵන්දමානං දුක්ඛදුක්ඛෙන ඵන්දමානං සංඛාරදුක්ඛෙන ඵන්දමානං විපරිණාමදුක්ඛෙන ඵන්දමානං, චක්ඛුරොගෙන දුක්ඛෙන ඵන්දමානං සොතරොගෙන දුක්ඛෙන ඵන්දමානං ඝානරොගෙන දුක්ඛෙන ජිව්හාරොගෙන දුක්ඛෙන කායරොගෙන දුක්ඛෙන කණ්ණරොගෙන දුක්ඛෙන මුඛරොගෙන දුක්ඛෙන දන්තරොගෙන දුක්ඛෙන කාසෙන සාසෙන පිනාසෙන ඩහෙන ජරෙන කුච්ඡිරොගෙන මුච්ඡාය පක්ඛන්දිකාය සූලාය[8] විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන අපමාරෙන දද්දුයා කණ්ඩුයා කච්ඡුයා රඛසාය[9] විතච්ඡිකාය ලොහිතෙන පිත්තෙන මධුමෙහෙන අංසාය පිළකාය භගන්දලෙන පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන උතුපරිණාමජෙන ආබාධෙන විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය උච්චාරෙන පස්සාවෙන ඩංසමකසවාතා-තපසිරිංසපසම්ඵස්සෙන දුක්ඛෙන මාතුමරණෙන දුක්ඛෙන පිතුමරණෙන දුක්ඛෙන භාතුමරණෙන දුක්ඛෙන භගිනිමරණෙන දුක්ඛෙන පුත්ත-මරණෙන දුක්ඛෙන ධීතුමරණෙන දුක්ඛෙන ඤාතිව්‍යසනෙන දුක්ඛෙන භොගව්‍යසනෙන දුක්ඛෙන රොගව්‍යසනෙන දුක්ඛෙන සීලව්‍යසනෙන දුක්ඛෙන දිට්ඨිව්‍යසනෙන දුක්ඛෙන ඵන්දමානං සම්ඵන්දමානං විප්ඵන්දමානං වෙධමානං පවෙධමානං සම්පවෙධමානං පස්සාමි දක්ඛාමි ඔලොකෙමි නිජ්ඣායාමි උපපරික්ඛාමීති-පස්සාමි ලොකෙ පරිඵන්දමානං.

---

1. රත්ත - ස්‍යා. 2. දුට්ඨ - ස්‍යා.
3 මූළ්හ. (ස්‍යාම පොත්වල ඊදිසෙසු සමාසො දිස්සති.)
4. ගබ්භාවක්කන්ති - සීමු. 1. 5. ගබ්භ ඨිති - ස්‍යා. මජසං.
6. අත්තූපක්කමේන - ස්‍යා. මජසං. 7. පරූපක්කමේන - ස්‍යා මජසං
8. සූලෙන - මජසං. 9. නඛසාය - සීමු. II.

**පරිඵන්දමානං** - තෘෂ්ණාස්පන්දනයෙන් පොපියනු = සැලෙනු වූ, දෘෂ්ටිස්පන්දනයෙන් සැලෙනු වූ, ක්ලේශස්පන්දනයෙන් සැලෙනු වූ, ප්‍රයොගස්පන්දනයෙන් සැලෙනු වූ, විපාකස්පන්දනයෙන් සැලෙනු වූ, දුශ්චරිතස්පන්දනයෙන් සැලෙනු වූ, රාගයෙන් රක්ත වැ සැලෙනු වූ, ද්වේෂයෙන් දුෂ්ට වැ සැලෙනු වූ මෝහයෙන් මූඪ වැ සැලෙනු වූ මානයෙන් අරමුණෙහි බැඳී සැලෙනු වූ දෘෂ්ටියෙන් පරාමෘෂ්ට වැ සැලෙනු වූ ඖද්ධත්‍යයෙන් වික්ෂේපයට පැමිණ සැලෙනු වූ විචිකිත්සායෙන් සන්නිට්ඨානයට නො පැමිණ සැලෙනු වූ අනුශයයන්ගෙන් ස්ථිර බවට පැමිණ සැලෙනු වූ ලාභයෙන් සැලෙනු වූ, අලාභයෙන් - යශසින් - අයශසින් - ප්‍රශංසායෙන් - නින්දායෙන් - සුඛයෙන් - දුඃඛයෙන් සැලෙනු වූ, ජාතියෙන් සැලෙනු වූ, ජරායෙන් - ව්‍යාධියෙන් මරණයෙන් - සොක-පරිදෙව-දුක්-දෞර්මනස්-උපායාසයන්ගෙන් සැලෙනු වූ, නිරයදුකින් සැලෙනු වූ, තිරිසන්යොනිහි දුකින් - ප්‍රේතවිෂයයෙහි වූ දුකින් - මිනිස්ලොවැ වූ දුකින් සැලෙනු වූ, ගර්භාවක්‍රාන්තිමූලක දුකින් - ගර්භස්ථිතිමූලක දුකින් - ගර්භව්‍යුත්ථානමූලක දුකින් සැලෙනු වූ, උපන්නහු පිළිජග්නා දුකින් - උපන්නහු පරා අයත් කොට ඇති දුකින් - ආත්මොපක්‍රමමූලක දුකින් - පරොපක්‍රමමූලකදුකින් - දුඃඛදුඃඛ සඞ්ඛ්‍යාත කායිකචෛතසිකදුඃඛවේදනායෙන් - සංස්කාරදුඃඛයෙන් - විපරිණාම දුඃඛයෙන් සැලෙනු වූ, චක්ෂූරොගදුඃඛයෙන් සැලෙනු වූ, ශ්‍රොත්‍රරොග දුඃඛයෙන් - ඝ්‍රාණරොගදුඃඛයෙන් - ජිහ්වාරොගදුඃඛයෙන් - කායරොග දුඃඛයෙන් - කර්ණරොගදුඃඛයෙන් - මුඛරොගදුඃඛයෙන් - දන්තරොග දුඃඛයෙන්, කාසයෙන් ශ්වාසයෙන් පීනසයෙන් දාහයෙන් ජ්වරයෙන් කුක්ෂිරොගයෙන් මූර්ඡායෙන් ලොහිතාතිසාරයෙන් ආමශූලයෙන් මහාවිරෙචනයෙන් කුෂ්ඨයෙන් ගණ්ඩයෙන් ශ්වේතකුෂ්ඨයෙන් ශොෂව්‍යාධියෙන් අපස්මාරයෙන් දද්‍රු(=දද)යෙන් කණ්ඩූතියෙන් මහාකණ්ඩූතියෙන් නියපහරින් හටගත් රොගයෙන් විතච්ඡිකායෙන් (=අතුල්පතුල් පැලීමෙන්) රක්තපිත්තයෙන් මධුමෙහයෙන් අර්ශසින් රත්පිළිකාරොගයෙන් භගන්දරායෙන් පිතින් උපදනා රොගයෙන් සෙමින් උපදනා රොගයෙන් වයින් උපදනා රොගයෙන් සාන්නිපාතිකරොගයෙන් ඍතුපරිණාමයෙන් උපදනා රොගයෙන් විෂම වූ ස්ථානනිෂද්‍යාදියෙන් උපදනා රොගයෙන් වධබන්ධනාදි උපක්‍රමයෙන් උපදනා රොගයෙන් කර්මවිපාකයෙන් උපදනා රොගයෙන් ශීතයෙන් උෂ්ණයෙන් ජිඝත්සායෙන් පිපාසායෙන් උච්චාර(=මලකිස)යෙන් ප්‍රස්‍රාව (=මූකිස)යෙන් මැසි මදුරු වා අවු දික්දූපහසින් වූ දුකින් මව මල දුකින් පියා මල දුකින් බෑයන් මල දුකින් බූන් මල දුකින් පුතුන් මල දුකින් දූන් මල දුකින් නෑයන්ගේ වැසනින් වූ දුකින් භොගව්‍යසනයෙන් වූ දුකින් රොගව්‍යසන දුකින් ශීලව්‍යසන දුකින් දෘෂ්ටිව්‍යසන දුකින් සැලෙනුවහු පුනපුනා සැලෙනුවහු වෙසෙසින් සැලෙනුවහු වෙව්ලනුවහු වෙසෙසින් වෙව්ලනුවහු පුනපුනා වෙව්ලනුවහු බලමි දක්මි අවලොකන කෙරෙමි සිතමි විමසමි නුයි - 'පස්සාමි ලොකෙ පරිඵන්දමානං' යනු වේ.

**පජං ඉමං තණ්හාගතං භවෙසූති** - 'පජා'ති සත්තාධිවචනං. **තණ්හාති** - රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා භවතණ්හා විභවතණ්හා, තණ්හානුගතං තණ්හානුසටං තණ්හාපන්නං[1] තණ්හාපරිපතිතං[2] අභිභූතං පරියාදින්නචිත්තං; **භවෙසූ'**ති - කාමභවෙ රූපභවෙ අරූපභවෙති 'පජං ඉමං තණ්හාගතං භවෙසු.'

**හීනා නරා මච්චුමුඛෙ ලපන්ති'**ති - 'හීනා නරා'ති හීනෙන කායකම්මෙන සමන්නාගතාති හීනා නරා, හීනෙන වචීකම්මෙන සමන්නාගතාති හීනා නරා, හීනෙන මනොකම්මෙන සමන්නාගතා - හීනෙන පාණාතිපාතෙන සමන්නාගතා-හීනෙන අදින්නාදානෙන- හීනෙන කාමෙසු මිච්ඡාචාරෙන- හීනෙන මුසාවාදෙන- හීනාය පිසුනාය වාචාය- හීනාය ඵරුසාය වාචාය- හීනෙන සම්ඵප්පලාපෙන- හීනාය අභිජ්ඣාය- හීනෙන ව්‍යාපාදෙන- හීනාය මිච්ඡාදිට්ඨියා- හීනෙහි සංඛාරෙහි- හීනෙහි පඤ්චහි කාමගුණෙහි- හීනෙහි පඤ්චහි නීවරණෙහි- හීනාය චෙතනාය- හීනාය පත්ථනාය- හීනාය පණිධියා සමන්නාගතාති හීනා නිහීනා ඔමකා ලාමකා ජතුක්කා[3] පරිත්තාති හීනා නරා. **මච්චුමුඛෙ ලපන්තීති** - 'මච්චුමුඛෙ' ති මාරමුඛෙ මරණමුඛෙ මච්චුපත්තා මච්චුසමපත්තා මච්චූපගතා මාරපත්තා මාරසමපත්තා මාරූපගතා මරණපත්තා මරණසමපත්තා මරණූපගතා ලපන්ති සල්ලපන්ති සොචන්ති කිලමන්ති පරිදෙවන්ති උරත්තාළිං කන්දන්ති සම්මොහං ආපජ්ජන්තීති 'හීනා නරා මච්චුමුඛෙ ලපන්ති.'

**අවීතතණ්හා සෙ භවාභවෙසූ'**ති - 'තණ්හා'ති රූපතණ්හා -පෙ- ධම්මතණ්හා; **භවාභවෙසූති** - භවාභවෙ කම්මභවෙ පුනබ්භවෙ, කාමභවෙ කම්මභවෙ කාමභවෙ පුනබ්භවෙ, රූපභවෙ කම්මභවෙ රූපභවෙ පුනබ්භවෙ, අරූපභවෙ කම්මභවෙ අරූපභවෙ පුනබ්භවෙ, පුනප්පුනභවෙ පුනප්පුනගතියා පුනප්පුනඋප්පත්තියා පුනප්පුනපටිසන්ධියා පුනප්පුනඅත්තභාවාභිනිබ්බත්තියා අවීතතණ්හා අවිගතතණ්හා අචත්තතණ්හා අවන්තතණ්හා අමුත්තතණ්හා අප්පහීනතණ්හා අප්පටිනිස්සට්ඨතණ්හාති 'අවීතතණ්හා සෙ භවාභවෙසු'.

තෙනාහ භගවා:

> "පස්සාමි ලොකෙ පරිඵන්දමානං
> පජං ඉමං තණ්හාගතං භවෙසු,
> හීනා නරා මච්චුමුඛෙ ලපන්ති
> අවීතතණ්හා සෙ භවාභවෙසූ"ති.

---

1. තණ්හාධිපන්නං - ස. 2. පාතිතං - ස. 3. ජතුක්කා - සීමු. II.

**පජං ඉමං තණ්හාගතං භවෙසු** – ‘පජා’ යනු: සත්නට නමෙකි. **තණ්හා** යනු: රූපතෘෂ්ණා යැ ශබ්දතෘෂ්ණා යැ ගන්ධතෘෂ්ණා යැ රසතෘෂ්ණා යැ ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා යැ ධර්මතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි. තෘෂ්ණාවට පිවිසි තෘෂ්ණාවෙන් වැසුණු තෘෂ්ණාවට පැමිණි තෘෂ්ණාවෙන් හෙලන ලද මඩනා ලද්දහු හාත්පසින් ගත්නාලද සිත් ඇත්තහු; **භවෙසු** – කාමභවයෙහි රූපභවයෙහි අරූපභවයෙහි තුසි: ‘පජං ඉමං තණ්හාගතං භවෙසු’ යනු වේ.

**හීනා නරා මච්චුමුඛෙ ලපන්ති** – ‘හීනා නරා’ යනු: හීන වූ කායකර්මයෙන් යුක්ත වූවාහු තුසි හීනනරයෝ = සත්ත්වයෝ; හීන වූ වාක්කර්මයෙන් යුක්ත වූවාහු තුසි හීනනරයෝ, හීන වූ මනඃකර්මයෙන් යුක්ත වූවාහු – හීන වූ ප්‍රාණඝාතයෙන් යුක්ත වූවාහු – හීන වූ අදත්තාදානයෙන් – හීන වූ කාමමිථ්‍යාචාරයෙන් – හීන වූ මෘෂාවාදයෙන් – හීන වූ පෛශුන්‍ය වචනයෙන් – හීන වූ පරුෂවචනයෙන් – හීන වූ සම්පප්‍රලාපයෙන් – හීන වූ අභිධ්‍යායෙන් – හීන වූ ව්‍යාපාදයෙන් – හීන වූ මිථ්‍යාදෘෂ්ටියෙන් – හීන වූ සංස්කාරයන්ගෙන් – හීන වූ පඤ්චකාමගුණයන්ගෙන් – හීන වූ පඤ්ච නීවරණයෙන් – හීන වූ චේතනායෙන් – හීන වූ ප්‍රාර්ථනායෙන් – හීන වූ ප්‍රණිධියෙන් යුක්ත වූවාහු තුසි හීන වූවාහු නිහීන වූවාහු ඔමක වූවාහු ලාමක වූවාහු අප්‍රත්‍යය වූවාහු පරිත්ත වූවාහු තුසි හීන වූ සත්ත්වයෝ; **මච්චුමුඛෙ ලපන්ති** – ‘මච්චුමුඛෙ’ යනු: මාරමුඛයෙහි මරණමුඛයෙහි මෘත්‍යු = මරු වෙත පැමිණියාහු, මරු වෙත සපැමිණියාහු මරුට උපගත වූවාහු, මරණයට පැමිණියාහු, සපැමිණියාහු, මරණොපගත වූවාහු කියති, පුනපුනා කියති, ශොක කෙරෙති, වෙහෙසෙති, පරිදෙවනා කෙරෙති, ළෙහි පැහැර හඬති. සම්මෝහයට පැමිණෙත් තුසි – ‘හීනා නරා මච්චුමුඛෙ ලපන්ති’ යනු වේ.

**අවීතතණ්හා සෙ භවාභවෙසු** – ‘තණ්හා’ යනු: රූපතෘෂ්ණා යැ... ධර්ම තෘෂ්ණා යි. **භවාභවෙසු** – භව අභව සඞ්ඛ්‍යාතකාමභවයෙහි හා රූපාරූපභව යෙහි වූ, කර්මවෘත්තයෙහි විපාකවෘත්තයෙහි, කාමධාතුයෙහි වූ කර්මවෘත්ත විපාකවෘත්තයෙහි, රූපධාතුයෙහි වූ කර්මවෘත්තවිපාකවෘත්තයෙහි, අරූප-ධාතුයෙහි වූ කර්මවෘත්තවිපාකවෘත්තයෙහි, නැවත නැවත උත්පත්ති-යෙහි, පුනපුනා පස්ගතියෙහි, පුනපුනා උපතෙහි, පුනපුනා පිළිසඳෙහි, පුනපුනා ආත්මභාවයන්ගේ පහළ වීමෙහි පහ නො වූ තෘෂ්ණා ඇති අවිගත තෘෂ්ණා ඇති (තදඞ්ග විසින්) ත්‍යාග නො කළ තෘෂ්ණා ඇති (විෂ්කම්භණ විසින්) වමනය නො කළ තෘෂ්ණා ඇති (සමුච්ඡේද විසින්) නො මිදූ තෘෂ්ණා ඇති (ප්‍රතිප්‍රශ්‍රබ්ධි විසින්) අප්‍රහීණ තෘෂ්ණා ඇති (නිස්සරණ ප්‍රහාණ විසින්) අප්‍රතිනිසෘෂ්ට තෘෂ්ණා ඇත් තුසි – ‘අවීතතණ්හා සෙ භවාභවෙසු’ යනු වේ.

එයින් වදාළහ බුදුහු: “පස්සාමි – පෙ – භවාභවෙසු” යි.

2 - 6

මමායිතෙ පස්සථ ඵන්දමානෙ
මච්ඡෙව[1] අප්පොදකෙ[2] ඛීණසොතෙ,
එතම්පි[3] දිස්වා අමමො චරෙය්‍ය
භවෙසු ආසත්තිමකුබ්බමානො.

**මමායිතෙ පස්සථ ඵන්දමානෙ**'ති – 'මමත්තා'ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච දිට්ඨිමමත්තඤ්ච.

කතමං තණ්හාමමත්තං? යාවතා තණ්හාසංඛාතෙන සීමකතං මරියාදිකතං[4] ඔධිකතං පරියන්තකතං පරිග්ගහිතං මමායිතං ඉදං මමං එතං මමං එත්තකං මමං එත්තාවතා මමං මම රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථු හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ජනපදො කොසො ච කොට්ඨාගාරං ච කෙවලම්පි මහාපඨවිං තණ්හාවසෙන මමායති. යාවතා[5] අට්ඨසතතණ්හාවිචරිතං, ඉදං තණ්හාමමත්තං.

කතමං දිට්ඨිමමත්තං? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං[6] දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො[7] අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො විපරීතග්ගාහො විපල්ලාසග්ගාහො මිච්ඡාගාහො අයාථාවතස්මිං 'යාථාවත'න්ති[8]ගාහො යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි, ඉදං දිට්ඨිමමත්තං.

**මමායිතෙ පස්සථ ඵන්දමානෙ**'ති මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි ඵන්දන්ති, අච්ඡින්දන්තෙපි[9] ඵන්දන්ති, අච්ඡින්නෙපි ඵන්දන්ති, මමායිතං ච වත්ථුං විපරිණාමසඞ්කිනොපි ඵන්දන්ති, විපරිණමන්තෙපි ඵන්දන්ති, විපරිණතෙපි ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්ති. එවං ඵන්දමානෙ සම්ඵන්දමානෙ විප්ඵන්දමානෙ වෙධමානෙ පවෙධමානෙ සම්පවෙධමානෙ පස්සථ දක්ඛථ ඔලොකෙථ නිජ්ඣායථ උපපරික්ඛථාති 'මමායිතෙ පස්සථ ඵන්දමානෙ.'

---

1. මච්ඡාව - මු. II. 2. අප්පොදකා - සභා. 3. එවම්පි - මු II.
4. සීමාකතං - මු. II. මරියාදකතං - මු. I. මජ්සං.
5. 'යාවතා'ති ස්‍යාම පොත්ථකෙ නත්ථි. 6. විප්ඵන්දිකං - සීමු I. මජ්සං.
7. පතිට්ඨාහො - සීමු. I මජ්සං.
8. අයාථාවකස්මිං යාථාවකන්ති - සීමු. II. - අයථාවතස්මිං යථාවතන්ති-ස.
9. අච්ඡිජ්ජන්තෙපි - සීමු. II.

## 2 – 6.

සිඳීගිය දහර ඇති දියත්තෙක්හි පොපියන (සැලෙන) මසුන් මෙන් මාගේ යැයි ගත්තා ලද වස්තුයෙහි පොපියන සත්ත්වයන් බලවු. (මමායිත වස්තූන්හි) තෙල ආදීනවය ද දක මමායන රහිත වැ කාමාදි-භවයෙහි නො ඇලෙමින් හැසිරෙන්නේ යි.

**මමායිතෙ පස්සථ ඵන්දමානෙ** – 'මමත්තා' යනු: තෘෂ්ණාමමත්වය ද, දෘෂ්ටිමමත්වය දැයි මමත්ව (ආලය) දෙකෙකි: තෘෂ්ණාමමත්ව කවරැ ? යත්: 'මේ මාගේ යැ, තෙල මාගේ යැ, මෙතෙක් මාගේ යැ, මෙ පමණ මාගේ යැ'යි යම්තාක් තෘෂ්ණා කොටසින් හිමි කරන ලද ද, මයීන්දු කරන ලද ද, අවධි කරන ලද ද, පරිච්ඡෙද කරන ලද ද, අයත් කරන ලද ද, මමායන කරන ලද ද; 'මාගේ රූපයෝ යැ ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ පහස්හු යැ අතුරුණු යැ පොරෝන යැ දැසිදස්හු යැ එළුබැටළු යැ හූරුකුකුළු යැ ඇත්අස්ගවවෙළඹු යැ කෙත් යැ වතු යැ අමුරනැ රන්රනැ ගම්නියම්ගම්රජදහන්හු යැ රට යැ දනවු යැ කොෂ යැ කොටුගුළු යැ'යි සියලු මැ මහපොළොව තෘෂ්ණාවශයෙන් මමායන කෙරෙයි. යම්තාක් අෂ්ටෝත්තරශතතෘෂ්ණාවිචරිතයෙක් වේ ද, මේ යැ තෘෂ්ණාමමත්ව නම්.

දෘෂ්ටිමමත්ව කවරැ ? යත්: ('රූපං අත්තතො සමනුපස්සති' යනාදීන් සිටි) විංශද්වස්තුක සත්කායදෘෂ්ටි යැ, ('නත්ථි දින්නං' යනාදීන් පැවැති) දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි යැ, ('සස්සතො ලොකො' යනාදි නයින් පැවැති) දශවස්තුක අන්තග්‍රාහිකා දෘෂ්ටි යැ යන මෙබඳු වූ දෘෂ්ටියක් දෘෂ්ටිගත යෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් (සම්‍යග්දෘෂ්ටිය විනිවිදින) දෘෂ්ටිවිෂූකයෙක් දෘෂ්ටිවිලතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් (අරමුණු දැඩි කොට) ගැනීමෙක් බලවත් ගැනීමෙක් (නිත්‍යාදිවශයෙන්) අභිනිවේශයෙක් පරාමර්ශ-යෙක් කුත්සිතමාර්ගයෙක් අයථාමාර්ගයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතන-යෙක් විරුද්ධග්‍රාහයෙක් විපරීතග්‍රාහයෙක් විපර්‍යාසග්‍රාහයෙක් මිථ්‍යාග්‍රාහයෙක් අස්වභාවයෙහි ස්වභාව යැයි ගැනීමෙක් වේ ද, යම්තාක් දෙසැට මිසදිටු කෙනෙක් වෙත් ද, මේ යැ දෘෂ්ටිමමත්ව නම්.

**මමායිතෙ පස්සථ ඵන්දමානෙ** – මාගේ යැයි ගත් වස්තුව අසිඳ ගනිතියි සැක ඇති ව ද සැලෙති. අසිඳුනා කල්හි ද සැලෙති. අසිඳගත් කල්හි ද සැලෙත්. තවද මමායිත වස්තුව පෙරළෙයි යන සැක ඇති ව ද සැලෙති. පෙරළෙන කල්හි ද සැලෙති. පෙරළුණු කල්හි ද සැලෙති, අතිශයින් සැලෙති, විවිධ ව සැලෙති, බියෙන් වෙවුලති, තැති ගනිති, ලොමුදහ ගනිත් මෙසෙයින් සැලෙන විසැලෙන වෙවුලන තැති ගන්නා ලොමුදහ ගන්නා සත්ත්වයන් බලවු, දකිවු සිතවු විමසවු. එහෙයින් 'මමායිතෙ පස්සථ ඵන්දමානෙ' යනු වේ.

**මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ**'ති – යථා මච්ඡා[1] අප්පොදකෙ පරිත්තොදකෙ උදකපරියාදානෙ[2] කාකෙහි වා කුලලෙහි වා බලාකාහි[3] වා යෙහි වා තෙහි පරිපාතියමානා උක්ඛිපියමානා ඛජ්ජමානා ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්ති, එවමෙවං පජා මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි ඵන්දන්ති, අච්ඡින්දන්තෙපි ඵන්දන්ති, අච්ඡින්නෙපි ඵන්දන්ති, මමායිතං වත්ථුං විපරිණාමසඞ්කිනොපි ඵන්දන්ති, විපරිණාමන්තෙපි ඵන්දන්ති, විපරිණතෙපි ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්තීති 'මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ.'

**එතම්පි[4] දිස්වා අමමො චරෙය්‍යා**ති – එතං[5] ආදීනවං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා මමත්තෙසූති – එතම්පි දිස්වා; **අමමො චරෙය්‍යා**'ති – 'මමත්තා'ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච –පෙ– ඉදං තණ්හාමමත්තං. දිට්ඨිමමත්තඤ්ච –පෙ– ඉදං දිට්ඨිමමත්තං. තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අමමායන්තො සොතං අමමායන්තො ඝානං අමමායන්තො ජිව්හං අමමායන්තො කායං අමමායන්තො මනං අමමායන්තො රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ ධම්මෙ කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අමමායන්තො අගණ්හන්තො අපරාමසන්තො අනභිනිවිසන්තො චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති 'එතම්පි[6] දිස්වා අමමො චරෙය්‍ය.'

**භවෙසු ආසත්තිමකුබ්බමානො**'ති – 'භවෙසූ'ති කාමභවෙ රූපභවෙ අරූපභවෙ; ආසත්ති වුච්චති තණ්හා යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං. 'භවෙසු ආසත්තිමකුබ්බමානොති' – ඡන්දං පෙමං රාගං ඛන්තිං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානොති 'භවෙසු ආසත්තිමකුබ්බමානො.'

තෙනාහ භගවා:

"මමායිතෙ පස්සථ ඵන්දමානෙ
මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ,
එතම්පි[6] දිස්වා අමමො චරෙය්‍ය
භවෙසු ආසත්තිමකුබ්බමානො"ති.

**2 – 7**

උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං
ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො,[7]
යදත්තගරහී තදකුබ්බමානො
න ලිප්පතී දිට්ඨසුතෙසු ධීරො.

1. මච්ඡා – සීමු II. 2. පරියාදානොදකෙ – සීමු. I. 3. බලාකෙහි – ස්‍යා.
4. එවම්පි – සීමු. II. 5. එවං – සීමු. II. 6. එවම්පි – සීමු. I.
7. අනනුගිද්ධො – ස

**මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ** – මිඳ වූ කැලැඹුණු සිඳුණු දියෙහි කවුඩන් හෝ උකුසන් හෝ කොකුන් හෝ අන්‍ය පක්ෂි කෙනකුන් හෝ විසින් වෙහෙසනු ලබන නහනු ලබන කනු ලබන (එහෙයින් ම) සැලෙන විසැලෙන වෙවුලන අතිශයින් වෙවුලන තැති ගත්තා මසුන් මෙන් මේ සත්ත්වයෝ මමායිත වස්තුව අසිදගතිති සැක ඇති ව සැලෙති, අසිඳුනා කල්හි ද සැලෙති, අසිඳගත් කල්හි ද සැලෙති, මමායිත වස්තුව විපරිණාම (=පෙරළෙන) සැක ඇති ව... පෙරළෙන කල්හි ... පෙරළුණු කල්හි ද සැලෙති, විසැලෙති, වෙවුලති, තැතිගනිති, ලොමුදහ ගනිත් නුයි 'මච්ඡෙව අප්පොදකෙ ඛීණසොතෙ' යනු වේ.

**එතම්පි දිස්වා අමමො චරෙය්‍ය** – මමත්වයෙහි තෙල ආදීනවය දැක බලා තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත (=ප්‍රකට) කොට නුයි 'එතම්පි දිස්වා අමමො චරෙය්‍ය' යනු වේ' 'මමත්තා' යනු: තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය දැයි මමත්ව දෙකෙකි...තෘෂ්ණාමමත්වය හැරපියා, දෘෂ්ටිමමත්වය දුරු කොට, ඇස තෘෂ්ණාදෘෂ්ටි විසින් ආලය නො කරනුයේ කන...නැහය...දිව...කය...සිත මමායන (= ආලය) නො කරනුයේ, රූප ශබ්ද ගන්ධ රස පහස් දහම් කුලය ගණයා ආවාසය ලාභය යසස පැසැසුම සුවය සිවුර පිඬුවා සෙනසුන ගිලන්පස බෙහෙත්පිරිකර, කාම – රූප – අරූපධාතුව, කාම – රූප – අරූප භවය, සඤ්ඤ – අසඤ්ඤ – නෙවසඤ්ඤනාසඤ්ඤභවය, එකවොකාර – චතුවොකාර – පඤ්චවොකාරභවය, අතීතය අනාගතය ප්‍රත්‍යුත්පන්නය රූපායතනය, ශබ්දායතනය ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනය ධර්මායතනය ආලය නො කරනුයේ නො ගන්නේ පරාමර්ශ නො කෙරෙමින් නො බස්මින් හැසිරෙන්නේ යැ...යපනය කරන්නේ නුයි 'එතමපි දිස්වා අමමො චරෙය්‍ය'.

**භවෙසු ආසත්තිමකුබ්බමානො** – 'භවෙසු' යනු: කාම – රූප – අරූප භවයෙහි; 'ආසත්ති' යි තෘෂ්ණාව කියනු ලබා. රාගය සංරාගය... අභිධ්‍යාව ලොභඅකුශලමූලය යි. 'භවෙසු ආසත්තිමකුබ්බමානො' යනු: ඡන්දය ප්‍රේමය රාගය කැමැත්ත නො කරනුයේ නූපදවනුයේ වෙසෙසින් නූපදවනුයේ නො නිපදවනුයේ නුයි 'භවෙසු ආසත්තිමකුබ්බමානො' යනු වේ.

එයින් වදාලහ බුදුහු:

"මමායිතෙ – පෙ – ආසත්තිමකුබ්බමානො" යි.

**2 - 7.**

(ඵස්ස – ඵස්සසමුදයාදි) දෙ දෙ අන්තයන්හි ඡන්දරාගය දුරු කොට (චක්ඛුසම්ඵස්සාදි) ස්පර්ශය ත්‍රිවිධ පරිඥයෙන් දැන රූපාදියෙහි ගිජු නො වූ කල නො කල හෙයින් තමහට ගරහ උපදවන කායදුශ්චරිත කායසුචරිතාදිය නො කරන ධීර (ප්‍රාඥ) තෙම රූප ශබ්ද (ගන්ධරසස්ප්‍රෂ්ටව්‍ය) ආයතනයන්හි තෘෂ්ණාදෘෂ්ටි විසින් නො ඇලේ.

**උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දන්ති** – 'අන්තා'ති ද්වෙ අන්තා: ඵස්සො එකො අන්තො, ඵස්සසමුදයො දුතියො අන්තො. අතීතො එකො අන්තො, අනාගතො දුතියො අන්තො. සුඛා වෙදනා එකො අන්තො, දුක්ඛා වෙදනා දුතියො අන්තො. නාමං එකො අන්තො, රූපං දුතියො අන්තො. ඡ අජ්ඣත්තිකානි ආයතනානි එකො අන්තො, ඡ බාහිරානි ආයතනානි දුතියො අන්තො. සක්කායො එකො අන්තො, සක්කාය–සමුදයො දුතියො අන්තො. **ඡන්දො**'ති යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො, කාමුපාදානං කාමච්ඡන්දනීවරණං.[*] **උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දන්ති** – උභොසු අන්තෙසු ඡන්දං විනෙය්‍ය පටිවිනෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය ව්‍යන්තී කරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති 'උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං.'

**ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධොති** – **'ඵස්සො'**ති චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනො–සම්ඵස්සො අධිවචනසම්ඵස්සො පටිඝසම්ඵස්සො සුඛවෙදනීයො සම්ඵස්සො දුක්ඛවෙදනීයො සම්ඵස්සො අදුක්ඛමසුඛවෙදනීයො සම්ඵස්සො කුසලො ඵස්සො අකුසලො ඵස්සො අව්‍යාකතො ඵස්සො කාමාවචරො ඵස්සො රූපාවචරො ඵස්සො අරූපාවචරො ඵස්සො සුඤ්ඤතො ඵස්සො අනිමිත්තො ඵස්සො අප්පණිහිතො ඵස්සො ලොකියො ඵස්සො ලොකුත්තරො ඵස්සො අතීතො ඵස්සො අනාගතො ඵස්සො පච්චුප්පන්නො ඵස්සො, යො එවරූපො ඵස්සො ඵුසනා සම්ඵුසනා[1] සම්ඵුසිතත්තං, අයං වුච්චති ඵස්සො.

**ඵස්සං පරිඤ්ඤායා**'ති – ඵස්සං තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා ඤාත පරිඤ්ඤාය තීරණපරිඤ්ඤාය පහානපරිඤ්ඤාය.

කතමා ඤාතපරිඤ්ඤා? ඵස්සං ජානාති: 'අයං චක්ඛුසම්ඵස්සො, අයං සොතසම්ඵස්සො, අයං ඝානසම්ඵස්සො, අයං ජිව්හාසම්ඵස්සො, අයං කායසම්ඵස්සො, අයං මනොසම්ඵස්සො, අයං අධිවචනසම්ඵස්සො, අයං පටිඝසම්ඵස්සො, අයං සුඛවෙදනීයො ඵස්සො, අයං දුක්ඛවෙදනීයො ඵස්සො, අයං අදුක්ඛමසුඛවෙදනීයො ඵස්සො, අයං කුසලො ඵස්සො, අයං අකුසලො ඵස්සො, අයං අව්‍යාකතො ඵස්සො, අයං කාමාවචරො ඵස්සො, අයං රූපාවචරො ඵස්සො, අයං අරූපාවචරො ඵස්සො, අයං සුඤ්ඤතො ඵස්සො, අයං අනිමිත්තො ඵස්සො, අයං අප්පණිහිතො ඵස්සො, අයං ලොකියො ඵස්සො, අයං ලොකුත්තරො ඵස්සො, අයං අතීතො ඵස්සො, අයං අනාගතො ඵස්සො, අයං පච්චුප්පන්නො ඵස්සො'ති ජානාති පස්සති. අයං ඤාතපරිඤ්ඤා.

---

1. ඵුසනා, සම්ඵුසනා - ස.

[*] ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ.

**උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං** – 'අන්තා' යනු: අන්ත දෙකෙකි: ස්පර්ශය එක් අන්තයෙකැ, ස්පර්ශසමුදය දෙවැනි අන්තය යි. අතීතය එක් අන්තයෙකැ, අනාගතය දෙවැනි අන්තය යි. සුඛවේදනාව එක් අන්තයෙකැ, දුක් වේදනාව දෙවැනි අන්තය යි. නාමය එක් අන්තයෙකැ, රූපය දෙවැනි අන්තය යි. ෂඩ් ආධ්‍යාත්මිකායතනයෝ එක් අන්තයෙකැ, ෂඩ් බාහිරායතනයෝ දෙවැනි අන්තය යි. සත්කාය එක් අන්තයෙකැ, සත්කායසමුදය දෙවැනි අන්තය යි. **ඡන්ද නම්:** පස්කම්ගුණයෙහි කාම සංඛ්‍යාත ඡන්දය කාමරාගය කාමනන්දිය කාමතෘෂ්ණාව කාමස්නෙහය කාමපරිදාහය කාමමූර්ඡාව කාමඅධ්‍යවසානය (–බැසගැනීම) කාමෞඝය කාමයොගය කාමොපාදානය කාමච්ඡන්දනීවරණය යි. **උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං** – දෙ දෙ අන්තයන්හි ඡන්දරාගය සන්හිඳුවන්නේ යැ, දුරු කරන්නේ යැ, බැහැර කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අභාවයට පමුණුවන්නේ නුයි 'උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං' යනු වේ.

**ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො** – 'ඵස්සො' යනු: චක්ඛුසම්ඵස්ස යැ සොත – ඝාන – ජිව්හා – කාය – මනොසම්ඵස්ස යැ අධිවචන(–මනොද්වාරික) සම්ඵස්ස යැ පටිඝ(පඤ්චද්වාරික)සම්ඵස්ස යැ සුඛවේදනීය – දුක්ඛවේදනීය– අදුක්ඛමසුඛවේදනීය සම්ඵස්ස යැ කුසල්සිත් සහගත පහස යැ අකුසල්සිත් සහගත – අව්‍යාකෘත සිත් සහගත – කාමාවචර සිත් සහගත – රූපාවචර – අරූපාවචර – ශූන්‍යත – අනිමිත්ත – අප්‍රණිහිත – ලෞකික – ලොකොත්තර– අතීත – අනාගත – වර්තමාන පහස යැ යන මෙබඳු වූ පහස පහස්නා අයුර මොනොවට ස්පර්ශ කළ බව 'ඵස්ස' යි කියනු ලැබේ.

**ඵස්සං පරිඤ්ඤාය** – ස්පර්ශය ඥාතපරිඥ තීරණපරිඥ ප්‍රහාණපරිඥ යන තුන් පරිඥයෙන් දැන.

ඥාතපරිඥ කවරී ද යත්: මේ චක්ඛුසම්ඵස්ස යැ, මේ ශ්‍රොත්‍රසංස්පර්ශ යැ, මේ ඝ්‍රාණසංස්පර්ශ යැ, මේ ජිහ්වාසංස්පර්ශ යැ, මේ කායසංස්පර්ශ යැ, මේ මනස්සංස්පර්ශ යැ, මේ අධිවචනසංස්පර්ශ යැ, මේ ප්‍රතිඝසංස්පර්ශ යැ, මේ සුඛවේදනීයස්පර්ශ යැ, මේ දුඃඛවේදනීයස්පර්ශ යැ, මේ උපෙක්ෂා වේදනීයස්පර්ශ යැ, මේ කුශලස්පර්ශ යැ, මේ අකුශලස්පර්ශ යැ, මේ අව්‍යාකෘතස්පර්ශ යැ, මේ කාමාවචරස්පර්ශ යැ, මේ රූපාවචරස්පර්ශ යැ, මේ අරූපාවචරස්පර්ශ යැ, මේ ශූන්‍යතස්පර්ශ යැ, මේ අනිමිත්තස්පර්ශ යැ, මේ අප්‍රණිහිතස්පර්ශ යැ, මේ ලෞකිකස්පර්ශ යැ, මේ ලොකොත්තරස්පර්ශ යැ, මේ අතීතස්පර්ශ යැ, මේ අනාගතස්පර්ශ යැ, මේ ප්‍රත්‍යුත්පන්නස්පර්ශ යැ'යි ස්පර්ශය දැනගනී. මේ යැ ඥාතපරිඥ නම්.

කතමා තීරණපරිඤ්ඤා? එවං ඤාතං කත්වා ඵස්සං තීරෙති අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපස්සග්ගතො චලතො පභඞ්ගුතො අද්ධුවතො අතාණතො අලෙණතො අසරණතො අසරණීභූතතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරතො අඝමූලතො වධකතො විභවතො සාසවතො සංඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො ව්‍යාධිධම්මතො ˚මරණධම්මතො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාස – ධම්මතො සංකිලෙසිකධම්මතො සමුදයතො අත්ථඞ්ගමතො අස්සාදතො ආදීනවතො නිස්සරණතො තීරෙති. අයං තීරණපරිඤ්ඤා.

කතමා පහානපරිඤ්ඤා? එවං තීරෙත්වා ඵස්සෙ ඡන්දරාගං පජහති විනොදෙති ව්‍යන්තිං කරොති අනභාවං ගමෙති. වුත්තං හෙතං භගවතා: "යො භික්ඛවෙ ඵස්සෙසු ඡන්දරාගො, තං පජහථ. එවං සො ඵස්සො පහීනො භවිස්සති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවං ගතො[1] ආයතිං අනුප්පාදධම්මො"ති.[a] අයං පහානපරිඤ්ඤා.

**ඵස්සං පරිඤ්ඤායා'ති** – ඵස්සං ඉමාහි තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා; **අනානුගිද්ධො'ති** – ගෙධො වුච්චති තණ්හා "යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං"[b] යස්සෙසො ගෙධො පහීණො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති අගිද්ධො. සො රූපෙ අගිද්ධො සද්දෙ අගිද්ධො ගන්ධෙ අගිද්ධො රසෙ අගිද්ධො ඵොට්ඨබ්බෙ අගිද්ධො කුලෙ ගණෙ ආවාසෙ ලාභෙ යසෙ පසංසාය සුඛෙ චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ කාමධාතුයා රූපධාතුයා අරූපධාතුයා කාමභවෙ රූපභවෙ අරූපභවෙ සඤ්ඤාභවෙ අසඤ්ඤාභවෙ නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ එකවොකාරභවෙ චතුවොකාරභවෙ පඤ්චවොකාරභවෙ අතීතෙ අනාගතෙ පච්චුප්පන්නෙ දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු අගිද්ධො අගධිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො* පහීනගෙධො පටිනිස්සට්ඨගෙධො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො* පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතීභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො.

---

1. අනභාවකතො – සීමු I.

a. අයං සුත්තප්පදෙසො පෙය්‍යාලමුඛෙන ඛන්ධසංයුත්තතො ගහිතො'ති මඤ්ඤාම.

b. ධම්මසඞ්ගණී – නික්ඛෙපකණ්ඩ, ඛුද්දකවත්ථු විභඞ්ග.

*. පුප්ඵලක්ඛණන්තරිතො භාගො සීමු. I. පොත්ථකෙ න දිස්සති.

තීරණපරිඥා කවරී ද යත්: මෙසෙසින් ස්පර්ශය ප්‍රකට කොට දැන-මින් තීරණය කෙරෙයි (=සිතයි. කෙසේ ද ?) අනිත්‍ය හෙයින් සිතයි, දුක් හෙයින් රෝග හෙයින් ගණ්ඩහෙයින් ශල්‍ය හෙයින් අඝ(=දුක්) හෙයින් ආබාධ හෙයින් පර(අවසඟ) හෙයින් පලෝක (බිඳෙන) හෙයින් ව්‍යසන හෙයින් උපද්‍රව - භය - උපසර්ග - චඤ්චල - බිඳෙනසුලු - අධ්‍රැව - අත්‍රාණ - අලෙන - අශරණ - අශරණීභූත - සිස් - තුච්ඡ - ශූන්‍ය - අනාත්ම - ආදීනව - විපරිණාම-සවභාව - අසාර - අඝමූල - වධක - විභව - සාස්‍රව - හෙතුප්‍රත්‍යයාභිසංස්කෘත - මාරාමිෂ - ජාතිධර්ම - ජරාධර්ම - ව්‍යාධිධර්ම - මරණධර්ම්ම - ශොකපරිදෙව-දුඃඛදෞර්මනස්‍යොපායාසධර්ම - සංක්ලෙශධර්ම - සමුදය - අස්තඞ්ගම - ආස්වාද-ආදීනව හෙයින් නිස්සරණ හෙයින් තීරණය කෙරෙයි. මෝ යැ තීරණපරිඥා නම්.

ප්‍රහාණපරිඥා කවරී ද යත්: මෙසෙසින් තීරණය කොට ස්පර්ශයෙහි ඡන්දරාගය දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අභාවයට පමුණුවයි. මේ වදාරන ලද මැ ය භාග්‍යවතුන් වහන්සේ විසින්: "මහණෙනි, ස්පර්ශයන්හි ඡන්දරාගය දුරු කරවු. එවිට ඒ ස්පර්ශය ප්‍රහීණ වෙයි. උපුන් මුල් ඇතියේ (මුල්සුන්) තල්රැකක් මෙන් කරන ලදුයේ අභාවයට ගියේ මතු නූපදනා පියවි ඇතියේ වේ යැ"යි. මෝ යැ ප්‍රහාණපරිඥා නම්.

ඵස්සං පරිඤ්ඤාය - ස්පර්ශය මේ ත්‍රිවිධ පරිඥායෙන් දැන; අනානුගිද්ධො- 'ගෙධ' යී තෘෂ්ණාව කියනු ලබෝ. යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවෙක් ලොභඅකුශලමූලයෙක් වේ ද, යමක් හට තෙල ගෙධය ප්‍රහීණ වූයේ සිඳුනා ලදුයේ සන්හුන්තේ දුරු කරන ලදුයේ පෙරළා උපදනට අභව්‍ය වූයේ මාර්ගඥාන ගින්නෙන් දවන ලදුයේ වේ ද, හෙතෙම 'අගිද්ධ' යයි කියනු ලැබේ. හේ රූපයෙහි ගිජු නො වූයේ, ශබ්දයෙහි - ගන්ධයෙහි - රසයෙහි - ස්පර්ශයෙහි ගිජු නො වූයේ, කුලයෙහි ගණයෙහි ආවාසයෙහි යශස්හි ප්‍රශංසායෙහි සුඛයෙහි චීවර - පිණ්ඩපාත - සෙනාසන - ගිලන්-පසයෙහි, කාම - රූප - අරූපධාතුයෙහි, කාම - රූප - අරූපභවයෙහි, සඤ්ඤ - අසඤ්ඤ - නෙවසඤ්ඤනාසඤ්ඤ - එකවොකාර - චතුවොකාර - පඤ්ච-වොකාර භවයෙහි, අතීත - අනාගත - ප්‍රත්‍යුත්පන්නයෙහි, දෘෂ්ටශ්‍රැතමුත-විඥාතව්‍ය ධර්මයන්හි ගිජු නො වූයේ නො ගෙතුණේ මුසපත් නො වූයේ නො බැඳුණේ පහ වූ - හරන ලද - වමනය කරන ලද - මුදන ලද - ප්‍රහීණ වූ - දුරලන ලද තෘෂ්ණා ඇතියේ පහ වූ...දුරලන ලද රාග ඇතියේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳිනුයේ උතුම් වූ සිතින් යුක්ත ව වෙසේ නුයි 'ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො' යනු වේ.

**යදත්තගරහි තදකුබ්බමානො**'ති – 'යද'ත්ති[1] යං; **අත්තගරහීති** – ද්වීහි කාරණෙහි අත්තානං ගරහති: කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති? 'කතං මෙ කායදුච්චරිතං, අකතං මෙ කායසුචරිත'න්ති අත්තානං ගරහති. 'කතං මෙ වචීදුච්චරිතං, අකතං මෙ වචීසුචරිත'න්ති අත්තානං ගරහති. 'කතං මෙ මනොදුච්චරිතං, අකතං මෙ මනොසුචරිත'න්ති අත්තානං ගරහති. 'කතො මෙ පාණාතිපාතො, අකතා මෙ පාණාතිපාතා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතං මෙ අදින්නාදානං, අකතා මෙ අදින්නාදානා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතො මෙ කාමෙසු මිච්ඡාචාරො, අකතා කාමෙසු මිච්ඡාචාරා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතො මෙ මුසාවාදො, අකතා මෙ මුසාවාදා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතා මෙ පිසුනාවාචා, අකතා මෙ පිසුනාය වාචාය[2] වෙරමණී'ති අත්තානං ගරහති. 'කතා මෙ ඵරුසා වාචා, අකතා මෙ ඵරුසාය වාචාය[3] වෙරමණී'ති අත්තානං ගරහති. 'කතො මෙ සම්ඵප්පලාපො, අකතා මෙ සම්ඵප්පලාපා වෙරමණී'ති අත්තානං ගරහති. 'කතා මෙ අභිජ්ඣා, අකතා මෙ අනභිජ්ඣා'ති[4] අත්තානං ගරහති. 'කතො මෙ ව්‍යාපාදො, අකතො මෙ අව්‍යාපාදො'ති[5] අත්තානං ගරහති. 'කතා මෙ මිච්ඡාදිට්ඨි, අකතා මෙ සම්මාදිට්ඨී'ති[6] අත්තානං ගරහති. එවං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති. අථවා සීලෙසු'ම්හි න පරිපූරකාරීති අත්තානං ගරහති. ඉන්ද්‍රියෙසු'ම්හි අගුත්තද්වාරොති අත්තානං ගරහති. භොජනෙ'ම්හි අමත්තඤ්ඤූති අත්තානං ගරහති. ජාගරියං අනනුයුත්තොම්හීති අත්තානං ගරහති. සතිසම්පජඤ්ඤෙන අසමන්නාගතොති අත්තානං ගරහති. අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති අත්තානං ගරහති. අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති අත්තානං ගරහති. අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති අත්තානං ගරහති. අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති අත්තානං ගරහති. අභාවිතානි මෙ පඤ්ච බලානීති අත්තානං ගරහති. අභාවිතා මෙ සත්ත බොජ්ඣඞ්ගාති අත්තානං ගරහති. අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති අත්තානං ගරහති. දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති අත්තානං ගරහති. සමුදයො මෙ අප්පහීනොති අත්තානං ගරහති. මග්ගො මෙ අභාවිතොති අත්තානං ගරහති. නිරොධො මෙ අසච්ඡිකතොති අත්තානං ගරහති. එවං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති. එවං අත්තගරහිතං කම්මං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානොති 'යදත්තගරහී තදකුබ්බමානො.'

**න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො**ති – 'ලෙපා'ති ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච –පෙ– අයං තණ්හාලෙපො –පෙ– අයං දිට්ඨිලෙපො. ධීරොති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී. ධීරො තණ්හාලෙපං පහාය දිට්ඨිලෙපං පටිනිස්සජ්ජිත්වා දිට්ඨෙ න ලිප්පති සුතෙ න ලිප්පති මුතෙ න ලිප්පති විඤ්ඤාතෙ න ලිප්පති න සංලිප්පති[7] න උපලිප්පති. අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො[8] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො'ති.

---

1 යදත්ති – ඡමු. II. 2. පිසුණාවාචා – සීමු. I. 3. ඵරුසවාචා – සීමු. I.
4. අභිජ්ඣාවෙරමණීති – සීමු. I. 5. ව්‍යාපාද වෙරමණීති. I.
6. මිච්ඡාදිට්ඨිවෙරමණීති – I. 7. පලිප්පති – සීමු. II.
8. නිස්සතො – ස.

**යදත්තගරහී තදකුබ්බමානො** – 'යද' යනු: යං. **අත්තගරහී** – කළ හෙයින් ද නො කළ හෙයින් දූයි දෙ කරුණෙකින් තමහට ගරහයි: කිසෙයින යත්: මා විසින් කායදුශ්චරිතය කරන ලද, කායසුචරිතය නො කරන ලදූයි තමහට ගරහයි. මා විසින් වාග්දුශ්චරිතය කරන ලද, වාක්සුචරිතය නො කරන ලදූයි ද – මා විසින් මනොදුශ්චරිතය කරන ලද, මනස්සුචරිතය නො කරන ලදූයි ද තමහට ගරහයි. මා විසින් ප්‍රාණඝාතය කරන ලද, ප්‍රාණඝාතයෙන් විරමණය නො කරන ලදූයි ද – අදත්තාදානය කරන ලද, අදිත්තාදානවිරමණය නො කරන ලදූයි ද – මා විසින් කාමයෙහි වරදවා හැසිරෙන ලද, කාමමිථ්‍යාචාරවිරමණය නො කරන ලදූයි ද – මෘෂාවාදය කරන ලද, මෘෂාවාදයෙන් විරමණය නොකරන ලදූයි ද – පිසුනුබස් කියන ලද, පිසුනුබසින් විරමණය නො කරන ලදූයි ද – පරොස්බස් කියන ලද, පරොස්බසින් විරමණය නො කරන ලදූයි ද – ප්‍රලාපබස් කියන ලද, ප්‍රලාපබසින් විරමණය නො කරන ලදූයි ද – අභිධ්‍යාව කරන ලද, අනභිධ්‍යාව නො කරන ලදූයි ද – ව්‍යාපාදය කරන ලද, අව්‍යාපාදය නො කරන ලදූයි ද, මා විසින් මිථ්‍යාදෘෂ්ටිය කරන ලද, සම්‍යග්දෘෂ්ටිය නො කරන ලදූයි ද – තම හට ගරහයි. මෙසේ කළ හෙයින් ද නො කළ හෙයින් ද තම හට ගරහයි. නොහොත් සිවුපිරිසුදුසිල් නො පුරනසුලු වෙමි තම හට ගරහයි. පසිඳුරන්හි නො පියූ දොර ඇත්මි – භොජනයෙහි පමණ නො දත්මි – නිදි වැරීමෙහි නො යෙදුණෙමි – සිහිනුවණින් සමන්විත නො වෙමි තම හට ගරහයි. මා විසින් සතර සිවටන් අභාවිතහයි තම හට ගරහයි. සතර සම්‍යක්ප්‍රධානයෝ අභාවිතහයි – සතර ඍද්ධිපාදයෝ අභාවිතහයි – පඤ්චෙන්ද්‍රියයෝ අභාවිතහයි – පඤ්චබලයෝ – සප්තබොධ්‍යඞ්ගයෝ – ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්‍ගය අභාවිත යැයි – මා විසින් දුඃඛසත්‍යය අපරිඥත යැයි - සමුදයය අප්‍රහීණ යැයි – මාර්‍ගය නො වඩනා ලදූයි – නිරොධය ප්‍රත්‍යක්ෂ නො කරන ලදූයි තම හට ගරහයි. මෙසෙයින් කළ හෙයිනු දූ නො කළ හෙයිනු දූ තම හට ගරහා. මෙසේ ආත්මගර්හකකර්මය නො කරනුයේ නූපදවනුයේ නො නිපදවනුයේ නුයි 'යදත්තගරහී තදකුබ්බමානො' යනු වේ.

**නාලිප්පති දිට්ඨසුතෙසු ධීරො** – 'ලෙප' නම්: තණ්හාලෙප දිට්ඨිලෙප යැයි ලෙප දෙකකි: . . .මේ තණ්හාලෙප යැ. . .මේ දිට්ඨිලෙප යි. **ධීරො** යනු: ධීර යැ...මෙධාවී යැ. ධීර වූ පුරුෂ තෙම තෘෂ්ණාලෙපය හැර පියා දෘෂ්ටිලෙපය දුරු කොට රූපායතනයෙහි නො ඇලෙයි. ශබ්දායතන–යෙහි නො ඇලෙයි. ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනයෙහි නො ඇලෙයි. මනායතන–යෙහි නො ඇලෙයි. වෙසෙසින් නො ඇලෙයි. අලිප්ත – අසංලිප්ත – අනුපලිප්ත වූයේ බැහැර වූයේ නික්මුණේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍ය්‍යාද ඇති සිතින් යුක්ත ව වෙසේ නුයි 'න ලිප්පති දිට්ඨසුතෙසු ධීරො' යනු වේ.

තෙනාහ භගවා:

"උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං
ඵස්සං පරිඤ්ඤාය අනානුගිද්ධො
යදත්තගරහී තදකුබ්බමානො
න ලිප්පතී දිට්ඨසුතෙසු ධීරො"ති.

**2 – 8.**

සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං
පරිග්ගහෙසු මුනි නොපලිත්තො,
අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො
නාසිංසති ලොකමිමං පරං ච.

**සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝන්ති** – 'සඤ්ඤා'ති කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා නෙක්ඛම්මසඤ්ඤා අව්‍යාපාදසඤ්ඤා අවිහිංසාසඤ්ඤා රූපසඤ්ඤා සද්දසඤ්ඤා ගන්ධසඤ්ඤා රසසඤ්ඤා ඵොට්ඨබ්බසඤ්ඤා ධම්මසඤ්ඤා, යා එවරූපා සඤ්ඤා සංජානනා සංජානිතත්තං, අයං වුච්චති සඤ්ඤා. **සඤ්ඤං පරිඤ්ඤාති** – සඤ්ඤං තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා ඤාතපරිඤ්ඤාය තීරණපරිඤ්ඤාය පහානපරිඤ්ඤාය. කතමා ඤාතපරිඤ්ඤා? සඤ්ඤං ජානාති 'අයං කාමසඤ්ඤා අයං ව්‍යාපාදසඤ්ඤා අයං විහිංසාසඤ්ඤා අයං නෙක්ඛම්මසඤ්ඤා අයං අව්‍යාපාදසඤ්ඤා අයං අවිහිංසාසඤ්ඤා අයං රූපසඤ්ඤා අයං සද්දසඤ්ඤා අයං ගන්ධසඤ්ඤා අයං රසසඤ්ඤා අයං ඵොට්ඨබ්බසඤ්ඤා අයං ධම්මසඤ්ඤා'ති ජානාති පස්සති. අයං ඤාතපරිඤ්ඤා.

කතමා තීරණපරිඤ්ඤා? එවං ඤාතං කත්වා සඤ්ඤං තීරෙති: අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපස්සග්ගතො චලතො[1] පභඞ්ගුතො-පෙ- සමුදයතො අත්ථඞ්ගමතො අස්සාදතො ආදීනවතො නිස්සරණතො තීරෙති. අයං තීරණපරිඤ්ඤා.

කතමා පහානපරිඤ්ඤා? එවං ඤාතං කත්වා එවං තීරයිත්වා සඤ්ඤාය ඡන්දරාගං පජහති විනොදෙති ව්‍යන්තීකරොති අනභාවං ගමෙති. වුත්තම්පි හෙතං භගවතා: "යො භික්ඛවෙ සඤ්ඤාය ඡන්දරාගො, තං පජහථ. එවං සා සඤ්ඤා පහීනා භවිස්සති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවං ගතා[2] ආයතිං අනුප්පාදධම්මා"ති[a]. අයං පහානපරිඤ්ඤා. 'සඤ්ඤං පරිඤ්ඤා'ති සඤ්ඤං ඉමාහි තීහි පරිඤ්ඤාහි පරිජානිත්වා; **විතරෙය්‍ය ඔඝන්ති** – කාමොඝං භවොඝං දිට්ඨොඝං අවිජ්ජොඝං තරෙය්‍ය උත්තරෙය්‍ය පතරෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍යාති 'සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං.'

**පරිග්ගහෙසු මුනි නොපලිත්තොති** – 'පරිග්ගහා'ති ද්වෙ පරිග්ගහා: තණ්හාපරිග්ගහො ච දිට්ඨිපරිග්ගහො ච -පෙ- අයං තණ්හාපරිග්ගහො -පෙ- අයං දිට්ඨිපරිග්ගහො. **මුනීති** – මොනං[3] වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා-පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි,[b] තෙන ඤාණෙන සමන්නාගතො මුනි මොනප්පත්තොති.

---

1. චලතො - සීමු. I.
2. අනභාවකතා - සීමු. I. අනභාවංකතා-මජසං, අනභාවගතා - සභා - සීමු. II.
a. ඛන්ධසංයුත්ත - භාරවග්ග. 3. මොනං - සීමු. I.
b ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ. I.

එයින් වදාළහ බුදුහු:
"උභොසු - පෙ - දිට්ඨසුතෙසු ධීරො" යනු.

2·8

කාමසංඥාදිසංඥාව නොහොත් සංඥානුසාරයෙන් නාමරූපය ත්‍රිවිධ පරිඥායෙන් දැන චතුරෝඝය තරණය කරන්නේ ය. එහෙයින් තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහයන්හි නො ඇලුණු ඒ ක්ෂීණාශ්‍රව මුනි තෙම උපුටා හළ රාගාදිශල්‍ය ඇතියේ අප්‍රමත්ත වැ හැසිරෙනුයේ (ස්වාත්මභාවාදි සඞ්ඛ්‍යාත) මෙලොවත් (පරාත්මභාවාදි සඞ්ඛ්‍යාත) පරලොවත් නො පතන්නේ යි.

**සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං** – 'සඤ්ඤා' යනු: කාමසංඥා යැ ව්‍යාපාද – විහිංසා – නෛෂ්කාම්‍ය – අව්‍යාපාද – අවිහිංසා සංඥා යැ, රූපසංඥා යැ ශබ්ද – ගන්ධ – රස – ස්පර්ශ – ධර්මසංඥා යැ යන මෙ බඳු වූ හැඳිනීම හඳුනන අයුරු හැඳිනගත්බව 'සඤ්ඤා' යී කියනු ලැබේ. **සඤ්ඤං පරිඤ්ඤා** – සංඥාව ඥාත තීරණ ප්‍රහාණ යන ත්‍රිවිධපරිඥාවයන් පිරිසිඳ දැන; එහි ඥාතපරිඥා කවරී ද යත්: මේ කාමසංඥා යැ මේ ව්‍යාපාද – විහිංසා – නෛෂ්කාම්‍ය – අව්‍යාපාද – අවිහිංසා සංඥා යැ මේ රූප - ශබ්ද – ගන්ධ – රස – ස්පර්ශ – ධර්මසංඥා යැයි සංඥාව දැනගනී, දකී. මේ යැ ඥාතපරිඥා නම්.

තීරණපරිඥා කවරී ද යත්: මෙසෙයින් සංඥාව ප්‍රකට කොට දැන අනිත්‍ය හෙයින් සිතයි. දුඃඛ – රෝග – ගණ්ඩ – ශල්‍ය – අඝ – ආබාධ – පර– පලොක – ඊති – උපද්‍රව – භය – උපසර්ග – චල – පභඞ්ගු හෙයින් .. සමුදය – අස්තඞ්ගම – ආස්වාද – ආදීනව – නිස්සරණ හෙයින් සිතයි. මේ යැ තීරණපරිඥා නම්.

ප්‍රහාණපරිඥා කවරී ද යත්: මෙසෙයින් ප්‍රකට කොට දැන මෙ සෙයින් තීරණ කොට සංඥායෙහි ඡන්දරාගය දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අභාවයට පමුණුවයි. වදාරන ලද මැ ය භාග්‍යවතුන් වහන්සේ විසින්: "මහණෙනි, සංඥායෙහි ඡන්දරාගය දුරු කරවූ එවිට ඒ සංඥාව ප්‍රහීණ වූවා වෙයි. උපුටා හළ මුල් ඇත්තී, තාලවත්ථුවක් මෙන් කරන ලද්දී, අභාවයට පැමිණියා, මතු නූපදනා පියවි ඇති වන්නී යැ" යි. මේ යැ ප්‍රහාණපරිඥා නම්. 'සඤ්ඤං පරිඤ්ඤා' යනු: සංඥාව මේ ත්‍රිවිධ පරිඥාවෙන් පිරිසිඳ දැන; **විතරෙය්‍ය ඔඝං** - කාම – භව – දෘෂ්ටි – අවිද්‍යා ඕඝය තරණය උත්තරණය ප්‍රතරණය සමතික්‍රමණය කරන්නේ යැ ඉක්මවන්නේ නුයි 'සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං' යනු වේ.

**පරිග්ගහෙසු මුනි නොපලිත්තො** – 'පරිග්ගහ' යනු: තෘෂ්ණාපරිග්‍රහ යැ දෘෂ්ටිපරිග්‍රහ යැයි පරිග්‍රහ දෙකෙකි....මුනි යනු: 'මොන'යී ඥානය කියනු ලැබෙයි. ප්‍රඥාව දැනගන්නා අයුරු...අමොහය ධර්මවිචය සම්‍යග්දෘෂ්ටිය යැ. ඒ ඥානයෙන් යුක්ත වූ මුනි තෙම 'මොනප්පත්ත'යි.

තීනි මොනෙය්‍යානි: කායමොනෙය්‍යං වචීමොනෙය්‍යං මනොමොනෙය්‍යං. කතමං කායමොනෙය්‍යං? තිවිධානං කායදුච්චරිතානං පහානං කායමොනෙය්‍යං. තිවිධං කායසුචරිතං කායමොනෙය්‍යං, කායාරම්මණෙ ඤාණං කායමොනෙය්‍යං, කායපරිඤ්ඤා කායමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො කායමොනෙය්‍යං, කායෙ ඡන්දරාගස්ස පහානං කායමොනෙය්‍යං, කායසංඛාරනිරොධා චතුත්ථජ්ඣානසමාපත්ති කායමොනෙය්‍යං. ඉදං කායමොනෙය්‍යං.

කතමං වචීමොනෙය්‍යං? චතුබ්බිධානං[1] වචීදුච්චරිතානං පහානං වචීමොනෙය්‍යං, වචීසුචරිතං වචීමොනෙය්‍යං, වාචාරම්මණෙ ඤාණං වචීමොනෙය්‍යං, වාචාපරිඤ්ඤා වචීමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො වචීමොනෙය්‍යං, වාචාය ඡන්දරාගස්ස පහානං වචීමොනෙය්‍යං. වචීසංඛාරනිරොධා දුතියජ්ඣානසමාපත්ති වචීමොනෙය්‍යං. ඉදං වචීමොනෙය්‍යං.

කතමං මනොමොනෙය්‍යං? තිවිධානං මනොදුච්චරිතානං පහානං මනොමොනෙය්‍යං, තිවිධං මනොසුචරිතං මනොමොනෙය්‍යං, චිත්තාරම්මණෙ ඤාණං මනොමොනෙය්‍යං, චිත්තපරිඤ්ඤා මනොමොනෙය්‍යං, පරිඤ්ඤාසහගතො මග්ගො මනොමොනෙය්‍යං, චිත්තෙ ඡන්දරාගස්ස පහානං මනොමොනෙය්‍යං, චිත්තසංඛාරනිරොධා සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති මනොමොනෙය්‍යං. ඉදං මනොමොනෙය්‍යං.

1, "කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු සබ්බපහායිනං. a

2. කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු නින්හාතපාපක"න්ති. b

ඉමෙහි තීහි මොනෙය්‍යෙහි ධම්මෙහි සමන්නාගතා ඡ මුනිනො:[2] අගාරමුනිනො අනගාරමුනිනො සෙඛමුනිනො අසෙඛමුනිනො පච්චෙකමුනිනො මුනිමුනිනොති. කතමෙ අගාරමුනිනො? යෙ තෙ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා, ඉමෙ අගාරමුනිනො. කතමෙ අනගාරමුනිනො? යෙ තෙ පබ්බජිතා දිට්ඨපදා විඤ්ඤාතසාසනා, ඉමෙ අනගාරමුනිනො. සත්ත සෙඛා සෙඛමුනිනො. අරහන්තො අසෙඛමුනිනො. පච්චෙකබුද්ධා පච්චෙකමුනිනො. මුනිමුනිනො වුච්චන්ති තථාගතා අරහන්තො සම්මාසම්බුද්ධා.

3. "න මොනෙන[3] මුනි හොති මූළ්හරූපො අවිද්දසු,
යො ච තුලංව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො.

4. පාපානි පරිවජ්ජෙති ස මුනි තෙන සො මුනි,
යො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති." c

1. චතුබ්බිධා - සීමු. I. 2. මුනයො-සපා. 3. මොනෙය්‍යෙන - ස.
a තිකඞ්ගුත්තර - ආපායිකවග්ග. b ඉතිවුත්තක - දුතියවග්ග.
c ධම්මපද - ධම්මට්ඨවග්ග.

කායමොනෙය්‍ය වචීමොනෙය්‍ය මනොමොනෙය්‍ය යැයි මොනෙය්‍ය තුනෙකි. කායමොනෙය්‍ය කවරැ? යත්: ත්‍රිවිධ කායදුශ්චරිතයන්ගේ ප්‍රහාණය කායමොනෙය්‍ය යැ. ත්‍රිවිධ කායසුචරිතය කායමොනෙය්‍ය යැ. කය අරමුණු කොට අනිත්‍යාදිවශයෙන් පැවැති ඥනය කායමොනෙය්‍ය යැ. කායපරිඥව කායමොනෙය්‍ය යැ. පරිඥසහගත වූ මාර්ගය කායමොනෙය්‍ය යැ. කයෙහි ඡන්දරාගය දුරු කිරීම කායමොනෙය්‍ය යැ. කායසංස්කාර (=ආශ්වාසප්‍රශ්වාස)යන්ගේ නිරොධය වූ චතුර්ථධ්‍යානසමාපත්තිය කාය-මොනෙය්‍යය යි. මේ කායමොනෙය්‍ය නම.

වචීමොනෙය්‍ය කවරැ? යත්: චතුර්විධ වාග්දුශ්චරිතයන්ගේ ප්‍රහාණය වචීමොනෙය්‍ය යැ. වාක්සුචරිතය – අනිත්‍යාදිවශයෙන් වාගාලම්බනයෙහි පැවැති ඥනය – ත්‍රිවිධ පරිඥවශයෙන් වාක්පරිඥව – පරිඥසහගත මාර්ගය– වාක්හි ඡන්දරාගප්‍රහාණය – වාක්සංස්කාර(විතර්කවිචාර)යන්ගේ නිරොධය වූ ද්විතීයධ්‍යානසමාපත්තිය වචීමොනෙය්‍යය යි. මේ වචීමොනෙය්‍ය නම.

මනොමොනෙය්‍ය කවරැ? යත්: ත්‍රිවිධ මනොදුශ්චරිතයන්ගේ ප්‍රහාණය මනොමොනෙය්‍ය යැ, ත්‍රිවිධ මනසුචරිතය – චිත්තාලම්බනයෙහි පැවැති ඥනය – චිත්තපරිඥව – පරිඥසහගත වූ මාර්ගය – චිත්තයෙහි ඡන්දරාග-ප්‍රහාණය – චිත්තසංස්කාරයන්(=සංඥවෙදනාවන්)ගේ නිරොධය වූ සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිය මනොමොනෙය්‍යය යි. මේ මනො-මොනෙය්‍ය නම්.

1. කායදුශ්චරිතප්‍රහාණයෙන් කායමුනි වූ වාග්දුශ්චරිතප්‍රහාණයෙන් වාචාමුනි වූ මනොදුශ්චරිතප්‍රහාණයෙන් මනොමුනි වූ සර්වාකුශලප්‍රහාණයෙන් ඵලයෙහි සිටි හෙයින් මුනිභාවයෙන් යුක්ත වූවහු සියලු කෙලෙසුන් දුරු කළ හෙයින් 'සබ්බප්පහායී' යයි කියත්.

2. ...මාර්ගඥනයෙන් සියලු පව් බොවනය කළ හෙයින් 'නින්හාතපාපක, යයි කියත්.

මේ ත්‍රිවිධ මොනෙයධර්මයන්ගෙන් සමන්විත වූ අගාරමුනිහු යැ අනගාරමුනිහු යැ ශෛක්‍ෂමුනිහු යැ අශෛක්‍ෂමුනිහු යැ ප්‍රත්‍යෙකමුනිහු යැ මුනිමුනිහු යැයි ෂඩ්විධමුනි කෙනෙක් වෙති. අගාරමුනිහු කවරහ යත්: ගිහිකම්හි යෙදුණු දුටු නිවන් ඇති දත් (ශික්‍ෂාත්‍රය සඞ්ඛ්‍යාත) තුන් සසුන් ඇත්තාහු අගාරමුනිහු යැ. අනගාරමුනිහු කවරහ යත්: පැවිදි වූ දුටුනිවන් ඇති දත් සසුන් ඇත්තාහු අනගාරමුනිහු යැ. සප්තශෛක්‍ෂයෝ සෙඛමුනිහු යැ. රහත්හු අසෙඛමුනිහු යැ. පසේබුදුහු පච්චෙකමුනිහු යැ. තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ මුනිමුනිහු යැයි කියනු ලැබෙත්.

3–4. සිඤ් පියම් ඇති අඥ (=නුවණ නැති) තෙනැත්තේ මෞනභාවයෙන් (=නො කිණීමෙන්) මුනි නම් නො වෙයි. තවද පණ්ඩිත වූ යමෙක් තුලාව (=තරාදිය) ගෙන (අධිකය හැර ඌනය පුරන්නාක් මෙන්) ශීලසමාධ්‍යාදි උතුම් දය ගෙන පව් දුරු කෙරේ ද, එ කරුණෙන් හෙතෙම මුනි නම් වෙයි. යමෙක් ස්කන්ධාදිලොකයෙහි ආධ්‍යාත්මික බාහ්‍යස්කන්ධාදි උභයාර්ථයන් දනී නම් එ කරුණෙන් හේ මුනි යයි කියනු ලැබේ.

5. "අසතඤ්ච සතඤ්ච ඤත්වා ධම්මං
අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ,
දෙවමනුස්සෙහි පූජිතො යො
සඞ්ගජාලමතිච්ච සො මුනී"ති. [a]

**ලෙපාති** – ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච –පෙ– අයං තණ්හාලෙපො -පෙ– අයං දිට්ඨිලෙපො. මුනි තණ්හාලෙපං පහාය දිට්ඨිලෙපං පටිනිස්සජ්ජිත්වා පරිග්ගහෙසු න ලිප්පති න සංලිප්පති[1] න උපලිප්පති අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො[2] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'පරිග්ගහෙසු මුනි නොපලිත්තො.

**අබ්බූළ්හසල්ලො චරමප්පමත්තොති** – 'සල්ල'න්ති සත්ත සල්ලානි: රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං සොකසල්ලං දුච්චරිතසල්ලං.[3] යස්සෙතෙ සල්ලා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අබ්බූළ්හසල්ලො අබ්බුහිතසල්ලො[4] උද්ධතසල්ලො සමුද්ධතසල්ලො උප්පාටිතසල්ලො සමුප්පාටිතසල්ලො චත්තසල්ලො වන්තසල්ලො මුත්තසල්ලො පහීනසල්ලො පටිනිස්සට්ඨසල්ලො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති 'අබ්බූළ්හසල්ලො.' **චරන්ති** – චරන්තො විහරන්තො ඉරියන්තො වත්තෙන්තො පාලෙන්තො යපෙන්තො යාපෙන්තො. **අප්පමත්තොති** – සක්කච්චකාරී සාතච්චකාරී අට්ඨිතකාරී අනොලීනවුත්තිකො අනික්ඛිත්තච්ඡන්දො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. 'කථාහං අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙය්‍යං, පරිපූරං වා සීලක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍ය'න්ති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤං ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසු. 'කථාහං අපරිපූරං වා සමාධික්ඛන්ධං පරිපූරෙය්‍යං, පරිපූරං වා සමාධික්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍යං –පෙ– කුසලෙසු ධම්මෙසු. 'කථාහං අපරිපූරං වා පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙය්‍යං –පෙ– විමුත්තික්ඛන්ධං –පෙ– විමුත්තිඤාණදස්සනක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍ය'න්ති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤං ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසු. 'කථාහං අපරිඤ්ඤාතං වා දුක්ඛං පරිජානෙය්‍යං, අප්පහීනෙ වා කිලෙසෙ පජහෙය්‍යං, අභාවිතං වා මග්ගං භාවෙය්‍යං, අසච්ඡිකතං වා නිරොධං සච්ඡිකරෙය්‍යන්ති' යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤං ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසූති 'අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො.'

---

1. පලිප්පති - සීමු. II
2. නිස්සට්ඨො - සං. නිස්සතො - ස. 3. කථං කථාසල්ලං - ස්‍යා.
4. පහතසල්ලො - ස්‍යා.

a. සුත්තනිපාත - සභියසුත්ත.

5. යමෙක් ආධ්‍යාත්මික වූ ද බාහ්‍ය වූ ද සියලු ලොකයෙහි කුශලාකුශල භෙද වූ සාධූන්ගේ ද අසාධූන්ගේ ද ධර්මය (ප්‍රච්චයඥනයෙන්) දැන එහෙයින් මැ රාගාදිසඞ්ගය හා තෘෂ්ණාදෘෂ්ටිජාලය ඉක්මවා සිටියේ දෙව්මිනිසුන් විසින් පුදන ලද්දේ වේ ද, ඒ ක්ෂීණාස්‍රව තෙම 'මුනි' යයි කියනු ලැබේ.

ලෙප නම්: තෘෂ්ණාලෙප යැ දෘෂ්ටිලෙප යැයි ලෙප දෙකෙකි... ක්ෂීණාස්‍රව මුනි තෙම තෘෂ්ණාලෙපය හැර දෘෂ්ටිලෙපය දුරු කොට තෘෂ්ණාදෘෂ්ටීන් ගත් වස්තුයෙහි නො ඇලෙයි, වෙසෙසින් නො ඇලෙයි, නො යෙදෙයි, අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාදා ඇති සිතින් යුක්ත වැ වෙසේ නුයි 'පරිග්ගහෙසු මුනි නොපලිත්තො' යනු වේ.

අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො - 'සල්ල' නම්: රාගශල්‍ය යැ දෙස - මොහ - මාන - දිට්ඨි - සොක - දුශ්චරිතශල්‍ය යැයි සපත ශල්‍ය කෙතෙකි. යමක්හු විසින් තෙල ශල්‍යයෝ ප්‍රහාණ කරන ලද්දාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුවන ලද්දාහු ඉපදීමට නුසුදුසු කරන ලද්දාහු නුවණ-ගින්නෙන් දවන ලද්දාහු ද, හෙතෙම බැහැර කළ ශල්‍ය (= හුල්) ඇත්තේ යැ, උපුටාහල හුල් ඇත්තේ යැ, සිඳුනා ලද හුල් ඇත්තේ යැ, ත්‍යාග කල - වමනය කල - මුදන ලද - ප්‍රහාණ කල - දුරු කල - හුල් ඇත්තේ යැ, තෘෂ්ණා රහිත යැ, නිවුණේ යැ, සිහිල් වූයේ යැ, සුව විඳිනසුලු වූයේ උතුම් වූ සිතින් යුක්ත වැ වෙසේ නුයි 'අබ්බූළ්හසල්ල' නම්. චරං යනු: හැසිරෙනුයේ වෙසෙනුයේ ඉරියව් පවත්වනුයේ ඉරියව් උපදවනුයේ ඉරියව් රක්නේ යැපෙනුයේ; අප්පමත්තො - කුසල් දහම්හි සත්කාර (සකස් කොට) කරනුයේ සතතභාවයෙන් කරනුයේ නො නැවැත කරනුයේ නො හැකිලැ කරනුයේ නො නැබූ ඡන්දය ඇතියේ නො නැබූ ධූර (නො පසුබස්නා සිත්) ඇතියේ 'කෙසේ නම් මම නොපිරිපුන් ශීලස්කන්ධය පුරම් ද්‍ර හෝ පිරිපුන් ශීලස්කන්ධය ප්‍රඥයෙන් අනුග්‍රහ කෙරෙම් ද්‍ර හෝ' යි ඒ කුසල් දහම්හි යම් කත්තුකම්‍යතාඡන්දයෙක් වැයමෙක් උත්සාහයෙක් අධිමාත්‍රඋත්සාහයෙක් නො පසු බස්නා වීර්‍ය්‍යයෙක් ස්මෘතියෙක් සම්ප්‍රජන්‍යයෙක් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙක් ප්‍රධන්වීර්‍ය්‍යයෙක් අධිෂ්ඨානයෙක් අනුයොගයෙක් අප්‍රමාදයෙක් වේ ද, 'කෙසේ නම් මම නො පිරිපුන් සමාධිස්කන්ධය පුරම් ද්‍ර හෝ පිරිපුන් සමාධිස්කන්ධය ඒ ඒ තැන නුවණින් අනුගනිම් ද්‍ර හො' යි...නො පිරිපුන් ප්‍රඥස්කන්ධය. . .විමුක්තිස්කන්ධය. . .විමුක්තිඥන දර්ශනස්කන්ධය පුරම් ද්‍ර හෝ... කෙසේ නම් මම අපරිඥත වූ දුඃඛය ඥතපරිඥයෙන් දැනගනිම් ද්‍ර හෝ, අප්‍රහීණ වූ කෙලශයන් දුරු කෙරෙම් ද්‍ර හෝ, නො වැඩූ මාර්ගය වඩම් ද්‍ර හෝ, නො පසක් කල නිරොධය පසක් කෙරෙම් ද්‍ර හෝ, යි කුසල්දහම්හි යම් ඡන්දයෙක් වැයමෙක් උත්සාහයෙක් අධිමාත්‍රඋත්සාහයෙක් නො පසු බස්නා වීර්‍ය්‍යයෙක් ස්මෘතියෙක් සම්ප්‍රජන්‍යයෙක් කෙලෙස් තවන වීර්‍ය්‍යයෙක් ප්‍රධන් වීර්‍ය්‍යයෙක් අධිෂ්ඨානයෙක් අනුයොගයෙක් අප්‍රමාදයෙක් වේ ද, එයින් යුක්ත නුයි .'අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො' යනු වේ.

**නාසිංසතී ලොකමිමං පරං චාති** – ඉමං ලොකං නාසිංසති සකත්තභාවං, පරං ලොකං නාසිංසති පරත්තභාවං, ඉමං ලොකං නාසිංසති සකරූපවෙදනාසඤ්ඤාසංඛාරවිඤ්ඤාණං, පරං ලොකං නාසිංසති පරරූප-වෙදනාසඤ්ඤාසංඛාරවිඤ්ඤාණං, ඉමං ලොකං නාසිංසති ඡ අජ්ඣත්තිකානි ආයතනානි, පරං ලොකං නාසිංසති ඡ බාහිරානි ආයතනානි, ඉමං ලොකං නාසිංසති මනුස්සලොකං, පරං ලොකං නාසිංසති දෙවලොකං, ඉමං ලොකං නාසිංසති කාමධාතුං, පරං ලොකං නාසිංසති රූපධාතුං අරූපධාතුං, ඉමං ලොකං නාසිංසති කාමධාතුං රූපධාතුං, පරං ලොකං නාසිංසති අරූපධාතුං, පුනගතිං වා උපපත්තිං වා පටිසන්ධිං වා භවං වා සංසාරං වා වට්ටං වා නාසිංසති න ඉච්ඡති න සාදියති න පත්ථෙති න පිහෙති නාභිජප්පතීති 'නාසිංසතී ලොකමිමං පරං චා'ති.

තෙනාහ භගවා:

"සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය ඔඝං
පරිග්ගහෙසු මුනි නොපලිත්තො,
අබ්බූළ්හසල්ලො චරමප්පමත්තො
නාසිංසතී ලොකමිමං පරං චා"ති.

**ගුහට්ඨකසුත්තනිද්දෙසො දුතියො.**

# 3

# දුට්ඨට්ඨකසුත්තනිද්දෙසො

අථ දුට්ඨට්ඨකසුත්තද්දෙසං වක්ඛති:

**3 – 1**

වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ
අථොපි වෙ[1] සච්චමනා වදන්ති,
වාදං ච ජාතං මුනි නො උපෙති
තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චි.

**වදන්ති වෙ දුට්ඨමනාපි එකෙති** – එකෙ තිත්ථියා දුට්ඨමනා පදුට්ඨමනා විරුද්ධමනා[2] පටිවිරුද්ධමනා ආහතමනා පච්චාහතමනා ආඝාතිතමනා[3] පච්චාඝාතිතමනා වදන්ති උපවදන්ති භගවන්තං ච භික්ඛුසඞ්ඝං ච අභූතෙනාති 'වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ.'

**අථොපි වෙ[4] සච්චමනා වදන්තීති** –යෙ තෙසං තිත්ථියානං සද්දහන්තා ඔකප්පෙන්තා අධිමුච්චන්තා සච්චමනා සච්චසඤ්ඤිනො භූතමනා භූතසඤ්ඤිනො තථමනා තථසඤ්ඤිනො යාථාවමනා යාථාවසඤ්ඤිනො[5] අවිපරීතමනා අවිපරීතසඤ්ඤිනො වදන්ති උපවදන්ති භගවන්තඤ්ච භික්ඛුසඞ්ඝං ච අභූතෙනාති 'අථොපි වෙ[1] සච්චමනා වදන්ති.'

---

1. අඤ්ඤෙපි තෙ – සීමු. II.
2. විදුට්ඨමනා – කත්ථචි.
3. අඝාටිතමනා – සෑ.
4. අථොපි තෙ – සීමු. II.
5. යථාවමනා යථාවසඤ්ඤිනො – ස.

**නාසිංසති ලොකමිමං පරං ච** - ස්වාත්මභාවසඞ්ඛ්‍යාත මෙලොව නො පතයි. පරාත්මභාවසඞ්ඛ්‍යාත පරලොව නො පතයි. ස්වකීයරූපවේදනා-සංඥසංස්කාරවිඥන සඞ්ඛ්‍යාත මෙලොව, පරරූපවේදනාසංඥසංස්කාරවිඥන සංඛ්‍යාත පරලොව, ආධ්‍යාත්මිකෂඩායතනසංඛ්‍යාත මෙලොව, බාහ්‍ය ෂඩායතනසංඛ්‍යාත පරලොව, මනුෂ්‍යලොක සංඛ්‍යාත මෙලොව, දිව්‍යලොක සංඛ්‍යාත පරලොව, කාමභව සංඛ්‍යාත මෙලොව, රූපාරූපභවසංඛ්‍යාත පරලොව, කාම - රූපභවසංඛ්‍යාත මෙලොව, අරූපභව සංඛ්‍යාත පරලොව නො පතයි. පෙරලා පක්‍ෂවගතිය හෝ (සිව්‍යොනියෙහි) උපත හෝ පිළිසඳ හෝ කර්මභවය හෝ සසර හෝ ත්‍රෛභූමකවෘත්තය හෝ ආශංසන නො කෙරෙයි, නො කැමැති වෙයි, නො ඉවසයි, නො පතයි, නො ඉස්නේ වෙයි, අභිජල්පන නො කෙරේ නුයි 'නාසිංසති ලොකමිමං පරඤ්ච' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

"සඤ්ඤං පරිඤ්ඤා - පෙ - පරං ච" යි.

**දෙවැනි වූ ගුහට්ඨකසුත්‍රනිද්දේශය යි.**

## 3

## දුට්ඨට්ඨකසුත්‍රනිද්දේශය

ඉක්බිති දුට්ඨට්ඨකසුත්‍රනිද්දේශය කියනු ලැබේ.

**3 - 1.**

ඇතැම් (අන්‍යතීර්ථ) කෙනෙක් ඒකාන්තයෙන් විරුද්ධ සිත් ඇත්තාහු මැ (බුදුනට හා සඟනට) උපවාද කෙරෙති (-නුගුණ කියති.) යළි (ඔවුන් ගෙන් ඇසූ) අන් කෙනෙක් ඒකාන්තයෙන් 'සැබෑවැ' යන සිත් ඇත්තහු මැ උපවාද කෙරෙත්. බුද්ධමුනි තෙම අභූතයෙන් උපන් (තෙල ආක්‍රොශ)වාදයට ද නො පැමිණෙයි. එහෙයින් මුනි තෙම කිසි තැනෙක්හි රාගාදි කිල (හුල්) නැත්තේ වේ.

**වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ** - ඇතැම් තීර්ථක කෙනෙක් දූෂිත සිත් ඇත්තාහු ප්‍රදූෂිත සිත් ඇත්තාහු විරුද්ධ සිත් ඇත්තාහු කොපයෙන් පහළ සිත් ඇත්තාහු ගැටුණු සිත් ඇත්තාහු බුදුනට ද සඟනට ද අභූතයෙන් (බොරුවෙන්) කියති, උපවාද කෙරෙත් නුයි 'වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ' යනු වේ.

**අථොපි වෙ සච්චමනා වදන්ති** - ඒ තොටුවත්ගේ බස් හදහන ගුණවශයෙන් රුසගත් පැහැදීමෙන් ඉවසන යම් කෙනෙක් වෙත් ද, ඔහු සැබෑවැ යන සිත් ඇත්තාහු සැබෑවැයි හඟනාහු වූයෙකැ යන සිතැත්තාහු වූයෙකැ යි හඟනාහු අවිපරීත සිතැත්තාහු අවිපරීත වැ හඟනාහු නිශ්චල සිතැත්තාහු නිශ්චල වැ හඟනාහු නිශ්චය වූ සිතැත්තාහු නිශ්චයෙන් හඟනාහු බුදුනට ද සඟනට ද අභූතයෙන් බෙණෙති. උපවාද කෙරෙත් නුයි 'අථොපි වෙ සච්චමනා වදන්ති' යනු වේ.

**වාදං ච ජාතං මුනි නො උපෙතීති** - සො වාදො ජාතො හොති සඤ්ජාතො නිබ්බත්තො අභිනිබ්බත්තො පාතුභූතො, පරතොඝොසො අක්කොසො උපවාදො භගවතො ච භික්ඛුසඞ්ඝස්ස ච අභූතෙනාති 'වාදං ච ජාතං.' **මුනි නො උපෙතීති** - 'මුනී'ති මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි, තෙන ඤාණෙන සමන්නාගතො මුනි මොනප්පත්තො -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි. යො වාදං උපෙති, සො ද්වීහි කාරණෙහි වාදං උපෙති: කාරකො කාරකතාය වාදං උපෙති අථවා දුච්චමානො උපවදියමානො කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති අකාරකොම්හීති. යො වාදං උපෙති, සො ඉමෙහි ද්වීහි කාරණෙහි වාදං උපෙති. මුනි ද්වීහි කාරණෙහි වාදං න උපෙති: අකාරකො මුනි අකාරකතාය වාදං න උපෙති. අථවා වුච්චමානො උපවදියමානො න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති, න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති අකාරකොම්හීති. මුනි ඉමෙහි ද්වීහි කාරණෙහි වාදං න උපෙති න උපගච්ඡති න ගණ්හාති න පරාමසති න අභිනිවිසතීති 'වාදඤ්ච ජාතං මුනි නො උපෙති.'

**තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චීති** - 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා[1] මුනිනො ආහතචිත්තතා[2] ඛිලජාතතාපි නත්ථි, පඤ්චපි චෙතොඛිලා නත්ථි. තයොපි ඛිලා නත්ථි: රාගඛිලො දොසඛිලො මොහඛිලො නත්ථි න සංවිජ්ජති නුපලබ්භති පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො. **කුහිඤ්චීති** - කුහිඤ්චි කිම්හිචි කත්ථචි, අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති 'තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චී'ති.

තෙනාහ භගවා:

"වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ
අථොපි වෙ[3] සච්චමනා වදන්ති,
වාදං ච ජාතං මුනි නො උපෙති
තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චී"ති.

8 - 2

සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය
ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො,
සයං සමත්තානි පකුබ්බමානො
යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය.

1. තං නිදානං - සීමු. I. 2. ආහතක චිත්තතා - සීමු. I.
3. අඤ්ඤෙපි තෙ - සීමු. II.

**වාදං ච ජාතං මුනි නො උපෙති** – ඒ ආක්‍රොශවාදය බුදුනට ද සඟනට ද අභූතයෙන් උපන්නේ හටගත්තේ නිපන්නේ මොනොවට නිපන්නේ පහළ වූයේ මෙරමා බසින් වූයේ උපවාද වූයේ වේ නුයි 'වාදං ච ජාතං' යනු වෙයි. **මුනි නො උපෙති** – 'මුනි' යනු: (2-8. සුත්තනිද්දෙසය බලන්න) යමෙක් උපවාදයට පැමිණේ නම්, හෙතෙම දෙ කරුණෙකින් උපවාදයට පැමිණෙයි: කාරක (=කළ දොස ඇතියේ) කාරක බැවින් උපවාදයට පැමිණෙයි. නොහොත් කියනු ලබනුයේ උපවාද කරනු ලබනුයේ 'මම අකාරකයෙමි' කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, තදබවට පැමිණෙයි, කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ කෙරෙයි. උපවාදයට පැමිණෙනුයේ මේ දෙ කරුණෙන් පැමිණෙයි. බුද්ධමුනි තෙම දෙ කරුණෙකින් උපවාදයට නො පැමිණෙයි: අකාරක වූ මුනි අකාරක බැවින් උපවාදයට නො පැමිණෙයි, නොහොත් (අන්‍යයන් විසින් කියනු ලබනුයේ උපවාද කරනු ලබනුයේ 'මම අකාරකයෙමි' නො කිපෙයි, පූති නො වෙයි, තද නො වෙයි, කෝපයත් ද්වේෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි. මුනි තෙම මේ දෙ කරුණෙන් උපවාදයට නො පැමිණෙයි, නො එළැඹෙයි, පරාමශී නො කෙරෙයි, නො පිවිසේ නුයි 'වාදං ච ජාතං මුනි නො උපෙති' යනු වේ.

**තස්මා මුනි නත්ථි ඛිලො කුහිඤ්චි** – 'තස්මා' යනු: එහෙයින් එ කරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මුනිහුගේ කොපයෙන් පහළ සිතැති බවෙක් ප්‍රතිඝඛිල (-හුල්) හටගත් බවෙක් නැති. චෙතොඛිල පස ම නැති. රාග ද්වේස මෝහ යන ඛිල තුන ම නැත්තේයි. **නත්ථි** – අවිද්‍යමාන වෙයි, නො ලැබෙයි ප්‍රහීණ වූයේ සමුච්ඡින්න වූයේ සන්හිඳුණේ සැහැල්ලු වූයේ උපනට නො සුදුසු වූයේ නුවණගින්නෙන් දැවුණේ වෙයි. **කුහිඤ්චි** යනු: අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ කොහි දු කිසිවෙක්හි දු කිසි තැනෙක්හි දු නුයි 'තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"වදන්ති වෙ -පෙ- නත්ථි ඛිලො කිහිඤ්චි"යි.

**8-2.**

දෘෂ්ටිච්ඡන්දයෙන් මෙහෙයන ලද දෘෂ්ටිරුචියෙහි බැසගත් තීර්ථක ජන තෙමේ සවකීය දෘෂ්ටිය කිසෙයින් හරනේ ද, යළි තමා විසින් රැස් කරන ලද ඒ දෘෂ්ටිගතයන් කරනුයේ යම්සේ දනී නම් එසේ මැ කියන්නේ යි.

**සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍යාති** – යෙ තෙ[1] තිත්ථියා සුන්දරිං පරිබ්බාජිකං හන්ත්වා සමණානං සක්‍යපුත්තියානං අවණ්ණං පකාසයිත්වා එවං එතං ලාභං යසං සක්කාරං සම්මානං පච්චාහරිස්සාමා'ති තෙ එවංදිට්ඨිකා එවංඛන්තිකා එවංරුචිකා එවංලද්ධිකා එවංඅජ්ඣාසයා එවමධිප්පායා, තෙ නාසක්ඛිංසු සකං දිට්ඨිං සකං ඛන්තිං සකං රුචිං සකං ලද්ධිං සකං අජ්ඣාසයං සකං අධිප්පායං අතික්කමිතුං. අථ ඛො ස්වෙව අයසො තෙ පච්චාගතොති. එවම්පි සකං දිට්ඨිං කථමච්චයෙය්‍ය. අථවා 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති යො සො එවංවාදො සො සකං දිට්ඨිං සකං ඛන්තිං සකං රුචිං සකං ලද්ධිං සකං අජ්ඣාසයං සකං අධිප්පායං කථං අච්චයෙය්‍ය අතික්කමෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍ය ? තං කිස්ස හෙතු ? තස්ස සා දිට්ඨි තථා සමත්තා සමාදින්නා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තාති. එවම්පි 'සකඤ්හි දිට්ඨිං කථමච්චයෙය්‍ය.' අථවා 'අසස්සතො ලොකො, අන්තවා[2] ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න හොති ච තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති යො සො එවංවාදො, සො සකං දිට්ඨිං සකං ඛන්තිං සකං රුචිං සකං ලද්ධිං සකං අජ්ඣාසයං සකං අධිප්පායං කථං අච්චයෙය්‍ය අතික්කමෙය්‍ය සමතික්කමෙය්‍ය වීතිවත්තෙය්‍ය; තං කිස්ස හෙතු ? තස්ස සා දිට්ඨි තථා සමත්තා සමාදින්නා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තාති. එවම්පි 'සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය.'

**ඡන්දානුනීතො රුචියා නිවිට්ඨොති** –'ඡන්දානුනීතො'ති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා යායති නීයති වුය්හති සංහරීයති, යථා හත්ථියානෙන වා අස්සයානෙන වා ගොයානෙන වා මෙණ්ඩකයානෙන වා ඔට්ඨයානෙන වා යායති නියය්‍යති වුය්හති සංහරීයති, එවමෙවං සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා යායති නිය්‍යති වුය්හති සංහරීයතීති ඡන්දානුනීතො; **රුචියා නිවිට්ඨොති** සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා නිවිට්ඨො පතිට්ඨිතො අල්ලීනො උපගතො අජ්ඣොසිතො අධිමුත්තොති 'ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො.'

---

1. යෙන - සීමු. I. 2. අනන්තවා - සීමු. I.

**සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය** – ඒ තීර්ථකයෝ සුන්දරී පිරිවැජිය තසා ශ්‍රමණශාක්‍යපුත්‍රයන්ගේ අගුණ ප්‍රකට කොට 'මෙසේ මේ ලාභ යශස් සත්කාර සම්මාන උපදවම්හ' යන මෙබඳු දෘෂ්ටි ඇත්තාහු මෙබඳු කැමැත්ත – මෙබඳු රුචිය – මෙබඳු ලබ්ධිය – මෙබඳු අදහස – මෙබඳු අභිප්‍රාය ඇත්තාහු, ඔහු ස්වකීය දෘෂ්ටිය කැමැත්ත රුචිය ලබ්ධිය අධ්‍යාශය ස්වකීය අභිප්‍රාය ඉක්මවන්නට නො හැකි වූහ. වැලි එ මැ අයස ඔවුන් කරා පෙරළා පැමිණියේ නුයි මෙසේත් 'සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය' යනු වේ. නොහොත් 'ලෝකය ශාශ්වත යැ, මේ මැ සැබැවැ, අන්‍යය සිස් යැ' යන මෙබඳු වාදය ස්වකීය දෘෂ්ටිය සිය කැමැත්ත සිය රුචිය සිය ලබ්ධිය සිය අදහස සිය සිතැඟිය කෙසේ නම් ඉක්මවන්නේ ද, අතික්‍රමණය සමතික්‍රමණය කරන්නේ ද, බැහැර කරන්නේ ද, (නො කරන්නේ මැයැ.) ඊට කරුණු කිම යත්: ඔහුගේ ඒ දෘෂ්ටි තොමෝ එපරිද්දෙන් සම්පූර්ණ වූවා යැ මොනොවට ගන්නා ලද්දී යැ ඇසුරු කොට ගන්නා ලද්දී යැ පරාමර්ශනය කරන ලද්දී යැ අභිනිවේශය කරන ලද්දී යැ ඇතුළත් වූවා යැ බැසගන්නා ලද්දී යැ (එහෙයිනි). මෙසේත් 'සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය, යනු වේ. නොහොත් ආත්මභාවසඞ්ඛ්‍යාත ලෝකය අශාශ්වත යැ, ලෝකය (ආත්මභාවය) අන්තවත් යැ, ලෝකය අනන්තවත් යැ, ජීවයත් ශරීරයත් හේ මැයැ, ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ, සත්ත්ව තෙමේ මරණින් මතු (පරලොවැ) වෙයි. සත්ත්ව තෙමේ පරලොවැ නො මැ වෙයි. සත්ත්ව තෙමේ පරලොවැ උපදනේත් නූපදනේත් වෙයි. පරලොවැ නො මැ වෙයි. නොවන්නේ නො වෙයි. මේ මැ සැබැවැ අන්‍යය සිස් යැ යන මෙබඳු වාද සඞ්ඛ්‍යාත වූ ස්වකීය දෘෂ්ටිය...ස්වකීය හැඟීම කෙසේ නම් ඉක්මවන්නේ ද; ඊට හෙතු කිම ? යත්: ඔහු විසින් ඒ දෘෂ්ටි තොමෝ නො ඉක්මැවියැ හැකි පරිද්දෙන් පුරන ලද, සමාදන් වන ලද ගන්නා ලද, පරාමර්ශ කරන ලද, අභිනිවේශ කරන ලද, ඇතුළත් වන ලද, බැසගන්නා ලද හෙයිනි. මෙසේත් 'සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය' යනු වේ.

**ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො** – 'ඡන්දානුනීතො' යනු: ස්වකීය දෘෂ්ටියෙන් – කැමැත්තෙන් – රුචියෙන් – ලබ්ධියෙන් යවනු ලබයි, පමුණුවනු ලබයි, උසුලනු ලබයි, මොනවට හරිනු ලබා. ඇත්යානකින් හෝ අස්යානකින් හෝ රියකින් හෝ ගවයානකින් හෝ එළුයානකින් හෝ බැටළුයානකින් හෝ ඔටුයානකින් හෝ කොටළුයානකින් හෝ පමුණුවනු ලබන්නාක් මෙන් තමාගේ දෘෂ්ටියෙන් - කැමැත්තෙන් – රුචියෙන් – ලබ්ධියෙන් යවනු පමුණුවනු උසුලනු සංහරණය කරනු ලබා නුයි 'ඡන්දානුනීතො' යනු වේ. 'රුචියා නිවිට්ඨො' යනු: තමාගේ දෘෂ්ටියෙහි කැමැත්තෙහි රුචියෙහි ලබ්ධියෙහි පිවිසියේ පිහිටියේ ඇලුණේ උපගත වූයේ ඇතුළත් වූයේ බැසගන්නා ලද්දේ නුයි 'ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො' යනු වේ.

**සයං සමත්තානි පකුබ්බමානොති** - සයං සමත්තං කරොති, පරිපුණ්ණං කරොති, අනොමං කරොති, අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති; 'අයං සත්ථා සබ්බඤ්ඤූ'ති සයං සමත්තං කරොති, පරිපුණ්ණං කරොති, අනොමං කරොති; අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති; 'අයං ධම්මො ස්වාක්ඛාතො, අයං ගණො සුප්පටිපන්නො, අයං දිට්ඨි භද්දිකා, අයං පටිපදා සුපඤ්ඤත්තා, අයං මග්ගො නිය්‍යානිකො'ති සයං සමත්තං කරොති, පරිපුණ්ණං කරොති, අනොමං කරොති, අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති ජනෙති සඤ්ජනෙති නිබ්බත්තෙති අභිනිබ්බත්තෙතීති 'සයං සමත්තානි පකුබ්බමානො.'

**යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍යාති** - යථා ජානෙය්‍ය තථා වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපෙය්‍ය වොහරෙය්‍ය. 'සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති යථා ජානෙය්‍ය, තථා වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපෙය්‍ය වොහරෙය්‍ය. 'අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති යථා ජානෙය්‍ය, තථා වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපෙය්‍ය වොහරෙය්‍යාති-යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය.

තෙනාහ භගවා:

"සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය
ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො,
සයං සමත්තානි පකුබ්බමානො
යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍යා"ති.

**3 - 3**

යො අත්තනො සීලවතානි ජන්තු
අනානුපුට්ඨොව පරෙසං[1] පාවා[2]
අනරියධම්මං කුසලා තමාහු
යො ආතුමානං සයමෙව පාවා.

**යො අත්තනො සීලවතානි ජන්තූති** - 'යො'ති යො යාදිසො යථායුත්තො යථාවිහිතො යථාපකාරො යං ඨානං පත්තො යංධම්මසමන්නාගතො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා; **සීලබ්බතානීති** අත්ථි සීලං චෙව වතං ච, අත්ථි වතං න සීලං. කතමං සීලං චෙව වතං ච? ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, යො තත්ථ සඤ්ඤමො සංවරො අනතික්කමො, ඉදං සීලං. යං සමාදානං, තං වතං. සංවරට්ඨෙන සීලං, සමාදානට්ඨෙන වතං. ඉදං වුච්චති සීලං චෙව වතං ච. කතමං වතං න සීලං? අට්ඨ ධුතඞ්ගානි: ආරඤ්ඤිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පංසුකූලිකඞ්ගං තෙචීවරිකඞ්ගං සපදානචාරිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං යථාසන්ථතිකඞ්ගං, ඉදං වුච්චති වතං න සීලං. විරියසමාදානම්පි වුච්චති වතං න සීලං. "කාමං තචො ච නහාරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිසබලෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතී"ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපං විරියසමාදානං වුච්චති වතං න සීලං.

---

1. පරස්ස - සු. 2 පාවද - ස.

**සයං සමත්තානි පකුබ්බමානො** - තෙමේ සම්පූර්ණ කෙරෙයි, පරිපූර්ණ කෙරෙයි, අලාමක කෙරෙයි, අග්‍ර ශ්‍රේෂ්ඨ ජ්‍යෙෂ්ඨ ප්‍රමුඛ උත්තම ප්‍රවර කෙරෙයි. 'මේ ශාස්තෘ සර්වඥ යැයි තෙමේ සම්පූර්ණ කෙරෙයි. . . ප්‍රවර කෙරෙයි. මේ ධර්මය ස්වාඛ්‍යාත යැ, මේ ගණ තෙමේ සුප්‍රතිපන්න යැ, මෙ දෘෂ්ටි තොමෝ සොඳුරු යැයි, මෙ ප්‍රතිපදා මැනැවින් පනවන ලදැයි, මේ මාර්ගය නෛර්යාණික' යැයි තෙමේ සම්පූර්ණ කෙරෙයි පරිපූර්ණ. . .ප්‍රවර කෙරෙයි, උපදවයි, මොනොවට උපදවයි, නිපදවයි, වෙසෙසින් නිපදවා නුයි 'සයං සමත්තානි පකුබ්බමානො' යනු වේ.

**යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය** - යම් සේ දන්නේ නම් එපරිද්දෙන් කියන්නේය, දක්වන්නේය, ව්‍යවහාර කරන්නේයැ; 'ආත්මභාවලොකය ශාශ්වත යැ, මේ මැ සැබැව, අන්‍යය සිස් යැ'යි යම් සේ දනී නම් එසෙයින් කියන්නේ යැ, දක්වන්නේ යැ, වහරන්නේ යැ; ලොකය අශාශ්වත යැ. . . .සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නො මැ වන්නේ යැ, නො වන්නේත් නො වෙයි, මෙය මැ සැබැව, අන්‍යය සිස් යැයි යම්සේ දනී නම් එසෙයින් කියන්නේය, පවසන්නේය, දක්වන්නේය වහරන්නේ නුයි 'යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

'සකං හි දිට්ඨිං - පෙ - තථා වදෙය්‍ය' සි.

## 3 - 3.

යම් පුද්ගලයෙක් නො පුළුවුස්නා ලදුයේ මැ තමාගේ ප්‍රාතිමොක්ෂාදි ශීලයන් හා ධුතඞ්ගාදිව්‍රතයන් අනුනට කියා ද, යමෙක් මෙසේ තමා (ගුණවතැයි) තෙමේ කියා ද, ඔහුගේ ඒ කීම අනාර්යධර්මයෙකැයි ස්කන්ධාදියෙහි කුශල වූ ආර්යයෝ කියත්.

**යො අත්තනො සීලවතානි ජන්තු** - 'යො' යනු: යම්බඳු වූ. . .(1-3 නිද්දෙසය) **'සීලබ්බතානි'** යනු: ශීල ද වූ ව්‍රත ද වූයෙක් ඇත, ශීල නො වූ ව්‍රතයෙක් ඇති. සීලනාර්ථයෙන් ශීල වූයේත් සමාදානාර්ථයෙන් ව්‍රත වූයේත් කවරැ? යත්: මේ ශාසනයෙහි මහණ සිල්වත් වූයේ ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වූයේ ආචාර ගොචර දෙකින් යුක්ත වැ වෙසෙයි, අණුමාත්‍ර දොෂයෙහි භය දක්නාසුලු වූයේ සමාදන් වැ ශික්ෂා කොටස්හි හික්මෙයි. එහි යම් සංයමයෙක් සංවරයෙක් අනතික්‍රමයෙක් වී නම් මේ ශීල යැ. යම් සමාදානයෙක් වී නම් ඒ ව්‍රත යි. සංවරාර්ථයෙන් ශීල යැ, සමාදානාර්ථයෙන් ව්‍රත යි. මේ ශීලයත් ව්‍රතයත් වේ යැයි කියනු ලැබේ. ශීල නො වූ ව්‍රතය කවරැ? යත් 'ආරඤ්ඤිකඞ්ග යැ පිණ්ඩපාතිකඞ්ග යැ පංසුකූලිකඞ්ග යැ තෙචීවරිකඞ්ග යැ සපදානචාරිකඞ්ග යැ ඛලුපච්ඡාභත්තිකඞ්ග යැ නෙසජ්ජිකඞ්ගය යථාසන්ථතිකඞ්ග යැ' යන මේ ධුතාඞ්ග අට ශීල නො වූ ව්‍රත යැයි කියනු ලැබේ. වීර්යසමාදානයත් ශීල නො වූ ව්‍රත යැයි කියනු ලැබෙයි: 'එකාන්තයෙන් ශරීරයෙහි සමත් නහරත් ඇටත් ඉතිරි වේවා, මස් ලේ වියැළේවා, පුරුෂශක්තියෙන් පුරුෂබලයෙන් පුරුෂවීර්යයෙන් පුරුෂපරාක්‍රමයෙන් පැමිණියැ යුතු ඒ උත්තමාර්ථයට නො පැමිණ වීර්යයාගේ ශිථිලබවෙක් නො වන්නේ යැ'යි සිත උත්සාහ ගන්වයි, පිහිටුවයි. මෙ බඳු වූ වීර්යසමාදානය ශීල නො වූ ව්‍රත යැයි කියනුලැබේ.

1. "නාසිස්සං න පිවිස්සාමි විහාරතො න නික්ඛමෙ,
නපි පස්සං නිපාතෙස්සං[1] තණ්හාසල්ලෙ අනූහතෙ"ති [a]

චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. "න තාවාහං ඉමං පල්ලඞ්කං භින්දිස්සාමි, යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී"ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපං විරියසමාදානං වුච්චති වතං න සීලං. 'න තාවාහං ඉමම්හා ආසනා වුට්ඨහිස්සාමි, චඞ්කමා ඔරොහිස්සාමි, විහාරා නික්ඛමිස්සාමි, අඩ්ඪයොගා නික්ඛමිස්සාමි, පාසාදා නික්ඛමිස්සාමි, හම්මියා නික්ඛමිස්සාමි, ගුහාය නික්ඛමිස්සාමි, ලෙණා නික්ඛමිස්සාමි, කුටියා නික්ඛමිස්සාමි, කූටාගාරා නික්ඛමිස්සාමි, අට්ටා[2] නික්ඛමිස්සාමි, මාළා නික්ඛමිස්සාමි, උද්දණ්ඩා[3] නික්ඛමිස්සාමි, උපට්ඨානසාලාය නික්ඛමිස්සාමි, මණ්ඩපා නික්ඛමිස්සාමි, රුක්ඛමූලා නික්ඛමිස්සාමි යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී'ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපං විරියසමාදානං වුච්චති වතං න සීලං. 'ඉමස්මිං යෙව පුබ්බණ්හසමයං අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි ඵස්සයිස්සාමි[4] සච්ඡිකරිස්සාමී'ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපං විරියසමාදානං වුච්චති වතං න සීලං. 'ඉමස්මිංයෙව මජ්ඣන්තිකසමයං -පෙ- සායන්හසමයං – පුරෙභත්තං– පච්ඡාභත්තං– පුරිමං යාමං– මජ්ඣිමං යාමං– පච්ඡිමං යාමං– කාළෙ – ජුණ්හෙ– වස්සෙ – හෙමන්තෙ – ගිම්හෙ – පුරිමෙ වයොඛන්ධෙ – මජ්ඣිමෙ වයොඛන්ධෙ – පච්ඡිමෙ වයොඛන්ධෙ අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි ඵස්සයිස්සාමි සච්ඡිකරිස්සාමී'ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. **ජන්තූ**ති සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[5] ජන්තු ඉන්දගු හින්දගු මනුජොති 'යො අත්තනො සීලවතානි ජන්තු.'

**අනානුපුට්ඨො ච පරෙසං පාවා**ති – 'පරෙස'න්ති පරෙසං ඛත්තියානං බ්‍රාහ්මණානං වෙස්සානං සුද්දානං ගහට්ඨානං පබ්බජිතානං දෙවානං මනුස්සානං; **අනානුපුට්ඨො**ති අපුට්ඨො අපුච්ඡිතො අයාචිතො අනජ්ඣෙසිතො අපසාදිතො; **පාවා**ති අත්තනො සීලං වා වතං වා සීලබ්බතං වා පාවදති: අහමස්මි සීලසම්පන්නොති වා වතසම්පන්නොති වා සීලබ්බතසම්පන්නොති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන[6] වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, උච්චාකුලා පබ්බජිතොති වා මහාකුලා පබ්බජිතොති වා මහාභොගකුලා පබ්බජිතොති වා උළාරභොගකුලා පබ්බජිතොති වා, ඤාතො යසස්සී සගහට්ඨපබ්බජිතානන්ති වා, ලාභිම්හි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති වා, විනයධරොති වා ධම්මකථිකොති වා ආරඤ්ඤිකොති වා රුක්ඛමූලිකොති වා පිණ්ඩපාතිකොති වා පංසුකූලිකොති වා තෙචීවරිකොති වා සපදානචාරිකොති වා ඛලුපච්ඡාභත්තිකොති වා නෙසජ්ජිකොති වා යථාසන්ථතිකොති වා, පඨමස්ස ඣානස්ස ලාභීති වා දුතියස්ස ඣානස්ස ලාභීති වා තතියස්ස ඣානස්ස ලාභීති වා චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභීති වා විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ලාභීති වා ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා පාවදති කථෙති භණති දීපයති වොහරතීති 'අනානුපුට්ඨොව පරෙසං පාවා.'

---

1. නපි පස්සං න නිපාතෙස්සං – සීමු I. 2. අඩ්ඩා – මජසං. 3. කුඩ්ඩා – සීමු. I.
4 ඵුසයිස්සාමි – සයා. 5. ජතු – මු II. ජාතු – සයා මජසං.
a. ථෙරගාථාපාළි – පච්චයත්ථෙරගාථා – 3 1 2. මුදිතත්ථෙරගාථා – 4 1 12.
6. අජ්ඣෙනෙන – සීමු. I.

1. "තෘෂ්ණා නමැති හුල උපුටා නො ලූ කල්හි (මම් බාදනදිය) නො කමි, (යාගු ආදිය) නො බොමි, වෙහෙරින් බැහැර නො යමි, (ඇඳපුටු ආදියෙහි) ඇලය නො තබමි."

සිත උත්සාහ ගත්වයි, පිහිටුවයි. මෙබඳු වූ වියඨිසමාදානයත් ශීල නො වූ ව්‍රත යයි කියනු ලැබේ. 'මාගේ සිත උපාදානග්‍රහණය නො කොට (කාමාදි) ආස්‍රවයන්ගෙන් සමුච්ඡේදවිමුක්තියෙන් නො මිදෙන තාක් මේ පලඟ නො බිඳිමි' සිත උත්සාහ ගත්වයි, පිහිටුවයි. මෙබඳු වියඨිසමාදානය ශීල නො වූ ව්‍රත යයි කියනු ලැබේ. 'මාගේ සිත උපදානග්‍රහණය නො කොට ආස්‍රවයන්ගෙන් නොමිදෙන තාක් මේ ආසනයෙන් නො නැඟිසිටිමි, සක්මනින් නො බස්මි, ගුරුළුවක් ගෙයින් ප්‍රාසාදයෙන් හම්ඨියෙන් ගුහායෙන් ලෙනින් කිළියෙන් කුළුගෙයින් අටල්ලෙන් වටගෙයින් උදෑණ්ඩයෙන් උවටැන්හලින් මඩුයෙන් රුක්මුලින් නො නික්මෙමි' සිතට වැර ගත්වයි, පිහිටුවයි. මෙබඳු වියඨිසමාදානය ශීල නොවූ ව්‍රත යයි කියනු ලැබේ. 'මෙ දවස් මැ ආයඨිධම්ය (මාගේ සිතට) එලවමි, මොනොවට එලවමි, අධිගමය කරමි, ස්පර්ශ කරමි, ප්‍රත්‍යක්ෂ කරමි, සිත දැඩි කොට ගත්වයි, පිහිටුවයි. මෙබඳු වියඨිසමාදානය ශීල නො වූ ව්‍රත යයි කියනු ලැබේ. මේ මැදි දහවල්හි මැ. . .පස්වරුයෙහි පෙරබත්හි පසුබත්හි – පෙරයමැ මැදියමැ අලුයමැ අවපසැ පුරපසැ වැසිකලැ හිමත් කලැ ගිම්කලැ ප්‍රථමවයස්හි මධ්‍යමවයස්හි පශ්චිමවයස්හි අර්දහම් එලවමි, අධිගමය කෙරෙමි, ස්පර්ශ කෙරෙමි, ප්‍රත්‍යක්ෂ කෙරෙමි' සිත දැඩි කොට ගත්වයි, පිහිටුවයි. මෙබඳු වියඨිසමාදානයත් ශීල නො වූ ව්‍රත යයි කියනු ලැබේ. **ජනතු** යනු: (1-1.නිද්දෙසය.) 'යො අත්තනො සීලවතානි ජනතු' යනු වේ.

**අනානුපුට්ඨොව පරෙසං පාවා** – 'පරෙසං' යනු: අන්‍ය වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර ගෘහස්ථ ප්‍රව්‍රජිත දෙව මනුෂ්‍යයනට; **අනානුපුට්ඨො** – අපෘෂ්ට වූයේ නො පුළුවුස්නා ලදුයේ නො අයදනා ලදුයේ නො ඇණවන ලදුයේ නො පහදවන ලදුයේ; **පාවා** – තමා ගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය හෝ කියයි: 'මම් සිල්වත්මි හෝ, ව්‍රතවත්මි හෝ, ශීලව්‍රතවත්මි හෝ, ජාතියෙන් ගොත්‍රයෙන් කුලපුත්‍රභාවයෙන් වර්ණසෞන්දර්යයෙන් ධනයෙන් අධ්‍යයනයෙන් කර්මාන්තයෙන් ශිල්පයෙන් විද්‍යාවෙන් ශ්‍රුතයෙන් ප්‍රතිභාණයෙන් හෝ එක්තරයෙකින් යුක්ත වෙමි හෝ, උසස් කුලයෙන් නික්මැ පැවිදි වීමි මහාසාරකුලයෙන් පැවිදි වීමි මහද්භොග ඇති කුලයෙන් පැවිදි වීමි උලාරභොග ඇති කුලයෙන් පැවිදි වීමි හෝ, ගෑහැවිපැවිද්දන් අතුරෙහි ප්‍රකටයෙමි පිරිවර ඇත්තෙමි හෝ, සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකර ලැබෙමි හෝ, සෞත්‍රාන්තිකයෙමි විනයධරයෙමි ධර්මකථිකයෙමි හෝ, ආරණ්‍යකයෙමි වෘක්ෂමූලිකයෙමි පිණ්ඩපාතිකයෙමි පාංශුකූලිකයෙමි ත්‍රෛචීවරිකයෙමි සපදානචාරිකයෙමි ඛලුපච්ඡාභත්තිකයෙමි නෙසජ්ජිකයෙමි යථාසන්ථතිකයෙමි හෝ, ප්‍රථමධ්‍යානලාභී වෙමි ද්විතීය – තෘතීය – චතුර්ථධ්‍යානලාභී වෙමි ආකාසානඤ්චායතන – විඤ්ඤාණඤ්චායතන – ආකිඤ්චඤ්ඤායතන – නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි හෝ පවසයි කියයි බෙණෙයි දක්වයි ව්‍යවහාර කෙරේ නුයි 'අනානුපුට්ඨොව පරෙසං පවා' යනු වේ.

**අනරියධම්මං කුසලා තමාහූති** – 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ගකුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා; තෙ කුසලා එවමාහංසු: අනරියානං එසො ධම්මො, නෙසො ධම්මො අරියානං, බාලානං එසො ධම්මො, නෙසො ධම්මො පණ්ඩිතානං, අසප්පුරිසානං එසො ධම්මො, නෙසො ධම්මො සප්පුරිසානන්ති එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති-අනරියධම්මං කුසලා තමාහු.

**යො ආතුමානං සයමෙව පාවාති** – 'ආතුමා' වුච්චති අත්තා. **සයමෙව පාවාති** සයමෙව අත්තානං[1] පාවදති: අහමස්මි සීලසම්පන්නොති වා වතසම්පන්නොති වා සීලබ්බතසම්පන්නොති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, උච්චාකුලා පබ්බජිතොති වා මහාකුලා පබ්බජිතොති වා මහාභොගකුලා පබ්බජිතොති වා උළාරභොගකුලා පබ්බජිතොති වා, ඤාතො යසස්සී සගහට්ඨපබ්බජිතානන්ති වා, ලාභිම්හි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති වා, සුත්තන්තිකොති වා විනයධරොති වා ධම්මකථිකොති වා ආරඤ්ඤිකොති වා පිණ්ඩපාතිකොති වා පංසුකූලිකොති වා තෙචීවරිකොති වා සපදානචාරිකොති වා ඛලුපච්ඡාභත්තිකොති වා නෙසජ්ජිකොති වා යථාසන්ථතිකොති වා පඨමස්ස ඣානස්ස ලාභීති වා දුතියස්ස ඣානස්ස ලාභීති වා තතියස්ස ඣානස්ස ලාභීති වා චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභීති වා විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ලාභීති වා ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා පාවදති කථෙති භණති දීපයති වොහරතීති-යො ආතුමානං සයමෙව පාවාති.

තෙනාහ භගවා:

"යො අත්තනො සීලවතානි ජන්තු
අනානුපුට්ඨොව පරෙසං පාවා,
අනරියධම්මං කුසලා තමාහු
යො ආතුමානං සයමෙව පාවා"ති.

**8 - 4**

සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො
ඉතිහන්ති[2] සීලෙසු අකත්ථමානො,
තමරියධම්මං කුසලා වදන්ති
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ.

**සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තොති** – 'සන්තො' ති රාගස්ස සමිතත්තා සන්තො, දොසස්ස සමිතත්තා සන්තො, මොහස්ස සමිතත්තා සන්තො, කොධස්ස, උපනාහස්ස, මක්ඛස්ස, පළාසස්ස, ඉස්සාය, මච්ඡරියස්ස, මායාය, සාඨෙය්‍යස්ස, ථම්භස්ස, සාරම්භස්ස, මානස්ස, අතිමානස්ස, මදස්ස, පමාදස්ස, සබ්බකිලෙසානං, සබ්බදුච්චරිතානං, සබ්බසන්තාපානං, සබ්බාකුසලාභිසංඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති-සන්තො; භික්ඛූති සත්තන්නං ධම්මානං භින්නත්තා භික්ඛු: සක්කායදිට්ඨි භින්නා හොති, විචිකිච්ඡා භින්නා හොති, සීලබ්බතපරාමාසො භින්නො හොති, රාගො භින්නො හොති, දොසො භින්නො හොති, මොහො භින්නො හොති, මානො භින්නො හොති, භින්නාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා[3] දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

---

1. අත්තං - ස. 2. ඉදහන්ති - සිමු. I. 1. සදර - ස.

**අනරියධම්මං කුසලා තමාහු** – 'කුසලා' යනු: ස්කන්ධ – ධාතු – ආයතන ප්‍රතීත්‍යසමුත්පාද – සමෘතිප්‍රස්ථාන – සම්‍යක්ප්‍රධාන – සෘද්ධිපාද – ඉන්ද්‍රිය – බල– බොධ්‍යඞ්ග – මාර්ග – ඵල – නිර්වාණයෙහි නිපුණ වූවාහු මෙසේ කියති: 'තෙල ධර්මය අනාර්යයන්ගේ යැ, ආර්යයන්ගේ ධර්මයෙක් නො වෙයි. බාලයන්ගේ දහමෙක, පණ්ඩිතයන්ගේ දහමෙක් නො වෙයි. අසත්පුරුෂයන්ගේ දහමෙක, සත්පුරුෂයන්ගේ දහමෙක් නො වේ යයි මෙසේ පවසති කියති බෙණෙති දක්වති. මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'අනරියධම්මං කුසලා තමාහු' යනු වේ.

**යො ආතුමානං සයමෙව පාවා** – 'අතුමා' යි ආත්මය කියනු ලැබේ. **සයමෙව පවා** – තෙමේ මැ තමා පවසයි: 'මම සීලසම්පන්නයෙමි' හෝ ('අනානුපුට්ඨො පරෙසං පාවා' යන්නෙහි නිර්දෙශය බලනු.)... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි හෝ පවසයි, කියයි බෙණෙයි දක්වයි වහරා නුයි 'යො ආතුමානං සයමෙව පාවා' යනු වේ.

එයින් වදාලහ බුදුහු:

"යො අත්තනො සීලවතානි –පෙ– ආතුමානං සයමෙව පාවා" යනු.

## 8–4.

තවද යම් ක්ෂීණාසුව මහණෙක් රාගාදි කෙලෙස් සන්හිඳීමෙන් ශාන්ත වූයේ රාගාදි ගිනි නිවීමෙන් නිවුණු සිත් ඇත්තේ 'මම මෙසේ වෙමි' සිල් නිමිති කොට තමා එලවා කියන තෙපුල් නො කියන්නේ වේ ද, යමක්හුගේ ස්කන්ධාදිලොකයෙහි කිසි තැනෙක්හි රාගාදිඋත්සදයෝ නැද්ද, ඔහුගේ ඒ සිය ගුණ නො පාලකිරීම අරිදහමෙකැයි ස්කන්ධාදියෙහි නිපුණ වූ බුද්ධාදීහු කියත්.

**සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො** – 'සන්තො' යනු: රාගය සමිත (සන්හිඳුවන ලද) වන බැවින් ශාන්ත යැ, ද්වෙෂය සමිත වන බැවින් ශාන්ත යැ, මොහය සමිත වන බැවින් ශාන්ත යැ, ක්‍රොධය උපනාහය මකුබව පලාස(යුගග්‍රාහ)ය ඊර්ෂ්‍යාව මාත්සර්‍ය්‍යය මායාව ශඨබව තදබව කරණුත්තරියකරණය මානය අතිමානය මදය ප්‍රමාදය සියලු කෙලෙසුන් සියලු දුශ්චරිතයන් සියලු දරථයන් සියලු පරිදාහයන් සියලු සන්තාපයන් සියලු අකුශලාභිසංස්කාරයන් ශාන්ත වන බැවින් සමිත වන බැවින් වෙසෙසින් සමිත වන බැවින් දවන ලද වන බැවින් (සියලු සන්තාපයන්) නිවන ලද වන බැවින් දුරු කල බැවින් ඉපැදීමට නුසුදුසු කල බැවින් ශාන්ත වූයේ උපශාන්ත වූයේ නිවුණේ සන්හිඳුණේ නුයි 'සන්ත' නම. **භික්ඛු** – (මතු කියන) සප්තධර්මයන් භින්න වන බැවින් 'භික්ඛු' නම. සත්කායදෘෂ්ටිය බිඳුණේ වෙයි, විචිකිත්සාව – ශීලව්‍රතපරාමර්ශය – රාගය – ද්වෙෂය – මොහය – මානය බිඳුණේ වෙයි. ඔහු විසින් කෙලශප්‍රත්‍යය වූ පුනර්භවය දෙන්නා වූ කෙලශදරථ සහිත වූ දුඃඛවිපාක වූ අනාගතයෙහි ජාතිජරාමරණයන්ට කාරණ වූ ලාමක වූ අකුශලධර්මයෝ බිඳුණා ලද්දාහු වෙත්.

1. “පජ්ජෙන කතෙන අත්තනා (සභියාති භගවා)
පරිනිබ්බානගතො විතිණ්ණකඞ්ඛො
විභවං භවං ච විප්පහාය
වුසිතවා ඛීණපුනබ්භවො[1] ස භික්ඛූ”ති-[ක].

සන්තො ච භික්ඛූ.

**අභිනිබ්බුතත්තොති** - රාගස්ස නිබ්බාපිතත්තා අභිනිබ්බුතත්තො; දොසස්සනිබ්බාපිතත්තා අභිනිබ්බුතත්තා.
මොහස්ස නිබ්බාපිතත්තා අභිනිබ්බුතත්තො; කොධස්ස, උපනාහස්ස, මක්ඛස්ස, පළාසස්ස, ඉස්සාය, මච්ඡරියස්ස, මායාය, සාඨෙය්‍යස්ස, ථම්භස්ස, සාරම්භස්ස, මානස්ස, අතිමානස්ස, මදස්ස, පමාදස්ස, සබ්බකිලෙසානං, සබ්බදුච්චරිතානං, සබ්බදරථානං, සබ්බපරිළාහානං, සබ්බසන්තාපානං, සබ්බාකුසලාභිසඞ්ඛාරානං නිබ්බාපිතත්තා අභිනිබ්බුතත්තොති ‘සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො.’

**ඉතිහන්ති[2] සීලෙසු අකත්ථමානොති** - ‘ඉතිහ’න්ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි. අක්ඛරසමවායො ව්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාපෙතං[3] ඉතිහන්ති. **සීලෙසු අකත්ථමානොති** - ඉධෙකච්චො කත්ථී හොති විකත්ථී;[4] සො කත්ථති ‘අහමස්මි සීලසම්පන්නො’ති වා ‘වතසම්පන්නො’ති වා ‘සීලබ්බතසම්පන්නො’ති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා කත්ථති විකත්ථති, එවං න කත්ථති න විකත්ථති, කත්ථනා ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති ‘ඉතිහන්ති සීලෙසු අකත්ථමානො’

**තමරියධම්මං කුසලා වදන්තීති** - ‘කුසලා’ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ගකුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා, තෙ කුසලා එවං වදන්ති: ‘අරියානං එසො ධම්මො; නෙසො ධම්මො අනරියානං. පණ්ඩිතානං එසො ධම්මො; නෙසො ධම්මො බාලානං. සප්පුරිසානං එසො ධම්මො; නෙසො ධම්මො අසප්පුරිසානන්ති එවං වදන්ති, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති ‘තමරියධම්මං කුසලා වදන්ති.’

1. ඛීණා පුනබ්භවා - සීමු. I. 2. ඉදහං - පු.
3. පදනුපුබ්බතානාමෙතං - සීමු. I. 4. කත්ථිකො හොති විකත්ථිකො - සී. මු. II.
ක. සුත්තනිපාත - සභියසුත්ත.

1. යමෙක් තෙමෙ තමා විසින් වැඩූ මාර්ගයෙන් කෙලශපරිනිර්වාණයට ගියේ ද, එහෙයින් ම තරණය කළ සැක ඇත්තේ ද, විපත්ති සම්පත්ති ආදි භෙද ඇති විභවයත් භවයත් දුරු කොට මාර්ගවාස වැස නිම වූ ක්ෂය කළ පුනර්භව ඇති හෙතෙම භික්ෂු නම් වේ නුයි- 'සන්තො ච භික්ඛු' යනු වේ.

**අභිනිබ්බුතත්තො** - රාගය නිවන ලද වන බැවින් නිවුණු සිත් ඇතියේ ක්‍රොධය උපනාහය මකුබව පලාස(යුගග්‍රාහ)ය ඊර්ෂ්‍යාව මසුරුබව මායාව ශඨබව තදබව කරණුත්තරියකරණය මානය අතිමානය මදය ප්‍රමාදය සියලු කෙලෙසුත් සියලු දුශ්චරිතයන් සියලු දරථයන් සියලු පරිදාහයන් සියලු සන්තාපයන් සර්වාකුශලාභි-සංස්කාරයන් නිවන ලද වන බැවින් වෙසෙසින් නිවුණු සිත් ඇත්තේ නුයි 'සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො' යනු වේ.

**ඉතිහන්ති සීලෙසු අකත්ථමානො** - 'ඉතිහං' යනු: පදසන්ධි යෑ, පදයන්ගේ සංසර්ගී යෑ, පදයන්ගේ එකතු වීම යෑ, ව්‍යඤ්ජනයන්ගේ සිලුටුබව යෑ, තෙල 'ඉතිහං' යනු පදයන්ගේ පරිපාටිය ද වේ. **සීලෙසු අකත්ථමානො** - මෙ ලොවැ කිසිවෙක් ආත්මවර්ණනාව කරනුයේ විවිධ කොට ආත්මවර්ණනාව කරනුයේ වෙයි: හෙතෙම 'මම සිල්වත්මි' හෝ කියයි, ව්‍රතසම්පන්නයෙමි හෝ, ශීලව්‍රතසම්පන්නයෙමි හෝ, ජාතියෙන්, ගොත්‍රයෙන්, කුලපුත්‍රභාවයෙන්, වර්ණසෞන්දර්යයෙන් හෝ. . .නෙවසඤ්ඤානාසඤ්ඤා-යතනසමාපත්තිලාභී වෙමි හෝ කියයි වෙසෙසින් කියයි. මෙසේ නො කියයි, විවිධ කොට නො කියයි. ආත්මවර්ණනායෙන් දුරින් දුරු වූයේ නො ඇලුණේ සියලු ලෙසින් වෙන් වූයේ නික්මුණේ වෙන් වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්තවූයේ විගතමර්යාද කළ(එක් ව නො යෙදුණු) සිතින් යුක්ත ව වෙසේ නුයි 'ඉතිහන්ති සීලෙසු අකත්ථමානො' යනු වේ.

**තමරියධම්මං කුසලා වදන්ති** - 'කුසලා' යනු: ස්කන්ධයන්හි නිපුණ වූවාහු ධාතු - ආයතන - ප්‍රතීත්‍යසමුත්පාද - ස්මෘතිප්‍රස්ථාන - සම්‍යක්ප්‍රධාන - - ඍද්ධිපාද - ඉන්ද්‍රිය - බල - බොධ්‍යඞ්ග - මාර්ග - ඵල - නිර්වාණයෙහි නිපුණ වූවාහු මෙසේ කියති: 'තෙල ආර්යයන්ගේ දහමෙකි; අනාර්යයන්ගේ දහමෙක් නො වෙයි. පණ්ඩිතයන්ගේ දහමෙකි; බාලයන්ගේ දහමෙක් නො වෙයි. තෙල සත්පුරුෂයන්ගේ දහමෙකි; අසත්පුරුෂයන්ගේ දහමෙක් නො වේ ය'යි මෙසේ පවසති, කියති, බෙණෙති, දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'තමරියධම්මං කුසලා වදන්ති' යනු වේ.

**යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙති** – ‘යස්සා’ති අරහතො ඛීණාසවස්ස; **උස්සදාති** – සත්තුස්සදා: රාගුස්සදො දොසුස්සදො මොහුස්සදො මානුස්සදො දිට්ඨුස්සදො කිලෙසුස්සදො කම්මුස්සදො. තස්සිමෙ උස්සදා නත්ථි න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා; **කුහිඤ්චීති** – කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වා; **ලොකෙති** – අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ආයතනලොකෙති ‘යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ’ති.

තෙනාහ භගවා:

“සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො
ඉතිහන්ති සීලෙසු අකත්ථමානො,
තමරියධම්මං කුසලා වදන්ති
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ”ති.

**3 – 5**

පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා
පුරෙක්ඛතා සන්ති අවෙවදාතා,[1]
යදත්තනි පස්සති ආනිසංසං
තන්නිස්සිතො කුප්පපටිච්චසන්තිං[2],

**පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මාති**– ‘පකප්පනා’ති ද්වෙ පකප්පනා: තණ්හාපකප්පනා ච දිට්ඨිපකප්පනා ච–පෙ–අයං තණ්හාපකප්පනා–පෙ–අයං දිට්ඨිපකප්පනා, ඉමා ද්වෙ පකප්පනා. **සඞ්ඛතාති** – සඞ්ඛතා විසඞ්ඛතා අභිසඞ්ඛතා සණ්ඨාපිතා’තිපි සඞ්ඛතා, අථ වා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මාතිපි සඞ්ඛතා; **යස්සාති** – දිට්ඨිගතිකස්ස; **ධම්මා** වුච්චන්ති ද්වාසට්ඨිදිට්ඨිගතානීති ‘පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා.’

**පුරෙක්ඛතා සන්ති අවෙවදාතාති** – ‘පුරෙක්ඛතා’[3] ති ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච–පෙ–අයං තණ්හාපුරෙක්ඛාරො. – පෙ – අයං දිට්ඨිපුරෙක්ඛාරො. තස්ස තණ්හාපුරෙක්ඛාරො අප්පහීනො දිට්ඨිපුරෙක්ඛාරො අප්පටිනිස්සට්ඨො. තස්ස තණ්හාපුරෙක්ඛාරස්ස අප්පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස අප්පටිනිස්සට්ඨත්තා සො තණ්හං වා දිට්ඨිං වා පුරතො කත්වා චරති, තණ්හාධජො තණ්හාකෙතු තණ්හාධිපතෙය්‍යො, දිට්ඨිධජො දිට්ඨිකෙතු දිට්ඨාධිපතෙය්‍යො, තණ්හාය වා දිට්ඨියා වා පරිවාරිතො චරතීති පුරෙක්ඛතා; **සන්තීති** – සන්ති සංවිජ්ජන්ති අත්ථි උපලබ්භන්ති; **අවෙවදාතාති** – අවෙවදාතා අවොදාතා අපරිසුද්ධා සංකිලිට්ඨා සංකිලෙසිකාති ‘පුරෙක්ඛතා සන්ති අවෙවදාතා.’

1. අවිවදාතා – සු. PTS. 2. සන්ති – සීමු. I. 3. පුරෙක්ඛාරා – කත්ථචි.

**යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ** – 'යස්ස' යනු: අර්හත් වූ ක්ෂීණාස්‍රවයන්හුගේ; **උස්සදා** – උත්සදයෝ සතෙකි: රාගොත්සදය දෝෂ – මෝහ – මාන – දෘෂ්ටි – ක්ලේශ – කර්මොත්සදය ය යි. ඔහුට මේ උත්සදයෝ නැත, විද්‍යමාන නො වෙති, නො ලැබෙති, ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු දුරු වූවාහු අභව්‍යොත්පත්තික වූවාහු නුවණ නමැති ගින්නෙන් දවනා ලද්දාහු වෙත්. **කුහිඤ්චි** – අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ කිසි තැනෙක්හි; **ලොකෙ** – අපායලෝකයෙහි මනුෂ්‍ය – දෙව – ස්කන්ධ – ධාතු – ආයතනලෝකයෙහි නුයි 'යස්සුස්සදා නත්ථි කුහිඤ්චි ලොකෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

''සතෙතා ච භික්ඛු–පෙ–කුහිඤ්චි ලොකෙ''යි.

**8 – 5.**

යම් දෘෂ්ටිගතිකයන්හුගේ තෘෂ්ණාදෘෂ්ටි විසින් පරිකල්පිත වූ (=සලකන ලද) ප්‍රත්‍යයෙන් සකස් කරන ලද තෘෂ්ණාදෘෂ්ටි පෙරටු කරන ලද අපිරිසුදු වූ දෙසැටදිට්ඨිගත ධර්ම කෙනෙක් ඇත්තාහු ද, හෙතෙම යම් හෙයකින් ඒ දෘෂ්ටියෙහි ප්‍රත්‍යය සත්කාරාදි දෘෂ්ටධාර්මික වූ ද ගතිවිශෙෂාදි සාම්පරායික වූ ද ආනිසංසයක් දක්නේ ද, එහෙයින් විපාකජනක පරිවර්තනශීලි හෙයින් කොප්‍ය වූ ද ප්‍රතීත්‍යසමුත්පන්න වූ ද සංවෘතිශාන්ති සඞ්ඛ්‍යාත දෘෂ්ටිය ඇසිරි කොට පවත්නේ වේ.

**පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා** – 'පකප්පනා' යි: තෘෂ්ණාප්‍රකල්පනය ද දෘෂ්ටිප්‍රකල්පනය දැයි ප්‍රකල්පනයෝ දෙදෙනෙකි; . . .මේ තෘෂ්ණාප්‍රකල්පනා යැ . . .මේ දෘෂ්ටිප්‍රකල්පනා යි. **සඞ්ඛතා** – ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දාහු වෙසෙසින් සකස් කරන ලද්දාහු මොනොවට සකස් කරන ලද්දාහු ප්‍රත්‍යයවශයෙන් ම මනා කොට තබන ලද්දාහු නුයි 'සඞ්ඛත' නම් වෙති. නොහොත් ඇති වැ නැති වන හෙයින් අනිත්‍ය වූවාහු ප්‍රත්‍යයන් විසින් සකස් කරන ලද්දාහු වස්ත්වාලම්බනයන් නිසා උපන්නාහු ක්ෂය වන ස්වභාව ඇත්තාහු පිරිහෙන ස්වභාව ඇත්තාහු නො නැවැතී පහ වන ස්වභාව ඇත්තාහු නිරුද්ධ වන ස්වභාව ඇත්තාහු නුයි ද 'සඞ්ඛත' නම් වෙත්. **යස්ස** – දෘෂ්ටිගතිකයන්හුගේ; ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ 'ධම්ම' යි කියනු ලැබෙත් නුයි 'පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා' යනු වේ.

**පුරෙක්ඛතා සන්ති අවෙවදාතා** – 'පුරෙක්ඛතා' යනු: තෘෂ්ණාපුරස්කාරය ද දෘෂ්ටිපුරස්කාරය දැයි පුරස්කාරයෝ දෙදෙනෙක් වෙති. . . .ඔහුට (ඔහු විසින් හෝ) තෘෂ්ණාපුරස්කාරය අප්‍රහීණ යැ, දෘෂ්ටිපුරස්කාරය දුරු නො කරන ලද්දේ යැ, ඔහු විසින් තෘෂ්ණාපුරස්කාරය අප්‍රහීණ හෙයින් දෘෂ්ටිපුරස්කාරය දුරු නො කළ හෙයින් හෙතෙම තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට හැසිරෙයි, තෘෂ්ණා නමැති ධ්වජ ඇත්තේ තෘෂ්ණා නමැති කෙහෙළි ඇත්තේ තෘෂ්ණාව අධිපති කොට ඇත්තේ, දෘෂ්ටි නමැති ධ්වජ ඇත්තේ දෘෂ්ටි නමැති කෙහෙළි ඇත්තේ දෘෂ්ටිය අධිපති කොට ඇත්තේ වෙයි. තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ විසින් පිරිවරන ලද්දේ හැසිරේ නුයි 'පුරෙක්ඛතා' යනු වේ. **සන්ති** – ඇත, විද්‍යමාන වෙති, ලැබෙත්. **අවෙවදාතා** – අනවදාත වූවාහු අපරිශුද්ධ වූවාහු කුමු කිලිටි වූවාහු කෙලෙසුණාහු නුයි 'පුරෙක්ඛතා සන්ති අවෙවදාතා' යනු වේ.

**යදත්තනි පස්සති ආනිසංසන්ති** 'යදත්තනී'ති යං අත්තනි; අත්තා වුච්චති දිට්ඨිගතං. අත්තනො දිට්ඨියා ද්වෙ ආනිසංසෙ පස්සති: දිට්ඨධම්මිකඤ්ච ආනිසංසං සම්පරායිකඤ්ච ආනිසංසං. කතමො දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො? යංදිට්ඨිකො සත්ථා හොති, තංදිට්ඨිකා සාවකා හොන්ති. තංදිට්ඨිකං සත්ථාරං සාවකා සක්කරොන්ති ගරුංකරොන්ති මානෙන්ති පූජෙන්ති අපචිතිං කරොන්ති. ලභති ච තතොනිදානං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරං. අයං දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො. කතමො දිට්ඨියා සම්පරායිකො ආනිසංසො? අයං දිට්ඨි අලං නාගත්තාය වා සුපණ්ණත්තාය වා යක්ඛත්තාය වා අසුරත්තාය වා ගන්ධබ්බත්තාය වා මහාරාජත්තාය වා ඉන්දත්තාය වා බ්‍රහ්මත්තාය වා දෙවත්තාය වා, අයං දිට්ඨි අලං සුද්ධියා විසුද්ධියා පරිසුද්ධියා මුත්තියා විමුත්තියා පරිමුත්තියා, ඉමාය දිට්ඨියා සුජ්ඣන්ති විසුජ්ඣන්ති පරිසුජ්ඣන්ති මුච්චන්ති විමුච්චන්ති පරිමුච්චන්ති; ඉමාය දිට්ඨියා සුජ්ඣිස්සාමි විසුජ්ඣිස්සාමි පරිසුජ්ඣිස්සාමි මුච්චිස්සාමි විමුච්චිස්සාමි පරිමුච්චිස්සාමීති ආයතිං ඵලපාටිකඞ්ඛී හොති. අයං දිට්ඨියා සම්පරායිකො ආනිසංසො. අත්තනො දිට්ඨියා ඉමෙ ද්වෙ ආනිසංසෙ පස්සති දක්ඛති ඕලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති 'යදත්තනි පස්සති ආනිසංසං'.

**තංනිස්සිතො කුප්පපටිච්චසන්තින්ති** – තිස්සො සන්තියො: අච්චන්තසන්ති තදඞ්ගසන්ති සම්මුතිසන්ති.[1] කතමා අච්චන්තසන්ති? අච්චන්තසන්ති වුච්චති අමතං නිබ්බානං යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අයං අච්චන්තසන්ති. කතමා තදඞ්ගසන්ති? පඨමජ්ඣානං සමාපන්නස්ස නීවරණා සන්තා හොන්ති, දුතියජ්ඣානං සමාපන්නස්ස විතක්කවිචාරා සන්තා හොන්ති, තතියජ්ඣානං සමාපන්නස්ස පීති සන්තා හොති, චතුත්ථජ්ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛා සන්තා හොන්ති, ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤා පටිඝසඤ්ඤා නානත්තසඤ්ඤා සන්තා හොන්ති, විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤා සන්තා හොති, ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤා සන්තා හොති, නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤා සන්තා හොති, අයං තදඞ්ගසන්ති. කතමා සම්මුතිසන්ති? සම්මුතිසන්ති[2] වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි, (ඉමා) දිට්ඨිසන්තියො. අපි ච සම්මුතිසන්ති ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා සන්තීති. **තංනිස්සිතො කුප්පපටිච්ච සන්තින්ති**– කුප්පසන්තිං පකුප්පසන්තිං එරිතසන්තිං[3] සමෙරිතසන්තිං චලිතසන්තිං ඝට්ටිතසන්තිං කම්පිතසන්තිං පකම්පිතසන්තිං අනිච්චං සඞ්ඛතං[4] පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මං, සන්තිං නිස්සිතො අස්සිතො අල්ලීනො උපගතො සමුපගතො අජ්ඣොසිතො අධිමුත්තොති තන්නිස්සිතො කුප්පපටිච්චසන්තිං.'

---

1 සම්මතිසන්ති - ස්‍යා. 2. සම්මුති සන්තියො - සීමු. II. 3. පරිතසන්ති - ස.
4. අසඞ්ඛතං - සීමු. I.

**යදත්තනි පස්සති ආනිසංසං** – 'යදත්තනි' – යං අත්තනි; 'අත්තා' යි දෘෂ්ටිගතය කියනු ලැබෙයි තමාගේ දෘෂ්ටියෙහි අනුසස් දෙකක් දකී: දෘෂ්ටධාර්මිකආනෘශංසය සාම්පරායිකආනෘශංසය යි කියා යි. දෘෂ්ටියෙහි දෘෂ්ටධාර්මිකආනෘශංසය කවරැ යත්: ශාස්තෘ තෙම යම් බඳු දෘෂ්ටි ඇත්තේ නම්, ශ්‍රාවකයෝ එබඳු දෘෂ්ටි ඇත්තාහු වෙති. එබඳු දෘෂ්ටි ඇති ශාස්තෘහු හට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙති, ගරු කෙරෙති, බුහුමන් කෙරෙති, පුදති, අඤ්ජලිකර්මාදියෙන් අපචායන කෙරෙත්; එකරුණෙන් චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පසබෙහෙත්පිරිකර ලබන්නේත් වෙයි. මේ දෘෂ්ටියෙහි දෘෂ්ටධාර්මිකආනෘශංස යි. දෘෂ්ටියෙහි සාම්පරායික ආනෘශංසය කවරැ යත්: 'මේ දෘෂ්ටිය නාරජබවට හෝ ගුරුළු – යක්සෙනෙවි – අසුර – ගඳෙව් – වරම්රජ – සක්දෙව් – මහබඹ – සම්මුතිදෙව බවට හෝ පමණ යැ, මේ දෘෂ්ටිය ශුද්ධියට විශුද්ධියට පාරිශුද්ධියට මුක්තියට විමුක්තියට සර්වප්‍රකාරයෙන් මුක්තියට පමණ යැ, මේ දෘෂ්ටියෙන් ශුද්ධ වෙති, විශුද්ධ වෙති, පරිශුද්ධ වෙති, මිදෙති, වෙසෙසින් මිදෙති, සර්වප්‍රකාරයෙන් මිදෙති; මේ දෘෂ්ටියෙන් ශුද්ධ වෙමි, විශුද්ධ – පරිශුද්ධ වෙමි, මිදෙමි, වෙසෙසින් මිදෙමි, සර්වප්‍රකාරයෙන් මිදෙමි' අනාගතඵලය කැමැති වන්නේ වෙයි. මේ දෘෂ්ටියෙහි සාම්පරායික ආනෘශංස යි. තමාගේ දෘෂ්ටියෙහි මේ දෙ අනුසස් දකී බලයි සිතයි විමසා නුයි 'යදත්තනි පස්සති ආනිසංසං' යනු වේ.

**තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං** – ශාන්තීහු අත්‍යන්තශාන්ති යැ තදඞ්ගශාන්ති යැ සංවෘතිශාන්ති යැයි තිදෙනෙකි; අත්‍යන්තශාන්ති කවරී ද යත්? සියලු සංස්කාරයන්ගේ සන්හිඳීම ඇති සියලු කාමාදිඋපධි දුරැලූ තෘෂ්ණාක්ෂය වූ කෙලෙස්රජස් නො ඇලුණු සියලු දුක් නිරුද්ධ වූ අමාමහනිවන 'අත්‍යන්තශාන්ති' යයි කියනු ලැබේ; මේ යැ අත්‍යන්තශාන්ති නම්. තදඞ්ගශාන්ති කවරී ද යත්? පළමුවන දූහැනට සමවත්හුගේ නීවරණයෝ සන්හිඳුණාහු වෙති, දෙවැනි දූහැනට සමවත්හුගේ විතර්කවිචාරයෝ ශාන්ත වෙති, තෙවැනි දූහැනට සමවත්හුගේ ප්‍රීතිය ශාන්ත වෙයි, සිවුවැනි දූහැනට සමවත්හුගේ සුවදුක් ශාන්ත වෙයි, අකාසානඤ්චායතනයට සමවත්හුගේ රූපසංඥා ප්‍රතිඝසංඥා නානාත්වසංඥාවෝ ශාන්ත වේති, විඤ්ඤාණඤ්චායතනයට සමවත්හුගේ ආකාසානඤ්චායතනසංඥාව ශාන්ත වෙයි, ආකිඤ්චඤ්ඤායතනයට සමවත්හුහට විඤ්ඤාණඤ්චායතනසංඥාව ශාන්ත වෙයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත්හුහට ආකිඤ්චඤ්ඤායතනසංඥාව ශාන්ත (–සන්හිඳුණේ) වේ; මේ තදඞ්ගශාන්තිය යි. සම්මුතිශාන්ති කවරී ද යත්? 'සම්මුතිශාන්ති' යයි දෙසැට දෘෂ්ටිගතයෝ කියනු ලැබෙත්. (මොහු) දෘෂ්ටිශාන්තීහු යි. වැලිදු සංවෘතිශාන්තිය මේ අර්ථයෙහි 'ශාන්ති' යයි අදහස් කරන ලදී. **තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං** – (විපාකජනක විසින් ද පරිවර්තන විසින් ද) කොප්‍යශාන්ති වූ වෙසෙසින් කොප්‍යශාන්ති වූ චංචලශාන්ති වූ චලිතශාන්ති වූ පීඩිතශාන්ති වූ කම්පිතශාන්ති වූ ප්‍රකම්පිතශාන්ති වූ අනිත්‍ය වූ සංස්කෘත වූ ප්‍රත්‍යයසමුත්පන්න වූ ක්ෂය වනසුලු නැසෙනසුලු නො නවත්නාසුලු නිරුද්ධ වන සභාව ඇති ශාන්තිය ඇසුරු කෙළේ වෙසෙසින් ඇසුරු කෙළේ වැළඳගත්තේ ඊට පැමිණියේ ඇතුළු වූයේ ඇලුණේ නුයි 'තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං' යනු වේ.

තෙනාහ භගවා:

"පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා
පුරෙක්ඛතා සන්ති අවෙවදාතා,
යදත්තනි පස්සති ආනිසංසං
තන්නිස්සිතො කුප්පපටිච්චසන්ති" න්ති.

3 - 6

දිට්ඨීනිවෙසා න හි ස්වාතිවත්තා[1]
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා නරො තෙසු නිවෙසනෙසු
නිරස්සති[2] ආදියතිච්ච[3] ධම්මං.

**දිට්ඨිනිවෙසා න හි ස්වාතිවත්තාති** – 'දිට්ඨීනිවෙසා'ති 'සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨිනිවෙසනං. 'අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති අභිනිවෙසපරාමාසො දිට්ඨිනිවෙසනන්ති දිට්ඨිනිවෙසා; **න හි ස්වාතිවත්තාති** – දිට්ඨීනිවෙසා න හි ස්වාතිවත්තා,[1] දුරතිවත්තා දුත්තරා දුප්පතරා දුස්සමතික්කමා දුබ්බීති-වත්තාති 'දිට්ඨීනිවෙසා න හි ස්වාතිවත්තා.'

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතන්ති** – 'ධම්මෙසූ'ති ද්වාසට්ඨි දිට්ඨිගතෙසු; **නිච්ඡෙය්‍යාති** – නිච්ඡිනිත්වා විනිච්ඡිනිත්වා[4] විචිනිත්වා පවිචිනිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **සමුග්ගහීතන්ති** නිවෙසනෙසු ඔධිග්ගාහො බිලග්ගාහො වරග්ගාහො කොට්ඨාසග්ගාහො උච්චයග්ගාහො සමුච්චයග්ගාහො, ඉදං සච්චං තච්ඡං තථං භූතං යථාසභාවං[5] අවිපරීතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තන්ති - ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

**තස්මා නරො තෙසු නිවෙසනෙසූති**– 'තස්මා'ති –තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා; **නරොති** සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[6] ජන්තු ඉන්දගු හින්දගු මනුජො; **තෙසු නිවෙසනෙසූති** – තෙසු දිට්ඨිනිවෙසනෙසූති 'තස්මා නරො තෙසු නිවෙසනෙසු.'

---

1. සමාතිවත්තා – සීමු. I. මජ්ඣං. ස. 2. නිදස්සති – ස්‍යා. PTS.
3. ආදියති ච. PTS.
4. නිච්ඡිනිත්වා විච්ඡිනිත්වා 'තිපි පාඨො.
5. යථාවං – ස. 6. ජතු – සීමු. II. ජාතු - ස්‍යා.

එයින් වදාළහ බුදුහු:

"පකප්පිතා සඞ්ඛතා-පෙ-කුප්පපටිච්චසන්තිං" යි.

3-6.

ඉදංසච්චාභිනිවෙස සඞ්ඛ්‍යාත දෘෂ්ටිනිවෙශනයෝ යම් හෙයකින් සුව සේ ඉක්මැවිය හෙන්නාහු නො වෙත් ද, දෙසැට දිට්ඨදම් අතුරෙහි මොනොවට බැසගත් ඒ ඒ ධර්මය නිශ්චය කොට පවත්තේ ද, එහෙයින් සත්ත්ව තෙමෙ ඒ දෘෂ්ටිනිවෙශනයන්හි අජසීල ගොශීලාදි ධර්මය හරනේ ද වෙයි, ගන්නේත් වේ.

**දිට්ඨිනිවෙසා න හි ස්වාතිවත්තා** - 'දිට්ඨිනිවෙසා' යනු: 'ආත්මභාව සඞ්ඛ්‍යාත ලොකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය සිස්' යැයි, අභිනිවෙශයෙන් පරාමර්ශනය කිරීම දෘෂ්ටිනිවෙශන යැ; ('අසස්සතො' යන ආදිය 3-2ගාථානිද්දෙසයෙහි යැ.) **න හි ස්වාතිවත්තා** - දෘෂ්ටිනිවෙශනයෝ නො මැ සුව සේ ඉක්මැවිය හෙන්නාහු, දුක සේ ඉක්මැවිය යුත්තාහු, දුස්තර වූවාහු දුෂ්ප්‍රතර වූවාහු නුයි 'න හි ස්වාතිවත්තා' යනු වේ.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං** - 'ධම්මෙසු' යනු: ද්වාෂෂ්ටිදෘෂ්ටිගත-යන්හි; **නිච්ඡෙය්‍ය** - නිශ්චය කොට විනිශ්චය කොට විමසා සර්වප්‍රකාරයෙන් විමසා තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට; **සමුග්ගහීතං** - දෘෂ්ටිනිවෙශනයන්හි අවධි කොට ගැනීම යැ, කොටස් වශයෙන් ගැනීම යැ, උත්තමග්‍රාහ යැ, කොට්ඨාසග්‍රාහ යැ, රාශිවශයෙන් ගැනීම යැ, විශෙෂරාශිවශයෙන් ගැනීම යි; මෙය මැ ස්වභාව යැ අවිපරීත යැ අවිපරිණාම යැ විද්‍යමාන යැ යථාස්වභාව යැ විපරීත නො වේ යැයි ගන්නා ලද පරාමර්ශ කළ අභිනිවෙශ කළ බැසගන්නා ලද නිශ්චය කර ගන්නා ලද නුයි 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං' යනු වේ.

**තස්මා නරො තෙසු නිවෙසනෙසු** - 'තස්මා' යනු: එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන්; **නරො** - සත්ත්ව යැ නර යැ මානව යැ පුරුෂ යැ පුද්ගල යැ ජීව යැ (ජාතියට යේ නුයි) ජාගු යැ ජන්තු යැ (ඉන්ද්‍රියයෙන් යේ නුයි) ඉන්දගු යැ (මරණයට යේ නුයි) හින්දගු යැ මනුජ යැ; **තෙසු නිවෙසනෙසු** - ඒ දෘෂ්ටිනිවෙශනයන්හි නුයි 'තස්මා නරො තෙසු නිවෙසනෙසු' යනු වේ.

**නිරස්සති[1] ආදියතීච[2] ධම්ම**න්ති – 'නිරස්සතී'ති ද්වීහි කාරණෙහි නිරස්සති: පරවිච්ඡින්දනාය වා නිරස්සති, අනභිසම්භුණන්තො වා නිරස්සති. කථං පරවිච්ඡින්දනාය වා නිරස්සති? පරො විච්ඡින්දෙති, සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුප්පටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, නත්ථෙත්ථ[3] සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා, නත්ථෙත්ථ සුජ්ඣන්ති වා විසුජ්ඣන්ති වා පරිසුජ්ඣන්ති වා මුච්චන්ති වා විමුච්චන්ති වා පරිමුච්චන්ති වා, හීනා නිහීනා ඔමකා ලාමකා ඡත්තකා[4] පරිත්තාති එවං පරො විච්ඡින්දෙති. එවං විච්ඡින්දියමානො සත්ථාරං නිරස්සති, ධම්මක්ඛානං නිරස්සති, ගණං නිරස්සති, දිට්ඨිං නිරස්සති, පටිපදං නිරස්සති, මග්ගං නිරස්සති, එවං පරවිච්ඡින්දනාය නිරස්සති. කථං අනභිසම්භුණන්තො නිරස්සති? සීලං අනභිසම්භුණන්තො සීලං නිරස්සති, වතං අනභිසම්භුණන්තො වතං නිරස්සති, සීලබ්බතං අනභිසම්භුණන්තො සීලබ්බතං නිරස්සති. **ආදියතීච ධම්ම**න්ති– සත්ථාරං ගණ්හාති, ධම්මක්ඛානං ගණ්හාති, ගණං ගණ්හාති දිට්ඨිං ගණ්හාති, පටිපදං ගණ්හාති, මග්ගං ගණ්හාති පරාමසති අභිනිවිසතීති 'නිරස්සති ආදියතීච ධම්මං.'

තෙනාහ භගවා:

"දිට්ඨීනිවෙසා න හි ස්වාතිවත්තා
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා නරො තෙසු නිවෙසනෙසු
නිරස්සතී[1] ආදියතීච[2] ධම්ම"න්ති.

8 – 7

ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ
පකප්පිතා දිට්ඨි භවාභවෙසු,
මායඤ්ච මානඤ්ච පහාය ධොනො
ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො.

**ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසූ**ති– 'ධොනො'ති ධොනා වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභබ්‍යා චින්තා උපපරික්ඛා භූරී මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි.[a] කිං කාරණා ධොනා වුච්චති පඤ්ඤා?

1. නිදස්සති-සස්, PTS. 2. ආදියතිච PTS.
3. න තත්ථ - සස්. PTS. 4. ජතුක්කා - සිමු. II. PTS.
a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

**නිරස්සති ආදියතිච්ච ධම්මං** – 'නිරස්සති' යනු: දෙකරුණෙකින් දුර ලයි: පරවච්ඡන්දතායෙන් හෝ දුර ලයි, අනභිසම්භවනයෙන් හෝ දුර ලයි. කිසෙයින් පරවච්ඡන්දතායෙන් (=අන්‍යයන් විසින් වෙන් කරනු ලැබීමෙන්) දුර ලයි යත්– අනෙකෙක් වියොග කෙරෙයි: 'ඒ ශාස්තෘ සර්වඥ නො වෙයි. ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි, ගණයා සුප්‍රතිපන්න නො වෙයි, දෘෂ්ටිය සොඳුරු නො වෙයි, ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි, මාර්ගය නෛර්යාණික නො වෙයි, මෙහි ශුද්ධියක් හෝ විශුද්ධියක් – පාරිශුද්ධියක් – මුක්තියක් – විමුක්තියක් – පරිමුක්තියක් හෝ නැත; මෙහි ශුද්ධ වෙති හෝ විශුද්ධ වෙති – පරිශුද්ධ වෙති – මුක්ත වෙති – විමුක්ත වෙති – පරිමුක්ත වෙති හෝ නැත; හීනයෝ යැ, නිහීනයෝ යැ, අවමකයෝ යැ, ලාමකයෝ යැ, ඡතුක්ක(=ප්‍රත්‍යයගීත)යෝ යැ, අල්පයෝ යැ'යි මෙසෙයින් අනෙකෙක් වියොග කරවයි. මෙසේ වියෝග කරනු ලබනුයේ ශාස්තෘහු දුර ලයි, ධර්මාඛ්‍යානය – ගණයා – දෘෂ්ටිය – ප්‍රතිපදාව – මාර්ගය දුර ලයි. මෙසේ පරවච්ඡන්දතායෙන් දුර ලයි. කිසෙයින් අනභිසම්භවනයෙන් (=නො පැමිණෙනුයේ හෝ නො හැකි වනුයේ) දුර ලයි යත්: ශීලය නො පුරනුයේ ශීලය දුර ලයි, ව්‍රතය නො පුරනුයේ ව්‍රතය දුර ලයි, ශීලව්‍රතය නො පුරනුයේ ශීලව්‍රතය දුර ලයි. **ආදියතිච්ච ධම්මං** – ශාස්තෘහු ගනී, ධර්මාඛ්‍යානය – ගණයා – දෘෂ්ටිය – ප්‍රතිපදාව – මාර්ගය ගනී පරාමර්ශ කෙරෙයි, බැසගනී නුයි 'නිරස්සති ආදියතිච්ච ධම්මං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

'දිට්ඨිනිවෙසා–පෙ–ආදියතිච්ච ධම්මං' යනු.

**8 – 7.**

යම් හෙයකින් ධූතපාප ඇති ක්ෂීණාස්‍රව මහණහු හට කාමාදිභවයන්හි ආත්මභාවලොකයෙහි කිසි තැනෙක්හි තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රකල්පිත (=සලකන ලද) දෘෂ්ටියක් නැද්ද, එහෙයින් ඒ ක්ෂීණාස්‍රව තෙම මායාව ද මානය ද දුර ලා සිටියේ රාගාදි කුමකින් නිරයාදිගතිවිශෙෂයකට යන්නේ ද, හෙතෙම තෘෂ්ණාදෘෂ්ටිඋපය (=දෙෂ) රහිත වූයේ මැයි.

**ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසු** – 'ධොනො' යනු: 'ධොනා' යී ප්‍රඥාව කියනු ලබයි. අනිත්‍යාදිප්‍රකාරයෙන් ධර්මයන් දනගන්නා වූ අනිත්‍යාදිය විමසන්නා වූ ප්‍රකර්ෂයෙන් විමසන්නා වූ සිවුසස්දහම් විමසන්නා වූ අනිත්‍යාදිය සලකන උපලක්ෂණ – ප්‍රත්‍යුපලක්ෂණ වූ පණ්ඩිතභාව කුසලබව නිපුණබව යයි කියන ලද අනිත්‍යාදිය විභාවනය කරන අනිත්‍යාදිය සිතන පරීක්ෂා කරන පොළොව මෙන් පතල හෙයින් භූරි නම් වූ කෙලෙසුන් නසන හෙයින් මෙධා යයි කියන ලද යාථාවලක්ෂණ-ප්‍රතිවෙධයෙහි පමුණුවන හෙයින් පරිණායිකා නම් වූ අනිත්‍යාදි විසින් ධර්මයන් දක්නා හෙයින් විදර්ශනා නම් වූ අනිත්‍යාදිය දනගන්නා හෙයින් සම්ප්‍රඥාන නම් වූ නොමග යන සිත විදසුන්මගට නගන හෙයින් ප්‍රතොදයක් (=කෙවිටක්) වැනි වූ ප්‍රඥෙන්ද්‍රිය ප්‍රඥාබලය (කෙලෙස් සිඳින හෙයින්) ප්‍රඥාශස්ත්‍රය (අත්‍යුද්ගත හෙයින්) ප්‍රඥාප්‍රාසාදය ප්‍රඥාලොකය ප්‍රඥාවභාසය ප්‍රඥාප්‍රද්‍යොතය ප්‍රඥාරත්නය යි කියන ලද අරමුණෙහි නො මුළා වන හෙයින් අමොහ නම් වූ ධර්මවිචය සඞ්ඛ්‍යාත වූ සම්‍යග්දෘෂ්ටි යයි කියන ලද ප්‍රඥාව යි. කවර කරුණෙකින් ප්‍රඥාව 'ධොනා' නම් වූ යැ යත්:

තාය[1] පඤ්ඤාය කායදුච්චරිතං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච, වචීදුච්චරිතං-පෙ-මනොදුච්චරිතං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච, රාගො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, දොසො – මොහො – කොධො – උපනාහො – මක්ඛො – පළාසො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, ඉස්සා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච, සාඨෙය්‍යං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච, ථම්භො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, සාරම්භො – මානො – අතිමානො – මදො – පමාදො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, සබ්බෙ කිලෙසා – සබ්බෙ දුච්චරිතා– සබ්බෙ දරථා – සබ්බෙ පරිළාහා –සබ්බෙ සන්තාපා – සබ්බාකුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. තංකාරණා ධොනා වුච්චති පඤ්ඤා. අථ වා සම්මාදිට්ඨියා මිච්ඡාදිට්ඨි ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච, සම්මාසඞ්කප්පෙන මිච්ඡාසඞ්කප්පො ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, සම්මාවාචාය මිච්ඡාවාචා ධුතා ච -පෙ- සම්මාකම්මන්තෙන මිච්ඡාකම්මන්තො ධුතො ච- සම්මාආජීවෙන මිච්ඡාආජීවො ධුතො ච – සම්මාවායාමෙන මිච්ඡාවායාමො ධුතො ච– සම්මාසතියා මිච්ඡාසති ධුතා ච – සම්මාසමාධිනා මිච්ඡාසමාධි ධුතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච සම්මාඤාණෙන මිච්ඡාඤාණං ධුතඤ්ච – සම්මාවිමුත්තියා මිච්ඡාවිමුත්ති ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අථ වා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බා–කුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අරහා ඉමෙහි ධොනියෙහි[2] ධම්මෙහි උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො, තස්මා අරහා ධොනො. සො ධුතරාගො ධුතපාපො ධුතකිලෙසො ධුතපරිළාහොති 'ධොනො.'

**කුහිඤ්චීති**– කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වා; **ලොකෙති** – අපායලොකෙ –පෙ– ආයතනලොකෙ. **පකප්පිතාති**[3] – ද්වෙ පකප්පනා: තණ්හාපකප්පනා ච දිට්ඨිපකප්පනා ච –පෙ– අයං දිට්ඨිපකප්පනා. **භවාභවෙසූති** – භවාභවෙ කම්මභවෙ පුනබ්භවෙ, කාමභවෙ කම්මභවෙ කාමභවෙ පුනබ්භවෙ, රූපභවෙ කම්මභවෙ රූපභවෙ පුනබ්භවෙ, අරූපභවෙ කම්මභවෙ අරූපභවෙ පුනබ්භවෙ පුනප්පුන[4]භවෙ පුනප්පුනගතියා පුනප්පුනඋපපත්තියා පුනප්පුනපටිසන්ධියා පුනප්පුනඅත්තභාවාභිනිබ්බත්තියා; "ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨී භවාභවෙසූ"ති – ධොනස්ස කුහිඤ්චි ලොකෙ භවාභවෙසු ච කප්පිතා අභිසංඛතා සණ්ඨපිතා දිට්ඨි නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති 'ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨී භවාභවෙසු.

1. යාය - සිමු. I. 2. ධොනෙය්‍යෙහි - සිමු. II. ප සා. PTS.
3. පකප්පිතාති - සා. 4. පුනප්පුනං - සා., ස.

ඒ ප්‍රඥාවෙන් කායදුශ්චරිතය කම්පිත වූයේත් ධොවිත =ශෝධනා ලදුයේත් සන්ධොවිත නිද්ධොවිත වූයේත් වේ ද, වාග්දුශ්චරිතය - මනොදුශ්චරිතය - රාගය - ද්වේෂය - මොහය - ක්‍රොධය - උපනාහය - මකුබව - පලාස (=යුගග්‍රාහ) ය - ඊර්ෂ්‍යාව - මාත්සර්‍යය - මායාව - ශඨබව - තදබව - සාරම්භ (=කරණුත්තරියකරණ) ය - මානය - අතිමානය - මදය - ප්‍රමාදය ධූත ධෞත සන්ධෞත නිර්ධෞත (=කම්පා කරන ලද සෝදන ලද මැනවින් සෝදන ලද වෙසෙසින් සෝදන ලද) වේ ද, සියලු කෙලශයෝ සියලු දුශ්චරිතයෝ සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ ධූත ධෞත සන්ධෞත නිර්ධෞත වූවාහු වෙත් ද, එ කරුණෙන් ප්‍රඥාව 'ධොනා' නම් වූ යැ. නොහොත් සම්‍යග්දෘෂ්ටිය විසින් මිථ්‍යාදෘෂ්ටිය කම්පිත ධොවිත සන්ධොවිත නිද්ධොවිත වූ යැ, සම්‍යක්සඞ්කල්පය විසින් මිථ්‍යාසඞ්කල්පය...සම්‍යග්වචනයෙන් මිථ්‍යාවචනය...සම්‍යක්කර්මාන්තයෙන් මිථ්‍යාකර්මාන්තය. . .සම්‍යගාජීවයෙන් මිථ්‍යාජීවය. . .සම්‍යග්ව්‍යායාමයෙන් මිථ්‍යාව්‍යායාමය...සම්‍යක්ස්මෘතියෙන් මිථ්‍යාස්මෘතිය...සම්‍යක්සමාධියෙන් මිථ්‍යාසමාධිය. . .සම්‍යග්ඥානයෙන් මිථ්‍යාඥානය. . .සම්‍යග්විමුක්තියෙන් මිථ්‍යාවිමුක්තිය ධූත ධෞත සන්ධෞත නිර්ධෞත වූවාත් වෙයි. නොහොත් ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සියලු කෙලශයෝ - දුශ්චරිතයෝ - දරථයෝ - පරිදාහයෝ - සියලු අකුශලාභිසංස්කාරයෝ ධූත ධෞත සන්ධෞත නිර්ධෞත වූවාහු ද වෙත්. ක්‍ෂීණාශ්‍රව තෙමේ මේ ධොතිය ධර්මයන්ගෙන් යම් හෙයකින් උපෙත - සමුපෙත - උපගත - සමුපගත - උපපන්න - සමුපපන්න - සමන්විත වූයේ වේ ද, එහෙයින් ක්‍ෂීණාශ්‍රව 'ධොන' නම් වෙයි. හෙතෙම ධූතරාග ධූතපාප ධූතකෙලශ ධූතපරිදාහ ඇති වන බැවින් 'ධොන' නම් වේ.

**කුහිඤ්චි** - කිසිතැනෙක්හි කිසිවෙක්හි අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ. **ලොකෙ** - අපායලොකයෙහි. . .ආයතන-ලොකයෙහි. **පකප්පිතා** - තෘෂ්ණාප්‍රකල්පනා යැ දෘෂ්ටිප්‍රකල්පනා යැයි ප්‍රකල්පනා දෙකෙකි. . .**භවාභවෙසු** - භව-අභව (=කාමභව - රූපාරූප-භවයන්හි (2-5.ගාථානිද්දෙසය.)...පුනපුනා ආත්මභාවයාගේ පහළ වීමෙහි; **ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසු**- රහත්හු හට අපායාදිලොකයෙහි ද කාමාදිභවයන්හි ද කල්පිත (=සිතින් ගන්නා ලද) පරිකල්පිත වූ ප්‍රත්‍යයෙන් සකස් කළ ප්‍රත්‍යයවශයෙන් ම මොනොවට තබන ලද දෘෂ්ටීහු නැත, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙති, ප්‍රහීණ වූවාහු සිඳින ලද්දාහු සින්සිඳුණාහු දුර ලන ලද්දාහු උපනට අභව්‍ය වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුසි 'ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ පකප්පිතා දිට්ඨි භවාභවෙසු' යනු වේ.

**මායඤ්ච මානඤ්ච පහාය ධොනොති**- මායා වුච්චති වඤ්චනිකා චරියා; ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය[1] දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදනහෙතු[2] පාපිකං ඉච්ඡං පණිදහති: මා මං ජඤ්ඤූති ඉච්ඡති. මා මං ජඤ්ඤූති සංකප්පෙති. මා මං ජඤ්ඤූති වාචං භාසති. මා මං ජඤ්ඤූති කායෙන පරක්කමති. යා එවරූපා මායා මායාවිතා අච්චයා[3] වඤ්චනා නිකති නිකිරණා[4] පරිහරණා ගූහනා පරිගූහනා ඡාදනා පරිච්ඡාදනා අනුත්තානීකම්මං අනාවීකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා.[a] **මානොති** - එකවිධෙන මානො: යා චිත්තස්ස උන්නති; දුවිධෙන මානො: අත්තුක්කංසන මානො පරවම්භනමානො; තිවිධෙන මානො: සෙය්‍යොහමස්මීති මානො සදිසොහමස්මීති මානො හීනොහමස්මීති මානො; චතුබ්බිධෙන මානො: ලාභෙන මානං ජනෙති, යසෙන මානං ජනෙති, පසංසාය මානං ජනෙති, සුඛෙන මානං ජනෙති; පඤ්චවිධෙන මානො: ලාභි'ම්හි මනාපිකානං රූපානන්ති මානං ජනෙති, ලාභි'ම්හි මනාපිකානං සද්දානං– ගන්ධානං – රසානං – ඵොට්ඨබ්බානන්ති මානං ජනෙති; ඡබ්බිධෙන මානො: චක්ඛුසම්පදාය මානං ජනෙති, සොතසම්පදාය – ඝානසම්පදාය – ජිව්හාසම්පදාය – කායසම්පදාය – මනොසම්පදාය මානං ජනෙති; සත්තවිධෙන මානො: මානො අතිමානො මානාතිමානො ඔමානො අධිමානො අස්මිමානො මිච්ඡාමානො; අට්ඨවිධෙන මානො: ලාභෙන මානං ජනෙති, අලාභෙන ඔමානං ජනෙති, යසෙන මානං ජනෙති, අයසෙන ඔමානං ජනෙති, පසංසාය මානං ජනෙති, නින්දාය ඔමානං ජනෙති, සුඛෙන මානං ජනෙති, දුක්ඛෙන ඔමානං ජනෙති; නවවිධෙන මානො: සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානො, සෙය්‍යස්ස සදිසොහමස්මීති මානො, සෙය්‍යස්ස හීනොහමස්මීති මානො; සදිසස්ස සෙය්‍යොහමස්මීති මානො, සදිසස්ස සදිසොහමස්මීති මානො, සදිසස්ස හීනොහමස්මීති මානො, හීනස්ස සෙය්‍යොහමස්මීති මානො, හීනස්ස සදිසොහමස්මීති මානො, හීනස්ස හීනොහමස්මීති මානො; දසවිධෙන මානො: ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මානො.[a] "මායඤ්ච මානඤ්ච පහාය ධොනො"ති – ධොනො මායඤ්ච මානඤ්ච පහාය පජහිත්වා විනොදෙත්වා ව්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති 'මායඤ්ච මානඤ්ච පහාය ධොනො.'

---

1. වචසා - සයා. 2. තප්පටිච්ඡාදනහෙතු - ස.
3. අච්චසරා - සයා, මජසං. 4 කිරණා - සීමු. I.
[a]. විභඞ්ගපාළි - ඛුද්දකවත්ථුවිභඞ්ග.

**මායං ච මානං ච පහාය ධෝනො**- වඤ්චක ක්‍රියාව (=වඤ්චා කිරීම) 'මායා' නමු. මෙලොවැ ඇතැම් පුද්ගලයෙක් කයින් දුසිරිත් කොට වචනයෙන් දුසිරිත් කොට සිතින් දුසිරිත් කොට එය ප්‍රකාශ නො වනු නිසා ලාමක වූ ප්‍රාර්ථනාව තබයි: 'මා කළ පව මෙරමා නහමක් දනිත්ව' යි කැමැති වෙයි, - සලකයි, - වචන කියයි, 'මා කළ පව නහමක් දනිත්ව'යි කයින් වෑයම් කෙරෙයි; මෙබඳු වූ මායාව මායා ඇති බව අත්‍යය (=ඉක්මැ යැම) වඤ්චනාව නිකෘතිය (=මිථ්‍යාක්‍රියාව) 'මම මෙසේ නො කෙරෙමි' පාපවික්ෂෙපය පාපපරිහරණය පව් සැඟවීම හාත්පසින් සැඟවීම පව් වැසීම හාත්පසින් වැසීම ප්‍රකට නො කිරීම පව් කොට නො පැවසීම මොනොවට වැසීම පෙරළාත් පව් කිරීම 'මායා' නැමැයි කියනු ලැබේ. **මාන** නම්: එක් ප්‍රකාරයකින් මානය වෙයි: චිත්තයාගේ උන්නතිය යි; ආත්මොත්කර්ෂණමාන යැ පරවම්භනමාන යැයි ද්විප්‍රකාරයෙන් මානය වෙයි. 'මම් ශ්‍රෙෂ්ඨ වෙමි' මාන යැ, සදෘශ වෙමි මාන යැ හීන වෙමි මාන යැයි, ත්‍රිප්‍රකාරයෙන් මානය වෙයි. ලාභයෙන් මානය උපදවයි, යශසින් මානය උපදවයි, ප්‍රශංසායෙන් මානය උපදවයි, සුවය කරණ කොට මානය උපදවා යයි සිවුපරිද්දෙකින් මානය වෙයි. 'මනාප වූ රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන් ලබනුයෙම් වෙමි' පඤ්චප්‍රකාරයෙන් මානය වෙයි. චක්ෂුඃසම්පත්තියෙන් මානය උපදවයි, ශ්‍රොත්‍ර - ඝ්‍රාණ - ජිහ්වා - කාය - මනස්සම්පත්තියෙන් මානය උපදවා යැයි සපරිද්දෙකින් මානය වෙයි. මාන යැ අතිමාන යැ මානාතිමාන යැ අවමාන (=හීනමාන) යැ අධිමාන යැ අස්මිමාන යැ මිථ්‍යාමාන යැයි සත් පරිද්දෙකින් මානය වෙයි. ලාභයෙන් මානය උපදවයි, අලාභයෙන් අවමානය උපදවයි, යශසින් මානය - අයශසින් අවමානය - ප්‍රශංසායෙන් මානය - නින්දායෙන් අවමානය - සුවයෙන් මානය - දුකින් අවමානය උපදවා යැයි අෂ්ටප්‍රකාරයෙකින් මානය වෙයි. ශ්‍රෙෂ්ඨයා හට ශ්‍රෙෂ්ඨ වෙමි මාන යැ, ශ්‍රෙෂ්ඨයා හට සදෘශ වෙමි මාන යැ, ශ්‍රෙෂ්ඨයා හට හීන වෙමි මානයැ; සදෘශයා හට ශ්‍රෙෂ්ඨ වෙමි මාන යැ, සදෘශයාහට සදෘශ වෙමි මාන යැ සදෘශයා හට හීන වෙමි මාන යැ; හීනයාට ශ්‍රෙෂ්ඨ වෙමි මාන යැ, හීනයාට සදෘශ වෙමි මාන යැ, හීනයාට හීන වෙමි මාන යැයි නවප්‍රකාරයකින් මානය වේ. මෙලොවැ කිසිවෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයකින් හෝ ශිල්පායතනයකින් හෝ විද්‍යාවකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ එක්තරා වස්තුවකින් හෝ මානය උපදවා යැයි දශප්‍රකාරයකින් මානය වේ. මෙබඳු වූ යම් මානයෙක් මඤ්ඤනාවෙක් මාන ඇතිබවෙක් උන්නතියෙක් ඔසවා තැබීමෙක් මානධ්වජයෙක් සිත ඔසවාගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතායෙක් වේ නම්' මේ 'මාන' නමැයි කියනු ලැබේ. **මායං ච මානං ච පහාය ධෝනො** යනු: ධොත - ක්ෂීණාස්‍රව තෙමේ මායාවත් මානයත් හැර දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අනු-අභාවයට (=සමුච්ඡෙදප්‍රහාණයට) පමුණුවා නුයි 'මායං ච මානං ච පහාය ධොතො' යනු වේ.

**ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සොති** – ‘උපයා’ති ද්වෙ උපයා: තණ්හාඋපයො ච දිට්ඨිඋපයො ච –පෙ– අයං තණ්හූපයො –පෙ– අයං දිට්ඨූපයො. තස්ස තණ්හූපයො පහීනො, දිට්ඨූපයො පටිනිස්සට්ඨො. තණ්හූපයස්ස පහීනත්තා දිට්ඨූපයස්ස පටිනිස්සට්ඨත්තා අනූපයො පුග්ගලො කෙන රාගෙන ගච්ඡෙය්‍ය? කෙන දොසෙන ගච්ඡෙය්‍ය? කෙන මොහෙන ගච්ඡෙය්‍ය? කෙන මානෙන ගච්ඡෙය්‍ය? කාය දිට්ඨියා ගච්ඡෙය්‍ය? කෙන උද්ධච්චෙන ගච්ඡෙය්‍ය? කාය විචිකිච්ඡාය ගච්ඡෙය්‍ය? කෙහි අනුසයෙහි ගච්ඡෙය්‍ය? රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති[1] වා ථාමගතොති වා? තෙ අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා[2] කෙන ගච්ඡෙය්‍ය නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා, සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි, යෙන ගච්ඡෙය්‍යාති ‘ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො.’

තෙනාහ භගවා:

“ධොනස්ස හි නත්ථි කුහිඤ්චි ලොකෙ
පකප්පිතා දිට්ඨි භවාභවෙසු,
මායඤ්ච මානඤ්ච පහාය ධොනො
ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො”ති.

3 - 8

උපයො හි ධම්මෙසු උපෙති වාදං
අනූපයං කෙන කථං වදෙය්‍ය,
අත්තං නිරත්තං න හි තස්ස අත්ථි
අධොසි සො දිට්ඨිමිධෙව සබ්බං[3].

**උපයො හි ධම්මෙසු උපෙති වාදන්ති** – ‘උපයො’ති ද්වෙ උපයා: තණ්හූපයො ච දිට්ඨූපයො ච –පෙ– අයං තණ්හූපයො –පෙ– අයං දිට්ඨූපයො. තස්ස තණ්හූපයො අප්පහීනො, දිට්ඨූපයො අප්පටිනිස්සට්ඨො. තණ්හූපයස්ස අප්පහීනත්තා දිට්ඨූපයස්ස අප්පටිනිස්සට්ඨත්තා ධම්මෙසු වාදං උපෙති: රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති වා ථාමගතොති වා, තෙ අභිසඞ්ඛාරා අප්පහීනා. අභිසඞ්ඛාරානං අප්පහීනත්තා ගතියා වාදං උපෙති: නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා වාදං උපෙති උපගච්ඡති ගණ්හාති පරාමසති අභිනිවිසතීති ‘උපයො හි ධම්මෙසු උපෙති වාදං.’

1. අනිට්ඨගතො - මජසං. 2. ගතියා පරං - සීමු.I. ගතියො - සීමු. II.
3. සබ්බා - සීමු I, ස.

**ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො** – 'උපය' යනු: තෘෂ්ණා උපය දෘෂ්ටි උපය යැයි 'උපය' දෙකෙක් වෙයි.. ඔහු විසින් තෘෂ්ණෝපය ප්‍රහීණ යැ. දෘෂ්ටිඋපය දුර ලන ලද්දේ යැ. තෘෂ්ණෝපය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිඋපය දුර ලන ලද වන බැවින් උපය රහිත වූ පුද්ගල තෙමේ කවර රාගයකින් – කවර ද්වේෂයකින් – කවර මෝහයකින් – කවර මානයකින් – කවර දෘෂ්ටියකින් – කවර ඖද්ධත්‍යයෙකින් – කවර විචිකිත්සායෙකින් – කවර අනුශයධර්මයක්හෙන් – රක්ත වූයෙකැයි හෝ දුෂ්ට වූයෙකැයි හෝ මූඪ වූයෙකැයි හෝ විනිබද්ධයෙකැයි හෝ පරාමෘෂ්ටයෙකැයි හෝ වික්ෂෙපයට පැමිණියෙකැයි හෝ නිෂ්ඨාවට නො ගියේ යැයි හෝ ස්ථාම(=තද) බවට ගියේ යැයි හෝ (යමෙකින් නිරයාදි ගතිවිශෙෂයෙහි) සංඛ්‍යාවට යන්නේ ද; ඒ අභිසංස්කාරයෝ ප්‍රහීණයෝ යැ. අභිසංස්කාරයන් ප්‍රහීණ කළ වන බැවින් නිරයෙහි උපදනා සත්ත්වයෙකැයි හෝ තිරිසන්යෝනිහි උපදනෙකැයි හෝ ප්‍රෙතවිෂයයෙහි උපදනෙකැයි හෝ මිනිසෙකැයි හෝ දෙවියෙකැයි හෝ රූපීබ්‍රහ්ම යැයි හෝ සංඥී යැයි හෝ අසංඥී යැයි හෝ නෛවසංඥීනාසංඥී යැයි හෝ කවර අභිසංස්කාරයෙකින් කවර ගතියක් හා සංඛ්‍යාවට යන්නේ ද; යම් හෙයකින් යේ නම්, ඒ හෙතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණය නැත් නුයි 'ස කෙන ගච්ඡෙය්‍ය අනූපයො සො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ධොනස්ස හි නත්ථි–පෙ–අනූපයො සො" යනු.

**3 – 8.**

තෘෂ්ණාදි උපය (=නිඃශ්‍රය) ඇති සත්ත්ව තෙමේ රාගරක්ත යැ යනාදි ඒ ඒ දහම්හි ලා වාදයට (=කියැ යුතු බවට) පැමිණෙයි. තෘෂ්ණාදෘෂ්ටි පුහුත් බැවින් උපය රහිත වූ ක්ෂීණාස්‍රවයා රාගාදි කවර දහමකින් කිසෙයින් කියන්නේ ද, යම්හෙයකින් ඒ ක්ෂීණාස්‍රවයානට ආත්මදෘෂ්ටිය හෝ උච්ඡෙදදෘෂ්ටිය නැත්තේ ද, යම් හෙයකින් හෙතෙම මේ අත්බැව්හි මැ නුවණ නැමැති දියෙන් සියලු දෘෂ්ටිගතය දෙවී ද, දුරැ කෙළේ ද, එහෙයිනි.

**උපයො හි ධම්මෙසු උපෙති වාදං** – 'උපය' යනු: තෘෂ්ණෝපය ද දෘෂ්ටිඋපය දැයි උපය දෙකෙක් වෙයි. ...ඔහු විසින් තෘෂ්ණෝපය අප්‍රහීණ යැ, දෘෂ්ටිඋපය නො හරන ලද්දේ යැ; තණ්හූපය නො පුහුත් වන බැවින් දිට්ඨූපය නො හළ වන බැවින් රක්ත යැයි හෝ දුෂ්ට යැ – මූඪ යැ – විනිබද්ධ යැ – පරාමෘෂ්ට යැ – වික්ෂෙපගත යැ – අනිෂ්ඨාගත යැ – ස්ථාමගත යැයි හෝ වාදයට (=කියැයුතු බවට) පැමිණෙයි. ඒ පුණ්‍යාපුණ්‍යානෙඤ්ජාභිසංස්කාරයෝ අප්‍රහීණ වූවාහු ය. කර්මාභිසංස්කාරයන් අප්‍රහීණ වන බැවින් එක්තරා ගතියකින් කීමට පැමිණෙයි, නිරයෙහි උපදිනුයෙකැයි හෝ තිරශ්චීනයෝනි ඇතියෙකැයි හෝ ප්‍රෙතවිෂයයෙහි උපදිනුයෙකැයි හෝ මිනිසෙකැයි හෝ දෙවියෙකැයි හෝ රූපී යැයි හෝ අරූපී යැයි හෝ සංඥී යැයි හෝ අසංඥී යැයි හෝ නෛවසංඥීනාසංඥී යැයි හෝ (එක්තරා ගතියකින්) කථනයට පැමිණෙයි, එළැඹෙයි, ග්‍රහණය කෙරෙයි, පරාමර්ශ කෙරෙයි, පිවිසේ නුයි 'උපයො හි ධම්මෙසු උපෙති වාදං' යනු වේ.

**අනූපයං කෙන කථං වදෙය්‍යාති** – 'උපයා'ති ද්වෙ උපයා: තණ්හූපයො ච දිට්ඨූපයො ච –පෙ– අයං තණ්හූපයො –පෙ– අයං දිට්ඨූපයො. තස්ස තණ්හූපයො පහීනො දිට්ඨූපයො පටිනිස්සට්ඨො. තණ්හූපයස්ස පහීනත්තා දිට්ඨූපයස්ස පටිනිස්සට්ඨත්තා අනූපයං පුග්ගලං කෙන රාගෙන වදෙය්‍ය? කෙන දොසෙන වදෙය්‍ය? කෙන මොහෙන වදෙය්‍ය? කෙන මානෙන වදෙය්‍ය? කාය දිට්ඨියා වදෙය්‍ය? කෙන උද්ධච්චෙන වදෙය්‍ය? කාය විචිකිච්ඡාය වදෙය්‍ය? කෙහි අනුසයෙහි වදෙය්‍ය රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති[1] වා ථාමගතොති වා? තෙ අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා[2] කෙන වදෙය්‍ය නෙරයිකොති වා –පෙ– නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා? සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි, යෙන[3] වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපයෙය්‍ය වොහරෙය්‍යාති 'අනූපයං කෙන කථං වදෙය්‍ය.'

**අත්තං නිරත්තං න හි තස්ස අත්ථීති** – 'අත්තා'ති සස්සතදිට්ඨි[4] නත්ථි; **නිරත්තාති** උච්ඡෙද දිට්ඨි නත්ථි අත්තාති ගහිතං නත්ථි නිරත්තාති මුඤ්චිතබ්බං නත්ථි. යස්සත්ථි ගහිතං, තස්සත්ථි මුඤ්චිතබ්බං; යස්සත්ථි මුඤ්චිතබ්බං, තස්සත්ථි ගහිතං; ගහණ[5]මුඤ්චනා සමතික්කන්තො[6] අරහා වුද්ධිපරිහානිවීතිවත්තො. සො වුත්ථවාසො චිණ්ණචරණො ගතද්ධො ගතදිසො. ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති 'අත්තං නිරත්තං න හි තස්ස අත්ථි.'

**අධොසි සො දිට්ඨිමිධෙව සබ්බන්ති** – තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි. සො සබ්බං දිට්ඨිගතං ඉධෙව අධොසි ධූනි[7] සන්ධූනි නිද්ධූනි පජහි විනොදෙසි ව්‍යන්තිං අකාසි අනභාවං ගමෙසීති 'අධොසි සො දිට්ඨිමිධෙව සබ්බ'න්ති.

තෙනාහ භගවා:

"උපයො හි ධම්මෙසු උපෙති වාදං
අනූපයං කෙන කථං වදෙය්‍ය,
අත්තං නිරත්තං න හි තස්ස අත්ථි
අධොසි සො දිට්ඨිමිධෙව සබ්බ"න්ති.

**දුට්ඨට්ඨකසුත්තනිද්දෙසො තතියො.**

---

1. අභිට්ඨංගතො - මනුප. 2. ගතියා පරං - සීමු. I. ගතියො - සීමු. II.
3. කෙන - සීමු. I. 4. අත්තානු දිට්ඨි - මු. I. මජසං. 5. ගහණං - සීමු I. මජසං.
6. සමතික්කමන්තො - මනුප. 7. දිට්ඨි ධූනි - සීමු. I.

**අනූපයං කේන කථං වදෙය්‍ය** – ‘උපය’ යනු: තණ්හූපය ද දිට්ඨූපය දැයි ‘උපය’ දෙකෙකි. . . .ඔහු විසින් තණ්හූපය ප්‍රහීණ යැ. දිට්ඨූපය දුරලන ලද්දේ යැ. තණ්හූපය ප්‍රහීණ වන බැවින් දිට්ඨූපය දුරලන ලද වන බැවින් උපය රහිත වූ පුද්ගලයා කවර රාගයක් හෙතු කොට ගෙන කියන්නේ ද? කවර ද්වේෂයකින් – මෝහයකින් – මානයකින් – දෘෂ්ටියෙකින් ඖද්ධත්‍යයෙකින් – විචිකිත්සාවකින් – කවර අනුශයධර්මයකින් රක්ත යැ යි හෝ දුෂ්ට යැ – මූඪ යැ – විනිබද්ධ යැ – පරාමෘෂ්ට යැ – වික්ෂෙපගත යැ – අනිෂ්ඨාගත යැ – ස්ථාමගත යැ යි හෝ කියන්නේ ද? ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයෝ යැ පුණ්‍යාදි අභිසංස්කාරයන් ප්‍රහීණ වන බැවින් කවර රාගාදිකෙලශයක් හෙතු කොට ගෙන නෙරිසන් වන්නේ යැ යි හෝ...නෙවසංඥිනාසංඥී යැයි හෝ එක්තරා ගතියෙකින් කියන්නේ ද; යම් හෙයකින් කියන්නේ නම් බණන්නේ නම් දක්වන්නේ නම් වහරන්නේ නම්, ඒ හෙතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණය නැත් නු යි ‘අනූපයං කේන කථං වදෙය්‍ය’ යනු වේ.

**අත්තං නිරත්තං න හි තස්ස අත්ථි** – ‘අත්තා’ යී ශාශ්වතදෘෂ්ටිය නැත, ‘නිරත්තා’ යී උච්ඡෙදදෘෂ්ටිය නැති. ආත්ම යැයි ගන්නා ලද්දෙක් නැත, නිරාත්ම යැයි හල යුත්තෙක් නැති. යමක් හට ‘මම යැ මා ගේ යැයි ගන්නා ලද්දෙක් ඇත් නම්, ඔහුට හල යුත්තෙක් ඇති; යමක් හට හල යුත්තෙක් ඇත් නම්, ඔහුට ගන්නා ලද්දෙක් ඇති. ග්‍රහණමුඤ්චන ඉක්මවා සිටි රහත්හු වෘද්ධිපරිහාණි ඉක්මැවූහ. ඒ රහත්හු දශවිධ අංයසීවාසයෙහි වැසූ නිමවූහ. ශීලය සමග අටසමවත්හි චීර්ණවශීහ. සසරඅදත්මග ඉක්මැවූහ. සිහිනෙහි පවා නොගියවිරූ නිවන්දසාවට ගියහ. ජාතිමරණසංසාර සඞ්ඛ්‍යාත පුනර්භවය ඔවුනට නැත් නු යි ‘අත්තං නිරත්තං න හි තස්ස අත්ථි’ යනු වේ.

**අධොසි සො දිට්ඨිමිධෙව සබ්බං** – ඔහු විසින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ ප්‍රහාණ කරන ලදහ, මුල් සිඳින ලදහ, සත්හිඳුවන ලදහ, අභව්‍යොත්පත්ති කරන ලදහ, නුවණගින්නෙන් දවන ලදහ. ඒ රහතුන් වහන්සේ සියලු දෘෂ්ටිගතය මෙ අත්බැව්හි මැ හලහ... විගතානත්ත කළහ, අන්‍ධභාවයට පැමිණැවූහු නු යි ‘අධොසි සො දිට්ඨිමිධෙව සබ්බං’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“උපයො හි ධම්මෙසු–පෙ–දිට්ඨිමිධෙව සබ්බං” යනු.

**තුන්වැනි දුට්ඨට්ඨක සූත්‍රනිද්දේශය යි,**

# 4

# සුද්ධට්ඨකසුත්තනිද්දෙසො

අථ සුද්ධට්ඨකසුත්තනිද්දෙසො වුච්චති*

## 4 - 1

පස්සාමි සුද්ධං පරමං අරොගං
දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති,
එවාභිජානං[1] පරමන්ති ඤත්වා
සුද්ධානුපස්සී පච්චෙති ඤාණං.

**පස්සාමි සුද්ධං පරමං අරොගන්ති** – 'පස්සාමි සුද්ධ'න්ති පස්සාමි සුද්ධං, දක්ඛාමි සුද්ධං, ඔලොකෙමි සුද්ධං, නිජ්ඣායාමි සුද්ධං, උපපරික්ඛාමි සුද්ධං; **පරමං අරොගන්ති** – පරමං ආරොග්‍යප්පත්තං[2] ඛෙමප්පත්තං තාණප්පත්තං ලෙනප්පත්තං සරණප්පත්තං අභයප්පත්තං අච්චුතප්පත්තං නිබ්බානප්පත්තන්ති 'පස්සාමි සුද්ධං පරමං අරොගං.'

**දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොතීති** – චක්ඛුවිඤ්ඤාණෙන[3] රූපදස්සනෙන නරස්ස සුද්ධි විසුද්ධි පරිසුද්ධි මුත්ති විමුත්ති පරිමුත්ති හොති; නරො සුජ්ඣති විසුජ්ඣති පරිසුජ්ඣති මුච්චති විමුච්චති පරිමුච්චතීති 'දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති.'

**එවාභිජානං පරමන්ති ඤත්වාති** – එවං අභිජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො ඉදං පරමං අග්ගං[4] සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති 'එවාභිජානං පරමන්ති ඤත්වා.'

**සුද්ධානුපස්සී පච්චෙති ඤාණන්ති** – යො සුද්ධං පස්සති, සො සුද්ධානුපස්සී; **පච්චෙති ඤාණන්ති** – චක්ඛුවිඤ්ඤාණං රූපදස්සනෙන ඤාණන්ති පච්චෙති, මග්ගොති පච්චෙති, පථොති පච්චෙති, නිය්‍යානන්ති[5] පච්චෙතීති 'සුද්ධානුපස්සී පච්චෙති ඤාණ'න්ති.
තෙනාහ භගවා:

"පස්සාමි සුද්ධං පරමං අරොගං
දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති,
එවාභිජානං පරමන්ති ඤත්වා
සුද්ධානුපස්සී පච්චෙති ඤාණ"න්ති.

---

*. න දිස්සතෙ'යං පාඨො කෙසුචි පොත්ථකෙසු. 1. එතාභිජානං - සු.
2. අරොගප්පත්තං - මජසං 3. චක්ඛුවිඤ්ඤාණං - සීමු.I.
4. තං අග්ගං - සීමු.II. 5. නීයානන්ති - PTS.

# 4

# සුද්ධට්ඨකසූත්‍රනිද්දේශය

ඉක්බිති සුද්ධට්ඨකසූත්‍රනිද්දේශය කියනු ලැබේ.

## 4 – 1.

දෘෂ්ටිගතික බාල තෙමේ කෙලෙස්කිලුටින් අශුද්ධ වූ කෙලෙස් රොගින් සරොග වූවකු දක ශුද්ධ වූ උත්තම නිර්‍වාණයට පැමිණි සිටියක්හු දකිමි යැයි ද, ඒ දෘෂ්ටිසඞ්ඛ්‍යාත දර්‍ශනයෙන් මිනිසාගේ සංශුද්ධිය වේ යයි ද, මෙසේ වෙසෙසින් දන්නේ ඒ දර්‍ශනය පරම යයි සලකා ඒ දර්‍ශනයෙහි ශුද්ධිය දක්නාසුලු වූයේ ඒ දර්‍ශනය මාර්‍ගඥාන යයි හදහයි. (එතෙකුදු වුවත් එය මාර්‍ගඥානය නො වේ.)

**පස්සාමි සුද්ධං පරමං අරොගං** – ‘පස්සාමි සුද්ධං’ යනු: ශුද්ධ වූවකු බලමි, ශුද්ධ වූවකු දක්මි, අවලොකන කෙරෙමි, සිතමි, ශුද්ධ වූවකු විමසමි. **පරමං අරොගං** – උත්තම වූ ආරොග්‍යයට පැමිණියක්හු ක්‍ෂෙමයට පැමිණියක්හු ත්‍රාණ(-පාලන)යට පැමිණියක්හු ආරක්‍ෂාවට – පිහිටට – නිඃශ්‍රීයට – අවලම්බයට – අමෘතයට – නිර්‍වාණයට පැමිණියක්හු නුයි ‘පස්සාමි සුද්ධං පරමං අරොගං’ යනු වේ.

**දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති** – චක්‍ෂුර්විඥානයෙන් රූපදර්‍ශනය හෙතු කොට ගෙන සත්ත්වයාගේ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වෙයි, සත්ත්ව තෙමේ ශුද්ධ විශුද්ධ පරිශුද්ධ මුක්ත විමුක්ත පරිමුක්ත වේ යයි ‘දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති’ යනු වේ.

**එවාභිජානං පරමන්ති ඤත්වා** – මෙසේ වෙසෙසින් දන්නේ එකාන්තයෙන් දන්නේ විවිධාකාරයෙන් දන්නේ ඒ ඒ කරුණෙන් විවිධාකාරයෙන් දන්නේ ප්‍රතිවෙධ කරන්නේ මෙය පරම යැ සෙට යැ දෙටු යැ පාමොක් යැ උතුම් යැ පවර යැයි සලකා දැන තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට නුයි ‘එවාභිජානං පරමන්ති ඤත්වා’ යනු වේ.

**සුද්ධානුපස්සී පච්චෙති ඤාණං** – යමෙක් ශුද්ධ යයි දකී නම්, හේ ශුද්ධානුදර්‍ශී යැ; **පච්චෙති ඤාණං** – රූපදර්‍ශනය හෙතු කොට ගෙන චක්‍ෂුර්-විඥානය ඥානය යි හදහයි, මාර්‍ගය යි හදහයි, පථය යි හදහයි, නිර්‍යාණය යි හදහා නුයි – ‘සුද්ධානුපස්සී පච්චෙති ඤාණං’ යනු වේ. එහින් වදාළහ බුදුහු:

“පස්සාමි සුද්ධං -පෙ- පච්චෙති ඤාණං” යි.

## 4 - 2

දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති
ඤාණෙන වා සො පජහාති දුක්ඛං,
අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො
දිට්ඨී හි නං පාව තථා වදානං.

**දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොතීති** – චක්ඛුවිඤ්ඤාණෙන[1] රූපදස්සනෙන චෙ නරස්ස සුද්ධි විසුද්ධි පරිසුද්ධි මුත්ති විමුත්ති පරිමුත්ති හොති, නරො සුජ්ඣති විසුජ්ඣති පරිසුජ්ඣති, මුච්චති විමුච්චති පරිමුච්චතීති 'දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති.'

**ඤාණෙන වා සො පජහාති දුක්ඛන්ති** – චක්ඛුවිඤ්ඤාණෙන[1] රූපදස්සනෙන චෙ නරො ජාතිදුක්ඛං පජහාති,[2] ජරාදුක්ඛං පජහාති, ව්‍යාධිදුක්ඛං පජහාති, මරණදුක්ඛං පජහාති, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසදුක්ඛං පජහාතීති 'ඤාණෙන වා සො පජහාති දුක්ඛං.'

**අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකොති** – අඤ්ඤෙන අසුද්ධි මග්ගෙන මිච්ඡාපටිපදාය අනිය්‍යානිකපථෙන අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා[3] නරො සුජ්ඣති විසුජ්ඣති පරිසුජ්ඣති මුච්චති විමුච්චති පරිමුච්චති; **සොපධීකොති** – සරාගො සදොසො සමොහො සමානො සතණ්හො සදිට්ඨි සකිලෙසො සඋපාදානොති 'අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො.'

**දිට්ඨී හි නං පාව තථා වදානන්ති** – සා ච දිට්ඨි තං පුග්ගලං පාවදති: 'ඉති ච යං පුග්ගලො මිච්ඡාදිට්ඨිකො විපරීතදස්සනො'ති; **තථා වදානන්ති** - තථා වදන්තං කථෙන්තං භණන්තං දීපයන්තං වොහරන්තං, 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති තථා වදන්තං කථෙන්තං භණන්තං දීපයන්තං වොහරන්තං, 'අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති තථා වදන්තං කථෙන්තං භණන්තං දීපයන්තං වොහරන්තන්ති 'දිට්ඨී හි නං පාව තථාවදානං.'

තෙනාහ භගවා:

"දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති
ඤාණෙන වා සො පජහාති දුක්ඛං,
අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො
දිට්ඨී හි නං පාව තථා වදාන"න්ති.

---

1. චක්ඛුවිඤ්ඤාණං - සීමු I. මජ්ස.  2. පජහති - සීමු. II.
3. අට්ඨඞ්ගිකාමග්ගෙන - ස්‍යා.

**4 – 2.**

ඒ රූපදර්ශන සඞ්ඛ්‍යාත වූ දර්ශනය හේතු කොට ගෙන ඉදින් සත්ත්වයාගේ ශුද්ධිය වේ නම්, නොහොත් ඒ චක්ෂුර්විඥාන සඞ්ඛ්‍යාත ඥානයෙන් හෙතෙම ජාත්‍යාදි දුක දුරු කෙරේ නම්, එකල්හි ආර්‍යමාර්ගයෙන් අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙකින් කාමාදි උපධි සහිත වූයේ මැ හෙතෙම ශුද්ධ වේ යයි කිය යුතු බවට පැමිණෙයි; යම් හෙයකින් දෘෂ්ටි තොමෝ එසේ කියන්නා වූ ඔහු 'මේ තෙමේ මිසදිටුවෙකැ'යි පවසා ද, එහෙයිනි.

**දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස හොති** – චක්ෂුර්විඥානයෙන් රූප දැකීමෙන් ඉදින් සත්ත්වයාගේ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වේ නම්, සත්ත්ව තෙමේ ශුද්ධ විශුද්ධ පරිශුද්ධ මුක්ත විමුක්ත පරිමුක්ත වේ නම් යි 'දිට්ඨෙන. චෙ සුද්ධි නරස්ස හොති' යනු වේ.

**අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො** – අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් මිථ්‍යාප්‍රතිපදායෙන් අනෛර්‍යාණිකමාර්ගයෙන් සතිපට්ඨානයන්ගෙන් වෙන් වැ සම්‍යක්ප්‍රධානයන්ගෙන් වෙන් වැ ඍද්ධිපාදයන්ගෙන් වෙන් වැ ඉන්ද්‍රියයන්ගෙන් වෙන් වැ බලයන්ගෙන් වෙන් වැ බොධ්‍යඞ්ගයන්ගෙන් වෙන් වැ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් වෙන් වැ ශුද්ධ විශුද්ධ පරිශුද්ධ වූයේ වෙයි, මුක්ත විමුක්ත පරිමුක්ත වූයේ වේ. **සොපධීකො** – සරාග වූයේ සද්වේෂ වූයේ සමොහ වූයේ තෘෂ්ණා සහිත වූයේ දෘෂ්ටි සහිත වූයේ කෙලශ සහිත වූයේ උපාදාන සහිත වූයේ නුයි 'අඤ්ඤෙන සො සුජ්ඣති සොපධීකො' යනු වේ.

**ඤාණෙන වා සො පජහාති දුක්ඛං** – චක්ෂුර්විඥානයෙන් රූප දැකීමෙන් ඉදින් සත්ත්ව තෙමේ ජාතිදුක දුරු කෙරේ නම්, ජරාදුක – ව්‍යාධිදුක – මරණදුක – සොකපරිදෙවදුක්ඛදෞමනස්සුපායාස දුක දුරු කෙරේ නම් යි 'ඤාණෙන වා සො පජහාති දුක්ඛං' යනු වේ.

**දිට්ඨී හි නං පාව තථා වදානං** – තවද ඒ දෘෂ්ටි තොමෝ ඒ පුග්ලා 'මෙසේත් මේ පුද්ගල තෙමේ මිථ්‍යාදෘෂ්ටි ඇත්තෙක, විපරීත දර්ශන ඇත්තෙකැ' යි ප්‍රකාශ කෙරෙයි. **තථා වදානං** – එසේ පවසන කියන බණන දක්වන බැවහර කරනුවහු, 'ලොකය ශාශ්වත යැ, මේ මැ සැබව, අන්‍යදෘෂ්ටිය හිස් යැ' යි එසේ පවසන්නහු...බැවහර කරනුවහු, ලොකය අශාශ්වත යැ, ලොකය අන්තවත් යැ, ලොකය අනන්තවත් යැ, යමක් ජීවය ද එය ම ශරීර යැ, ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ, සත්ත්ව තෙමේ මරණින් මතු උපදනේ වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු නූපදනේ වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු උපදනේත් නො ද උපදනේත් වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ උපදනේ වෙයි, නූපදනේත් නොවෙයි, මෙ මැ සැබව අන්‍යය තුච්ඡ යැ'යි එසේ පවසනුවහු කියනුවහු බණන්නහු දක්වනුවහු බැවහර කරනුවහු යි 'දිට්ඨී හි නං පාව තථාවදානං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"දිට්ඨෙන චෙ සුද්ධි -පෙ-තථා වදානං" යි.

## 4 - 8

න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ
දිට්ඨෙ සුතෙ සීලවතෙ[1] මුතෙ වා,
පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො
අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වාති** – නා’ති පටික්ඛෙපො; **බ්‍රාහ්මණොති** සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො: සක්කායදිට්ඨි බාහිතා හොති, විචිකිච්ඡා බාහිතා හොති, සීලබ්බතපරාමාසො බාහිතො හොති, රාගො බාහිතො හොති, දොසො බාහිතො හොති, මොහො බාහිතො හොති, මානො බාහිතො හොති, බාහිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

1. “බාහෙත්වා සබ්බපාපකානි (සභියාති භගවා)
විමලො සාධු සමාහිතො ඨිතත්තො,
සංසාරමතිච්ච කෙවලී සො
අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා”.[a]

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහාති** – බ්‍රාහ්මණො අඤ්ඤත අසුද්ධිමග්ගෙන මිච්ඡාපටිපදාය අනිය්‍යානිකපථෙන අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ න කථෙති න භණති න දීපයති න වොහරතීති ‘න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ.’

**දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වාති** – සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨසුද්ධිකා.[2] තෙ එකච්චානං රූපානං දස්සනං මඞ්ගලං පච්චෙන්ති. එකච්චානං රූපානං දස්සනං අමඞ්ගලං පච්චෙන්ති.

කතමෙසං රූපානං දස්සනං මඞ්ගලං පච්චෙන්ති? තෙ කාලතො වුට්ඨහිත්වා අභිමඞ්ගලගතානි රූපානි පස්සන්ති: වටක[3]සකුණං පස්සන්ති. ඵුස්සවෙළුවලට්ඨිං[4] පස්සන්ති. ගබ්භිනිත්ථිං පස්සන්ති කුමාරකං ඛන්ධෙ ආරොපෙත්වා ගච්ඡන්තං පස්සන්ති. පුණ්ණඝටං පස්සන්ති. රොහිතමච්ඡං පස්සන්ති. ආජඤ්ඤං පස්සන්ති. ආජඤ්ඤරථං පස්සන්ති. උසභං පස්සන්ති. ගොකපිලං පස්සන්ති. එවරූපානං රූපානං දස්සනං මඞ්ගලං පච්චෙන්ති.

කතමෙසං රූපානං දස්සනං අමඞ්ගලං පච්චෙන්ති? පලාලපුඤ්ජං පස්සන්ති. තක්කඝටං පස්සන්ති. රිත්තඝටං පස්සන්ති. නටං පස්සන්ති. නග්ගසමණං පස්සන්ති. ඛරං පස්සන්ති. ඛරයානං පස්සන්ති. එකයුත්තයානං පස්සන්ති. කාණං පස්සන්ති. කුණිං පස්සන්ති. ඛඤ්ජං පස්සන්ති. පක්ඛහතං පස්සන්ති. ජිණ්ණකං පස්සන්ති. බ්‍යාධිතං[5] පස්සන්ති. මතං පස්සන්ති. එවරූපානං රූපානං දස්සනං අමඞ්ගලං පච්චෙන්ති.

ඉමෙ තෙ[6] සමණබ්‍රාහ්මණා දිට්ඨසුද්ධිකා.[2] තෙ දිට්ඨෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති

1. සීලබ්බතෙ – සීමු. I 2. දිට්ඨි සුද්ධිකා – සීමු. I, ස., මජසං.
3. වාත – ස්‍යා., වාතක සීමු I. 4. වෙළුවලට්ඨං – ස්‍යා., මජසං.
5. බ්‍යාධිකං – සීමු. I, ස්‍යා. මජසං. 6. ඉමෙච්චෙත – ස්‍යා., මජසං.
a. සුත්තනිපාත – සභියසුත්ත.

## 4 – 8.

ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමේ ආර්‍යමාර්ගඥානයෙන් අන්‍ය වූ අභිමඞ්ගල-සම්මතරූපසඞ්ඛ්‍යාත රූපායතනයෙහි ද, එබඳු මැ වූ ශබ්දායතනයෙහි ද, අව්‍යතික්‍රමසඞ්ඛ්‍යාත ශීලය හා (හස්තිව්‍රතාදි) වූ ව්‍රතයෙහි ද, ගන්ධ රස ස්ප්‍රෂ්ට-ව්‍යායතනයෙහි ද උපන් මිථ්‍යාඥානයෙන් ශුද්ධිය වේ යයි නො කියයි. යම් හෙයකින් හෙතෙම ත්‍රෛධාතුක පුණ්‍යයෙහිත් සියලු පාපයෙහිත් නො ඇලුණේ වේ ද, එහෙයින් ආත්මදෘෂ්ටිය ප්‍රහීණ කෙළේ වේ ත්‍රෛධාතුක ලොකයෙහි පුණ්‍යාභිසංස්කාරාදිය නො කරනුයේ වේ.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා** – 'න' යනු: ප්‍රතික්ෂෙප යැ; **බ්‍රාහ්මණො** – සප්තධර්ම් කෙනකුත් දුරු කළ වන බැවින් බ්‍රාහ්මණ යැ: සත්කායදෘෂ්ටිය (ප්‍රහීණ) කරන ලද්දී වෙයි, විචිකිත්සාව – ශීලව්‍රතපරාමර්ශය – රාගය – ද්වේෂය – මෝහය – මානය ප්‍රහීණ කරන ලදුයේ වෙයි, ඔහු විසින් සංක්ලෙශික වූ පුනර්භවය ඇති කරන්නාවූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මතුයෙහි ජාතිජරාමරණයට හෙතු වූ ලාමක අකුශලධර්මයෝ ප්‍රහීණ කරන ලද්දාහු වෙත්.

1. ('සභිය' යී අමතා භාග්‍යවත්හු මෙසේ වදාළහ:) සියලු පාපධර්ම – යන් ප්‍රහීණ කොට එහෙයින් ම විගතමල වූ (–ශ්‍රෙෂ්ඨ වූ) මාර්ගඵලසමාධියෙන් මොනොවට සමාහිත වූ ලොකධර්මයන්ගෙන් කම්පිත නො වන හෙයින් ස්ථිතාත්ම වූ සංසාර හෙතු ඉක්මා සිටී නිමවන ලද කෘත්‍ය ඇති හෙයින් කෙවලී වූ ඒ ක්ෂීණාස්‍රව තෙම තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රය නැති හෙයින් 'අසිත' යයි ද, ලොකධර්මයෙන් නිර්විකාර හෙයින් 'තාදී' යයි ද කියනු ලැබේ. හෙතෙම බ්‍රාහ්මණ' නම් වේ.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ** – ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමේ අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් මිථ්‍යාප්‍රතිපදයෙන් අනෛර්‍යාණිකපථයෙන් සති පට්ඨාන – සම්මප්පධාන – ඉද්ධිපාද – ඉන්ද්‍රිය – බල – බොජ්ඣඞ්ග – ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් වෙන් වැ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නො කියයි නො බෙණෙයි නො දක්වයි නො බැවහර කෙරේ හුයි 'න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ' යනු වේ.

**දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා** – දෘෂ්ට(–මඞ්ගලසම්මත රූපායතන) යෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණ බමුණු කෙනෙක් වෙති. ඔහු ඇතැම් රූපයන් දැකීම මඞ්ගල යයි ද ඇතැම් රූපයන් දැකීම අමඞ්ගල යයි ද හඳහති.

කවර රූපයන්ගේ දැකීම 'මඞ්ගල' යයි හඳහති? යත්: ඒ දෘෂ්ට-මාඞ්ගලිකයෝ උදෑසන ම නැඟිසිට අභිමඞ්ගල බවට (වෘද්ධිකාරණයට) ගිය ගේකුරුල්ලකු බලති, පුසනකතින් ගිඳුවන ලද තරුණ බෙලියසක් බලති, ගැබිනිඅඟනක බලති; දරුවකු ඇකයේ හිඳුවා යනුවන්හු බලති, පුන්කලස බලති, රේමසකු බලති, ආජානීය අසකු බලති, ආජානීය අසුන් යෙදූ රියක් බලති, ඍෂභයකු බලති, කබරදෙනක බලත්. මෙබඳු රූපයන් දැකීම මඞ්ගල යයි හඳහත්.

කවර රූපයන්ගේ දැකීම 'අමඞ්ගල' යයි හඳහති? යත්: පිදුරුමිටියක් දකිත් නම්, මෝරුකලයක් – හිස්කලයක් – නළුවකු – නග්නශ්‍රමණයකු – කොටළුවකු – කොටළුරියක් – එක ගවයකු යෙදූ රියක් – කණකු – කොරකු – කුදකු – පිලකු – මහල්ලකු – ලෙඩ වූවකු – මළ එකකු දකිත් නම්, මෙබඳු රූපයන්ගේ දැකීම 'අමඞ්ගල' යයි හඳහත්.

ඒ මෙකී මහණබමුණෝ දෘෂ්ටශුද්ධිකයෝ යැ; ඔහු අභිමඞ්ගලසම්මත රූපයෙන් ශුද්ධිය... පරිමුක්තිය කැමැති වෙත්.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සුතසුද්ධිකා. තෙ එකච්චානං සද්දානං සවණං මඞ්ගලං පච්චෙන්ති. එකච්චානං සද්දානං සවණං අමඞ්ගලං පච්චෙන්ති.

කතමෙසානං සද්දානං සවණං මඞ්ගලං පච්චෙන්ති? තෙ කාලතො වුට්ඨහිත්වා අභිමඞ්ගලගතානි සද්දානි[1] සුණන්ති: වඩ්ඪාති වා, වඩ්ඪමානාති වා, පුණ්ණාති වා, ඵුස්සාති වා, අසොකාති වා, සුමනාති වා, සුනක්ඛත්තාති වා, සුමඞ්ගලාති වා, සිරීති වා, සිරිවඩ්ඪාති වා, එවරූපානං සද්දානං සවණං මඞ්ගලං පච්චෙන්ති.

කතමෙසං සද්දානං සවණං අමඞ්ගලං පච්චෙන්ති? කාණොති වා, කුණීති වා, ඛඤ්ජොති වා, පක්ඛහතොති වා, ජිණ්ණකොති වා, බ්‍යාධිතොති වා, මතොති වා, ඡින්නන්ති වා, භින්නන්ති වා, දඩ්ඪන්ති වා, නට්ඨන්ති වා, නත්ථීති වා, එවරූපානං සද්දානං සවණං අමඞ්ගලං පච්චෙන්ති.

ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා සුතසුද්ධිකා. තෙ සුතෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලසුද්ධිකා. තෙ සීලමත්තෙන සංයමමත්තෙන සංවරමත්තෙන අවීතික්කමමත්තෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

සමණො මණ්ඩිකා[2] පුත්තො එවමාහ: "චතූහි ඛො අහං ථපති[3] ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං. කතමෙහි චතූහි? ඉධ ථපති[4] න කායෙන පාපකං කම්මං කරොති. න පාපිකං වාචං භාසති. න පාපකං සංකප්පං සංකප්පෙති. න පාපකං ආජීවං ආජීවති. ඉමෙහි ඛො අහං ථපති චතූහි ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං"[5][a]. එවමෙව සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලසුද්ධිකා. තෙ සීලමත්තෙන සංයමමත්තෙන සංවරමත්තෙන අවීතික්කමමත්තෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා වතසුද්ධිකා. තෙ හත්ථිවතිකා වා හොන්ති. අස්සවතිකා වා හොන්ති. ගොවතිකා වා හොන්ති. කුක්කුරවතිකා වා හොන්ති. කාකවතිකා වා හොන්ති. වාසුදෙවවතිකා වා හොන්ති. බලදෙවවතිකා වා හොන්ති. පුණ්ණභද්දවතිකා වා හොන්ති. මණිභද්දවතිකා වා හොන්ති. අග්ගිවතිකා වා හොන්ති. නාගවතිකා වා හොන්ති. සුපණ්ණවතිකා වා හොන්ති. යක්ඛවතිකා වා හොන්ති. අසුරවතිකා වා හොන්ති. ගන්ධබ්බවතිකා වා හොන්ති. මහාරාජවතිකා වා හොන්ති. චන්දවතිකා වා හොන්ති. සුරියවතිකා වා හොන්ති. ඉන්දවතිකා වා හොන්ති. බ්‍රහ්මවතිකා වා හොන්ති. දෙවවතිකා වා හොන්ති. දිසාවතිකා වා හොන්ති. ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා වතසුද්ධිකා. තෙ වතෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

---

1. සද්දනං - සිමු I. මජසං. 2. මුණ්ඩිකා - සයා.
3. ගහපති - සිමු. I. මජසං. 4. ගහපති - සිමු. I. 5. අයොජ්ජං - මජසං.
a. මජ්ඣිමනිකාය - සමණ මණ්ඩිකාසුත්ත.

මඞ්ගලසම්මත ශබ්දයෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔහු ඇතැම් ශබ්දයන් ඇසීම 'මඞ්ගල' යයි ද, ඇතැම් ශබ්දයන් ඇසීම 'අමඞ්ගල' යයි ද හදහත්.

කවර ශබ්දයන්ගේ ශ්‍රවණය 'මඞ්ගල' යයි හදහති ? යත්: ඔවුහු උදෑසන මැ නැඟීසිට 'අභිමඞ්ගල' යැයි සම්මත වැ ගිය ශබ්ද අසති: වැඩෙව (=දිනේවා) යැ – වඩ්ඪමාන යැ –පූර්ණ යැ – පුෂ්‍ය යැ – අශෝක යැ – සුමන යැ – සුනක්ඛත්ත යැ – සුමඞ්ගල යැ – ශ්‍රී යැ – ශ්‍රීවර්ධන (–සිරිවඩු) යැ හෝ මෙබඳු වූ ශබ්දයන්ගේ ඇසීම 'මඞ්ගල' යයි කැමැති වෙත්.

කවර ශබ්දයන්ගේ ඇසීම 'අමඞ්ගල' යයි හදහති ? යත්: 'කණා යැ හෝ කොර යැ – කුදු යැ – පිළු යැ – මහලු යැ – ලෙඩ ඇත්තෙ යැ – මළේ යැ – දිරුයෙ යැ – බිඳුණෙ යැ – දැවුණෙ යැ – නටුයෙ යැ – 'නැත'යි හෝ මෙබඳු ශබ්දයන්ගේ ශ්‍රවණය 'අමඞ්ගල' යයි හදහති.

ඒ මෙකී මහණබමුණෝ ශ්‍රැතශුද්ධිකයෝ යැ. ඔහු ශ්‍රැත (=අභිමඞ්ගල-සම්මත ශබ්ද) යෙන් ශුද්ධිය...පරිමුක්තිය කැමැති වෙත්.

ශීලයෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔහු ශීලමාත්‍රයෙන් සංයමමාත්‍රයෙන් (=ඉඳුරන් දැමීම් පමණෙකින්) තුන්දොර වැසීම් පමණෙකින් ව්‍යතික්‍රම නො කිරීම් පමණෙකින් ශුද්ධිය ...පරිමුක්තිය කැමැති වෙත්.

මණ්ඩිකාපුත්‍ර වූ ශ්‍රමණ තෙමේ මෙසේ කියයි: "ස්ථපතිය, (=වඩුව,) මම් සතර ධර්මයෙකින් සමන්විත වූ පුරුෂයක්හු පරිපූර්ණ වූ කුසල් ඇතියකු පරමකුසල් ඇත්තකු උත්තම වූ අභිතාවයට (=පැමිණිය යුත්තට) පැමිණියකු නො පරදවාලියැ හැකි මහණකු කොට පනවමි. කවර සතරකිනැ ? යත්: ස්ථපතිය, මෙලොවැ යමෙක් කයින් පව්කම් නො කෙරේ ද, ලාමක බස් නො බෙණේ ද, පවිටු කල්පනා (–සංකල්ප) නො සිතා ද, ලාමක ආජීවයෙන් ජිවත් නො වේ ද, ස්ථපතිය, මම් මේ සතර දහමින් යුත් පුහුලක්හු පරිපූර්ණ වූ සිල් ඇතියක්හු...නො පරදවාලියැ හැකි මහණකු කොට පනවමි". එසෙයින් මැ ශීලයෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔහු සිල්මතුයෙකින් (සිල් පමණෙකින්) සංයමමතුයෙකින් සංවරමතුයෙකින් අව්‍යතික්‍රමමතුයෙකින් ශුද්ධිය... පරිමුක්තිය කැමැති වෙත්.

ව්‍රතසමාදානයෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔහු හස්තිව්‍රත ඇත්තාහු හෝ වෙති, අශ්වව්‍රත ඇත්තාහු – ගොව්‍රත ඇත්තාහු – කුක්කුර (=බලු) ව්‍රත ඇත්තාහු – කාකව්‍රත ඇත්තාහු – වාසුදෙවව්‍රත – බලදෙවව්‍රත – පූර්ණභද්‍රව්‍රත – මණිභද්‍රව්‍රත – අග්නිව්‍රත – නාග-ව්‍රත – ගරුඩව්‍රත – යක්ෂව්‍රත – අසුරව්‍රත – ගාන්ධර්වව්‍රත – මහාරාජව්‍රත – චන්ද්‍රව්‍රත – සූර්‍ය්‍යව්‍රත – ඉන්ද්‍රව්‍රත – බ්‍රහ්මව්‍රත – දෙවව්‍රත ඇත්තාහු හෝ පෙරදිග්ආදියට නමස්කාර කරන දිශාව්‍රත ඇත්තාහු හෝ වෙත්. ඒ මේ මහණබමුණෝ ව්‍රතයෙන් ශුද්ධිය කැමැති වන්නාහු වෙත්. ඔහු ව්‍රතයෙන් ශුද්ධිය...පරි-මුක්තිය කැමැති වෙත්.

සන්තෙකෙ සමණබ්‍රාහ්මණා මුතසුද්ධිකා. තෙ කාලතො වුට්ඨහිත්වා පථවිං ආමසන්ති. හරිතං ආමසන්ති. ගොමයං ආමසන්ති. කච්ඡපං ආමසන්ති. ඵාලං[1] අක්කමන්ති[2]. තිලවාහං ආමසන්ති. ඵුස්ස[3]තිලං ඛාදන්ති. ඵුස්ස[3]තෙලං මක්ඛෙන්ති. ඵුස්සදන්තකට්ඨං ඛාදන්ති. ඵුස්සමත්තිකාය නහායන්ති. ඵුස්සසාටකං නිවාසෙන්ති. ඵුස්සවෙඨනං වෙඨෙන්ති. ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා මුතසුද්ධිකා. තෙ මුතෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා**ති – බ්‍රාහ්මණො දිට්ඨසුද්ධියාපි සුද්ධිං නාහ; සුතසුද්ධියාපි සුද්ධිං නාහ; සීලසුද්ධියාපි සුද්ධිං නාහ; වතසුද්ධියාපි සුද්ධිං නාහ; මුතසුද්ධියාපි සුද්ධිං නාහ, න කථෙති, න භණති, න දීපයති, න වොහරතීති ‘න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා.’

**පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො**ති – පුඤ්ඤං වුච්චති යං කිඤ්චි තෙධාතුකං කුසලාභිසඞ්ඛාරං; අපුඤ්ඤං වුච්චති සබ්බං අකුසලං. යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවඞ්ගතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතා පුඤ්ඤෙ ච පාපෙ ච න ලිම්පති න සංලිම්පති, න උපලිම්පති, අලිත්තො අසංලිත්තො[4] අනූපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති ‘පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො.’

**අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො**ති – ‘අත්තඤ්ජහො’ති අත්තදිට්ඨිජහො, අත්තං ජහොති ගාහජහො, අත්තං ජහොති තණ්හාවසෙන දිට්ඨිවසෙන ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං, සබ්බං[5] තං චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං; **නයිධ පකුබ්බමානො**ති – පුඤ්ඤාභිසඞ්ඛාරං[6] වා අපුඤ්ඤාභිසඞ්ඛාරං වා ආනෙඤ්ජාභිසඞ්ඛාරං වා අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානොති ‘අත්තං ජහො නයිධ පකුබ්බමානො.’

තෙනාහ භගවා:

“න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා,
පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො
අත්තංජහො නයිධ පකුබ්බමානො”ති.

## 4 - 4

පුරිමං පහාය අපරං සිතාසෙ
එජානුගා තෙ න තරන්ති සඞ්ගං,
තෙ උග්ගහායන්ති නිරස්සජන්ති
කපීව සාඛං පමුඛ[7]ග්ගහාය.

1. ජාලං - සභා. 2. ඵලං ආමසන්ති. මජසං. 3. පුස්ස - සභා. සීමු. I.
4. අපලිත්තො - මජසං. 5. සබ්බස්ස - සීමු. I.
6. සඞ්ඛාරො - සීමු. I. 7. පමුඤ්ච - සීමු. I.

මුත(=ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය)යෙන් ශුද්ධිය කැමැති වන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති: ඔහු උදෑසන මැ නැඟීසිට මහපොළොව කසිත් ස්පර්ශ කෙරෙති, නොත් තිල්තණ ස්පර්ශ කෙරෙති, අමුගොම ස්පර්ශ කෙරෙති, කසුබුවකු ස්පර්ශ කෙරෙති, සීවැල් ඇක්මෙති, තලරූසක් ස්පර්ශ කෙරෙති, මඞ්ගල සඳහා සකස් කළ (-පුෂ්‍ය) තල අනුභව කෙරෙති, මඟුල්තෙල් ඇඟ ගල්වති, මඟුල්දැහැටි කති, මඟුල්මැටියෙන් ස්නානය කෙරෙති, මඟුල්සළු හඳිති, මඟුල් හිස්වෙළුම් වෙළත්. මොහු ඒ මුතයෙන් ශුද්ධිය පතන මහණබමුණෝ යැ. ඔහු මුතයෙන් ශුද්ධිය...පරිමුක්තිය කැමැති වෙත්.

**න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා** – බාහිතපාපී බ්‍රාහ්මණ තෙමේ දෘෂ්ටශුද්ධියයෙනුදු ශුද්ධිය නො කියයි, ශ්‍රැතශුද්ධියෙනුදු ශුද්ධිය නො කියයි, ශීලශුද්ධියෙනු දු ශුද්ධිය නො කියයි, ව්‍රතශුද්ධියෙනුදු ශුද්ධිය නො කියයි, මූතශුද්ධියෙනුදු ශුද්ධිය නො කියයි, නො බෙණෙයි, නො දක්වයි, ව්‍යවහාර නො කෙරේ නුයි 'න බ්‍රාහ්මණො අඤ්ඤතො සුද්ධිමාහ දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා' යනු වේ.

**පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො** – යම් කිසි ත්‍රෛධාතුක කුශලාභිසංස්කාරයෙක් 'පුණ්‍ය' යි කියනු ලැබෙයි, සියලු අකුශලය 'අපුණ්‍ය' යි කියනු ලැබේ. යම් තැනෙක පටන් පුණ්‍යාභිසංස්කාරයත් අපුණ්‍යාභිසංස්කාරයත් ආනෙඤ්ජාභිසංස්කාරයත් ප්‍රහීණ වූවාහු උපුටා හළ මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අභාවයට ගියාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින් පුණ්‍යයෙහි ද පාපයෙහි ද නො ඇලෙයි, වෙසෙසින් නො ඇලෙයි, නො තැවැරෙයි, අලිප්ත වූයේ (=නො ඇලුණේ)අසංලිප්ත – අනුපලිප්ත වූයේ නික්මැ ගියේ නිස්සට වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කළ සිතින් යුක්ත වැ වෙසේ නුයි 'පුඤ්ඤෙ ච පාපෙ ච අනූපලිත්තො' යනු වේ.

**අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො** – 'අත්තඤ්ජහො' යනු: ආත්මදෘෂ්ටිය හළුයේ, 'අත්තං ජහො' – ග්‍රාහය හළුයේ, 'අත්තං ජහො' – තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් ගත්තා ලද පරාමර්ශ කරන ලද අභිනිවේශ කළ ඇතුළත් ව සිටි බැස ගෙන සිටි ඒ සියල්ල ත්‍යක්ත වෙයි, වාන්ත මුක්ත ප්‍රහීණ ප්‍රතිනිස්සෘෂ්ට වෙයි. **නයිධ පකුබ්බමානො** – පුණ්‍යාභිසංස්කාරය හෝ අපුණ්‍යාභිසංස්කාරය හෝ ආනෙඤ්ජාභිසංස්කාරය හෝ නො කරනුයේ නො දනවනුයේ වෙසෙසින් නො දනවනුයේ නූපදවනුයේ වෙසෙසින් නූපදවනුයේ නුයි 'අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න බ්‍රාහ්මණො–පෙ–නයිධ පකුබ්බමානො" යි.

4 – 4.

පූර්ව ශාස්තෘආදීන් හැරපියා අපර ශාස්තෘ ආදීන් ඇසුරු කරන එජා සඞ්ඛ්‍යාත තෘෂ්ණායෙන් මඩනා ලද්දාහු රාගාදි සඞ්ගය තරණය නො කෙරෙති. යළි ඔහු පූර්වශාඛාව හැරපියා අපරශාඛාවක් ගන්නා වූ වඳුරකු සෙයින් ඒ ඒ ධර්මයන් ගන්නාහු ද වෙත්.

**පුරිමං පහාය අපරං සිතා සෙති** - පුරිමං සත්ථාරං පහාය අපරං සත්ථාරං නිස්සිතා, පුරිමං ධම්මක්ඛානං පහාය අපරං ධම්මක්ඛානං නිස්සිතා, පුරිමං ගණං පහාය අපරං ගණං නිස්සිතා, පුරිමං දිට්ඨිං පහාය අපරං දිට්ඨිං නිස්සිතා, පුරිමං පටිපදං පහාය අපරං පටිපදං නිස්සිතා, පුරිමං මග්ගං පහාය අපරං මග්ගං නිස්සිතා සන්නිස්සිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති 'පුරිමං පහාය අපරං සිතා සෙ.'

**එජානුගා තෙ න තරන්ති සඞ්ගන්ති** - එජා වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං;[a] **එජානුගාති**- එජානුගා එජානුගතා එජානුසටා එජායාපන්නා පතිතා අභිභූතා පරියාදින්නචිත්තා; **තෙ න තරන්ති සඞ්ගන්ති** - රාගසඞ්ගං දොසසඞ්ගං මොහසඞ්ගං මානසඞ්ගං දිට්ඨිසඞ්ගං කිලෙසසඞ්ගං දුච්චරිතසඞ්ගං න තරන්ති, න උත්තරන්ති, න සමතික්කමන්ති, න වීතිවත්තන්තීති 'එජානුගා තෙ න තරන්ති සඞ්ගං.'

**තෙ උග්ගහායන්ති නිරස්සජන්තීති** - සත්ථාරං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං සත්ථාරං ගණ්හන්ති, ධම්මක්ඛානං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං ධම්මක්ඛානං ගණ්හන්ති; ගණං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං ගණං ගණ්හන්ති; දිට්ඨිං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං දිට්ඨිං ගණ්හන්ති; පටිපදං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං පටිපදං ගණ්හන්ති; මග්ගං ගණ්හන්ති, තං මුඤ්චිත්වා අඤ්ඤං මග්ගං ගණ්හන්ති; ගණ්හන්ති ච මුඤ්චන්ති[1] ච ආදියන්ති ච නිරස්සජන්ති චාති 'තෙ උග්ගහායන්ති නිරස්සජන්ති.'

**කපී'ව සාඛං පමුඛඞ්ගහායාති** - යථා මක්කටො අරඤ්ඤෙ පවනෙ චරමානො සාඛං ගණ්හාති, තං මුඤ්චිත්වා අඤ්ඤං සාඛං ගණ්හාති, තං මුඤ්චිත්වා අඤ්ඤං සාඛං ගණ්හාති. එවමෙව පුථුසමණබ්‍රාහ්මණා පුථුදිට්ඨිගතානි ගණ්හන්ති ච මුඤ්චන්ති ච ආදියන්ති ච නිරස්සජන්ති චාති 'කපී ච සාඛං පමුඛඞ්ගහාය.[2]'

තෙනාහ භගවා:

"පුරිමං පහාය අපරං සිතා සෙ
එජානුගා තෙ න තරන්ති සඞ්ගං,
තෙ උග්ගහායන්ති නිරස්සජන්ති
කපීව සාඛං පමුඛඞ්ගහායා"ති.

**4 - 5**

සයං සමාදාය වතානි ජන්තු
උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො,
විද්වා ච[3] වෙදෙහි සමෙච්ච ධම්මං
න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො.

---

1. පමුඤ්චන්ති - ස. 2. පමුඤ්චගහාය - සීමු. I.
3. විද්ධා - සං. මජසං.
a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

**පුරිමං පහාය අපරං සිතාසෙ** – පූර්වශාස්තෘවරයකු හැරපියා අපර ශාස්තෘවරයකුහු ඇසුරු කළාහු පළමු ගත් ධර්මය හැරපියා අන්‍ය ධර්මයක් ඇසුරු කළාහු පළමු ගත් ගණයා හැරපියා අන් ගණයක් ඇසුරු කළාහු පළමු ගත් දෘෂ්ටිය හැර අන්‍යදෘෂ්ටියක් ඇසුරු කළාහු පූර්වප්‍රතිපදාව හැර අපරප්‍රතිපදාවක් ඇසුරු කළාහු පූර්වමාර්ගය හැර අපරමාර්ගයක් ඇසුරු කළාහු වෙසෙසින් ඇසුරු කළාහු ඇලුණාහු එළැඹියාහු පිවිසියාහු බැසගත්තාහු නුයි 'පුරිමං පහාය අපරං සිතාසෙ' යනු වේ.

**එජානුගා තෙ න තරන්ති සඞ්ගං** – 'එජා' යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවෙක් ලෝභඅකුශලමූලයෙක් වේ ද (එයයි). **එජානුගා** – තෘෂ්ණාව අනුව ගියාහු තෘෂ්ණාවට අනුගත වූවාහු තෘෂ්ණාවට පිවිසියාහු තෘෂ්ණාවට පැමිණියාහු වැටුණාහු මඩනා ලද්දාහු හාත්පසින් අල්ලාගත් සිත් ඇත්තාහු. **තෙ න තරන්ති සඞ්ගං** – රාගසඞ්ගය ද්වේෂසඞ්ගය මෝහසඞ්ගය මානසඞ්ගය දෘෂ්ටිසඞ්ගය කෙලෙශසඞ්ගය දුශ්චරිතසඞ්ගය තරණය නො කෙරෙති උත්තරණය නො කෙරෙති ප්‍රතරණය නො කෙරෙති නො ඉක්මෙති ව්‍යතික්‍රමණය නො කෙරෙත් නුයි 'එජානුගා තෙ න තරන්ති සඞ්ගං' යනු වේ.

**තෙ උග්ගහායන්ති නිරස්සජන්ති** – ශාස්තෘවරයකු ගනිති, ඔහු හැරපියා අන් ශාස්තෘවරයකු ගනිත්; ධර්මාඛ්‍යානයක් ගනිති, එය හැරපියා අන් ධර්මාඛ්‍යානයක් ගනිත්, ගණයක් ගනිති, එය හැරපියා අන් ගණයක් ගනිති, දෘෂ්ටියක් ගනිති, එය හැර අන්‍යදෘෂ්ටියක් ගනිත්; ප්‍රතිපදාවක් ගනිති, එය හැරපියා අන් පිළිවෙතක් ගනිත්; මාර්ගයක් ගනිති, එය හැරපියා අන් මගක් ගනිත්; ගත්තාහු ද හරණාහු ද ආදානය කරන්නාහු ද බැහැර කරන්නාහු ද වෙත් නුයි 'තෙ උග්ගහායන්ති නිරස්සජන්ති' යනු වේ.

**කපීව සාඛං පමුඤ්චගහාය** – යම් සේ අරණ්‍යසඞ්ඛ්‍යාත මහවෙනෙහි හැසිරෙන වඳුරෙක් එක් ශාඛාවක් ගෙන එය හැරපියා අනෙකක් ගනී ද, එය ද හැරපියා අන් ශාඛාවක් ගනී ද, එසෙයින් මැ බොහෝ මහණබමුණෝ බොහෝ දෘෂ්ටිගතයන් ගත්තාහු ද හරනාහු ද දුරු ලන්නාහු ද වෙත් නුයි 'කපීව සාඛං පමුඤ්චගහාය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“පුරිමං පහාය–පෙ–පමුඤ්චගහාය”යි.

**4 – 5.**

කාමාදි සංඥයෙහි ඇලුණා වූ සත්ත්ව තෙමෙ හස්තිව්‍රතාදි ව්‍රතයන් තෙමේ මැ සමාදන් වැ එකකින් එකකට යෙයි. පරමාර්ථයෙන් විද්වත් වූ මහාප්‍රඥ ඇති රහත් මහණ සතර මාර්ගඥානවෙදයෙන් දහම් අවබොධ කොට සිටියේ උච්චාවච බවට නො පැමිණේ.

**සයං සමාදාය වතානි ජන්තූති** – ‘සයං සමාදායා’ති සාමං සමාදාය; **වතානීති** – හත්ථිවතං වා අස්සවතං වා ගොවතං වා කුක්කුරවතං වා කාකවතං වා වාසුදෙවවතං වා බලදෙවවතං වා පුණ්ණභද්දවතං වා මණිභද්දවතං වා අග්ගිවතං වා නාගවතං වා සුපණ්ණවතං වා යක්ඛවතං වා අසුරවතං වා –පෙ– දිසාවතං වා, ආදාය සමාදාය ආදියිත්වා සමාදියිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා; **ජන්තූති** – සත්තො නරො –පෙ– මනුජොති ‘සයං සමාදාය වතානි ජන්තු.’

**උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තොති** – සත්ථාරතො සත්ථාරං ගච්ඡති, ධම්මක්ඛානතො ධම්මක්ඛානං ගච්ඡති, ගණතො ගණං ගච්ඡති, දිට්ඨියා දිට්ඨිං ගච්ඡති, පටිපදතො පටිපදං ගච්ඡති, මග්ගතො මග්ගං ගච්ඡති; **සඤ්ඤසත්තොති** – කාමසඤ්ඤාය ව්‍යාපාදසඤ්ඤාය විහිංසාසඤ්ඤාය දිට්ඨිසඤ්ඤාය සත්තො විසත්තො ආසත්තො ලග්ගො ලග්ගිතො පලිබුද්ධො, යථා භිත්තිඛීලෙ වා නාගදන්තෙ වා භණ්ඩං සත්තං විසත්තං ආසත්තං ලග්ගං ලග්ගිතං පලිබුද්ධං; එවමෙව කාමසඤ්ඤාය ව්‍යාපාදසඤ්ඤාය විහිංසාසඤ්ඤාය දිට්ඨිසඤ්ඤාය සත්තො විසත්තො ආසත්තො ලග්ගො ලග්ගිතො පලිබුද්ධොති ‘උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො.’

**විද්වා[1] ච වෙදෙහි සමෙච්ච ධම්මන්ති** – ‘විද්වා’ති විද්වා විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී; **වෙදෙහීති** – වෙදා වුච්චන්ති චතූසු මග්ගෙසු ඤාණං, පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි, තෙහි වෙදෙහි ජාතිජරාමරණස්ස අන්තගතො අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙනගතො ලෙනප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො[2] අච්චුතප්පත්තො[3] අමතගතො අමතප්පත්තො නිබ්බානගතො නිබ්බානප්පත්තො; වෙදානං වා අන්තගතොති වෙදගූ, වෙදෙහි වා අන්තං ගතොති වෙදගූ, සත්තන්නං වා ධම්මානං විදිතත්තා වෙදගූ: සක්කායදිට්ඨි විදිතා හොති, විචිකිච්ඡා විදිතා හොති, සීලබ්බතපරාමාසො විදිතො හොති, රාගො විදිතො හොති, දොසො විදිතො හොති, මොහො විදිතො හොති, මානො විදිතො හොති, විදිතාස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සඞ්කිලෙසිකා පොනොභවිකා සදරා දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

1. “වෙදානි විචෙය්‍ය කෙවලානි (සභියාති භගවා)
සමණානං යානිපත්ථි[4] බ්‍රාහ්මණානං,
සබ්බවෙදනාසු වීතරාගො
සබ්බං වෙදමතිච්ච වෙදගූ සො”ති.

---

1. විද්ධා – ස්‍යා. මජ්ඣං. 2. අච්චුතිංගතො – ස. 3. අච්චුතිප්පත්තො – ස.
4. ධත්ථි – සීමු. 1. මජ්ඣං.

**සයං සමාදාය වතානි ජන්තු** – 'සයං සමාදාය' – තෙමේ මැ සමාදන් වැ; **වතානි** – හස්තිව්‍රතය හෝ අශ්ව – ගො – කුක්කුර – කාක – වාසුදෙව – බලදෙව – පූර්ණභද්‍ර – මණිභද්‍ර – අග්නි – නාග – සුපර්ණ – යක්‍ෂ – අසුර – ව්‍රතය හෝ...දිශාව්‍රතය හෝ ගෙන මොනොවට ගෙන ආදානය කොට සමාදානය කොට ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවෙශ කොට; **ජන්තු** – සත්ත්ව – නර...මනුජ තෙමේ නුසි 'සයං සමාදාය වතානි ජන්තු' යනු වේ.

**උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො** – ශාස්තෘවරයකු කෙරෙන් ශාස්තෘවරයකු කරා යෙයි, ධර්මාඛ්‍යානයකින් ධර්මාඛ්‍යානයකට – ගණයක් කෙරෙන් ගණයක්හු කරා – දෘෂ්ටියකින් දෘෂ්ටියකට – ප්‍රතිපදාවකින් ප්‍රතිපදාවකට – මාර්ගයකින් මාර්ගයකට යෙයි; **සඤ්ඤසත්තො** කාමසංඥායෙහි ව්‍යාපාද–සංඥායෙහි විහිංසාසංඥායෙහි දෘෂ්ටිසංඥායෙහි ඇලුණේ වෙසෙසින් ඇලුණේ හාත්පසින් ඇලුණේ ලැගුණේ ලග්න වූයේ පලිබුද්ධ වූයේ, යම් සේ භිත්ති–ඛිලය (=භිත්තියෙහි සවි කළ හුල)ක හෝ නාගදන්තයක හෝ භාණ්ඩයක් සක්ත විෂක්ත ආසක්ත ලග්න ලග්නකළ පරිබුද්ධ වූයේ ද, එසෙයින් ම කාම – ව්‍යාපාද – විහිංසා – දෘෂ්ටිසංඥායෙහි සක්ත...පරිබුද්ධ වූයේ නුසි 'උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො' යනු වේ.

**විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං** – 'විද්වා' යනු: විද්වද් වූයේ විද්‍යාවට පැමිණියේ නුවණැතියේ නුවණින් විමසනුයේ මෙධා(=අනිත්‍යාදි විසින් තුලනය කළ ඥාන) ඇතියේ; **වෙදෙහි** – සතර මාර්ගයන්හි ඥානය 'වෙද' යී කියනු ලැබේ; ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රියය ප්‍රඥාබලය ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය වීමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය යි; ඒ මාර්ගඥානවෙදයන්ගෙන් ජාතිජරාමරණයන්ගේ අන්තයට ගියේ අන්තයට පැමිණියේ (මාර්ගයෙන්) කෙළවරට ගියේ (ඵලයෙන්) කෙළවරට පැමිණියේ පර්‍යන්තයට ගියේ පර්‍යන්තයට පැමිණියේ අවසානයට ගියේ අවසානයට පැමිණියේ (මාර්ගයෙන්) ත්‍රාණයට ගියේ (ඵලයෙන්) ත්‍රාණයට පැමිණියේ නිලීයනයට (මාර්ගයෙන්) ගියේ (ඵලයෙන්) පැමිණියේ ප්‍රතිෂ්ඨාවට (මාර්ගයෙන්) ගියේ (ඵලයෙන්) පැමිණියේ නිර්භයට ගියේ නිර්භයප්‍රාප්ත වූයේ අච්‍යුතිය (=නිවන)ට ගියේ අච්‍යුතප්‍රාප්ත වූයේ අමෘතයට ගියේ අමෘතයට පැමිණියේ මාර්ගයෙන් නිවනට ගියේ ඵලයෙන් නිවනට පැමිණියේ; නොහොත් වෙද (=දතයුතු ධර්ම) යන්ගේ අන්තයට ගියේ නුසි 'වෙදගූ' යැ, සතරමාර්ගඥාන–වෙදයෙන් වෘත්තදුඃඛයාගේ අන්තයට ගියේ නුසි හෝ 'වෙදගූ' යැ; නොහොත් සප්තධර්මයන් විදිත වන බැවින් 'වෙදගූ' යැ: සත්කායදෘෂ්ටිය විදිත වෙයි, විචිකිත්සාව – ශීලව්‍රතපරාමර්ශය – රාගය – ද්වෙෂය – මොහය – මානය විදිත වෙයි, ඔහු විසින් කෙලෙසුන්ට ප්‍රත්‍යය වූ පුනර්භවය උපදවන කෙලශදරථ සහිත වූ දුඃඛවිපාක දෙන අනාගතයෙහි ජාතිජරාමරණයන්ට ප්‍රත්‍යය වූ ලාමක අකුශලධර්මයෝ විදිත වූවාහු වෙත්.

1. (බුදුහු 'සභිය' යි අමතා මෙසේ වදාළහ:) යමෙක් ශ්‍රමණබ්‍රාහ්මණ–යන්ගේ ශාස්ත්‍ර යයි කියන ලද යම් වෙද කෙනෙක් වෙත් ද, ඒ සියලු වෙදයන් මාර්ගභාවනායෙන් කෘත්‍ය හෙයින් අනිත්‍යාදිවශයෙන් විමසා එහි ඡන්දරාගප්‍රහාණයෙන් ඒ සියලු වෙදයන් ඉක්මවා යළි වෙදප්‍රත්‍යයෙන් හෝ අත් පරිද්දෙකින් උපදනා සියලු වෙදනාවන්හි වීතරාග වූයේ ද හෙතෙම පරමාර්ථවශයෙන් 'වෙදගූ' නම් වේ යයි.

**විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්ම**න්ති – සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සබ්බෙ ධම්මා අනත්තා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘අවිජ්ජා පච්චයා සඞ්ඛාරා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සඞ්ඛාරපච්චයා විඤ්ඤාණ’න්ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘විඤ්ඤාණපච්චයා නාමරූප’න්ති – නාමරූපපච්චයා සළායතනන්ති – සළායතනපච්චයා ඵස්සොති – ඵස්සපච්චයා වෙදනාති – වෙදනාපච්චයා තණ්හාති – තණ්හාපච්චයා උපාදානන්ති – උපාදානපච්චයා භවොති – භවපච්චයා ජාතීති – ජාතිපච්චයා ජරාමරණ’න්ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො’ති – නාමරූපනිරොධා සළායතනනිරොධොති – සළායතනනිරොධා ඵස්සනිරොධොති – ඵස්සනිරොධා වෙදනානිරොධොති – වෙදනානිරොධා තණ්හානිරොධොති – තණ්හානිරොධා උපාදානනිරොධොති – උපාදානනිරොධා භවනිරොධොති – භවනිරොධා ජාතිනිරොධොති – ජාතිනිරොධා ජරාමරණනිරොධො’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘ඉදං දුක්ඛ’න්ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘අයං දුක්ඛසමුදයො’ති – අයං දුක්ඛනිරොධොති – අයං දුක්ඛනිරොධගාමිනීපටිපදා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘ඉමෙ ආසවා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘අයං ආසවසමුදයො’ති – අයං ආසවනිරොධොති – අයං ආසවනිරොධගාමිනීපටිපදා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං, ‘ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං, ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති – ඉමෙ ධම්මා පහාතබ්බාති – ඉමෙ ධම්මා භාවෙතබ්බාති – ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා’ති සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච සමෙච්ච අභිසමෙච්ච ධම්මං; පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච සමෙච්ච අභිසමෙච්ච ධම්මං; චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච සමෙච්ච අභිසමෙච්ච ධම්මං; ‘යං කිඤ්චි සමුදයධම්මං, සබ්බං තං නිරොධධම්ම’න්ති සමෙච්ච අභිසමෙච්ච ධම්මන්ති ‘විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං.’

**න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො**ති – න සත්ථාරතො සත්ථාරං ගච්ඡති, න ධම්මක්ඛානතො ධම්මක්ඛානං ගච්ඡති, න දිට්ඨියා දිට්ඨිං ගච්ඡති, න පටිපදාය පටිපදං ගච්ඡති, න මග්ගතො මග්ගං ගච්ඡති. **භූරිපඤ්ඤො**ති භූරිපඤ්ඤො මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො[1] ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො; භූරි වුච්චති පථවී, තාය පථවිසමාය පඤ්ඤාය විපුලාය විත්ථතාය සමන්නාගතොති ‘න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො.’

---

1. හාසපඤ්ඤො PTS.

**විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං** – සිවුසස් දහමට නුවණින් පැමිණ, සිවුසස් දහම් නුවණින් පිළිවිද; ‘සියලු සංස්කාරයෝ ඇති වැ නැති වන බැවින් අනිත්‍යයහ’යි සිවුසස් දහම් නුවණින් පැමිණ අභිසමය කොට, ‘සියලු සංස්කාරයෝ පීඩා උපදවන බැවින් දුඃඛයහ’යි දහම් දැන අභිසමය කොට, ‘සියලු ධර්මයෝ වශයෙහි නො පවත්නා බැවින් අනාත්මයහ’යි සිවුසස් දහම් නුවණින් දැන අභිසමය කොට; ‘අවිද්‍යාප්‍රත්‍යයෙන් (-අවිද්‍යාව නිසා) තුන් බිමට අයත් කුශලාදි සංස්කාරයෝ පහළ වෙති’ සිවුසස් දහම් නුවණින් දැන ප්‍රතිවෙධ කොට, සංස්කාරප්‍රත්‍යයෙන් චක්ෂුර්විඥානාදි දෙතිස් ලෞකිකවිපාකවිඥානය පහළ වේ යයි...එකුන්විසි ප්‍රතිසන්ධිවිඥාන-ප්‍රත්‍යයෙන් වෙදනා සංඥා සංස්කාරස්කන්ධ සඞ්ඛ්‍යාත නාමය හා රූපය වේ යයි...නාමරූපප්‍රත්‍යයෙන් චක්ෂුරායතනාදි ෂඩායතනය වේ යයි...ෂඩායතනප්‍රත්‍යයෙන් චක්ෂුඃසංස්පර්ශාදි ස්පර්ශය වේ යයි... ස්පර්ශප්‍රත්‍යයෙන් චක්ෂුඃසංස්පර්ශජාදි වෙදනාව වේ යයි...වෙදනාප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ යයි...තෘෂ්ණාප්‍රත්‍යයෙන් කාමාදි උපාදානය වේ යයි...උපාදානප්‍රත්‍යයෙන් භවය වේ යයි...කර්මභවප්‍රත්‍යයෙන් ප්‍රතිසන්ධිස්කන්ධ සඞ්ඛ්‍යාත ජාතිය වේ යයි...ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය වේ යයි නුවණින් දැන සිවුසස් දහම් ප්‍රතිවෙධ කොට, ‘අවිද්‍යාව ගේ අනුත්පාදනිරොධයෙන් සංස්කාරයන් ගේ අනුත්පාදනිරොධය වේ යයි නුවණින් දැන සිවුසස් දහම් අවබොධ කොට; සංස්කාරයන් ගේ අනුත්පාදනිරොධයෙන් විඥානනිරොධය වේ යයි – ප්‍රතිසන්ධිවිඥානයා ගේ අනුත්පාදනිරොධයෙන් නාමරූපනිරොධය වේ යයි – නාමරූපනිරොධයෙන් ෂඩායතනනිරොධය වේ යයි – ෂඩායතනනිරොධයෙන් ස්පර්ශනිරොධය වේ යයි – ස්පර්ශනිරොධයෙන් වෙදනානිරොධය වේ යයි – වෙදනානිරොධයෙන් තෘෂ්ණානිරොධය වේ යයි – තෘෂ්ණානිරොධයෙන් උපාදානනිරොධය වේ යයි – උපාදානනිරොධයෙන් භවනිරොධය වේ යයි – භවනිරොධයෙන් ජාතිනිරොධය වේ යයි – ජාතිනිරොධයෙන් ජරාමරණ නිරොධය වේයයි නුවණින් දැන සිවුසස් අවබොධ කොට; ‘මේ දුකැ’යි දැන... මේ දුක් සමුදය යි...මේ දුක් නැසීම යැයි...මේ දුක් නිරොධයට පමුණුවන පිළිවෙතැයි නුවණින් දැන සිවුසස් ප්‍රතිවෙධ කොට; ‘මොහු ආස්‍රවයෝ ය’යි...‘මේ ආස්‍රවසමුදය යි...මේ ආස්‍රවනිරොධය යි...‘මේ ආස්‍රව-නිරොධගාමිනීප්‍රතිපදා ය’යි දැන සිවුසස්දහම් අභිසමය කොට, ‘මේ ධර්මයෝ ස්වභාවලක්ෂණාවබොධවශයෙන් දතයුත්තාහ’යි දැන – මේ (ත්‍රෛභූමක) ධර්මයෝ සාමාන්‍යලක්ෂණාවබොධවශයෙන් හාත්පසින් දතයුත්තාහ’යි දැන – ‘මේ සමුදයපක්ෂයෙහි වූ ධර්මයෝ ඒ ඒ ගුණාඞ්ගයෙන් හළ යුත්තාහ’යි – ‘මේ දහම්හු වැඩිය යුත්තාහ’යි – ‘මේ දහම්හු ප්‍රත්‍යක්ෂ කටයුත්තාහ’යි නුවණින් දැන සිවුසස් දහම් අවබොධ කොට, චක්ෂුරාදි ෂට්ස්පර්ශායතනයන් ගේ සමුදය (-ඉපදීම)ද නිරොධය ද ආශ්වාදය ද ආදීනවය ද නිශ්ශරණය ද දැන දහම් පසක් කොට, පඤ්චොපාදානස්කන්ධයන්ගේ සමුදය ද... නිශ්ශරණය ද දැන – සතරමහාභූතයන්ගේ සමුදය ද...නිශ්ශරණය ද දැන – ‘සමුදයපක්ෂයෙහි වූ සියලු ධර්මජාතය නිරොධස්වභාව ඇතැ’යි නුවණින් දැන සිවුසස් දහම් විශිෂ්ටඥානයෙන් දැන තුයි ‘විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං’ යනු වේ.

**න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො** – ශාස්තෘවරයකු කෙරෙන් ශාස්තෘ-වරයකු කරා නො යෙයි, ධර්මාඛ්‍යානයකින් ධර්මාඛ්‍යානයකට – දෘෂ්ටියකින් දෘෂ්ටියකට – පිළිවෙතකින් පිළිවෙතකට – මඟෙකින් මඟකට නො යන්නේයි. **භූරිපඤ්ඤො** – පෘථිවිය බඳු විපුලප්‍රඥා ඇතියේ මහාප්‍රඥා ඇතියේ පැතුරුණු ප්‍රඥා ඇතියේ තුෂ්ටි බහුල වූ ප්‍රඥා ඇතියේ අනිත්‍යාදියෙහි වහා දිවෙන ප්‍රඥා ඇතියේ තියුණු වූ ප්‍රඥා ඇතියේ ලොභාදිය විනිවිදින ප්‍රඥා ඇතියේ යැ; පෘථිවිය ‘භූරි’ යැයි කියනු ලබයි, ඒ පෘථිවිසම වූ විපුල වූ විස්තෘත වූ ප්‍රඥායෙන් සමන්විත තුයි ‘න උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො’ යනු වේ.

තෙනාහ භගවා:

"සයං සමාදාය වතානි ජන්තු
උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො,
විද්වා ච වෙදෙහි සමෙච්ච ධම්මං
උච්චාවචං ගච්ඡති භූරිපඤ්ඤො"ති.

4 - 6

ස සබ්බධම්මෙසු[1] විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා,
තමෙව දස්සිං විවටං චරන්තං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.

**ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨංව සුතං මුතං වාති**- සෙනා වුච්චති මාරසෙනා; කායදුච්චරිතං මාරසෙනා, වචීදුච්චරිතං මාරසෙනා, මනොදුච්චරිතං මාරසෙනා, රාගො මාරසෙනා, දොසො මාරසෙනා, මොහො මාරසෙනා, කොධො - උපනාහො-පෙ - සබ්බාකුසලාභි-සඞ්ඛාරා මාරසෙනා. වුත්තං හෙතං භගවතා:

1. "කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති,
   තතියා ඛුප්පිපාසා තෙ චතුත්ථී තණ්හා පවුච්චති.

2. පඤ්චමී[2] ථිනමිද්ධං තෙ ඡට්ඨා භීරූ පවුච්චති,
   සත්තමී[3] විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො තෙ අට්ඨමො.

3. ලාභො සිලොකො සක්කාරො මිච්ඡාලද්ධො ච යො යසො,
   යො චත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති.

4. එසා නමුචි තෙ සෙනා කණ්හස්සාභිප්පහාරිණී,
   න නං අසූරො ජිනාති ජෙත්වා ච ලභතෙ සුඛ"න්ති.[a]

යතො චතූහි අරියමග්ගෙහි සබ්බා ච මාරසෙනා සබ්බෙ ච පටිසෙනිකරා කිලෙසා ජිතා ච පරාජිතා ච භග්ගා විප්පලුග්ගා පරම්මුඛා, සො වුච්චති විසෙනිභූතො; සො දිට්ඨෙ විසෙනිභූතො සුතෙ විසෙනිභූතො මුතෙ විසෙනිභූතො විඤ්ඤාතෙ විසෙනිභූතොති - ස සබ්බධම්මෙසු[4] විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා.

1. සබ්බෙසු ධම්මෙසු - සීමු. I. 2. පඤ්චමං - සයා.
3. සත්තමං - සීමු. I. 4. සබ්බෙසු ධම්මෙසු - සීමු I.
a. සුත්තනිපාත - පධානසුත්ත.

එයින් වදාළහ බුදුහු:

"සයං සමාදාය-පෙ-ගච්ඡති භූරිපඤ්ඤො"ති.

4 – 6.

ඒ භූරිප්‍රාඥ වූ ක්ෂීණාස්‍රව තෙමේ යම් කිසි රූපාලම්බනයක් හෝ ශබ්දාලම්බනයක් හෝ ගන්ධ-රස-ස්පෘෂ්ටව්‍ය ආලම්බණයක් හෝ වේද, ඒ සියලු ධර්මයන්හි අකුශලාභිසංස්කාර සංඛ්‍යාත මරසෙනග වනසා සිටි එන බැවින් විසෙනී වූයේ වෙයි. මෙසේ විශුද්ධ දර්‍ශන ඇති විවෘත වැ හැසිරෙන ඒ රහත්හු මෙ ලොවැ තෘෂ්ණාදි කවර කල්පනයකින් විකල්පනය කරන්නේ ද.

**ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා** – 'සෙනා' යි මාරසෙනාව කියනු ලබයි, කායදුශ්චරිතය මාරසෙනා යැ, වාග්දුශ්චරිතය – මනොදුශ්චරිතය මාරසෙනා යැ, රාගය මාරසෙනා යැ, ද්වේෂය – මෝහය – ක්‍රෝධය – උපනාහය...සියලු අකුශලාභිසංස්කාරයෝ මාරසෙනා යි. මේ වදාරන ලද මැය භාග්‍යවත්හු විසින්:

1. "අනනකය, වස්තුකාම ක්ලේශකාමයෝ තාගේ පළමු වැනි සෙනාව යැ, වනසෙනසුන්හි හෝ අධිකුශලධර්මයන්හි උපදනා අරතිය දෙවැනි සෙනාව යැයි කියනු ලැබෙයි, සා පවස් දෙක තාගේ තෙවැනි සෙනාව යැ, පයෙෂ්ෂණතෘෂ්ණාව සතරවැනි සෙනාව යැයි කියනු ලැබේ.

2. ථිනමිද්ධය තාගේ පස්වැනි සෙනාව යැ, තැතිගැනීම් සඞ්ඛ්‍යාත බියසුලු බව සවැන්නී යැයි කියනු ලැබෙයි, පයර්‍යාජතියෙහි සැකය තාගේ සත්වැනි සෙනාව යැ (මානය) මකුබව හා ස්තම්භය තාගේ අටවැනි සෙනාව යි.

3. ලාභය ප්‍රශංසාය සත්කාරය යන මොහු ද මිථ්‍යාවෙන් ලද යශස ද නවවැනි සෙනාව වෙයි, ජාත්‍යාදිය හෙතු කොටගෙන ආත්මොත්-කර්ෂණය ද පරවම්භනය ද දසවැනි සෙනාව වේ.

4. අනනකය, කෘෂ්ණධර්මයෙන් සමන්විත වූ තා ගේ මේ දශවිධ සෙනා තොමෝ මහණබමුණන්ට අන්තරාය කරන සුලු වෙයි, සූර නො වූ පුරුෂ තෙමේ ඒ මරසෙනග නො දිනයි, යළි කායජීවිත නිරපෙක්ෂ වූ සූර තෙමේ ජයග්‍රහණය කොට මගපලසුවයට පැමිණේ" යයි.

යම් හෙයකින් සතර ආර්‍යමාර්ගයෙන් සියලු දශවිධ මාරසෙනාව ද ප්‍රතිපක්ෂ බව කරන සියලු ක්ලේශයෝ ද දිනන ලද්දාහු පරදවන ලද්දාහු, බිඳින ලද්දාහු සුණුවිසුණු කරන ලද්දාහු පරාමුඛ බවට පමුණුවන ලද්දාහු ද වෙති, හෙතෙම විසෙනීභූත (=නික්ලේශ වූයේ) යැයි කියනු ලැබේ. හෙතෙම රූපායතනයෙහි විසෙනී වූයේ ශබ්දායතනයෙහි – ගන්ධ-රස ස්ප්‍රෂ්ටව්‍යායතනයෙහි – ධර්මායතනයෙහි විසෙනී වූයේ නුයි 'ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා' යනු වේ.

**තමෙව දස්සිං විවටං චරන්තන්ති** – තමෙව සුද්ධදස්සිං විසුද්ධදස්සිං පරිසුද්ධදස්සිං වොදාතදස්සිං පරියොදාතදස්සිං; අථ වා සුද්ධදස්සනං විසුද්ධදස්සනං පරිසුද්ධදස්සනං වොදාතදස්සනං පරියොදාතදස්සනං; **විවටන්ති** තණ්හාඡදනං දිට්ඨිඡදනං කිලෙසඡදනං දුච්චරිතඡදනං, තානි ඡදනානි විවටානි හොන්ති විද්ධංසිතානි උග්ඝාටිතානි සමුග්ඝාටිතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිපස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි; **චරන්තන්ති** චරන්තං විචරන්තං ඉරියන්තං වත්තෙන්තං පාලෙන්තං යපෙන්තං යාපෙන්තන්ති – තමෙව දස්සිං විවටං චරන්තං.

**කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍යාති** – කප්පාති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච –පෙ– අයං තණ්හාකප්පො –පෙ– අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො, දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා කෙන රාගෙන කප්පෙය්‍ය? කෙන දොසෙන කප්පෙය්‍ය? කෙන මොහෙන කප්පෙය්‍ය? කෙන මානෙන කප්පෙය්‍ය? කාය දිට්ඨියා කප්පෙය්‍ය? කෙන උද්ධච්චෙන කප්පෙය්‍ය? කාය විචිකිච්ඡාය කප්පෙය්‍ය? කෙහි අනුසයෙහි කප්පෙය්‍ය රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති වා ථාමගතොති වා? තෙ[1] අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා[2] කෙන කප්පෙය්‍ය නෙරයිකොති වා, තිරච්ඡානයොනිකොති වා, පෙත්තිවිසයිකොති වා, මනුස්සොති වා, දෙවොති වා, රූපීති වා, අරූපීති වා, සඤ්ඤීති වා, අසඤ්ඤීති වා, නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා? සො හෙතු නත්ථි පච්චයො නත්ථි කාරණං නත්ථි, යෙන කප්පෙය්‍ය විකප්පෙය්‍ය විකප්පං ආපජ්ජෙය්‍ය; **ලොකස්මින්ති** අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙති 'කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.'

තෙනාහ භගවා:

> "ස සබ්බධම්මෙසු විසෙනිභූතො
> යං කිඤ්චි දිට්ඨංච සුතං මුතං වා,
> තමෙව දස්සිං විවටං චරන්තං
> කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍යා"ති.

## 4 – 7

> න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
> අච්චන්තසුද්ධීති[3] න තෙ වදන්ති,
> ආදානගන්ථං ගථිතං[4] විසජ්ජ
> ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ.

---

1. එතෙ – මනුප. 2. ගතියො – සීමු. II.
3. අච්චන්තසුද්ධි – සීමු. II. මජසං 4. ගධිතං – සීමු. I.

**තමෙව දස්සිං විවටං චරන්තං** – ඒ මෙසේ ශුද්ධදර්ශී වූවහු විශුද්ධදර්ශී වූවහු පරිශුද්ධදර්ශී වූවහු ව්‍යවදාතදර්ශී වූවහු හාත්පසින් විශුද්ධ දර්ශන ඇත්තහු; නොහොත් ශුද්ධදර්ශන විශුද්ධදර්ශන පරිශුද්ධදර්ශන ව්‍යවදාතදර්ශන පර්‍ය්‍යවදාතදර්ශන ඇත්තහු. **විවටං** – තෘෂ්ණා සඞ්ඛ්‍යාත ඡදන (=සෙවෙනි) ය දෘෂ්ටිඡදනය කෙලශඡදනය දුශ්චරිතඡදනය අවිද්‍යාඡදනය යන මේ කෙලෙස් ඡදනයෝ විවෘත කරන ලද්දාහු වෙති, විධ්වංශන කරන ලද්දාහු උද්ඝාටන කරන ලද්දාහු සමුද්ඝාටන කරන ලද්දාහු ප්‍රහීණ කරන ලද්දාහු සිඳින ලද්දාහු සන්සිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යෝත්පත්තික කරන ලද්දාහු නුවණගින්නෙන් දවන ලද්දාහු වෙත්. **චරන්තං** – හැසිරෙනුවහු වෙසෙසින් හැසිරෙනුවහු ඉරියව් පවත්වනුවහු ඉරියව් උපදවනුවහු ඉරියව් රක්නහු යැපෙනුවහු යාපනය කරවනුවහු නුසි 'තමෙව දස්සිං විවටං චරන්තං' යනු වේ.

**කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය** – 'කප්පා' යනු: තෘෂ්ණාකල්පන යැ දෘෂ්ටිකල්පන යැයි කල්පනයෝ දෙදෙනෙකි:...ඔහු විසින් තෘෂ්ණාකල්පය ප්‍රහීණ යැ දෘෂ්ටිකල්පය දුරලන ලද; තෘෂ්ණාකල්පනය ප්‍රහීණ හෙයින් දෘෂ්ටිකල්පනය දුරලන ලද හෙයින් කවර රාගයෙකින් කවරෙක් විකල්පනය කරන්නේ ද, කවර ද්වේෂයෙකින් – කවර මෝහයෙකින් – කවර මානයෙකින් – කවර දෘෂ්ටියෙකින් – කවර ඖද්ධත්‍යයෙකින් – කවර විචිකිත්සායෙකින් – කවර අනුසයධර්මයෙකින් රක්ත යැ හෝ දුෂ්ට යැ හෝ මූඪ යැ හෝ විනිබද්ධ යැ හෝ පරාමෘෂ්ට යැ හෝ වික්ෂෙපයට ගියේ යැ හෝ අනිෂ්ඨාවට ගියේ යැ හෝ තදබවට ගියේ යැ හෝ කල්පනය කරන්නේ ද, (කල්පනයට හෙතු වූ) ඒ අභිසංස්කාරයෝ ප්‍රහීණයහ. අභිසංස්කාරයන් ප්‍රහීණ වන බැවින් කුමක් හෙතු කොටගෙන නිරයට යන්නෙකැයි හෝ තිරිසන් යොනි ඇතියෙකැයි හෝ ප්‍රෙතවිෂය ඇතියෙකැයි හෝ මිනිස් වෙයි හෝ දෙවි වෙයි හෝ රූපී – අරූපී – සංඥී – අසංඥී – නෙවසංඥීනාසංඥී වෙයි හෝ එක්තරා ගතියෙකින් කල්පනය කරන්නේ ද, යම් හෙයකින් කල්පන විකල්පන කරන්නේ ද, විකල්පයට පැමිණෙන්නේ ද, ඒ හෙතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණය නැති. **ලොකස්මිං** – අපායලොකයෙහි ... ආයතනලොකයෙහි නුසි 'කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය' යනු වේ. එයින් වදාළහ බුදුහු:

"ස සබ්බධම්මෙසු-පෙ-විකප්පයෙය්‍ය" යි.

## 4 – 7.

යම් හෙයකින් ඒ ශාන්ත වූ ක්ෂීණාස්‍රවයෝ ද්විවිධ තෘෂ්ණාදි කල්පනයන් හා පුරස්කාරයන් අතුරෙන් කිසිවකින් කල්පනය නො කෙරෙත් ද, පෙරටු නො කෙරෙත් ද, ඔවුහු (පරමාර්ථ අත්‍යන්තශුද්ධිය අධිගත වන බැවින් අත්‍යන්තශුද්ධ වූවාහු මැ) අක්‍රිය – ශාශ්වතදෘෂ්ටි අත්‍යන්තශුද්ධි යයි නො කියත් ද එහෙයින් ස්වකීය චිත්තසන්තානයෙහි ගෙතුණාවූ ආදානග්‍රන්ථ යයි කියන ලද අභිධ්‍යාදි චතුර්විධ කායග්‍රන්ථය සිඳපියා කිසි ලෙෘකයෙක්හි තෘෂ්ණාව නූපදවත්.

**න කප්පයන්ති න පුරෙක්ඛරොන්තීති** – ‘කප්පා’ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච –පෙ– අයං තණ්හාකප්පො –පෙ– අයං දිට්ඨිකප්පො. තෙසං තණ්හාකප්පො පහීනො, දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තණ්හාකප්පං වා න කප්පෙන්ති[1] න ජනෙන්ති න සඤ්ජනෙන්ති න නිබ්බත්තෙන්ති නාභිනිබ්බත්තෙන්තීති න කප්පයන්ති; **න පුරෙක්ඛරොන්තීති** ‘පුරෙක්ඛාරා’ති ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච –පෙ–අයං තණ්හාපුරෙක්ඛාරො –පෙ– අයං දිට්ඨිපුරෙක්ඛාරො. තෙසං තණ්හාපුරෙක්ඛාරො පහීනො, දිට්ඨිපුරෙක්ඛාරො පටිනිස්සට්ඨො. තණ්හාපුරෙක්ඛාරස්ස පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස පටිනිස්සට්ඨත්තා න තණ්හං වා න දිට්ඨිං වා පුරතො කත්වා චරන්ති; න තණ්හාධජා න තණ්හාකෙතූ න තණ්හාධිපතෙය්‍යා න දිට්ඨිධජා න දිට්ඨිකෙතූ න දිට්ඨාධිපතෙය්‍යා, න තණ්හාය වා න දිට්ඨියා වා පරිවාරිතා චරන්තීති – න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති.

**අච්චන්තසුද්ධීති[2] න තෙ වදන්තීති** – අච්චන්තසුද්ධිං සංසාරසුද්ධිං අකිරියදිට්ඨිං[3] සස්සතවාදං න වදන්ති න කථෙන්ති න භණන්ති න දීපයන්ති න වොහරන්තීති ‘අච්චන්තසුද්ධින්ති න තෙ වදන්ති.’

**ආදානගන්ථං ගථිතං විසජ්ජාති** – ‘ගන්ථා’ති චත්තාරො ගන්ථා: අභිජ්ඣා කායගන්ථො, බ්‍යාපාදො කායගන්ථො, සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො. අත්තනො දිට්ඨියා රාගො අභිජ්ඣා කායගන්ථො. පරවාදෙසු ආඝාතො අප්පච්චයො බ්‍යාපාදො කායගන්ථො. අත්තනො සීලං වා වතං වා සීලබ්බතං වා පරාමසන්තීති සීලබ්බතපරාමාසො කායගන්ථො. අත්තනො දිට්ඨි ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො. කිං කාරණා වුච්චති[3] ආදානගන්ථො? තෙහි ගන්ථෙහි රූපං ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති. වෙදනං සඤ්ඤං සඞ්ඛාරෙ විඤ්ඤාණං ගතිං උපපත්තිං පටිසන්ධිං භවං සංසාරවට්ටං ආදියන්ති උපාදියන්ති ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති. තං කාරණා වුච්චති[4] ආදානගන්ථො. **විසජ්ජාති** ගන්ථෙ වොස්සජ්ජිත්වා වා විසජ්ජ; අථ වා ගන්ථෙ ගථිතෙ ගන්ථිතෙ බද්ධෙ විබද්ධෙ ආබද්ධෙ ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ බන්ධනෙ ඵොටයිත්වා විසජ්ජ; යථා වය්හං වා රථං වා සකටං වා සන්දමානිකං වා සජ්ජං විසජ්ජං කරොන්ති විකොපෙන්ති, එවමෙවං ගන්ථෙ වොස්සජ්ජිත්වා වා විසජ්ජ; අථවා ගන්ථෙ ගථිතෙ ගන්ථිතෙ බද්ධෙ විබද්ධෙ ආබද්ධෙ ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ බන්ධනෙ ඵොටයිත්වා විසජ්ජාති ‘ආදානගන්ථං ගථිතං විසජ්ජ.’

---

1. න කප්පයන්ති - මජුප. 2. අච්චන්තසුද්ධීති - සීමු II. මජසං.
3. අකිරියසුද්ධිං - ස්‍යා. 4. වුච්චන්ති - සීමු I මජසං.

**න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති** - 'කප්පා' යනු තෘෂ්ණාකල්ප යෑ, දෘෂ්ටිකල්ප යෑයි කල්පයෝ දෙදෙනෙක් වෙති:...ඔවුන් විසින් තෘෂ්ණා-කල්පය ප්‍රහීණ යෑ, දෘෂ්ටිකල්පය දුරලන ලද්දේයෑ තෘෂ්ණාකල්පය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිකල්පය දුරලන ලද බැවින් තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටිකල්පය හෝ කල්පනය නො කෙරෙති, නූපදවති, නො නිපදවත් නුයි - 'න කප්පයන්ති' යනු වේ. **න පුරෙක්ඛරොන්ති** - තෘෂ්ණාපුරස්කාරයෑ, දෘෂ්ටිපුරස්කාර යයි පුරස්කාරයෝ දෙදෙනෙක් වෙති:...තෘෂ්ණාපුරස්කාරය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිපුරස්කාරය දුර ලන ලද බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නො හැසිරෙති; තෘෂ්ණාව ධ්වජ කොට ඇත්තාහු තෘෂ්ණාව කෙහෙලි කොට ඇත්තාහු තෘෂ්ණාව අධිපති කොට ඇත්තාහු, දෘෂ්ටිය ධ්වජ කොට ඇත්තාහු දෘෂ්ටිය කෙහෙලි කොට ඇත්තාහු දෘෂ්ටිය අධිපති කොට ඇත්තාහු නො හැසිරෙති; තෘෂ්ණාව විසින් හෝ දෘෂ්ටිය විසින් හෝ පිරිවරන ලද්දාහු නො හැසිරෙත් නුයි 'න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති' යනු වේ.

**අච්චන්තසුද්ධීති න තෙ වදන්ති** - අක්‍රියදෘෂ්ටිය ත් ශාශ්වතවාදයත් අත්‍යන්තශුද්ධි යෑ සංසාරශුද්ධි යෑයි නො කියති නො බෙණෙති නො දක්වති ව්‍යවහාර නො කෙරෙත් නුයි 'අච්චන්තසුද්ධීති න තෙ වදන්ති' යනු වේ.

**ආදානගන්ථං ගථිතං විසජ්ජ** - 'ගන්ථ' යනු අභිධ්‍යාකායග්‍රන්ථ යෑ, ව්‍යාපාදකායග්‍රන්ථ යෑ ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ යෑ ඉදංසත්‍යාභිනිවේශකාය-ග්‍රන්ථ යෑයි ග්‍රන්ථයෝ සතර දෙනෙක් වෙති: ස්වකීය දෘෂ්ටිය පිළිබඳ ඡන්දරාගය 'අභිධ්‍යාකායග්‍රන්ථ' නම, පරවාදයන්හි කෝපය නො සතුට 'ව්‍යාපාදකායග්‍රන්ථ' නම, තමාගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය හෝ පරාමර්ශ කෙරෙත් නුයි 'ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ' නම, තමාගේ දෘෂ්ටිය 'ඉදංසත්‍යාභිනිවේශකායග්‍රන්ථ' නමි. කවර කරුණෙකින් 'ආදානගන්ථ' යි කියනු ලැබෙයි? යත්: මෙ කියන ලද අභිධ්‍යාදි නාමකායග්‍රන්ථයන් හෙතු කොටගෙන චතුසමුච්ඡාතිකරූපාරම්මණය ආදානය කෙරෙති උපාදානය (=දැඩි කොට ගැනීම) කෙරෙති තෘෂ්ණාග්‍රහණයෙන් ගනිති, දෘෂ්ටිග්‍රහණයෙන් පරාමර්ශ කෙරෙති, මානග්‍රහණයෙන් අභිනිවේශය කෙරෙත්. වේදනාව සංඥාව සංස්කාරයන් විඥානය ගතිය උත්පත්තිය ප්‍රතිසන්ධිය භවය සංසාරවර්ත්තනය ආදානය කෙරෙති උපාදානය කෙරෙති ග්‍රහණය කෙරෙති පරාමර්ශ කෙරෙති අභිනිවේශය කෙරෙත්. එ කරුණෙන් 'ආදානග්‍රන්ථ' යි කියනු ලැබේ. **විසජ්ජ** - ග්‍රන්ථ (බන්ධන) යන් මොනොවට විසුරුවා හෝ හැර, නොහොත් බන්ධනයන් ග්‍රන්ථනයන් බන්ධයන් විබන්ධයන් ආබන්ධ-(=අනෙකවිධබන්ධ) යන් ලග්න වූවන් ලග්ගිත වූවන් හාත්පසින් බද්ධ-වූවන් බන්ධනයන් පොළා දුරු කොට; යම් සේ වාහනයක් හෝ රථයක් හෝ ගැලක් හෝ යානයක් හෝ ගලවා අපරිභොග කෙරෙත් ද සුණු කෙරෙත් ද, එසෙයින් ම කායග්‍රන්ථයන් විසුරුවා හෝ දුරු කොට, නොහොත් ග්‍රන්ථ(=බන්ධන)යන්...හාත්පසින් බද්ධ වූවන් බන්ධනයන් පොළා දුරුකොට නුයි 'ආදානගන්ථං ගථිතං විසජ්ජ' යනු වේ.

**ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙති** – ආසා වුච්චති තණ්හා යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **ආසං න කුබ්බන්තීති** ආසං න කුබ්බන්ති න ජනෙන්ති න සඤ්ජනෙන්ති න නිබ්බත්තෙන්ති න අභිනිබ්බත්තෙන්ති; **කුහිඤ්චීති** කුහිඤ්චි කිම්හිචි අජ්ඣත්තං වා බහිද්ධා වා; අජ්ඣත්තබහිද්ධා වා; **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති 'ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ.'

තෙනාහ භගවා:

> "න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
> අච්චන්තසුද්ධීති න තෙ වදන්ති,
> ආදානගන්ථං ගථිතං විසජ්ජ
> ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ"ති.

## 4 – 8

> සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි
> ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතං,
> න රාගරාගී[1] න විරාගරත්තො
> තස්සීධ නත්ථි පරමුග්ගහීතං.

**සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතන්ති** – 'සීමා'ති චතස්සො සීමායො: සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො තදෙකට්ඨා ච කිලෙසා, අයං පඨමා සීමා. ඔළාරිකං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඔළාරිකො කාමරාගානුසයො පටිඝානුසයො තදෙකට්ඨා ච කිලෙසා, අයං දුතියා සීමා. අනුසහගතං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං අනුසහගතො කාමරාගානුසයො පටිඝානුසයො තදෙකට්ඨා ච කිලෙසා, අයං තතියා සීමා. රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො තදෙකට්ඨා ච කිලෙසා, අයං චතුත්ථා සීමා.[2] යතො ච චතූහි අරියමග්ගෙහි ඉමා චතස්සො සීමායො අතික්කන්තො හොති සමතික්කන්තො වීතිවත්තො, සො වුච්චති සීමාතිගො. **බ්‍රාහ්මණොති** – සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො; සක්කායදිට්ඨි බාහිතා හොති, විචිකිච්ඡා බාහිතා හොති, සීලබ්බතපරාමාසො බාහිතො හොති -පෙ- අසිතො[3] තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා. **තස්සාති** – අරහතො ඛීණාසවස්ස; **ඤත්වාති** – පරචිත්තඤාණෙන වා ඤත්වා, පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා ඤත්වා; **දිස්වාති** – මංසචක්ඛුනා වා දිස්වා, දිබ්බචක්ඛුනා වා දිස්වා; '**සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහීත'න්ති** – තස්ස ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං[4] පාමොක්ඛං උත්තමං පවරන්ති, ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අධිමුත්තං නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති 'සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතං.'

---

1. රාගරජී – සුති අ.
2. චතුත්ථ සීමා PTS.
3. අතිස්සිතො – ස්‍යා, මජසං.
4. විසිට්ඨං – මජසං.

**ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ** – 'ආසා' යි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභඅකුශලමූලයෙක් වේ ද එයයි. **ආසං න කුබ්බන්ති** – ආශා නො කෙරෙති නො දනවති නූපදවති වෙසෙසින් නූපදවත්. **කුහිඤ්චි** – අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ කිසි තැනෙක්හි කොහිත්; **ලොකෙ** – අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි 'ආසං න කුබ්බන්ති කුහිඤ්චි ලොකෙ' යනු වේ.

එයින් වදාලහ බුදුහු:

"න කප්පයන්ති-පෙ-කුහිඤ්චි ලොකෙ"යි.

## 4 – 8.

ඒ භූරිප්‍රාඥ වූ ක්ෂීණාස්‍රව තෙමෙ චතුර්විධ කෙලශසීමාව ඉක්මවූයේ යැ, බාහිතපාපී හෙයින් බ්‍රාහ්මණ යැ, ඒ ක්ෂීණාශ්‍රව හට පරසිත් දත්නා නුවණින් පෙර විසූ කඳපිළිවෙළ දත්නා නුවණින් දැන හෝ මසැසින් හා දිවැසින් දැක හෝ මොනොවට බැස ගත්තා ලද්දක් නැත. තවද හෙතෙම කාමරාගයෙන් රාගවත් නො වෙයි. රූපාරූපරාග සඞ්ඛ්‍යාත විරාගයෙන් රක්ත වූයේ නොමෙ යි. ඔහුට මෙලොවැ උතුමැයි දැඩිව ගත්තා ලද කිසිවක් නැත්තේ යි.

**සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහිතං** – 'සීමා' යනු: සතර සීමාවෙකි: සත්කායදෘෂ්ටි යැ විචිකිත්සා යැ ශීල-ව්‍රතපරාමර්ශ යැ දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ ඔවුන් හා (සහජෙකාර්‍ය්‍ය විසින්) එක් වැ සිටි කෙලශයෝ යැ යන මේ ප්‍රථම සීමා යැ; ඖදාරික වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ, ඖදාරික වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ, ඔවුන් හා එක් වැ සිටි කෙලශයෝ යැ යන මෝ තොමෝ දෙවැනි සීමා යැ; අනුසහගත වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ, අනුසහගත වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ, ඔවුන් හා එක් වැ සිටි කෙලශයෝ යැ යන මෝ තොමෝ තෙවැනි සීමා යැ; රූපරාග යැ අරූපරාග යැ මාන යැ ඖද්ධත්‍ය යැ අවිද්‍යා යැ, මානානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යැ, ඔවුන් හා සහජෙකාර්‍ය්‍ය විසින්. එක් වැ සිටි කෙලශයෝ යැ යන මෝ තොමෝ සතරවැනි සීමා යි. සතර ආර්‍ය්‍යමාර්ගයෙන් මේ සතර කෙලෙස් සීමාවන් ඉක්මවූ වෙසෙසින් ඉක්මවූ අත්‍යන්තයෙන් ඉක්මවූ තැන් සිට හෙතෙම 'සීමාතිග' යයි කියනු ලැබේ. **බ්‍රාහ්මණො** – සප්තධර්ම කෙනකුන් බාහිත වන බැවින් 'බ්‍රාහ්මණ' යැ; සත්කායදෘෂ්ටිය බාහිත වෙයි, විචිකිත්සාව – ශීලව්‍රතපරාමර්ශය බාහිත වෙයි...තෘෂ්ණාදෘෂ්ටීන් අනිශ්‍රිත වූ අවලෝදගම්භී තාදී වූ හෙතෙම 'බ්‍රාහ්මණ' යයි කියනු ලැබේ. **තස්ස** – රහත් හට ක්ෂීණාශ්‍රවහට; **ඤත්වා** – පරචිත්තඥාන-යෙන් හෝ දැන පූර්වනිවාසානුස්මෘති ඥානයෙන් හෝ දැන; **දිස්වා** – මසැසින් හෝ දැක, දිවැසින් හෝ දැක; "සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහිතං" – ඔහුට මේ පරම යැ අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ වෙසෙසින් ශ්‍රෙෂ්ඨ යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි ගත්තා ලද පරාමෘෂ්ට වූ අභිනිවෙශය කළ අධ්‍යවසිත වූ අධිමුක්ත වූවක් නැත, අවිද්‍යමාන යැ නො ලැබෙයි ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ ව්‍යුපශාන්ත යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධ යැ අභව්‍යොත්පත්තික යැ ඥානාග්නීන් දග්ධ නුයි 'සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි ඤත්වා ච දිස්වා ච සමුග්ගහිතං' යනු වේ.

**න රාගරාගී න විරාගරත්තොති** – රාගරත්තා වුච්චන්ති යෙ පඤ්චසු කාමගුණෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා; විරාගරත්තා වුච්චන්ති යෙ රූපාවචරඅරූපාවචරසමාපත්තීසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා; 'න රාගරාගී න විරාගරත්තො'ති යතො කාමරාගො ච රූපරාගො ච අරූපරාගො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා[1] ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතා 'න රාගරාගී න විරාගරත්තො.'

**තස්සීධ නත්ථි පරමුග්ගහීතන්ති** – 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස; තස්ස ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති 'තස්සීධ නත්ථි පරමුග්ගහීතං.'

තෙනාහ භගවා:

"සීමාතිගො බ්‍රාහ්මණො තස්ස නත්ථි
ඤත්වා ච දිස්වා ච සමුග්ගහීතං,
න රාගරාගී න විරාගරත්තො
තස්සීධ නත්ථි පරමුග්ගහීතං"න්ති.

**සුද්ධට්ඨකසුත්තනිද්දෙසො චතුත්ථො.**

## 5

## පරමට්ඨකසුත්තනිද්දෙසො

අථ පරමට්ඨකසුත්තනිද්දෙසො වුච්චති.[2]

### 5 – 1

පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො
යදුත්තරිං කුරුතෙ[3] ජන්තු ලොකෙ,
හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ
තස්මා විවාදානි අවීතිවත්තො.

**පරමන්ති දිට්ඨීසු පරිබ්බසානොති** – සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා, තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා[4] වසන්ති[5] ආවසන්ති පරිවසන්ති, යථා අගාරිකා වා ඝරෙසු වසන්ති, සාපත්තිකා වා ආපත්තීසු වසන්ති, සකිලෙසා වා කිලෙසෙසු වසන්ති, එවමෙව සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා, තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා[4] වසන්ති ආවසන්ති පරිවසන්තීති 'පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො.'

1. අනභාවං ගතා - සයා.
2. සුත්තං වක්ඛති - සීමු. II.
3. යදුත්තරි කුරුතෙ - මනුප.
4. සකායදිට්ඨියා - සයා.
5. පවසන්ති - මජසං.

**න රාගරාගී න විරාගරත්තො** – පස්කම්ගුණයෙහි ඇලුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු ඇතුළත් වූවාහු ලැගුණාහු ඇවුරුණාහු 'රාගරත්ත' යයි කියනු ලැබෙති; රූපාරූ සමවත්හි ඇලුණාහු...ඇවුරුණාහු 'විරාගරත්ත' යයි කියනු ලැබෙත්. 'න රාගරාගී න විරාගරත්තො' – යම් තැනෙක සිට කාමරාගය ත් රූපරාගය ත් අරූපරාගය ත් ප්‍රහීණ වූවාහු වෙත් ද, උපුටා හල මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අභාවය කරන ලද්දාහු නැවත නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද; මෙතෙකින් 'න රාගරාගී න විරාගරත්ත' නම් වේ.

**තස්සීධ නත්ථි පරමුග්ගහීතං** – 'තස්ස' – රහත් හට, ක්ෂීණාස්‍රව හට; ඔහුට මේ පරම යැ අග්‍ර යැ ශ්‍රේෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි ගෘහීත වූ පරාමෘෂ්ට වූ අභිනිවිෂ්ට වූ අධ්‍යවසිත වූ අධිමුක්ත වූවක් නැත අවිද්‍යමාන යැ, නො ලැබෙයි ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ ව්‍යුපශාන්ත යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධ යැ අභව්‍යොත්පත්තික යැ ඥානාග්නියෙන් දග්ධ නුයි – 'තස්සීධ නත්ථි පරමුග්ගහීතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු: 'සීමාතිගො–පෙ–පරමුග්ගහීතං''යි.

**සතරවැනි සුද්ධට්ඨක සූත්‍රනිද්දේශය යි.**

# 5

# පරමට්ඨකසුත්‍රනිද්දේශය

ඉක්බිති පරමට්ඨකසුත්‍රනිද්දේශය කියනු ලැබේ.

**5 – 1.**

ලොවැ යම් සත්ත්වයෙක් දෙසැට දිට්ඨි අතුරෙන් එක්තරා දෘෂ්ටියක් මේ පරම යැයි ගෙන තමන් තමන් ගේ දෘෂ්ටියෙහි ඇතුළත් වැ වසනුයේ යම් හෙයකින් තමා ගේ ශාස්තෘ ආදිය උතුම්යැයි කියා ද, එයින් අන්‍ය වූ සියල්ල හීන යැයි කියා ද, එහෙයින් හෙතෙම දෘෂ්ටිවිවාදයන් නො ඉක්මැ වූයේ වේ.

**පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො** – දෘෂ්ටි ගෙන සිටුනා ඇතැම් මහණ බමුණුකෙනෙක් වෙති, ඔවුහු දෙසැට දෘෂ්ටිගතයන් අතුරෙන් එක්තරා–දෘෂ්ටියක් මේ පරම යැ අග්‍ර යැ ශ්‍රේෂ්ඨ යැ විශිෂ්ට යැ ප්‍රධාන යැ උත්තම යැ ප්‍රවර යැයි ගෙන දැඩි වැ ගෙන ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවේශය කොට තමන් තමන් ගේ දෘෂ්ටියෙහි වෙසෙති වෙසෙසින් වෙසෙති හාත්පසින් වෙසෙත්; යම් සේ ගිහියෙ වැසියෝ තමන් ගේ ගෙවල (නිසැකව) වෙසෙත් ද, අංපත්ති බහුල වූවෝ ඇවැත්හි වෙසෙත් ද, කෙලෙස් බහුලයෝ කෙලෙස්හි පිවිසැ වෙසෙත් ද, එසෙයින් මැ දෘෂ්ටි ගෙන සිටුනා ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහ; ඔවුහු දෙසැට දෘෂ්ටිගතයන් අතුරෙන් එක්තරා දෘෂ්ටියක් 'මේ පරම යැ අග්‍ර යැ...ප්‍රවර ය'යි ගෙන... අභිනිවේශය කොට තමන් තමන් ගේ දෘෂ්ටියෙහි වෙසෙති පිවිසැ වෙසෙති ඝනීකාරයෙන් වෙසෙත් නුයි 'පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො' යනු වේ.

**යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙති** - 'යදු' ති[1] යං; **උත්තරිං කුරුතෙති** - උත්තරිං කරොති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති - අයං සත්ථා සබ්බඤ්ඤූති උත්තරිං කරොති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති. අයං ධම්මො ස්වාක්ඛාතො, අයං ගණො සුපටිපන්නො, අයං දිට්ඨි භද්දිකා, අයං පටිපදා සුපඤ්ඤත්තා, අයං මග්ගො නිය්‍යානිකොති උත්තරිං කරොති අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං කරොති නිබ්බත්තෙන්ති; අභිනිබ්බත්තෙන්ති; **ජන්තූති** සත්තො නරො -පෙ- මනුජො; **ලොකෙති** අපායලොකෙ -පෙ-ආයතනලොකෙති 'යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ.'

**හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහාති** - අත්තනො සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං ඨපෙත්වා සබ්බෙ පරවාදෙ[2] ඛිපති උක්ඛිපති පරික්ඛිපති: සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුපටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, න තත්ථ[3] සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා, නත්ථෙත්ථ සුජ්ඣන්ති වා විසුජ්ඣන්ති වා පරිසුජ්ඣන්ති වා, මුච්චන්ති වා, විමුච්චන්ති වා පරිමුච්චන්ති වා, හීනා නිහීනා ඔමකා ලාමකා ඡත්තකා[4] පරිත්තාති එවමාහ එවං කථෙති එවං භණති එවං දීපයති එවං වොහරතීති 'හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ.'

**තස්මා විවාදානි අවීතිවත්තොති** -'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා; **විවාදානීති** දිට්ඨිකලහානි දිට්ඨිභණ්ඩනානි දිට්ඨිවිග්ගහානි දිට්ඨිවිවාදානි දිට්ඨිමෙධගානි; **අවීතිවත්තොති** - අනතික්කන්තො අසමතික්කන්තො අවීතිවත්තොති තස්මා විවාදානි අවීතිවත්තො.

තෙනාහ භගවා:

"පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො
යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ,
හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ
තස්මා විවාදානි අවීතිවත්තො"ති.

## 5 - 2

යදත්තනී පස්සති ආනිසංසං
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා,
තදෙව සො තත්ථ සමුග්ගහාය
නිහීනතො පස්සති සබ්බමඤ්ඤං.

---

1. යදත්ති - සී . II.   2. පරප්පවාදෙ - සීමු. II.
3. තත්ථ - සීමු. II.   4. ජතුක්කා - I. සීමු. I.

**යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ** - 'යද' යනු යම් හෙයකින්; **උත්තරිං කුරුතෙ** - අතිරේක කෙරෙයි, අග්‍ර - ශ්‍රේෂ්ඨ - විශිෂ්ට - ප්‍රමුඛ - උත්තම-ප්‍රවර කෙරෙයි: 'මේ ශාස්තෘ තෙමේ සර්වඥ ය'යි අතිරේක කෙරෙයි... ප්‍රවර කෙරෙයි 'මේ ධර්මය ස්වාඛ්‍යාත යැ, මේ ගණ තෙමේ සුප්‍රතිපන්න යැ, මේ දෘෂ්ටි තොමෝ භද්‍ර වූ යැ, මේ ප්‍රතිපදා තොමෝ සුප්‍රඥප්ත යැ, මේ මාර්ගය නෛර්යාණික යැ'යි අතිරේක කෙරෙයි, අග්‍ර...ප්‍රවර කෙරෙයි, නිපදවයි වෙසෙසින් නිපදවයි; **ජන්තු** - සත්ත්ව නර...මනුජ තෙමේ; **ලොකෙ** - අපායලෝකයෙහි...ආයතනලෝකයෙහි නුයි 'යදුත්තරිං කුරුතෙ ජන්තු ලොකෙ' යනු වේ.

**හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ** - තමා ගේ ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය තබා සියලු පරවාදයන් හැරදමයි බැහැර කෙරෙයි පරාඞ්මුඛ කෙරෙයි: 'ඒ ශාස්තෘ සර්වඥ නො වෙයි, ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි, ගණයා සුප්‍රතිපන්න නො වෙයි, දෘෂ්ටිය භද්‍ර නො වෙයි ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි, මාර්ගය නෛර්යාණික නො වෙයි, මෙහි ශුද්ධියක් විශුද්ධියක් පරිශුද්ධියක් හෝ මුක්තියක් විමුක්තියක් පරිමුක්තියක් හෝ නැත; එහි පැවිද්දෙත් ශුද්ධ - විශුද්ධ - පරිශුද්ධ හෝ නො වෙති, මුක්ත - විමුක්ත පරිමුක්ත හෝ නො වෙත්; හීන - නිහීන - ඔමක - ලාමක වූවාහ, හරන ලද්දාහ, අල්ප වූවාහ'යි මෙසේ කියයි, මෙසේ බණෙයි, මෙසේ දක්වයි, මෙසේ ව්‍යවහාර කෙරේ නුයි 'හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ' යනු වේ.

**තස්මා විවාදානි අවීතිවත්තො** - 'තස්මා' යනු: එහෙයින් එ කාරණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන්; **විවාදානි** දෘෂ්ටිකලහයන් දෘෂ්ටිභණ්ඩනයන් දෘෂ්ටිවිග්‍රහයන් දෘෂ්ටිවිවාදයන් දෘෂ්ටිමෙධගයන්; **අවීතිවත්තො** - නො ඉක්මැ වූයේ මොනොවට නො ඉක්මැ වූයේ බැහැර නො කෙළේ නුයි 'තස්මා විවාදානි අවීතිවත්තො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පරමන්ති දිට්ඨීසු-පෙ-අවීතිවත්තො"යි.

**5 - 2**

මෙසේ දෘෂ්ටිකලහයන් නො ඉක්මැවූයේ රූපාලම්බනයෙහි ද ශබ්දාලම්බනයෙහි ද ශීලව්‍රත දෙක්හි ද ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි ද උපන් දෘෂ්ටිසඞ්ඛ්‍යාත වූ ආත්මයෙහි උක්තප්‍රකාර වූ යම් අනුසසක් දකී ද, හෙතෙම ස්වකීය දෘෂ්ටියෙහි ඒ අනුසස ම ශ්‍රේෂ්ඨ යයි දැඩිව ගෙන පරශාස්තෘ ආදි අන් සියල්ල නිහීන හෙයින් දක්නේ යි.

**යදත්තනි පස්සති ආනිසංසං දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වාති** – 'යදත්තනී'ති යං අත්තනි, අත්තා වුච්චති දිට්ඨිගතං, අත්තනො දිට්ඨියා ද්වෙ ආනිසංසෙ පස්සති: දිට්ඨධම්මිකඤ්ච ආනිසංසං සම්පරායිකඤ්ච ආනිසංසං. කතමො දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො? යංදිට්ඨිකො සත්ථා හොති, තංදිට්ඨිකා සාවකා හොන්ති, තංදිට්ඨිකං සත්ථාරං සාවකා සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති. ලභන්ති ච තතොනිදානං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං. අයං දිට්ඨියා දිට්ඨධම්මිකො ආනිසංසො. කතමො දිට්ඨියා සම්පරායිකො ආනිසංසො? අයං දිට්ඨි අලං නාගත්තාය වා සුපණ්ණත්තාය වා යක්ඛත්තාය වා අසුරත්තාය වා ගන්ධබ්බත්තාය වා මහාරාජත්තාය වා ඉන්දත්තාය වා බ්‍රහ්මත්තාය වා දෙවත්තාය වා, අයං දිට්ඨි අලං සුද්ධියා විසුද්ධියා පරිසුද්ධියා මුත්තියා විමුත්තියා පරිමුත්තියා, ඉමාය දිට්ඨියා සුජ්ඣන්ති විසුජ්ඣන්ති පරිසුජ්ඣන්ති මුච්චන්ති විමුච්චන්ති පරිමුච්චන්ති, ඉමාය දිට්ඨියා සුජ්ඣිස්සාමි විසුජ්ඣිස්සාමි පරිසුජ්ඣිස්සාමි මුච්චිස්සාමි විමුච්චිස්සාමි පරිමුච්චිස්සාමීති ආයතිං ඵලපාටිකඞ්ඛී හොති. අයං දිට්ඨියා සම්පරායිකො ආනිසංසො. අත්තනො දිට්ඨියා ඉමෙ ද්වෙ ආනිසංසෙ පස්සති. දිට්ඨසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති – සුතසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති – සීලසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති – වතසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති – මුතසුද්ධියාපි ද්වෙ ආනිසංසෙ පස්සති: දිට්ඨධම්මිකඤ්ච ආනිසංසං සම්පරායිකඤ්ච ආනිසංසං. කතමො මුතසුද්ධියා දිට්ඨධම්මිකො ආනිසංසො? යංදිට්ඨිකො සත්ථා හොති, තංදිට්ඨිකා සාවකා හොන්ති –පෙ– අයං මුතසුද්ධියා දිට්ඨධම්මිකො ආනිසංසො. කතමො මුතසුද්ධියා සම්පරායිකො ආනිසංසො? අයං දිට්ඨි අලං නාගත්තාය වා –පෙ– අයං මුතසුද්ධියා සම්පරායිකො ආනිසංසො. මුතසුද්ධියාපි ඉමෙ ද්වෙ ආනිසංසෙ පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති 'යදත්තනී පස්සති ආනිසංසං දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා.'

**තදෙව සො තත්ථ සමුග්ගහායාති** – 'තදෙවා'ති තං දිට්ඨිගතං; **තත්ථා**ති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා; **සමුග්ගහායා**ති – ඉදං පරමං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති තදෙව සො තත්ථ සමුග්ගහාය. **නිහීනතො පස්සති සබ්බමඤ්ඤ**න්ති – අඤ්ඤං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ජතුක්කතො[1] පරිත්තතො දිස්සති පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති 'නිහීනතො පස්සති සබ්බමඤ්ඤං.'

තෙනාහ භගවා:

"යදත්තනී පස්සති ආනිසංසං
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා,
තදෙව සො තත්ථ සමුග්ගහාය
නිහීනතො පස්සති සබ්බමඤ්ඤ"න්ති.

1. ජතුක්කතො - සීමු. II ඡතුක්කතො - මජසං.

**යදත්තනි පස්සති ආනිසංසං දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා** - 'යදත්තනි - යං අත්තනි'. 'ආත්ම' යි දෘෂ්ටිගතය කියනු ලැබෙයි. ස්වකීය දෘෂ්ටියෙහි දෙ අනුසසක් දකී: දෘෂ්ටධාර්මික ආනෘශංසය ද සාම්පරායික ආනෘශංසය ද කියායි. දෘෂ්ටියෙහි දෘෂ්ටධාර්මික ආනෘශංසය කවරු යත්? ශාස්තෘ තෙමේ යම් දෘෂ්ටියක් ඇත්තේ වේ නම්, ශ්‍රාවකයෝ එබඳු දෘෂ්ටි ඇත්තාහු වෙති, ශ්‍රාවකයෝ ඒ දෘෂ්ටිය ඇති ශාස්තෘ හට සත්කාර කෙරෙති ගරු කෙරෙති බුහුමන් කෙරෙති පුදත්. එහෙයින් සිවුරු පිඩුවා සෙනසුන් ගිලන්පසඃබෙහෙත්පිරිකර ද ලබයි, මේ (දෘෂ්ටි පිළිබඳ) ඉහාත්මයෙහි විපාක දෙන අනුසසි. දෘෂ්ටියෙහි සාම්පරායික ආනෘශංසය කවරු යත්? මේ දෘෂ්ටිය (පරලොවෙහි විපාක දෙන) නාගබවට හෝ ගුරුළුබවට හෝ යක්බවට හෝ අසුරබවට හෝ ගඳෙව්බවට හෝ වරම්රජබවට හෝ ශක්‍රබවට හෝ බ්‍රහ්මබවට හෝ දෙවිබවට හෝ පමණ වෙයි, මේ දෘෂ්ටිය ශුද්ධියට විශුද්ධියට පරිශුද්ධියට මුක්තියට විමුක්තියට පරිමුක්තියට ප්‍රමාණ වෙයි, මේ දෘෂ්ටියෙන් සත්ත්වයෝ ශුද්ධ - විශුද්ධ - පරිශුද්ධ වෙති, මුක්ත - විමුක්ත - පරිමුක්ත වෙත්. මේ දෘෂ්ටියෙන් ශුද්ධ - විශුද්ධ - පරිශුද්ධ වෙමි, මුක්ත - විමුක්ත - පරිමුක්ත වෙමි අනාගතයෙහි විපාකඵලය පතන්නේ වෙයි, මේ දෘෂ්ටිය පිළිබඳ පරලොව දී ලැබියයුතු අනුසසි. තමා ගේ දෘෂ්ටියෙහි මේ දෙ අනුසස් දකී. චක්ෂුර්විඥානයෙන් දුටු රූපායතනවශයෙන් ශුද්ධිය හෙතු කොටගෙන ද අනුසස් දෙකක් දකී, ශබ්දායතනශුද්ධියෙන් ද...ශීලශුද්ධියෙන් ද...ව්‍රතශුද්ධියෙන් ද ...ගන්ධරසස්පෘෂ්ටව්‍යායතනසුද්ධියෙන් ද අනුසස් දෙකක් දකී: දෘෂ්ටධාර්මික ආනෘශංසය ද සාම්පරායික ආනෘශංසය ද කියායි. මුතශුද්ධියෙහි දිට්ඨධම්මික (=ඉහාත්මයෙහි) ආනිසංසය කවරු යත්? ශාස්තෘ තෙමේ යම් දෘෂ්ටියක් ඇත්තේ නම් ශ්‍රාවකයෝ ඒ දෘෂ්ටිය ඇත්තාහු වෙති...මේ යැ මුතශුද්ධියෙහි ඉහාත්ම ආනෘශංසය. මුතශුද්ධියෙහි සාම්පරායික ආනෘශංසය කවරු යත්? මේ දෘෂ්ටි තොමෝ පරලොවැ නාගභාවයට පමණ යැ...මේ මුතශුද්ධියෙහි සාම්පරායික ආනෘශංසය යි. මුතශුද්ධියෙහි මේ අනුසස් දෙක බලයි දකියි අවලොකනය කෙරෙයි සිතයි විමසා නුයි 'යදත්තනි පස්සති ආනිසංසං දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා' යනු වේ.

**තදෙව සො තත්ථ සමුග්ගහාය** - 'තදෙව' යනු: ඒ දෘෂ්ටිගතය; **තත්ථ** - ස්වකීය දෘෂ්ටියෙහි - කැමැත්තෙහි - රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි; **සමුග්ගහාය** - මෙය පරම ය අග්‍ර ය ශ්‍රෙෂ්ඨ ය විශිෂ්ට ය ප්‍රධාන ය උත්තම ය ප්‍රවර යයි ගෙන දැඩි වැ ගෙන ග්‍රහණය කොට පරාමර්ශනය කොට අභිනිවෙශ කොට නුයි 'තදෙව සො තත්ථ සමුග්ගහාය' යනු වේ.

**නිහීනතො පස්සති සබ්බමඤ්ඤං** - අන්‍ය ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා ලබ්ධිය ප්‍රතිපදාව මාර්ගය හීනහෙයින් නිහීනහෙයින් පහත් හෙයින් ලාමකහෙයින් ප්‍රත්‍යයහීන හෙයින් අල්ප හෙයින් බලයි දකී අවලොකනය කෙරෙයි සිතයි විමසා නුයි 'නිහීනතො පස්සති සබ්බමඤ්ඤං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යදත්තනි පස්සති-පෙ-නිහීනතො පස්සති සබ්බමඤ්ඤං" යි.

5 - 3

තං[1] වාපි ගන්ථං[2] කුසලා වදන්ති
යන්නිස්සිතො පස්සති හීනමඤ්ඤං,
තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා
සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය.

**තං වාපි ගන්ථං කුසලා වදන්තීති** – 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ග-කුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා. තෙ කුසලා එවං වදන්ති: ගන්ථො[3] එසො, ලග්ගනං[4] එතං, බන්ධනං එතං, පලිබොධො එසොති එවං වදන්ති එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති – 'තං වාපි ගන්ථං කුසලා වදන්ති.'

**යං නිස්සිතො පස්සති හීනමඤ්ඤන්ති** – 'යං නිස්සිතො'ති යං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං නිස්සිතො සන්නිස්සිතො[5] අල්ලීනො උපගතො අජ්ඣොසිතො අධිමුත්තො; **පස්සති හීනමඤ්ඤන්ති** අඤ්ඤං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ජතුක්කතො[6] පරිත්තතො දිස්සති පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපනිජ්ඣායති උපපරික්ඛතීති – 'යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං.'

**තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍යාති**– 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා – දිට්ඨං වා දිට්ඨසුද්ධිං වා සුතං වා සුතසුද්ධිං වා මුතං වා මුතසුද්ධිං වා සීලං වා සීලසුද්ධිං වා වතං වා වතසුද්ධිං වා න නිස්සයෙය්‍ය න ගණ්හෙය්‍ය න පරාමසෙය්‍ය න අභිනිවිසෙය්‍යාති – 'තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය.'

තෙනාහ භගවා:

"තංවාපි ගන්ථං[7] කුසලා වදන්ති
යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං,
තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා
සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍යා"ති.

5 - 4

දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය
ඤාණෙන වා සීලවතෙන වාපි,
සමොති අත්තානමනූපනෙය්‍ය
හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි.

1. තං වාපි - ස්‍යා, මජසං. 2. ගණ්ඨං - මනුප. 3. ගණ්ඨො - මනුප.
4. ලග්ගනං - ස්‍යා. 5. අතිනිස්සිතො - මජසං
6. ජතුක්කතො - සීමු. II. ජතුක්කතො - මනුප. 7. ගණ්ඨං - මනුප.

## 5 - 3

මෙසේ දක්නේ තමාගේ යම් ශාස්තෘ ආදියක් ඇසිරැ කරන ලද්දේ නම්, එයින් අන්‍ය වූ පරශාස්තෘ ආදිය ලාමක කොට දක්නේය. ඒ දර්ශනය ද ස්කන්ධාදිය දැනීමෙහි නිපුණ වූවාහු බන්ධනයෙකැයි කියති. එහෙයින් ම මහණ තෙමේ රූපාලම්බනය හෝ ශබ්දාලම්බනය හෝ ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය හෝ ශීලව්‍රතසඞ්ඛ්‍යාත ධර්මාලම්බන හෝ ඇසුරැ නො කරන්නේ යි.

**තං වාපි ගන්ථං කුසලා වදන්ති** – ‘කුසලා’ යනු: යම් කෙනෙක් රූපාදි පඤ්චස්කන්ධයෙහි නිපුණ වූවාහු ද, ධාතු - ආයතන - ප්‍රතීත්‍යසමුත්පාද - සතිපට්ඨාන - සම්‍යක්ප්‍රධාන - ඍද්ධිපාද - ඉන්ද්‍රිය - බල - බොධ්‍යඞ්ග - මාර්ග - ඵල - නිර්වාණයෙහි නිපුණ වූවාහු ද, ඒ නිපුණයෝ මෙසේ කියති: (එසේ දක්නාවූත්ට) තෙල ග්‍රන්ථයෙක, තෙල (නාගදන්තයක මෙන්) යටට එල්බීමෙක, තෙල බන්ධයෙක, තෙල (සසරින් නික්මැ යා නො දෙන-හෙයින්) පලිබොධයෙකැයි මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි ‘තං වාපි ගන්ථං කුසලා වදන්ති’ යනු වේ.

**යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං** – ‘යං නිස්සිතො’ – යම් ශාස්තෘවක්හු ධර්මාඛ්‍යානයක් ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ඇසුරැ කෙළේ මොනොවට ඇසුරැ කෙළේ ඇලුණේ එල්‍ලැඹියේ ඇතුළත් වූයේ බැසගත්තේ වේ ද; **පස්සති හීනමඤ්ඤං** – අන්‍ය ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය හීනහෙයින් පහත්හෙයින් ලාමකහෙයින් ප්‍රත්‍යන්තහෙයින් අල්පහෙයින් බලයි දකී අවලොකනය කෙරෙයි සිතයි පුනපුනා සිතයි පිරික්සා නුයි ‘යං නිස්සිතො පස්සති හීනමඤ්ඤං’ යනු වේ.

**තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය** – ‘තස්මා’ – එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් රූපායතනය හෝ දෘෂ්ටශුද්ධිය හෝ ශබ්දායතනය හෝ ශ්‍රැතශුද්ධිය හෝ ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යායතනය හෝ මුතශුද්ධිය හෝ ශීලය හෝ ශීලශුද්ධිය හෝ ව්‍රතය හෝ ව්‍රතශුද්ධිය හෝ නො ඇසිරැ කරන්නේ ය නො ගන්නේ ය පරාමර්ශනය නො කරන්නේ ය අභිනිවෙශය නො කරන්නේ නුයි ‘තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා සීලබ්බතං භික්ඛු න නිස්සයෙය්‍ය’ යනු වේ.
එයින් වදාළහ බුදුහු:

“තං වාපි ගන්ථං කුසලං වදන්ති–පෙ–භික්ඛු න නිස්සයෙය්‍ය”යි.

## 5 - 4

හුදෙක් ඒ මහණ දෘෂ්ටි-ශ්‍රැතාදිය මතු නො ගන්නේ වෙයි. යළි ලොවැ නූපන් දෘෂ්ටිය ද සමාපත්ත්‍යාදිඥානයෙන් හෝ ශීලව්‍රතයෙන් හෝ නූපන්නේ ය. තවද ජාත්‍යාදිවස්තුයෙන් ‘මම සදෘශයෙමි’ තමා (මානවශයෙන්) නො සිතන්නේ ය, – හීනයෙමි’ ද නො සිතන්නේ යි.

**දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය ඤාණෙන වා සීලවතෙන වාපීති** අට්ඨසමාපත්තිඤාණෙන වා පඤ්චාභිඤ්ඤාඤාණෙන වා මිච්ඡාඤාණෙන වා සීලෙන වා වතෙන වා සීලබ්බතෙන වා දිට්ඨිං න කප්පයෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය; **ලොකස්මින්ති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති - දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය.

**ඤාණෙන වා සීලවතෙන වාපි සමොති අත්තානමනූපනෙය්‍යාති** සදිසොහමස්මීති අත්තානං න උපනෙය්‍ය ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති 'සමොති අත්තානමනූපනෙය්‍ය.'

**හීනො න මඤ්ඤෙථ විසෙසි වාපීති** - 'හීනොහමස්මී'ති අත්තානං න උපනෙය්‍ය[1] ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, 'සෙය්‍යොහමස්මී'ති අත්තානං න උපනෙය්‍ය[1] ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති 'හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි.'

තෙනාහ භගවා:

"දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය
ඤාණෙන වා සීලවතෙන වාපි,
සමොති අත්තානමනූපනෙය්‍ය
හීනො න මඤ්ඤෙථ විසෙසි වාපී"ති.

**5 - 5**

අත්තං පහාය අනුපාදියානො
ඤාණෙපි[2] සො නිස්සයං නො කරොති,
ස වෙ වියත්තෙසු න වග්ගසාරී
දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි.

**අත්තං පහාය අනුපාදියානොති** - 'අත්තං පහායා'ති අත්තදිට්ඨිං පහාය; 'අත්තං පහායා'ති අත්තගාහං පහාය; 'අත්තං පහායා'ති තණ්හාවසෙන දිට්ඨිවසෙන ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං පහාය පජහිත්වා විනොදයිත්වා[3] බ්‍යන්තිං කරිත්වා අනභාවං ගමෙත්වාති - අත්තං පහාය; **අනුපාදියානොති** චතූහි උපාදානෙහි අනුපාදියමානො අගණ්හමානො අපරාමසමානො අනභිනිවිසමානොති 'අත්තං පහාය අනුපාදියානො.

1. උපවදෙය්‍ය - සීමු II
2. මූ: ඤාණෙනාපි - සීමු II.
3. විනොදෙත්වා - ස්‍යා.

**දිට්ඨිම්පි ලෝකස්මිං න කප්පයෙය්‍ය ඤාණෙන වා සීලවතෙන වාපි** - අෂ්ටසමාපත්තිඥානයෙන් හෝ පඤ්චාභිඥඥානයෙන් හෝ විපරීතඥානයෙන් හෝ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ ශීලව්‍රතයෙන් හෝ දෘෂ්ටිය නූපදවත්තේ ය මොනොවට නූපදවත්තේ ය මැනවින් නූපදවත්තේ ය. **ලෝකස්මිං** - අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි 'දිට්ඨිම්පි ලොකස්මිං න කප්පයෙය්‍ය' යනු වේ.

**ඤාණෙන වා සීලවතෙන වාපි සමොති අත්තානං මනූපනෙය්‍ය** - 'මම සදෘශයෙමි, තමා ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණසෞන්දර්යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයකින් හෝ ශිල්පායතනයකින් හෝ විද්‍යාවකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභාණයෙන් හෝ අන්‍යතර අන්‍යතරවස්තුවෙකින් හෝ නො සිතත්තේ නුයි - 'සමොති අත්තානමනූපනෙය්‍ය' යනු වේ.

**හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි** - 'මම හීනයෙමි' තමා ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ නො සිතත්තේ ය, 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' තමා ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ නො සිතත්තේ නුයි - 'හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"දිට්ඨිම්පි ලොකස්මිං-පෙ-හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි"යි.

**5 - 5**

හෙතෙම (පෙර ගත්නා ලද) ආත්මලබ්ධිය ප්‍රහාණය කොට (අනෙකක් චතුරුපාදානයෙන්) නො ගත්තේ (උක්තප්‍රකාර) ඥානයෙහි පවා තෘෂ්ණා-දෘෂ්ටිනිඃශ්‍රය නො කෙරෙයි. (තවද) හෙතෙම එකාන්තයෙන් දෘෂ්ටිවශයෙන් වෙන් වැ ගිය සත්ත්වයන් කෙරෙහි (ඡන්දාදිවශයෙන්) නො යන ස්වභාව-ඇත්තේ වෙයි, හෙතෙම (දෙසැට දිට්ඨි අතුරෙන්) කිසි දෘෂ්ටියකට ද නො පැමිණෙන්නේ වේ.

**අත්තං පහාය අනුපාදියානො** - 'අත්තං පහාය' - ආත්මදෘෂ්ටිය ප්‍රහාණය කොට; **අත්තං පහාය** - ආත්මග්‍රාහය ප්‍රහාණය කොට; **අත්තං පහාය** - තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් ගත්නා ලද හාත්පසින් ආමර්ශනය කරන ලද අභිනිවේශය කරන ලද ඇතුළු වැ සිටි බැසගත්නා ලද (ආත්මලබ්ධිය) ප්‍රහාණය කොට දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අභාවයට පමුණුවා නුයි - 'අත්තං පහාය' යනු වේ. **අනුපාදියානො** - සතර උපාදානයන්ගෙන් උපාදානය නො කරනුයේ නො ගන්නේ පරාමර්ශනය නො කරනුයේ අභිනිවේශය නො කරනුයේ නුයි - 'අත්තං පහාය අනුපාදියානො' යනු වේ.

**ඤාණෙපි[1] සො නිස්සයං නො කරොතීති** අට්ඨසමාපත්තිඤාණෙ වා පඤ්චාභිඤ්ඤාඤාණෙ වා මිච්ඡාඤාණෙ[1] වා තණ්හානිස්සයං වා දිට්ඨිනිස්සයං වා න කරොති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතීති – 'ඤාණෙපි[1] සො නිස්සයං නො කරොති.'

**ස වෙ වියත්තෙසු න වග්ගසාරීති** ස වෙ වියත්තෙසු භින්නෙසු ද්වෙජ්ඣාපන්නෙසු ද්වෙළ්හකජාතෙසු නානාදිට්ඨිකෙසු නානාඛන්තිකෙසු නානාරුචිකෙසු නානාලද්ධිකෙසු නානාදිට්ඨිනිස්සයං නිස්සිතෙසු ඡන්දාගතිං ගච්ඡන්තෙසු දොසාගතිං ගච්ඡන්තෙසු මොහාගතිං ගච්ඡන්තෙසු භයාගතිං ගච්ඡන්තෙසු න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති; න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති සංහරීයතීති – 'ස වෙ වියත්තෙසු න වග්ගසාරී.'

**දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චීති** තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි; සො කිඤ්චි දිට්ඨිගතං න පච්චෙති න පච්චාගච්ඡතීති – 'දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි.'

තෙනාහ භගවා:

“අත්තං පහාය අනුපාදියානො
ඤාණෙපි[1] සො නිස්සයං නො කරොති,
ස වෙ වියත්තෙසු න වග්ගසාරී
දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චී”ති.

**5 - 6**

යස්සූභයන්තෙ පණිධීධ නත්ථි
භවාභවාය ඉධ වා හුරං වා,
නිවෙසනා තස්ස න සන්ති කෙචි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

---

1 ඤාණෙන වා – සීමු. II, මනුප.

**ඤාණම්පි සො නිස්සයං නො කරොති** - අෂ්ටසමාපත්තිඥානයෙහි හෝ පඤ්චාභිඥාඥානයෙහි හෝ මිථ්‍යාඥානයෙහි හෝ තෘෂ්ණානිඃශ්‍රය හෝ දෘෂ්ටිනිඃශ්‍රය හෝ නො කෙරෙයි නො දනවයි සඤ්ජනනය නො කෙරෙයි නුපදවයි වෙසෙසින් නුපදවා නුයි - 'ඤාණම්පි සො නිස්සයං නො කරොති' යනු වේ.

**ස වෙ වියත්තෙසු න වග්ගසාරී** - හෙතෙම එකාන්තයෙන් ව්‍යස්ත වූ භින්න වූ දෙකට බෙදුණු හටගත් සැක ඇති නානාදෘෂ්ටිකයන් කෙරෙහි නානාඛන්තිකයන් - නානාරුචිකයන් - නානාලබ්ධිකයන් කෙරෙහි නානාදෘෂ්ටිනිඃශ්‍රය ඇසුරු කළවුන් කෙරෙහි ඡන්දයෙන් අගතියට යනුවත්, ද්වෙෂයෙන් - මොහයෙන් - භයින් අගතියට යනුවත් කෙරෙහි ඡන්දාගතියට - ද්වෙෂාගතියට - මොහාගතියට - භයාගතියට නො යෙයි, රාගවශයෙන් නො පැමිණෙයි, ද්වෙෂවශයෙන් - මොහවශයෙන් - මාන-වශයෙන් - දෘෂ්ටිවශයෙන් - ඖද්ධත්‍යවශයෙන් - විචිකිත්සාවශයෙන් - අනුශයවශයෙන් නො පැමිණෙයි, (ඡන්දාදිවශයෙන්) පැමිණෙන ධර්මයන් ගෙන් නො යැවෙයි නො පමුණුවනු ලැබෙයි වගනය සංහරණය නො කරනු ලැබේ නුයි - 'ස වෙ වියත්තෙසු න වග්ගසාරී' යනු වේ.

**දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි** - ඔහු විසින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහුය, මොහොවට සිඳින ලද්දාහුය, සන්හිඳුවන ලද්දාහුය, දුරලන ලද්දාහුය, උපතට නුසුදුසු කරන ලද්දාහුය, නුවණ-ගින්නෙන් දවන ලද්දාහුය; හෙතෙම කිසි දෘෂ්ටිගතයකට නො පැමිණෙයි, පෙරලා නො පැමිණේ නුයි - 'දිට්ඨිම්පි සො න පච්චෙති කිඤ්චි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අත්තං පහාය-පෙ-සො න පච්චෙති කිඤ්චි" යි.

**5 - 6**

යම් ක්ෂීණාස්‍රවයක් හට (පෙර කියන ලද) ඵස්ස-ඵස්සසමුදයාදි භෙද වූ උභයාන්තයෙහි ද පුනපුනා භවය පිණිස ද ස්වාත්මභාවයෙහි හෝ පරාත්මභාවයෙහි ද තෘෂ්ණා නැත්තේ ද, ඒ ක්ෂීණාශ්‍රවහට කිසි තෘෂ්ණාදෘෂ්ටිනිවෙසන කෙනෙක් නො වෙති; දෙසැටදිට්ඨුදහම්හි නිශ්චය කොට දැඩි ව ගන්නා ලද්දෙක් නැත්තේ යි.

**යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වාති** – ‘**යස්සාති**’ අරහතො ඛීණාසවස්ස, **අන්තාති** ඵස්සො එකො අන්තො, ඵස්සසමුදයො දුතියො අන්තො; අතීතො එකො අන්තො, අනාගතො දුතියො අන්තො; සුඛා වෙදනා එකො අන්තො, දුක්ඛා වෙදනා දුතියො අන්තො; නාමං එකො අන්තො, රූපං දුතියො අන්තො; ඡ අජ්ඣත්තිකානි ආයතනානි එකො අන්තො, ඡ බාහිරානි ආයතනානි දුතියො අන්තො; සක්කායො එකො අන්තො, සක්කායසමුදයො දුතියො අන්තො; **පණිධි** වුච්චති තණ්හා යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **භවාභවායාති** භවාභවාය කම්මභවාය පුනබ්භවාය, කාමභවාය කම්මභවාය, කාමභවාය පුනබ්භවාය, රූපභවාය කම්මභවාය, රූපභවාය පුනබ්භවාය, අරූපභවාය කම්මභවාය, අරූපභවාය පුනබ්භවාය පුනප්පුනභවාය පුනප්පුන ගතියා පුනප්පුන උපපත්තියා පුනප්පුන පටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා; **ඉධාති** සකත්තභාවො; **හුරංති**[1] පරත්තභාවො; ඉධාති සකරූපවෙදනාසඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණං; හුරංති පරරූපවෙදනා-සඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණං; ඉධාති ඡ අජ්ඣත්තිකානි ආයතනානි; හුරංති ඡ බාහිරානි ආයතනානි; ඉධාති මනුස්සලොකො; හුරංති දෙවලොකො; ඉධාති කාමධාතු; හුරංති රූපධාතු අරූපධාතු; ඉධාති කාමධාතු රූපධාතු; හුරංති අරූපධාතු.

**යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වාති** ‘යස්ස’ උභො අන්තා ච භවාභවාය ච ඉධ හුරං ච පණිධි තණ්හා නත්ථි න සන්ති, න සංවිජ්ජති[2], නුපලබ්භති[3], පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වා.

**නිවෙසනා තස්ස න සන්ති කෙචීති** – ‘**නිවෙසනා**’ති ද්වෙ නිවෙසනා තණ්හානිවෙසනා ච දිට්ඨිනිවෙසනා ච -පෙ- අයං තණ්හානිවෙසනා -පෙ- අයං දිට්ඨිනිවෙසනා; **තස්සාති** අරහතො ඛීණාසවස්ස; ‘නිවෙසනා තස්ස න සන්ති කෙචී’ති නිවෙසනා තස්ස කෙචි නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – නිවෙසනා තස්ස න සන්ති කෙචි.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතන්ති** – ‘**ධම්මෙසූ**’ති ද්වාසට්ඨියා[4] දිට්ඨිගතෙසු; **නිච්ඡෙය්‍යාති** නිච්ඡිනිත්වා විනිච්ඡිනිත්වා පවිචිනිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **සමුග්ගහීතන්ති** ඔධිග්ගාහො බිලග්ගාහො වරග්ගාහො කොට්ඨාසග්ගාහො උච්චයග්ගාහො සමුච්චයග්ගාහො ඉදං සච්චං තච්ඡං තථං භූතං යාථාවං අවිපරීතන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪන්ති – ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

තෙනාහ භගවා:

“යස්සූභයන්තෙ පණිධීධ නත්ථි
භවාභවාය ඉධ වා හුරං වා,
නිවෙසනා තස්ස න සන්ති කෙචි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං”න්ති.

---

1. හුරන්ති - සීමු II. ස්‍යා.
2. නසංවිජ්ජන්ති - සීමු. II. මජ්සං.
3. නුපලබ්භන්ති - සීමු. II මජ්සං.
4. ද්වාසට්ඨි - සීමු I.

**යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වා** - **'යස්ස'** යනු: අගීත් වූ ක්ෂීණාස්‍රවහට; **'අන්ත'** නම්: ස්පර්ශය එක් අන්තයෙක ස්පර්ශසමුදය දෙවැනි අන්ත යයි, අතීතය එක් අන්තයෙක අනාගතය දෙවැනි අන්තය යි, සුඛවෙදනාව එක් අන්තයෙක දුඃඛවෙදනාව දෙවැනි අන්තය යි, නාමය එක් අන්තයෙක රූපය දෙවැනි අන්තය යි, ෂඩ්ආධ්‍යාත්මිකායතනයෝ එක් අන්තයෙක ෂඩ්බාහ්‍යායතනයෝ දෙවැනි අන්තය යි, සත්කාය එක් අන්තයෙක සත්කායසමුදය දෙවැනි අන්තය යි; **'පණිධි'** යී රාග සංරාග...අභිධ්‍යා, ලොභඅකුශලමූල නම් වූ තෘෂ්ණා කියනු ලබයි; **භවාභවාය** කාමභව - රූපභව - අරූපභවයන් සඳහා, කර්මවෘත්ත -විපාකවෘත්තයන් සඳහා මතුමත්තෙහි භවය සඳහා පඤ්චගතිය - පුනපුන උත්පත්තිය ප්‍රතිසන්ධිය සඳහා නැවත නැවත ආත්මභාවය පහළවීම සඳහා; **ඉධ** යනු: සිය අත්බැව, **හුරං** යනු: පරඅත්බැව; **ඉධ** යනු: ස්වකීය රූපවෙදනාසංඥාසංස්කාරවිඥානය යැ, **හුරං** යනු: පරකීය රූප-වෙදනාසංඥාසංස්කාරවිඥානය යැ; **ඉධ** යනු: සවැදෑරුම් ආධ්‍යාත්මික ආයතනයෝ යැ, **හුරං** යනු: සවැදෑරුම් බාහ්‍යායතනයෝ යැ; **ඉධ** යනු මිනිස්ලොව යැ, **හුරං** යනු: දෙව්ලොව යැ, **ඉධ** යනු: කාමධාතුව යැ, **හුරං** යනු: රූප-අරූපධාතු යැ; **ඉධ** යනු: කාම-රූපධාතු යැ, **හුරං** යනු: අරූපධාතුව යි.

**යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වා** - යම් රහත් මහණක් හට ඵස්සාදි උභයාන්තයෙහි ද, කාමාදි භවය සඳහා ද, ස්ව-පරආත්මභාවාදියෙහි ද, ප්‍රාර්ථනා තෘෂ්ණා නැද්ද නො වේ ද, අවිද්‍යමාන වේ ද, නො ලැබේ ද, ප්‍රහීණ වූවා සත්හිඳුණී දුරලන ලද්දී උපතට නුසුදුසු වූවා නුවණ ගින්නෙන් නසන ලද්දී නුයි 'යස්සූභයන්තෙ පණිධීධ නත්ථි භවාභවාය ඉධ වා හුරං වා' යනු වේ.

**නිවෙසනා තස්ස න සන්ති කෙචි** - **'නිවෙසනා'** යනු: නිවෙසන දෙකෙකි: තෘෂ්ණානිවෙසන ද දෘෂ්ටිනිවෙසන දැයි කියායි. ...**තස්ස** - රහත් ක්ෂීණාස්‍රවහට; නිවෙසනා තස්ස න සන්ති කෙචි' යනු. ඔහුට කිසි නිවෙසන කෙනෙක් නැත, නො වෙති, නො ලැබෙත්; ප්‍රහීණ වූවාහු සිඳුනා ලද්දාහු සත්හිඳුණාහු උපතට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි "නිවෙසනා තස්ස න සන්ති කෙචි" යනු වේ.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං** - **'ධම්මෙසු'** යනු: දෙසැට දෘෂ්ටිගතයන් අතුරෙහි; **නිච්ඡෙය්‍ය** නිශ්චය කොට විනිශ්චය කොට විමසා තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට; **සමුග්ගහීතං** - අවධිවශයෙන් කොටස් වශයෙන් - උත්තමවශයෙන් - කොට්ඨාසවශයෙන් රාශිවශයෙන් - විශෙෂරාශිවශයෙන් ගැනීම, මේ සැබෑව තථ්‍ය ය අවිපරිණාම ය විද්‍යමාන ය යථාස්වභාව ය අවිපරීත යයි ගන්නා ලද පරාමර්ශ කළ අභිනිවෙස කළ ඇතුළත් වූ බැසගත්නා ලද්දක් නැත, නො වෙයි අවිද්‍යමාන වෙයි, නො ලැබෙත්, ප්‍රහීණ ය මුලුසුන් කරන ලද සත්හිඳුවන ලද දුරලන ලද උපතට නුසුදුසු කරන ලද නුවණගින්නෙන් නසන ලද නුයි - 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

"යස්සූභයන්තෙ-පෙ-ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං" යී.

5 - 7

තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා
පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා,
තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.

**තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤාති** - ‘**තස්සාති**’ අරහතො ඛීණාසවස්ස, තස්ස දිට්ඨෙ වා දිට්ඨසුද්ධියා වා සුතෙ වා සුතසුද්ධියා වා මුතෙ වා මුතසුද්ධියා වා, සඤ්ඤාපුබ්බඞ්ගමතා සඤ්ඤාවිකප්පයතා, සඤ්ඤාවිග්ගහෙන සඤ්ඤාය උට්ඨපිතා සමුට්ඨපිතා කප්පිතා පකප්පිතා සඞ්ඛතා අභිසඞ්ඛතා සණ්ඨපිතා දිට්ඨි නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති - තස්සීධ දිට්ඨෙව සුතෙ මුතෙ වා පකප්පිතා නත්ථි අණූපිසඤ්ඤා.

**තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානන්ති** - **බ්‍රාහ්මණොති** සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො, සක්කායදිට්ඨි බාහිතා හොති, -පෙ- අසිතො[1] තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා; **තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානන්ති** - තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියන්තං අගණ්හන්තං අපරාමසන්තං අනභිනිවිසන්තන්ති ‘තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං.’

**කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍යාති** - ‘**කප්පා**’ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා. කෙන රාගෙන කප්පෙය්‍ය ? කෙන දොසෙන කප්පෙය්‍ය ? කෙන මොහෙන කප්පෙය්‍ය ? කෙන මානෙන කප්පෙය්‍ය ? කාය දිට්ඨියා කප්පෙය්‍ය ? කෙන උද්ධච්චෙන කප්පෙය්‍ය ? කාය විචිකිච්ඡාය කප්පෙය්‍ය ? කෙහි අනුසයෙහි කප්පෙය්‍ය රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨඞ්ගතොති වා ථාමගතොති වා ? තෙ අභිසඞ්ඛාරා පහීනා, අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා[2] කෙන කප්පෙය්‍ය නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා ? සො හෙතු නත්ථි පච්චයො නත්ථි කාරණං නත්ථි යෙන කප්පෙය්‍ය විකප්පෙය්‍ය විකප්පං ආපජ්ජෙය්‍ය. **කෙනීධ ලොකස්මින්ති** - අපායලොකෙ -පෙ- ආයතනලොකෙති - කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය.

තෙනාහ භගවා:

“තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා
පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා,
තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං
කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍යා”ති.

1. අනිස්සිතො - සයා. 2. ගතියො - සයා.

**5 – 7**

ඒ රහත් මහණ හට රූපායතන සඞ්ඛ්‍යාත දෘෂ්ටශුද්ධියෙහි හෝ ශ්‍රැතශුද්ධියෙහි හෝ මුතශුද්ධියෙහි හෝ තෘෂ්ණාදෘෂ්ටි විසින් ප්‍රකල්පිත වූ අණුමාත්‍ර වූ ද සංඥාවෙන් උපදවන ලද දෘෂ්ටියෙක් නැත, මේ සත්ත්ව-ලොකයෙහි (තෘෂ්ණාමානදෘෂ්ටි විසින්) දෙසැටදිටු නො ගත්තාවූ ඒ බාහිතපාපී බ්‍රාහ්මණයා රාගාදි කවර ධර්මයෙකින් විකල්පනය කරන්නේ ද.

**තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා**-'තස්ස' යනු: අර්හත් ක්ෂීණාස්‍රව හට; රූපාලම්බනයෙහි හෝ, දෘෂ්ටශුද්ධියෙහි හෝ ශබ්දාලම්බනයෙහි හෝ ශ්‍රැතශුද්ධියෙහි හෝ, ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යාලම්බන-යෙහි හෝ මුතශුද්ධියෙහි හෝ, සංඥා පූර්වඞ්ගම කොට ඇති සංඥාවිකල්පන ඇති සංඥාවිග්‍රහයෙන් සංඥාවෙන් ඔසවන ලද මොනොවට ඔසවන ලද කල්පිත වූ ප්‍රකල්පිත වූ සකස් කරන ලද මොනොවට සකස් කරන ලද පිහිටුවන ලද දෘෂ්ටියෙක් නැත, නො වෙයි, විද්‍යමාන නො වෙයි, නො ලැබෙයි, ප්‍රහීණ වූවා සමුච්ඡින්න වූවා සන්හිඳුණා දුරලන ලද්දී අභව්‍යොත්පත්තික වූවා ඥානාග්නීන් දවන ලද්දී නුයි – 'තස්සීධ දිට්ඨෙ ව සුතෙ මුතෙ වා පකප්පිතා නත්ථි අණූපි සඤ්ඤා' යනු වේ.

**තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං** – **'බ්‍රාහ්මණො'** යනු: සප්තධර්ම කෙනකුන් බාහිත හෙයින් බ්‍රාහ්මණ යැ....(4–3. සුත්‍රනිද්දේශය.) **තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං** – ඒ බාහිතපාපී බ්‍රාහ්මණයා දෘෂ්ටිය ආදානය නො කරනුවනු නො ගන්නහු පරාමර්ශනය නො කරනුවහු අභිනිවෙශය නො කරනුවහු නුයි 'තං බ්‍රාහ්මණං දිට්ඨිමනාදියානං' යනු වේ.

**කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය** – **'කප්පා'** යනු: තෘෂ්ණාකල්ප යැ දෘෂ්ටිකල්ප යැයි දෙ කල්ප කෙනෙකි: ... ඔහු විසින් තෘෂ්ණාකල්පය ප්‍රහීණ කරන ලද, දෘෂ්ටිකල්පය දුරලන ලද, තෘෂ්ණාකල්පය ප්‍රහීණ කළ හෙයින් දෘෂ්ටිකල්පය දුරලූ හෙයින් කවර රාගයෙකින් කල්පනය කරන්-නේ ද? කවර ද්වේෂයෙකින් – කවර මොහයෙකින් – කවර මානයෙකින් – කවර දෘෂ්ටියෙකින් – කවර ඖද්ධත්‍යයෙකින් – කවර විචිකිත්සායෙකින් – කවර අනුශයයෙකින් රක්ත යැයි හෝ ද්විෂ්ට යැයි හෝ මූඪ යැයි හෝ විනිබද්ධ යැයි හෝ පරාමෘෂ්ට යැයි හෝ වික්ෂෙපයට ගියේ යැයි හෝ අනිශ්චාවට ගියේ යැයි හෝ තිරබවට ගියේ යැයි හෝ කල්පනය කරන්නේ නම් ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයහ, අභිසංස්කාරයන් ප්‍රහීණ කළ වන බැවින් ගතිවශයෙන් තිරිසන් යැයි හෝ තිරිසන්ගත යැයි හෝ ප්‍රෙතවිෂය ඇතියෙකැයි හෝ මිනිස් යැයි හෝ දෙවි යැයි හෝ රූපී යැයි හෝ අරූපී යැයි හෝ සංඥී යැයි හෝ අසංඥී යැයි හෝ නෛවසංඥී නාසංඥී යැයි හෝ කුමකින් කල්පනය කරන්නේ ද; යම් කරුණෙකින් කල්පනය – විකල්පනය – කරන්නේ නම් විකල්පනයට පැමිණෙන්නේ නම්, ඒ හෙතුව නැත ප්‍රත්‍යය නැත කාරණය නැති; **කෙනීධ ලොකස්මිං** – අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි – 'කෙනීධ ලොකස්මිං විකප්පයෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

"තස්සීධ දිට්ඨෙ ව-පෙ-ලොකස්මිං විකප්පයෙය්‍ය"යි.

5 - 8

න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
ධම්මාපි තෙසං න පටිච්ඡිතාසෙ,
න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො
පාරං ගතො න පච්චෙති තාදී.

**න කප්පයන්ති න පුරෙක්ඛරොන්තීති** – 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච.

කතමො තණ්හාකප්පො? යාවතා තණ්හාසඞ්ඛාතෙන සීමකතං මරියාදීකතං[1] ඔධිකතං පරියන්තකතං[2] පරිග්ගහිතං මමායිතං: ඉදං මමං එතං මමං එත්තකං මමං එත්තාවතා මමං, මම රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා ඛෙත්තං වත්ථු හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨං ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරඤ්ච කෙවලම්පි මහාපඨවිං තණ්හාවසෙන මමායති, යාවතා අට්ඨසතතණ්හාවිචරිතං, අයං තණ්හාකප්පො.

කතමො දිට්ඨිකප්පො? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි, යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරං දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පටිග්ගාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො විපරීතග්ගාහො විපල්ලාසග්ගාහො මිච්ඡාගාහො, අයාථාවකස්මිං යාථාවකන්ති[3] ගාහො, යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි; අයං දිට්ඨිකප්පො.

තෙසං තණ්හාකප්පො පහීනො, දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො; තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තෙ තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා න කප්පෙන්ති න ජනෙන්ති න සඤ්ජනෙන්ති න නිබ්බත්තෙන්ති නාභිනිබ්බත්තෙන්තීති – න කප්පයන්ති; **න පුරෙක්ඛරොන්තීති පුරෙක්ඛාරාති** ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච –පෙ– අයං තණ්හාපුරෙක්ඛාරො –පෙ– අයං දිට්ඨිපුරෙක්ඛාරො. තෙසං තණ්හාපුරෙක්ඛාරො පහීනො; දිට්ඨිපුරෙක්ඛාරො පටිනිස්සට්ඨො තණ්හාපුරෙක්ඛාරස්ස පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස පටිනිස්සට්ඨත්තා න තණ්හං වා න දිට්ඨිං වා පුරතො කත්වා චරන්ති. න තණ්හාධජා න තණ්හාකෙතූ න තණ්හාධිපතෙය්‍යා න දිට්ඨිධජා න දිට්ඨිකෙතූ න දිට්ඨාධිපතෙය්‍යා න තණ්හාය වා න දිට්ඨියා වා පරිවාරෙත්වා චරන්තීති – න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති.

---

1. මරියාදිකතං - මජසං, සයා. 2. පරියන්තිකතං - සයා.
3. යථාවකන්ති - සීමු.II.

5 – 8

ඒ ක්ෂීණාස්‍රවයෝ තෘෂ්ණාදෘෂ්ටිකල්පයන් නො කෙරෙති, පෙරටු කොට නො හැසිරෙත්; ඔවුන් විසින් දෙසැට දිට්ඨිදහම්හු ද නො පිළිගන්නා ලද්දහු වෙති. ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමෙ ශීලව්‍රතය කරණ කොටගෙන ගෙනයා නො හැක්ක. යම්හෙයකින් තාදී වූ රහත් තෙම නිර්වාණපාරයට ගියේ මාර්ගයෙන් නැසූ කෙලෙසුන් කරා පෙරළා නො පැමිණේ ද එහෙයිනි.

**න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති** – ‘කප්පා’ යනු: තෘෂ්ණා කල්පය ද දෘෂ්ටිකල්පය දැයි දෙ කල්ප කෙනෙක් වෙති:

තෘෂ්ණාකල්පය කවරැ යත්? යම් පමණ තෘෂ්ණාකොටසින් සීම් කරන ලද ද මර්යාදා කරන ලද ද අවධි කරන ලද ද පර්යන්ත කරන ලද ද අයත් කරන ලද ද මමායන කරන ලද ද: මේ මාගේ යැ, මෙතෙල මාගේ යැ, මෙතෙක් මාගේ යැ, මාගේ රූප-ශබ්ද-ගන්ධ-රස-ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, අතුරුණු බුමුතුරුණු යැ, දැසිදස්හු යැ, එළුතිරෙළු යැ, කුරුකුකුළු යැ, ඇත්අස්ගවමීවෙළඹු යැ, කෙත්වත් යැ, රන්රුවන් යැ, ගම්නියම්ගම්රජදහන්හු යැ, රට දනව්-කොටුගුල් හා සියලු මැ මහපොළොව තෘෂ්ණාවශයෙන් මමායන කෙරෙයි, යම්තාක් අටෝරාසියක් තෘෂ්ණාවිචරිතය වේ ද, මේ තෘෂ්ණාකල්ප නම් වෙයි.

දෘෂ්ටිකල්පය කවරැ යත්? විංශතිවස්තුකසත්කායදෘෂ්ටි යැ, දශවස්තුකමිථ්‍යාදෘෂ්ටි යැ, දශවස්තුකඅන්තග්‍රාහිකාදෘෂ්ටි යැ යන මෙබඳු වූ යම් දෘෂ්ටියෙක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් විලොම්දෘෂ්ටියෙක් දෘෂ්ටිචලනයෙක් දෘෂ්ටිසංයොජනයෙක් වේ ද, දෘෂ්ටිග්‍රහණයෙක් මිථ්‍යාමාර්ගයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්යාසග්‍රාහයෙක් විපරීතග්‍රාහයෙක් මිථ්‍යාග්‍රාහයෙක් අස්වභාවයෙහි ස්වභාව යැයි ගැනීමෙක් වේ ද, යම් දෙ සැට දෘෂ්ටි කෙනෙක් වෙත් ද මේ දෘෂ්ටිකල්ප නම් වේ. ඒ රහතුන් විසින් තෘෂ්ණාකල්පය පහන ලද, දෘෂ්ටිකල්පය දුරලන ලද, තෘෂ්ණාකල්පය පුහුත් බැවින් දෘෂ්ටිකල්පය දුරලූ බැවින් ඔවුහු තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටිකල්පය හෝ කල්පනය නො කෙරෙති නො දනවති නූපදවත් නුයි –‘න කප්පයන්ති, යනු වේ.

**න පුරෙක්ඛරොන්ති** – ‘පුරෙක්ඛාර’ නම්: තෘෂ්ණාපුරස්කාරය ද දෘෂ්ටිපුරස්කාරය දැයි දෙ පුරස්කාර කෙනෙක් වෙති ... ඒ රහතුන් විසින් තෘෂ්ණාපුරස්කාරය පහන ලද, දෘෂ්ටිපුරස්කාරය දුරලන ලද, තෘෂ්ණාපුරස්කාරය පුහුත් බැවින් දෘෂ්ටිපුරස්කාරය දුරලූ බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නො හැසිරෙති, තෘෂ්ණාව ධවජ කොට ඇත්තාහු තෘෂ්ණාව කෙහෙළි කොට ඇත්තාහු තෘෂ්ණාව අධිපති කොට ඇත්තාහු දෘෂ්ටිය ධවජ කොට ඇත්තාහු දෘෂ්ටිය කෙහෙළි (=කොඩි) කොට ඇත්තාහු දෘෂ්ටිය අධිපති කොට ඇත්තාහු නො වෙති, තෘෂ්ණාව විසින් හෝ දෘෂ්ටිය විසින් හෝ නො පිරිවරා හැසිරෙත් නුයි ‘න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති’ යනු වේ.

**ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ**ති - ධම්මා වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; **තෙස**න්ති තෙසං අරහන්තානං ඛීණාසවානං; **න පටිච්ඡිතා සෙ**ති සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති න පටිච්ඡිතා සෙ, අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති න පටිච්ඡිතා සෙති - ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ.

**න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො**ති - 'නා'ති පටික්ඛෙපො; **බ්‍රාහ්මණො**ති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො, සක්කායදිට්ඨි බාහිතා හොති -පෙ- අසිතො[1] තාදී[2] පවුච්චතෙ ස බ්‍රහ්මා. **න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො**ති - බ්‍රාහ්මණො සීලෙන වා වතෙන[3] වා සීලබ්බතෙන[4] වා න යායති න නිය්‍යති[5] න වුය්හති න සංහරීයතීති - න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො.

**පාරං ගතො න පච්චෙති තාදී**ති - පාරං වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, සො පාරං ගතො පාරං පත්තො අන්තගතො අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො (විත්ථාරො) ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති- පාරං ගතො; **න පච්චෙතී**ති සොතාපත්ති මග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡති. සකදාගාමිමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡති, අනාගාමිමග්ගෙන යෙ කිලෙසා පහීනා තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡති, අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති න පච්චෙති න පච්චාගච්ඡතීති - පාරං ගතො න පච්චෙති;

---

1. අනිස්සිතො - ස්‍යා. 2. තාදි - ස්‍යා. 3. වත්තෙන - ස්‍යා.
4. සීලවතෙන - ස්‍යා. 5. නිය්‍යාති - ස්‍යා.

**ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ** - 'ධම්මා' යි දෙසැට දෘෂ්ටිගතයෝ කියනු ලැබෙත්. **තෙසං** ඒ අතීත් ක්ෂීණාස්‍රවයන් විසින්; **න පටිච්ඡිතා සෙ** - ලෝකය ශාශ්වත යැ මේ මැ සැබැවැ අන්‍යය සිස් යැයි නො පිළිගත්තා ලද්දහු වෙති. ලෝකය අශාශ්වත යැ, ලෝකය අන්තවත් යැ, ලෝකය අනන්තවත් යැ, ආත්ම සඞ්ඛ්‍යාත ජීවයත් ශරීරයත් එය ම යැ, ජීවය අනෙකෙක ශරීරය අනෙකෙකැ, සත්ත්ව තෙමේ මරණින් මතු විද්‍යමාන වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු අවිද්‍යමාන වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු වත්නේ ත් නො වත්නේ ත් වෙයි, සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි නො වත්නේ නො වෙයි, මේ මැ සැබැවැ අන්‍යය සිස් යැයි නොපිළිගත්තා ලද්දහු නුයි - 'ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ' යනු වේ.

**න බ්‍රාහ්මණො සීලවතෙන නෙයෙය්‍යා** - 'න' යනු ප්‍රතික්ෂෙප යැ, **බ්‍රාහ්මණො** - සප්තධර්ම කෙනකුන් බාහිත (-ප්‍රහීණ කළ) වන බැවින් බ්‍රාහ්මණ යැ, සත්කායදෘෂ්ටිය බාහිත වෙයි,...(4-3 නිද්දේශය) **න බ්‍රාහ්මණො සීලවතෙන නෙයෙය්‍යා** - ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ ශීලව්‍රතයෙන් හෝ නො යවනු ලැබෙයි නො පමුණුවනු ලැබෙයි නො අදනු ලැබෙයි නො එළවනු ලැබේ නුයි - 'න බ්‍රාහ්මණො සීලවතෙන නෙයෙය්‍යා' යනු වේ.

**පාරං ගතො න පච්චෙති තාදී** - අමාමහනිවන 'පාරං' යයි කියනු ලැබෙයි, සියලු සංස්කාරයෙන් සන්හිඳුණු සියලු උපධි දුරු කළ තෘෂ්ණාක්‍ෂය වූ කෙලෙස්රජස් නැති සියලු දුක් නිරුද්ධ වූ නිර්වාණය සි; ඒ ක්ෂීණාස්‍රව පාරයට ගියේ පාරයට පැමිණියේ... (1-6. සුත්‍රනිද්දේශය.) නුයි - 'පාරං ගතො' යනු වේ. **න පච්චෙති** - සෝවාන්මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා නැවත නො එයි පෙරළා නො එයි ආපසු නො පැමිණෙයි, සකෘදාගාමිමඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා පෙරළා නො පැමිණෙයි-අනාගාමිමඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා පෙරළා නො පැමිණෙයි - රහත් මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා නැවත නො එයි පෙරළා නො පැමිණෙයි ආපසු නො පැමිණේ නුයි - 'පාරං ගතො න පච්චෙති' යනු වේ.

**තාදීති** අරහා පඤ්චහාකාරෙහි තාදී: ඉට්ඨානිට්ඨෙ තාදී, චත්තාවීති තාදී, තිණ්ණාවීති තාදී, මුත්තාවීති තාදී, තංනිද්දෙසා තාදී. කථං අරහා ඉට්ඨානිට්ඨෙ තාදී? අරහා ලාභෙපි තාදී, අලාභෙපි තාදී, යසෙපි තාදී, අයසෙපි තාදී, පසංසායපි තාදී, නින්දායපි තාදී, සුඛෙපි තාදී, දුක්ඛෙපි තාදී, එකං චෙ බාහං[1] ගන්ධෙන ලිම්පෙය්‍යුං,[2] එකං චෙ බාහං[1] වාසියා තච්ඡෙය්‍යුං, අමුස්මිං නත්ථි රාගො, අමුස්මිං නත්ථි පටිඝං. අනුනයපටිඝවිප්පහීනො උග්ඝාතිනිග්ඝාති-වීතිවත්තො අනුරොධවිරොධං සමතික්කන්තො; එවං අරහා ඉට්ඨානිට්ඨෙ තාදී. කථං අරහා චත්තාවීති තාදී? අරහතො රාගො චත්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො, දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා චත්තා වන්තා මුත්තා පහීනා පටිනිස්සට්ඨා, එවං අරහා චත්තාවීති තාදී. කථං අරහා තිණ්ණාවීති තාදී? අරහා කාමොඝං තිණ්ණො භවොඝං තිණ්ණො දිට්ඨොඝං තිණ්ණො අවිජ්ජොඝං තිණ්ණො සබ්බං සංසාරපථං[3] තිණ්ණො උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො, සො වුට්ඨවාසො චිණ්ණචරණො ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති. එවං අරහා තිණ්ණාවීති තාදී. කථං අරහා මුත්තාවීති තාදී? අරහතො රාගා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; දොසා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; මොහා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; කොධා උපනාහා මක්ඛා පළාසා ඉස්සාය මච්ඡරියා මායාය සාඨෙය්‍යා ථම්භා සාරම්භා මානා අතිමානා මදා පමාදා සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බපරිළාහෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; එවං අරහා මුත්තාවීති තාදී. කථං අරහා තන්නිද්දෙසා තාදී? අරහා සීලෙ සති සීලවාති තංනිද්දෙසා තාදී; සද්ධාය සති සද්ධොති තංනිද්දෙසා තාදී, විරියෙ සති විරියවාති තංනිද්දෙසා තාදී, සතියා සති සතිමාති තංනිද්දෙසා තාදී, සමාධිස්මිං සති සමාහිතොති තංනිද්දෙසා තාදී, පඤ්ඤාය සති පඤ්ඤවාති තංනිද්දෙසා තාදී, විජ්ජාය සති තෙවිජ්ජොති තංනිද්දෙසා තාදී, අභිඤ්ඤාය සති ඡළභිඤ්ඤොති තංනිද්දෙසා තාදී, එවං අරහා තංනිද්දෙසා තාදීති – පාරඞ්ගතො න පච්චෙති තාදී.

තෙනාහ භගවා:

"න කප්පයන්ති න පුරෙක්ඛරොන්ති
ධම්මාපි තෙසං න පටිච්ඡිතාසෙ,
න බ්‍රාහ්මණො සීලවතෙන නෙය්‍යො
පාරඞ්ගතො න පච්චෙති තාදීති.

**පරමට්ඨකසුත්තනිද්දෙසො පඤ්චමො.**

1. අඞ්ගං - සීමු. I. 2. විලිම්පෙය්‍යුං - සීමු. II.
3. සබ්බසංසාරපථං - මනුප. සබ්බසඞ්ඛාරපථං - සීමු. II.

තාදී යනු – රහත්හු පස්කරුණෙකින් තාදීහ: ඉට්ඨානිට්ඨයෙහි තාදී (-සමානය) හ, කෙලෙසුන් හළහු නුයි තාදීහ, සසර තරණය කළාහු නුයි තාදීහ, රාගාදීයෙන් මිදුණාහු නුයි තාදීහ, තන්නිර්දේශයෙන් (-ඒ ඒ ශීලශ්‍රද්ධාදියෙන් දක්විය යුත්තාහු නුයි) තාදීහ. කිසෙයින් රහත්හු ඉෂ්ටානිෂ්ටයෙහි තාදී සේක් ද යත්: රහත්හු ලාභයෙහි ද තාදීහ, අලාභයෙහි ද – යශස්හි ද – අයශස්හි ද – ප්‍රශංසායෙහි ද – නින්දායෙහි ද සුඛයෙහි ද – දුඃඛයෙහි ද තාදී සේක. ඉදින් එක් බාහුවක් සිවුඳගඳින් ආලේප කරන්නාහු නම්, අනෙක් බාහුව වෑයකින් සස්නාහු නම් අර ගන්ධාලේපයෙහි ඇලීමෙක් නැත, අර සැසීමෙහි කොපයෙක් නැත; රාගද්වේෂ දුරු කොට සිටියහ, අනුග්‍රහනිග්‍රහ ඉක්මවා සිටියහ, අනුනය-ප්‍රතිඝ මොනොවට ඉක්මෑවූහ. මෙසේ රහත්හු ඉෂ්ටානිෂ්ටයෙහි තාදී සේක. කිසෙයින් රහත්හු කෙලෙස් හළ හෙයින් 'තාදී' වූහ යත්: රහත්හු විසින් රාගය ත්‍යක්ත යෑ වාන්ත යෑ ප්‍රහීණ යෑ දුරලන ලද්දේයෑ, ද්වේෂය – මෝහය – ක්‍රොධය – උපනාහය – මකුබව – යුගග්‍රාහය – ඊර්ෂ්‍යාව – මාත්සර්ය්‍යය – මායාව – ශඨබව – තදබව – සාරම්භය – මානය – අතිමානය මදය – ප්‍රමාදය – සියලු කෙලශයෝ – සියලු දුශ්චරිතයෝ – සියලු දරථයෝ – සියලු පරිදාහයෝ – සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ – ත්‍යක්තයහ වාන්තයහ මුක්තයහ ප්‍රහීණයහ දුරලන ලද්දාහ. මෙසෙයින් රහත්හු කෙලෙසුන් හළ හෙයින් 'තාදී' නම් වූ සේක. කිසෙයින් රහත්හු සසර තරණය කළහෙයින් 'තාදී' වූහ යත්: රහත්හු කාමෞඝය තරණය කළාහ, භවෞඝය - දෘෂ්ට්‍යෞඝය - අවිද්‍යා – ඕඝය තරණය කළහ, සියලු සංසාරපථය තරණය කළහ, උත්තරණය – නිස්තරණය කළහ, ඉක්මෑවූහ, මැනවින් ඉක්මෑවූහ, වෙසෙසින් ඉක්මෑවූහ, ඒ රහත්හු වුසූ ආර්‍ය්‍යවාස ඇතියහ, පුරුදු කළ චරණධර්ම ඇතියහ... (1-6. සූත්‍රනිර්දේශය.) මෙසෙයින් රහත්හු තරණය කළහෙයින් රහත් නම් වූ සේක කිසෙයින් රහත්හු මිදුණු හෙයින් 'තාදී' වූහ යත්: රහත්හුගේ සිත රාගයෙන් මුක්ත ය විමුක්ත ය සුවිමුක්ත ය, ද්වේෂයෙන් – මෝහයෙන් මුක්ත ය විමුක්ත ය සුවිමුක්තය, ක්‍රොධයෙන් උපනාහයෙන් ම්‍රක්ෂයෙන් පලාසයෙන් ඊර්ෂ්‍යායෙන් මායාවෙන් ශාඨ්‍යයෙන් ස්තම්භයෙන් සාරම්භයෙන් මානයෙන් අතිමානයෙන් ප්‍රමාදයෙන් මදයෙන් සර්වදුශ්චරිතයෙන් සර්වදරථයෙන් සර්වපරිදාහයෙන් සර්වසන්තාපයෙන් සර්වාකුශලාභිසංස්කාරයන් කෙරෙන් මුක්තය විමුක්තය සුවිමුක්තය. මෙසෙයින් රහත්හු රාගාදියෙන් මිදුණු හෙයින් තාදී නම් වූහ. කිසෙයින් රහත්හු තන්නිර්දේශයෙන් 'තාදී' වූහ යත්: ශීලය ඇති කල්හි 'සිල්වත්හ, යි ඒ ශීලයෙන් දක්විය යුතු හෙයින් තාදීහ, ශ්‍රද්ධා ඇති කල්හි 'සැදැහැවත්හ' යි එයින් නිදෙසිය යුතු හෙයින් තාදීහ, වීර්‍ය්‍ය ඇති කල්හි 'වීර්‍ය්‍යවත්හ'යි...ස්මෘතිය ඇති කල්හි 'ස්මෘතිමත්හ'යි...සමාධිය ඇති කල්හි 'සමාහිත'යයි.. ප්‍රඥාව ඇති කල්හි 'ප්‍රඥාවත්හ'යි...විද්‍යාව ඇති කල්හි 'ත්‍රිවිද්‍යා ඇත්තාහ'යි...අභිඥාව ඇති කල්හි 'ෂඩභිඥයහ'යි ඒ අභිඥායෙන් දක්වියයුතු හෙයින් තාදී නම් වූහ. මෙසෙයින් රහත්හු තන්නිර්දේශයෙන් 'තාදී' නම් වූවාහු නුයි – 'පාරං ගතො න පච්චෙති තාදී' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න කප්පයන්ති-පෙ-න පච්චෙති තාදී" යනු.

**පස්වැනි පරමට්ඨකසූත්‍රනිර්දේශය යි.**

# 6

# ජරාසුත්තනිද්දෙසො

අථ ජරාසුත්තනිද්දෙසො[1] වුච්චති:

## 6 - 1

අප්පං වත ජීවිතං ඉදං
ඔරං වස්සසතාපි මීයති,[2]
යො චෙපි අතිච්ච ජීවති
අථ ඛො සො ජරසාපි මීයති.

**අප්පං වත ජීවිතං ඉදන්ති** – 'ජීවිත'න්ති ආයු ඨිති[3] යපනා යාපනා ඉරියනා වත්තනා පාලනා ජීවිතං ජීවිතින්ද්‍රියං; අපිච ද්වීහි කාරණෙහි අප්පකං ජීවිතං, ථොකකං ජීවිතං; ඨිතිපරිත්තතාය වා අප්පකං ජීවිතං, සරසපරිත්තතාය වා අප්පකං ජීවිතං. කථං ඨිති පරිත්තතාය වා අප්පකං ජීවිතං? අතීතෙ චිත්තක්ඛණෙ ජීවිත්ථ න ජීවති න ජීවිස්සති; අනාගතෙ චිත්තක්ඛණෙ ජීවිස්සති න ජීවති න ජීවිත්ථ; පච්චුප්පන්නෙ චිත්තක්ඛණෙ ජීවති න ජීවිත්ථ න ජීවිස්සති.

1. ජීවිතං අත්තභාවො ච සුඛදුක්ඛා ච කෙවලා,
එකචිත්තසමායුත්තා ලහුසො වත්තතෙ ඛණො.

2. චුල්ලාසීති සහස්සානි කප්පා[4] තිට්ඨන්ති යෙ මරූ,
නත්වෙව තෙපි ජීවන්ති ද්වීහි චිත්තෙහි සංයුතා[5].

3. යෙ නිරුද්ධා මරන්තස්ස තිට්ඨමානස්ස වා ඉධ,
සබ්බෙපි[6] සදිසා ඛන්ධා ගතා අප්පටිසන්ධිකා.[7]

4. අනන්තරා ච යෙ භග්ගා යෙ ච භග්ගා අනාගතා,
තදන්තරෙ නිරුද්ධානං වෙසමං[8] නත්ථි ලක්ඛණෙ.

5. අනිබ්බත්තෙන න ජාතො පච්චුප්පන්නෙන ජීවති,
චිත්තභඞ්ගා මතො ලොකො පඤ්ඤත්තිපරමත්ථියා.[9]

6. යථා නින්නා පවත්තන්ති ඡන්දෙන පරිණාමිතා,
අච්ඡින්නධාරා වත්තන්ති සළායතනපච්චයා.

7. අනිධානගතා භග්ගා පුඤ්ජො නත්ථි අනාගතෙ,
නිබ්බත්තායෙව තිට්ඨන්ති ආරග්ගෙ සාසපූපමා.

---

1. ජරාසුත්තං - සීමු. II. 2. මීයාති - සු, ස.
3. ආයුවඨිති - සීමු. II. 4. කප්පං - වි. 5. සමොහිතා - සීමු. II. සමාහිතා - වි.
6. සබ්බෙව - සීමු. II. 7. අප්පටිසන්ධියා - වි.
8. වෙසම්මං - ස. 9. පරමට්ඨියා - වි. පරමට්ඨිති - ස.

# 6

# ජරාසූත්‍රනිද්දේශය

ඉක්බිති ජරාසූත්‍රනිද්දේශය කියනු ලැබේ:

## 6 – 1

මිනිසුන්ගේ මේ ජීවිතය එකාන්තයෙන් අල්ප වෙයි. අවුරුදු සියයකින් මෙපිට (කලලාදි කාලයෙහි දු) මැරෙයි. ඉදින් යමෙක් සියක් වස් ඉක්මවා ජීවත් වේ නම්, එකල හෙතෙම ජරාවෙන් නමුදු මියන්නේ සි.

**අප්පං වත ජීවිතං ඉදං** – ‘ජීවිතං’ යනු: (අරූපධර්මයන්ගේ) ආයුෂය සිටීම යපනය යාපනය (=යැපීම) ඉරියනය පැවැත්ම පාලනය ජීවිතය ජීවිතෙන්ද්‍රිය සි. තවද, දෙ කරුණෙකින් ජීවිතය අල්ප වෙයි: ස්ථිතික්ෂණය මඳ බැවින් හෝ ජීවිතය අල්ප යැ, කෘත්‍යලක්‍ෂණ හෝ සම්පත්තිලක්‍ෂණ රසය මඳ බැවින් හෝ ජීවිතය අල්ප සි. කිසෙයින් ස්ථිතිපරිත්තතායෙන් ජීවිතය අල්ප වෙයි යත්? අතීත චිත්තක්‍ෂණයෙහි ජීවත් විය, ජීවත් නො වෙයි, ජීවත් නො වන්නේ ය; අනාගත චිත්තක්‍ෂණයෙහි ජීවත් වන්නේ යැ, ජීවත් නො වෙයි, ජීවත් නො වී; වර්තමාන චිත්තක්‍ෂණයෙහි ජීවත් වෙයි, ජීවත් නො වී, ජීවත් නො වන්නේ සි.

1. (සංස්කාරස්කන්ධ සඞ්ඛ්‍යාත) ජීවිතය ද, (රූපස්කන්ධ සඞ්ඛ්‍යාත) ආත්මය ද, (වෙදනාස්කන්ධ සඞ්ඛ්‍යාත) සුවදුක් ද, (ධ්‍රැවසුබසුභත්තභාව රහිත හෙයින්) කෙවල වූවාහු (විඥානස්කන්ධ සඞ්ඛ්‍යාත) එක් සිතක් සමග යෙදුණාහු ඒ (ජීවිතාදීන්ගේ) ක්‍ෂණය අල්ප වශයෙන් පවත්නේ යැ.

2 යම් දෙවි කෙනෙක් කප් සුවාසූදහසක් ආයු ගෙන (නෛවසඤ්ඤා-නාසඤ්ඤායතනයෙහි) සිටිත් නම්, ඔහු පවා දෙ සිතෙකින් යුක්ත වූවාහු නො මැ ජීවත් වෙති.

3. මෙ ලොවැ මළහුගේ හෝ ජීවත් වන්නහුගේ හෝ යම් ස්කන්ධ කෙනෙක් නිරුද්ධ වූවාහු ද, (ච්‍යුතියෙන් උඩ නිරුද්ධ වූ හෝ) ප්‍රවෘත්තියෙහි නිරුද්ධ වූ හෝ ඒ සියලු මැ ස්කන්ධයෝ ගියාහු අප්‍රතිසන්ධිකයෝ යැයි කියනු ලැබෙත්.

4. යම් ස්කන්ධ කෙනෙක් අනන්තර (=අතීත) වැ සිට බිඳී ගියාහු ද, යම් අනාගත ස්කන්ධ කෙනෙකුත් බිඳී යන්නාහු ද, ඒ අතුරෙ නිරුද්ධ වූ වර්තමානස්කන්ධයන්ගේ ලක්‍ෂණයෙහි විෂම බවෙක් (=නානාත්වයෙක්) නැති.

5. නූපන් අනාගතස්කන්ධයෙන් නූපන්නේ යැ, ක්‍ෂණප්‍රත්‍යුත්පන්න වූ වර්තමානස්කන්ධයෙන් ජීවත් වෙයි, ලෝවැසි තෙම චිත්තයාගේ බිඳීමෙන් මළේ නම, (දත්ත මළේය, තිස්ස මළේය යන) ප්‍රඥප්තිය චිත්තභඞ්ගසඞ්ඛ්‍යාත පරමාර්ථය නිඃශ්‍රිත කොට ඇත.

6. ඡන්ද විසින් පරිණාමිත වූවාහු නතු වූ පරිදි පවත්නාහු යැ, ෂඩායතනප්‍රත්‍යයෙන් නුසුන් ධාරා (=සන්තති) ඇති වැ පවතිත්.

7. බිඳුණු ස්කන්ධයෝ නිධානයට (=රැස්වීමට) නො ගියාහු යැ, අනාගතයෙහි දු ඔවුන්ගේ රැස්වීමෙක් නැති, උපන්නාහු මැ හිඳිඅගැ අබඇට සෙයින් ස්ථිතික්‍ෂණයෙහි සිටිත්.

8. නිබ්බත්තානඤ්ච ධම්මානං භඞ්ගො නෙසං පුරක්ඛතො,
පලොකධම්මා තිට්ඨන්ති පුරාණෙහි අමිස්සිතා.

9. අදස්සනාතො ආයන්ති භග්ගා ගච්ඡන්ති අදස්සනං,[1]
විජ්ජුප්පාදෙව ආකාසෙ උප්පජ්ජන්ති වයන්ති ච.

එවං ඨිතිපරිත්තතාය අප්පකං ජීවිතං.

කථං සරසපරිත්තතාය අප්පකං ජීවිතං? අස්සාසූපනිබද්ධං ජීවිතං, පස්සාසූපනිබද්ධං ජීවිතං, අස්සාසපස්සාසූපනිබද්ධං ජීවිතං, මහාභූතූපනිබද්ධං ජීවිතං, කබලීකාරාහාරූපනිබද්ධං ජීවිතං, උස්මූපනිබද්ධං ජීවිතං, විඤ්ඤාණූපනිබද්ධං ජීවිතං. මූලම්පි ඉමෙසං දුබ්බලං, පුබ්බහෙතූ'පි ඉමෙසං දුබ්බලා, යෙපි පච්චයා තෙ'පි දුබ්බලා, යාපි පභාවිකා සාපි[2] දුබ්බලා, සහභූපි[3] ඉමෙසං දුබ්බලා, සම්පයොගා'පි ඉමෙසං දුබ්බලා, සහජාපි ඉමෙසං දුබ්බලා, යා'පි පයොජිකා සා'පි දුබ්බලා, අඤ්ඤමඤ්ඤං නිච්චදුබ්බලා ඉමෙ, අඤ්ඤමඤ්ඤං අනවට්ඨිතා ඉමෙ, අඤ්ඤමඤ්ඤං පරිපාතයන්ති ඉමෙ, අඤ්ඤමඤ්ඤස්ස හි නත්ථි තායිතා, න චාපි ඨපෙන්ති අඤ්ඤමඤ්ඤං ඉමෙ. යො'පි නිබ්බත්තකො සො න විජ්ජති.

10. "න ච කෙනචි කොචි හායති භඞ්ගබ්‍යා[4] ඉමෙ හි සබ්බසො,
පුරිමෙහි පභාවිතා ඉමෙ යෙපි පභවකා[5] තෙ පුරෙ මතා
පුරිමා'පි ච පච්ඡිමා'පි ච අඤ්ඤමඤ්ඤං න කදාචිමද්දසු"න්ති.

එවං සරසපරිත්තතාය අප්පකං ජීවිතං.

අපි ච චාතුම්මහාරාජිකානං දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං අප්පකං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ඛණිකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතං. තාවතිංසානං දෙවානං - යාමානං දෙවානං - තුසිතානං දෙවානං - නිම්මාණරතීනං දෙවානං - පරනිම්මිතවසවත්තීනං දෙවානං - බ්‍රහ්මකායිකානං දෙවානං ජීවිතං උපාදාය මනුස්සානං අප්පකං ජීවිතං පරිත්තං ජීවිතං ථොකං ජීවිතං ඛණිකං ජීවිතං ලහුකං ජීවිතං ඉත්තරං ජීවිතං අනද්ධනියං ජීවිතං න චිරට්ඨිතිකං ජීවිතං. වුත්තම්පි චෙතං භගවතා:

"අප්පමිදං භික්ඛවෙ මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, මන්තාය බොද්ධබ්බං, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං. යො හි භික්ඛවෙ චිරං ජීවති, සො වස්සසතං අප්පං වා භිය්‍යො."[a]

---

1. ගච්ඡන්තාදස්සනං - වි.
2. යෙපි පභාවිකා තෙපි - සීමු. II.
3. සහභූමි පි - සීමු. II.
4. භඞ්ගබ්බා - සීමු II.
5. පභාවිතා - සීමු. II.

a. මාරසංයුත්ත - පඨමවග්ග.

8. ඉපැදූ පවත්නාවූ ඒ ස්කන්ධධර්මයන්ගේ ද බිඳීම පෙරටු කරන ලද්දේ යෑ, නැසෙන පියවි ඇත්තාහු පැරණි ස්කන්ධයන් හා අමිශ්‍ර වූවාහු සිටිත්.

9. නොදක්නාහු මැ පැමිණෙති (=උපදිති). නැසීමෙන් මතු නො දක්නා බවට මැ යෙති. අහසැ විදුලි කෙටීමක් මෙන් උපදනාහු ද නැසෙන්නාහු ද වෙත්.

මෙසේ සපිතිපරිත්තතායෙන් ජීවිතය අල්ප වේ.

කිසෙයින් සරසපරිත්තතායෙන් ජීවිතය අල්ප වෙයි යත් ? ආශ්වාසය නිසා පවත්නේ යෑ ජීවිතය, ප්‍රශ්වාසය නිසා පවත්නේ යෑ ජීවිතය, ආශ්වාසප්‍රශ්වාස පිළිබඳ යෑ ජීවිතය, පෘථිව්‍යාදි මහාභූතයන් පිළිබඳ යෑ ජීවිතය, කවලීකාරාහාරය පිළිබඳ යෑ ජීවිතය. උණුසුම (=කර්මජතේජස) පිළිබඳ යෑ ජීවිතය, භවාඞ්ගවිඥනය පිළිබඳ යෑ ජීවිතය. මේ ආශ්වාසාදීන් ගේ මූලකාරණය (=හෙතුව) ද දුබල යෑ, මොවුන් ගේ අවිද්‍යාදි පූර්වහෙතූහු ද දුබලයෝ යෑ, ආරම්මණාදි අසාධාරණප්‍රත්‍යයෝ ද දුබලයෝ යෑ, ප්‍රධාන වැ සිට උපදවන ඒ තෘෂ්ණාව ද දුබල යෑ, මොවුන්ගේ සමග උපන් රූපාරූපධර්මයෝ ද දුබලයෝ යෑ, මොවුන් ගේ එක් වැ යෙදුණු අරූප-ධර්මයෝ ද දුබලයෝ යෑ, මොවුන්ගේ සහජධර්මයෝ ද දුබලයෝ යෑ, ච්‍යුතිප්‍රතිසන්ධි විසින් යොදවන වෘත්තමූලක වූ ඒ තෘෂ්ණාව ද දුබල යෑ, මොවුහු ඔවුනොවුන් නිරතුරු දුබලයෝ යෑ. මොහු ඔවුනොවුන් අනවස්ථිතයෝ යෑ, මොහු ඔවුනොවුන් පිරිහෙළති, ඔවුනොවුන් රැකීමෙක් නැති, මොහු ඔවුනොවුන් නො ද සිටුවති. මොවුන්ගේ උත්පාදකධර්මය ද නැත්.

10. එකෙක් එකක්හුගේ වශයෙන් නො ද පිරිහෙයි. මේ සියලු මැ ස්කන්ධයෝ සර්වප්‍රකාරයෙන් බිඳීමට යායුත්තාහු යෑ. මේ වර්තමානස්කන්ධ-යෝ පූර්වහෙතුප්‍රත්‍යයන් විසින් උපදවන ලද්දාහු යෑ. උත්පාදක වූ ඒ පූර්වහෙතුප්‍රත්‍යයෝ පළමු මැ මළාහු යෑ. පූර්වහෙතුප්‍රත්‍යයෝ ද වර්තමාන ප්‍රත්‍යයසමුත්පන්නයෝ ද ඔවුනොවුන් කිසි කලෙක නොදුටුවිරූහ.

මෙසේ සරසපරිත්තතායෙන් ජීවිතය අල්ප වේ.

තවද - චාතුර්මහාරාජික දෙවියන්ගේ ජීවිතය පිණිස මිනිසුන්ගේ ජීවිතය අල්ප යෑ, ජීවිතය පරිත්ත යෑ, ජීවිතය මඳ යෑ, ජීවිතය ක්‍ෂණික යෑ, ජීවිතය සැහැල්ලු යෑ, ඉත්වර යෑ, ජීවිතය කල් නොපවත්නේ යෑ, ජීවිතය චිරස්ථායී නො වේ. ත්‍රයස්ත්‍රිංශත් දෙවියන්ගේ - යාමදෙවියන්ගේ - තුෂිතදෙවියන්ගේ - නිර්මාණරතිදෙවියන්ගේ - පරනිර්මිතවශවර්ති දෙවි-යන්ගේ - බ්‍රහ්මකායික දෙවියන්ගේ ජීවිතය පිණිස මිනිසුන්ගේ ජීවිතය අල්ප යෑ, ජීවිතය පරිත්ත යෑ, ජීවිතය මඳ යෑ, ජීවිතය ක්‍ෂණික යෑ, ජීවිතය ලහුක යෑ, ජීවිතය ඉත්වර යෑ, ජීවිතය අනවස්ථිතය යෑ, ජීවිතය අචිරස්ථායී වේ. වදාරන ලද මැනු භාග්‍යවත්හු විසින්:

"මහණෙනි, මිනිසුන්ගේ මේ ආයුෂ අල්ප යෑ, පරලොව යා යුත්තේ යෑ, නුවණින් දත යුතු යෑ, කුසල් කළ යුතු යෑ. බඹසර සිරියැ යුතු යෑ, උපන්හුගේ නොමැරීමෙක් නැති. මහණෙනි, යමෙක් කලක් ජීවත් වේ නම් හෙතෙම හවුරුදු සියයක් ජීවත් වෙයි. අධික වූයේ නම් ස්වල්පයක් මැයි.

11. “අප්පමායු මනුස්සානං හීළෙය්‍ය නං සුපොරිසො,
චරෙය්‍යාදිත්තසීසොව නත්ථි මච්චුස්සනාගමො.

12. අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති,
ආයු ඛීයති මච්චානං කුන්නදීනංව ඔදක”න්ති.[අ]

**අප්පං වත ජීවිතං ඉදං ඔරං වස්සසතාපි මීයතීති**[1] - කලලකාලෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, අබ්බුදකාලෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, පෙසිකාලෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ඝනකාලෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, පසාඛකාලෙපි[2] චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ජාතමත්තොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, සූතිඝරෙපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, අඩ්ඪමාසිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, මාසිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ද්වෙමාසිකොපි - තෙමාසිකොපි - චතුමාසිකොපි - පඤ්චමාසිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ඡමාසිකොපි - සත්තමාසිකොපි - අට්ඨමාසිකොපි - නවමාසිකොපි - දසමාසිකොපි - සංවච්ඡරිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, ද්වෙවස්සිකොපි - තිවස්සිකොපි - චතුවස්සිකොපි පඤ්චවස්සිකොපි - ඡවස්සිකොපි - සත්තවස්සිකොපි - අට්ඨවස්සිකොපි - නවවස්සිකොපි - දසවස්සිකොපි - වීසතිවස්සිකොපි - තිංසවස්සිකොපි - චත්තාරීසවස්සිකොපි - පඤ්ඤාසවස්සිකොපි - සට්ඨිවස්සිකොපි - සත්තතිවස්සිකොපි - අසීතිවස්සිකොපි - නවුතිවස්සිකොපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජතීති ‘ඔරං වස්සසතාපි මීයති.[3]’

**යො චෙපි අතිච්ච ජීවතීති** - යො වස්සසතං අතික්කමිත්වා ජීවති, සො එකං වා වස්සං[4] ජීවති, ද්වෙ වා වස්සානි ජීවති, තීණි වා වස්සානි ජීවති, චත්තාරි වා වස්සානි ජීවති, පඤ්ච වා වස්සානි ජීවති -පෙ- දස වා වස්සානි ජීවති, වීසතිං වා වස්සානි ජීවති, තිංසං වා වස්සානි ජීවති, චත්තාරීසං වා වස්සානි ජීවතීති ‘යො චෙපි අතිච්ච ජීවති.’

**අථ ඛො සො ජරසාපි මීයතීති** - යදා ජිණ්ණො හොති වුඩ්ඪො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො, ඛණ්ඩදන්තො පලිතකෙසො,[5] විලූනං ඛලිතංසිරො වලිතං තිලකාහතගත්තො වඞ්කො භොග්ගො දණ්ඩපරායණො, සො ජරායපි චවති මරති අන්තරධායති විප්පලුජ්ජති, නත්ථි මරණම්හා මොක්ඛො.

13. “ඵලානමිව පක්කානං පාතො පපතනා භයං,
එවං ජාතාන මච්චානං නිච්චං මරණතො භයං.

14. යථාපි කුම්භකාරස්ස කතං මත්තිකභාජනං,[6]
සබ්බං භෙදනපරියන්තං[7] එවං මච්චාන ජීවිතං.

15. දහරා ච මහන්තා ච යෙ බාලා යෙ ච පණ්ඩිතා,
සබ්බෙ මච්චුවසං යන්ති සබ්බෙ මච්චුපරායණා.”

---

1. මීයතීති - සීමු. II. 2. පඤ්චසාඛකාලෙපි - ස්‍යා.
3. මීයති - සීමු. II. 4. වස්සසතං - සීමු. II. 5. ඵලිතකෙසො - ස.
6. කතා මත්තිකභාජනා - මජ්සං. ස්‍යා. 7. සබ්බෙ භෙදන පරියන්තා - මජ්සං. ස්‍යා.
අ. මාරසංයුත්ත - පඨමවග්ග.

11. මිනිසුන්ගේ ආයුස අල්ප යැ. සාධුපුරුෂ තෙම ඒ මඳ වූ ආයුසයට ලජ්ජා වන්නේ යැ. හිස ගිනි ගත්තකු සෙයින් කුසල්හි හැසිරෙන්නේ යැ. මරහුගේ නොපැමිණීමෙක් නම් නැති.

12. රෑදුවල්හු ඉක්මැ යෙති. ජීවිතෙන්ද්‍රියය අභාවයට යෙයි. කුඩා නදියක දියත්තක් සෙයින් මිනිසුන්ගේ ආයුස ගෙවේ.

**අප්පං වත ජීවිතං ඉදං ඔරං වස්සසතාපි මීයති** – කලලකාලයෙහිදු ච්‍යුත වෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනැසෙයි. අර්බුදකාලයෙහි දු... පෙශිකාලයෙහි දු...ඝනකාලයෙහි දු...ප්‍රශාඛකාලයෙහි දු...උපන්කෙණෙහි දු...තිඹිරිගෙහි දු ච්‍යුත වෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනසෙයි. අඩමැසි වූයේ ද...එක්මැසි වූයේ ද... දෙමැසි වූයේ ද...තෙමැසි වූයේ ද...සිවුමැසි වූයේ ද...පස්මැසි වූයේ ද...සමැසි වූයේ ද...සත්මැසි වූයේ ද...අටමැසි වූයේද...නවමැසි වූයේ ද...දසමැසි වූයේ ද ච්‍යුත වෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනැසෙයි. එක්හැවිරිදි වූයේ ද...දෙහැවිරිදි වූයේ ද... තුන්හැවිරිදි වූයේ ද...සිවුහැවිරිදි වූයේ ද...පස්හැවිරිදි වූයේ ද...සහැවිරිදි වූයේ ද...සත්හැවිරිදි වූයේ ද...අටහැවිරිදි වූයේ ද...නවහැවිරිදි වූයේ ද...දසහැවිරිදි වූයේ ද. . .විසිහැවිරිදි. . .තිස්හැවිරිදි. . .සතලිස්හැවිරිදි. . . පනස්හැවිරිදි...සැටහැවිරිදි...සැත්තෑහැවිරිදි...අසූහැවිරිදි...අනූහැවිරිදි වූයේ ද ච්‍යුතවෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනැසේ නුයි 'ඔරං වස්සසතාපි මීයති' යනු වේ.

**යො චෙපි අතිච්ච ජීවති** – යමෙක් අවුරුදු සියය ඉක්මවා ජීවත් වේ නම්, හෙතෙම එක් වසක් හෝ ජීවත් වෙයි, දෙවසක් හෝ... තෙවසක් හෝ...සිවුවසක් හෝ...පස්වසක් හෝ ජීවත්වෙයි, ...දසවසක් හෝ හෝ...විසිවසක් හෝ...තිස්වසක් හෝ...සතලිස්වසක් හෝ ජීවත් වේ නුයි – 'යො චෙපි අතිච්ච ජීවති' යනු වේ.

**අථ ඛො සො ජරසාපි මීයති** – යම් කලෙක ජරාවෙන් දිරුයේ වේ ද වයසින් වෘද්ධ වූයේ මහලු වූයේ තුන්වයස් ඉක්මැවූයේ අන්තිම වයසට පැමිණියේ වේ ද, (එකල්හි) කඩ (ගිලිහුණු) දත් ඇතියේ පැසුණු කෙස් ඇතියේ සිඳුණු කෙස් ඇති බල්වාටයිෂී වූයේ රැලිහටගත් තලකැලලින් යුත් සිරුරු ඇතියේ වක්වූයේ බිඳුණු සිරුරු ඇතියේ සැරයටිය පිහිට කොට ඇතියේ හෙතෙම ජරාවෙන් මඩනා ලද්දේම ච්‍යුත වෙයි මැරෙයි අතුරුදහන් වෙයි වැනැසෙයි. මරණයෙන් මිදීමෙක් නැති.

13. එලගිමියතට පැසුණු ගෙඩි උදෑසන වැටීමෙන් උපදනා බිය මෙන් මෙසේ උපන් සත්නට නිරතුරු මරණයෙන් බිය උපදනේය.

14. කුඹලා විසින් කරන ලද මැටිබඳුන් සියල්ල යම්සේ බිඳීම අවසන් කොට ඇත්තේ ද, එසෙයින් සත්ත්වයන්ගේ ජීවිතය මරණය අවසන් කොට ඇත්තේය.

15. තරුණයෝ ද මහල්ලෝ ද බාලයෝ ද පණ්ඩිතයෝ ද යන සියල්ලෝ මරහුගේ වශයට යෙති. සියල්ලෝ මරණය පරායණ කොට ඇත්තාහ.

16. "තෙසං මච්චුපරෙතානං ගච්ඡතං පරලොකතො,
න පිතා තායතෙ පුත්තං ඤාතී වා පන ඤාතකෙ.

17. පෙක්ඛතඤ්ඤෙව ඤාතීනං පස්ස ලාලපතං[1] පුථු,
එකමෙකොව මච්චානං ගොවජ්ඣො විය නීයති.
එවමබ්භාහතො ලොකො මච්චුනා ච ජරාය චා"ති[a]

අථ ඛො සො ජරසාව මීයති.

තෙනාහ භගවා:

"අප්පං වත ජීවිතං ඉදං
ඔරං වස්සසතාපි මීයති,
යො චෙපි අතිච්ච ජීවති
අථ ඛො සො ජරසාව මීයතී"ති.

6 - 2

සොචන්ති ජනා මමායිතෙ
න හි සන්ති නිච්චා පරිග්ගහා,
විනාභාවං සන්තමෙවිදං
ඉති දිස්වා නාගාරමාවසෙ.[2]

**සොචන්ති ජනා මමායිතෙති** - 'ජනා'ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච; **මමත්තා**ති- ද්වෙ මමත්තා: තණ්හාමමත්තං ච දිට්ඨිමමත්තං ච -පෙ- ඉදං තණ්හාමමත්තං -පෙ- ඉදං දිට්ඨිමමත්තං. මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි සොචන්ති. අච්ඡිජ්ජන්තෙපි සොචන්ති. අච්ඡින්නෙපි සොචන්ති. මමායිතං වත්ථුං විපරිණාමසඞ්කිනොපි සොචන්ති. විපරිණාමන්තෙපි සොචන්ති. විපරිණතෙපි සොචන්ති, කිලමන්ති, පරිදෙවන්ති, උරත්තාළිං කන්දන්ති, සම්මොහං ආපජ්ජන්තීති 'සොචන්ති ජනා මමායිතෙ.'

**න හි සන්ති නිච්චා පරිග්ගහා**ති - 'පරිග්ගහා'ති - ද්වෙ පරිග්ගහා: තණ්හාපරිග්ගහො ච දිට්ඨිපරිග්ගහො ච -පෙ- අයං තණ්හාපරිග්ගහො -පෙ- අයං දිට්ඨිපරිග්ගහො. තණ්හාපරිග්ගහො අනිච්චො සඞ්ඛතො පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො විරාගධම්මො නිරොධධම්මො විපරිණාමධම්මො. දිට්ඨිපරිග්ගහො ච අනිච්චො සඞ්ඛතො[3] පටිච්චසමුප්පන්නො ඛයධම්මො වයධම්මො විරාගධම්මො නිරොධධම්මො විපරිණාමධම්මො.

වුත්තං හෙතං භගවතා:

"පස්සථ නො තුම්හෙ භික්ඛවෙ, තං පරිග්ගහං, යවාස්ස[4] පරිග්ගහො නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සතීති? නො හෙතං භන්තෙ. සාධු භික්ඛවෙ, අහම්පි ඛො එතං භික්ඛවෙ පරිග්ගහං න සමනුපස්සාමි, යවාස්ස[4] පරිග්ගහො නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සතී"ති.[b] පරිග්ගහා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්තීති 'න හි සන්ති නිච්චා පරිග්ගහා'.

---

1 ලාලපතං - සීමු II. ලාලප්පතං - මජ්ස. a. සුත්තනිපාත - සල්ලසුත්ත.
2. න ඝරමාවසෙ - මනුප. 3. අසඞ්ඛතො - සීමු. I.
4. යවායං - සීමු. II. යායං - PTS.
b. මජ්ඣිමනිකාය - අලගද්දූපමසුත්ත

16. මරණයෙන් පීඩිත වූ මෙලොවින් පරලොවට යන ඒ සත්‍වයන් පිළිබඳ ව යම්හෙයකින් පියා පුතු නො රකී ද, නෑ කෙනෙක් හෝ නෑයන් නො රකිත් ද, එහෙයින් -

17. බලව! නත් අඬුරින් වැළැපෙන්නාවූ නෑයන් බලාසිටියදී මැ මිනිසුන් අතුරෙන් එකඑකා මැ වධයට ගෙන යන ගවයකු මෙන් මරණයට පමුණුවනු ලැබෙයි. මෙසෙයින් ලොවැසි තෙමේ මරණය විසින් හා ජරාව විසින් ද මඩනා ලදුයේ නුයි - 'අථ ඛො සො ජරසාව මීයති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අප්පං වත-පෙ-අථ ඛො සො ජරසාව මීයති" යි.

**6 - 2**

සත්‍වයෝ තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් මමත්‍වයෙන් ගන්නා ලද වස්තුවිෂයෙහි (=වස්තුව කරණ කොටගෙන) ශොක කෙරෙති. එතෙකුදු වත් නිත්‍ය වූ පරිග්‍රහ කෙනෙක් නො මැ වෙති. මේ විනාභාවය විද්‍යමාන වූයේ මැ යයි දැක (නුවණැත්තේ) ගිහිගෙයි නො වසන්නේ යි.

**සොචන්ති ජනා මමායිතෙ** - 'ජනා' යනු: ක්‍ෂත්‍රිය-බ්‍රාහ්මණ-වෛශ්‍ය-ශුද්‍ර-ගෘහස්ථ-ප්‍රව්‍රජිත-දෙව-මනුෂ්‍යයෝ ය; 'මමායිතා' යනු: තෘෂ්ණාමමත්‍වය ද දෘෂ්ටිමමත්‍වය දැයි මමත්‍වයෝ දෙදෙනෙක් වෙති...මාගේ යයි ගන්නා ලද වස්තුව 'අසිඳ ගනිති' යන සැක ඇත්තාහු ද (සිතින්) ශොක කෙරෙති, අසිඳුනා කල්හි දු ශොක කෙරෙති, අසිඳගත් කල්හි දු ශොක කෙරෙත්, මමායිත වස්තුව 'විපරීත වෙති' සැක ඇත්තාහු ද ශොක කෙරෙති, විපරීත වන කල්හි දු ශොක කෙරෙති, විපරීත වූ කල්හි දු ශොක කෙරෙති, වෙහෙසෙති විලාප කියති ළෙහි අත් ගසා හඬති සම්මෝහයට පැමිණෙත් නුයි - 'සොචන්ති ජනා මමායිතෙ' යනු වේ.

**න හි සන්ති නිච්චා පරිග්ගහා** - 'පරිග්ගහා' යනු: තෘෂ්ණාපරිග්‍රහය ද දෘෂ්ටිපරිග්‍රහය දැයි පරිග්‍රහයෝ දෙදෙනෙක් වෙති...තෘෂ්ණාපරිග්‍රහය අනිත්‍ය යැ, සංඛත (=ප්‍රත්‍යයන් විසින් කරන ලද) යැ, ප්‍රත්‍යයසාමග්‍රිය නිසා උපන, ක්‍ෂය වන සුලු යැ, නැසෙන සුලු යැ, නොඇලෙන පියවි ඇත්තේ යැ, නිරුද්ධ වන පියවි ඇත්තේ යැ, පෙරළෙන පියවි ඇත්තේ යැ; දෘෂ්ටිපරිග්‍රහය ද අනිත්‍ය යැ සංඛත යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්‍ෂයධර්මී යැ ව්‍යයධර්මී යැ විරාගධර්මී යැ නිරොධධර්මී යැ විපරිණාමධර්මී යි.

මේ වදාරන ලද්දේ මැනු, බුදුන් විසින්:

"මහණෙනි, තෙපි නිත්‍ය වූ ධ්‍රැව වූ ශාශ්වත වූ අවිපරිණාමස්‍වභාව වූ යම් පරිග්‍රහයෙක් ශාශ්වතිකයක් සෙයින් එසේ ම සිටුනේ නම්, එබඳු පරිග්‍රහයක් දකිවූ දැ?'යි 'නෙල නැත් මැ ය වහන්ස'. සොඳුරු යැ මහණෙනි, ඇපි දු මහණෙනි, යම් පරිග්‍රහයෙක් නිත්‍ය-ධ්‍රැව-ශාශ්වත -අවිපරිණාමස්‍වභාව වූයේ ශාශ්වතිකයක් මෙන් එසෙයින් මැ සිටුනේ නම්, නෙල පරිග්‍රහය නො දකුම්හ"යි. පරිග්‍රහයෝ නිත්‍ය වූවාහු ස්ථිර වූවාහු ශාශ්වත වූවාහු අවිපරිණාමස්‍වභාව වූවාහු නැති, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙත් නුයි 'න සන්ති නිච්චා පරිග්ගහා' යනු වේ.

**විනාභාවං සන්තමෙවිදන්ති** – නානාභාවෙ විනාභාවෙ අඤ්ඤථාභාවෙ සන්තෙ සංවිජ්ජමානෙ[1] උපලබ්භියමානෙ; වුත්තං හෙතං භගවතා; "අලං ආනන්ද, මා සොචි. මා පරිදෙවි. නනු එතං මයා ආනන්ද, පටිගච්චෙව අක්ඛාතං සබ්බෙහෙව පියෙහි මනාපෙහි නානාභාවො විනාභාවො අඤ්ඤථාභාවො. තං කුතෙත්ථ ආනන්ද, ලබ්භා, යං තං ජාතං භූතං සඞ්ඛතං පලොකධම්මං තං වත මා පලුජ්ජීති නෙතං ඨානං විජ්ජතී"ති.[a] පුරිමානං පුරිමානං ඛන්ධානං ධාතූනං ආයතනානං විපරිණාමඤ්ඤථාභාවා පච්ඡිමා පච්ඡිමා ඛන්ධා ච ධාතුයො ච ආයතනානි ච පවත්තන්තීති– 'විනාභාවං සන්තමෙවිදං.'

**ඉති දිස්වා නාගාරමාවසෙති** – 'ඉතී'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා නාමෙතං ඉතීති. **ඉති දිස්වා** – පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා මමත්තෙනපීති 'ඉති දිස්වා'; **නාගාරමාවසෙති**[2] – සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපලිබොධං ඡින්දිත්වා සන්නිධිපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චන[3]භාවං උපගන්ත්වා එකො චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති 'ඉති දිස්වා නාගාරමාවසෙ'.

තෙනාහ භගවා:

"සොචන්ති ජනා මමායිතෙ
න හි සන්ති නිච්චා පරිග්ගහා,
විනාභාවං සන්තමෙවිදං
ඉති දිස්වා නාගාරමාවසෙ"ති.[2]

**6 – 8**

මරණෙනපි තං පහීයති
යං පුරිසො මමිදන්ති මඤ්ඤති,
එතං දිස්වාන[4] පණ්ඩිතො
න මමත්තාය නමෙථ මාමකො.

**මරණෙනපි තං පහීයතීති** – 'මරණ'න්ති යා[5] තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්සුපච්ඡෙදො;[b] තන්ති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං; **පහීයතීති** – පහීයති ජහීයති විජහීයති අන්තරධායති විප්පලුජ්ජති. භාසිතම්පිහෙතං:

1. "පුබ්බෙව මච්චං විජහන්ති භොගා
මච්චො ච තෙ පුබ්බතරං ජහාති,
අසස්සතා භොගිනො කාමකාමී
තස්මා න සොචාමහං සොකකාලෙ.[c]

---

1. සංවිජ්ජමානෙ අධි – සීමු. I. 2. න ඝරමාවසෙති – මජ්ඣප.
3. ආකිඤ්චන – සහ. 4. එතමපි විදිත්වා – සහ, මජ්ඣප. 5. යං – සීමු. I.
a. දීඝනිකාය – මහාපරිනිබ්බානසුත්ත. b. පටිච්චසමුප්පාදවිභඞ්ග.
c. මණිකුණ්ඩලජාතක.

**විනාභාවං සන්තමෙවිදං** – නානාභාවය වියොගභාවය අන්‍යථාභාවය ඇතිකල්හි විද්‍යමාන කල්හි ලැබෙන කල්හි; මේ වදාරන ලද මැ ය බුදුන් විසින්: “ආනන්ද, තහමක් ශොක කර, නහමක් පරිදෙවනා කර; ආනන්ද, මා විසින් මෙය පළමු (කලින්) මැ කියන ලද්දේ නො වේ ද, සියලු මැ ප්‍රිය මනාපයන් කෙරෙන් (ජාත්‍යාදිය හෙතු කොටගෙන) නානාභාවය වියොගභාවය අන්‍යථාභාවය වෙයි. ආනන්ද, යමක් ජාත නම් භූත නම් ප්‍රත්‍යයොත්පන්න නම් බිඳෙන පියෙවි ඇත් නම් එය නහමක් බිඳේවා’යි, එය කොයින් ලැබේ ද, මේ කාරණය විද්‍යමාන නො වේ”ය යි. පළමු පළමු හටගත් ස්කන්ධ-ධාතු-ආයතනයන්ගේ ප්‍රකෘතිය හැර අන්‍යථාත්වයට පැමිණීම හෙතු කොට ගෙන පසු පසු වූ ස්කන්ධ-ධාතු-ආයතනයෝ පවත්නාහු නුයි – ‘විනාභාවං සන්තමෙවිදං’ යනු වේ.

**ඉති දිස්වා නාගාරමාවසෙ** – ‘ඉති’ – තෙල ‘ඉති’ යනු: පදසන්ධි යැ, පදසංයොග යැ පදපූරණ යැ, අක්ෂරසන්නිපාත යැ, ව්‍යඤ්ජනයන්ගේ සිලිටුබව යැ, පදයන්ගේ අනුපිළිවෙළ නම් වේ. **ඉති දිස්වා** මමායිත වස්තුවිෂයෙහි බලා තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට නුයි ‘ඉති දිස්වා’ යනු වේ. **නාගාරමාවසෙ** – සියලු ගෘහවාසපළිබොධය (=කරදරය) සිඳ, අඹුදරුපළිබොධය සිඳ, ඥතිපළිබොධය සිඳ, මිත්‍රාමාත්‍යපළිබොධය සිඳ, සන්නිධිපළිබොධය සිඳ, කෙස්දැළිරවුළු බහා කහවත් හැඳපෙරවැ, ගිහිගෙන් නික්මැ සස්නෙහි පැවිදි වැ, කිසිවක් නැතිබවට පැමිණ, එකලා වැ හැසිරෙන්නේය වෙසෙන්නේය ඉරියවු පවත්වන්නේය පාලන-යපන-යාපනය කරන්නේ නුයි ‘ඉති දිස්වා නාගාරමාවසෙ’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“සොචන්ති ජනා–පෙ–ඉති දිස්වා නාගාරමාවසෙ” යනු.

6 – 8

පුරුෂ තෙමේ යම් රූපාදියක් ‘මේ මාගේ’ යයි මඤ්ඤනාවශයෙන් හඟනේ නම්, එය මරණයෙන් තමුදු දුරු කරනු ලැබෙයි. බුද්ධාදීන් කෙරෙහි මාමක වූ පණ්ඩිත තෙමේ රූපාදීයෙහි තෙල ආදීනවය දැක මමත්වයට නො නැමෙන්නේ යි.

**මරණෙනපි තං පහීයති** – ‘මරණං’ යනු: ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙන් යම් ච්‍යුතියෙක් ච්‍යුතවන බවෙක් බිඳීමෙක් අතුරුදහන් වීමෙක් මෘත්‍යුසඞ්ඛ්‍යාත මරණයෙක් කළුරියකිරීමෙක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් කළෙවරයාගේ බහාලීමෙක් ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමෙක් වේ ද එය යි. **තං** – ඒ රූපය වෙදනාව සංඥව සංස්කාරය විඥනය; **පහීයති** – ප්‍රහීණ කරනු ලැබෙයි, හරිනු ලැබෙයි, වෙසෙසින් හරිනු ලැබෙයි, අතුරුදහන් වෙයි, සුණුවිසුණු වේ. මේ කියන ලදුයේ මැ ය:

1. භොගයෝ පළමු මැ මිනිසා දුරු කෙරෙති (–අත්හරිති). මිනිසා ද ඊටත් පෙරටුව ඒ භොගයන් දුරු කෙරෙයි. එම්බා කාමකාමිය, (ලොවැ) කාමභොගීනු අශාශ්වතයෝ යැ. එහෙයින් මම මහාජනයා ශොක කරන කල්හි ශොක නො කෙරෙමි.

2. උදෙති ආපූරති වෙති චන්දො
අත්ථඞ්ගමෙත්වාන පලෙති සූරියො,
විදිතා මයා සත්තුක! ලොකධම්මා
තස්මා න සොචාමහං සොකකාලෙ"තිa

මරණෙනපි තං පහීයති.

**යං පුරිසො මමිදන්ති මඤ්ඤතීති** – 'ය'න්ති රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං; **පුරිසොති** සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො; **මමිදන්ති මඤ්ඤතීති** තණ්හාමඤ්ඤනාය මඤ්ඤති, දිට්ඨිමඤ්ඤනාය මඤ්ඤති, මානමඤ්ඤනාය මඤ්ඤති, කිලෙසමඤ්ඤනාය මඤ්ඤති, දුච්චරිත-මඤ්ඤනාය මඤ්ඤති, පයොගමඤ්ඤනාය මඤ්ඤති, විපාකමඤ්ඤනාය මඤ්ඤතීති 'යං පුරිසො මමිදන්ති මඤ්ඤති.'

**එතං දිස්වාන[1] පණ්ඩිතොති** – එතං ආදීනවං ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා මමත්තෙසූති – එතං[2] දිස්වාන; **පණ්ඩිතොති** – ධීරො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවීති – 'එතං දිස්වාන පණ්ඩිතො.'

**න මමත්තාය නමෙථ මාමකොති** – 'මමත්තා'ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තං ච දිට්ඨිමමත්තං ච -පෙ- ඉදං තණ්හාමමත්තං -පෙ- ඉදං දිට්ඨිමමත්තං; **මාමකොති** – මාමකො බුද්ධමාමකො ධම්මමාමකො සඞ්ඝමාමකො; සො තං භගවන්තං මමායති. භගවා තං පුග්ගලං පරිග්ගණ්හාති. වුත්තං හෙතං භගවතා: "යෙ තෙ භික්ඛවෙ භික්ඛූ කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා, න මෙ තෙ භික්ඛවෙ, භික්ඛූ මාමකා. අපගතා ච තෙ භික්ඛවෙ, භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. න ච පන තෙ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. යෙ ච ඛො තෙ භික්ඛවෙ, භික්ඛූ නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා, තෙ ඛො මෙ භික්ඛවෙ, භික්ඛූ මාමකා. අනපගතා ච තෙ භික්ඛවෙ, භික්ඛූ ඉමස්මා ධම්මවිනයා; තෙ ච ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති.b

3. "කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා,
න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ.

4. නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා,
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ"තිb

---

1. එතම්පි විදිත්වා - ස්‍යා. මනුප 2. එතම්පි - සීමු. II

a. ජාතක - පඤ්චකනිපාත - මණිකුණ්ඩලජාතක.

b. චතුක්කඞ්ගුත්තර - උරුවෙලවග්ග.

2. එම්බා සත්තුකය, මා විසින් (ලාභාලාභාදි) ලෝකධම්මයෝ දැනගන්නා ලද්දහ, සඳු උදයට පැමිණෙයි, පිරෙයි, යළි ගෙවී යෙයි. හිරු උදයට පැමිණ යළි අස්තයට යෙයි. (එසෙයින් භොගයෝ උපදිති යළි වැනැසෙත්;) එහෙයින් මම මහජනයා ශොක කරන කල්හි ශොක නො කරම් යයි.

**යං පුරිසො මමිදන්ති මඤ්ඤති** - 'යං' යනු: යම් රූප-වේදනා සඤ්ඤ-සඞ්ඛාර-විඤ්ඤණගතයක්; **පුරිසො** යනු: සඞ්ඛ්‍යා යැ සංඥ යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නාම යැ නාමකර්‍ම යැ නාමධෙය්‍ය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප යි; **මමිදන්ති මඤ්ඤති** - තෘෂ්ණා-යෙන් උපන් මානයෙන් සිතයි (-මාන කෙරෙයි,) දෘෂ්ටිමඤ්ඤනාවෙන් මාන කෙරෙයි, සහජාත මානමඤ්ඤනාවෙන් මාන කෙරෙයි' ක්ලෙශමඤ්ඤ-නාවෙන් මාන කෙරෙයි, දුශ්චරිතමඤ්ඤනාවෙන් මාන කෙරෙයි, ප්‍රයොගමඤ්ඤනාවෙන් මාන කෙරෙයි, විපාකමඤ්ඤනාවෙන් මාන කෙරේ නුයි - 'යං පුරිසො මමිදන්ති මඤ්ඤති' යනු වේ.

**එතං දිස්වාන පණ්ඩිතො** - මමත්‍ව කළ වස්තුවිෂයෙහි හෙල ආදීනවය දැන තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට නුයි 'එතං දිස්වාන' යනු වේ. **පණ්ඩිතො** - ධීර වූයේ ප්‍රඥවත්-බුද්ධිමත්-ඥනවත් - විද්වත් වූයේ මෙධා ඇතියේ නුයි - 'එතං දිස්වාන පණ්ඩිතො' යනු වේ.

**න මමත්තාය නමෙථ මාමකො** - 'මමත්තා'යනු මමත්‍ව දෙකෙක... **මාමකො** - මමත්‍වය ඇතියේ බුද්ධමාමක - ධම්මාමාමක - සඞ්ඝමාමක වූයේ; හෙතෙම ඒ බුදුන් මමායන කෙරෙයි. බුදුහු ඒ පුහුලා විමසති: මේ වදාරන ලද මැයි, භාග්‍යවතුන් විසින්: ''මහණෙනි, යම් ඒ මහණ කෙනෙක් කුහක වූවාහු තද වූවාහු ප්‍රත්‍යය නිමිත්තෙන් බණන්නාහු සැරසෙන පියවි ඇත්තාහු නැඟුණු මානනල ඇත්තාහු සමාධි රහිත වූවාහු වෙත් ද, මහණෙනි ඒ මාගේ භික්ෂූහු මා අයත් වූවාහු නො වෙති, මහණෙනි, ඒ භික්ෂූහු මෙ සස්නෙන් බැහැර වූවාහු ද වෙති. තවද ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වෘද්ධියට ස්ථිරබවට විපුල බවට නො ද පැමිණෙත්. මහණෙනි, තවද යම් භික්ෂු කෙනෙක් කුහක නොවූවාහු ලපක නොවූවාහු ධීර වූවාහු නොතද වූවාහු එකඟ සිත් ඇත්තාහු වෙත් ද, මහණෙනි, ඒ මාගේ භික්ෂූහු මා අයත් වූවාහු වෙති, තවද මහණෙනි, ඒ භික්ෂූහු මෙ සස්නෙන් බැහර නොවූවාහු වෙති, ඔවුහු මෙ සස්නෙහි වැඩීමට නැවුරු බවට පැතුරුණු බවට ද පැමිණෙත්.

3. කුහක වූ කොපයෙන් හා මානයෙන් තද වූ ප්‍රත්‍යය පිළිබඳ කොට කථා කරන නැඟුණු මානනල ඇති සමාධි රහිත වූ යම් කෙනෙක් වෙත් නම්, ඔවුහු සම්මාසම්බුදුන් වදාළ සසුන්දහම්හි නො වැඩෙත්.

4. කුහක නො වූ ලපක නො වූ ධෘතිමත් වූ නොතද වූ මොහොවට එකඟ කළ සිත් ඇති යම් කෙනෙක් වෙත් නම්, ඔවුහු එකාන්තයෙන් සම්මාසම්බුදුන් වදාළ සසුන්දහම්හි වැඩෙත්.

**න මමත්තාය නමෙථ මාමකොති** – මාමකො තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා මමත්තාය න නමෙය්‍ය, න ඔනමෙය්‍ය, න තන්නින්නො අස්ස, න තප්පොණො න තප්පබ්භාරො න තදධිමුත්තො න තදධිපතෙය්‍යොති – න මමත්තාය නමෙථ මාමකො.
තෙනාහ භගවා:

"මරණෙනපි තං පහීයති
යං පුරිසො මමිදන්ති මඤ්ඤති,
එතං දිස්වාන පණ්ඩිතො
න මමත්තාය නමෙථ මාමකො"ති.

6 – 4

සුපිනෙන[1] යථාපි සඞ්ගතං[2]
පටිබුද්ධො පුරිසො න පස්සති,
එවං[3] පියායිතං ජනං
පෙතං කාලකතං න පස්සති.

**සුපිනෙන යථාපි සඞ්ගතන්ති** – සඞ්ගතං සමාගතං සමාහිතං සන්නිපතිතන්ති 'සුපිනෙන යථාපි සඞ්ගතං.'

**පටිබුද්ධො පුරිසො න පස්සතීති** – යථා පුරිසො සුපිනගතො චන්දං පස්සති, සුරියං පස්සති, මහාසමුද්දං පස්සති, සිනෙරුං පබ්බතරාජානං පස්සති, හත්ථිං පස්සති, අස්සං පස්සති, රථං පස්සති, පත්තිං පස්සති, සෙනාබ්‍යූහං පස්සති, ආරාමරාමණෙය්‍යකං පස්සති, වනරාමණෙය්‍යකං පස්සති, භූමිරාමණෙය්‍යකං පස්සති, පොක්ඛරණීරාමණෙය්‍යකං පස්සති; පටිබුද්ධො න කිඤ්චි පස්සතීති 'පටිබුද්ධො පුරිසො න පස්සති.'

**එවං පියායිතං ජනන්ති** – 'එව'න්ති ඔපම්මසම්පටිපාදනං; **පියායිතං ජනන්ති** පියායිතං මමායිතං ජනං, මාතරං වා පිතරං වා භාතරං වා භගිනිං වා පුත්තං වා ධීතරං වා මිත්තං වා අමච්චං වා ඤාතිසාලොහිතං වාති[4] 'එවං පියායිතං ජනං.'[5] **පෙතං කාලකතං න පස්සතීති** – පෙතො වුච්චති මතො කාලකතො, තං පෙතං න පස්සති, න දක්ඛති, නාධිගච්ඡති, න වින්දති, න පටිලභතීති – පෙතං කාලකතං න පස්සති.
තෙනාහ භගවා:

සුපිනෙන[6] යථාපි සඞ්ගතං
පටිබුද්ධො පුරිසො න පස්සති,
එවං[7] පියායිතං ජනං
පෙතං කාලකතං න පස්සතී"ති.

6 – 5

දිට්ඨාපි සුතාපි තෙ ජනා
යෙසං නාමමිදං පවුච්චති,
නාමමෙවාවසිස්සති
අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො.

**දිට්ඨාපි සුතාපි තෙ ජනාති** – 'දිට්ඨා'ති යෙ චක්ඛුවිඤ්ඤාණාභිසම්භූතා; **සුතාති** යෙ සොතවිඤ්ඤාණාභිසම්භූතා; **තෙ ජනාති** ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා චාති 'දිට්ඨාපි සුතාපි තෙ ජනා.'

---

1. සුපිනෙපි - මනුප. 2. සංඛතං - ස. 3. එව මපි - මනුප.
4. වා - සීමු II. 5. ජනන්ති - සීමු II. මනුප.
6. සුපිනෙපි - මනුප. 7. එවමපි - මනුප.

**න මමත්තාය නමෙථ මාමකො** - බුද්ධාදීන් කෙරෙහි මමත්වය ඇතියේ තෘෂ්ණාමමත්වය හැර දෘෂ්ටිමමත්වය දුරු කොට මමත්වයට නො නැමෙන්නේය, අවනත නො වන්නේය, ඊට නැමුණේ ඊට ප්‍රවණ වූයේ ඊට බර වූයේ එයි ඇලුණේ එය අධිපති කොට ඇතියේ නො වන්නේ නුයි 'න මමත්තාය නමෙථ මාමකො, යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"මරණෙනපි තං පහීයති-පෙ-න මමත්තාය නමෙථ මාමකො" යි.

## 6 - 4

පුරුෂ තෙමේ සිහිනෙන් පැමිණ හෝ දක්නා ලද චන්ද්‍රාදි කිසිවක් පිබිදියේ යම්සේ නො දකී ද, එසෙයින් පරලොව ගිය කලුරිය කළා වූ ප්‍රිය කළ සත්ත්වයා නො දකී.

**සුපිනෙන යථාපි සඞ්ගතං** - හමු වූ සමීපයට පැමිණි එක් වූ පිඬු වූවාහු නුයි 'සුපිනෙන යථාපි සඞ්ගතං, යනු වේ.

**පටිබුද්ධො පුරිසො න පස්සති** - පුරුෂ තෙමේ නිදන්නේ සඳ දකී, හිරු දකී, මහමුහුද දකී, මහමෙර දකී, ඇතකු - අසකු - රියක් - පාවිලසෙනඟක් - සේනාසමූහයක් දකී, සිත්කලු අරම් - සිත්කලු උයන් - සිත්කලු බිම්පෙදෙස් - සිත්කලු පොකුණු දකී, (එතෙකුදු වත්) පිබිදියේ යම්සේ කිසිවක් නො දකී ද, එහෙයින් 'පටිබුද්ධො පුරිසො න පස්සති, යනු වේ.

**එවං පියායිතං ජනං** - 'එවං' යනු: ඖපම්‍ය දැක්වීම යි; **පියායිතං ජනං** - ප්‍රිය කළ මමත්වය කළ සත්ත්වයා: මව හෝ පියා හෝ බෑයා හෝ බුහුන හෝ පුතු හෝ දූ හෝ මිතුරකු හෝ යහළුවකු හෝ නෑ-සහලේ-නෑයකු හෝ නුයි 'එවං පියායිතං ජනං' යනු වේ. **පෙතං කාලකතං න පස්සති** - මළේ කලුරිය කෙළේ 'ප්‍රෙත, යයි කියනු ලැබේ. ඒ මළහු නො දකී නො පැමිණෙයි නො ලැබෙයි ප්‍රතිලාභ නො වේ නුයි 'පෙතං කාලකතං න පස්සති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සුපිනෙන යථාපි-පෙ-කාලකතං න පස්සති" යි.

## 6 - 5

ක්ෂත්‍රියාදි යම් කෙනකුන්ගේ නාමප්‍රඥප්තිය මේ යැයි කියනු ලැබේ ද, ඒ සත්ත්වයෝ ඇසින් දුටු චතුසමුට්ඨානික රූපයෝ ද කනින් ඇසූ ද්විසමුට්ඨානික ශබ්දයෝ ද වෙති. පරලොව ගිය සත්ත්වයා ගේ නාමමාත්‍රය ම කියන්නට ඉතිරි වේ.

**දිට්ඨාපි සුතාපි තෙ ජනා** - **දිට්ඨා** - චක්ෂුර්විඥානයෙන් දක්නා ලද චතුසමුට්ඨානික රූපයෝ; **සුතා** - ශ්‍රොත්‍රවිඥානයෙන් අසන ලද ද්විසමුට්ඨානික ශබ්දයෝ; **තෙ ජනා** - ක්ෂත්‍රිය - බ්‍රාහ්මණ - වෛශ්‍ය - ශුද්‍ර - ගෘහස්ථ - ප්‍රව්‍රජිත - දෙව - මනුෂ්‍යයෝ නුයි දිට්ඨාපි සුතාපි තෙ ජනා.

**යෙසං නාමමිදං පවුච්චතීති** – 'යෙස'න්ති ඛත්තියානං බ්‍රාහ්මණානං වෙස්සානං සුද්දානං ගහට්ඨානං පබ්බජිතානං දෙවානං මනුස්සානං; **නාමන්ති** සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො; **පවුච්චතීති** වුච්චති පවුච්චති කථියති භණියති දීපියති වොහරියතීති 'යෙසං නාමමිදං පවුච්චති.'

**නාමමෙවාවසිස්සති අක්ඛෙය්‍යන්ති** – රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං පහීයති ජහීයති අන්තරධායති විප්පලුජ්ජතීති– නාමමෙවාවසිස්සති; **අක්ඛෙය්‍යන්ති** – අක්ඛාතුං කථෙතුං භණිතුං දීපයිතුං වොහරිතුන්ති 'නාමමෙවාවසිස්සති අක්ඛෙය්‍යං.'

**පෙතස්ස ජන්තුනො**–'පෙතස්සා'ති පෙතස්ස කාලකතස්ස; **ජන්තුනොති** සත්තස්ස නරස්ස මාණවස්ස පොසස්ස පුග්ගලස්ස ජීවස්ස ජාගුස්ස[1] ජන්තුස්ස ඉන්දගුස්ස හින්දගුස්ස මනුජස්සාති – අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො.

තෙනාහ භගවා:

"දිට්ඨාපි සුතාපි තෙ ජනා
යෙසං නාමමිදං පවුච්චති,
නාමමෙවාවසිස්සති
අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො"ති.

**6 – 6**

සොකපරිදෙවමච්ඡරං[2]
න ජහන්ති ගිද්ධා මමායිතෙ
තස්මා මුනයො පරිග්ගහං
හිත්වා අචරිංසු ඛෙමදස්සිනො.

**සොකපරිදෙවමච්ඡරං[2] න ජහන්ති ගිද්ධා මමායිතෙති** – 'සොකො'ති ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො අන්තොදාහො[3] අන්තොපරිදාහො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං[a]; **පරිදෙවොති** – ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස – පෙ – දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා[4] ලාලප්පිතත්තං[5][a]; **මච්ඡරියන්ති** – පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං, යං එවරූපං මච්ඡරියං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං.[b] අපි ච ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතන මච්ඡරියම්පි මච්ඡරියං, ගාහො; ඉදං වුච්චති[6] මච්ඡරියං.

1. ජතුස්ස – සීමු. II. මජසං සස. 2. මච්ඡරං – මනුප. 3. ඩාහො – ස.
4. ලාලප්පායනා – සීමු. II. මනුප. 5. ලාලප්පායිතත්තං – සීමු. II. මනුප.
6. ගාහො වුච්චති – II. මනුප. a. පටිච්චසමුප්පාදවිභඞ්ග.
b. ඛුද්දකවත්ථුවිභඞ්ග.

**යෙසං නාමමිදං පවුච්චති** – යෙසං – (යම්) ක්ෂත්‍රිය–බ්‍රාහ්මණ – වෛශ්‍ය –ශුද්‍ර–ගෘහස්ථ–ප්‍රව්‍රජිත–දෙව්–මනුෂ්‍යයන්ගේ; **නාමං** – සංඛ්‍යාව සංඥව ප්‍රඥප්තිය ව්‍යවහාරය නාමය නාමකර්මය නාමධෙය්‍යය නිරුක්තිය ව්‍යඤ්ජනය අභිලාප යි; **පවුච්චති** – පවසනු ලැබෙයි’ කියනු ලැබෙයි, බණනු ලැබෙයි, දක්වනු ලැබෙයි, වහරනු ලැබේ නුයි – ‘යෙසං නාමමිදං පවුච්චති’ යනු වේ.

**නාමමෙවාවසිස්සති අක්ඛෙය්‍යං** – රූපය වෙදනාව සංඥව සංස්කාරය විඥනය ප්‍රහීණ වෙයි, හරිනු ලැබෙයි, අතුරුදහන් වෙයි, වැනැසේ නුයි – ‘නාමමෙවාවසිස්සති’ යනු වේ. **අක්ඛෙය්‍යං** – පවසන්නට කියන්නට බණන්නට දක්වන්නට වහරන්නට නුයි – ‘නාමමෙවාවසිස්සති අක්ඛෙය්‍යං’ යනු වේ.

**පෙතස්ස ජන්තුනො** – **පෙතස්ස** යනු: පරලොව ගියහු කලුරිය කළහු ගේ; **ජන්තුනො** – සත්ත්වයාගේ නර – මානව – පුරුෂ – පුද්ගල – ජීව – ජාගු – ජන්තු – ඉන්දගු – හින්දගු – මනුජයක්හුගේ නුයි – “අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“දිට්ඨාපි සුතාපි තෙ ජනා -පෙ- අක්ඛෙය්‍යං පෙතස්ස ජන්තුනො,,යි.

6 – 6

මමත්වය කළ වස්තු විෂයෙහි ගිජු වූවාහු ශොකපරිදෙවමාත්සර්‍ය්‍යය යම් හෙයකින් නො හරිත් ද, එහෙයින් මුනිහු තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහය හැරපියා ක්ෂෙමසඞ්ඛ්‍යාත නිවන දකිමින් විසූහ.

**සොකපරිදෙවමච්ඡරං න ජහන්ති ගිද්ධා මමායිතෙ** – ‘සොක’ නම්: ඥතින්ගේ විනාශයෙන් මඩනා ලද්දහුගේ හෝ භොගයන්ගේ විනාශයෙන් මඩනා ලද්දහු ගේ හෝ රොගව්‍යසනයෙන් – ශීලව්‍යසනයෙන් – දෘෂ්ටිව්‍යසනයෙන් මඩනා ලද්දහුගේ හෝ මිත්‍රව්‍යසනාදි යම් කිසි ව්‍යසනයෙකින් යුක්ත වූවහුගේ හෝ යම් කිසි දුක්හෙතුවකින් මඩනා ලද්දහුගේ හෝ ශොකයෙක් ශොක කරන අයුරෙක් ශොක කරන බවෙක් අභ්‍යන්තරශොකයෙක් සිත තුළ අධිකශොකයෙක් අභ්‍යන්තරදාහයෙක් අභ්‍යන්තරපරිදාහයෙක් සිත දැවෙන අයුරෙක් දොම්නසෙක් ශොකශල්‍යයෙක් වේ නම් එයයි. ‘පරිදෙව’ නම්: නෑයන්ගේ වනසින් මඩනා ලද්දහුගේ හෝ...දෘෂ්ටිව්‍යසනයෙන් – යම් කිසි ව්‍යසනයෙකින් යුක්ත වූවහු ගේ හෝ යම් කිසි දුඃඛහෙතුවකින් මඩනා ලද්දහුගේ හෝ හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් හඬන අයුරෙක් හඬන බවෙක් ගුණ කියා හඬන බවෙක් වචනයෙක් ප්‍රලාපයෙක් විප්‍රලාපයෙක් පුනපුනා කීමෙක් පුනපුනා කියන අයුරෙක් පුනපුනා කියන බවෙක් වේ නම් එය යි. **මච්ඡරියං** – මාත්සර්‍ය්‍යය:... (2-3.සූත්‍ර නිර්දේශය.) මේ මාත්සර්‍ය්‍ය යයි කියනු ලැබේ.

**ගෙධො** වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **මමත්තාති** ද්වෙ මමත්තා: තණ්හාමමත්තං ච දිට්ඨිමමත්තං ච -පෙ- ඉදං තණ්හාමමත්තං -පෙ- ඉදං දිට්ඨිමමත්තං; මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනො'පි සොචන්ති. අච්ඡිජ්ජන්තෙපි සොචන්ති. අච්ඡින්නෙපි සොචන්ති. මමායිතං වත්ථුං විපරිණාමසඞ්කිනො'පි සොචන්ති. විපරිණමන්තෙ'පි[1] සොචන්ති. මමායිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනො'පි පරිදෙවන්ති. අච්ඡිජ්ජන්තෙ'පි පරිදෙවන්ති. අච්ඡින්නෙ'පි පරිදෙවන්ති. මමායිතං වත්ථුං විපරිණාමසඞ්කිනො'පි පරිදෙවන්ති. විපරිණමන්තෙ'පි පරිදෙවන්ති. විපරිණතෙ'පි පරිදෙවන්ති. මමායිතං වත්ථුං රක්ඛන්ති ගොපෙන්ති පරිග්ගණ්හන්ති. මමායන්ති මච්ඡරායන්ති.[2] මමායිතස්මිං වත්ථුස්මිං සොකං න ජහන්ති. පරිදෙවං න ජහන්ති. මච්ඡරියං න ජහන්ති. ගෙධං න ජහන්ති. නප්පජහන්ති න විනොදෙන්ති න බ්‍යන්තිං කරොන්ති න අනභාවං ගමෙන්තීති-සොකපරිදෙවමච්ඡරං න ජහන්ති ගිද්ධා මමායිතෙ.

**තස්මා මුනයො පරිග්ගහං හිත්වා අචරිංසු ඛෙමදස්සිනොති** – 'තස්මා' ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තංනිදානා එතං ආදීනවං සම්පස්සමානා[3] මමත්තෙසූති තස්මා; **මුනයොති** – මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි; තෙන ඤාණෙන සමන්නාගතා මුනයො මොනප්පත්තා. තීණි මොනෙය්‍යානි: කායමොනෙය්‍යං වචීමොනෙය්‍යං මනොමොනෙය්‍යං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; **පරිග්ගහොති** – ද්වෙ පරිග්ගහා: තණ්හාපරිග්ගහො ච දිට්ඨිපරිග්ගහො ච -පෙ- අයං තණ්හාපරිග්ගහො -පෙ- අයං දිට්ඨිපරිග්ගහො; මුනයො තණ්හාපරිග්ගහං පරිච්චජිත්වා දිට්ඨිපරිග්ගහං පටිනිස්සජිත්වා චජිත්වා පරිච්චජිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තිං කරිත්වා අනභාවං ගමෙත්වා අචරිංසු විචරිංසු[4] ඉරියිංසු වත්තයිංසු පාලයිංසු යපයිංසු යාපයිංසු; **ඛෙමදස්සිනොති** – ඛෙමං වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං; **ඛෙමදස්සිනොති** – ඛෙමදස්සිනො තාණදස්සිනො ලෙණදස්සිනො සරණදස්සිනො අභයදස්සිනො අච්චුතදස්සිනො අමතදස්සිනො නිබ්බානදස්සිනොති 'තස්මා මුනයො පරිග්ගහං හිත්වා අචරිංසු ඛෙමදස්සිනො.'

තෙනාහ භගවා:

"සොකපරිදෙවමච්ඡරං
න ජහන්ති ගිද්ධා මමායිතෙ,
තස්මා මුනයො පරිග්ගහං
හිත්වා අචරිංසු ඛෙමදස්සිනො"ති.

**6 – 7**

පතිලීනචරස්ස භික්ඛුනො
භජමානස්ස විවිත්තමාසනං,[5]
සාමග්ගියමාහු තස්ස තං[6]
යො අත්තානං[7] භවනෙ න දස්සයෙ.

---

1. විපරිණාමන්තෙපි - මජසං, ස්‍යා. 2. මමායිතන්ති මච්ඡරායිතන්ති - ස්‍යා.
3. සම්පස්සමානො - සීමු. I. 4. විහරිංසු - මජසං.
5. විවිත්තමාසනං - මනුප. 6. තස්ස තං - මනුප. ස්‍යා. 7. අත්තං - මනුප.

**ගෙධ** යයි තෘෂ්ණාව කියනු ලබයි,... යම් රාගයෙක් සංරාගයෙක්... ලොභ අකුශලමූලයෙක් වේ ද එයයි. **මමත්තා** – තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය දැයි මමත්ව දෙකෙකි, ... මමත්වය කළ වස්තුව අසිදගනිති සැක ඇතිව ද සොවිති, අසිඳුනා කල්හි දු සොවිති, අසිඳගත් කල්හි දු සොවිත්. මමායිත වස්තුව වෙනස් වෙති සැක ඇතිව ද සොවිති, වෙනස් වන කල්හි දු සොවිති, වෙනස් වූ කල්හි දු සොවිත්; මමායිත වස්තුව අසිදගනිති සැක ඇතිව ද හඬති, අසිඳුණා කල්හි දු හඬති,• අසිඳගත් කල්හි දු හඬත්; මමත්වය කළ වස්තුව වෙනස් වෙති සැක ඇතිව ද හඬති, වෙනස් වන කල්හි දු හඬති, වෙනස් වූ කල්හි දු හඬත්; මමත්වය කළ වස්තුව රකිති ගොපනය කෙරෙති විමසති මමායන කෙරෙති මච්ඡරායන කෙරෙති. මමායිත වස්තුවිෂයෙහි ශොකය නො හරිති, පරිදෙව නො හරිති, මසුරුබව නො හරිති, ගිජුබව නො හරිති, නො දුරු කෙරෙති නො බැහැර කෙරෙති කෙළවර නො කෙරෙති අනභාවයට නො පමුණුවත් නුයි 'සොකපරිදෙවමච්ඡරං න ජහන්ති ගිද්ධා මමායිතෙ' යනු වේ.

**තස්මා මුනයො පරිග්ගහං හිත්වා අචරිංසු ඛෙමදස්සිනො** – තස්මා – එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මමායිත වස්තුවිෂයෙහි තෙල ආදීනවය දක්නාහු නුයි 'තස්මා' යනු වේ. **මුනයො** – 'මොන' යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රකෂ්ට දැනීමෙක්...අමොහයෙක් ධම්විචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එයයි. ඒ නුවණින් සමන්විත වූ මුනිහු මොනප්‍රාප්තයෝ යි. මොනෙය්‍ය තුනෙකි: කායමොනෙය්‍ය වචීමොනෙය්‍ය මනොමොනෙය්‍ය යයි...(2-8.සූත්‍රනිද්දේශය.) **පරිග්ගහො** – පරිග්‍රහයෝ දෙදෙනෙකි: තෘෂ්ණාපරිග්‍රහය ද දෘෂ්ටිපරිග්‍රහය දැයි,...මුනිහු තෘෂ්ණාපරිග්‍රහය හැරපියා දෘෂ්ටිපරිග්‍රහය දුරලා ත්‍යාග කොට හැර බැහැර කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා හැසුරුණාහ මෙසෙසින් හැසුරුණාහ ඉරියවූ පැවැත්වූහ පාලන – යපන – යාපන කළහ. **ඛෙමදස්සිනො** – 'ඛෙම' යි අමාමහනිවන කියනු ලැබෙයි, සියලු සංස්කාරයන්ගේ සන්හිඳීම ඇති සියලු උපධීන්ගේ දුරලීම ඇති තෘෂ්ණාක්ෂය වූ විරාග වූ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණයයි. **ඛෙමදස්සිනො** – ක්ෂෙමය දක්නාහු ත්‍රාණය – ලෙනය – ශරණය – අභය – අච්‍යුතය – අමෘතය – නිර්වාණය දක්නාහු නුයි – 'තස්මා මුනයො පරිග්ගහං හිත්වා අචරිංසු ඛෙමදස්සිනො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සොකපරිදෙවමච්ඡරං –පෙ– හිත්වා අචරිංසු ඛෙමදස්සිනො"යි.

**6 – 7**

ඒ ඒ අරමුණෙන් වැළැක්වූ සිත්හසර ඇති විවෙක අසුනක් සෙවුනා වූ ශෛක්ෂ මහණ හට ද නිරයාදි භවනයෙහි (ප්‍රතිසන්ධි වසින්) තමා නොදක්වන ඒ රහත් මහණ හට ද නිර්වාණසාමග්‍රියෙහි ලා මේ (නිරයාදි භවනයෙහි තමා නොදැක්වීම) අනුරූප යයි කියත්.

**පතිලීනචරස්ස භික්ඛුනොති** – පතිලීනචරා වුච්චන්ති සත්ත සෙඛා; අරහා පතිලීනො. කිං කාරණා පතිලීනචරා වුච්චන්ති සත්ත සෙඛා? තෙ තතො තතො චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා[1] පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා[2] සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. චක්ඛුද්වාරෙ චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. සොතද්වාරෙ චිත්තං – ඝානද්වාරෙ චිත්තං – ජිව්හාද්වාරෙ චිත්තං – කායද්වාරෙ චිත්තං – මනොද්වාරෙ චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. යථා කුක්කුටපත්තං වා න්හාරුදද්දුලං වා අග්ගිම්හි පක්ඛිත්තං පතිලීයති පතිකුටති පතිවට්ටති න සම්පසාරීයති, එවමෙවං තෙ තතො තතො චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. චක්ඛුද්වාරෙ චිත්තං – සොතද්වාරෙ චිත්තං – ඝානද්වාරෙ චිත්තං – ජිව්හාද්වාරෙ චිත්තං – කායද්වාරෙ චිත්තං – මනොද්වාරෙ චිත්තං පතිලීනෙන්තා පතිකුටෙන්තා පතිවට්ටෙන්තා සන්නිරුම්භෙන්තා සන්නිග්ගණ්හන්තා සන්නිවාරෙන්තා රක්ඛන්තා ගොපෙන්තා චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. තං කාරණා පතිලීනචරා වුච්චන්ති සත්ත සෙඛා. **භික්ඛුනොති** – පුථුජ්ජනකල්‍යාණකස්ස[3] වා භික්ඛුනො සෙඛස්ස වා භික්ඛුනොති 'පතිලීනචරස්ස භික්ඛුනො.'

**භජමානස්ස විවිත්තමාසනන්ති** – ආසනං වුච්චති යත්ථ නිසීදන්ති, මඤ්චො පීඨං භිසි තට්ටිකා චම්මඛණ්ඩො තිණසන්ථාරො පණ්ණසන්ථාරො පලාලසන්ථාරො; තං ආසනං අසප්පායරූපදස්සනෙන රිත්තං විවිත්තං පවිවිත්තං, අසප්පායසද්දසවණෙන – අසප්පායගන්ධඝායනෙන – අසප්පායරසසායනෙන – අසප්පායඵොට්ඨබ්බඵුසනෙන – අසප්පායෙහි පඤ්චහි කාමගුණෙහි රිත්තං විවිත්තං පවිවිත්තං, තං විවිත්තං ආසනං භජතො සම්භජතො සෙවතො නිසෙවතො සංසෙවතො පටිසෙවතොති 'භජමානස්ස විවිත්තමාසනං.'

**සාමග්ගියමාහු තස්සෙතං යො අත්තානං භවනෙ න දස්සයෙති**– 'සාමග්ගී'ති[4] තිස්සො සාමග්ගියො: ගණසාමග්ගී ධම්මසාමග්ගී අනභිනිබ්බත්තිසාමග්ගී. කතමා ගණසාමග්ගී? බහූ චෙපි භික්ඛූ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්තා විහරන්ති. අයං ගණසාමග්ගී. කතමා ධම්මසාමග්ගී? චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො, තෙ එකතො පක්ඛන්දන්ති පසීදන්ති සම්පතිට්ඨන්ති විමුච්චන්ති. න තෙසං ධම්මානං විවාදො පටිවාදො අත්ථි. අයං ධම්මසාමග්ගී.

---

1. පතිකුජ්ජන්තා - ස්‍යා. 2. සන්නිරුද්ධන්තා - මජසං. ස්‍යා.
3. කල්‍යාණපුථුජ්ජනස්ස - ස්‍යා. 4. සාමග්ගීයොති - සීමු. ii. සාමග්ගියාති - ස්‍යා.

**පතිලීනචරස්ස භික්ඛුනො** – සප්ත ශෛක්ෂයෝ පතිලීනචරයෝ යැයි කියනු ලැබෙත්. රහත්හු පතිලීනයහ. කුමක් හෙයින් සප්ත ශෛක්ෂයෝ පතිලීනචරයෝ යැයි කියනු ලැබෙති යත් ? ඔහු ඒ ඒ අරමුණෙන් සිත නවතමින් හකුළුවමින් පෙරළමින් අවුරමින් නිගත්මින් වළහමින් රක්මින් ගොපනය කෙරෙමින් හැසිරෙති ඉරියව් පවත්වති පාලනය – යපනය – යාපනය කෙරෙත්, චක්ෂුර්ද්වාරයෙහි සිත නවතමින් හකුළුවමින් හකුළමින් අවුරමින් නිගත්මින් වළනමින් රක්මින් ගොපනය කෙරෙමින් සෙරෙති හැසිරෙති ඉරියව් පවත්වති ඉරියව් උපදවති පාලනය කෙරෙති යපනය යාපනය කෙරෙති, ශ්‍රොත්‍රද්වාරයෙහි සිත...ඝ්‍රාණ – ජිහ්වා – කාය – මනො-ද්වාරයෙහි සිත නවතමින් (පස්බස්වමින්) ... පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත්. යම්සේ කුකුළුපතෙක් හෝ නහරදුදුලෙක් හෝ ගින්නෙහි ලන ලදුයේ හැකිළේ ද, නො පැතිරේ ද, එසෙයින් ම ඒ (පතිලීනචරයෝ) ඒ ඒ අරමුණෙන් සිත නවතමින් හකුළුවමින් ... වෙසෙති ... යැපෙත්. චක්ෂුර්ද්වාරයෙහි ..ශ්‍රොත්‍ර – ඝ්‍රාණ – ජිහ්වා – කාය – මනොද්වාරයෙහි සිත නවතමින්. . .හැසිරෙති. . . යැපෙත්. එකරුණෙන් සප්ත ශෛක්ෂයෝ පතිලීනචරයෝ යැයි කියනු ලැබෙත්. භික්ඛුනො – කල්‍යාණපෘථග්ජන භික්ෂුහුගේ හෝ . ශෛක්ෂභික්ෂුහුගේ හෝ නුයි ‘පතිලීනචරස්ස භික්ඛුනො, යනු වේ.

**භජමානස්ස විවිත්තමාසනං** – ඇඳ පුටු තිසි පත්කඩ සම්කඩ තණඇතිරි පත්ඇතිරි පිදුරුඇතිරි යන මේ හිඳිනා තැන ‘ආසන’ යයි කියනු ලැබේ, ඒ අසුන අසත්ප්‍රාය (=නොසරුප්) රූප දැකීමෙන් සිස් යැ ශූන්‍ය යැ වෙසෙසින් ශූන්‍ය යැ, අසත්ප්‍රායශබ්දශ්‍රවණයෙන් – අසත්ප්‍රාය – ගන්ධාඝ්‍රාණයෙන් – අසත්ප්‍රාය රස විඳීමෙන් – අසත්ප්‍රාය ස්පර්ශයෙන් – අසත්ප්‍රාය වූ ස්ත්‍රීන් පිළිබඳ රූපාදි පඤ්චකාමගුණයන්ගෙන් සිස් යැ ශූන්‍ය යැ වෙසෙසින් ශූන්‍ය යි, ඒ විවික්ත (=ශූන්‍ය) වූ අසුන සෙවුනා හට මැනැවින් සෙවුනා හට එළඹෙනුවහුට නිවෙසනය කරනුවහුට මැනැවින් සෙවනය කරනුවහුට පුනපුනා ඇසුරු කරනුවහුට නුයි ‘භජමානස්ස විවිත්තමාසනං’ යනු වේ.

**සාමග්ගියමාහු තමෙස්සනං යො අත්තානං භවනෙ න දස්සයෙ** – ‘සාමග්ගි’ – තුන් සාමග්‍රි කෙනෙක් වෙති: ‘ගණසාමග්ගි ධම්මසාමග්ගි අනභිනිබ්බත්තිසාමග්ගි යැයි. ‘ගණසාමග්ගි’ කවරී ද යත් ? ඉදින් බොහෝ භික්ෂූහු නමුදු කයින් සමග වූවාහු සිතින් සතුටු වන්නාහු බසින් විවාද නො කරන්නාහු කිරි මුසු දිය මෙන් වූවාහු ඔවුනොවුන් ප්‍රිය ඇසින් බලමින් වෙසෙත් නම්, මෝ ගණසාමග්ගි නමු. ‘ධම්මසාමග්ගි’ කවරී ද යත් ? සතර සතිපට්ඨානයෝ යැ සතර සම්‍යක්ප්‍රධානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ පඤ්චෙන්ද්‍රියයෝ යැ පඤ්ච බලයෝ යැ සප්ත බොධ්‍යඞ්ගයෝ යැ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගී යැ යන මොහු යි, ඔවුහු එක අරමුණෙහි පිවිසෙති පහදිති පිහිටා සිටිති විමුක්තියට පැමිණෙත්. ඒ ධර්මයන්ගේ විවාදයෙක් ප්‍රකර්ෂිවිවාදයෙක් නැති, මෝ ‘ධම්මසාමග්ගි’ නමු.

කතමා අනභිනිබ්බත්තිසාමග්ගී? බහූ චෙපි භික්ඛූ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්ති. න තෙන[1] නිබ්බානධාතුයා ඌනත්තං වා පුණ්ණත්තං වා පඤ්ඤායති. අයං අනභිනිබ්බත්තිසාමග්ගී.

**භවනෙති** – නෙරයිකානං නිරයො භවනං තිරච්ඡානයොනිකානං තිරච්ඡානයොනි භවනං; පෙත්තිවිසයිකානං පෙත්තිවිසයො භවනං; මනුස්සානං මනුස්සලොකො භවනං; දෙවානං දෙවලොකො භවනන්ති ‘සාමග්ගියමාහු තමෙසතං.’

**යො අත්තානං භවනෙ න දස්සයෙති** – තස්සෙසා සාමග්ගී එතං ඡන්නං එතං පතිරූපං එතං අනුච්ඡවිකං එතං අනුලොමං, යො එවං පටිච්ඡන්නො නිරයෙ අත්තානං න දස්සෙය්‍ය, තිරච්ඡානයොනියා අත්තානං න දස්සෙය්‍ය, පෙත්තිවිසයෙ අත්තානං න දස්සෙය්‍ය, මනුස්සලොකෙ අත්තානං න දස්සෙය්‍ය, දෙවලොකෙ අත්තානං න දස්සෙය්‍යාති. **එවමාහු** – එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති ‘සාමග්ගියමාහු තමෙසතං යො අත්තානං භවනෙ න දස්සයෙ.’

තෙනාහ භගවා:

“පතිලීනචරස්ස භික්ඛුනො
භජමානස්ස විවිත්තමාසනං,
සාමග්ගියමාහු තමෙසතං
යො අත්තානං භවනෙ න දස්සයෙ”ති.

## 6 – 8

සබ්බත්ථ මුනී අනිස්සිතො
න පියං කුබ්බති නොපි අප්පියං,
තස්මිං පරිදෙවමච්ඡරං
පණ්ණෙ වාරි යථා න ලිප්පති.

**සබ්බත්ථ මුනී අනිස්සිතොති** – ‘සබ්බං’ වුච්චති ද්වාදසායතනානි: චක්ඛුඤ්චෙව රූපා ච, සොතඤ්ච සද්දා ච, ඝානඤ්ච ගන්ධා ච, ජිව්හා ච රසා ච, කායො ච ඵොට්ඨබ්බා ච, මනො ච, ධම්මා ච; **මුනීති** – මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; **අනිස්සිතොති** – ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච -පෙ- අයං තණ්හානිස්සයො -පෙ- අයං දිට්ඨිනිස්සයො; මුනි තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සිතො සොතං අනිස්සිතො ඝානං අනිස්සිතො ජිව්හං අනිස්සිතො කායං අනිස්සිතො මනං අනිස්සිතො රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ ධම්මෙ කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං සබ්බෙ ධම්මෙ අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො[2] අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො[3] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති ‘සබ්බත්ථ මුනී අනිස්සිතො.’

1. තෙසං - සීමු. I. 2. අනජ්ඣසිතො - සීමු. 3. නිස්සතො - ස.

'අනභිනිබ්බත්තිසාමග්ගි' කවරී ද යත්? ඉදින් බොහෝ භික්ෂූහු පවා නිරුපධිශේෂනිර්වාණධාතුයෙන් පිරිනිවෙත් නමුදු එයින් නිර්වාණධාතුහුගේ ඌනබවෙක් හෝ පිරුණුබවෙක් හෝ නො පැනෙයි; මෝ තොමෝ 'අනභිනිබ්බත්තිසාමග්ගි' නම් වන්නීය.

**භවනෙ** – නෙරිසත්නට නරකය භවන (=ගෘහ) යැ, තිරිසන් යෝනි ඇතියනට තිරිසන් යෝනිය භවන යැ, ප්‍රෙතවිෂය ඇතියනට ප්‍රෙතවිෂය භවන යැ, මිනිසුන්ට මිනිස් ලොව භවන යැ, දෙවියනට දෙව්ලොව භවනය තුයි 'සාමග්ගියමාහු භසෙසතං' යනු වේ.

**යො අත්තානං භවනෙ න දස්සයෙ** - යමෙක් මෙසේ ප්‍රතිවජනනා වූ නිරයෙහි තමා නො දක්වන්නේ නම්, තිරිසන් යෝනියෙහි – ප්‍රෙතවිෂයෙහි මිනිස්ලොව, – දෙව්ලොව, තමා නො දක්වන්නේ නම්, ඒ ක්ෂීණාස්‍රවයා හට මෝ නිර්වාණසාමග්‍රිය වෙයි, මෙය සුදුසුය ප්‍රතිරූප ය අනුච්ඡවික ය අනුලෝම් වේ යයි; **එවමාහු** – මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් තුයි "සාමග්ගියමාහු තසෙසතං යො අත්තානං භවනෙ න දස්සයෙ" යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පතිලීනචරස්ස භික්ඛුනො -පෙ- යො අත්තානං භවනෙ න දස්සයෙ" යි.

## 6 – 8

ද්වාදශායතන සඞ්ඛ්‍යාත සියලු තැන්හි තෘෂ්ණා-දෘෂ්ටිනිඃශ්‍රය රහිත වූ ක්ෂීණාස්‍රව මුනි තෙම (සත්ත්වයන් හා සංස්කාරයන් කෙරෙහි) රාගවශයෙන් ප්‍රිය නො කෙරෙයි, ප්‍රතිඝවශයෙන් අප්‍රිය නො ද කෙරෙයි, ඒ රහත්හු කෙරෙහි පරිදෙවය හා මාත්සර්‍ය්‍යය පියුම්පත දිය සෙයින් නො ඇලේ.

**සබ්බත්ථ මුනි අනිස්සිතො** – 'සබ්බ' යි දොළොස් ආයතනයෝ කියනු ලැබෙති: ඇසත් රූපයෝත්, කනත් ශබ්දයෝත්, නැහැයත් ගන්ධයෝත්, දිවත් රසයෝත්. කයත් ස්ප්‍රෂ්ටව්‍යයෝත්, සිතත් ධර්මයෝත් යන මොහු යි; **මුනි** යනු: 'මොන' යි ඥානය කියනු ලැබෙයි,...**අනිස්සිතො** – තෘෂ්ණානිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය දැයි නිඃශ්‍රයයෝ දෙදෙනෙකි...මුනි තෙම තෘෂ්ණානිශ්‍රය හැරදමා දෘෂ්ටිනිශ්‍රය දුරලා ඇස තෘෂ්ණාදෘෂ්ටිවශයෙන් අනිඃශ්‍රිත වූයේ කන අනිඃශ්‍රිත වූයේ නැහැය අනිඃශ්‍රිත වූයේ දිව අනිඃශ්‍රිත වූයේ කය අනිඃශ්‍රිත වූයේ සිත අනිඃශ්‍රිත වූයේ රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය – ධර්මයන් කුලය ගණයා ආවාසය ලාභය සශස ප්‍රශංසාය සැපය සිවුර පිණ්ඩපාතය සෙනසුන ගිලන්පසබෙහෙත්පිරිකර කාමධාතුව රූපධාතුව අරූපධාතුව කාමභවය රූපභවය අරූපභවය සඤ්ඤාභවය අසඤ්ඤාභවය නෙවසඤ්ඤානාසඤ්ඤාභවය එකවොකාරභවය චතුවොකාරභවය පඤ්චවොකාරභවය අතීතය අනාගතය වර්තමානය රූපායතනය සද්දායතනය ගන්ධ-රස-පොට්ඨබ්බායතනය ධම්මායතනය සියලු ධර්මයන් තෘෂ්ණාදෘෂ්ටි විසින් අනිශ්‍රිත වූයේ නො ඇලුණේ නො පැමිණියේ ඇතුළු නො වූයේ නො බැසගත්තේ නික්මැ ගියේ හළයේ වෙසෙසින් මිදුණේ විසංයොග වූයේ විගතමර්‍ය්‍යාදා කළ සිතින් යුක්ත වැ වෙසේ තුයි 'සබ්බත්ථ මුනී අනිස්සිතො' යනු වේ.

**න පියං කුබ්බති නොපි අප්පියන්ති** - පියාති ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා පියා? ඉධ යස්ස තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා, මාතා වා පිතා වා භාතා වා භගිනී වා පුත්තා වා ධීතා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, ඉමෙ සත්තා පියා. කතමෙ සඞ්ඛාරා පියා? මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා පියා.

**අප්පියාති** - ද්වෙ අප්පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා අප්පියා? ඉධ යස්ස තෙ හොන්ති අනත්ථකාමා අහිතකාමා අඵාසුකාමා අයොගක්ඛෙමකාමා ජීවිතා වොරොපෙතුකාමා, ඉමෙ සත්තා අප්පියා. කතමෙ සඞ්ඛාරා අප්පියා? අමනාපිකා රූපා අමනාපිකා සද්දා අමනාපිකා ගන්ධා අමනාපිකා රසා අමනාපිකා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා අප්පියා.

**න පියං කුබ්බති නොපි අප්පියන්ති** 'අයං මෙ සත්තො පියො,' ඉමෙ ච මෙ සඞ්ඛාරා මනාපා'ති රාගවසෙන පියං න කරොති. 'අයං මෙ සත්තො අප්පියො, ඉමෙ සඞ්ඛාරා අමනාපා'ති පටිඝවසෙන අප්පියං න කරොති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතීති 'න පියං කුබ්බති නොපි අප්පියං.'

**තස්මිං පරිදෙවමච්ඡරං පණ්ණෙ වාරි යථා න ලිප්පතීති** - 'තස්මි'න්ති තස්මිං පුග්ගලෙ අරහන්තෙ ඛීණාසවෙ, **පරිදෙවොති** - ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා[1] ලාලප්පිතත්තං a[2] **මච්ඡරියන්ති** පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡරියං මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා[3] අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං.b අපිච, ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං, ගාහො වුච්චති මච්ඡරියං.

**පණ්ණෙ වාරි යථා න ලිප්පතීති** - පණ්ණං වුච්චති පදුමපත්තං; **වාරි** වුච්චති උදකං; යථා වාරි පදුමපත්තෙ න ලිප්පති න සංලිප්පති න උපලිප්පති, අලිත්තං අසංලිත්තං අනුපලිත්තං, එවමෙවං තස්මිං පුග්ගලෙ අරහන්තෙ ඛීණාසවෙ පරිදෙවො ච මච්ඡරියඤ්ච න ලිප්පති න සංලිප්පති න උපලිප්පති අලිත්තො අසංලිත්තො අනුපලිත්තො; සො ච පුග්ගලො තෙහි කිලෙසෙහි න ලිප්පති න සංලිප්පති න උපලිප්පති අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො[4] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති 'තස්මිං පරිදෙවමච්ඡරං පණ්ණෙ වාරි යථා න ලිප්පති.'

1. ලාලප්පායනා - සීමු. II. 2. ලාලප්පායිතත්තං සීමු. II. මජ්ඣ.
3. කටුකඤ්චුතා - මජ්ඣ. 4 නිස්සන්තො - ස.
a විභඞ්ගපාළි - පටිච්චසමුප්පාදවිභඞ්ග. b. ඛුද්දකවත්ථුවිභඞ්ග.

**න පියං කුබ්බති නොපි අප්පියං** – ‘පියා’ යනු: ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ. කවර සත්හු ප්‍රියයෝ ද යත්? මෙලොවැ මව හෝ පියා හෝ බෑයා හෝ භගිනිය හෝ දුව හෝ පුතා හෝ මිතුරෝ හෝ ඇමදයෝ හෝ නෑයෝ හෝ සහලේනෑයෝ හෝ යම් කෙනෙක් වැඩ කැමැත්තාහු හිත කැමැත්තාහු සුව කැමැත්තාහු යොගක්ෂෙමය කැමැත්තාහු වෙත් නම්, මේ සත්ත්වයෝ ප්‍රියයෝ යැ. ප්‍රිය වූ සංස්කාරයෝ කවරහු ද යත්? මනවඩන රූපයෝ යැ ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යන මොහු ප්‍රිය වූ සංස්කාරයෝ යි.

**අප්පියා** යනු: අප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ. අප්‍රිය සත්ත්වයෝ කවරහ යත්? මේ ලොවැ යම් කෙනෙක් අවැඩ කැමැත්තාහු අහිත කැමැත්තාහු නො සුව කැමැත්තාහු අයොගක්ෂෙමය කැමැත්තාහු දිවි තොරකරනු කැමැත්තාහු වෙත් නම්, මේ සත්හු අප්‍රියයෝ යැ. අප්‍රිය වූ සංස්කාරයෝ කවරහ යත්? අමනාප වූ රූපයෝ යැ – ශබ්දයෝ යැ – ගන්ධයෝ යැ – රසයෝ යැ අමනාප වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, යන මොහු අප්‍රිය වූ සංස්කාරයෝ යි.

**න පියං කුබ්බති නොපි අප්පියං** – ‘මේ සත්ත්ව මට ප්‍රිය යැ, මේ සංස්කාරයෝ මට මනාපයෝ යැ’යි රාගවශයෙන් ප්‍රිය නොකෙරෙයි. ‘මේ සත්ත්ව මට අප්‍රිය යැ, මේ සංස්කාරයෝ අමනාපයෝ යැ’යි ප්‍රතිඝවශයෙන් අප්‍රිය නො කෙරෙයි, නො දනවයි, නූපදවා නුයි ‘න පියං කුබ්බති නොපි අප්පියං’ යනු වේ.

**තස්මිං පරිදෙවමච්ඡරං පණ්ණෙ වාරි යථා න ලිප්පති** – ‘තස්මිං’ යි ඒ අර්හත් වූ ක්ෂීණාස්‍රව වූ පුගුල්හු කෙරෙහි; **පරිදෙව** – නම්: ඥාතිව්‍යසනයෙන් (=විනාශයෙන්) මඩනා ලද්දහුගේ හෝ, භොග විපතින් හෝ – රොග විපතින් හෝ – සීල විපතින් හෝ – දෘෂ්ටි විපතින් හෝ මඩනා ලද්දහුගේ යම්කිසි විපතකින් යුක්ත වූවහුගේ හෝ පරිදෙවදුකට හෙතු වූ යම් කිසිවකින් මඩනා ලද්දහුගේ නම කියා හැඬීම ගුණ කියා හැඬීම හඩන ආකාරය හඩන බව වචනය ප්‍රලාපය විප්‍රලාපය පුනපුනා ලපනය ලපනාකාරය පුනපුනා ලපනය කරන බව යි. **මච්ඡරිය** නම්: මාත්සය්‍ර්‍ය පසෙකි: ආවාසමාත්සය්‍ර්‍යය කුලමාත්සය්‍ර්‍යය ලාභමාත්සය්‍ර්‍යය වර්‍ණමාත්සය්‍ර්‍යය ධර්‍ම-මාත්සය්‍ර්‍යය කියායි. යම් මෙබඳු වූ මසුරුකමෙක් මසුරුඅයුරෙක් මසුරුකම් ඇතිබවෙක් සම්පත් සඟවන බවෙක් අනාය්‍ර්‍ය බවෙක් කටුකකමින් සිත හැකිලැවීමෙක් සිත මසුරුකමින් ගත්තා ලද බවෙක් වේ ද, මේ මාත්සය්‍ර්‍ය යයි කියනු ලැබේ. තවද ස්කන්ධමාත්සය්‍ර්‍යය ද – ධාතුමාත්සය්‍ර්‍යය ද – ආයතන-මාත්සය්‍ර්‍යය ද ‘මච්ඡරිය’ නම්. ග්‍රහණය මාත්සය්‍ර්‍ය යයි කියනු ලැබේ.

**පණ්ණෙ වාරි යථා න ලිප්පති** – ‘පණ්ණෙ’ යි පියුම්පත කියනු ලැබෙයි; ‘වාරි’ යි ජලය කියනු ලැබේ. යම් සේ ජලය පියුම්පතෙහි නො ඇලේ ද වෙසෙසින් නො ඇලේ ද නො තැවැරේ ද, අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වේ ද එසෙයින් ම අර්හත් ක්ෂීණාස්‍රව වූ ඒ පුගුල්හු කෙරෙහි පරිදෙවය ද, මාත්සය්‍ර්‍යය ද නොඇලෙයි වෙසෙසින් නො ඇලෙයි නො තැවැරෙයි, අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වූයේ වෙයි; ඒ පුද්ගල තෙමේ ද ඒ කෙලෙසුන් සමග නො ඇලෙයි වෙසෙසින් නො ඇලෙයි නො තැවැරෙයි අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වූයේ නික්මැ ගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ වෙන්වූයේ විගතමය්‍ර්‍යාද කළ (=මිදීගිය) සිතින් යුක්ත ව වෙසේ නුයි – “තස්මිං පරිදෙවමච්ඡරං පණ්ණෙ වාරි යථා න ලිප්පති” යනු වේ.

තෙනාහ භගවා:

"සබ්බත්ථ මුනී අනිස්සිතො
න පියං කුබ්බති නොපි අප්පියං,
තස්මිං පරිදෙවමච්ඡරං
පණ්ණෙ වාරි යථා න ලිප්පතී"ති.

## 6 - 9

උදබින්දු යථාපි පොක්ඛරෙ
පදුමෙ වාරි යථා න ලිප්පති,[1]
එවං මුනි නොපලිප්පති
යදිදං දිට්ඨසුතං[2] මුතෙසු වා.

**උදබින්දු යථාපි පොක්ඛරෙති** - උදබින්දු වුච්චති උදකථෙවො;[3] පොක්ඛරං වුච්චති පදුමපත්තං; යථා උදබින්දු පදුමපත්තෙ න ලිප්පති න පලිප්පති න උපලිප්පති අලිත්තං අපලිත්තං[4] අනුපලිත්තන්ති 'උදබින්දු යථාපි පොක්ඛරෙ.'

**පදුමෙ වාරි යථා න ලිප්පතීති** - පදුමං වුච්චති පදුමපුප්ඵං;[5] වාරි වුච්චති උදකං; යථා වාරි පදුමපුප්ඵෙ න ලිප්පති න පලිප්පති න උපලිප්පති අලිත්තං අපලිත්තං අනුපලිත්තන්ති 'පදුමෙ වාරි යථා න ලිප්පති.'

**එවං මුනි නොපලිප්පති යදිදං දිට්ඨසුතං මුතෙසු වාති** - 'එව'න්ති ඔපම්මසම්පටිපාදනං; මුනීති මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගමතිච්ච සො මුනි; 'ලෙපා'ති ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච -පෙ- අයං තණ්හාලෙපො -පෙ- අයං දිට්ඨිලෙපො; මුනි තණ්හාලෙපං පහාය දිට්ඨිලෙපං පටිනිස්සජ්ජිත්වා දිට්ඨෙ න ලිප්පති, සුතෙ න ලිප්පති, මුතෙ න ලිප්පති, විඤ්ඤාතෙ න ලිප්පති න පලිප්පති න උපලිප්පති. අලිත්තො අපලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'එවං මුනි නොපලිප්පති යදිදං දිට්ඨසුතං මුතෙසු වා.'

තෙනාහ භගවා:

"උදබින්දු යථාපි පොක්ඛරෙ
පදුමෙ වාරි යථා න ලිප්පති,
එවං මුනි නොපලිප්පති
යදිදං දිට්ඨසුතං[6] මුතෙසු වා"ති.

## 6 - 10

ධොනො න හි තෙන මඤ්ඤති
යදිදං දිට්ඨසුතං[6] මුතෙසු වා,
නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡති
න හි සො රජ්ජති නො විරජ්ජති.

1. ලිම්පති - මු. II. සආ. 2. දිට්ඨසුතෙ - සීමු. II.
3. උදකථෙවකො - පු. 4. අසංලිත්තං - සීමු. II.
5. පදුමපත්තං - සීමු. I. 6. දිට්ඨසුතෙ - සීමු. II.

එයින් වදාළහ බුදුහු:

“සබ්බත්‍ථ මුනී අනිස්සිතො-පෙ-පණ්ණෙ වාරි යථා න ලිප්පති” යි.

## 6 – 9

පොකුරුපත්හි දියබිඳු යම්සේ නො ඇලේ ද, පියුමෙහි දිය යම් සේ නො ඇලේ ද, එසෙයින් ක්ෂීණාශ්‍රව මුනි තෙම දිට්ඨශ්‍රුතයෙහි හෝ මුතයෙහි නො ඇලේ.

**උදබින්දු යථාපි පොක්ඛරෙ** – ‘උදබින්දු’ යයි උදකස්තොකය (=දියබිඳ) කියනු ලැබේ; ‘පොක්ඛර’ යි පියුම්පත කියනු ලැබේ; යම්සේ දියබිඳක් පියුම්පතෙහි නො ඇලේ ද, වෙසෙසින් නො ඇලේ ද නො තැවැරේ ද, අලිප්ත අප්‍රලිප්ත අනුපලිප්ත වේ ද එයින් ‘උදබින්දු යථාපි පොක්ඛරෙ’ යනු වේ.

**පදුමෙ වාරි යථා න ලිප්පති** – ‘පදුම’යි පියුම්මල කියනු ලැබේ; ‘වාරි’ යි දිය කියනු ලැබෙයි; යම්සේ දිය පියුම්මලෙහි නො ඇලේ ද වෙසෙසින් නො ඇලේ ද නො තැවැරේ ද, අලිප්ත අප්‍රලිප්ත අනුපලිප්ත වේ ද, එයින් ‘පදුමෙ වාරි යථා න ලිප්පති’ යනු වේ.

**එවං මුනි නොපලිප්පති යදිදං දිට්ඨසුතං මුතෙසු වා** – ‘එවං’ යනු ඖපම්‍යසම්ප්‍රතිපාදනා යැ; **මුනි** – ‘මොන’ යි ඥානය කියනු ලැබෙයි... (2-8සූත්‍රනිද්දේශය.) **ලෙපා** – තණ්හාලෙපය ද දිට්ඨිලෙපය දැයි ලෙපයෝ දෙදෙනෙකි...මුනි තෙම තණ්හාලෙපය හැරපියා දිට්ඨිලෙපය දුරලා, රූපායතනයෙහි නො ඇලෙයි, සද්දායතනයෙහි – ගන්ධ – රස – ඵොට්ඨබ්බා-යතනයෙහි ධර්මායතනයෙහි නො ඇලෙයි, වෙසෙසින් නො ඇලෙයි නො තැවැරෙයි, අලිප්ත අප්‍රලිප්ත අනුපලිප්ත වූයේ නික්මැගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ විසංයොග වූයේ විසංයුක්ත වූ සිතින් යුක්ත ව වෙසේ නුයි ‘එවං මුනි නොපලිප්පති යදිදං දිට්ඨසුතං මුතෙසු වා’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“උදබින්දු යථාපි පොක්ඛරෙ-පෙ-යදිදං දිට්ඨසුතං මුතෙසු වා”යි.

## 6 – 10

ක්ෂීණාශ්‍රව තෙම යම් මේ (දුටු ඇසූ) රූප-ශබ්දාලම්බනයෙක් වේ ද, ඒ වස්තුවෙන් මඤ්ඤනා වශයෙන් නො සිතයි, (දැනගත්) මුත-ධර්මාලම්බනයන් කෙරෙහි හෝ මඤ්ඤනාවශයෙන් නො සිතයි, හෙ තෙම අනික් අශුද්ධිමාර්ගයෙකින් ශුද්ධිය නො කැමැති වෙයි, හෙතෙම (බාලපුහුදුනුවන් මෙන්) නො මැ ඇලෙයි, (කලණ පුහුදුනුවන් හා ශෛක්ෂයන් මෙන්) විරාග නො ද වේ.

**ධොනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං[1] මුතෙසු වාති** – 'ධොනො' ති ධොනා වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨී.[a] කිං කාරණා ධොනා වුච්චති පඤ්ඤා? තාය පඤ්ඤාය කායදුච්චරිතං ධූතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච; වචීදුච්චරිතං – මනොදුච්චරිතං ධූතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච; රාගො ධූතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච, දොසො– මොහො – කොධො – උපනාහො – මක්ඛො – පළාසො – ඉස්සා – මච්ඡරියං– මායා – සාඨෙය්‍යං – ථම්භො –සාරම්භො–මානො – අතිමානො –මදො –පමාදො –සබ්බෙ කිලෙසා – සබ්බෙ දුච්චරිතා – සබ්බෙ දරථා – සබ්බෙ පරිළාහා– සබ්බෙ සන්තාපා – සබ්බාකුසලාභිසඞ්ඛාරා ධූතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච; තංකාරණා ධොනා වුච්චති පඤ්ඤා. අථවා සම්මාදිට්ඨියා මිච්ඡාදිට්ඨි ධූතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච; සම්මාසඞ්කප්පෙන මිච්ඡාසඞ්කප්පො ධූතො ච ධොතො ච සන්ධොතො ච නිද්ධොතො ච; සම්මාවාචාය මිච්ඡාවාචා ධූතා ච ධොතා ච – සම්මාකම්මන්තෙන මිච්ඡාකම්මන්තො ධූතො ච ධොතො ච – සම්මාආජීවෙන මිච්ඡාආජීවො ධූතො ච ධොතො ච – සම්මාවායාමෙන මිච්ඡාවායාමො ධූතො ච ධොතො ච – සම්මාසතියා මිච්ඡාසති ධූතා ච ධොතා ච – සම්මාසමාධිනා මිච්ඡාසමාධි ධූතො ච ධොතො ච – සම්මාඤාණෙන මිච්ඡාඤාණං ධූතඤ්ච ධොතඤ්ච– සම්මාවිමුත්තියා මිච්ඡාවිමුත්ති ධූතා ච ධොතා ච සන්ධොතා ච. අථවා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා ධූතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අරහා ඉමෙහි ධොනෙහි ධම්මෙහි උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො. තස්මා අරහා ධොනො. සො ධූතරාගො ධූතපාපො ධූතකිලෙසො ධූතපරිළාහොති – ධොනො.

**ධොනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං[1] මුතෙසු වාති** – ධොනො දිට්ඨං න මඤ්ඤති. දිට්ඨස්මිං න මඤ්ඤති. දිට්ඨතො න මඤ්ඤති. දිට්ඨං මෙති න මඤ්ඤති. සුතං න මඤ්ඤති. සුතස්මිං න මඤ්ඤති. සුතතො න මඤ්ඤති. සුතං මෙති න මඤ්ඤති. මුතං න මඤ්ඤති. මුතස්මිං න මඤ්ඤති. මුතතො න මඤ්ඤති. මුතං මෙති න මඤ්ඤති. විඤ්ඤාතං න මඤ්ඤති. විඤ්ඤාතස්මිං න මඤ්ඤති. විඤ්ඤාතතො න මඤ්ඤති. විඤ්ඤාතං මෙති න මඤ්ඤති. වුත්තම්පි හෙතං භගවතා:

1. දිට්ඨසුතෙ - සිමු. II. 2. අසම්භාසි - සිමු. II.

a ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ

**ධෝනො නහි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං මුතෙසු වා** - 'ධෝනො' යනු - 'ධෝනා' යි ප්‍රඥාව කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රකර්ෂ ජානනයෙක්...අමෝහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එය යි. කුමක් හෙයින් ප්‍රඥාව 'ධෝනා' යි කියනු ලැබෙයි යත් ? ඒ ප්‍රඥායෙන් කායදුශ්චරිතය කම්පා කරන ලද්දේ ද සෝදන ලද්දේ ද මැනවින් දෙවන ලද්දේ ද වෙසෙසින් දෙවන ලද්දේ ද; වාග්දුශ්චරිතය මනොදුශ්චරිතය ධූත-ධෝත-සන්ධෝත-නිද්ධෝත වූයේත් වෙයි, රාගය ධූත-ධෝත-සන්ධෝත-නිද්ධෝත වූයේත් වෙයි; ද්වේෂය - මෝහය - ක්‍රෝධය - උපනාහය - ම්‍රක්ෂය - පලාසය - ඊර්ෂ්‍යාව - මාත්සර්ය්‍යය - මායාව - ශඨබව - තදබව - සාරම්භය - මානය - අතිමානය - මදය - ප්‍රමාදය - සියලු කෙලෙශයෝ සියලු දුශ්චරිතයෝ - සියලු දරථයෝ - සියලු සන්තාපයෝ - සියලු අකුශලාභිසංස්කාරයෝ - ධූත - ධෝත - සන්ධෝත - නිද්ධෝත වූවාහු ද වෙත්. එකරුණෙන් ප්‍රඥාව 'ධෝන' යයි කියනු ලබයි, නොහොත් සම්‍යග්දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය කම්පා කරන ලද්දී ධෝවනය කරන ලද්දී මැනැවින් ධෝවනය කරන ලද්දී වෙසෙසින් ධෝවනය කරන ලද්දී ද වෙයි; සම්‍යක්සංකල්පයෙන් මිථ්‍යාසංකල්පය කම්පිත ධෝවිත සන්ධෝවිත නිද්ධෝවිත ද වෙයි; සම්‍යග්වචනයෙන් මිථ්‍යාවචනය. .සම්‍යක්කර්මාන්තයෙන් මිථ්‍යාකර්මාන්තය... සම්‍යගාජීවයෙන් මිථ්‍යාජීවය. . .සම්‍යග්ව්‍යායාමයෙන් මිථ්‍යාව්‍යායාමය. . . සම්‍යක්ස්මෘතියෙන් මිථ්‍යාස්මෘතිය . .සම්‍යක්සමාධියෙන් මිථ්‍යාසමාධිය. . . සම්‍යග්ඥානයෙන් මිථ්‍යාඥානය. . .සම්‍යග්විමුක්තියෙන් මිථ්‍යාවිමුක්තිය ධූත-ධෝවිත-සන්ධෝවිත-නිද්ධෝවිත වූවා ද වෙයි. නොහොත් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සියලු කෙලෙශයෝ සියලු දුශ්චරිතයෝ සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ ධූත-ධෝත-සන්ධෝත-වූවාහු ද වෙත්. රහත්හු මේ ධෝනධර්මයන්ගෙන් උපෙත වූවාහු සමුපෙත උපාගත සමුපාගත උපපන්න සමුපපන්න සමන්නාගත වූවාහු වෙති; එහෙයින් රහත්හු ධෝනයහ; ඔහු ධූතරාගයහ ධූතපාපයහ ධූතකෙලෙශයන ධූතපරිදාහ නුයි 'ධෝන' නම් වෙත්.

**ධෝනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං මුතෙසු වා** - ධෝන සඞ්ඛ්‍යාත ක්ෂීණාස්‍රව තෙමේ (මසැසින් හෝ දිවැසින් දුටු) රූපායතනය (ත්‍රිවිධ මඤ්ඤනායෙන්) නො සිතයි, රූපායතනයෙහි ආත්මය ඇතැයි නො සිතයි, රූපායතනයෙන් අන්‍ය වූ ආත්මයෙක් ඇතැයි නො සිතයි, රූපායතනය මාගේ යැයි නො සිත යි; ශබ්දායතනය ත්‍රිවිධ මඤ්ඤනායෙන් ආත්මයයි නො සිතයි, ශබ්දායතනයෙහි ආත්මය ඇතැයි නො සිතයි, ශබ්දායතනයෙන් පිටත (අන්‍ය) වූ ආත්මයෙක් ඇතැයි නො සිතයි, ශබ්දායතනය මාගේ යයි නො සිතයි; (ගන්ධ-රස-ඵොට්ඨබ්බායතන සඞ්ඛ්‍යාත) මුතය ආත්මයයි නො සිතයි, මුතයෙහි ආත්මය ඇතැයි නො සිතයි, මුතයෙන් අන්‍ය වූ ආත්මයෙක් ඇතැයි නො සිතයි, මුතය මාගේ යයි නො සිතයි; (සිතින් දනගත් සජ්ඣායතන සඞ්ඛ්‍යාත) විඥානය ආත්මයයි නො සිතයි, විඥානයෙහි ආත්මය ඇතැයි නො සිතයි, විඥානයෙන් අන්‍ය වූ ආත්මයෙක් ඇතැයි නො සිතයි, විඥානය මාගේ යයි නො සිතයි. මෙ වදාරන ලද මැය භාග්‍යවතුන් විසින්:

“අස්මිති[1] භික්ඛවෙ මඤ්ඤිතමෙතං. අයමහමස්මීති[1] මඤ්ඤිතමෙතං. භවිස්සන්ති මඤ්ඤිතමෙතං. න භවිස්සන්ති මඤ්ඤිතමෙතං. රූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං අරූපී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. සඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. අසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. නෙවසඤ්ඤීනාසඤ්ඤී භවිස්සන්ති මඤ්ඤිතමෙතං. මඤ්ඤිතං හි භික්ඛවෙ, රොගො, මඤ්ඤිතං ගණ්ඩො, මඤ්ඤිතං සල්ලං, මඤ්ඤිතං උපද්දවො, තස්මාතිහ භික්ඛවෙ අමඤ්ඤමානෙන චෙතසා විහරිස්සාමාති එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බ”න්ති[a] ‘ධොනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං මුතෙසු වා.’

**නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡතීති** - ධොනො අඤ්ඤෙන අසුද්ධිමග්ගෙන මිච්ඡාපටිපදාය අනිය්‍යාණිකපථෙන අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං න ඉච්ඡති න සාදියති න පත්ථෙති න පිහෙති නාභිජප්පතීති ‘නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡති.’

**න හි සො රජ්ජති නො විරජ්ජතීති** - ‘සබ්බෙ බාලපුථුජ්ජනා රජ්ජන්ති. පුථුජ්ජනකල්‍යාණකං උපාදාය සත්ත සෙඛා විරජ්ජන්ති. අරහා නෙව රජ්ජති නො විරජ්ජති. විරත්තො සො ඛයා රාගස්ස වීතරාගත්තා ඛයා දොසස්ස වීතදොසත්තා ඛයා මොහස්ස වීතමොහත්තා සො වුත්ථවාසො චිණ්ණචරණො -පෙ- ජාතිජරාමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති ‘න හි සො රජ්ජති නො විරජ්ජති.’

තෙනාහ භගවා:

“ධොනො න හි තෙන මඤ්ඤති
යදිදං දිට්ඨසුතං මුතෙසු වා,
නාඤ්ඤෙන විසුද්ධිමිච්ඡති
න හි සො රජ්ජති නො විරජ්ජතී”ති.

**ජරාසුත්තනිද්දෙසො ඡට්ඨො.**

# 7

# තිස්සමෙත්තෙය්‍යසුත්තනිද්දෙසො

අථ තිස්සමෙත්තෙය්‍යසුත්තනිද්දෙසො වුච්චති:[2]

## 7 - 1

මෙථුනමනුයුත්තස්ස (ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො)
විඝාතං බ්‍රූහි මාරිස,
සුත්වාන තව සාසනං
විවෙකෙ සික්ඛිස්සාම සෙ.

---

1. අස්මින්ති - මු ii 2. සුත්තං වක්ඛති - සීමු II.

a සළායතනසංයුත්ත - ආසීවිසවග්ග.

"මහණෙනි; නිත්‍ය වෙමි යන මෙය මඤ්ඤිත (=දෘෂ්ටිකල්පිත) යෙකි, මේ මම වෙමි යන මෙය මඤ්ඤිතයෙකි, (අනාගතයෙහි) වන්නෙමි මඤ්ඤිතයෙකි, නො වන්නෙමි මඤ්ඤිතයෙකි, සංඥී වන්නෙමි මඤ්ඤිත-යෙකි, අසංඥී වන්නෙමි මඤ්ඤිතයෙකි, නෛවසංඥීනාසංඥී වන්නෙමි මඤ්ඤිතයෙකි; මහණෙනි, යම් හෙයකින් මඤ්ඤිතය රෝගයෙක් වේ ද, මඤ්ඤිතය ගණ්ඩයෙක් වේ ද, මඤ්ඤිතය ශල්‍යයෙක් වේ ද, මඤ්ඤිතය උපද්‍රවයෙක් වේ ද, එහෙයින් මහණෙනි, මෙහි ලා (තෘෂ්ණා-මාන-දෘෂ්ටි විසින්) මඤ්ඤනා නො කරන සිතින් යුක්ත ව වාසය කරම්'හයි මෙසේ මැ තොප විසින් හික්මියැ යුත්තේයැ''යි. එහෙයින් 'ධෝනො න හි තෙන මඤ්ඤති යදිදං දිට්ඨසුතං මුතෙසු වා' යනු වේ.

**නාඤ්ඤේන සුද්ධිමිච්ඡති** - ධෝන (=ක්ෂීණාශ්‍රව) තෙමේ සතර සතිපට්ඨානයන් තබා, සතර සම්‍යක්ප්‍රධානයන් - සතර ඍද්ධිපාදයන් - පඤ්චේන්ද්‍රියයන් - පඤ්චබලයන් - සප්තබොධ්‍යඞ්ගයන් - ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික-මාර්ගය හැරපියා අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙකින් මිථ්‍යාප්‍රතිපදාවකින් අනෛර්‍ය්‍යා-ණිකපථයෙකින් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නො කැමැති වෙයි, නො ඉච්ඡයි නො පතයි නො රිසි වෙයි නො කියා තුයි 'නාඤ්ඤේන විසුද්ධිමිච්ඡති' යනු වේ.

**න හි සො රජ්ජති නො විරජ්ජති** - සියලු බාලපෘථග්ජනයෝ ඇලෙති, කල්‍යාණපෘථග්ජනයා පටන් සප්තශෛක්ෂයෝ විරාගයට පැමිණෙත්. රහත්හු නො මැ ඇලෙති, විරාගයට නො පැමිණෙත්. රාගය ක්ෂය වීමෙන් වීතරාග හෙයින් ද්වේෂය ක්ෂය වීමෙන් වීතද්වේෂ හෙයින් මෝහය ක්ෂය වීමෙන් වීතමෝහ හෙයින් හෙතෙම විරක්ත යැ, වැස නිම වූ ආර්‍ය්‍යවාස ඇත්තේ යැ, පුරුදු කල චරණධම් ඇත්තේ යැ...ඔහුට ජාති ජරා මරණ ද (කඳපිළිවෙල යයි කියන ලද) සසර ද පුනර්භවය ද නැත් තුයි 'න හි සො රජ්ජති නො පිරජ්ජති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ධෝනො න හි තෙන මඤ්ඤති-පෙ-න හි සො රජ්ජති නො පිරජ්ජති" යි.

**සවැනි වූ ජරාසූත්‍රනිර්දේශය යි.**

## 7

## තිස්සමෙත්තෙය්‍යසූත්‍රනිර්දේශය

ඉක්බිති තිස්සමෙත්තෙය්‍යසූත්‍රනිර්දේශය කියනු ලැබේ.

**7 - 1**

**නිදුකාණෙනි, මෛථුන්දම්හි යෙදුණහුට (වන) උපද්‍රවය වදාළ මැනව, නුඹ වහන්සේගේ අනුසසුන් අසා ත්‍රිවිධ විවේකයෙහි හික්මෙනුවම්හ. (ආයුෂ්මත් තිෂ්‍යමෛත්‍රෙය තෙමේ මෙසේ විචාළේයි.)**

**මෙථුනමනුයුත්තස්සාති** – මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො දුට්ඨුල්ලො ඔදකන්තිකො රහස්සො ද්වයංද්වයසමාපත්ති; [a] කිංකාරණා වුච්චති මෙථුනධම්මො? උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති, තංකාරණා වුච්චති මෙථුනධම්මො. යථා උභො කලහකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො භණ්ඩනකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො භස්සකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො විවාදකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො අධිකරණකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො වාදිනො 'මෙථුනකා'ති වුච්චන්ති, උභො සල්ලාපකා 'මෙථුනකා'ති වුච්චන්ති, එවමෙවං උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති, තං කාරණා වුච්චති මෙථුනධම්මො; **මෙථුනමනුයුත්තස්සාති** – මෙථුනධම්මෙ යුත්තස්ස පයුත්තස්ස ආයුත්තස්ස සමායුත්තස්ස තච්චරිතස්ස තබ්බහුලස්ස තග්ගරුකස්ස තන්නින්නස්ස තප්පොණස්ස තප්පබ්භාරස්ස තදධිමුත්තස්ස තදධිපතෙය්‍යස්සාති 'මෙථුනමනුයුත්තස්ස.'

**ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යොති** – 'ඉච්චා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා නාමෙතං ඉච්චාති; **ආයස්මාති** – පියවචනං ගරුවචනං සගාරවවචනං සප්පතිස්සවචනමෙතං ආයස්මාති; **තිස්සොති** – තස්ස ථෙරස්ස නාමං සංඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපො; **මෙත්තෙය්‍යොති** – තස්ස ථෙරස්ස ගොත්තං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරොති 'ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො.'

**විඝාතං බ්‍රූහි මාරිසාති** – 'විඝාත'න්ති විඝාතං උපඝාතං පීළනං ඝට්ටනං උපද්දවං උපස්සග්ගං; **බ්‍රූහි** – ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහි; **මාරිසාති** – 'පියවචනං ගරුවචනං සගාරවවචනං සප්පතිස්සවචනමෙතං මාරිසාති 'විඝාතං බ්‍රූහි මාරිස.'

**සුත්වාන තව සාසනන්ති** – 'තුය්හං වචනං ව්‍යප්පථං දෙසනං අනුසාසනං අනුසිට්ඨිං[1] සුත්වා සුණිත්වා උග්ගහෙත්වා උපධාරයිත්වා උපලක්ඛයිත්වාති 'සුත්වාන තව සාසනං.'

---

1. අනුසට්ඨිං – ස.

a. විනයමහාවිභඞ්ග – පඨමපාරාජිකං. (තත්‍ථ "දුට්ඨුල්ලං' ඔදකන්තිකං රහස්ස"න්ති නපුංසකලිඞ්ගවසෙන දිස්සති).

**මෙථුනමනුයුත්තස්ස** – 'මෛථුනධම්ම' නම්: යම් අසද්ධර්මයෙක් ග්‍රාමධර්මයෙක් වෘෂලධර්මයෙක් වේ ද, දුෂ්ඨුතිඃශ්‍රිත වූ දියකිස අන්ත කොට ඇති රහස්‍ය වූ ධර්මයෙක්, ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද එයයි. කුමක් හෙයින් 'මෛථුනධම්ම' යි කියනු ලැබේ ද යත්? රාගයෙන් රත් වූ වෙසෙසින් රැඳුණු ක්ලේශයෙන් තෙත් වූ කුසලවාරය මැඩගෙන සිටි කුසල්සිත ගෙවාගෙන සිටි ස්ත්‍රීපුරුෂ දෙදෙනක්හුගේ සමාන කෙලෙස් ඇති දෙදෙනක්හුගේ සවභාවය නුයි, එකරුණෙන් 'මෛථුනධම්ම' යි කියනු ලැබේ. යම් සේ කලහකරුවෝ දෙදෙන මෛථුනක(-සදෘශ)යෝ යැයි කියනු ලැබෙත් ද, ඩබරකරුවෝ දෙදෙන මෛථුනකයෝ යැයි කියනු ලැබෙත් ද, බසින් කලහකරනුවෝ දෙදෙන – විවාදකරුවෝ දෙදෙන – අධිකරණ-කරුවෝ දෙදෙන – වාදපථය කියනුවෝ දෙදෙන – කථා කරනුවෝ දෙදෙන මෛථුනකයෝ යැයි කියනු ලැබෙත් ද, එසෙයින් ම රාගයෙන් රත් වූ වෙසෙසින් රත් වූ කෙලෙසුන්ගෙන් තෙත් වූ කුසලවාරය මැඩගෙන සිටි හාත්පසින් යටකොට ගත් කුශලචිත්තය ඇති ස්ත්‍රීපුරුෂ දෙදෙනාගේ සමාන කෙලෙස් ඇති ස්ත්‍රීපුරුෂ දෙදෙනාගේ සවභාවය නුයි එකරුණෙන් 'මෛථුනධම්ම' යි කියනු ලැබේ. **මෙථුනධම්මමනුයුත්තස්ස** – මෙවුන්දම්හි යෙදුණු ආදරයෙන් යෙදුණු වෙසෙසින් යෙදුණු එක්වැ යෙදුණු එය කරන්නාවූ එය බහුල කොට ඇති එය ගරුකරන්නාවූ එහි නැමුණු සිත් ඇති එහි නැමුණු කය ඇති එහි අභිමුඛ වූ කය ඇති එහි ඇලුණාවූ එය අධිපති කොට ඇත්තහුගේ නුයි 'මෙථුනමනුයුත්තස්ස' යනු වේ.

**ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො** – 'ඉච්ච' යනු. පදසන්ධි යැ, පදසංසර්ගී යැ, පදපූරණ යැ, අක්ෂරසමවාය යැ, ව්‍යඤ්ජනයන්ගේ සිලිටිබව යැ, පදානුපූර්වීය නම් වෙයි මේ 'ඉච්ච' යනු; **ආයස්මා** යනු ප්‍රියවචන යැ, ගරුවචන යැ, සගෞරවවචන යැ, සප්‍රතිශ්‍රවවචන යැ මේ 'ආයස්මා' යනු. **තිස්සො** යනු: ඒ තෙරුන්ගේ නම යැ සංඛ්‍යාව යැ සංඥව යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාර යැ නාම යැ නාමකර්ම යැ නාමධෙය්‍ය යැ නිරුක්ති යැ ව්‍යඤ්ජන යැ අභිලාප යයි. **මෙත්තෙය්‍යො** – යනු: ඒ තෙරුන්ගේ ගොත්‍ර යැ සංඛ්‍යාව යැ සංඥව යැ ප්‍රඥප්තිය යැ ව්‍යවහාරය නුයි 'ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො' යනු වේ.

**විඝාතං බ්‍රෑහි මාරිස** – 'විඝාතං' යනු: වෙහෙස හිංසාව පෙළුම ගැටුම උවදුර උපද්‍රවය; **බ්‍රෑහි** – කියව දෙසව පනවව පිහිටුවව විවරණ කරව විභාග කරව ප්‍රකට කරව ප්‍රකාශ කළ මැනව; **මාරිස** යනු: ප්‍රියවචන යැ ගරුවචන යැ සගෞරවවචන යැ සප්‍රතිශ්‍රවවචනයෙකි මේ 'මාරිස' යනු. එහෙයින් 'විඝාතං බ්‍රෑහි මාරිස' යනු වේ.

**සුත්වාන තව සාසනං** – ඔබගේ වචනය වාක්පථය දෙසුම අනුසස්න අනුශිෂ්ටිය අසා ශ්‍රවණය කොට උගෙන විමසා සලකා නුයි 'සුත්වාන තව සාසනං' යනු වේ.

**විවෙකෙ සික්ඛිස්සාම සෙති** - 'විවෙකො'ති තයො විවෙකා: කායවිවෙකො චිත්තවිවෙකො උපධිවිවෙකො.

කතමො කායවිවෙකො? ඉධ භික්ඛු විවිත්තං සෙනාසනං භජති: අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. කායෙන විවිත්තො විහරති. සො එකො ගච්ඡති. එකො තිට්ඨති. එකො නිසීදති. එකො සෙය්‍යං කප්පෙති. එකො ගාමං පිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති. එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. අයං කායවිවෙකො.

කතමො චිත්තවිවෙකො? පඨමං ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං විවිත්තං හොති. දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරෙහි චිත්තං විවිත්තං හොති. තතියං ඣානං සමාපන්නස්ස පීතියා චිත්තං විවිත්තං හොති. චතුත්ථං ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං විවිත්තං හොති. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. සොතාපන්නස්ස සක්කායදිට්ඨියා විචිකිච්ඡාය සීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. සකදාගාමිස්ස ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අනාගාමිස්ස අනුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අරහතො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි බහිද්ධා ච සබ්බනිමිත්තෙහි චිත්තං විවිත්තං හොති. අයං චිත්තවිවෙකො.

කතමො උපධිවිවෙකො? උපධි වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච. උපධිවිවෙකො වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අයං උපධිවිවෙකො.

කායවිවෙකො ච වවකට්ඨකායානං[1] නෙක්ඛම්මාභිරතානං. චිත්තවිවෙකො ච පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං. උපධිවිවෙකො ච නිරුපධීනං පුග්ගලානං විසඞ්ඛාරගතානං.

**විවෙකෙ සික්ඛිස්සාම සෙති** - සො ථෙරො පකතියා සික්ඛිතසික්ඛො. අපි ච, ධම්මදෙසනං උපාදාය ධම්මදෙසනං යාචන්තො[2] එවමාහ: 'විවෙකෙ සික්ඛිස්සාම සෙ'ති. තෙනාහ තිස්සො මෙත්තෙය්‍යො:

"මෙථුනමනුයුත්තස්ස (ඉච්චායස්මා තිස්සො මෙත්තෙය්‍යො)
විඝාතං බ්‍රූහි මාරිස,
සුත්වාන තව සාසනං
විවෙකෙ සික්ඛිස්සාම සෙ".ති

1. විවෙකට්ඨකායානං - සීමු. II. වූපකට්ඨකායානං - PTS.
2. යාචමානො - මජසං.

**විවෙකෙ සික්ඛිස්සාම සෙ** – 'විවේක' නම්: කායවිවේක යැ චිත්තවිවේක යැ උපධිවිවේක යැ යි තුන් විවේක කෙනෙක් වෙති

කායවිවේකය කවරැ යත්? මේ සස්නෙහි මහණ තෙමේ අරණ්‍ය යැ වෘක්‍ෂමූල යැ පර්වත යැ කඳුරැ යැ ගල්ගේ යැ සොහොන යැ වනපත් යැ අබවස යැ පිදුරු බිසි (කුටි) යැ යන විවේකසෙනාසනයක් ඇසුරු කෙරෙයි. කයින් විවික්ත වැ වෙසෙයි. හේ එකලා වැ යෙයි. එකලා වැ සිටී. එකලා වැ හොවී. එකලා වැ ගමට පිඬු සිඟා යෙයි. එකලා වැ පෙරළා එයි. එකලා වැ රහසැ හිඳී. එකලා වැ සක්මන් කෙරෙයි. එකලා වැ හැසිරෙයි. වෙසෙයි. ඉරියව් පවත්වයි යැපෙයි යාපනය කෙරෙයි. මේ 'කායවිවේක' යැ.

චිත්තවිවේකය කවරැ යත්? ප්‍රථමධ්‍යානයට සමවැදුනහුගේ සිත නීවරණයන්ගෙන් වෙන් වූයේ වෙයි, ද්විතීයධ්‍යානයට සමවැදුනහුගේ සිත විතර්කවිචාරයන්ගෙන් වෙන් වූයේ වෙයි, තෘතීයධ්‍යානයට සමවැදුනහුගේ සිත ප්‍රීතියෙන් වෙන් වූයේ වෙයි, චතුර්ථධ්‍යානයට සමවැදුනහුගේ සිත සුඛදුඃඛයන්ගෙන් වෙන් වූයේ වෙයි, ආකාසානඤ්චායතනයට සමවැදුනහුගේ සිත රූපසංඥයෙන් ප්‍රතිඝසංඥයෙන් නානාත්මසංඥයෙන් වෙන් වූයේ වෙයි, විඤ්ඤාණඤ්චායතනයට සමවත්නහුගේ සිත අකාසානඤ්චායතනසංඥයෙන් විවික්ත වෙයි, ආකිඤ්චඤ්ඤායතනයට සමවත්නහුගේ සිත විඤ්ඤාණඤ්චායතනසංඥයෙන් විවික්ත වෙයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත්නහුගේ සිත ආකිඤ්චඤ්ඤායතනසංඥයෙන් විවික්ත වෙයි, ස්‍රොතාපන්නයාගේ සිත සත්කායදෘෂ්ටියෙන් විචිකිත්සායෙන් ශීලව්‍රතපරාමර්ශයෙන් දෘෂ්ට්‍යනුශයයෙන් විචිකිත්සානුශයයෙන් හා ඔවුන් හා එක්වැ සිටි කෙලෙසුන්ගෙන් ද විවික්ත වෙයි, සකෘදාගාමිහුගේ සිත ඖදාරිකකාමරාගසංයොජනයෙන් ප්‍රතිඝසංයොජනයෙන් ඖදාරික කාමරාගානුශයයෙන් ප්‍රතිඝානුශයයෙන් හා තදෙකස්ථ කෙලශයන් ගෙන් ද විවික්ත වෙයි, අනාගාමිහුගේ සිත අනුසහගත වූ කාමරාගසංයොජනයෙන් ප්‍රතිඝසංයොජනයෙන් අනුසහගත කාමරාගානුශයයෙන් ප්‍රතිඝානුශයයෙන් හා තදෙකස්ථ කෙලශයන් ගෙන් ද විවික්ත වෙයි, රහත්හු ගේ සිත රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යාවෙන් මානානුශයයෙන් භවරාගානුශයයෙන් අවිද්‍යානුශයයෙන් හා තදෙකස්ථ වූ කෙලශයන්ගෙන් ද බාහ්‍ය ව පැවැති සියලු සංස්කාරනිමිත්තයන්ගෙන් ද විවික්ත වූයේ වේ. මේ යැ චිත්තවිවේක ය.

උපධිවිවේක කවරැ යත්? කෙලශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද 'උපධි' යයි කියනු ලැබෙති; අමාමහ නිවන 'උපධිවිවේක' යයි කියනු ලැබේ. හේ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීම යැ සියලු උපධීන්ගේ දුරැලීම යැ තෘෂ්ණාක්‍ෂය යැ විරාග යැ නිරොධ යැ නිර්වාණයයි. මේ උපධිවිවේක යි.

ගණසඞ්ගනිකායෙන් වෙන් වූ නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණවුන්ගේ කායවිවේකය ද, පිරිසිදු සිත් ඇති උත්තමපාරිශුද්ධියට පැමිණියවුන්ගේ චිත්තවිවේකය ද, උපධිරහිත වූ නිවනට ගිය සිත් ඇති පුද්ගලයන්ගේ උපධිවිවේකය ද වේ.

**විවෙකෙ සික්ඛිස්සාම සෙ** – ඒ තෙරණුවෝ පියවින් හික්මුණු ත්‍රිවිධ ශික්‍ෂා ඇත්තාහ; තවද දම්දෙසුම් සඳහා දම්දෙසුම අයදමින් මෙසේ කියති: 'විවෙකෙ සික්ඛිස්සාම සෙ' යි. එයින් කීහ, තිෂ්‍යමෛත්‍රෙය තෙරණුවෝ:

"මෙථුනමනුයුත්තස්ස -පෙ- සික්ඛිස්සාම සෙ" යි.

7 - 2

මෙථුන මනුයුත්තස්ස (මෙත්තෙය්‍යාති භගවා)
මුස්සතෙ වාපි[1] සාසනං,
මිච්ඡා ච පටිපජ්ජති
එතං තස්මිං අනාරියං.

**මෙථුනමනුයුත්තස්සාති** - මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො දුට්ඨුල්ලො ඔදකන්තිකො රහස්සො ද්වයංද්වයසමාපත්ති,[a] කිං කාරණා වුච්චති මෙථුනධම්මො ? උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති, තං කාරණා වුච්චති මෙථුනධම්මො, යථා උභො කලහකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො භණ්ඩනකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො භස්සකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො විවාදකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො අධිකරණකාරකා 'මෙථුනකා'ති වුච්චන්ති, උභො වාදිනො 'මෙථුනකා'ති වුච්චන්ති, උභො සල්ලාපකා 'මෙථුනකා'ති වුච්චන්ති, එවමෙවං උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති, තං කාරණා වුච්චති මෙථුනධම්මො. **මෙථුනමනුයුත්තස්සාති** මෙථුනධම්මෙ යුත්තස්ස පයුත්තස්ස ආයුත්තස්ස සමායුත්තස්ස තච්චරිතස්ස[2] තබ්බහුලස්ස තග්ගරුකස්ස තන්නින්නස්ස තප්පොණස්ස තප්පබ්භාරස්ස තදධිමුත්තස්ස තදධිපතෙය්‍යස්සාති 'මෙථුනමනුයුත්තස්ස'.

**මෙත්තෙය්‍යාති** - භගවා තං ථෙරං ගොත්තෙන ආලපති; භගවාති ගාරවාධිවචනං; අපිච, භග්ගරාගොති භගවා; භග්ගදොසොති භගවා; භග්ගමොහොති භගවා; භග්ගමානොති භගවා; භග්ගදිට්ඨීති භගවා; භග්ගකණ්ටකොති භගවා; භග්ගකිලෙසොති භගවා; භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා භවානං අන්තකරොති භගවා; භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා; භජි වා භගවා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා; භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා; භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා.

---

1, මුස්සතෙ වාපි - සු අ. මුස්සතෙ වාහි - ස. 2. තංචරිතස්ස - ස.
a. විනයමහාවිභඞ්ග - පඨමපාරාජිකා.

7 - 2

(මෛත්‍රෙය, යී බුදුහු මෙසේ වදාළහ:) මෛථුන්දම්හි ඇලුණහුගේ (පර්‍ය්‍යාප්ති-ප්‍රතිපත්ති) ශාසනය නැසෙයි, යළි (හෙතෙම) වරදවා පිළිපදී, ඔහු කෙරෙහි තෙල මිථ්‍යාප්‍රතිපදාව අනාර්‍ය්‍යධර්‍මයෙකි.

**මෙථුනමනුයුත්තස්ස** - 'මෙථුනධම්ම' නම්: යම් අසද්ධර්‍මයෙක් ග්‍රාම්‍යධර්‍මයෙක් දුෂ්ටබහුල වූ ධර්‍මයෙක් දියකිස අන්ත කොට ඇති රහස්‍ය වූ (ධර්‍මයෙක්) ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද එයයි. කවර කරුණෙකින් 'මෙථුනධම්ම' යී කියනු ලැබේ ද යත්? (රාගයෙන්) රත් වූ වෙසෙසින් රත් වූ (කෙලශයෙන්) තෙත් වූ කුශලවාරය මැඩගෙන සිටි කුසල්සිත යටපත් කළ ස්ත්‍රීපුරුෂ දෙදෙනාගේ කෙලශයෙන් සදෘශ වූ දෙදෙනාගේ ධර්‍මය හුයි එ කරුණෙන් 'මෙථුනධම්ම' යී කියනු ලැබේ; යම්සේ කලහකරුවෝ දෙදෙනෙක් මෛථුනකයෝ යැයි කියනු ලැබෙත් ද, ඩබරකරුවෝ දෙදෙනෙක් - වාක්කලහකරුවෝ දෙදෙනෙක් - විවාදකරුවෝ දෙදෙනෙක් - අධිකරණකරුවෝ දෙදෙනෙක් - වාදීහු දෙදෙනෙක් - කථාකරුවෝ දෙදෙනෙක් 'මෛථුනකයෝ' යැයි කියනු ලැබෙත් ද, එසෙයින් ම රක්ත වූ සංරක්ත වූ (කෙලශයෙන්) තෙත් වූ කුශලසිත මැඩගෙන සිටි යටපත් කළ කුසල්සිත ඇති ස්ත්‍රීපුරුෂදෙදෙනාගේ සදෘශ වූ ස්ත්‍රීපුරුෂදෙදෙනාගේ ධර්‍මය හුයි - එ කරුණෙන් 'මෙථුනධම්ම' යී කියනු ලැබේ.

**මෙථුනමනුයුත්තස්ස** - මෛථුනධර්‍මයෙහි යුක්ත වූ ප්‍රයුක්ත වූ විශෙෂයෙන් යුක්ත වූ එක් වැ යෙදුණා වූ එය කරන්නාවූ එය බහුල වැ කරන්නාවූ එය ගරු කරන්නාවූ ඊට නැමුණාවූ ඊට නතු වූ ඊට බර වූ එහි ඇලුණා වූ එය අධිපති කොට පවත්නහු ගේ හුයි 'මෙථුනමනුයුත්තස්ස' යනු වේ.

**'මෙත්තෙය්‍ය'** යී බුදුහු ඒ තෙරුන් ගොත්‍රයෙන් ආමන්ත්‍රණ කෙරෙති; **භගවා** යනු: ගෞරවාධිවචන යි; නවද- භග්න කළ රාග ඇත් හුයි - භගවත් යැ, භග්න ද්වෙෂ ඇත් හුයි - භගවත් යැ, භග්න මොහ ඇත් හුයි - භගවත් යැ, භග්න (=බිඳි) මාන ඇත් හුයි - භගවත් යැ, බිඳි දෘෂ්ටි ඇත් හුයි - භගවත් යැ; බිඳි කෙලෙස් කටු ඇත් හුයි - භගවත් යැ, බිඳි කෙලෙස් ඇත් හුයි - භගවත් යැ, ධර්‍මරත්නය භාග-විභාග-ප්‍රවිභාග කෙළේ හුයි - භගවත් යැ, භවයන් කෙළවර කෙළේ හුයි - භගවත් යැ, භාවිතකාය - භාවිතසීල - භාවිතචිත්ත - භාවිතප්‍රඥ ඇත් හුයි - භගවත් යැ, නොහොත් බුදුහු ශබ්ද රහිත වූ නිර්ඝොෂ රහිත වූ ජනවාත රහිත වූ මිනිසුන් ගේ රහස්‍යකාරණයට සථාන වූ විවෙකයට අනුරූප වූ වනසෙනසුන් වෙනෙහි දුර සෙනසුන් ඉතා දුර සෙනසුන් සෙවනය කළාහු හුයි - භගවත් යැ, නොහොත් බුදුහු චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පසබෙහෙත්පිරිකරට හිමි වූවාහු හුයි - භගවත් යැ, බුදුහු අර්ථරසයට ධර්‍මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමිවූවාහු හුයි - හෝ භගවත් යැ.

භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා; භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං, ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා; භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා; භගවාති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවාති 'මෙත්තෙය්‍යාති භගවා.'

**මුස්සතෙ වාපි[1] සාසනන්ති** - ද්වීහි කාරණෙහි සාසනං මුස්සති: පරියත්තිසාසනම්පි මුස්සති. පටිපත්තිසාසනම්පි මුස්සති. කතමං තං පරියත්තිසාසනං? යන්තස්ස පරියාපුතං[2] සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං, ඉදං පරියත්තිසාසනං. තම්පි මුස්සති සම්මුස්සති පමුස්සති සම්පමුස්සති පරිබාහිරො හොතීති- 'එවම්පි මුස්සතෙ වාපි සාසනං' කතමං පටිපත්තිසාසනං? සම්මාපටිපදා අනුලොමපටිපදා අපච්චනීකපටිපදා අන්වත්ථපටිපදා ධම්මානුධම්මපටිපදා සීලෙසු පරිපූරකාරිතා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො, ඉදං පටිපත්තිසාසනං. තම්පි මුස්සති සම්මුස්සති පමුස්සති සම්පමුස්සති පරිබාහිරො හොතීති එවම්පි 'මුස්සතෙ වාපි සාසනං.'

**මිච්ඡා ච පටිපජ්ජතීති** - 'පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණතීති 'මිච්ඡා ච පටිපජ්ජති.'

**එතං තස්මිං අනාරියන්ති** - එතං තස්මිං පුග්ගලෙ අනරියධම්මො බාලධම්මො මූළ්හධම්මො අඤ්ඤාණධම්මො අමරාවික්ඛෙපධම්මො යදිදං මිච්ඡාපටිපදාති 'එතං තස්මිං අනාරියං.'

තෙනාහ භගවා:

"මෙථුනමනුයුත්තස්ස (මෙත්තෙය්‍යාති භගවා)
මුස්සතෙ වාපි සාසනං,
මිච්ඡා ච පටිපජ්ජති
එතං තස්මිං අනාරිය"න්ති.

1. මුස්සතෙ වාති - ස.
2. පරියාපුණනං - සීමු. II. පරියාපුටං - මනුප. පරියාපුත්තං - පු.

බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රමාණ්‍යයන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු නුසි හෝ භගවත් යැ, බුදුහු අෂ්ටවිමොක්ෂයන්ට අෂ්ටඅභිභ්වායතනයන්ට නවානුපූර්වවිහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුසි හෝ භගවත් යැ, බුදුහු දශසංඥභාවනාවන්ට දශකෘත්ස්නසමාපත්තීන්ට ආනාපානසමෘතිසමාධියට අශුභසමාපත්තියට හිමි වූවාහු නුසි හෝ භගවත් යැ, බුදුහු සතර සතිපට්ඨානයන්ට සතර සම්‍යක්ප්‍රදහනයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චඉන්ද්‍රියයන්ට පඤ්චබලයන්ට සප්තබොධ්‍යඞ්ගයන්ට ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු නුසි – භගවත් යැ, බුදුහු දශවිධ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍යයන්ට සිවු පිළිසැඹියාවන්ට ෂඩ් අභිඥාවන්ට ෂඩ් බුද්ධධර්මයන්ට හිමි වූවාහු නුසි – භගවත් යැ; තෙල 'භගවත්' යන නම මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑණන් විසින් නො කරන ලද, බූණන් විසින් නො කරන ලද, සගයනළුවන් විසින් නො කරන ලද, නෑ–සහලේනෑයන් විසින් නො කරන ලද, මහණ–බමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරන ලද; යම් භගවත් යන නමක් වී නම් තෙල භාග්‍යවත් බුදුවරයන්ට විමොක්ෂාන්තයෙහි බෝමුලැ සර්වඥතාඥනයාගේ ප්‍රතිලාභය සමග අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වූවා නුසි 'මෙත්තෙය්‍යාති භගවා' යනු වේ.

**මුස්සතෙ වාපි සාසනං** – දෙ කරුණෙකින් ශාසනය නැසෙයි: පර්‍ය්‍යාප්තිශාසනය ද නැසෙයි, ප්‍රතිපත්තිශාසනය ද නැසෙයි; පර්‍ය්‍යාප්තිශාසනය කවරැ යත්? ඔහු විසින් පුහුණු කළ යම් සූත්‍රයෙක් ගෙය්‍ය – වෙය්‍යාකරණ – ගාථා – උදාන – ඉතිවුත්තක – ජාතක – අද්භූතධර්මයෙක් වේ ද, මේ යැ පර්‍ය්‍යාප්තිශාසනය; හෙ ද නැසෙයි වෙසෙසින් නැසෙයි ප්‍රකර්ෂයෙන් නැසෙයි අත්‍යන්තයෙන් නැසෙයි පරිබාහිර වේ නුසි මෙසේත් 'මුස්සතෙ වාපි සාසනං' යනු වේ. ප්‍රතිපත්තිශාසනය කවරැ යත්? සම්‍යක්ප්‍රතිපදාව අනුලොමප්‍රතිපදාව අවිරුද්ධප්‍රතිපදාව අන්වර්ථප්‍රතිපදාව ධර්මානුධර්මප්‍රතිපදාව සිල් පුරනසුලු බව ඉඳුරන්හි පියූ දොර ඇති බව බොජුන්හි පමණ දන්නා බව නිදිවැරීමෙහි යෙදීම සිහිනුවණ ඇති බව සතර සතිපට්ඨානය සතර සම්‍යක්ප්‍රදහනය සතර ඍද්ධිපාදය පඤ්චඉන්ද්‍රියය පඤ්චබලය සප්තබොධ්‍යඞ්ගය ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය යන මේ යැ ප්‍රතිපත්තිශාසනය; හෙ ද මුෂ්‍ය – සම්මුෂ්‍ය – ප්‍රමුෂ්‍ය – සම්ප්‍රමුෂ්‍ය වෙයි, පරිබාහිර වේ නුසි මෙසේත් 'සම්මුස්සතෙ වාපි සාසනං' යනු වේ.

**මිච්ඡා ච පටිපජ්ජති** – ප්‍රාණඝාත ද කෙරෙයි, නුදුන් දෙය ද ගනී, ගෘහසන්ධි බිඳියි, ගම් පැහැරීම ද කෙරෙයි, ගෙවල් පැහැරීම ද කෙරෙයි, මංපැහැරීම ද කෙරෙයි, පරඹුන් කරා ද යෙයි, බොරු ද කියා නුසි 'මිච්ඡා ච පටිපජ්ජති' යනු වේ.

**එතං තස්මිං අනාරියං** – යම් මිථ්‍යාප්‍රතිපදාවක් වේ ද, තෙල ඒ පුද්ගලයා කෙරෙහි අනාර්‍ය්‍ය බව යැ බාල බව යැ මූඪ බව යැ, අඥන බව යැ, අමරාවික්ෂෙපභාවය නුසි 'එතං තස්මිං අනාරියං' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

"මෙථුනමනුයුත්තස්ස –පෙ– එතං තස්මිං අනාරියං"යි.

### 7 - 8

එකො පුබ්බෙ චරිත්වාන
මෙථුනං යො නිසෙවති,
යානං භන්තංව තං ලොකෙ
හීනමාහු පුථුජ්ජනං.

**එකො පුබ්බෙ චරිත්වානාති** – ද්වීහි කාරණෙහි එකො පුබ්බෙ චරිත්වාන: පබ්බජ්ජාසඞ්ඛාතෙන වා ගණා වවස්සග්ගට්ඨෙන[1] වා. කථං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො පුබ්බෙ චරිත්වාන? සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපලිබොධං ඡින්දිත්වා සන්නිධිපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. එවං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො පුබ්බෙ චරිත්වාන; කථං ගණා වවස්සග්ගට්ඨෙන[1] එකො පුබ්බෙ චරිත්වාන? සො එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො එකො ගච්ඡති. එකො තිට්ඨති. එකො නිසීදති. එකො සෙය්‍යං කප්පෙති. එකො ගාමං පිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති. එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති. එවං ගණා වවස්සග්ගට්ඨෙන[1] 'එකො පුබ්බෙ චරිත්වාන'.

**මෙථුනං යො නිසෙවතීති** – මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො -පෙ- ද්වයංද්වයසමාපත්ති, -පෙ- තං කාරණා වුච්චති මෙථුනධම්මො; **මෙථුනං යො නිසෙවතීති** යො අපරෙන සමයෙන බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා මෙථුනං ධම්මං සෙවති නිසෙවති සංසෙවති පටිසෙවතීති 'මෙථුනං යො නිසෙවති.'

**යානං භන්තංව තං ලොකෙති** – 'යාන'න්ති හත්ථියානං අස්සයානං ගොයානං අජයානං මෙණ්ඩයානං ඔට්ඨයානං ඛරයානං, භන්තං අදන්තං අකාරිතං අවිනීතං උප්පථං ගණ්හාති, විසමං ඛාණුම්පි පාසාණම්පි අභිරූහති, යානම්පි ආරොහකම්පි[2] භඤ්ජති[3] පපාතෙපි පපතති, යථා තං භන්තං යානං අදන්තං අකාරිතං අවිනීතං උප්පථං ගණ්හාති, එවමෙවං සො විබ්භන්තකො භන්තයානපටිභාගො උප්පථං ගණ්හාති මිච්ඡාදිට්ඨිං ගණ්හාති – පෙ– මිච්ඡාසමාධිං ගණ්හාති. යථා තං භන්තං යානං අදන්තං අකාරිතං අවිනීතං විසමං ඛාණුම්පි පාසාණම්පි අභිරූහති, එවමෙවං සො විබ්භන්තකො භන්තයානපටිභාගො විසමං කායකම්මං අභිරූහති. විසමං වචීකම්මං – විසමං මනොකම්මං අභිරූහති, විසමං පාණාතිපාතං අභිරූහති. විසමං අදින්නාදානං අභිරූහති. විසමං කාමෙසු මිච්ඡාචාරං අභිරූහති. විසමං මුසාවාදං අභිරූහති. විසමං පිසුනවාචං අභිරූහති. විසමං ඵරුසවාචං අභිරූහති. විසමං සම්ඵප්පලාපං අභිරූහති. විසමං අභිජ්ඣං අභිරූහති විසමං ව්‍යාපාදං අභිරූහති. විසමං මිච්ඡාදිට්ඨිං අභිරූහති. විසමෙ සඞ්ඛාරෙ අභිරූහති. විසමෙ පඤ්ච කාමගුණෙ අභිරූහති. විසමෙ පඤ්ච නීවරණෙ අභිරූහති.

---

1. ගණවවස්සග්ගට්ඨෙන - ස. 2. ආරොහකං - සීමු. I. 3. විභඤ්ජති - සීමු. II.

### 7 - 8

යමෙක් පෙර (පැවිද්දෙන්) එකලා වැ ලොවැ හැසිර (පසුව) මෙවුන්දම් සෙවුණේ නම්, නො හික්මුණු (ඇත් ආදී) යානයක් සෙයින් ඒ (සිවුරලූ) පෘථග්ජනයා ලාමක යැයි කියත්.

**එකො පුබ්බෙ චරිත්වාන** - දෙ කරුණෙකින් පෙර එකලා වැ හැසිර; ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත වූ හෝ ගණසඞ්ගණිකායෙන් වෙන් ව විසීම් අර්ථ වූ හෝ දෙ කරුණෙනි. කිසෙයින් පැවිදිකොටසින් පෙර එකලා වැ හැසිර ද යත්? ගෘහාවාසපලිබොධය සිඳ අඹුදරු පලිබොධය සිඳ ඥාතිපලිබොධය සිඳ මිත්‍රාමාත්‍යපලිබොධය සිඳ සන්නිධිපලිබොධය සිඳ කෙස්රවුළු බහා කසාවත් හැඳපෙරෙවැ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිව කිසිවක් නැතිබවට පැමිණ එකලා වැ සෙරෙයි හැසිරෙයි ඉරියවු පවත්වයි වැටෙයි රැකෙයි යැපෙයි යාපනය වේ; මෙසේ පැවිදිකොටසින් පෙර එකලා වැ හැසිර; කිසෙයින් ගණසඞ්ගණිකායෙන් වෙන් ව විසීම් අර්ථයෙන් පෙර එකලා වැ හැසිර ද යත්? හේ මෙසේ පැවිදි වූයේ එකලා වැ නිශ්ශබ්ද වූ අනිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන් ගේ රහස්‍යයට කාරණ වූ විවෙකානුරූප වූ වනසෙනසුන් වෙනෙහි දුරසෙනසුන් ඉතා දුරසෙනසුන් ඇසුරු කෙරෙයි' හෙතෙම එකලා වැ යෙයි, එකලා වැ සිටී, එකලා වැ හිඳී, එකලා වැ හොවී, එකලා වැ ගමට පිඬු සිඟා යෙයි, එකල වැ පෙරලා එයි, එකලා වැ විවෙකව හිඳී, එකලා වැ සක්මන් කෙරෙයි, එකලා වැ සෙරෙයි හැසිරෙයි ඉරියවු පවත්වයි වැටෙයි රැකෙයි යැපෙයි යාපනය වේ. මෙසේ ගණව්‍යවසඞ්ගාර්ථයෙන් පෙර එකලා වැ හැසිර.

**මෙථුනං යො නිසෙවති** - 'මෙවුන්දම' නම්: යම් අසද්ධර්මයෙක්... ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද එයයි,... එකරුණෙන් 'මෙවුන්දම් ය' යි කියනු ලැබේ. **මෙථුනං යො නිසෙවති** - යමෙක් පසු කලෙක බුදුන් දහම් සඟුන් ශික්‍ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කොට හීන වූ ගිහිබවට පෙරළී මෙවුන්දම් සෙවන නිසෙවන සංසෙවන ප්‍රතිසෙවන කෙරේ නුයි 'මෙථුනං යො නිසෙවති' යනු වේ.

**යානං භන්තංව තං ලොකෙ** - 'යාන' නම්: ඇත්යාන යැ අස්යාන යැ ගවයාන යැ එළුයාන යැ බැටළුයාන යැ ඔටුයාන යැ කොටළුයාන යි. **භන්තං** - නො දැමුණු නො හික්මුණු අවිනීත වූ (යානය) නො මඟට පැමිණෙයි, විෂම ව සිටි කණුවට ද ගලට ද නගී, යානය ද ආරෝහකයාගේ අත්පා ආදිය ද බිඳී, ප්‍රපාතයෙහි දු වැටෙයි, යම්සේ නො දැමුණු නො හික්මුණු අවිනීත වූ ඒ භ්‍රාන්තයානය නො මඟට යේ ද, එසෙයින් ම ඒ සිවුරලූ තෙමේ නො දැමුණු යානයක් බඳු වූයේ නො මඟට පැමිණෙයි, මිථ්‍යාදෘෂ්ටිය ගනී...මිථ්‍යාසමාධිය ගනී; යම්සේ අදාන්ත වූ අශික්‍ෂිත වූ අවිනීත වූ භ්‍රාන්ත වූ යානය විෂම ව සිටි කණුවට හා ගලට ත් නගී ද, එසෙයින් ම භ්‍රාන්තයානයක් බඳු වූ ඒ විභ්‍රාන්තක (=සිවුරලූ) තෙම විෂම වූ කායකර්මය උපදවයි, විෂම වූ වාක්කර්මය - විෂම වූ මනඃකර්මය උපදවයි, විෂම වූ ප්‍රාණඝාතය උපදවයි (=කෙරෙයි) විෂම වූ අදත්තාදානය - විෂම වූ කාමමිථ්‍යාචාරය - විෂම වූ මෘෂාවාදය - විෂම වූ පෛශුන්‍යවචනය - විෂම වූ පරුෂවචනය - විෂම වූ සම්පප්‍රලාපය - විෂම වූ අභිධ්‍යාව - විෂම වූ ව්‍යාපාදය - විෂම වූ මිථ්‍යාදෘෂ්ටිය උපදවයි, විෂම වූ සංස්කාරයන් උපදවයි, විෂම වූ පස්කම්ගුණ උපදවයි, විෂම වූ පඤ්චනීවරණයන් උපදවයි.

යථා තං භන්තා යානං අදන්තා අකාරිතං අවිනීතං යානම්පි ආරොහකම්පි භඤ්ජති, එවමෙවං සො විබ්භන්තකො භන්තයානපටිභාගො නිරයෙ අත්තානං භඤ්ජති. තිරච්ඡානයොනියං අත්තානං භඤ්ජති. පෙත්තිවිසයෙ අත්තානං භඤ්ජති. මනුස්සලොකෙ අත්තානං භඤ්ජති. දෙවලොකෙ අත්තානං භඤ්ජති. යථා තං භන්තං යානං අදන්තං අකාරිතං අවිනීතං පපාතෙ පපතති, එවමෙවං සො විබ්භන්තකො භන්තයානපටිභාගො ජාතිප්පපාතම්පි පපතති. ජරාපපාතම්පි පපතති. ව්‍යාධිපපාතම්පි පපතති. මරණපපාතම්පි පපතති. සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසපපාතම්පි පපතති. **ලොකෙති** - අපායලොකෙ -පෙ- මනුස්සලොකෙති 'යානං භන්තංව තං ලොකෙ.'

**හීනමාහු පුථුජ්ජනන්ති** - 'පුථුජ්ජනා'ති කෙනට්ඨෙන පුථුජ්ජනා? පුථු කිලෙසෙ ජනෙන්තීති පුථුජ්ජනා. පුථු අවිහතසක්කායදිට්ඨිකාති පුථුජ්ජනා. පුථු සත්ථාරානං මුඛුල්ලොකිකාති පුථුජ්ජනා. පුථු සබ්බගතීහි අවුට්ඨිතාති පුථුජ්ජනා, පුථු නානාභිසඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්තීති පුථුජ්ජනා. පුථු නානාඔඝෙහි වුය්හන්තීති පුථුජ්ජනා. පුථු නානාසන්තාපෙහි සන්තප්පන්තීති[1] පුථුජ්ජනා. පුථු නානාපරිළාහෙහි පරිඩය්හන්තීති පුථුජ්ජනා. පුථු පඤ්චසු කාමගුණෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා[2] ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති පුථුජ්ජනා. පුථු පඤ්චහි නීවරණෙහි ආවුතා නිවුතා ඔවුතා පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතාති පුථුජ්ජනා. **හීනමාහු පුථුජ්ජනන්ති** - පුථුජ්ජනං හීනං නිහීනං ඔමකං ලාමකං ඡතුක්කං[3] පරිත්තන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති 'හීනමාහු පුථුජ්ජනං.'

තෙනාහ භගවා:

"එකො පුබ්බෙ චරිත්වාන
මෙථුනං යො නිසෙවති,
යානං භන්තංව තං ලොකෙ
හීනමාහු පුථුජ්ජන"න්ති.

**7 - 4**

යසො කිත්ති ච යා පුබ්බෙ
හායතෙ වාපි තස්ස සා,
එතම්පි[4] දිස්වා සික්ඛෙථ
මෙථුනං විප්පහාතවෙ.

**යසො කිත්ති ච යා පුබ්බෙ හායතෙ වාපි තස්ස සාති** - කතමො යසො? ඉධෙකච්චො පුබ්බෙ සමණභාවෙ සක්කතො හොති ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චය-භෙසජ්ජපරික්ඛාරානං. අයං යසො.

1. සන්තපන්තීති - සීමු. II. 2. අජ්ඣොසන්නා - මඡසං. 3. ජතුක්කං - සීමු. II.
4. එවම්පි - සීමු II. එතං - මනුප.

යම්සේ අදාන්ත වූ අශික්ෂිත වූ අවිනීත වූ ඒ භ්‍රාන්තයානය වාහනයන් ආරෝහකයාගේ අත්පා ආදියත් බිඳී ද, එසෙයින් ම ඒ නො දමුණු යානයක් බඳු සිවුරලූ තෙම නිරයෙහි ආත්මය සුණුවිසුණු කෙරෙයි, තිරිසන් යෝනියෙහි ආත්මය පෙළයි, ප්‍රෙතවිෂයයෙහි ආත්මය පෙළයි, මිනිස්ලොවැ (කම්කටොලු විසින්) ආත්මය පෙළයි, දෙව්ලොවැ (විෂයෝ-දුකින්) ආත්මය පෙළයි. යම්සේ අදාන්ත වූ අශික්ෂිත වූ අවිනීත වූ ඒ භ්‍රාන්තයානය ප්‍රපාතයෙහි වැටේ ද, එසෙයින් ම ඒ නො හික්මුණු යානයක් බඳු ඒ සිවුරලූ තෙම ජාතිප්‍රපාතයට ද වැටෙයි’ ජරාප්‍රපාතයට ද වැටෙයි, ව්‍යාධිප්‍රපාතයට ද – මරණප්‍රපාතයට ද් – ශොකපරිදෙවදුඃඛ-දෞර්මනස්‍යඋපායාසප්‍රපාතයට ද වැටෙයි. **ලොකෙ** – අපායලොකයෙහි... මනුෂ්‍යලොකයෙහි නුසි ‘යානං භන්තංව තං ලොකෙ’ යනු වේ.

**හීනමාහු පුථුජ්ජනං** – ‘පුථුජ්ජනා’ යනු: කවර අරුතෙකින් පෘථග්ජන-යෝ වෙති යත් ? බොහෝ කෙලෙසුන් උපදවත් නුසි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ නො නසන ලද සත්කායදෘෂ්ටි ඇත්තාහු නුසි – පෘථග්ජනයෝ යැ බොහෝ ශාස්තෘන් ගේ මුහුණු බලත් නුසි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ සියලු ගතිවලින් නො නැඟීසිටියාහු නුසි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ විවිධ අභිසංස්කාරයන් රැස් කෙරෙත් නුසි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ විවිධ ඔඝවලින් වැහෙත් නුසි – පෘථග්ජනයෝ යැ පුථු නා නා සන්තාපයන් ගෙන් තැවෙත් නුසි – පුථු නානා පරිදාහයන් ගෙන් දැවෙත් නුසි පෘථග්ජනයෝ යැ බොහෝ වූ පස්කම්ගුණයන්හි රැදුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මූර්‍ඡපත් වූවාහු ඇතුළු වූවාහු ලැගුණාහු ලගනින වූවාහු පිළිපත්නාහු නුසි – පෘථග්ජනයෝ යැ බොහෝ වූ පඤ්චනීවරණයන් ගෙන් එතුණාහු නැමැත්තාහු වැසුණාහු යටින් වැසුණාහු පිළිසන් වූවාහු යටිනුරු වූවාහු නුසි – පෘථග්ජනයෝ සි. **හීනමාහු පුථුජ්ජනං** – පුහුදුනනු හීන යැ නිහීන යැ අවමත යැ ලාමක යැ ත්‍යක්ත යැ පරිත්ත යැ සි මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ වහරත් නුසි ‘හීනමාහු පුථුජ්ජනං’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

> ‘‘එකො පුබ්බෙ චරිත්වාන –පෙ– හීනමාහු පුථුජ්ජනං’’ සි.

**7 – 4**

තවද පෙර මහණබැවිහි ඔහුගේ යම් යශසකුත් කීර්තියකුත් වී නම් ඒ යශස හා කීර්ති පිරිහේ මැ ය, තෙල යශස් කීර්තති හානිය ද දැක මෛථුන්දම් දුරලනු සඳහා (ත්‍රිවිධ ශික්ෂාව) හික්මෙන්නේ ය.

**යසො කිත්ති ච යා පුබ්බෙ හායතෙ වාපි තස්ස සා** – යශස් කවරේ ද? මේ ශාසනයෙහි කිසිවෙක් පෙර මහණ බැව්හි සිටියේ සත්කාර කරන ලදුයේ ගරු කරන ලදුයේ බුහුමන් කරන ලදුයේ පුදන ලදුයේ අපචායන කරන ලදුයේ චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලන්පස බෙහෙත්සත් පිරිකර ලබන සුලු වූයේ වෙයි, මේ යශස් යැ.

කතමා කිත්ති. ? ඉධෙකච්චො පුබ්බෙ සමණභාවෙ කිත්තිවණ්ණගතො[1] හොති: පණ්ඩිතො වියත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභානො, සුත්තන්තිකොති වා, විනයධරොති වා, ධම්මකථිකොති වා, ආරඤ්ඤිකොති වා, පිණ්ඩපාතිකොති වා, පංසුකූලිකොති වා, තෙචීවරිකොති වා, සපදානචාරිකොති වා ඛලුපච්ඡාභත්තිකොති වා, නෙසජ්ජිකොති වා, යථාසන්ථතිකොති වා, පඨමස්ස ඣානස්ස ලාභීති වා, දුතියස්ස ඣානස්ස ලාභීති වා, තතියස්ස ඣානස්ස ලාභීති වා, චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා, ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභීති වා, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ලාභීති වා, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා අයං කිත්තීති 'යසො කිත්ති ච යා පුබ්බෙ.'

**හායතෙ වාපි තස්ස සාති** – තස්ස අපරෙන සමයෙන බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තස්ස සො ච යසො සා ච කිත්ති හායති පරිහායති පරිධංසති පරිපතති[2] අන්තරධායති විප්පලුජ්ජතීති 'යසො කිත්ති ච යා පුබ්බෙ හායතෙ වාපි තස්ස සා.'

**එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙති** – 'එත'න්ති පුබ්බෙ සමණභාවෙ යසො කිත්ති ච, අපරභාගෙ බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තස්ස අයසො ච අකිත්ති ච, එතං සම්පත්ති-විපත්තිං;[3] **දිස්වාති** පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති – එතම්පි දිස්වා. **සික්ඛෙථාති** තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. කතමා අධිසීලසික්ඛා ? ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, ඛුද්දකො සීලක්ඛන්ධො මහන්තො සීලක්ඛන්ධො සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො මොක්ඛං පමොක්ඛං[4] කුසලානං ධම්මානං සමාපත්තියා. අයං අධිසීලසික්ඛා. කතමා අධිචිත්තසික්ඛා ? ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති -පෙ- දුතියං ඣානං – තතියං ඣානං – චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති අයං අධිචිත්තසික්ඛා. කතමා අධිපඤ්ඤාසික්ඛා ? ඉධ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො හොති අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා, සො 'ඉදං දුක්ඛ'න්ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛසමුදයො'ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධො'ති යථාභූතං පජානාති. 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. 'ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති. 'අයං ආසවසමුදයො'ති යථාභූතං පජානාති. 'අයං ආසවනිරොධො'ති යථාභූතං පජානාති. 'අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති. අයං අධිපඤ්ඤාසික්ඛා.

---

1. කිත්තීවණ්ණගතො – සීමු. II. 2. පරිපටති – ස.
3. සම්පත්තිං විපත්තිං – සීමු. II. 4. මුඛං පමුඛං – සීමු. II, මනුප.

කීර්ත්ති කවරී ද යත්? මේ ශාසනයෙහි කිසිවෙක් පෙර මහණබැව්හි සිටියේ දුරු කීර්ත්තිශබ්දය හා ගුණ ඇතියේ වෙයි: පණ්ඩිතයැ ව්‍යක්ත යැ ප්‍රඥාවත් යැ බහුශ්‍රැත යැ චිත්‍රකථා ඇත්තේ යැ සුන්දර ප්‍රඥා ඇත්තේ යැ සෞත්‍රාන්තික යැ හෝ විනයධර යැ හෝ ධම්කථික යැ හෝ ආරණ්‍යක යැ හෝ පිණ්ඩපාතික යැ හෝ පාංශුකූලික යැ හෝ තෙචීවරික යැ හෝ සපදානචාරික යැ හෝ ඛලුපච්ඡාභත්තික යැ හෝ නෙසජ්ජික යැ හෝ යථාසන්තතිකාඞ්ග ඇත්තේ යැ හෝ ප්‍රථමධ්‍යාන ලාභී යැ හෝ ද්විතීයධ්‍යානලාභී යැ හෝ තෘතීයධ්‍යාන ලාභී යැ හෝ චතුර්ථධ්‍යාන ලාභී යැ හෝ ආකාසානඤ්චායතනසමාපත්තිලාභී යැ හෝ විඤ්ඤාණඤ්චායතනසමාපත්තිලාභී යැ හෝ ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිලාභී යැ හෝ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී යැ හෝ සි; මේ කීර්ත්තිය සි එහෙයින් "යසො කිත්ති ච යා පුබ්බෙ" යනු වේ.

**හායතෙ වාපි තස්ස සා** – පසු කලෙක බුදුන් දහම් සඟුන් ශික්ෂාව ප්‍රත්‍යාඛ්‍යාන කොට ලාමක වූ ගිහිබවට හැරුණු ඒ සිවුරලූවාගේ ඒ යශස ද ඒ කීර්ත්තිය ද හෙයි පිරිහෙයි ගිලිහෙයි පෙරළෙයි අතුරුදහන් වෙයි වැනැසේ නුයි 'යසො කිත්ති ච යා පුබ්බෙ හායතෙ වාපි තස්ස සා' යනු වේ.

**එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ**– 'එතං' යනු: පෙර මහණබැව්හි යශස හා කීර්ත්තිය ද පසුව බුදුන් දහම් සඟුන් ශික්ෂාව හැරපියා ගිහි බවට පෙරළා ආවහුගේ අයශස් හා අකීර්ත්තිය ද යන තෙල සම්පත් පිළිබඳ විපත්; **දිස්වා** – දැක තුලනය තීරණය විභාවනය කොට විභූත කොට නුයි: 'එතම්පි දිස්වා' යනු වේ. **සික්ඛෙථ** – අධිශීලශික්ෂා අධිචිත්තශික්ෂා අධිප්‍රඥාශික්ෂා ය සි ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා කවරී ද යත්? මේ ශාසනයෙහි මහණ තෙම සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවර වූයේ වෙසෙයි, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වූයේ අල්පමාත්‍ර අකුශලයෙහි භය දක්නා සුලු වූයේ ශික්ෂාපදයන් සමාදන් ව හික්මෙයි; ක්ෂුද්‍රශීලස්කන්ධ ය මහාශීලස්කන්ධ ය සි යන ශීලය කුශලධර්මයන්ගේ ප්‍රතිලාභයට ප්‍රතිෂ්ඨා යැ ආදි යැ චරණ යැ සංයම යැ සංවර යැ ප්‍රමුඛ යැ පූර්වඞ්ගම සි. මේ අධිශීලශික්ෂාව යැ. අධිචිත්තශික්ෂා කවරී ද යත්? මේ ශාසනයෙහි මහණ තෙම කාමච්ඡන්දනීවරණයෙන් වෙන් ව ම අකුශලධර්මයන් ගෙන් වෙන් ව විතර්ක සහිත වූ විචාර සහිත වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි... ...ද්විතීයධ්‍යානයට... ... තෘතීයධ්‍යානයට චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි මේ අධිචිත්තශික්ෂාව යැ. අධිප්‍රඥාශික්ෂා කවරී ද යත්? මේ ශාසනයෙහි මහණ තෙම ප්‍රඥාවත් වෙයි, ආයර්‍ය වූ (ලෝභාදිය) සිඳීමට සමර්ථ වූ දුක් ක්ෂය වීමට යනසුලු වූ උදයව්‍යය අවබොධ කිරීමට පොහොසත් වූ ප්‍රඥාවෙන් සමන්විත වූයේ වෙයි, හෙතෙම 'මේ දුක යැ' සි තත්වූ පරිද්දෙන් දැනගනී, 'මේ දුඃඛසමුදය යැ' සි තත්වූ පරිද්දෙන් දැනගනී, 'මේ දුඃඛනිරොධය'සි තත්වූ පරිද්දෙන් දැනගනී, 'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාව යැ' සි තත්වූ පරිද්දෙන් දැනගනී; 'මොහු ආශ්‍රවයෝ යැ' සි තතුසෙයින් දැනගනී, 'මේ ආශ්‍රවසමුදය යැ' සි තතුසේ දැනගනී, 'මේ ආශ්‍රවනිරොධය යැ' සි තතුසේ දැනගනී, 'මේ ආශ්‍රවනිරොධයට පමුණුවන ප්‍රතිපදාව ය'සි තතුසේ දැනගනී. මේ අධිප්‍රඥාශික්ෂා සි.

**මෙථුනධම්මො** නාම: යො සො අසද්ධම්මො -පෙ- ද්වයංද්වයසමාපත්ති[ක]. -පෙ- තං කාරණා වුච්චති මෙථුනධම්මො. **එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙති** - මෙථුනධම්මස්ස පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය. අධිචිත්තම්පි සික්ඛෙය්‍ය. අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය. ජානන්තො සික්ඛෙය්‍ය. පස්සන්තො සික්ඛෙය්‍ය. පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය. චිත්තං අධිට්ඨහන්තො සික්ඛෙය්‍ය. සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය. විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය සතිං උපට්ඨපෙන්තො සික්ඛෙය්‍ය චිත්ත සමාදහන්තො සික්ඛෙය්‍ය. පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය. අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය. පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය. පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය. භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය. සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ.'

තෙනාහ භගවා:

"යසො කිත්ති ච යා පුබ්බෙ
හායතෙ වාපි තස්ස සා,
එතම්පි දිස්වා සික්ඛෙථ
මෙථුනං විප්පහාතවෙ"ති.

7 - 5

සඞ්කප්පෙහි පරෙතො සො[1]
කපණො විය ඣායති,
සුත්වා පරෙසං නිග්ඝොසං
මඞ්කු හොති තථාවිධො,

**සඞ්කප්පෙහි පරෙතො සො කපණො විය ඣායතීති** - කාමසඞ්කප්පෙන බ්‍යාපාදසඞ්කප්පෙන විහිංසාසඞ්කප්පෙන දිට්ඨිසඞ්කප්පෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො පිහිතො; **කපණො විය** මන්දො විය මොමූහො විය ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති; යථා උලූකො රුක්ඛසාඛායං මූසිකං මගයමානො ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති, යථා කොත්ථු නදීතීරෙ මච්ඡෙ මගයමානො ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති, යථා බිළාරො[2] සන්ධිසමලසංකටීරෙ මූසිකං මගයමානො ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති, යථා ගද්‍රභො වහච්ඡින්නො සන්ධිසමලසඞ්කටීරෙ ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායති, එවමෙවං සො විබ්භන්තකො කාමසඞ්කප්පෙන බ්‍යාපාදසඞ්කප්පෙන විහිංසාසඞ්කප්පෙන දිට්ඨිසඞ්කප්පෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො පිහිතො කපණො විය මන්දො විය මොමූහො විය ඣායති පජ්ඣායති නිජ්ඣායති අපජ්ඣායතීති 'සඞ්කප්පෙහි පරෙතො සො කපණො විය ඣායති'.

ක. විනයමහාවිභඞ්ග - පඨමපාරාජිකා.
1. යො - සු.   2. විළාරෙ - ස.

**මෙථුනධම්ම නම**: යම් ඒ අසද්ධම්මයෙක්... ද්වයංද්වයසමාපත්තියෙක් වේ ද ...එ කරුණෙන් මෛථුනධර්මය යි කියනු ලැබේ. **එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ** මෛථුන්දම් දුරලීම පිණිස සන්හිඳුවීම පිණිස බැහැරලීම පිණිස 'පටිපස්සද්ධි (=ඵල)ය පිණිස අධිශීලය ද අධිචිත්තය ද අධිප්‍රඥාව ද හික්මෙන්නේය, මේ ත්‍රිවිධ ශික්‍ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේය, දැනගනිමින් හික්මෙන්නේය, බලමින් හික්මෙන්නේය, ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙමින් හික්මෙන්නේය, සිත පිහිටුවමින් හික්මෙන්නේය, ශ්‍රද්ධාවෙන් නිශ්චය කෙරෙමින් හික්මෙන්නේය, වීර්‍ය්‍යය දැඩි කොට ගනිමින් හික්මෙන්නේය, සිහි එළවමින් හික්මෙන්නේය, සිත පිහිටුවමින් හික්මෙන්නේය, ප්‍රඥාවෙන් දැනගනිමින් හික්මෙන්නේය, (ස්වභාවලක්‍ෂණාවබොධයෙන්) අභිජානනය කළයුතු ධර්මය අභිජානනය කෙරෙමින් - සාමාන්‍යලක්‍ෂණාවබොධයෙන් පරිඥාතව්‍ය වූ ධර්මයන් හාත්පසින් දැනගනිමින් - ප්‍රහාතව්‍ය වූ (සමුදය) ප්‍රහීණ කෙරෙමින් - භාවිතව්‍ය වූ (මාර්‍ගය) වඩමින් - ප්‍රත්‍යක්‍ෂ කළයුතු (නිරොධය) ප්‍රත්‍යක්‍ෂ කෙරෙමින් හික්මෙන්නේය, හැසිරෙන්නේය, මොනොවට හැසිරෙන්නේය. සමාදන්ව පවත්නේ නුයි 'එතම්පි දිස්වා සික්ඛෙථ මෙථුනං විප්පහාතවෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යසසං කිත්ති ච යා පුබ්බෙ -පෙ- මෙථුනං විප්පහාතවෙ"යි.

7 - 5

කාමාදි සංකල්පයන් විසින් මඩනා ලද ඒ සිවුරලූ තෙම දිළිත්දකු සෙයින් සිතයි, එබඳු පුද්ගල තෙම උපාධ්‍යායාදී අන්‍යයන් ගේ වදන් අසා මකු වන්නේ යි.

**සඞ්කප්පෙහි පරෙතො සො කපණො විය ඣායති** - කාමසඞ්කල්පයෙන් ව්‍යාපාදසඞ්කල්පයෙන් විහිංසාසඞ්කල්පයෙන් දෘෂ්ටිසඞ්කල්පයෙන් ස්පර්ශ කරන ලද්දහුගේ මඩනා ලද්දහුගේ යුක්ත වූහුගේ සමන්‍වාගත වූහුගේ පිහිත වූහුගේ, **කපණො විය**: අඥානයකු මෙන් සම්මොහ වූවකු මෙන් සිතයි, අතිශයින් සිතයි, අනෙකප්‍රකාරයෙන් සිතයි, එයින් බැහැරව සිතයි; යම්සේ මහමුහුණෙක් අතු අග මීයකු බලමින් සිතා ද අතිශයින් සිතා ද අනෙකප්‍රකාරයෙන් සිතා ද බැහැර සිතා ද, යම්සේ සිවලෙක් ගංඉවුරෙහි මසුන් සොයමින් ධ්‍යාන ප්‍රධ්‍යාන නිධ්‍යාන අපධ්‍යාන කෙරේ ද, යම්සේ බළලෙක් ගෘහසන්ධි - දියනැසිති - කසළගොඩෙහි මීයකු සොයමින් ධ්‍යාන ප්‍රධ්‍යාන නිධ්‍යාන අපධ්‍යාන කෙරේ ද, යම්සේ කොඳුඇට සිඳුණු කොටළුවෙක් සන්ධි - නැසිති - කසළගොඩෙහි ධ්‍යාන - ප්‍රධ්‍යාන නිධ්‍යාන - අපධ්‍යාන කෙරේ ද, එසෙයින් ම ඒ සිවුරලූ තෙම කාමසඞ්කල්පයෙන් ව්‍යාපාදසඞ්කල්පයෙන් විහිංසාසඞ්කල්පයෙන් දෘෂ්ටිසඞ්කල්පයෙන් ස්පර්ශ කරන ලද්දහුගේ යුක්ත වූහුගේ ඇතුළත පිවිසියේ සමන්විත වූහුගේ පිහිත වූහුගේ කෘපණයකු මෙන් අඥානයකු මෙන් සම්මූඪ වූවකු මෙන් සිතයි අතිශයින් සිතයි නොයෙක් ලෙසින් සිතයි ඉන් බැහැරව සිතා නුයි 'සඞ්කප්පෙහි පරෙතො සො කපණො විය ඣායති' යනු වේ.

**සුත්වා පරෙසං නිග්ඝොසං මඞ්කු හොති තථාවිධොති** – 'පරෙස'න්ති උපජ්ඣායා වා ආචරියා වා සමානුපජ්ඣායකා වා සමානාචරියකා වා මිත්තා වා සන්දිට්ඨා වා සම්භත්තා වා සහායා වා චොදෙන්ති: "තස්ස තෙ ආවුසො අලාභා, තස්ස තෙ දුල්ලද්ධං, යං ත්වං එවරූපං උළාරං සත්ථාරං ලභිත්වා එවං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ පබ්බජිත්වා එවරූපං අරියගණං ලභිත්වාපි තස්ස මෙථුනධම්මස්ස කාරණා බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තොසි. සද්ධාපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. හිරීපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. ඔත්තප්පම්පි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. විරියම්පි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. සතිපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසු. පඤ්ඤාපි නාම තෙ නාහොසි කුසලෙසු ධම්මෙසූ"ති. තෙසං වචනං බ්‍යප්පථං දෙසනං අනුසාසනං අනුසිට්ඨිං, **සුත්වා** – සුණිත්වා උග්ගහෙත්වා උපධාරෙත්වා උපලක්ඛයිත්වා; **මඞ්කු හොති** – පීළිතො ඝට්ටිතො[1] බ්‍යාධිතො දොමනස්සිතො හොති. **තථාවිධොති** – තථාවිධො තාදිසො තස්සණ්ඨිතො තප්පකාරො තප්පටිභාගො යො සො විබ්භන්තකොති – 'සුත්වා පරෙසං නිග්ඝොසං මඞ්කු හොති තථාවිධො'.

තෙනාහ භගවා:

"සඞ්කප්පෙහි පරෙතො සො
කපණො විය ඣායති,
සුත්වා පරෙසං නිග්ඝොසං
මඞ්කු හොති තථාවිධො"ති.

7 – 6

අථ සත්ථානි කුරුතෙ
පරවාදෙහි චොදිතො,
එස ඛ්වස්ස මහාගෙධො
මොසවජ්ජං පගාහති.

**අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතොති** – 'අථා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා නාමෙතං අථාති; **සත්ථානීති** – තීණි සත්ථානි: කායසත්ථං වචීසත්ථං මනොසත්ථං. තිවිධං කායදුච්චරිතං කායසත්ථං, චතුබ්බිධං වචීදුච්චරිතං වචීසත්ථං, තිවිධං මනොදුච්චරිතං මනොසත්ථං.

**පරවාදෙහි චොදිතොති** – උපජ්ඣායෙහි වා ආචරියෙහි වා සමානුපජ්ඣායකෙහි[2] වා සමානාචරියකෙහි වා මිත්තෙහි වා සන්දිට්ඨෙහි වා සම්භත්තෙහි වා සහායෙහි වා චොදිතො සම්පජානමුසා භාසති: "අභිරතො[3] අහං භන්තෙ අහොසිං පබ්බජ්ජාය. මාතා මෙ පොසෙතබ්බා. තෙනම්හි විබ්භන්තො"ති භණති. "පිතා මෙ පොසෙතබ්බො. තෙනම්හි විබ්භන්තො"ති භණති. "භාතා මෙ පොසෙතබ්බො"ති භණති. 'භගිනී මෙ පොසෙතබ්බා"ති භණති. "පුත්තො මෙ පොසෙතබ්බො, ධීතා මෙ පොසෙතබ්බා, මිත්තා මෙ පොසෙතබ්බා, අමච්චා මෙ පොසෙතබ්බා, ඤාතකා මෙ පොසෙතබ්බා, සාලොහිතා මෙ පොසෙතබ්බා. තෙනම්හි විබ්භන්තො"ති භණති. වචීසත්ථං කරොති සඞ්කරොති ජනෙති සඤ්ජනෙති නිබ්බත්තෙති අභිනිබ්බත්තෙතීති – 'අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතො.'

---

1. ඝට්ටිතො - මජසං. 2. සමානුපජ්ඣායෙහි - සීමු. II. 3. අනභිරතො - ස.

**සුත්වා පරෙසං නිග්ඝොසං මඞ්කු හොති තථාවිධො** – ‘පරෙසං’ යනු: උපාධ්‍යායයෝ හෝ ආචාර්‍ය්‍යයෝ හෝ සමානොපාධ්‍යායකයෝ හෝ සමානාචාර්‍ය්‍යකයෝ හෝ මිත්‍රයෝ හෝ සන්දෘෂ්ටයෝ හෝ සම්භක්තයෝ හෝ සහායයෝ හෝ (මෙසේ) චෝදනා කෙරෙති: “ඇවැත්නි, තෙපි යම්හෙයකින් මෙබඳු උදාර වූ ශාස්තෘවක්හු ලැබ මෙසේ ස්වාඛ්‍යාත ශාසනයක පැවිදිව මෙබඳු ආචාර්‍ය්‍යධනයක් ලැබත් ඒ මෙවුත්දම් හෙතුයෙන් බුදුන් දහම් සඟුන් ශික්ෂාව හැරපියා හීනබවට පෙරළුණාව, තොපට කුසල් දහම්හි ශ්‍රද්ධාවකු දු නො වීය. කුසල්දහම්හි ලජ්ජාවකු දු නො වීය, කුසල් දහම්හි බියකු දු නො වීය, කුසල්දහම්හි වීර්‍ය්‍යයකු දු නො වීය, කුසල්දහම්හි සිහියකු දු නො වීය, කුසල්දහම්හි ප්‍රඥාවකු දු නො වීය, ඒ තොපට අලාභයෙක, ඒ තොප විසින් දුර්ලබ්ධ යැ” යි ඔවුන් ගේ වචනය වදත්මග දෙසුම අනුසස්ත අනුශිෂ්ටිය; **සුත්වා** – අසා උගෙන විමසා සලකා; **මඞ්කු හොති** – පෙළුණේ ගැටුණේ වෙසෙසින් පෙළුණේ උපන් දොම්නස් ඇතියේ; **තථාවිධො** – එබඳු වූ තාදෘශ වූ එසේ සිටි තත්ප්‍රකාර වූ, තත්ප්‍රතිභාග වූ ඒ සිවුරලූ තෙමේ නුයි ‘සුත්වා පරෙසං නිග්ඝොසං මඞ්කු හොති තථාවිධො’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“සඞ්කප්පෙහි පරෙතො සො –පෙ– මඞ්කු හොති තථාවිධො”යි.

## 7 – 6

ඉක්බිති අන්‍යයන් ගේ වචනයෙන් චෝදනා කරන ලදුයේ දුශ්චරිත නමැති ශස්ත්‍රයන් කෙරෙයි, තෙල ඔහු ගේ මහාවඤ්චනය තෙමේ මෘෂාවාදයට බැසගන්නේ වේ.

**අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතො** – ‘අථ’ යනු: පදයන් ගේ සන්ධි යැ පදසංසර්ගී යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්තා නමැ තෙල ‘අථ’ යනු. **සත්ථානි** – කායශස්ත්‍ර යැ වාක්ශස්ත්‍ර යැ මනශ්ශස්ත්‍ර යැයි ශස්ත්‍ර (ආයුධයෝ) තිදෙනෙකි. ත්‍රිවිධ කායදුශ්චරිතය කායශස්ත්‍ර යැ චතුර්විධ වාග්දුශ්චරිතය වාක්ශස්ත්‍ර යැ ත්‍රිවිධ මනොදුශ්චරිතය මනශ්ශස්ත්‍රය යි.

**පරවාදෙහි චොදිතො** – උපාධ්‍යායයන් විසින් හෝ ආචාර්‍ය්‍යයන්–සමානොපාධ්‍යායකයන් – සමානාචාර්‍ය්‍යකයන් – මිත්‍රයන් – සන්දෘෂ්ටයන්–සම්භක්තයන් – සහායයන් විසින් හෝ චෝදනා කරන ලදුයේ දැනැ දැනැ බොරු කියයි: ස්වාමීනි, මම පැවිද්දට ඇලුම් ඇති වීමි, (එහෙත්) මා විසින් මව පොෂණය කළ යුත්තීය, එහෙයින් සිවුරු හළෙමී’ කියයි. ‘පියා මා විසින් පොෂණය කළ යුතු හෙයින් සිවුරු හළෙමී’ කියයි. ‘බෑයා මා විසින් පොෂණය කළ යුතු හෙයින් සිවුරු හළෙමී’ කියයි. ‘භගිනිය මා විසින් පොෂණය කළ යුත්තීය’යි කියයි. ‘පුත්‍රයා මා විසින් පොෂණය කළ යුත්තේය, දුහිතෘව මා විසින් පොෂණය කළ යුත්තීය, මිත්‍රයෝ මා විසින් පොෂණය කළ යුත්තෝය, සගයෝ මා විසින් පොෂණය කළ යුත්තෝය, නෑයෝ මා විසින් පොෂණය කළ යුත්තෝය, සහලේනෑයෝ මා විසින් පොෂණය කළ යුත්තෝය, එහෙයින් සිවුරු හළෙමී’ කියයි; වචන අවිය කෙරෙයි, මොනවට කෙරෙයි, උපදවයි මැනවින් උපදවයි නිපදවයි මැනවින් නිපදවා නුයි ‘අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතො’ යනු වේ.

**එසබ්බස්ස මහාගෙධොති** - එසො බො තස්ස මහාගෙධො මහාවනං මහාගහනං මහාකන්තාරො මහාවිසමො මහාකුටිලො මහාපඞ්කො මහාපලිපො මහාපලිබොධො මහාබන්ධනං යදිදං සම්පජානමුසාවාදොති 'එසබ්බස්ස මහාගෙධො.'

**මොසවජ්ජං පගාහතීති** - මොසවජ්ජං වුච්චති මුසාවාදො. ඉධෙකච්චො සභග්ගතො වා පරිසග්ගතො වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො "එහම්භො පුරිස, යං ජානාසි, තං වදෙහී"ති. සො අජානං වා ආහ: 'ජානාමී'ති. ජානං වා ආහ: 'න ජානාමී'ති. අපස්සං වා ආහ: 'පස්සාමී'ති. පස්සං වා ආහ: 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ධනහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසති.[a] ඉදං වුච්චති මොසවජ්ජං. අපි ච තීහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති. භණන්තස්ස හොති 'මුසා භණාමී'ති. භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. ඉමෙහි තීහාකාරෙහි මුසාවාදො හොති. අපි ච, චතූහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති. භණන්තස්ස හොති 'මුසා භණාමී'ති. භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. විනිධාය දිට්ඨිං. ඉමෙහි චතූහාකාරෙහි මුසාවාදො හොති. අපිච, පඤ්චහාකාරෙහි -ඡහාකාරෙහි - සත්තහාකාරෙහි - අට්ඨහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති. භණන්තස්ස හොති 'මුසා භණාමී'ති. භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය සඤ්ඤං, විනිධාය භාවං. ඉමෙහි අට්ඨහාකාරෙහි මුසාවාදො හොති. **මොසවජ්ජං පගාහතීති** - මොසවජ්ජං පගාහති ඔගාහති අජ්ඣොගාහති පවිසතීති 'මොසවජ්ජං පගාහති.'

තෙනාහ භගවා:

"අථ සත්ථානි කුරුතෙ පරවාදෙහි චොදිතො,
එසබ්බස්ස මහාගෙධො මොසවජ්ජං පගාහතී"ති.

**7 - 7**

පණ්ඩිතොති සමඤ්ඤාතො එකචරියමධිට්ඨිතො,
සචාපි[1] මෙථුනෙ යුත්තො මන්දොව පරිකිස්සති.

**පණ්ඩිතොති සමඤ්ඤාතොති** - ඉධෙකච්චො පුබ්බෙ සමණභාවෙ-කිත්තිවණ්ණගතො[2] හොති පණ්ඩිතො වියත්තො මෙධාවී බහුස්සුතො චිත්තකථී කල්‍යාණපටිභානො සුත්තන්තිකොති වා විනයධරොති වා ධම්මකථිකොති වා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා, එවං ඤාතො හොති සඤ්ඤාතො[3] සමඤ්ඤාතො හොතීති - පණ්ඩිතොති සමඤ්ඤාතො.

1. අථාපි - PTS. 2. කිත්තිවණ්ණගතො - සීමු II.
3. පඤ්ඤාතො - සීමු. II. මජ්සං.
a. මජ්ඣිමනිකාය - සාලෙය්‍යකසුත්ත, තිකඞ්ගුත්තර - පුග්ගලවග්ග.

**එසබ්බවස්ස මහාගෙධො** – යම් සම්පජාන මුසාවාදයෙක් වේ ද, තෙල වනාහි ඔහුගේ මහාගෙධ(=බන්ධ) යැ මහාවන යැ මහලැහැබ යැ මහත් කාන්තාර යැ මහද්විෂම යැ මහාපඞ්ක යැ මහමඩවල යැ මහහැළි යැ මිහාදුර්ගයැ මහාබන්ධනය නුයි 'එසබ්බවස්ස මහාගෙධො' යනු වේ.

**මොසවජ්ජං පගාහති** – මුසාවාද ය 'මොසවජ්ජ' යි කියනු ලැබෙයි. මෙලොව්‍ැ කිසිවෙක් සභායෙහි සිටියේ හෝ ගම් සභායෙහි සිටියේ හෝ නෑයන් මැද සිටියේ හෝ සෙනා මැද සිටියේ හෝ රදෙල් මැද සිටියේ හෝ ශාක්ෂියට කැඳවනු ලදුයේ 'එව එම්බා පුරුෂය, දන්නා දය කිය'යි ශාක්ෂි අසන ලදුයේ හෙතෙම නො දනිමින් හෝ දනිමි' කියයි, දනිමින් හෝ 'නො දනිමි' කියයි, නො දක්මින් හෝ 'දක්මි' කියයි, දක්මින් හෝ 'නො දක්මි' කියයි; මෙසේ තමා නිසා හෝ මෙරමා නිසා හෝ ධනය නිසා හෝ මද වූ අල්ලසක් නිසා හෝ දැනැ දැනැ බොරු කියයි. මේ 'මොසවජ්ජ' යි කියනු ලැබෙයි. තවද තුන් අයුරෙකින් මෘෂාවාදය වෙයි: පළමු මැ ඔහුට 'බොරුවක් කියන්නෙමි' සිත වෙයි, කියන්නා හට 'මෘෂා (බොරු) බෙණෙමි' සිත වෙයි, කීවහුට, 'මෘෂා මා විසින් කියන ලද්'යි සිත වෙයි; මේ තුන් අයුරින් මෘෂාවාද වේ. තවද සතර අයුරෙකින් මෘෂාවාද වෙයි: පළමු මැ ඔහුට 'මෘෂා බණන්නෙමි' සිත වෙයි, කියන්නා හට මෘෂා බෙණෙමි' සිත වෙයි, කීවහුට 'මෘෂා මං විසින් බණන ලද්'යි සිත වෙයි. ලබ්ධිය සඟවාගෙන කියයි. මේ සතර අයුරින් මෘෂාවාද වේ. තවද පස් පරිද්දෙකින් – සපරිද්දෙකින් – සත්-පරිද්දෙකින් – අට පරිද්දෙකින් මෘෂාවාද වෙයි. පළමු මැ ඔහුට බොරු කියන්නෙමි' සිත වෙයි. කියන්නහුට 'බොරු කියමි' සිත වෙයි. කීවහුට 'බොරු මං විසින් කියන ලද්'යි සිත වෙයි. ලබ්ධිය සඟවා කියයි. කැමැත්ත සඟවා කියයි, රුචිය සඟවා කියයි, සංඥාව සඟවා කියයි, භාවය සඟවා කියයි. මේ අට අයුරින් මෘෂාවාද වේ. **මොසවජ්ජං පගාහති** – මෘෂාවාදයට බසී බැසගනී ඇතුළු වෙයි පිවිසේ නුයි 'මොසවජ්ජං පගාහති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අථ සත්ථානි කුරුතෙ -පෙ- මොසවජ්ජං පගාහති"** යි.

7 – 7

පෙර පණ්ඩිතයෙකැ'යි ප්‍රසිද්ධ වූයේ එකලා චංසයෙහි පිහිටියේ යළි මෙවුන්දම්හි යෙදුණේ වී නම් හෙතෙම මූඪයකු මෙන් කෙලෙසෙන්නේ යි.

**පණ්ඩිතොති සමඤ්ඤාතො** – මේ සසුන්හි කිසිවෙක් පෙර මහණුවම් කරන කල්හි කීර්ති සඛ්‍යාත යශසට පැමිණියේ වෙයි; පණ්ඩිතයෙක් ව්‍යක්තයෙක නුවණැත්තෙක බහුශ්‍රැතයෙක චිත්‍රකථිකයෙක සුන්දරප්‍රඥ ඇත්තෙක සෞත්‍රාන්තික යැ හෝ විනයධර යැ හෝ ධම්කථික යැ හෝ... නෙවසංඥානාසංඥායතනසමාපත්තිලාභියෙකැයි හෝ මෙසේ දන්නා ලදුයේ පැනුණේ ප්‍රසිද්ධ වේ නුයි 'පණ්ඩිතොති සමඤ්ඤාතො' යනු වේ.

**එකචරියං අධිට්ඨිතොති** – ද්වීහි කාරණෙහි එකචරියං අධිට්ඨිතො පබ්බජ්ජාසඞ්ඛාතෙන වා ගණා වවස්සග්ගට්ඨෙන වා. කථං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකචරියං අධිට්ඨිතො? සබ්බං ඝරාවාසපලිබොධං ඡින්දිත්වා -පෙ- එවං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකචරියං අධිට්ඨිතො. කථං ගණා වවස්සග්ගට්ඨෙන එකචරියං අධිට්ඨිතො? සො එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤෙ වනපත්ථානි -පෙ- එවං ගණා වවස්සග්ගට්ඨෙන එකචරියං අධිට්ඨිතොති – එකචරියං අධිට්ඨිතො.

**සචාපි මෙථුනෙ යුත්තොති** – මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො -පෙ- තංකාරණා වුච්චති මෙථුනධම්මො. "සචාපි මෙථුනෙ යුත්තො"ති සො අපරෙන සමයෙන බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිත්වා මෙථුනධම්මෙ යුත්තො සංයුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තොති 'සචාපි මෙථුනෙ යුත්තො.'

**මන්දොව පරිකිස්සතීති** – කපණො විය මන්දො විය මොමූහො විය කිස්සති පරිකිස්සති පරිකිලිස්සති, පාණම්පි හනති, අදින්නම්පි ආදියති. සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, එවම්පි කිස්සති පරිකිස්සති පරිකිලිස්සති. තමෙනං රාජානො ගහෙත්වා විවිධා කම්මකාරණා කාරෙන්ති: කසාහිපි තාළෙන්ති, වෙත්තෙහිපි තාළෙන්ති, අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති, හත්ථම්පි ඡින්දන්ති, පාදම්පි ඡින්දන්ති, හත්ථපාදම්පි ඡින්දන්ති, කණ්ණම්පි ඡින්දන්ති, නාසම්පි ඡින්දන්ති, කණ්ණනාසම්පි ඡින්දන්ති, බිලඞ්ගථාලිකම්පි කරොන්ති, සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති, රාහුමුඛම්පි කරොන්ති, ජොතිමාලිකම්පි කරොන්ති, හත්ථපජ්ජොතිකම්පි කරොන්ති, එරකවත්තිකම්පි කරොන්ති, චීරකවාසිකම්පි කරොන්ති, එණෙය්‍යකම්පි කරොන්ති, බලිසමංසිකම්පි කරොන්ති, කහාපණකම්පි[1] කරොන්ති, ඛාරාපතච්ඡිකම්පි කරොන්ති, පලිඝපරිවත්තිකම්පි කරොන්ති, පලාලපීඨකම්පි කරොන්ති, තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති, සුනඛෙහිපි ඛාදාපෙන්ති, ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති, අසිනාපි සීසං ඡින්දන්ති එවම්පි කිස්සති පරිකිස්සති පරිකිලිස්සති. අථවා කාමතණ්හාය අභිභූතො පරියාදින්නචිත්තො භොගෙ පරියෙසන්තො නාවාය මහාසමුද්දං පක්ඛන්දති: සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො[2] ඛුප්පිපාසාහි මීයමානො[3] තිගුම්බං[4] ගච්ඡති, තක්කොලං ගච්ඡති, තක්කසිලං ගච්ඡති, කාලමුඛං ගච්ඡති, පරමුඛං[5] ගච්ඡති, වෙසුඞ්ගං ගච්ඡති, වෙරාපථං ගච්ඡති, ජවං ගච්ඡති, තාමලිං[6] ගච්ඡති, වඞ්ගං[7] ගච්ඡති, එළවද්ධනං[8] ගච්ඡති, සුවණ්ණකූටං ගච්ඡති, සුවණ්ණභූමිං ගච්ඡති, තම්බපණ්ණිං ගච්ඡති, සුප්පාරකං[9] ගච්ඡති, භරුකච්ඡං[10] ගච්ඡති, සුරට්ඨං[11] ගච්ඡති, අඞ්ගලොකං[12] ගච්ඡති, ගඞ්ගණං[13] ගච්ඡති, පරමගඞ්ගණං[14] ගච්ඡති, යොනං ගච්ඡති, පරමයොනං ගච්ඡති,
තවකං[15] ගච්ඡති, මූලපදං[16] ගච්ඡති,

---

1. කහාපණ්කම්පි සීමු II. 2. පිළියමානො - සීමු. II. මජසං.
3. පිළියමානො - PTS. 4. ගුම්භං - සීමු. I. ගුබ්බං - ස.
5. මරණපාරං - සී. පුරපුරං - මජස.
6. කාමලිං. තමසිං - සී. තම්මුනිං - මනුප. තක්කල්ඞගං - සී. 7. වඞ්කං - සී.
8. එළබන්ධනං - සී. මජසං. ජලවහං - සීමු. II. 9. සුප්පාදකං - මජසං. සුප්පාරං - සී.
10. භාරුකච්ඡං - සීමු. II. භරුකං - භාරුකච්ඡිං - සී. 11. සුරද්ධං - සුරරට්ඨං - සී.
12. සඞ්ගලොකං - සීමු. II. භඞ්ගලොකං - මජස. අඞ්ගනෙකං - PTS
13. තඞ්ගණං - සීමු. I සඞ්ගණං - සීමු. II. භඞ්ගණං - මජසං.
14 පදපතඞ්ගං - සීමු. I. පදමතඞ්ගණං - සී. සරමතඞ්ගණං - මජසං
15. විනකං - මජස, විනං - සී. 16. මූලපද්දං - මනුප.

**ඒකචරියං අධිට්ඨිතො** - දෙකරුණෙකින් එකචර්‍ය්‍යාවෙහි පිහිටියේ: ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත වූ හෝ ගණයා කෙරෙන් වෙන් ව විසීම් සඞ්ඛ්‍යාත වූ හෝ දෙකරුණෙනි. කෙසේ ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත කරුණෙන් එකචර්‍ය්‍යාවෙහි පිහිටියේ ද යත් ? සියලු ගෘහාවාසපරිබොධය සිඳපියා...(7 - 3 සූත්‍රනිද්දේශය) මෙසේ පැවිදිකොටසින් එකලාවාසයෙහි පිහිටියේ; කෙසේ ගණ-ව්‍යවස්සග්ගාර්ථයෙන් එකචර්‍ය්‍යාවෙහි පිහිටියේ ද යත් ? හෙතෙම මෙසේ පැවිදි වූයේ එකලා, වැ...මෙසේ ගණව්‍යවස්සග්ගාර්ථයෙන් එකචර්‍ය්‍යාවෙහි පිහිටියේ නුයි ‘ඒකචරියං අධිට්ඨිතො’ යනු වේ.

**සචාපි මෙථුනෙ යුත්තො** - ‘මෙථුනධම්ම’ නම්: යම් අසද්ධර්මයෙක් ග්‍රාමධර්මයෙක් වසලධර්මයෙක්...එහෙයින් ‘මෙථුනධම්ම’ යයි කියනු ලැබේ. **සචාපි මෙථුනෙ යුත්තො** - හේ පසු කලෙක බුදුන් දහම් සඟුන් ශික්‍ෂාව හැරපියා ගිහිබවට පෙරළී මෙවුන්දම්හි යෙදුණේ සංයුක්ත ප්‍රයුක්ත ආයුක්ත සමායුක්ත වූයේ නුයි ‘සචාපි මෙථුනෙ යුත්තො’ යනු වේ.

**මන්දොව පරිකිස්සති** - කෘපණයකු මෙන් අඥයකු මෙන් මුග්ධයකු මෙන් කෙලෙසෙයි හාත්පසින් කෙලෙසෙයි වෙහෙසට පැමිණේ. ප්‍රාණවධ ද කෙරෙයි, අදත්තාදානය ද කෙරෙයි, ගෘහසන්ධි ද සිඳී, ගම් පහරයි, ගෙවල් පහරයි, මං පහරයි, පරඹුත් කරු ද යෙයි, මෘෂා ද බෙණෙයි; මෙසේ ත් කෙලෙසෙයි හාත්පසින් කෙලෙසෙයි වෙහෙසට පැමිණේ. ඒ (අපරාධ කරු) රජවරු අල්වාගෙන විවිධ කම්කටොලු කරවති: කසයෙනුදු තළවති, වේවැලිනු දු තළවති, අඩදඬියෙනු දු තළවති, අත් සිඳුවති, පා සිඳුවති, අත්පා ද සිඳුවති, කනු දු සිඳුවති, නැහැය ද සිඳුවති, කන්නාසා ද සිඳුවති, කාඩිසැළි කම්කටොලු ද කෙරෙති, සක්මුඩු කම්කටොලු ද කෙරෙති, රාහුමුඛ කම්කටොලු ද කෙරෙති, ගිනිවැලලු කම්කටොලු ද කෙරෙති, අත් දල්වන කම්කටොලු ද කෙරෙති, එරුවත් කම්කටොලු ද කෙරෙති, තිහිරිවත් කම්කටොලු ද කෙරෙති, එණෙය්‍යක කම්කටොලු ද කෙරෙති, බිළියෙන් මස් සිඳුණා කම්කටොලු ද කෙරෙති, කහාපණික කම්කටොලු ද කෙරෙති, කොස්සෙන් කාරම් ගල්වති, පරිඝපරිවත්තික-කම්කටොලු ද කෙරෙති, පිදුරුපිටු කම්කටොලු ද කෙරෙති, කකාල තෙල් ද ඉස්වති, ශුනකයන් (- කිණබල්ලන්) ලවා කවති, දිවස්හුල ද හිඳුවති, කඩුවෙනු දු හිස සිඳිත්; මෙසේ ත් කෙලෙසෙයි හාත්පසින් කෙලෙසෙයි වෙහෙසට පැමිණේ. නොහොත් කාමතෘෂ්ණාවෙන් මඩනා ලදුයේ හාත්පසින් අල්වාගත් සිත් ඇතියේ භොගයන් සොයමින් නැවින් මහමුහුදට පිවිසෙයි, සීතල පෙරටු කොට උෂ්ණුම පෙරටු කොට මැසිමදුරු අව්සුළං හා සපුන් ගේ පහසින් වෙහෙසෙමින් සාපවසින් මැරෙමින් තිගුම්බජන-පදයට යෙයි, තක්කෝලයට - තක්ෂශිලාවට - කාලමුඛයට - පරාමුඛයට- වෙසුඞගයට - වෙරාපථයට - ජාවකරටට - තාමලිප්තියට - වංගරටට- එළවද්ධනයට - සුවණ්ණකූටයට -සුවණ්ණභූමියට - තාම්‍රපර්ණියට- සුප්පාරකයට භරුකච්ඡජනපදයට - සෞරාෂ්ට්‍රයට - අඞ්ගලෝකයට - ගඞ්ගණයට - පර-මගඞ්ගණයට - යවනරටට - පරමයවනයට - අලසන්දවට - නවකජනපදයට මූලපදරටට යෙයි,

මරුකන්තාරං ගච්ඡති, ජණ්ණුපථං ගච්ඡති, අජපථං ගච්ඡති, මෙණ්ඩපථං ගච්ඡති, සඞ්කුපථං ගච්ඡති, ඡත්තපථං ගච්ඡති, වංසපථං ගච්ඡති; සකුණපථං[1] ගච්ඡති, මූසිකපථං ගච්ඡති, දරීපථං ගච්ඡති, වෙත්තාධාරං[2] ගච්ඡති, එවම්පි කිස්සති, පරිකිස්සති, පරිකිලිස්සති. ගවෙසන්තො න වින්දති. අලාභමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි කිස්සති පරිකිස්සති පරිකිලිස්සති. ගවෙසන්තො වින්දති[3] ලද්ධා ච ආරක්ඛමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති: "කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං' න චොරා හරෙය්‍යුං' න අග්ගි දහෙය්‍ය' න උදකං වහෙය්‍ය' න අප්පියා දායාදා හරෙය්‍යු"න්ති. තස්ස එවං ආරක්ඛතො ගොපයතො තෙ භොගා විප්පලුජ්ජන්ති. සො විප්පයොගමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි කිස්සති පරිකිස්සති පරිකිලිස්සතීති – සවාපි මෙථුනෙ යුත්තො මන්දොව පරිකිස්සති.

තෙනාහ භගවා:

"පණ්ඩිතොති සමඤ්ඤාතො එකචරියමධිට්ඨිතො,
සවාපි මෙථුනෙ යුත්තො මන්දොව පරිකිස්සතී"ති.

7 – 8

එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ,
එකචරියං දළ්හං කයිරා න නිසෙවෙථ මෙථුනං.

**එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධාති** – 'එත'න්ති පුබ්බෙ සමණභාවෙ යසො ච කිත්ති ච, අපරභාගෙ බුද්ධං ධම්මං සඞ්ඝං සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තස්ස අයසො ච අකිත්ති ච, එතං සම්පත්ති-විපත්තිං[4] ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; මුනීති මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනි; ඉධාති ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉසස්මිං ධම්මවිනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං සත්ථුසාසනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං අත්තභාවෙ ඉමස්මිං මනුස්සලොකෙති 'එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ.'

1. අංසපථං - සී. 2. වෙත්තාචාරං - සීමු. II. මජසං. වෙත්තාධාරං - මනුප.
3. න වින්දති - සීමු. II.
4. සම්පත්තිං විපත්තිං - සීමු. II. සම්පත්තිවිපත්තිඤ්ච - මනුප.

වැලිකතරට යෙයි, දණ්ඩගට යෙයි, අජපථයට යෙයි, මෙණ්ඩපථයට යෙයි, (කණ්ණුපහායන) ශඞ්කුපථයට යෙයි ඡත්‍රපථයට යෙයි, වංසපථයට යෙයි, ශකුණපථයට යෙයි, මූෂිකපථයට යෙයි, දරිපථයට යෙයි, වේත්‍රාධාරයට පැමිණෙයි;* මෙසේත් කෙලෙසෙයි හාත්පසින් කෙලෙසෙයි වෙහෙසට පැමිණේ. සොයනුයේ නො ලැබෙයි, නො ලැබීම නිසා උපන් දුකට දොම්නසට ද පැමිණෙයි, මෙසේත් කෙලෙසෙයි, පෙළෙයි වෙහෙසට පැමිණේ. සොයනුයේ ලැබෙයි, ලැබී වැලිත් කිසෙයිත් මා ගේ භොගයන් රජවරු නො මැ ගන්නාහු ද, සොරු නො ගන්නාහු ද, ගින්නෙත් නො දැවේ ද, වතුරෙත් නො වැගේ ද, අමනාප වූ අයිමියෝ නො ගන්නාහු ද'යි රැකීම නිසා උපදනා දුකට දොම්නසට ද පැමිණෙයි; මෙසේ රක්ෂණ ගොපනය කරන්නා වූ ඔහු ගේ ඒ භොගයෝ වැනසෙති; හෙතෙම වියොගය නිසා උපදනා දුකට දොම්නසට ද පැමිණේ. මෙසේත් කෙලෙසෙයි පෙළෙයි වෙහෙසට පැමිණේ නුයි 'සචාපි මෙථුනෙ යුත්තො මන්දොව පරිකිස්සති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පණ්ඩිතොති සමඤ්ඤාතො -පෙ- මන්දොව පරිකිස්සති" යි.

7 – 8

මේ සපුත්ගි මුනි තෙම පෙර මහණකමයි (යශස්කීර්ති) සැපත ද පසුව (ගිහි වූවහුගේ විපත ද යන) සම්පත්හුගේ විපත්ති සඞ්ඛ්‍යාත තෙල ආදීනවය දැක එකලා වාසය දැඩි කරන්නේය, මෙවුන්දම් නො සෙවුණේය.

එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ – 'එතං' යනු: පෙර මහණ බව්හි යශස් ද කීර්තිය ද පසුකලෙක බුදුන් දහම් සඟුන් හා ශික්ෂාව හැරපියා ගිහි වූවහුගේ අයශස් හා අකීර්තිය ද (යන) තෙල සම්පත්හුගේ විපත්තිය දුන දැනැගෙන තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට; මුනි – 'මෞන'යි ඤාණය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක්,...(2 – 8 සූත්‍රනිර්දේශය). ඉධ – මේ දෘෂ්ටියෙහි මේ ක්ෂාන්තියෙහි මේ රුචියෙහි මේ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්මවිනයෙහි මේ ප්‍රවචනයෙහි මේ ශාස්ත්‍රශාසනයෙහි මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි මේ ආත්මභාවයෙහි මේ මනුෂ්‍යලොකයෙහි නුයි 'එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ' යනු වේ.

---

* පිටපත්වල අනියයින් වාකුල ව තුබූ ජනපදනාම පණ්ඩිත වැලිවිටියේ සොරත නායක සාමිපාදයන් වහන්සේගේ හා පුරාවිද්‍යාධිකාරී ආචාර්ය සෙනරත් පරණවිතාන මහතාණන් ගේ උපදෙසින් මෙසේ සකස් විය. Sylvain Levi මහතාගේ Ptalemce Le Middesa Etle Brbut Katha නැමැති ග්‍රන්ථය ද මෙයි උපකාර විය.

**එකචරියං දළ්හං කයිරාති** - ද්වීහි කාරණෙහි එකචරියං දළ්හං කරෙය්‍ය: පබ්බජ්ජාසඞ්ඛාතෙන වා ගණා වවකඨට්ඨෙන වා. කථං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකචරියං දළ්හං කරෙය්‍ය? සබ්බං ඝරාවාස-පලිබොධං ඡින්දිත්වා පුත්තදාරපලිබොධං ඡින්දිත්වා ඤාතිපලිබොධං ඡින්දිත්වා මිත්තාමච්චපලිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරෙය්‍ය විහරෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍ය. එවං පබ්බජ්ජාසඞ්ඛාතෙන එකචරියං දළ්හං කරෙය්‍ය. කථං ගණා වවකඨට්ඨෙන එකචරියං දළ්හං කරෙය්‍ය.? සො එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවෙය්‍ය අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහ-සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො එකො ගච්ඡෙය්‍ය. එකො තිට්ඨෙය්‍ය. එකො නිසීදෙය්‍ය එකො සෙය්‍යං කප්පෙය්‍ය. එකො ගාමං පිණ්ඩාය පවිසෙය්‍ය. එකො පටික්කමෙය්‍ය. එකො රහො නිසීදෙය්‍ය. එකො චඞ්කමං අධිට්ඨෙය්‍ය. එකො චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍ය. එවං ගණා වවකඨට්ඨෙන එකචරියං දළ්හං කරෙය්‍ය එකචරියං ථිරං[1] කරෙය්‍ය, විරියං කරෙය්‍ය දළ්හසමාදානො අස්ස, අවට්ඨිතසමාදානො අස්ස කුසලෙසු ධම්මෙසූති 'එකචරියං දළ්හං කයිරා.'

**න නිසෙවෙථ මෙථුනන්ති** - මෙථුනධම්මො නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො -පෙ- තංකාරණා වුච්චති මෙථුනධම්මො. මෙථුනධම්මං න සෙවෙය්‍ය, න නිසෙවෙය්‍ය, න සංසෙවෙය්‍ය න පටිසෙවෙය්‍ය, න චරෙය්‍ය, න සමාචරෙය්‍ය, න සමාදාය වත්තෙය්‍යාති 'න නිසෙවෙථ මෙථුනං'.

තෙනාහ භගවා:

> "එතමාදීනවං ඤත්වා මුනි පුබ්බාපරෙ ඉධ,
> එකචරියං දළ්හං කයිරා න නිසෙවෙථ මෙථුන"න්ති.

**7 - 9**

> විවෙකඤ්ඤෙව[2] සික්ඛෙථ එතදරියානමුත්තමං[3],
> තෙන සෙට්ඨො න මඤ්ඤෙථ ස වෙ නිබ්බානසන්තිකෙ.

**විවෙකඤ්ඤෙව සික්ඛෙථාති** - 'විවෙකා'ති තයො විවෙකා: කාය-විවෙකො චිත්තවිවෙකො උපධිවිවෙකො. කතමො කායවිවෙකො? -පෙ- අයං උපධිවිවෙකො කායවිවෙකො ච වවකඨට්ඨකායානං[4] නෙක්ඛම්මා-භිරතානං. චිත්තවිවෙකො ච පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං. උපධිවිවෙකො ච නිරුපධීනං පුග්ගලානං විසඞ්ඛාරගතානං. "සික්ඛා"ති. තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා, අධිචිත්තසික්ඛා, අධිපඤ්ඤාසික්ඛා -පෙ- අයං අධිපඤ්ඤාසික්ඛා. **විවෙකඤ්ඤෙව සික්ඛෙථාති** - විවෙකඤ්ඤෙව සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'විවෙකඤ්ඤෙව සික්ඛෙථ.'

---

1. දළ්හං - සිමු. II. 2. විවෙකං යෙව - සු.
3. එතමරියානමුත්තමං - ස. 4. විවෙකට්ඨකායානං - සිමු. II; මජසං.

**එකචරියං දළ්හං කයිරා** – දෙ කරුණෙකින් එකලා වාසය දැඩි කරන්නේය: පැවිදි කොටසින් හෝ ගණයා කෙරෙන් වෙන් ව විසීමෙන් හෝ යැ, කිසෙයින් පැවිදි කොටසින් එකචර්‍ය්‍යාව දැඩි කරන්නේ ද යත්? සියලු ගෘහාවාසපලිබෝධය සිඳපියා පුත්‍රදාරපලිබෝධය – ඥාතිපලිබෝධය– මිත්‍රාමාත්‍යපලිබෝධය සිඳපියා කෙස් දැලිරවුළු බහා කසටවත් හැඳ පෙරෙවැ ගිහිගෙන් නික්ම සසුන්හි පැවිදිව කිසිවක් නැති බවට පැමිණ එකලා වැ හැසිරෙන්නේය, වෙසෙන්නේය, වැටෙන්නේ ය, රැකෙන්නේය, යැපෙන්නේය, පාලනය වන්නේය, මෙසේ පැවිදි කොටසින් එකචර්‍ය්‍යාව දැඩි කරන්නේය. කිසෙයින් ගණයා කෙරෙන් වෙන්ව විසීමෙන් එකලා වාසය දැඩි කරන්නේද යත්? හේ මෙසේ පැවිදි වූයේ අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්‍යයන්ට යොග්‍ය වූ විවේකයට අනුරූප වූ වනසෙනසුන් වෙනෙහි දුර සෙනසුන් ඉතා දුරසෙනසුන් සෙවුණේය, හේ තනි වැ යෙයි, තනි වැ සිටී, තනි වැ හිඳී, තනි වැ හොවී, තනි වැ ගමට පිඬු සිඟායයි, තනි වැ පෙරළා එයි, තනි වැ රහසැ හිඳී, තනි වැ සක්මන් කරන්නේය, තනි වැ හැසිරෙන්නේය, වෙසෙන්නේය, ඉරියවු පවත්වන්නේය පවත්නේය රැකෙන්නේය යැපෙන්නේය පාලනය වන්නේ යි. මෙසේ ගණයා කෙරෙන් වෙන්ව සිටීමෙන් එකචර්‍ය්‍යාව දැඩි කරන්නේය, එකචර්‍ය්‍යාව නො ලිහිල් කරන්නේය, වීර්‍ය්‍ය කරන්නේය. කුසල්දහම්හි දැඩි සමාදන ඇති වන්නේය, සනිටුහන් කළ සමාදන ඇතිවන්නේ නුයි 'එකචරියං දළ්හං කයිරා' යනු වේ.

**න නිසෙවෙථ මෙථුනං** – 'මෛථුනධම්ම' නම්: යම් අසද්ධර්මයෙක් ග්‍රාම්‍යධර්මයෙක්...එහෙයින් 'මෛථුනධම්ම' යයි කියනු ලැබේ. මෙවුන්දම් නො සෙවුණේය, නිසෙවන – සංසෙවන – ප්‍රතිසෙවනය නො කරන්නේය; නො හැසිරෙන්නේය, නො යෙදෙන්නේය, සමාදන්ව නො පවත්නේ නුයි 'න නිසෙවෙථ මෙථුනං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**එතමාදීනවං ඤත්වා** -පෙ- **න නිසෙවෙථ මෙථුනං**" යි

7 - 9

බුද්ධාදි ආර්‍ය්‍යයන් ගේ උතුම් වූ තෙල විවේකයෙහි ම හික්මෙන්නේය, ඒ විවේකය හෙතුකොටගෙන 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' නො සිතන්නේය, හෙතෙම එකාන්තයෙන් නිවන සමීපයෙහි වන්නේ යි.

**විවෙකඤ්ඤෙව සික්ඛෙථ** – 'විවේක' යනු: කායවිවේක යැ චිත්ත විවේක යැ උපධිවිවේක යැ යන තුන් විවේකයෝ ය. කායවිවේකය කවරැ යත්?...මේ උපධි විවේක යි. ගණයා කෙරෙන් වෙන්වූ කය ඇති නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණවුන්ට කායවිවේකය ද පිරිසිදු සිත් ඇති උත්තම පරිශුද්ධියට පැමිණියවුන්ට චිත්තවිවේකය ද ආරම්මණවශයෙන් නිවනට පැමිණි උපධි රහිත පුද්ගලයන්ට උපධිවිවේකය ද වේ. **සික්ඛා** යනු: අධිශීලශික්ෂා යැ අධිචිත්තශික්ෂා යැ අධිප්‍රඥාශික්ෂා යැයි ශික්ෂා තුනෙකි.... මේ අධිප්‍රඥාශික්ෂා යි. **විවෙකඤ්ඤෙව සික්ඛෙථ** – විවේකයෙහි මැ හැසිරෙන්නේය වෙසෙයින් හැසිරෙන්නේය, සමාදන්ව පවත්නේ ය, හික්මෙන්නේ නුයි 'විවෙකඤ්ඤෙව සික්ඛෙථ' යනු වේ.

**එතදරියානමුත්තමන්ති** - අරියා වුච්චන්ති බුද්ධා ච බුද්ධසාවකා ච පච්චෙකබුද්ධා ච. අරියානං එතං අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං යදිදං විවෙකචරියාති 'එතදරියානමුත්තමං.'

**තෙන සෙට්ඨො න මඤ්ඤෙථාති** - තායවිවෙකචරියාය උන්නතිං න කරෙය්‍ය, උන්නමං න කරෙය්‍ය, මානං න කරෙය්‍ය, ථාමං න කරෙය්‍ය, ථම්භං න කරෙය්‍ය, න තෙන මානං ජනෙය්‍ය, න තෙන ථද්ධො අස්ස පත්ථද්ධො පග්ගහිතසිරොති 'තෙන සෙට්ඨො න මඤ්ඤෙථ.'

**ස වෙ නිබ්බානසන්තිකෙති** - සො නිබ්බානස්ස සන්තිකෙ සාමන්තා ආසන්නෙ අවිදූරෙ උපකට්ඨෙති - ස වෙ නිබ්බානසන්තිකෙ.

තෙනාහ භගවා:

"විවෙකඤ්ඤෙව[1] සික්ඛෙථ එතදරියානමුත්තමං,[2]
තෙන සෙට්ඨො න මඤ්ඤෙථ ස වෙ නිබ්බානසන්තිකෙ"ති.

## 7 - 10

රිත්තස්ස මුනිනො චරතො කාමෙසු අනපෙක්ඛිනො,
ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා[3] පජා.

**රිත්තස්ස මුනිනො චරතොති** - 'රිත්තස්සා'ති රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස කායදුච්චරිතෙන රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස, වචීදුච්චරිතෙන රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස, මනොදුච්චරිතෙන රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස, රාගෙන දොසෙන මොහෙන කොධෙන උපනාහෙන මක්ඛෙන පළාසෙන ඉස්සාය මච්ඡරියෙන මායාය සාඨෙය්‍යෙන ථම්භෙන සාරම්භෙන මානෙන අතිමානෙන මදෙන පමාදෙන සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බපරිළාහෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි[4] රිත්තස්ස විවිත්තස්ස පවිවිත්තස්ස; **මුනිනොති** මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; **චරතොති** චරතො විහරතො ඉරියතො වත්තෙතො පාලයතො යපයතො යාපයතොති 'රිත්තස්ස මුනිනො චරතො.'

**කාමෙසු අනපෙක්ඛිනොති** - 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා කාමෙසු අනපෙක්ඛමානො චත්තකාමො වන්තකාමො මුත්තකාමො පහීනකාමො පටිනිස්සට්ඨකාමො වීතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති 'කාමෙසු අනපෙක්ඛිනො.'

---

1. විවෙකං යෙව - සු. 2. එතමරියානමුත්තමං - ස.
3. ගධිතා - මජ්ඣප. මජසං. PTS. 4. සබ්බකුසලාභිසඞ්ඛාරෙහි - සීමු. II.

**එතදරියානමුත්තමං** - බුදුවරු ද බුදුසව්වෝ ද පසේබුදුවරු ද ආර්‍ය්‍යයෝ යැයි කියනු ලැබෙත්. ආර්‍ය්‍යයන්ගේ යම් විවේකවාසයෙක් වේ ද මෙය අග්‍ර යැ ශ්‍රේෂ්ඨ යැ අතිශ්‍රේෂ්ඨ යැ ප්‍රමුඛ යැ උත්තම යැ ප්‍රවර නුයි 'එතදරියානමුත්තමං' යනු වේ.

**තෙන සෙට්ඨො න මඤ්ඤෙථ** - ඒ විවේකයෙහි යෙදීමෙන් (තමා) උසස් නො කරන්නේ යැ නො නගන්නේ යැ මානය නො කරන්නේ යැ බල නො කරන්නේ යැ දැඩි නො කරන්නේ යැ එයින් මානය නූපදවන්නේ යැ එයින් තද වූයේ වෙසෙසින් තද වූයේ ඔසවාගත් හිස ඇත්තේ නො වන්නේ නුයි 'තෙන සෙට්ඨො න මඤ්ඤෙථ' යනු වේ.

**ස වෙ නිබ්බානසන්තිකෙ** - හෙතෙම නිවන සමීපයෙහි වැලන අසල නුදුරු ලඟ නුයි 'ස වෙ නිබ්බානසන්තිකෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"විවෙකං සික්ඛෙථ -පෙ- ස වෙ නිබ්බානසන්තිකෙ" යි.**

## 7 - 10

**කෙලෙසුන් කෙරෙන් සිස් වූ එකලා ව හැසිරෙන කාමයන්හි අපෙක්‍ෂා රහිත වූ චතුරොඝතරණය කළ ක්‍ෂීණාස්‍රව මුනි හට කාමයන්හි ගෙතුණා වූ සත්ත්වයෝ කැමැති වෙත්.**

**රිත්තස්ස මුනිනො චරතො** - 'රිත්තස්ස' යනු: කායදුශ්චරිතයෙන් හිස් වූ වෙන් වූ විවේක වූවහුට, වාග්දුශ්චරිතයෙන් - මනොදුශ්චරිතයෙන් හිස් වූ වෙන් වූ විවේක වූවහුට, රාගයෙන් ද්වෙෂයෙන් මොහයෙන් ක්‍රොධයෙන් වෛරයෙන් මකුබැවින් යුගග්‍රාහයෙන් ඊර්ෂ්‍යායෙන් මසුරුබැවින් ශඨබැවින් තදබැවින් එකටෙක කිරීමෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන් ප්‍රමාදයෙන් සියලු කෙලෙසුන්ගෙන් සියලු දුසිරිත් වලින් සියලු දරථවලින් සියලු පරිදාහයන්ගෙන් සියලු සන්තාපයන්ගෙන් සියලු අකුශලාභිසංස්කාරයන් ගෙන් හිස් වූ වෙන් වූ විවේක වූවහුගේ; **මුනිනො** 'මොන'යි ඥානය කියනු ලැබෙයි...**චරතො** හැසිරෙනුවහුගේ වෙසෙන - ඉරියව් පවත්වන - පැවැතෙන - රැකෙන - යැපෙනුවහුගේ නුයි 'රිත්තස්ස මුනිනො චරතො' යනු වේ.

**කාමෙසු අනපෙක්ඛිනො**-'කාමා' යනු: වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ දැයි උදුන හෙයින් කාමයෝ දෙදෙනෙකි...වස්තුකාමයන් හැඳින ක්ලේශකාමයන් හැරපියා දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා කාමයන්හි අපෙක්‍ෂා නැතියේ ත්‍යාග කළ කාම ඇතියේ වමනය කළ - මුදන ලද - ප්‍රහීණ කළ - දුරලන ලද කාම ඇතියේ වීතරාග වූයේ ත්‍යක්තරාග වූයේ චාන්තරාග වූයේ මුක්තරාග වූයේ ප්‍රහීණරාග වූයේ දුරලන ලද රාග ඇතියේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳිනුයේ උතුම් වූ සිතින් යුක්ත ව වෙසේ නුයි 'කාමෙසු අනපෙක්ඛිනො' යනු වේ.

**ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා[1] පජාති** – "පජා" ති සත්තාධිවචනං, පජා කාමෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා; තෙ කාමොඝතිණ්ණස්ස භවොඝතිණ්ණස්ස දිට්ඨොඝතිණ්ණස්ස අවිජ්ජොඝතිණ්ණස්ස සබ්බසංසාරපථං[2] තිණ්ණස්ස උත්තිණ්ණස්ස නිත්තිණ්ණස්ස අතික්කන්තස්ස සමතික්කන්තස්ස වීතිවත්තස්ස පාරං ගතස්ස පාරං පත්තස්ස අන්තං ගතස්ස අන්තං පත්තස්ස කොටිං ගතස්ස කොටිං පත්තස්ස පරියන්තං ගතස්ස පරියන්තං පත්තස්ස වොසානං ගතස්ස වොසානං පත්තස්ස තාණං ගතස්ස තාණං පත්තස්ස ලෙනං ගතස්ස ලෙනං පත්තස්ස සරණං ගතස්ස සරණං පත්තස්ස අභයං ගතස්ස අභයං පත්තස්ස අච්චුතං ගතස්ස අච්චුතං පත්තස්ස අමතං ගතස්ස අමතං පත්තස්ස නිබ්බානං ගතස්ස නිබ්බානං පත්තස්ස ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්ති අභිජප්පන්ති. යථා නාම ඉණායිකා ආනණ්‍යං පත්ථෙන්ති පිහයන්ති, යථා ආබාධිකා ආරොග්‍යං පත්ථෙන්ති පිහයන්ති, යථා බන්ධනබද්ධා බන්ධනමොක්ඛං පත්ථෙන්ති පිහයන්ති, යථා දාසා භුජිස්සං පත්ථෙන්ති පිහයන්ති, යථා කන්තාරද්ධානපක්ඛන්තා[3] ඛෙමන්තභූමිං පත්ථෙන්ති පිහයන්ති, එවමෙවං පජා කාමෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා. තෙ කාමොඝතිණ්ණස්ස භවොඝතිණ්ණස්ස –පෙ– නිබ්බානං ගතස්ස නිබ්බානං පත්තස්ස ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්ති අභිජප්පන්තීති 'ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා[1] පජා.'

තෙනාහ භගවා:

> "රිත්තස්ස මුනිනො චරතො කාමෙසු අනපෙක්ඛිනො,
> ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා පජා"ති.

**තිස්සමෙත්තෙය්‍යසුත්තනිද්දෙසො සත්තමො.**

# 8

# පසූරසුත්තනිද්දෙසො

## 8 – 1

අථ පසූරසුත්තනිද්දෙසො වුච්චති:

> "ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති[4]
> නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
> යං නිස්සිතා තත්ථ සුභංවදානා
> පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා.

---

1. ගධිතා - මනුප. මජසං. PTS. 2. සබ්බසඞ්ඛාරපථං - ස.
3. පක්ඛන්දා - සිමු. I. පක්ඛන්ද - මජසං. 4. වාදියන්ති - සු. PTS.

**ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා පජා** – 'පජා' යනු: සත්වයන්ට නමෙකි; සත්වයෝ කාමයන්හි ඇලුණාහුය, ගිජු වූවාහුය ගෙතුණාහුය මුසපත් වූවාහුය ඇතුළු වූවාහුය ලැගුණාහුය එල්බුණාහුය ඇවුරුණාහුය ඔඩිහු කාමෞඝය – භවෞඝය – දිට්ඨෞඝය – අවිජ්ජෞඝය තරණය කළ සියලු සසරමග තරණය කළ එතෙර වූ නිස්තරණය කළ ඉක්ම වූ මැනවින් ඉක්ම වූ ව්‍යතික්‍රමණය කළ නිර්වාණපාරයට ගිය පාරයට පැමිණි අන්තයට ගිය අන්තයට පැමිණි කෙළවරට ගිය කෙළවරට පැමිණි පර්‍ය්‍යන්තයට ගිය පර්‍ය්‍යන්තයට පැමිණි අවසානයට ගිය අවසානයට පැමිණි ත්‍රාණයට ගිය ත්‍රාණයට පැමිණි ලෙනයට ගිය ලෙනයට පැමිණි සරණයට ගිය සරණයට පැමිණි අභයට ගිය අභයට පැමිණි අච්‍යුතියට ගිය අච්‍යුතියට පැමිණි අමෘතයට ගිය අමෘතයට පැමිණි නිර්වාණයට ගිය නිර්වාණයට පැමිණි (ක්ෂීණාශ්‍රවයා) හට කැමැති වෙති, ආස්වාදය කෙරෙති, ප්‍රාර්ථනා කෙරෙති, රිසි උපදවති, තෘප්තියට පැමිණෙත්; ණයගැතියෝ අනණ (ණයනැති) බව යම්සේ පතත් ද, කැමැති වෙත් ද, රෝගීහු අරෝග බව – සිරබන්ධනයෙන් බැඳුණාහු බන්ධනයෙන් මිදීම – දාසයෝ නිදාස බව – කතරමගට පිවිසියාහු ක්ෂෙමභූමිය යම්සේ ප්‍රාර්ථනා කෙරෙත් ද කැමැති වෙත් ද එසෙයින් සත්වයෝ කාමයන් හි ඇලුණාහු ගිජුවූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු පිවිසියාහු ලැගුණාහු එල්බුණාහු ඇවුරුණාහු වෙති, ඔවුහු කාමෞඝය තරණය කළ භවෞඝය තරණය කළ...නිවනට ගිය නිවනට පැමිණි ක්ෂීණාස්‍රවය හට කැමති වෙති, ආස්වාදය කෙරෙති, ප්‍රාර්ථනා කෙරෙති, රිසි උපදවති තෘප්තියට පැමිණෙත් නුයි 'ඔඝතිණ්ණස්ස පිහයන්ති කාමෙසු ගථිතා පජා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ජිතත්තස්ස මුනිනො චරතො -පෙ- කාමෙසු ගථිතා පජා"යි**

**සත්වැනි තිස්සමෙත්තෙය්‍ය සූත්‍රනිර්දේශය යි.**

## 8

# පසූරසූත්‍රනිර්දේශය

ඉක්බිති පසූරසූත්‍රනිර්දේශය කියනු ලැබේ.

### 8 – 1

යම් ශාස්තෘ ආදියක් ඇසුරු කළා වූ ඒ ස්වකීය දෘෂ්ටියෙහි ශුභවාද ඇත්තා වූ බොහෝ මහණ බමුණෝ වෙන වෙන සත්‍යයන්හි බැසගත්තාහු ද (මේ දෘෂ්ටිගතිකයෝ) මෙහි මැ ශුද්ධිය වේ යැයි වාද කෙරෙති අන්‍ය ධර්මයන්හි විශුද්ධිය නැතැයි කියත්.

**ඉධෙව සුද්ධිං ඉති වාදයන්තී**ති – ඉධෙව සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; ‘සස්සතො ලොකො, අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති ‘ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති.’

**නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහූ**ති – අත්තනො සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං ඨපෙත්වා සබ්බෙ පරවාදෙ ඛිපන්ති උක්ඛිපන්ති පරික්ඛිපන්ති: සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුප්පටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, න ත්‍ථ සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා; න ත්‍ථ සුජ්ඣන්ති වා විසුජ්ඣන්ති වා පරිසුජ්ඣන්ති වා මුච්චන්ති වා විමුච්චන්ති වා පරිමුච්චන්ති වා; හීනා නිහීනා ඔමකා ලාමකා ඡතුක්කා[1] පරිත්තාති, එවමාහංසු එවං වදන්ති එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති ‘නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු.’

**යන්නිස්සිතා තත්ථ සුභංවදානා**ති – ‘යන්නිස්සිතා’ති යං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං නිස්සිතා අස්සිතා[2] අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා; **තත්ථා**ති – සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා; **සුභංවදානා**ති සුභවාදා සොභනවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති ‘යන්නිස්සිතා තත්ථ සුභංවදානා.’

**පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා**ති – පුථූ සමණබ්‍රාහ්මණා පුථූ පච්චෙකසච්චෙසු නිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා ‘සස්සතො ලොකො, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති නිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා; ‘අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති නිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති ‘පච්චෙක සච්චෙසු පුථූ නිවිට්ඨා.’

තෙනාහ භගවා:

“ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
යන්නිස්සිතා තත්ථ සුභංවදානා
පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා”ති.

---

1. ඡතුක්කා - සීමු. II ඡතුක්කා - මජසං චතුක්කා - මනුප
2. ආනිස්සිතා - සී. මජසං. යන්නිස්සිතා - PTS. පතිට්ඨිතා - සීමු II.

**ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති** - මෙහි මැ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වේ යයි පවසති කියති බෙණෙති දක්වති වහරත්. 'ලොකය ශාශ්වත යැ ලොකය අශාශ්වත යැ ලොකය අන්තවත් යැ ලොකය අනන්තවත් යැ ආත්මයත් ශරීරයත් එකෙක් මැ ය ආත්මය අනෙකෙකැ ශරීරය අනෙකෙකැ සත්ත්වයා මරණින් මතු විද්‍යමාන වෙයි, සත්ත්වයා මරණින් මතු නො වෙයි, සත්ත්වයා මරණින් මතු වන්නේ ත් නො වන්නේ ත් වෙයි, සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි මේ මැ සැබව අන්‍යය හිස් යැ' යි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති' යනු වේ.

**නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු** - තමා ගේ ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය තබා සියලු පරවාදයන් බැහැර කෙරෙති දුරු කෙරෙති ප්‍රතික්‍ෂෙප කෙරෙත්; ඒ ශාස්තෘහු අසර්වඥ යැ, ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි, ගණයා සුප්‍රතිපන්න නො වෙයි, දෘෂ්ටිය භද්‍ර නො වෙයි, ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි, මාර්ගය අනෛර්‍යාණික යැ, එහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය හෝ මුක්තිය විමුක්තිය පරිමුක්තිය හෝ නැත. (සත්ත්වයෝ) එහි ශුද්ධ විශුද්ධ පරිශුද්ධ හෝ නො වෙති, මුක්ත විමුක්ත පරිමුක්ත හෝ නො වෙත්; (ඔහු) හීනයෝ යැ නිහීනයෝ යැ අවමතයෝ යැ ලාමකයෝ යැ අප්‍රත්‍යයෝ යැ අල්පයෝ යැයි මෙසේ කියති පවසති කථා කෙරෙති බෙණෙති දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු' යනු වේ.

**යං නිස්සිතා තත්ථ සුභංවදානා** - යං 'නිස්සිතා' යනු: යම් ශාස්තෘවක්හු ධර්මාඛ්‍යානයක් ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ඇසුරු කළාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළු වූවාහු බැසගත්තාහු; **තත්ථ** - ස්වකීය දෘෂ්ටියෙහි සිය කැමැත්තෙහි සිය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි; **සුභංවදානා** - ස්වකීය ලබ්ධියෙහි ශුභවාද ඇත්තාහු සුන්දර යයි කියන්නාහු (ඇපි) පණ්ඩිතයම්හ යි කියන්නාහු ස්ථිරවාද ඇතියම්හයි - න්‍යායවාද ඇතියම්හයි - හෙතුවාද ඇතියම්හයි - සැලකිය යුතු දෑ කියම්හයි - සකාරණ ව කියම්හයි - නැවැතුණු වාද ඇතියම්හයි කියන්නාහු නුයි 'යං නිස්සිතා තත්ථ සුභංවදානා' යනු වේ.

**පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා** - බොහෝ මහණබමුණෝ බොහෝ වූ වෙන වෙන ම සත්‍යයන්හි පිවිසියාහු පිහිටියාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළු වූවාහු බැසගත්තාහු 'ලොකය ශාශ්වත යැ මේ මැ සැබව අන්‍යය තුච්ඡ යැ' යි පිවිසියාහු පිහිටියාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළු වූවාහු බැසගත්තාහු; 'ලොකය අශාශ්වත යැ...'සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මෙය මැ සැබව අන්‍යය තුච්ඡ යැ' යි පිවිසියාහු පිහිටියාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළුවූවාහු බැසගත්තාහු නුයි 'පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

**“ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති -පෙ- පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා”**යි.

8 - 2

තෙ වාදකාමා පරිසං විගය්හ
බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං,
වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං
පසංසකාමා කුසලාවදානා.

**තෙ වාදකාමා පරිසං විගය්හාති** – 'තෙ වාදකාමා'ති තෙ වාදකාමා වාදත්ථිකා වාදාධිප්පායා වාදපුරෙක්ඛාරා වාදපරියෙසනං චරන්තා; **පරිසං**– ඛත්තියපරිසං බ්‍රාහ්මණපරිසං ගහපතිපරිසං සමණපරිසං විගය්හ ඔගය්හ; **විගය්හාති**– අජ්ඣොගහෙත්වා පවිසිත්වාති 'තෙ වාදකාමා පරිසං විගය්හ.'

**බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤන්ති** – 'මිථූ'ති ද්වෙ ජනා ද්වෙ කලහකාරකා ද්වෙ භණ්ඩනකාරකා ද්වෙ භස්සකාරකා ද්වෙ විවාදකාරකා ද්වෙ අධිකරණකාරකා ද්වෙ වාදිනො ද්වෙ සල්ලාපකා; තෙ අඤ්ඤමඤ්ඤං හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො දහන්ති පස්සන්ති දක්ඛන්ති ඔලොකෙන්ති නිජ්ඣායන්ති[1] උපපරික්ඛන්තීති 'බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං.'

**වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජන්ති** – තෙ අඤ්ඤං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං නිස්සිතා අස්සිතා[2] අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තා; **කථොජ්ජං** වුච්චති කලහො භණ්ඩනං විග්ගහො විවාදො මෙධගං; අථ වා **කථොජ්ජන්ති** අනොජවන්තී[3] සා කථා[4] කථොජ්ජං වදන්ති, කලහං වදන්ති. භණ්ඩනං වදන්ති. විග්ගහං වදන්ති. විවාදං වදන්ති. මෙධගං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං.'

**පසංසකාමා කුසලාවදානාති** – 'පසංසකාමා'ති පසංසකාමා පසංසත්ථිකා පසංසාධිප්පායා පසංසාපුරෙක්ඛාරා පසංසාපරියෙසනං චරන්තා; **කුසලාවදානාති** කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති 'පසංසකාමා කුසලාවදානා.'

තෙනාහ භගවා:

"තෙ වාදකාමා පරිසං විගය්හ
බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං,
වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං
පසංසකාමා කුසලාවදානා"ති.

8 - 3

යුත්තො කථායං පරිසාය මජ්ඣෙ
පසංසමිච්ඡං විනිඝාති හොති,
අපාසදස්මිං[5] පන මඞ්කු හොති,
නින්දාය සො කුප්පති රන්ධමෙසී.

1. නිගඝායන්ති – PTS.
2. පතිට්ඨිතා – සීමු. II. අභිස්සිතා – මජ්ඣප. ආනිස්සිතා – මජසං. සන්නිස්සිතා – PTS. 3. අනොජවන්තීති – සීමු II. 4. නිසාකථා – මජසං.
5. අපාහතස්මිං – සීමු II. අවාසදස්මිං – මජසං.

8 - 2

ඔවුහු වාද කැමැත්තාහු පිරිස්මැදට වැද වාදකරුවෝ දෙදෙන ඔවුනොවුන් බාලයයි සිතති, ඔහු අන්‍ය ශාස්තෘ ආදිය ඇසුරු කළාහු පැසසුම් කැමැති ව (ඇපි) පණ්ඩිතවාදඇතියම්හ'යි විවාද කථා කියත්.

**තෙ වාදකාමා පරිසං විගය්හ** - 'තෙ වාදකාමා' යනු: ඔහු වාද කැමැත්තාහු වාදාර්ථි වූවාහු වාද අදහස් ඇත්තාහු වාද පෙරටු කොට ඇත්තාහු වාද සෙවීමෙහි හැසිරෙන්නාහු; **පරිසං විගය්හ** - ක්ෂත්‍රිය පිරිසට බ්‍රාහ්මණ - ගෘහපති - ශ්‍රමණ පිරිසට පැමිණ බැස ඇතුළුව පිවිස නුයි 'තෙ වාදකාමා පරිසං විගය්හ' යනු වේ.

**බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං** - 'මිථු' යනු දෙදෙනා කලහකරුවෝ දෙදෙන ඩබරකරුවෝ - (විවාද) කථාකරුවෝ - විවාදකරුවෝ-අධිකරණ කරුවෝ - වාදකරුවෝ - කථාකරනුවෝ දෙදෙන, ඔහු ඔවුනොවුන් හීනවසයෙන් නිහීනවසයෙන් අවමන්වසයෙන් ලාමකවසයෙන් පළත් වසයෙන් අල්පවසයෙන් සලකති බලති දකිති අවලොකන කෙරෙති සිතති විමසත් නුයි 'බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං' යනු වේ.

**වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං** - ඔවුහු අන්‍ය ශාස්තෘවක්හු ධර්මාඛ්‍යානයක් ගණයක් ලබ්ධියක් ප්‍රතිපදාවක් මාර්ගයක් ඇසුරු කළාහු වෙසෙසින් ඇසුරු කළාහු ඇලුණාහු පැමිණියාහු පිවිසියාහු බැසගත්තාහු; '**කථොජ්ජ**' යි කලහය ඩබරය විග්‍රහය විවාදය මෙධගය කියනු ලැබෙයි. නොහොත් **කථොජ්ජං** - අනොජවත් වූ ඒ කථාව 'කථොජ්ජ' යයි කියති, කලහ - භණ්ඩන - විග්ගහ - විවාද - මෙධග යයි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'වදන්ති තෙ අඤ්ඤසිතා කථොජ්ජං' යනු වේ.

**පසංසකාමා කුසලාවදානා** - 'පසංසකාමා' යනු: පැසැසුම් කැමැත්තාහු ප්‍රශංසාර්ථි වූවාහු ප්‍රශංසාභිප්‍රාය ඇත්තාහු පැසැසුම් පෙරටු කොට සිටියාහු පැසැසුම් සෙවීමෙහි හැසිරෙන්නාහු; **කුසලාවදානා** - සවකීය ලබ්ධියෙහි කුසලවාද - පණ්ඩිතවාද - ස්ථිරවාද - න්‍යායවාද - හෙතුවාද- ලක්ෂණවාද - කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි 'පසංසකාමා කුසලාවදානා' යනු වේ.

එයින් වදාළහ බුදුනු:

**"තෙ වාදකාමා -පෙ- කුසලාවදානා"**යි

8 - 3

පිරිස් මැද වාදකථායෙහි උත්සුක වූයේ (තමහට) පැසැසුම් කැමැති වෙමින් (පලමු මැ) සැක ඇතියේ වෙයි. යළි (විමංසකයන් විසින් ඔහු ගේ වාදය) බැහැර කරනු ලැබූ කල්හි මකු වෙයි. සිදුරු සොයන්නාවූ හෙකෙම නින්දාවෙන් කොපයට පැමිණේ.

යුඤ්ජමානා කථායං පරිසාය මජ්ඣෙති – ඛත්තියපරිසාය වා බ්‍රාහ්මණ-පරිසාය වා ගහපතිපරිසාය වා සමණපරිසාය වා මජ්ඣෙ අත්තනො කථායං යුත්තා පයුත්තා ආයුත්තා සමායුත්තා සම්පයුත්තා කථෙන්තීති ‘යුඤ්ජමානා කථායං පරිසාය මජ්ඣෙ.’

පසංසමිච්ඡං විනිඝාති හොතීති – ‘පසංසමිච්ඡ’න්ති පසංසං ථොමනං කිත්තිං වණ්ණහාරියං ඉච්ඡන්තො පත්ථයන්තො පිහයන්තො අභිජප්පන්තො; විනිඝාති හොතීති – පුබ්බෙව සල්ලාපා කථංකථී විනිඝාති හොති: ‘ජයො නු ඛො මෙ භවිස්සති, පරාජයො නු ඛො මෙ භවිස්සති, කථං නිග්ගහං කරිස්සාමි, කථං පටිකම්මං කරිස්සාමි, කථං විසෙසං කරිස්සාමි, කථං පටිවිසෙසං කරිස්සාමි, කථං ආවෙඨියං කරිස්සාමි, කථං නිබ්බෙඨියං කරිස්සාමි, කථං ඡෙදං[1] කරිස්සාමි, කථං මණ්ඩලං කරිස්සාමී’ති. එවං පුබ්බෙව සල්ලාපා කථංකථී විනිඝාති හොතීති ‘පසංසමිච්ඡං විනිඝාති හොති.’

අපාසදස්මිං[2] පන මඞ්කු හොතීති – ‘යෙ තෙ පඤ්හවීමංසකා පරිසා පාරිසජ්ජා පාසාරිකා[3] තෙ අපසාදෙන්ති: ‘අත්ථාපගතං භණිත’න්ති අත්ථතො අපසාදෙන්ති. ‘බ්‍යඤ්ජනාපගතං භණිත’න්ති බ්‍යඤ්ජනතො අපසාදෙන්ති.[4] ‘අත්ථබ්‍යඤ්ජනාපගතං භණිත’න්ති අත්ථබ්‍යඤ්ජනතො අපසාදෙන්ති. ‘අත්ථො තෙ දුන්නීතො. බ්‍යඤ්ජනං තෙ දුරොපිතං. අත්ථබ්‍යඤ්ජනං තෙ දුන්නීතං දුරොපිතං. නිග්ගහො තෙ අකතො. පටිකම්මං තෙ දුක්කතං. විසෙසො තෙ අකතො. පටිවිසෙසො තෙ දුක්කතො. ආවෙඨියා තෙ අකතා. නිබ්බෙඨියා තෙ දුක්කතා. ඡෙදො තෙ අකතො. මණ්ඩලං තෙ දුක්කතං. විසමං කථිතං[5] දුක්කථිතං දුබ්භණිතං දුල්ලපිතං දුරුත්තං දුබ්භාසිත’න්ති අපසාදෙන්ති.[6] අපාසදස්මිං[2] පන මඞ්කු හොතීති අපාහතස්මිං මඞ්කු හොති පීළිතො ඝට්ටිතො බ්‍යාධිතො දොමනස්සිතො හොතීති ‘අපාසදස්මිං පන මඞ්කු හොති.’

නින්දාය සො කුප්පති රන්ධමෙසීති – ‘නින්දාය ගරහාය අකිත්තියා අවණ්ණහාරිකාය කුප්පති ව්‍යාපජ්ජති පතිට්ඨීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොතී’ති නින්දාය සො කුප්පති. රන්ධමෙසීති රන්ධමෙසී විරන්ධමෙසී අපරාධමෙසී ඛලිතමෙසී ගලිතමෙසී ඝට්ටිතමෙසී විවරමෙසීති ‘නින්දාය සො කුප්පති රන්ධමෙසී.’

තෙනාහ භගවා:

“යුඤ්ජමානා කථායං පරිසාය මජ්ඣෙ
පසංසමිච්ඡං විනිඝාති හොති,
අපාසදස්මිං[2] පන මඞ්කු හොති
නින්දාය සො කුප්පති රන්ධමෙසී”ති.

---

1 ඡෙදනං - ස. 2. අපාහතස්මිං - සීමු. II. PTS.
3. පාසණිකා - PTS. පාසාදනියා - ස. 4. අපහරන්ති - සීමු. II. PTS.
5. විසමකථං - සීමු. II. 6. අපහරන්ති - සීමු. II.

**යුත්තො කථායං පරිසාය මජ්ඣෙ** - ක්ෂත්‍රියපර්ෂද් හෝ බ්‍රාහ්මණපර්ෂද් හෝ ගෘහපතිපර්ෂද් හෝ ශ්‍රමණපර්ෂද් හෝ මැද තමාගේ වාදකථායෙහි කියන්නට උත්සුක වූයේ ප්‍රයුක්ත වූයේ ආයුක්ත වූයේ සංයුක්ත වූයේ සම්ප්‍රයුක්ත වූයේ නුසි 'යුත්තො කථායං පරිසාය මජ්ඣෙ' යනු වේ.

**පසංසමිච්ඡං විනිඝාති හොති** - 'පසංසමිච්ඡං' යනු: පැසැසුම් තෙමුම් කිත්තිය යසස්වැඩිම කැමැති වෙමින් ඉවසමින් පතමින් බලාපොරොත්තු වෙමින් ගුණ කියමින්; **විනිඝාති හොති** - වාදකථාවෙන් පළමු මැ සැක ඇතියේ ගැටෙනුයේ වෙයි: 'මට ජය වෙයි දෝ හෝ, මට පරාජය වෙයි දෝ හෝ, කිසෙසින් නිග්‍රහ කෙරෙම් ද කෙසේ පිළියම් කෙරෙම් ද කිසෙයින් විශෙෂ (=අතිරෙක) කෙරෙම් ද කිසෙසින් පුන පුනා විශෙෂ කෙරෙම් ද කිසෙසින් වෙළුම් කෙරෙම් ද කිසෙසින් (මාගේ) වෙළුම් හරිම් ද කෙසේ (වාදය) සිඳිම් ද කෙසේ මඬුලු කෙරෙම් දැ'යි මෙසේ වාදකථාවෙන් පෙර මැ සැක ඇතියේ ගැටෙනුයේ වේ නුයි 'පසංසමිච්ඡං විනිඝාති හොති' යනු වේ.

**අපාහතස්මිං පන මඞ්කු හොති** - පිරිස්වැසි වූ පිරිවර වූ කාරුණික වූ යම් ප්‍රශ්නවිමංසකයෝ වෙත් ද ඔවුහු බැහැර කෙරෙති: 'අර්ථයෙන් බැහැර ව කියන ලද්දැ'සි අර්ථයෙන් බැහැර කෙරෙති. 'ව්‍යඤ්ජන රහිත ව කියන ලද්දැ'යි ව්‍යඤ්ජනයෙන් බැහැර කෙරෙති. 'අර්ථව්‍යඤ්ජන රහිතව කියන ලද්දැ'සි අර්ථව්‍යඤ්ජනයෙන් බැහැර කෙරෙති. 'තා විසින් අර්ථය වරදවා එළවන ලද. තා විසින් ව්‍යඤ්ජනය වරදවා තබන ලද. තා විසින් අර්ථව්‍යඤ්ජනය වරදවා එළවන ලද. තබන ලද. තා විසින් නිග්‍රහය නො කරන ලද. තා විසින් පිළියම් (ලබ්ධිය පිහිටුවීම) වරදවා කරන ලද. විශෙෂය තා විසින් නො කරන ලද. ප්‍රතිවිශෙෂය තා විසින් වරදවා කරන ලද. වෙළුම තා විසින් නො කරන ලද. වෙළුම් හැරිම තා විසින් වරදවා කරන ලද. වාද සිඳුම තා විසින් නො කරන ලද. මණ්ඩලය තා විසින් වරදවා කරන ලද. විෂම ව කියන ලද, වරදවා කියන ලද, වරදවා බණින ලද, වරදවා විසඳන ලද, වරදවා උපුරුවන ලද, විරූපව කියන ලද්දැ'සි බැහැර කෙරෙත්. **අපාහතස්මිං පන මඞ්කු හොති** - බැහැර කළ කල්හි මකු වෙයි. පෙළුණේ ගැටුණේ ව්‍යාධිත වූයේ දොම්නස් වූයේ වේ නුයි 'අපාහතස්මිං පන මඞ්කු හොති' යනු වේ.

**නින්දාය සො කුප්පති රන්ධමෙසී** - නින්දායෙන් ගර්හායෙන් අපකීර්තියෙන් අගුණ වැකිමෙන් කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, (කොපයෙන්) තද බවට පැමිණෙයි. කොපයත් ද්වෙෂයත් නො සතුටත් පහළ කෙරේ නුයි 'නින්දාය සො කුප්පති' යනු වේ. **රන්ධමෙසී** - රන්ධ්‍රය (=අතර) සොයනුයේ සිදුරු සොයනුයේ දෝෂය සොයනුයේ පැකුළුම සොයනුයේ ගිලිහුම් සොයනුයේ ගැටුම සොයනුයේ විවරය සොයනුයේ නුයි 'නින්දාය සො කුප්පති රන්ධමෙසී' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**"යුත්තො කථායං** - පෙ - **කුප්පති රන්ධමෙසී"**'සි.

8 - 4

යමස්ස වාදං පරිහීනමාහු
අපාසදං[1] පඤ්හවීමංසකා සෙ,
පරිදෙවති සොචති හීනවාදො
උපච්චගා මන්ති අනුත්ථුනාති.

**යමස්ස වාදං පරිහීනමාහූති** - යං අස්ස[2]වාදං හීනං නිහීනං පරිහීනං පරිහාපිතං න පරිපූරිතං එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති 'යමස්ස වාදං පරිහීනමාහු.'

**අපාසදං පඤ්හවීමංසකා සෙති** - යෙ තෙ පඤ්හවීමංසකා පරිසා පාරිසජ්ජා පාසාරිකා[3] තෙ අපසාදෙන්ති: 'අත්ථාපගතං භණිත'න්ති අත්ථතො අපසාදෙන්ති. 'බ්‍යඤ්ජනාපගතං භණිත'න්ති' 'බ්‍යඤ්ජනතො අපසාදෙන්ති. 'අත්ථබ්‍යඤ්ජනාපගතං භණිත'න්ති අත්ථබ්‍යඤ්ජනතො අපසාදෙන්ති. 'අත්ථො තෙ දුන්නීතො. බ්‍යඤ්ජනං තෙ දුරොපිතං. අත්ථබ්‍යඤ්ජනං දුන්නීතං දුරොපිතං. නිග්ගහො තෙ අකතො. පටිකම්මං තෙ දුක්කතං. විසෙසො තෙ අකතො. පටිවිසෙසො තෙ දුක්කතො. ආවෙඨියා තෙ අකතා. නිබ්බෙඨියා තෙ දුක්කතා, ඡෙදො තෙ අකතො, මණ්ඩලං තෙ දුක්කතං, විසමං කථිතං[4] දුක්කථිතං දුබ්භණිතං දුල්ලපිතං දුරුත්තං දුබ්භාසිතන්ති අපහරන්තීති - 'අපාසදං පඤ්හවීමංසකා සෙ.'

**පරිදෙවති සොචති හීනවාදොති** - 'පරිදෙවතී'ති 'අඤ්ඤං මයා ආවජ්ජිතං, අඤ්ඤං චින්තිතං, අඤ්ඤං උපධාරිතං, අඤ්ඤං උපසික්ඛිතං, අඤ්ඤං උපලක්ඛිතං. සො මහාපක්ඛො මහාපරිසො මහාපරිවාරො. පරිසා'යං වග්ගා න සමග්ගා. සමග්ගාය පරිසාය හෙතු කථාසල්ලාපො. පුන භඤ්ජිස්සාමී'ති[5] යා එවරූපා වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා[6] ලාලප්පිතත්තන්ති[7] පරිදෙවති. **සොචතීති** 'තස්ස ජයො'ති සොචති, 'මය්හං පරාජයො'ති සොචති. 'තස්ස ලාභො'ති සොචති. 'මය්හං අලාභො'ති සොචති. 'තස්ස යසො'ති සොචති. 'මය්හං අයසො'ති සොචති. 'තස්ස පසංසා'ති සොචති. 'මය්හං නින්දා'ති සොචති; 'තස්ස සුඛ'න්ති සොචති; 'මය්හං දුක්ඛ'න්ති සොචති. 'සො සක්කතො ගරුකතො මානිතො පූජිතො අපචිතො ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අහමස්මි අසක්කතො අගරුකතො අමානිතො අපූජිතො අනපචිතො න ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන'න්ති සොචති කිලමති පරිදෙවති උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජතීති පරිදෙවති සොචති.' **හීනවාදොති** - හීනවාදො පරිහීනවාදො පරිහාපිතවාදො න පරිපූරවාදොති 'පරිදෙවති සොචති හීනවාදො.'

---

1. අපාහතං - සීමු II. මජසං, PTS. 2. තස්ස - මජුප. 3. පසාදනීයා - ස.
4. විසමකථං - සීමු. II. 5. භඤ්ඤිස්සාමීති - සීමු. II සජ්ඣිස්සාමීති - මජුප. භිඤ්දිස්සාමීති - සී. 6. ලාලප්පායනා - සීමු. II මජසං. PTS
7. ලාලප්පායිතත්තන්ති - සීමු II. මජ

**8 - 4**

යම් හෙයකින් ඔහුගේ වාදය ප්‍රශ්නවිමංසකයෝ හීන වූයේ බැහැර කරන ලදැයි කියත් ද, (එහෙයින්) පිරිහුණු වාද ඇති හෙතෙම 'වාදයෙන් මා ඉක්මැ ගියේ යැ'යි වැලැපෙයි ශෝක කෙරෙයි තතානන්නේ යි.

**යමස්ස වාදං පරිහීනමාහු** – යම් හෙයකින් ඔහුගේ වාදය හීන යැ නිහීන යැ පරිහීන යැ පිරිහෙළන ලද නො පුරන ලදැයි මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති, මෙසේ දක්වති මෙසේ ව්‍යවහරත් නුයි 'යම්සස වාදං පරිහීනමාහු' යනු වේ.

**අපාසදං පඤ්හවීමංසකා සෙ** – පිරිස් වැසි වූ පිරිවර වූ කාරුණික වූ යම් ප්‍රශ්නවිමංසකයෝ වෙත් ද, ඔවුහු බැහැර කෙරෙති: 'අර්ථ රහිත ව කියන ලදැ'යි අර්ථයෙන් බැහැර කෙරෙති. 'ව්‍යඤ්ජන රහිත ව කියන ලදැ'යි ව්‍යඤ්ජනයෙන් බැහැර කෙරෙති. 'අර්ථව්‍යඤ්ජන රහිත ව කියන ලදැ'යි අර්ථව්‍යඤ්ජනයෙන් බැහැර කෙරෙති, 'අර්ථය තා විසින් වරදවා එලවන ලද, ව්‍යඤ්ජනය තා විසින් වරදවා තබන ලද, අර්ථව්‍යඤ්ජනය තා විසින් වරදවා කියන ලද තබන ලද, නිග්‍රහය තා විසින් නො කරන ලද, ප්‍රතිකර්මය තා විසින් වරදවා කරන ලද, විශෙෂය තා විසින් නො කරන ලද, ප්‍රතිවිශෙෂය තා විසින් වරදවා කරන ලද, වෙළුම තා විසින් නො කරන ලද, වෙළුම් හැරීම තා විසින් වරදවා කරන ලද, වාදච්ඡේදය තා විසින් නො කරන ලද, වාදමණ්ඩලය තා විසින් වරදවා කරන ලද, විෂම ව කියන ලද, වරදවා කියන ලද, වරදවා බණන ලද, වරදවා විසඳන ලද, වරදවා උසුරුවන ලද, විරූප කොට කියන ලදැ'යි බැහැර කෙරෙත් නුයි 'අපාසදං පඤ්හවීමංසකා සෙ' යනු වේ.

**පරිදෙවති සොචති හීනවාදො** – 'පරිදෙවති' යනු: 'අත් කරුණක් මා විසින් (සිතට) නතු කරන ලද, අනෙකක් සිතන ලද, අනෙකක් විමසන ලද, අනෙකක් හික්මෙන ලද, අනෙකක් සලකන ලද. හේ මහාපක්ෂ ඇතියේ යැ, මහපිරිස් ඇතියේ යැ, මහපිරිවර ඇතියේ යැ. මෝ පිරිස එගී වූ යැ. සමගි නො වේ. සමගි පිරිස හෙතු කොට කථාසංලාපය වෙයි. නැවත බිඳින්නෙමි' මෙබඳු වූ යම් වචනය ප්‍රලාපය විප්‍රලාපය පුන පුනා ලපනය ලපනාකාරය ලපනය කළ බව නුයි 'පරිදෙවති' යනු වේ. **සොචති** – 'ඔහුට ජය යැ'යි ශොක කෙරෙයි, 'මට පරජය යැ'යි ශොක කෙරෙයි, 'ඔහුට ලාභ යැ'යි සොවී, 'මට අලාභ යැ'යි සොවී, 'ඔහුට කීර්තිය යැ'යි සොවී, 'මට අපකීර්තිය යැ'යි සොවී, 'ඔහුට ප්‍රශංසාව යැ'යි සොවී, 'මට නින්දාව යැ'යි සොවී, 'ඔහුට සැප යැ'යි සොවී, 'මට දුකැ'යි සොවී. 'හෙතෙම සත්කාර කරන ලද ගරු කරන ලද බුහුමන් කරන ලද පුදන ලද සලකන ලද චීවරපිණ්ඩපාතසෙනාසන ගිලන්පසබෙහෙත් පිරිකර ලබන සුලු යැ, මම් අසත්කෘතයෙමි අගරුකෘතයෙමි අමානිතයෙමි අපූජිතයෙමි අනපචිතයෙමි චීවරපිණ්ඩපාතසෙනාසන ගිලන්පසබෙහෙත් පිරිකර නො ලැබෙමි' ශොක කෙරෙයි, වෙහෙසෙයි වැලැපෙයි ළෙහි පැහැර හඬයි මුළාවට පැමිණේ නුයි 'පරිදෙවති සොචති' යනු වේ. **හීනවාදො** – හීනවාද ඇතියේ නිහීනවාද ඇතියේ පරිහීණවාද ඇතියේ පිරිහෙළු වාද ඇතියේ නො පිරුණු වාද ඇතියේ නුයි 'පරිදෙවති සොචති හීනවාදො' යනු වේ.

**උපච්චගා මන්ති අනුත්ථුනාතීති** - 'සො මං වාදෙන වාදං අච්චගා උපච්චගා අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො'ති එවම්පි උපච්චගා මන්ති; අථවා 'මං වාදෙන වාදං අභිභවිත්වා අජ්ඣොත්ථරිත්වා පරියාදියිත්වා මද්දයිත්වා චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙතී'ති එවම්පි උපච්චගා මන්ති; **අනුත්ථුනාති** වුච්චති වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පායනා ලාලප්පිතත්තන්ති 'උපච්චගා මන්ති අනුත්ථුනාති.'

තෙනාහ භගවා:

"යමස්ස වාදං පරිහීනමාහු
අපාහතං පඤ්හවීමංසකා යෙ,
පරිදෙවති සොචති හීනවාදො
උපච්චගා මන්ති අනුත්ථුනාතී"ති.

**8 - 5**

එතෙ විවාදා සමණෙසු ජාතා
එතෙසු උග්ඝාති නිඝාති හොති,
එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං
න හඤ්ඤදත්ථ'ත්ථි පසංසලාභා.

**එතෙ විවාදා සමණෙසු ජාතාති** – 'සමණා'ති යෙ කෙචි ඉතො බහිද්ධා පරිබ්බාජූපගතා[1] පරිබ්බාජසමාපන්නා.[2] එතෙ දිට්ඨිකලහා දිට්ඨිභණ්ඩනා දිට්ඨිවිග්ගහා දිට්ඨිවිවාදා දිට්ඨිමෙධගා සමණෙසු ජාතා සඤ්ජාතා නිබ්බත්තා අභිනිබ්බත්තා පාතුභූතාති 'එතෙ විවාදා සමණෙසු ජාතා.'

**එතෙසු උග්ඝාති නිඝාති හොතීති** - ජයපරාජයො හොති, ලාභාලාභො හොති, යසායසො හොති, නින්දාපසංසා හොති, සුඛදුක්ඛං හොති, සොමනස්සදොමනස්සං හොති, ඉට්ඨානිට්ඨං හොති, අනුනයපටිඝං හොති, උග්ඝාතිනිග්ඝාතිතං[3] හොති, අනුරොධවිරොධො හොති, ජයෙන චිත්තං උග්ඝාතිතං හොති, පරාජයෙන චිත්තං නිඝාතිතං හොති, ලාභෙන චිත්තං උග්ඝාතිතං හොති, අලාභෙන චිත්තං නිඝාතිතං හොති, යසෙන චිත්තං උග්ඝාතිතං හොති, අයසෙන චිත්තං නිඝාතිතං හොති, පසංසාය චිත්තං උග්ඝාතිතං හොති, නින්දාය චිත්තං නිඝාතිතං හොති, සුඛෙන චිත්තං උග්ඝාතිතං හොති, දුක්ඛෙන චිත්තං නිඝාතිතං හොති, සොමනස්සෙන චිත්තං උග්ඝාතිතං හොති, දොමනස්සෙන චිත්තං නිඝාතිතං හොති, උන්නතියා[4] චිත්තං උග්ඝාතිතං හොති, ඔනතියා චිත්තං නිඝාතිතං හොතීති 'එතෙසු උග්ඝාති නිඝාති හොති.'

**එතම්පි දිස්වා විරමෙ කථොජ්ජන්ති** – 'එතම්පී'ති එතං ආදීනවං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා දිට්ඨිකලහෙසු දිට්ඨිභණ්ඩනෙසු දිට්ඨිවිග්ගහෙසු දිට්ඨිවිවාදෙසු දිට්ඨිමෙධගෙසූති එතම්පි දිස්වා; **විරමෙ කථොජ්ජන්ති** – 'කථොජ්ජං' වුච්චති කලහො භණ්ඩනං විග්ගහො විවාදො මෙධගං. අථවා, **කථොජ්ජන්ති** අනොජවන්තී සා කථා. කථොජ්ජං න කරෙය්‍ය, කලහං න කරෙය්‍ය, භණ්ඩනං න කරෙය්‍ය, විග්ගහං න කරෙය්‍ය, විවාදං න කරෙය්‍ය, මෙධගං න කරෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගං පජහෙය්‍ය, විනොදෙය්‍ය ව්‍යන්තිං කරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පයුත්තො[5] විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති 'එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං.'

1. පරිබ්බජූපගතා - මජසං. 2. පරිබ්බාජසමාපන්නා - මජසං. පරිබ්බාජකසමාපන්නා - PTS.
3. උග්ඝාතිනිග්ඝාති - PTS. 4. උණ්ණතියා - සතා. 5. විප්පමුත්තො - සී.

**උපච්චගා මනති අනුත්ථුනාති** - 'හෙතෙම මා වාදයෙන් වාදය ඉක්මැ ගියේ යැ අතිශයින් ඉක්මැ ගියේ යැ ඉක්මැවූයේ යැ අතිශයින් ඉක්මැවූයේ යැ පසු කෙළේ යැ'යි මෙසේත් 'උපච්චගා මං'යි; නොහොත් 'මා වාදයෙන් වාදය යට කොට වතුරුවා අල්වාගෙන මැඬගෙන හැසිරෙයි වෙසෙයි ඉරියව් පවත්වයි වැජෙයි පාලන යපන යාපනය කෙරේ නුයි මෙසේත් 'උපච්චගා මං' යි. **අනුත්ථුනාති** – බෙණෙයි, (මෙබඳු වූ) වචනය ප්‍රලාපය විප්‍රලාපය ලපනය ලපනාකාරය ලපනය කාලු බව නුයි 'උපච්චගා මනති අනුත්ථුනාති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“සමස්ස වාදං -පෙ- උපච්චගා මනති අනුත්ථුනාති”** යි.

8 - 5

**තෙල දෘෂ්ටිවිවාදයෝ බාහ්‍ය පරිව්‍රාජකයන් කෙරෙහි උපන්නාහුය. තෙල වාදවිෂයෙහි (ජය-පරාජයාදි වශයෙන්) අනුග්‍රහ නිග්‍රහ ද වෙයි. මේ ආදීනවය ද දැක කලහය දුරු කරන්නේය. ප්‍රශංසා ලාභයෙන් අන්‍ය වූ අර්ථයක් මෙහි නැති හෙයිනි.**

**එතෙ විවාදා සමණෙසු ජාතා** – 'සමණ' යනු මේ ශාසනයෙන් බැහැර පිරිවැජි බවට එළැඹි, පිරිවැජි බවට පැමිණි යම් කිසි කෙනෙකි. තෙල දෘෂ්ටිකලහයෝ දෘෂ්ටිභණ්ඩනයෝ දෘෂ්ටිවිග්‍රහයෝ දෘෂ්ටිවිවාදයෝ දෘෂ්ටිමෙධගයෝ පරිව්‍රාජකශ්‍රමණයන් කෙරෙහි උපන්නාහු මෙනාවට උපන්නාහු නිපන්නාහු වෙසෙසින් නිපන්නාහු පහළ වූවාහු නුයි 'එතෙ විවාදා සමණෙසු ජාතා' යනු වේ.

**එතෙසු උග්ඝාති නිඝාති හොති** – ජය පරාජය වෙයි, ලාභඅලාභ-යශස් අයශස් – නින්දා ප්‍රශංසා – සුඛ දුඃඛ – සොම්නස් දොම්නස් – ඉෂ්ට අනිෂ්ට – සෙනහ කොප – අනුග්‍රහ නිග්‍රහ – අනුනය කොප වෙයි. ජය හෙතු කොට සිත අනුගෘහීත වෙයි, පරාජය හෙතු කොට සිත නිගෘහීත වෙයි. ලාභයෙන් සිත අනුගෘහීත වෙයි, අලාභයෙන් නිගෘහීත වෙයි. යශසින් සිත අනුගෘහීත වෙයි, අයශසින් නිගෘහීත වෙයි. ප්‍රශංසාවෙන් සිත අනුගෘහීත වෙයි, නින්දාවෙන් නිගෘහීත වෙයි. සැපයෙන් සිත අනුගෘහීත වෙයි, දුකින් නිගෘහීත වෙයි. සොම්නසින් සිත අනුගෘහීත වෙයි. දොම්නසින් නිගෘහීත වෙයි. උන්නතියෙන් සිත අනුගෘහීත වෙයි, අවනති-යෙන් සිත නිගෘහීත වේ නුයි 'එතෙසු උග්ඝාති නිඝාති හොති' යනු වේ.

**එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං** – 'එතම්පි' යනු: දෘෂ්ටිකලහයෙහි දෘෂ්ටිභණ්ඩනයෙහි දෘෂ්ටිවිග්‍රහයෙහි දෘෂ්ටිවිවාදයෙහි දෘෂ්ටිමෙධගයෙහි තෙල ආදීනවය දැක බලා තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට නුයි– 'එතම්පි දිස්වා' යනු වේ. **විරමෙ කථොජ්ජං**– 'කථොජ්ජ' යි කලහය ඬබරය විග්‍රහය විවාදය මෙධගය කියනු ලැබෙයි. නොහොත් **කථොජ්ජං** යනු: තෙද රහිත වූ මේ කථාව යැ. ඒ නිස්තේජ වූ කථාව නො කරන්නේ යැ කලහය නො කරන්නේ යැ ඬබරය නො කරන්නේ යැ විග්‍රහය නො කරන්නේ යැ විවාදය නො කරන්නේ යැ මෙධගය නො කරන්නේ යැ කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධගය දුරු කරන්නේ යැ බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනුඅභාවයට පමුණුවන්නේ යැ. කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධගයෙන් දුරු වන්නේ යැ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැ ගියේ විප්‍රයුක්ත වූයේ විසංයුක්ත වූයේ විගතමර්‍යාදා කළ සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං' යනු වේ.

**නහඤ්ඤදත්ථ'ත්ථි පසංසලාභාති** – පසංසලාභා අඤ්ඤො අත්ථො නත්ථි අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගුළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්තී'ති 'න හඤ්ඤදත්ථ'ත්ථි පසංසලාභා.'

තෙනාහ භගවා:

"එතෙ විවාදා සමණෙසු ජාතා
එතෙසු උග්ඝාතිනිඝාති හොති,
එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං
නහඤ්ඤදත්ථ'ත්ථි පසංසලාභා"ති.

8 - 6

පසංසිතො වා පන තත්ථ හොති
අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ,
සො තං හසති[1] උන්නමතිච්ච[2] තෙන
පප්පුය්‍ය[3] තමත්ථං යථාමනො අහු.

**පසංසිතො වා පන තත්ථ හොතීති** – 'තත්ථා'ති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා පසංසිතො ථොමිතො කිත්තිතො වණ්ණිතො හොතීති 'පසංසිතො වා පන තත්ථ හොති.'

**අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙති** – ඛත්තියපරිසාය වා බ්‍රාහ්මණපරිසාය වා ගහපතිපරිසාය වා සමණපරිසාය වා මජ්ඣෙ අත්තනො වාදං අක්ඛාය ආචික්ඛිත්වා අනුවාදං අක්ඛාය ආචික්ඛිත්වා ථමහයිත්වා බ්‍රෑහයිත්වා දීපයිත්වා ජොතයිත්වා වොහරිත්වා පරිග්ගණ්හිත්වාති 'අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ.'

**සො තං හසති උන්නමතිච්ච තෙනාති** – සො තෙන ජයත්ථෙන තුට්ඨො හොති හට්ඨො පහට්ඨො අත්තමනො පරිපුණ්ණසංකප්පො; අථවා දන්තවිදංසකං හසමානො සො හසති. **උන්නමතිච්ච තෙනාති** – සො තෙන ජයත්ථෙන උන්නතො හොති. උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්සාති 'සො තං හසති උන්නමතිච්ච තෙන.'

**පප්පුය්‍ය තමත්ථං යථාමනො අහූති** – 'තං ජයත්ථං 'පප්පුය්‍ය පාපුණිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වා; **යථාමනො අහූති** යථාමනො අහු යථාචිත්තො අහු යථාසංකප්පො අහු යථාවිඤ්ඤාණො අහූති – පප්පුය්‍ය තමත්ථං යථාමනො අහු.'

තෙනාහ භගවා:

"පසංසිතො වා පන තත්ථ හොති
අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ,
සො තං හසති උන්නමතිච්ච තෙන
පප්පුය්‍ය[3] තමත්ථං යථාමනො අහූ"ති

1. ජහා හසති - මජසං, PTS. 2. උන්නමී ච - මජසං.
3. සම්පප්පුය්‍ය - සතථි.

**න හස්සාදදන්'ත්ථි පසංසලාභා** - ප්‍රශංසාලාභයෙන් අන්‍ය වූ අර්ථයෙක් නැති: ආත්මාර්ථයෙක් හෝ පරාර්ථයෙක් හෝ උභයාර්ථයෙක් හෝ දෘෂ්ටධාර්මිකාර්ථයෙක් හෝ සාම්පරායිකාර්ථයෙක් හෝ නො ගැඹුරු අර්ථයෙක් හෝ ගැඹුරු අර්ථයෙක් හෝ සැඟවුණු අර්ථයෙක් හෝ අප්‍රකට අර්ථයෙක් හෝ නෙය්‍යාර්ථයෙක් හෝ නීතාර්ථයෙක් හෝ අනවද්‍යාර්ථයෙක් හෝ නිෂ්කලංකාර්ථයෙක් හෝ පරිශුද්ධාර්ථයෙක් හෝ පරමාර්ථයෙක් හෝ නැති, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙත් නුයි 'න හස්සාදදන්'ත්ථි පසංසලාභා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"එතෙ විවාද -පෙ- න හස්සාදදන්'ත්ථි පසංසලාභා" යි.**

## 8 - 6

තවද (යමෙක්) ඒ ස්වකීය ලබ්ධියෙහි පසස්නා ලද්දේ හෝ වේ ද, හෙතෙම පිරිස් මැද ඒ දෘෂ්ටිවාදය ප්‍රකාශ කොට ඒ ජයාර්ථයට පැමිණි සිත් සේ වූ හෙයින් ඒ ජයහෙතුයෙන් (දත් විදහා) සිනා සෙයි. යලි උඩඟු වේ.

**පසංසිතො වා පන තත්ථ හොති** - 'තත්ථ' යනු: ස්වකීය දෘෂ්ටියෙහි කැමැත්තෙහි රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි පසස්නා ලද්දේ ස්තුති කරන ලද්දේ කීර්තනය කරන ලද්දේ වර්ණනා කරන ලද්දේ වේ නුයි 'පසංසිතො වා පන තත්ථ හොති' යනු වේ.

**අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ** - ක්ෂත්‍රියපිරිස් හෝ බමුණුපිරිස් හෝ ගෘහපතිපිරිස් හෝ මහණපිරිස් හෝ මැද තමාගේ වාදය කියා ප්‍රකාශ කොට අනුවාදය කියා ප්‍රකාශ කොට පුරා වඩා දක්වා බබුළුවා ව්‍යවහාර කොට පරිග්‍රහණය කොට නුයි 'අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ' යනු වේ.

**සො තං හසති උන්නමතිච්ච තෙන** - හෙතෙම ඒ ජයාර්ථයෙන් තුටු වූයේ හටු වූයේ පහටු වූයේ සතුටුසිත් ඇතියේ පිරිපුන් අදහස් ඇතියේ නොයොන් දත් විදහා සෙමින් හේ සිනා සෙයි. **උන්නමතිච්ච තෙන** - හෙතෙම ඒ ජයාර්ථයෙන් උඩඟු වෙයි, නැඟුණේ ධ්වජයක් මෙන් වූයේ ඔසවාගත් සිතැතියේ චිත්තයාගේ කෙතුකම්‍යතාව නුයි 'සො තං හසති උන්නමතිච්ච තෙන' යනු වේ.

**පප්පුය්‍ය තමත්ථං යථාමනො අහු** - ඒ ජයාර්ථයට පැමිණ සපැමිණ අධිගමය කොට ලැබ ප්‍රතිලාභ කොට; **යථාමනො අහු** - සිත් සේ විය, යථාචින්තන විය, යථාසංකල්ප විය යථාවිඥාන වූයේ නුයි 'පප්පුය්‍ය තමත්ථං යථාමනො අහු' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"පසංසිතො වා පන -පෙ- පප්පුය්‍ය තමත්ථං යථාමනො අහු" යි.**

8 - 7

යා උන්නතී සාස්ස විඝාතභූමි
මානාතිමානං වදතෙ[1] පනෙසො,
එතම්පි දිස්වා න විවාදයෙථ
න හි තෙන සුද්ධිං කුසලා වදන්ති.

**යා උන්නතී සාස්ස විඝාතභූමීති** – 'යා'ති යා උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්සාති යා උන්නති; **සාස්ස විඝාතභූමීති** සා තස්ස විඝාතභූමි උපඝාතභූමි පීළනභූමි ඝට්ටනභූමි උපද්දවභූමි උපස්සග්ගභූමීති – 'උන්නති සාස්ස විඝාතභූමි.'

**මානාතිමානං වදතෙ[2] පනෙසොති** – සො පුග්ගලො මානං ච වදති, අතිමානං ච වදතීති – 'මානාතිමානං වදතෙ පනෙසො.'

**එතම්පි දිස්වා න විවාදියෙථාති** – එතං ආදීනවං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා දිට්ඨිකලහෙසු දිට්ඨිභණ්ඩනෙසු දිට්ඨිවිග්ගහෙසු දිට්ඨිවිවාදෙසු දිට්ඨිමෙධගෙසූති – එතම්පි දිස්වා; **න විවාදියෙථාති** – න කලහං කරෙය්‍ය, න භණ්ඩනං කරෙය්‍ය, න විග්ගහං කරෙය්‍ය, න විවාදං කරෙය්‍ය, න මෙධගං කරෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තිං කරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පයුත්තො[3] විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති 'එතම්පි දිස්වා න විවාදියෙථ.'

**න හි තෙන සුද්ධිං කුසලා වදන්තීති** – 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ගකුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා දිට්ඨිකලහෙන දිට්ඨිභණ්ඩනෙන දිට්ඨිවිග්ගහෙන දිට්ඨිවිවාදෙන දිට්ඨිමෙධගෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං න වදන්ති, න කථෙන්ති, න භණන්ති න දීපයන්ති, න වොහරන්තීති 'න හි තෙන සුද්ධිං කුසලා වදන්ති.'

තෙනාහ භගවා:

"යා උන්නති සාස්ස විඝාතභූමි
මානාතිමානං වදතෙ පනෙසො,
එතම්පි දිස්වා න විවාදයෙථ
න හි තෙන සුද්ධිං කුසලා වදන්තී"ති.

8 - 8

සූරො යථා රාජඛාදාය පුට්ඨො
අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං,
යෙනෙව සො තෙන පලෙහි සූර[4]
පුබ්බෙව නත්ථි යදිදං යුධාය.

---

1. වරෙත - සීමු. II. මජුප.
2. වරෙත - මජුප.
3. විප්පමුත්තො - සීමු II. PTS.
4. සූරං - මජුප.

## 8 - 7

යම් උත්තානිය (-උඩඟුබව) ක් වේද එය ඔහුට උපද්‍රව භූමි වෙයි. යශ්‍රි තෙමෙනම මානයද අතිමානයද පවසයි. තෙල ආදීනවයද දැක විවාද නො කරන්නේ යැ. සකඛාදියෙහි නිපුණයෝ ඒ දෘෂ්ටිවාදයෙන් ශුද්ධිය නො මැ කියත්.

**යා උණ්ණති සාස්ස විඝාතභූමි** – 'යා' යනු: යම් බඳු උන්නාමය ධවජය තහා ගැනීම චිත්තයාංගේ කෙතුකම්‍යතාව නුයි -යා උන්නති, 'යනු වේ. **සාස්ස විඝාතභූමි** – ඒ (උඩඟුව) ඔහුට විඝාතභූමි යැ උපඝාතභූමි යැ පෙළෙන බිම යැ ගැටෙන බිම යැ උපද්‍රවභූමි යැ උපසග්ගභූමි නුයි 'යා උන්නති සාස්ස විඝාතභූමි' යනු වේ.

**මානාතිමානං වදතෙ පනෙසො** – ඒ පුද්ගල තෙම මානය ද පවසයි අතිමානය ද පවසා නුයි 'මානාතිමානං වදතෙ පනෙසො' යනු වේ.

**එතම්පි දිස්වා න විවාදියෙථ** – දෘෂ්ටිකලහයන්හි දෘෂ්ටිභණ්ඩන-දෘෂ්ටි විග්‍රහ – දෘෂ්ටිවිවාද – දෘෂ්ටිමෙධගයන්හි තෙල ආදීනවය දැක බලා තුලනය කොට තීරණය කොට විභාග විභූත කොට නුයි 'එතම්පි දිස්වා' යනු වේ.

**න විවාදියෙථ** – කලහ නො කරන්නේ යැ, ඩබරය – විග්‍රහය – විවාදය මෙධගය නො කරන්නේ යැ, කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධගය හරණේ යැ දුරු කරන්නේ යැ සන්හිඳුවන්නේ යැ- අනුඅභාවයට පමුණුවන්නේ යැ. කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධගයෙන් දුරුවන්නේ යැ වෙන් වූයේ භාත්පසින් වෙන් වූයේ නික්මුණේ නික්මැ ගියේ නො යෙදුණේ නො බැඳුණේ නො හිමි කළ සිතින් වෙසේ නුයි 'එතම්පි දිස්වා න විවාදියෙථ' යනු වේ.

**න හි තෙන සුද්ධිං කුසලා වදන්ති** – 'කුසලා' යනු: යම් සකඛයන්හි නිපුණයෝ වෙත් ද, ධාතු – ආයතන – ප්‍රතීත්‍යසමුත්පාද සතිපට්ඨාන – සම්‍යක්ප්‍රධාන – ඍද්ධිපාද – ඉන්ද්‍රිය – බල – බොධ්‍යඞ්ග – මාර්ග –ඵල–නිර්වාණයෙහි නිපුණයෝ වෙත් ද ඒ නිපුණයෝ දෘෂ්ටිකලහයෙන් දෘෂ්ටි-භණ්ඩනයෙන් දෘෂ්ටිවිග්‍රහයෙන් දෘෂ්ටිවිවාදයෙන් දෘෂ්ටිමෙධගයෙන් ශුද්ධිය විශුද්ධිය – පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නො පවසති නො කියති නො බෙණෙති නො දක්වති ව්‍යවහාර නො කෙරෙත්නුයි 'න හි තෙන සුද්ධිං කුසලා වදන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යා උණ්ණති -පෙ- න හි තෙන සුද්ධිං කුසලා වදන්ති"** යි.

## 8 - 8

යම්සේ රාජභොජනයෙන් වැඩුණු ශූරයෙක් ප්‍රතිමල්ලයා පතනුයේ ගර්ජනා කෙරෙමින් ඒ ද, ශූරය, ඒ (තාගේ) ප්‍රතිශූර තෙමේ යම් තැනෙක්හි ද (තෝ) එහි මැ පලායව. කලය සඳහා යම් කෙලෙස් කෙනෙක් වෙත් නම් ඔහු පළමු මැ (බෝමුල්හි දී නැසූ හෙයින් මට) නැත.

**සූරො යථා රාජඛාදාය පුට්ඨොති** - 'සූරො'ති සූරො වීරො වික්කන්තො අභීරු අච්ඡම්භී අනුත්‍රාසී අපලායී; **රාජඛාදාය පුට්ඨොති** රාජඛාදනීයෙන රාජභොජනීයෙන පුට්ඨො පොසිතො ආපාදිතො[1] වඩ්ඪිතොති 'සූරො යථා රාජඛාදාය පුට්ඨො.'

**අභිගජ්ජමෙති පටිසූරමිච්ඡන්ති** - සො ගජ්ජන්තො උග්ගජ්ජන්තො අභිගජ්ජන්තො එති උපෙති උපගච්ඡති පටිසූරං පටිපුරිසං පටිසත්තුං පටිමල්ලං ඉච්ඡන්තො සාදියන්තො පත්ථයන්තො පිහයන්තො අභිජප්පන්තොති 'අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං.'

**යෙනෙව සො තෙන පලෙහි සූරාති** - යෙනෙව සො දිට්ඨිගතිකො තෙන පලෙහි, තෙන වජ[2], තෙන ගච්ඡ, තෙන අභික්කම. සො තුය්හං පටිසූරො පටිපුරිසො පටිසත්තු පටිමල්ලොති 'යෙනෙව සො තෙන පලෙහි සූර.'

**පුබ්බෙව නත්ථි යදිදං යුද්ධායාති** - 'පුබ්බෙව බොධියා මූලෙ යෙ පටිසෙනිකරා කිලෙසා පටිලොමකරා පටිකණ්ටකරා[3] පටිපක්ඛකරා, තෙ නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා; යදිදං යුද්ධායාති යදිදං යුද්ධත්ථාය කලහත්ථාය භණ්ඩනත්ථාය විග්ගහත්ථාය විවාදත්ථාය මෙධගත්ථායාති 'පුබ්බෙව නත්ථි යදිදං යුද්ධාය.'

තෙනාහ භගවා:

"සූරො යථා රාජඛාදාය පුට්ඨො
අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං,
යෙනෙව සො තෙන පලෙහි සූර
පුබ්බෙව නත්ථි යදිදං යුද්ධායා"ති.

8 - 9

යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති[4]
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,[5]
තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි
වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා.

**යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්තීති** - යෙ ද්වාසට්ඨිදිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා විවාදයන්ති, කලහං කරොන්ති, භණ්ඩනං කරොන්ති, විග්ගහං කරොන්ති, විවාදං කරොන්ති, මෙධගං කරොන්ති: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි. අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො. සහිතං මෙ. අසහිතං තෙ. පුරෙ වචනීයං පච්ඡා අවච පච්ඡා වචනීයං පුරෙ අවච. ආචිණ්ණං[6] තෙ විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. නිග්ගහීතොසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි[7] වා සචෙ පහොසී'ති 'යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති.'

1. අපාදිතො - මජසං. 2. වද - සීමු. I.
3. පටිභණ්ඩකරා - සීමු. II. පටිකණ්ඨකරා - මනුප. පටිකණ්ඩකකරා - මජසං.
4. විවාදියන්ති - සීමු II. PTS. 5. වාදියන්ති - PTS.
6. අධිචිණ්ණං - සීමු. II. මජසං. PTS. අවචිත්තං - මනුප.
7. නිබ්බෙධෙහි - සීමු II. නිබ්බෙඨසි - මජසං. PTS.

**සූරො යථා රාජඛාදාය පුට්ඨො** – ‘සූරො’ යනු සූරු වූයේ වීරු වූයේ විකුම් ඇතියේ බියසුලු නො වූයේ නො තැතිගන්නේ උත්‍රාස රහිත වූයේ නො පැනයන සුලු වූයේ; **රාජඛාදාය පුට්ඨො** – රාජඛාද්‍යයෙන් රාජභොජ්‍යයෙන් පුෂ්ට පොෂණය කළ පාලනය කළ වඩන ලදුයේ නුයි ‘සූරො යථා රාජඛාදාය පුට්ඨො’ යනු මේ.

**අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං** – හෙතම ගර්ජන කෙරෙමින් උත්කට ගර්ජන කෙරෙමින් සිංහනාද කෙරෙමින් එයි පැමිණෙයි එළැඹෙයි, ප්‍රතිශූරයකු විරුද්ධ පුරුෂයකු විරුද්ධ ව සිටි සතුරකු ප්‍රතිමල්ලයකු ඉස්නේ ඉවසනුයේ පතනුයේ කැමැතිවනුයේ අභිගර්ජන කරනුයේ නුයි ‘අභිගජ්ජමෙති පටිසූරමිච්ඡං, යනු මේ.

**යෙනෙව සො තෙන පලෙහි සූර** – ඒ දෘෂ්ටිගතික තෙම යම් තැනෙක්හි මැ වේ ද, එහි පලායව, එහි වදුව, එහි යව, එහි තික්මෙව, හේ තට ප්‍රතිශූර යැ ප්‍රතිපුරුෂ යැ ප්‍රතිශත්‍රු යැ ප්‍රතිමල්ල වූයේ නුයි ‘යෙනෙව සො තෙන පලෙහි සූර’ යනු මේ.

**පුබ්බෙව නත්ථි යදිදං යුද්ධාය** – පෙර මැ බෝමුල්හි දී ප්‍රතිපක්ෂකර වූ හානිකර වූ ප්‍රතිකණ්ටකර වූ ප්‍රතිවිරුද්ධකර වූ යම් ක්ලෙශ කෙනෙක් වෙත් ද ඔවුහු නැත නො වෙති විද්‍යමාන නො වෙති නො ලැබෙත්; ප්‍රහීණ වූවාහු මුලුසුන් වූවාහු සන්සිඳුණාහු දුරලන ලද්දාහු උපතට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දැවුණාහුය; **යදිදං යුද්ධාය** – යුද්ධ සඳහා කලහ සඳහා ඩබර සඳහා විග්‍රහ සඳහා විවාද සඳහා මෙධග සඳහා නුයි ‘පුබ්බෙව නත්ථි යදිදං යුද්ධාය’ යනු මේ.

එයින් වදාළහ බුදුහු:

**“සූරො යථා -පෙ- යදිදං යුද්ධාය” යි”**

## 8 – 9

යම් කෙනෙක් (දෙසැට දිටු අතුරෙන්) එක්තරා දෘෂ්ටියක් දැඩිව ගෙන විවාද කෙරෙත් ද, සැබැ මෙය මැ සැබවැයි කියත් ද, තෝ ඔවුනට කිය, වාදයක් උපන් කල්හි විරුද්ධකාරක වූ ඔහු මේ සස්නෙහි නැති හෙයිනි.

**යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති** – යම් කෙනෙක් දෙසැට දිටු අතුරෙන් එක්තරා දෘෂ්ටියක් ගෙන ග්‍රහණය කොට දැඩිව ගෙන පරාමර්ශනය කොට අභිනිවේශය කොට විවාද කෙරෙති, කලහ කෙරෙති, ඩබර කෙරෙති, විග්‍රහ කෙරෙති, විරුද්ධවාද කෙරෙති, මෙධග කෙරෙති: ‘තෝ මේ ධම්විනය නො දන්නෙහි ය, මම් මේ ධම්විනය දනිමි, කිමැ තෝ මේ ධම්විනය දනි ද? තෝ වරදවා පිළිපන්නෙහි ය, මම් සම්‍යක්ප්‍රතිපන්න යෙමි, මාගේ වචනය අර්ථසහිත ය, තාගේ වචනය අනර්ථසංහිතය, පළමු කියැයුත්ත පසුව කිවුය, පසුව කියැයුත්ත පළමු කිවුය. තා විසින් ආචීර්ණ වූ දෙය (මාගේ වාදයට පැමිණ) නැවැතිණ, තට (මා විසින්) දොෂාරොපණය කරන ලද. නිග්‍රහ කරන ලදුයෙහි දෙසින් මිදෙනු සඳහා පිළිතුරු සොයා යව. පොහොසත්හි නම් (මා නැගූ දෙසින්) මිදෙව’යි ‘යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති’ යනු මේ.

**ඉදමෙව සච්චන්ති ච වාදයන්තීති** - 'සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති වාදයන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; 'අසස්සතො ලොකො -පෙ- නෙව හොති, න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති වාදයන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති 'ඉදමෙව සච්චන්ති ච වාදයන්ති'

**තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තාති** - තෙ ත්වං දිට්ඨිගතිකෙ වදස්සු වා වාදෙන වාදං විග්ගහෙන විග්ගහං පටිකම්මෙන පටිකම්මං විසෙසෙන විසෙසං පටිවිසෙසෙන පටිවිසෙසං ආවෙඨියාය ආවෙඨියං නිබ්බෙඨියාය නිබ්බෙඨියං ඡෙදෙන ඡෙදං මණ්ඩලෙන මණ්ඩලං. තෙ තුය්හං පටිසූර පටිපුරිස පටිසත්තු පටිමල්ලාති තෙ ත්වං වදස්සු; **නහි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තාති** - වාදෙ ජාතෙ සඤ්ජාතෙ නිබ්බත්තෙ අභිනිබ්බත්තෙ පාතුභූතෙයෙව පටිසෙනිකත්තා පටිලොමකත්තා පටිකණ්ටකත්තා පටිපක්ඛකත්තා කලහං කරෙය්‍යුං, භණ්ඩනං කරෙය්‍යුං, විග්ගහං කරෙය්‍යුං, විවාදං කරෙය්‍යුං, මෙධගං කරෙය්‍යුං. තෙ නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති 'තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා.'

තෙනාහ භගවා:

"යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,
තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි
වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා"ති.

**8 - 10**

විසෙනිකත්වා පන යෙ චරන්ති
දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා,
තෙසු ත්වං කිං ලභෙථො[1] පසූර
යෙසී'ධ නත්ථි පරමුග්ගහීතං.

**විසෙනිකත්වා පන යෙ චරන්තීති** - 'සෙනා වුච්චති මාරසෙනා: කායදුච්චරිතං මාරසෙනා, වචීදුච්චරිතං මාරසෙනා, මනොදුච්චරිතං මාරසෙනා, ලොභො[2] මාරසෙනා, දොසො මාරසෙනා, මොහො මාරසෙනා, කොධො මාරසෙනා, උපනාහො මාරසෙනා, මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො, සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා මාරසෙනා. වුත්තං හෙතං භගවතා:

1. කිසුව් ලභෙථ - සීමු 1, කිං ලභෙථ - මජසං. 2. රාගො - PTS

**ඉදමෙව සච්චන්ති ච වාදයන්ති** - 'ලොකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය හිස් යැ' යි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්; 'ලොකය අශාශ්වත යැ...සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි, මේ මැ සැබව, අන්‍යය මොස යැ'යි පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'ඉදමෙව සච්චන්ති ච වාදයන්ති' යනු වේ.

**තෙ ත්වං වදස්සු න හි තෙධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා** - තෙපි ඒ දෘෂ්ටිනතිකයන්ට වාදයෙන් වාදය විග්‍රහයෙන් විග්‍රහය ප්‍රතිකර්මයෙන් ප්‍රතිකර්මය විශෙෂයෙන් විශෙෂය ප්‍රතිවිශෙෂයෙන් ප්‍රතිවිශෙෂය වෙළුමෙන් වෙළුම මිදුමෙන් මිදුම සිඳුමෙන් සිඳුම මණ්ඩලයෙන් මණ්ඩලය කියවු, ඔවුහු තට ප්‍රතිශූර ප්‍රතිපුරුෂ පතිශත්‍රු ප්‍රතිමල්ලයෝ වෙත් නුයි 'තෙ ත්වං වදස්සු යනු වේ. **න හි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා** - වාදය උපන් කල්හි හටගත් කල්හි නිපන් කල්හි වෙසෙසින් නිපන් කල්හි පහළවූ කල්හි මැ විරුද්ධ කාරක තෙම ප්‍රතිලොමකථී තෙම ප්‍රතිභණ්ඩකාරක තෙම ප්‍රතිපක්ෂ කාරක තෙම කලහ කරන්නේ යැ, ඩබර කරන්නේ යැ, විග්‍රහ කරන්නේ යැ, විවාද කරන්නේ යැ, මෙධග කරන්නේ යි; ඒ (ප්‍රතිපක්ෂකර) කෙලෙශයෝ නැත, නො වෙති අවිද්‍යමාන වෙති නො ලැබෙත්; (ඔහු) ප්‍රහීණයෝ යැ සමුච්ඡින්නයෝ යැ සන්හිඳුණාහුය, දුරලන ලද්දාහු යැ උපනට නුසුදුසු වූවාහු යැ නුවණගින්නෙන් දැවුණාහු නුයි - 'තෙ ත්වං වදස්සු න හි තෙ'ධ අත්ථි වාදම්හි ජාතෙ පටිසෙනිකත්තා' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

"**යෙ දිට්ඨිමුග්ගය්හ -පෙ- පටිසෙනිකත්තා**" යි.

### 8 - 10

තවද යම් කෙනෙක් (කෙලෙස්මාරසෙනහ)වනසා දෙසැට දෘෂ්ටියෙන් දෘෂ්ටීනට අවිරුද්ධ වෙමින් වෙසෙත් ද, මේ සස්නෙහි යම් කෙනකුන්ට මේ පරම යයි දැඩිව ගන්නා ලද්දක් නැත්තේ ද, පසූරය, තෝ ඒ රහතුන් කෙරෙහි කවර ප්‍රතිමල්ලයකු ලබන්නෙහි ද ?

**විසෙනිකත්වා පන යෙ චරන්ති** - මරසෙනහ 'සෙනා' යයි කියනු ලැබෙයි, කායදුශ්චරිතය මාරසෙනා යැ, වාග්දුශ්චරිතය මාරසෙනා යැ, මනොදුශ්චරිතය මාරසෙනා යැ, ලොභය මාරසෙනා යැ, ද්වෙෂය මාරසෙනා යැ, මොහය මාරසෙනා යැ, ක්‍රොධය මාරසෙනා යැ, උපනාහය මාරසෙනා යැ, මක්‍ෂය මාරසෙනා යැ, යුගග්‍රාහය මාරසෙනා යැ, ඊර්ෂ්‍යාව මාත්සර්‍ය්‍යය මායාව ශඨබව තදබව කරණුත්තරියකරණය මානය අතිමානය මදය සියලු දුශ්චරිතයෝ සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ මාරසෙනා යි. මේ වදාරන ලද මැය යාථාවත්හු විසින්:

1. "කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති -පෙ-
ජෙත්වා ච ලභතෙ සුඛන්ති."[a]

යතො චතූහි අරියමග්ගෙහි සබ්බා ච මාරසෙනා සබ්බෙ ච පටිසෙනිකරා කිලෙසා ජිතා ච පරාජිතා ච භග්ගා විප්පලුග්ගා[1] පරම්මුඛා තෙන වුච්චති "විසෙනිකත්වා"ති. **යෙති** - අරහන්තො ඛීණාසවා; **චරන්තීති** චරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්තීති 'විසෙනිකත්වා පන යෙ චරන්ති.'

**දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානාති** - යෙසං ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, තෙ දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා අප්පටිවිරුජ්ඣමානා අඝට්ටියමානා අප්පටිහඤ්ඤමානා අප්පටිහනමානානි* 'දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා.'

**තෙසු ත්වං කිං ලභෙථො[1] පසූරාති** - තෙසු අරහන්තෙසු ඛීණාසවෙසු කිං ලභෙථො පටිසූරං පටිපුරිසං පටිසත්තුං පටිමල්ලන්ති 'තෙසු ත්වං කිං ලභෙථො[1] පසූර.'

**යෙසී'ධ නත්ථි පරමුග්ගහීතන්ති** - යෙසං අරහන්තානං ඛීණාසවානං ඉදං පරමං අග්ගං සෙට්ඨං විසිට්ඨං[2] පාමොක්ඛං උත්තමං පවරන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති - 'යෙසී'ධ නත්ථි පරමුග්ගහීතං.'

තෙනාහ භගවා:

"විසෙනි කත්වා පන යෙ චරන්ති
දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා,
තෙසු ත්වං කිං ලභෙථො[1] පසූර
යෙසී'ධ නත්ථි පරමුග්ගහීත"න්ති.

**8 - 11**

අථ ත්වං පවිතක්කමාගමො[3]
මනසා දිට්ඨිගතානි චින්තයන්තො,
ධොනෙන යුගං සමාගමො[4]
න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ.

1. විප්පලුග්ගා - මනුප. 2. විසෙට්ඨං - PTS.
3. මාගම - සීමු. II. මාගමා - මජසං. PTS. 4. සමාගම - සීමු. II.
a. සුත්තනිපාත - පධානසුත්ත.
* සබ්බපොත්ථකෙසු 'අප්පටිහනමානා'ති දිස්සති.

1. "කාමයෝ තාගේ පළමුවැනි සේනාව ය, දෙවැන්නී අරතිය යි කියනු ලැබෙයි .." (4-6 සුත්‍රනිද්දේශය)

යම් හෙයකින් සතර ආර්‍ය්‍යමාර්ගයෙන් සියලු මාරසේනාවෝ ද සියලු ප්‍රතිපක්ෂකර කෙලෙශයෝ ද ජයගන්නා ලද්දාහු පරදවන ලද්දාහු බිඳින ලද්දාහු නසන ලද්දාහු පරාඞ්මුඛ කරන ලද්දාහු වෙත් ද, එහෙයින් 'විසෙනිකත්වා, යි කියනු ලැබේ. **යෙ** යනු: අර්හත් ක්ෂීණාස්‍රවයෝ යැ; **චරන්ති** – හැසිරෙති, වෙසෙති ඉරියවු පවත්වති වැඩෙති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත් නුයි 'විසෙනි කත්වා පන යෙ චරන්ති' යනු වේ.

**දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා** – යම් කෙනකුන් විසින් දෙසැට දෘෂ්ටිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහු සිඳින ලද්දාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු උපදනට අභව්‍ය කරන ලද්දාහු ඥානාග්නියෙන් දවන ලද්දාහු ද ඔහු (දෙසැට) දෘෂ්ටියෙන් දෘෂ්ටියකට අවිරුද්ධ වන්නාහු දැඩිව නො ගන්නාහු නො ගැටෙන්නාහු අප්‍රතිහත වන්නාහු නුයි 'දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා' යනු වේ.

**තෙසු ත්වං කිං ලභෙථො පසූර** – ඒ අර්හත් ක්ෂීණාස්‍රවයන් කෙරෙහි ප්‍රතිශූරයකු ප්‍රතිපුරුෂයකු විරුද්ධ සතුරකු ප්‍රතිමල්ලයකු කිම ලබන්නෙහි දැ යි 'තෙසු ත්වං කිං ලභෙථො පසූර' යනු වේ.

**යෙසී'ධ නත්ථි පරමුග්ගහීතං** – යම් අර්හත් ක්ෂීණාස්‍රව කෙනකුන්ට මේ පරම් යැ අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි ගන්නා ලද පරාමර්ශනය කළ අභිනිවේශ කළ අධ්‍යවසිත අධිමුක්ත වූවක් නැත් ද නො වෙත් ද අවිද්‍යමාන වෙත් ද නො ලැබෙත් ද ප්‍රහීණ කරන ලද සමුච්ඡින්න කරන ලද සන්හිඳුවන ලද දුරලන ලද අභව්‍යොත්පත්තික කරන ලද ඥානාග්නීන් දවන ලද නුයි 'යෙසීධ නත්ථි පරමුග්ගහීතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"විසෙනි කත්වා පන -පෙ- පරමුග්ගහීතං"** යි.

## 8 - 11

තවද තෝ සිතින් දෘෂ්ටිගතයන් සිතමින් (මට ජය වේ දෝ හෝයි ආදිය) විතර්ක කෙරෙමින් ආයෙහි. ධූතකෙලශ වූ බුදුන් සමග යුගග්‍රාහයට ආයෙහි. එතෙකුදුවත් තෝ සම්පයට පැමිණෙන්නට නො හැකි වන්නෙහි.

**අථ ත්වං පවිතක්කමාගමොති** – 'අථා' ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා නාමෙතං 'අථා'ති. **පවිතක්කමාගමොති** – තක්කෙන්තො විතක්කෙන්තො සංකප්පෙන්තො 'ජයො නු ඛො මෙ භවිස්සති පරාජයො නු ඛො මෙ භවිස්සති, කථං නිග්ගහං කරිස්සාමි? කථං පටිකම්මං කරිස්සාමි? කථං විසෙසං කරිස්සාමි? කථං පටිවිසෙසං කරිස්සාමි? කථං ආවෙඨියං කරිස්සාමි? කථං නිබ්බෙඨියං කරිස්සාමි? කථං ඡෙදං කරිස්සාමි? කථං මණ්ඩලං කරිස්සාමී'ති එවං තක්කෙන්තො විතක්කෙන්තො සංකප්පෙන්තො ආගතොසි උපාගතොසි සම්පත්තොසි මයා සද්ධිං සමාගතොසීති 'අථ ත්වං පවිතක්කමාගමො.'

**මනසා දිට්ඨිගතානි චින්තයන්තොති** – 'මනො'ති යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතුª, චින්තෙන්තො දිට්ඨිං චින්තෙන්තො විචින්තෙන්තො 'සස්සතො ලොකො'ති වා, 'අසස්සතො ලොකො'ති වා -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා'ති 'මනසා දිට්ඨිගතානි චින්තයන්තො.'

**ධොනෙන යුගං සමාගමො[1] නහි ත්වං සක්ඛසි සම්පයාතවෙති** – ධොනා වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨිª, කිං කාරණා ධොනා වුච්චති පඤ්ඤා? තාය පඤ්ඤාය කායදුච්චරිතං ධුතඤ්ච ධොතඤ්ච සන්ධොතඤ්ච නිද්ධොතඤ්ච, වචීදුච්චරිතං -පෙ- සබ්බාකුසලාභිසංඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අථවා සම්මාදිට්ඨියා මිච්ඡාදිට්ඨි සම්මාසඞ්කප්පෙන මිච්ඡාසඞ්කප්පො -පෙ- සම්මාවිමුත්තියා මිච්ඡාවිමුත්ති ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. අථවා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා ධුතා ච ධොතා ච සන්ධොතා ච නිද්ධොතා ච. භගවා ඉමෙහි ධොනෙය්‍යෙහි ධම්මෙහි උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො, තස්මා භගවා ධොනො. සො ධුතරාගො ධුතපාපො ධුතකිලෙසො ධුතපරිළාහොති – ධොනො.

---

1. සමාගම - සීමු. II. සමාගමා - මජසං. PTS.

ª. ධම්මසඞ්ගණි - චිත්තුප්පාදකණ්ඩ

**අථ ත්වං පවිතක්කමාගමො** – 'අථ' යනු: පදසන්ධි යැ පදසංසග්ගී යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්විතා නමැ තෙල 'අථ' යනු. **පවිතක්කමාගමො** – තර්ක කෙරෙමින් සලකමින් 'මට ජය වන්නේ දෝ හෝ මට පරාජය වන්නේ දෝ හෝ කෙසේ නිග්‍රහ කෙරෙම් ද, කෙසේ පිළියම් (-ලබ්ධිශුද්ධිය) කෙරෙම් ද, කෙසේ විශෙෂ කෙරෙම් ද, කෙසේ ප්‍රතිවිශෙෂ කෙරෙම් ද, කෙසේ ආවෙෂ්ටන කෙරෙම් ද, කෙසේ නිර්වේෂ්ටන කෙරෙම් ද, කෙසේ වාදච්ඡෙද කෙරෙම් ද, කෙසේ වාදමණ්ඩල කෙරෙම් දැ' යි මෙසේ තර්කණ විතර්කණ සංකල්පන කෙරෙමින් ආයෙහි පැමිණියෙහි සපැමිණියෙහි මා සමග එක්වූයෙහි නුයි 'අථ ත්වං පවිතක්කමාගමො' යනු වේ.

**මනසා දිට්ඨිගතානි චින්තයන්තා** – 'මනො' යනු: යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයෙක් පණ්ඩර (-භවාඞ්ග) සිතෙක් මනසෙක් මනායතනයෙක් මනින්ද්‍රියයෙක් විඥනයෙක් විඥනස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥනධාතුයෙක් වේ ද, ඒ සිතින් 'ලොකය ශාශ්වතැ'යි, හෝ ලොකය අශාශ්වතැ'යි හෝ...සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි හෝ' යි දෘෂ්ටිය සිතනුයේ වෙසෙසින් සිතනුයේ නුයි 'මනසා දිට්ඨිගතානි චින්තයන්තා' යනු වේ.

**ධොනෙන යුගං සමාගමො න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ** – 'ධොනා' යි ප්‍රඥව කියනු ලැබෙයි, යම් ප්‍රඥවක් දැනීමෙක්...අමොහයෙක් ධර්මවිචය යෙක් සම්‍යග්දෘෂ්ටියෙක් වේ ද එයයි. කුමක් හෙයින් ප්‍රඥව 'ධොනා' යි කියනු ලැබෙයි යත්? ඒ ප්‍රඥවෙන් කායදුශ්චරිතය කම්පා කරන ලද ද දෙවුණා ලද ද මැනවින් දෙවුණා ලද ද වෙසෙසින් දෙවුණා ලද ද වෙයි, වාග්දුශ්චරිතය...සියලු අකුශලාභිසංස්කාරයෝ ධූත – ධෞත – සංධෞත- ද වෙත්; නොහොත් සම්‍යග්දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය, සම්‍යක් සංකල්පයෙන් මිථ්‍යාසංකල්පය...සම්‍යග්විමුක්තියෙන් මිථ්‍යාවිමුක්තිය ධූත – ධෞත- සංධෞත – නිර්ධෞත ද වෙයි, නොහොත් අර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සියලු කෙලශයෝ සියලු දුශ්චරිතයෝ සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ අකුශලාභිසංස්කාරයෝ ධූත – ධෞත – සංධෞත- නිර්ධෞත ද වෙත්. බුදුහු මේ ධෞනෙයධර්මයන්ගෙන් උපෙතයහ සමුපෙතයහ සමුපාගතයහ අවියුක්තයහ පරිපූර්ණයහ සමන්විතයහ, එහෙයින් බුදුහු ධොනයෝ යැ; ඒ භාග්‍යවත්හු ධූතරාගයහ ධූතපාපයහ ධූතකෙලශයහ ධූතපරිදාහයෝ නුයි 'ධොන' නම් වෙත්.

**ධොනෙන යුගං සමාගමො න හි ත්වං සක්ඛසි සම්පයාතවෙති** - පසූරො පරිබ්බාජකො නප්පටිබලො ධොනෙන බුද්ධෙන භගවතා සද්ධිං යුගසමාගමං[1] සමාගන්ත්වා යුගග්ගාහං ගණ්හිත්වා සාකච්ඡිතුං[2] සල්ලපිතුං සාකච්ඡං සමාපජ්ජිතුං. තං කිස්ස හෙතු? පසූරො පරිබ්බාජකො හීනො නිහීනො ඔමකො ලාමකො ඡත්තකො[3] පරිත්තො. සො හි භගවා අග්ගො ච සෙට්ඨො ච විසිට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො ච. යථා සසො න පටිබලො මත්තෙන මාතඞ්ගෙන සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුගග්ගාහං ගණ්හිතුං, යථා කොට්ඨුකො න පටිබලො සීහෙන මිගරඤ්ඤා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුගග්ගාහං ගණ්හිතුං, යථා වච්ඡකො තරුණකො ධෙනුපකො න පටිබලො උසභෙන චලක්කකුනා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුගග්ගාහං ගණ්හිතුං, යථා ධඞ්කො න පටිබලො ගරුළෙන වෙනතෙය්‍යෙන සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුගග්ගාහං ගණ්හිතුං, යථා චණ්ඩාලො න පටිබලො රඤ්ඤා චක්කවත්තිනා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුගග්ගාහං ගණ්හිතුං, යථා පංසුපිසාචකො න පටිබලො ඉන්දෙන දෙවරඤ්ඤා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුගග්ගාහං ගණ්හිතුං, එවමෙවං පසූරො පරිබ්බාජකො න පටිබලො ධොනෙන බුද්ධෙන භගවතා සද්ධිං යුගසමාගමං සමාගන්ත්වා යුගග්ගාහං ගණ්හිත්වා සාකච්ඡිතුං[2] සල්ලපිතුං සාකච්ඡං සමාපජ්ජිතුං. තං කිස්ස හෙතු? පසූරො පරිබ්බාජකො හීනපඤ්ඤො නිහීනපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො. ඡත්තකපඤ්ඤො පරිත්තපඤ්ඤො. සො හි භගවා මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො[4] ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්තඤාණො අනන්තතෙජො අනන්තයසො අඩ්ඪො මහද්ධනො[5] ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතා.

සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො. මග්ගානුගා ච පනස්ස එතරහි සාවකා විහරන්ති පච්ඡාසමන්නාගතා.

---

1. යුගං සමාගමං - සීමු. II. මජසං. PTS. 2. සාකච්ජිතුං - ස.
3. ජතුක්කො - මජසං. PTS. ජතුක්කො - සීමු. II. ජතුකො - මනුප.
4. හාසපඤ්ඤො - මජසං. 5. මහාධනො - පු.

**ධොනෙන යුගං සමාගමො න හි ත්වං සක්කසි සම්පයාතවෙ** - පසූර පරිබ්‍රාජක තෙම ධොත වූ භාග්‍යවත් බුදුන් සමග එක්විට සමාගමයට පැමිණ යුගග්‍රාහය ගෙන සාකච්ඡා කරන්නට සල්ලාප කරන්නට සාකච්ඡාවට පැමිණෙන්නට සමර්ථ නො වෙයි, ඒ කවර හෙයින යත්? පසූරපරිබ්‍රාජක හීන යැ නිහීන යැ අධම යැ ලාමක යැ අහෙතුක යැ අල්ප සි. ඒ බුදුහු වූ කලී අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද විශිෂ්ට ද උත්තම ද ප්‍රවර ද වෙත්. යම් සේ සාවෙක් මතැතක්හු සමග එක් පැහැර පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ සිවලෙක් සිංහමෘගරාජයකු සමග යුග සමාගමයට පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ කිරි බොන වසුපැටෙක් සැලෙන මොල්ලිය ඇති වෘෂභයකු සමග යුගසමාගමයට (කරට කර) පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ කවුඩෙක් ගුරුළුරජකු සමග යුගසමාගමයට පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ සැඩොලෙක් සක්විතිරජක්හු සමග යුගසමාගමයට පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, යම් සේ පාංශුපිශාචයෙක් (කසළපිසසෙක්) සක්දෙව්රජහු සමග යුගසමාගමයට පැමිණ යුගග්‍රාහ ගන්නට අසමර්ථ වේ ද, එසෙයින් මැ පසූර පිරිවැජි තෙම කෙලෙස් දෙවූ භගවත් බුදුන් සමග යුගසමාගමයට පැමිණ යුගග්‍රාහය ගෙන කථා කරන්නට සල්ලාප කරන්නට සාකච්ඡාවට පැමිණෙන්නට අසමර්ථ වෙයි. ඊට හෙතු කිම ? යත්: පසූර පිරිවැජි තෙම හීනප්‍රඥ ඇත්තේ යැ නිහීනප්‍රඥ ඇත්තේ යැ අධමප්‍රඥ ඇත්තේ යැ ලාමකප්‍රඥ ඇත්තේ යැ අහෙතුකප්‍රඥ ඇත්තේ යැ අල්පප්‍රඥ ඇත්තේ සි. ඒ බුදුහු වූ කලී මහාප්‍රඥ ඇතියහ ශීඝ්‍රප්‍රඥ ඇතියහ දිවෙන ප්‍රඥ ඇතියහ නිපුණ ප්‍රඥ ඇතියහ නිර්වේධික ප්‍රඥ ඇතියහ. ප්‍රඥප්‍රභෙදයෙහි නිපුණයහ ප්‍රභෙදගත ඥාන ඇත්තාහ අධිගම කළ ප්‍රතිසම්භිද් ඇත්තාහ. චතුර්වෛශාරද්‍යයට පැමිණියහ දශ-බලධාරීහ පුරුෂශ්‍රෙෂ්ඨයහ පුරුෂසිංහයහ පුරුෂනාගයහ පුරුෂාජානෙයහ පුරුෂධෞරෙයහ අනන්තඥානයහ අනන්තතෙජස් ඇත්තාහ අනන්තයශස් ඇත්තාහ (ප්‍රඥධනයෙන්) ආඪ්‍යයහ මහාධන ඇත්තාහ ධනවත්හ. (නිවනට පමුණුවන හෙයින්) නෙතෘ වූහ (විනයන කරන හෙයින්) විනෙතෘ වූහ අනුනෙතෘ වූහ (සැක සිඳ අර්ථය) පනවනුවහ නිශ්චය කරවනුවහ (පිළිවෙත්) දක්වනුවහ (ප්‍රතිපත්තිඵලයෙන්) පහදනුවහ.

තවද ඒ බුදුහු නූපන් මාර්ගය සවසන්තානයෙහි උපදවනුවහ, (වෛනෙය සන්තානයෙහි) අසඤ්ජාතමාර්ගය දනවනුවහ, ප්‍රකාශ නො කළ මාර්ගය (විවරණ වශයෙන්) ප්‍රකාශ කරනුවහ, (ප්‍රත්‍යවෙක්ෂාවශයෙන්) මාර්ගය දතුවහ, මාර්ගය දන්නා සුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ. ඒ බුදුන් විසින් හෙළි කළ මාර්ගය හෙතු කොට මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදිගුණයෙන්) පසුපස යමින් වෙසෙත්.

සො හි භගවා ජානං ජානාති. පස්සං පස්සති. චක්ඛුභූතො ඤාණභූතො, ධම්මභූතො, බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං[1] අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං[2] පඤ්ඤාය. අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති. යං කිඤ්චි ඤෙය්‍යං නාම අත්ථි ධම්මං ජානිතබ්බං, අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා අත්ථො සබ්බං තං අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්තති. සබ්බං වචීකම්මං ඤාණානුපරිවත්තති[3]. සබ්බං මනොකම්මං ඤාණානුපරිවත්තති.

අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං. අනාගතෙ අප්පටිහතං ඤාණං. පච්චුප්පන්නෙ අප්පටිහතං[4] ඤාණං. යාවතකං ඤෙය්‍යං, තාවතකං ඤාණං. යාවතකං ඤාණං, තාවතකං ඤෙය්‍යං. ඤෙය්‍යපරියන්තිකං ඤාණං. ඤාණපරියන්තිකං ඤෙය්‍යං. ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති. ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵුස්සිතානං හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමං නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො, එවමෙවං බුද්ධස්ස භගවතො ඤෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො. යාවතකං ඤෙය්‍යං, තාවතකං ඤාණං. යාවතකං ඤාණං, තාවතකං ඤෙය්‍යං. ඤෙය්‍යපරියන්තිකං ඤාණං. ඤාණපරියන්තිකං ඤෙය්‍යං. ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති. ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා, සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති.

සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛනපටිබද්ධා මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා. සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙසඤ්ච සත්තානං භගවා ආසයං ජානාති. අනුසයං ජානාති. චරිතං ජානාති. අධිමුත්තිං ජානාති. අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තො මහාසමුද්දෙ පරිවත්තන්ති, එවමෙව සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තො බුද්ධඤාණෙ පරිවත්තති.

---

1. අඤ්ඤතං - ස, PTS. 2. අඵුසිතං - PTS.
3. ඤාණානුපරිවත්තති - සීමු I. 4. අප්පතිහතං - ස.

තවද ඒ බුදුහු දතයුතු (ඥෙයධර්මය) දනිති, දක්ක යුත්ත (නුවණැසින්) දකිති; ඇසක් මෙන් වූවහ, ඥානමය වූවහ, ධර්මමය වූවහ, වක්තෘයහ, ප්‍රවක්තෘයහ, නිනේතෘයහ, ශ්‍රෙෂ්ඨ වූවහ; (දහම් දෙසන හෙයින්) වක්තෘයහ (ඥෙය දක්වනුයෙන්) නිනේතෘයහ, අමෘතය දෙනුවහ, ධර්මස්වාමීහ, තථාගතයහ. ඒ බුදුන් විසින් (මඟනැණින්) නො දන්නා ලද්දෙක් (සව්නේ දත් නැණින්) නො දක්නා ලද්දෙක් අවිදිත වූයෙක් ප්‍රත්‍යක්ෂ නො කරන ලද්දෙක් ප්‍රඥාවෙන් ස්පර්ශ නො කරන ලද්දෙක් නැති. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයෙක් වේ ද, අතීතානාගත-ප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට සියලු ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුන්ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙත්. ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද දෘෂ්ටධාර්මිකාර්ථය ද සාම්පරායිකාර්ථය ද උත්තානාර්ථය ද ගම්භීරාර්ථය ද ගූඪාර්ථය ද ප්‍රතිච්ඡන්නාර්ථය ද නීතාර්ථය ද අනවද්‍යාර්ථය ද නික්ලේශාර්ථය ද පරිශුද්ධාර්ථය ද පරමාර්ථාර්ථය (- නිර්වාණය) ද යන ඒ සියල්ල බුද්ධඥානය තුළ පවතී, භාග්‍යවත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී, සියලු වාක්කර්මය ඥානය අනුව පවතී, සියලු මනඃකර්මය ඥානය අනුව පවතී.

අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (-නිරාවරණ) යැ, අනාගතයෙහි ඥානය අප්‍රතිහත යැ, ප්‍රත්‍යුත්පන්නයෙහි ඥානය අප්‍රතිහත යැ, දතයුත්ත යම් පමණ ද ඥානය එපමණ යැ, ඥානය යම් පමණ ද ඥෙයය එපමණ යැ, ඥානය ඥෙයපර්යන්තික යැ ඥෙයය ඥානපර්යන්තික යැ, ඥෙයය ඉක්මැ ඥානය නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැත, ඒ ධර්මයෝ අන්‍යොන්‍යපර්යන්තයෙහි පවත්නා සුල්ලහ; යම් සේ මනාකොට පැහැසූ සුමුගුපටල (=තහඩු) දෙකෙකින් යට සුමුගුපටල උපරිමය නො ඉක්මවා ද, උඩ සුමුගුපටල හෙට්ඨිමය නො ඉක්මැ සිටී ද, ඔහු ඔවුනොවුන් ගේ කෙළවර සිටුනා සුලු වෙත් ද; එසෙයින් මැ භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යොන්‍යපර්යන්තයෙහි පවත්නාසුල්ලහ; යම්තාක් ඥෙයය ද ඒතාක් ඥානය යැ, යම්තාක් ඥානය ද ඒතාක් ඥෙය යැ ඥානය ඥෙයපර්යන්තික යැ, ඥෙයය ඥානපර්යන්තික යැ ඥෙයය ඉක්මැ ඥානය නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති; ඒ දහම්හු අන්‍යොන්‍යපර්යන්තයෙහි සිටුනාසුල්ලහ.

සියලු දහම් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී, සියලු දහම්හු භාග්‍යවත් බුදුන් ගේ මනොද්වාරාවර්ජනයට අයත්හු වෙති, රුචිය ප්‍රතිබද්ධයහ, මනසිකාර ප්‍රතිබද්ධයහ, චිත්තොත්පාදප්‍රතිබද්ධයහ; සියලු සතුන් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී, බුදුහු සියලු සත්ත්වයන්ගේ ආශය දනිති, අනුශය දනිති, චරිතය දනිති, අධිමුක්තිය දනිති, අල්ප වූ කෙලෙස්රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති සුන්දර ආකාර ඇති ගර්හිතාකාර ඇති සුවිඥෙය වූ දුර්විඥෙය වූ භව්‍යාභව්‍ය සත්ත්වයන් දනිති, මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත ලෝ වැසි තෙම මහණ බමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත වූ ප්‍රජාව බුද්ධඥානය තුළ පවතී, යම්සේ තිමි තිමිංගල පටන් කොට යම් මස්කැසුබු කෙනෙක් වෙත් නම් ඔහු මහමුහුද තුළ හැසිරෙත් ද එසෙයින් මරුන් බඹුන් සහිත වූ සදෙවක ලෝක තෙමේ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත සදෙවමනුෂ්‍යප්‍රජාව බුද්ධඥානය තුළ පවතී;

යථා යෙ කෙචි පක්ඛී අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙවං යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය, තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති. බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨතියෙව. යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හං අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගුළ්හානි ච පටිච්ඡන්නානි ච. කථිතා විසජ්ජිතාව තෙ පඤ්හා භගවතා හොන්ති නිද්දිට්ඨකාරණා. උපක්ඛිත්තකාව තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවාව තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති – ධොනෙන යුගං සමාගමො න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ.

තෙනාහ භගවා:

"අථ ත්වං පවිතක්කමාගමො
මනසා දිට්ඨිගතානි චින්තයන්තො,
ධොනෙන යුගං සමාගමො
න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ"ති.

**පසූරසුත්තනිද්දෙසො අට්ඨමො.**

# 9

# මාගන්දියසුත්තනිද්දෙසො

අථ මාගන්දියසුත්තනිද්දෙසො වුච්චතෙ:

## 9 - 1

දිස්වාන තණ්හං අරතිං රගඤ්ච[1]
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං,
කිමෙවිදං මුත්තකරීසපුණ්ණං?
පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ.

**දිස්වාන තණ්හං අරතිං රගඤ්ච නාහොසි ඡන්දො අපි මෙථුනස්මින්ති** තණ්හඤ්ච අරතිඤ්ච රගඤ්ච[2] මාරධීතරො දිස්වා පස්සිත්වා මෙථුනධම්මෙ ඡන්දො වා රාගො වා පෙමං වා නාහොසීති – දිස්වාන තණ්හං අරතිං රගඤ්ච නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං.

**කිමෙවිදං මුත්තකරීසපුණ්ණං පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙති**– කිමෙවිදං සරීරං මුත්තපුණ්ණං කරීසපුණ්ණං සෙම්හපුණ්ණං රුහිරපුණ්ණං අට්ඨිසඞ්ඝාතං[3] නහාරුසම්බන්ධං රුහිරමංසාවලෙපනං චම්මාවනද්ධං[4] ඡවියා පටිච්ඡන්නං ඡිද්දාවඡිද්දං උග්ඝරන්තං පග්ඝරන්තං[5] කිමිසඞ්ඝනිසෙවිතං නානාකලිමලපරිපූරං පාදෙන අක්කමිතුං න ඉච්ඡෙය්‍යං,[6] කුතො පන සංවාසො වා සමාගමො වාති – කිමෙවිදං මුත්තකරීසපුණ්ණං පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ.

තෙනාහ භගවා:

"දිස්වාන තණ්හං අරතිං රගඤ්ච
නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං,
කිමෙවිදං මුත්තකරීසපුණ්ණං
පාදාපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ"ති.

1. අරතිඤ්ච රාගං - PTS. 2. රාගඤ්ච - PTS. 3. අට්ඨිසංඝාටං - ස.
4. චම්මවිනද්ධං - ස. 5 උග්ඝරං පග්ඝරං - ස. 6. ඉච්ඡෙය්‍ය - සීමු. II. මජසං.

යම්සේ වෛනතෙය ගුරුළුරජහු පවත් කොට යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම් ඔහු අහස පෙදෙසෙක හැසිරෙත් ද, එසෙයින් මැ යම් කෙනෙක් නුවණින් සැරියුත් තෙරුන් සමවූවාහු නම් ඔවුහු ද බුද්ධඥානයාගේ පෙදෙසෙක පවත්නාහුය. බුද්ධඥානය දෙව්මිනිසුන්ගේ ප්‍රඥාව පැතිරැ මැඩගෙනැ සිටී මැය. නිපුණ වූ කල පරවාද ඇති වල් විදුනා දුනුවායන් බඳු ප්‍රසිද්ධ වූ යම් ක්ෂත්‍රිය – බ්‍රාහ්මණ – ගෘහපති – ශ්‍රමණපණ්ඩිත කෙනෙක් ප්‍රඥාවෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද බොහෝ ප්‍රශ්න සකස් කොට ගෙන බුදුන් කරා පැමිණ විචාරති. ඒ ප්‍රශ්නයෝ බුදුන් විසින් සකාරණ ව කියන ලද්දාහු විසඳන ලද්දාහු ද වෙති. තවද ඔවුහු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක වූවාහු මැ වෙත්. යස්මා බුදුහු මැ එහි ප්‍රඥාවෙන් අතිශයින් බබලත් නුයි 'ධොනෙන යුගං සමාගමො න හි ත්වං සක්ඛසි සම්පයාතවෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අථ ත්වං -පෙ- සක්ඛසි සම්පයාතවෙ" යි.**

**අටවැනි 'පසූර' සූත්‍ර නිද්දේශය යි.**

# 9

# මාගන්දියසුත්තනිද්දේශය

ඉක්බිති මාගන්දිය සූත්‍රනිද්දේශය කියනු ලැබේ.

**9 – 1**

තෘෂ්ණා යැ අරති යැ රගා යැ යන (මාරදුහිතෘන්) තිදෙනා දැක මෙවුන්දම්හි ඡන්දයෙක් හෝ නො වී යැ. මලමූයෙන් පිරුණු මේ සිරුර දැක කවර කරුණෙකින් (ඡන්දයෙක් වේ ද නො වේ මැයි.) ඒ සිරුර පයිනු දු ස්පර්ශ කරන්නට නො රිස්සෙමි.

**දිස්වාන තණ්හං අරතිං රගඤ්ච නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං**– තෘෂ්ණා ද අරති ද රගා ද යන මාරදුහිතෘන් දැක පවා, මෙවුන්දම්හි ඡන්දයෙක් හෝ රාගයෙක් හෝ ප්‍රෙමයෙක් හෝ නො වී නුයි 'දිස්වාන තණ්හං අරතිං රගඤ්ච නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං' යනු වේ.

**කිමෙවිදං මුත්තකරීසපුණ්ණං පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ** – මූයෙන් පිරුණු මලයෙන් පිරුණු සෙමින් පිරුණු ලෙයින් පිරුණු ඇටසැකිළු වූ නහරවැලින් බැඳුණු, ලේමසින් ආලේප කළ සමින් එතුණු සිවියෙන් වැසුණු නොයෙක් සිදුරු ඇති (ඇස් ආදියෙන්) ඉතිරෙන (අධොභාගයෙන්) වැගිරෙන පණුකැලන් ගැවැසෙන නොයෙක් අසුචිමල යෙන් හාත්පසින් පිරුණු මේ සිරුර කියනු මැ කිම. (එය) පයින් ඇක්මෙන්නට (පවා) නො රිස්සෙමි. වැලි කවර කරුණෙකින් සංවාසයෙක් හෝ සමාගමයෙක් හෝ වේ දැ'යි 'කිමෙවිදං මුත්තකරීසපුණ්ණං පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ, යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"දිස්වාන තණ්හං -පෙ- පාදපි නං සම්ඵුසිතුං න ඉච්ඡෙ"යි.**

### 9 – 2

එතාදිසං චෙ රතනං න ඉච්ඡසි
නාරිං නරින්දෙහි බහූහි පත්ථිතං,
දිට්ඨිගතං සීලවතානුජීවිතං
භවූපපත්තිඤ්ච වදෙසි කීදිසං.

අනච්ඡරියමෙවෙතං මනුස්සා යං දිබ්බෙ කාමෙ පත්ථයන්තා මානුසකෙ කාමෙ න ඉච්ඡෙය්‍ය, මානුසකෙ වා කාමෙ පත්ථයන්තා දිබ්බෙ කාමෙ න ඉච්ඡෙය්‍ය, යං ත්වං උභොපි න ඉච්ඡසි[1] න සාදියසි න පත්ථෙසි න පිහෙසි නාභිජප්පසි, කිං තෙ දස්සනං? කතමාය ත්වං දිට්ඨියා සමන්නාගතො'ති පුච්ඡති.

"එතාදිසං චෙ රතනං න ඉච්ඡසි
නාරිං නරින්දෙහි බහූහි පත්ථිතං,
දිට්ඨිගතං සීලවතානුජීවිතං
භවූපපත්තිඤ්ච වදෙසි කීදිස''න්ති.

### 9 – 3

ඉදං වදාමීති න තස්ස හොති (මාගන්දියා'ති භගවා)
ධම්මෙසු[2] නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය
අජ්ඣත්තසන්තිං පචිනං අදස්සං.

**ඉදං වදාමීති න තස්ස හොති** – 'ඉදං වදාමී'ති ඉදං වදාමි. එතං වදාමි. එත්තකං වදාමි. එත්තාවතා වදාමි. ඉදං දිට්ඨිගතං වදාමි. 'සස්සතො ලොකො'ති වා –පෙ– 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා; **න තස්ස හොතීති** – න මය්හං හොති එත්තාවතා වදාමීති න තස්ස හොතීති – 'ඉදං වදාමීති න තස්ස හොති.' **මාගන්දියාති** – භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති; **භගවාති** – ගාරවාධිවචනං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති – 'මාගන්දියාති භගවා.'

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතන්ති** – 'ධම්මෙසු'ති ද්වාසට්ඨිදිට්ඨිගතෙසු; **නිච්ඡෙය්‍යාති** නිච්ඡිනිත්වා විනිච්ඡිනිත්වා විචිනිත්වා පවිචිනිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ඔධිග්ගාහො බිලග්ගාහො වරග්ගාහො කොට්ඨාසග්ගාහො උච්චයග්ගාහො සමුච්චයග්ගාහො ඉදං සච්චං තච්ඡං තථං භූතං යාථාවං[3] අවිපරීතන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සංවිජ්ජති නූපලබ්භති පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.'

---

1. ඉච්ඡති - මු. II
2. න ච ධම්මෙසු - මු. II. මජසං.
3. යථාවං - සිමු. II.

## 9 - 2

බොහෝ රජුන් විසින් පතන ලද දිව්‍යස්ත්‍රීරත්නයක් වැනි වූ මෙබඳු ස්ත්‍රියක ඉදින් නො කැමැත්තවූ නම්, (එකල්හි) තොපගේ දෘෂ්ටිය ද ශීලව්‍රතය ද ජීවිතය ද භවෝත්පත්තිය ද කෙබඳු දැ'යි කියනු මැනවැ' යි.

යම් හෙයකින් මිනිසෙක් දිව්‍යකාමයන් ප්‍රාර්ථනා කෙරෙමින් මානුෂිකකාමයන් නො කැමැති වන්නේ නම්, මානුෂිකකාමයන් හෝ ප්‍රාර්ථනා කෙරෙමින් දිව්‍යකාමයන් නො කැමැති වන්නේ නම්, තෙල ආශ්චර්යයෙක් නො වෙයි. යම් හෙයකින් තෙපි දෙක මැ නො රිසියවූ ද නො ඉවසවූ ද, නො පතවූ ද, නො කැමැති වවූ ද, නො සිතවූ ද, (එහෙයින්) තොප ගේ දර්‍ශනය කිම ? තෙපි කවර ලබ්ධියකින් සමන්විතයවූ දැ'යි විචාරයි:

**"එතාදිසං චෙ -පෙ- වදෙසි කීදිසං"**, යි

## 9 - 3

(බුදුහු මාගන්දිය, යී මෙසේ වදරති:) දෙසැටදිට්ඨුදහම්හි, නිශ්චය කොට මෙය මැ (සැබැවැයි මෙසේ) කියමි දැඩි ව ගන්නා ලද්දෙක් මට නො වෙයි, යළි දෙසැට දෘෂ්ටීන්හි (ආදීනවය) දක්නෙම් (කිසි දෘෂ්ටියක්) දැඩි ව නො ගෙන (සිවුසස්) සොයනුයෙම් අධ්‍යාත්මශාන්ති යයි කියන ලද නිවන දිටිමි.

**ඉදං වදාමීති න තස්ස හොති** – 'ඉදං වදාමි' යනු: මේ කියමි, තෙල කියමි, මෙතෙක් කියමි, මෙතෙකින් කියමි, මේ දෘෂ්ටිගතය කියමි: 'ලොකය ශාශ්වතැ'යි හෝ...සත්ත්ව නෙම මරණින් මතුයෙහි නො මැ වෙයි, නො වන්නේ නො වේය යි; **න තස්ස හොති** – මට නොවෙයි, මෙතෙකින් කියමි, ඒ මට නො වේ නුයි 'ඉදං වදාමීති න තස්ස හොති' යනු වේ. **'මාගන්දිය'** යී බුදුහු ඒ බමුණු නමින් අමතන සේක....'භගවා' යනු: ගෞරවාධිවචන යැ...මේ 'භගවා' යනු (සර්‍වධර්‍මයන්) ප්‍රත්‍යක්‍ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියෙක් නුයි 'මාගන්දියාති භගවා' යනු වේ.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං** – 'ධම්මෙසු' යනු: දෙසැට දෘෂ්ටිගත යන්හි; **නිච්ඡෙය්‍ය** – නිශ්චය කොට විනිශ්චය කොට විමසා වෙසෙසින් විමසා තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට, අවධි කොට ගැනීම කොටස් වශයෙන් ගැනීම උතුම් කොට ගැනීම කොටස් කොට ගැනීම රාශිවශයෙන් ගැනීම විශෙෂරාශිවශයෙන් ගැනීම, මේ සැබව අවිපරීත යැ භූත යැ යාථාවත් යැ අවිපරීත යැයි ගන්නා ලද පරාමර්‍ශ කළ අභිනිවෙශ කළ ඇතුළත් වැ සිටි බැසගන්නා ලද්දක් නැත, විද්‍යමාන නො වෙයි, නො ලැබෙයි, ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ සන්හිඳුවන ලද දුරලන ලද අභව්‍යොත්පත්තික කරන ලද නුවණගින්නෙන් දවන ලද නුයි 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං' යනු වේ.

**පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහායාති** – ‘දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි න පරාමසාමි නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි – ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය, අථවා, ‘සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති දිට්ඨිගතමෙතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසංයොජනං සදුක්ඛං සවිඝාතං සඋපායාසං සපරිළාහං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තතීති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි න පරාමසාමි නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි – ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය’. අථවා, ‘අසස්සතො ලොකො, අන්තවා ලොකො, අනන්තවා ලොකො, තං ජීවං තං සරීරං, අඤ්ඤං ජීවං අඤ්ඤං සරීරං, හොති තථාගතො පරම්මරණා, න හොති තථාගතො පරම්මරණා, හොති ච න ච හොති තථාගතො පරම්මරණා, නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති දිට්ඨිගතමෙතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං සදුක්ඛං සවිඝාතං සඋපායාසං සපරිළාහං න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තතීති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි, න පරාමසාමි, නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි – ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය.’ අථවා, ඉමා දිට්ඨියො එවං ගහිතා එවං පරාමට්ඨා එවංගතිකා භවිස්සන්ති එවං අභිසම්පරායාති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි, න පරාමසාමි, නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි– ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය.’ අථවා, ඉමා දිට්ඨියො නිරයසංවත්තනිකා තිරච්ඡානයොනිසංවත්තනිකා පෙත්තිවිසයසංවත්තනිකාති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි, න පරාමසාමි, නාභිනිවිසාමි; අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි – ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය.’ අථවා, ඉමා දිට්ඨියො අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මාති දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි, න පරාමසාමි, නාභිනිවිසාමි. අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි– ‘පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය.’

**පසඞ්ඛාය දිට්ඨීසු අනුග්ගහාය** - දෘෂ්ටීන්හි ආදීනව දක්මින් දෘෂ්ටීන් නො ගන්මි, පරාමර්ශ නො කරමි, පිවිසැ නො සිටිමි; නොහොත් නො ගතයුත්තාහුය නො දැහැගතයුත්තාහුය, නො පිවිසැ සිටිය යුත්තාහුය යි මෙසේත් 'පසඞ්ඛාය දිට්ඨීසු අනුග්ගහාය' යනු වේ. නොහොත් 'ලොකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය මොඝය' යන තෙල දෘෂ්ටිගතය දෘෂ්ටිගහනය දෘෂ්ටිකාන්තාරය දෘෂ්ටි නමැති හුල දෘෂ්ටිචලනය දෘෂ්ටිසංයොජනය (කායික) දුක් සහිත යැ (චෛතසික) පීඩා සහිත යැ දැඩි ආයාස සහිත යැ පරිදාහ සහිත යැ සංසාර (වට්ටයෙහි) නිර්වේදය පිණිස නො වෙයි, විරාගය පිණිස උපශමය පිණිස අභිජානනය පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස නො පවත්නේ නුයි දෘෂ්ටීන්හි ආදීනව දක්මින් දෘෂ්ටීන් නො ගන්මි, පරාමර්ශ නො කරමි, පිවිසැ නො සිටිමි; නොහොත් නො ගත යුත්තාහු යැ පරාමර්ශ නො කළ යුත්තාහු යැ නො පිවිසැ සිටිය යුත්තාහු නුයි මෙසේත් "පසඞ්ඛාය දිට්ඨීසු අනුග්ගහාය" යනු වේ. නොහොත් 'ලොකය අශාශ්වත යැ, ලොකය අන්තවත් යැ, ලොකය අනන්තවත් යැ, ජීවය ත් ශරීරයත් ඒ මැය, ජීවය අනෙකෙකැ ශරීරය අනෙකෙකි, මරණින් මතු සත්ත්ව තෙම වෙයි, මරණින් මතු සත්ත්ව තෙම නො වෙයි, මරණින් මතු සත්ත්ව තෙමේ වන්නේ ද නො ද වන්නේ ද වෙයි, මරණින් මතු සත්ත්ව තෙමේ නො මැ වෙයි නො වන්නේ නො වෙයි, මෙය මැ සැබව, අන්‍යය මොඝ යැ යන තෙල දෘෂ්ටිගතය දෘෂ්ටිගහනය දෘෂ්ටිකාන්තාරය දෘෂ්ටිශූලය දෘෂ්ටිවිෂ්පන්දනය දෘෂ්ටිසංයොජනය දුක් සහිත යැ පීඩා සහිත යැ දැඩි ආයාස සහිත යැ පරිදාහ සහිත යැ නිර්වේදය පිණිස නො පවතී, විරාගය පිණිස - නිරොධය පිණිස - උපශමය පිණිස අභිඥාව පිණිස - සම්බොධය පිණිස - නිර්වාණය පිණිස නො පවතී නුයි දෘෂ්ටීන් කෙරෙහි ආදීනව දක්නෙම් දෘෂ්ටීන් නො ගන්මි, පරාමර්ශ නො කරමි, පිවිසැ නොසිටිමි; නොහොත් නො ගතයුත්තාහු යැ පරාමර්ශ නො කළ යුත්තාහු යැ නො පිවිසියැ යුත්තාහු යැ'යි මෙසේ ත් 'පසඞ්ඛාය දිට්ඨීසු අනුග්ගහාය' යනු වේ. නොහොත් 'මේ දෘෂ්ටිහු මෙසේ ගන්නා ලද්දාහු මෙසේ පරාමර්ශ කරන ලද්දාහු මෙබඳු ගති ඇත්තාහු මෙබඳු පරලොව ඇත්තාහු වෙති' දෘෂ්ටීන්හි ආදීනව දක්නෙම් දෘෂ්ටි නො ගන්මි, පරාමර්ශ නො කරමි; නොහොත් නො ගතයුත්තාහු ය, නො දැහියයුත්තාහු යැ, නො පිවිසි යැ යුත්තාහු නුයි මෙසේත් 'පසඞ්ඛාය දිට්ඨීසු අනුග්ගහාය' යනු වේ. නොහොත් 'මේ දෘෂ්ටිහු නිරයෙහි ඉපදීම පිණිස පවත්නාහු යැ තිරිසන්යොන්හි ඉපදීම පිණිස පවත්නාහු යැ ප්‍රෙතවිෂයයෙහි ඉපදීම පිණිස පවත්නාහු යැ' යි දෘෂ්ටීන්හි ආදීනව දක්මින් දෘෂ්ටි නො ගන්මි, නො දහමි, නො පිවිසැ සිටිමි; නොහොත් නො ගතයුත්තාහු යැ නො දැහියයුත්තාහුය, නො පිවිසියැ යුත්තාහු නුයි මෙසේත් 'පසඞ්ඛාය දිට්ඨීසු අනුග්ගහාය' යනු වේ. නොහොත් 'මේ දෘෂ්ටිහු අනිත්‍යයහ ප්‍රත්‍යයන් විසින් කරන ලද්දාහු ය, ප්‍රතීත්‍යසමුත්පන්නාහ, ක්ෂයවන සුල්ලහ, නැසෙන සුල්ලහ, නො රැඳෙන සුල්ලහ, නිරුද්ධවන සුල්ලහ'යි දෘෂ්ටීන්හි ආදීනව දක්නෙම් දෘෂ්ටි නො ගන්මි, නො දහමි නො පිවිසෙමි; නොහොත් නො ගතයුත්තාහු යැ පරාමර්ශ නො කළ යුත්තාහු යැ අභිනිවෙශ නො කළයුත්තාහු නුයි මෙසේ ත් 'පසඞ්ඛාය දිට්ඨීසු අනුග්ගහාය' යනු වේ.

**අජ්ඣත්තසන්තිං පචිනං අදස්සන්ති** – 'අජ්ඣත්තසන්ති'න්ති අජ්ඣත්තං රාගස්ස සන්තිං දොසස්ස සන්තිං මොහස්ස සන්තිං කොධස්ස – උපනාහස්ස මක්ඛස්ස – පළාසස්ස – ඉස්සාය – මච්ඡරියස්ස – මායාය – සාඨෙය්‍යස්ස ථම්භස්ස – සාරම්භස්ස – මානස්ස – අතිමානස්ස – මදස්ස – පමාදස්ස – සබ්බකිලෙසානං – සබ්බදුච්චරිතානං – සබ්බදරථානං – සබ්බපරිළාහානං – සබ්බසන්තාපානං – සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තිං උපසන්තිං වූපසන්තිං නිබ්බුතිං පටිප්පස්සද්ධිං; **පචිනන්ති** – පචිනන්තො විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තො; 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති පචිනන්තො විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තො; 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා' ති –පෙ– 'සබ්බෙ ධම්මා අනත්තා'ති පචිනන්තො විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභූතං කරොන්තො; 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්ම'න්ති පචිනන්තො විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තො; **අදස්සන්ති** – අදස්සං[1] අද්දක්ඛිං අපස්සිං පටිවිජ්ඣින්ති 'අජ්ඣත්තසන්තිං පචිනං අදස්සං.'

තෙනාහ භගවා:

"ඉදං වදාමීති න තස්ස හොති ('මාගන්දියා'ති භගවා)
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය
අජ්ඣත්තසන්තිං පචිනං අදස්ස"න්ති.

**9 - 4**

විනිච්ඡයා යානි පකප්පිතානි (ඉති මාගන්දියො)
තෙ වෙ මුනි බ්‍රෑසි අනුග්ගහාය,
අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං
කථන්නු ධීරෙහි පවෙදිතං තං.[2]

**විනිච්ඡයා යානි පකප්පිතානීති** – 'විනිච්ඡයා' වුච්චන්ති ද්වාසට්ඨි-දිට්ඨිගතානි; **පකප්පිතානීති** – කප්පිතා පකප්පිතා අභිසඞ්ඛතා සණ්ඨ-පිතාතිපි පකප්පිතානි; අථවා, අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා විපරිණාමධම්මාතිපි පකප්පිතානීති– විනිච්ඡයා යානි පකප්පිතානි; **ඉති මාගන්දියොති** – 'ඉතී'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතා නාමෙතං 'ඉතී'ති; **මාගන්දියොති** – තස්ස බ්‍රාහ්මණස්ස නාමං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරොති 'ඉති මාගන්දියො.'[3]

**තෙ වෙ මුනි බ්‍රෑසි අනුග්ගහාය අජ්ඣත්තසන්තීති යමෙතමත්ථන්ති**– 'තෙ වෙ' ති ද්වාසට්ඨිදිට්ඨිගතානි; **මුනීති** – මොනං වුච්චති ඤාණං –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනීති; **අනුග්ගහායාති** – දිට්ඨීසු ආදීනවං පස්සන්තො දිට්ඨියො න ගණ්හාමි න පරාමසාමි නාභිනිවිසාමීති ච භණසි අජ්ඣත්තසන්තීති ච භණසි; **යමෙතමත්ථන්ති** – යං පරමත්ථන්ති – 'තෙ වෙ මුනි බ්‍රෑසි අනුග්ගහාය අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං.'

1. අද්දසං - ස. 2. පවෙදිතන්ති - මනුප. 3. මාගන්දියොති - සීමු. II.

**අජ්ඣත්තසන්තිං පවිනං අද්දසං** - 'අජ්ඣත්තසන්තිං' යනු: අධ්‍යාත්මයෙහි රාගයාගේ සන්හිඳීම ද්වේෂයාගේ - මෝහයාගේ සන්හිඳීම ක්‍රෝධයාගේ - උපනාහ - මකුබව - පලාස - ඊර්ෂ්‍යා - මාත්සය්‍ය - මායා - සාඨෙය්‍ය - ස්තම්භ - සාරම්භ - මාන - අතිමාන - මද - ප්‍රමාදයාගේ - සියලු කෙලෙසුන්ගේ සියලු දුශ්චරිතයන්ගේ - සියලු දරථයන්ගේ - සියලු පරිදාහයන්ගේ සියලු සන්තාපයන්ගේ - සියලු අකුශලාභිසංස්කාරයන්ගේ ශාන්තිය ව්‍යුපශාන්තිය නිර්වෘතිය ප්‍රතිප්‍රශ්‍රබ්ධිය; **පවිනං** - (සිව්සස්) වඩමින් වෙසෙසින් වඩමින් ප්‍රකර්ෂයෙන් වඩමින් තුලනය කෙරෙමින් තීරණය කෙරෙමින් සලකමින් ප්‍රකට කෙරෙමින්; 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි...'සියලු සංස්කාරයෝ දුක්ඛ' යි...'සියලු ධර්මයෝ අනාත්මයෝ යැ'යි 'යම් කිසි සමුදයධර්මයෙක් වේ නම් ඒ සියල්ල නැසෙන සුලු යැ යි' වඩමින් වෙසෙසින් වඩමින් ප්‍රකර්ෂයෙන් වඩමින් තුලනය කෙරෙමින් තීරණය කෙරෙමින් විභාවනය කෙරෙමින් විභූත කෙරෙමින්; **අද්දසං**- දුක්කෙමි දිටිමි බැලූවෙමි (නුවණින්) ප්‍රතිවෙධ කෙළෙම් නුයි 'අජ්ඣත්තසන්තිං පවිනං අද්දසං' යනු' වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඉදං වදාමීති -පෙ- අජ්ඣත්තසන්තිං පවිනං අද්දසං"** යි.

**9 - 4**

(මාගන්දිය තෙම මෙසේ කීය:) විනිශ්චය කොට ගන්නා ලද යම් දෙසැට දෘෂ්ටිධර්ම කෙනෙක් ප්‍රකල්පිත වූවාහු ද, ඒ දෘෂ්ටිධර්මයන් සම්බන්ධ මුනි වූ නෙපි ඒකාන්තයෙන් නො ගෙන අධ්‍යාත්මශාන්ති යයි තෙල යම් අර්ථයක් වදාළහු ද, ධීරයන් විසින් ඒ පරමාර්ථය කෙසේ ප්‍රකාශ කරන ලද ද ?

**විනිච්ඡයා යානි පකප්පිතානි** - 'විනිච්ඡය' යී ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙත්. **පකප්පිතානි** - කල්පිත ප්‍රකල්පිත අභිසංස්කෘත වූවාහු මොනොවට පිහිටුවන ලද්දාහු නුයි 'පකප්පිත' නම් වෙති; නොහොත් අනිත්‍ය - සංස්කෘත - ප්‍රතීත්‍යසමුත්පන්න වූවාහු ක්ෂයවන සුලු නැසෙන සුලු නො ඇලෙන සුලු නිරුද්ධවන සුලු විපරිණාමස්වභාව ඇත්තාහු නුයි ද 'පකප්පිත' නුයි 'විනිච්ඡයා යානි පකප්පිතානි' යනු වේ. **ඉති මාගන්දියො**- 'ඉති' යනු: පදසන්ධි යැ පදසංසර්ග යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්විතා නමැ තෙල 'ඉති' යනු. 'මාගන්දියො' යනු ඒ බමුණුගේ නම යැ සංඛ්‍යා යැ සංඥා යැ ප්‍රඥප්ති යැ ව්‍යවහාරය නුයි 'ඉති මාගන්දියො' යනු වේ.

**තෙ වෙ මුනි බ්‍රූසි අනුග්ගහාය අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං**- 'තෙ වෙ' යනු: ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ යි. **මුනි** යනු: 'මොන' යී ඥානය කියනු ලැබෙයි ..(2-8 සූත්‍රනිර්දේශය.) **අනුග්ගහාය** - දෘෂ්ටීන්හි ආදීනව දක්මින් දෘෂ්ටි නො ගත්මි පරාමර්ශ නො කෙරෙමි අභිනිවෙශ නො කෙරෙමි ද කියවූ, අධ්‍යාත්මශාන්තිය'යි ද කියවූ; **යමෙතමත්ථං** - යම් පරමාර්ථයක් නුයි 'තෙ වෙ මුනි බ්‍රූසි අනුග්ගහාය අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං' යනු වේ.

**කථංනු ධීරෙහි පවෙදිතං තන්ති** – ‘කථංනූ’ති පදං සංසයපුච්ඡා විමතිපුච්ඡා ද්වෙළ්හකපුච්ඡා අනෙකංසපුච්ඡා, එවංනුඛො න නුඛො කිංනුඛො කථංනුඛොති කථංනු; **ධීරෙහීති** – ධීරෙහි පණ්ඩිතෙහි පඤ්ඤවන්තෙහි බුද්ධිමන්තෙහි ඤාණීහි විභාවීහි මෙධාවීහි; **පවෙදිතන්ති**– වෙදිතං පවෙදිතං ආවික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විහත්තං උත්තානීකතං පකාසිතන්ති ‘කථංනු ධීරෙහි පවෙදිතං තං’.

තෙනාහ සො බ්‍රාහ්මණො:

“විනිච්ඡයා යානි පකප්පිතානි (ඉති මාගන්දියො)
තෙ වෙ මුනී බ්‍රෑසි අනුග්ගහාය,
අජ්ඣත්තසන්තීති යමෙතමත්ථං
කථංනු ධීරෙහි පවෙදිතං ත”න්ති.

9 - 5

න දිට්ඨියා න සුතියා න ඤාණෙන (‘මාගන්දියා’ති භගවා)
සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,
අදිට්ඨියා අස්සුතියා අඤාණා[1]
අසීලතා අබ්බතා නොපි තෙන.
එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය
සන්තො අනිස්සාය භවං න ජප්පෙ.

**න දිට්ඨියා න සුතියා න ඤාණෙනාති** – දිට්ඨියාපි[2] සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි[3] න භණාමි[4] න දීපයාමි; න වොහරාමි සුතියාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි[5], න භණාමි,[6] න දීපයාමි[7] න වොහරාමි දිට්ඨියා සුතියාපි[8] සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි, න දීපයාමි, න වොහරාමි; ඤාණෙනාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි න දීපයාමි, න වොහරාමීති – න දිට්ඨියා න සුතියා න ඤාණෙන. **මාගන්දියාති භගවාති** – ‘මාගන්දියා’ති භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති; **භගවාති** – ගාරවාධිවචනං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං ‘භගවා’ති – ‘මාගන්දියාති භගවා.’

**සීලබ්බතෙනාපි න සුද්ධිමාහාති** – සීලෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි, න දීපයාමි, න වොහරාමි; වතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි, න දීපයාමි, න වොහරාමි; සීලබ්බතෙනාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං නාහ, න කථෙමි, න භණාමි, න දීපයාමි, න වොහරාමීති ‘සීලබ්බතෙනාපි න සුද්ධිමාහ.’

---

1. අස්සුතියා අඤ්ඤාණා – ස. මනුප. 2. දිට්ඨෙන – සීමු. II. දිට්ඨෙනාපි – මජසං. PTS.
3. කථෙසි – සබ්බත්ථ. 4. භණසි – සබ්බත්ථ. 5. කථෙසි – සීමු. II. PTS.
6. භණසි – සීමු. II. 7. දීපයසි. සීමු. II. 8. සුතෙනාපි – සබ්බත්ථ.

**කථංකථා ධීරෙහි පවෙදිතං තං** – යනු: 'කථංකථා' යන පදය සැක විචාරීම යැ විමතිපෘච්ඡා යැ විචිකිත්සාපෘච්ඡා යැ අනේකාන්තපෘච්ඡා යැ: මෙසේ දෝ හෝ, නො වේ දෝ හෝ, කිමෙක් දෝ හෝ, කෙසේ දෝ හෝ නුයි 'කථංකථා' යනු වේ. **ධීරෙහි** – ධීරයන් විසින් පණ්ඩිතයන් විසින් ප්‍රඥාවතුන් විසින් බුද්ධිමතුන් විසින් නුවණැතියන් විසින් විභාවීන් විසින් ප්‍රාඥයන් විසින්; **පවෙදිතං** – දක්නා ලද ප්‍රකාශ කරන ලද කියන ලද දෙසන ලද පනවන ලද තාපන ලද විභාග කරන ලද ප්‍රකට කරන ලද ප්‍රකාශ කරන ලද නුයි 'කථංකථා ධීරෙහි පවෙදිතං තං' යනු වේ.

එයින් කියැ ඒ බමුණු:

**"විනිච්ඡයා යානි -පෙ- පවෙදිතං තං"** යී.

### 9 - 5

(බුදුහු 'මාගන්දිය' යී මෙසේ වදාළහ:) මම් දෘෂ්ටියෙන් ශුද්ධිය නො කියමි. ශ්‍රැතියෙන් – සමාපත්තිඥනයෙන් – බාහිර ශීලව්‍රතයෙනු දු ශුද්ධිය නො කියමි. (දශවස්තුක) සම්‍යග්දෘෂ්ටියෙන් වෙත් වැ නවාඞ්ගශ්‍රැතියෙන් වෙත් වැ කර්මස්වකතා සත්‍යානුලෝමිකඥනයෙන් වෙත් වැ ප්‍රාතිමොක්ෂ-සංවරයෙන් වෙත් වැ ධුතාඞ්ගව්‍රතයෙන් වෙත් වැ ශුද්ධිය නො කියමි. ඒ සම්‍යග්දෘෂ්ට්‍යාදිමාත්‍රයකිනු දු නො කියමි. තවද තෙල දෘෂ්ටි ආදි ධර්මයන් දුරු කොට අදෘෂ්ටි ආදි ධර්මයන් අනුග්‍රහ කොට ශාන්ත තෙමේ (චක්ඛාදීන් අතුරෙන් කිසිවක්) නිඃශ්‍රය නො කොට කාමාදි භවය නො පතන්නට සමර්ථ වන්නේය.

**න දිට්ඨියා න සුතියා න ඤාණෙන** – දෘෂ්ටියෙන් ද ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය, **නාහ** – නො කියමි. නො බෙණෙමි. නො දක්වමි. නො වහරමි. ශ්‍රැතියෙනු දු ශුද්ධිය විශුද්ධිය පරි-ශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **නාහ** – නො කියමි, නො බෙණෙමි නො දක්වමි නො වහරමි. දෘෂ්ටිශ්‍රැතියෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **නාහ** – නො කියමි, නො බෙණෙමි නො දක්වමි නො වහරමි. සමාපත්තිඥනයෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **'නාහ'** නො කියමි. නො බෙණෙමි නො දක්වමි ව්‍යවහාර නො කෙරෙමි නුයි 'න දිට්ඨියා න සුතියා න ඤාණෙන' යනු වේ. **මාගන්දියාති භගවා** – 'මාගන්දිය' යී බුදුහු ඒ බමුණා නමින් ආමන්ත්‍රණය කෙරෙති. **භගවා** – යනු: ගෞරවාධිවචන යැ...මෙ 'භගවා' යනු සියලු ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් නුයි 'මාගන්දියාති භගවා' යනු වේ.

**සීලබ්බතෙනාපි න සුද්ධිමාහ** – ශීලයෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය **නාහ** – නො කියමි නො බෙණෙමි නො දක්වමි නො වහරමි. ව්‍රතයෙනු දු ශුද්ධිය...පරිමුක්තිය 'නාහ' නො කියමි නො බෙණෙමි නො දක්වමි නො වහරමි. ශීලව්‍රතයෙනු දු ශුද්ධිය...පරිමුක්තිය 'නාහ' නො කියමි නො බෙණෙමි නො දක්වමි නො වහරමි නුයි 'සීලබ්බතෙනාපි න සුද්ධිමාහ' යනු වේ.

**අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙනාති**- දිට්ඨිපි[1] ඉච්ඡිතබ්බා දසවත්ථුකා සම්මාදිට්ඨි: අත්ථි දින්නං, අත්ථි යිට්ඨං, අත්ථි හුතං, අත්ථි සුකතදුක්කටානං කම්මානං ඵලං විපාකො, අත්ථි අයං ලොකො, අත්ථි පරො ලොකො, අත්ථි මාතා, අත්ථි පිතා, අත්ථි සත්තා ඔපපාතිකා, අත්ථි ලොකෙ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිපන්නා යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙන්තීති. සවණම්පි ඉච්ඡිතබ්බං පරතොඝොසො: සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. ඤාණම්පි ඉච්ඡිතබ්බං: කම්මස්සකතං ඤාණං, සච්චානුලොමිකං ඤාණං, අභිඤ්ඤාඤාණං සමාපත්තියා ඤාණං. සීලම්පි ඉච්ඡිතබ්බං: පාතිමොක්ඛසංවරො. වතම්පි ඉච්ඡිතබ්බං අට්ඨ ධුතඞ්ගානි: ආරඤ්ඤිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පංසුකූලිකඞ්ගං තෙචීවරිකඞ්ගං සපදානචාරිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං යථාසන්ථතිකඞ්ගන්ති- අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා. **නොපි තෙනාති** - නාපි සම්මාදිට්ඨිමත්තෙන නාපි සවණමත්තෙන නාපි ඤාණමත්තෙන නාපි සීලමත්තෙන නාපි වතමත්තෙන අජ්ඣත්තසන්තිං පත්තො හොති. නපි විනා එතෙහි ධම්මෙහි අජ්ඣත්තසන්තිං පාපුණාති. අපිච, සම්භාරා ඉමෙ ධම්මා හොන්ති අජ්ඣත්තසන්තිං පාපුණිතුං අධිගන්තුං ඵුසිතුං[2] සච්ඡිකාතුන්ති 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙන.'

**එතෙ ච නිස්සජ්ජ අනුග්ගහායාති** - 'එතෙ'ති කණ්හපක්ඛිකානං ධම්මානං සමුග්ඝාතතො පහානං ඉච්ඡිතබ්බං, තෙධාතුකෙසු කුසලෙසු ධම්මෙසු අතම්මයතා[3] ඉච්ඡිතබ්බා, යතො කණ්හපක්ඛියා ධම්මා සමුග්ඝාතපහානෙන පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[4] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තෙධාතුකෙසු ච කුසලෙසු ධම්මෙසු අතම්මයතා හොති. එත්තාවතාපි න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසති. අථවා, න ගණ්හිතබ්බා න පරාමසිතබ්බා නාභිනිවිසිතබ්බාති එවම්පි- 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය.' යතො තණ්හා ච දිට්ඨි ච මානො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[4] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා[5], එත්තාවතාපි න ගණ්හාති න පරාමසති නාභිනිවිසතීති එවම්පි - 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය.' යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතාපි න ගණ්හාති න පරාමසති නාභිනිවිසතීති එවම්පි- 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය.'

---

1. දිට්ඨි - සීමු. II. 2. ඵස්සිතුං - මජසං. 3. අකම්මයතා - සීමු. II.
4. තාලවත්ථුකතා - ස. 5. අනුප්පාදධම්මාති - සීමු. II. මජසං.

**අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නො'පි තෙන** – 'දෙන ලද්දෙහි ඵල ඇත, යදන ලද්දෙහි ඵල ඇත, පුදන ලද්දෙහි ඵල ඇත, කුශලාකුශලකර්මයන්ගේ ඵල විපාක ඇත, මෙලොව ඇත, පරලොව ඇත' මවු ඇත, පියා ඇත, ඕපපාතික සත්ත්වයෝ ඇත්තාහ. මෙලොවත් පරලොවත් තුමූ මැ නුවණින් දැන ප්‍රකාශ කරන සම්‍යග්ගත වූ සම්‍යක්-ප්‍රතිපන්න වූ ශ්‍රමණබ්‍රාහ්මණයෝ ලොකයෙහි ඇත්තාහ' යන දශවස්තුක සම්‍යග්දෘෂ්ටි සඞ්ඛ්‍යාත දෘෂ්ටිය ද කැමැති විය යුත්තීය.' සූත්‍ර යැ ගෙය්‍ය යැ වෙය්‍යාකරණ යැ ගාථා යැ උදාන යැ ඉතිවුත්තක යැ ජාතක යැ අබ්භූතධම්ම යැ වෙදල්ල යැ යන (නවාඞ්ගවශයෙන්) පරතොඝොෂ සඞ්ඛ්‍යාත ශ්‍රවණය ද කැමැති වියයුතු යැ. කර්මස්වකතාඥානය යැ සත්‍යානු-ලොමිකඥානය යැ අභිඥාඥානය යැ සමාපත්තිඥානය යැ යන ඥානය ද කැමැති විය යුතු යැ. ප්‍රාතිමොක්ෂසංවර සඞ්ඛ්‍යාත ශීලය ද කැමැති විය යුතු යැ. ආරණ්‍යකාඞ්ග යැ පිණ්ඩපාතිකාඞ්ග යැ පාංශුකූලිකාඞ්ග යැ තෙචීවරිකාඞ්ග යැ සපදානචාරිකාඞ්ග යැ ඛලුපච්ඡාභත්තිකාඞ්ග යැ නෙසජ්ජිකාඞ්ග යැ යථාසන්ථතිකාඞ්ග යැ යන අෂ්ට ධුතාඞ්ගසඞ්ඛ්‍යාත ව්‍රතය ද කැමැති වියයුත්තේ නුයි 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා' යනු වේ. **නො පි තෙන** – නො ද සම්‍යග්දෘෂ්ටිමාත්‍රයෙන් නො ද ශ්‍රවණ මාත්‍රයෙන් නො ද ඥානමාත්‍රයෙන් නො ද ශීලමාත්‍රයෙන් නො ද ව්‍රතමාත්‍රයෙන් අධ්‍යාත්මශාන්තියට පැමිණියේ වෙයි. තෙල ධර්මයන්ගෙන් වෙන් වැ අධ්‍යාත්මශාන්තියට නො ද පැමිණෙයි. තවද මේ ධර්මයෝ අධ්‍යාත්ම-ශාන්තියට පැමිණෙන්නට අධිගම කරන්නට ස්පර්ශ කරන්නට ප්‍රත්‍යක්ෂ කරන්නට උපකාර වූවාහු වෙත් නුයි 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නො 'පි තෙන' යනු වේ.

**එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය** – 'එතෙ' යනු: කෘෂ්ණපක්ෂයෙහි වූ ධර්මයන්ගේ නැසීමෙන් ප්‍රහාණය කැමැති වියයුතුය; තුන්බිමට අයත් කුශලධර්මයන්හි තෘෂ්ණා රහිත බව කැමැති වියයුතුය; යම් තැනෙක පටන් කෘෂ්ණපක්ෂයෙහි වූ ධර්මයෝ සමුච්ඡෙද ප්‍රහාණයෙන් ප්‍රහීණ වූවාහු උදුන්මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා පියවි ඇත්තාහු වෙත් ද, ත්‍රෛධාතුකකුශල-ධර්මයන්හි ද තෘෂ්ණා රහිත බව වේ ද, මෙතෙකින් ද ග්‍රහණය නො කෙරෙයි, පරාමර්ශ නො කෙරෙයි, අභිනිවෙශ නො කෙරෙයි. නොහොත් නො ගතයුත්තාහු නො දැහියයුත්තාහු නො පිවිසියැ යුත්තාහු වෙත් නුයි-මෙසේ ත් 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය' යනු වේ. යම් තැනෙක පටන් තෘෂ්ණාවත් දෘෂ්ටියත් මානයත් ප්‍රහීණ වූවාහු උදුන්මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා පියවි ඇත්තාහු වෙත් ද, මෙතෙකින් ද ග්‍රහණ – පරාමර්ශ-අභිනිවෙශ නො කෙරේ නුයි – මෙසේ ත් 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය' යනු වේ. යම් තැනෙක පටන් පුණ්‍යාභිසංස්කාරයත් අපුණ්‍යාභිසංස්කාරයත් ආනෙඤ්ජාභිසංස්කාරයත් ප්‍රහීණ වූවාහු උදුන්මුල් ඇත්තාහු අනභාවය කරන ලද්දාහු මත්තෙහි අනුත්පාදස්වභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින්ද ග්‍රහණ – පරාමර්ශ – අභිනිවෙශ නො කෙරේ නුයි – මෙසේත් 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය' යනු වේ.

**සන්තො අනිස්සාය භවං න ජප්පෙති** - 'සන්තො'ති රාගස්ස සමිතත්තා සන්තො, දොසස්ස සමිතත්තා සන්තො, මොහස්ස සමිතත්තා සන්තො, කොධස්ස - උපනාහස්ස - මක්ඛස්ස - පළාසස්ස - ඉස්සාය - මච්ඡරියස්ස - මායාය - සාඨෙය්‍යස්ස - ථම්භස්ස - සාරම්භස්ස - මානස්ස - අතිමානස්ස - මදස්ස - පමාදස්ස - සබ්බකිලෙසානං - සබ්බදුච්චරිතානං - සබ්බදරථානං - සබ්බපරිළාහානං - සබ්බසන්තාපානං - සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා[1] පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති 'සන්තො'. **අනිස්සායාති** - ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච -පෙ- අයං තණ්හානිස්සයො -පෙ- අයං දිට්ඨිනිස්සයො. තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සාය සොතං අනිස්සාය ඝානං අනිස්සාය ජිව්හං අනිස්සාය කායං අනිස්සාය මනං අනිස්සාය රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ ධම්මෙ කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අනිස්සාය අගණ්හිත්වා අපරාමසිත්වා අනභිනිවිසිත්වාති - 'සන්තො අනිස්සාය.' **භවං න ජප්පෙති** - කාමභවං න ජප්පෙය්‍ය, රූපභවං න ජප්පෙය්‍ය, අරූපභවං න ජප්පෙය්‍ය, නප්පජප්පෙය්‍ය, න අභිජප්පෙය්‍යාති - 'සන්තො අනිස්සාය භවං න ජප්පෙ.'

තෙනාහ භගවා:

"න දිට්ඨියා න සුතියා[2] න ඤාණෙන ('මාගන්දියා'ති භගවා)
සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,
අදිට්ඨියා අස්සුතියා අඤාණා
අසීලතා අබ්බතා නොපි තෙන.
එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය
සන්තො අනිස්සාය භවං න ජප්පෙ"ති.

**9 - 6**

**නො චෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන**
**(ඉති මාගන්දියො)**
**සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,**
**අදිට්ඨියා අස්සුතියා අඤාණා**
**අසීලතා අබ්බතා නොපි තෙන.**
**මඤ්ඤාමහං මොමූහමෙව ධම්මං**
**දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං.**

---

1. විහතත්තා - මු. II. 2. නස්සුතියා - සීමු. I. සීමු. II.

**සන්තො අනිස්සාය භවං න ජප්පෙ** - 'සන්තො' යනු: රාගය සන්හිඳු වන ලද බැවින් ශාන්ත යැ ද්වෙෂය ශමිත වන බැවින් ශාන්ත යැ මොහය ශමිත වන බැවින් ශාන්ත යැ, ක්‍රොධය - උපනාහය - මක්‍ඛය - පලාසය- ඊර්ෂ්‍යාව - මාත්සර්‍ය්‍යය - මායාව - සාඨෙය්‍යය - ථම්භය - සාරම්භය - මානය- අතිමානය - මදය - ප්‍රමාදය - සර්වක්ලෙශයන්- සර්වදුශ්චරිතයන්-සර්වදරථයන් සර්වපරිදාහයන් - සර්වසන්තාපයන් - සර්වාකුශලාභිසංස්කාරයන් ශාන්තවන බැවින් ශමිත වන බැවින් ව්‍යුපශමිත වන බැවින් දවන ලද බැවින් නිවන ලද බැවින් දුරුව ගිය බැවින් වෙසෙසින් නසන ලද බැවින් ශාන්ත වූයේ උපශාන්ත වූයේ වෙසෙසින් උපශාන්ත වූයේ නිවුණේ වෙසෙසින් නසන ලදුයේ නුයි 'සන්තො' යනු වේ. **අනිස්සාය** - තෘෂ්ණානිශ්‍ශ්‍රය ද දෘෂ්ටිනිශ්‍ශ්‍රය දැයි නිශ්‍ශ්‍රය...දෙකෙකි; තෘෂ්ණානිශ්‍රය හැර දෘෂ්ටිනිශ්‍රය දුරලා චක්‍ෂුස්ප්‍රසාදය නො නිසා ශ්‍රොත්‍රප්‍රසාදය නිශ්‍රය නො කොට ඝ්‍රාණප්‍රසාදය නො නිසා ජිහ්වාප්‍රසාදය නො නිසා කායප්‍රසාදය නො නිසා මනඃප්‍රසාදය නො නිසා රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය - ධර්මයන්- කුලය - ගණයා - ආවාසය ලාභය - යශස - ප්‍රශංසාව - සුඛය - චීවරය - පිණ්ඩපාතය - සෙනසුන- ගිලන්පසබෙහෙත්පිරිකර - කාමධාතුව - රූපධාතුව - අරූපධාතුව -කාම- භවය - රූපභවය - අරූපභවය - සඤ්ඤාභවය - අසඤ්ඤාභවය - නෙව- සඤ්ඤානාසඤ්ඤාභවය - එකවොකාරභවය - චතුවොකාරභවය - පඤ්ච- වොකාරභවය - අතීතය - අනාගතය - ප්‍රත්‍යුත්පන්නය - දෘෂ්ටශ්‍රැතමුත විඥාතව්‍යධර්මයන් නිශ්‍රය නො කොට ග්‍රහණය නො කොට පරාමර්ශ නො කොට අභිනිවෙශ නො කොට නුයි - 'සන්තො අනිස්සාය' යනු වේ. **භවං න ජප්පෙ** - කාමභවය නො පතන්නේ යැ, රූපභවය නො පතන්නේ යැ, අරූපභවය නො පතන්නේ යැ, ප්‍රකර්ෂයෙන් නො පතන්නේ යැ, වෙසෙසින් නො පතන්නේ නුයි 'සන්තො අනිස්සාය භවං න ජප්පෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"න දිට්ඨියා න සුතියා -පෙ- සන්තො අනිස්සාය භවං න ජප්පෙ"**යි

**9 - 6**

(මාගණ්ඩිය තෙම මෙසේ කීය:) ඉදින් දෘෂ්ටියෙන් ශුද්ධිය නො කියවූ නම්, ශ්‍රැතියෙන් - සමාපත්තිඥානයෙන් - ශීලව්‍රතයෙනු දු නො කියවූ නම්, යළි දෘෂ්ටියෙන් වෙන් වැ ශ්‍රැතියෙන් වෙන් වැ ඥානයෙන් වෙන් වැ ශීලයෙන් වෙන් වැ ව්‍රතයෙන් වෙන් වැ ශුද්ධිය නො කියවූ නම්, ඒ දෘෂ්ට්‍යාදිමාත්‍රයෙනුදු නො කියවූ නම්, මම තොපගේ මේ ධර්මය අතිශයින් මූඪ වූවක් මැ කොට සිතමි. ඇතැම් මහණ බමුණු කෙනෙක් දෘෂ්ටියෙන් ශුද්ධිය කැමැති වෙත්.

**නො වෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙනාති** - දිට්ඨියාපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං 'නාහ, න කථෙසි, න භණසි, න දීපයසි, න වොහරසි. සුතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං - දිට්ඨසුතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං - ඤාණෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං 'නාහ න කථෙසි න භණසි න දීපයසි න වොහරසීති- 'නො වෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන.' **ඉති මාගන්දියොති**- 'ඉතී'ති පදසන්ධි -පෙ- **මාගන්දියොති** - තස්ස බ්‍රාහ්මණස්ස නාමං -පෙ- 'ඉති මාගන්දියො.'

**සීලබ්බතෙනාපි න සුද්ධිමාහාති** - සීලෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං -පෙ- වතෙනපි[1] සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං -පෙ- සීලබ්බතෙනපි සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං 'නාහ' න කථෙසි න භණසි න දීපයසි න වොහරසීති 'සීලබ්බතෙනාපි න සුද්ධිමාහ.'

**අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙනාති**- දිට්ඨිපි ඉච්ඡිතබ්බාති එවං භණසි; සවණම්පි ඉච්ඡිතබ්බන්ති එවං භණසි; ඤාණම්පි ඉච්ඡිතබ්බන්ති එවං භණසි; සීලම්පි ඉච්ඡිතබ්බන්ති එවං භණසි; වතම්පි ඉච්ඡිතබ්බන්ති එවං භණසි. න සක්කොසි එකංසෙන අනුජානිතුං න සක්කොසි එකංසෙන පටික්ඛිපිතුන්ති 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙන.'

**මඤ්ඤාමහං මොමූහමෙව ධම්මන්ති** - මොමූහධම්මො අයං තුය්හං බාලධම්මො මූළ්හධම්මො අඤ්ඤාණධම්මො අමරාවික්ඛෙපධම්මොති එවං මඤ්ඤාමි එවං ජානාමි එවං ආජානාමි එවං විජානාමි එවං පටිවිජානාමි එවං පටිවිජ්ඣාමීති 'මඤ්ඤාමහං මොමූහමෙව ධම්මං.'

**දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධින්ති** - දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති: "සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ"න්ති දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති. "අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ"න්ති දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්තීති 'දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං.'

තෙනාහ සො බ්‍රාහ්මණො:

"නො වෙ කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන (ඉති
මාගන්දියො)
සීලබ්බතෙනාපි න සුද්ධිමාහ,
අදිට්ඨියා අස්සුතියා අඤාණා
අසීලතා අබ්බතා නොපි තෙන,
මඤ්ඤාමහං මොමූහමෙව ධම්මං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධි"න්ති.

1. වතෙනපි - PTS.

**නො ච කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන** – දෘෂ්ටියෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය ‘නාහ’ තෙපි නො කියවූ, නො බණවූ, නො දක්වවූ, නො වහරවූ; ශ්‍රැතයෙනු දු ශුද්ධිය... පරිමුක්තිය...දෘෂ්ටිශ්‍රැතයෙනු දු ශුද්ධිය...පරිමුක්තිය...ඥානයෙනු දු ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය ‘නාහ’ නො කියවූ, නො බණවූ, නො දක්වවූ, නො වහරවූ නුසි ‘නො ච කිර දිට්ඨියා න සුතියා න ඤාණෙන’ යනු වේ. **ඉති මාගන්දියො** – ‘ඉති’ යනු: පදසන්ධි යැ... මාගන්දියො යනු: ඒ බමුණාගේ නම යැ...‘ඉති මාගන්දියො’ යනු වේ.

**සීලබ්බතෙනාපි න සුද්ධිමාහ** – ශීලයෙනු දු ශුද්ධිය...ව්‍රතයෙනු දු ශුද්ධිය... ශීලයෙන් හා ව්‍රතයෙනු දු ශුද්ධිය...පරිමුක්තිය ‘නාහ’ නො කියවූ, නො බණවූ, නො දක්වවූ, නො වහරවූ නුසි ‘සීලබ්බතෙනාපි න සුද්ධිමාහ’ යනු වේ.

**අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙන** – දෘෂ්ටියත් කැමැති වියයුතු ය’යි මෙසේ කියවූ, ශ්‍රවණයත් කැමැති වියයුතුය’යි මෙසේ කියවූ, ඥානයත් කැමැති වියයුතුයයි මෙසේ කියවූ, ශීලයත් කැමැති විය යුතුයයි මෙසේ කියවූ, ව්‍රතයත් කැමැති වියයුතුයයි මෙසේ කියවූ; එකාන්තයෙන් අනුඥා කරන්නට නො හැකියවූ, එකාන්ත-යෙන් ප්‍රතික්ෂෙප කරන්නටත් නො හැකියවූ නුසි ‘අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නො’පි තෙන’ යනු වේ.

**මඤ්ඤෙමහං මොමූහමෙව ධම්මං** – ‘මේ තොපගේ අතිමූඪධර්මයෙක බාලධර්මයෙක මූඪධර්මයෙක අඥානධර්මයෙක අමරාවික්ෂෙපධර්මයෙකැ’යි මෙසේ හඟිමි, මෙසේ දනිමි, මෙසේ හාත්පසින් දනිමි, මෙසේ වෙසෙසින් දනිමි, මෙසේ අවබොධ කෙරෙමි, මෙසේ ප්‍රතිවෙධ කෙරෙමි නුසි- ‘මඤ්ඤෙමහං මොමූහමෙව ධම්මං’ යනු වේ.

**දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං** – දෘෂ්ටියෙන් ඇතැම් මහණ බමුණු කෙනෙක් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පිළි-ගනිති: ‘ලොකය ශාශ්වත යැ මේ මැ සැබව, අන්‍යය මොඝයැ’යි දෘෂ්ටියෙන් ඇතැම් මහණබමුණෝ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පිළිගනිති; ‘ලොකය අශාශ්වත යැ,...සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි, මේ මැ සැබව, සෙස්ස මොඝයැ’යි දෘෂ්ටියෙන් ඇතැම් මහණබමුණෝ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පිළිගනිත් නුසි ‘දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං’ යනු වේ.

එයින් කී යැ ඒ බමුණු:

**“නො ච කිර දිට්ඨියා -පෙ- දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං”යි.**

**9 - 7**

දිට්ඨීඤ්ච[1] නිස්සාය අනුපුච්ඡමානො (මාගන්දියා'ති භගවා)
සමුග්ගහීතෙසු පමොහමාගතො[2],
ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං
තස්මා තුවං මොමූහතො දහාසි.

**දිට්ඨීඤ්ච[1] නිස්සාය අනුපුච්ඡමානොති** – මාගන්දියො බ්‍රාහ්මණො දිට්ඨිං නිස්සාය දිට්ඨිං පුච්ඡති, ලග්ගනං නිස්සාය ලග්ගනං පුච්ඡති, බන්ධනං නිස්සාය බන්ධනං පුච්ඡති, පලිබොධං නිස්සාය පලිබොධං පුච්ඡති; **අනුපුච්ඡමානොති** – පුනප්පුනං පුච්ඡතීති – 'දිට්ඨීඤ්ච නිස්සාය අනුපුච්ඡමානො.' **මාගන්දියාති** – භගවා තං බ්‍රාහ්මණං නාමෙන ආලපති; **භගවාති** – ගාරවාධිවචනං –පෙ– සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති – 'මාගන්දියාති භගවා.'

**සමුග්ගහීතෙසු පමොහමාගතොති** – යා සා දිට්ඨි තයා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තා, තායෙව ත්වං දිට්ඨියා මූළ්හොසි පමූළ්හොසි[3] සම්මූළ්හොසි[4] මොහං ආගතොසි පමොහං ආගතොසි සම්මොහං ආගතොසි අන්ධකාරං පක්ඛන්තොසීති[5] 'සමුග්ගහීතෙසු පමොහමාගතො.'

**ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤන්ති** – ඉතො අජ්ඣත්තසන්තිතො වා පටිපදාතො වා[6] ධම්මදෙසනාතො වා යුත්තසඤ්ඤං වා පත්තසඤ්ඤං වා ලක්ඛණසඤ්ඤං වා කාරණසඤ්ඤං වා ඨානසඤ්ඤං වා නප්පටිලභසි කුතො ඤාණන්ති එවම්පි – 'ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං.' අථවා, අනිච්චං වා අනිච්චසඤ්ඤානුලොමං වා, දුක්ඛං වා දුක්ඛසඤ්ඤානුලොමං වා, අනත්තං වා අනත්තසඤ්ඤානුලොමං වා, සඤ්ඤුප්පාදමත්තං වා සඤ්ඤානිමිත්තං වා නප්පටිලභසි, කුතො ඤාණන්ති එවම්පි – 'ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං.'

**තස්මා තුවං මොමූහතො දහාසීති** – 'තස්මාති' තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා මොමූහධම්මතො බාලධම්මතො මූළ්හධම්මතො අඤ්ඤාණධම්මතො අමරාවික්ඛෙපධම්මතො දහාසි පස්සසි දක්ඛසි ඔලොකෙසි නිජ්ඣායසි උපපරික්ඛසීති 'තස්මා තුවං මොමූහතො දහාසී'ති.

තෙනාහ භගවා:

"දිට්ඨීඤ්ච[7] නිස්සාය අනුපුච්ඡමානො ('මාගන්දියා'ති භගවා)
සමුග්ගහීතොසි පමොහමාගතො[8],
ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං
තස්මා තුවං මොමූහතො දහාසී"ති.

1. දිට්ඨිසු – සීමු. II. PTS.
2. පමොහමාග – සීමු. II. PTS. සම්මොහමාගතො – මනුප. පමොහමාගා – මජසං.
3. පමූළ්හො PTS. 4. සම්මූළ්හො – PTS. 5 පටිපත්තිතො – PTS.
6. පක්ඛන්ධොසීති – සීමු I. මනුප. පක්ඛන්දොසීති – මජසං. පක්ඛන්තොසීති – සහා. PTS.
7. දිඨිසු – සීමු. II. PTS. 8. පමොහමාග – සීමු. I., පමොහමාගා – මජසං. PTS.

9 – 7

(බුදුහු මංගන්දිය යි මෙසේ වදාරති:) දෘෂ්ටිය මැ නිශ්‍රය කොට (-නිසා) පුනපුනා විචාරනුයෙහි දැඩිව ගන්නා ලද දෘෂ්ටීන් කෙරෙහි ප්‍රකර්ෂමෝහයට පැමිණියෙහි යම් හෙයකින් තෝ මේ දහම්හි මඳ වූ සංඥාවකු දු නුදුටුයෙහි ද එහෙයින් අභිමුඛ වූවක් වශයෙන් දක්නෙහි.

**දිට්ඨිඤ්ච නිස්සාය අනුපුච්ඡමානො** – මාගන්දිය බමුණු දෘෂ්ටිය නිසා දෘෂ්ටිය විචාරයි, දෘෂ්ටිලග්නය නිසා (-එල්බගෙන) දෘෂ්ටිලග්නය විචාරයි, දෘෂ්ටිබන්ධනය නිසා දෘෂ්ටිබන්ධනය විචාරයි, දෘෂ්ටිපරිබෝධය නිශ්‍රය කොට දෘෂ්ටිපරිබෝධය විචාරයි; **අනුපුච්ඡමානො** – පුනපුනා විචාරනුයි 'දිට්ඨිඤ්ච නිස්සාය අනුපුච්ඡමානො' යනු වේ. **මාගන්දිය** යි බුදුහු ඒ බමුණා නමින් ආමන්ත්‍රණය කෙරෙති. **භගවා** යනු: ගෞරවාධිවචන යැ...මේ 'භගවා' යනු ප්‍රත්‍යක්ෂකරණයෙන් උපන් ප්‍රඥප්තියක් නුයි – 'මාගන්දියාති භගවා' යනු වේ.

**සමුග්ගහීතෙසු පමොහමාගතො** – තා විසින් යම් දෘෂ්ටියක් ගන්නා ලද්දී පරාමර්ශ කරන ලද්දී පිවිසැ ගන්නා ලද්දී දැඩි වැ ගන්නා ලද්දී අධිමුක්ත වූවා ද, තෝ ඒ දෘෂ්ටියෙන් මැ මූඪ වූයෙහි ප්‍රමූඪ වූයෙහි සම්මූඪ වූයෙහි මෝහයට පැමිණියෙහි ප්‍රමෝහයට පැමිණියෙහි සම්මෝහයට පැමිණියෙහි අඳුරට පිවිසියෙහි නුයි 'සමුග්ගහීතෙසු පමොහමාගතො' යනු වේ.

**ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං** – මේ අධ්‍යාත්මශාන්තියෙන් හෝ ප්‍රතිපදායෙන් හෝ ධර්මදේශනාවෙන් හෝ (මහණදම්හි) යුක්තසංඥාවක් හෝ ප්‍රාප්තසංඥාවක් හෝ ලක්ෂණසංඥාවක් හෝ කාරණසංඥාවක් හෝ හේතුසංඥාවක් හෝ නො ලබව, මාර්ගඥානය වැලින් කොයින් ලබවු දැ'යි මෙසේත් – 'ඉතො ච නාද්දක්ඛි අණුම්පි සඤ්ඤං' යනු වේ. නොහොත් අනිත්‍යය හෝ අනිත්‍යසංඥානුලෝමය හෝ දුඃඛය හෝ දුඃඛසංඥානුලෝමය හෝ අනාත්මය හෝ අනාත්මසංඥානුලෝමය හෝ සංඥෝත්පාදමාත්‍රයක් හෝ සංඥානිමිත්ත හෝ නො ලබව, මාර්ගඥානය කොයින් ලබවු දැ'යි මෙසේත් – 'ඉතො ච නාද්දක්ඛි අනුම්පි සඤ්ඤං' යනු වේ.

**තස්මා තුවං මොමූහතො දහාසි** – 'තස්මා' යනු: එහෙයින් එකරුණෙන් ඒ හේතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මොමූහධර්මයක් වශයෙන් බාලධර්මයක් වශයෙන් මූඪධර්මයක් වශයෙන් අඥානධර්මයක් වශයෙන් අමරාවික්ෂේපධර්මයක් වශයෙන් ගත්ව බලව දක්හි අවලෝකනය කෙරෙහි සිතව විමසව'යි 'තස්මා තුවං මොමූහතො දහාසි' යනු වේ.
එයින් වදාලහ බුදුහු:

**"දිට්ඨිං ච නිස්සාය -පෙ- මොමූහතො දහාසි"යි.**

9 - 8

සමො විසෙසී උදවා නිහීනො
යො මඤ්ඤති සො විවදෙථ තෙන,
තීසු විධාසු අවිකම්පමානො
සමො විසෙසීති න තස්ස හොති.

**සමො විසෙසී උදවා නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙනාති**- 'සදිසොහමස්මී'ති වා 'සෙය්‍යොහමස්මී'ති වා 'හීනොහමස්මී'ති වා, යො මඤ්ඤති, සො තෙන මානෙන තාය දිට්ඨියා තෙන වා පුග්ගලෙන කලහං කරෙය්‍ය භණ්ඩනං කරෙය්‍ය විග්ගහං කරෙය්‍ය විවාදං කරෙය්‍ය මෙධගං කරෙය්‍ය: "න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි, අහං ඉමං ධම්මවිනයං ආජානාමි. කිං ත්වං ඉමං ධම්මවිනයං ආජානිස්සසි ? මිච්ඡාපටිපන්නො ත්වමසි. අහමස්මි සම්මාපටිපන්නො. සහිතමෙම, අසහිතනෙත. පුරෙ වචනීයං පච්ඡා අවච. පච්ඡා වචනීයං පුරෙ අවච. ආචිණ්ණන්තෙ[1] විපරාවත්තං. ආරොපිතො තෙ වාදො. නිග්ගහිතොසි. චර වාදප්පමොක්ඛාය. නිබ්බෙඨෙහි සචෙ පහොසී' ති - සමො විසෙසී උදවා නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙන.

**තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොතීති**- යස්සෙතා තිස්සො විධා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො තීසු විධාසු න කම්පති න විකම්පති; අවිකම්පමානස්ස පුග්ගලස්ස 'සදිසොහමස්මී'ති වා 'සෙය්‍යොහමස්මී'ති වා 'හීනො හමස්මී'ති වා; **න තස්ස හොතීති** න මය්හං හොතීති -තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොති.

තෙනාහ භගවා:

"සමො විසෙසී උදවා නිහීනො
යො මඤ්ඤති සො විවදෙථ තෙන,
තීසු විධාසු අවිකම්පමානො
සමො විසෙසීති න තස්ස හොතී"ති.

9 - 9

සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය
මුසාති වා සො විවදෙථ කෙන,
යස්මිං සමං විසමං චාපි නත්ථි
ස කෙන වාදං පටිසංයුජෙය්‍ය[2].

1. අභිචිණ්ණන්තෙ - මු II. මජසං. 2. පටිසඤ්ඤුජෙය්‍ය - මනුප.

9 - 8

යමෙක් '(මම) සම වෙමි, හෝ විශිෂ්ට වෙමි, හෝ නොහොත් හීන වෙමි' මාන කෙරේ නම්, හෙතෙම ඒ මානයෙන් හෝ දෘෂ්ටියෙන් හෝ පුද්ගලයා සමග හෝ විවාද කරන්නේ යැ. (යමෙක් ඒ) ත්‍රිවිධ මානයෙහි නො සැලෙනුයේ වේ නම්, ඒ මට 'සම වෙමි හෝ විශිෂ්ට වෙමි' (මානය) නො වේ.

**සමො විසෙසී උදවා නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙන**- 'මම් සදෘශ වෙමි' හෝ 'මම් ශ්‍රෙෂ්ඨ වෙමි' හෝ 'මම් හීන වෙමි' හෝ යමෙක් හඟනේ නම් හෙතෙම ඒ මානයෙන් හෝ ඒ දෘෂ්ටියෙන් හෝ 'ඒ පුද්ගලයා සමග හෝ කලහ කරන්නේ යැ, ඛබර කරන්නේ යැ, විග්‍රහ කරන්නේ යැ, විවාද කරන්නේ යැ, අරගල කරන්නේ යැ: 'තෙපි මේ ධම්මවිනය නො දන්නහු යැ, මෙ ධම්මවිනය මම් දනිමි, කිමැ තෙපි මේ ධම්මවිනය දන්නහු ද? තෙපි වරදවා පිළිපන්නහු යැ, මම් සම්‍යක්-ප්‍රතිපන්නයෙමි, මාගේ බස අර්ථසංහිත යැ, තාගේ බස අනර්ථසංහිත යැ' පළමු කියැයුත්ත පසුව කීයෙහි, පසුව කියැයුත්ත පළමු කීයෙහි, තා පුහුණු කළ දෙය නැවැතිණ, තට වාදාරෝපණය කරන ලද, නිග්‍රහ කරන ලදුයෙහි, වාදයෙන් ගැලැවෙනු සඳහා පිළිතුරු සොයා යව, ඉදින් පොහොසත්හි නම් (තමා) මුදා ගතැ'යි (විවාද කරන්නේ නුයි) 'සමො විසෙසී උදවා නිහීනො යො මඤ්ඤති සො විවදෙථ තෙන' යනු වේ.

**තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොති**- යමක්හට තෙල ත්‍රිවිධමානයෝ ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු (මාර්ගයෙන්) නසන ලද්දාහු උපතට අභව්‍ය වූවාහු නුවණ ගින්නෙන් දවන ලද්දාහු වෙත් ද; හෙතෙම තුන් මානයන්හි නො සැලෙයි, වෙසෙසින් නො සැලෙයි, නො සැලෙන පුද්ගලයාහට 'මම් සදෘශ වෙමි' හෝ 'මම් ශ්‍රෙෂ්ඨ වෙමි' හෝ 'මම් හීන වෙමි' හෝ- **න තස්ස හොති** - මට නො වේ නුයි 'තීසු විධාසු අවිකම්පමානො සමො විසෙසීති න තස්ස හොති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සමො විසෙසී -පෙ- න තස්ස හොති"**යි.

9 - 9

ඒ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙම (මෙය මැ) සැබැවැයි කවර වස්තුවක් (හෝ කුමන කරුණෙකින්) කියන්නේ ද, හෙතෙම (තා කියන්නේ) මෘෂා යැයි හෝ කවර මානයකින් (දෘෂ්ටියකින් හෝ පුද්ගලයකු හා සමග) විවාද කරන්නේ ද, යමක්හු කෙරෙහි සමමානය හෝ විෂමමානය හෝ නැද්ද, හෙතෙම කවර මානයකින් වාදයෙහි යෙදෙන්නේ ද.

**සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍යාති** – ‘බ්‍රාහ්මණො’ති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො -පෙ- අසිතො තාදී[1] පවුච්චතෙ ස බ්‍රහ්මා; **සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍යාති** ‘සස්සතො ලොකො, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති බ්‍රාහ්මණො කිං වදෙය්‍ය? කිං කථෙය්‍ය? කිං භණෙය්‍ය? කිං වොහරෙය්‍ය? ‘අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ’න්ති බ්‍රාහ්මණො කිං වදෙය්‍ය? කිං කථෙය්‍ය? කිං භණෙය්‍ය? කිං දීපයෙය්‍ය? කිං වොහරෙය්‍ය වාති ‘සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය.’

**මුසාති වා සො විවදෙථ කෙනාති** – බ්‍රාහ්මණො ‘මය්හංව සච්චං, තුය්හං මුසා’ති කෙන මානෙන කාය දිට්ඨියා කෙන වා පුග්ගලෙන කලහං කරෙය්‍ය? භණ්ඩනං කරෙය්‍ය? විග්ගහං කරෙය්‍ය? විවාදං කරෙය්‍ය? මෙධගං කරෙය්‍ය: ‘න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි[2] වා සචෙ පහොසී’ති – මුසාති වා සො විවදෙථ කෙන.

**යස්මිං සමං විසමං වාපි නත්ථීති** – ‘යස්මි’න්ති යස්මිං පුග්ගලෙ අරහන්තෙ ඛීණාසවෙ ‘සදිසොහමස්මී’ ති මානො නත්ථි, ‘සෙය්‍යො හමස්මී’ති අතිමානො නත්ථි; ‘හීනොහමස්මී’ති ඔමානො නත්ථි, න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති – යස්මිං සමං විසමං වාපි නත්ථි.

**ස කෙන වාදං පටිසංයුජෙය්‍යාති** – සො කෙන මානෙන කාය දිට්ඨියා කෙන වා පුග්ගලෙන වාදං පටිසංයුජෙය්‍ය, පටිවරෙය්‍ය, කලහං කරෙය්‍ය, භණ්ඩනං කරෙය්‍ය, විග්ගහං කරෙය්‍ය, විවාදං කරෙය්‍ය, මෙධගං කරෙය්‍ය: ‘න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී’ති – ස කෙන වාදං පටිසංයුජෙය්‍ය.

තෙනාහ භගවා:

“සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය
මුසාති වා සො විවදෙථ කෙන,
යස්මිං සමං විසමං වාපි නත්ථි
ස කෙන වාදං පටිසංයුජෙය්‍යා”ති.

## 9 – 10

ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න[3] විග්ගය්හ ජනෙන කයිරා[4].

1. අසිතො අතාදි – සයා. 2. නිබ්බෙධෙහි – සයා. මජසං.
1. කථන්නු – මු. II. 2. කාරියා – මජසං.

**සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය** – 'බ්‍රාහ්මණො' යනු: සප්තධර්ම කෙනකුත් බාහිත වන බැවින් බ්‍රාහ්මණ යැ...(4-3 නිද්දේශය) **සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය** – 'ශාශ්වත යැ ලොකය, මෙ මැ සැබව, අන්‍යය මොස යැ' යි බ්‍රාහ්මණ තෙමේ කිම කියන්නේ ද ? පවසන්නේ ද ? බණන්නේ ද ? දක්වන්නේ ද? කිම වහරන්නේ ද ? 'අශාශ්වත යැ ලොකය...සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මෙ මැ සැබව, අන්‍යය මොස යැ'යි බ්‍රාහ්මණ තෙමේ කිම පවසන්නේ ද ? කියන්නේ ද ? බණන්නේ ද ? දක්වන්නේ ද කිම වහරන්නේ ද ? එයින් 'සච්චන්ති සො බ්‍රාහ්මණො කිං වදෙය්‍ය' යනු වේ.

**මුසාති වා සො විවදෙථ කෙන** – බාහිතපාපී බ්‍රාහ්මණ තෙම 'මා කියන්නක් මැ සැබව තාගේ බස මෘෂා යැ'යි කවර මානයකින් කවර දෘෂ්ටියකින් හෝ කවර පුහුලක්හු සමග කලහ කරන්නේ ද, ඩබර විග්‍රහ – විවාද – අරගල කරන්නේ ද; 'තෝ මේ ධම්විනය නො දන්නෙහි..., ඉදින් පොහොනෙහි නම් තමා මුදාගනැ'යි 'මුසාති වා සො විවදෙථ කෙන' යනු වේ.

**යස්මිං සමං විසමං වාපි නත්‍ථි** – 'යස්මිං' යනු: යම් අර්හත් ක්ෂීණාස්‍රව පුද්ගලයක්හු කෙරෙහි 'මම සදෘශ වෙමි' මානයෙක් නැත, මම ශ්‍රෙෂ්ඨයෙමි අතිමානයෙක් නැත, 'මම හීනයෙමි' අවමානයෙක් නැත, නො වෙයි විද්‍යමාන නො වෙයි නො ලැබෙයි, ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ වෙසෙසින් නසන ලද දුරලන ලද අභව්‍යොත්පත්තික යැ ඥානාග්නීන් දගධ නුයි 'යස්මිං සමං විසමං වා පි නත්‍ථි' යනු වේ.

**ස කෙන වාදං පටිසංයුජෙය්‍ය** – හෙතෙම කවර මානයකින් කවර දෘෂ්ටියකින් හෝ කවර පුද්ගලයක්හු සමග වාදයෙහි යෙදෙන්නේ ද, හැසිරෙන්නේ ද, කලහ කරන්නේ ද, ඩබර කරන්නේ ද, විග්‍රහ කරන්නේ ද, විවාද කරන්නේ ද, අරගල කරන්නේ ද: 'තෙපි මේ ධම්විනය නො දන්නවු යැ...ඉදින් සමර්ථයවු නම් තමා මුදාලව'යි 'ස කෙන වාදං පටිසංයුජෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“සච්චන්ති සො බ්‍රාහ්මණො -පෙ- වාදං පටිසංයුජෙය්‍යා”**යි.

## 9 – 10

(රූපනිමිත්තාදි නිකෙතයෙහි නො හැසිරෙන හෙයින්) අනිකෙතසාරී වූ ක්ෂීණාස්‍රව මුනි තෙම රූපවස්තුවාදි විෂයගොචරය – ඔකය හැරපියා ගම්හි ගිහිසන්ථවයන් නො කෙරෙමින් කාමයන් කෙරෙන් වෙන් වූයේ (මතු අත්බව්හි තෘෂ්ණාවශයෙන්) වට්ටය පෙරටු නො කරනුයේ ජනයා සමග විග්‍රාහිකකථාව නො කරන්නේ යි.

"අථ ඛො හාලිද්දකානි ගහපති යෙනායස්මා මහාකච්චානො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං මහාකච්චානං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො හාලිද්දකානි ගහපති ආයස්මන්තං මහාකච්චානං එතදවොච: 'වුත්තමිදං භන්තෙ කච්චාන, භගවතා අට්ඨකවග්ගියෙ[1] මාගන්දියපඤ්හෙ:

1. "ඔකං පහාය අනිකෙතසාරී
   ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
   කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
   කථං න[2] විග්ගය්හ ජනෙන කයිරා"ති.[a]

ඉමස්ස නු ඛො භන්තෙ කච්චාන! භගවතා සඞ්ඛිත්තෙන භාසිතස්ස කථං විත්ථාරෙන අත්ථො දට්ඨබ්බො?"ති.

"රූපධාතු ඛො ගහපති, විඤ්ඤාණස්ස ඔකො. රූපධාතුරාගවිනිබන්ධඤ්ච[3] පන විඤ්ඤාණං 'ඔකසාරී'ති වුච්චති. වෙදනාධාතු ඛො ගහපති – සඤ්ඤාධාතු ඛො ගහපති – සඞ්ඛාරධාතු ඛො ගහපති, විඤ්ඤාණස්ස ඔකො, සඞ්ඛාරධාතුරාගවිනිබන්ධඤ්ච පන විඤ්ඤාණං 'ඔකසාරී'ති වුච්චති. එවං ඛො ගහපති ඔකසාරී හොති.

කථඤ්ච ඛො ගහපති අනොකසාරී හොති? රූපධාතුයා ඛො ගහපති යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයූපාදානා[4] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[5] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා තථාගතො 'අනොකසාරී'ති වුච්චති. වෙදනාධාතුයා ඛො ගහපති – සඤ්ඤාධාතුයා ඛො ගහපති – සඞ්ඛාරධාතුයා ඛො ගහපති – විඤ්ඤාණධාතුයා ඛො ගහපති, යො ඡන්දො යො රාගො යා නන්දී යා තණ්හා යෙ උපයූපාදානා[3] චෙතසො අධිට්ඨානාභිනිවෙසානුසයා, තෙ තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා තථාගතො 'අනොකසාරී'ති වුච්චති. එවං ඛො ගහපති අනොකසාරී හොති.

කථඤ්ච ගහපති, නිකෙතසාරී හොති? රූපනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති 'නිකෙතසාරී'ති වුච්චති. සද්දනිමිත්ත-ගන්ධනිමිත්ත – රසනිමිත්ත – ඵොට්ඨබ්බනිමිත්ත – ධම්මනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති 'නිකෙතසාරී'ති වුච්චති. එවං ඛො ගහපති, නිකෙතසාරී හොති.

1. වග්ගිකෙ - සයා. මජසං. 2. කථ - සීමු. II.
3. විනිබන්ධඤ්ච - සයා. මජසං. 4. උපායුපාදානා - සබ්බත්ථ. 5. තාලවත්ථුකතා - ස.
a. සුත්තනිපාත - මාගන්දියසුත්ත ඛන්ධසංයුත්ත - නකුලපිතුවග්ග.

"එකල්හි හලිද්දකානි ගෘහපති තෙම ආයුෂ්මත් මහාකාත්‍යායනයන් වහන්සේ සමීපයට එළැඹ, ආයුෂ්මත් මහාකාත්‍යායනයන් වහන්සේට පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව හුන්නේය. එකත්පස් ව හුන් හලිද්දකානි ගෘහපති තෙම ආයුෂ්මත් මහාකාත්‍යායනයන් වහන්සේට මෙපවත් කීය: 'ස්වාමීනි, කාත්‍යායනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් අෂ්ටක-වර්ගයෙහි වූ මාගන්ධියප්‍රශ්නයෙහි මේ වදාරන ලද්දේය:

1. 'රූපවස්තවාදි විඥානයාගේ අවකාශ සඞ්ඛ්‍යාත ඔකය දුරු කොට අනිකේතසාරී වූ ක්ෂීණාශ්‍රව මුනි තෙම ගම්හි ගිහීන් හා සන්ථව නො කෙරෙමින් කාමයන් කෙරෙන් වෙන්වූයේ වට්ටය පෙරටු කොට නො සිටියේ ජනයා සමග විග්‍රාහික කථාව නො කරන්නේය'යි.

ස්වාමීනි, කාත්‍යායනයන් වහන්ස, භාග්‍යවතුන් විසින් සැකෙවින් වදාළ මේ භාෂිතයාගේ අර්ථය කෙසේ නම් විස්තරයෙන් දතයුත්තේ දැ"යි.

'ගෘහපතිය, රූපස්කන්ධය (කර්ම) විඥානයාගේ ඔක (=ප්‍රත්‍යය) වෙයි, තවද රූපධාතුයෙහි රාගයෙන් බැඳුණු කර්මවිඥානය ඔකසාරී (-ආලයෙහි හැසිරෙන සුලු) යැයි කියනු ලැබෙයි. ගෘහපතිය, වේදනාස්කන්ධය... සංඥාස්කන්ධය...ගෘහපතිය සංස්කාරස්කන්ධය කර්මවිඥානයාගේ ඔකය වෙයි, තවද සංස්කාරස්කන්ධයෙහි රාගයෙන් බැඳුණු කර්මවිඥානය 'ඔකසාරී' යයි කියනු ලැබේ. මෙසෙයින් ගෘහපතිය ඔකසාරී වේ.

තවද ගෘහපතිය, කිසෙයින් 'අනොකසාරී' වෙයි ද යත්? ගෘහපතිය, රූපස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් යම් (තෘෂ්ණා දෘෂ්ටි සඞ්ඛ්‍යාත) උපය කෙනෙක් හා (කාමාදි) උපාදාන කෙනෙක් අකුශල චිත්තයාගේ අධිෂ්ඨාන අභිනිවේශ අනුශය වූවාහු ද ඔවුහු තථාගතයන් විසින් ප්‍රහීණ කරන ලද්දාහු උපුත්මුල් කළාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත් ද, එහෙයින් සම්මාසම්බුදුහු 'අනොකසාරී' යයි කියනු ලැබෙති. ගෘහපතිය, වේදනාස්කන්ධයෙහි... සංඥාස්කන්ධයෙහි...සංස්කාරස්කන්ධයෙහි...ගෘහපතිය, විඥානස්කන්ධයෙහි යම් ඡන්දයෙක් යම් රාගයෙක් යම් නන්දියක් යම් තෘෂ්ණාවක් යම් උපය හා උපාදාන කෙනෙක් අකුසල් සිතට ආධාර නිවාස අනුශය වූවාහු නම් ඔවුහු සම්මාසම්බුදුන් විසින් ප්‍රහාණය කරන ලද්දාහු උපුටාහල මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තාහු වෙත් ද, එහෙයින් තථාගතයෝ 'අනොකසාරී' යයි කියනු ලැබෙත්. මෙසෙයින් ගෘහපතිය, අනොකසාරී වේ.

තවද ගෘහපතිය, කිසෙයින් නිකේතසාරී වෙයි ද යත්? රූපනිමිත්ත සඞ්ඛ්‍යාත නිකේතයෙහි (-රූප නමැති නිවාසයෙහි) පැතිරීම හා බැඳීම හේතු කොටගෙන 'නිකේතසාරී' යයි කියනු ලැබෙයි. ශබ්දනිමිත්ත... ගන්ධනිමිත්ත...රසනිමිත්ත . ස්ප්‍රෂ්ටව්‍යනිමිත්ත...ධර්මනිමිත්ත නමැති නිවාස යෙහි විසාරවිනිබන්ධ (-පැතිරීම ත් බැඳීම ත්) හේතු කොටගෙන 'නිකේතසාරී යයි කියනු ලැබේ. මෙසෙයින් ගෘහපතිය, නිකේතසාරී (-අරමුණෙහි වෙසෙනුයේ) වේ.

"කථඤ්ච ගහපති, අනිකෙතසාරී හොති? රූපනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති, තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා තථාගතො 'අනිකෙතසාරී'ති වුච්චති. සද්දනිමිත්ත - ගන්ධනිමිත්ත - රසනිමිත්ත - ඵොට්ඨබ්බනිමිත්ත - ධම්මනිමිත්තනිකෙතවිසාරවිනිබන්ධා ඛො ගහපති, තථාගතස්ස පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[1] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, තස්මා තථාගතො 'අනිකෙතසාරී'ති වුච්චති. එවං ඛො ගහපති, අනිකෙතසාරී හොති.

කථඤ්ච ගහපති, ගාමෙ සන්ථවජාතො හොති? ඉධ ගහපති, එකච්චො භික්ඛු ගිහීහි සංසට්ඨො විහරති: සහනන්දී සහසොකී, සුඛිතෙසු සුඛිතො, දුක්ඛිතෙසු දුක්ඛිතො, උප්පන්නෙසු කිච්චකරණීයෙසු අත්තනා වොයොගං ආපජ්ජති. එවං ඛො ගහපති! ගාමෙ සන්ථවජාතො හොති.

කථඤ්ච ගහපති, ගාමෙ න සන්ථවජාතො හොති? ඉධ ගහපති, එකච්චො භික්ඛු ගිහීහි අසංසට්ඨො විහරති: න සහනන්දී න සහසොකී න සුඛිතෙසු සුඛිතො, න දුක්ඛිතෙසු දුක්ඛිතො, උප්පන්නෙසු කිච්චකරණීයෙසු න අත්තනා වොයොගං ආපජ්ජති. එවං ඛො ගහපති! ගාමෙ න සන්ථවජාතො හොති.

කථඤ්ච ගහපති, කාමෙහි අරිත්තො හොති? ඉධ ගහපති, එකච්චො භික්ඛු කාමෙසු අවීතරාගො හොති අවිගත[2]ච්ඡන්දො අවිගතපෙමො අවිගතපිපාසො අවිගතපරිළාහො අවිගතතණ්හො. එවං ඛො ගහපති, කාමෙහි අරිත්තො හොති

කථඤ්ච ගහපති, කාමෙහි රිත්තො හොති? ඉධ ගහපති එකච්චො භික්ඛු කාමෙසු වීතරාගො හොති විගත[3]ච්ඡන්දො විගතපෙමො විගතපිපාසො විගතපරිළාහො විගතතණ්හො. එවං ඛො ගහපති! කාමෙහි රිත්තො හොති.

කථඤ්ච ගහපති, පුරෙක්ඛරානො හොති? ඉධ ගහපති, එකච්චස්ස භික්ඛුනො එවං හොති: 'එවංරූපො සියං අනාගතමද්ධාන'න්ති. තත්ථ නන්දිං සමන්නානෙති[4] 'එවංවෙදනො සියං - එවංසඤ්ඤො සියං - එවංසඞ්ඛාරො සියං - එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධාන'න්ති තත්ථ නන්දිං සමන්නානෙති. එවං ඛො ගහපති, පුරෙක්ඛරානො හොති.

1. තාලවත්ථුකතා - ස.
2. අවීත - සයා. මජසං. PTS.
3. වීත - සයා. මජසං. PTS.
4. සමන්නාගමෙති - සයා. PTS.

තවද ගෘහපතිය, කිසෙයින් **අනිකේතසාරී** වේ ද? යත්: ගෘහපතිය රූපනිමිත්තනිකේතයෙහි (කෙලෙසයන්ගේ) විසාරවිනිබන්ධයෝ තථාගතයන් විසින් ප්‍රහීණයෝ යෑ, නැසූ මුල් ඇත්තෝ යෑ, තාලවස්තුවක් මෙන් කරන ලද්දේ යෑ, නසන ලද්දේ යෑ, මතු නූපදනා පියවි ඇත්තෝ යෑ. එහෙයින් සම්මාසම්බුදුහු 'අනිකේතසාරී' යයි කියනු ලැබෙති. ශබ්දනිමිත්ත... ගන්ධනිමිත්ත....රසනිමිත්ත ..ස්ප්‍රෂ්ටව්‍යනිමිත්ත.....ගෘහපතිය, ධර්මනිමිත්තනිකේතයෙහි විසාරවිනිබන්ධයෝ තථාගතයන් විසින් ප්‍රහීණ කරන ලද්දාහුය... මත්තෙහි නූපදනා සවභාව ඇත්තාහුය. එහෙයින් සම්මාසම්බුදුහු අනිකේතසාරී යයි කියනු ලැබෙත්. මෙසෙයින් ගෘහපතිය, අනිකේතසාරී වේ

තවද ගෘහපතිය, කිසෙයින් ග්‍රාමයෙහි **සන්ථවජාත** වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් ගෘහීන් හා සංසෘෂ්ට වැ වෙසෙයි: එක් වැ සතුටු වෙයි, එක් වැ ශොක ඇත්තේ වෙයි, (දායකයන්) සුඛිත කල්හි (ගෘහශ්‍රිත සැපයෙන්) සුඛිත වෙයි, දුකට පැමිණි කල්හි දුකට පැමිණෙයි, උපන් කටයුතු ඇතිකල්හි තමා උපයොගයට (-කළ යුතුබවට) පැමිණෙයි. මෙසෙයින් ගෘහපතිය, ගම්හි හටගත් සන්ථව ඇත්තේ වේ.

තවද ගෘහපතිය, කෙසේ ගම්හි නූපන් **ගිහිසන්ථව** ඇත්තේ වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් ගිහීන් හා අසංසෘෂ්ට වූයේ වෙසෙයි: සමග සතුටු නො වන්නේ සමග ශොකී නො වන්නේ සුඛිත කල්හි සුඛිත නො වූයේ දුඃඛිත කල්හි දුඃඛිත නො වූයේ උපන් කටයුතු ඇති කල්හි තමා උපයොගයට නො පැමිණෙයි. මෙසෙයින් ගෘහපතිය, ගම්හි නූපන් ගිහිසන්ථව ඇත්තේ වේ.

යළි ගෘහපතිය, කිසෙයින් කාමයන් කෙරෙන් නො සිස් වූයේ වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි කිසි මහණෙක් වස්තුකාමයන්හි නො පහ වූ රාග ඇතියේ අවිගත වූ කාමච්ඡන්ද ඇතියේ අවිගත වූ ප්‍රෙම ඇතියේ අවිගත වූ පිපාසා ඇතියේ අවිගත වූ පරිදාහ ඇතියේ අවිගත වූ කාම-තෘෂ්ණා ඇතියේ වෙයි. මෙසෙයින් ගෘහපතිය, කෙලෙශකාමයන් කෙරෙන් අතුච්ඡ වේ.

තවද ගෘහපතිය, කිසෙයින් කාමයන් කෙරෙන් **රිත්ත** (-සිස්) වූයේ වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි කිසි මහණෙක් වස්තුකාමයන් කෙරෙහි පහවැගිය රාග ඇත්තේ විගත වූ කාමච්ඡන්ද ඇත්තේ විගත වූ පෙම ඇතියේ විගත වූ පිපාසා ඇතියේ විගත වූ පරිදාහ ඇතියේ විගත වූ තෘෂ්ණා ඇතියේ වෙයි. මෙසෙයින් ගෘහපතිය, කෙලෙශකාමයන් කෙරෙන් රිත්ත වූයේ වේ.

තවද ගෘහපතිය, කිසෙයින් වට්ටය පෙරටු කරන්නේ වේ ද? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණක් හට මෙබඳු සිතෙක් වෙයි: 'අනාගතකාලයෙහි මෙබඳු රූ ඇතියෙම් වෙම්වා'යි එහි තෘෂ්ණාව පිහිටුවයි මෙබඳු සැප වේදනා ඇතියෙම්...මෙබඳු සංඥා ඇතියෙම් . මෙබඳු සංස්කාර ඇතියෙම්...අනාගතකාලයෙහි මෙබඳු විඥාන ඇතියෙම් වෙම් වා'යි එහි ප්‍රාර්ථනාව පිහිටුවයි. මෙසෙයින් ගෘහපතිය, වට්ටය පෙරටු කරනුයේ වේ.

කථඤ්ච ගහපති, අපුරෙක්ඛරාණො හොති? ඉධ ගහපති, එකච්චස්ස භික්ඛුනො එවං හොති: 'එවංරූපො සියං අනාගතමද්ධාන'න්ති න තත්‍ථ නන්දිං සමන්නානෙති. 'එවංවෙදනො සියං - එවංසඤ්ඤො සියං - එවංසඞ්ඛාරො සියං - එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධාන'න්ති න තත්‍ථ නන්දිං සමන්නානෙති. එවං ඛො ගහපති, අපුරෙක්ඛරානො හොති.

කථඤ්ච ගහපති, කථං විග්ගය්හ ජනෙන කත්තා හොති? ඉධ ගහපති, එකච්චො භික්ඛු එවරූපං කථං කත්තා හොති: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති. එවං ඛො ගහපති, කථං විග්ගය්හ ජනෙන කත්තා හොති.

කථඤ්ච ගහපති, කථං න විග්ගය්හ ජනෙන කත්තා හොති? ඉධ ගහපති එකච්චො භික්ඛු න එවරූපං කථං කත්තා හොති: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති. එවං ඛො ගහපති, කථං න විග්ගය්හ ජනෙන කත්තා හොති. ඉති ඛො ගහපති, යන්තං වුත්තං භගවතා අට්ඨකවග්ගියෙ මාගන්දියපඤ්හෙ:

'ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න විග්ගය්හ ජනෙන කයිරා'ති.

ඉමස්ස ඛො ගහපති, භගවතා සංඛිත්තෙන භාසිතස්ස එවං විත්‍ථාරෙන අත්‍ථො දට්ඨබ්බො''ති.[a]

''ඔකං පහාය අනිකෙතසාරී
ගාමෙ අකුබ්බං මුනි සන්ථවානි,
කාමෙහි රිත්තො අපුරෙක්ඛරානො
කථං න විග්ගය්හ ජනෙන කයිරා''ති.

## 9 - 11

යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ
න තානි උග්ගය්හ වදෙය්‍ය[1] නාගො,
එලම්බුජං කණ්ටකං වාරිජං[2] යථා
ජලෙන පඞ්කෙන ච නූපලිත්තං.
එවං මුනී සන්තිවාදො අගිද්ධො
කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො.

**යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙති** - 'යෙහී'ති යෙහි දිට්ඨිගතෙහි; **විවිත්තොති** කායදුච්චරිතෙන රිත්තො විවිත්තො පවිවිත්තො; වචීදුච්චරිතෙන - මනො දුච්චරිතෙන - රාගෙන -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි රිත්තො විවිත්තො පවිවිත්තො; **විචරෙය්‍යාති** විචරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍ය; **ලොකෙති** මනුස්සලොකෙ -පෙ- ආයතනලොකෙති 'යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ.'

---

a. ඛන්ධසංයුත්ත - නකුලපිතුවග්ග.

1. වදෙය්‍ය - මජ්ඣප. 2. කණ්ටකවාරිජං - මජ්ඣං.

තවද ගෘහපතිය, කිසෙයින් වට්ටය නො පෙරටු කරනුයේ වේ ද ? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් හට මෙසේ සිතෙක් වෙයි: 'අනාගතකාලයෙහි මෙබඳු රූ ඇතියෙම් වෙම්වා'යි එහි ප්‍රාර්ථනාව නො පිහිටුවයි. මෙබඳු වෙදනා ඇතියෙම්...මෙබඳු සංඥා ඇතියෙම්...මෙබඳු සංස්කාර ඇතියෙම්...මෙබඳු විඥාන ඇතියෙම් වෙම්වා'යි එහි ප්‍රාර්ථනාව නො පිහිටුවයි. මෙසෙයින් ගෘහපතිය, සසරවට නො පෙරටු කරනුයේ වේ.

තවද ගෘහපතිය, කිසෙයින් ජනයා සමග විග්‍රාහිකකථාව කරන්නේ වේ ද ? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් මෙබඳු විවාද-කථාව කරන්නේ වෙයි: 'තෙපි මේ ධර්මවිනය නො දන්නවූ යෑ...ඉදින් සමර්ථ වූවහු නම් මිදෙව'යි. මෙසෙයින් ගෘහපතිය, ජනයා සමග විග්‍රාහික කථාව කරන්නේ වෙයි.

තවද ගෘහපතිය, කිසෙයින් ජනයා සමග විග්‍රහ නො කරන්නේ වේ ද ? යත්: ගෘහපතිය, මෙ සස්නෙහි ඇතැම් මහණෙක් මෙබඳු විවාදකථාව නො කරන්නේ වෙයි: 'තෙපි මේ ධර්මවිනය නො දන්නවූ යෑ......ඉදින් පොහොනවූ නම් (තමං දෙසින්) මුදාගනුවයි.' මෙසෙයින් ගෘහපතිය, ජනයා සමග විග්‍රාහික කථාව නො කරන්නේ වේ. ගෘහපතිය, මෙසේ භාග්‍යවතුන් විසින් අෂ්ටකවර්ගයෙහි වූ මාගන්දියප්‍රශ්නයෙහි '**ඔකං පහාය -පෙ- න විග්ගය්හ ජනෙන කයිරා**'යි යමක් වදාරන ලද්දේ නම්, ගෘහපතිය, භාග්‍යවත් බුදුන් විසින් සැකෙවින් වදාරන ලද මේ දෙශනාවෙහි විස්තරාර්ථය මෙසේ දතයුත්තේය'යි.

එයින් වදාළහ බුදුහු:

"**ඔකං පහාය -පෙ- න විග්ගය්හ ජනෙන කයිරා**"යි.

## 9 – 11

ක්ෂීණාස්‍රව නාග තෙම යම් දෘෂ්ටිගතාදියෙකින් වෙන් වූයේ ලොවැ හැසිරෙන්නේ ද, (හෙතෙම) ඒ දෘෂ්ටිගතයන් දැඩි වැ ගෙන නො කියන්නේ යෑ. එල සඞ්ඛ්‍යාත ජලයෙහි උපන් කටු සහිත දඬු ඇති පියුම දියෙන් හා කලලින් යම්සේ නො තැවැරුණේ ද, එසෙයින් අධ්‍යාත්මශාන්තිය ප්‍රකාශ කරන තෘෂ්ණා රහිත වූ ක්ෂීණාස්‍රව මුනි තෙම කාමයෙහි ද ලොකයෙහි ද නො ඇලුණේ වේ.

**යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ** –'යෙහි' යනු: යම් දෘෂ්ටිගතයන් ගෙන්; **විවිත්තො** – කායදුශ්චරිතයෙන් සිස් වූයේ වෙන් වූයේ ඉතා වෙන් වූයේ වාග්දුශ්චරිතයෙන්...මනොදුශ්චරිතයෙන්......රාගයෙන්...සියලු අකුශලාභි-සංස්කාරයන් කෙරෙන් රිත්ත – විවිත්ත – ප්‍රවිවිත්ත වූයේ; **විචරෙය්‍ය**– හැසිරෙන්නේය වෙසෙන්නේය ඉරියවු පවත්වන්නේය, රකෙන්නේය යැපෙන්නේය යාපනය වන්නේය; **ලොකෙ** – මිනිස් ලොවැ...ආයතන-ලොකයෙහි නුයි 'යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ' යනු වේ.

**න තානි උග්ගය්හ වදෙය්‍ය නාගොති** – ‘නාගො’ති ආගුං න කරොතීති නාගො, න ගච්ඡතීති නාගො, නාගච්ඡතීති නාගො. කථං ආගුං න කරොතීති නාගො? ආගු වුච්චන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා[1] දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

1. “ආගුං න කරොති කිඤ්චි ලොකෙ (සභියාති භගවා)
සබ්බසංයොගෙ විසජ්ජ බන්ධනානි,
සබ්බත්ථ න සජ්ජති විමුත්තො
නාගො තාදී පවුච්චතෙ[2], තථත්තා.”[a]

එවං ආගුං න කරොතීති නාගො. කථං න ගච්ඡතීති නාගො? න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති සංහරීයති. එවං න ගච්ඡතීති – නාගො. කථං නාගච්ඡතීති නාගො? සොතාපත්තිමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසා න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡති.[3] සකදාගාමිමග්ගෙන – අනාගාමිමග්ගෙන – අරහත්තමග්ගෙන යෙ කිලෙසා පහීනා, තෙ කිලෙසෙ න පුනෙති, න පච්චෙති, න පච්චාගච්ඡති. එවං නාගච්ඡතීති – නාගො.

**න තානි උග්ගය්හ වදෙය්‍ය නාගොති** – නාගො න තානි දිට්ඨිගතානි ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපයෙය්‍ය වොහරෙය්‍ය, සස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤන්ති වදෙය්‍ය කථෙය්‍ය භණෙය්‍ය දීපයෙය්‍ය වොහරෙය්‍යාති – ‘න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො.’

**එලම්බුජං කණ්ටකං වාරිජං යථා ජලෙන පඞ්කෙන ච නූපලිත්තන්ති** – ‘එලං’ වුච්චති උදකං. **‘අම්බුජං’** වුච්චති පදුමං. **‘කණ්ටකො’** වුච්චති ඛරදණ්ඩො. **‘වාරි’** වුච්චති උදකං. **‘වාරිජං’** වුච්චති පදුමං වාරිසම්භවං. **‘ජලං’** වුච්චති උදකං. **‘පඞ්කො’** වුච්චති කද්දමො. යථා පදුමං වාරිජං වාරිසම්භවං ජලෙන ච පඞ්කෙන ච න ලිප්පති, න සංලිප්පති[4] නූපලිප්පති, අලිත්තං අසංලිත්තං, අනුපලිත්තන්ති – “එලම්බුජං කණ්ටකං වාරිජං යථා ජලෙන පඞ්කෙන ච නූපලිත්තං.”

---

1. සදදරා - ස. 2. වුච්චතෙ - සෲ, PTS.
3. කිලෙසා පුනෙතානි, න පච්චෙන්ති, න පච්චාගච්ඡන්ති - මු. I.
4. උපලිම්පති - මු. II. සංලිම්පති - ස. a. සුත්තනිපාත - සභියසුත්ත.

**න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො** – 'නාගො' යනු: පව් නො කෙරේ නුඹ 'නාග' යැ (අගතියට) නො යේ නුයි 'නාග' යැ (පුහුත් කෙලෙසුන් කරා) නො පැමිණේ නුයි 'නාග' යැ. කිසෙසින් පව් නො කරනුයෙන් නාග වෙයි යත්: පීඩාකර වූ පුනර්භවය දෙන්නා වූ දරථ සහිත වූ දුඃඛ විපාක උපදවන මත්තෙහි ජාතිජරාමරණයන්ට ප්‍රත්‍යය වූ ලාමක අකුශල ධර්මයෝ 'ආගු' යයි කියනු ලැබෙත්.

1. ('සභිය'යි බුදුහු මෙසේ වදාළහ:) යමෙක් ලොකයෙහි අල්පමාත්‍ර වූ ද පාපයක් නො කෙරේ නම් එබඳු වූයේ 'නාග' යයි කියනු ලැබෙයි. හෙතෙම කාමාදි සියලු යොගයන් ද සංයොජනභෙද වූ බන්ධනයන් ද හැරපියා ස්කන්ධාදි සියලු තැන්හි, කිසි සඞ්ගයෙකින් නො ඇලෙයි, ද්විවිධ විමුක්ති යෙන් මිදුණේ ලාභාලාභාදියෙහි තාදී වූයේ ද වේ.

මෙසේ පව් නො කෙරේ නුයි 'නාග' යැ. කිසෙසින් නො යේ නුයි නාග වෙයි යත්: ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, භයින් අගතියට නො යෙයි, රාගවශයෙන් නො යෙයි, ද්වෙෂවශයෙන් – මොහවශයෙන් – මානවශයෙන් දෘෂ්ටිවශයෙන් – ඖද්ධත්‍යවශයෙන් – විචිකිත්සාවශයෙන් – අනුශයවශයෙන් නො යෙයි, වර්ගී වූ ධර්මයන් ගෙන් නො යවනු ලැබෙයි, නො පමුණුවනු ලැබෙයි, නො වහනු ලැබෙයි, නො හරිනු ලැබේ. මෙසේ නො යේ නුයි– 'නාග' යැ. කෙසේ නො ඒ නුයි 'නාග' නම් වෙයි යත්: සෝවාන්මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම් ඒ කෙලෙසුන් කරා පෙරළා නො එයි, පසු වැ නො එයි, ආපසු නො එයි. සැදෑගැමිමඟින්...අනගැමි මඟින්...රහත්මඟින් යම් කෙලෙස් කෙනෙක් ප්‍රහීණ වූවාහු නම්, ඒ කරා පෙරළා නො එයි පසු වැ නො එයි ආපසු නො එයි. මෙසේ නො ඒ නුයි 'නාග' නමි.

**න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො** – නාග තෙමේ ඒ දෘෂ්ටිගතයන් නෙන ඔසොවා ගෙන ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවෙශය කොට නො පවසන්නේය නො කියන්නේය නො බණන්නේය නො දක්වන්නේය නො වහරන්නේය. 'ශාශ්වත යැ ලොකය...සත්ත්වයා මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ සැබව, සෙස්ස මොස යැ'යි නො පවසන්නේය නො කියන්නේය නො බණන්නේය නො දක්වන්නේය නො වහරන්නේ නුයි 'න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො' යනු වේ.

**ඵලම්බුජං කණ්ටකං වාරිජං යථා ජලෙන පඞ්කෙන ච නූපලිත්තං**– 'එලං' යී දිය කියනු ලැබෙයි. 'අම්බුජ'යී පියුම කියනු ලැබෙයි. 'කණ්ටක, යී රළු වූ දණ්ඩ කියනු ලැබෙයි. 'වාරි'යී දිය කියනු ලැබෙයි. 'වාරිජ'යී දියෙහි උපන් පියුම කියනු ලැබෙයි. 'ජල'යී දිය කියනු ලැබෙයි. 'පඞ්ක'යී කලල් කියනු ලැබේ. යම් සේ දියෙහි උපන් දියෙහි හටගත් පියුම දියෙන් හා කලලින් නො ඇලේ ද වෙසෙසින් නො ඇලේ ද නො තැවැරේ ද, නො ඇලුණේ වෙසෙසින් නො ඇලුණේ නො තැවැරුණේ නුයි 'ඵලම්බුජං කණ්ටකං වාරිජං යථා ජලෙන පඞ්කෙන ච නූපලිත්තං' යනු වේ.

**එවං මුනි සන්තිවාදො අගිද්ධො කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො**ති 'එව'න්ති ඔපම්මසම්පටිපාදනං; **මුනී**ති මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි. **සන්තිවාදො**ති සන්තිවාදො මුනි තාණවාදො ලෙණවාදො සරණවාදො අභයවාදො අච්චුතවාදො අමතවාදො නිබ්බානවාදොති – එවං මුනි සන්තිවාදො. **අගිද්ධො**ති ගෙධො වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්ස සො ගෙධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති අගිද්ධො. සො රූපෙ අගිද්ධො; සද්දෙ – ගන්ධෙ – රසෙ – ඵොට්ඨබ්බෙ – කුලෙ – ගණෙ – ආවාසෙ – ලාභෙ – යසෙ[1] පසංසාය – සුඛෙ – චීවරෙ – පිණ්ඩපාතෙ – සෙනාසනගිලානපච්චයභෙසජ්ජ-පරික්ඛාරෙ – කාමධාතුයා – රූපධාතුයා – අරූපධාතුයා – කාමභවෙ – රූපභවෙ – අරූපභවෙ – නෙවසඤ්ඤානාසඤ්ඤාභවෙ – එකවොකාරභවෙ – චතුවොකාරභවෙ – පඤ්චවොකාරභවෙ අතීතෙ – අනාගතෙ – පච්චුප්පන්නෙ – දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු අගිද්ධො අගථිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො[2] වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො පහීනගෙධො පටිනිස්සට්ඨගෙධො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති – එවං මුනී සන්තිවාදො අගිද්ධො.

**කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො**ති – 'කාමා'ති උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා; **ලොකෙ**ති අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ; 'ලෙපා'ති ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච -පෙ- අයං තණ්හාලෙපො -පෙ- අයං දිට්ඨිලෙපො. මුනි තණ්හාලෙපං පහාය දිට්ඨිලෙපං පටිනිස්සජ්ජිත්වා කාමෙ ච ලොකෙ ච න ලිප්පති, න පලිප්පති, න උපලිප්පති. අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො[3] විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති – එවං මුනී සන්තිවාදො අගිද්ධො කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො.'

තෙනාහ භගවා:

> ''යෙහි විවිත්තො විචරෙය්‍ය ලොකෙ
> න තානි උග්ගය්හ වදෙය්‍ය නාගො
> එලම්බුජං කණ්ටකං වාරිජං යථා
> ජලෙන පඞ්කෙන ච නූපලිත්තං,
> එවං මුනී සන්තිවාදො අගිද්ධො
> කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො''ති.

1. යසසා - මු. II. 2. අනජ්ඣාපන්නො - මු. II. 3. නිස්සනො - ස.

**එවං මුනි සන්තිවාදො අගිද්ධො කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො**– ‘එවං’ යනු: ඖපම්‍යසම්ප්‍රතිපාදනා යැ; **මුනි** – ‘මොන’යි ඥානය කියනු ලැබෙයි...**සන්තිවාදො** – මුනි තෙම අධ්‍යාත්මශාන්තිය කියන්නේ යැ, ත්‍රාණවාද යැ ලෙනවාද යැ ශරණවාද යැ අභයවාද යැ අච්‍යුතවාද යැ අමෘතවාද යැ නිර්වාණවාද (=නිවන පවසා) නුයි ‘එවං මුනි සන්තිවාදෙ’ යනු වේ. **අගිද්ධො**– ‘ගෙධ’යි තෘෂ්ණාව කියනු ලැබෙයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද, යමක්හු විසින් ඒ ගෙධ තෙමේ ප්‍රහීණ කරන ලද ද සිඳින ලද ද සන්හිඳුවන ලද ද දුරලන ලද ද, උපතට නුසුදුසු වූයේ නුවණගින්නෙන් දවන ලද ද, හෙතෙම ‘අගිද්ධ’යි කියනු ලැබෙයි. හේ රූපයෙහි අගිද්ධ යැ ශබ්දයෙහි – ගන්ධයෙහි – රසයෙහි– ස්ප්‍රෂ්ටව්‍යයෙහි – කුලයා කෙරෙහි – ගණයා කෙරෙහි – ආවාසයෙහි – ලාභයශස් – ප්‍රශංසායෙහි – සුවයෙහි – චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගලාන - ප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයෙහි – කාමධාතුයෙහි – රූපධාතුයෙහි – අරූපධාතුයෙහි – කාම – රූප – අරූපභවයෙහි – නෛවසංඥානාසංඥාභවයෙහි – එකවොකාර – චතුවොකාර – පඤ්චවොකාරභවයෙහි –අතීත අනාගත – ප්‍රත්‍යුත්පන්නයෙහි – දෘෂ්ට ශ්‍රැත මූත විඥාතව්‍යධර්මයන්හි නො ගිජු වූයේ නො ගෙතුණේ මුසපත් නො වූයේ නො බැඳුණේ පහවූ තෘෂ්ණා ඇතියේ පහවගිය තෘෂ්ණා ඇතියේ ත්‍යක්ත වූ තෘෂ්ණා ඇතියේ වාන්ත (=වමනය කළ) තෘෂ්ණා ඇතියේ මුදන ලද තෘෂ්ණා ඇතියේ දුරු ලූ තෘෂ්ණා ඇතියේ වීතරාග – විගතරාග – ත්‍යක්තරාග – වාන්තරාග – මුක්තරාග– ප්‍රහීණ රාග – ප්‍රතිනිසෘෂ්ටරාග වූයේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ (කයින් සිතින්) සුව විඳිනසුලු වූයේ ශ්‍රේෂ්ඨ වූ සිතින් යුක්ත වැ වෙසේ නුයි ‘එවං මුනී සන්තිවාදො අගිද්ධො’ යනු වේ.

**කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො** – ‘කාමා’ යනු: උද්දාන හෙයින් කාමයෝ දෙදෙනෙකි:...මොහු ක්ලේශකාමයෝ යි කියනු ලැබෙත්. **ලොකෙ**– අපායලොකයෙහි මනුෂ්‍ය – දෙව – ස්කන්ධ – ධාතු – ආයතනලොකයෙහි; ‘ලෙප’ යනු: තෘෂ්ණාලෙපය ද දෘෂ්ටිලෙපය දැයි ලෙප දෙකෙකි...මුනි තෙම තෘෂ්ණාලෙපය හැර දෘෂ්ටිලෙපය දුරලා කාමයෙහි ද, ලොකයෙහි ද, නො ඇලෙයි වෙසෙසින් නො ඇලෙයි, නො තැවැරෙයි. අලිප්ත අසංලිප්ත අනුපලිප්ත වූයේ නික්මැගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ (අරමුණුවලින්) මිදුණු සිතින් යුක්ත වැ වෙසේ නුයි ‘එවං මුනී සන්තිවාදො අගිද්ධො කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො’ යනු වේ.

එයින් වදාලහ බුදුහු:

**“යෙහි විවිත්තො -පෙ- කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො”යි.**

### 9 - 12

න වෙදගූ දිට්ඨියා න මුතියා
ස මානමෙති න හි තම්මයො[1] සො,
න කම්මුනා[2] නොපි සුතෙන නෙය්‍යො
අනූපනීතො ස[3] නිවෙසනෙසු.

**න වෙදගූ දිට්ඨියා න මුතියා ස මානමෙතීති** – 'නා'ති පටික්ඛෙපො. **වෙදගූති** 'වෙදං' වුච්චති චතූසු මග්ගෙසු ඤාණං, පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි. තෙහි වෙදෙහි ජාතිජරාමරණස්ස අන්තගතො අන්තප්පත්තො කොටිගතො කොටිප්පත්තො පරියන්තගතො පරියන්තප්පත්තො වොසානගතො වොසානප්පත්තො තාණගතො තාණප්පත්තො ලෙණගතො ලෙණප්පත්තො සරණගතො සරණප්පත්තො අභයගතො අභයප්පත්තො අච්චුතගතො අච්චුතප්පත්තො අමතගතො අමතප්පත්තො නිබ්බානගතො නිබ්බානප්පත්තො වෙදානං වා අන්තං ගතොති වෙදගූ. වෙදෙහි වා අන්තං ගතොති වෙදගූ. සත්තන්නං ධම්මානං විදිතත්තා වෙදගූ: සක්කායදිට්ඨි විදිතා හොති, විචිකිච්ඡා විදිතා හොති, සීලබ්බතපරාමාසො විදිතො හොති, රාගො විදිතො හොති, දොසො විදිතො හොති, මොහො විදිතො හොති, මානො විදිතො හොති, විදිතා'ස්ස හොන්ති පාපකා අකුසලා ධම්මා සංකිලෙසිකා පොනොභවිකා සදරා[4] දුක්ඛවිපාකා ආයතිං ජාතිජරාමරණියා.

1. "වෙදානි විචෙය්‍ය කෙවලානි (සභියාති භගවා)
සමණානං යානි'පත්ථි[5] බ්‍රාහ්මණානං,
සබ්බ[6]වෙදනාසු වීතරාගො
සබ්බ[7]වෙදමතිච්ච වෙදගූ සො"ති [a]

**න දිට්ඨියාති** – තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි. සො දිට්ඨියා න යායති, න නීයති, න වුය්හති, න සංහරීයති, නපි තං දිට්ඨිගතං සාරතො පච්චෙති. න පච්චාගච්ඡතීති – න වෙදගූ දිට්ඨියා.

**න මුතියා ස මානමෙතීති** – මුතරූපෙන වා පරතොඝොසෙන වා මහාජනසම්මුතියා වා මානං නෙති, න උපෙති, න උපගච්ඡති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසතීති – 'න වෙදගූ දිට්ඨියා න මුතියා 'ස මානමෙති'.

**න හි තම්මයො සොති** – න තණ්හාවසෙන න දිට්ඨිවසෙන තම්මයො හොති තප්පරමො තප්පරායණො; යතො තණ්හා ච දිට්ඨි ච මානො ච අස්ස පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා[8] අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතා න තම්මයො හොති, න තප්පරමො, න තප්පරායණොති – න හි තම්මයො සො'.

---

1. සාවිම්මයො - මනුප. 2. සම්මතා - ස. 3. සො - සු.
4. සදූර - ස. 5. යානිපත්ථි - මජසං. PTS. 6. සබ්බාසු - සු.
7. සබ්බං - සු. 8. තාලවත්ථුකතා - ස.
a. සුත්තනිපාත - සභිය සුත්ත.

**9 - 12**

සිවුමග නුවණට පැමිණි (මා වැනියෙක්) දෘෂ්ටියට (හෝ දෘෂ්ටියෙන්) යන්නේ නො වෙයි. හෙතෙම (මුතරූපාදි භේද වූ) මුතියෙනුදු මානයට නො පැමිණේ යි. ඒ (තෘෂ්ණා - දෘෂ්ටි විසින්) නො මැ තම්මය වෙයි. කර්මයෙන් හෝ ශ්‍රැතයෙන් හෝ නො ද පැමිණැවියැ යුත්තේ, වෙයි. හේ තෘෂ්ණාදෘෂ්ටිනිවෙසනයන්හි අනූපනීත වේ.

**න වෙදගූ දිට්ඨියා න මුතියා ස මානමෙති** - 'න' යනු: ප්‍රතික්ෂෙප යැ. **වෙදගූ** 'වෙද'යි සතර මඟ නුවණ කියනු ලැබෙයි, ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රිය ප්‍රඥාබලය ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය විමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය යි. ඒ මාර්ගඥානවෙදයන්ගෙන ජාතිජරාමරණයාගේ අන්තයට ගියේ අන්තයට පැමිණියේ කෙළවරට ගියේ කෙළවරට පැමිණියේ පර්යන්තයට ගියේ පර්යන්තයට පැමිණියේ අවසානයට ගියේ අවසානයට පැමිණියේ ත්‍රාණයට ගියේ ත්‍රාණයට පැමිණියේ ලෙනයට ගියේ ලෙනයට පැමිණියේ ශරණයට ගියේ ශරණයට පැමිණියේ අභයට ගියේ අභයට පැමිණියේ අච්‍යුතයට ගියේ අච්‍යුතයට පැමිණියේ අමෘතයට ගියේ අමෘතයට පැමිණියේ නිවනට ගියේ නිවනට පැමිණියේ නොහොත් වෙදයන්ගේ අන්තයට ගියේ නුයි-'වෙදගූ'යැ, වෙදයන්ගෙන් අන්තයට ගියේ නුයි හෝ - 'වෙදගූ' යැ. සප්තධර්මයන් විදිත හෙයින් 'වෙදගූ' යැ: සත්කායදෘෂ්ටිය දන්නා ලද්දී වෙයි, විචිකිත්සාව- ශීලව්‍රතපරාමර්ශය - රාගය - ද්වෙෂය - මොහය - මානය විදිත වෙයි. කෙලෙසට කරුණු වූ පුනර්භවය දෙන්නා වූ දරථ සහිත වූ දුඃඛවිපාක ඇති අනාගතයෙහි ජාතිජරාමරණයට හෙතු වූ ලාමක අකුශලධර්මයෝ ඔහු විසින් විදිත වූවාහු වෙත්.

1. ("සභිය, යී බුදුහු මෙසේ වදාළහ:) මාර්ගඥානවෙදයට පැමිණි ඒ ක්ෂීණාස්‍රව තෙම මේ ලොකයෙහි මහණබමුණන්ගේ ශාස්ත්‍ර සඞ්ඛ්‍යාත යම් වෙද කෙනෙක් ඇත් ද ඒ සියල්ල (අනිත්‍යාදි වශයෙන්) විමසා (එහි ඡන්දරාගප්‍රහාණයෙන්) සියලු ශාස්ත්‍රවෙදය ඉක්මැ සියලු වෙදනාවන්හි වීතරාග වේ."

**න දිට්ඨියා** - ඔහු විසින් දෙසැට දිටුහු පහන ලද්දාහු සිඳුණා ලද්දාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු උපනට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු වෙති; හෙතෙම දෘෂ්ටිය විසින් නො යවනු ලැබෙයි; නො පමුණුවනු ලැබෙයි, නො වහනු ලැබෙයි, නො හරනු ලැබේ. ඒ දෘෂ්ටියට නො ද සාර හෙයින් පැමිණෙයි, නො පෙරළා ඒ නුයි 'න වෙදගූ දිට්ඨියා' යනු වේ.

**න මුතියා ස මානමෙති** - මුත (-ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය) රූපයෙන් හෝ පරතොඝොෂයෙන් හෝ මහජන සම්මුතියෙන් හෝ මානයට නො එයි නො පැමිණෙයි, නො එළැඹෙයි, නො ගනී, නො ඇලෙයි, නො පිවිසේ නුයි 'න වෙදගූ න දිට්ඨියා න මුතියා ස මානමෙති' යනු වේ.

**න හි තම්මයො සො** - තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් තන්මය නො වෙයි, තත්පරම තත්පරායණ නො වේ. යම් තැනක සිට තෘෂ්ණාව ත් දෘෂ්ටිය ත් මානය ත් ඔහු විසින් ප්‍රහීණ කරන ලද්දාහු උපුටා හළ මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අභාවය කරන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින් එය ප්‍රකෘති කොට ඇත්තේ නො වෙයි, තත්පරම නො වෙයි, තත්පරායණ නො වේ නුයි 'න හි තම්මයො සො' යනු වේ.

**න කම්මුනා නො'පි සුතෙන නෙය්‍යොති** – 'න කම්මුනා'ති පුඤ්ඤාභිසඞ්ඛාරෙන වා අපුඤ්ඤාභිසඞ්ඛාරෙන වා ආනෙඤ්ජාභිසඞ්ඛාරෙන වා න යායති, න නීයති, න වුය්හති, න සංහරීයතීති – න කම්මුනා; **නොපි සුතෙන නෙය්‍යොති** සුතසුද්ධියා වා පරතොඝොසෙන වා මහාජනසම්මුතියා වා න යායති, න නීයති, න වුය්හති, න සංහරීයතීති – න කම්මුනා නොපි සුතෙන නෙය්‍යො.

**අනූපනීතො ස නිවෙසනෙසූති** – 'උපයා'ති ද්වෙ උපයා: තණ්හාඋපයො ච දිට්ඨිඋපයො ච -පෙ- අයං තණ්හාඋපයො -පෙ- අයං දිට්ඨිඋපයො. තස්ස තණ්හාඋපයො පහීනො, දිට්ඨිඋපයො පටිනිස්සට්ඨො; තණ්හූපයස්ස පහීනත්තා දිට්ඨූපයස්ස පටිනිස්සට්ඨත්තා සො නිවෙසනෙසු අනූපනීතො අනුපලිත්තො අනුපගතො අනජ්ඣොසිතො[1] අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති අනූපනීතො ස නිවෙසනෙසු.'

තෙනාහ භගවා:

"න වෙදගූ දිට්ඨියා න මුතියා
ස මානමෙති න හි තම්මයො සො,
න කම්මුනා නො පි සුතෙන නෙය්‍යො
අනූපනීතො ස නිවෙසනෙසූ"ති.

**9 - 18**

සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා[2]
පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා,
සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං
තෙ ඝට්ටයන්තා[3] විචරන්ති[4] ලොකෙ.

**සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථාති** – යො සමථපුබ්බඞ්ගමං අරියමග්ගං[5] භාවෙති, තස්ස ආදිතො උපාදාය ගන්ථා වික්ඛම්භිතා හොන්ති, අරහත්තෙ පත්තෙ[6] අරහතො ගන්ථා ච මොහා ච නීවරණා ච, කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා දිට්ඨිසඤ්ඤා ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මාති – 'සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා.'

**පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා** – යො විපස්සනාපුබ්බඞ්ගමං අරියමග්ගං භාවෙති, තස්සාදිතො උපාදාය මොහා වික්ඛම්භිතා හොන්ති, අරහත්තෙ පත්තෙ[6] අරහතො මොහා ච ගන්ථා ච නීවරණා ච කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසාසඤ්ඤා දිට්ඨිසඤ්ඤා ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මාති – 'පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා.'

1. අනජ්ඣොසිතො - සීමු. II. 2. ගණ්ඨා - මනුප. 3. ඝට්ටමානා - සීමු. II. මජසං.
4. විවදන්ති - සකව්. 5. අරියධම්මං - සීමු. II.
6. අරහත්තප්පත්තෙ - සීමු. II. ස්‍යා. PTS.

**න කම්මුනා නො 'පි සුතෙන නෙය්‍යො** – 'න කම්මුනා' යනු: පුණ්‍යාභිසංස්කාරයෙන් හෝ අපුණ්‍යාභිසංස්කාරයෙන් හෝ ආනෙඤ්ජාභිසංස්කාරයෙන් හෝ නො යවනු ලැබෙයි, නො ගෙනයනු ලැබෙයි, නො පමුණුවනු ලැබෙයි, නො හරිනු ලැබේ නුයි 'න කම්මුනා' යනු වේ. **නො 'පි සුතෙන නෙය්‍යො** – ශ්‍රැතශුද්ධියෙන් හෝ පරතොඝොෂයෙන් හෝ මහජනසම්මුතියෙන් හෝ නො යවනු ලැබෙයි,...නො හරිනු ලැබේ නුයි 'න කම්මුනා නො 'පි සුතෙන නෙය්‍යො' යනු වේ.

**අනූපනීතො ස නිවෙසනෙසු** – 'උපය' යනු: තෘෂ්ණා උපය ද දෘෂ්ටි උපය දැයි උපයයෝ දෙදෙනෙක් වෙති...ඔහු විසින් තෘෂ්ණාඋපය ප්‍රහීණ යැ, දෘෂ්ටිඋපය දුරලන ලද; තෘෂ්ණෝපය ප්‍රහීණ වන බැවින් දෘෂ්ට්‍යූපය දුරලන ලද බැවින් හේ (අපායාදි) නිවෙසනයන්හි නො පමුණුවන ලද්දේ නො ඇලුණේ නො පැමිණියේ නො පිවිසියේ නො ඇතුළු වූයේ නික්මැගියේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ නො බැඳුණේ කෙලෙසුන් හා නො යෙදුණු සිතින් යුක්ත වැ වෙසේ නුයි 'අනූපනීතො ස නිවෙසනෙසු යනු වේ.

එයින් වදාළහ:

**"න වෙදගූ -පෙ- ස නිවෙසනෙසූ"යි.**

## 9 – 18

ප්‍රහීණ කළ කාමාදි සංඥා ඇත්තහුට (අභිධ්‍යාකායාදි) ග්‍රන්ථයෝ නො වෙති. විදර්ශනාප්‍රඥාවෙන් කෙලෙසුන් කෙරෙන් මිදුණහුට මොහයෝ නො වෙති. යම් කෙනෙක් කාමාදි සංඥාව ත් දෙසැට දෘෂ්ටිය ත් දැඩි වැ ගත්තාහු නම්, ඔහු උනුත් ගටමින් ලොව්, හැසිරෙත්.

**සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා** – යමෙක් ශමථපූර්වඞ්ගම ආර්‍ය්‍යමාර්ගය වඩා ද ආදියෙහි පටන් ඔහුගේ අභිධ්‍යාකායාදි ග්‍රන්ථයෝ විෂ්කම්භණ වූවාහු වෙති, රහත්බවට පැමිණි කල්හි රහත්හුගේ ග්‍රන්ථයෝ ද මොහයෝ ද නීවරණයෝ ද කාමසංඥා ව්‍යාපාදසංඥා විහිංසාසංඥා දෘෂ්ටිසංඥා ද ප්‍රහීණ වූවාහු වෙති, උදුත්මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මතු නූපදනා පියවි ඇත්තාහු නුයි 'සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා' යනු වේ.

**පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා** – යමෙක් විදර්ශනා පූර්වඞ්ගම වූ ආර්‍ය්‍යමාර්ගය වඩා ද, ඔහුගේ ආදියෙහි පටන් මොහයෝ විෂ්කම්භණ වූවාහු වෙති, රහත්බවට පැමිණි කල්හි රහත්හුගේ මොහයෝ ද ග්‍රන්ථයෝ ද නීවරණයෝ ද කාම – ව්‍යාපාද – විහිංසා – දෘෂ්ටිසංඥා ද ප්‍රහීණ වූවාහු වෙති සිඳින ලද මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මතු නූපදනා පියවි ඇත්තාහු නුයි – 'පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා' යනු වේ.

**සඤ්ඤං ච දිට්ඨිං ච යෙ අග්ගහෙසුං තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙති** යෙ සඤ්ඤං ගණ්හන්ති කාමසඤ්ඤං ව්‍යාපාදසඤ්ඤං විහිංසාසඤ්ඤං, තෙ සඤ්ඤාවසෙන ඝට්ටෙන්ති සංඝට්ටෙන්ති. රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති. ගහපතිකාපි ගහපතිකෙහි විවදන්ති, මාතාපි පුත්තෙන විවදති. පුත්තොපි මාතරා විවදති. පිතාපි පුත්තෙන විවදති. පුත්තොපි පිතරා විවදති. භාතාපි භාතරා විවදති. භගිනීපි භගිනියා විවදති. භාතාපි භගිනියා විවදති. භගිනීපි භාතරා විවදති. සහායොපි සහායෙන විවදති. තෙ තත්ථ කලහවිග්ගහවිවාදමාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති. ලෙඩ්ඩූහිපි උපක්කමන්ති. දණ්ඩෙහිපි උපක්කමන්ති. සත්ථෙහිපි උපක්කමන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති, මරණමත්තම්පි දුක්ඛං. යෙ දිට්ඨිං ගණ්හන්ති 'සස්සතො ලොකො'ති වා -පෙ- 'නෙව හොති න න හොති තථාගතො පරම්මරණා'ති වා, තෙ දිට්ඨිවසෙන ඝට්ටෙන්ති සංඝට්ටෙන්ති. සත්ථාරතො සත්ථාරං ඝට්ටෙන්ති. ධම්මක්ඛානතො ධම්මක්ඛානං ඝට්ටෙන්ති. ගණතො ගණං ඝට්ටෙන්ති. දිට්ඨියා දිට්ඨිං ඝට්ටෙන්ති. පටිපදාය පටිපදං ඝට්ටෙන්ති. මග්ගතො මග්ගං ඝට්ටෙන්ති. අථවා, තෙ විවදන්ති. කලහං කරොන්ති. භණ්ඩනං කරොන්ති. විග්ගහං කරොන්ති විවාදං කරොන්ති. මෙධගං කරොන්ති: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි[1] වා සචෙ පහොසී'ති. තෙසං අභිසඞ්ඛාරා අප්පහීනා, අභිසඞ්ඛාරානං අප්පහීනත්තා ගතියා ඝට්ටෙන්ති. නිරයෙ ඝට්ටෙන්ති, තිරච්ඡානයොනියා ඝට්ටෙන්ති. පෙත්තිවිසයෙ ඝට්ටෙන්ති. මනුස්සලොකෙ ඝට්ටෙන්ති. දෙවලොකෙ ඝට්ටෙන්ති. ගතියා ගතිං උපපත්තියා උපපත්තිං පටිසන්ධියා පටිසන්ධිං භවෙන භවං සංසාරෙන සංසාරං වට්ටෙන වට්ටං ඝට්ටෙන්ති සංඝට්ටෙන්ති. ඝට්ටෙන්තා[2], චරන්ති[3], විචරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති. **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති – 'සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ.'

තෙනාහ භගවා:

''සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා
පඤ්ඤාවිමුත්තස්ස න සන්ති මොහා,
සඤ්ඤං ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං
තෙ ඝට්ටයන්තා[4] විචරන්ති ලොකෙ''ති.

**මාගණ්ඩියසුත්තනිද්දෙසො නවමො.**

## 10

# පුරාභෙදසුත්තනිද්දෙසො

අථ පුරාභෙදසුත්තනිද්දෙසො වුච්චති:

**10 – 1**

කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති,
තං මෙ ගොතම පබ්‍රූහි පුච්ඡිතො උත්තමං නරං.

1. නිබ්බෙඨෙහි - PTS.
2. ඝට්ටයන්තාති පදං - සීමු. II මජ්ඣං. පොත්ථකෙසු න දිස්සති.
3. වදන්ති - සීමු. II. මජ්ඣං.
4. ඝට්ටමානා - සීමු. II. මජ්ඣං.

**සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ** – යම් කෙනෙක් කාම – ව්‍යාපාද – විහිංසා – යන සංඥාව ගනිත් ද ඒ ගැහැවියෝ සංඥාවශයෙන් ගටති, ඉතා ගටත්. රජහු ද රජුන් සමග විවාද කෙරෙති, ක්ෂත්‍රියයෝත් ක්ෂත්‍රියයන් සමග විවාද කෙරෙති, බමුණෝත් බමුණන් සමග විවාද කෙරෙති, ගැහැවියෝත් ගැහැවියන් සමග විවාද කෙරෙති, මවු ද පුතු සමග විවාද කෙරෙයි, පුතාත් මව සමග විවාද කෙරෙයි, පියතෙමේ ත් පුතු සමග විවාද කෙරෙයි, පුතාත් පියා සමග විවාද කෙරෙයි, සොහොයුරාත් සොහොයුරු සමග විවාද කෙරෙයි, සොහොයුරියත් සොහොයුරිය සමග විවාද කෙරෙයි, සොහොයුරාත් සොහොයුරිය සමග විවාද කෙරෙයි, සොහොයුරියත් සොහොයුරු සමග විවාද කෙරෙයි, යහළුවාත් යහළුහු සමග විවාද කෙරෙයි, ඔව්හු එහි කලහවිග්‍රහවිවාදයට පැමිණියාහු උනුනට අත්වලිනු දු පහර දෙති, කැටගලිනු දු ගසති, දඬුවලිනු දු ගසති, සැතිනු දු පහර දෙත්. ඔව්හු එහි දී මරණයටත් මරණ මාත්‍ර දුකටත් පැමිණෙත්. යම් කෙනෙක් දෘෂ්ටිය ගනිත් ද: 'ශාශ්වත යැ ලොකයැයි හෝ...සත්ත්වතෙමේ මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වේ යැයි හෝ' ඔව්හු දෘෂ්ටිවශයෙන් ගටති, ඉතා ගටති ශාස්තෘහු වශයෙන් ශාස්තෘහු ගටති, ධර්මාඛ්‍යානයෙන් ධර්මාඛ්‍යානය – ගණයා කෙරෙන් ගණයා – දෘෂ්ටියෙන් දෘෂ්ටිය – පිළිවෙතින් පිළිවෙත – මාර්ගයෙන් මාර්ගය ගටත්. නොහොත් ඔහු විවාද කෙරෙති, කලහ කෙරෙති, ඩබර කෙරෙති, විග්‍රහ කෙරෙති, විවාද කෙරෙති අරගල කෙරෙති: 'තෙපි මේ ධර්මවිනය නො දන්නවුයැ...ඉදින් පොහොසත්හු නම් තමා මුදා ගනිවුයැ'යි. ඔවුන්ගේ පුණ්‍යාදි අභිසංස්කාරයෝ අප්‍රහීණයහ, අභිසංස්කාරයන් අප්‍රහීණ වන බැවින් (යායුතු) ගතියෙන් ගටති, නිරයෙහි ලා ගටති, තිරශ්චීනයොනි යෙහි ගටති, ප්‍රෙතවිෂයයෙහි ගටති, මනුෂ්‍යලොකයෙහි ගටති, දිව්‍යලොකයෙහි ගටත්. ගතියෙන් ගතිය උපතින් උපත පිළිසඳින් පිළිසඳ භවයෙන් භවය සසරින් සසර වටින් වට ගටති, ඉතා ගටති. ගටමින් ඇවිදිති හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති වැටෙති රැකෙති යැපෙති යපනය වෙත්. **ලොකෙ** – අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි 'සඤ්ඤඤ්ච දිට්ඨිඤ්ච යෙ අග්ගහෙසුං තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ' යනු ඒ.

එහින් වදාළහ බුදුහු:

**"සඤ්ඤාවිරත්තස්ස -පෙ- තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ"යි.**

**නවවැනි 'මාගන්දිය' සූත්‍රනිර්දේශය යි.**

# 10

# පුරාභෙදසුත්‍රනිර්දේශය

ඉක්බිති 'පුරාභෙද' සූත්‍රනිර්දේශය කියනු ලැබේ:

## 10 - 1

කෙබඳු දර්ශනයකින් යුක්ත වූ කෙබඳු ශීලයකින් යුක්ත වූ පුද්ගල තෙම උපශාන්ත යැයි කියනු ලැබේ ද? ගොයුමාණෙනි, මා විසින් පුළුවුස්නා ලදුවහු ඒ උත්තම පුද්ගලයා වදාළ මැනව.

**කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චතීති** – 'කථංදස්සී'ති කිදිසෙන දස්සනෙන සමන්නාගතො කිංසණ්ඨිතෙන කිම්පකාරෙන කිංපටිභාගෙනාති කථංදස්සී; **කථංසීලොති** කිදිසෙන සීලෙන සමන්නාගතො කිංසණ්ඨිතෙන කිම්පකාරෙන කිම්පටිභාගෙනාති – කථංදස්සී කථංසීලො.'

**උපසන්තොති වුච්චතීති** – සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති වුච්චති පවුච්චති කථියති භණියති දීපියති වොහරියති; 'කථංදස්සී'ති අධිපඤ්ඤං පුච්ඡති; 'කථංසීලො'ති අධිසීලං පුච්ඡති 'උපසන්තො'ති අධිචිත්තං පුච්ඡතීති – 'කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති.'

**තං මෙ ගොතම පබ්‍රෑහීති** – 'තන්ති' යං පුච්ඡාමි යං යාචාමි යං අජ්ඣෙසාමි යං පසාදෙමි; **ගොතමාති** සො නිම්මිතො බුද්ධං භගවන්තං ගොත්තෙන ආලපති; **පබ්‍රෑහීති** බ්‍රෑහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති – 'තං මෙ ගොතම පබ්‍රෑහි.'

**පුච්ඡිතො උත්තමං නරන්ති** – 'පුච්ඡිතො'ති පුට්ඨො පුච්ඡිතො යාචිතො අජ්ඣෙසිතො පසාදිතො; **උත්තමං නරන්ති** අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං නරන්ති – 'පුච්ඡිතො උත්තමං නරං.'

තෙනාහ සො නිම්මිතො:

> "කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති,
> තං මෙ ගොතම පබ්‍රෑහි පුච්ඡිතො උත්තමං නර"න්ති.

## 10 - 2

> වීතතණ්හො පුරා භෙදා (ඉති[1] භගවා) පුබ්බමන්තමනිස්සිතො,
> වෙමජ්ඣෙනුපසංඛෙය්‍යො තස්ස නත්ථි පුරෙක්ඛතං.

**වීතතණ්හො පුරා භෙදාති** – පුරා කායස්ස භෙදා පුරා අත්තභාවස්ස භෙදා පුරා කළෙබරස්ස නික්ඛෙපා පුරා ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදා, වීතතණ්හො විගතතණ්හො චත්තතණ්හො වන්තතණ්හො මුත්තතණ්හො පහීනතණ්හො පටිනිස්සට්ඨතණ්හො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො, නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරති.

1. පුරා භෙදාති - සයා. PTS.

**කථංදස්සී කථංසීලො උපසන්තොති වුච්චති** – 'කථංදස්සී' යනු කෙබඳු වූ කවර සංස්ථාන ඇති කවර ප්‍රකාර වූ කවර ආකාර වූ දර්ශනයකින් සමන්විත වූයේ නුඹ 'කථංදස්සී' යනු වේ. **කථංසීලො** කීදෘශ වූ කෙසේ සිටි කවර ප්‍රකාර වූ කවර ආකාර වූ ශීලයකින් සමන්විත වූයේ නුඹ 'කථංදස්සී කථංසීලො' යනු වේ.

**උපසන්තොති වුච්චති** – ශාන්ත වූයේ උපශාන්ත වූයේ සන්සිඳුණේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ (කෙලෙස්) දුරලන ලද්දේ යයි කියනු ලැබෙයි පවසනු ලැබෙයි කථනය කරනු ලැබෙයි බණනු ලැබෙයි දක්වනු ලැබෙයි වහරනු ලැබේ. 'කථංදස්සී'යි අධිප්‍රඥාව අසයි, 'කථංසීලො' යි අධිශීලය අසයි, 'උපසන්තො' යි අධිචිත්තය අසා නුඹ 'කථංදස්සී කථං - සීලො උපසන්තොති වුච්චති' යනු වේ.

**තං මෙ ගොතම පබ්‍රෑහි** – 'තං, යනු: යම් පුද්ගලයකු අසම් ද යමකු අයැදිම් ද, යමකු ආරාධනා කෙරෙම් ද, පහදවම් ද; ඔහු **'ගොතම'**යි ඒ නිර්මිත බුදුහු භාග්‍යවත් බුදුන් ගොත්‍රයෙන් ආමන්ත්‍රණ කෙරෙති; **'පබ්‍රෑහි'** කියනු මැනව පවසවූ පතවවූ තබනු මැන, විවෘත කරනු මැන, විභාග කරනු මැන, පහළ කරනු මැන, ප්‍රකාශ කරනු මැනවැ යි' 'තං මෙ ගොතම, පබ්‍රෑහි' යනු වේ.

**පුච්ඡිතො උත්තමං නරං** – අසන ලදුවහු විචාරන ලදුවහු අයදන ලදුවහු අරියන ලදුවහු පහදවන ලදුවහු; **උත්තමං නරං** අග්‍ර වූ ශ්‍රෙෂ්ඨ වූ විශිෂ්ට වූ පාමොක් වූ උතුම් වූ ප්‍රවර වූ පුද්ගලයා නුඹ 'පුච්ඡිතො උත්තමං නරං' යනු වේ.

එහෙයින් කීහ ඒ නිර්මිත බුදුහු:

"**කථංදස්සී** -පෙ- **උත්තමං නරං**" යි.

## 10 - 2

(බුදුහු මෙසේ වදාරති:) යමෙක් ශරීරය බිඳීමෙන් පෙර මැ ප්‍රහීණ වූ තෘෂ්ණා ඇත්තේ පූර්වාන්ත සඞ්ඛ්‍යාත අතීතය (තෘෂ්ණා දෘෂ්ටීන්) ඇසුරු නො කෙළේ ප්‍රත්‍යුත්පන්නයෙහි (රාගරක්ත යැ යනාදීන්) නො ගිණියැ යුත්තේ වේ ද, ඒ රහත් මහණහට අනාගතයෙහි (තෘෂ්ණාදෘෂ්ටිවශයෙන්) පෙරටු කරන ලද්දෙක් නැත. (ඔහු උපශාන්ත යයි කියමි.)

**වීතතණ්හො පුරා භෙදා** – කය බිඳීමෙන් පෙර ආත්මභාවය බිඳීමෙන් පෙර කළෙවරය තැබීමෙන් පෙර ජීවිතෙන්ද්‍රියයාගේ සිඳීමෙන් පෙර, ප්‍රහීණ තෘෂ්ණා ඇත්තේ පහවැගිය තෘෂ්ණා ඇත්තේ හරන ලද තෘෂ්ණා ඇත්තේ වමනය කළ තෘෂ්ණා ඇත්තේ මුදන ලද තෘෂ්ණා ඇත්තේ ගෙවන ලද තෘෂ්ණා ඇත්තේ දුරලන ලද තෘෂ්ණා ඇත්තේ වීතරාග වූයේ විගතරාග වූයේ ත්‍යක්තරාග වූයේ වාන්තරාග වූයේ මුක්තරාග වූයේ ප්‍රහීණරාග වූයේ ප්‍රතිනිස්සෘෂ්ටරාග වූයේ නිර්වෘත වූයේ සිහිල් වූයේ (කායිකචෛතසික) සුඛානුභවනය කරනුයේ ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත වැ වෙසෙයි.

**භගවාති** ගාරවාධිවචනං; අපිච, භග්ගරාගොති භගවා; භග්ගදොසොති භගවා; භග්ගමොහොති භගවා; භග්ගදිට්ඨීති භගවා; භග්ගමානොති භගවා; භග්ගකණ්ටකොති[1] භගවා; භග්ගකිලෙසොති භගවා; භජි විභජි පටිවිභජි ධම්මරතනන්ති භගවා; භවානං අන්තකරොති භගවා; භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා; භජි වා භගවා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා; භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා; භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා; භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා; භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා; භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා; භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා; භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා; 'භගවා'ති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං 'භගවා'ති - 'වීතතණ්හො පුරා භෙදා ඉති[2] භගවා,

**පුබ්බමන්තමනිස්සිතොති** - පුබ්බන්තො වුච්චති අතීතො අද්ධා; අතීතං අද්ධානං ආරබ්භ තණ්හා පහීනා හොති, දිට්ඨි පටිනිස්සට්ඨා; තණ්හාය පහීනත්තා දිට්ඨියා පටිනිස්සට්ඨත්තා එවම්පි පුබ්බමන්තමනිස්සිතො; අථවා, 'එවංරූපො අහොසිං අතීතමද්ධාන'න්ති තත්ථ නන්දිං න සමන්නානෙති 'එවංවෙදනො අහොසිං, එවංසඤ්ඤො අහොසිං, එවංසඞ්ඛාරො අහොසිං, එවංවිඤ්ඤාණො අහොසිං අතීතමද්ධාන'න්ති තත්ථ නන්දිං න සමන්නානෙති; එවම්පි - 'පුබ්බමන්තමනිස්සිතො' අථවා, 'ඉති මෙ චක්ඛු අහොසි අතීතමද්ධානං, ඉති රූපා'ති තත්ථ න ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං, න ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි - 'පුබ්බමන්තමනිස්සිතො' ඉති මෙ සොතං අහොසි අතීතමද්ධානං, ඉති සද්දා'ති ඉති, මෙ ඝානං අහොසි අතීතමද්ධානං, ඉති ගන්ධා'ති, 'ඉති මෙ ජිව්හා අහොසි අතීතමද්ධානං ඉති රසා'ති', 'ඉති මෙ කායො අහොසි අතීතමද්ධානං, ඉති ඵොට්ඨබ්බා'ති, 'ඉති මෙ මනො අහොසි අතීතමද්ධානං, ඉති ධම්මා'ති තත්ථ න ඡන්දරාගපටිබද්ධං හොති විඤ්ඤාණං, න ඡන්දරාගපටිබද්ධත්තා විඤ්ඤාණස්ස න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි - 'පුබ්බමන්තමනිස්සිතො,' අථවා, යානිස්සු තානි[3] තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිතලපිතකීළිතානි, න තදස්සාදෙති, න තං නිකාමෙති; න ච තෙන විත්තිං ආපජ්ජති, එවම්පි 'පුබ්බමන්තමනිස්සිතො.'

---

1 තණ්හාති - මජසං. 2. භෙදාති - සීමු II. මජසං. PTS.
3. යානි තානි - මජසං.

**භගවා** – යනු: ගෞරවාධිවචන යැ. තවද: භග්නරාග නුයි – භගවත් යැ, භග්නද්වේෂ නුයි භගවත් යැ, භග්නමෝහ නුයි – භගවත් යැ, භග්නදෘෂ්ටි නුයි – භග්නමාන නුයි – භග්නකණ්ටක නුයි – භග්නක්ලේශ නුයි – භගවත් යැ; ධර්මරත්නය භාග – විභාග – ප්‍රතිවිභාග කෙළේ නුයි – භගවත් යැ, භවයන් කෙළවර කෙළේ නුයි – භගවත් යැ, භාවිතකාය – භාවිතචිත්ත–භාවිතප්‍රඥ ඇත් නුයි භගවත් යැ, බුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මනුෂ්‍යයන්ගේ රාහස්‍යයනට ස්ථාන වූ විවේකයට අනුරූප වූ වනයෙහි දුරසෙනසුන් හා ඉතා දුරසෙනසුන් සෙවනය කළාහු නුයි හෝ භගවත් යැ, බුදුහු චීවරපිණ්ඩපාතසේනාසනග්ලාන–ප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයනට හිමි වූවාහු නුයි භගවත් යැ, බුදුහු අර්ථරස යට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රමාණ්‍යයන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු අෂ්ටවිමෝක්ෂයන්ට අෂ්ට අභිභායතනයන්ට නව අනුපූර්විහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ' බුදුහු දශ සංඥාභාවනාවන්ට දශ කෘත්ස්නසමාපත්තීන්ට ආනා–පානසමෘති සමාධියට අශුභසමාපත්තියට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, බුදුහු සතර සමෘතිප්‍රස්ථානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයට හිමි වූවාහු නුයි හෝ – භගවත් යැ, බුදුහු දශ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍යයන්ට චතුර්ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්බුද්ධ ධර්මයන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යැ, 'භගවත්' යන තෙල නාමය මව විසින් නො කරන ලද, පියා විසින් – බෑයකු විසින් – බූනක විසින් මිතුරු – යහළුවන් විසින් – නෑසහලේනෑයන් විසින් – මහණබමුණන් විසින් දෙවියන් විසින් නො කරන ලද, 'භගවත්' යන යම් ප්‍රඥප්තියක් වී ද භගවත් බුදුවරුන්ට රහත්පෙලෙන් උපන් තෙල නාමය බෝමුල දී සර්වඥතාඥානය ලැබීම සමග සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් නුයි 'වීතතණ්හො පුරාභෙද ඉති භගවා' යනු වේ.

**පුබ්බමන්තමනිස්සිතො** – 'පුබ්බන්ත' යි අතීතකාලය කියනු ලැබෙයි. අතීතකාලය නිසා තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී දෘෂ්ටිය දුරලන ලද්දී වෙයි, තෘෂ්ණාව ප්‍රහීණ හෙයින් දෘෂ්ටිය දුරලූ හෙයින් මෙසේත් පූර්වාන්තය අනිඃශ්‍රිත වෙයි; නොහොත් අතීත කාලයෙහි මෙබඳු රූ ඇතියෙම් වීමි' එහි ඇලීම නො එලවයි, 'මෙබඳු වේදනා ඇතියෙම් වීමි, මෙබඳු සංඥා ඇතියෙම් වීමි, මෙබඳු සංස්කාර ඇතියෙම් වීමි, මෙබඳු විඥාන ඇතියෙම් වීමි' එහි ඇලීම නො එලවයි. මෙසේත් පූර්වාන්තය අනිඃශ්‍රිත වෙයි; නොහොත් 'මා ගේ ඇස අතීතයෙහි මෙසේ විය, රූපයෝ මෙසේ වූහ'යි එහි විඥානය ඡන්දරාගය පිළිබැඳි වූයේ නො වෙයි, විඥානය ඡන්දරාග ප්‍රතිබද්ධ නො වූ හෙයින් එය නො කැමැති වෙයි; එය නො කැමැති වනුයේ මෙසේත් 'පුබ්බමන්තමනිස්සිතො' යනු වේ. 'මාගේ ශ්‍රොත්‍රප්‍රසාදය අතීතකාලයෙහි මෙසේ විය, ශබ්දයෝ මෙසේ වූහ'යි – 'මාගේ ඝ්‍රාණප්‍රසාදය අතීතයෙහි මෙසේ විය, ගන්ධයෝ මෙසේ වූහ'යි – 'මාගේ ජිහ්වාප්‍රසාදය අතීතයෙහි මෙසේ විය, රසයෝ මෙසේ වූහ'යි – 'මාගේ කායප්‍රසාදය අතීතයෙහි මෙසේ විය, ස්ප්‍රෂ්ටව්‍යයෝ මෙසේ වූහ'යි – 'මාගේ භවාඞ්ග චිත්තය මෙසේ විය, මාගේ ත්‍රෛභූමක ධර්මාලම්බනයෝ මෙසේ වූහ'යි එහි විඥානය ඡන්දරාගප්‍රතිබද්ධ වූයේ නො වෙයි, විඥානය ඡන්දරාගප්‍රතිබද්ධ නො වූ හෙයින් එය නො කැමැති වෙයි, එය නො කැමැති වනුයේ මෙසේත් – 'පුබ්බමන්තමනිස්සිතො' යනු වේ. නොහොත් පෙර මාගමක සමග යම්බඳු ඒ ඒ කෙළිසිනාබස් වී නම් එය ආස්වාද නො කෙරෙයි, එය නො කැමැති වෙයි, එයින් නො ද සතුටට පැමිණේ. මෙසේත්– 'පුබ්බමන්තමනිස්සිතො' යනු වේ.

**වෙමජ්ඣෙනුපසංඛෙය්‍යොති** – 'වෙමජ්ඣං' වුච්චති පච්චුප්පන්නො අද්ධා, පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ තණ්හා පහීනා හොති, දිට්ඨි පටිනිස්සට්ඨා; තණ්හාය පහීනත්තා දිට්ඨියා පටිනිස්සට්ඨත්තා 'රත්තො'ති නුපසංඛෙය්‍යො, 'දුට්ඨො'ති නුපසංඛෙය්‍යො, 'මූළ්හො'ති නුපසංඛෙය්‍යො, 'විනිබද්ධො'ති නුපසංඛෙය්‍යො, 'පරාමට්ඨො'ති නුපසංඛෙය්‍යො, 'වික්ඛෙපගතො'ති නුපසං-ඛෙය්‍යො, 'අනිට්ඨංගතො'ති නුපසංඛෙය්‍යො, 'ථාමගතො'ති නුපසංඛෙය්‍යො; තෙ අභිසඛාරා පහීනා, අභිසඛාරානං පහීනත්තා ගතියා නුපසංඛෙය්‍යො: නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා; සො හෙතු නත්ථි, පච්චයො නත්ථි, කාරණං නත්ථි, යෙන සඛං ගච්ඡෙය්‍යාති – 'වෙමජ්ඣෙනුපසඛෙය්‍යො.'

**තස්ස නත්ථි පුරෙක්ඛතන්ති** – 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස; **පුරෙක්ඛාරාති** ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච, -පෙ- අයං තණ්හාපුරෙක්ඛාරො -පෙ- අයං දිට්ඨිපුරෙක්ඛාරො, තස්ස තණ්හාපුරෙක්ඛාරො පහීනො, දිට්ඨිපුරෙක්ඛාරො පටිනිස්සට්ඨො; තණ්හා-පුරෙක්ඛාරස්ස පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස පටිනිස්සට්ඨත්තා න තණ්හං වා දිට්ඨිං වා පුරතො කත්වා චරති, න තණ්හාධජො න තණ්හාකෙතු න තණ්හාධිපතෙය්‍යො, න දිට්ඨිධජො න දිට්ඨිකෙතු න දිට්ඨාධිපතෙය්‍යො, න තණ්හාය වා දිට්ඨියා වා පරිවාරිතො චරති; එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.' අථවා, 'එවංරූපො සියං අනාගතමද්ධාන'න්ති තත්ථ නන්දිං න සමන්නානෙති[1]; 'එවංවෙදනො සියං – එවංසඤ්ඤො සියං – එවංසඛාරො සියං – එවංවිඤ්ඤාණො සියං 'අනාගතමද්ධාන'න්ති තත්ථ නන්දිං න සමන්නානෙති;[1] එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.' අථවා, 'ඉති මෙ චක්ඛු[2] සියා අනාගතමද්ධානං, ඉති රූපා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති; චෙතසො අප්පණිධානපච්චයා[3] න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.' 'ඉති මෙ සොතං සියා අනාගතමද්ධානං, ඉති සද්දා'ති– 'ඉති මෙ ඝානං සියා අනාගතමද්ධානං, ඉති ගන්ධා'ති –'ඉති මෙ ජිව්හා සියා අනාගතමද්ධානං, ඉති රසා'ති – 'ඉති මෙ කායො සියා අනාගතමද්ධානං, ඉති ඵොට්ඨබ්බා'ති – 'ඉති මෙ මනො සියා අනාගතමද්ධානං, ඉති ධම්මා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති; චෙතසො අප්පණිධානපච්චයා න තදභිනන්දති; න තද-භිනන්දන්තො; එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.' අථවා 'ඉමිනාහං සීලෙන වා වතෙන[4] වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති; චෙතසො අප්පණිධානපච්චයා න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි – 'තස්ස නත්ථි පුරෙක්ඛතං.'

තෙනාහ භගවා:

"වීතතණ්හො පුරාභෙදා (ඉති භගවා) පුබ්බමන්තමනිස්සිතො,
වෙමජ්ඣෙනුපසංඛෙය්‍යො තස්ස නත්ථි පුරෙක්ඛත"න්ති.

---

1. සමන්නාගමෙති - PTS. ස්‍යා. 2. චක්ඛුං - සීමු. II.
3. අපණිධානපච්චයා - ස. 4. වත්තෙන - PTS

**වෙමජ්ඣෙනුපසඞ්ඛෙය්‍යො** – 'වෙමජ්ඣ' යි පවත්නා කාලය කියනු ලැබෙයි; වර්තමානකාලය අරබයා තෘෂ්ණාව ප්‍රහීණ වූවා, දෘෂ්ටිය දුරලන ලද්දී වෙයි, තෘෂ්ණාව ප්‍රහීණ බැවින් දෘෂ්ටිය දුරලූ බැවින් 'රාගයෙන් රක්ත' යැයි නො ගිණියැ යුත්තේ යැ, 'දුෂ්ට' යැයි – 'මූඪ' යැයි – මානයෙන් බැඳිණැ' යි – 'දෘෂ්ටියෙන් පරාමෘෂ්ට' යැයි – 'ඖද්ධත්‍යයෙන් වික්ෂෙපයට පැමිණියැ'යි – විචිකිත්සායෙන් අනිෂ්ඨාවට ගියේයැ'යි – 'අනුශයෙන් දෘඪබවට ගියේයැ 'යි නො ගිණියැ යුත්තේ යැ; ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයහ, ප්‍රහීණ බැවින් 'නෙරිසත් වනැ'යි හෝ 'තිරිසත්යොනි ඇතියෙකැ' යි හෝ 'ප්‍රෙතගති ඇතියෙකැ'යි හෝ 'මිනිස් වන්නේයැ'යි හෝ 'දෙවි වන්නේයැ'යි හෝ 'රූපී යැ'යි හෝ 'අරූපී යැ'යි හෝ 'සංඥී යැ'යි හෝ 'අසංඥී යැ' යි හෝ 'නෛවසංඥිනාසංඥී යැ'යි හෝ ගතියෙන් නො ගිණියැ යුත්තේ ය; යම් හෙයෙකින් සඞ්ඛ්‍යාවට යන්නේ නම්, ඒ හෙතුව නැත ඒ ප්‍රත්‍යය නැත කාරණය නැත් නුයි 'වෙමජ්ඣෙනුපසඞ්ඛෙය්‍යො' යනු වේ.

**තස්ස නත්ථි පුරෙක්ඛතං** – 'තස්ස' යනු: අතීත් ක්ෂීණාස්‍රව හට, **පුරෙක්ඛාර** නම්: තෘෂ්ණාපුරස්කාරය ද දෘෂ්ටිපුරස්කාරය ද'යි දෙ පුරස්කාර කෙනෙක් වෙති...ඔහු විසින් තෘෂ්ණාපුරස්කාරය ප්‍රහීණ යැ දෘෂ්ටිපුරස්කාරය දුරලන ලද,, තෘෂ්ණාපුරස්කාරය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිපුරස්කාරය දුරලූ බැවින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නො හැසිරෙයි, තෘෂ්ණාධ්වජ ඇතියේ නො වෙයි, තෘෂ්ණාකෙතු ඇතියේ – තෘෂ්ණාව අධිපති කොට ඇතියේ දෘෂ්ටිධ්වජ ඇතියේ – දෘෂ්ටිකෙතු ඇතියේ දෘෂ්ටිය අධිපති කොට ඇතියේ නො වෙයි; තෘෂ්ණාව විසින් හෝ දෘෂ්ටිය විසින් හෝ පිරිවරන ලදුයේ නො හැසිරෙයි; මෙසේ ත් 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ. නොහොත් 'අනාගතකාලයෙහි මෙබඳු රූ වෙම්ව'යි එහි නන්දිය (–තෘෂ්ණාව) නො එලවයි, 'මෙබඳු වෙදනා ඇති වෙම්ව'යි මෙබඳු සංඥා ඇති වෙම්ව'යි– මෙබඳු සංස්කාර ඇති වෙම්ව'යි – අනාගතයෙහි මෙබඳු විඥාන ඇති වෙම්ව යි එහි සතුට නො එලවයි; මෙසේත් – 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ. නොහොත් 'මාගේ ඇස අනාගතකාලයෙහි මෙසේ වන්නේය, රූපයෝ මෙසේ වන්නාහ' යි නො ලද්දහු ගේ ලැබීම පිණිස සිත නො පිහිටුවයි; චිත්තයා ගේ ප්‍රාර්ථනා නො තබන හෙයින් ඊට සතුටු නො වෙයි, ඊට සතුටු නො වන්නේ මෙසේ ත් – 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ. මා ගේ ශ්‍රොත්‍රප්‍රසාදය අනාගතයෙහි මෙසේ වන්නේය, ශබ්දයෝ මෙසේ වන්නාහ, යි – මා ගේ ඝ්‍රාණප්‍රසාදය අනාගතයෙහි මෙසේ වන්නේය, ගන්ධයෝ මෙසේ වන්නාහ'යි – 'මාගේ ජිහ්වාප්‍රසාදය අනාගතයෙහි මෙසේ වන්නේය. රසයෝ මෙසේ වන්නාහ'යි – මාගේ කායප්‍රසාදය අනාගතයෙහි මෙසේ වන්නේය, ස්ප්‍රෂ්ටව්‍යයෝ මෙසේ වන්නාහ'යි – 'මාගේ භවාඞ්ගචිත්තය අනාගතයෙහි මෙසේ වන්නේය, ත්‍රෛභූමකධර්මාලම්බනයෝ මෙසේ වන්නාහ'යි නො ලද්දහුගේ ලැබීම පිණිස සිත නො පිහිටුවයි, චිත්තයාගේ ප්‍රාර්ථනා නො තබන හෙයින් ඊට සතුටු නො වෙයි, ඊට සතුටු නො වනුයේ මෙසේ ත් 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ. නොහොත් 'මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍ය්‍යයෙන් හෝ දෙවියෙක් හෝ දෙවාන්‍යතරයෙක් හෝ වන්නෙමි' නො ලද්දහු ලැබීම පිණිස සිත නො පිහිටුවයි, සිත නො පිහිටුවීම හෙතු කොට ගෙන ඊට නො කැමැති වනුයේ මෙසේ ත් – 'තස්ස නත්ථි පුරෙක්ඛතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**වීතතණ්හා පුරාභෙදා** -පෙ- **තස්ස නත්ථි පුරෙක්ඛතං**"යි

## 10 - 8

අක්කොධනො අසන්තාසී[1] අවිකත්ථී අකුක්කුචො[2]
මන්තභාණී අනුද්ධතො ස වෙ වාචායතො මුනි.

**අක්කොධනො අසන්තාසීති** - 'අක්කොධනො'ති හි ඛො[3] වුත්තං, අපි ච, කොධො තාව වත්තබ්බො: දසහාකාරෙහි කොධො ජායති: 'අනත්ථං මෙ අචරී'ති කොධො ජායති. 'අනත්ථං මෙ චරතී'ති කොධො ජායති. 'අනත්ථං මෙ චරිස්සතී'ති කොධො ජායති. 'පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි, අනත්ථං චරති, අනත්ථං චරිස්සතී'ති කොධො ජායති, 'අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි, අත්ථං චරති, අත්ථං චරිස්සතී'ති කොධො ජායති. අට්ඨානෙ වා පන කොධො ජායති. යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස ව්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං ව්‍යාපත්ති ව්‍යාපජ්ජනා ව්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො[4] අනත්තමනතා චිත්තස්ස; අයං වුච්චති කොධො.

අපි ච, කොධස්ස අධිමත්තපරිත්තතා වෙදිතබ්බා: අත්ථි කඤ්චි කාලං[5] කොධො චිත්තාවිලකරණමත්තො හොති, න ච තාව මුඛකුලානවිකුලානො හොති; අත්ථි කඤ්චි කාලං කොධො මුඛකුලානවිකුලානමත්තො හොති, න ච තාව හනුසඤ්චොපනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො හනුසඤ්චොපනමත්තො හොති, න ච තාව ඵරුසවාචානිච්ඡාරණො හොති; අත්ථි කඤ්චි කාලං කොධො ඵරුසවාචානිච්ඡාරණමත්තො හොති, න ච තාව දිසාවිදිසානුවිලොකනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො දිසාවිදිසානුවිලොකනමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථපරාමසනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො දණ්ඩසත්ථපරාමසනමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථඅබ්භුක්කිරණො හොති; අත්ථි කඤ්චි කාලං කොධො දණ්ඩසත්ථඅබ්භුක්කිරණමත්තො හොති, න ච තාව දණ්ඩසත්ථඅභිනිපාතනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො දණ්ඩසත්ථඅභිනිපාතනමත්තො හොති, න ච තාව ඡින්නවිච්ඡින්නකරණො[6] හොති, අත්ථි කඤ්චි කාලං කොධො ඡින්නවිච්ඡින්නකරණමත්තො හොති, න ච තාව සම්භඤ්ජනපලිභඤ්ජනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො සම්භඤ්ජනපලිභඤ්ජනමත්තො හොති, න ච තාව අඞ්ගමඞ්ගාපකඩ්ඪනො හොති; අත්ථි කඤ්චි කාලං කොධො අඞ්ගමඞ්ගාපකඩ්ඪනමත්තො හොති, න ච තාව ජීවිතා වොරොපනො[7] හොති; අත්ථි කඤ්චි කාලං කොධො ජීවිතා වොරොපනමත්තො හොති, න ච තාව සබ්බචාගපරිච්චාගාය සණ්ඨිතො හොති, යතො කොධො පරපුග්ගලං ඝාතෙත්වා අත්තානං ඝාතෙති, එත්තාවතා කොධො පරමුස්සදගතො පරමවෙපුල්ලප්පත්තො හොති.

---

1. අසන්තාපි - මනුප. 2. අකුක්කුච්චො - සීමු. II. 3. යං හි ඛො - මජසං.
4. අසුරොපො - සීමු. II. 5. කිඤ්චිකාලං - ස
6. ඡිද්දවිච්ඡිද්දකරණො - ස. PTS. ඡින්නාවිච්ඡින්නකරණො - මනුප.
7. ජීවිතපනාසනො - ස්‍යා. PTS.

## 10 - 8

යමෙක් නො කිපෙන පියවි ඇතියේ නො තැතිගන්නා සුලු වූයේ තමා හුවා නො දක්වනා සුලු වූයේ කුකුස් රහිත වූයේ නුවණින් විමසා බණනු යේ උඩගු නො වූයේ වේ ද ඒ ක්ෂීණාශ්‍රව මුනි තෙම එකාන්තයෙන් වචනයෙන් සංයම වූයේ වේ. (ඔහු උපශාන්ත යයි කියමි.)

**අක්කොධනො අසන්තාසී** – 'අක්කොධනො' යි මැ කියන ලද, තවද පළමු කොට ක්‍රොධය කියයුතු යැ: දස අයුරෙකින් ක්‍රොධය උපදී: 'මට අවැඩ කෙළේ යැ'යි ක්‍රොධය උපදී, 'මට අවැඩ කෙරේ යැයි – 'මට අවැඩ කරන්නේ'යි ක්‍රොධය උපදී; 'මා ගේ ප්‍රිය මනාප වූවහුට අවැඩ කෙළේයැ අවැඩ කරයි – අවැඩ කරන්නේ යැ'යි ක්‍රොධය උපදී; 'මා ගේ අප්‍රිය අමනාප වූවහුට වැඩ කෙළේයැ – වැඩ කරයි – වැඩ කරන්නේයැ'යි ක්‍රොධය උපදී; යළි අස්ථානයෙහි හෝ ක්‍රොධය උපදී, යම් මෙබඳු වූ චිත්තයා ගේ ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් ප්‍රකොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් සිත පෙරළීමෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාරයෙක් ක්‍රොධ කරන බවෙක් ද්වෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂ්‍යවන බවෙක් පෙරළීමෙක් පෙරළෙන අයුරෙක් පෙරළුණු බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩබවෙක් නො පිරුණු බසෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ ක්‍රොධ යයි කියනු ලැබේ.

තවද, ක්‍රොධයා ගේ අඩුවැඩි බව දතයුතු යැ: කිසිවිටෙක ක්‍රොධ තෙමේ සිත කලඹන මතුයෙක් වෙයි, තව මුහුණ කුලනු හකුලනු වූයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය මුහුණ කුලන හකුලන පමණ වූයේ වෙයි, තව හනු සොලවනු වූයේ නො ද වෙයි; කිසි විටෙක කොපය හනු සොලවනුයේ වෙයි, තව පරොස්බස් කියන පමණ වූයේ නො ද වෙයි; කිසි විටෙක කොපය පරොස්බස් කියනා පමණ වෙයි, තවම වට පිට බලනු වූයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය වට පිට බලන පමණ වූයේ වෙයි, තවම දඬු සැත් නො ද ගත්තේ වෙයි; කිසිවිටෙක කොපය දඬු සැත් ගන්නා පමණ වූයේ වෙයි, තවම දඬු සැත් නගනුයේ නො ද වෙයි; කිසිවිටෙක කොපය දඬුසැත් කියපාන (–නගන) පමණ වූයේ වෙයි, තවම දඬු සැත් දමාගසනුයේ නො ද වෙයි; කිසි විටෙක කොපය දඬුසැත් දමාගසන පමණ වූයේ වෙයි, තවම (මෙරමා සිරුර) සිදුරු කරනු වූයේ නො ද වෙයි; කිසි විටෙක කොපය සිරුර සිදුරු බිදුරු කරන පමණ වූයේ වෙයි, තවම සිරුර සුණු විසුණු කරනුයේ නො ද වෙයි; කිසි විටෙක කොපය සිරුර සුණු විසුණු කරන පමණ වූයේ වෙයි, තවම අඟපසඟ ඇද කඩනුයේ නො ද වෙයි; කිසි විටෙක කොපය අඟපසඟ ඇද කඩන පමණ වූයේ වෙයි, තවම දිවි තොර කරනුයේ නො ද වෙයි; කිසි විටෙක කොපය දිවි තොර කරන පමණ වූයේ වෙයි, තවම මෙරමා දිවි නසා සිය දිවි නැසීම පිණිස සිටියේ නො ද වෙයි; යම් කලෙක ක්‍රොධය සතුරා නසා තමා ත් නසා ද, මෙතෙකින් ක්‍රොධ තෙමේ ඉතා බලවත් බවට ගියේ ඉතා මහත් බවට පැමිණියේ වේ.

යස්ස සො කොධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති 'අක්කොධනො.' කොධස්ස පහීනත්තා 'අක්කොධනො.' කොධවත්ථුස්ස පරිඤ්ඤාතත්තා 'අක්කොධනො.' කොධහෙතුස්ස උපච්ඡින්නත්තා 'අක්කොධනො'ති– 'අක්කොධනො.' **අසන්තාසීති** – ඉධෙකච්චො තාසී හොති උත්තාසී පරිත්තාසී, සො තසති උත්තසති පරිත්තසති භායති සන්තාසං ආපජ්ජති: කුලං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චය–භෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං[1] වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති[2] තසති උත්තසති පරිත්තසති භායති සන්තාසං ආපජ්ජති. ඉධ භික්ඛු අසන්තාසී හොති අනුත්තාසී අපරිත්තාසී, සො න තසති න උත්තසති න පරිත්තසති න භායති න සන්තාසං ආපජ්ජති: කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති න තසති න උත්තසති න පරිත්තසති න භායති න සන්තාසං ආපජ්ජතීති 'අක්කොධනො අසන්තාසී.'

**අවිකත්ථී අකුක්කුච්චොති** – 'ඉධෙකච්චො කත්ථී හොති විකත්ථී, සො කත්ථති විකත්ථති: අහමස්මි සීලසම්පන්නොති වා වතසම්පන්නොති වා සීලබ්බතසම්පන්නොති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා, උච්චාකුලා පබ්බජිතොති වා මහාකුලා පබ්බජිතොති වා මහාභොගකුලා පබ්බජිතොති වා උළාරභොගකුලා පබ්බජිතොති වා, ඤාතො යසස්සී සගහට්ඨපබ්බජිතානන්ති වා, ලාභිම්හි චීවර–පිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති වා, සුත්තන්ති–කොති වා විනයධරොති වා ධම්මකථිකොති වා, ආරඤ්ඤිකොති වා පිණ්ඩපාතිකොති වා පංසුකූලිකොති වා තෙචීවරිකොති වා සපදානචාරි–කොති වා ඛලුපච්ඡාභත්තිකොති වා නෙසජ්ජිකොති වා යථාසන්ථතිකොති වා, පඨමස්ස ඣානස්ස ලාභීති වා දුතියස්ස ඣානස්ස ලාභීති වා තතියස්ස ඣානස්ස ලාභීති වා චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා, ආකාසානඤ්චායතන–සමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා කත්ථති විකත්ථති. එවං න කත්ථති, න විකත්ථති; කත්ථනා විකත්ථනා ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති 'අවිකත්ථී.'

1. ගිලානුපට්ඨානං – සීමු. I[1]. 2 අප්පපඤ්ඤාතොම්හීති – සීමු. I.

යම්භික්ෂු විසින් ඒ ක්‍රොධය ප්‍රහීණ වූයේ නාසන ලද්දේ සන්හිඳුණේ දුරලන ලද්දේ අභව්‍යොත්පත්තික වූයේ නුවණ ගින්නෙන් දවන ලද්දේ වේ ද, හෙ තෙම 'අක්කොධනො' යි කියනු ලැබේ. ක්‍රොධය (අනාගැමිමගින්) ප්‍රහීණ කල බැවින් නො කිපෙනුයේ යැ; ක්‍රොධවස්තුව පරිඥත බැවින් නො කිපෙනුයේ යැ; ක්‍රොධහෙතුව සිඳින ලද බැවින් නො කිපෙනුයේ නුයි 'අක්කොධනො' වේ. **අසන්තාසී** – මෙ ලොවැ කිසිවෙක් බියසුලු වෙයි, ඉතා බියසුලු වෙයි, හාත්පසින් බියසුලු වේ. හේ ත්‍රස්ත වෙයි, ඉතා ත්‍රස්ත වෙයි, හාත්පසින් ත්‍රස්ත වෙයි, බියට පැමිණෙයි, සන්ත්‍රාසයට පැමිණෙයි: කුලය හෝ නො ලබම්, ගණයා හෝ – ආවාසය – ලාභ – යශස් – පැසැසුම් – සුව– චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලන්පසබෙහෙත්පිරිකර – ග්ලානොපසථායකයකු හෝ නො ලබම්, නො පැනෙනුයෙම් වෙමි' ත්‍රස්ත වෙයි, ඉතා ත්‍රස්ත වෙයි, හාත්පසින් ත්‍රස්ත වෙයි; තැති ගැනීමට පැමිණේ. මේ ශාසනයෙහි මහණ තෙම බියසුලු නො වෙයි, ඉතා බියසුලු නො වෙයි, හාත්පසින් බියසුලු නො වෙයි. හෙ තෙම ත්‍රස්ත – උත්‍රස්ත – – පරිත්‍රස්ත – නො වෙයි, භය නො වෙයි, සන්ත්‍රාසයට නො පැමිණෙයි: 'කුලය හෝ නො ලබම්, ගණයා – ආවාසය – ලාභ – යශස් – ප්‍රශංසා – සුබ – චීවර – පිණ්ඩපාත– සෙනාසන – ගිලන්පසබෙහෙත්පිරිකර – ග්ලානොපසථායකයකු හෝ නො ලබම්, නො පැනෙනුයෙම් වෙමි' ත්‍රස්ත – උත්‍රස්ත – පරිත්‍රස්ත නො වෙයි, භය නො වෙයි, සන්ත්‍රාසයට නො පැමිණේ නුයි 'අක්කොධනො අසන්තාසී' යනු වේ.

**අවිකත්ථී අකුක්කුච්චො** – මෙ ලොවැ කිසිවෙක් සිය ගුණය කියන සුලු වූයේ විවිධාකාරයෙන් ගුණ කියනසුලු වූයේ වෙයි; හෙතෙම කත්ථන විකත්ථන කෙරෙයි: 'මම් ශීලසම්පන්නයෙමි' හෝ 'ව්‍රතසම්පන්නයෙමි' හෝ 'ශීලව්‍රතසම්පන්නයෙමි' හෝ ජාතියෙන් හෝ ගොත්‍රයෙන් – කුලපුත්‍රභාව යෙන් – වර්ණසෞන්දර්‍ය්‍යයෙන් – ධනයෙන් – අධ්‍යයනයෙන් – කර්මායතන යෙන් හෝ ශිල්පායතනයෙන් හෝ විද්‍යාවෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රති– භානයෙන් හෝ එක්තරා වස්තුවකින් හෝ, උසස් කුලයෙන් (නික්ම) පැවිදි වූයෙමි හෝ මහාසාරකුලයෙන් පැවිදි වූයෙමි හෝ මහාභොග ඇති කුලයෙන් පැවිදි වූයෙමි හෝ බොහෝ සම්පත් ඇති කුලයෙන් පැවිදි වූයෙමි හෝ ගැහැවියන් සහිත පැවිද්දන් අතුරෙහි ප්‍රසිද්ධයෙමි පිරිවර ඇත්තෙමි හෝ චීවරපිණ්ඩපාතසෙනාසන ගිලන්පසබෙහෙත්පිරිකර ලබන සුලු වෙමි හෝ සෞත්‍රාන්තිකයෙමි – විනයධරයෙමි – ධර්මකථිකයෙමි හෝ ආරණ්‍යකාඞ්ග ඇත්තෙමි හෝ පිණ්ඩපාතික – පාංශුකූලික – ත්‍රෛචීවරික– සපදානචාරික – ඛලුපච්ඡාභත්තික – නෙසජ්ජික – යථාසන්ථතිකාඞ්ග ඇත්තෙමි හෝ, ප්‍රථමධ්‍යානලාභී වෙමි හෝ ද්විතීයධ්‍යාන – තෘතීයධ්‍යාන – චතුර්ථධ්‍යාන ලාභී වෙමි හෝ, ආකාසානඤ්චායතනසමාපත්තිය විඤ්ඤාණඤ්චායතන– සමාපත්තිය ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිය නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමා– පත්තිලාභී වෙමි' හෝ කත්ථන විකත්ථන කෙරෙයි; මෙසේ කත්ථන විකත්ථන නො කෙරෙයි, කත්ථනයෙන් විකත්ථනයෙන් (–ආත්මශලාඝායෙන්) දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැ ගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්‍ය්‍යාද කල සිතින් යුක්ත ව වෙසේ නුයි 'අවිකත්ථී' යනු වේ.

**අකුක්කුච්චොති** – ‘කුක්කුච්ච’න්ති හත්ථකුක්කුච්චම්පි කුක්කුච්චං, පාදකුක්කුච්චම්පි කුක්කුච්චං, හත්ථපාදකුක්කුච්චම්පි කුක්කුච්චං, “අකප්පියෙ කප්පියසඤ්ඤිතා, කප්පියෙ අකප්පියසඤ්ඤිතා, විකාලෙ කාලසඤ්ඤිතා, කාලෙ විකාලසඤ්ඤිතා, අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා, වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා. යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං, චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං[අ]”. අපිච ද්වීහි කාරණෙහි උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො: කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො? ‘කතං මෙ කායදුච්චරිතං, අකතං මෙ කායසුචරිත’න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො; ‘කතං මෙ වචීදුච්චරිතං, අකතං මෙ වචීසුචරිත’න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො; ‘කතං මෙ මනොදුච්චරිතං, අකතමෙම මනොසුචරිත’න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො; ‘කතො මෙ පාණාතිපාතො, අකතා මෙ පාණාතිපාතා වෙරමණී’ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ‘කතං මෙ අදින්නාදානං අකතා මෙ අදින්නාදානා වෙරමණී’ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ‘කතො මෙ කාමෙසු මිච්ඡාචාරො අකතා මෙ කාමෙසු මිච්ඡාචාරා වෙරමණී’ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ‘කතො මෙ මුසාවාදො, අකතා මෙ මුසාවාදා වෙරමණී’ති – ‘කතා මෙ පිසුනා වාචා, අකතා මෙ පිසුණාය වාචාය වෙරමණී’ති – ‘කතා මෙ ඵරුසා වාචා, අකතා මෙ ඵරුසාය වාචාය වෙරමණී’ති – ‘කතො මෙ සම්ඵප්පලාපො, අකතා මෙ සම්ඵප්පලාපා වෙරමණී’ති – ‘කතා මෙ අභිජ්ඣා, අකතා මෙ අනභිජ්ඣා’ති – ’කතො මෙ ව්‍යාපාදො – අකතො මෙ අව්‍යාපාදො’ති – ‘කතා මෙ මිච්ඡාදිට්ඨි, අකතා මෙ සම්මාදිට්ඨී’ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. එවං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. අථ වා සීලෙසුම්හි න පරිපූරකාරීති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරොති – භොජනෙ අමත්තඤ්ඤුම්හීති ජාගරියං අනනුයුත්තොම්හීති – න සතිසම්පජඤ්ඤෙන සමන්නාගතොම්හීති – අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති – අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති – අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති – අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති අභාවිතානි මෙ පඤ්චබලානීති – අභාවිතා මෙ සත්ත බොජ්ඣඞ්ගාති – අභාවිතො[1] මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති – දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති – සමුදයො මෙ අප්පහීනොති, මග්ගො මෙ අභාවිතොති – නිරොධො මෙ අසච්ඡිකතොති උප්පජ්ජති, කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. යං එතං කුක්කුච්චං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති අකුක්කුච්චොති – අවිකත්ථී අකුක්කුච්චො.

1. අභාවිතා – සීමු. II.
අ. විභඞ්ගප්පකරණ – ඣානවිභඞ්ග.

**අක්කුක්කුච්චො** – 'කුක්කුච්ච' නම්: අත්කුකුස (=අතින් කළ කුත්සිත ක්‍රියාව) ද කුකුස යැ, පාකුකුස ද කුකුස යැ, අත්පාකුකුස ද කුකුස යැ, නො කැපයෙහි කැපයැ යන සත් (=සංඥ) ඇතිබව – කැපයෙහි අකැපසත් ඇතිබව – විකාලයෙහි කාලයැ'යි සත් ඇතිබව – කාලයෙහි විකාලයැ'යි සත් ඇතිබව – නිවරදෙහි වරදැයි හැඟීම – වරදෙහි නිවරදැයි හැඟීම යැ යන මෙබඳු යම් කුකුසෙක් කුකුස් අයුරෙක් කුකුස් කළබවෙක් සිතෙහි විපිළිසරෙක් චිත්තවිලෙඛයෙක් වේ ද, මේ 'කුක්කුච්ච' යයි කියනු ලැබේ. තවද දෙ කාරණෙකින් කුකුස චිත්තවිප්පටිසාරය චිත්තවිලෙඛය උපදී: කළ බැවින් හා නො කළ බැවින් හා යැ, කළබැවින් හා නො කළ බැවින් හා කුකුස...විලෙඛය කෙසේ උපදී ද යත්? 'මා විසින් කායදුශ්චරිතය කරන ලද, මා විසින් කාය සුචරිතය නො කරන ලද'යි කුකුස චිත්තවිප්පටිසාරය චිත්තවිලෙඛය උපදී; 'මා විසින් වාග්දුශ්චරිතය කරන ලද, වාක්සුචරිතය නො කරන ලද'යි... 'මා විසින් මනොදුශ්චරිතය කරන ලද, මා විසින් මනස්සුචරිතය නො කරන ලද'යි කුකුස සිතෙහි විපිළිසර සිතෙහි විලෙඛය උපදී; 'මා විසින් ප්‍රාණඝාතය කරන ලද, මා විසින් ප්‍රාණඝාතවිරමණය නො කරන ලද'යි... 'මා විසින් අදත්තාදානය කරන ලද, මා විසින් අදත්තාදානවිරමණය නො කරන ලද'යි...'මා විසින් කාමමිථ්‍යාචාරය කරන ලද, මා විසින් කාමමිථ්‍යාචාරයෙන් විරමණය නො කරන ලද'යි...'මා විසින් මෘෂා කියන ලද, මා විසින් මෘෂාවාදවිරමණය නො කරන ලද'යි – 'මා විසින් පිසුනුබස් කියන ලද, පිසුනු බසින් වැළැකීම නො කරන ලද'යි – 'මා විසින් පරුෂවචන කියන ලද, පරුෂවචනයෙන් වැළැකීම නො කරන ලද'යි –'මා විසින් ප්‍රලාප කියන ලද, ප්‍රලාපයෙන් වැළැකීම නො කරන ලද'යි – 'මා විසින්, අභිධ්‍යාව (=දැඩිලොභය) කරන ලද, අනභිධ්‍යාව මා විසින් නො කරන ලද'යි – 'මා විසින් ව්‍යාපාද කරන ලද, අව්‍යාපාද මා විසින් නො කරන ලද'යි – 'මා විසින් මිථ්‍යාදෘෂ්ටි ගන්නා ලද, සම්‍යග්දෘෂ්ටි මා විසින් නො ගන්නා ලද'යි කුකුස සිතට විපිළිසර මනොවිලෙඛය උපදී; මෙසේ කළ බැවින් ද නො කළ බැවින් ද කෞකෘත්‍ය චිත්තවිප්‍රතිසාර මනොවිලෙඛ උපදී; නොහොත් ඉන්ද්‍රියයන්හි නො පියූ දොර ඇතියෙම් වීමි– භොජනයෙහි පමණ නො දතුයෙම් වීමි – නිදිවැරීමෙහි නො යෙදුණෙමි– සිහිනුවණින් සමන්විතයෙම් නො වීමි – මා විසින් සතර සිවටන් නො වඩන ලද'යි – සතර සම්‍යක්ප්‍රධාන මා විසින් නො වඩන ලද'යි– සතර ඍද්ධිපාද මා විසින් නො වඩන ලද'යි – පඤ්චෙන්ද්‍රියයෝ මා විසින් නො වඩන ලදහ'යි – පඤ්චබලයෝ මා විසින් නො වඩන ලදහ'යි– සප්තබොධ්‍යඞ්ගයෝ මා විසින් නො වඩන ලදහ'යි – ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය මා විසින් නො වඩන ලද'යි – මා විසින් දුඃඛසත්‍යය අපරිඥාත යැ'යි– සමුදයසත්‍යය අප්‍රහීණ යැ'යි – මාර්ගසත්‍යය අභාවිත යැ'යි – නිරොධසත්‍යය මා විසින් ප්‍රත්‍යක්ෂ නො කරන ලද'යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. යමක්හු හට තෙල කුකුස ප්‍රහීණ ද සමුච්ඡින්න ද සන්හිඳිණි ද නැසිණි ද උපතට නුසුදුසු වී ද, නුවණගින්නෙන් දැවිණි ද, හෙතෙම 'අකුක්කුච්ච' යැයි කියනු ලැබේ නුසි' අවිකම්පී අකුක්කුච්චො' යනු වේ.

**මන්තභාණී අනුද්ධතොති** – ‘මන්තා’ වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා – අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි[ෂ]; මන්තාය පරිග්ගහෙත්වා පරිග්ගහෙත්වා වාචං භාසති, බහුම්පි කථෙන්තො බහුම්පි භණන්තො බහුම්පි දීපයන්තො බහුම්පි වොහරන්තො දුක්කථිතං දුබ්භණිතං දුල්ලපිතං දුරුත්තං දුබ්භාසිතං වාචං න භාසතීති මන්තභාණී. **අනුද්ධතො** – තත්ථ කතමං උද්ධච්චං? යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස, ඉදං වුච්චති උද්ධච්චං. යස්සෙතං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති අනුද්ධතොති – ‘මන්තභාණී අනුද්ධතො.’

**ස වෙ වාචායතො මුනීති** – ‘ඉධ භික්ඛු මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති, සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස. පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති; ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය, ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො[1] සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති, යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති, කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති, කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. චතූහි වචීසුචරිතෙහි සමන්නාගතො චතුදොසාපගතං වාචං භාසති, ද්වත්තිංසාය තිරච්ඡානකථාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. දස කථාවත්ථූනි[2] කථෙති, සෙය්‍යථිදං? අප්පිච්ඡකථං කථෙති. සන්තුට්ඨිකථං කථෙති. පවිවෙකකථං අසංසග්ගකථං විරියාරම්භකථං සීලකථං සමාධිකථං පඤ්ඤාකථං විමුත්තිකථං විමුත්තිඤාණදස්සනකථං සතිපට්ඨානකථං සම්මප්පධානකථං ඉද්ධිපාදකථං ඉන්ද්‍රියකථං බලකථං බොජ්ඣඞ්ගකථං මග්ගකථං ඵලකථං නිබ්බානකථං කථෙති; වාචාය යතො යත්තො පරියත්තො ගුත්තො ගොපිතො රක්ඛිතො වූපසන්තො; මුනීති මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි[ෂ] -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනීති – ස වෙ වාචායතො මුනි.

තෙනාහ භගවා:

“අක්කොධනො අසන්තාසී අවිකත්ථී අකුක්කුචො,
මන්තභාණී අනුද්ධතො ස වෙ වාචායතො මුනී”ති.

---

ෂ. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

1. සමග්ගරාමො - පු. 2. දස වත්ථූනි - PTS.

**මන්තභාණී අනුද්ධතො** – 'මන්තා'යි ප්‍රඥාව කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක්...අමෝහයෙක් ධම්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වී ද එය යි; මන්තා (–ප්‍රඥා) යෙන් විමස විමසා වචන කියයි, බොහෝ බසුදු කියනුයේ බොහෝ බණනුයේ බොහෝ දක්වනුයේ බොහෝ කොට ත් වහරනුයේ දුෂ්කථිත වූ දුර්භණිත වූ දුල්ලපිත වූ තපුරු කොට කියන ලද දුබැසි වූ බසක් නො කියා නුයි 'මන්තභාණී' යැ; **අනුද්ධතො** – එහි 'උද්ධච්චය' කවරැ යත් ? සිතෙහි යම් උඩඟු බවෙක් නො සන්හුන් බවෙක් සිතෙහි විසුරුණු බවෙක් චිත්තයා ගේ භ්‍රාන්ත (–නැතිගත්) බවෙක් වේ නම්, මේ 'උද්ධච්ච' යයි කියනු ලැබේ. යමක්හු හට මේ උද්ධත බව ප්‍රහීණ ද සමුච්ඡින්න වී ද සන්හිඳිණී ද නැසිණී ද අභව්‍යොත්පත්තික ද, ඥානාග්නියෙන් දැවිණී ද, හේ 'අනුද්ධත' යයි කියනු ලැබේ නුයි 'මන්තභාණී අනුද්ධතො' යනු වේ.

**ස වෙ වාචායතො මුනි** – මෙ සස්නෙහි මහණ තෙම මෘෂාවාදය හැර මෘෂාවාදයෙන් වැළැකුණේ වෙයි, සැබෑ කියනුයේ සැබැවින් සැබව ගළපනුයේ තිර වූයේ හැදැහිය යුතු බස් ඇතියේ ලොකයා නො රවට නුයේ වෙයි; පිසුනු බස් හැරපියා පිසුනු බසින් වැළැකුණේ වෙයි: මෙතැනින් අසා මූන්ගේ බිඳුමට අතැන නො කියනුයේ, අතැනින් අසා අරුන්ගේ බිඳුමට මොවුන්ට නො කියනුයේ වෙයි, මෙසේ භින්න වූවන් ද සමග කරනුයේ සමග වූවන් හෝ දැඩි කරනුයේ සමගියෙහි ඇලුම් ඇතියේ සමග වූවන් කෙරෙහි ඇලුණේ සමග වූවන්ට සතුටු වූයේ සමග කරන බස් කියනුයේ වෙයි. රළුබස් හැරපියා රළුබසින් වැළැකුණේ වෙයි, යම් වචනයෙක් නිදොස් ද කනට සුව ද පෙම් උපදවා ද සිතට වදී ද, පුරෙහි වූවා ද බොහෝ දෙනාට කැමැති ද බොහෝ දෙනාගේ මන වඩා ද, එබඳු වචන කියන්නේ වෙයි. නිසරු (–ප්‍රලාප) බස් හැරපියා නිසරුබසින් වැළැකුණේ වෙයි, කල් බලා කියනුයේ සැබවක් ම කියනුයේ වැඩදායක තෙපුල් කියනුයේ ධර්මවාදී වූයේ විනයවාදී වූයේ සුදුසු කල කරුණු සහිත වූ පිරිසිඳීම් ඇති වැඩ සහිත වූ ලෙසි තැබිය යුතු වූ තෙපුලක් ම කියන්නේ වෙයි, සතර වාක්සුචරිතයෙන් සමන්විත වූයේ සතර දොසින් වෙන්වූ තෙපුලක් ම කියයි, දෙතිස් තිරිසන් කථාවෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වෙසෙයි; දශ කථාවස්තූන් කියයි, ඒ මෙසේ යැ: අල්පෙච්ඡකථාව කියයි, ඉතරෙතරප්‍රත්‍යසන්තොෂකථාව කියයි, විවෙකනිශ්‍රිත කථාව කියයි, අසංසර්ගකථාව – වීර්‍යාරම්භකථාව – ශීලකථාව – සමාධිකථාව – ප්‍රඥාකථාව– විමුක්තිකථාව – විමුක්තිඥානදර්ශනකථාව – සතිපට්ඨාන – සම්‍යක්ප්‍රධාන– ඍද්ධිපාද – ඉන්ද්‍රිය–බල – බොධ්‍යඞ්ග – මාර්ග – ඵල – නිර්‍වාණකථාව කියයි; වචනයෙන් සංයම වූයේ දැමුණේ හාත්පසින් දැමුණේ ගොපන වූයේ ගොපිත වූයේ රැකුණේ සන්හිඳුණේ යැ; **මුනි** – 'මොන'යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක්...'ස වෙ වාචායතො මුනි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අක්කොධනො –පෙ– වාචායතො මුනි"යි

## 10 - 4

නිරාසත්ති අනාගතෙ අතීතං නානුසොචති,
විවෙකදස්සී ඵස්සෙසු දිට්ඨීසු ච න නීයති.

**නිරාසත්ති අනාගතෙති** – 'ආසත්ති' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං[a], යස්සෙසා ආසත්ති තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා. එවම්පි – 'නිරාසත්ති අනාගතෙ.' අථවා, එවංරූපො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්නානෙති[1], එවංවෙදනො සියං – එවංසඤ්ඤො සියං – එවංසඞ්ඛාරො සියං – එවං විඤ්ඤාණො සියං අනාගතමද්ධානන්ති තත්ථ නන්දිං න සමන්නානෙති, එවම්පි නිරාසත්ති අනාගතෙ; අථවා, 'ඉති මෙ චක්ඛුං සියා අනාගතමද්ධානං, ඉති රූපා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති, චෙතසො අප්පණිධානප්පච්චයා න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි නිරාසත්ති අනාගතෙ; 'ඉති මෙ සොතං සියා අනාගතමද්ධානං, ඉති සද්දා'ති -පෙ- 'ඉති මෙ මනො සියා අනාගතමද්ධානං, ඉති ධම්මා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති, චෙතසො අප්පණිධානප්පච්චයා න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි නිරාසත්ති අනාගතෙ; අථවා, 'ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරො වා'ති අප්පටිලද්ධස්ස පටිලාභාය චිත්තං න පණිදහති, අප්පණිධානප්පච්චයා න තදභිනන්දති, න තදභිනන්දන්තො එවම්පි 'නිරාසත්ති අනාගතෙ.'

**අතීතං නානුසොචතීති** – විපරිණතං වා වත්ථුං න සොචති, විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති; චක්ඛුං මෙ විපරිණතන්ති න සොචති, සොතං මෙ – ඝානං මෙ – ජිව්හා මෙ – කායො මෙ – රූපා මෙ – සද්දා මෙ – ගන්ධා මෙ – රසා මෙ – ඵොට්ඨබ්බා මෙ – කුලං මෙ – ගණො මෙ – ආවාසො මෙ – ලාභො මෙ – යසො මෙ – පසංසා මෙ – සුඛං මෙ – චීවරං මෙ – පිණ්ඩපාතො මෙ – සෙනාසනං මෙ – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරො මෙ – මාතා මෙ – පිතා මෙ – භාතා මෙ – භගිනී මෙ – පුත්තා මෙ – ධීතා මෙ – මිත්තා මෙ – අමච්චා[2] මෙ – ඤාතකා මෙ – සාලොහිතා මෙ විපරිණතාති න සොචති. න කිලමති. න පරිදෙවති. න උරත්තාළිං කන්දති. න සම්මොහං ආපජ්ජතීති – 'අතීතං නානුසොචති.'

---

a. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ.

1. සමන්නාගමෙන්ති – PTS. 2. මිත්තාමච්චා – PTS.

## 10 - 4

යමෙක් අනාගතයෙහි තෘෂ්ණා රහිත වේ ද, ඉක්මැගිය දෑයට ශෝක නො කෙරේ ද, වර්තමාන චක්ඛුසම්ඵස්සාදියෙහි ආත්මාදිභාවවිවේකය දකී ද, දෙසැට දිට්ඨි අතුරෙන් කිසි දෘෂ්ටියකින් නො පමුණුවනු ලැබේ ද, (ඔහු උපශාන්ත යයි කියමි.)

**නිරාසත්ති අනාගතෙ**- 'ආසත්ති'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි; යමක්හු විසින් මේ ආසත්ති සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සමුච්ඡින්න වූවා සන්හිඳුවන ලද්දී දුරලන ලද්දී උපතට නුසුදුසු වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද, මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ. නොහොත් 'අනාගතයෙහි මෙබඳු රූ ඇති වෙම්ව'යි එහි තෘෂ්ණාව නො එළවයි, 'මෙබඳු වේදනා ඇති වෙම්ව'යි – සංඥා – සංස්කාර – විඥාන ඇති වෙම්ව'යි එහි තෘෂ්ණාව නො එළවයි, මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ' නොහොත් 'අනාගතයෙහි මෙසේ මා ගේ චක්ෂුඃප්‍රසාදය වන්නේය, මෙසේ රූපයෝ වන්නාහ'යි නො ලද්දහු ගේ ලැබීමට සිත නො පිහිටුවයි, සිත පිළිබඳ ප්‍රාර්ථනා නො තබන හෙයින් ඊට සතුටු නො වෙයි, ඊට සතුටු නො වන්නේ මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ. 'අනාගතයෙහි මා ගේ ශ්‍රොත්‍රප්‍රසාදය මෙසේ වන්නේය, ශබ්දයෝ මෙසේ වන්නාහ'යි...අනාගතයෙහි මා ගේ භවාඞ්ගමනස මෙසේ වන්නේය, ත්‍රෛභූමකධර්මාලම්බනයෝ මෙසේ වන්නාහ'යි නො ලද්දහු ගේ ලැබීමට සිත නො පිහිටුවයි, චිත්තයා ගේ ප්‍රාර්ථනා නැති බැවින් ඊට නො කැමැති වෙයි, ඊට නො කැමැති වන්නේ මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ. නොහොත් 'මම මේ ශීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්‍යයෙන් හෝ දෙවියෙක් හෝ දෙවාන්‍යතරයෙක් හෝ වන්නෙමි' නො ලද්දහු ගේ ලැබීමට චිත්තප්‍රණිධිය නො පිහිටුවයි, චිත්තප්‍රණිධි නො තබන හෙයින් ඊට සතුටු නො වෙයි, ඊට සතුටු නො වන්නේ මෙසේ ත් – 'නිරාසත්ති අනාගතෙ' යනු වේ.

**අතීතං නානුසොචති** - නැසුණු වස්තුවට හෝ ශෝක නො කෙරෙයි, වස්තුව නැසෙන කල්හි හෝ ශෝක නො කෙරෙයි, 'මා ගේ ඇස නැසිණැ'යි ශෝක නො කෙරෙයි, කන – නැහැය – දිව – කය – රූප – ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය – මාගේ කුලය – ගණයා – ආවාසය – ලාභ – යශස් – ප්‍රශංසා සුඛ – චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර – මව – පියා – සහෝදරයා – සහෝදරිය – පුතා – දුව – මිත්‍රයෝ – සහායයෝ – නෑයෝ – සහලේනෑයෝ නැසුණාහ'යි ශෝක නො කරයි, නො වෙහෙසෙයි, නො හඬයි, ළෙහි පැහැර නො හඬයි, සම්මොහයට නො පැමිණේ නුයි 'අතීතං නානුසොචති' යනු වේ.

**විවෙකදස්සී ඵස්සෙසූති** – 'ඵස්සො'ති චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොසම්ඵස්සො අධිවචනසම්ඵස්සො පටිඝසම්ඵස්සො සුඛවෙදනීයො ඵස්සො දුක්ඛවෙදනීයො ඵස්සො අදුක්ඛමසුඛවෙදනීයො ඵස්සො. කුසලො ඵස්සො අකුසලො ඵස්සො අබ්‍යාකතො ඵස්සො කාමාවචරො ඵස්සො රූපාවචරො ඵස්සො අරූපාවචරො ඵස්සො සුඤ්ඤතො ඵස්සො අනිමිත්තො ඵස්සො අප්පණිහිතො ඵස්සො ලොකියො ඵස්සො ලොකුත්තරො ඵස්සො අතීතො ඵස්සො අනාගතො ඵස්සො පච්චුප්පන්නො ඵස්සො, යො එවරූපො ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං, අයං වුච්චති ඵස්සො.

**විවෙකදස්සී ඵස්සෙසූති** – චක්ඛුසම්ඵස්සං විවිත්තං පස්සති අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා, සොතසම්ඵස්සං විවිත්තං පස්සති – ඝානසම්ඵස්සං විවිත්තං පස්සති – ජිව්හාසම්ඵස්සං විවිත්තං පස්සති – කායසම්ඵස්සං විවිත්තං පස්සති – මනොසම්ඵස්සං විවිත්තං පස්සති – අධිවචනසම්ඵස්සං විවිත්තං පස්සති – පටිඝසම්ඵස්සං විවිත්තං පස්සති – සුඛවෙදනීයං ඵස්සං[1] – දුක්ඛවෙදනීයං ඵස්සං[1] – අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං[1] – කුසලං ඵස්සං – අකුසලං ඵස්සං – අව්‍යාකතං ඵස්සං – කාමාවචරං ඵස්සං – රූපාවචරං ඵස්සං – අරූපාවචරං ඵස්සං – ලොකියං ඵස්සං* විවිත්තං පස්සති අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා; අථවා අතීතං ඵස්සං අනාගතෙහි ච[2] පච්චුප්පන්නෙහි ච ඵස්සෙහි විවිත්තං පස්සති, අනාගතං ඵස්සං අතීතෙහි ච පච්චුප්පන්නෙහි ච ඵස්සෙහි විවිත්තං පස්සති, පච්චුප්පන්නං ඵස්සං අතීතෙහි ච අනාගතෙහි[3] ච ඵස්සෙහි විවිත්තං පස්සති; අථවා, යෙ තෙ ඵස්සා අරියා අනාසවා ලොකුත්තරා සුඤ්ඤතාපටිසඤ්ඤුත්තා, තෙ ඵස්සෙ විවිත්තෙ පස්සති රාගෙන දොසෙන මොහෙන කොධෙන උපනාහෙන මක්ඛෙන පළාසෙන ඉස්සාය මච්ඡරියෙන මායාය සාඨෙය්‍යෙන ථම්භෙන සාරම්භෙන මානෙන අතිමානෙන මදෙන පමාදෙන සබ්බකිලෙසෙහි සබ්බදුච්චරිතෙහි සබ්බදරථෙහි සබ්බසන්තාපෙහි සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි විවිත්තෙ පස්සතීති – 'විවෙකදස්සී ඵස්සෙසු.'

**දිට්ඨීසු ච න නීයතීති** – තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, සො දිට්ඨියා න යායති න නීයති න වුය්හති න සංහරීයති නපි තං දිට්ඨිගතං සාරතො පච්චෙති න පච්චාගච්ඡතීති – 'දිට්ඨීසු ච න නීයති.'

තෙනාහ භගවා:

"නිරාසත්ති අනාගතෙ අතීතං නානුසොචති,
විවෙකදස්සී ඵස්සෙසු දිට්ඨීසු ච න නීයතී"ති.

**10 – 5**

පතිලීනො අකුහකො අපිහාලු අමච්ඡරී,
අප්පගබ්භො අජෙගුච්ඡො පෙසුණෙය්‍යෙ ච නො යුතො.

---

1. සම්ඵස්සං – PTS. ස්‍යා. 2. අනාගතෙහි ච ඵස්සෙහි – PTS. ස්‍යා.
3. පච්චුප්පන්නෙහි – සීමු. II.

* 'ලොකුත්තරං ඵස්ස'න්ති පාඨො ස්‍යාම – PTS. පොත්ථකෙසු දිස්සති.

**විවෙකදස්සී ඵස්සෙසු** - 'ඵස්ස' නම්: චක්ෂුර්විඥානසහජාත ස්පර්ශය ශ්‍රොත්‍ර - ඝ්‍රාණ - ජිහ්වා - කාය - මනොවිඥානසහජාත ස්පර්ශය අධිවචන (-මනොද්වාරික) ස්පර්ශය ප්‍රතිඝ (-පඤ්චද්වාරික) ස්පර්ශය සුඛවෙදනා උපදවන ස්පර්ශය දුඃඛ - උපෙක්ෂාවෙදනීය ස්පර්ශය කුශලචිත්තසහජාත ස්පර්ශය අකුශල - අව්‍යාකෘත - කාමාවචර -රූපාවචර - අරූපාවචර - ශූන්‍යත- අනිමිත්ත - අප්‍රණිහිත - ලෞකික - ලොකොත්තර - අතීත - අනාගත- ප්‍රත්‍යුත්පන්න ස්පර්ශය යන මෙබඳු වූ යම් පහසෙක් පහස්නා අයුරෙක් සංස්පර්ශාකාරයෙක් සංස්පර්ශ කල බවෙක් වේ ද, මේ 'ඵස්ස' යයි කියනු ලැබේ. **විවෙකදස්සී ඵස්සෙසු** - චක්ෂුඃසංස්පර්ශය ආත්මයෙන් හෝ ආත්ම- නීයභාවයෙන් හෝ නිත්‍ය බැවින් - ධ්‍රැව - ශාශ්වත - අවිපරිණාමභාවයෙන් හෝ වෙන් කොට දකී, ශ්‍රොත්‍රසංස්පර්ශය...ඝ්‍රාණ - ජිහ්වා - කාය - මනො- අධිවචනසංස්පර්ශය - පටිඝ - සුඛවෙදනීය - දුක්ඛවෙදනීය - කුසල - අකුසල අව්‍යාකෘත - කාමාවචර - රූපාවචර - අරූපාවචර - ලෞකිකස්පර්ශය ආත්ම- භාවයෙන් හෝ ආත්මනීය - නිත්‍ය - ධ්‍රැව - ශාශ්වත - අවිපරිණාමස්වභාව- යෙන් හෝ වෙන් කොට දකී; නොහොත් අතීතස්පර්ශය අනාගත වූ ද වර්තමාන වූ ද පහසුන් ගෙන් වෙන් කොට දකී, අනාගතස්පර්ශය අතීත- ප්‍රත්‍යුත්පන්නස්පර්ශයන්ගෙන් ද වෙන් කොට දකී, වර්තමානස්පර්ශය අතීත- අනාගතස්පර්ශයන්ගෙන් ද වෙන් කොට දකී; නොහොත් යම් ඒ පහස් කෙනෙක් ආර්‍ය්‍ය වූවාහු අනාශ්‍රව වූවාහු ලොකොත්තර වූවාහු ශූන්‍යතා ප්‍රතිසංයුක්ත වූවාහු ද, ඒ ස්පර්ශයන් වෙන් වූවන් කොට දකී, රාගයෙන් ද්වෙෂයෙන් මොහයෙන් ක්‍රොධයෙන් උපනාහයෙන් මක්ඛයෙන් පලාසයෙන් ඊර්ෂ්‍යායෙන් මාත්සර්‍ය්‍යයෙන් මායාවෙන් ශාඨ්‍යයෙන් ස්තම්භයෙන් මානයෙන් අතිමානයෙන් මදයෙන් ප්‍රමාදයෙන් සියලු කෙලෙසුන්ගෙන් සියලු දුශ්චරිතයන්ගෙන් සියලු දරථයන්ගෙන් සියලු පරිදාහයන්ගෙන් සියලු සන්තාපයන්ගෙන් සියලු අකුශලාභිසංස්කාරයන්ගෙන් වෙන් වූවන් කොට දකී නුයි 'විවෙකදස්සී ඵස්සෙසු' යනු වේ.

**දිට්ඨීසු ච න නීයති** - ඔහු විසින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහු සිඳින ලද්දාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යාත්පත්තික වූවාහු ඥානාග්නීන් දග්ධ වූවාහුය, හේ දෘෂ්ටිය විසින් නො යවනු ලැබෙයි නො පමුණුවනු ලැබෙයි නො හරිනු ලැබෙයි, ඒ දෘෂ්ටිගතයට සාරභෙයින් නො ද පැමිණෙයි, නො පෙරළා ඒ නුයි 'දිට්ඨීසු ච න නීයති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**නිරාසත්ති අනාගතෙ -පෙ- දිට්ඨීසු ච න නීයති**"යි.

## 10 - 5

යමෙක් රාගාදිය ප්‍රහීණ කෙලේ‍ර කුහක නො වූයේ තෘෂ්ණා රහිත වූයේ නො මසුරු වූයේ කායාදි ප්‍රගල්භ රහිත වූයේ ජුගුප්සා නො කටයුතු වූයේ පිසුනු කීමෙහි නො යෙදුණේ ත් ෆේ ද, (ඔහු උපශාන්ත යයි කියමි.)

**පතිලීනො අකුහකොති** - 'පතිලීනො'ති රාගස්ස පහීනත්තා පතිලීනො දොසස්ස-මොහස්ස පහීනත්තා පතිලීනො; කොධස්ස -උපනාහස්ස -මක්ඛස්ස- පළාසස්ස -ඉස්සාය - මච්ඡරියස්ස -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං පහීනත්තා පතිලීනො[1] වුත්තං හෙතං භගවතා: 'කථඤ්ච භික්ඛවෙ භික්ඛු පතිලීනො[1] හොති? ඉමස්ස භික්ඛවෙ භික්ඛුනො අස්මිමානො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො. එවං ඛො භික්ඛවෙ භික්ඛු පතිලීනො හොතී''ති[a] 'පතිලීනො.'

**අකුහකොති**[2] - තීණි කුහනවත්ථූනි: පච්චයපටිසෙධනසඞ්ඛාතං[3] කුහනවත්ථු,[4] ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු, සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං පච්චයපටිසෙධනසඞ්ඛාතං[3] කුහනවත්ථු? ඉධ ගහපතිකා භික්ඛුං නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. සො පාපිච්ඡො ඉච්ඡාපකතො අත්ථිකො චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං භිය්‍යොකම්‍යතං උපාදාය චීවරං පච්චක්ඛාති පිණ්ඩපාතං පච්චක්ඛාති. සෙනාසනං පච්චක්ඛාති. ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පච්චක්ඛාති. සො එවමාහ: කිං සමණස්ස මහග්ඝෙන චීවරෙන? එතං සාරුප්පං - යං සමණො සුසානා වා සඞ්කාරකූටා වා පාපණිකා වා නන්තකානි උච්චිනිත්වා සඞ්ඝාටිං ධාරෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන පිණ්ඩපාතෙන? එතං සාරුප්පං - යං සමණො උඤ්ඡාචරියාය පිණ්ඩියාලොපෙන ජීවිකං කප්පෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන සෙනාසනෙන? එතං සාරුප්පං - යං සමණො රුක්ඛමූලිකො වා අස්ස සොසානිකො වා අබ්භොකාසිකො වා. කිං සමණස්ස මහග්ඝෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන? එතං සාරුප්පං - යං සමණො පූතිමුත්තෙන වා හරීතකීඛණ්ඩෙන වා ඔසධං කරෙය්‍යාති. තදුපාදාය ලූඛං චීවරං ධාරෙති. ලූඛං පිණ්ඩපාතං පරිභුඤ්ජති. ලූඛං සෙනාසනං පටිසෙවති. ලූඛං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති. තමෙනං ගහපතිකා එවං ජානන්ති, අයං සමණො අප්පිච්ඡො සන්තුට්ඨො පවිවිත්තො අසංසට්ඨො ආරද්ධවිරියො ධුතවාදො'ති. භිය්‍යො භිය්‍යො නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. සො එවමාහ: "තිණ්ණං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති: සද්ධාය සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දෙය්‍යධම්මස්ස සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දක්ඛිණෙය්‍යානං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. තුම්හාකං චෙවායං සද්ධා අත්ථි, දෙය්‍යධම්මො ච සංවිජ්ජති. අහඤ්ච පටිග්ගාහකො. සචෙහං න පටිග්ගහෙස්සාමි, එවං තුම්හෙ පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ[5]. න මය්හං ඉමිනා අත්ථො. අපිච, තුම්හාකං යෙව අනුකම්පාය පටිග්ගණ්හාමී''ති. තදුපාදාය බහුම්පි චීවරං පටිග්ගණ්හාති. බහුම්පි පිණ්ඩපාතං පටිග්ගණ්හාති. බහුම්පි සෙනාසනං පටිග්ගණ්හාති. බහුම්පි ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිග්ගණ්හාති. යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං පච්චයපටිසෙධනසඞ්ඛාතං කුහනවත්ථු.

---

1. පටිලීනො - මජ්ස. 2. අකුහකො - මජුප.
3. පච්චයපටිසෙවනසඞ්ඛාතං - සීමු II. මජුප
4. කුහනවත්ථුං සීමු II.
a. චතුක්කඞ්ගුත්තර - චක්කවග්ග. 5. භවිස්සන්ති - සීමු. II.

**පතිලීනො අකුහකො** – 'පතිලීනො' යනු: රාගය ප්‍රහීණ කළ බැවින් 'පතිලීන' යැ, ද්වෙෂය – මොහය ප්‍රහීණ කළ බැවින් – ක්‍රොධය – උපනාහය – මකුබව – යුගග්‍රාහය – ඊර්ෂ්‍යාව – මාත්සය්‍ය්‍ය...සියලු අකුශලාභිසංස්කාරයන් ප්‍රහීණ කළ බැවින් 'පතිලීන' යැ; මේ වදාරන ලද මැය, භාග්‍යවතුන් විසින්: "කෙසේ නම් මහණෙනි, මහණ තෙමේ පතිලීන වේ ද ? මහණෙනි, මේ මහණහුගේ අස්මිමානය ප්‍රහීණ වූයේ උපුත් මුල් ඇත්තේ තල් වස්තුවක් මෙන් කරන ලද්දේ අනභාවය කරන ලද්දේ මතු නූපදනා පියවි ඇත්තේ වෙයි. මෙසේ මහණෙනි, මහණ පතිලීන වේ යැ"යි පතිලීනො' යනු වේ.

**අකුහකො** – කුහනවස්තු තුනෙකි ප්‍රත්‍යයප්‍රතිෂෙධනසඞ්ඛ්‍යාත කුහන වස්තුව යැ ඊර්යාපථසඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ සාමන්තජල්පනසඞ්ඛ්‍යාත කුහනවස්තුව යැයි.

ප්‍රත්‍යයප්‍රතිෂෙධනසඞ්ඛ්‍යාත කුහනවස්තුව කවරැ යත් ? මෙහි ගැහැවියෝ මහණක් හට සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පසබෙහෙත්පිරිකරින් පවරති, හෙතෙම පාපෙච්ඡ වූයේ ආශායෙන් මඩනා ලදුයේ සිවුරු...බෙහෙත් පිරිකර කැමැති වූයේ බොහෝ කැමැති බව නිසා චීවරය ප්‍රතික්ෂෙප කරයි. පිණ්ඩපාතය – සෙනස්න – ගිලන්පසබෙහෙත්පිරිකර ප්‍රතික්ෂෙප කරයි. හේ මෙසේ කියයි: 'මහණහට මාහැඟි සිවුරෙන් කිම ? යම් හෙයකින් මහණ තෙමේ සොහොනින් හෝ කසලගොඩින් හෝ අවුණු ලෙරින් හෝ රෙදිකැබැලි රැස් කොට සඟල කොට දරන්නේ නම් තෙල සරුප් වෙයි; මහණ හට මාහැඟි පිණ්ඩපාතයෙන් කිම ? යම් හෙයකින් මහණ සිඟා හැසිරීමෙන් පිණ්ඩපාතයෙන් ලද ආලොපයෙන් ජීවිකාව කරන්නේ නම්, තෙල සරුප් වෙයි. මහණ හට මාහැඟි සෙනස්නෙන් කිම ? යම් හෙයකින් මහණ රුක්ඛමූලික හෝ සොසානික හෝ අබ්භොකාසික හෝ වන්නේ නම්, තෙල සරුප් වෙයි. මහණ හට මාහැඟි ගිලන්පසබෙහෙත්පිරිකරින් කිම ? යම් හෙයකින් මහණ පූතිමූත්‍රයෙන් හෝ අරළුකෑඩෙකින් හෝ බෙහෙත් කරන්නේ නම්, තෙල සරුප් යැයි. එතැන් පටන් රළු සිවුරු දරයි, රළු පිණ්ඩපාතය වළඳයි, රළු සෙනසුන් ඇසුරු කරයි, රළු ගිලන්පසබෙහෙත්පිරිකර සේවනය කරයි. ගෘහපතියෝ ඔහු මෙසේ දනගනිති: 'මේ මහණ අල්පෙච්ඡ යැ, සන්තුෂ්ට යැ 'ප්‍රවිවික්ත යැ' අසංසෘෂ්ට යැ, ආරබ්ධවීය්‍යී යැ, ධුතවාද යැ'යි චීවර...බෙහෙත්පිරිකරින් මතුමත්තෙහි පවරත්. හෙතෙම මෙසේ කියයි: "තිදෙනකුන්ගේ සම්මුඛ භාවයෙන් ශ්‍රද්ධාවත් කුලපුත්‍ර තෙමේ බොහෝ පින් රැස් කරයි: ශ්‍රද්ධාව හමු වීමෙන් සැදැහැති කුලපුත් තෙම බොහෝ පින් රැස් කරයි, දෙය්‍යධර්මය ඉදිරිපත් වීමෙන්...ප්‍රතිග්‍රාහකයන් සම්මුඛ වීමෙන් සැදැහැවත් කුලපුත්‍ර තෙම බොහෝ පින් රැස් කරයි; තොපට වැලින් මේ ශ්‍රද්ධාව ඇත් මැය, දෙය්‍යධර්මය ද විද්‍යමාන වෙයි, මම ද ප්‍රතිග්‍රාහක වෙමි; ඉදින් මම් නො පිළිගනිම් නම්, මෙසේ කල්හි තෙපි පිනින් පරිබාහිර වන්නහුය, මට මෙයින් ප්‍රයොජනයෙක් නැත, තොපට මැ අනුකම්පා පිණිස පිළිගනිමී"යි එතැන් පටන් බොහෝ සිවුරුත් පිළිගනී, බොහෝ පිණ්ඩපාතයත් – බොහෝ සෙනාසනත් – බොහෝ ගිලන්පසබෙහෙත්පිරිකරත් පිළිගනී. මෙබඳු වූ යම් මුහුණ හැකිළීමෙක් මුහුණ හකුළුවන සුලු බවෙක් විසමය කරවීමෙක් කුහනාකාරයෙක් කුහිත (–කොහොන්) බවෙක් වේ ද, මේ ප්‍රත්‍යයප්‍රතිෂෙධනසඞ්ඛ්‍යාත කුහනවස්තු යැ.

කතමං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො ‘එවං මං ජනො සම්භාවෙස්සතී’ති ගමනං සණ්ඨපෙති. ඨානං සණ්ඨපෙති. නිසජ්ජං සණ්ඨපෙති. සයනං සණ්ඨපෙති. පණිධාය ගච්ඡති. පණිධාය තිට්ඨති. පණිධාය නිසීදති. පණිධාය සෙය්‍යං කප්පෙති. සමාහිතො විය ගච්ඡති. සමාහිතො විය තිට්ඨති. සමාහිතො විය නිසීදති. සමාහිතො විය සෙය්‍යං කප්පෙති. ආපාථකජ්ඣායී ච හොති.[1] යා එවරූපා ඉරියාපථස්ස අට්ඨපනා[2] ඨපනා සණ්ඨපනා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො ‘එවං මං ජනො සම්භාවෙස්සතී’ති[3] අරියධම්මසන්නිස්සිතං වාචං භාසති: ‘යො එවරූපං චීවරං ධාරෙති, සො සමණො මහෙසක්ඛො’ති භණති. ‘යො එවරූපං පත්තං ධාරෙති, ලොහථාලකං ධාරෙති, ධම්මකරකං[4] ධාරෙති, පරිස්සාවනං ධාරෙති, කුඤ්චිකං ධාරෙති, උපාහනං ධාරෙති, කායබන්ධනං ධාරෙති, ආයොගං ධාරෙති, සො සමණො මහෙසක්ඛො’ති භණති. ‘යස්ස එවරූපො උපජ්ඣායො සො සමණො මහෙසක්ඛො’ති භණති. ‘යස්ස එවරූපො ආචරියො, එවරූපා සමානුපජ්ඣායකා, සමානාචරියකා, එවරූපා මිත්තා සන්දිට්ඨා සම්භත්තා සහායා, සො සමණො මහෙසක්ඛො’ති භණති. ‘යො එවරූපෙ විහාරෙ වසති, සො සමණො මහෙසක්ඛො’ති භණති. යො එවරූපෙ අඩ්ඪයොගෙ වසති, පාසාදෙ වසති, හම්මියෙ වසති, ගුහායං වසති, ලෙණෙ වසති, කුටියා වසති, කූටාගාරෙ වසති, අට්ටෙ වසති, මාලෙ වසති, උද්දණ්ඩෙ වසති, උපට්ඨානසාලායං වසති, මණ්ඩපෙ වසති, රුක්ඛමූලෙ වසති, සො සමණො මහෙසක්ඛො’ති භණති. අථවා, කොරජ්ජිකකොරජ්ජිකො භාකුටිකභාකුටිකො කුහකකුහකො ලපකලපකො, මුඛසම්භාවිතො ‘අයං සමණො ඉමාසං එවරූපානං සන්තානං විහාරසමාපත්තීනං ලාභී’ති[5] තාදිසං ගම්භීරං ගුළ්හං[6] නිපුණං පටිච්ඡන්නං ලොකුත්තරං සුඤ්ඤතාපටිසංයුත්තං කථං කථෙති. යා එවරූපා භාකුටිතා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං. ඉදං වුච්චති සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

යස්සිමානි තීණි කුහනවත්ථූනි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, සො වුච්චති අකුහකොති - ‘පතිලීනො අකුහකො.’

---

1. ආපාථකජ්ඣායී ච - මජසං. සයා. PTS. මූ. II.
2. ආඨපනා - PTS. ඨපනා, ආඨපනා මජසං. 3. සම්භාවිස්සතීති - PTS.
4. ධම්මකරණං - මජසං. 5. ලාභී - PTS. 6. ගුය්හං - PTS.

ඊර්‍යාපථසඞ්ඛ්‍යාත කුහනවස්තුව කවරැ යත්? මෙහි කිසිවෙක් පවිටු වූ අදහස් ඇතියේ ඉච්ඡායෙන් මඩනා ලදුයේ බුහුමන් කරවන අදහස් ඇතියේ 'මෙසේ ජන තෙමේ මා බුහුමන් කරන්නේ යැ'යි ගමන සකස් කෙරෙයි, සිටීම - හිඳීම - ශයනය සකස් කෙරෙයි. පතාගෙන (-සිත පිහිටුවා) යෙයි. පතා ගෙන සිටී. පතාගෙන හිඳී, පතාගෙන නිදයි. ධ්‍යාන සමාපන්නයකු මෙන් ගමන් යෙයි. සමාහිතයකු මෙන් සිටී. සමාහිතයකු මෙන් හිඳී, සමාහිතයකු මෙන් නිදයි. හමුයෙහි ධ්‍යාන කරන්නේ ද වෙයි. මෙබඳු යම් ඉරියවු ආදියෙහි තැබීමෙක් තබන අයුරෙක් මොනොවට තැබීමෙක් මුහුණ හැකිළීමෙක් මුහුණ හකුළුවන බවෙක් විස්මය කැරවීමෙක් විස්මය පැවැත් වීමෙක් කොහොත් බවෙක් වේ ද. මේ ඊර්‍යාපථසඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ.

සාමන්තජල්පන සඞ්ඛ්‍යාත කුහනවස්තුව කවරැ යත්? මෙහි කිසිවෙක් පවිටු අදහස් ඇතියේ ආශායෙන් මඩනා ලදුයේ 'ජනයා මා මෙසේ සල කන්නේ යැ'යි බුහුමන් කරවන අදහස් ඇතියේ ආර්‍යධර්මයන් ඇසුරු කළ බස් බෙණෙයි: 'යමෙක් මෙබඳු සිවුරක් ධරා නම් ඒ මහණ මහත් අනුභාව ඇත්තේ යැ'යි බෙණෙයි, යමෙක් මෙබඳු පාත්‍රයක් ධරා නම්, ලෝහ තලුවක් - ධමරුවක් - පෙරහනක් - කෙස්සක් - වහනක් - කාබානක්- ආමයාගයක් ධරා නම්, ඒ මහණ මහත් අනුභාව ඇත්තේ යැ'යි බෙණෙයි. 'යමක් හට මෙබඳු වූ උපාධ්‍යායයෙක් වේ නම්, ඒ මහණ මහානුභාව ඇත්තේ යැ'යි බෙණෙයි. මෙබඳු වූ ආචාර්‍යයෙක් - සමානොපාධ්‍යායයෝ- සමානාචාර්‍යයෝ - මිත්‍රයෝ - දෘෂ්ටමාත්‍රමිත්‍රයෝ - සම්භක්තයෝ - සහායයෝ වෙත් නම්, ඒ මහණ මහේශාක්‍ය යැ'යි කියයි. 'යමෙක් මෙබඳු විහාරයෙක වෙසේ නම්, දික් පනයෙක - සිවුරුස්පනයෙක - සඳලු ඇති ගෙයෙක - ගල් ගුහායෙක - ගල්ලෙනෙක -කිළියෙක -කුළුගෙයෙක -අටල්ලෙක- මහලෙක- දිග්නලෙක - උපස්ථානශාලායෙක - මණ්ඩපයෙක - රුක්මුලෙක වෙසේ නම්, ඒ මහණ මහත් අනුභාව ඇත්තේ යැ'යි කියයි. නොහොත් ඉතා හැකිළෙනුයේ ඉතා මුහුණුහකුළුවන සුලු වූයේ ඉතා විස්මය කරවනුයේ ඉතා ප්‍රලාප තෙපුල් බණනුයේ සිය මුවින් මැ (අනුන් විසින්) සම්භාවනා කරන ලද්දේ 'මේ මහණ මෙබඳු වූ ශාන්ත වූ විහාරසමාපත්තීන් ලබනසුලු යැ'යි එබඳු වූ ගැඹුරැ වූ ගූඪ වූ සියුම් වූ මුවන කටයුතු වූ ලොකොත්තර වූ නිර්වාණප්‍රතිසංයුක්ත වූ කථා කියයි. මෙබඳු යම් මුහුණ හැකුළුමෙක් මුහුණ හකුළුවන බවෙක් විස්මය කැරවීමෙක් විස්මය පැවැත් වීමෙක් කොහොත් බවෙක් වේ ද, මේ සාමන්තජල්පනසඞ්ඛ්‍යාත කුහනවස්තුව යැයි කියනු ලැබේ.

යමක්හු විසින් මේ තුන් කුහනවස්තූහු ප්‍රහීණ කරන ලද්දාහු... ඥානාග්නීන් දග්ධ වූවාහු ද, හේ 'අකුහක' යැයි කියනු ලැබේ නුයි 'පතිලීනො අකුහකො' යනු වේ.

**අපිහාලු අමච්ඡරීති** - 'පිහා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං.ඍ යස්සෙසා පිහා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අපිහාලු; සො රූපෙ න පිහෙති. සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ, කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං, චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං, කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං, අතීතං අනාගතං පච්චුප්පන්නං, දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ න පිහෙති න ඉච්ඡති න සාදියති න පත්ථෙති නාභිජප්පතීති - අපිහාලු; අමච්ඡරීති පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං කුලමච්ඡරියං වණ්ණමච්ඡරියං ලාභමච්ඡරියං ධම්මමච්ඡරියං,ඍ යං එවරූපං මච්ඡරියං[1] මච්ඡරායනා මච්ඡරායිතත්තං වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා[2] අග්ගහිතත්තං චිත්තස්ස, ඉදං වුච්චති මච්ඡරියං. අපිච, ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං, ගාහො, ඉදං වුච්චති මච්ඡරියං. යස්සෙතං මච්ඡරියං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති අමච්ඡරීති - අපිහාලු අමච්ඡරී.

**අප්පගබ්භො අජිගුච්ඡොති** - 'පාගබ්භිය'න්ති තීණි පාගබ්භියානි: කායිකං පාගබ්භියං වාචසිකං පාගබ්භියං චෙතසිකං පාගබ්භියං. කතමං කායිකං පාගබ්භියං? ඉධෙකච්චො සඞ්ඝගතොපි කායිකං පාගබ්භියං දස්සෙති. ගණගතොපි කායිකං පාගබ්භියං දස්සෙති. භොජනසාලායම්පි කායිකං පාගබ්භියං දස්සෙති. ජන්තාඝරෙපි කායිකං පාගබ්භියං දස්සෙති. උදකතිත්ථෙපි කායිකං පාගබ්භියං දස්සෙති. අන්තරඝරං පවිසන්තොපි කායිකං පාගබ්භියං දස්සෙති. අන්තරඝරං පවිට්ඨොපි කායිකං පාගබ්භියං දස්සෙති.

කථං සඞ්ඝගතො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො සඞ්ඝගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති. ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උච්චෙපි ආසනෙ නිසීදති. සසීසං පාරුපිත්වාපි නිසීදති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං සඞ්ඝගතො කායිකං පාගබ්භියං දස්සෙති.

කථං ගණගතො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ගණගතො අචිත්තීකාරකතො ථෙරානං භික්ඛූනං අනුපාහනානං චඞ්කමන්තානං සඋපාහනො චඞ්කමති. නීචෙ චඞ්කමෙ චඞ්කමන්තානං උච්චෙ චඞ්කමෙ චඞ්කමති. ඡමාය[3] චඞ්කමන්තානං චඞ්කමෙ චඞ්කමති, ඝට්ටයන්තොපි තිට්ඨති. ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උච්චෙපි ආසනෙ නිසීදති. සසීසං පාරුපිත්වාපි නිසීදති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ගණගතො කායිකං පාගබ්භියං දස්සෙති.

---

ඍ. බුද්ධසාවජ්ජුවිභඞ්ග.

1. මච්ඡරං - මජ්ජං 2. කටුකඤ්චුකතා - PTS 3. ඡමායං, PTS. සයා

**අපිහාලු අමච්ඡරී** – ‘පිහා’යි තෘෂ්ණාව කියනු ලබයි. යම් රාගයෙක්... ලොභඅකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල පිහාව තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී – නුවණගින්නෙන් දවන ලද්දී ද හේ ‘අපිහාලු යැයි කියනු ලැබෙයි. හෙතෙම රූපයන් නො කැමැති වෙයි. ශබ්ද – ගන්ධ–රස ස්ප්‍රෂ්ටව්‍යයන් - කුලය – ගණයා – ආවාසය – ලාභය – යශස් – ප්‍රශංසා–සුඛය, චීවර – පිණ්ඩපාත – සෙනාසන – ගිලන්පසබෙහෙත්පිරිකර, කාම–ධාතුව – රූප – අරූපධාතුව, කාමභවය – රූප – අරූප – සංඥ – අසංඥ–නෛවසංඥනාසංඥ – එකවොකාර – චතුවොකාර – පඤ්චවොකාරභවය, අතීත – අනාගත – ප්‍රත්‍යුත්පන්නය, දෘෂ්ටශ්‍රැතමුතවිඥතව්‍යධර්මයන් නො කැමැති වෙයි, නො රිසි වෙයි, නො ඉවසයි, නො පතයි, අභිජල්පනය නො කෙරේ නුයි ‘අපිහාලු’ යනු වේ. **අමච්ඡරී** ‘ආවාසමච්ඡරිය කුලමච්ඡරිය වණ්ණමච්ඡරිය ලාභමච්ඡරිය ධම්මමච්ඡරිය’ යි මාත්සය්‍යී පසෙක් වෙයි; මෙබඳු යම් මසුරුබවෙක් මසුරු කරන අයුරෙක් මසුරුකමින් යුත් බවෙක් (සම්පත්) සඟවනු කැමැතිබවෙක් තදමසුරුබවෙක් කටුකබැවින් සිත හැකිළීමෙක් සිත හාත්පසින් ගත්බවෙක් වේ ද, මේ ‘මච්ඡරිය’යි කියනු ලැබේ. තවද ස්කන්ධමාත්සය්‍යීය ද ‘මච්ඡරිය’ යැ ධාතුමාත්සය්‍යීය ද–ආයතනමාත්සය්‍යීය ද ‘මච්ඡරිය’ යැ, ග්‍රාහයැ යන මේ ‘මච්ඡරිය’ යි කියනු ලැබෙයි. යමක්හු විසින් තෙල මාත්සය්‍යීය ප්‍රහීණ කරන ලද ද...නුවණ ගින්නෙන් දවනා ලද ද, හේ ‘අමච්ඡරී’ යැයි කියනු ලැබේ නුයි ‘අපිහාලු අමච්ඡරී’ යනු වේ.

**අප්පගබ්භො අජෙගුච්ඡො** – ‘පාගබ්භිය’ නම්: කායික ප්‍රාගල්භ්‍ය (–බුහුටිබව) යැ, වාචසික ප්‍රාගල්භ්‍ය යැ, චෛතසික ප්‍රාගල්භ්‍ය යැයි ප්‍රාගල්භ්‍යයෝ තිදෙනෙක් වෙති. කායික ප්‍රාගල්භ්‍යය කවරැ යත් ? මෙහි කිසිවෙක් සඟමැදට පැමිණියේ ද කායිකප්‍රාගල්භ්‍ය (–නො සරුප් බුහුටිබව) දක්වයි, ගණමැදට ගියේ ද – භොජනශාලායෙහි දු – ගිනිහල්ගෙයි දු – දිය තොටෙහි දු – ඇතුළුගමට පිවිසෙනුයේ ද – ඇතුළුගමට පිවිසියේ ද– කායිකප්‍රගල්භතාව දක්වයි.

කෙසේ සඟමැදට පැමිණියේ කායික ප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් සඟමැදට පැමිණියේ නො කළ බුහුමන් ඇතියේ ස්ථවිර භික්ෂූන් ගටමිනු දු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්නෙහිදු හිඳී, හිස් වසා පෙරවැ හිඳී. සිට ද බෙණෙයි, අත සලසලා ද බෙණෙයි. මෙසේ සඟමැදට පැමිණියේ කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ ගණමැදට පැමිණියේ කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ගණමැදට පැමිණියේ බුහුමන් රහිත වූයේ ස්ථවිරභික්ෂූන් වහන් නැති වැ සක්මන් කරන කල්හි වහන් නැඟී සක්මන් කෙරෙයි, පහත් සක්මනැ සක්මන් කරන කල්හි උස් සක්මනැ සක්මන් කෙරෙයි, බිමැ සක්මන් කරන කල්හි සක්මනෙහි සක්මන් කෙරෙයි, ගටමිනු දු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්නෙහි දු හිඳී, හිස් වසා පෙරවැ හිඳී, සිට ද බෙණෙයි, අත සල සලා ද බෙණෙයි. මෙසේ ගණයා මැදට පැමිණියේ කායික වූ ප්‍රාගල්භ්‍යය (–නො සරුප් බුහුටිබව) දක්වයි.

කථං භොජනසාලායං කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො භොජනසාලායං අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදති. නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහති. ඝට්ටයන්තොපි තිට්ඨති. ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උච්චෙපි ආසනෙ නිසීදති. සසීසං පාරුපිත්වාපි නිසීදති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං භොජනසාලායං කායිකං පාගබ්භියං දස්සෙති.

කථං ජන්තාඝරෙ කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ජන්තාඝරෙ අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උච්චෙපි ආසනෙ නිසීදති. අනාපුච්ඡාපි කට්ඨං පක්ඛිපති. අනාපුච්ඡාපි ද්වාරං[1] පිදහති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ජන්තාඝරෙ කායිකං පාගබ්භියං දස්සෙති.

කථං උදකතිත්ථෙ කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො උදකතිත්ථෙ අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ඔතරති. පුරතොපි ඔතරති. ඝට්ටයන්තොපි න්හායති[2]. පුරතොපි න්හායති. උපරිතොපි න්හායති. ඝට්ටයන්තොපි උත්තරති. පුරතොපි උත්තරති. උපරිතොපි උත්තරති. එවං උදකතිත්ථෙ කායිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිසන්තො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිසන්තො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ගච්ඡති. පුරතොපි ගච්ඡති. වොක්කම්මාපි ථෙරානං භික්ඛූනං පුරතො පුරතො[3] ගච්ඡති. එවං අන්තරඝරං පවිසන්තොපි කායිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිට්ඨො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිට්ඨො 'න පවිසථ[4] භන්තෙ'ති වුච්චමානො පවිසති. 'න තිට්ඨථ භන්තෙ'ති වුච්චමානො තිට්ඨති. 'න නිසීදථ භන්තෙ'ති වුච්චමානො නිසීදති. අනොකාසම්පි පවිසති. අනොකාසෙපි තිට්ඨති. අනොකාසෙපි නිසීදති. යානි තානිපි හොන්ති කුලානං ඔවරකානි ගුළ්හානි ච පටිච්ඡන්නානි ච, යත්ථ කුලිත්ථියො කුලධීතරො[5] කුලසුණ්හායො කුලකුමාරිකායො නිසීදන්ති, තත්ථපි සහසා පවිසති. කුමාරකස්සපි සිරං පරාමසති. එවං අන්තරඝරං පවිට්ඨො කායිකං පාගබ්භියං දස්සෙති.

කතමං වාචසිකං පාගබ්භියං? ඉධෙකච්චො සඞ්ඝගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති. ගණගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති. අන්තරඝරං පවිට්ඨොපි වාචසිකං පාගබ්භියං දස්සෙති.

කථං සඞ්ඝගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො සඞ්ඝගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා වා අනජ්ඣිට්ඨො වා ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. පාතිමොක්ඛං උද්දිසති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං සඞ්ඝගතො වාචසිකං පාගබ්භියං දස්සෙති.

---

1. ආකුලීභූතායං පජාය - මජසං. PTS. පොත්ථකෙසු, 2. නහායති - මජසං.
3. පුරතො - PTS. 4. පවිස - මජසං. සතා. PTS.
5. කුලධීතායො - සීමු.II.

කෙසේ බොජුන්හල්හි කායික ප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් බොජුන්හල්හි බුහුමන් රහිත වූයේ ස්ථවිර භික්ෂූන් හුන් තැනට වැද හිඳී. නවක භික්ෂූන් ද අස්නෙන් පිළිබාහයි. ගැටෙමිනු දු සිටී. ගැටෙමිනු දු හිඳී. ඉදිරියෙහි දු සිටී. ඉදිරියෙහි දු හිඳී. උසස්නෙහි දු හිඳී. හිස වසා පෙරවැගෙන ද හිඳී. සිට ද බෙණෙයි. අත සල සලා ද බෙණෙයි. මෙසේ බොජුන්හල්හි කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ ගිනිහල්ගෙයි කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ජන්තාඝරයෙහි බුහුමන් රහිත වූයේ ස්ථවිරභික්ෂූන් ගටමිනි දු සිටී...නො පිළිවිසැ දර හා බහාලයි. නො පිළිවිසැ දොර හා පියාලයි. අත සල සලා ද බෙණෙයි. මෙසේ ජන්තාඝරයෙහි කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ පැන්තොටැ කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් පැන්තොට බුහුමන් රහිත වූයේ ස්ථවිරභික්ෂූන් ගටමිනු දු බසී. පෙරටුව ද බසී. ගටමිනු දු නහයි. ඉදිරියෙහි දු නහයි. උඩුගංහි දු නහයි. ගටමිනු දු නැගෙයි, පෙරටුව ද නැගෙයි, උඩිනු දු නැගෙයි. මෙසේ පැන්තොටැ කායික ප්‍රගල්භ බව දක්වයි.

කෙසේ ගොදුරුගමට වදනේ කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ගොදුරුගමට වදනේ නො කල බුහුමන් ඇතියේ ස්ථවිරභික්ෂූන් ගටමිනු දු යෙයි. පෙරටුව ද යෙයි. ඉක්මවා ද ස්ථවිරභික්ෂූන්ට පෙරටු පෙරටු වැ යෙයි. මෙසේ ගොදුරුගමට පිවිසෙනුයේ ද කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ ඇතුළුගමට පිවිසියේ කායිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ඇතුළුගමට පිවිසියේ 'නො පිවිසෙත්න වහන්සැ'යි කියනු ලබන්නේ පිවිසෙයි. 'නො සිටින්න වහන්සැ'යි කියනු ලබන්නේ සිටී. 'නො හිඳින්න වහන්සැ'යි කියනු ලබන්නේ හිඳී. අනවකාශයට ද පිවිසෙයි, අනවකාශයෙහි දු සිටී, අනවකාශයෙහි දු හිඳී, කුලවැස්සන්ගේ (පියවින්) මුවහගු ද (තිරආදියෙන්) මුවහකලා වූ ද කුලස්ත්‍රීන් කුලදුහිතෘන් කුලසුණ්හාවන් හිඳිනා යම් ඔවරක (=ඇතුළුගබඩා) වෙත් තම එහි දු ලාහෙලා පිවිසෙයි. කුමරුන් හිස ද පිරිමදී. මෙසේ ඇතුළුගමට පිවිසියේ කායිකප්‍රාගල්භ්‍යය දක්වයි.

වාචසික ප්‍රාගල්භ්‍යය කවර යත් ? මෙහි එකෙක් සඟමැදට ගියේ ද - ගණ මැදට ගියේ ද - ඇතුළුගමට පිවිසියේ ද වාචසිකප්‍රාගල්භ්‍යය දක්වයි: කෙසේ සඟමැදට ගියේ වාචසික ප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් සඟමැදට ගියේ නො කළ බුහුමන් ඇතියේ ස්ථවිරභික්ෂූන් නො පිළිවිසැ හෝ නො ඇණවන ලද වැ හෝ බණ කියයි. පැන විසඳයි. පාමොක් උදෙසයි. සිටියේ ද බෙණෙයි. අත සල සලා ද බෙණෙයි. මෙසේ සඟමැදට ගියේ වාචසිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කථං ගණගතො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ගණගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා වා අනජ්ඣිට්ඨො වා ආරාමගතානං භික්ඛූනං ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. ආරාමගතානං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං ධම්මං භණති. පඤ්හං විස්සජ්ජෙති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ගණගතො වාචසිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිට්ඨො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිට්ඨො ඉත්ථිං වා කුමාරිං වා එවමාහ: ‘ඉත්ථංනාමෙ, ඉත්ථංගොත්තෙ, කිං අත්ථි? යාගු අත්ථි? භත්තං අත්ථි? ඛාදනීයං අත්ථි? කිං පිවිස්සාම? කිං භුඤ්ජිස්සාම? කිං ඛාදිස්සාම,? කිං වා අත්ථි,? කිං වා මෙ දස්සථා’ති විප්පලපති. *එවං අන්තරඝරං පවිට්ඨො වාචසිකං පාගබ්භියං දස්සෙති. ඉදං වාචසිකං පාගබ්භියං.

කතමං චෙතසිකං පාගබ්භියං? ඉධෙකච්චො න උච්චාකුලා පබ්බජිතො සමානො උච්චාකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන, න මහාකුලා පබ්බජිතො සමානො මහාකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන, න මහාභොගකුලා පබ්බජිතො සමානො මහාභොගකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන, න උළාරභොගකුලා පබ්බජිතො සමානො – න සුත්තන්තිකො සමානො සුත්තන්තිකෙන සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන. න විනයධරො සමානො – න ධම්මකථිකො සමානො – න ආරඤ්ඤිකො සමානො – න පිණ්ඩපාතිකො සමානො – න පංසුකූලිකො සමානො – න තෙචීවරිකො සමානො – න සපදානචාරිකො සමානො – න ඛලුපච්ඡාභත්තිකො සමානො – න නෙසජ්ජිකො සමානො – න යථාසන්ථතිකො සමානො – න පඨමස්ස ඣානස්ස ලාභී සමානො පඨමස්ස ඣානස්ස ලාභිනා සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන. –පෙ– න නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභී සමානො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභිනා සද්ධිං සදිසං අත්තානං දහති චිත්තෙන. ඉදං චෙතසිකං පාගබ්භියං.

යස්සිමානි තීණි පාගබ්භියානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිපස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, සො වුච්චති අප්පගබ්භොති – ‘අප්පගබ්භො.’

* යා එවරූපා -පෙ- ලාලප්පිතත්තං ඉතිපි මජසං PTS පොත්ථකෙසු දිස්සති. තං පන පරිදෙවනිද්දෙසෙ දෙසිතං ඉධ න යුජ්ජතීති මඤ්ඤෙ.

කෙසේ ගණමැදට ගියේ වාචසිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ගණමැදට ගියේ නො කළ බුහුමන් ඇතියේ සංඝස්ථවිරභික්ෂූන් නො පිළිවිසැ හෝ නො පවරන ලදුයේ හෝ අරමට වත් මහණුන්ට බණ කියයි, පැන විසඳයි, සිටියේ ද බෙණෙයි, අත සල සලා ද බෙණෙයි, අරමට වත් මෙහෙණනට - උවසුවනට - උවැසියනට බණ කියයි, පැන විසඳයි, සිටියේ ද බෙණෙයි. අත සලසලා ද බෙණෙයි. මෙසේ ගණමැදට ගියේ වාචසිකප්‍රාගල්භ්‍යය දක්වයි.

කෙසේ ඇතුළුගමට පිවිසියේ වාචසිකප්‍රාගල්භ්‍යය දක්වා ද යත් ? මෙහි එකෙක් ගොදුරුගමට පිවිසියේ ස්ත්‍රියකට හෝ කුමරියකට හෝ මෙසේ කියයි: 'මෙ නම් ඇත්තිය, මෙ ගොත් ඇත්තිය, කුමක් ඇද්ද ? කැඳ ඇත් ද, බත් ඇත් ද ? කැවුතු ඇත් ද ? කුමක් බොන්නමෝ ද ? කුමක් වළඳන්නමෝ ද ? කුමක් කන්නමෝ ද ? කුමක් හෝ ඇද්ද ? කුමක් හෝ මට දෙවු දැ'යි නන් දොඩයි; මෙසේ අන්තරඝරයට පිවිසියේ වාචසික ප්‍රාගල්භ්‍යය දක්වයි. මේ වාචසිකප්‍රාගල්භ්‍යය යි.

චෛතසිකප්‍රාගල්භ්‍යය කවරේ ද යත් ? මෙහි එකෙක් උසස් නො වූ කුලයෙන් නික්මැ පැවිදි වූයේ උසස් කුලයෙන් පැවිදිවූවකු හා තමා සම කොට සිතින් දනයි, නො මහත්කුලයෙන් නික්මැ පැවිදි වූයේ...නො මහත් භොග ඇති කුලයෙන් නික්මැ පැවිදි වූයේ...උදාරභොගවත් නො වූ කුලයෙන් නික්මැ පැවිදි වූයේ...සෞත්‍රාන්තිකයකු හා තමා සදෘශ කොට සිතින් දනයි, විනයධර නො වූයේ - ධර්මකථික නො වූයේ - ආරණ්‍යක නො වූයේ - පිණ්ඩපාතික නො වූයේ - පංසුකූලික නො වූයේ - තෛචීවරික නො වූයේ - සපදානචාරික නො වූයේ - ඛලුපච්ඡාභත්තික නො වූයේ- නෛසජ්ජික නො වූයේ - යථාසන්ථතික නො වූයේ - ප්‍රථමධ්‍යානලාභී නො වූයේ ප්‍රථමධ්‍යානලාභියකු හා තමා සදෘශ කොට සිතින් දනයි,... නෛවසඥානාසඥායතනසමාපත්තිලාභී නො වූයේ නෛවසඥානාසඥා-යතනසමාපත්තිලාභියකු හා තමා සදෘශ කොට සිතින් දනයි. මෙ චෛතසිකප්‍රාගල්භ්‍යය යි.

යමක්හු විසින් මෙ ත්‍රිවිධ ප්‍රගල්භභාවයෝ ප්‍රහීණ කරන ලද්දාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යොත්පත්තික වූවාහු ඥානාග්නීන් දග්ධ වූවාහු ද හේ අප්‍රගල්භ යයි කියනු ලැබේ තුසි අප්පගබ්භො' යනු වේ.

**අජෙගුච්ඡොති** – අත්ථි පුග්ගලො ජෙගුච්ඡො. අත්ථි අජෙගුච්ඡො. කතමො ච පුග්ගලො ජෙගුච්ඡො? ඉධෙකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො අසුචිසඞ්කස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරිපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො. අයං වුච්චති පුග්ගලො ජෙගුච්ඡො. අථවා, කොධනො හොති උපායාසබහුලො අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති, කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. අයං වුච්චති පුග්ගලො ජෙගුච්ඡො. අථවා, කොධනො හොති උපනාහී,* මක්ඛී හොති පළාසී, ඉස්සුකී හොති මච්ඡරී, සඨො හොති මායාවී, ථද්ධො හොති අතිමානී, පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨී, සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී; අයං වුච්චති පුග්ගලො ජෙගුච්ඡො.

කතමො ච පුග්ගලො අජෙගුච්ඡො? ඉධ භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. අයං වුච්චති පුග්ගලො අජෙගුච්ඡො. අථවා, අක්කොධනො හොති අනුපායාසබහුලො, බහුම්පි වුත්තො සමානො නාභිසජ්ජති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති, න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. අයං වුච්චති පුග්ගලො අජෙගුච්ඡො. අථවා, අක්කොධනො හොති අනුපනාහී,* අමක්ඛී හොති අපළාසී, අනුස්සුකී හොති අමච්ඡරී, අසඨො හොති අමායාවී, අථද්ධො හොති අනතිමානී, න පාපිච්ඡො හොති, න මිච්ඡාදිට්ඨී, අසන්දිට්ඨි-පරාමාසී හොති අනාධානගාහී සුප්පටිනිස්සග්ගී. අයං වුච්චති පුග්ගලො අජෙගුච්ඡො. සබ්බෙ බාලපුථුජ්ජනා ජෙගුච්ඡා. පුථුජ්ජනකල්‍යාණකං උපාදාය අට්ඨ අරියපුග්ගලා[1] අජෙගුච්ඡාති – අප්පගබ්භො අජෙගුච්ඡො.

**පෙසුණෙය්‍යෙ ච නො යුතොති** – ‘පෙසුඤ්ඤ’න්ති ඉධෙකච්චො පිසුනවාචො[2] හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය; අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය; ඉති සමග්ගානං වා භෙත්තා භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො, වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදං වුච්චති පෙසුඤ්ඤං.

---

* සතාව. PTS. පොත්ථකෙසු ‘හොති’ සද්දො සබ්බපදෙසු යොජිතො.

1. සබ්බා කල්‍යාණපුථුජ්ජනං උපාදාය අරියපුග්ගලා, PTS.
2. පිසුණවාචො – මජසං, සීමු. II.

**අජෙගුච්ඡො** – ජුගුප්සා (-පිළිකුල්) කටයුතු පුද්ගලයෙක් ඇත, ජුගුප්සා නො කටයුතු පුද්ගලයෙක් ඇත. ජුගුප්සා කටයුතු පුද්ගලයා කවරේ ද යත් ? මෙහි එක් පුද්ගලයෙක් දුශ්ශීල වෙයි, ලාමකස්වභාව ඇතියේ අපවිත්‍ර වූ සැකයෙන් සිහි කළයුතු හැසිරීම් ඇතියේ සැඟ වූ කායවාක්කර්ම ඇතියේ අශ්‍රමණ වූයේ ‘ශ්‍රමණයෙමි’ ප්‍රතිඥා ඇත්තේ අබ්‍රහ්මචාරී වූයේ ‘බ්‍රහ්මචාරී වෙමි’ ප්‍රතිඥා ඇත්තේ (කුසල් නැතියෙන්) ඇතුළත කුණු වූයේ රාගයෙන් තෙත් වූයේ කසළ වැනි වූයේ වේ. මේ පුද්ගල තෙම ජුගුප්සා කට යුත්තේ යයි කියනු ලැබේ. නොහොත් කිපෙන සුලු වූයේ උපායාස බහුල කොට ඇත්තේ වෙයි, මඳකුදු කියන ලදුයේ ලැගෙයි කිපෙයි ප්‍රකෘතිය හරී තදබවට පැමිණෙයි කොපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙරෙයි. මේ පුද්ගල තෙමේ ජුගුප්සා කටයුතු වෙයි. නොහොත් කිපෙන සුලු වූයේ බද්ධවෛර ඇත්තේ වෙයි, මකු වූයේ යුගග්‍රාහ ඇත්තේ වෙයි, ඊර්ෂ්‍යා කරනුයේ මසුරු වූයේ වෙයි, ශඨ (-කෛරාටික) වූයේ මායා ඇත්තේ වෙයි, තද වූයේ අතිකමාන ඇත්තේ වෙයි, පාපෙච්ඡ වූයේ මිථ්‍යා-දෘෂ්ටි ඇත්තේ වෙයි, ස්වදෘෂ්ටිය පරාමර්ශී කරනුයේ දැඩි ව ගත්තේ දුර ලන්නට නො හැකි වූයේ වේ. මේ පුද්ගල තෙමේ ජුගුප්සිතව්‍ය යැයි කියනු ලැබේ.

කවර පුද්ගලයෙක් ජුගුප්සා නො කටයුත්තේ වේ ද යත් ? මේ සස්නෙහි මහණ තෙමේ සිල් ඇත්තේ වෙයි, ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවර වූයේ වෙසෙයි, ආචාරයෙන් හා ගොචරයෙන් යුක්ත වූයේ අණු මාත්‍ර වූ වරදෙහි දු භය දක්නේ මොනොවට ගෙන ශික්ෂා කොටසෙහි හික්මෙයි; මේ පුද්ගල තෙමේ ජුගුප්සා නො කටයුතු යැයි කියනු ලැබේ. නොහොත් නො කිපෙන සුලු වූයේ උපායාස බහුල කොට නැත්තේ වෙයි, බොහෝ කොට ද කියන ලදුයේ නො ඇලෙයි, නො කිපෙයි, ප්‍රකෘතිය නො හරී, තදබවට නො පැමිණෙයි, කොපය ත් ද්වේෂය ත් නො සතුට ත් නො පහළ කෙරෙයි. මේ පුද්ගල තෙම ජුගුප්සා නො කටයුතු යයි කියනු ලැබේ. නොහොත් නො කිපෙනසුලු වූයේ බද්ධවෛර නැත්තේ වෙයි, නො මකු වූයේ යුගග්‍රාහ නැත්තේ වෙයි, ඊර්ෂ්‍යා නැත්තේ නො මසුරු වෙයි, ශඨ නො වූයේ මායා රහිත වෙයි, නො තද වූයේ අතිමාන රහිත වෙයි, ලාමක ආශා රහිත වූයේ මිථ්‍යාදෘෂ්ටි නැත්තේ වෙයි, ස්වකීය දෘෂ්ටිය පරාමර්ශී නො කරනුයේ දැඩි කොට නො ගත්තේ සුවසේ දුරලිය හැක්කේ වෙයි; මේ පුද්ගල තෙමේ අජුගුප්-සිතව්‍ය යයි කියනු ලැබේ. සියලු මැ බාලපෘථග්ජනයෝ ජුගුප්සා කට යුත්තෝ යැ කල්‍යාණපෘථග්ජනයා පටන් අෂ්ටායර්‍යපුද්ගලයෝ ජුගුප්සා නො කටයුත්තාහු නුයි ‘අප්පගබ්භො අජෙගුච්ඡො’ යනු වේ.

**පෙසුණෙය්‍යෙ ච නො යුතො** – ‘පෙසුණුඤ්ඤ’ නම්: මෙහි එකෙක් පිසුනු. බස් කියන්නේ වෙයි: මෙ තැනින් අසා මුන්ගේ බිඳුමට එතැන කියන්නේ වෙයි, එතැනින් හෝ අසා අරුන්ගේ බිඳීමට මුන්ට කියන්නේ වෙයි, මෙසේ සමඟවූවන් හෝ බිඳිනුයේ භෙදවූවන් හෝ දැඩි කරනුයේ වර්ග වීමෙහි ඇලුණේ වර්ග වූවන් කෙරෙහි රුචි ඇත්තේ වර්ග වූවන්ට සතුටු වනුයේ වර්ග කරන බස් කියන්නේ වෙයි; මේ පෛශුන්‍ය යයි කියනු ලැබේ.

අපිච, ද්වීහි කාරණෙහි පෙසුඤ්ඤං උපසංහරති: පියකම්‍යතාය වා භෙදාධිප්පායෙන වා. කථං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති? 'ඉමස්ස පියො භවිස්සාමි, මනාපො භවිස්සාමි, විස්සාසිකො භවිස්සාමි, අබ්භන්තරිකො භවිස්සාමි, සුහදයො භවිස්සාමී'ති එවං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති. කථං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරති? 'කථං ඉමෙ නානා අස්සු, විනා අස්සු, වග්ගා අස්සු, ද්වෙධා අස්සු, ද්වෙජ්ඣා අස්සු, ද්වෙ පක්ඛා අස්සු, භිජ්ජෙය්‍යුං න සමාගච්ඡෙය්‍යුං, දුක්ඛං අඵාසුං විහරෙය්‍යු'න්ති එවං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරති. යස්සෙතං පෙසුඤ්ඤං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො පෙසුඤ්ඤෙ නො[1] යුත්තො න යුත්තො නප්පයුත්තො න සමායුත්තොති – 'පෙසුණෙය්‍ය ච නො යුතො.'

තෙනාහ භගවා:

"පතිලීනො අකුහකො අපිහාලු අමච්ඡරී,
අප්පගබ්භො අජෙගුච්ඡො පෙසුණෙය්‍ය ච නො යුතො"ති.

## 10 – 6

සාතියෙසු අනස්සාවී අතිමානෙ ච නො යුතො,
සණ්හො ච පටිභානවා න සද්ධො න විරජ්ජති.

**සාතියෙසු අනස්සාවීති** – 'සාතියා' වුච්චන්ති පඤ්ච කාමගුණා. කිංකාරණා සාතියා වුච්චන්ති පඤ්ච කාමගුණා? යෙභුය්‍යෙන දෙවමනුස්සා පඤ්ච කාමගුණෙ ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්ති අභිජප්පන්ති. තංකාරණා සාතියා වුච්චන්ති පඤ්ච කාමගුණා. යෙසං එසා සාතියා තණ්හා අප්පහීනා, තෙසං චක්ඛුතො රූපතණ්හා සවති ආසවති[2] සන්දති පවත්තති. සොතතො සද්දතණ්හා –පෙ– ඝානතො ගන්ධතණ්හා – ජිව්හාතො රසතණ්හා– කායතො ඵොට්ඨබ්බතණ්හා, මනතො ධම්මතණ්හා සවති ආසවති[2] සන්දති පවත්තති. යෙසං එසා සාතියා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා; තෙසං චක්ඛුතො රූපතණ්හා න සවති නාසවති[3] න සන්දති නප්පවත්තති. සොතතො සද්දතණ්හා -පෙ- මනතො ධම්මතණ්හා න සවති නාසවති[3] න සන්දති න පවත්තතීති– 'සාතියෙසු අනස්සාවී.'

1. පෙසුඤ්ඤෙන - සීමු. II. 2. අස්සවති - ස. මනුප.- පසවති PTS.
3. නාස්සවති - මනුප. නපසවති PTS.

තවද දෙකරුණෙකින් පිසුනු එලවා කියයි: ප්‍රියකාම්‍යතායෙන් හෝ භෙදාධිප්‍රාය ඇති වැ හෝ යැ. කෙසේ ප්‍රිය කැමැති බැවින් පිසුනු කියා ද යත්? මොහුට ප්‍රිය වන්නෙමි, මනාප වන්නෙමි, විස්වැසි වන්නෙමි, අභ්‍යන්තරික වන්නෙමි, සුහෘද් වන්නෙමි' මෙසේ ප්‍රියකාම්‍යතායෙන් පිසුනු බස් කියයි. කෙසේ භෙදාධිප්‍රායයෙන් පිසුනුබස් කියා ද යත්? මොහු කෙසේ නම් නානා වන්නාහු ද? වෙන් වන්නාහු ද? වගී වන්නාහු ද? දෙපරිදි වන්නාහු ද? දෙකඩ වන්නාහු ද? දෙ පක්‍ෂ වන්නාහු ද? බිඳෙන්නාහු නො එක්වන්නාහු ද? දුකසේ නො සුවයෙන් වෙසෙන්නාහු ද'යි මෙසේ භෙද කරන අදහස් ඇති වැ පිසුනු කියයි. යමක්හු විසින් තෙල පෛශුන්‍යය ප්‍රහීණ ද සමුච්ඡින්න ද සන්හිඳුවන ලද ද, දුරලන ලද ද, අභව්‍යෝත්පත්තික ද ඥානාග්නියෙන් දග්ධ ද, හෙතෙම පෛශුන්‍යයෙහි නො යෙදුණේ අතිශයින් නො යෙදුණේ සංයුක්ත නො වූයේ නුයි 'පෙසුණෙය්‍යෙ ච නො යුතො' යනු වේ.

එයින් වදාළහ බුදුනු:

**“පතිලීනො අකුහකො -පෙ- පෙසුණෙය්‍යෙ ච නො යුතො”යි.**

**10 - 6**

(යමක් හට) පඤ්චකාමගුණයෙහි තෘෂ්ණාව නො පවතී ද, (යමෙක්) අතිමානයෙහි නො යෙදුණේත් වේ ද, සිනිඳු වූ කායකර්මාදියෙන් යුක්ත ද, ප්‍රතිභානයෙන් සමන්විත වූයේ ද, (පරප්‍රත්‍යයෙන්) නො හදහා ද, (වීතරාග හෙයින්) නො රඳනේ ත් වේ ද, (ඔහු උපශාන්ත යයි කියමි.)

**සාතියෙසු අනස්සාවී** - 'සාතියා'යි පස්කම් ගුණයෝ කියනු ලැබෙත්. කුමක් හෙයින් පස්කම්ගුණයෝ 'සාතියා' යි කියනු ලැබෙත් ද යත්? බොහෝ සෙයින් දෙවිමිනිස්හු පස් කම්ගුණයන් ආශා කෙරෙති, ඉවසති පතති කැමැති වෙති අභිජල්පන කෙරෙත්; එ කරුණෙන් පස් කම්ගුණයෝ 'සාතිය'යි කියනු ලැබෙති. යම් කෙනකුන්ට මේ පඤ්චකාමගුණයෙහි තෘෂ්ණාව අප්‍රහීණ වූවා ද, ඔවුන්ට චක්‍ෂුර්ද්වාරයෙහි (ජවනසම්ප්‍රයුක්ත) රූපාලම්බනතෘෂ්ණාව උපදී, හාත්පසින් උපදී, ගලයි, පවතී. ශ්‍රොත්‍රද්වාර යෙහි ශබ්දතෘෂ්ණාව - ඝ්‍රාණද්වාරයෙහි ගන්ධතෘෂ්ණාව - ජිහ්වාද්වාරයෙහි රස තෘෂ්ණාව - කායද්වාරයෙහි ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණාව - මනොද්වාරයෙහි ධර්මතෘෂ්ණාව උපදී, හාත්පසින් උපදී, ගලයි පවතී; යම් කෙනකුන් විසින් මේ පඤ්චකාම ගුණ තෘෂ්ණාව ප්‍රහීණකරන ලද්දී සිඳින ලද්දී සන්හිඳුණී දුරලන ලද්දී අභව්‍යෝත්පත්තික වූවා ඥානාග්නියෙන් දවන ලද්දී ද, ඔවුන්ට චක්‍ෂුර්ද්වාර යෙහි රූපතෘෂ්ණාව නූපදී - ශ්‍රොත්‍රද්වාරයෙහි ශබ්දතෘෂ්ණාව...මනොද්වාර යෙහි ධර්මතෘෂ්ණාව නූපදී, හාත්පසින් නූපදී, නො ගලයි, නො පවතී නුයි 'සාතියෙසු අනස්සාවී' යනු වේ.

**අතිමානෙ ච නො යුත්තොති** – කතමො අතිමානො? ඉධෙකච්චො පරං අතිමඤ්ඤති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති අතිමානො. යස්සෙසො අතිමානො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො අතිමානෙ ච නො යුත්තො න යුත්තො නප්පයුත්තො න සම්පයුත්තොති 'අතිමානෙ ච නො යුත්තො.'

**සණ්හො ච පටිභානවාති** – 'සණ්හො'ති සණ්හෙන කායකම්මෙන සමන්නාගතොති සණ්හො; සණ්හෙන වචීකම්මෙන සමන්නාගතොති සණ්හො; සණ්හෙන මනොකම්මෙන සමන්නාගතොති සණ්හො; සණ්හෙහි සතිපට්ඨානෙහි සමන්නාගතොති සණ්හො; සණ්හෙහි සම්මප්පධානෙහි– සණ්හෙහි ඉද්ධිපාදෙහි – සණ්හෙහි ඉන්ද්‍රියෙහි – සණ්හෙහි බලෙහි සණ්හෙහි බොජ්ඣඞ්ගෙහි සමන්නාගතොති සණ්හො; සණ්හෙන අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතොති සණ්හො; **පටිභානවාති** – තයො පටිභානවන්තො: පරියත්තිපටිභානවා පරිපුච්ඡාපටිභානවා අධිගමපටිභානවා. කතමො පරියත්තිපටිභානවා? ඉධෙකච්චස්ස පකතියාපි පරියාපුතං හොති සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථා උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං; තස්ස පරියත්තිං නිස්සාය පටිභාති[1]. අයං පරියත්තිපටිභානවා. කතමො පරිපුච්ඡාපටිභානවා? ඉධෙකච්චො පරිපුච්ඡිතා[2] හොති අත්ථෙ ච ඤායෙ ච ලක්ඛණෙ ච කාරණෙ ච ඨානාඨානෙ ච, තස්ස තං පරිපුච්ඡං නිස්සාය පටිභාති. අයං පරිපුච්ඡාපටිභානවා. කතමො අධිගමපටිභානවා? ඉධෙකච්චස්ස අධිගතා හොන්ති චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො චත්තාරො අරියමග්ගා චත්තාරි සාමඤ්ඤඵලානි චතස්සො පටිසම්භිදායො ඡ අභිඤ්ඤායො; තස්ස අත්ථො ඤාතො. ධම්මො ඤාතො. නිරුත්ති ඤාතා. අත්ථෙ ඤාතෙ අත්ථො පටිභාති.[1] ධම්මෙ ඤාතෙ ධම්මො පටිභාති[1] නිරුත්තියා ඤාතාය නිරුත්ති පටිභාති[1] ඉමෙසු තීසු ඤාණෙසු ඤාණං පටිභානපටිසම්භිදා, ඉමාය පටිභානපටිසම්භිදාය උපෙතො සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො සමුපපන්නො සමන්නාගතො. සො වුච්චති පටිභානවා. යස්ස පරියත්ති නත්ථි, පරිපුච්ඡා නත්ථි, අධිගමො නත්ථි, කිං තස්ස පටිභායිස්සතීති – 'සණ්හො ච පටිභානවා...

1 පටිභායති - සීමු. II මජසං. PTS. 2. පරිපුච්ඡිතං සීමු. II. පරිපුච්ඡකතා - මනුප.

**අතිමානෙ ච නො යුතො** - අතිමානය කවරේ යත් ? මෙහි එකෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...එක්තරා කරුණකින් හෝ මෙරමා ඉක්මැ සිතයි; මෙබඳු යම් මානයෙක් මාන කරන අයුරෙක් මාන කරන බවෙක් උන්නතියෙක් නගා තැබීමෙක් මානධවජයෙක් දැඩිව ගැනීමෙක් චිත්තයාගේ කෙතුකාම්‍යතාවක් වේ ද, මේ අතිමාන යයි කියනු ලැබේ. යමක්හු විසින් තෙල අතිමාන ප්‍රහීණ කරන ලද්දේ...නුවණගින්නෙන් දවන ලද්දේ ද, හෙතෙම අතිමානයෙහි ද නො යෙදුණේ යුක්ත නො වූයේ ප්‍රයුක්ත නො වූයේ හාත්පසින් නො යෙදුණේ නුයි 'අතිමානෙ ච නො යුතො' යනු වේ.

**සණ්හො ච පටිභානවා** - 'සණ්හො' යනු: මෘදු වූ කායකර්මයෙන් යුක්ත වූයේ නුයි 'සණ්හ'යැ මෘදු වූ වාක්කර්මයෙන් - මෘදු වූ මනඃකර්මයෙන් - මෘදු වූ සතිපට්ඨානයන් ගෙන් - මෘදු වූ සම්‍යක්ප්‍රධානයන් ගෙන් - සෘද්ධිපාදයන් ගෙන් ඉන්ද්‍රියයන් ගෙන් බලයන් ගෙන් - බොධ්‍යඞ්ගයන් ගෙන් - මෘදු වූ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සමන්විත වූයේ නුයි 'සණ්හ' යැ; **පටිභානවා**- පර්‍ය්‍යාප්තිප්‍රතිභානවත් යැ, පරිපෘච්ඡාප්‍රතිභානවත් යැ, අධිගමප්‍රතිභානවත් යැයි ප්‍රතිභානවත්හු තිදෙනෙක් වෙති: කවරෙක් පර්‍ය්‍යාප්තිප්‍රතිභානවත් ද යත් ? මේ සස්නෙහි එකක්හු විසින් සූත්‍ර යැ ගෙය්‍ය - වෙය්‍යාකරණ- ගාථා - උදාන - ඉතිවුත්තක - ජාතක - අබ්භූතධම්ම - වෙදල්ල යැ (යන නවාඞ්ගය) පියවින් මැ පුහුණු කරන ලද වෙයි, ඔහුට පර්‍ය්‍යාප්තිය නිසා ඥානය අභිමුඛ වෙයි; මේ පර්‍ය්‍යාප්තිප්‍රතිභානවත් යැ. කවරෙක් පරිපෘච්ඡා ප්‍රතිභානවත් වේ ද යත් ? මේ සස්නෙහි එකෙක් ආත්මාර්‍ථයන් ද න්‍යායාර්‍ථයන් ද ලක්ෂණයන් ද කාරණයන් ද ස්ථානාස්ථානයන් ද පුළුවුස්නේ වෙයි, ඔහුට ඒ පිළිවිසීම් නිසා ඥානය අභිමුඛ වෙයි, මේ තෙම පරිපෘච්ඡා- ප්‍රතිභානවත් යැ. කවරෙක් අධිගමප්‍රතිභානවත් වේ ද යත් ? මේ සස්නෙහි එකක්හු විසින් සතර සතිපට්ඨානයෝ අධිගත වූවාහු වෙති, සතර සම්‍යක්ප්‍රධානයෝ - සතර සෘද්ධිපාදයෝ - පඤ්චෙන්ද්‍රියයෝ - පඤ්ච බලයෝ- සප්ත බොධ්‍යඞ්ගයෝ - ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය - සතර ආර්‍ය්‍යමාර්ගයෝ-සතර ශ්‍රාමණ්‍යඵලයෝ - සතර ප්‍රතිසම්භිදාහු - ෂඩභිඥාවෝ අධිගත වූවාහු වෙත්. ඔහු විසින් අර්‍ථය දන්නා ලද, ධර්‍මය දන්නා ලද, නිරුක්තිය දන්නා ලද. අර්‍ථ (-හෙතුඵල)ය ප්‍රකට වූ කල්හි අර්‍ථය නුවණට අභිමුඛ වෙයි, ධර්‍ම (-ප්‍රත්‍යය) ය ප්‍රකට වූ කල්හි ධර්‍මය නුවණට අභිමුඛ වෙයි, නිරුක්තිය ප්‍රකට වූ කල්හි නිරුක්තිය නුවණට අභිමුඛ වෙයි, මේ ත්‍රිවිධඥානයෙහි ප්‍රභෙදගත වූ ඥානය 'පටිභානපටිසම්භිදා' නමු, මේ පටිභානපටිසම්භිදායෙන් උපෙත සමුපෙත උපාගත සමුපාගත උපපන්න සමුපපන්න සමන්වාගත වෙයි, හේ 'ප්‍රතිභානවත්'යයි කියනු ලැබෙයි. යමක් හට පර්‍ය්‍යාප්තිය නැත් නම්, පරිපෘච්ඡාව නැත් නම්, අධිගමය නැත් නම්, ඔහුට කුමක් වැටහෙන්නේ දැ'යි 'සණ්හො ච පටිභානවා' යනු වේ.

**න සද්ධො න විරජ්ජතීති** - 'න සද්ධො'ති සාමං සයං අභිඤ්ඤාතං අත්තපච්චක්ඛං ධම්මං න කස්සචි සද්දහති. අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා දෙවස්ස වා මාරස්ස වා බ්‍රහ්මුනො වා. 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති සාමං සයං අභිඤ්ඤාතං -පෙ- 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති- 'සබ්බෙ ධම්මා අනත්තා'ති - 'අවිජ්ජාපච්චයා සඞ්ඛාරා'ති -පෙ- 'ජාතිපච්චයා ජරාමරණ'න්ති - 'අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධො'ති -පෙ- 'ජාතිනිරොධා ජරාමරණනිරොධො'ති - 'ඉදං දුක්ඛ'න්ති -පෙ- 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති 'ඉමෙ ආසවා'ති -පෙ- 'අයං ආසවනිරොධගාමිනීපටිපදා'ති 'ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යා'ති -පෙ- 'ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා'ති සාමං සයමභිඤ්ඤාතං -පෙ- ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථංගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච. පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච -පෙ- චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථංගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච සාමං සයමභිඤ්ඤාතං -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති සාමං සයමභිඤ්ඤාතං, අත්තපච්චක්ඛං ධම්මං න කස්සචි සද්දහති, අඤ්ඤස්ස සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා දෙවස්ස වා මාරස්ස වා බ්‍රහ්මුනො වා. වුත්තං හෙතං භගවතා:

"සද්දහසි ත්වං සාරිපුත්ත සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං? විරියින්ද්‍රියං - සතින්ද්‍රියං- සමාධින්ද්‍රියං - පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසාන'න්ති. නඛ්වාහං එත්ථ භන්තෙ භගවතො සද්ධාය ගච්ඡාමි. සද්ධින්ද්‍රියං - විරියින්ද්‍රියං - සතින්ද්‍රියං - සමාධින්ද්‍රියං - පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති යෙසං නු එතං භන්තෙ අඤ්ඤාතං අස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය; තෙ තත්ථ පරෙසං සද්ධාය ගච්ඡෙය්‍යුං: සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං, විරියින්ද්‍රියං-සතින්ද්‍රියං-සමාධින්ද්‍රියං- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති. යෙසඤ්ච ඛො එතං භන්තෙ ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය නික්කඞ්ඛා තෙ තත්ථ නිබ්බිචිකිච්ඡා: සද්ධින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානං විරියින්ද්‍රියං - සතින්ද්‍රියං - සමාධින්ද්‍රියං- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති. මය්හඤ්ච ඛො එතං භන්තෙ ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය. නික්කඞ්ඛ්වාහං තත්ථ නිබ්බිචිකිච්ඡො. සද්ධින්ද්‍රියං විරියින්ද්‍රියං- සතින්ද්‍රියං - සමාධින්ද්‍රියං පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති. සාධු සාධු සාරිපුත්ත, යෙසං හෙතං සාරිපුත්ත, අඤ්ඤාතං අස්ස අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය, තෙ තත්ථ පරෙසං සද්ධාය ගච්ඡෙය්‍යුං. සද්ධින්ද්‍රියං -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවිතං බහුලීකතං අමතොගධං හොති අමතපරායනං අමතපරියොසානන්ති.[a]

1. සද්දහති PTS

a සංයුත්තනිකාය - ඉන්ද්‍රියසංයුත්ත.

න සද්ධෝ න විරජ්ජති - 'න සද්ධෝ' යනු: තෙමේ මැ තමා විසින් අවබෝධ කළ, තම හට ප්‍රත්‍යක්‍ෂ වූ ධර්මය අන් මහණකුගේ හෝ බමුණකුගේ හෝ දෙවියකුගේ හෝ මරකුගේ හෝ බඹකුගේ හෝ කිසිවෙකුගේ බසින් නො හදහයි; 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි තෙමේ මැ තමා විසින් අවබෝධ කළ...'සියලු සංස්කාරයෝ දුඃඛයෝ යැ'යි . සියලු ධර්මයෝ අනාත්මයෝ යැ'යි.. 'අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති'... 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යැ'යි...'මේ දුඃඛසත්‍ය යැ'යි...'මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාව යැ'යි...'මොහු ආස්‍රවයෝ යැ'යි...'මේ ආස්‍රවනිරෝධගාමිනීප්‍රතිපදාව යැ'යි...'මේ ධර්මයෝ දතයුත්තාහ'යි....'මේ ධර්මයෝ ප්‍රත්‍යක්‍ෂ කටයුත්තාහ'යි තෙමේ මැ තමා විසින් අවබෝධ කළ... සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ පහළවීම ද විනාශය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද, පඤ්චෝපාදානස්කන්ධයන්ගේ සමුදය ද...සතර මහාභූතයන්ගේ සමුදය ද අස්තඞ්ගමය ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද තෙමේ මැ තමා විසින් අවබෝධ කළ...'යම් කිසි සමුදයධර්මයෙක් වේ නම් ඒ සියල්ල නිරුද්ධ වන පියවි ඇතැ'යි තෙමේ මැ තමා විසින් අවබෝධ කළ තම හට ප්‍රත්‍යක්‍ෂ වූ ධර්මය අන් කිසි මහණකුගේ හෝ බමුණකුගේ හෝ දෙවියකුගේ හෝ මරකුගේ හෝ බඹකුගේ හෝ බසින් නො හදහයි. මේ වදාරන ලද මැය, බුදුන් විසින්:

"ශාරිපුත්‍රයෙනි, තෙපි ශ්‍රද්ධෙන්ද්‍රිය වඩන ලදුයේ නැවත නැවත වඩන ලදුයේ නිර්වාණෙහි ඇතුළත් වෙයි, නිවන පිහිට කොට ඇත, නිවන කෙළවර කොට ඇතැ"යි හදහවු ද ? වීර්යෙන්ද්‍රිය - ස්මෘතීන්ද්‍රිය- සමාධීන්ද්‍රිය - ප්‍රඥෙන්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතොගධ අමතපරායණ අමතපරියොසාන වේ යයි හදහවු ද"යි. ස්වාමීනි, මම මෙහිලා භාග්‍යවතුන් වහන්සේගේ (වචනය) හැදැහීමෙන් අවබෝධ නො කෙරෙමි, සද්ධින්ද්‍රිය- විරියින්ද්‍රිය - සතින්ද්‍රිය - සමාධින්ද්‍රිය - පඤ්ඤින්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමෘතයෙහි ඇතුළත් වූයේ අමෘතය ප්‍රතිෂ්ඨා කොට ඇත්තේ අමෘතය නිෂ්ඨා කොට ඇත්තේය'යි. ස්වාමීනි, යම් කෙනකුන් විසින් තෙල නො දන්නා ලද්දේ (නුවණින්) නො දක්නා ලද්දේ අවබෝධ නො කරන ලද්දේ ප්‍රත්‍යක්‍ෂ නො කරන ලද්දේ ප්‍රඥාවෙන් ස්පර්ශ නො කරන ලද්දේ වේ නම්, ඔව්හු එහිලා මෙරමා බස් හැදැහීමෙන් අවබෝධ කරන්නාහුය: 'ශ්‍රද්ධෙන්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ - වීර්යෙන්ද්‍රිය-ස්මෘතීන්ද්‍රිය- සමාධීන්ද්‍රිය - ප්‍රඥෙන්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතොගධ අමතපරායණ අමතපරියොසාන වේ යැ'යි. තවද ස්වාමීනි, යම් කෙනකුන් විසින් තෙල දන්නා ලද දක්නා ලද අවබෝධ කරන ලද ප්‍රත්‍යක්‍ෂ කරන ලද ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද නම්, ඔවුහු එහි නිසැකයෝ යැ, විචිකිත්සා රහිතයෝ යැ: සද්ධින්ද්‍රිය - විරිය - සති - සමාධි - පඤ්ඤින්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතොගධ අමතපරායණ අමතපරියොසාන කොට ඇත්තේ යයි. ස්වාමීනි, මා විසින් වැලින් තෙල ඥාත යැ දෘෂ්ට යැ විදිත යැ සාක්‍ෂාත්කෘත යැ ප්‍රඥාවෙන් ස්පර්ශ කරන ලද, මම් එහි නිසැකයෙම්, විචිකිත්සා රහිතයෙම්, සද්ධින්ද්‍රිය - විරිය - සති - සමාධි - පඤ්ඤින්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතොගධ අමතපරායණ අමතපරියොසාන කොට ඇතැ'යි. 'සාධු! සාධු!! ශාරිපුත්‍රයෙනි, සැබව ශාරිපුත්‍රයෙනි, යම් කෙනකුන් විසින් තෙල අඥාත අදෘෂ්ට අවිදිත අසාක්‍ෂාත්කෘත ප්‍රඥාවෙන් අස්පෘෂ්ට වන්නේ නම්, ඔහු එහි පරප්‍රත්‍යයෙන් අවබෝධ කරන්නාහුය: සද්ධින්ද්‍රිය.. පඤ්ඤින්ද්‍රිය භාවිත බහුලීකෘත වූයේ අමතොගධ අමතපරායණ අමතප - පරියොසාන වේ"යයි.

1. අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො ච යො නරො,
හතාවකාසො වන්තාසො ස වෙ උත්තමපොරිසො”ති.[a]

**න විරජ්ජතීති** -සබ්බෙ බාලපුථුජ්ජනා රජ්ජන්ති, පුථුජ්ජනකල්‍යාණකං[1] උපාදාය සත්ත සෙඛා විරජ්ජන්ති; අරහා නෙව රජ්ජති නො විරජ්ජති. විරතත්තා[2] සො ඛයා රාගස්ස වීතරාගත්තා ඛයා දොසස්ස වීතදොසත්තා ඛයා මොහස්ස වීතමොහත්තා; සො වුත්ථවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති ‘න සද්ධො න විරජ්ජති.’

තෙනාහ භගවා:

“සාතියෙසු අනස්සාවී අතිමානෙ ච නො යුතො,
සණ්හො ච පටිභානවා න සද්ධො න විරජ්ජතී”ති.

## 10 - 7

ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති,
අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣති.

**ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පතීති** – කථං ලාභකම්‍යා සික්ඛති? “ඉධ භික්ඛු භික්ඛුං පස්සති ලාභිං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං; තස්ස එවං හොති ‘කෙන නු ඛො අයමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන’න්ති. තස්ස එවං හොති: ‘අයං ඛො ආයස්මා සුත්තන්තිකො. තෙනායමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන’න්ති. සො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා ලාභාභිනිබ්බත්තියා ලාභං පරිපාචෙන්තො සුත්තන්තං පරියාපුණාති. එවම්පි ලාභකම්‍යා සික්ඛති. අථවා, භික්ඛු භික්ඛුං පස්සති ලාභිං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. තස්ස එවං හොති: ‘කෙන නු ඛො අයමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන’න්ති. තස්ස එවං හොති: ‘අයං ඛො ආයස්මා විනයධරො -පෙ- ධම්මකථිකො[3], තෙනායමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන’න්ති. සො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා ලාභාභිනිබ්බත්තියා ලාභං පරිපාචෙන්තො අභිධම්මං පරියාපුණාති. එවම්පි ලාභකම්‍යා සික්ඛති. අථවා, භික්ඛු භික්ඛුං පස්සති. ලාභිං චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. තස්ස එවං හොති: ‘කෙන නු ඛො අයමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන’න්ති. තස්ස එවං හොති, ‘අයං ඛො ආයස්මා ආරඤ්ඤිකො -පිණ්ඩපාතිකො- පංසුකූලිකො – තෙචීවරිකො – සපදානචාරිකො – ඛලුපච්ඡාභත්තිකො- නෙසජ්ජිකො – යථාසන්ථතිකො. තෙනායමායස්මා ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරාන’න්ති. සො ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා ලාභාභිනිබ්බත්තියා ලාභං පරිපාචෙන්තො ආරඤ්ඤිකො හොති. -පෙ- යථාසන්ථතිකො හොති. එවම්පි ලාභකම්‍යා සික්ඛති.

---

a. ධම්මපද - අරහන්තවග්ග. 1. කල්‍යාණපුථුජ්ජනං - සං. PTS.
2. විරත්තො - PTS. 3. ආභිධම්මිකො - සං. PTS.

1. යම් පුද්ගලයෙක් (තමා අධිගත හෙයින්) අනුන්ගේ බසින් නො හදහා ද, අකත නම් වූ නිවන ප්‍රත්‍යක්‍ෂ කොට දන්නේ ද, වෘත්තසන්ධි (සංසාරසන්ධි) සිඳපූයේ ද, නසන ලද ප්‍රතිසන්ධ්‍යවකාශ ඇත්තේ ද, වමනය කල සියලු ආශා ඇත්තේ ද, හෙතෙම එකාන්තයෙන් උත්තමපුරුෂ නම් වේ.

**න විරජ්ජති** – සියලු බාලපෘථග්ජනයෝ ඇලෙති, කල්‍යාණපෘථග්ජනයා පටන් සප්ත ශෛක්‍ෂයෝ විරාගයට පැමිණෙති, ක්‍ෂීණාස්‍රව තෙම නො මැ ඇලෙයි, විරාගයට නො පැමිණේ. හෙතෙම රාගය ක්‍ෂය කිරීමෙන් වීතරාග හෙයින් ද්වෙෂය ක්‍ෂය කිරීමෙන් වීතදෙස හෙයින් මොහය ක්‍ෂය කිරීමෙන් වීතමොහ හෙයින් විරක්ත යැ, වැස නිමවූ මගබඹසර ඇත්තේ යැ, පුරුදු කල චරණධර්ම ඇත්තේ යැ...ඔහුට ජාති මරණසංසාරය පුනර්භවය නැත් නුසි 'න සජ්ජති න විරජ්ජති' යනු වේ.

එයින් වදාලහ බුදුහු:

"සාතියෙසු -පෙ- න සජ්ජා න විරජ්ජතී"ති

## 10 – 7

යමෙක් ලාභප්‍රාර්ථනාවෙන් නො හික්මේ ද, අලාභයෙහිත් නො කිපේ ද, (විරොධ නැත්තෙන්) අවිරොධ වේ ද, තෘෂ්ණාවෙන් රසයෙහි ගෙධය (-ගිජුබව)ට නො පැමිණේ ද; (ඔහු උපශාන්ත යයි කියමි.)

**ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති** – කිසෙයින් ලාභ-ප්‍රාර්ථනාවෙන් හික්මේ ද යත්? 'මේ සස්නෙහි මහණෙක් චීවර පිණ්ඩපාත සෙනාසන ගිලන්පසබෙහෙත් පිරිකර ලබනසුලු මහණක්හු දකී. ඔහුට මේ සිත වෙයි: 'මේ ආයුෂ්මත් තෙම කවර කරුණෙකින් සිවුරු... බෙහෙත්පිරිකර ලබනසුලු දැ'යි; ඔහුට මේ සිත වෙයි: 'මේ ආයුෂ්මත් සෞත්‍රාන්තික යැ, එයින් මේ ආයුෂ්මත් සිවුරු...බෙහෙත් පිරිකර ලබන සුලු' යැයි. හෙතෙම ලාභ හෙතුයෙන් ලාභ නිසා ලාභ කරුණෙන් ලාභ නිපදවනු පිණිස ලාභය උපද වන්නේ සූත්‍රාන්තය පුහුණු කරයි; මෙසේත් ලාභප්‍රාර්ථනාවෙන් හික්මෙයි. නොහොත් මහණෙක් සිවුරු...බෙහෙත් පිරිකරලබනසුලු මහණක්හු දකී. ඔහුට මේ සිත වෙයි: 'කුමකින් මේ ආයුෂ්මත් සිවුරු...ලබනසුලු වේ දැ'යි. ඔහුට මේ සිත වෙයි: 'මේ ආයුෂ්මත් විනයධර යැ...ධර්මකථික යැ, එහෙයින් මේ ආයුෂ්මත්...ලබනසුලු වේ ය'යි. හෙතෙම ලාභහෙතුයෙන්...ලාභය උපදවනුයේ අභිධර්මය පුහුණු කරයි; මෙසේ ලාභ කැමැත්තෙන් හික්මෙයි. නොහොත් මහණෙක් චීවර... ලාභී වූ මහණක්හු දකී. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'කුමක් හෙයින් මේ ආයුෂ්මත් චීවර ..ලබනසුලු වේ දැ'යි. ඔහුට මේ සිත වෙයි: 'මේ ආයුෂ්මත් වූ කලී ආරණ්‍යක යැ – පිණ්ඩපාතික යැ– පාංසුකූලික යැ – තෛචීවරික යැ– සපදානචාරික යැ - ඛලුපච්ඡාභත්තික යැ – නෙසජ්ජික යැ – යථාසන්ථතික යැ. එයින් මේ ආයුෂ්මත් තෙම චීවර...පරිෂ්කාරයන් ලබනසුලු වේ ය'යි. හෙතෙම ලාභහෙතුවෙන්...ලාභය උපදවනුයේ ආරණ්‍යක වෙයි...යථාසන්-ථතික වේ. මෙසේත් ලාභප්‍රාර්ථනාවෙන් හික්මෙයි.

කථං න ලාභකම්‍යා සික්ඛති? ඉධ භික්ඛු න ලාභහෙතු න ලාභපච්චයා න ලාභකාරණා න ලාභාභිනිබ්බත්තියා න ලාභං පරිපාචෙන්තො යාවදෙව අත්තදමථාය අත්තසමථාය අත්තපරිනිබ්බාපනත්ථාය සුත්තන්තං පරියාපුණාති. විනයං පරියාපුණාති අභිධම්මං පරියාපුණාති. එවම්පි න ලාභකම්‍යා සික්ඛති. අථවා, භික්ඛු න ලාභහෙතු න ලාභපච්චයා න ලාභකාරණා න ලාභාභිනිබ්බත්තියා න ලාභං පරිපාචෙන්තො යාවදෙව අප්පිච්ඡංයෙව නිස්සාය සන්තුට්ඨිංයෙව[1] නිස්සාය සල්ලෙඛංයෙව නිස්සාය පවිවෙකංයෙව නිස්සාය ඉදම්අත්ථිතංයෙව[2] නිස්සාය ආරඤ්ඤිකො හොති. පිණ්ඩපාතිකො හොති. පංසුකූලිකො හොති. තෙචීවරිකො හොති. සපදානචාරිකො හොති. ඛලුපච්ඡාභත්තිකො හොති. නෙසජ්ජිකො හොති. යථාසන්ථතිකො හොති. එවම්පි න ලාභකම්‍යා සික්ඛතීති - ලාභකම්‍යා න සික්ඛති.

අලාභෙ ච න කුප්පතීති - කථං අලාභෙ කුප්පති? ඉධෙකච්චො කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථීයති[3] කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. එවං අලාභෙ කුප්පති. කථං අලාභෙ න කුප්පති? ඉධ භික්ඛු කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි -පෙ- අප්පඤ්ඤාතොම්හීති න කුප්පති න ව්‍යාපජ්ජති න පතිත්ථීයති න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකරොති. එවං අලාභෙ ච න කුප්පතීති - ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති.

අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣතීති - 'විරුද්ධො'ති යො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො දොසො පදොසො සම්පදොසො චිත්තස්ස බ්‍යාපත්ති මනොපදොසො කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො[4] අනත්තමනතා චිත්තස්ස[8]. අයං වුච්චති විරොධො. යස්සෙසො විරොධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො. සො වුච්චති අවිරුද්ධො. තණ්හාති රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා. රසොති මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො, අම්බිලං මධුරං තිත්තකං[5] කටුකං ලොණිකං ඛාරිකං ලම්බිලං[6] කසාවො සාදුං අසාදුං[7] සීතං උණ්හං; සන්තෙකෙ සමණබ්‍රාහ්මණා රසගිද්ධා, තෙ ජිව්හග්ගෙන රසග්ගානි පරියෙසන්තා ආහිණ්ඩන්ති. තෙ අම්බිලං ලභිත්වා අනම්බිලං පරියෙසන්ති. අනම්බිලං ලභිත්වා අම්බිලං පරියෙසන්ති. මධුරං ලභිත්වා අමධුරං පරියෙසන්ති. අමධුරං ලභිත්වා මධුරං පරියෙසන්ති තිත්තකං ලභිත්වා අතිත්තකං පරියෙසන්ති. අතිත්තකං ලභිත්වා තිත්තකං පරියෙසන්ති. කටුකං ලභිත්වා අකටුකං පරියෙසන්ති. අකටුකං ලභිත්වා කටුකං පරියෙසන්ති. ලොණිකං ලභිත්වා අලොණිකං පරියෙසන්ති. අලොණිකං ලභිත්වා ලොණිකං පරියෙසන්ති.

---

1. සන්තුට්ඨිංමෙව - ස. 2. ඉදම්පච්චතංයෙව - සී. II.
3. පතිට්ඨීයති - ස්‍යා. PTS. - පතිට්ඨීයති - මජසං. 4. අසුරොපො - සීමු II.
5. තිත්තිකං - PTS. 6. ලම්බිල - මජසං. ලම්බිලං - PTS.
7. සාදු අසාදු - මජසං. 8. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ.

කිසෙයින් ලාභප්‍රාර්ථනාවෙන් නො හික්මේ ද යත්? මෙ සස්නෙහි මහණ තෙම ලාභහෙතුයෙන් නො වැ ලාභය නො නිසා ලාභකරුණෙන් නො වැ ලාභ නූපදවනු පිණිස ලාභය නො නිපදවනුයේ යම්තාක් ආත්මදමනය පිණිස ආත්මසමාධානය පිණිස ආත්මපරිනිර්වාණය පිණිස සූත්‍රාන්තය - විනය - අභිධර්මය පුහුණු කෙරෙයි. මෙසේත් ලාභප්‍රාර්ථනාවෙන් නො හික්මෙයි. නොහොත් මහණ තෙම ලාභහෙතුවෙන් නො වැ...ලාභය නො නිපදවනුයේ යම්තාක් අපිස්බව ම නිසා සන්තොස්බව ම නිසා කෙලෙස් නැසීම ම නිසා උත්තමවිවේකය ම නිසා මේ කුශලධර්මයන්ගෙන් ප්‍රයෝජන ඇතිබව ම නිසා ආරණ්‍යක වෙයි, පිණ්ඩපාතික...යථාසන්ථතික වෙයි. මෙසේත් ලාභකාම්‍යයෙන් නො හික්මේ නුයි - 'ලාභකම්‍යා න සික්ඛති' යනු වේ.

**අලාභෙ ච න කුප්පති** - කිසෙයින් අලාභයෙහි කිපේ ද යත්? මෙහි එකෙක් 'කුලය හෝ නො ලබම්, ගණයා හෝ - ආවාසය හෝ - ලාභය හෝ - යශස් හෝ - පැසැසුම් හෝ - සුව හෝ නො ලබම්, සිවුරු හෝ - පිණ්ඩපාත - සෙනසුන් - ගිලන්පසබෙහෙත්පිරිකර හෝ නො ලබම් ග්ලානොපස්ථායකයකු හෝ නො ලබම්, නො පැතෙනුයෙම් වෙම්' කිපෙයි, ව්‍යාපාදයට පැමිණෙයි, තදබවට පැමිණෙයි, කෝපයත් ද්වේෂයත් නො සතුටත් පහළ කෙරෙයි; මෙසේ අලාභයෙහි කිපෙයි. කිසෙයින් අලාභයෙහි නො කිපේ ද යත්: මෙ සස්නෙහි මහණ තෙම 'කුලය හෝ නො ලබම්, ගණයා හෝ නො ලබම්...නො පැතෙනුයෙම් වෙම්' නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, තදබවට නො පැමිණෙයි, කෝපයත් ද්වේෂයත් නො සතුටත් පහළ නො කෙරෙයි. මෙසේ අලාභයෙහි දු නො කිපේ නුයි 'ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති' යනු වේ.

**අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣති** - 'විරුද්ධො' යනු: චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරෝධයෙක් කිපීමෙක් ප්‍රකෝපයෙක් සම්ප්‍රකෝපයෙක් ද්වේෂයෙක් ප්‍රද්වේෂයෙක් චිත්තයාගේ ප්‍රකෘතිය හැරීමෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාරයෙක් ක්‍රොධ වූ බවෙක් ද්වේෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිත බවෙක් ව්‍යාපාදාකාරයෙක් ව්‍යාපාදයට පැමිණි බවෙක් විරෝධයෙක් ප්‍රතිවිරෝධයෙක් චණ්ඩ බවෙක් නො පිරිපුන් වචන ඇති බවෙක් සිතෙහි නො සතුටු බවෙක් වේ ද, ඒ 'විරොධ'යයි කියනු ලැබේ. යමක්හු විසින් තෙල විරෝධය ප්‍රහීණ කරන ලද ද සන්හිඳුවන ලද ද දුරලන ලද ද අනාව්‍යෝත්පත්තික වූයේ ද ඥානාග්නීන් දග්ධ ද, හෙතෙම 'අවිරුද්ධ' යයි කියනු ලැබේ. තණ්හා යනු: රූපතණ්හා යැ සද්ද - ගන්ධ - රස - ඵොට්ඨබ්බ - ධම්මතණ්හා යැ; රස නම්: මුල්රස යැ කඳෙහි රස යැ පොතුරස යැ පත්රස යැ මල්රස යැ ඵලරස යැ ඇඹුල් මිහිරි තිත්ත යැ කුළු යැ ලුණුරස යැ කරරස යැ ලපිල - (නො කසටරස) යැ කසටරස යැ මිහිරි යැ නො මිහිරි යැ සිසිල් රස යැ හුණුරස යි; රසයෙහි ගිජු වූ මහණ බමුණු කෙනෙක් ඇත්තාහ. ඔහු දිවගින් අග්‍රරස සොයමින් ඇවිදිති: ඔහු ඇඹුලක් ලැබ නො ඇඹුලක් සොයති, නො ඇඹුලක් ලැබ ඇඹුල් සොයති, මිහිරක් ලැබ අමිහිරි දෑ සොයති, අමිහිරක් ලැබ මිහිරි දෑ සොයති, තිත්ත දෑයක් ලැබ නො තිත්ත දෑ සොයති, නො තිත්ත දෑ ලැබ තිත්ත දෑ සොයති, කුළු දෑ ලැබ නො කුළු දෑ සොයති, නො කුළු දෑ ලැබ කුළු දෑයක් සොයති, ලුණක් ලැබ ලුණු නැත්තක් සොයති, ලුණුනැති දෑ ලැබ ලුණු ඇති දෑ සොයති.

බාරිකං ලභිත්වා අබාරිකං පරියෙසන්ති. අබාරිකං ලභිත්වා බාරිකං පරියෙසන්ති. ලපිලං[1] ලභිත්වා කසාවං පරියෙසන්ති. කසාවං ලභිත්වා ලපිලං පරියෙසන්ති. සාදුං ලභිත්වා අසාදුං පරියෙසන්ති. අසාදුං ලභිත්වා සාදුං පරියෙසන්ති. සීතං ලභිත්වා උණ්හං පරියෙසන්ති. උණ්හං ලභිත්වා සීතං පරියෙසන්ති. තෙ යං යං ලභිත්වා තෙන තෙන[2] න සන්තුස්සන්ති. අපරාපරං පරියෙසන්ති. මනාපිකෙසු රසෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා. යස්සෙසා[3] රසතණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා.

සො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි[4] නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි. යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො ච. යථා වණං[5] ආලිම්පෙය්‍ය යාවදෙව රොපනත්ථාය; යථා වා පන අක්ඛං අබ්භඤ්ජෙය්‍ය[6] යාවදෙව භාරස්ස නිත්ථරණත්ථාය; යථා වා පන පුත්තමංසං ආහාරං ආහරෙය්‍ය යාවදෙව කන්තාරස්ස නිත්ථරණත්ථාය; එවමෙව භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති, 'නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චා'ති. රසතණ්හං පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. රසතණ්හාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදී-කතෙන[7] චෙතසා විහරතීති - 'අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣති.'

තෙනාහ භගවා:

ලාභකම්‍යා න සික්ඛති අලාභෙ ච න කුප්පති,
අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣතී"ති.

## 10 - 8

උපෙක්ඛකො සදා සතො න ලොකෙ මඤ්ඤතෙ සමං,
න විසෙසී න නීචෙය්‍යො තස්ස නො සන්ති උස්සදා.

**උපෙක්ඛකො සදා සතොති** - 'උපෙක්ඛකො'ති ඡළඞ්ගුපෙක්ඛාය සමන්නාගතො: චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො; සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො. චක්ඛුනා රූපං දිස්වා මනාපං නාභිගිජ්ඣති නාභිහංසති[8] න රාගං ජනෙති. තස්ස ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං.

---

1. ලබිලං - මජසං, PTS. 2. තෙන - PTS. 3. යස්ස - PTS.
4. පටිකඞ්ඛාමි - PTS. 5. වනං - මජසං. 6. අබ්භඤ්ජස්ස - PTS.
7. විමරියාදිකතෙන - මජසං. 8. නාභිහසති - සීමු. II. PTS.

කරරසයක් ලැබ නො කරරස සොයයි, නො කරරස දෙයක් ලැබ කරරස සොයති, නො කසටක් ලැබ කසට සොයයි, කසට ද ලැබ නො කසට ද සොයයි, මිහිරක් ලැබ අමිහිරි ද සොයයි, අමිහිරක් ලැබ මිහිරි ද සොයති, සිහිලක් ලැබ නුණු ද සොයති, නුණු දෙයක් ලැබ සිහිල් සොයත්. ඔවුහු යම් යම් දෙයක් ලැබ ඒ ඒ දෙයින් නො සතුටු වෙති, මතුමත්තෙහි සොයති. මින වඩන රසයෙහි රැඳුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු වැතුරුණාහු ලැගුණාහු ඇළුණාහු බැසගත්තාහු ය. යමක්හු විසින් තෙල රසතෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සිඳින ලද්දී සන්හිඳුවන ලද්දී දුරලන ලද්දී උපතට නුසුදුසු වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද.

හෙතෙම නුවණින් විමසා අහර වළඳයි, කෙළි පිණිස නො මැ වළඳයි, මද පිණිස-අලඞ්කාර පිණිස - සැරසුම් පිණිස නො වළඳයි, යම්තාක් මේ කය පැවැත්ම පිණිස යැපීම පිණිස බඩගිනි වේදනා නැසීම පිණිස බඹසරට අනුග්‍රහ පිණිස වළඳයි, මෙසේ 'පැරණි බඩගිනි වේදනා නසමි, අලුත් වේදනාත් නුපදවමි, මා ගේ යැපීම ද වන්නේය, අනවද්‍යභාවය ද සුව විහරණය ද වන්නේය; යම්සේ මස්වැඩීම පමණට ව්‍රණය ආලේප කරන්නේ ද, නවද යම්සේ බර ගෙන යන පමණට අක්ෂය තෙල් ගල්වන්නේ ද, නවද යම්සේ කතරමග තරණය කරන පමණට පුත්‍රමාංසාහාරය අනුභව කරන්නේ ද, එපරිද්දෙන් ම මහණ තෙම නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට අහර වළඳයි, නො මැ කෙළි පිණිස වළඳයි,...මාගේ ජීවිත යාත්‍රාව ද අනවද්‍යභාව ද ඵාසුවිහරණය ද වන්නේ යැ'යි. රසතෘෂ්ණාව දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අභාවයට පමුණුවයි. රසතෘෂ්ණා-වෙන් දුරු වූයේ වෙන් වූයේ නික්මුණේ නික්මැ ගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ වන්නේය, විගතමර්යාද කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'අවිරුද්ධො ච තණ්හාය රසෙ ච නානුගිජ්ඣති'යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“ලාභකම්‍යා න සික්ඛති -පෙ- රසෙ ච නානුගිජ්ඣති”යි

## 10 - 8

යමෙක් ෂඩඞ්ගොපෙක්ෂාවෙන් සමන්විත වූයේ හැමකල්හි ස්මෘතිමත් වූයේ ලොව්, (කිසිවක්හු හා) සම කොට නො සිතා ද, (මම්) ශ්‍රෙෂ්ඨ වෙමි නො සිතා ද හීන වෙමි මත් නැත්තේ වේ ද, ඒ පුද්ගලයා හට උත්සදයෝ නො වෙති. (ඔහු උපශාන්ත යයි කියමි.)

**උපෙක්ඛකො සදා සතො** - 'උපෙක්ඛකො' යනු: ෂඩඞ්ගොපෙක්ෂාවෙන් සමන්වාගත වූයේ ඇසින් රූපයක් දැක (ලොභවශයෙන්) නො මැ සතුටු සිත් ඇත්තේ වෙයි, (ද්වේෂවශයෙන්) දුම්මට සිත් ඇත්තේ නො වෙයි, සිහි ඇතියේ නුවණැතියේ උපෙක්ෂා සහිත වූයේ වෙසෙයි; කනින් ශබ්දයක් අසා...සිතින් ධර්මාලම්බනයක් දැන නො මැ සොමිනස් ඇත්තේ වෙයි, දොම්නස් ඇත්තේ නො වෙයි, සිහි නුවණ ඇතියේ උපෙක්ෂා සහිත වූයේ වෙසෙයි, ඇසින් මනාප වූ රූපයක් දැක නො ගිජු වෙයි, නො සතුටු වෙයි, රාග නූපදවයි; ඔහු ගේ චක්ෂුරාදි කාය සිටියේ (නිශ්චල වූයේ) මැ වෙයි, අධ්‍යාත්මයෙහි සිත සිටියේ සුනිශ්චල වූයේ සුවිමුක්ත වූයේ වෙයි.

චක්ඛුනා ඛො පනෙව රූපං දිස්වා අමනාපං න මඞ්කු හොති අප්පතිට්ඨිතචිත්තො අලීනමනසො[1] අබ්‍යාපන්නචෙතසො, තස්ස ඨිතොව කායො හොති, ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං; සොතෙන සද්දං සුත්වා - ඝානෙන ගන්ධං ඝායිත්වා - ජිව්හාය රසං සායිත්වා - කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය - මනාපං නාභිගිජ්ඣති නාභිහංසති න රාගං ජනෙති, තස්ස ඨිතොව කායො හොති. ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං. මනසා ඛො පනෙව ධම්මං විඤ්ඤාය අමනාපං න මඞ්කු හොති අප්පතිට්ඨිතචිත්තො අලීනමනසො[1] අබ්‍යාපන්නචෙතසො තස්ස ඨිතොව කායො හොති. ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං. චක්ඛුනා රූපං දිස්වා මනාපාමනාපෙසු රූපෙසු තස්ස ඨිතොව කායො හොති. ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය මනාපාමනාපෙසු ධම්මෙසු තස්ස ඨිතොව කායො හොති. ඨිතං චිත්තං අජ්ඣත්තං සුසණ්ඨිතං සුවිමුත්තං. චක්ඛුනා රූපං දිස්වා රජනීයෙ න රජ්ජති. දොසනීයෙ න දුස්සති. මොහනීයෙ න මුය්හති. කොපනීයෙ න කුප්පති. කිලෙසනීයෙ න කිලිස්සති. මදනීයෙ න මජ්ජති. සොතෙන සද්දං සුත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය රජනීයෙ න රජ්ජති. දොසනීයෙ න දුස්සති. මොහනීයෙ න මුය්හති. කොපනීයෙ න කුප්පති. කිලෙසනීයෙ න කිලිස්සති. මදනීයෙ න මජ්ජති. දිට්ඨෙ දිට්ඨමත්තො. සුතෙ සුතමත්තො. මුතෙ මුතමත්තො. විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තො. දිට්ඨෙ න ලිප්පති.[2] සුතෙ න ලිප්පති.[2] මුතෙ න ලිප්පති. විඤ්ඤාතෙ න ලිප්පති. දිට්ඨෙ අනූපයො අනපායො[3] අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති. සුතෙ මුතෙ විඤ්ඤාතෙ අනූපයො අනපායො[3] අනිස්සිතො අප්පටිබද්ධො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරති.

සංවිජ්ජති අරහතො චක්ඛු.[4] පස්සති අරහා චක්ඛුනා රූපං. ඡන්දරාගො අරහතො නත්ථි. සුවිමුත්තචිත්තො අරහා. සංවිජ්ජති අරහතො සොතං. සුණාති අරහා සොතෙන සද්දං. ඡන්දරාගො අරහතො නත්ථි. සුවිමුත්තචිත්තො අරහා. සංවිජ්ජති අරහතො ඝානං. ඝායති අරහා ඝානෙන ගන්ධං. ඡන්දරාගො අරහතො නත්ථි. සුවිමුත්තචිත්තො අරහා. සංවිජ්ජති අරහතො ජිව්හා. සායති අරහා ජිව්හාය රසං. ඡන්දරාගො අරහතො නත්ථි. සංවිජ්ජති අරහතො කායො. ඵුසති අරහා කායෙන ඵොට්ඨබ්බං. -පෙ- සංවිජ්ජති අරහතො මනො. විජානාති අරහා මනසා ධම්මං. ඡන්දරාගො අරහතො නත්ථි. සුවිමුත්තචිත්තො අරහා. චක්ඛුං රූපාරාමං රූපරතං රූපසම්මුදිතං. තං අරහතො දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං. තස්ස ච සංවරාය ධම්මං දෙසෙති. සොතං සද්දාරාමං -පෙ- ඝානං ගන්ධාරාමං ජිව්හා රසාරාමා රසරතා රසසම්මුදිතා. සා අරහතො දන්තා ගුත්තා රක්ඛිතා සංවුතා. තස්ස ච සංවරාය ධම්මං දෙසෙති. කායො ඵොට්ඨබ්බාරාමො -පෙ- මනො ධම්මාරාමො ධම්මරතො ධම්මසම්මුදිතො. සො අරහතො දන්තො ගුත්තො රක්ඛිතො සංවුතො. තස්ස ච සංවරාය ධම්මං දෙසෙති.

---

අප්පතිට්ඨිතචිත්තො ආදීනමනසො - PTS. 2. ලිම්පති - සීමු. II. මජසං. PTS.
3. අනූපයො - සං. PTS. 4. චක්ඛුං - සීමු II.

යළි ඇසින් මැ අමනාප වූ රූපයක් දැක නො මකු වූයේ (ක්‍රොධවශයෙන්) නො පිහිටි සිත් ඇතියේ නො හැකුළුණු සිත් ඇතියේ ව්‍යාපාද රහිත සිත් ඇත්තේ වෙයි; ඔහුගේ කය නිශ්චල වූයේ මැ වෙයි, සිත නිශ්චල වූයේ අධ්‍යාත්මයෙහි සුසංස්ථිත සුවිමුක්ත වූයේ වෙයි. කනින් ශබ්දයක් අසා.. නැහැයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට දිවින් රසයක් ආස්වාද කොට - කයින් පහසක් ස්පර්ශ කොට - මනසින් ධර්මයක් දැන ඉෂ්ටාලම්බනයට නො ගිජු වෙයි, නො සතුටු වෙයි, රාග නූපදවයි. ඒ රහත්හුගේ කය නිශ්චල වූයේ මැ වෙයි, අධ්‍යාත්මයෙහි සිත නිශ්චල වූයේ මොනොවට පිහිටියේ වෙසෙසින් මිදුණේ වෙයි. යළි සිතින් මැ අමනාප වූ ධර්මාලම්බනයක් දැන නො මකු වෙයි, (ක්‍රොධවශයෙන්) නො පිහිටි සිත් ඇතියේ නො හැකුළුණු සිත් ඇතියේ ව්‍යාපාද රහිත සිත් ඇතියේ වෙයි. ඔහුගේ කය නිශ්චල වූයේ මැ වෙයි, අධ්‍යාත්මයෙහි සිත පිහිටියේ සුසංස්ථිත සුවිමුක්ත වෙයි. ඇසින් රූපයක් දැක මනාපාමනාපරූපයන්හි ඔහුගේ කය සිටියේ (-නිශ්චල වූයේ) මැ වෙයි, සිත අධ්‍යාත්මයෙහි සිටියේ සුපිහිටියේ සුවිමුක්ත වෙයි. කනින් ශබ්දයක් අසා...මනසින් ධර්මයක් දැන මනාපාමනාපධර්මයන්හි ඔහුගේ කය සිටියේ මැ වෙයි, සිත... සුවිමුක්ත වෙයි. ඇසින් රූපයක් දැක ඇලුම් කටයුතු වස්තුවෙහි නො ඇලෙයි, ද්වේෂ ඉපදවියැ යුත්තෙහි ද්වේෂය නූපදවයි, මුළාවියැ යුත්තෙහි මුළා නො වෙයි, කිපියැ යුත්තෙහි නො කිපෙයි, කෙලෙසියැ යුත්තෙහි නො කෙලෙසෙයි, මත්වියැ යුත්තෙහි නො මත් වෙයි. කනින් ශබ්දයක් අසා...මනසින් ධර්මයක් දැන රජනීය වස්තුවෙහි නො ඇලෙයි, දෙසනීය-යෙහි - මොහනීයයෙහි - කොපනීයයෙහි - කිලෙසනීයයෙහි - මදනීය වස්තුවෙහි නො මත් වෙයි. රූපාලම්බනයෙහි (චක්ෂුර්විඥනයෙන්) දුටු පමණ වූයේ ශබ්දායතනයෙහි ශ්‍රැතමාත්‍ර වූයේ මුතාලම්බනයෙහි මුත (-පැමිණ ගන්නා ලද) මාත්‍ර වූයේ ධම්මාරම්මණයෙහි විඥතමාත්‍ර වූයේ වෙයි; චක්ෂුර් විඥනයෙන් දුටු) රූපාරම්මණයෙහි (තෘෂ්ණාදෘෂ්ටිලෙපයෙන්) නො ඇලෙයි, ශබ්දාලම්බනයෙහි නො ඇලෙයි, ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙහි නො ඇලෙයි, ධර්මාලම්බනයෙහි නො ඇලෙයි; රූපාලම්බනයෙහි තෘෂ්ණා නැත්තේ දූෂ්‍ය නො වූයේ අනිඃශ්‍රිත වූයේ නො බැඳුණේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වෙසෙයි, ශ්‍රැතයෙහි - මුතයෙහි- විඥතයෙහි තෘෂ්ණා නැත්තේ...විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වෙසෙයි.

රහත්හට ඇස ලැබෙයි, රහත් තෙම ඇසින් රූප දකී, ඡන්දරාගයෙක් රහත් හට නැත, රහත් තෙම් වෙසෙසින් මිදුණු සිත් ඇත්තේ ය. රහත්හට ශ්‍රොත්‍රප්‍රසාදය ලැබෙයි, රහත් තෙම කනින් ශබ්ද අසයි, ඡන්දරාගය රහත් හට නැත, රහත් තෙම සුවිමුක්තචිත්ත යැ. රහත් හට ඝ්‍රාණය - රහත් තෙම සුවිමුක්තචිත්ත යැ. ජිහ්වාප්‍රසාදය - කායප්‍රසාදය- රහත් හට මනස ලැබෙයි, රහත් තෙම මනසින් ධර්මය දැනගනී, ඡන්දරාගය රහත් හට නැත, රහත් තෙම සුවිමුක්තචිත්ත යැ, ඇස රූපාරාම යැ, රූපයෙහි ඇලුණේ යැ, රූපයෙහි සතුටු වූයේ යැ, එය රහත්හු විසින් දමනය කරන ලද, ගොපනය කරන ලද, රක්නා ලද, සංවර කරන ලද, යළි ඒ ඇස සංවර පිණිස දහම් දෙසයි. කන ශබ්දාරාම යැ... නැහැය ගන්ධාරාම යැ - දිව රසාරාම යැ - කය ස්ප්‍රෂ්ටව්‍යාරාම යැ - මනස ධර්මය ඇලුම් කොට ඇත්තේ යැ, ධර්මරත යැ ධර්මයෙහි සතුටු වූයේ යැ. ඒ මනස රහත්හු විසින් දන්ත යැ ගුප්ත යැ රක්ෂිත යැ සංවෘත යි, ඒ මනස සංවර පිණිස දහම් දෙසයි.

1. "දන්තං නයන්ති සමිතිං දන්තං රාජාභිරූහති,
දන්තො සෙට්ඨො මනුස්සෙසු යො'තිවාක්‍යං තිතික්ඛති.a

2. වරමස්සතරා දන්තා ආජානීයා ච සින්ධවා,
කුඤ්ජරා ච[1] මහානාගා අත්තදන්තො තතො වරං.a

3. න හි එතෙහි යානෙහි ගච්ඡෙය්‍ය අගතං දිසං,
යථත්තනා[2] සුදන්තෙන දන්තො දන්තෙන ගච්ඡති.a

4. විධාසු න විකම්පන්ති[3] විප්පමුත්තා පුනබ්භවා,
දන්තභූමිමනුප්පත්තා තෙ ලොකෙ විජිතාවිනො.b

5. යස්සින්ද්‍රියානි භාවිතානි[4] අජ්ඣත්තබහිද්ධා ච සබ්බලොකෙ,
නිබ්බිජ්ඣ ඉමං පරඤ්ච ලොකං කාලං කඞ්ඛති භාවිතො
සදන්තො[5]"තිc

**උපෙක්ඛකො සදාති** - සදා සබ්බදා සබ්බකාලං නිච්චකාලං ධුවකාලං -පෙ- පච්ඡිමෙ වයොඛන්ධෙ.[6] **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, වෙදනාසු - චිත්ත- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො -පෙ- සො වුච්චති සතො'ති - 'උපෙක්ඛකො සදා සතො.'

**න ලොකෙ මඤ්ඤතෙ සමන්ති** - 'සදිසො හමස්මී'ති මානං න ජනෙති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති - 'න ලොකෙ මඤ්ඤතෙ සමං.'

**න විසෙසී න නීචෙය්‍යොති** - 'සෙය්‍යො හමස්මී'ති අතිමානං න ජනෙති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා; 'හීනොහමස්මී'ති මානං න ජනෙති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා'ති - න විසෙසී න නීචෙය්‍යො, **තස්ස නො සන්ති උස්සදාති** - 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස, උස්සදාති සත්තුස්සදා රාගුස්සදො දොසුස්සදො මොහුස්සදො මානුස්සදො දිට්ඨුස්සදො කිලෙසුස්සදො කම්මුස්සදො; තස්සිමෙ උස්සදා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති - 'තස්ස නො සන්ති උස්සදා.'

තෙනාහ භගවා:

"උපෙක්ඛකො සදා සතො න ලොකෙ මඤ්ඤතෙ සමං,
න විසෙසී න නීචෙය්‍යො තස්ස නො සන්ති උස්සදා"ති.

---

1. කුඤ්ජර ච - PTS. 2. යථාත්තනා - PTS 3 විකප්පන්ති සීමු. I. PTS.
4. විභාවිතානි - සීමු. II. PTS. 5. සුදන්තො - සං. PTS.
6 වයොඛන්ධො - සීමු. II. පච්ඡිමවයොඛන්ධෙ -PTS. a. ධම්මපද - නාගවග්ග.
b. ඛන්ධසංයුත්ත - ඛජ්ජනීය වග්ග. c. සුත්තනිපාත - සභියසුත්ත.

1. දමුණු ඇතකු අසකු මැ බොහෝදෙනා රැස්වූ තැනට පමුණුවති, රජ ද දමුණු ඇතකු පිට මැ නැගෙයි, යමෙක් අනුන් කිණු පරොස්බස් ඉවසා නම් දමුණා වූ හෙතෙම මිනිසුන් අතුරෙහි උත්තම යි.

2. අශ්වතරයෝ දමුණාහු මැ උතුම් වෙති, ආජානෙය අශ්වයෝ ද සෛන්ධවයෝ ද කුඤ්ජර නම් වූ මහඇත්හු ද දමුණාහු මැ උතුම් වෙති, ඊට වඩා (මාර්ගභාවනාවෙන්) ආත්මදමනය කරන ලද්දේ උත්තම යි.

3. දමුණු මහණ තෙම (පූර්වභාගයෙහි ඉන්ද්‍රියදමනයෙන්) දමුණා වූ (අපරභාගයෙහි ආර්‍යමාර්ගභාවනාවෙන්) මනාව දමුණා වූ සිතින් අගත නම් වූ නිර්වාණදිශාවට යම්සේ යේ ද, මේ ඇත්ආදි යානයෙන් එසේ නො මැ යන්නේ යි.

4. යම් කෙනෙක් ත්‍රිවිධමානයෙහි කම්පා නො වෙත් ද, පුනර්භවයෙන් මිදුණාහු ද, (රහත්ඵල සංඛ්‍යාත) දන්තභූමියට පැමිණියාහු ද ඔවුහු මේ සත්වලොකයෙහි දිනුවාහු නම් වෙත්.

5. යමක්හු විසින් අධ්‍යාත්ම වූ ද බාහිර වූ ද සියලු ලොකයෙහි (චක්ෂුරාදි) ෂඩින්ද්‍රියයෝ (ත්‍රිලක්ෂණයට නගා) වෙසෙසින් වඩන ලද්දාහු ද, භාවිත ඉන්ද්‍රිය ඇති ඒ දන්ත වූ පුද්ගල තෙම (ස්වපරසන්තති සංඛ්‍යාත) මෙ ලොව හා පරලොව හා දැන මරණකාලය බලාපොරොත්තු වේ යයි.

**උපෙක්ඛකො සදා** – හැමදා සියලුදා සියලු කල දිනපතා නිරතුරු පශ්චිම වයස් කොටසෙහි; **සතො** – සතර කරුණකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ, වෙදනාවන්හි- චිත්තයෙහි – ධර්මයන්හි ධම්මානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ... හෙතෙම සිහි ඇතැයි කියනු ලැබේ නුසි 'උපෙක්ඛකො සදා සතො' යනු වේ.

**න ලොකෙ මඤ්ඤතෙ සමං** – 'මම් සදෘශයෙමි' ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...එක්තරා වස්තුවකින් හෝ මානය නූපදවා නුසි 'න ලොකෙ මඤ්ඤතෙ සමං' යනු වේ.

**න විසෙසි න නීචෙය්‍යො** – 'මම් ශ්‍රෙෂ්ඨ වෙමි' ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...එක්තරා වස්තුවකින් හෝ අතිමානය නූපදවයි; 'මම් හීන වෙමි' ජාතියෙන් හෝ...එක්තරා වස්තුවකින් හෝ මානය නූපදවා නුසි 'න විසෙසී න නීචෙය්‍යො' යනු වේ.

**තස්ස නො සන්ති උස්සදා** – 'තස්ස' යනු: අගීත් ක්ෂීණාස්‍රව හට; **උස්සදා** යනු: උස්සදයෝ සතෙකි: රාගොත්සදය ද්වෙෂ – මොහ – මාන– දෘෂ්ටි – ක්ලේශ – කර්මොත්සද යැ'යි; ඒ රහත් හට මේ උත්සදයෝ නැත, නො වෙති, අවිද්‍යමාන වෙති, නො ලැබෙත්; ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු දුරලන ලද්දාහු අභව්‍යොත්පත්තික වූවාහු ඥානාග්නින් දග්ධ වූවාහු නුසි 'තස්ස නො සන්ති උස්සදා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**උපෙක්ඛකො** -පෙ- **තස්ස නො සන්ති උස්සදා**"යි.

## 10 - 9

යස්ස නිස්සයතා නත්ථි ඤත්වා ධම්මං අනිස්සිතො,
භවාය විභවාය වා[1] තණ්හා යස්ස න විජ්ජති.

**යස්ස නිස්සයතා නත්ථීති**- 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස; **නිස්සයතාති** ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච; -පෙ- අයං තණ්හානිස්සයො -පෙ- අයං දිට්ඨිනිස්සයො. තස්ස තණ්හානිස්සයො පහීනො දිට්ඨිනිස්සයො පටිනිස්සට්ඨො. තණ්හානිස්සයස්ස පහීනත්තා දිට්ඨිනිස්සයස්ස පටිනිස්සට්ඨත්තා නිස්සයතා යස්ස නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති. පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති - 'යස්ස නිස්සයතා නත්ථි'.

**ඤත්වා ධම්මං අනිස්සිතොති** - 'ඤත්වා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා' ති සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා' ති 'සබ්බෙ ධම්මා අනත්තා'ති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්මං'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **අනිස්සිතොති** ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච -පෙ- අයං තණ්හානිස්සයො -පෙ- අයං දිට්ඨිනිස්සයො. තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සිතො සොතං අනිස්සිතො ඝානං අනිස්සිතො ජිව්හං අනිස්සිතො කායං අනිස්සිතො මනං අනිස්සිතො. රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ කුලං ගණං ආවාසං -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො[2] විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතී'ති - 'ඤත්වා ධම්මං අනිස්සිතො.'

**භවාය විභවාය වා[1] තණ්හා යස්ස න විජ්ජතීති** - 'තණ්හා'ති රූපතණ්හා, සද්දතණ්හා, ගන්ධතණ්හා, රසතණ්හා, ඵොට්ඨබ්බතණ්හා, ධම්මතණ්හා. **යස්සාති** -අරහතො ඛීණාසවස්ස; **භවායාති** -භවදිට්ඨියා; **විභවායාති** විභවදිට්ඨියා; **භවායාති** - සස්සතදිට්ඨියා වා; **විභවායාති** - උච්ඡෙදදිට්ඨියා; 'භවායා'ති පුනප්පුනභවාය[3] පුනප්පුන ගතියා පුනප්පුන උපපත්තියා පුනප්පුන පටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා, තණ්හා යස්ස නත්ථි න සන්ති න සංවිජ්ජති නුපලබ්භති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති - භවාය විභවාය ච තණ්හා යස්ස න විජ්ජති.

තෙනාහ භගවා:

"යස්ස නිස්සයතා නත්ථි ඤත්වා ධම්මං අනිස්සිතො,
භවාය විභවාය වා තණ්හා යස්ස න විජ්ජතී"ති.

---

1. විභවාය ච - PTS. 2. නිස්සටො - PTS.
3. පුනප්පුනං භවාය - සත. - PTS.

## 10 - 9

යම් ක්ෂීණාශ්‍රවයක් හට (තෘෂ්ණාදෘෂ්ටි) නිඃශ්‍රය බව නැත් ද, (යමෙක් අනිත්‍යාදි ආකාරයෙන් සියලු) ධර්මය දැන අනිඃශ්‍රිත වූයේ ද, යමකුට භවදෘෂ්ටියෙහි හෝ විභවදෘෂ්ටියෙහි තෘෂ්ණාව අවිද්‍යමාන වේ ද; (ඔහු උපශාන්ත යයි කියමි.)

**යස්ස නිස්සයතා නත්ථි** – 'යස්ස' යනු: අර්හත් ක්ෂීණාශ්‍රවයක් හට; **නිස්සයතා** – තෘෂ්ණානිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය ද'යි නිඃශ්‍රය දෙකෙකි...ඔහු විසින් තෘෂ්ණානිඃශ්‍රය නසන ලද, දෘෂ්ටිනිඃශ්‍රය දුරලන ලද; තෘෂ්ණානිඃශ්‍රය ප්‍රහීණ හෙයින් දෘෂ්ටිනිඃශ්‍රය දුරලූ හෙයින් නිඃශ්‍රය බව යමක් හට නැත්ද නො වේ ද අවිද්‍යමාන ද නො ලැබේ ද, ප්‍රහීණ වූවා . ඥානාග්නිත් දග්ධ නුයි 'යස්ස නිස්සයතා නත්ථි' යනු වේ.

**ඤත්වා ධම්මං අනිස්සිතො** – 'ඤත්වා' යනු: දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට, 'සියලු සංස්කාරයෝ අනිත්‍යය'යි, 'සියලු සංස්කාරයෝ දුක්ඛ'යි, 'සියලු ධර්මයෝ අනාත්මය සි. .උපදනා පියම් ඇති ඒ සියල්ල නැසෙනසුලු යැ'යි දැන.. විභූත කොට; **අනිස්සිතො**– තෘෂ්ණා දෘෂ්ටි යැයි නිඃශ්‍රයයෝ දෙදෙනෙකි...තෘෂ්ණානිඃශ්‍රය නසා දෘෂ්ටිනිඃශ්‍රය දුරලා චක්ෂුස අනිඃශ්‍රිත වූයේ ශ්‍රොත්‍ර – ඝ්‍රාණ – ජිහ්වා– මනස අනිඃශ්‍රිත වූයේ, රූප ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් – කුලය– ගණයා – ආවාසය. .දෘෂ්ට ශ්‍රැත මූත විඥාතව්‍ය ධර්මයන් ඇසුරු නො කෙළේ නො ඇලුණේ නො පැමිණියේ නො පිවිසියේ නො බැසගත්තේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කළ සිතින් වෙසේ නුයි 'ඤත්වා ධම්මං අනිස්සිතො' යනු වේ.

**භවාය විභවාය වා තණ්හා යස්ස න විජ්ජති** – 'තණ්හා' යනු: රූපයෙහි තෘෂ්ණාව ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍ය – ධර්මතෘෂ්ණා යි **යස්ස**– අර්හත් ක්ෂීණාශ්‍රව හට; **භවාය** – භවදෘෂ්ටියෙහි; **විභවාය** – විභවදෘෂ්ටියෙහි; **භවාය** –ශාශ්වතදෘෂ්ටියෙහි හෝ; **විභවාය** – උච්ඡේදදෘෂ්ටියෙහි; **භවාය** – පුන පුනා භවයෙහි පුනපුනා ගතියෙහි පුනපුනා උත්පත්තියෙහි පුනපුනා ප්‍රතිසන්ධියෙහි පුනපුනා ආත්මභාවයාගේ පහළ වීමෙහි තෘෂ්ණාව යමක් හට නැත් ද නො වේ ද විද්‍යමාන නො වේ ද නො ලැබේ ද, ප්‍රහීණ වූවා සමුච්ඡින්න වූවා සන්හිඳුණි දුරලන ලද්දී උපනට නුපුදුපු වූවා නුවණ–ගින්නෙන් දවන ලද්දී නුයි 'භවාය විභවාය වා තණ්හා යස්ස න විජ්ජති' යනු වේ.

එයින් වදාළහ, බුදුහු:

**යස්ස නිස්සයතා නත්ථි -පෙ- තණ්හා යස්ස න විජ්ජති"යි**

## 10 - 10

තං බ්‍රෑමි උපසන්තො’ති කාමෙසු අනපෙක්ඛිනං,
ගන්ථා[1] තස්ස න විජ්ජන්ති අතරී[2] සො විසත්තිකං.

**තං බ්‍රෑමි උපසන්තොති** - උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධො’ති තං බ්‍රෑමි තං කථෙමි තං භණාමි තං දීපයාමි තං වොහරාමී’ති - තං බ්‍රෑමි උපසන්තො.

**කාමෙසු අනපෙක්ඛිනන්ති** - ‘කාමා’ති උද්දානතො ද්වෙ කාමා: වත්ථු-කාමා ච කිලෙසකාමා ච -පෙ- ඉමෙ වුච්චන්ති වත්ථුකාමා -පෙ- ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. වත්ථුකාමෙ පරිජානිත්වා කිලෙසකාමෙ පහාය පජහිත්වා විනොදිත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා; **කාමෙසු අනපෙක්ඛිනන්ති** වීතකාමො චත්තකාමො වන්තකාමො මුත්තකාමො පහීනකාමො පටිනිස්සට්ඨකාමො, කාමෙසු වීතරාගො විගතරාගො චත්තරාගො වන්ත-රාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතී’ති - ‘කාමෙසු අනපෙක්ඛිනං.’

**ගන්ථා[1] තස්ස න විජ්ජන්තීති** - ‘ගන්ථා’ති චත්තාරො ගන්ථා. අභිජ්ඣා-කායගන්ථො ව්‍යාපාදො කායගන්ථො[3] සීලබ්බතපරාමාසො කායගන්ථො ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො; අත්තනො දිට්ඨියා රාගො අභිජ්ඣා කායගන්ථො[3]; පරවාදෙසු ආඝාතො අප්පච්චයො ව්‍යාපාදො කායගන්ථො; අත්තනො සීලං වා වතං වා සීලබ්බතං වා පරාමසති සීලබ්බතපරාමාසො කායගන්ථො; අත්තනො දිට්ඨි ඉදං සච්චාභිනිවෙසො කායගන්ථො[3] **තස්සාති** අරහතො ඛීණාසවස්ස; ගන්ථා තස්ස නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා’ති - ‘ගන්ථා තස්ස න විජ්ජන්ති.’

**අතරි සො විසත්තිකන්ති** - ‘විසත්තිකා’ වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. **විසත්තිකාති** - කෙනට්ඨෙන විසත්තිකා විසතාති විසත්තිකා; විසාලාති විසත්තිකා, විසටාති[4] විසත්තිකා, විසමාති විසත්තිකා, විසක්කතී’ති විසත්තිකා, විසංහරතී’ති විසත්තිකා, විසංවාදිකා’ති විසත්තිකා, විසමූලා’ති විසත්තිකා, විසඵලා’ති විසත්තිකා, විසපරිභොගා’ති විසත්තිකා; විසාලා වා පන සා තණ්හා රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ කුලෙ ගණෙ ආවාසෙ -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු විසතා විත්ථතා’ති විසත්තිකා. “අතරී සො විසත්තික”න්ති සො ඉමං විසත්තිකං තණ්හං අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තයී’ති ‘අතරී සො විසත්තිකං’.

තෙනාහ භගවා:

“තං බ්‍රෑමි උපසන්තො’ති කාමෙසු අනපෙක්ඛිනං,
ගන්ථා තස්ස න විජ්ජන්ති අතරී සො විසත්තික”න්ති.

1. ගණ්ඨා - මජසං 2. අතාරි - PTS. 3. කායගණ්ඨො - මජසං.
4. විසට්ඨාති - PTS.

## 10 - 10

වත්ථුකාමකෙලෙශකාමයන්හි අපෙක්‍ෂා රහිත වූ ඒ රහත්හු 'උපශාන්ත ය'යි කියමි. ඔහුට (අභිධ්‍යාකායාදි) ග්‍රන්ථයෝ විද්‍යමාන නො වෙති. තෙතෙම තෘෂ්ණාව තරණය කෙළේ යි.

**තං බ්‍රෑමි උපසන්තො** - (යට දක්වූ) ඔහු සන්හිඳුණේ යැ වෙසෙසින් සන්හිඳුණේ යැ නිවුණේ යැ නැසූ කෙලෙස් ඇත්තේ යැයි පවසමි ඔහු කියමි බෙණෙමි - දක්වමි - ව්‍යවහාර කෙරෙමි නුයි 'තං බ්‍රෑමි උපසන්තො' යනු වේ.

**කාමෙසු අනපෙක්ඛිනං** - 'කාමා' යනු: උදෙස් විසින් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාමයෝ ද කෙලශකාමයෝ දැයි. වස්තුකාමයන් පරිඥාතනය කොට කෙලශකාමයන් හැර දුරු කොට බැහැර කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා. **කාමෙසු අනපෙක්ඛිනං** - පහවූ කාම ඇත්තේ හරන ලද - වමනය කළ - මුදන ලද - ප්‍රහීණ කළ - දුරලන ලද කාම ඇත්තේ; කාමයන්හි පහවූ රාග ඇත්තේ විගතරාග වූයේ ත්‍යක්තරාග- වාන්තරාග මුක්තරාග - ප්‍රහීණරාග - ප්‍රතිනිස්සෘෂ්ටරාග වූයේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳින සුලු වූයේ ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත ව වෙසේ නුයි 'කාමෙසු අනපෙක්ඛිනං' යනු වේ.

**ගන්ථා තස්ස න විජ්ජන්ති** - 'ගන්ථා' යනු: ග්‍රන්ථයෝ සතර දෙනෙකි: අභිධ්‍යාකායග්‍රන්ථ යැ, ව්‍යාපාදකායග්‍රන්ථ යැ, ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ යැ, ඉදංසත්‍යාභිනිවේශකායග්‍රන්ථ යැයි; තමා ගැන්මා ලද දෘෂ්ටියෙහි රාගය අභිධ්‍යාකායග්‍රන්ථ යැ, පරවාදයන්හි කොපය හා නො සතුට ව්‍යාපාදකාය- ග්‍රන්ථ යැ, තමාගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය දැඩිව ගැනීම ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ යැ, තමා (නුනුවණින්) ගත් දෘෂ්ටිය ඉදංසත්‍යාභි- නිවේශකායග්‍රන්ථ යයි. **තස්ස** - අතීත් ක්‍ෂීණාස්‍රව හට; **ගන්ථා තස්ස න විජ්ජන්ති** - ග්‍රන්ථයෝ ඔහුට නැත, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙති, ප්‍රහීණයහ සමුච්ඡින්නයහ සන්හිඳුණාහ, දුරලන ලද්දාහු අනවොත්පත්තිකයහ ඥානාග්නියෙන් දග්ධ වූවාහු නුයි - 'ගන්ථා තස්ස න විජ්ජන්ති' යනු වේ.

**අතරී සො විසත්තිකං** - 'විසත්තිකා' යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභඅකුශලමූලයෙක් වේ ද, එය යි. **විසත්තිකා** - කිනම් අර්‍ථයෙකින් 'විසත්තිකා' වූ ද යත්? පතළ වූවා නුයි විසත්තිකා යැ, විශාලවූවා නුයි විසත්තිකා යැ, විසෘත නුයි විසත්තිකා යැ, විෂමවූවා නුයි විසත්තිකා යැ, ඉවසා නුයි විසත්තිකා යැ, (සිත) වෙසෙසින් හකුළුවා නුයි විසත්තිකා යැ, විසංවාදන කරන්නී නුයි විසත්තිකා යැ, විෂ (=දුඃඛහෙතු කම්) යට මුල වූවා නුයි විසත්තිකා යැ, විෂඵල ඇත් නුයි විසත්තිකා යැ, විෂපරිභොග ඇත් නුයි විසත්තිකා යැ; තවද විශාල වූ ඒ තෘෂ්ණාව රූපයෙහි ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය යෙහි කුලයෙහි ගණයෙහි ආවාසයෙහි...දෘෂ්ටශ්‍රුතමුතවිඥාතව්‍ය ධර්මයන්හි පතළා විසෘත වූවා නුයි විසත්තිකා නමු. **අතරී සො විසත්තිකං**- තෙතෙම මේ විසත්තිකා නම් තෘෂ්ණාව තරණය කෙළේ ය, උත්තරණය ප්‍රතරණය සමතික්‍රමණය කෙළේ ය, ඉක්මූ වූයේ නුයි 'අතරී සො විසත්තිකං' යනු වේ

එයින් වදාළහ බුදුහු:

"තං බ්‍රෑමි උපසන්තොති -පෙ- අතරී සො විසත්තිකං"යි.

## 10 - 11

න තස්ස පුත්තා පසවො[1] ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති,
අත්තා වාපි නිරත්තා[2] වා න තස්මිං උපලබ්භති.

**න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජතීති** - 'නා'ති පටික්ඛෙපො; **තස්සාති** අරහතො ඛීණාසවස්ස; **පුත්තාති** චත්තාරො පුත්තා: අත්‍රජො පුත්තො, ඛෙත්තජො පුත්තො, දින්නකො පුත්තො, අන්තෙවාසිකො පුත්තො; **පසවොති** අජෙළකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවළවා; **ඛෙත්තන්ති** සාලික්ඛෙත්තං වීහික්ඛෙත්තං මුග්ගඛෙත්තං මාසඛෙත්තං යවඛෙත්තං ගොධුමඛෙත්තං තිලඛෙත්තං; **වත්ථුන්ති** ඝරවත්ථු[3] කොට්ඨකවත්ථු පුරෙවත්ථු පච්ඡාවත්ථු ආරාමවත්ථු විහාරවත්ථු. **න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජතීති** තස්ස පුත්තපරිග්ගහො වා පසුපරිග්ගහො වා ඛෙත්තපරිග්ගහො වා වත්ථුපරිග්ගහො වා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති[4] නුපලබ්භන්ති[5] පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා'ති - 'න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති.'

**අත්තා වාපි නිරත්තා වා න තස්මිං උපලබ්භතීති** - 'අත්තා'ති සස්සතදිට්ඨි නත්ථි. **නිරත්තාති** උච්ඡෙදදිට්ඨි නත්ථි. 'අත්තා'ති ගහිතං නත්ථි; 'නිරත්තා'ති මුඤ්චිතබ්බං නත්ථි; යස්ස නත්ථි ගහිතං, තස්ස නත්ථි මුඤ්චිතබ්බං. යස්ස නත්ථි මුඤ්චිතබ්බං, තස්ස නත්ථි ගහිතං. ගාහමුඤ්චනසමතික්කන්තො අරහා වුද්ධිපරිහානිවීතිවත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවො'ති - අත්තා වා පි නිරත්තා වා න තස්මිං උපලබ්භති.

තෙනාහ භගවා:

"න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති,
අත්තා වා පි නිරත්තා වා න තස්මිං උපලබ්භතී"ති.

## 10 - 12

යෙන නං වජ්ජුං[6] පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා,
තං තස්ස අපුරෙක්ඛතං තස්මා වාදෙසු නෙජති.

1. පසවො ච - මජුර. 2. අත්තං වාපි නිරත්තං - PTS.
3. ඝරවත්ථු - සීමු. II. [illegible] 4. සංවිජ්ජන්ති - [illegible]
5. නුපලබ්භන්ති PTS 6. වජ්ජු - [illegible]

## 10 - 11

ඒ ක්ෂීණාශ්‍රව හට පුත්‍රයෝ ද (ගෙරිසරක් ආදි) පසුවර්ගයෝ ද නැත්තාහු ය, කෙත් වත් ද නැත. තවද ඔහු කෙරෙහි ශාශ්වතදෘෂ්ටිය හෝ උච්ඡේදදෘෂ්ටිය හෝ නො ලැබේ.

**න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති** – 'න' යනු: ප්‍රතික්ෂේප යැ; **තස්ස** – අහීත් ක්ෂීණාශ්‍රව හට; **පුත්තා** – පුත්‍රයෝ සතර-දෙනෙකි: අත්‍රජපුත්‍ර යැ, ක්ෂේත්‍රජපුත්‍ර යැ, දින්නකපුත්‍ර යැ, අන්තේවාසික පුත්‍ර යැයි. **පසවො** – එළුබැටළු යැ, කුකුළුහූරු යැ, ඇත්අස්ගවවෙළඹහු යි. **ඛෙත්තා** – හැල්කෙත යැ, වීකෙත යැ, මුංකෙත යැ, මෑකෙත යැ, යවකෙත යැ, තිරිඟුකෙත යැ, තලකෙත යි. **වත්ථුං** – ගෙවතු යැ, කොටුවතු යැ, පෙරටිවතු යැ, පසුවතු යැ, අරම්වතු යැ, වෙහෙරවතු යි. **න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති** – ඔහුට පුත්‍රපරිග්‍රහයෙක් (=පුත්‍රයන් ගේ අයැතියෙක්) හෝ... නැත, නො වෙයි විද්‍යමාන නො වෙයි නො ලැබේ; (ඔහු විසින් පරිග්‍රහයෝ) ප්‍රහීණ කරන ලද්දාහු සිඳින ලද්දාහු සන්සිඳුණාහු දුරලන ලද්දාහු උපනට නො සුදුසු වූවාහු ඥානගින්නෙන් දවන ලද්දාහු නුයි. 'න තස්ස පුත්තා පසවො ඛෙත්තං වත්ථුඤ්ච විජ්ජති' යනු වේ.

**අත්තා වා පි නිරත්තා වා න තස්මිං උපලබ්භති** – **අත්තා**– ශාශ්වත-දෘෂ්ටිය නැත; **නිරත්තා** – උච්ඡේදදෘෂ්ටිය නැත; 'ආත්ම'යැ'යි ගතයුත්තෙක් නැත, 'නිරාත්ම යැ'යි හළයුත්තෙක් නැත; යම් පුද්ගලයකුට (තෘෂ්ණාදි වශයෙන්) ගතයුත්තෙක් නැත් නම්, ඔහුට හළ යුත්තෙක් නැත, යමක් හට හළයුත්තෙක් නැත් නම්, ඔහුට ගතයුත්තෙක් නැත; ගැනීමත් හැරීමත් ඉක්මැ වූ රහත් තෙම වැඩීමත් පිරිහීමත් ඉක්මැවූයේ යැ. හෙතෙම වුසූ බඹසරවස් ඇත්තේ යැ, පුරුදු කළ චරණධම් ඇත්තේ යැ...ඔහුට ජාතිමරණසංසාරය පුනර්භවය නැත් නුයි 'අත්තා වා'පි නිරත්තා වා න තස්මිං උපලබ්භති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න තස්ස පුත්තා පසවො -පෙ- න තස්මිං උපලබ්භති"යි.

## 10 - 12

යම් (රාගාදි) දෙසකින් (දිව්‍යමනුෂ්‍යාදි) පෘථග්ජනයෝ ද, (ශාසන යෙන් පිටත්හි) මහණබමුණෝ ද, (ඒ රහත්හු රාගරක්ත යැ යනාදින්) කියන්නාහු නම්, ඒ දෙෂය ඔහු විසින් නො පෙරටු කරන ලද්දේය. එහෙයින් (හෙතෙම) නින්දාවචනයන්හි කම්පා නො වේ.

**යෙන නං වජ්ජුං[1] පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණාති** – 'පුථුජ්ජනා'ති පුථු කිලෙසෙ ජනෙන්තීති පුථුජ්ජනා, පුථු අවිහතසක්කායදිට්ඨිකාති පුථුජ්ජනා, පුථු සත්ථාරානං මුඛුල්ලොකිකාති පුථුජ්ජනා, පුථු සබ්බගතීහි අවුට්ඨිතාති පුථුජ්ජනා, පුථු නානාභිසඞ්ඛාරෙ අභිසඞ්ඛරොන්තීති පුථුජ්ජනා, පුථු නානාඔඝෙහි වුය්හන්තීති පුථුජ්ජනා, පුථු නානාසන්තාපෙහි සන්තප්පන්තීති පුථුජ්ජනා, පුථු නානාපරිළාහෙහි පරිඩය්හන්තීති පුථුජ්ජනා, පුථු පඤ්චසු කාමගුණෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධාති පුථුජ්ජනා; පුථු පඤ්චහි නීවරණෙහි ආවුතා නිවුතා ඔවුතා පිහිතා පටිච්ඡන්නා පටිකුජ්ජිතාති පුථුජ්ජනා. **සමණාති** – යෙ කෙචි ඉතො බහිද්ධා පරිබ්බාජූපගතා පරිබ්බාජසමාපන්නා. **බ්‍රාහ්මණාති** – යෙ කෙචි භොවාදිකා. **යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණාති** – පුථුජ්ජනා යෙන රාගෙන වදෙය්‍යුං, යෙන දොසෙන වදෙය්‍යුං, යෙන මොහෙන වදෙය්‍යුං, යෙන මානෙන වදෙය්‍යුං, යාය දිට්ඨියා වදෙය්‍යුං, යෙන උද්ධච්චෙන වදෙය්‍යුං, යාය විචිකිච්ඡාය වදෙය්‍යුං, යෙහි අනුසයෙහි වදෙය්‍යුං, රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨඞ්ගතොති වා ථාමගතොති වා; තෙ අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා යෙන නං වදෙය්‍යුං නෙරයිකොති වා තිරච්ඡානයොනිකොති වා පෙත්තිවිසයිකොති වා මනුස්සොති වා දෙවොති වා රූපීති වා අරූපීති වා සඤ්ඤීති වා අසඤ්ඤීති වා නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා; සො හෙතු නත්ථි පච්චයො නත්ථි කාරණං නත්ථි යෙන නං වදෙය්‍යුං කථෙය්‍යුං භණෙය්‍යුං දීපයෙය්‍යුං වොහරෙය්‍යුන්ති – 'යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා.

**තං තස්ස අපුරෙක්ඛතන්ති** – 'තස්සා'ති අරහතො ඛීණාසවස්ස. **පුරෙක්ඛාරාති** – ද්වෙ පුරෙක්ඛාරා: තණ්හාපුරෙක්ඛාරො ච දිට්ඨිපුරෙක්ඛාරො ච –පෙ– අයං තණ්හාපුරෙක්ඛාරො –පෙ– අයං දිට්ඨිපුරෙක්ඛාරො –පෙ– තස්ස තණ්හාපුරෙක්ඛාරො පහීනො, දිට්ඨිපුරෙක්ඛාරො පටිනිස්සට්ඨො. තණ්හාපුරෙක්ඛාරස්ස පහීනත්තා දිට්ඨිපුරෙක්ඛාරස්ස පටිනිස්සට්ඨත්තා න තණ්හං වා දිට්ඨිං වා පුරතො කත්වා චරති න තණ්හාධජො න තණ්හාකෙතු න තණ්හාධිපතෙය්‍යො න දිට්ඨිධජො න දිට්ඨිකෙතු න දිට්ඨාධිපතෙය්‍යො. න තණ්හාය වා දිට්ඨියා වා පරිවාරිතො චරතීති – 'තං තස්ස අපුරෙක්ඛතං'

**තස්මා වාදෙසු නෙජතීති** – 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා[2] තංනිදානා[3] වාදෙසු උපවාදෙසු නින්දාය ගරහාය අකිත්තියා අවණ්ණහාරිකාය නෙජති න ඉඤ්ජති න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධතීති – 'තස්මා වාදෙසු නෙජති.'

1. වජ්ජු - සී. යෙන වජ්ජුං - PTS
2. තං පච්චයා - සකච
3. තංනිදානා - සීමු. II.

**යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා** – ‘පුථුජ්ජනා’ යනු: බොහෝ කෙලෙසුන් උපදවත් නුයි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නො නැසූ සත්කායදෘෂ්ටි ඇත්තාහු නුයි පුහුදුනුවෝ යැ, බොහෝ ශාස්තෘන්ගේ මුහුණු බලන්නාහු නුයි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නිරයාදී සියලු ගතිවලින් නො නැඟිසිටියාහු නුයි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නානා කර්මාභිසංස්කාරයන් රැස් කෙරෙත් නුයි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නානා ඕඝයන් ගෙන් වහනය කරනු ලැබෙත් නුයි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නානා සන්තාපයන් ගෙන් තැවෙත් නුයි පුහුදුනුවෝ යැ, බොහෝ වූ නානා පරිදාහයන් ගෙන් දැවෙත් නුයි පුහුදුනුවෝ යැ, බොහෝ වූ පඤ්චකාමගුණයන්හි ඇලුණාහු ගිජුවූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු ඇතුළත් වූවාහු ලග්න වූවාහු ලග්නිත වූවාහු පරිරුද්ධ වූවාහු නුයි-පුහුදුනුවෝ යැ, බොහෝ වූ පඤ්චනීවරණයන්ගෙන් ආවෘත – නිවෘත– අපවෘත – පිහිත – ප්‍රතිච්ඡන්න – අවොමුඛ වූවාහු නුයි – පුහුදුනුවෝ යි. **සමණා** – මේ ශාසනයෙන් බැහැර යම් කිසි පැවිද්දකට පැමිණියාහු පැවිදි වූවාහු යැ. **බ්‍රාහ්මණා** – යම් කිසි භොවාදි බමුණෝ යැ. **යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණාති** – පෘථග්ජනයෝ යම් රාගයකින් (නුගුණ) කියන්නාහු නම්, යම් ද්වේෂයකින් – මෝහයකින් – මානයකින්– දෘෂ්ටියකින් ඖද්ධත්‍යයකින් – විචිකිත්සාවකින් – යම් අනුශයධර්මයන්ගෙන් රාගරක්ත යැ හෝ දුෂ්ට යැ – මූඪ යැ – විනිබද්ධ යැ – පරාමෘෂ්ට යැ– වික්ෂේපයට ගියේ යැ – අනිෂ්ඨාවට ගියේ යැ හෝ තදබවට ගියේ යැයි හෝ කියන්නාහු නම්, ඒ අභිසංස්කාරයෝ ප්‍රහීණ කරන ලද්දාහුය, අභිසංස්කාරයන් ප්‍රහීණ කළ හෙයින් යම් හෙතුවකින් ඔහු නෙරියත් වන්නේ යැයි හෝ තිරිසන් යොනි ඇත්තෙකැයි හෝ ප්‍රෙතගති ඇත්තෙකැයි හෝ මිනිසෙකැයි හෝ දෙවියෙකැයි හෝ රූපී යැ හෝ අරූපී යැ හෝ සංඥී යැ හෝ අසංඥී යැ හෝ නෛවසංඥී නාසංඥී යැයි හෝ එක්තරා ගතියකින් කියන්නාහු නම්, යම් හෙයකින් කියන්නාහු නම්, බණන්නාහු නම්, දක්වන්නාහු නම්, වනරන්නාහු නම්, ඒ හෙතුව නැත, ප්‍රත්‍යය නැත, කාරණය නැත් නුයි ‘යෙන නං වජ්ජුං පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා’ යනු වේ.

**තං තස්ස අපුරෙක්ඛතං** – ‘තස්ස’ යනු ඒ අර්හත් ක්ෂීණාස්‍රවයා විසින්. **පුරෙක්ඛාරා** – තෘෂ්ණාපුරස්කාරය දෘෂ්ටිපුරස්කාරය දැයි පෙරටු කිරීම් දෙකෙකි... ඔහු විසින් තෘෂ්ණාපුරස්කාරය නසන ලද්දේය, දෘෂ්ටිපුරස්කාරය දුරලන ලද්දේය. තෘෂ්ණාපුරස්කාරය නැසූ හෙයින් දෘෂ්ටිපුරස්කාරය දුරලූ හෙයින් තෘෂ්ණාව හෝ දෘෂ්ටිය හෝ පෙරටු කොට නො හැසිරෙයි, තෘෂ්ණාධ්වජ ඇතියේ – තෘෂ්ණා කෙහෙලි ඇතියේ – තෘෂ්ණාධිපති බව ඇත්තේ– දෘෂ්ටිධ්වජ ඇතියේ – දෘෂ්ටිකෙතු ඇතියේ – දෘෂ්ට්‍යධිපතිභාවය ඇත්තේ නො හැසිරෙයි, තෘෂ්ණාව විසින් හෝ දෘෂ්ටිය විසින් හෝ පිරිවරන ලදුයේ නො හැසිරේ නුයි ‘තං තස්ස අපුරෙක්ඛතං’ යනු වේ.

**තස්මා වාදෙසු නෙජති** – ‘තස්මා’ යනු: එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන්; **වාදෙසු** – උපවාදයන්හි නින්දායෙන් ගර්හායෙන් අකීර්තියෙන් නො කැපෙයි නො කම්පා වෙයි නො සැලෙයි නො වෙවුලයි භූතා නො වෙවුලයි. පුනපුනා නො වෙවුලා නුයි ‘තස්මා වාදෙසු නෙජති’ යනු වේ.

තෙනාහ භගවා:

"යෙන නං වජ්ජුං[1] පුථුජ්ජනා අථො සමණබ්‍රාහ්මණා,
තං තස්ස අපුරෙක්ඛතා තස්මා වාදෙසු නෙජතී"ති.

10 - 18

වීතගෙධො අමච්ඡරී න උස්සෙසු[2] වදතෙ මුනි,
න සමෙසු න ඔමෙසු කප්පං නෙති අකප්පියො.

**වීතගෙධො අමච්ඡරීති** - 'ගෙධො' වුච්චති තණ්හා. යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. යස්සෙසො ගෙධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො; සො වුච්චති වීතගෙධො. සො රූපෙ අගිද්ධො -පෙ- දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු අගිද්ධො අගථිතො අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො පහීනගෙධො පටිනිස්සට්ඨගෙධො නිච්ඡාතො -පෙ- බ්‍රහ්මභූතෙන අත්තනා විහරතී'ති වීතගෙධො. අමච්ඡරීති - මච්ඡරියන්ති පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං, කුලමච්ඡරියං, ලාභමච්ඡරියං, වණ්ණමච්ඡරියං, ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡරියා -පෙ- ගාහො වුච්චති මච්ඡරියං. යස්සෙතං මච්ඡරියං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති අමච්ඡරී'ති - 'වීතගෙධො අමච්ඡරී'.

**න උස්සෙසු[2] වදතෙ මුනි න සමෙසු න ඔමෙසූති** - 'මුනී'ති මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; සෙය්‍යොහමස්මී'ති වා සදිසොහමස්මී'ති වා හීනොහමස්මී'ති වා න වදති න කථෙති න භණති න දීපයති න වොහරතී'ති - න උස්සෙසු වදතෙ මුනි න සමෙසු න ඔමෙසු.

**කප්පං නෙති අකප්පියොති** - 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො; තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා නෙති න උපෙති න උපගච්ඡති න ගණ්හාති න පරාමසති, නාභිනිවිසතී'ති - 'කප්පං නෙති.' **අකප්පියොති** 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පං ච. -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තස්ස තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා න කප්පෙති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතී'ති - 'කප්පං නෙති අකප්පියො.'

1. යෙන වජ්ජුං - PTS. 2. ඌසෙසු - PTS.

එයින් වදාළහ බුදුහු:

**“යෙන නං වජ්ජුං -පෙ- තස්මා වාදෙසු නෙජති”** යි.

**10 - 18**

පහවූ තෘෂ්ණා ඇති නො මසුරු වූ ක්ෂීණාස්‍රව මුනි තෙමේ විශිෂ්ටයන් කෙරෙහි (තමා ඇතුළත් කොට අභිමාන වශයෙන්) නො කියයි, සමානයන් කෙරෙහි ලා නො කියයි, හීනයන් කෙරෙහි ලා නො කියයි. තෘෂ්ණාදෘෂ්ටිකල්ප රහිත වූයේ කල්පනයට නො පැමිණේ.

**වීතගෙධො අමච්ඡරී** - ‘ගෙධ’ යයි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල ගෙධය නසන ලද ද සිඳින ලද ද සන්සිඳුවන ලද ද දුරලන ලද ද උපනට නුසුදුසු කරන ලද ද නුවණ-ගින්නෙන් දවන ලද ද හෙතෙම ‘වීතගෙධ’ යයි කියනු ලැබේ. හෙතෙම රූපයෙහි අගිද්ධ යැ...දෘෂ්ටශ්‍රුතමුතවිඥෙතව්‍ය ධර්මයන්හි නො ගිජු යැ, නො ගෙතුණේ යැ, නො මුසපත් වූයේ යැ, නො බැසගත්තේ යැ, වීතගෙධ යැ විගත - ව්‍යක්ත - මුක්ත - ප්‍රහීණ - ප්‍රතිනිසෘෂ්ටගෙධ යැ, තෘෂ්ණා රහිත වූයේ...ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත ව වෙසේ නුසි ‘වීතගෙධො’ යනු වේ. **අමච්ඡරී** - ‘මච්ඡරිය’ නම්: ආවාස - කුල - ලාභ - වර්ණ - ධර්මමාත්සර්ය යැයි මාත්සර්ය පසෙකි. මෙබඳු වූ යම් මසුරු බවෙක්...ග්‍රාහයෙක් වේ නම්, එම මච්ඡරිය යි කියනු ලැබෙයි. යමක්හු විසින් තෙල මාත්සර්යය නසන ලද ද සිඳින ලද ද සන්සිඳුවන ලද ද දුරලන ලද ද උපනට නුසුදුසු කරන ලද ද නුවණගින්නෙන් නසන ලද ද හෙතෙම, ‘අමච්ඡරී’ යයි කියනු ලැබේ නුසි ‘වීතගෙධො අමච්ඡරී’ යනු වේ.

**න උස්සෙසු වදතෙ මුනි න සමෙසු න ඔමෙසු** - ‘මුනි’ යනු ‘මොන’යි නුවණ කියනු ලැබෙයි...‘මම ශ්‍රෙෂ්ඨයෙමි’ හෝ ‘මම සදෘශයෙමි’ හෝ ‘මම හීනයෙමි’ හෝ නො පවසයි නො කියයි නො බෙණෙයි නො දක්වයි, නො වහරා නුසි ‘න උස්සෙසු වදතෙ මුනි න සමෙසු න ඔමෙසු’ යනු වේ.

**කප්පං නෙති අකප්පියො** - ‘කප්ප නම්: තෘෂ්ණාකල්ප යැ දෘෂ්ටිකල්ප යැයි කල්පනයෝ දෙදෙනෙකි. ඔහු විසින් තෘෂ්ණාකල්පය ප්‍රහීණ යැ, දෘෂ්ටිකල්පය ප්‍රතිනිසෘෂ්ට යැ, තෘෂ්ණාකල්පය ප්‍රහීණ බැවින් දෘෂ්ටිකල්පය ප්‍රතිනිසෘෂ්ට බැවින් තෘෂ්ණාකල්පයට හෝ දෘෂ්ටිකල්පයට හෝ නො පැමිණෙයි නො එළඹෙයි නො ගනී නො පරාමර්ශ කෙරෙයි නො පිවිසේ නුසි ‘කප්පං නෙති’ යනු වේ. **අකප්පියො** - ‘කප්පා’ යනු කල්පයෝ දෙදෙනෙකි: තෘෂ්ණාකල්පය දෘෂ්ටිකල්පය දැයි...තෘෂ්ණාකල්පය ප්‍රහීණ හෙයින් දෘෂ්ටිකල්පය ප්‍රතිනිසෘෂ්ට හෙයින් තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටිකල්පය හෝ කල්පනය නො කෙරෙයි, නුපදවයි, වෙසෙසින් නුපදවයි, නො නිපදවයි, වෙසෙසින් නො නිපදවා නුසි ‘කප්පං නෙති අකප්පියො’ යනු වේ.

තෙනාහ භගවා:

"වීතගෙධො අමච්ඡරී න උස්සෙසු වදතෙ මුනි,
න සමෙසු න ඔමෙසු කප්පං නෙති අකප්පියො"ති.

## 10 - 14

යස්ස ලොකෙ සකං නත්ථි අසතා ච න සොචති,
ධම්මෙසු ච න ගච්ඡති ස වෙ සන්තො'ති වුච්චති.

**යස්ස ලොකෙ සකං නත්ථීති** - 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස; සකං නත්ථීති යස්ස 'මය්හං වා ඉදං, පරෙසං වා ඉද'න්ති කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සන්ති -පෙ- ඤාණග්ගිනා දඩ්ඪන්ති - 'යස්ස ලොකෙ සකං නත්ථි.'

**අසතා ච න සොචතීති** - 'විපරිණතං වා වත්ථුං න සොචති; විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති; චක්ඛුං මෙ විපරිණතන්ති න සොචති. සොතං මෙ - ඝානං මෙ - ජිව්හා මෙ - කායො මෙ - මනො මෙ - රූපා මෙ - සද්දා මෙ - ගන්ධා මෙ - රසා මෙ - ඵොට්ඨබ්බා මෙ - කුලං මෙ - ගණො මෙ - ආවාසො මෙ - ලාභො මෙ - යසො මෙ - පසංසා මෙ - සුඛං මෙ - චීවරං මෙ - පිණ්ඩපාතො මෙ - සෙනාසනං මෙ - ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ මෙ - මාතා මෙ - පිතා මෙ - භාතා මෙ - භගිනී මෙ - පුත්තො මෙ - ධීතා මෙ - මිත්තා මෙ - අමච්චා මෙ - ඤාතකා මෙ - සාලොහිතා මෙ විපරිණතා'ති න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජතී'ති - එවම්පි අසතා ච න සොචති. අථවා, අසාතාය[1] දුක්ඛාය වෙදනාය ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති. චක්ඛුරොගෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජති. සොතරොගෙන ඝානරොගෙන ජිව්හාරොගෙන කායරොගෙන සීසරොගෙන කණ්ණරොගෙන මුඛරොගෙන දන්තරොගෙන කාසෙන සාසෙන පිනාසෙන ඩහෙන ජරෙන කුච්ඡිරොගෙන මුච්ඡාය පක්ඛන්දිකාය සූලාය විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන අපමාරෙන දද්දුයා කණ්ඩුයා කච්ඡුයා නඛසාය[2] විතච්ඡිකාය ලොහිතෙන පිත්තෙන මධුමෙහෙන අංසාය පිළකාය භගන්දලාය පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන[3] උතුපරිණාමජෙන ආබාධෙන[3] විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජතී'ති - එවම්පි 'අසතා ච න සොචති.

1. අසාතාය - සීමු II PTS අසන්තාය - මජුප, මජසං.
2. රඛසාය - සීමු. I. 3. ආබාධෙහි - PTS.

එයින් වදාළහ බුදුහු:

**“වීතගෙධො අමච්ඡරී -පෙ- කප්පං නෙති අකප්පියො”ති**

## 10 - 14

ලොවැ යම් ක්ෂීණාශ්‍රවයක්හට මාගේ යැයි ගන්නා ලද දෙයෙක් නැත් ද, යළි අවිද්‍යමාන බැවින් ශොක නො කෙරේ ද, සියලු ධර්මයන්හි ඡන්දාදිවශයෙන් අගතියට නො යේ ද, ඒ රහත් තෙම ඒකාන්තයෙන් ‘ශාන්තයෙකැ’යි කියනු ලැබේ.

**යස්ස ලොකෙ සකං නත්ථි** - ‘යස්ස’ යනු: අර්හත් ක්ෂීණාශ්‍රවයක්හට **සකං නත්ථි** - යමක්හට ‘මේ මාගේ හෝ යැ, මම මෙරමාගේ හෝ යැ’යි ගන්නා ලද පරාමර්ශිතය කළ අභිනිවෙශ කළ ඇතුළත් වැ සිටි බැසගන්නා ලද කිසි රූපගතයෙක් වෙදනා - සඤ්ඤා - සඞ්ඛාර - විඤ්ඤාණගතයෙක් නැත් ද අවිද්‍යමාන ද ..ඤාණගින්නෙන් දවන ලද නුයි ‘යස්ස ලොකෙ සකං නත්ථි’ යනු වේ.

**අසතා ච න සොචති** - ‘විපරිණත (-වෙනස් වූ) වස්තුවට හෝ ශොක නො කෙරෙයි, වස්තුව වෙනස් වූ කල්හි හෝ ශොක නො කෙරෙයි, මාගේ ඇස වෙනස් වී යැයි ශොක නො කෙරෙයි, මාගේ කන - නැහැය - දිව - කය - මනස - රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයෝ - කුලය - ගණයා - ආවාසය - - ලාභය - යශස - ප්‍රශංසාව - සුඛය - චීවර - පිණ්ඩපාත - සේනාසන - ගිලානපච්චයභෛෂජ්‍යපරිෂ්කාර - මවු - පියා - බෑයා - බූනැණියා - පුත්‍රයා - දුහිතෘව - මිත්‍රයෝ - සහායයෝ - නෑයෝ - මාගේ සහලේනෑයෝ වෙනස් වූහ’යි ශොක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මොහයට නො පැමිණේ නුයි මෙසේ ත්‘ - අසතා ච න සොචති’ යනු වේ. නොහොත් අසාත (-අමිහිරි) වූ දුඃඛවෙදනාවෙන් ස්පර්ශ කරන ලදුයේ මඩනා ලදුයේ පිරිසියේ සමන්විත වූයේ ශොක නො කෙරෙයි...සම්මොහයට නො පැමිණෙයි, චක්ෂුරොගයෙන් ස්පර්ශ කරන ලදුයේ පීඩිත වූයේ සමවහිත වූයේ සමන්විත වූයේ ශොක නො කෙරෙයි...සම්මොහයට නො පැමිණෙයි, ශ්‍රොත්‍රරොගයෙන් - ඝ්‍රාණරොගයෙන් - ජිහ්වාරොගයෙන් - කායරොගයෙන් - ශීර්ෂරොගයෙන් කර්ණරොගයෙන් මුඛරොගයෙන් - දන්තරොගයෙන් - කාසයෙන් - ශ්වාසයෙන් - පිනසයෙන් - දහයෙන් - ජ්වරයෙන් - කුක්ෂිරොගයෙන් - මූර්ඡායෙන් - අතිසාරයෙන් - ආමශූලයෙන් - විරෙචනයෙන් - කුෂ්ඨයෙන් - ගණ්ඩයෙන් - කිලාසයෙන් - ශොෂයෙන් - අපස්මාරයෙන් - දද්‍රුයෙන් - කණ්ඩූතියෙන් - මහාකුෂ්ඨයෙන් - නියපහරින් - අතුල්පතුල් පැළීමෙන් - රත්පිතින් - මධුමෙහයෙන් - අර්ශසින් - පොළයෙන් - භගන්දරයෙන් - පිත්තරොගයෙන් - ශ්ලෙෂ්මරොගයෙන් - වාතරොගයෙන් - සාන්නිපාතිකරොගයෙන් - ඍතුවිපර්‍යාසයෙන් උපන් රොගයෙන් විෂමපරිහරණයෙන් උපන් රොගයෙන් - උපක්‍රමයෙන් උපන් රොගයෙන් - කර්මවිපාකජ ආබාධයෙන් - සීතයෙන් - උෂ්ණයෙන් - සයින් - පවසින් - මැසිමදුරු වා අව් දිග්දෑ පහසින් ස්පර්ශ කරන ලදුයේ පීඩිත වූයේ පිරිසියේ සමන්විත වූයේ ශොක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මොහයට නො පැමිණේ නුයි මෙසේත් - ‘අසතා ච න සොචති’ යනු වේ.

අථවා, අසන්තෙ අසංවිජ්ජමානෙ අනුපලබ්භමානෙ[1] අහු වත මෙ[2], තං වත මෙ නත්ථි, සියා වත මෙ, තං වතාහං න ලභාමී'ති[3] න සොචති න කිලමති න පරිදෙවති න උරත්තාළිං කන්දති න සම්මොහං ආපජ්ජතී'ති - 'එවම්පි අසතා ච න සොචති.'

**ධම්මෙසු ච න ගච්ඡතීති** - න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති; න රාගවසෙන ගච්ඡති; න දොසවසෙන ගච්ඡති; න මොහවසෙන ගච්ඡති; න මානවසෙන ගච්ඡති; න දිට්ඨිවසෙන ගච්ඡති; න උද්ධච්චවසෙන ගච්ඡති; න විචිකිච්ඡාවසෙන ගච්ඡති; න අනුසයවසෙන ගච්ඡති; න ච වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති සංහරීයතී'ති - 'ධම්මෙසු ච න ගච්ඡති.

**ස වෙ සන්තොති වුච්චතීති** - 'සො සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධො'ති වුච්චති පවුච්චති කථීයති භණීයති දීපීයති වොහරීයතී'ති - 'ස වෙ සන්තො'ති වුච්චති.

තෙනාහ භගවා:

"යස්ස ලොකෙ සකං නත්ථි අසතා ච න සොචති,
ධම්මෙසු ච න ගච්ඡති ස වෙ සන්තො'ති වුච්චතී"ති.

**පුරාභෙදසුත්තනිද්දෙසො දසමො.**

# 11

# කලහවිවාදසුත්තනිද්දෙසො

අථ කලහවිවාදසුත්තනිද්දෙසො වුච්චති:

**11 - 1**

කුතො පහූතා කලහා විවාදා
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුණා ච
කුතො පහූතා[4] තෙ තදිඞ්ඝ බ්‍රූහි.

**කුතො පහූතා[4] කලහා විවාදා'ති** - 'කලහො'ති එකෙන ආකාරෙන කලහො; විවාදොතිපි තඤ්ඤෙව; යො කලහො, සො විවාදො. යො විවාදො, සො කලහො. අථවා, අපරෙන ආකාරෙන විවාදො වුච්චති: කලහස්ස පුබ්බභාගො විවාදො; රාජානොපි රාජූහි විවදන්ති. ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති. බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති. ගහපතීපි[5] ගහපතීහි විවදන්ති. මාතාපි පුත්තෙන විවදති. පුත්තොපි මාතරා විවදති. පිතාපි පුත්තෙන විවදති. පුත්තොපි පිතරා විවදති. භාතාපි භාතරා විවදති. භාතාපි භගිනියා විවදති. භගිනීපි භාතරා විවදති. සහායොපි සහායෙන විවදති. අයං විවාදො.

1. අනුපලබ්භියමානෙ - PTS. 2. අහො වත මෙ තං - සීමු. II, PTS.
3. න ච ලභාමිති - සීමු. II. 4. බහූතා - මජසං.
5. ගහපතිකාපි - PTS.

නොහොත් නැත්තාවූ අවිද්‍යමාන වූ නොලැබෙන්නාවූ වස්තුවෙකි මට ඒදෙය ඒකාන්තයෙන් වූයේ ය, ඒ පෙර උපන් දෙය දූත් මට නැත, යමක් මට වන්නේ නම්, මම එය ඒකාන්තයෙන් නො ලබමි' ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙයි අත් ගසා නො හඬයි, බලවත් මෝහයට නො පැමිණේ නුයි මෙසේ ත් 'අසතා ච න සොචති' යනු වේ.

**ධම්මෙසු ච න ගච්ඡති** - ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වේෂයෙන් අගතියට නො යෙයි, මෝහයෙන් අගතියට නො යෙයි, භයින් අගතියට නො යෙයි, රාගවශයෙන් නො යෙයි, ද්වේෂවශයෙන් - මෝහවශයෙන්- මානවශයෙන් - දෘෂ්ටිවශයෙන් - ඖද්ධත්‍යවශයෙන් - විචිකිත්සා වශයෙන්- අනුශය වශයෙන් නො යෙයි, ව්‍යග්‍ර වූ ධර්මයන් විසින් නො ද යවනු ලැබෙයි, පමුණුවනු ලැබෙයි, වහනය කරනු ලැබෙයි, හරිනු ලැබේ නුයි 'ධම්මෙසු ච න ගච්ඡති' යනු වේ.

**ස වෙ සන්තොති වුච්චති** - හෙතෙම ශාන්ත යැ උපශාන්ත යැ ව්‍යුපශාන්ත යැ නිවුණේ යැ පහවූ කෙලශදරථ ඇත්තේ යැ'යි වුච්චති පවසනු ලැබෙයි කියනු ලැබෙයි බණනු ලැබෙයි, දක්වනු ලැබෙයි ව්‍යවහාර කරනු ලැබේ නුයි 'ස වෙ සන්තො'ති වුච්චයි' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**"යස්ස ලොකෙ -පෙ- ස වෙ සන්තොති වුච්චතී"**යි.

දසවැනි 'පුරාභෙද' සූත්‍ර නිර්දේශය යි.

# 11

# කලහවිවාදසූත්‍රනිර්දේශය

ඉක්බිති 'කලහවිවාද' සූත්‍රනිර්දේශය කියනු ලැබේ:

## 11 - 1

කලහයෝත් විවාදයෝත් කොතැනින් උපන්නාහු ද ? පරිදෙව- ශෝකයෝ ද මාත්සර්‍යයෝ ද මාන - අතිමානයෝ ද පිසුනු වචනයෝ ද යන ඒ (අටවැදෑරුම්) කෙලශධර්මයෝ කොතැනින් උපන්නාහු ද ඒ අර්ථය වදාළ මැනවි.

**කුතො පහූතා කලහා විවාදා** - 'කලහ' නම්: එක් අයුරෙකින් කලහයැ. 'විවාද' නමුදු එය මැ යි, යමෙක් කලහය නම්, හේ විවාද යැ, යමෙක් විවාදය නම් හේ කලහ යයි, නොහොත් අන් අයුරෙකින් විවාදය කියනු ලැබෙයි: කලහයාගේ පූර්වභාගය විවාද යයි; රජහු ද රජුන් සමග විවාද කෙරෙති, ක්ෂත්‍රියයෝ ද ක්ෂත්‍රියයන් සමග විවාද කෙරෙති, බමුණෝ ද බමුණන් සමග විවාද කෙරෙති, ගැහැවියෝ ද ගැහැවියන් සමග විවාද කෙරෙති, මවු ද පුතු සමග විවාද කෙරෙයි, පුතා ද මව සමග විවාද කෙරෙයි, පියා ද පුතු සමග විවාද කෙරෙයි, පුතා ද පියහු සමග විවාද කෙරෙයි, සොහොයුරා ද සොහොයුරු සමග විවාද කෙරෙයි, සොහොයුරා ද සොහොයුරිය සමග විවාද කෙරෙයි, සොහොයුරි ද සොහොයුරු සමග විවාද කෙරෙයි, යහළුවා ද යහළුවා සමග විවාද කෙරෙයි; මේ විවාදයයි.

කතමො කලහො? ආගාරිකා[1] දණ්ඩපසුතා කායෙන වාචාය කලහං කරොන්ති. පබ්බජිතා ආපත්තිං ආපජ්ජන්තා කායෙන වාචාය කලහං කරොන්ති. අයං කලහො.

**කුතො පහූතා කලහා විවාදා**'ති - කලහං ච විවාදං ච කුතො පහූතා? කුතො ජාතා? කුතො සඤ්ජාතා? කුතො නිබ්බත්තා? කුතො අභිනිබ්බත්තා? කුතො පාතුභූතා? කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවා'ති කලහස්ස ච විවාදස්ස ච මූලං පුච්ඡති. හෙතුං පුච්ඡති, නිදානං පුච්ඡති, සම්භවං පුච්ඡති, පභවං පුච්ඡති, සමුට්ඨානං පුච්ඡති, ආහාරං පුච්ඡති, ආරම්මණං පුච්ඡති, පච්චයං පුච්ඡති, සමුදයං පුච්ඡති, පපුච්ඡති, යාචති, අජ්ඣෙසති[2], පසාදෙතීති - 'කුතො පහූතා කලහා විවාදා.'

**පරිදෙවසොකා සහමච්ඡරා චා**'ති - 'පරිදෙවො'ති ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවො පරිදෙවො ආදෙවනා පරිදෙවනා, ආදෙවිතත්තං පරිදෙවිතත්තං, වාචා පලාපො විප්පලාපො ලාලප්පො ලාලප්පනා[3] ලාලප්පිතත්තං;[4][a] **සොකො**ති ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොග - රොග- සීල - දිට්ඨි බ්‍යසනෙන වා ඵුට්ඨස්ස, අඤ්ඤතරඤ්ඤතරෙන වා බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන වා දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස, සොකො සොචනා සොචිතත්තං, අන්තො සොකො අන්තො පරිසොකො අන්තො දාහො[5] අන්තො පරිදාහො, චෙතසො පරිජ්ඣායනා දොමනස්සං සොකසල්ලං; **මච්ඡර**න්ති පඤ්ච මච්ඡරියානි: - ආවාසමච්ඡරියං කුලමච්ඡරියං ලාභමච්ඡරියං වණ්ණමච්ඡරියං ධම්මමච්ඡරියං. යං එවරූපං මච්ඡරියං මච්ඡරායනා මච්ඡරායිතත්තං, වෙවිච්ඡං කදරියං කටුකඤ්චුකතා අග්ගහිතත්තං චිත්තස්ස;[b] ඉදං වුච්චති මච්ඡරියං. අපි ච ඛන්ධමච්ඡරියම්පි මච්ඡරියං, ධාතුමච්ඡරියම්පි මච්ඡරියං, ආයතනමච්ඡරියම්පි මච්ඡරියං; ගාහො වුච්චති මච්ඡරියන්ති - පරිදෙවසොකා සහමච්ඡරා ච.

**මානාතිමානා සහපෙසුනා**[6] **චා**'ති - 'මානො'ති ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන[7] වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා[8] සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. **අතිමානො**ති ඉධෙකච්චො පරං අතිමඤ්ඤති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා.

---

1. අගාරිකා - සීමු. II. 2. අජ්ඣොසති - සීමු II.
3. ලාලප්පායනා - සීමු. II, මජසං PTS.
4. ලාලප්පායිතත්තං - සීමු. II මජසං PTS 5. වාහො - ස.
6. පෙසුණා - සීමු. II. 7. අජ්ඣියෙනෙන - ස.
8. විජ්ජායූණෙන වා - කත්ථචි.
a. සච්ච-පටිච්චසමුප්පාදවිභඞ්ග. b. ඛුද්දකවත්ථුවිභඞ්ග.

කලහය කවරේ ද? ගිහිවැසියෝ දඬුවමෙහි යෙදුණාහු කයින් වචසින් කලහ කෙරෙති. පැවිද්දෝ ඇවැත් අවදනාහු කයින් වචසින් කලහ කෙරෙත්. මේ කලහ යයි. **කුතො පහූතා කලහා විවාද**- කලහයෝ ද විවාදයෝ ද කොතැනින් වූවාහු ද කොයින් උපන්නාහු ද කොයින් හටගත්තාහු ද කොයින් නිපත්නාහු ද කොයින් වෙසෙසින් නිපන්නාහු ද කොයින් පහළ වූවාහු ද කුමක් නිදාන කොට ඇත්තාහු ද කුමක් සමුදය කොට ඇත්තාහු ද කුමක් ජාති කොට ඇත්තාහු ද කුමක් ප්‍රභව කොට ඇත්තාහු දැයි කලහයාගේ ද විවාදයාගේ ද මූලය විචාරයි, හෙතුව - නිදානය - සම්භවය - ප්‍රභවය - සමුට්ඨානය - ආහාරය- ආලම්බනය - ප්‍රත්‍යය - සමුදය විචාරයි, වෙසෙසින් විචාරයි, ආයාචනය කෙරෙයි, කැමැති කරවයි, පහදවා තුයි 'කුතො පහූතා කලහා විවාද' යනු වේ

**පරිදෙවසොකා සහමච්ඡරා ච** - 'පරිදෙව' නම්: නෑයන්ගේ විනාශයෙන් පහස්නා ලද්දහුගේ හෝ භොගවිනාශයෙන් හෝ - රොගව්‍යසනයෙන් හෝ - ශීලව්‍යසනයෙන් හෝ - දෘෂ්ටිව්‍යසනයෙන් හෝ - එක්තරා ව්‍යසනයකින් හෝ යුක්ත වූවහුගේ එක්තරා දුඃඛහෙතුවකින් හෝ පහස්නා ලද්දහුගේ නම කියා හැඬීමෙක් ගුණ කියා හැඬීමෙක් හඬන අයුරෙක් ගුණ කියා හඬනා අයුරෙක් හඬන බවෙක් ගුණ කියා හඬන බවෙක් ප්‍රලාපයෙක් විප්‍රලාපයෙක් පුනපුනා ලපනයෙක් ලාලප්පනාකාරයෙක් ලාලප්පිත බවෙක් වේ ද එය යි. 'සොක' නම්: ඥාතිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ භොග - රොග - ශීල - දෘෂ්ටිව්‍යසනයෙන් හෝ පහස්නා ලද්දහුගේ එක්තරා ව්‍යසනයකින් හෝ යුක්ත වූවහුගේ එක්තරා දුඃඛහෙතුවකින් ස්පර්ශ කරන ලද්දහුගේ ශොකයෙක් ශොකාකාරයෙක් ශොක කළ බවෙක් අභ්‍යන්තර ශොකයෙක් අභ්‍යන්තරයෙහි පරිශොකයෙක් අභ්‍යන්තරදාහයෙක් අභ්‍යන්තරපරිදාහයෙක් සිත දැවෙන අයුරෙක් දෞර්මනස්‍යයෙක් ශොක නමැති හුලෙක් වේ ද එයයි. 'මච්ඡර' නම්: ආවාසමාත්සර්‍ය්‍ය යැ කුල - ලාභ - වර්ණ - ධර්මමාත්සර්‍ය්‍ය යැයි මාත්සර්‍ය්‍ය පසෙකි. මෙබඳු වූ යම් මසුරු බවෙක් මසුරු ආකාරයෙක් මාත්සර්‍ය්‍යයෙන් යුක්ත බවෙක් සඟවනු කැමැති බවෙක් අනාර්‍ය්‍ය බවෙක් කටුකත්වයෙන් සිත හකුළුවන බවෙක් සිත හාත්පසින් ගන්නා ලද බවෙක් වේ ද, මේ මාත්සර්‍ය්‍ය යි කියනු ලැබේ. තවද ස්කන්ධමාත්සර්‍ය්‍යය ද - ධාතු - ආයතන මාත්සර්‍ය්‍යය ද මාත්සර්‍ය්‍ය යැ; ග්‍රාහය මාත්සර්‍ය්‍ය යැයි කියනු ලැබේ තුයි 'පරිදෙවසොකා සහමච්ඡරා ච' යනු වේ.

**මානාතිමානා සහපෙසුනා ච** - 'මාන' නම්: මෙ ලොවැ එකෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් - කුලයෙන් - කුලපුත්‍රභාවයෙන් - වර්ණසෞන්දර්‍ය්‍යයෙන් - ධනයෙන් - අධ්‍යයනයෙන් - කර්මායතනයකින් - ශිල්පායතනයකින් විද්‍යාස්ථානයකින් - ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ එක්තරා වස්තුවකින් හෝ මානය උපදවයි. 'අතිමාන' නම්: මෙ ලොවැ එකෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන්...එක්තරා වස්තුවකින් හෝ මෙරමා ඉක්මවා සිතයි.

**පෙසුඤ්ඤන්ති** – ඉධෙකච්චො පිසුණවාචො හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තා භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති. ඉදං වුච්චති පෙසුඤ්ඤං; අපිච, ද්වීහි කාරණෙහි පෙසුඤ්ඤං උපසංහරති: පියකම්‍යතාය වා භෙදාධිප්පායො වා. කථං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති? ඉමස්ස පියො භවිස්සාමි, මනාපො භවිස්සාමි, විස්සාසිකො භවිස්සාමි, අබ්භන්තරිකො භවිස්සාමි, සුහදයො භවිස්සාමීති එවං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති. කථං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරති? කථං ඉමෙ නානා අස්සු, විනා අස්සු, වග්ගා අස්සු, ද්විධා අස්සු, ද්වෙජ්ඣා අස්සු, ද්වෙ පක්ඛා අස්සු, භිජ්ජෙය්‍යුං න සමාගච්ඡෙය්‍යුං, දුක්ඛං න ඵාසු විහරෙය්‍යුන්ති. එවං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරතීති – ‘මානාතිමානා සහපෙසුනා ච.

**කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහීති** – ‘කලහො ච විවාදෙ ච පරිදෙවො ච සොකො ච මච්ඡරියං ච මානො ච අතිමානො ච පෙසුඤ්ඤඤ්චා’ති ඉමෙ අට්ඨ කිලෙසා කුතො පහූතා? කුතො ජාතා? කුතො සඤ්ජාතා? කුතො නිබ්බත්තා? කුතො අභිනිබ්බත්තා? කුතො පාතුභූතා? කිංනිදානා? කිංසමුදයා? කිංජාතිකා? කිම්පභවාති? ඉමෙසං අට්ඨන්නං කිලෙසානං මූලං පුච්ඡති, හෙතුං පුච්ඡති, නිදානං පුච්ඡති, සම්භවං පුච්ඡති, පභවං පුච්ඡති, සමුට්ඨානං පුච්ඡති, ආහාරං පුච්ඡති, ආරම්මණං පුච්ඡති, පච්චයං පුච්ඡති, සමුදයං පුච්ඡති, පපුච්ඡති යාචති අජ්ඣෙසති පසාදෙතීති– **කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහීති** ඉඞ්ඝ බ්‍රෑහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති – කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහීති.

තෙනාහ සො නිම්මිතො:

“කුතො පහූතා කලහා විවාදා
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුනා ච
කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහී’ති.

## 11 - 2

පියප්පහූතා[1] කලහා විවාදා
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුනා ච
මච්ඡෙරයුත්තා කලහා විවාදා
විවාදජාතෙසු ච පෙසුනානි.

1. පියා පහූතා - සු. පියප්පභූතා - මනුප.

**'පෙසුණියඤ්ච'** නම්: මෙ ලොවැ එකෙක් පෛශුන්‍යවචන ඇත්තේ වෙයි: මෙතැනින් අසා මුන්ගේ භේදය පිණිස එතැන කියන්නේ වෙයි, නොහොත් එතැනින් අසා උන්ගේ බිඳීම පිණිස මුන්ට කියන්නේ වෙයි; මෙසේ සමඟ වූවන් හෝ බිඳිනුයේ භින්න වූවන් හෝ භේදය දැඩි කරනුයේ වර්ගය (=අසමගිය) සතුටු වූයේ වර්ග වූවන් කෙරෙහි ඇලුණේ වර්ග වූවන් දැන සතුටු වනුයේ වර්ග කරන බස් කියනුයේ වෙයි. මේ පෙසුණියඤ්ච' යයි කියනු ලැබේ. තවද දෙ කරුණෙකින් පිසුනුබස් එලවා කියයි: ප්‍රියකාම්‍යතායෙන් හෝ භේදාධිප්‍රාය ඇත්තේ හෝ යැ. කෙසේ ප්‍රියකාම්‍යතායෙන් පිසුනු කියා ද? යත්: 'මොහුට ප්‍රියයෙම් වෙමි, මන වඩනුයෙම් වෙමි, විස්වැසි වෙමි, ඇතුලත් වූයෙම් වෙමි, යහළු වෙමි, මෙසේ ප්‍රිය කැමැති බැවින් පිසුනු කියයි. කෙසේ භේදාධිප්‍රාය ඇතියේ පිසුනු කියා ද? යත්: 'කෙසේ නම් මොහු නානා වන්නාහු ද, වෙන් වන්නාහු ද වර්ග වන්නාහු ද, විවිධ වන්නාහු ද, දෙ කඩවන්නාහු ද, දෙපක්ෂ වන්නාහු ද, බිදෙන්නාහු ද, සමඟම් නොවන්නාහු ද, දුක සේ නො සුවසේ වසන්නාහු දැ'යි මෙසේ භෙද කරන සිත් ඇතියේ පිසුනු එලවා කියා නුයි 'මානාතිමානා සහපෙසුනා ච' යනු වේ.

**කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහි** - කලහය ද විවාදය ද පරිදෙවය ද ශොකය ද මාත්සර්‍ය්‍යය ද මානය ද අතිමානය ද පෛශුන්‍යය ද යන මේ අටකෙලෙස්හු කොතැනින් වූවාහු ද? කොහි උපන්නාහු ද? කොහි හටගත්තාහු ද? කොහි උපන්නාහු ද? කොහි වෙසෙසින් උපන්නාහු ද? කොහි පහළ වූවාහු ද? කුමක් නිදාන - සමුදය - ජාති - ප්‍රභව කොට ඇත්තාහු දැ'යි මේ අටකෙලෙසුන්ගේ මූලය විචාරයි, හෙතුව - නිදානය සම්භවය - සමුට්ඨානය - ආහාරය - ආලම්බනය - ප්‍රත්‍යය විචාරයි, වෙසෙසින් විචාරයි, යාඥ කෙරෙයි, අධ්‍යෙෂණය කෙරෙයි, (කියනු සඳහා) පහදවා නුයි 'කුතො පහූතා තෙ' යනු වේ. **තදිඞ්ඝ බ්‍රෑහි**- වදාළ මැනව, ප්‍රකාශ කළ මැනව, දෙශනා කළ මැනව, පනවනු මැනව, විස්තරයෙන් තබනු මැනව, විවරණ - විභජන කරනු මැනව, ප්‍රකට කරනු මැනව, ප්‍රකාශ කරනු මැනවැයි 'කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහි' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

**“කුතො පහූතා කලහා විවාදා -පෙ- තෙ තදිඞ්ඝ බ්‍රෑහි”**යි

## 11 - 2

කලහයෝ ද විවාදයෝ ද පරිදෙව - ශොකයෝ ද මාත්සර්‍ය්‍යයෝ ද මානාතිමානයෝ ද පෛශුන්‍යයෝ ද ප්‍රියවස්තූහු කෙරෙන් උපන්නාහුය. කලහයෝ ද විවාදයෝ ද (පරිදෙව - ශොක - මාන - අතිමාන - පෛශුන්‍යයෝ ද) මාත්සර්‍ය්‍යයෙහි යෙදුණාහු වෙති. විවාද උපන් කල්හි පිසුනු වචනයෝ වෙත්.

**පියප්පහූතා කලහා විවාදා පරිදෙවසොකා සහමච්ඡරා චාති** - පියාති ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා පියා? ඉධ යස්ස[1] තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා, මාතා වා පිතා වා භාතා වා භගිනී වා පුත්තා වා ධීතා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, ඉමෙ සත්තා පියා. කතමෙ සඞ්ඛාරා පියා? මනාපිකා රූපා මනාපිකා සද්දා මනාපිකා ගන්ධා මනාපිකා රසා මනාපිකා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා පියා. පියං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි කලහං කරොන්ති. අච්ඡිජ්ජන්තෙපි කලහං කරොන්ති අච්ඡින්නෙපි කලහං කරොන්ති. පියං වත්ථුං විපරිණාමසඞ්කිනොපි කලහං කරොන්ති. විපරිණමන්තෙපි කලහං කරොන්ති. විපරිණතෙපි කලහං කරොන්ති. පියං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි විවදන්ති. අච්ඡිජ්ජන්තෙපි විවදන්ති. අච්ඡින්නෙපි විවදන්ති. පියං වත්ථුං විපරිණාමසඞ්කිනොපි විවදන්ති. විපරිණමන්තෙපි විවදන්ති. විපරිණතෙපි විවදන්ති. පියං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි පරිදෙවන්ති. අච්ඡිජ්ජන්තෙපි පරිදෙවන්ති. අච්ඡින්නෙපි පරිදෙවන්ති. පියං වත්ථුං විපරිණාමසඞ්කිනොපි පරිදෙවන්ති. විපරිණමන්තෙපි පරිදෙවන්ති. විපරිණතෙපි පරිදෙවන්ති. පියං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි සොචන්ති. අච්ඡිජ්ජන්තෙපි සොචන්ති. අච්ඡින්නෙපි සොචන්ති. පියං වත්ථුං විපරිණාමසඞ්කිනොපි සොචන්ති. විපරිණමන්තෙපි සොචන්ති. විපරිණතෙපි සොචන්ති. පියං වත්ථුං රක්ඛන්ති ගොපෙන්ති පරිග්ගණ්හන්ති මමායන්ති මච්ඡරායන්ති.

**මානාතිමානා සහපෙසුණා චාති** - පියං වත්ථුං නිස්සාය මානං ජනෙන්ති. පියං වත්ථුං නිස්සාය අතිමානං ජනෙන්ති. කථං පියං වත්ථුං නිස්සාය මානං ජනෙන්ති? "මයං ලාභිනො මනාපිකානං රූපානං සද්දානං ගන්ධානං රසානං ඵොට්ඨබ්බානං. ඉමෙ පනඤ්ඤෙ න ලාභිනො මනාපිකානං රූපානං සද්දානං ගන්ධානං රසානං ඵොට්ඨබ්බාන"න්ති එවං පියං වත්ථුං නිස්සාය මානං ජනෙන්ති. කථං පියං වත්ථුං නිස්සාය අතිමානං ජනෙන්ති? "මයං ලාභිනො මනාපිකානං රූපානං සද්දානං ගන්ධානං රසානං ඵොට්ඨබ්බානං. ඉමෙ පනඤ්ඤෙ න ලාභිනො මනාපිකානං රූපානං සද්දානං ගන්ධානං රසානං ඵොට්ඨබ්බාන"න්ති එවං පියං වත්ථුං නිස්සාය අතිමානං ජනෙන්ති.

**පෙසුඤ්ඤන්ති** - ඉධෙකච්චො පිසුණවාචො හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය -පෙ- එවං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරතීති 'මානාතිමානා සහපෙසුණා ච.'

**මච්ඡරියුත්තා කලහා විවාදා**'ති - කලහො ච විවාදො ච පරිදෙවො ච සොකො ච මානො ච අතිමානො ච පෙසුඤ්ඤඤ්චාති ඉමෙ සත්ත කිලෙසා මච්ඡරියෙ යුත්තා පයුත්තා ආයුත්තා සමායුත්තාති - 'මච්ඡරියුත්තා කලහා විවාදා.'

---

1. යස - සීමු II

**පියප්පහූතා කලහා විවාදා පරිදෙවසොකා සහමච්ඡරා ච** – 'පියා' යනු: ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ ද සංස්කාරයෝ දැයි. කවර සත්ත්වයෝ ප්‍රියයෝ ද යත්? මෙලොව, මවු හෝ පියා හෝ බෑයා හෝ බූනැණිය හෝ පුතා හෝ දූ හෝ මිතුරෝ හෝ යහළුවෝ හෝ නෑයෝ හෝ ඔහුට වැඩ කැමැති වූ හිත කැමැති වූ සුව කැමැති වූ යොගක්ෂෙමය කැමැති වූ යම් කෙනෙක් වෙත් ද මේ සත්ත්වයෝ ප්‍රියයෝ වෙත්. කවර සංස්කාරයෝ ප්‍රියයෝ ද යත්? මනවඩන රූපයෝ මනවඩන ශබ්දයෝ මනවඩන ගන්ධයෝ මනවඩන රසයෝ මනවඩන ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, මේ සංස්කාරයෝ ප්‍රිය වෙත්. ප්‍රියවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තාහු ද කලහ කෙරෙති, අසිඳුනා කල්හි දූ කලහ කෙරෙති, අසිඳගත් කල්හි දූ කලහ කෙරෙති, ප්‍රියවස්තුව 'පෙරළෙති' සැක ඇත්තාහු ද – පෙරළෙන කල්හි දූ පෙරළුණු කල්හි දූ කලහ කෙරෙති, ප්‍රියවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තාහු ද විවාද කෙරෙති, අසිඳුනා කල්හි දූ – අසිඳගත් කල්හි දූ – ප්‍රියවස්තුව 'පෙරළෙති' සැක ඇත්තාහු ද – පෙරළෙන කල්හි දූ – පෙරළුණු කල්හි දූ විවාද කෙරෙත්. ප්‍රියවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තාහු ද පරිදෙවනා කෙරෙති, අසිඳුනා කල්හි දූ අසිඳගත් කල්හි දූ – ප්‍රියවස්තුව 'පෙරළෙති' සැක ඇත්තාහු ද - පෙරළෙන කල්හි දූ – පෙරළුණු කල්හි දූ පරිදෙවනා කෙරෙත්. ප්‍රියවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තාහු ද ශොක කෙරෙති, අසිඳ ගන්නා කල්හි දූ – අසිඳගත් කල්හි දූ – ප්‍රියවස්තුව 'පෙරළෙති' සැක ඇත්තාහු ද - පෙරළෙන කල්හි දූ – පෙරළුණු කල්හි දූ ශොක කෙරෙත්. ප්‍රියවස්තුව රකිති, ගොපනය කෙරෙති, අයත් කෙරෙති, මමායන කෙරෙති, මසුරු කෙරෙත්.

**මානාතිමානා සහපෙසුනා ච** – ප්‍රියවස්තුව නිසා මානය උපදවති ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවත්. කිසෙයින් ප්‍රියවස්තුව නිසා මානය උපදවති? යත්: 'අපි මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් ලබන සුල්ලම්හ, එහෙත් මේ අන්‍යයෝ මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් නො ලබන සුල්ලභ'යි මෙසේ ප්‍රියවස්තුව නිසා මානය උපදවත්. කෙසේ ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවති? යත් 'අපි මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් ලබන සුලල්ම්හ, මේ අන්‍යයෝ වැලිත් මනවඩන රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් නො ලබන සුල්ලභ'යි මෙසේ ප්‍රියවස්තුව නිසා අතිමානය උපදවත්. **පෙසුඤ්ඤං** – මෙහි එකෙක් පිසුනුබස් කියනුයේ වෙයි: මෙතැනින් අසා මොවුන්ගේ භෙදය පිණිස එතැන කියන්නේ වෙයි .. මෙසේ බිඳුවන අදහස් ඇතියේ පිසුනුබස් එලවා කියා නුයි 'මානාතිමානා සහපෙසුනා ච' යනු වේ.

**මච්ඡෙරයුත්තා කලහා විවාදා** – කලහය ද විවාදය ද පරිදෙවය ද ශොකය ද මානය ද අතිමානය ද පෛශුන්‍යය ද යන සප්ත කෙලෙශයෝ මාත්සර්‍ය්‍යයෙහි යෙදුණාහු අතිශයින් යෙදුණාහු හාත්පසින් යෙදුණාහු වෙසෙසින් යෙදුණාහු නුයි 'මච්ඡෙරයුත්තා කලහා විවාදා' යනු වේ.

**විවාදජාතෙසු ච පෙසුණානීති** – ‘විවාදෙ ජාතෙ සඤ්ජාතෙ නිබ්බත්තෙ අභිනිබ්බත්තෙ පාතුභූතෙ පෙසුඤ්ඤං උපසංහරන්ති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛායන්ති ඉමෙසං භෙදාය. අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛායන්ති අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තාරො භින්නානං වා අනුප්පදාතාරො වග්ගාරාමා වග්ගරතා වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතාරො හොන්ති. ඉදං වුච්චති පෙසුඤ්ඤං. අපි ච, ද්වීහි කාරණෙහි පෙසුඤ්ඤං උපසංහරන්ති: පියකම්‍යතාය වා භෙදාධිප්පායා වා. කථං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරන්ති? ඉමස්ස පියො භවිස්සාමි, මනාපො භවිස්සාමි, විස්සාසිකො භවිස්සාමි, අබ්භන්තරිකො භවිස්සාමි, සුහදයො භවිස්සාමීති. එවං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරන්ති. කථං භෙදාධිප්පායා පෙසුඤ්ඤං උපසංහරන්ති? කථං ඉමෙ නානා අස්සු, විනා අස්සු, වග්ගා අස්සු, ද්වෙධා අස්සු, ද්වෙජ්ඣා අස්සු, ද්වෙ පක්ඛා අස්සු, භිජ්ජෙය්‍යුං න සමාගච්ඡෙය්‍යුං, දුක්ඛං න ඵාසු විහරෙය්‍යුන්ති. එවං භෙදාධිප්පායා පෙසුඤ්ඤං උපසංහරන්තීති – ‘විවාද-ජාතෙසු ච පෙසුණානී’

“පියප්පහූතා කලහා විවාදා
පරිදෙවසොකා සහමච්ඡරා ච,
මානාතිමානා සහපෙසුණා ච
මච්ඡෙරයුත්තා කලහා විවාදා
විවාදජාතෙසු ච පෙසුණානී”ති.

## 11 - 8

පියා සු ලොකස්මිං කුතොනිදානා
යෙ වාපි[1] ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච කුතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්ති.

**පියා සු ලොකස්මිං කුතොනිදානාති** – පියා කුතො නිදානා, කුතො ජාතා, කුතො සඤ්ජාතා, කුතො නිබ්බත්තා, කුතො අභිනිබ්බත්තා, කුතො පාතුභූතා, කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවාති පියානං මූලං පුච්ඡති -පෙ- සමුදයං පුච්ඡති පපුච්ඡති යාචති අජ්ඣෙසති[2] පසාදෙතීති – ‘පියා සු ලොකස්මිං කුතොනිදානා.’

1. චාපි - PTS 2. අජ්ඣෙසති - සීමු. II.

**විවාදජාතෙසු ච පෙසුණානි** - විවාදය උපන් කල්හි හටගත් කල්හි නිපන් කල්හි වෙසෙසින් නිපන් කල්හි පහළ වූ කල්හි පිසුනුබස් එළවා කියති: මෙතැනින් අසා මොවුන්ගේ භේදය පිණිස එතැන කියති, එතැනින් හෝ අසා ඔවුන්ගේ භේදය පිණිස මොවුන්ට කියති: මෙසේ සමඟ වූවන් හෝ බිඳින්නාහු භේද වූවන්ගේ හෝ භේදය දැඩි කරන්නාහු වර්ගය කැමැති වූවාහු වර්ග වීමෙහි ඇලුණාහු වර්ග වීමට සතුටු වන්නාහු වර්ග කරන බස් කියන්නාහු වෙත්. මේ 'පෙසුඤ්ඤ'යි කියනු ලැබෙයි. තවද දෙකරුණෙකින් පිසුනු කියති: ප්‍රියකාම්‍යතායෙන් හෝ භේදාභි-ප්‍රායයෙන් හෝ යැ. කිසෙයින් ප්‍රියකාම්‍යතායෙන් පිසුනු කියති ? යත්: මොහුට ප්‍රිය වම්හ. මනාප වම්හ, විස්වැසි වම්හ, ආභ්‍යන්තරික වම්හ, සුහද් වම්හ'යි මෙසේ ප්‍රියකාම්‍යතායෙන් පෛශුන්‍යවචන කියත්. කිසෙයින් භේදාභිප්‍රාය ඇත්තාහු පිසුනුබස් එළවා කියති යත් ? 'කෙසේ නම් මොහු නානා වන්නාහු ද වෙන් වන්නාහු ද වර්ග වන්නාහු ද ද්විධා වන්නාහු ද දෙකඩ වන්නාහු ද දෙපක්ෂ වන්නාහු ද බිඳෙන්නාහු ද සමාගම් නො වන්නාහු ද දුකසේ නො සුවසේ වාසය කරන්නාහු දැ'යි මෙසේ භේදාභිප්‍රායයෙන් පෛශුන්‍ය කියත් නුයි 'විවාදජාතෙසු ච පෙසුනානි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

''පියප්පහූතා -පෙ- විවාදජාතෙසු ච පෙසුණානි''යි.

## 11 - 8

ලොව් ප්‍රියවස්තූහු කොයින් උපන්නාහු ද ? නොහොත් කුමක් හේතු කොට ඇත්තාහු ද ? තවද ලොව් ක්ෂත්‍රියාදී යම් කෙනෙක් ලෝභය හේතු-කොටගෙන හැසිරෙත් නම්, (ඒ ලෝභය කුමක් හේතු කොට ඇත්තේ ද ? ආශාවත් (ඒ ආශාවගේ) සමෘද්ධියත් කොයින් උපන්නාහු ද ? (කුමක් නිදාන කොට ඇත්තාහු ද ?) යම් ධර්ම කෙනෙක් සත්ත්වයා හට පරලොව් පිහිට පිණිස වෙත් නම්, ඒ ධර්මයෝ කොයින් උපන්නාහු ද ? (කුමක් නිදාන කොට ඇත්තාහු ද ?)

**පියා සු ලොකස්මිං කුතොනිදානා** - ප්‍රියවස්තූහු කුමක් නිදාන කොට ඇත්තාහු ද ? කොයින් උපන්නාහු ද ? කොයින් හටගත්තාහු ද ? කොයින් නිපන්නාහු ද ? කොයින් වෙසෙසින් නිපන්නාහු ද ? කොයින් පහළ වූවාහු ද ? කුමක් නිදාන කොට ඇත්තාහු ද ? කුමක් උත්පත්ති කොට ඇත්තාහු ද ? කුමක් ජාති කොට ඇත්තාහු ද ? කුමක් ප්‍රභව කොට ඇත්තාහු දැයි ප්‍රියවස්තූන්ගේ මූලය විචාරති...සමුදය විචාරති, පුළුවුස්ති අසැදිති අධ්‍යේෂණ කෙරෙති පහදවති නුයි 'පියා සු ලොකස්මිං කුතො-නිදානා' යනු වේ.

**යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ**ති-'යෙ චාපී'ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච; **ලොභො**ති යො ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං සාරාගො සාරජ්ජනා සාරජ්ජිතත්තං අභිජ්ඣා ලොභො අකුසලමූලං[a] **විචරන්තී**ති විචරන්ති විහරන්ති ඉරියන්ති වත්තන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති; **ලොකෙ**ති අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙති- 'යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ.'

**ආසා ච නිට්ඨා ච කුතොනිදානා**ති – 'ආසා ච නිට්ඨා ච කුතොනිදානා කුතො ජාතා කුතො සඤ්ජාතා කුතො නිබ්බත්තා කුතො අභිනිබ්බත්තා කුතො පාතුභූතා කින්නිදානා කිංසමුදයා කිඤ්ජාතිකා කිම්පභවා,ති ආසාය ච නිට්ඨාය ච මූලං පුච්ඡති -පෙ- සමුදයං පුච්ඡති, පපුච්ඡති යාචති අජ්ඣෙසති[1] පසාදෙතීති – 'ආසා ච නිට්ඨා ච කුතොනිදානා.'

**යෙ සම්පරායාය නරස්ස හොන්තී**ති – යෙ නරස්ස පරායනා හොන්ති. දීපා හොන්ති, තාණා හොන්ති, ලෙනා හොන්ති, සරණා හොන්ති, නරො නිට්ඨා පරායනො හොතීති[2] 'යෙ සම්පරායාය නරස්ස හොන්ති.'

තෙනාහ සො නිම්මිතො:

"පියා සු ලොකස්මිං කුතොනිදානා
යෙ චාපි[3] ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච කුතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්තී"ති

## 11 - 4

ඡන්දනිදානානි පියානි ලොකෙ
යෙ චාපි[3] ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච ඉතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්ති.

**ඡන්දනිදානානි පියානි ලොකෙ**ති – 'ඡන්දො'ති යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං කාමච්ඡන්දනීවරණං. අපිච, පඤ්ච ඡන්දා: පරියෙසනච්ඡන්දො පටිලාභච්ඡන්දො පරිභොගච්ඡන්දො සන්නිධිච්ඡන්දො විස්සජ්ජනච්ඡන්දො. කතමො පරියෙසනච්ඡන්දො? ඉධෙකච්චො අජ්ඣොසිතොයෙව අත්ථිකො ඡන්දජාතො රූපෙ පරියෙසති. සද්දෙ-ගන්ධෙ රසෙ - ඵොට්ඨබ්බෙ පරියෙසති. අයං පරියෙසනච්ඡන්දො. කතමො පටිලාභච්ඡන්දො? ඉධෙකච්චො අජ්ඣොසිතොයෙව අත්ථිකො ඡන්දජාතො රූපෙ පටිලභති. සද්දෙ - ගන්ධෙ - රසෙ - ඵොට්ඨබ්බෙ පටිලභති. අයං පටිලාභච්ඡන්දො.

---

a ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ

1 අජ්ඣෙසති - සීමු. II 2. නිට්ඨාපරායනා හොන්තීති - මජසං, සීමු II.

3. යෙ වා පි - සයා, PTS.

**යෙ වාපි ලොභා විචරන්ති ලොකෙ** - 'යෙ වා පි' යනු: ක්‍ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශූද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවියෝ ද මනුෂ්‍යයෝ ද; **ලොභා** – යම් ලොභයෙක් ලොභ කරන අයුරෙක් ලොභ කරන බවෙක් ඇලීමෙක් ඇලෙන අයුරෙක් ඇලුණු බවෙක් දැඩි ලොභයෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද; **විචරන්ති** – හැසිරෙති වෙසෙති ඉරියව් පවත්වති පාලනය කෙරෙති යැපෙති යාපනය කෙරෙත්; **ලොකෙ**– අපායලොකයෙහි මනුෂ්‍ය – දෙව – ස්කන්ධ – ධාතු – ආයතනලොකයෙහි නුයි 'යෙ වාපි ලොභා විචරන්ති ලොකෙ' යනු වේ.

**ආසා ච නිට්ඨා ච කුතොනිදානා** – ආශාව ත් ආශාසමෘද්ධිය ත් කුමන හෙතු ඇත්තාහු ද? කොයින් උපන්නාහු ද? කොයින් හටගත්තාහු ද? කොයින් නිපන්නාහු ද? කොයින් නැඟුණාහු ද? කොයින් පහළ වූවාහු ද? කුමක් නිදාන කොට – කුමක් සමුදය කොට – කුමක් ජාති කොට – කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද'යි ආශාවේ ත් ආශාසමෘද්ධිය ගේ ත් මූලය විචාරති...සමුදය විචාරති, පුළුවුස්ති අයැදිති අධ්‍යෙෂණ කෙරෙති පහදවත් නුයි 'ආසා ච නිට්ඨා ච කුතොනිදානා' යනු වේ.

**යෙ සම්පරායාය නරස්ස හොන්ති** – යම් ධම් කෙනෙක් සත්ත්වයා හට (පරලොවට) පිහිට වෙත් ද ප්‍රතිෂ්ඨා වෙත් ද ත්‍රාණ වෙත් ද රක්‍ෂාස්ථාන වෙත් ද සරණ වෙත් ද. මිනිසා ඒ සමෘද්ධිය පරායණ කොට ඇත් නුයි – 'යෙ සම්පරායාය නරස්ස හොන්ති' යනු වේ.

එයින් කීහ, ඒ නිර්මිත බුදුහු:

"පියා සු ලොකස්මිං -පෙ- යෙ සම්පරායාය නරස්ස හොන්ති"යි

## 11 – 4

ලොවැ ප්‍රියවස්තූහු කාමච්ඡන්දය නිදාන කොට ඇත්තාහුය, තවද ලොවැ යම් කෙනෙක් ලොභය හෙතු කොට හැසිරෙත් ද, (ඔවුන්ගේ ඒ ලොභයත් කාමච්ඡන්දය හෙතු කොට ඇත්තේය,) ආශාව ත් ආශා සමෘද්ධියත් මේ කාමච්ඡන්දය ම නිදාන කොට ඇත්තාහු ය, යම් ධම් කෙනෙක් සත්ත්වයා හට පරලොව පිහිට පිණිස වෙත් නම්, (ඔහු ද කාමච්ඡන්දයෙන් ම උපන්නාහු යි.)

**ඡන්දනිදානානි පියානි ලොකෙ** – 'ඡන්ද' නම්: කාමවස්තූන් කෙරෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණායෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ඡායෙක් කාමයන්හි ගැලීමෙක් කාමෞඝයෙක් කාමයොගයෙක් කාමොපාදානයෙක් කාමච්ඡන්දනීවරණයෙක් වේ ද, එයයි; තවද ඡන්ද පසෙකි: පර්යෙෂණ (=සෙවීම)ඡන්දය, ප්‍රතිලාභච්ඡන්දය, පරිභොගච්ඡන්දය, සන්නිධි (=රැස්කිරීම) ඡන්දය, විසර්ජන (=වියදම් කිරීම) ඡන්දය දැයි; එහි පර්යෙෂණච්ඡන්දය කවරැ යත්? මෙහි එකෙක් කාමයෙන් මඩනා ලද්දේ මැ කැමැති වූයේ හටගත් ඡන්දය ඇත්තේ රූපයන් සොයයි, ශබ්ද – ගන්ධ – රස – ස්ප්‍රෂ්ටව්‍යයන් සොයයි, මේ පර්යෙෂණච්ඡන්ද යයි. ප්‍රතිලාභච්ඡන්දය කවරැ යත්? මෙහි එකෙක් කාමයෙන් මඩනා ලද්දේ මැ අර්ථී වූයේ හටගත් ඡන්දය ඇත්තේ රූපයන් ලබයි, ශබ්ද-ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන් ලබයි, මේ ප්‍රතිලාභච්ඡන්ද යයි.

කතමො පරිභොගච්ඡන්දො? ඉධෙකච්චො අපෙක්ඛාසිතො යෙව අත්ථිකො ඡන්දජාතො රූපෙ පරිභුඤ්ජති, සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ පරිභුඤ්ජති. අයං පරිභොගච්ඡන්දො. කතමො සන්නිධිච්ඡන්දො? ඉධෙකච්චො අපෙක්ඛාසිතොයෙව අත්ථිකො ඡන්දජාතො ධනසන්නිචයං කරොති ආපදාසු භවිස්සතීති; අයං සන්නිධිච්ඡන්දො. කතමො විසජ්ජනච්ඡන්දො? ඉධෙකච්චො අපෙක්ඛාසිතොයෙව අත්ථිකො ඡන්දජාතො ධනං විසජ්ජෙති හත්ථාරොහානං අස්සාරොහානං රථිකානං ධනුග්ගහානං පත්තිකානං 'ඉමෙ මං රක්ඛිස්සන්ති ගොපිස්සන්ති සම්පරිවාරෙස්සන්තී'ති. අයං විසජ්ජනච්ඡන්දො. **පියානීති** ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා -පෙ- ඉමෙ සත්තා පියා -පෙ- ඉමෙ සඞ්ඛාරා පියා; **ඡන්දනිදානානි පියානි ලොකෙති** පියා ඡන්දනිදානා ඡන්දසමුදයා ඡන්දජාතිකා ඡන්දපභවාති – 'ඡන්දනිදානානි පියානි ලොකෙ.'

**යෙ චාපි ලොභා විචරන්ති ලොකෙති** – 'යෙ චාපී'ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච; **ලොභාති** යො ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං සාරාගො සාරජ්ජනා සාරජ්ජිතත්තං අභිජ්ඣා ලොභො අකුසලමූලං[a]; **විචරන්තීති** විචරන්ති විහරන්ති ඉරියන්ති වත්තෙන්ති පාලෙන්ති යපෙන්ති යාපෙන්ති; **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති – 'යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ.'

**ආසා ච නිට්ඨා ච ඉතොනිදානාති** – 'ආසා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං;[b] **නිට්ඨාති** ඉධෙකච්චො රූපෙ පරියෙසන්තො රූපං පටිලභති, රූපනිට්ඨො හොති. සද්දෙ- ගන්ධෙ රසෙ – ඵොට්ඨබ්බෙ, කුලං, ගණං, ආවාසං, ලාභං, යසං, පසංසං, සුඛං, චීවරං, පිණ්ඩපාතං, සෙනාසනං, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, සුත්තන්තං, විනයං, අභිධම්මං, ආරඤ්ඤිකඞ්ගං, පිණ්ඩපාතිකඞ්ගං, පංසුකූලිකඞ්ගං, තෙචීවරිකඞ්ගං, සපදානචාරිකඞ්ගං, ඛලුපච්ඡාභත්තිකඞ්ගං, නෙසජ්ජිකඞ්ගං, යථාසන්ථතිකඞ්ගං, පඨමජ්ඣානං, දුතියජ්ඣානං, තතියජ්ඣානං, චතුත්ථජ්ඣානං ආකාසානඤ්චායතනසමාපත්තිං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිං, ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං, පරියෙසන්තො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං පටිලභති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිනිට්ඨො හොති.

1 "ආසාය කසතෙ[1] ඛෙත්තං බීජං ආසාය වප්පති
ආසාය වාණිජා යන්ති සමුද්දං ධනහාරකා;
යාය ආසාය තිට්ඨාමි[2] සා මෙ ආසා සමිජ්ඣතු"ති[3][c]

a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ. b ධම්මසඞ්ගණී නික්ඛෙපකණ්ඩ
1. කස්සතෙ - මජසං. 2. නිට්ඨාදි - සීමු. II. පතිට්ඨාමි - සයා.
3. සමිජ්ඣතීති - සීමු II. PTS. c. ථෙරගාථා - 10. 1. 1.

පරිභොගච්ඡන්දය කවරේ යත්: මෙහි එකෙක් කාමයෙන් මඩනා ලදුයේ මැ අර්පිත වූයේ හටගත් ඡන්දය ඇත්තේ රූපයන් පරිභොග කෙරෙයි, ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන් පරිභොග කෙරෙයි, මේ පරිභොගච්ඡන්ද යයි. සන්නිධිච්ඡන්දය කවරේ යත්? මෙහි එකෙක් කාමයෙන් මඩනා ලදුයේ මැ අර්පිත වූයේ හටගත් ඡන්දය ඇත්තේ 'විපත්හි වන්නේයැ' යි ධන රැස් කෙරෙයි, මේ සන්නිධිච්ඡන්ද යයි, විසර්ජනච්ඡන්දය කවරේ යත්? මෙහි එකෙක් කාමයෙන් මඩනා ලදුයේ මැ අර්පිත වූයේ හටගත් ඡන්දය ඇත්තේ 'මොවුහු මා රක්‍ෂණ ගොපනය කරන්නාහුය, පිරිවර සිටින්නාහ'යි ඇතරුවන්ට අසරුවන්ට රියැදුරන්ට දුනුවාවන්ට පාබලසෙනඟට ධනය වියදම් කරයි, මේ විසර්ජනච්ඡන්ද යයි. **පියානි** - ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ;...මේ ප්‍රියවූ සංස්කාරයෝ යි. **ඡන්දනිදානානි පියානි ලොකෙ** - ප්‍රිය වූ සත්ත්ව - සංස්කාරයෝ ඡන්දය නිදාන කොට ඇත්තාහුය, ඡන්දය උත්පත්ති කොට ඇත්තාහුය, ඡන්දය ජාති කොට ඇත්තාහුය, ඡන්දය ප්‍රභව කොට ඇත්තාහු නුයි 'ඡන්දනිදානානි පියානි ලොකෙ' යනු වේ.

**යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ** - 'යෙ චාපි' යනු: ක්‍ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ගැහැවියෝ ද පැවිද්දෝ ද දෙවියෝ ද මිනිස්හු ද; **ලොභා** - යම් ලොභයෙක් ලොභාකාරයෙක් ලොභ කරන බවෙක් ඇලීමෙක් ඇලෙන අයුරෙක් ඇලුණු බවෙක් අභිධ්‍යාවෙක් ලොභ අකුශලමූල-යෙක් වේ ද එයයි. **විචරන්ති** - හැසිරෙති වෙසෙති ඉරියවු පවත්වති, වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්; **ලොකෙ** - අපායලොකයෙහි.... ආයතනලොකයෙහි නුයි 'යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ' යනු වේ.

**ආසා ච නිට්ඨා ච ඉතො නිදානා** - 'ආසා'යි තෘෂ්ණාව කියනු ලබයි. යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවෙක් ලොභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එයයි; **නිට්ඨා** - මෙලො වැ එකෙක් රූපයන් සොයනුයේ රූපය ලබයි, රූපසමෘද්ධිය ඇත්තේ වෙයි, ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන්-කුලය - ගණයා - ආවාසය - ලාභය යශස් - ප්‍රශංසාව - සුඛය - චීවර-පිණ්ඩපාත - සෙනාසන - ගිලන්පසබෙහෙත්පිරිකර - සූත්‍රාන්තය - විනය-අභිධර්මය - ආරණ්‍යකාඞ්ගය - පිණ්ඩපාතිකාඞ්ගය - පාංසුකූලිකාඞ්ගය - තෙචීවරි-කාඞ්ගය - සපදානචාරිකාඞ්ගය - ඛලුපච්ඡාභත්තිකාඞ්ගය - නෙසජ්ජිකාඞ්ගය-යථාසන්තිකාඞ්ගය - ප්‍රථමධ්‍යානය - ද්විතීය - තෘතීය - චතුර්ථධ්‍යානය-ආකාසානඤ්චායතනසමාපත්තිය - විඤ්ඤාණඤ්චායතන - ආකිඤ්චඤ්ඤායතන-නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිය සොයනුයේ නෙවසඤ්ඤානාසඤ්ඤා-යතන සමාපත්තිය ලබයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්ති සමෘද්ධිය ඇත්තේ වේ.

1. ආශාව හෙතු කොට (ගොවියා) කෙත සායි, ආශාව හෙතු කොට කිජුවට වපුරනු ලැබෙයි, ධනය රැස්කර ගන්නා වූ වෙළෙන්දෝ ආශාව හෙතු කොට (නැවින්) මුහුදට යෙති, යම් ආශාවකින් මම මෙහි සිටිම් නම්, ඒ මාගේ ආශාව සමෘද්ධ වේවා'යි.

ආසාය සමිද්ධි වුච්චතෙ[1] නිට්ඨා; ආසා ච නිට්ඨා ච ඉතොනිදානාති ආසා ච නිට්ඨා ච ඉතො ඡන්දනිදානා ඡන්දසමුදයා ඡන්දජාතිකා ඡන්දපභවාති - ආසා ච නිට්ඨා ච ඉතොනිදානා.

**යෙ සම්පරායාය නරස්ස හොන්තීති** - යෙ නරස්ස පරායනා හොන්ති, දීපා හොන්ති, තාණා හොන්ති, ලෙනා හොන්ති, සරණා හොන්ති. නරො නිට්ඨා පරායනො හොතීති[2] - යෙ සම්පරායාය නරස්ස හොන්ති.

තෙනාහ භගවා:

“ඡන්දනිදානානි පියානි ලොකෙ
යෙ චාපි ලොභා විචරන්ති ලොකෙ,
ආසා ච නිට්ඨා ච ඉතොනිදානා
යෙ සම්පරායාය නරස්ස හොන්තී”ති.

### 11 - 5

ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො
විනිච්ඡයා චාපි කුතො පහූතා,
කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
යෙ චාපි[3] ධම්මා සමණෙන වුත්තා.

**ඡන්දො නු ලොකස්මිං - කුතොනිදානොති** - ඡන්දො කුතොනිදානො කුතො ජාතො කුතො සඤ්ජාතො කුතො නිබ්බත්තො කුතො අභිනිබ්බත්තො කුතො පාතුභූතො කිංනිදානො කිංසමුදයො කිංජාතිකො කිංපභවොති ඡන්දස්ස මූලං පුච්ඡති -පෙ- සමුදයං පුච්ඡති පපුච්ඡති යාචති අජ්ඣෙසති[4] පසාදෙතීති - ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො.

**විනිච්ඡයා චාපි කුතො පහූතාති** - විනිච්ඡයා කුතො පහූතා කුතො ජාතා කුතො සඤ්ජාතා කුතො නිබ්බත්තා කුතො අභිනිබ්බත්තා කුතො පාතුභූතා කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිංපභවාති විනිච්ඡයානං මූලං -පෙ- සමුදයං පුච්ඡති පපුච්ඡති යාචති අජ්ඣෙසති පසාදෙතීති - විනිච්ඡයා චාපි කුතො පහූතා.

**කොධො මොසවජ්ජඤ්ච කථංකථා චාති** ‘කොධො’ති - යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො, දොසො පදොසො සම්පදොසො, චිත්තස්ස බ්‍යාපත්ති මනොපදොසො, කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං, දොසො දුස්සනා දුස්සිතත්තං, බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං, විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස[a]; **මොසවජ්ජං** වුච්චති මුසාවාදො, **කථංකථා** වුච්චති විචිකිච්ඡා’ති - කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච.

---

1. වුච්චති - ස.
2. නිට්ඨා පරායනා හොන්තීති - මජසං. නිට්ඨා හොන්ති පරායණා හොන්ති - සීමු II.
3. වාපි - සනා. PTS. ස.
4. අජ්ඣෙසති සීමු. II.

a. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ.

ආශාසමෘද්ධිය 'නිට්ඨා, (ඵලනිෂ්පත්ති) යයි කියනු ලැබේ. **ආසා ච නිට්ඨා ච ඉතොනිදානා** - ආශාවත් නිෂ්ඨාව (-සමෘද්ධිය) ත් මේ (රූපඡන්දාදි) ඡන්දය නිදාන කොට ඇත්තාහුය, ඡන්දය උත්පත්ති කොට - ඡන්දය ජාති කොට - ඡන්දය ප්‍රභව කොට ඇත්තාහු නුයි 'ආසා ච නිට්ඨා ච ඉතොනිදානා' යනු වේ.

**යෙ සම්පරායාය නරස්ස හොන්ති** - යම් ධර්ම කෙනෙක් සත්ත්වයා හට පරායණ වෙත් ද, ප්‍රතිෂ්ඨා වෙත් ද, ත්‍රාණ වෙත් ද, රක්‍ෂාස්ථාන වෙත් ද, සරණ වෙත් ද, මිනිසා ඒ ආශාසමෘද්ධිය පරායණ කොට ඇත් නුයි 'යෙ සම්පරායාය නරස්ස හොන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඡන්දනිදානානි -පෙ- යෙ සම්පරායාය නරස්ස හොන්ති"**සි.

## 11 - 5

ලොව කාමච්ඡන්ද තෙමේ කුමක් නිදාන කොට ඇත්තේ ද? (තෘෂ්ණා දෘෂ්ටි) විනිශ්චයයෝ හෝ කොයිබින් උපන්නාහු ද? ක්‍රොධය ත් මෘෂාවාදයත් විචිකිත්සාව ත් බුද්ධශ්‍රමණයන් විසින් දෙසූ යම් අකුශලධර්ම කෙනෙකුත් වෙත් නම්, ඔවුහු ත් කොයිබින් උපන්නාහු ද?

**ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො** - කාමච්ඡන්ද තෙමේ කුමක් නිදාන කොට ඇත්තේ ද? කොතැනින් උපන්නේ ද? කොයින් හට ගත්තේ ද? කොයින් නැඟුණේ ද? කොයිබින් පහළ වූයේ ද? කුමක් නිදාන කොට - කුමක් සමුදය කොට - කුමක් ජාති කොට - කුමක් ප්‍රභව කොට ඇත්තේ ද'යි ඡන්දයා ගේ මූලය විචාරති...සමුදය විචාරති පුළුවුස්ති අයැදිති අධ්‍යෙෂණ කෙරෙයි, පහදවත් නුයි 'ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො' යනු වේ.

**විනිච්ඡයා චා පි කුතො පහූතා** - තෘෂ්ණා - දෘෂ්ටිවිනිශ්චයයෝ කොයින් වූවාහු ද? කොයින් උපන්නාහු ද? කොයින් හටගත්තාහු ද? කොයින් නිපන්නාහු ද? කොයින් පැනනැඟුණාහු ද? කොයින් පහළ වූවාහු ද? කුමක් නිදාන - සමුදය - ජාති - ප්‍රභව කොට ඇත්තාහු ද'යි විනිශ්චයයන්ගේ මූලය විචාරති...සමුදය විචාරති පුළුවුස්ති අයැදිති අධ්‍යෙෂණ කෙරෙති පහදවත් නුයි 'විනිච්ඡයා චා'පි කුතො පහූතා'. යනු වේ.

**කොධො මොසවජ්ජඤ්ච කථංකථා** ච -'කොධො' යනු: මෙබඳු වූ චිත්තයා ගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් චිත්තයාගේ ව්‍යාපත්තියෙක් සිතෙහි දූෂ්‍ය බවෙක් කිපීමෙක් කිපෙන අයුරෙන් කිපුණු බවෙක් දූෂ්‍ය වීමෙක් දූෂ්‍යාකාරයෙක් දූෂ්‍ය බවෙක් ව්‍යාපත්තියෙක් ව්‍යාපත්තාකාරයෙක් ව්‍යාපන්න බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් චණ්ඩ බවෙක් නො පිරුණු වචන ඇතිබවෙක් සිත පිළිබඳ නො සතුටු බවෙක් වේ ද එයයි. 'මොසවජ්ජ'යි මෘෂාවාදය කියනු ලැබෙයි; 'කථංකථා'යි විචිකිත්සාව කියනු ලබා නුයි 'කොධො මොසවජ්ජං ච කථංකථා ච' යනු වේ.

**යෙ චාපි ධම්මා සමණෙන වුත්තා'ති**– 'යෙ චාපී'ති යෙ කොධෙන ච මොසවජ්ජෙන ච කථංකථාය ච සහගතා සහජාතා සංසට්ඨා සම්පයුත්තා එකුප්පාදා එකනිරොධා එකවත්ථුකා එකාරම්මණා, ඉමෙ වුච්චන්ති 'යෙ චාපි ධම්මා' අථවා, යෙ තෙ කිලෙසා අඤ්ඤජාතිකා අඤ්ඤවිහිතකා, ඉමෙ වුච්චන්ති 'යෙ චාපි ධම්මා' **සමණෙන වුත්තාති** සමණෙන සමිතපාපෙන බ්‍රාහ්මණෙන බාහිතපාපධම්මෙන[1] භික්ඛුනා භින්නකිලෙසමූලෙන සබ්බාකුසලමූලබන්ධනා[2] පමුත්තෙන වුත්තා පවුත්තා ආචික්ඛිතා දෙසිතා පඤ්ඤපිතා පට්ඨපිතා විවටා විභත්තා උත්තානීකතා පකාසිතාති – 'යෙ චාපි ධම්මා සමණෙන වුත්තා.'

තෙනාහ භගවා:

"ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො
විනිච්ඡයා චාපි කුතො පහූතා,
කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
යෙ චාපි ධම්මා සමණෙන වුත්තා"ති.

**11 – 6**

සාතං අසාතන්ති යමාහු ලොකෙ
තමූපනිස්සාය පහොති ඡන්දො,
රූපෙසු දිස්වා විභවං භවඤ්ච
විනිච්ඡයං කුරුතෙ[3] ජන්තු ලොකෙ.

**සාතං අසාතන්ති යමාහු ලොකෙති** – 'සාත'න්ති සුඛා ච වෙදනා ඉට්ඨඤ්ච වත්ථු,[4] **අසාතන්ති** දුක්ඛා ච වෙදනා අනිට්ඨඤ්ච වත්ථු; **යමාහු ලොකෙති** යං ආහංසු යං කථෙන්ති යං භණන්ති යං දීපයන්ති යං වොහරන්තීති – 'සාතං අසාතන්ති යමාහු ලොකෙ.'

"තමුපනිස්සාය පහොති ඡන්දොති, සාතාසාතං නිස්සාය සුඛ දුක්ඛං නිස්සාය සොමනස්ස දොමනස්සං නිස්සාය, ඉට්ඨානිට්ඨංනිස්සාය අනුනය පටිඝං නිස්සාය. ඡන්දො හොති පහොති පභවති සඤ්ජායති නිබ්බත්තති අභි නිබ්බත්තති තමුපනිස්සාය පහොති ඡන්දො"

**රූපෙසු දිස්වා විභවං භවඤ්චා'ති** –'රූපෙසූ'ති චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං. කතමො රූපානං භවො? යො රූපානං භවො ජාති සඤ්ජාති නිබ්බත්ති අභිනිබ්බත්ති පාතුභාවො; අයං රූපානං භවො. කතමො රූපානං විභවො? යො රූපානං ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං; අයං රූපානං විභවො. **රූපෙසු දිස්වා විභවං භවඤ්චා'ති** රූපෙසු භවඤ්ච විභවඤ්ච දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති – 'රූපෙසු දිස්වා විභවං භවඤ්ච.'

---

1. බාහිතපාපෙන - සහ. 2. සබ්බාකුසලබන්ධනා - ස.
3. කුබ්බති - මජසං. 4. වත්ථුං - ඡමු. II.

**යෙ වා'පි ධම්මා සමණෙන වුත්තා** - 'යෙ වාපි' යනු: යම් ධර්ම කෙනෙක් ක්‍රෝධයත් මෘෂාවාදයත් විචිකිත්සාවත් සමග සහගත වූවාහු ද සහජාත - සංසෘෂ්ට - සම්ප්‍රයුක්ත වූවාහු ද එක් වැ උපදනාහු එක් වැ නිරුද්ධ වන්නාහු සමාන වස්තු ඇත්තාහු සමාන අරමුණු ඇත්තාහු වෙත් ද මොවුහු 'යම් ධර්මයෝ' යි කියනු ලැබෙත්. නොහොත් යම් කෙලෙස් කෙනෙක් අන්‍යස්වභාව ඇත්තාහු අන් කරුණෙකින් වූවාහු වෙත් ද, මොවුහු 'යම් ධර්මයෝ'යි කියනු ලැබෙත්. **සමණෙන වුත්තා**- නිවුණු පව් ඇති ශ්‍රමණයා විසින්, නැසූ පව් ඇති බ්‍රාහ්මණයා විසින්, බුත් කෙලෙස්මුල් ඇති භික්ෂුහු විසින්, සියලු අකුශලමූලබන්ධනයෙන් මිදුණාහු විසින් කියන ලද පවසන ලද ප්‍රකාශ කරන ලද දෙසන ලද පනවන ලද පිහිටුවන ලද විවෘත කළ විභාග කළ ප්‍රකට කළ ප්‍රකාශ කරන ලද්දාහු නුසි 'යෙ වා'පි ධම්මා සමණෙන වුත්තා' යනු වේ.

එයින් කිහ, ඒ නිර්මිත බුදුහු:

**"ඡන්දො නු ලොකස්මිං -පෙ- යෙ වා පි ධම්මා සමණෙන වුත්තා"යි**

**11 - 6**

මෙ ලොවැ සුව යැයි ද දුකැයි ද යමක් කියත් නම්, ඒ සාතාසාත වේදනාව නිසා ඡන්දය උපදී, ලොවැ සත්ත්ව තෙමේ භූතොපාදායරූපයන්හි විනාශය ත් උත්පත්තිය ත් දැක තෘෂ්ණා - දෘෂ්ටිවිනිශ්චය කරත්තේ යි.

**සාතං අසාතන්ති යමාහු ලොකෙ** - 'සාත' නම්, සුඛවේදනාව හා ඉෂ්ටවස්තුව යැ: **අසාත** - නම්: දුඃඛවේදනාව හා අනිෂ්ටවස්තුව යැ; **යමාහු ලොකෙ** - යමක් පවසත් නම්, යමක් කියත් නම් යමක් බෙණෙත් නම් යමක් දක්වත් නම් යමක් වහරත් නම් නුසි 'සාතං අසාතන්ති යමාහු ලොකෙ' යනු වේ.

**තමූපනිස්සාය පහොති ඡන්දො** - සාතාසාත (වේදනාව හා වස්තුව) නිසා සැපදුක් නිසා සොම්නස් දොම්නස් නිසා ඉටුඅනිටු නිසා අනුනය ප්‍රතිඝ නිසා ඡන්දය වෙයි පහළ වෙයි උපදී හටගනී නිපදී වෙසෙසින් නිපදී නුසි 'තමූපනිස්සාය පහොති ඡන්දො' යනු වේ.

**රූපෙසු දිස්වා විභවං භවඤ්ච** - 'රූපෙසු' යනු: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා උපදනා රූපය ද වේ; රූපයන්ගේ භවය කවරැ යත්? රූපයන් ගේ යම් භවයෙක් ජාතියෙක් හටගැනීමෙක් නිපැදීමෙක් වෙසෙසින් නිපැදීමෙක් පහළ වීමෙක් වේ ද, මේ රූපයන්ගේ භවයයි; රූපයන්ගේ විභවය කවරැ යත්? රූපයන්ගේ යම් ක්ෂයවීමෙක් වැනැසීමෙක් භෙදයෙක් පරිභෙදයෙක් අනිත්‍ය බවෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ රූපයන් ගේ විභව යයි. **රූපෙසු දිස්වා විභවං භවඤ්ච** - රූපයන්හි හටගැනීම් ද වැනැසීම ද දැක බලා තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට නුසි 'රූපෙසු දිස්වා විභවං භවඤ්ච' යනු වේ.

විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙති – 'විනිච්ඡයා'ති ද්වෙ විනිච්ඡයා තණ්හාවිනිච්ඡයො ච දිට්ඨිවිනිච්ඡයො ච. කථං තණ්හාවිනිච්ඡයං කරොති? ඉධෙකච්චස්ස අනුප්පන්නා චෙව භොගා[1] න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති; තස්ස එවං හොති: 'කෙන නු ඛො මෙ උපායෙන අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති? උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්තී'ති. තස්ස පන එවං හොති: 'සුරාමෙරයමජ්ජප්පමාදට්ඨානානුයොගං අනුයුත්තස්ස මෙ අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති. විකාලවිසිඛාචරියානුයොගං අනුයුත්තස්ස මෙ අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති. සමජ්ජාභිචරණං අනුයුත්තස්ස මෙ – ජූතප්පමාදට්ඨානානුයොගං අනුයුත්තස්ස මෙ – පාපමිත්තානුයොගං අනුයුත්තස්ස මෙ අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්ති. ආලස්සානුයොගං[2] අනුයුත්තස්ස මෙ අනුප්පන්නා චෙව භොගා න උප්පජ්ජන්ති; උප්පන්නා ච භොගා පරික්ඛයං ගච්ඡන්තී'ති එවං ඤාණං කත්වා ඡ භොගානං අපායමුඛානි න සෙවති. ඡ භොගානං ආයමුඛානි සෙවති. එවම්පි තණ්හාවිනිච්ඡයං කරොති.

අථවා කසියා වා වණිජ්ජාය වා ගොරක්ඛෙන වා ඉස්සත්තෙන වා රාජපොරිසෙන[3] වා සිප්පඤ්ඤතරෙන වා පටිපජ්ජති. එවම්පි තණ්හාවිනිච්ඡයං කරොති. කථං දිට්ඨිවිනිච්ඡයං කරොති? චක්ඛුස්මිං උප්පන්නෙ ජානාති 'අත්තා මෙ උප්පන්නො'ති. චක්ඛුස්මිං අන්තරහිතෙ ජානාති 'අත්තා මෙ අන්තරහිතො, විගතො මෙ අත්තා'ති. එවම්පි දිට්ඨිවිනිච්ඡයං කරොති. සොතස්මිං– ඝානස්මිං– ජිව්හාය– කායස්මිං– රූපස්මිං– සද්දස්මිං– ගන්ධස්මිං– රසස්මිං– ඵොට්ඨබ්බස්මිං උප්පන්නෙ ජානාති 'අත්තා මෙ උප්පන්නො'ති. ඵොට්ඨබ්බස්මිං අන්තරහිතෙ ජානාති 'අත්තා මෙ අන්තරහිතො, විගතො මෙ අත්තා'ති. එවම්පි දිට්ඨිවිනිච්ඡයං කරොති, ජනෙති සඤ්ජනෙති නිබ්බත්තෙති අභිනිබ්බත්තෙති. ජන්තූති සත්තො නරො මානවො -පෙ- මනුජො; ලොකෙ'ති අපායලොකෙ -පෙ- ආයතනලොකෙති – 'විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ.'

තෙනාහ භගවා:

"සාතං අසාතන්ති යමාහු ලොකෙ
තමූපනිස්සාය පහොති ඡන්දො,
රූපෙසු දිස්වා විභවං භවං ච
විනිච්ඡයං කුරුතෙ[4] ජන්තු ලොකෙ"ති.

11 – 7

කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ,
කථංකථී ඤාණපථාය සික්ඛෙ
ඤත්වා පවුත්තා සමණෙන ධම්මා.

---

1. ලොභා. - සිමු. II. 2. ආලසානුයොගං - මජසං.
3. රාජපොරිසෙන - සිමු. II. 4. කුබ්බති - මජසං.

**විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ** - 'විනිච්ඡය' නම්: තෘෂ්ණා-විනිශ්චය ද දෘෂ්ටිවිනිශ්චය දැයි විනිශ්චය දෙකෙකි: කෙසේ තෘෂ්ණාවිනිශ්චය කෙරෙයි යත්? මෙහි එකක් හට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් ක්ෂය වීමට යෙති; ඔහුට මෙසේ සිතෙක් වෙයි: 'කවර උපායයෙකින් මට නූපන් භොගයෝ ත් නූපදිත් ද, උපන් භොගයෝත් ක්ෂය වීමට යෙත් දැ'යි. යළි ඔහුට මෙසේ සිත් වෙයි: 'මද්‍යට ප්‍රමාදයට කරුණු වූ රහමෙර පීමෙහි නැවත නැවත යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් පිරිහෙති: නො කල්හි විථිසඤ්චාරයෙහි පුනපුනා යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් පිරිහීමට යෙති; නෘත්‍යාදිය දැකීම් වශයෙන් පිරිස්හි හැසිරීමෙහි පුනපුනා යෙදුණු මට - ප්‍රමාදයට කරුණු වූ ද්‍යූතයෙහි පුනපුනා යෙදුණු මට - පාපමිත්‍රානුයොගයෙහි පුනපුනා යෙදුණු මට - ආලස්‍යයෙන් යුක්ත බැවිහි පුනපුනා යෙදුණු මට නූපන් භොගයෝ ත් නූපදිති, උපන් භොගයෝ ත් පිරිහීමට යෙති' මෙසේ නුවණ උපදවා සවැදෑරුම් වූ භොගයන් ගේ විනාසමුඛයන් දුරුවූ සෙවනය නො කෙරෙයි, සවැදෑරුම් වූ භොගයන් ගේ ආයද්වාරයන් සෙවනය කෙරෙයි; මෙසේත් තෘෂ්ණා විනිශ්චය කෙරෙයි.

නොහොත් ගොවිතැනින් හෝ වෙළෙඳාමෙන් හෝ ගවපාලනයෙන් හෝ ධනුශිල්පයෙන් හෝ රාජසේවායෙන් හෝ එක්තරා ශිල්පයෙකින් හෝ උත්සාහ කෙරෙයි; මෙසේ ත් තෘෂ්ණාවිනිශ්චය කෙරෙයි. කෙසේ දෘෂ්ටිවිනිශ්චය කෙරෙයි යත්? සසම්භාර චක්ෂුස උපන් කල්හි 'මා ගේ ආත්මය උපනැ'යි දෘෂ්ටිවශයෙන් දැනගනී, චක්ෂුස නැසුණු කල්හි, 'මා ගේ ආත්මය නැසිණ, මා ගේ ආත්මය ඉක්මැ ගියේ යැ'යි දෘෂ්ටිවශයෙන් දැනගනී; මෙසේ ත් දෘෂ්ටිවිනිශ්චය කෙරෙයි, ශ්‍රොත්‍රය - ඝ්‍රාණය - ජිහ්වාව- කායය - රූපය - ශබ්දය - ගන්ධය - රසය - ස්ප්‍රෂ්ටව්‍යය උපන් කල්හි 'මා ගේ ආත්මය උපනැ'යි දෘෂ්ටිවශයෙන් දැනගනී, ස්ප්‍රෂ්ටව්‍යය නැසුණු කල්හි 'මා ගේ ආත්මය නැසිණ, මා ගේ ආත්මය පහව ගියේ වනැ'යි දෘෂ්ටි වශයෙන් දැනගනී; (-දෘෂ්ටිය ගනී යයි සේයි.) මෙසේ ත් දෘෂ්ටිවිනිශ්චය කෙරෙයි, උපදවයි, මොනොවට උපදවයි, නිපදවයි, වෙසෙසින් නිපදවයි. **ජන්තු** - සත්ත්ව- නර -මානව...මනුජ තෙමේ. **ලොකෙ** -අපායලොකයෙහි... ආයතනලොකයෙහි නුයි 'විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සාතං අසාතන්ති -පෙ- විනිච්ඡයං කුරුතෙ ජන්තු ලොකෙ"යි.**

**11 - 7**

ක්‍රෝධය ද මෘෂාවාදය ද විචිකිත්සාව ද යන මේ ධර්මයෝ ද සාතාසාත දෙක ඇති කල්හි මැ වෙති, විචිකිත්සා සහිත වූ පුද්ගල තෙම ඥානදර්ශන-ඥානාධිගමය පිණිස ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන්නේ ය, බුද්ධශ්‍රමණයන් විසින් දැන (අනිත්‍යාදි) ධර්මයෝ දෙසන ලද්දාහු ය

**කොධො මොසවජ්ජඤ්ච කථංකථා චාති** – 'කොධො'ති යො එවරූපො චිත්තස්ස ආඝාතො පටිඝාතො -පෙ- මොසවජ්ජං වුච්චති මුසාවාදො; කථංකථා වුච්චති විචිකිච්ඡා; ඉට්ඨං වත්ථුං නිස්සායපි කොධො ජායති; අනිට්ඨං වත්ථුං නිස්සායපි කොධො ජායති. ඉට්ඨං වත්ථුං නිස්සායපි මුසාවාදො උප්පජ්ජති. අනිට්ඨං වත්ථුං නිස්සායපි මුසාවාදො උප්පජ්ජති, ඉට්ඨං වත්ථුං නිස්සායපි කථංකථා උප්පජ්ජති, අනිට්ඨං වත්ථුං නිස්සායපි කථංකථා උප්පජ්ජති.

කථං අනිට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති? පකතියා අනිට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති: අනත්ථං මෙ අචරීති කොධො ජායති. අනත්ථං මෙ චරතීති කොධො ජායති. අනත්ථං මෙ චරිස්සතීති කොධො ජායති. පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි – අනත්ථං චරති – අනත්ථං චරිස්සතීති කොධො ජායති. අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි – අත්ථං චරති – අත්ථං චරිස්සතීති කොධො ජායති. එවං අනිට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති. කථං ඉට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති? ඉට්ඨං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි[1] කොධො ජායති, අච්ඡිජ්ජන්තෙපි කොධො ජායති, අච්ඡින්නෙපි කොධො ජායති. ඉට්ඨං වත්ථුං විපරිණාමසඞ්කිනොපි කොධො ජායති. විපරිණමන්තෙපි කොධො ජායති. විපරිණතෙපි කොධො ජායති. එවං ඉට්ඨං වත්ථුං නිස්සාය කොධො ජායති.

කථං අනිට්ඨං වත්ථුං නිස්සාය මුසාවාදො උප්පජ්ජති? ඉධෙකච්චො අන්දුබන්ධනෙන[2] වා බද්ධො[3] තස්ස බන්ධනස්ස මොක්ඛත්ථාය සම්පජානමුසා භාසති. රජ්ජුබන්ධනෙන වා බද්ධො,[3] සඞ්ඛලිකබන්ධනෙන වා බද්ධො, වෙත්තබන්ධනෙන වා බද්ධො, ලතාබන්ධනෙන වා බද්ධො, පක්ඛෙපබන්ධනෙන වා බද්ධො, පරික්ඛෙපබන්ධනෙන වා බද්ධො, ගාමනිගමනගරජනපදරට්ඨබන්ධනෙන වා බද්ධො, ජනපදබන්ධනෙන වා බද්ධො, තස්ස බන්ධනස්ස මොක්ඛත්ථාය සම්පජානමුසා භාසති. එවං අනිට්ඨං වත්ථුං නිස්සාය මුසාවාදො උප්පජ්ජති. කථං ඉට්ඨං වත්ථුං නිස්සාය මුසාවාදො උප්පජ්ජති? ඉධෙකච්චො මනාපිකානං[4] රූපානං හෙතු සම්පජානමුසා භාසති, මනාපිකානං සද්දානං -ගන්ධානං- රසානං-ඵොට්ඨබ්බානං හෙතු- චීවර හෙතු- පිණ්ඩපාත- හෙතු - සෙනාසන හෙතු – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සම්පජානමුසා භාසති, එවං ඉට්ඨං වත්ථුං නිස්සාය මුසාවාදො උප්පජ්ජති. කථං අනිට්ඨං වත්ථුං නිස්සාය කථංකථා උප්පජ්ජති? 'මුච්චිස්සාමි[5] නු ඛො චක්ඛුරොගතො, න නු ඛො මුච්චිස්සාමි චක්ඛුරොගතො, මුච්චිස්සාමි නු ඛො සොතරොගතො, ඝානරොගතො, ජිව්හාරොගතො, කායරොගතො, සීසරොගතො, කණ්ණරොගතො, මුඛරොගතො, මුච්චිස්සාමි[5] නු ඛො දන්තරොගතො, න නු ඛො මුච්චිස්සාමි දන්තරොගතො'ති එවං අනිට්ඨං වත්ථුං නිස්සාය කථංකථා උප්පජ්ජති. කථං ඉට්ඨං වත්ථුං නිස්සාය කථංකථා උප්පජ්ජති? 'ලභිස්සාමි නු ඛො මනාපියෙ[6] රූපෙ, න නු ඛො ලභිස්සාමි මනාපියෙ රූපෙ, ලභිස්සාමි නු ඛො මනාපියෙ[6] සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර'න්ති එවං ඉට්ඨං වත්ථුං නිස්සාය කථංකථා උප්පජ්ජතී'ති – කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච.

---

1. වත්ථුච්ඡෙදසඞ්කිනොපි - ස්‍යා 2. අද්දුබන්ධනෙන - ස්‍යා. PTS.
3. බන්ධො - ස්‍යා. PTS. 4. මනාපානං - සීමු. II 5. මුඤ්චිස්සාමි - සීමු. II.
6. මනාපිකෙ - මජසං.

**කොධො මොසවජ්ජං ච කථංකථා ච** – 'කොධො' යනු: මෙබඳු වූ චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක්...'**මොසවජ්ජ**'යි මෘෂාවාදය කියනු ලැබෙයි; '**කථංකථා**'යි විචිකිත්සාව කියනු ලබයි; ඉෂ්ටවස්තුව නිසා ද කොපය උපදී, අනිෂ්ටවස්තුව නිසා ද කොපය උපදී; ඉෂ්ටවස්තුව නිසා ද මෘෂාවාදය උපදී, අනිෂ්ටවස්තුව නිසා ද මෘෂාවාදය උපදී; ඉෂ්ට-වස්තුව නිසා ද විචිකිත්සාව උපදී, අනිෂ්ටවස්තුව නිසා ද විචිකිත්සාව උපදී;

කිසෙයින් අනිෂ්ටවස්තුව නිසා කොපය උපදී ද යත්: පියවින් මැ අනිෂ්ටවස්තුව නිසා කොපය උපදී; 'මට අනර්ථ කෙළේ යැ'යි කොපය උපදී, මට අනර්ථ කෙරෙයි කොපය උපදී, 'මට අනර්ථ කරන්නේ යැ'යි කොපය උපදී, 'මාගේ ප්‍රිය වූ මනාප වූවහුට අනර්ථ කෙළේය – අනර්ථ කරයි – අනර්ථ කරන්නේයැ'යි කොපය උපදී; ,මා ගේ අප්‍රිය අමනාප වූවහුට අර්ථ කෙළේය – අර්ථ කරයි – අර්ථ කරන්නේයැ'යි කොපය උපදී; මෙසේ අනිෂ්ට වස්තුව නිසා ක්‍රොධය උපදී. කිසෙයින් ඉෂ්ටවස්තුව නිසා ක්‍රොධය උපදී ද යත්: ඉෂ්ටවස්තුව 'අසිද ගනිති' සැක ඇත්තහුට ද ක්‍රොධය උපදී, ඉෂ්ටවස්තුව අසිඳුනා කල්හි දු ක්‍රොධය උපදී, ඉෂ්ටවස්තුව අසිදගත් කල්හි දු ක්‍රොධය උපදී; ඉෂ්ටවස්තුව 'වෙනස් වෙති' සැක ඇත්තහුට ද ක්‍රොධය උපදී, ඉෂ්ටවස්තුව වෙනස් වන කල්හි දු ක්‍රොධය උපදී, ඉෂ්ටවස්තුව වෙනස් වූ කල්හි දු ක්‍රොධය උපදී; මෙසේ ඉෂ්ටවස්තුව නිසා ක්‍රොධය උපදී.

කිසෙයින් අනිෂ්ටවස්තුව නිසා මෘෂාවාදය උපදී ද යත්: මෙහි එකෙක් අන්දුබන්ධනයෙන් (–යදමින්) හෝ බඳනා ලදුයේ ඒ බන්ධනය මුදනු සඳහා දැන දැන බොරු කියයි, රැහැනින් හෝ බඳනා ලදුයේ – හැකිළි බැඳුමෙන් හෝ බඳනා ලදුයේ – වේ වැලින් හෝ බඳනා ලදුයේ– ලතාබන්ධනයෙන් හෝ බඳනා ලදුයේ – සිරබැඳුමෙන් හෝ බඳනා ලදුයේ– පවුරුබැඳුමෙන් හෝ බඳනා ලදුයේ – ගම් නියම්ගම් නගර රටබැඳුමෙන් හෝ බඳනා ලදුයේ – දනවුබැඳුමෙන් හෝ බඳනා ලදුයේ ඒ බන්ධනය මුදනු සඳහා දැන දැන බොරු කියයි; මෙසේ අනිෂ්ට වස්තුව නිසා මුසාවාදය උපදී. කිසෙයින් ඉෂ්ටවස්තුව නිසා මුසාවාදය උපදී ද යත්? මෙහි එකෙක් මනවඩන රූපයන් හේතු කොට දැන දැන බොරු කියයි, මන වඩන ශබ්දයන්– ගන්ධ – රස ස්ප්‍රෂ්ටව්‍යයන් හෙතු කොට - සිවුරු හෙතුයෙන් පිණ්ඩපාත – සෙනසුන් – ගිලන්පස බෙහෙත් පිරිකර හෙතුයෙන් දැන දැන බොරු කියයි: මෙසේ ඉෂ්ටවස්තුව නිසා මෘෂාවාදය උපදී. කිසෙයින් අනිෂ්ටවස්තුව නිසා විචිකිත්සාව (–සැකය) උපදී ද යත් ? චක්ෂුරොගයෙන් මිදෙම් දෝ හෝ චක්ෂුරොගයෙන් නො මිදෙම් දෝ හෝ ශ්‍රොත්‍රරොගයෙන්– ඝ්‍රාණරොගයෙන් – ජිහ්වාරොගයෙන් – කායරොගයෙන් – ශීර්ෂරොගයෙන්– කර්ණරොගයෙන් – මුඛරොගයෙන් – දන්තරොගයෙන් මිදෙම් දෝ හෝ, දන්තරොගයෙන් නො මිදෙම් දෝ හෝ'යි මෙසේ අනිෂ්ටවස්තුව නිසා සැක උපදී, කෙසේ ඉෂ්ටවස්තුව නිසා සැක උපදී ද යත්? මනවඩන රූපයන් ලැබෙම් දෝ හෝ, 'මනවඩන රූපයන් නො ලැබෙම් දෝ හෝ, මනවඩන ශබ්ද– ගන්ධ – රස - ස්ප්‍රෂ්ටව්‍යයන් - කුලයා – ගණයා – ආවාසය – ලාභය– යශස්– පැසැසුම් – සුව – සිවුරු පිණ්ඩපාත – සෙනසුන් – ගිලන්පසබෙහෙත්පිරිකර නො ලැබෙම් දෝ හෝ'යි මෙසේ ඉෂ්ටවස්තුව නිසා සැක උපදී නුයි 'කොධො මොසවජ්ජං ච කථංකථා ච' යනු වේ.

එතෙපි ධම්මා ද්වයමෙව සන්තාති - සාතාසාතෙ සන්ත සුඛදුක්ඛෙ[1] සන්ත සොමනස්සදොමනස්සෙ සන්ත ඉට්ඨානිට්ඨෙ සන්ත අනුනයපටිඝෙ සන්ත සංවිජ්ජමානෙ අපි උපලබ්භමානෙති - එතෙපි ධම්මා ද්වයමෙව සන්ත.

කථඞ්කථී ඤාණපථාය සික්ඛෙති - ඤාණම්පි ඤාණපථො ඤාණස්ස ආරම්මණම්පි ඤාණපථො; ඤාණසහභුනොපි ධම්මා ඤාණපථො; යථා අරියමග්ගො අරියපථො, දෙවමග්ගො දෙවපථො, බ්‍රහ්මමග්ගො බ්‍රහ්මපථො; එවමෙව ඤාණම්පි ඤාණපථො, ඤාණස්ස ආරම්මණම්පි ඤාණපථො, ඤාණසහභුනොපි ධම්මා ඤාණපථො; සික්ඛෙති තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. කතමා අධිසීලසික්ඛා? ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු; ඛුද්දකො සීලක්ඛන්ධො, මහන්තො සීලක්ඛන්ධො සීලං පතිට්ඨා ආදි චරණං සංවරො මුඛං පමුඛං කුසලානං ධම්මානං සමාපත්තියා, අයං අධිසීලසික්ඛා. කතමා අධිචිත්තසික්ඛා? ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති; අයං අධිචිත්තසික්ඛා. කතමා අධිපඤ්ඤාසික්ඛා? ඉධ භික්ඛු පඤ්ඤවා හොති, උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා: සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති; ඉමෙ ආසවා'ති යථාභූතං පජානාති -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදා'ති යථාභූතං පජානාති, අයං අධිපඤ්ඤාසික්ඛා.

කථඞ්කථී ඤාණපථාය සික්ඛෙති - කථඞ්කථී පුග්ගලො සකඞ්ඛො සවිලෙඛො සද්වෙළ්හකො සවිචිකිච්ඡො ඤාණාධිගමාය ඤාණඵුසනාය[2] ඤාණසච්ඡිකිරියාය අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය; ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො සික්ඛෙය්‍ය, පස්සන්තො සික්ඛෙය්‍ය, පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය, චිත්තං අධිට්ඨහන්තො සික්ඛෙය්‍ය, සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය, විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය, සතිං උපට්ඨපෙන්තො සික්ඛෙය්‍ය, චිත්තං සමාදහන්තො සික්ඛෙය්‍ය, පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය, පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය, භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය, සමාදාය වත්තෙය්‍යා'ති - කථඞ්කථී ඤාණපථාය සික්ඛෙ.

---

1. සුඛාසුඛෙ සයා 2. ඤාණදස්සනාය - ස

**එතෙ පි ධම්මා ද්වයමෙව සන්තෙ** - සාතාසාත (දෙක) ඇති කල්හි සුව - දුක් ඇති කල්හි සොම්නස් දොම්නස් ඇති කල්හි ඉට්ඨ අනිට්ඨ ඇති කල්හි අනුනය ප්‍රතිඝයන් විද්‍යමාන කල්හි සංවිද්‍යමාන කල්හි ඇති කල්හි ලැබෙන කල්හි නුසි 'එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ' යනු වේ.

**ඤාණපථාය සික්ඛෙ කථංකථී** - ඥානය ඥානපථ යැ, ඥානයා ගේ අරමුණ ද ඥානපථ යැ, ඥානය හා සහජාත වූ ධර්මයෝ ද ඥානපථ යි; යම් සේ ආයතීමාර්ගය ආයතීපථ වී ද, දෙවමාර්ගය දෙවපථ වී ද, බ්‍රහ්මමාර්ගය බ්‍රහ්මපථ වී ද, එසෙසින් ම ඥානය ත් ඥානපථ යැ, ඥානයා ගේ ආරම්මණය ත් ඥානපථ යැ, ඥානය සමග උපන් චිත්ත චෛතසික ධර්මයෝත් ඥානපථ යි. **සික්ඛෙ** - ශික්‍ෂා තුනෙකි: අධිශීලශික්‍ෂා යැ, අධිචිත්තශික්‍ෂා යැ, අධිප්‍රඥශික්‍ෂා යැයි, අධිශීලශික්‍ෂා කවරී ද යත්? මේ ශාසනයෙහි මහණ තෙම සිල්වත් වෙයි, ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් සංවර වූයේ ආචාරගොචර දෙකින් සමන්විත වූයේ අණුමාත්‍ර වරදෙහි භය දක්නාසුලු වූයේ වෙසෙසි, මොනොවට ගෙන ශික්‍ෂාකොට්ඨාසයන්හි හික්මෙයි; ක්‍ෂුද්‍රශීලස්කන්ධ යැ, මහත්ශීලස්කන්ධ යැ (යන) ශීලය චාතුර්භූමක කුශලධර්මයන් ගේ ප්‍රතිලාභයට ප්‍රතිෂ්ඨා වෙයි, ආදී වෙයි, පාදය වෙයි, සංයමය වෙයි, සංවරය වෙයි, ද්වාරය වෙයි, ප්‍රමුඛ වේ. මෝ අධිශීලශික්‍ෂා යැ. අධිචිත්තශික්‍ෂා කවරී ද යත්? මේ සස්නෙහි මහණ තෙමේ කාමච්ඡන්දනීවරණයෙන් වෙන්ව මැ...සිව්වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි; මෝ අධිචිත්තශික්‍ෂා යැ. අධිප්‍රඥශික්‍ෂා කවරී ද යත්? මේ සස්නෙහි මහණ තෙමේ ප්‍රඥවත් වෙයි, නිර්දේශ වූ නිර්වේධය පිණිස පවත්නා වූ මනා කොට තිවනට පමුණුවන්නා වූ අභිවෘද්ධිගාමිනී ප්‍රඥවෙන් පරිපූර්ණ වූයේ වෙයි, හෙතෙම 'මේ දුකැ'යි තත්වූ පරිද්දෙන් දැනගනී,...'මේ දුක් නැසීමට පමුණුවන පිළිවෙතැ'යි තත්වූ පරිද්දෙන් දැනගනී; මොහු ආශ්‍රවයෝ යැයි තත්වූ පරිද්දෙන් දැනගනී,...'මේ ආශ්‍රවනිරොධයට පමුණුවන ප්‍රතිපදව යැ'යි තත් වූ පරිද්දෙන් දැනගනී. මෝ තොමෝ අධිප්‍රඥශික්‍ෂා යි.

**කථංකථී ඤාණපථාය සික්ඛෙ** - විචිකිත්සාවත් පුද්ගල තෙමේ සැක සහිත වූයේ චිත්තවිලෙඛ (-සිතේ හිරි) සහිත වූයේ දෙසින් සහිතවූයේ විචිකිත්සා සහිත වූයේ නුවණ ලැබීම පිණිස ඥානස්පර්ශය පිණිස නුවණ ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස අධිශීලයෙහි ද හික්මෙන්නේය, අධිචිත්තයෙහි ද හික්මෙන්නේය අධිප්‍රඥවෙහි ද හික්මෙන්නේය; මෙහි ත්‍රිවිධ ශික්‍ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේය, දනිමින් හික්මෙන්නේය, දක්මින් හික්මෙන්නේය, ප්‍රත්‍යවෙක්‍ෂා කරමින් හික්මෙන්නේය, සිතෙහි පිහිටුවමින් හික්මෙන්නේය, සැදැහැයෙන් සන්ටුහන් කෙරෙමින් හික්මෙන්නේය, වියයීය දැඩිව ගනිමින් හික්මෙන්නේය, සිහියට එළවමින් හික්මෙන්නේය, සිත පිහිටුවමින් හික්මෙන්නේය, නුවණින් දැනගනිමින් හික්මෙන්නේය, (ස්වලක්‍ෂණාවබොධයෙන්) දතයුත්ත විශිෂ්ටඥානයෙන් දැනගනිමින් හික්මෙන්නේය, (සාමාන්‍යලක්‍ෂණාවබොධයෙන් කෘත්‍යවශයෙන්) දතයුත්ත ගෘත්පසින් දැනගනිමින් හික්මෙන්නේය, හළයුතු සමුදය දුරුකරමින් හික්මෙන්නේය, වැඩියයුතු මාර්ගය වඩමින් හික්මෙන්නේය, ප්‍රත්‍යක්‍ෂ කටයුතු නිවන ප්‍රත්‍යක්‍ෂ කරමින් හික්මෙන්නේය, හැසිරෙන්නේය, මොනොවට හැසිරෙන්නේය, සමාදන්ව පවත්නේ නුසි 'කථංකථී ඤාණපථාය සික්ඛෙ' යනු වේ.

ඤත්වා පවුත්තා සමණෙන ධම්මාති - 'ඤත්වා' ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා වුත්තා පවුත්තා ආචික්ඛිතා දෙසිතා පඤ්ඤපිතා පට්ඨපිතා විවටා විභත්තා උත්තානීකතා පකාසිතා 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, වුත්තා පවුත්තා ආචික්ඛිතා දෙසිතා පඤ්ඤපිතා පට්ඨපිතා විවටා විභත්තා උත්තානීකතා පකාසිතා. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති - සබ්බෙ ධම්මා අනත්තාති - අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති -පෙ- ජාතිපච්චයා ජරාමරණන්ති - අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති -පෙ- ජාතිනිරොධා ජරාමරණනිරොධොති, ඉදං දුක්ඛන්ති -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති, ඉමෙ ආසවාති -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදාති, ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති, ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති, ඉමෙ ධම්මා පහාතබ්බාති, ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බා'ති, ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච, පඤ්චන්නං උපාදානක්ඛන්ධානං - චතුන්නං මහාභූතානං - 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, වුත්තා පවුත්තා ආචික්ඛිතා දෙසිතා පඤ්ඤපිතා පට්ඨපිතා විවටා විභත්තා උත්තානීකතා පකාසිතා. වුත්තං හෙතං භගවතා: "අභිඤ්ඤායාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි; නො අනභිඤ්ඤාය. සනිදානාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි; නො අනිදානං. සප්පාටිහාරියාහං භික්ඛවෙ ධම්මං දෙසෙමි; නො අප්පාටිහාරියං. තස්ස මය්හං භික්ඛවෙ අභිඤ්ඤාය ධම්මං දෙසයතො නො අනභිඤ්ඤාය, සනිදානං ධම්මං දෙසයතො නො අනිදානං, සප්පාටිහාරියං ධම්මං දෙසයතො නො අප්පාටිහාරියං, කරණීයො ඔවාදො; කරණීයා අනුසාසනී. අලඤ්ච පන වො භික්ඛවෙ[1] තුට්ඨියා අලං පාමොජ්ජාය[2] අලං සොමනස්සාය 'සම්මාසම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො[3] ධම්මො, සුප්පටිපන්නො සඞ්ඝො'ති ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ දසසහස්සී[4] ලොකධාතු අකම්පිත්ථා"ති - ඤත්වා පවුත්තා සමණෙන ධම්මා.

තෙනාහ භගවා:

"කොධො මොසවජ්ජඤ්ච කථංකථා ච
එතෙපි ධම්මා ද්වයමෙව සන්තෙ,
කථංකථී ඤාණපථාය සික්ඛෙ
ඤත්වා පවුත්තා සමණෙන ධම්මා"ති.

## 11 - 8

සාතං අසාතඤ්ච කුතොනිදානා?
කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ,
විභවං භවඤ්චාපි යමෙතමත්ථං
එතං මෙ පබ්‍රූහි යතොනිදානං.

1 භික්ඛවෙ වො - සී. II. 2 අත්තමනතාය - අඞ්.
3 භගවතා ධම්මො - අඞ් 4 සහස්සී - අඞ
අඞ්ගුත්තර - තිකනිපාත - භරණ්ඩුවග්ග

**ඤත්වා පවුත්තා සමණෙන ධම්මා** – ‘ඤත්වා’ යනු: දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට කියන ලද්දහු වෙසෙසින් කියන ලද්දහු දක්වන ලද්දහු දෙසන ලද්දහු තබන ලද්දහු ප්‍රකට කරන ලද්දහු විභාග කරන ලද්දහු නො ගැඹුරු කරන ලද්දහු ප්‍රකාශ කරන ලද්දහු යැ; ‘සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ’යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට උක්තයහ, ප්‍රෝක්ත – ආචක්ෂිත – දෙශිත – ප්‍රඥප්ත – ප්‍රස්ථාපිත– විවෘත – විභක්ත – උත්තානීකෘත – ප්‍රකාශිතයහ,’ ‘සියලු සංස්කාරයෝ දුඃඛයහ’යි...‘සියලු ධර්මයෝ අනාත්මයහ’යි – ‘අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති...ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණය වේ යයි – අවිද්‍යාවගේ නිරෝධයෙන් සංස්කාරනිරෝධ යයි...ජාතිනිරෝධයෙන් ජරාමරණනිරෝධය වේ යයි– මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය යැයි – මොහු ආස්‍රවයෝ යැයි...මේ ආස්‍රවනිරෝධගාමිනීප්‍රතිපදාව යැයි – මේ ධර්මයෝ අවබෝධ කළයුත්තාහ’යි මේ ධර්මයෝ පරිජානනය කළයුත්තාහ’යි – මේ ධර්මයෝ ප්‍රහීණ කළ යුත්තාහ’යි–මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළයුත්තාහ’යි–සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ ඉපදීම ද නැසීම ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද– පඤ්චෝපාදානස්කන්ධයන්ගේ – සතර මහාභූතයන්ගේ – යම් කිසි සමුදයධර්මයෙක් වේ නම් ඒ සියල්ල නැසෙන පියවි ඇතැ’යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට කියන ලද්දේ යැ වෙසෙසින් කියන ලද්දේ යැ දක්වන ලද්දේ යැ දෙසන ලද්දේ යැ පනවන ලද්දේ යැ තබන ලද්දේ යැ විවෘත කරන ලද්දේ යැ විභාග කරන ලද්දේ යැ නො ගැඹුරු කරන ලද්දේ යැ පවසන ලද්දේ යි. මේ වදාළේ මැනු, භාග්‍යවතුන් විසින්: – ‘මහණෙනි, මම මාර්ගාවබෝධය පිණිස දහම් දෙසමි, අනභිඥාව පිණිස නො දෙසමි: මහණෙනි, මම නිදාන (–ප්‍රත්‍යය) සහිත ව දහම් දෙසමි, ප්‍රත්‍යය රහිත කොට නො දෙසමි, මහණෙනි, මම නෛර්‍යාණික කොට දහම් දෙසමි, අනෛර්‍යාණික කොට නො දෙසමි, මහණෙනි, අභිඥාව පිණිස දහම් දෙසන අනභිඥාව පිණිස නො දෙසන, සනිදාන කොට දහම් දෙසන අනිදාන කොට නො දෙසන, නෛර්‍යාණික කොට දහම් දෙසන අනෛර්‍යාණික කොට නො දෙසන ඒ මා විසින් අවවාද කටයුත්තේය, අනුශාසනා කළයුත්තීය. තවද මහණෙනි, ‘භාග්‍යවත්හු සම්‍යක්සම්බුද්ධයහ, ධර්මය ස්වාඛ්‍යාත යැ, සඞ්ඝ තෙමේ සුප්‍රතිපන්න යැ’යි තොපගේ සතුටට පමණ යැ, ප්‍රාමොද්‍යයට පමණ යැ, සොම්නසට පමණ වේ. තවද මේ වෛයාකරණය දෙසනු ලබන කල්හි දශසහස්‍රිලෝකධාතුව කම්පා වී’ යයි. ‘ඤත්වා පවුත්තා සමණෙන ධම්මා’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“කොධො මොසවජ්ජඤ්ච –පෙ– ඤත්වා පවුත්තා සමණෙන ධම්මා’යි.**

## 11 – 8

සුඛ වේදනාව ද දුක් වේදනාව ද (යන මොහු) කුමක් හේතු කොට උපදනාහු ද? කුමක් අවිද්‍යමාන කල්හි මොහු පහළ නො වෙත් ද? යළි ඒ සාතාසාතයන්ගේ විනාශය ද පහළ වීම ද යන යම් මේ අර්ථයෙක් යමක් කරුණු කොට ඇත්තේ ද, තෙල කාරණය මට ප්‍රකාශ කළ මැනව.

**සාතං අසාතඤ්ච කුතොනිදානාති** – සාතා අසාතා කුතොනිදානා ? කුතො ජාතා ? කුතො සඤ්ජාතා ? කුතො නිබ්බත්තා ? කුතො අභිනිබ්බත්තා ? කුතො පාතුභූතා ? කින්නිදානා ? කිංසමුදයා ? කිඤ්ජාතිකා කිම්පභවාති සාතාසාතානං මූලං පුච්ඡති -පෙ- සමුදයං පුච්ඡති පපුච්ඡති යාචති අජ්ඣෙසති පසාදෙතීති – 'සාතං අසාතඤ්ච කුතොනිදානා.'

**කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙති** – 'කිස්මිං අසන්තෙ අසං-විජ්ජමානෙ නත්ථි අනුපලබ්භමානෙ සාතා අසාතා න භවන්ති, න ජායන්ති, න සඤ්ජායන්ති, න නිබ්බත්තන්ති, න අභිනිබ්බත්තන්තීති – 'කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ.'

**විභවං භවඤ්චාපි යමෙතමත්ථන්ති** – කතමො සාතාසාතානං භවො? යො සාතාසාතානං භවො පභවො ජාති සඤ්ජාති නිබ්බත්ති අභිනිබ්බත්ති පාතුභාවො, අයං සාතාසාතානං භවො. කතමො සාතාසාතානං විභවො ? යො සාතාසාතානං ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං, අයං සාතාසාතානං විභවො; **යමෙතමත්ථන්ති** යං පරමත්ථන්ති – 'විභවං භවඤ්චාපි යමෙතමත්ථං.'

**එතං මෙ පබ්‍රූහි යතොනිදානන්ති** – 'එත'න්ති[2] යං පුච්ඡාමි, යං යාචාමි, යං අජ්ඣෙසාමි,[1] යං පසාදෙමි; **පබ්‍රූහීති** බ්‍රූහි වදෙහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහී'ති එතං මෙ පබ්‍රූහි; **යතොනිදානන්ති** යන්නිදානං යං සමුදයං යඤ්ජාතිකං යම්පභවන්ති – 'එතං මෙ පබ්‍රූහි යතොනිදානං.'

තෙනාහ සො නිම්මිතො:

> "සාතං අසාතඤ්ච කුතොනිදානා
> කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ,
> විභවං භවඤ්චාපි යමෙතමත්ථං
> එතං මෙ පබ්‍රූහි යතොනිදාන"න්ති.

## 11 - 9

> ඵස්සනිදානං සාතං අසාතං
> ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ,
> විභවං භවං චාපි යමෙතමත්ථං
> එතං තෙ පබ්‍රූමි ඉතොනිදානං.

---

1. අජ්ඣෙසාමි - සීමු. II. මජ්සං. 2. එතං මෙති - සීමු. I.

**සාතං අසාතං ච කුතොනිදානා** - සාත අසාතවෙදනාවෝ කුමක් නිදාන කොට ඇත්තාහු ද? කොයින් උපන්නාහු ද? කොයින් හට-ගත්තාහු ද? කොයින් නිපන්නාහු ද? කොයින් පහළ වූවාහු ද? කුමක් කරුණු කොට ඇත්තාහු ද? කුමක් සමුදය කොට - කුමක් ජාති කොට කුමක් ප්‍රභව කොට ඇත්තාහු දැ'යි සාතාසාතයන්ගේ මූලය විචාරති... සමුදය විචාරති, පුළුවුස්ති අයැදිති අධ්‍යෙෂණ කෙරෙති පහදවත් නුයි 'සාතං අසාතං ච කුතොනිදානා' යනු වේ.

**කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ** - කුමක් අවිද්‍යමාන කල්හි අසංවිද්‍යමාන කල්හි නැති කල්හි නො ලැබෙන කල්හි සාතවෙදනාත් අසාතවෙදනාත් නො වෙත් ද, නූපදිත් ද, නො හටගනිත් ද, නො නිපදිත් ද, නො පහළ වෙත් දැ'යි 'කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ' යනු වේ.

**විභවං භවඤ්චාපි යමෙතමත්ථං**-සාතාසාතයන්ගේ භවය (-හට ගැනීම) කවරේ ද යත්? සාතාසාතයන්ගේ යම් භවයෙක් ප්‍රභවයෙක් ජාතියෙක් සඤ්ජාතියෙක් නිර්වෘත්තියෙක් අභිනිර්වෘත්තියෙක් ප්‍රාදුර්භාවයෙක් වේ ද මේ සාතාසාතයන්ගේ ඉපැදීම යැ; සාතාසාතයන්ගේ විනාශය කවරේ ද යත්? සාතාසාතයන්ගේ යම් ක්‍ෂය වීමෙක් ව්‍යය වීමෙක් බිඳීමෙක් භාත්පසින් බිඳීමෙක් අනිත්‍ය බවෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ සාතාසාතයන්ගේ විනාශය යි. **යමෙතමත්ථං** යනු: යම් පරමාර්ථයෙක් නුයි 'විභවං භවඤ්චාපි යමෙතමත්ථං' යනු වේ.

**එතං මෙ පබ්‍රෑහි යතොනිදානං** - 'එතං' යනු: යමක් විචාරම් ද, යමක් අයදිම් ද, යමක් අධ්‍යෙෂණය කෙරෙම් ද, යමක් පහදවම් ද; **පබ්‍රෑහි** - කියනු මැනව, වදාළ මැනව, ප්‍රකාශ කළ මැනව, දෙසුව මැනව, පනවනු මැනව, තබනු මැනව, විවෘත කළ මැනව, විභාග කළ මැනව, ප්‍රකට කළ මැනව, ප්‍රකාශ කළ මැනවැ'යි 'එතං මෙ පබ්‍රෑහි' යනු වේ. **යතොනිදානං** - යම් කරුණක් යම් සමුදයක් යම් ඉපැදීමක් යම් ප්‍රභවයක් නුයි 'එතං මෙ පබ්‍රෑහි යතොනිදානං' යනු වේ.

එයින් කිහ ඒ නිර්මිත බුදුහු:

**"සාතං අසාතං ච -පෙ- එතං මෙ පබ්‍රෑහි යතොනිදානං"**යි.

**11 - 9**

සුඛවෙදනාව ද, දුක්වෙදනාව ද ස්පර්ශය ප්‍රත්‍යය කොට ඇත්තේ ය, ස්පර්ශය අවිද්‍යමාන කල්හි මොවුහු නො පහළ වෙති, (සුවදුක් වෙදනාවන් ගේ) විනාශය ද ඉපැදීම ද යන යම් අර්ථයෙක් මේ පහස කරුණු කොට උපදී ද, තෙල අර්ථය ඔබට කියමි.

**ඵස්සනිදානං සාතං අසාතන්ති** – සුඛවෙදනියං ඵස්සං පටිච්ච උප්පජ්ජති සුඛා වෙදනා. යා තස්සෙව සුඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං සුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා සුඛවෙදනා, සා නිරුජ්ඣති, සා වූපසම්මති. දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති දුක්ඛා වෙදනා. යා තස්සෙව දුක්ඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං දුක්ඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා දුක්ඛා වෙදනා, සා නිරුජ්ඣති; සා වූපසම්මති[1]. අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පජ්ජති අදුක්ඛමසුඛා වෙදනා. යා තස්සෙව අදුක්ඛමසුඛවෙදනීයස්ස ඵස්සස්ස නිරොධා යං තජ්ජං වෙදයිතං අදුක්ඛමසුඛවෙදනීයං ඵස්සං පටිච්ච උප්පන්නා අදුක්ඛමසුඛා වෙදනා, සා නිරුජ්ඣති; වූපසම්මති. **ඵස්සනිදානං සාතං අසාතන්ති** සාතාසාතා ඵස්සනිදානා ඵස්සසමුදයා ඵස්සජාතිකා ඵස්සපභවා'ති – 'ඵස්සනිදානං සාතං අසාතං.'

**ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙති** – ඵස්සෙ අසන්තෙ අසංවිජ්ජමානෙ නත්ථි අනුපලබ්භමානෙ සාතා අසාතා න භවන්ති නප්පභවන්ති න ජායන්ති න සඤ්ජායන්ති න නිබ්බත්තන්ති නාභිනිබ්බත්තන්තී'ති – 'ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ'.

**විභවං භවඤ්චාපි යමෙතමත්ථන්ති** – භවදිට්ඨිපි ඵස්සනිදානා විභවදිට්ඨිපි ඵස්සනිදානා; **යමෙතමත්ථන්ති** යං පරමත්ථන්ති – 'විභවං භවං චාපි යමෙතමත්ථං.'

**එතං තෙ පබ්‍රූමි ඉතොනිදානන්ති** – 'එත'න්ති යං පුච්ඡසි, යං යාචසි, යං අජ්ඣෙසසි, යං පසාදෙසි; **පබ්‍රූමීති** බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති – 'එතං තෙ පබ්‍රූමි.' **ඉතොනිදානන්ති** ඉතො ඵස්සනිදානං ඵස්සසමුදයං ඵස්සජාතිකං ඵස්සපභවන්ති – 'එතං තෙ පබ්‍රූමි ඉතොනිදානං.'

තෙනාහ භගවා:

"ඵස්සනිදානං සාතං අසාතං
ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ,
විභවං භවඤ්චාපි යමෙතමත්ථං
එතං තෙ පබ්‍රූමි ඉතොනිදාන"න්ති.

## 11 - 10

ඵස්සො නු ලොකස්මිං කුතොනිදානො
පරිග්ගහා චාපි කුතො පහූතා,
කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි
කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා.

**ඵස්සනිදානං සාතං අසාතං** – 'සුඛවේදනාවට කරුණු වූ පහස නිසා සුඛවේදනාව උපදී. එ මැ සුඛවේදනීය වූ ස්පර්ශයාගේ නිරෝධයෙන් තදනුරූප වේදනා ඇති සුඛවේදනීය වූ යම් පහසක් නිසා උපන් යම් සුඛවේදනාවක් වී නම්, එය නිරුද්ධ වෙයි. එය සන්හිඳෙයි. දුක්වේදනාවට නිමිත්ත වූ පහස නිසා දුක් වේදනා උපදී, එ මැ දුඃඛවේදනීය වූ ස්පර්ශයාගේ නිරෝධයෙන් තදනුරූප වූ වේදනා ඇති දුඃඛවේදනීය වූ යම් පහසක් නිසා උපන් යම් දුක් වේදනාවක් වූ නම්, එය නිරුද්ධ වෙයි. එය සන්හිඳෙයි. උපෙක්ෂාවේදනාවට නිමිත්ත වූ ස්පර්ශය නිසා උපෙක්ෂාවේදනාව උපදී. එ මැ උපෙක්ෂාවේදනාවට හිත වූ ස්පර්ශයාගේ නිරෝධයෙන් තදනුරූප වේදනා ඇති උපෙක්ෂා-වේදනාවට හිත වූ යම් පහසක් නිසා උපන් යම් උපෙක්ෂාවේදනාවක් වූ නම් එය නිරුද්ධ වෙයි. එය සන්හිඳෙයි. **ඵස්සනිදානං සාතං අසාතං**– සුවදුක් වේදනාවෝ පහස නිදාන කොට ඇත්තාහු ය, පහස සමුදය කොට ඇත්තාහු ය, පහස ජාති කොට ඇත්තාහු ය, ස්පර්ශය ප්‍රභව කොට ඇත්තාහු නුයි – 'ඵස්සනිදානං සාතං අසාතං' යනු වේ.

**ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ** – ස්පර්ශය අවිද්‍යමාන කල්හි අසංවිද්‍යමාන කල්හි නැති කල්හි නො ලැබෙන කල්හි සාතාසාතයෝ නො වෙති, ප්‍රභව නො වෙති, නූපදිති, නො හටගනිති, නො නිපදිති, නො වැඩෙති, නො පහළ වෙත් නුයි 'ඵස්සෙ අසන්තෙ න භවන්ති හෙතෙ' යනු වේ.

**විභවං භවඤ්චාපි යමෙතමත්ථං** – භවදෘෂ්ටිය ද ස්පර්ශය නිදාන කොට ඇත්තීය, විභවදෘෂ්ටිය ද ස්පර්ශය නිදාන කොට ඇත්තීය; **යමෙතමත්ථං**= යම් පරමාර්ථයක් නුයි 'විභවං භවඤ්චාපි යමෙතමත්ථං' යනු වේ.

**එතං තෙ පබ්‍රෑමි ඉතොනිදානං** – 'එතං' යනු: යමක් විචාරවූ ද; යමක් අයැදිවූ ද, යමක් අධ්‍යෙෂණ කරවූ ද, යමක් (සදහා) පහදවවූ ද, **පබ්‍රෑමි** – කියමි පවසමි දෙසමි පනවමි තබමි විවෘත කෙරෙමි විභාග කෙරෙමි ප්‍රකට කෙරෙමි, ප්‍රකාශ කෙරෙම් නුයි 'එතං තෙ පබ්‍රෑමි' යනු වේ. **ඉතොනිදානං** – මේ පහස නිදාන කොට ඇත්තේය, පහස උත්පත්ති කොට ඇත්තේ ය, පහස ජාති කොට ඇත්තේ ය, ස්පර්ශය ප්‍රභව කොට ඇත්තේ නුයි 'එතං තෙ පබ්‍රෑමි ඉතොනිදානං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**ඵස්සනිදානං** –පෙ– **එතං තෙ පබ්‍රෑමි ඉතොනිදානං**"යි.

## 11 – 10

ලොකයෙහි ස්පර්ශ තෙමේ කුමක් නිදාන (-මූලකාරණ) කොට ඇත්තේ ද ? තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහයෝ ත් කොතැනින් පහළ වූවාහු ද ? කුමක් අවිද්‍යමාන කල්හි තෘෂ්ණාදෘෂ්ටිමමත්වය නැත්තේ ද ? කුමක් ඉක්මැගිය කල්හි (චක්ඛුසම්ඵස්සාදි) පහස්හු ස්පර්ශ නො කෙරෙත් ද?

**එසො නු ලොකස්මිං කුතොනිදානොති** - එසො කුතො නිදානො? කුතො ජාතො? කුතො සඤ්ජාතො? කුතො නිබ්බත්තො? කුතො අභිනිබ්බත්තො? කුතො පාතුභූතො? කින්නිදානො? කිං සමුදයො? කිඤ්ජාතිකො? කිම්පභවොති එස්සස්ස මූලං පුච්ඡති, හෙතුං පුච්ඡති -පෙ- සමුදයං පුච්ඡති, පපුච්ඡති, යාචති, අජ්ඣෙසති, පසාදෙතීති - එසො නු ලොකස්මිං කුතොනිදානො.

**පරිග්ගහා චාපි කුතො පහූතාති** - පරිග්ගහා කුතො පහූතා? කුතො ජාතා? කුතො සඤ්ජාතා? කුතො නිබ්බත්තා? කුතො අභිනිබ්බත්තා? කුතො පාතුභූතා? කින්නිදානා? කිංසමුදයා? කිඤ්ජාතිකා? කිම්පභවාති පරිග්ගහානං මූලං පුච්ඡති, හෙතුං පුච්ඡති, -පෙ- සමුදයං පුච්ඡති, පපුච්ඡති යාචති අජ්ඣෙසති පසාදෙතීති - පරිග්ගහා චාපි කුතො පහූතා.

**කිස්මිං අසන්තෙ න මමත්තමත්ථීති** - කිස්මිං අසන්තෙ අසංවිජ්ජ-මානෙ[1] අනුපලබ්භමානෙ මමත්තා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නූපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිපස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති - කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි.

**කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සාති** - කිස්මිං විභූතෙ විභාවිතෙ අතික්කන්තෙ සමතික්කන්තෙ වීතිවත්තෙ ඵස්සා න ඵුසන්තී'ති - කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා.

තෙනාහ සො නිම්මිතො:

> "එසො නු ලොකස්මිං කුතොනිදානො
> පරිග්ගහා චාපි කුතො පහූතා,
> කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි
> කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා"ති.

## 11 - 11

> නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො
> ඉච්ඡානිදානානි පරිග්ගහානි,
> ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථි
> රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා.

**නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සොති** - චක්ඛුං ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; චක්ඛු ච[2] රූපා ච රූපස්මිං, චක්ඛුසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො;

1. අසංවිජ්ජමානෙ නත්ථි - මජසං සීමු.II. 2. චක්ඛුං ච සීමු. II.

**ඵස්සො නු ලොකස්මිං කුතොනිදානො** - පහස කුමක් කරුණු කොට ඇත්තේ ද? කොයින් උපන්නේ ද? කොයින් හටගත්තේ ද? කොයින් නිපන්නේ ද? කොයින් වැඩුණේ ද? කොතැනින් පහළ වූයේ ද? කුමක් නිදාන කොට ඇත්තේ ද? කුමක් සමුදය කොට - කුමක් ජාති කොට - කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ'යි ස්පර්ශයාගේ මූලය විචාරති, හේතුව විචාරති...සමුදය විචාරති, අසති, අයැදිති, අධ්‍යෙෂණ කෙරෙති, පහදවත් නුයි 'ඵස්සො නු ලොකස්මිං කුතොනිදානො' යනු වේ.

**පරිග්ගහා චාපි කුතො පහූතා** - පරිග්‍රහයෝ කොයින් වූවාහු ද? කොයින් උපන්නාහු ද? කොයින් හටගත්තාහු ද? කොයින් නිපන්නාහු ද? කොයින් වැඩුණාහු ද? කොයින් පහළ වූවාහු ද? කුමක් නිදාන කොට ඇත්තාහු ද? කුමක් සමුදය කොට ඇත්තාහු ද? කුමක් ජාති කොට ඇත්තාහු ද? කුමක් ප්‍රභව කොට ඇත්තාහු දැ'යි පරිග්‍රහයන්ගේ මූලය විචාරති, හෙතුව විචාරති...සමුදය විචාරති, පුළුවුස්ති, යාඥා කෙරෙති අධ්‍යෙෂණ කෙරෙති, පහදවත් නුයි - 'පරිග්ගහා චාපි කුතො පහූතා' යනු වේ.

**කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි**-කුමක් අවිද්‍යමාන කල්හි අසංවිද්‍යමාන කල්හි නො ලැබෙන කල්හි මමත්වයෝ නැත් ද, අවිද්‍යමාන වෙත් ද අසංවිද්‍යමාන වෙත් ද නො ලැබෙත් ද ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු දුරලන ලද්දාහු උපතට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි 'කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි' යනු වේ.

**කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා** - කුමක් ඉක්මැවූ කල්හි නො වැඩූ කල්හි ඉක්මැගිය කල්හි මොනවට ඉක්මැගිය කල්හි ව්‍යතික්‍රමණය කළ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත් දැයි 'කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

**"ඵස්සො නු ලොකස්මිං -පෙ- කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා"**යි.

## 11 - 11

සම්ප්‍රයුක්ත නාමය ද වස්ත්වාලම්බන රූපය ද නිසා ස්පර්ශය වෙයි, තෘෂ්ණාදෘෂ්ටිපරිග්‍රහයෝ ඉච්ඡා (-ආශා) ව නිදාන කොට ඇත්තාහු ය, ඉච්ඡාසංඛ්‍යාත තෘෂ්ණාව නැති කල්හි මමත්වය නැත්තේ ය, රූපය ඉක්මැගිය කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත්.

**නාමං ච රූපං ච පටිච්ච ඵස්සො** - චක්ෂුස ද රූපයන් ද නිසා චක්ෂුර්-විඥානය උපදී, (චක්ඛුරූප විඥාන යන) තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය උපදී; ප්‍රසාද චක්ෂුස ද රූපාලම්බනයෝ ද රූප කොටසෙහි වෙති, (තිදෙනාගේ සංගතියෙන් උපන්) චක්ෂුසම්ඵස්සය හැර (සෙසු) සම්ප්‍රයුක්තධර්මයෝ නාම කොටසෙහි වෙති, මෙසේ ත් නාමය ත් රූපයත් නිසා ස්පර්ශය උපදී;

සොතඤ්ච පටිච්ච සද්දෙ ච උප්පජ්ජති සොතවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; සොතඤ්ච සද්දා ච රූපස්මිං, සොතසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො. ඝානඤ්ච පටිච්ච ගන්ධෙ ච උප්පජ්ජති ඝානවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; ඝානඤ්ච ගන්ධා ච රූපස්මිං, ඝානසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං; එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො. ජිව්හඤ්ච පටිච්ච රසෙ ච උප්පජ්ජති ජිව්හාවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; ජිව්හා ච රසා ච රූපස්මිං, ජිව්හාසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො. කායඤ්ච පටිච්ච ඵොට්ඨබ්බෙ ච උප්පජ්ජති කායවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; කායො ච ඵොට්ඨබ්බා ච රූපස්මිං, කායසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො. මනඤ්ච පටිච්ච ධම්මෙ ච උප්පජ්ජති මනොවිඤ්ඤාණං, තිණ්ණං සඞ්ගති ඵස්සො; වත්ථුරූපං රූපස්මිං, ධම්මා රූපිනො රූපස්මිං, මනොසම්ඵස්සං ඨපෙත්වා සම්පයුත්තකා ධම්මා නාමස්මිං, එවම්පි නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො.

**ඉච්ඡානිදානානි පරිග්ගහානීති** – 'ඉච්ඡා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **පරිග්ගහාති** ද්වෙ පරිග්ගහා: තණ්හාපරිග්ගහො ච දිට්ඨිපරිග්ගහො ච -පෙ- අයං තණ්හාපරිග්ගහො -පෙ- අයං දිට්ඨිපරිග්ගහො. **ඉච්ඡානිදානානි පරිග්ගහානීති** පරිග්ගහා ඉච්ඡානිදානා ඉච්ඡාහෙතුකා ඉච්ඡාපච්චයා ඉච්ඡාකාරණා ඉච්ඡාපභවාති – ඉච්ඡානිදානානි පරිග්ගහානි.

**ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථී**'ති – 'ඉච්ඡා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **මමත්තා**ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච දිට්ඨිමමත්තඤ්ච -පෙ- ඉදං තණ්හාමමත්තං -පෙ- ඉදං දිට්ඨිමමත්තං; **ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථීති** ඉච්ඡාය අසන්ත්‍යා අසංවිජ්ජමානාය නත්ථි අනුපලබ්භමානාය මමත්තා නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති, පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථි.

**රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සාති** – 'රූපෙ'ති චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං; **රූපෙ විභූතෙති** චතූහාකාරෙහි රූපං විභූතං හොති. ඤාතවිභූතෙන[1] තීරණවිභූතෙන පහානවිභූතෙන සමතික්කමවිභූතෙන. කථං ඤාතවිභූතෙන[2] රූපං විභූතං හොති? රූපං ජානාති යං කිඤ්චි රූපං, සබ්බං රූපං චත්තාරි ච මහාභූතානි චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපන්ති ජානාති පස්සති

1. ඤාණවිභූතෙන - සීමු. II ඤාතවිතිවතෙන- ස. 2. ඤාණවිභූතෙන - සීමු. II.

ශ්‍රොත්‍රප්‍රසාදය ද ශබ්දයන් ද නිසා ශ්‍රොත්‍රවිඥානය උපදී, තිදෙනා ගේ එක්වීමෙන් ස්පර්ශය උපදී; ශ්‍රොත්‍රප්‍රසාදයත් ශබ්දයෝත් රූප කොට්ඨාසෙහි වෙති; සොතසම්ඵස්සය හැර (සෙසු) සම්ප්‍රයුක්ත ධර්මයෝ නාම කොටසෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී. ඝ්‍රාණය ද ගන්ධයන් ද නිසා ඝ්‍රාණවිඥානය උපදී, තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි; ඝ්‍රාණයත් ගන්ධයෝත් රූපයෙහි වෙති, ඝ්‍රාණසංස්පර්ශය හැර (සෙසු) සම්ප්‍රයුක්තධර්මයෝ නාමයෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී. දිව ද රසයන් ද නිසා ජිහ්වාවිඥානය උපදී, තිදෙනා ගේ සඞ්ගතියෙන් ස්පර්ශය වෙයි; දිවත් රසයෝත් රූපයෙහි වෙති, ජිහ්වාසංස්පර්ශය හැර සම්ප්‍රයුක්තධර්මයෝ නාමයෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී. කය ද ස්ප්‍රෂ්ටව්‍යයන් ද නිසා කායවිඥානය උපදී, තිදෙනාගේ සඞ්ගතියෙන් ස්පර්ශය වෙයි; කයත් ස්ප්‍රෂ්ටව්‍යයෝත් රූපයෙහි වෙති, කායසංස්පර්ශය හැර සම්ප්‍රයුක්තධර්මයෝ නාමයෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී, මනස ද ධර්මයන් ද නිසා මනොවිඥානය උපදී, තිදෙනාගේ සඞ්ගතියෙන් ස්පර්ශය වෙයි; හෘදයවස්තුරූපය රූපයෙහි වෙයි, රූපී ධර්මයෝ රූපයෙහි වෙති, මනස්සංස්පර්ශය හැර සම්ප්‍රයුක්තධර්මයෝ නාමයෙහි වෙති, මෙසේත් නාමයත් රූපයත් නිසා ස්පර්ශය උපදී.

**ඉච්ඡානිදානානි පරිග්ගහානි** – 'ඉච්ඡා'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්....අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **පරිග්ගහා** – පරිග්‍රහයෝ දෙදෙනෙකි: තෘෂ්ණාපරිග්‍රහය ද දෘෂ්ටිපරිග්‍රහය දැයි... මේ දෘෂ්ටිපරිග්‍රහය යි. **ඉච්ඡානිදානානි පරිග්ගහානි** – පරිග්‍රහයෝ ඉච්ඡා (–ඊප්සා) ව නිදාන කොට ඇත්තාහ, ඊප්සාව හෙතු කොට ඇත්තාහ, ඊප්සාව ප්‍රත්‍යය කොට ඇත්තාහ, ඊප්සාව කාරණ කොට ඇත්තාහ, ඊප්සාවෙන් පහළවූවාහු නුයි – 'ඉච්ඡානිදානානි පරිග්ගහානි' යනු වේ.

**ඉච්ඡාය'සන්‍යා න මමත්තමත්‍ථි** – 'ඉච්ඡා'යි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් සංරාගයෙක්...ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි; **මමත්තා**– මමත්වයෝ දෙදෙනෙකි: තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය දැයි...මේ දෘෂ්ටිමමත්වය යි. **ඉච්ඡාය'සන්‍යා න මමත්තමත්‍ථි** – ඊප්සාව අවිද්‍යමාන කල්හි අසංවිද්‍යමාන කල්හි නැති කල්හි නො ලැබෙන කල්හි මමත්වයෝ නැත, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙත්, ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්සිඳුණාහු දුරලන ලද්දාහු උපතට නුසුදුසු වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි 'ඉච්ඡාය'සන්‍යා න මමත්තමත්‍ථි' යනු වේ.

**රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා** – 'රූපෙ' යනු: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද; **රූපෙ විභූතෙ** – සතර අයුරකින් රූපය ඉක්මවන ලද වෙයි; ඥාතවිභූතයෙන් තීරණවිභූතයෙන් ප්‍රහාණවිභූතයෙන් සමතික්‍රමවිභූතයෙනි: කිසෙයින් ඥාතවිභූතයෙන් රූපය විභූත (–ඉක්මවන ලද) වේ ද යත්? රූපය (මෙසේ) දැන ගනී. යම් කිසි රූපයෙක් වේ නම්, සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය දැයි සියලු රූපය දැන ගනි, දකි;

එවං ඤාතවිභූතෙන රූපං විභූතං හොති. කථං තීරණවිභූතෙන රූපං විභූතං හොති? එවං ඤාතං කත්වා රූපං තීරෙති; අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපසග්ගතො චලතො පභඞ්ගුරතො[1] අද්ධුවතො අතාණතො අලෙනතො අසරණතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරකතො[2] අඝමූලතො වධකතො විභවතො සාසවතො සඞ්ඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො බ්‍යාධිධම්මතො මරණධම්මතො සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසධම්මතො සඞ්කිලෙසිකධම්මතො සමුදයතො අත්ථඞ්ගමතො අස්සාදතො[3] ආදීනවතො නිස්සරණතො තීරෙති. එවං තීරණවිභූතෙන රූපං විභූතං හොති. කථං පහානවිභූතෙන රූපං විභූතං හොති? එවං තීරයිත්වා රූපෙ ඡන්දරාගං පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. වුත්තං හෙතං භගවතා: "යො භික්ඛවෙ රූපෙ ඡන්දරාගො, තං පජහථ; එවං තං රූපං පහීනං භවිස්සති උච්ඡින්නමූලං තාලාවත්ථුකතං[4] අනභාවකතං ආයතිං අනුප්පාදධම්ම"න්ති.[a] එවං පහානවිභූතෙන රූපං විභූතං හොති. කථං සමතික්කමවිභූතෙන රූපං විභූතං හොති? චතස්සො අරූපසමාපත්තියො පටිලද්ධස්ස රූපා විභූතා හොන්ති විභාවිතා අතික්කන්තා සමතික්කන්තා වීතිවත්තා. එවං සමතික්කමවිභූතෙන රූපං විභූතං හොති. ඉමෙහි චතූහි කාරණෙහි රූපං විභූතං හොති. **රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සාති** රූපෙ විභූතෙ විභාවිතෙ අතික්කන්තෙ සමතික්කන්තෙ වීතිවත්තෙ පඤ්ච ඵස්සා න ඵුසන්ති: චක්ඛුසම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො – රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා.

තෙනාහ භගවා:

"නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සො
ඉච්ඡානිදානානි පරිග්ගහානි,
ඉච්ඡාය'සන්ත්‍යා න මමත්තමත්ථි
රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා"ති.

**11 - 12**

කථං සමෙතස්ස විභොති රූපං
සුඛං දුඛං[5] චාපි කථං විභොති,
එතං මෙ පබ්‍රූහි යථා විභොති
තං ජානිසාම ඉති[6] මෙ මනො අහු.

1. පභඞ්ගතො - PTS. පභඞ්ගුතො - ස. 2. අසරණතො - ස්‍යා
3. අසාරතො - සීමු.II. 4. තාලවත්ථුකතං - ස.
5. දුක්ඛං - ස්‍යා මනුප. PTS. දුඛඤ්චාපි - මජසං.
6. ජානිස්සාමාති - සීමු.II. මජසං. a. ඛන්ධසංයුත්ත - භාරවග්ග.

මෙසෙයින් ඥතවිභූතයෙන් (නුවණින් ඉක්මවීමෙන්) රූපය විභූත වෙයි. කිසෙයින් තීරණවිභූතයෙන් රූපය විභූත වේ ද යත්? මෙසේ ප්‍රකට කොට රූපය තීරණය කෙරෙයි: අනිත්‍ය හෙයින් දුඃඛ හෙයින් රෝග හෙයින් ගණ්ඩ හෙයින් සල්‍ය හෙයින් ව්‍යසන හෙයින් ආබාධ හෙයින් පර හෙයින් පලෝක (-බිඳීම්) හෙයින් ඊති (-විපත්ති) හෙයින් උපද්‍රව හෙයින් භය හෙයින් උපසර්ග හෙයින් සැලෙන හෙයින් බිඳෙනසුලු හෙයින් අධ්‍රැව (-අස්ථිර) හෙයින් අත්‍රාණ හෙයින් අලෙන හෙයින් අසරණ හෙයින් රිත්ත (-හිස්) හෙයින් තුච්ඡ හෙයින් ශූන්‍ය හෙයින් අනාත්ම හෙයින් ආදීනව හෙයින් විපරිණාමස්වභාව හෙයින් අසාර හෙයින් ව්‍යසනමූල හෙයින් වධක හෙයින් විගතභව හෙයින් සාස්‍රව හෙයින් සංඛත (-හේතුප්‍රත්‍යයෙන් සකස් කළ) හෙයින් මාරාමිෂ හෙයින් ජාතිධර්ම (ජාතිය පියවි කොට ඇති) හෙයින් ජරාධර්ම හෙයින් ව්‍යාධිධර්ම හෙයින් මරණධර්ම හෙයින් ශෝකපරිදෙවදුඃඛ-දෞර්මනස්‍යඋපායාසධර්ම හෙයින් සංක්ලෙශධර්ම (-තෘෂ්ණාදි සංක්ලෙශයන්ට විෂයස්වභාව) හෙයින් සමුදය හෙයින් අස්තඞ්ගම හෙයින් ආස්වාද හෙයින් ආදීනව හෙයින් නිස්සරණ හෙයින් තීරණ කෙරෙයි, මෙසෙයින් තීරණ-විභූතයෙන් රූපය විභූත වෙයි. කිසෙයින් ප්‍රහාණවිභූතයෙන් රූපය විභූත වේ ද යත්? මෙසේ තීරණය කොට රූපයෙහි ඡන්දරාගය දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි; මේ වදාරන ලද මැයි, භාග්‍යවතුන් විසින්: "මහණෙනි, රූපයෙහි යම් ඡන්දරාගයෙක් වේ නම්, එය දුරු කරවු, මෙසේ ඒ රූපය ප්‍රහීණ වන්නේ ය, උපුත් මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරන ලද්දේ අනභාවය කරන ලද්දේ මතු නූපදනා පියවි ඇත්තේ යැ"යි. මෙසෙයින් ප්‍රහාණවිභූතයෙන් රූපය විභූත වෙයි. කිසෙයින් සමතික්‍රමවිභූතයෙන් රූපය විභූත වේ ද යත්? සතර අරූපසමාපත්තීන් ලද්දහු විසින් රූපයෝ ඉක්මවන ලද්දහු විභාවිත වූවාහු අතික්‍රමණය-සමතික්‍රමණය-ව්‍යතික්‍රමණය කරන ලද්දහු වෙති; මෙසෙයින් සමතික්‍රමවිභූතයෙන් රූපය විභූත වෙයි. මේ සතර කාරණයන් ගෙන් රූපය විභූත වේ. රූපය විභූත වූ (ඉක්මවූ) කල්හි ස්පර්ශ නො කෙරෙත්. ඵස්සා - රූපය විභූත කල්හි විභාවිත කල්හි අතික්‍රාන්ත කල්හි සමතික්‍රාන්ත කල්හි ඉක්මගිය කල්හි චක්ඛුසම්ඵස්ස සෝතසම්ඵස්ස ඝානසම්ඵස්ස ජිව්හාසම්ඵස්ස කායසම්ඵස්ස යන පස්ව ස්පර්ශයෝ ස්පර්ශ නො කෙරෙත් තුයි - 'රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"නාමං ච රූපං ච -පෙ- රූපෙ විභූතෙ න ඵුසන්ති ඵස්සා"යි.

**11 - 12**

කෙසේ පිළිපන්නහුට රූපය නො වේ ද? යළි සැප දුක් (ඉටු අනිටු රූපය) හෝ කෙසේ නො වේ ද? තෙල (රූප - සුඛ - දුක්ඛය) යම් සේ නො වේ නම් (එසේ) මට දෙශනා කළ මැනව, එය දැන ගනුම්හ'යි මට සිතෙක් වී.

**කථං සමෙතස්ස විභොති රූපන්ති** – 'කථං සමෙතස්සා'ති කථං සමෙතස්ස, කථං පටිපන්නස්ස, කථං ඉරියන්තස්ස, කථං වත්තන්තස්ස, කථං පාලෙන්තස්ස, කථං යපෙන්තස්ස, කථං යාපෙන්තස්ස රූපං විභොති, විභාවීයති[1] අතික්කමීයති[2] සමතික්කමීයති, වීතිවත්තීයතීති– කථං සමෙතස්ස විභොති රූපං.

**සුඛං දුඛං වාපි කථං විභොතීති** – සුඛං ච දුක්ඛං ච කථං විභොති විභාවීයති අතික්කමීයති සමතික්කමීයති වීතිවත්තීයතීති – සුඛං දුඛං වාපි කථං විභොති.

**එතං මෙ පබ්‍රූහි යථා විභොතීති** – 'එත'න්ති යං පුච්ඡාමි, යං යාචාමි, යං අජ්ඣෙසාමි[3] යං පසාදෙමීති එතං; **මෙ පබ්‍රූහීති** මෙ පබ්‍රූහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති එතං මෙ පබ්‍රූහි; **යථා විභොතීති** යථා විභොති විභාවීයති අතික්කමීයති සමතික්කමීයති වීතිවත්තීයතීති – එතං මෙ පබ්‍රූහි යථා විභොති.

**තං ජානිස්සාම ඉති මෙ මනො අහූති** – 'තඤ්ජානිස්සාමා'ති තං ජානෙය්‍යාම ආජානෙය්‍යාම[4] විජානෙය්‍යාම පටිවිජානෙය්‍යාම පටිවිජ්ඣෙය්‍යාමා'ති; තං ජානිස්සාම; **ඉති මෙ මනො අහූති** ඉති මෙ මනො අහු, ඉති මෙ චිත්තං අහු, ඉති මෙ සඞ්කප්පො අහු, ඉති මෙ විඤ්ඤාණං අහූති – තං ජානිස්සාම ඉති මෙ මනො අහු.

තෙනාහ සො නිම්මිතො:

"කථං සමෙතස්ස විභොති රූපං
සුඛං දුඛං වාපි කථං විභොති,
එතං මෙ පබ්‍රූහි යථා විභොති
තං ජානිස්සාම ඉති මෙ මනො අහූ"ති.

## 11 - 13

න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී
නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී,
එවං සමෙතස්ස විභොති රූපං
සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා.

**න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤීති** – සඤ්ඤසඤ්ඤිනො වුච්චන්ති යෙ පකතිසඤ්ඤාය ඨිතා, නපි සො පකතිසඤ්ඤාය ඨිතො; විසඤ්ඤසඤ්ඤිනො වුච්චන්ති උම්මත්තකා, යෙ ච ඛිත්තචිත්තා; නපි සො උම්මත්තකො, නොපි ඛිත්තචිත්තොති – න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී.

---

1. විභාවියති සීමු. II. PTS. 2. අතික්කමියති - සීමු. II. PTS.
3. අජ්ඣෙසාමි - සීමු. II. 4. පජානෙය්‍යාම - ස.

**කථං සමෙතස්ස විභොති රූපං** – 'කථං සමෙතස්ස' යනු: කෙසේ යෙදුණහුට කෙසේ පිළිපන්නහුට කෙසේ ඉරියවු පවත්වන්නහුට කෙසේ වැටෙන්නහුට කෙසේ පාලනය වන්නහුට කෙසේ යැපෙන්නහුට කෙසේ යපනය වන්නහුට රූපය නො වේ ද? නො පැවැතේ ද? ඉක්මවනු ලැබේ ද? මොනොවට ඉක්මවනු ලැබේ ද? වෙසෙසින් ඉක්මවනු ලැබේ දැ'යි – 'කථං සමෙතස්ස විභොති රූපං' යනු වේ.

**සුඛං දුඛං වා'පි කථං විභොති** – සුවය ද දුක ද කෙසේ නො වේ ද? නො පැවැතේ ද? ඉක්මවනු ලැබේ ද? මොනොවට ඉක්මවනු ලැබේ ද? වෙසෙසින් ඉක්මවනු ලැබේ දැ'යි – 'සුඛං දුඛං වා'පි කථං විභොති' යනු වේ.

**එතං මෙ පබ්‍රෑහි යථා විභොති** – 'එතං' යනු: යමක් විචාරම් ද, යමක් යදිම් ද, යමක් ආරාධනා කෙරෙම් ද, යමක් (සදහා) පහදවම් නුයි – 'එතං' යනු වේ; **මෙ පබ්‍රෑහි** – මට කිව මැනව වදාළ මැනව දෙසුව මැනව පැනවුව මැනව නැබුව මැනව විවෘත කළ මැනව විභාග කළ මැනව ප්‍රකට කළ මැනව ප්‍රකාශ කළ මැනවැ'යි 'එතං මෙ පබ්‍රෑහි, යනු වේ. **යථා විභොති** – යම් සේ නො වේ ද නො පැවැතේ ද අතික්‍රමණ සමතික්‍රමණ කරනු ලැබේ ද වෙසෙසින් ඉක්මවනු ලැබේ දැ'යි – 'එතං මෙ පබ්‍රෑහි යථා විභොති' යනු වේ.

**තං ජානිස්සාම ඉති මෙ මනො අහු** – 'තං ජානිස්සාම' යනු: එය දැනගනුම්හ, හාත්පසින් දැනගනුම්හ වෙසෙසින් දැනගනුම්හ මැනවින් දැනගනුම්හ (සිතින්) අවබොධ කරම්හ'යි, 'තං ජානිස්සාම' යනු වේ. **ඉති මෙ මනො අහු** – මෙසේ මා ගේ මනස විය, මෙසේ මා ගේ සිත විය, මෙසේ මාගේ සඞ්කල්පය විය, මෙසේ මාගේ විඥනය වී නුයි– 'තං ජානිස්සාම ඉති මෙ මනො අහු' යනු වේ.

එයින් කිහ ඒ නිර්මිත බුදුහු:

"**කථං සමෙතස්ස** –පෙ- **ඉති මෙ මනො අහු**"යි.

## 11 - 13

(රූපය නො වන සේ පිළිපන් හෙතෙම) ප්‍රකෘතිසංඥවෙන් සංඥ ඇත්තේ නො වෙයි, විකෘතිසංඥවෙන් විසංඥ වූයේ නො වෙයි, සංඥ විරහිත වූයේ ද නො වෙයි, ඉක්මවූ සංඥ ඇත්තේ ද නො වෙයි, මෙසේ (සංඥ සංඥිතාදිභාවයෙහි නො සිට) පිළිපන්නහුට රූපය නො වෙයි, තෘෂ්ණාදි ප්‍රපඤ්චයෝ සංඥනිදාන කොට ඇත්තාහු ම වෙත් ද එහෙයිනි.

**න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී** – ප්‍රකෘතිසංඥවෙහි සිටි යම් කෙනෙක් වෙත් නම් ඔහු 'සඤ්ඤසඤ්ඤිනු' යයි කියනු ලැබෙති, යථා සමෙතයක්හු ගේ රූපය විභවයට යේ නම්) හෙතෙම ප්‍රකෘතිසංඥයෙහි සිටියේ නො ද වෙයි; උමතුවෝ ද ක්‍ෂිප්තචිත්තයෝ (-යක්උමතුවෝ) ද 'විසඤ්ඤසඤ්ඤිනු' යයි කියනු ලැබෙති, හෙතෙම උමතුවෙක් නො ද වෙයි, ක්‍ෂිප්තචිත්තයෙක් ද නො වේ නුයි – 'න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී' යනු වේ.

**නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤීති** – අසඤ්ඤිනො වුච්චන්ති නිරොධසමාපන්නා යෙ ච අසඤ්ඤසත්තා; නපි සො නිරොධසමාපන්නො, නපි අසඤ්ඤසත්තො. විභූතසඤ්ඤිනො වුච්චන්ති යෙ චතුන්නං ආරුප්පසමාපත්තීනං ලාභිනො; නපි සො චතුන්නං අරූපසමාපත්තීනං ලාභීති– නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී.

**එවං සමෙතස්ස විභොති රූපන්ති** – "ඉධ භික්ඛු සුඛස්ස ච පහානා -පෙ- චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. සො එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ ආකාසානඤ්චායතනසමාපත්තිපටිලාභත්ථාය චිත්තං අභිනීහරති අභිනින්නාමෙති", ආරුප්පමග්ගසමඞ්ගීති. **එවං සමෙතස්සාති** එවං පටිපන්නස්ස එවං ඉරියන්තස්ස එවං වත්තන්තස්ස එවං පාලෙන්තස්ස එවං යපෙන්තස්ස එවං යාපෙන්තස්ස රූපං විභොති විභාවීයති අතික්කමීයති සමතික්කමීයති වීතිවත්තීයතීති – එවං සමෙතස්ස විභොති රූපං.

**සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛාති** – පපඤ්චායෙව පපඤ්චසඞ්ඛා; තණ්හා පපඤ්චසඞ්ඛා, දිට්ඨි පපඤ්චසඞ්ඛා, මානං පපඤ්චසඞ්ඛා; සඤ්ඤානිදානා සඤ්ඤාසමුදයා සඤ්ඤාජාතිකා සඤ්ඤාපභවාති – සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා.

තෙනාහ භගවා:

"න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤසඤ්ඤී
නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී,
එවං සමෙතස්ස විභොති රූපං
සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා'ති.

## 11 - 14

යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො
අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි,
එත්තාවතග්ගං නු[1] වදන්ති හෙකෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ
උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො.

**යං තං අපුච්ඡිම්හ අකිත්තයී නොති** – යං තං අපුච්ඡිම්හ අයාචිම්හ අජ්ඣෙසිම්හ පසාදයිම්හ; **අකිත්තයී නොති** කිත්තිතං ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවටං විභත්තං උත්තානීකතං පකාසිතන්ති–යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො.

1. නො - ස. PTS

**නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී** - නිරෝධසමාපත්ති සමාපන්නයෝ ද අසංඥසත්ත්වයෝ ද 'අසඤ්ඤීහු' යයි කියනු ලැබෙති, හෙතෙම නිරෝධ-සමාපන්නයෙක් නො ද වෙයි, අසංඥසත්ත්වයෙක් ද නො වේ. සතර අරූපසමාපත්තිලාභීහු 'විභූතසඤ්ඤීහු' යයි කියනු ලැබෙති, හෙතෙම සතර අරූපසමාපත්තිලාභී වූයේ ද නො වේ නුයි - 'නො'පි අසඤ්ඤී න විභූතසඤ්ඤී' යනු වේ.

**එවං සමෙතස්ස විභොති රූපං** - 'මෙහි මහණ තෙම සුඛයාගේ ද ප්‍රහාණයෙන්...සතරවැනි ධ්‍යානයට පැමිණ වෙසෙයි, හෙතෙම මෙසේ (සතරවැනි ධ්‍යානයෙන්) සිත එකඟවූ කල්හි (උපෙක්‍ෂා ස්මෘතිපාරිශුද්ධියෙන්) පිරිසිදු කල්හි (පරිශුද්ධ හෙයින්) ප්‍රභාස්වර කල්හි (රාගාදි අඞ්ගන නැසූ හෙයින්) අනඞ්ගන කල්හි (අනඞ්ගන හෙයින් ම) පහවූ උපක්ලේශ ඇති කල්හි (සුභාවිත හෙයින්) මෘදුවූ කල්හි (මෘදු හෙයින් ම) කර්මක්‍ෂම වූ කල්හි (මේ පරිශුද්ධභාවාදියෙහි සිටි හෙයින් ම) ස්ථිත කල්හි (සිටි හෙයින් ම) අචල බවට පැමිණි කල්හි ආකාසානඤ්චායතනසමාපත්තිය ලැබීම සඳහා සිත එලවයි නතුකරයි, අරූපසමාපත්තියෙන් යුක්ත වූයේ යයි; **එවං සමෙතස්ස** - මෙසේ පිළිපන්නහුට මෙසේ ඉරියවු පවත්වන්නහුට මෙසේ වැටෙන්නහුට මෙසේ යැපෙන්නහුට මෙසේ යපනය වන්නහුට රූපය නො වෙයි, නො පැවැතෙයි, ඉක්මවනු ලැබෙයි, මනාකොට ඉක්මවනු ලැබෙයි, වෙසෙසින් ඉක්මවනු ලැබේ නුයි - 'එවං සමෙතස්ස විභොති රූපං' යනු වේ.

**සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා** - ප්‍රපඤ්චයෝ ම 'පපඤ්චසඞ්ඛ' නම් වෙති; තෘෂ්ණාව ප්‍රපඤ්චසඞ්ඛ යැ, දෘෂ්ටිය ප්‍රපඤ්චසඞ්ඛ යැ, මානය ප්‍රපඤ්චසඞ්ඛ යැ, (ඔහු) සංඥව නිදාන කොට ඇත්තාහු සංඥව සමුදය කොට ඇත්තාහු සංඥව ජාති කොට ඇත්තාහු සංඥව ප්‍රභව කොට ඇත්තාහු නුයි - 'සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**න සඤ්ඤසඤ්ඤී** -පෙ- **සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා**"යි.

## 11 - 14

යමක් විචාළමෝ නම්, එය අපට දෙශනා කළහ, අනෙකක්දු ඔබ ගෙන් විචාරම්හ, එ ද වදාළ මැනව, මෙ ලොවැ පණ්ඩිතවාද ඇති ඇතැම් මහණ බමුණු කෙනෙක් මේ අරූපසමාපත්තිමාත්‍රයෙන් ම සත්ත්වයා ගේ අග්‍ර වූ ශුද්ධිය කියත් ද? නොහොත් තෙල අරූපසමාපත්තියෙන් අනෙකු දු ශුද්ධියක් කියත් ද?

**යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො** - යමක් විචාළමෝ යාඥා කළමෝ අධ්‍යෙෂණ කළමෝ පැහැදවූම්හු නම් එය; **අකිත්තයී නො** - කීර්තනය කරන ලද පවසන ලද දෙසන ලද පනවන ලද තබන ලද විවෘත කරන ලද විභාග කරන ලද ප්‍රකට කරන ලද ප්‍රකාශ කරන ලද නුයි- 'යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො' යනු වේ

**අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහී**ති - අඤ්ඤං තං පුච්ඡාම, අඤ්ඤං තං පපුච්ඡාම, අඤ්ඤං තං අජ්ඣෙසාම, අඤ්ඤං තං පසාදෙම, උත්තරිං තං පුච්ඡාම; තදිඞ්ඝ බ්‍රූහීති ඉඞ්ඝ බ්‍රූහි ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති - අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහි.

**එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ**ති - එකෙ සමණබ්‍රාහ්මණා එතා අරූපසමාපත්තියො අග්ගං සෙට්ඨං විසිට්ඨං පාමොක්ඛං උත්තමං පවරං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. **යක්ඛස්සා**ති සත්තස්ස නරස්ස මානවස්ස පොසස්ස පුග්ගලස්ස ජීවස්ස ජාගුස්ස[1] ජන්තුස්ස ඉන්දගුස්ස[2] මනුජස්ස; **සුද්ධින්ති** සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං; **ඉධ පණ්ඩිතා සෙ**ති ඉධ පණ්ඩිතවාද වීරවාද[3] ඤායවාද හෙතුවාද ලක්ඛණවාද කාරණවාද ඨානවාද සකාය ලද්ධියා'ති - 'එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ.'

**උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො**'ති - උදාහු එකෙ සමණබ්‍රාහ්මණා එතා අරූපසමාපත්තියො අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තෙත්වා, එත්තො අරූපසමාපත්තිතො අඤ්ඤං උත්තරිං යක්ඛස්ස සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති - උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො.

තෙනාහ සො නිම්මිතො:

"යන්තං අපුච්ඡිම්හ අකිත්තයී නො
අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රූහි,
එත්තාවතග්ගං නු වදන්ති හෙ'කෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ
උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො"ති.

**11 - 15**

එත්තාවතග්ගම්පි වදන්ති හෙ'කෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ,
තෙසං පනෙකෙ සමයං වදන්ති
අනුපාදිසෙසෙ කුසලාවදනා.

**එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ**ති - සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සස්සතවාද එතා අරූපසමාපත්තියො අග්ගං සෙට්ඨං විසිට්ඨං පාමොක්ඛං උත්තමං පවරං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; **යක්ඛස්සා**'ති සත්තස්ස නරස්ස මානවස්ස පොසස්ස පුග්ගලස්ස ජීවස්ස ජාගුස්ස[1] ජන්තුස්ස ඉන්දගුස්ස[2] මනුජස්ස; **සුද්ධින්ති** සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං; **ඉධ පණ්ඩිතා සෙ**'ති ඉධ පණ්ඩිතවාද වීරවාද ඤායවාද හෙතුවාද ලක්ඛණවාද කාරණවාද ඨානවාද සකාය ලද්ධියා'ති - එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ

1. ජතුස්ස - සීමු. II. ජගුස්ස - PTS 2. හින්දගුස්ස - පු
ධීරවාද - ස්‍යා. - PTS.

**අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි** - අනෙකක් ඔබ විචාරම්හ, අනෙකක් ඔබ පුළුවුසුම්හ, අනෙකක් ඔබ අතිශයින් විචාරම්හ, අනෙකක් ඔබ අධ්‍යෙෂණ කරම්හ, අනෙකකට ඔබ පහදවම්හ, මත්තෙහි ඔබ විචාරම්හ; **තදිඞ්ඝ බ්‍රෑහි**- වදාළ මැනව, ප්‍රකාශ කළ මැනව, දෙසුව මැනව, පැනවුව මැනව, තැබුව මැනව, විවෘත කළ මැනව, විභාග කළ මැනව, ප්‍රකට කළ මැනව, ප්‍රකාශ කළ මැනවැයි - 'අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි' යනු වේ.

**එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ** - ඇතැම් මහණබමුණු කෙනෙක් නෙල අරූපසමාපත්තීහු අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. **යක්ඛස්ස** - සත්ත්වයාගේ; නර- මානව - පුරුෂ - පුද්ගල - ජීව - ජාගු - ජන්තු - ඉන්දගු - මනුජයාගේ; **සුද්ධිං** - ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය; **ඉධ පණ්ඩිතා සෙ** - මෙ ලොවැ සවකීය ලබ්ධියෙහි (ඇපි පණ්ඩිතයම්හ'යි) පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද - න්‍යායවාද - හෙතුවාද - ලක්‍ෂණවාද- කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි - 'එත්තාවතග්ගං නු වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ' යනු වේ.

**උදහු අඤ්ඤම්පි වදන්ති එත්තො** - නොහොත් ඇතැම් මහණබමුණු කෙනෙක් නෙල අරූසමවත් ඉක්මවා මැනවින් ඉක්මවා පසු කොට, නෙල අරූපසමාපත්තියෙන් අන්‍ය වූ මත්තෙහි යක්‍ෂ (-සත්ත්ව)යාගේ ශුද්ධියක් විශුද්ධියක් පරිශුද්ධියක් මුක්තියක් විමුක්තියක් පරිමුක්තියක් පවසත් ද බෙණෙත් ද, දක්වත් ද, ව්‍යවහාර කෙරෙත් දැයි - 'උදහු අඤ්ඤම්පි වදන්ති එත්තො' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

"යන්තං අපුච්ඡිම්හ -පෙ- උදහු අඤ්ඤම්පි වදන්ති එත්තො"ති

## 11 - 15

මේ ලොවැ පණ්ඩිතමානී වූ (ශාශ්වතවාදී) ඇතැම් මහණබමුණු කෙනෙක් මේ අරූපසමාපත්තිමාත්‍රයෙනු දු සත්ත්වයාගේ අග්‍ර වූ ශුද්ධිය කියත් මැයි. යලි ඔවුනතුරෙහි (උච්ඡේදවාදී) ඇතැම් මහණබමුණු කෙනෙක් අනුපාදිශෙෂයෙහි පණ්ඩිතවාද ඇත්තාහු උච්ඡේදය (ශුද්ධියයි) කියත්.

**එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ**- ශාශ්වතවාදය පවසන ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. (ඔහු) මේ අරූපසමාපත්තීන් අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. **යක්ඛස්ස**- සත්ත්වයාගේ නර - මානව - පුරුෂ - පුද්ගල - ජීව - ජාගු - ජන්තු - ඉන්දගු මනුජයාගේ; **සුද්ධිං** - විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය; **ඉධ පණ්ඩිතා සෙ** - මෙ ලොවැ සවකීය දෘෂ්ටියෙහි පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද - න්‍යායවාද - හෙතුවාද - ලක්‍ෂණවාද - කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි - 'එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ 'යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ' යනු වේ.

**තෙසං පනෙකෙ සමයං වදන්ති අනුපාදිසෙසෙ කුසලාවදානාති**- තෙසංයෙව සමණබ්‍රාහ්මණානං එකෙ සමණබ්‍රාහ්මණා උච්ඡෙදවාදා භවතජ්ජිතා විභවං අභිනන්දන්ති, තෙ සත්තස්ස සමං උපසමං වූපසමං නිරොධං පටිප්පස්සද්ධින්ති වදන්ති. යතො කිං හො අයං අත්තා කායස්ස භෙදා උච්ඡිජ්ජති විනස්සති න හොති පරම්මරණා, එත්තාවතා අනුපාදිසෙසො හොති. **කුසලාවදානාති** කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති – 'තෙසං පනෙකෙ සමයං වදන්ති අනුපාදිසෙසෙ කුසලාවදානා.

තෙනාහ භගවා:

"එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ
යක්ඛස්ස සුද්ධිං ඉධ පණ්ඩිතා සෙ,
තෙසං පනෙකෙ සමයං වදන්ති
අනුපාදිසෙසෙ කුසලාවදානා"ති.

**11 - 16**

එතෙ ච ඤත්වා උපනිස්සිතාති
ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී,
ඤත්වා විමුත්තො න විවාදමෙති[1]
භවාභවාය න සමෙති ධීරො.

**එතෙ ච ඤත්වා උපනිස්සිතාති** – 'එතෙ'ති දිට්ඨිගතිකෙ; **උපනිස්සිතාති** සස්සතදිට්ඨිනිස්සිතා'ති ඤත්වා, උච්ඡෙදදිට්ඨිනිස්සිතාති ඤත්වා, සස්සතුච්ඡෙද-දිට්ඨිනිස්සිතාති ඤත්වා, ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා'ති – එතෙ ච ඤත්වා උපනිස්සිතා"ති.

**ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී'ති** – 'මුනී'ති මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; මුනි සස්සතදිට්ඨිනිස්සිතාති ඤත්වා, උච්ඡෙදදිට්ඨිනිස්සිතාති ඤත්වා, සස්සතුච්ඡෙදදිට්ඨිනිස්සිතාති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; **සො විමංසී'ති** පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවීති – ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී.

---

1. නපි වාදමෙති - කත්ථචි.

**තෙසං පනෙ'කෙ සමයං වදන්ති අනුපාදිසෙසෙ කුසලාවදානා-** ඒ මහණබමුණන් අතුරෙන් උච්ඡේදවාද ඇති ඇතැම් මහණබමුණු කෙනෙක් භවයෙන් තැති ගැනුණාහු විභව (-උච්ඡේද) යට සතුටු වෙති, ඔහු සත්ත්වයා ගේ නො පැවැත්ම උපශමය ශාන්තිය අනුත්පාදය අපුනරුත්පත්තිය වේ යයි කියත්. භවත්නි, යම් හෙයකින් මේ ආත්මය කය බිඳීමෙන් මරණින් මතු සිඳියේ ද වැනැසේ ද නො වේ ද, මෙතෙකින් අනුපාදිශෙෂය වේ. **කුසලාවදානා** - ස්වකීය ලබ්ධියෙහි කුසලවාද ඇත්තාහු පණ්ඩිතවාද - ස්ථිරවාද - න්‍යායවාද - හේතුවාද - ලක්‍ෂණවාද- කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි - 'තෙසං පනෙකෙ සමයං වදන්ති අනුපාදිසෙසෙ කුසලාවදානා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"එත්තාවතග්ගම්පි -පෙ- අනුපාදිසෙසෙ කුසලාවදානා"යි

**11 - 16**

තවද තෙල දෘෂ්ටිගතිකයන් (මොහු ශාශ්වතොච්ඡේද) 'දෘෂ්ටි ඇසුරු කළාහු යැ'යි දැන, තෘෂ්ණාදෘෂ්ටිනිඃශ්‍රයන් දැන, ඒ පණ්ඩිත වූ බුද්ධමුනි තෙම (දුඃඛානිත්‍යාදි පිසින්) ධර්මයන් දැන (අනුපාදවිමොක්‍ෂයෙන්) මිදුණේ විරුද්ධවාදයට නො පැමිණෙයි, ඒ ධීර තෙම පුනපුනා භවයට ද නො පැමිණේ.

**එතෙ ච ඤත්වා උපනිස්සිතාති** - 'එතෙ' යනු: දෘෂ්ටිගතිකයන්; **උපනිස්සිතාති** - ශාශ්වතදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන, උච්ඡේදදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන, ශාශ්වතොච්ඡේදදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන, දැනගෙන තුලනය කොට තීරණය කොට සලකා ප්‍රකට කොට නුයි - 'එතෙ ච ඤත්වා උපනිස්සිතාති' යනු වේ.

**ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී** - 'මුනි' යනු: 'මොන'යි ඥානය කියනු ලැබෙයි... මුනි තෙම (ඔවුන්) ශාශ්වතදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන, උච්ඡේදදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන ශාශ්වතොච්ඡේදදෘෂ්ටිනිඃශ්‍රිතයෝ යැයි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවිත කොට: විභූත කොට, **සො විමංසී**-පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැත්තේ විභාවී වූයේ මේධාවී වූයේ නුයි - 'ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී' යනු වේ.

**ඤත්වා විමුත්තො න විවාදමෙතීති** - ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, විමුත්තො'ති මුත්තො විමුත්තො සුවිමුත්තො පරිමුත්තො අච්චන්තඅනුපාදාවිමොක්ඛෙන, "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා"ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා මුත්තො විමුත්තො සුවිමුත්තො පරිමුත්තො අච්චන්තඅනුපාදාවිමොක්ඛෙන, "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා"ති -පෙ- "සබ්බෙ ධම්මා අනත්තා"ති -පෙ- "යං කිඤ්චි සමුදයධම්මං සබ්බන්තං නිරොධධම්ම"න්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, මුත්තො විමුත්තො සුවිමුත්තො පරිමුත්තො අච්චන්තඅනුපාදාවිමොක්ඛෙනාති - ඤත්වා විමුත්තො; **න විවාදමෙතී'ති** - න කලහං කරොති, න භණ්ඩනං කරොති, න විග්ගහං කරොති, න විවාදං කරොති, න මෙධගං කරොති. වුත්තං හෙතං භගවතා: "එවං විමුත්තචිත්තො ඛො අග්ගිවෙස්සන, භික්ඛු න කෙන චි සංවදති. න කෙනචි විවදති, යඤ්ච ලොකෙ වුත්තං, තෙන ච වොහරති අපරාමස"න්ති[a] - ඤත්වා විමුත්තො න විවාදමෙති.

**භවාභවාය න සමෙති ධීරො'ති** - "භවාභවායා"ති භවාභවාය[1] කම්මභවාය පුනබ්භවාය කාමභවාය; කම්මභවාය කාමභවාය පුනබ්භවාය; රූපභවාය කම්මභවාය රූපභවාය පුනබ්භවාය; අරූපභවාය කම්මභවාය අරූපභවාය පුනබ්භවාය; පුනප්පුන භවාය; පුනප්පුන ගතියා පුනප්පුන උප්පත්තියා පුනප්පුන පටිසන්ධියා පුනප්පුන අත්තභාවාභි - නිප්පත්තියා න සමෙති න සමාගච්ඡති න ගණ්හාති න පරාමසති නාභිනිවිසති. **ධීරො'ති** ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී'ති - භවාභවාය න සමෙති ධීරො.

තෙනාහ භගවා:

"එතෙ ච ඤත්වා උපනිස්සිතාති
ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී,
ඤත්වා විමුත්තො න විවාදමෙති
භවාභවාය න සමෙති ධීරො"ති.

**කලහවිවාදසුත්තනිද්දෙසො සමත්තො**

**එකාදසමො.**

# 12

# චූළවියූහසුත්තනිද්දෙසො

අථ චූළවියූහසුත්තනිද්දෙසො වුච්චති:

**12 - 1**

සකං සකං දිට්ඨිපරිබ්බසානා
විග්ගය්හ නානා[2] කුසලා වදන්ති,
එවං පජානාති[3] ස වෙදි[4] ධම්මං
ඉදං පටික්කොසමකෙවලී සො.

---

1. භවාය - සීමු II.    a. මජ්ඣිමනිකාය - දීඝනඛසුත්ත.
2. වාදා - කත්ථචි.    3. යො එවං ජානාති - සා. මජ්ඣං.    4. පවෙදී - කත්ථචි.

**ඤත්වා විමුත්තො න විවාදමෙති** - දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට; **විමුත්තො** - අත්‍යන්ත වූ අනුපාදවිමොක්ෂයෙන් මිදුණේ මැනවින් මිදුණේ වෙසෙසින් මිදුණේ හාත්පසින් මිදුණේ 'සර්වසංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට අත්‍යන්ත අනුපාදවිමොක්ෂයෙන් මුක්ත විමුක්ත සුවිමුක්ත පරිමුක්ත වූයේ, 'සර්වසංස්කාරයෝ දුඃඛයෝ යැ'යි.... 'සර්වධර්මයෝ අනාත්මයෝයැ'යි...'යම් කිසි සමුදයධර්මයෙක් වේ නම්, ඒ සියල්ල නැසෙනසුලු යැ'යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට අත්‍යන්තඅනුපාදවිමොක්ෂයෙන් මුක්ත විමුක්ත සුවිමුක්ත පරිමුක්ත වූයේ නුයි - 'ඤත්වා විමුත්තො' යනු වේ; **න විවාදමෙති** - කලහ නො කෙරෙයි, ඩබර නො කෙරෙයි, විග්‍රහ නො කෙරෙයි, විරුද්ධවාද නො කෙරෙයි, කොලාහල නො කෙරෙයි; මේ වදාරන ලද මැයි, භාග්‍යවතුන් විසින්: 'ගිහිවෙස්න, මෙසේ මිදුණු සිත් ඇති මහණ තෙම කිසිවක්හු සමග සංවාද නො කෙරෙයි, කිසිවක්හු සමග විවාද නො කෙරෙයි, ලොවැ යමකුත් කියන ලද නම්, දැඩිව නො ගනිමින් එයින් ව්‍යවහාර කෙරේ යැ''යි.- 'ඤත්වා විමුත්තො න විවාදමෙති' යනු වේ.

**භවාභවාය න සමෙති ධීරො** - 'භවාභවාය' යනු: කාමභවයෙහි හා රූපාරූපභවයෙහි කර්මවෘත්තයට, (පුනර්භවික වූ) විපාකවෘත්තයට, කාමධාතුයෙහි කර්මවෘත්තයට, කාමධාතුයෙහි විපාකවෘත්තයට, රූපධාතුයෙහි කර්මවෘත්තයට, රූපධාතුයෙහි විපාකවෘත්තයට, අරූපධාතුයෙහි කර්මවෘත්තයට අරූපධාතුයෙහි විපාකවෘත්තයට, පුනපුනා භවයට පුනපුනා ගතියට පුනපුනා උපතට පුනපුනා පිළිසඳට පුනපුනා අත්බැවට නැවත නැවත පහළ වීමට නො එයි, නො පැමිණෙයි, නො ගනී, නො පරාමර්ශ කෙරෙයි, නො පිවිසේ; **ධීරො**- ධීර වූයේ පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැත්තේ විභාවී මෙධාවී නුයි - 'භවාභවාය න සමෙති ධීරො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"එතෙ ච ඤත්වා -පෙ- භවාභවාය න සමෙති ධීරො"යි**

**එකොළොස් වැනි කලහවිවාද සූත්‍රනිද්දේශය යි.**

# 12

# චූලවියූහ සූත්‍රනිද්දේශය

**ඉක්බිති 'චූලවියූහ' සූත්‍රනිද්දේශය කියනු ලැබේ:**

**12 - 1**

**තමතමාගේ දෘෂ්ටියෙහි වෙසෙන්නාහු (ඒ දෘෂ්ටිය) දෘඪග්‍රාහයෙන් ගෙන (ඇපි එහි) දක්ෂයම්හ'යි වෙන වෙන ම කියති. (යමෙක්) මෙසේ දනී නම්, හෙතෙම දහම් දැනගත්තේ ය, මෙය ගරහන්නාවූ (යමෙක් වේ නම් හෙතෙම) ලාමක වන්නේ යයි ද (කියත්.)**

**සකං සකං දිට්ඨිපරිබ්බසානා**'ති - සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා; තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්ති. යථා අගාරිකා වා[1] ඝරෙසු වසන්ති, සාපත්තිකා වා ආපත්තීසු වසන්ති, සකිලෙසා වා කිලෙසෙසු වසන්ති. එවමෙවං සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා, තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්තීති - සකං සකං දිට්ඨිපරිබ්බසානා.

**විග්ගය්හ නානා කුසලා වදන්තී**'ති - 'විග්ගය්හා'ති ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා, නානා වදන්ති විවිධං වදන්ති අඤ්ඤමඤ්ඤං[2] වදන්ති පුථු[3] වදන්ති න එකං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. **කුසලා**'ති කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති - විග්ගය්හ නානා කුසලා වදන්ති.

**එවං පජානාති ස වෙදි ධම්ම**න්ති - යො ඉදං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං ජානාති, සො ධම්මං වෙදි, අඤ්ඤාසි, අපස්සි, පටිවිජ්ඣීති[4] - එවං පජානාති ස වෙදි ධම්මං.

**ඉදං පටික්කොසමකෙවලී සො**'ති - යො ඉමං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං පටික්කොසති, අකෙවලී සො අසමත්තො සො අපරිපුණ්ණො සො, හීනො නිහීනො ඔමකො ලාමකො ජතුක්කො[5] පරිත්තොති.

තෙනාහ සො නිම්මිතො:

"සකං සකං දිට්ඨි පරිබ්බසානා
විග්ගය්හ නානා කුසලා වදන්ති,
එවං පජානාති ස වෙදි ධම්මං
ඉදං පටික්කොසමකෙවලී සො"ති.

**12 - 2**

එවම්පි විග්ගය්හ විවාදයන්ති
බාලො පරො අක්කුසලො'ති[1] චාහු,
සච්චො නු වාදො කතමො ඉමෙසං
සබ්බෙව හි'මෙ කුසලාවදානා.

**එවම්පි විග්ගය්හ විවාදයන්තීති** - එවං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා විවාදයන්ති, කලහං කරොන්ති, භණ්ඩනං කරොන්ති, විග්ගහං කරොන්ති, විවාදං කරොන්ති, මෙධගං කරොන්ති; 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී[ක]'ති - එවම්පි විග්ගය්හ විවාදයන්ති.

---

1. අගාරිකා - සිමු. II. 2. අඤ්ඤමඤ්ඤං - ස. 3. පුථු - සිමු. II
4. පටිවිජ්ඣතීති - සිමු. II. 5. ඡතුක්කො - සිමු. II ජතුක්කො - මජසං.
ක. දීඝනිකාය - බ්‍රහ්මජාල, සාමඤ්ඤඵල, අම්බට්ඨ, සඞ්ගීතිසුත්ත.

**සකං සකං දිට්ඨි පරිබ්බසානා** – දෘෂ්ටිගතික වූ ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති, ඔහු දෙසැට දිටු අතුරෙන් අන්‍යතරාන්‍යතර දෘෂ්ටියක් ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට පරාමර්ශ කොට පිවිසැගෙන තමතමාගේ දෘෂ්ටියෙහි වෙසෙති මොනොවට වෙසෙති පිවිසැ වෙසෙති හාත්පසින් වෙසෙත්; ගෙහිමියෝ හෝ සිය ගෙවල යම් සේ වෙසෙත් ද, ඇවැත් බහුලයෝ හෝ ඇවැත්හි වෙසෙත් ද, කෙලෙස් බහුලයෝ හෝ කෙලෙස්හි වෙසෙත් ද, එසෙයින් ම දෘෂ්ටිගතික වූ ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති, ඔහු දෙසැට දිටු අතුරෙන් අන්‍යතරාන්‍යතර දෘෂ්ටියක් ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවේශ කොට තමතමාගේ දෘෂ්ටියෙහි වෙසෙති පිවිසැ වෙසෙති මවෙසෙසින් වෙසෙති හාත්පසින් වෙසෙත් නුයි 'සකං සකං දිට්ඨිපරිබ්බසානා' යනු වේ.

**විග්ගය්හ නානා කුසලා වදන්ති** – 'විග්ගය්හ' යනු: ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන; **නානා වදන්ති** – විවිධ ව කියති, එකිනෙක කියති, වෙන වෙන ම කියති, එකක් නො කියති, නො බෙණෙති නො දක්වති, ව්‍යවහාර නො කෙරෙත්; **කුසලා** –ස්වකීය ලබ්ධියෙහි කුසලවාද ඇත්තාහු පණ්ඩිතවාද – ස්ථිරවාද – න්‍යායවාද – හෙතුවාද– ලක්‍ෂණවාද – කාරණවාද – ස්ථානවාද ඇත්තාහු නුයි 'විග්ගය්හ නානා කුසලා වදන්ති' යනු වේ.

**එවං පජානාති ස වෙදි ධම්මං** – යමෙක් මේ දහම දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය දනී නම්, හෙතෙම ධර්මය දත්තේ ය, දැනගත්තේ ය, දුටුයේ ය, අවබොධ කෙළේ නුයි 'එවං පජානාති ස වෙදි ධම්මං' යනු වේ.

**ඉදං පටික්කොසමකෙවලී සො** – යමෙක් මේ දහම් දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය ගරහා ද; **අකෙවලී සො** – හේ අසමත්ත යැ, හේ අපරිපූර්ණ යැ, නිහීන යැ අවමත යැ අප්‍රත්‍ය යැ අල්පවූයේ නුයි 'ඉදං පටික්කොසම-කෙවලී සො' යනු වේ.

එයින් කීහ ඒ මැවුණු බුදුහු:

"සකං සකං දිට්ඨි -පෙ- ඉදං පටික්කොසමකෙවලී සො"යි.

**12 – 2**

මෙසේ (ස්වකීය ලබ්ධිය) දැඩිව ගෙන විවාද කෙරෙති, මෙරමා බාල යැයි ද අදක්‍ෂ යැයි ද කියති, මේ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය වූයේ ද? මේ සියලු මැ මහණබමුණෝ පණ්ඩිතවාද ඇත්තාහු ද?

**එවම්පි විග්ගය්හ විවාදයන්ති** – මෙසේ ගෙන වෙසෙසින් ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන විරුද්ධවාද කෙරෙති, කලහ කෙරෙති, ඩබර කෙරෙති, විග්‍රහ කෙරෙති, විවාද කෙරෙති, මෙධග කෙරෙත්: 'තෙපි මේ ධර්මවිනය නො දන්නවුය,...ඉදිත් පොහොසත්හු නම්, (තෙමේ මැ) මුදාලව'යි 'එවම්පි විග්ගය්හ විවාදයන්ති' යනු වේ.

**බාලො පරො අක්කුසලොති**[1] **චාහූති** – පරො බාලො හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො පරිත්තො අකුසලො අවිද්වා අවිජ්ජාගතො අඤ්ඤාණී අවිභාවී දුප්පඤ්ඤොති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – බාලො පරො අක්කුසලො’ති චාහු.

**සච්චං නු වාදං කතමං ඉමෙසන්ති** – ඉමෙසං සමණබ්‍රාහ්මණානං කතමො සච්චො තච්ඡො තථො භූතො යාථාවො[2] අවිපරීතොති – සච්චං නු වාදං කතමං ඉමෙසං.

**සබ්බෙව හි’මෙ කුසලාවදානාති** – සබ්බෙපි ඉමෙ සමණබ්‍රාහ්මණා කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති – සබ්බෙව හි’මෙ කුසලාවදානා.

තෙනාහ භගවා:

> “එවම්පි විග්ගය්හ විවාදයන්ති
> බාලො පරො අක්කුසලො’ති චාහු,
> සච්චං නු වාදං කතමං ඉමෙසං?
> සබ්බෙව හිමෙ කුසලාවදානා”ති.

**12 - 8**

> පරස්ස චෙ ධම්මමනානුජානං[3]
> බාලො මගො[4] හොති නිහීනපඤ්ඤො,
> සබ්බෙව[5] බාලා සුනිහීනපඤ්ඤා[6]
> සබ්බෙ විමෙ දිට්ඨිපරිබ්බසානා.

**පරස්ස චෙ ධම්මමනානුජානන්ති** – පරස්ස ධම්මං පටිපදං මග්ගං අනනු[7] ජානන්තො අනනුපස්සන්තො අනනුමනන්තො අනනුමඤ්ඤන්තො අනනුමොදන්තොති – පරස්ස චෙ ධම්මමනානුජානං.

**බාලො මගො හොති නිහීනපඤ්ඤො’ති** – පරො බාලො හොති, හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො පරිත්තො හීනපඤ්ඤො නිහීනපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො ඡතුක්කපඤ්ඤො පරිත්තපඤ්ඤො’ති – බාලො මගො හොති නිහීනපඤ්ඤො.

**සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤාති** – සබ්බවිමෙ සමණබ්‍රාහ්මණා බාලා හීනා නිහීනා ඔමකා ලාමකා ඡතුක්කා පරිත්තා, සබ්බෙව හීනපඤ්ඤා නිහීනපඤ්ඤා ඔමකපඤ්ඤා ලාමකපඤ්ඤා ඡතුක්කපඤ්ඤා[8] පරිත්තපඤ්ඤා’ති – සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා.

---

1 අකුසලොති - සනං. සු. ස  2. යථාවො - ස  3. මනනුජානං - මජ්ඣ.
4. බාලොමකො - මජ්ඣ. මජසං. PTS.  5 සබ්බෙපි මෙ - ස
6. නිහීනපඤ්ඤා - මජ්ඣ.  7. අනානු - මජසං. සබ්බපදෙසු.
8. ජතුක්කපඤ්ඤා - සීමු. II.

**බාලො පරො අක්කුසලො'ති වාහු** - මෙරමා බාල යැ හීන යැ නිහීන යැ අවමත යැ ලාමක යැ අහේතුක යැ අල්ප යැ අදක්‍ෂ යැ අපණ්ඩිත යැ අවිද්‍යාවට පැමිණියේ යැ අඥාන යැ අවිමංසක යැ දුෂ්ප්‍රාඥ යැයි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'බාලො පරො අක්කුසලොති වාහු' යනු වේ.

**සච්චං නු වාදෙ කතමො ඉමෙසං** - මේ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය ද? තථ ද? අවිපරීත ද? විද්‍යමාන ද? යථා ස්වභාව ද? විපරීත නො වේ ද? යි 'සච්චං නු වාදෙ කතමො ඉමෙසං' යනු වේ.

**සබ්බෙව හිමෙ කුසලාවදානා** - මේ සියලු මැ මහණබමුණෝ ස්වලබ්ධියෙහි කුශලවාද ඇත්තෝ යැ පණ්ඩිතවාද - ස්ථිරවාද - න්‍යායවාද - හේතුවාද - ලක්‍ෂණවාද - කාරණවාද - ස්ථානවාද ඇත්තාහු නුයි 'සබ්බෙව හි'මෙ කුසලාවදානා' යනු වේ.

එහෙයින් කීහ ඒ මැවුණු බුදුහු:

"එවම්පි විග්ගය්හ -පෙ- සබ්බෙව හිමෙ කුසලාවදානා"යි.

## 12 - 8

ඉදින් මෙරමාගේ දෘෂ්ටිය අනුඥා නො කරනුයේ බාලයෙක් මෘග (සදෘශ) යෙක් ලාමක ප්‍රඥා ඇතියෙක් වේ නම්, (එකල්හි) සියලු මැ මහණබමුණෝ බාලයෝ වෙති අතිශයින් නිහීනප්‍රඥා ඇතියෝ වෙත්, මේ සියලු මැ මහණ බමුණෝ තමතමාගේ දෘෂ්ටියෙහි වසන්නාහු ද, එහෙයිනි.

**පරස්ස චෙ ධම්මමනානුජානං** - අන්‍යයාගේ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය නො දන්නේ නො දක්නේ අනුඥා නො කරනුයේ නො පිළිගන්නේ නො අනුමෝදන් වනුයේ නුයි 'පරස්ස චෙ ධම්මමනානුජානං' යනු වේ.

**බාලො මගො හොති නිහීනපඤ්ඤො** - මෙරමා අපණ්ඩිත වූයේ වෙයි, හීන වූයේ නිහීන - ඔමක - ලාමක - ඡතුක්ක - පරිත්ත වූයේ හීනප්‍රඥා ඇත්තේ නිහීනප්‍රඥා ඇත්තේ අවමතප්‍රඥා ඇත්තේ ලාමකප්‍රඥා ඇත්තේ ඡතුක්කප්‍රඥා ඇත්තේ පරිත්තප්‍රඥා ඇත්තේ නුයි 'බාලො මගො හොති නිහීනපඤ්ඤො' යනු වේ.

**සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා** - මේ සියලු මැ මහණබමුණෝ බාලයෝ යැ හීනයෝ යැ නිහීනයෝ යැ අවමතයෝ යැ ලාමකයෝ යැ අහේතුකයෝ යැ අල්පයෝ යැ සියල්ලෝ මැ හීනප්‍රඥා ඇත්තෝ යැ අවමත ප්‍රඥා ඇත්තෝ යැ ලාමකප්‍රඥා ඇත්තෝ යැ ඡතුක්කප්‍රඥා ඇත්තෝ යැ අල්ප වූ ප්‍රඥා ඇත්තාහු නුයි 'සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා' යනු වේ.

**සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා'ති** - සබ්බෙවිමෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා. තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගණ්හිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා, සකාය සකාය දිට්ඨියා වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්ති. යථා අගාරිකා වා ඝරෙසු වසන්ති, සාපත්තිකා වා ආපත්තීසු වසන්ති, සකිලෙසා වා කිලෙසෙසු වසන්ති, එවමෙවං සබ්බෙවිමෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා -පෙ- පරිවසන්තීති - සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා.

තෙනාහ භගවා:

"පරස්ස චෙ ධම්මමනානුජානං
බාලො මගො හොති නිහීනපඤ්ඤො,
සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා
සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා"ති.

## 12 - 4

සන්දිට්ඨියා චෙව න වෙවදාතා[1]
සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා,
තෙසං න කොචි පරිහීනපඤ්ඤො
දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා.

**සන්දිට්ඨියා චෙව න වෙවදාතා'ති** - සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා, න වෙවදාතා අවොදාතා අපරියොදාතා සඞ්කිලෙසිකාති - සන්දිට්ඨියා චෙව න වෙවදාතා.

**සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමාති** - "සංසුද්ධපඤ්ඤා"ති සුද්ධපඤ්ඤා පරිසුද්ධපඤ්ඤා ඔදාතපඤ්ඤා පරියොදාතපඤ්ඤා; අථවා, සුද්ධදස්සනා විසුද්ධදස්සනා පරිසුද්ධදස්සනා වොදාතදස්සනා පරියොදාතදස්සනා'ති - සංසුද්ධපඤ්ඤා; '**කුසලා**'ති කුසලා පණ්ඩිතා පඤ්ඤවන්තො බුද්ධිමන්තො ඤාණිනො විභාවිනො මෙධාවිනොති සංසුද්ධපඤ්ඤා කුසලා; '**මුතීමා**'ති මුතිමා පණ්ඩිතා පඤ්ඤවන්තො බුද්ධිමන්තො ඤාණිනො විභාවිනො මෙධාවිනොති - සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා.

**තෙසං න කොචි පරිහීනපඤ්ඤොති** - තෙසං සමණබ්‍රාහ්මණානං න කොචි හීනපඤ්ඤො නිහීනපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො ජත්තකපඤ්ඤො[2] පරිත්තපඤ්ඤො අත්ථි, සබ්බෙව සෙට්ඨපඤ්ඤා විසිට්ඨපඤ්ඤා පාමොක්ඛපඤ්ඤා උත්තමපඤ්ඤා පවරපඤ්ඤාති - තෙසං න කොචි පරිහීනපඤ්ඤො.

**දිට්ඨී හි තෙසම්පි තථා සමත්තාති** - තෙසං සමණබ්‍රාහ්මණානං දිට්ඨි තථා සමත්තා සමාදින්නා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තාති - දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා.

තෙනාහ භගවා:

"සන්දිට්ඨියා චෙව න වෙවදාතා
සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා,
තෙසං න කොචි පරිහීනපඤ්ඤො
දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා"ති.

---

1. සන්දිට්ඨියා චෙ පන වෙවදාතා - සු. සන්දිට්ඨියා චෙ න වෙවදාතා - පු. සන්දිට්ඨී යා චෙ පන විවදාතා - PTS.
2. ජතුක්කපඤ්ඤො - සීමු. II.

**සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා** - වේ සියලු මැ මහණබමුණෝ දෘෂ්ටිගතිකයෝ යැ, ඔහු දෙසැට දිට්ඨි අතුරෙන් අන්‍යතරාන්‍යතර දෘෂ්ටියක් ගෙන වෙසෙසින් ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන සවකීය සවකීය දෘෂ්ටියෙහි වෙසෙති, මොනවට වෙසෙති, පැමිණ වෙසෙති, හාත්පසින් වෙසෙත්; ගෙහිමියෝ හෝ සිය ගෙවල යම් සේ වෙසෙත් ද, ඇවැත් බහුලයෝ හෝ ඇවැත්හි වෙසෙත් ද, කෙලෙස් බහුලයෝ හෝ කෙලෙස්හි වෙසෙත් ද, එසෙසින් මේ සියලු මැ මහණබමුණෝ දෘෂ්ටිගතිකයෝ යැ... හාත්පසින් වෙසෙත් නුයි 'සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පරස්ස චෙ ධම්මමනානුජානං -පෙ- සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා"යි

**12 - 4**

ඉදින් සවකීය දෘෂ්ටියෙන් පිරිසුදු නො වූවාහු සංශුද්ධප්‍රඥ ඇත්තාහු දක්ෂ වූවාහු බුද්ධිමත් වූවාහු වෙත් නම්, ඒ මහණබමුණන් අතුරෙන් කිසිවෙක් පිරිහුණු නුවණැතියේ නො වෙයි, යම් හෙයකින් දෘෂ්ටිය ඔවුන් විසිනු ද එසේ සමාදන් වූවාහු ද එහෙයිනි.

**සන්දිට්ඨියා චෙව න වෙවදාතා** - සවකීය දෘෂ්ටියෙහි සවකීය ක්ෂාන්තියෙහි සවකීය රුචියෙහි සවකීය ලබ්ධියෙහි නො බබළන්නාහු අපරිශුද්ධ වූවාහු ප්‍රභාස්වර නො වූවාහු සංක්ලිෂ්ට වූවාහු සංකෙලශික වූවාහු නුයි 'සන්දිට්ඨියා චෙව න වෙවදාතා' යනු වේ.

**සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා** - 'සංසුද්ධපඤ්ඤා' යනු: ශුද්ධප්‍රඥ ඇත්තාහු පරිශුද්ධප්‍රඥ ඇත්තාහු අවදාතප්‍රඥ ඇත්තාහු හාත්පසින් බබළන ප්‍රඥ ඇත්තාහු, නොහොත් ශුද්ධදර්ශන ඇත්තාහු විශුද්ධදර්ශන ඇත්තාහු පරිශුද්ධදර්ශන ඇත්තාහු ව්‍යවදාතදර්ශන ඇත්තාහු පර්‍ය්‍යවදාතදර්ශන ඇත්තාහු නුයි 'සංසුද්ධපඤ්ඤා' යනු වේ. **කුසලා** - දක්ෂ වූවාහු පණ්ඩිත වූවාහු ප්‍රඥවත් වූවාහු බුද්ධිමත් වූවාහු ඥනවත් වූවාහු විමංසනප්‍රඥ ඇත්තාහු තීරණප්‍රඥ ඇත්තාහු නුයි 'සංසුද්ධපඤ්ඤා කුසලා' යනු වේ. **මුතිමා**- සමෘතිමත් වූවාහු පණ්ඩිත - ප්‍රඥවත් - බුද්ධිමත් - ඥනවත් - විමංසනප්‍රඥවත් වූවාහු නුයි 'සංසුද්ධපඤ්ඤා කුසලා මුතීමා' යනු වේ.

**තෙසං න කොචි පරිහීනපඤ්ඤො** - ඒ මහණබමුණන් අතුරෙන් හීනප්‍රඥ ඇති නිහීනප්‍රඥ ඇති පහත් වූ ප්‍රඥ ඇති ලාමක වූ ප්‍රඥ ඇති ජතුක්කප්‍රඥ ඇති අල්ප වූ ප්‍රඥ ඇති කිසිවෙක් නැති, සියල්ලෝ මැ ශ්‍රෙෂ්ඨප්‍රඥ ඇත්තාහු විශිෂ්ටප්‍රඥ ඇත්තාහු ප්‍රමුඛප්‍රඥ ඇත්තාහු උත්තම ප්‍රඥ ඇත්තාහු ප්‍රවරප්‍රඥ ඇත්තාහු නුයි 'තෙසං න කොචි පරිහීනපඤ්ඤො, යනු වේ.

**දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා** - ඒ මහණබමුණන් විසින් දෘෂ්ටිය එපරිද්දෙන් සපුරන ලද්දී මොනවට ගන්නා ලද්දී ග්‍රහණය කරන ලද්දී පරාමර්ශ කොට ගන්නා ලද්දී අභිනිවෙශ කරන ලද්දී පිවිස ගන්නා ලද්දී බැසගන්නා ලද්දී නුයි 'දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සන්දිට්ඨියා චෙව -පෙ- දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා"යි

## 12 - 5

න වාහමෙතං[1] තථියන්ති[2] බ්‍රූමි
යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං,
සකං සකං දිට්ඨිමකංසු සච්චං
තස්මා හි බාලොති පරං දහන්ති.

**න වාහමෙතං තථියන්ති බ්‍රූමීති** - 'නා'ති පටික්ඛෙපො; 'එත'න්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; නාහං එතං තච්ඡං තථං භූතං යාථාවං[3] අවිපරීතන්ති බ්‍රූමි, ආචික්ඛාමි, දෙසෙමි, පඤ්ඤපෙමි, පට්ඨපෙමි, විවරාමි, විභජාමි, උත්තානීකරොමි, පකාසෙමීති - න වාහමෙතං තථියන්ති බ්‍රූමි.

**යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤන්ති** - 'මිථූ'ති ද්වෙ ජනා, ද්වෙ කලහකාරකා, ද්වෙ භණ්ඩනකාරකා, ද්වෙ භස්සකාරකා, ද්වෙ විවාදකාරකා, ද්වෙ අධිකරණකාරකා, ද්වෙ වාදිනො, ද්වෙ සල්ලාපකා; තෙ අඤ්ඤමඤ්ඤං බාලතො හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං වොහරන්තීති - යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං.

**සකං සකං දිට්ඨිමකංසු සච්චන්ති** - සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති සකං සකං දිට්ඨිමකංසු සච්චං. අසස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති - සකං සකං දිට්ඨිමකංසු සච්චං.

**තස්මා හි බාලොති පරං දහන්තීති** - 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා; පරං බාලතො හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො; දහන්ති, පස්සන්ති, දක්ඛන්ති, ඔලොකෙන්ති, නිජ්ඣායන්ති, උපපරික්ඛන්තී'ති - තස්මා හි බාලො'ති පරං දහන්ති.

තෙනාහ භගවා:

"න වාහමෙතං තථියන්ති බ්‍රූමි
යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං,
සකං සකං දිට්ඨිමකංසු සච්චං
තස්මා හි බාලොති පරං දහන්තී"ති.

## 12 - 6

යමාහු සච්චං තථියන්ති[4] එකෙ
තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති,
එවම්පි විග්ගය්හ විවාදයන්ති[5]
කස්මා න එකං සමණා වදන්ති.

1. න වාහමෙතං - සු. ස. මජසං. PTS.
2. තථවතති - මජුප. තථිවතති - පු. සහා. PTS. 3. යථාවතං - ස.
4. තථවතති - මජුප. මජසං. 5. විවාදියන්ති - සු. PTS.

## 12 - 5

මම මෙතෙල ආශ්‍රවාදෘෂ්ටිජාතය සත්‍ය යැයි නො ද කියමි, යම් හෙයකින් කලහකාරක වූ දෙදෙනෙක් ඔවුනොවුන් බාල හෙයින් කියත් ද, (ඔහු) තමතමාගේ ලබ්ධිය සැබවැයි වාද කළාහු ද, එහෙයින් මැ වාදකාරක වූ අන්‍යයා බාලයෙකැයි සලකත්.

**න වාහමෙතං තථියන්ති බ්‍රූමි** - 'න' යනු: ප්‍රතික්ෂෙප යැ; 'එතං' යනු: ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ; මම මෙතෙල දෘෂ්ටිගතය නො සිස් යැ අවිපරීත යැ විද්‍යමාන යැ සංවිද්‍යමාන යැ අවිසංවාදක යැයි නො කියමි, නො පවසමි, නො දෙසමි, නො පනවමි, නො තබමි, විවරණය නො කරමි, විභාග නො කරමි, ප්‍රකට නො කරමි, ප්‍රකාශ නො කෙරෙමි 'න වාහමෙතං තථියන්ති බ්‍රූමි' යනු වේ.

**යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං** - 'මිථු' යනු: දෙදෙනෙක්, කලහකරුවෝ දෙදෙන ඬබර කරුවෝ දෙදෙන බසින් කලහ කරනුවෝ දෙදෙන විවාදකරුවෝ දෙදෙන අධිකරණකරුවෝ දෙදෙන වාදකරුවෝ දෙදෙන සංලාප කරනුවෝ දෙදෙන, ඔවුහු ඔවුනොවුන් බාල හෙයින් හීන හෙයින් නිහීන හෙයින් ඔමක හෙයින් ලාමක හෙයින් ඡත්තක හෙයින් පරිත්ත හෙයින් මෙසේ පවසති මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං' යනු වේ.

**සකං සකං දිට්ඨිමකංසු සච්චං** - 'ලොකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ'යි - 'සකං සකං දිට්ඨිමකංසු සච්චං' යනු වේ. 'අශාශ්වත යැ ලොකය, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ'යි...'සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නො- මැ වෙයි, නො වන්නේ නො වෙයි, මෙය මැ සැබව, අන්‍යය තුච්ඡ යැ' යි 'සකං සකං දිට්ඨිමකංසු සච්චං' යනු වේ.

**තස්මා හි බාලො'ති පරං දහන්ති** - 'තස්මා' යනු: එ හෙයින් එ කාරණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් මෙරමා බාල හෙයින් හීනහෙයින් නිහීන හෙයින් ඔමකහෙයින් ලාමකහෙයින් ඡත්තක හෙයින් සලකති, බලති දකිති අවලොකනය කෙරෙති, සිතති, විමසත් නුයි 'තස්මා හි බාලො'ති පරං දහන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න වාහමෙතං -පෙ- තස්මා හි බාලොති පරං දහන්ති"යි

## 12 - 6

ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දෘෂ්ටිසත්‍යයක් සැබවැයි කියත් ද, එයින් අන්‍ය වූ මහණබමුණෝ ඒ දෘෂ්ටිසත්‍යය තුච්ඡ වූ මෘෂායෙකැයි කියත්. (ඔහු) මෙසේත් දෘෂ්ටිය ද්ගිව ගෙන විවාද කෙරෙති. කුමක් හෙයින් ශ්‍රමණයෝ එක් සත්‍යයක් නො කියත් ද ?

**යමාහු සච්චං තථියන්ති එකෙති** – යං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා ඉදං සච්චං තථං භූතං යාථාවං[1] අවිපරීතන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති එවං දීපයන්ති, එවං වොහරන්තීති – යමාහු සච්චං තථියන්ති එකෙ.

**තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාතීති**[2] – තමෙව ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා තුච්ඡං එතං මුසා එතං අභූතං එතං අලිකං එතං අයාථාවං එතන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති.

**එවම්පි විග්ගය්හ විවාදයන්තීති** – එවං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා විවාදයන්ති, කලහං කරොන්ති, භණ්ඩනං කරොන්ති විග්ගහං කරොන්ති, විවාදං කරොන්ති, මෙධගං කරොන්ති, 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති – එවම්පි විග්ගය්හ විවාදයන්ති.'

**කස්මා න එකං සමණා වදන්තීති** – '**කස්මා**'ති කස්මා කිංකාරණා කිංහෙතු කිම්පච්චයා කින්නිදානා කිංසමුදයා කිඤ්ජාතියා කිම්පභවා න එකං වදන්ති? නානා වදන්ති විවිධං වදන්ති? අඤ්ඤඤ්ඤං වදන්ති? කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – කස්මා න එකං සමණා වදන්ති.

තෙනාහ සො නිම්මිතො:

"යමාහු සච්චං තථියන්ති එකෙ
තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති,
එවම්පි විග්ගය්හ විවාදයන්ති
කස්මා න එකං සමණා වදන්තී"ති.

### 12 - 7

එකං හි සච්චං න දුතියමත්ථි
යස්මිං පජා නො විවදෙ පජානං,
නානා තෙ සච්චානි සයං ථුනන්ති
තස්මා න එකං සමණා වදන්ති.

**එකං හි සච්චං න දුතියමත්ථීති** – එකං සච්චං වුච්චති දුක්ඛනිරොධො නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අථවා එකං සච්චං වුච්චති මග්ගසච්චං නිය්‍යාණසච්චං දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං: සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධීති – එකං හි සච්චං න දුතියමත්ථි.

---

1. යථාවතං - ස. 2. මුසාති - සීමු. II.

**යමාහු සච්චං තථියන්ති එකෙ** - ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දහමක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් මේ සැබව නො සිස් යැ අවිපරීත යැ විද්‍යමාන යැ සංවිද්‍යමාන යැ අවිසංකෙත යැයි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'යමාහු සච්චං තථියන්ති එකෙ' යනු වේ.

**තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති** - ඇතැම් මහණබමුණු කෙනෙක් එ මැ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය 'තෙල සිස් යැ තෙල මෘෂා යැ තෙල අභූත යැ තෙල බොරු යැ තෙල අසංවිද්‍යමාන යැ'යි මෙසේ පවසති, මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි "තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති' යනු වේ.

**එවම්පි විග්ගය්හ විවාදයන්ති** - මෙසේ ගෙන වෙසෙසින් ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන විරුද්ධවාද කෙරෙති කලහ කෙරෙති ඩබර කෙරෙති විග්‍රහ කෙරෙති විවාද කෙරෙති මෙධග කෙරෙති; 'තෙපි මේ ධම්විනය නො දන්නවූ යැ...ඉදින් සමර්ථ වූවහු නම් මුදාගනු'යි (කියත්) නුයි 'එවම්පි විග්ගය්හ විවාදයන්ති' යනු වේ.

**කස්මා න එකං සමණා වදන්ති** - 'කස්මා' යනු: කුමක් හෙයින් කිකරුණෙන් කවර හෙතුයෙන් කවර ප්‍රත්‍යයෙන් කවර නිදානයකින් කවර සමුදයකින් කවර ජාතියකින් කවර ප්‍රභවයකින් එකක් නො කියත් ද? නොයෙක් ලෙස කියත් ද? විවිධ ව කියත් ද එකිනෙක කියත් ද වෙන වෙන කියත් ද පවසත් ද බෙණෙත් ද දක්වත් ද ව්‍යවහාර කෙරෙත් දැයි 'කස්මා න එකං සමණා වදන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යමාහු සච්චං -පෙ- කස්මා න එකං සමණා වදන්ති"යි

## 12 – 7

සත්‍යය එකෙක් මැ (නිරොධය හෝ මාර්ගය හෝ) වෙයි, දෙවැන්නෙක් නැත, යම් සත්‍යයක් දන්නාවූ පුද්ගල තෙමේ විවාද නො කරන්නේ නම් එය යි; ඒ මහණබමුණෝ නානා සත්‍යයන් තුමූ මැ කියති, එ කරුණෙන් මහණබමුණෝ එක් සත්‍යයක් නො කියත්.

**එකං හි සච්චං න දුතියමත්ථි** - එක් සත්‍ය යැයි දුඃඛනිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය කියනු ලැබෙයි, යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරැලීමෙක් නැසීමෙක් කෙලශවිරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එයයි; නොහොත් එක් සත්‍ය යැයි මාර්ගසත්‍යය කියනු ලැබෙයි, නෛර්‍යාණිකසත්‍යය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදා සඞ්ඛ්‍යාත ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය යි. ඒ කවරේ ද යත්: සම්‍යග්දෘෂ්ටිය සම්‍යක් සංකල්පය සම්‍යග්වචනය සම්‍යක්කර්මාන්තය සම්‍යගාජීවය සම්‍යග්-ව්‍යායාමය සම්‍යක්ස්මෘතිය සම්‍යක්සමාධිය නුයි 'එකං හි සච්චං න දුතියමත්ථි' යනු වේ.

**යස්මිං පජා නො විවදෙ පජානන්ති** – ‘යස්මි’න්ති යස්මිං සච්චෙ; ‘පජා’ති සත්තාධිවචනං; ‘පජානං’ යං සච්චං පජානන්තා විජානන්තා පටිවිජානන්තා පටිවිජ්ඣන්තා න කලහං කරෙය්‍යුං, න භණ්ඩනං කරෙය්‍යුං, න විග්ගහං කරෙය්‍යුං, න විවාදං කරෙය්‍යුං, න මෙධගං කරෙය්‍යුං, කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං පජහෙය්‍යුං, විනොදෙය්‍යුං, බ්‍යන්තීකරෙය්‍යුං, අනභාවං ගමෙය්‍යුන්ති – යස්මිං පජා නො විවදෙ පජානං.

**නානා තෙ සච්චානි සයං ථුනන්තීති** – නානා තෙ සච්චානි සයං ථුනන්ති වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති, ‘සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති, සයං ථුනන්ති, වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – නානා තෙ සච්චානි සයං ථුනන්ති.

**තස්මා න එකං සමණා වදන්තීති** – ‘තස්මා’ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා න එකං වදන්ති, නානා වදන්ති, විවිධං වදන්ති, අඤ්ඤමඤ්ඤං වදන්ති පුථු වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – තස්මා න එකං සමණා වදන්ති

තෙනාහ භගවා:

“එකං හි සච්චං න දුතියමත්ථි
යස්මිං පජා නො විවදෙ පජානං,
නානා තෙ සච්චානි සයං ථුනන්ති
තස්මා න එකං සමණා වදන්තී”ති.

**12 - 8**

කස්මා නු සච්චානි වදන්ති නානා
පවාදියාසෙ කුසලාවදනා,
සච්චානි සුතානි[1] බහූනි නානා
උදාහු තෙ තක්කමනුස්සරන්ති.

**කස්මා නු සච්චානි වදන්ති නානාති** – ‘කස්මා’ති කස්මා කිං කාරණා කිංහෙතු කිම්පච්චයා කින්නිදානා සච්චානි නානා වදන්ති? විවිධානි වදන්ති? අඤ්ඤමඤ්ඤානි වදන්ති? පුථූනි වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – කස්මා නු සච්චානි වදන්ති නානා.

**පවාදියාසෙ කුසලාවදනාති** – ‘පවාදියාසෙ’ති විප්පවදන්තීතිපි පවාදියාසෙ; අථවා සකං සකං දිට්ඨිගතං පවදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති, සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති පවදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති අසස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති පවදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. **කුසලාවදනාති** කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා, සකාය ලද්ධියාති – පවාදියාසෙ කුසලාවදනා.

1. සුත්තානි – සං. PTT.

**යස්මිං පජා නො විවදෙ පජානං** – ‘යස්මිං’ යනු: යම් සත්‍යයක්; ‘**පජා**’ යනු: සත්ත්වයනට නමෙකි; **පජානං** – යම් සත්‍යයක් ප්‍රකර්ෂයෙන් දන්නාහු හාත්පසින් දන්නාහු වෙසෙසින් දන්නාහු මැනවින් දන්නාහු සිහින් අවබොධ කරන්නාහු කලහ නො කරන්නාහු ය, ඩබර නො කරන්නාහු ය, විග්‍රහ නො කරන්නාහු ය, විවාද නො කරන්නාහු ය, මෙධග නො කරන්නාහු ය, කලහ භණ්ඩන විග්‍රහ විවාද මෙධග හරනාහු ය, දුරලන්නාහු ය, බැහැර කරන්නාහු ය, අනභාවයට පමුණුවන්නාහු නුයි ‘යස්මිං පජා නො විවදෙ පජානං’ යනු වේ.

**නානා තෙ සච්චානි සයං ථුනන්ති** – ඔවුහු නානා සත්‍යයන් තුමූ මැ පසසති, පවසති කියති බෙණෙති දක්වති බැවහර කෙරෙත්; ‘ලොකය ශාශ්වත යැ, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ’යි පසසති පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි ‘නානා තෙ සච්චානි සයං ථුනන්ති’ යනු වේ.

**තස්මා න එකං සමණා වදන්ති** –‘තස්මා’ යනු: එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් එකක් නො කියති, නොයෙක් සේ කියති, විවිධ ව කියති, අනන්මත කියති, වෙන වෙන මැ කියති පවසති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි ‘තස්මා න එකං සමණා වදන්ති’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**“එකං හි සච්චං –පෙ– තස්මා න එකං සමණා වදන්ති”යි.**

## 12 – 8

විරුද්ධවාද ඇති (සවලබ්ධියෙහි) පණ්ඩිතවාද ඇති (ඔහු) කුමක් හෙයින් නානා සත්‍යයන් කියත් ද ? (ඔවුන් විසින්) බොහෝ වූ නානා සත්‍යයන් අසන ලද්දාහු ද ? නොහොත් ඔවුහු තර්කමාත්‍රයක් අනුව යෙත් ද ?

**කස්මා නු සච්චානි වදන්ති නානා** – ‘කස්මා’ යනු: කුමක් හෙයින් කිකරුණෙන් කවර හෙතුයෙකින් කවර ප්‍රත්‍යයෙකින් කවර නිදානයෙකින් සත්‍යයන් නන් ලෙස කියත් ද ? විවිධ ව කියත් ද ? අනන්මත කියත් ද ? වෙන වෙන මැ පවසත් ද ? කියත් ද ? බෙණෙත් ද ? දක්වත් ද ? ව්‍යවහාර කෙරෙත් ද’යි ‘කස්මා නු සච්චානි වදන්ති නානා’ යනු වේ.

**පවාදියා සෙ කුසලාවදානා** – ‘පවාදියා සෙ’ යනු: විවිධ ව කියත් නුයි ද ‘පවාදියා සෙ’ යනු වේ; නොහොත් තමතමාගේ දෘෂ්ටිගතය පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්: ‘ශාශ්වත යැ ලොකය, මෙ මැ සැබව, අන්‍යය තුච්ඡ යැ’යි පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. ‘අශාශ්වත යැ ලොකය...සත්ත්වයා මරණින් මත්තෙහි නො මැ වෙයි, නො වන්නේ නො වෙයි. මෙ මැ සැබව, අන්‍යය තුච්ඡ යැ’යි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. **කුසලාවදානා** – සවලබ්ධියෙහි කුශල යැ යන වාද ඇත්තාහු පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාදඇත්තාහු න්‍යායවාද ඇත්තාහු හෙතුවාද ඇත්තාහු ලක්ෂණවාද ඇත්තාහු කාරණවාද ඇත්තාහු ස්ථානවාද ඇත්තාහු නුයි ‘පවාදියා සෙ කුසලාවදානා’ යනු වේ.

**සච්චානි සුතානි බහූනි නානාති** – සච්චානි සුතානි බහුකානි නානානි විවිධානි අඤ්ඤමඤ්ඤානි පුථූනීති – සච්චානි සුතානි බහූනි නානා.

**උදාහු තෙ තක්කමනුස්සරන්ති**'ති – උදාහු තක්කෙන විතක්කෙන සඞ්කප්පෙන යායන්ති නීයන්ති වුය්හන්ති සංහරීයන්තීති එවම්පි – උදාහු තෙ තක්කමනුස්සරන්ති. අථවා තක්කපරියාහතං වීමංසානුචරිතං සයම්පටිභානං වදන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති එවම්පි–උදාහු තෙ තක්කමනුස්සරන්ති.

තෙනාහ සො නිම්මිතො:

"කස්මා නු සච්චානි වදන්ති නානා
පවාදියාසෙ කුසලාවදානා,
සච්චානි සුතානි බහූනි නානා
උදාහු තෙ තක්කමනුස්සරන්ති"ති.

12 - 9

න හෙව සච්චානි බහූනි නානා
අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ,
තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා
සච්චං මුසාති ද්වයධම්මමාහු.

**න හෙව සච්චානි බහූනි නානාති** – න හෙව සච්චානි බහුකානි නානානි විවිධානි අඤ්ඤමඤ්ඤානි පුථූනීති – න හෙව සච්චානි බහූනි නානා.

**අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙති** – අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චගාහා එකඤ්ඤෙව සච්චං ලොකෙ කථීයති[1] භණීයති[2] දීපීයති[3] වොහරීයති[4] දුක්ඛනිරොධො නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අථවා, එකං සච්චං වුච්චති මග්ගසච්චං නිය්‍යානසච්චං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියො අට්ඨඞ්ගිකො මග්ගො; සෙය්‍යථීදං? සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධීති – අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ.

**තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසාති ද්වයධම්මමාහූති**– තක්කං විතක්කං සඞ්කප්පං තක්කයිත්වා විතක්කයිත්වා සඞ්කප්පයිත්වා දිට්ඨිගතානි ජනෙන්ති සඤ්ජනෙන්ති නිබ්බත්තෙන්ති අභිනිබ්බත්තෙන්ති; දිට්ඨිගතානි ජනෙත්වා සඤ්ජනෙත්වා නිබ්බත්තෙත්වා අභිනිබ්බත්තෙත්වා 'මය්හං සච්චං තුය්හං මුසා'ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසාති ද්වයධම්මමාහු.

---

1. කථීයන්ති සීමු. II. කථියති - PTS. 2. භණීයන්ති - සීමු. II. භණියති - PTS
3. දීපියන්ති - සීමු. II. දීපයති - PTS.
4. වොහරියන්ති - සීමු. II. වොහරියති - PTS.

**සච්චානි සුතානි බහූනි නානා** - බොහෝ වූ නන් වැදෑරුම් වූ විවිධ වූ අනන්මත වූ වෙන් වෙන් වූ සත්‍යයෝ අසන ලද්දාහු දැ'යි 'සච්චානි සුතානි බහූනි නානා' යනු වේ.

**උදාහු තෙ තක්කමනුස්සරන්ති** - නොහොත් තර්කයෙන් සංකල්පයෙන් යවනු ලැබෙති, පමුණුවනු ලැබෙති, වහනය කරනු ලැබෙති, මොනවට හරිනු ලැබෙත් නුයි - මෙසේ ත් 'උදාහු තෙ තක්කමනුස්සරන්ති' යනු වේ. නොහොත් තර්කයෙන් හාත්පසින් එලවන ලද තමාගේ හැඟීමෙන් විමසන ලද ස්වකීය ප්‍රතිභානය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි - මෙසේත් 'උදාහු තෙ තක්කමනුස්සරන්ති' යනු වේ.

එයින් කිහ ඒ මැවුණු බුදුහු:

"කස්මා නු සච්චානි -පෙ- උදාහු තෙ තක්කමනුස්සරන්ති"යි

## 12 - 9

ලොවැ සංඥාමාත්‍රයෙන් නිත්‍ය යයි ගන්නා ලද ග්‍රහණයක් තබා නන්වැදෑරුම් වූ බොහෝ සත්‍යයෝ නො මැ වෙති, දෘෂ්ටීන්හයෙහි (තමං ගේ) මිත්‍යාසංකල්පමාත්‍රය ද උපදවා (මාගේ වචනය) සැබව, (තාගේ වචනය) බොරු යැ යන යුග්මධර්මය (-දෙ කරුණ) කියත්.

**නහෙව සච්චානි බහූනි නානා** - බොහෝ වූ නානා වූ විවිධ වූ අන්‍යෝන්‍ය වූ වෙන් වෙන් වූ සත්‍යයෝ නො මැ වෙත් නුයි 'නහෙව සච්චානි බහූනි නානා' යනු වේ.

**අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ** - සංඥාමාත්‍රයෙන් නිත්‍ය යයි ගන්නා ලද ග්‍රහණයෙන් වෙන් ව ලොවැ දුඃඛනිරොධ යයි කියන ලද නිර්වාණ නම් වූ එක මැ සත්‍යය කියනු ලැබෙයි, බණනු ලැබෙයි, දක්වනු ලැබෙයි, ව්‍යවහාර කරනු ලැබේ; යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳී-මෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාව නැසීමෙක් කෙලශවිරාග යෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. නොහොත් එක් සත්‍ය යැ'යි මාර්ගසත්‍යය කියනු ලැබෙයි, නෛර්යාණිකසත්‍යය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාව ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය යි, ඒ කවරේ ද යත්? සම්‍යග්දෘෂ්ටිය... සම්‍යක් සමාධිය නුයි 'අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ' යනු වේ.

**තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසා'ති ද්වයධම්මමාහු**-තර්කය විතර්කය සඞ්කල්පය තර්කණය කොට විතර්කණය සඞ්කල්පනය කොට දෘෂ්ටීනයන් උපදවති, මොනවට උපදවති, නිපදවති, වෙසෙසින් නිපද වත්, දෘෂ්ටිගතයන් (මතුමත්තෙහි) උපදවා මොනවට උපදවා නිපදවා වෙසෙසින් නිපදවා මාගේ (-වදන) සැබව, තාගේ (වදන) බොරු යයි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා සච්චං මුසාති ද්වයධම්මමාහු' යනු වේ.

තෙනාහ භගවා:

"න හෙව සච්චානි බහූනි නානා
අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි ලොකෙ,
තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා
සච්චං මුසාති ද්වයධම්මමාහූ"ති.

## 12 - 10

දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා
එතෙ ච[1] නිස්සාය විමානදස්සී,
විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො[2]
බාලො පරො අක්කුසලො'ති[3] චාහ.

**දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා එතෙ ච[1] නිස්සාය විමානදස්සීති** දිට්ඨං වා දිට්ඨසුද්ධිං වා සුතං වා සුතසුද්ධිං වා සීලං වා සීලසුද්ධිං වා වතං වා වතසුද්ධිං වා මුතං වා මුතසුද්ධිං වා නිස්සාය උපනිස්සාය ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති - දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා.

**එතෙ ච නිස්සාය විමානදස්සීති** - න සම්මානෙතීතිපි විමානදස්සී; අථවා, දෙමනස්සං ජනෙතීතිපි විමානදස්සීයි - දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා එතෙ ච නිස්සාය විමානදස්සී.

**විනිච්ඡයෙ ඨත්වා පහස්සමානොති** - විනිච්ඡයා වුච්චන්ති ද්වාසට්ඨි-දිට්ඨිගතානි; දිට්ඨිවිනිච්ඡයෙ විනිච්ඡයදිට්ඨියා ඨත්වා පතිට්ඨහිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති - විනිච්ඡයෙ ඨත්වා; **පහස්සමානොති** - තුට්ඨො හොති හට්ඨො පහට්ඨො අත්තමනො පරිපුණ්ණසඞ්කප්පො; අථවා, දන්තවිදංසකං පහස්සමානො[2] ති - විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො.

**බාලො පරො අක්කුසලොති චාහාති** - පරො බාලො හීනො නිහීනො ඔමකො ලාමකො ජත්තකො[4] පරිත්තො අකුසලො අවිද්වා අවිජ්ජාගතො අඤ්ඤාණී අවිභාවී අමෙධාවී දුප්පඤ්ඤොති එවමාහ, එවං කථෙති, එවං භණති, එවං දීපයති, එවං වොහරතීති - බාලො පරො අක්කුසලොති චාහ.

තෙනාහ භගවා:

"දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා
එතෙ ච නිස්සාය විමානදස්සී,
විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො
බාලො පරො අක්කුසලොති[3] චාහා"ති.

## 12 - 11

යෙනෙව බාලොති පරං දහාති
තෙනාතුමානං කුසලොති චාහ,
සයමත්තනා සො කුසලාවදානො
අඤ්ඤං විමානෙති තදෙව පාවා[5].

1. එතෙසු - සීමු II මජසං. 2 පහංසමානො - සීමු. II.
3. අකුසලොති - ස, සු. සහ. PTS.
4. ජතුක්කො - මජසං. ජතුක්කො - සීමු. II. PTS. 1. පාවද - සීමු. II. පාව. - මජසං.

එයින් වදාළහ බුදුහු:

**"න හෙව සච්චානි -පෙ- සච්චං මුසාති ද්වයධම්මමාහු"ති**

## 12 - 10

(රූපාලම්බන සඞ්ඛ්‍යාත) දෘෂ්ටශුද්ධිය ද ශීලව්‍රතශුද්ධිය ද (ගන්ධරසස්ප්‍රෂ්ට-ව්‍යාලම්බන සඞ්ඛ්‍යාත) මූතශුද්ධිය ද යන මොවුන් නිසා අසම්මානය දක්නේ නොහොත් දෙම්නස් උපදවනුයේ දෘෂ්ටිවිනිශ්චයෙහි සිට පහවූ වනුයේ මෙරමා හීන යයි ද අදක්‍ෂ යයි ද කියයි.

**දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා එතෙ ච නිස්සාය විමානදස්සී**- රූපාලම්බනය හෝ දෘෂ්ටශුද්ධිය හෝ, ශබ්දාලම්බනය හෝ ශ්‍රැතශුද්ධිය හෝ, ශීලය හෝ ශීලශුද්ධිය හෝ, ව්‍රතය හෝ ව්‍රත ශුද්ධිය හෝ, ගන්ධ - රස-ස්ප්‍රෂ්ටව්‍යාලම්බනය හෝ මූතශුද්ධිය හෝ නිසා ඇසුරු කොට ග්‍රහණය කොට දැහැගෙන පිහිටාගෙන තුයි 'දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා' යනු වේ.

**එතෙ ච නිස්සාය විමානදස්සී** - සම්මාන නො කෙරේ නුයි ද විමානදර්ශී යැ, නොහොත් දෙම්නස් දනවා නුයි ද විමානදර්ශී නුයි 'දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා එතෙ ච නිස්සාය විමානදස්සී' යනු වේ.

**විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො** - 'විනිච්ඡය'යි ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙත්. දෘෂ්ටිවිනිශ්චයෙහි විනිශ්චය (-සන්නිටුහන්) කොට ගත් දෘෂ්ටියෙහි සිට පිහිටා ග්‍රහණය කොට දැඩිව ගෙන පිහිටා ගෙන නුයි 'විනිච්ඡයෙ ඨත්වා' යනු වේ. **පහස්සමානො** - තුටු වූයේ පහටු වූයේ තුටුසිත් ඇතියේ පිරුණු සංකල්ප ඇතියේ; නොහොත් දත් විදහා සිනහ සෙනුයේ නුයි 'විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො' යනු වේ.

**බාලො පරො අක්කුසලොති චාහ** - මෙරමා බාල යැ හීන යැ නිහීන-යැ අවමත යැ ලාමක යැ ඡත්තක යැ අල්ප යැ අදක්‍ෂ යැ අපණ්ඩිත යැ නුවණ නැත්තේ යැ විමංසනප්‍රඥ රහිත යැ තීරණප්‍රඥ රහිත යැ දුෂ්ප්‍රාඥ යැයි මෙසේ පවසයි, මෙසේ කියයි, මෙසේ බෙණෙයි, මෙසේ දක්වයි, මෙසේ ව්‍යවහාර කෙරේ නුයි 'බාලො පරො අක්කුසලොති චාහ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"දිට්ඨෙ සුතෙ -පෙ- බාලො පරො අක්කුසලොති චාහ"ති.**

## 12 - 11

**යම් මැ කරුණෙකින් මෙරමා බාලයෙකැයි හඟී නම්, යළි එ කරුණෙන් ම තමං 'පණ්ඩිත වෙමි' කියයි, තෙමේ මැ තමහට (මම්) පණ්ඩිතයෙමි කියන්නාවූ හෙතෙම එය මැ කියනුයේ අනෙකක්හු ගරහයි.**

**යෙනෙව බාලොති පරං දහාතීති** – යෙනෙව හෙතුනා යෙන පච්චයෙන යෙන කාරණෙන යෙන පභවෙන පරං බාලතො හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො දහාති පස්සති දක්ඛති ඔලොකෙති නිජ්ඣායති උපපරික්ඛතීති – යෙනෙව බාලොති පරං දහාති.

**තෙනාතුමානං කුසලොති චාහාති** – 'ආතුමා[1]' වුච්චති අත්තා; සොපි තෙනෙව හෙතුනා තෙන පච්චයෙන තෙන කාරණෙන තෙන පභවෙන අත්තානං 'අහමස්මි කුසලො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී'ති – තෙනාතුමානං කුසලොති චාහ.

**සයමත්තනා සො කුසලාවදානොති** – සයමෙව අත්තානං කුසලවාදො පණ්ඩිතවාදො ධීරවාදො ඤායවාදො හෙතුවාදො ලක්ඛණවාදො කාරණවාදො ඨානවාදො සකාය ලද්ධියාති – සයමත්තනා සො කුසලාවදානො.

**අඤ්ඤං විමානෙති තදෙව පාවාති[2]** – න සම්මානෙතීතිපි 'අඤ්ඤං විමානෙති' අථවා, දොමනස්සං ජනෙතීතිපි 'අඤ්ඤං විමානෙති' **තදෙව පාවාති** තදෙව තං දිට්ඨිගතං පාවදති: 'ඉති වායං පුග්ගලො මිච්ඡාදිට්ඨිකො විපරීතදස්සනො'ති – අඤ්ඤං විමානෙති තදෙව පාවා.

"යෙනෙව බාලොති පරං දහාති
තෙනාතුමානං කුසලොති චාහ,
සයමත්තනා සො කුසලාවදානො
අඤ්ඤං විමානෙති තදෙව පාවා"ති[2].

## 12 - 12

අතිසාරදිට්ඨියා[3] සො සමත්තො
මානෙන මත්තො පරිපුණ්ණමානී,
සයමෙව සාමං මනසාභිසිත්තො
දිට්ඨී හි සා තස්ස තථා සමත්තා.

**අතිසාරදිට්ඨියා සො සමත්තොති** – අතිසාරදිට්ඨියො වුච්චන්ති ද්වාසට්ඨි-දිට්ඨිගතානි, කිංකාරණා අතිසාරදිට්ඨියො වුච්චන්ති ද්වාසට්ඨිදිට්ඨිගතානි? සබ්බා තා දිට්ඨියො කාරණාතික්කන්තා ලක්ඛණාතික්කන්තා ඨානාතික්කන්තා තංකාරණා අතිසාරදිට්ඨියො වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; සබ්බාපි දිට්ඨියො අතිසාරදිට්ඨියො; කිංකාරණා සබ්බාපි දිට්ඨියො වුච්චන්ති අතිසාරදිට්ඨියො? තෙ අඤ්ඤමඤ්ඤං අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා දිට්ඨිගතානි ජනෙන්ති සඤ්ජනෙන්ති නිබ්බත්තෙන්ති අභිනිබ්බත්තෙන්ති; තංකාරණා සබ්බාපි දිට්ඨියො වුච්චන්ති අතිසාරදිට්ඨියො. **අතිසාරදිට්ඨියා සො සමත්තොති** අතිසාරදිට්ඨියා සමත්තො පරිපුණ්ණො අනොමොති – අතිසාරදිට්ඨියා සො සමත්තො.

---

1. ආතුමානො – සීමු. II. මජසං. 2. පාවදති – සීමු. II.
3. අතිසාරංදිට්ඨියා – සහා. PTS.

**යෙනෙව බාලොති පරං දහාති** - යම් මැ හෙතුවකින් යම් ප්‍රත්‍යයෙකින් යම් කරුණෙකින් යම් පහළවීමෙකින් මෙරමා බාලහෙයින් හීන හෙයින් නිහීන හෙයින් අවමත හෙයින් ලාමක හෙයින් අහෙතුක හෙයින් අල්ප හෙයින් සලකා නම් බලා නම් දකී නම් අවලොකනය කෙරේ නම් සිතා නම් විමසා නම් යි 'යෙනෙව බාලො'ති පරං දහාති' යනු වේ.

**තෙනාතුමානං කුසලො'ති චා'හ** - 'ආතුමා'යි තෙමේ කියනු ලැබෙයි, හෙ තෙමේ ද ඒ හෙතුයෙන් ම ඒ ප්‍රත්‍යයෙන් ඒ කරුණෙන් ඒ පහළවීමෙන් තමා 'මම් දක්‍ෂයෙමි පණ්ඩිතයෙමි ප්‍රඥාවත්මි බුද්ධිමත්මි ඥානවත්මි විමංසනප්‍රඥා ඇත්තෙමි තීරණප්‍රඥා ඇත්තෙමී (කියා) නුයි 'තෙනාතුමානං කුසලො'ති චා'හ' යනු වේ

**සයමත්තනා සො කුසලාවදානො** - ස්වකීය ලබ්ධියෙහි තෙමේ ම තම හට 'මම් දක්‍ෂයෙමි, යන වාද ඇත්තේ පණ්ඩිතවාද ඇත්තේ ස්ථිරවාද ඇත්තේ න්‍යායවාද ඇත්තේ හෙතුවාද ඇත්තේ ලක්‍ෂණවාද ඇත්තේ කාරණවාද ඇත්තේ ස්ථානවාද ඇත්තේ නුයි 'සයමත්තනා සො කුසලා-වදානො' යනු වේ.

**අඤ්ඤං විමානෙති තදෙව පාවා** - සම්මාන නො කෙරේ නුයි ද, අඤ්ඤං විමානෙති' යනු වේ. නොහොත් දොම්නස් දනවා නුයි 'අඤ්ඤං විමානෙති' යනු වේ. **තදෙව පාවා** - 'මෙසේ හෝ පුද්ගල තෙම මිථ්‍යාදෘෂ්ටි ඇත්තෙක විපරීත දශීන ඇත්තෙකැ'යි එය ම එ දෘෂ්ටිගතය ම කියා නුයි 'අඤ්ඤං විමානෙති තදෙව පාවා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**''යෙනෙව බාලොති -පෙ- අඤ්ඤං විමානෙති තදෙව පාවා''යි**

## 12 - 12

හෙතෙම ද්වාෂෂ්ටිදෘෂ්ටියෙන් සම්පූර්ණ වූයේ (-ඉදිමුණේ) දෘෂ්ටිමානයෙන් මත් වූයේ පරිපූර්ණයෙමි මාන ඇතියේ තමා මැ තෙමේ සිතින් අභිෂෙක කරන ලදුයේ වෙයි, යම් හෙයෙකින් ඔහු විසින් ඒ දෘෂ්ටිය එපරිද්දෙන් ගන්නා ලද්දී ද එහෙයිනි.

**අතිසාරදිට්ඨියා සො සමත්තො** - 'අතිසාරදිට්ඨී' යයි දෙසැට දිට්ඨිගතයෝ කියනු ලැබෙති, කවර කරුණෙකින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ 'අතිසාරදිට්ඨී' යැයි කියනු ලැබෙත් ද යත්: ඒ සියලු දෙසැට දෘෂ්ටීහු කාරණ ඉක්මවූවාහුය ලක්‍ෂණ ඉක්මවූවාහුය ස්ථාන ඉක්මවූවාහුය, එ කරුණෙන් ද්වාෂෂ්ටි දෘෂ්ටිගතයෝ අතිසාරදිට්ඨී' යැයි කියනු ලැබෙති; සියලු මැ දෘෂ්ටීහු අතිසාර දෘෂ්ටීහු යැ, කවර කරුණෙකින් සියලු මැ දෘෂ්ටීහු 'අතිසාරදිට්ඨී' යයි කියනු ලැබෙත් ද ? ඔවුහු ඔවුනොවුන් ඉක්මවා මොනොවට ඉක්මවා වෙසෙසින් ඉක්මවා දෘෂ්ටිගතයන් උපදවති, මෙනොවට උපදවති- නිපදවති වෙසෙසින් නිපදවත්; එ කරුණෙන් සියලු මැ දෘෂ්ටීහු 'අතිසාර දිට්ඨී' යයි කියනු ලැබෙත්. **අතිසාරදිට්ඨියා සො සමත්තො** - දෙසැට දෘෂ්ටියෙන් සම්පූර්ණ වූයේ පරිපූර්ණ වූයේ අනූන වූයේ නුයි 'අතිසාරදිට්ඨියා සො සමත්තො' යනු වේ.

**මානෙන මත්තො පරිපුණ්ණමානීති** - සක්කාය දිට්ඨියා දිට්ඨිමානෙන මත්තො පමත්තො උම්මත්තො අතිමත්තොති - මානෙන මත්තො; **පරිපුණ්ණමානීති** පරිපුණ්ණමානී සමත්තමානී අනොමමානීති - මානෙන මත්තො පරිපුණ්ණමානී.

**සයමෙව සාමං මනසාභිසිත්තොති** - සයමෙව අත්තානං චිත්තෙන අභිසිඤ්චති: 'අහමස්මි කුසලො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී'ති 'සයමෙව සාමං මනසාභිසිත්තො.'

**දිට්ඨි හි සා තස්ස තථා සමත්තාති** - තස්ස සා දිට්ඨි තථා සමත්තා සමාදින්නා ගහිතා පරාමට්ඨා අභිනිවිට්ඨා අජ්ඣොසිතා අධිමුත්තාති-දිට්ඨි හි සා තස්ස තථා සමත්තා.

තෙනාහ භගවා:

> "අතිසාරදිට්ඨියා සො සමත්තො
> මානෙන මත්තො පරිපුණ්ණමානී,
> සයමෙව සාමං මනසා'භිසිත්තො
> දිට්ඨි හි සා තස්ස තථා සමත්තා"ති.

## 12 - 18

> පරස්ස චෙ හි වචසා නිහීනො
> තුමො සහා හොති නිහීනපඤ්ඤො,
> අථ චෙ[1] සයං වෙදගූ හොති ධීරො
> න කොචි බාලො සමණෙසු අත්ථි.

**පරස්ස චෙ හි වචසා නිහීනොති** - පරස්ස චෙ වාචාය වචනෙන නින්දිතකාරණා ගරහිතකාරණා උපවදිතකාරණා පරො බාලො හොති හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො[2] පරිත්තොති - පරස්ස චෙ හි වචසා නිහීනො.

**තුමො සහා හොති නිහීනපඤ්ඤොති** - සොපි තෙනෙව සහා හොති හීනපඤ්ඤො නිහීනපඤ්ඤො ඔමකපඤ්ඤො ලාමකපඤ්ඤො ඡතුක්කපඤ්ඤො පරිත්තපඤ්ඤොති - තුමො සහා හොති නිහීනපඤ්ඤො.

**අථ චෙ සයං වෙදගූ හොති ධීරොති** - අථ චෙ සයං වෙදගූ හොති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවීති - අථ චෙ සයං වෙදගූ හොති ධීරො.

**න කොචි බාලො සමණෙසු අත්ථීති** - සමණෙසු න කොචි බාලො හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො පරිත්තො අත්ථි, සබ්බෙව සෙට්ඨපඤ්ඤා විසිට්ඨපඤ්ඤා පාමොක්ඛපඤ්ඤා උත්තමපඤ්ඤා පවරපඤ්ඤාති- න කොචි බාලො සමණෙසු අත්ථි.

---

1. අථවා - සීමු. II. PTS.   2. ජතුක්කො - මජසං.

**මානෙන මත්තො පරිපුණ්ණමානී** - ස්වකීය දෘෂ්ටියෙහි දෘෂ්ටිමානයෙන් මත්වූයේ පමත්වූයේ උමතු වූයේ ඉතා මත්වූයේ නුයි 'මානෙන මත්තො' යනු වේ; **පරිපුණ්ණමානී** පරිපූර්ණමාන ඇතියේ සම්පූර්ණමාන ඇතියේ අනූනමාන ඇතියේ නුයි 'මානෙන මත්තො පරිපුණ්ණමානී' යනු වේ.

**සයමෙව සාමං මනසාභිසිත්තො** - 'මම් දක්‍ෂයෙමි පණ්ඩිතයෙමි ප්‍රඥාවත්මි බුද්ධිමත්මි ඥානවත්මි විමංසනප්‍රඥා ඇත්තෙමි තීරණප්‍රඥා ඇත්තෙමියි තෙමේ ම තමා විසින් අභිෂෙක කෙරේ නුයි 'සයමෙව සාමං මනසාභිසිත්තො' යනු වේ.

**දිට්ඨී හි සා තස්ස තථා සමත්තා** - ඔහු විසින් ඒ දෘෂ්ටි තොමෝ එපරිද්දෙන් පුරන ලද්දී සමාදන් වූවා ගන්නා ලද්දී දැඩගන්නා ලද්දී පිහිටා ගන්නා ලද්දී පිවිසියා බැසගන්නා ලද්දී නුයි 'දිට්ඨී හි සා තස්ස තථා සමත්තා' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

**“අතිසාරදිට්ඨියා සො -පෙ- දිට්ඨී හි සා තස්ස තථා සමත්තා”**යි

## 12 - 13

ඉදින් (යමෙක් දෘෂ්ටිවිනිශ්චයෙහි සිටි) අන්‍යයාගේ නින්‍දාවචනයෙන් නිහීනයෙක් වේ නම්, තෙමේත් ඔහු සමග ම නිහීනප්‍රඥා ඇත්තේ වෙයි. යලි තෙමේ මැ ඉදින් වේදාන්තයට ගියා වූ ධීරයෙක් වේ නම්, ශ්‍රමණයන් කෙරෙහි බාල වූ කිසිවෙක් නැත්තේ යි.

**පරස්ස චෙ හි වචසා නිහීනො** - ඉදින් අන්‍යයාගේ වචනයෙන් භාෂිතයෙන් නින්‍දාහෙතුයෙන් අවමානහෙතුයෙන් උපවාදකාරණයෙන් අන්‍යයා බාලයෙක් හීනයෙක් නිහීනයෙක් අවමතයෙක් ලාමකයෙක් අහෙතුකයෙක් අල්පයෙක් වේ නම්යි 'පරස්ස චෙ හි වචසා නිහීනො' යනු වේ.

**තුමො සහා හොති නිහීනපඤ්ඤො** - හෙතෙමේ ත් ඔහු සමග මැ හීනප්‍රඥා ඇත්තේ වෙයි, නිහීනප්‍රඥා ඇත්තේ අවමතප්‍රඥා ඇත්තේ ලාමකප්‍රඥා ඇත්තේ අහෙතුකප්‍රඥා ඇත්තේ අල්ප වූ ප්‍රඥා ඇත්තේ වේ නුයි 'තුමො සහා හොති නිහීනපඤ්ඤො' යනු වේ.

**අථ චෙ සයං වෙදගූ හොති ධීරො** - යලි ඉදින් තෙමේ වේදාන්තයට පැමිණියේ වේ නම්, ධීර වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැත්තේ විමංසනප්‍රඥා ඇත්තේ තීරණප්‍රඥා ඇත්තේ වී නම් යි 'අථ චෙ සයං වෙදගූ හොති ධීරො' යනු වේ.

**න කොචි බාලො සමණෙසු අත්ථි** - ශ්‍රමණයන් කෙරෙහි කිසි බාලයෙක් හීනයෙක් නිහීනයෙක් අවමතයෙක් ලාමකයෙක් ජතුක්කයෙක් පරිත්තයෙක් නැති. සියල්ලෝ මැ ශ්‍රෙෂ්ඨප්‍රඥා ඇත්තාහු විශිෂ්ටප්‍රඥා ඇත්තාහු ප්‍රමුඛප්‍රඥා ඇත්තාහු උත්තමප්‍රඥා ඇත්තාහු ප්‍රවරප්‍රඥා ඇත්තාහු නුයි 'න කොචි බාලො සමණෙසු අත්ථි' යනු වේ.

තෙනාහ භගවා:

"පරස්ස චෙ හි වචසා නිහීනො
තුමො සහා හොති නිහීනපඤ්ඤො,
අථ චෙ සයං වෙදගූ හොති ධීරො
න කොචි බාලො සමණෙසු අත්ථී"ති.

## 12 - 14

අඤ්ඤං ඉතො යා'භිවදන්ති ධම්මං
අපරද්ධා සුද්ධිමකෙවලී තෙ,[1]
එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති
සන්දිට්ඨිරාගෙන හි තෙ'භිරත්තා.[2]

**අඤ්ඤං ඉතො යා'භිවදන්ති ධම්මං අපරද්ධා සුද්ධිමකෙවලී තෙති** - ඉතො අඤ්ඤං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං යෙ අභිවදන්ති, තෙ සුද්ධිමග්ගං විසුද්ධිමග්ගං වොදානමග්ගං පරියොදානමග්ගං විරද්ධා අපරද්ධා ඛලිතා ගලිතා අඤ්ඤාය අපරද්ධා[3] **අකෙවලී තෙති** අසමත්තා තෙ අපරිපුණ්ණා තෙ හීනා නිහීනා ඔමකා ලාමකා ඡතුක්කා පරිත්තාති - අඤ්ඤං ඉතො යා'භිවදන්ති ධම්මං අපරද්ධා සුද්ධිමකෙවලී තෙ.[1]

**එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්තීති** - 'තිත්ථං' වුච්චති දිට්ඨිගතං, **තිත්ථියා** වුච්චන්ති දිට්ඨිගතිකා; පුථු තිත්ථියා[4] පුථු දිට්ඨිගතානි වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති - එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති.

**සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තාති** - සකාය දිට්ඨියා දිට්ඨිරාගෙන රත්තා අභිරත්තාති - සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා.

තෙනාහ භගවා:

"අඤ්ඤං ඉතො යා'භිවදන්ති ධම්මං
අපරද්ධා සුද්ධිමකෙවලී තෙ,
එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති
සන්දිට්ඨිරාගෙන හි තෙ'භිරත්තා"ති.

## 12 - 15

ඉධෙව සුද්ධිං ඉති[5] වාදයන්ති[6]
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා
සකායනෙ තත්ථ දළ්හං වදානා.

---

1. සුද්ධිමකෙවලී තො - ස්‍යා. 2. තෙභිරත්තා - මනුප.
3. ඤායාපරද්ධා - පු. 4. පුථුදිට්ඨියා - සීමු. II. මජසං. PTS.
5. සුද්ධි ඉති - සීමු. II. සුද්ධිමිති - සු. 6. වාදියන්ති - PTS.

එයින් වදාළහ බුදුහු:

**"පරස්ස චෙ හි -පෙ- න කොචි බාලො සමණෙසු අත්ථි"**යි.

## 12 - 14

යම් කෙනෙක් මෙයින් අන්‍ය වූ දහමක් (-දෘෂ්ටියක්) කියා නම්, අපරිපූර්ණ වූ ඔහු ශුද්ධිය වැරැද්දාහුය, මෙසේත් තීර්ථකයෝ බොහෝ දෘෂ්ටිවශයෙන් කියති, යම් හෙයකින් ඔවුහු සවකීය දෘෂ්ටිරාගයෙන් ඇලුණාහු ද එහෙයිනි.

**අඤ්ඤං ඉතො යාභිවදන්ති ධම්මං අපරද්ධා සුද්ධිමකෙවලී තෙ** - යම් කෙනෙක් මෙයින් අන්‍ය වූ දහමක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් කියත් නම්, ඔවුහු ශුද්ධිමාර්ගය විශුද්ධිමාර්ගය පරිශුද්ධිමාර්ගය පණ්ඩරමාර්ගය ප්‍රභාවත්මාර්ගය වැරැද්දාහුය පැරැද්දාහුය පිරිහුණාහුය ගිලිහුණාහුය නො දැන පරාජයට පැමිණියාහුය; **අකෙවලී තෙ** - ඔවුහු අසමස්තයෝ යෑ, ඔවුහු අපරිපූර්ණයෝ යෑ, හීන - නිහීන - ඔමක - ලාමක - ජත්තක - පරිත්තක වූවාහු නුයි 'අඤ්ඤං ඉතො යා 'භිවදන්ති ධම්මං අපරද්ධා සුද්ධිමකෙවලී තෙ' යනු වේ.

**එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති** - 'තිත්ථ'යි දෘෂ්ටිගතය කියනු ලැබෙයි, දෘෂ්ටිගතිකයෝ 'තිත්ථිය' යි කියනු ලැබෙත්, බොහෝ දෘෂ්ටිගතිකයෝ නානා දෘෂ්ටිගතයන් පවසති කියති බෙණෙති දක්වති වහරත් නුයි 'එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති' යන වේ.

**සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා** - සවකීය දෘෂ්ටියෙහි දෘෂ්ටිරාගයෙන් රැදුණාහු වෙසෙසින් රැදුණාහු නුයි 'සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අඤ්ඤං ඉතො -පෙ- සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා"**යි.

## 12 - 15

මෙසේ (අභිරක්ත වූ තීර්ථකයෝ) මෙහි ම ශුද්ධිය කියති, අන්‍ය-ධර්මයන්හි විශුද්ධිය නො කියත්; මෙසේ ත් සවකීය මාර්ගයෙහි බොහෝ සෙයින් බැසගත් තීර්ථකයෝ ඒ සව ලබ්ධියෙහි දෘඪවාද ඇත්තාහු වෙත්.

**ඉධෙව සුද්ධිං ඉති වාදයන්තීති** - ඉධ සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති ඉධ සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; 'අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති ඉධ සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති - ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති.

**නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහූති** - අත්තනො සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං ඨපෙත්වා සබ්බෙ පරවාදෙ ඛිපන්ති උක්ඛිපන්ති පරික්ඛිපන්ති: සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුප්පටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, නත්ථෙ'ත්ථ සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා, නත්ථෙත්ථ සුජ්ඣන්ති වා විසුජ්ඣන්ති වා පරිසුජ්ඣන්ති වා මුච්චන්ති වා විමුච්චන්ති වා පරිමුච්චන්ති වා, හීනා නිහීනා ඔමකා ලාමකා ජත්තකා[1] පරිත්තාති එවමාහංසු එවං කථෙන්ති එවං භණන්ති එවං දීපයන්ති එවං වොහරන්තීති - නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු.

**එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨාති** - තිත්ථං වුච්චති දිට්ඨිගතං; තිත්ථියා වුච්චන්ති දිට්ඨිගතිකා; පුථු තිත්ථියා පුථු දිට්ඨිගතෙසු නිවිට්ඨා පතිට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති - එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා.

**සකායනෙ තත්ථ දළ්හං වදානාති** - ධම්මො සකායනං, දිට්ඨි සකායනං, පටිපදා සකායනං, මග්ගො සකායනං, සකායනෙ දළ්හවාදා ථිරවාදා බලිකවාදා අවට්ඨිතවාදාති - සකායනෙ තත්ථ දළ්හං වදානා.

තෙනාහ භගවා:

"ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති
නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු,
එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා
සකායනෙ තත්ථ දළ්හං වදානා"ති.

**12 - 16**

සකායනෙ වාපි දළ්හං වදානො
කං තත්ථ[2] බාලොති පරං දහෙය්‍ය,
සයං 'ව සො මෙධගමාවහෙය්‍ය[3]
පරං වදං බාලමසුද්ධිධම්මං.

---

1. ජතුක්කා - සීමු. II.
2. කමෙත්ථ - මජසං. PST. 3. මෙධකං අවහෙය්‍ය - ප.

**ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති** - මෙහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති, කියති බෙණෙයි දක්වති ව්‍යවහාර කෙරෙත්: 'ශාශ්වත යැ ලොකය, මෙය මැ සැබව, අන්‍යය මොඝ යැයි මෙහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. 'අශාශ්වත යැ ලොකය . සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නොවෙයි, මෙය මැ සැබව, අන්‍යය සිස් යැ'යි මෙහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති යනු වේ.

**නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු** - තමාගේ ශාස්තෘහු ධර්මාඛ්‍යානය ගණයා දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය හැර සියලු පරවාදයන් දුරු කෙරෙති, බැහැර කෙරෙති, විසුරුවත්: 'ඒ ශාස්තෘ අසර්වඥ යැ, ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි, ගණයා සුප්‍රතිපන්න නො වෙයි, දෘෂ්ටිය සොඳුරු නො වෙයි, ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි, මාර්ගය නෛර්‍ය්‍යාණික නො වෙයි, එහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය හෝ මුක්තිය විමුක්තිය පරිමුක්තිය හෝ නැත, එහි (සත්ත්වයෝ) ශුද්ධ - විශුද්ධ පරිශුද්ධ හෝ නො වෙති, මුක්ත - විමුක්ත - පරිමුක්ත හෝ වන්නාහු නැති, හීනයෝ යැ නිහීනයෝ යැ ඔමකයෝ යැ ලාමකයෝ යැ ජත්තකයෝ යැ පරිත්තයෝ යැ'යි මෙසේ පවසති, මෙසේ කියති මෙසේ බෙණෙති මෙසේ දක්වති මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'නාඤ්ඤෙසු ධම්මෙසු විසුද්ධිමාහු' යනු වේ.

**එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා** - 'තිත්ථ'යි දෘෂ්ටිගතය කියනු ලැබෙයි, තිත්ථියා'යි දෘෂ්ටිගතිකයෝ කියනු ලැබෙත්; බොහෝ තීර්ථකයෝ බොහෝ දෘෂ්ටිගතයන්හි පිවිසියාහු ඇලුණාහු පැමිණියාහු ඇතුළු වූවාහු බැසගත්තාහු නුයි 'එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා' යනු වේ.

**සකායනෙ තත්ථ දළ්හං වදනා** - ධර්මය ස්වකීය මාර්ග යැ, දෘෂ්ටිය ස්වකීය මාර්ග යැ, ප්‍රතිපදාව ස්වකීය මාර්ග යැ, මාර්ගය ස්වකීය මාර්ග යැ ස්වකීය මාර්ගයෙහි දැඩි වාද ඇත්තාහු ස්ථිරවාද ඇත්තාහු බලවත් වාද ඇත්තාහු පිහිටා කියන ලද වාද ඇත්තාහු නුයි 'සකායනෙ තත්ථ දළ්හං වදනා' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

**“ඉධෙව සුද්ධිං ඉති -පෙ- සකායනෙ තත්ථ දළ්හං වදනා”**යි.

## 12 - 16

තවද ස්වකීය දෘෂ්ටිමාර්ගයෙහි මැ දැඩිව කියන්නාවූ තීර්ථක තෙම ඒ ස්වකීය මාර්ගයෙහි ලා අන්‍ය වූ කවරක්හු බාල යැයි දක්වන්නේ ද, හෙතෙම අන්‍යයා බාලයක්හු කොට අශුද්ධිධර්ම ඇත්තක්හු කොට කියනුයේ තෙමේ මැ කලහය එළවන්නේ යි.

**සකායනෙ වාපි දළ්හං වදානොති** – ධම්මො සකායනං, දිට්ඨි සකායනං, පටිපදා සකායනං, මග්ගො සකායනං සකායනෙ දළ්හවාදො ථිරවාදො බලිකවාදො අවට්ඨිතවාදොති – සකායනෙ වාපි දළ්හං වදානො.

**කං තත්ථ බාලොති පරං දහෙය්‍යාති** – තත්ථාති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා පරං බාලතො හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ජතුක්කතො පරිත්තතො කං දහෙය්‍ය? කං පස්සෙය්‍ය? කං දක්ඛෙය්‍ය? කං ඔලොකෙය්‍ය? කං නිජ්ඣායෙය්‍ය? කං උපපරික්ඛෙය්‍යාති – කං තත්ථ බාලොති පරං දහෙය්‍ය.

**සයංව සො මෙධගමාවහෙය්‍ය පරං වදං බාලමසුද්ධිධම්මන්ති** – පරො බාලො හීනො නිහීනො ඔමකො ලාමකො ජතුක්කො පරිත්තො අසුද්ධිධම්මො අවිසුද්ධිධම්මො අපරිසුද්ධිධම්මො අවොදාතධම්මොති එවං වදන්තො එවං කථෙන්තො එවං භණන්තො එවං දීපයන්තො එවං වොහරන්තො සයමෙව කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං ආවහෙය්‍ය සමාවහෙය්‍ය ආහරෙය්‍ය සමාහරෙය්‍ය ආකඩ්ඪෙය්‍ය සමාකඩ්ඪෙය්‍ය ගණ්හෙය්‍ය[1] පරාමසෙය්‍ය අභිනිවිසෙය්‍යාති – සයංව සො මෙධගමාවහෙය්‍ය පරං වදං බාලමසුද්ධිධම්මං.

තෙනාහ භගවා:

"සකායනෙ වාපි දළ්හං වදානො
කං තත්ථ බාලොති පරං දහෙය්‍ය,
සයංව සො මෙධගමාවහෙය්‍ය
පරං වදං බාලමසුද්ධිධම්ම"න්ති.

## 12 – 17

විනිච්ඡයෙ ඨත්වා සයං පමාය
උද්ධං සො[2] ලොකස්මිං විවාදමෙති,
හිත්වාන සබ්බානි විනිච්ඡයානි
න මෙධගං[3] කුරුතෙ[4] ජන්තු ලොකෙ.

**විනිච්ඡයෙ ඨත්වා සයං පමායාති** – 'විනිච්ඡයා' වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; විනිච්ඡයදිට්ඨියා ඨත්වා පතිට්ඨහිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති – විනිච්ඡයෙ ඨත්වා; **සයං පමායාති** සයං පමාය පමිණිත්වා[5] අයං සත්ථා සබ්බඤ්ඤූ'ති සයං පමාය පමිණිත්වා අයං ධම්මො ස්වාක්ඛාතො, අයං ගණො සුපටිපන්නො, අයං දිට්ඨි භද්දිකා, අයං පටිපදා සුපඤ්ඤත්තා, අයං මග්ගො නීයානිකො'ති සයං පමාය පමිණිත්වාති – විනිච්ඡයෙ ඨත්වා සයං පමාය.

---

1. ගණ්හෙය්‍ය - මජසං. 2. උද්ධං ස. - සිමු. II. මජසං. 3. මෙධකං - ප.
4. මෙධගං කුබ්බති - සිමු. II. මජසං. 5. සම්මිනිත්වා - පු.

**සකායනෙ වාපි දළ්හං වදානො** – ධර්මය සවකීය මාර්ග යැ, දෘෂ්ටිය සවමාර්ග යැ, ප්‍රතිපදාව සවමාර්ග යැ මාර්ගය සවමාර්ග යැ සවකීය දෘෂ්ටිමාර්ග-යෙහි දැඩි වාද ඇත්තේ ස්ථිරවාද ඇත්තේ බලවත් වාද ඇත්තේ පිහිටා කියන ලද වාද ඇත්තේ නුසි 'සකායනෙ වාපි දළ්හං වදානො' යනු වේ.

**කං තත්ථ බාලොති පරං දහෙය්‍ය** – 'තත්ථ' යනු: සවකීය දෘෂ්ටියෙහි සවකීය කැමැත්තෙහි සවකීය රුචියෙහි සවකීය ලබ්ධියෙහි බාල හෙයින් නිහීන හෙයින් ඔමක හෙයින් ලාමක හෙයින් ජත්තක හෙයින් පරිත්ත හෙයින් අන්‍ය වූ කවරක්හු සලකන්නේ ද, කවරක්හු බලන්නේ ද කවරක්හු දක්නේ ද කවරක්හු අවලොකනය කරන්නේ ද, කවරක්හු සිතන්නේ ද, කවරක්හු විමසන්නේ දැයි 'කං තත්‍ථ බාලොති පරං දහෙය්‍ය' යනු වේ.

**සයං ව සො මෙධගමාවහෙය්‍ය පරං වදං බාලමසුද්ධිධම්මං**–මෙරමා බාල යැ හීන යැ නිහීන යැ ඔමක යැ ලාමක යැ ජත්තක යැ පරිත්ත යැ අශුද්ධිධර්ම ඇත්තේ යැ අවිශුද්ධිධර්ම ඇත්තේ යැ අපරිශුද්ධිධර්ම ඇත්තේ යැ අනවදාතධර්ම ඇත්තේ යැ'යි මෙසේ පවසනුයේ මෙසේ කියනුයේ මෙසේ බණනුයේ මෙසේ දක්වනුයේ මෙසේ වහරනුයේ තෙමේ මැ කලහය භණ්ඩනය විග්‍රහය විවාදය මෙධගය එළවන්නේය මොනවට එළවන්නේය, හැර ගන්නේය මොනවට හැරගන්නේය, අදින්නේය මොනවට අදින්නේය, ගන්නේය, දැහැගන්නේය, පිහිටාගන්නේ නුසි 'සයං ව සො මෙධගමාව-හෙය්‍ය පරං වදං බාලමසුද්ධිධම්මං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**සකායනෙ වාපි** -පෙ- **පරං වදං බාලමසුද්ධි ධම්මං**"යි.

## 12 – 17

හෙතෙම ලබ්ධිවිනිශ්චයෙහි සිට තෙමේ මැ (ශාස්තෘ ආදිය) ප්‍රමාණ කොට ගෙන ලොකයෙහි බොහෝ සෙයින් (-මතුමත්තෙහි) විවාදයට පැමිණෙයි. (මෙසේ ලබ්ධියෙහි දොෂ දුටු) පුද්ගල තෙම සියලු දෘෂ්ටි-විනිශ්චයන් හැරපියා ලොකයෙහි කලහ නො කරන්නේ යි.

**විනිච්ඡයෙ ඨත්වා සයං පමාය**-'විනිච්ඡය'යි ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙති, විනිශ්චයදෘෂ්ටියෙහි සිට පිහිටා ගෙන දැහැගෙන පිවිසගෙන නුයි 'විනිච්ඡයෙ ඨත්වා' යනු වේ; **සයං පමාය** – 'මේ ශාස්තෘ සර්වඥ ය'යි තෙමේ මැනැ පමණ කොට, 'මේ ධර්මය ස්වාඛ්‍යාත යැ'යි තෙමේ මැනැ පමණ කොට, 'මේ ගණයා සුප්‍රතිපන්න යැ' මෝ දෘෂ්ටිය භද්‍ර යැ' 'මෝ ප්‍රතිපදාව සුප්‍රඥප්ත යැ, 'මේ මාර්ගය නෛර්‍යාණික යැ'යි තෙමේ මැනැ පමණ කොට නුසි 'විනිච්ඡයෙ ඨත්වා සයං පමාය' යනු වේ.

**උද්ධං සො ලොකස්මිං විවාදමෙතීති** – 'උද්ධං'[1] වුච්චති අනාගතං අත්තනො වාදං උද්ධං ඨපෙත්වා සයමෙව කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං එති උපෙති උපගච්ඡති ගණ්හාති පරාමසති අභිනිවිසතීති එවම්පි – උද්ධං සො ලොකස්මිං විවාදමෙති. අථවා අඤ්ඤෙන උද්ධං වාදෙන සද්ධිං කලහං කරොති භණ්ඩනං කරොති විග්ගහං කරොති විවාදං කරොති මෙධගං කරොති: 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති එවම්පි – උද්ධං සො ලොකස්මිං විවාදමෙති.

**හිත්වාන සබ්බානි විනිච්ඡයානීති** – විනිච්ඡයා වුච්චන්ති ද්වාසට්ඨිදිට්ඨි-ගතානි; දිට්ඨිවිනිච්ඡයා සබ්බෙ විනිච්ඡයෙ[2] හිත්වා චජිත්වා පරිච්චජිත්වා ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති – හිත්වාන සබ්බානි විනිච්ඡයානි.

**න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙති** – න කලහං කරොති, න භණ්ඩනං කරොති, න විග්ගහං කරොති, න විවාදං කරොති, න මෙධගං කරොති. වුත්තං හෙතං භගවතා: "එවං විමුත්තචිත්තො ඛො අග්ගිවෙස්සන භික්ඛු න කෙනචි සංවදති, න කෙනචි විවදති, යඤ්ච ලොකෙ වුත්තං, තෙන ච වොහරති අපරාමස"න්ති[a]. **ජන්තූති** සත්තො නරො මානවො පොසො පුග්ගලො ජීවො ජාගු[3] ජන්තු ඉන්දගු[4] මනුජො; **ලොකෙති** අපායලොකෙ -පෙ- ආයතනලොකෙති – න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙති.

තෙනාහ භගවා:

"විනිච්ඡයෙ ඨත්වා සයං පමාය
උද්ධං සො ලොකස්මිං විවාදමෙති,
හිත්වාන සබ්බානි විනිච්ඡයානි
න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙති".

**චූළවියූහසුත්තනිද්දෙසො සමත්තො ද්වාදසමො.**

# 13

## මහාවියූහසුත්තනිද්දෙසො

අථ මහාවියූහසුත්තනිද්දෙසො වුච්චති.

**13 - 1**

යෙ කෙචි'මෙ දිට්ඨිපරිබ්බසානා
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,[5]
සබ්බෙව තෙ නින්දමන්වානයන්ති
අථො පසංසම්පි ලභන්ති තත්ථ.

---

1 උද්ධං සො - සීමු. II. මජසං.
2. සබ්බා විනිච්ඡයදිට්ඨියො - මනුප. සබ්බා විනිච්ඡිතදිට්ඨියො. -PTS.
3. ජතු - සීමු. II. ජගු - PTS. 4. හිඞ්ගු - සීමු. II.
5. පවාදියන්ති - PTS. a. මජ්ඣිමනිකාය - දීඝනඛසුත්ත.

**උද්ධං සො ලොකස්මිං විවාදමෙති** - 'උද්ධං' යි අනාගතය කියනු ලැබෙයි, තමාගේ වාදය මතුයෙහි තබා තෙමේ මැ කලහ - භණ්ඩන- විග්‍රහ - විවාද - මේධගයට එයි පැමිණෙයි එළැඹෙයි, ග්‍රහණය කෙරෙයි පරාමර්ශ කෙරෙයි අභිනිවේශය කෙරේ නුයි මෙසේ ත් - 'උද්ධං සො ලොකස්මිං විවාදමෙති' යනු වේ; නොහොත් තමා මතුයෙහි ලා කථා කරන අනෙකක්හු සමග කලහ කෙරෙයි, ඩබර කෙරෙයි, විග්‍රහ කෙරෙයි, විවාද කෙරෙයි, මේධග කෙරෙයි: 'තෝ මේ ධර්මවිනය නො දන්නෙහි...නොහොත් ඉදිරිපත් නොහොතෙහි නම් (තමා) මුදාගනැ'යි මෙසේත් 'උද්ධං සො ලොකස්මිං විවාදමෙති' යනු වේ.

**හිත්වාන සබ්බානි විනිච්ඡයානි** - 'විනිච්ඡය'යි දෘෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙති; දෘෂ්ටිවිනිශ්චයයන්, සියලු දෙසැට දෘෂ්ටීන් හැර ත්‍යාග කොට පරිත්‍යාග කොට බැහැර කොට දුරු කොට නසා විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'හිත්වාන සබ්බානි විනිච්ඡයානි, යනු වේ.

**න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙ** - කලහ නො කෙරෙයි, ඩබර නො කෙරෙයි, විග්‍රහ නො කෙරෙයි, විවාද නො කෙරෙයි, මේධග නො කෙරෙයි; මේ වදාළේ මැයි: භාග්‍යවතුන් විසින් - "අග්ගිවෙස්සන, මෙසේ මිදුණු සිත් ඇති මහණ තෙම කිසිවක්හු සමග සංවාද නො කෙරෙයි, කිසිවක්හු සමග විවාද නො කෙරෙයි, තවද ලොකයෙහි යමක් කියන ලද නම්, දැඩිව නො ගනිමින් එයින් ව්‍යවහාර කෙරේ යැ"යි. **ජන්තු** යනු: සත්ත්ව- නර - මානව -පුරුෂ - පුද්ගල -ජීව - ජාගු - ජන්තු-ඉන්දගු- මනුජ තෙම; **ලොකෙ** යනු: අපායලොකයෙහි...ආයතනලොකයෙහි නුයි 'න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"විනිච්ඡයෙ ඨත්වා -පෙ- න මෙධගං කුරුතෙ ජන්තු ලොකෙ"**යි.

**දොළොස්වැනි 'චූලවියූහ' සූත්‍රනිද්දේශය සමාප්ත යි.**

# 13

# මහාවියූහසූත්‍රනිද්දේශය

**ඉක්බිති 'මහාවියූහ' සූත්‍රනිද්දේශය කියනු ලැබේ:**

**13 - 1**

**සවකීය දෘෂ්ටිය දැඩි වැ ගෙන වසන්නාවූ යම් කිසි මහණබමුණු කෙනෙක් 'මේ (අපගේ ලබ්ධිය) මැ සැබව, අන්‍යය තුච්ඡ යැ'යි ද කියත් නම්, ඔහු සියල්ලෝ මැ (තමන් වෙත) නින්දාව පුනපුනා එළවත් ද? නොහොත් ඒ දෘෂ්ටිය නිමිති කොට ගෙන ප්‍රශංසාත් ලබත් ද?**

**යෙ කෙචි'මෙ දිට්ඨිපරිබ්බසානාති** – 'යෙ කෙචී'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං 'යෙ කෙචී'ති. **දිට්ඨිපරිබ්බසානාති** සන්තෙකෙ සමණබ්‍රාහ්මණා දිට්ඨිගතිකා. තෙ ද්වාසට්ඨියා දිට්ඨිගතානං අඤ්ඤතරඤ්ඤතරං දිට්ඨිගතං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා සකාය සකාය දිට්ඨියා වසන්ති සංවසන්ති ආවසන්ති පරිවසන්ති. යථා අගාරිකා වා ඝරෙසු වසන්ති, සාපත්තිකා වා ආපත්තීසු වසන්ති, සකිලෙසා වා කිලෙසෙසු වසන්ති, එවමෙවං සන්තෙකෙ -පෙ- පරිවසන්තීති 'යෙ කෙචි' මෙ දිට්ඨි පරිබ්බසානා.'

**ඉදමෙව සච්චන්ති ච වාදයන්තීති** – 'සස්සතො ලොකො' ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති. 'අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං, මොඝමඤ්ඤ'න්ති වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – ඉදමෙව සච්චන්ති ච වාදයන්ති.

**සබ්බෙව තෙ නින්දමන්වානයන්තීති** – සබ්බෙව තෙ සමණබ්‍රාහ්මණා නින්දමෙව අන්වෙන්ති, ගරහමෙව අන්වෙන්ති, අකිත්තිමෙව අන්වෙන්ති, සබ්බෙ නින්දිතායෙව හොන්ති, ගරහිතායෙව හොන්ති අකිත්තිතායෙව හොන්තීති – සබ්බෙව තෙ නින්දමන්වානයන්ති.

**අථො පසංසම්පි ලභන්ති තත්ථාති** – තත්ථ සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා පසංසං ථොමනං කිත්තිං වණ්ණහාරිකං[1] ලභන්ති පටිලභන්ති උපගච්ඡන්ති වින්දන්තීති – අථො පසංසම්පි ලභන්ති තත්ථ.

තෙනාහ සො නිම්මිතො:

"යෙ කෙචි 'මෙ දිට්ඨිපරිබ්බසානා
ඉදමෙව සච්චන්ති ච වාදයන්ති,
සබ්බෙව තෙ නින්දමන්වානයන්ති
අථො පසංසම්පි ලභන්ති තත්ථා"ති.

**18 - 2**

අප්පඤ්හි එතං න අලං[2] සමාය
ද්වෙ විවාදස්ස ඵලානි බ්‍රූමි,
එතම්පි දිස්වා න විවාදයෙථ
ඛෙමාභිපස්සං අවිවාදභූමිං.[3]

**අප්පඤ්හි එතං න අලං සමායාති** – 'අප්පඤ්හි එත'න්ති අප්පකං එතං, ඔමකං එතං, ථොකං එතං, ලාමකං එතං, ඡතුක්කං එතං, පරිත්තකං එතන්ති – අප්පඤ්හි එතං; **න අලං සමායාති** නාලං රාගස්ස සමාය දොසස්ස සමාය මොහස්ස සමාය කොධස්ස උපනාහස්ස මක්ඛස්ස පළාසස්ස ඉස්සාය මච්ඡරියස්ස මායාය සාඨෙය්‍යස්ස ථම්භස්ස සාරම්භස්ස මානස්ස අතිමානස්ස මදස්ස පමාදස්ස සබ්බකිලෙසානං සබ්බදුච්චරිතානං සබ්බපරිළාහානං සබ්බසන්තාපානං සබ්බාකුසලාභිසඞ්ඛාරානං සමාය උපසමාය වූපසමාය නිබ්බානාය[4] පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියාති – අප්පඤ්හි එතං න අලං සමාය.

1. වණ්ණහාරියං - ස. 2. අප්පකෙහිතං නාලං - මජ්ඣ.
3. අවිවාදභූමං - PTS. 4. නිබ්බාපනාය - ස.

**යෙ කෙචි මෙ දිට්ඨිපරිබ්බසානා** - 'යෙ කෙචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වාකාරයෙන් සියල්ල අශේෂ කොට නිශ්ශේෂ කොට හාත්පසින් ගත්තා වචනයෙකි, තෙල 'යෙ කෙචි' යනු; **දිට්ඨිපරිබ්බසානා**-දෘෂ්ටිගතික වූ ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔවුහු දෙසැට දිට්ඨි අතුරෙන් එක්තරා දෘෂ්ටිගතයක් ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට දැඩිගෙන පිවිසගෙන තමතමාගේ දෘෂ්ටියෙහි වෙසෙති මොනවට වෙසෙති වෙසෙසින් වෙසෙති හාත්පසින් වෙසෙත්. යම්සේ ගෘහිමියෝ හෝ ගෙවල වෙසෙත්ද, ඇවැත් බහුලයෝ හෝ ඇවැත්හි වෙසෙත් ද, කෙලෙස් බහුලයෝ හෝ කෙලෙස්හි වෙසෙත් ද, එපරිද්දෙන් ඇතැම් මහණබමුණු කෙනෙක්... හාත්පසින් වෙසෙත් නුයි 'යෙ කෙචි'මෙ දිට්ඨිපරිබ්බසානා' යනු වේ.

**ඉදමෙව සච්චන්ති ච වාදයන්ති** - 'ශාශ්වත යැ ලොකය, මෙය මැ සැබෑව අන්‍යය මොස යැ'යි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. 'අශාශ්වත යැ ලොකය...සත්ත්වයා මරණින් මත්තෙහි නො මැ වෙයි, නො වන්නේ නො වෙයි. මෙය මැ සැබව, අන්‍යය මොස යැ'යි පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'ඉදමෙව සච්චන්ති ච වාදයන්ති' යනු වේ.

**සබ්බෙව තෙ නින්දමන්වානයන්ති** - ඒ සියලු මැ මහණබමුණෝ නින්දාවට ම පැමිණෙති, ගර්හාවට ම, පැමිණෙති අකීර්තියට ම පැමිණෙති, සියල්ලෝ නින්දා කරන ලද්දහු ම වෙති, ගරහන ලද්දහු ම වෙති, අවමන් කරන ලද්දහු ම වෙත් නුයි 'සබ්බෙව තෙ නින්දමන්වානයන්ති' යනු වේ.

**අථො පසංසම්පි ලභන්ති තත්ථ** - එහි සවකීය දෘෂ්ටියෙහි සවකීය කැමැත්තෙහි සවකීය රුචියෙහි සවකීය ලබ්ධියෙහි ප්‍රශංසාව ස්තුතිය කීර්තිය ගුණ වැඩීම ලබති පිළිලබති පැමිණෙති විඳිත් නුයි 'අථො පසංසම්පි ලභන්ති තත්ථ' යනු වේ.

එසින් කීහ ඒ මැවුණු බුදුහු:

**“යෙ කෙචි මෙ -පෙ- අථො පසංසම්පි ලභන්ති තත්ථ”**යි.

## 13 - 2

තෙල ප්‍රශංසා සඞ්ඛ්‍යාත වාදඵලය අල්ප මැ ය. (රාගාදීන්ගේ) සන්සිඳීම පිණිස සමර්ථ නො වේ. විවාදයාගේ (ජය - පරාජයාදි) ඵල දෙකක් කියමි. (විවාදයාගේ) තෙල ආදීනවය ද දැක, අවිවාදභූමි සඞ්ඛ්‍යාත නිවන ක්ෂෙම යයි දක්මින් විවාද නො කරන්නේ යි.

**අප්පඤ්හි එතං න අලං සමාය** - 'අප්පඤ්හි එතං' යනු: තෙල අල්ප යැ, තෙල පහත් යැ, තෙල මඳ යැ, තෙල පචිටු යැ, තෙල අහේතුක යැ, තෙල පරිත්ත නුයි 'අප්පඤ්හි එතං' යනු වේ. **න අලං සමාය** - රාගයාගේ ශමනයට ද්වේෂයාගේ ශමනයට මෝහයාගේ ශමනයට ක්‍රොධ - උපනාහ මක්ඛ - පලාස - ඊර්ෂ්‍යා - මාත්සර්‍ය්‍ය - මායා - සාඨෙය්‍ය - ස්තම්භ - සංරම්භ - මාන - අතිමාන - මද - ප්‍රමාදයාගේ සියලු කෙලෙසුන්ගේ සියලු දුශ්චරිතයන්ගේ සියලු දරථයන්ගේ සියලු පරිදාහයන්ගේ සියලු සන්තාපයන්ගේ සියලු අකුශලාභිසංස්කාරයන්ගේ ශමනයට උපශමනයට සන්හිඳුවීමට අමාමහනිවනට (මාර්ගයෙන්) කෙලෙසුන් දුරලීමට (ඵලයෙන්) අනුත්පාදනිරොධයට සමර්ථ නො වේ නුයි 'අප්පඤ්හි එතං න අලං සමාය' යනු වේ.

**දුවෙ විවාදස්ස ඵලානි බ්‍රූමීති** – දිට්ඨිකලහස්ස දිට්ඨිභණ්ඩනස්ස දිට්ඨිවිග්ගහස්ස දිට්ඨිවිවාදස්ස දිට්ඨිමෙධගස්ස ද්වෙ ඵලානි හොන්ති: ජයපරාජයො හොති, ලාභාලාභො හොති, යසායසො හොති, නින්දාපසංසා හොති, සුඛදුක්ඛං හොති, සොමනස්සදොමනස්සං හොති, ඉට්ඨානිට්ඨං හොති, අනුනයපටිඝං හොති, උග්ඝාතිනිග්ඝාති හොති, අනුරොධවිරොධො හොති; අථ වා තං කම්මං නිරයසංවත්තනිකං තිරච්ඡානයොනිසංවත්තනිකං පෙත්තිවිසයසංවත්තනිකන්ති බ්‍රූමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරොමි පකාසෙමීති – දුවෙ විවාදස්ස ඵලානි බ්‍රූමි.

**එතම්පි දිස්වා න විවාදයෙථාති** – 'එතම්පි දිස්වා'ති එතං ආදීනවං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා දිට්ඨිකලහෙසු දිට්ඨිභණ්ඩනෙසු දිට්ඨිවිග්ගහෙසු දිට්ඨිවිවාදෙසු දිට්ඨිමෙධගෙසූති එතම්පි දිස්වා; **න විවාදයෙථාති** න කලහං කරෙය්‍ය, න භණ්ඩනං කරෙය්‍ය, න විග්ගහං කරෙය්‍ය, න විවාදං කරෙය්‍ය, න මෙධගං කරෙය්‍ය, කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, කලහා භණ්ඩනා විග්ගහා විවාදා මෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසංයුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – එතම්පි දිස්වා න විවාදයෙථ.

**ඛෙමාභිපස්සං අවිවාදභූමින්ති** – අවිවාදභූමිං වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං; එතං අවිවාදභූමිං ඛෙමතො තාණතො ලෙණතො සරණතො අභයතො අච්චුතතො අමතතො නිබ්බානතො පස්සන්තො දක්ඛන්තො ඔලොකෙන්තො නිජ්ඣායන්තො උපපරික්ඛන්තොති – ඛෙමාභිපස්සං අවිවාදභූමිං.

තෙනාහ භගවා:

"අප්පඤ්හි එතං න අලං සමාය
දුවෙ විවාදස්ස ඵලානි බ්‍රූමි,
එතම්පි දිස්වා න විවාදයෙථ
ඛෙමාභිපස්සං අවිවාදභූමි"න්ති.

## 18 - 8

යා කාචිමා සම්මුතියො පුථුජ්ජා
සබ්බාව එතා න උපෙති විද්වා,
අනූපයො සො උපයං කිමෙය්‍ය[1]
දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො.[2]

**යා කාචිමා සම්මුතියො පුථුජ්ජාති** – 'යා කාචී'ති සබ්බෙන සබ්බං සබ්බථා[3] සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං[4] 'යා කාචී'ති; **සම්මුතියොති** සම්මුතියො වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි දිට්ඨිසම්මුතියො;[5] **පුථුජ්ජාති** පුථුජ්ජනෙහි ජනිතා සම්මුතියොති පුථුජ්ජා; පුථු නානා ජනෙහි ජනිතා වා සම්මුතියොති පුථුජ්ජාති – යා කාචි'මා සම්මුතියො පුථුජ්ජා.

---

1. කප්පෙය්‍ය – මනුප. 2. ඛන්තිමකුප්පමානො – මනුප.
3. සබ්බතො – ස්‍යා. 4. පරියාදනවචනමෙතං – මනුප.
5. තා සම්මුතියො – ස.

**දුවෙ විවාදස්ස ඵලානි බ්‍රෑමි** - දෘෂ්ටිකලහයාගේ දෘෂ්ටිභණ්ඩනයාගේ දෘෂ්ටිවිග්‍රහයාගේ දෘෂ්ටිවිවාදයාගේ දෘෂ්ටිමේධගයාගේ ඵල දෙකෙක් වෙති; ජය - පරාජය වෙයි, ලාභ - අලාභවෙයි, යශස් - අයශස් වෙයි, නින්‍දා - ප්‍රශංසා වෙයි, සුව - දුක් වෙයි, සොම්නස් - දොම්නස් වෙයි, ඉට්ඨ - අනිට්ඨ වෙයි, අනුනය - ප්‍රතිඝ වෙයි, අනුග්‍රහ - නිග්‍රහ වෙයි, සෙනහ - කොප වේ; නොහොත් ඒ කර්මය නිරයෙහි ඉපදීම පිණිස පවත්නේය, තිරිසන්යොන්හි ඉපදීම පිණිස පවත්නේය, ප්‍රෙතවිෂයෙහි ඉපදීම පිණිස පවත්නේයැ'යි කියමි පවසමි පනවමි පිහිටුවමි, විවරණ කෙරෙමි, විභාග කෙරෙමි, ප්‍රකට කෙරෙමි, ප්‍රකාශ කෙරෙමි නුයි 'දුවෙ විවාදස්ස ඵලානි බ්‍රෑමි' යනු වේ.

**එතම්පි දිස්වා න විවාදයෙථ** - 'එතම්පි දිස්වා' යනු: තෙල ආදීනවය දැක බලා තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට දෘෂ්ටිකලහයන්හි දෘෂ්ටිභණ්ඩනයන්හි දෘෂ්ටිවිග්‍රහයන්හි දෘෂ්ටිවිවාදයන්හි දෘෂ්ටිමේධගයන්හි නුයි 'එතම්පි දිස්වා' යනු වේ. **න විවාදයෙථ** - කලහ නො කරන්නේය, ඩබර නො කරන්නේය, විග්‍රහ නො කරන්නේය, විවාද නො කරන්නේය, මේධග නො කරන්නේය, කලහ භණ්ඩන විග්‍රහ විවාද මේධග හරනේය, දුරු කරන්නේය විගතාන්ත කරන්නේය, අනභාවයට පමුණුවන්නේය, කලහයෙන් භණ්ඩන - විග්‍රහ - විවාද - මේධගයෙන් දුරු වූයේ වෙන්වූයේ වෙසෙසින් වෙන්වූයේ නික්මැගියේ බැහැරි වූයේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ වන්නේය, විගතමයඵාදා කල සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'එතම්පි දිස්වා න විවාදයෙථ' යනු වේ.

**ඛෙමාභිපස්සං අවිවාදභූමිං** - 'අවිවාදභූමි'යි අමාමහනිවන කියනු ලැබෙයි: යම් ඒ සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාක්ෂයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි; තෙල අවිවාද භූමිය ක්ෂෙම හෙයින් ත්‍රාණ හෙයින් ලෙන හෙයින් සරණ හෙයින් අභය හෙයින් අච්‍යුත හෙයින් අමෘත හෙයින් නිර්වාණ හෙයින් බලනුයේ දක්නේ අවලොකනය කරනුයේ සිතනුයේ විමසනුයේ නුයි 'ඛෙමාභිපස්සං අවිවාදභූමිං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**අප්පඤ්හි එතං -පෙ- ඛෙමාභිපස්සං අවිවාදභූමිං**"යි.

## 13 - 8

පුහුදුනුවන් කෙරෙන් පහළ වූ යම් කිසි දෘෂ්ටි කෙනෙක් වෙත් ද, විද්වද් තෙමේ තෙල සියලු මැ දෘෂ්ටීන්ට නො පැමිණෙයි. (තෘෂ්ණා දෘෂ්ටි) උපය රහිත වූ හෙතෙම දෘෂ්ට - ශ්‍රැත - මුතශුද්ධියෙහි රුචි නො කරනුයේ රූපාදි උපයකට කිම පැමිණෙන්නේ ද.

**යා කාචිමා සම්මුතියො පුථුජ්ජා** - 'යා කාචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වාකාරයෙන් සියල්ල අශෙෂ කොට නිශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි: තෙල 'යා කාචි' යනු; **සම්මුතියො** - 'සම්මුති'යි ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ කියනු ලැබෙයි, ඒ දෘෂ්ටිසම්මුතිහු; **පුථුජ්ජා** - පුහුදුනුවන් විසින් උපදවන ලද සම්මුතිහු නුයි 'පුථුජ්ජා' නම් වෙති: බොහෝ නානා ජනයන් විසින් උපදවන ලද සම්මුතිහු නුයි හෝ 'පුථුජ්ජා' නම් වෙත් නුයි 'යා කාචිමා සම්මුතියො පුථුජ්ජා' යනු වේ.

**සබ්බාව එතා න උපෙති විද්වාති** - විද්වා විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී; සබ්බාව එතා දිට්ඨිසම්මුතියො නෙති, න උපෙති, න උපගච්ඡති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසතීති - සබ්බාව එතා න උපෙති විද්වා.

**අනූපයො සො උපයං කිමෙය්‍යාති** - 'උපයොති' ද්වෙ උපයා: තණ්හූපයො ච දිට්ඨූපයො ච -පෙ- අයං දිට්ඨූපයො, තස්ස තණ්හූපයො පහීනො, දිට්ඨූපයො පටිනිස්සට්ඨො; තණ්හූපයස්ස පහීනත්තා දිට්ඨූපයස්ස පටිනිස්සට්ඨත්තා අනූපයො පුග්ගලො කිං රූපං උපෙය්‍ය උපගච්ඡෙය්‍ය ගණ්හෙය්‍ය පරාමසෙය්‍ය අභිනිවෙසෙය්‍ය 'අත්තා මෙ'ති', කිං වෙදනං - කිං සඤ්ඤං - කිං සඞ්ඛාරෙ - කිං විඤ්ඤාණං - කිං ගතිං - කිං උපපත්තිං - කිං පටිසන්ධිං - කිං භවං - කිං සංසාරං - කිං වට්ටං උපෙය්‍ය උපගච්ඡෙය්‍ය ගණ්හෙය්‍ය පරාමසෙය්‍ය අභිනිවෙසෙය්‍යාති - අනූපයො සො උපයං කිමෙය්‍ය.

**දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානොති** - දිට්ඨෙ වා දිට්ඨසුද්ධියා වා සුතෙ වා සුතසුද්ධියා වා මුතෙ වා මුතසුද්ධියා වා ඛන්තිං අකුබ්බමානො ඡන්දං අකුබ්බමානො පෙමං අකුබ්බමානො රාගං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානොති - දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො.

තෙනාහ භගවා:

"යා කාචිමා සම්මුතියො පුථුජ්ජා
සබ්බාව එතා න උපෙති විද්වා,
අනූපයො සො උපයං කිමෙය්‍ය
දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො"ති.

**18 - 4**

සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං
වතං[1] සමාදාය උපට්ඨිතා සෙ,
ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධිං
භවූපනීතා කුසලාවදානා.

**සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධින්ති** - සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලුත්තමවාදා, තෙ සීලමත්තෙන සඤ්ඤමමත්තෙන සංවරමත්තෙන අවීතික්කමමත්තෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ආහංසු වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්ති; **සමණමුණ්ඩිකාපුත්තකො** එවමාහ: - "චතූහි ඛො අහං ථපති ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං. කතමෙහි චතූහි:

1. වත්තං - PTS.

**සඞ්ඛාය එතා න උපෙති විද්වා** – විද්වද් තෙමේ විද්‍යාවට පැමිණියේ නුවණැතියේ විමංසනප්‍රඥ ඇතියේ තීරණප්‍රඥ ඇතියේ තෙල සියලු මැ දෘෂ්ටිසම්මුතීන්ට නො එයි, නො පැමිණෙයි, උපගමනය නො කෙරෙයි, නො ගනී, නො දැනගනී, නො පිවිසගනී නුයි 'සඞ්ඛාය එතා න උපෙති විද්වා' යනු වේ.

**අනූපයො සො උපයං කිමෙය්‍ය** – 'උපය' නම්: තෘෂ්ණා උපය ද දෘෂ්ටි උපය දැයි උපයයෝ දෙදෙනෙකි...මේ දෘෂ්ටිඋපය නම්. ඔහු විසින් තෘෂ්ණා උපය ප්‍රහීණ ය, දෘෂ්ටිඋපය දුරලන ලද්දේය. තෘෂ්ණාඋපය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිඋපය දුරලූ බැවින් උපය රහිත වූ පුද්ගල තෙම කිම රූපය 'මාගේ ආත්මය' යි පැමිණෙන්නේ ද එළැඹෙන්නේ ද ග්‍රහණය කරන්නේ ද පරාමර්ශනය කරන්නේ ද අභිනිවෙශය කරන්නේ ද, කිම වේදනාව-සංඥාව – සංස්කාරයන් – විඥානය – ගතිය – උත්පත්තිය – ප්‍රතිසන්ධිය- භවය-සංසාරය – කිම වෘත්තයට පැමිණෙන්නේ ද, එළඹෙන්නේ ද, ග්‍රහණය කරන්නේ ද, පරාමර්ශණය කරන්නේ ද, අභිනිවෙශය කරන්නේ දැ'යි 'අනූපයො සො උපයං කිමෙය්‍ය' යනු වේ.

**දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො** – රූපායතන සඞ්ඛ්‍යාත දෘෂ්ටයෙහි හෝ දෘෂ්ටශුද්ධියෙහි හෝ ශබ්දායතන සඞ්ඛ්‍යාත ශ්‍රැතයෙහි හෝ ශ්‍රැතශුද්ධියෙහි හෝ ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතන සඞ්ඛ්‍යාත මුතයෙහි හෝ මුතශුද්ධියෙහි හෝ රුචිය නො කරනුයේ ඡන්දය නො කරනුයේ ප්‍රේමය නො කරනුයේ රාගය නො කරනුයේ නූපදවනුයේ වෙසෙසින් නූපදවනුයේ නො නිපදවනුයේ නො පහළ කරනුයේ නුයි 'දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යා කාචි –පෙ- දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බමානො"යි.

## 13 - 4

ශීලය මැ උතුමැයි හඟනාවූ ඇතැම් මහණබමුණු කෙනෙක් සංයම මාත්‍රයෙන් ශුද්ධිය කියති. (හස්තිව්‍රතාදි) ව්‍රතය සමාදන්ව එළැඹසිටියාහු 'මේ දෘෂ්ටියෙහි මැ හික්මෙනුවම්හ. එකල්හි මේ සත්ත්වයාගේ ශුද්ධිය වේ' යයි භවයට පැමිණියාහු මැ කියති. (එහෙත් ඔහු) කුශලවාද ඇත්තාහු වෙත්.

**සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං** – ශීලය මැ උතුමැයි සිතන්නාවූ ඇතැම් මහණබමුණු කෙනෙක් වෙති. ඔවුහු ශීලමාත්‍රයෙන් සංයමමාත්‍රයෙන් සංවරමාත්‍රයෙන් අව්‍යතික්‍රමමාත්‍රයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසයි කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත්. **ශ්‍රමණමණ්ඩිකාපුත්‍ර** තෙම මෙසේ කියයි: "ගෘහපතිය යම් කරුණු සතරෙකින් සමන්විත වූ පුද්ගලයා පිරිපුන් කුසල් ඇති උතුම් කුසල් ඇති උත්තම වූ අභීප්සියට පැමිණි අයොධ්‍ය වූ (–වාදයෙන් නො පැරැදවිය හැකි) ශ්‍රමණයා යැ'යි දක්වමි. කවර සතරකිනැ යත්:

ඉධ ථපයි න කායෙන පාපකං[1] කම්මං කරොති; න පාපකං වාචං භාසති; න පාපකං සඞ්කප්පං සඞ්කප්පෙති; න පාපකං ආජීවං ආජීවති[2]. ඉමෙහි ඛො අහං ථපති චතූහි ධම්මෙහි සමන්නාගතං පුරිසපුග්ගලං පඤ්ඤපෙමි සම්පන්නකුසලං පරමකුසලං උත්තමපත්තිපත්තං සමණං අයොජ්ඣං"ති.[ක] එවමෙවං සන්තෙකෙ සමණබ්‍රාහ්මණා සීලුත්තමවාදා, තෙ සීලමත්තෙන සඤ්ඤමමත්තෙන සංවරමත්තෙන අවීතික්කමමත්තෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ආහංසු වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති – සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං.

**වතං සමාදාය උපට්ඨිතා සෙති** – 'වත'න්ති හත්ථිවතං වා අස්සවතං වා ගොවතං වා කුක්කුරවතං වා කාකවතං වා වාසුදෙවවතං වා බලදෙවවතං වා පුණ්ණභද්දවතං වා මණිභද්දවතං වා අග්ගිවතං වා නාගවතං වා සුපණ්ණවතං වා යක්ඛවතං වා අසුරවතං වා ගන්ධබ්බවතං වා මහාරාජවතං වා චන්දවතං වා සූරියවතං වා ඉන්දවතං වා බ්‍රහ්මවතං වා දෙවවතං වා දිසාවතං වා ආදාය සමාදාය ආදියිත්වා සමාදියිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා උපට්ඨිතා පච්චුපට්ඨිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති[3] – වතං සමාදාය උපට්ඨිතා සෙ.

**ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධින්ති** – 'ඉධා'ති සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා; **සික්ඛෙමාති** සික්ඛෙම ආචරෙම සමාචරෙම සමාදාය වත්තෙමාති ඉධෙව සික්ඛෙම; **අථස්ස සුද්ධින්ති** අථස්ස සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තින්ති – ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධිං.

**භවූපනීතා කුසලාවදානාති** – 'භවූපනීතා'ති භවූපනීතා භවූපගතා භවජ්ඣොසිතා භවාධිමුත්තාති – භවූපනීතා; **කුසලාවදානාති** කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති – භවූපනීතා කුසලාවදානා.

තෙනාහ භගවා:

"සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං
වතං සමාදාය උපට්ඨිතා සෙ,
ඉධෙව සික්ඛෙම අථස්ස සුද්ධිං
භවූපනීතා කුසලාවදානා"ති.

**18 – 5**

සචෙ චුතො සීලබ්බතතො[4] හොති
ස වෙධති කම්මං විරාධයිත්වා,
ස ජප්පති[5] පත්ථයතීධ සුද්ධිං
සත්ථාව හීනො පවසං ඝරම්හා.

1. පාපකම්මං - සීමු II. PTS 2. ජීවති - සභා 3. අධිමුත්තාති - සීමු. II.
ක. මජ්ඣිමනිකාය - සමණමණ්ඩිකාසුත්ත.
4. සීලවතතො - සීමු. II මජසං. PTS. 5. පජප්පති - මජසං. මනුප.

ගෘහපතිය, මෙහි (යමෙක්) කයින් පව්කම් නො කෙරේ ද, ලාමක වූ තෙපුල් නො බෙණේ ද, ලාමක වූ සංකල්පය නො සිතා ද, ලාමක වූ ආජීවයෙන් ජීවත් නො වේ ද, ගෘහපතිය, මේ කරුණු සතරින් යුක්ත වූ පුද්ගලයා පරිපූර්ණ වූ කුසල් ඇති උත්තම වූ කුසල් ඇති උත්තම වූ අග්‍රත්වයට පැමිණි අයොධ්‍ය වූ ශ්‍රමණයා' යි කියමි." මේ පරිච්ඡෙදන් ශීලය මැ උතුමැයි වාද ඇති ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත්තාහුය; ඔවුහු ශීලමාත්‍රයෙන් සංයමමාත්‍රයෙන් සංවරමාත්‍රයෙන් අව්‍යතික්‍රමමාත්‍රයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'සීලුත්තමා සඤ්ඤමෙනාහු සුද්ධිං' යනු වේ.

**වතං සමාදාය උපට්ඨිතා සෙ** – 'වත' නම්: හස්තිව්‍රතය හෝ අශ්වව්‍රතය හෝ ගොව්‍රතය හෝ කුක්කුරව්‍රතය හෝ කාකව්‍රතය හෝ වාසුදෙවව්‍රතය හෝ බලදෙවව්‍රතය හෝ පූර්ණභද්‍රව්‍රතය හෝ මණිභද්‍රව්‍රතය හෝ අග්නිව්‍රතය හෝ නාගව්‍රතය හෝ සුපර්ණව්‍රතය හෝ යක්‍ෂව්‍රතය හෝ අසුරව්‍රතය හෝ ගාන්ධර්වව්‍රතය හෝ මහාරාජව්‍රතය හෝ චන්ද්‍රව්‍රතය හෝ සූර්‍ය්‍යව්‍රතය හෝ ඉන්ද්‍රව්‍රතය හෝ බ්‍රහ්මව්‍රතය හෝ දෙවව්‍රතය හෝ දිශාව්‍රතය හෝ ගෙන සමාදන්ව ආදානය කොට සමාදානය කොට ග්‍රහණය කොට පරාමර්ශනය කොට අභිනිවේශය කොට එළැඹ සිටියාහු ප්‍රත්‍යුපස්ථිත වූවාහු ඇලුණාහු පැමිණියාහු බැසගත්තාහු වැදගත්තාහු නුයි 'වතං සමාදාය උපට්ඨිතාසෙ' යනු වේ.

**ඉධෙව සික්ඛම අථස්ස සුද්ධිං** – 'ඉධ' යනු: ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය ක්‍ෂාන්තියෙහි ස්වකීය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි; **සික්ඛම** හික්මෙම්හ හැසිරෙම්හ මොනොවට හැසිරෙම්හ සමාදන්ව පවතුම්හයි 'ඉධෙව සික්ඛම' යනු වේ. **අථස්ස සුද්ධිං** – එකල්හි ඔහුගේ ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය වේ නුයි 'ඉධෙව සික්ඛම අථස්ස සුද්ධිං' යනු වේ.

**භවූපනීතා කුසලාවදානා** – 'භවූපනීතා' යනු: භවයට එළඹියාහු භවයට පැමිණියාහු භවයට බැසගත්තාහු භවයෙහි ඇලුණාහු නුයි 'භවූපනීතා' යනු වේ; **කුසලාවදානා** – ස්වකීය ලබ්ධියෙහි කුසලයම්හ යන වාද ඇත්තාහු පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද ඇත්තාහු න්‍යායවාද ඇත්තාහු හෙතුවාද ඇත්තාහු ලක්‍ෂණවාද ඇත්තාහු කාරණවාද ඇත්තාහු ස්ථානවාද ඇත්තාහු නුයි 'භවූපනීතා කුසලාවදානා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**' සීලුත්තමා -පෙ- භවූපනීතා කුසලාවදානා''යි**

## 18 – 5

ඉදින් ශීලව්‍රතයෙන් ගිලිහුණේ වේ නම්, හෙතෙම ඒ ශීලව්‍රතකර්මය වරදවාගෙන කම්පා වෙයි. තවද හෙතෙම ගෙන් නික්මැගොස් තො රට වසන පුරුෂයෙක් සාර්ථයෙන් පසුවූයේ (ඒ ගෙය හෝ සාර්ථය හෝ පතන්නාක් මෙන්) ඒ ශීලව්‍රතශුද්ධිය ජල්පනය කෙරෙයි. පතන්නේත් වේ.

**සචෙ චුතො සීලබ්බතතො**[1] **හොතීති**-ද්වීහි කාරණෙහි සීලබ්බතතො[1] චවති: පරවිච්ඡින්දනාය[2] වා චවති, අනභිසම්භුණන්තො වා චවති. කථං පරවිච්ඡින්දනාය[2] චවති? පරො විච්ඡින්දති 'සො සත්ථා න සබ්බඤ්ඤූ, ධම්මො න ස්වාක්ඛාතො, ගණො න සුප්පටිපන්නො, දිට්ඨි න භද්දිකා, පටිපදා න සුපඤ්ඤත්තා, මග්ගො න නිය්‍යානිකො, නත්ථෙත්ථ සුද්ධි වා විසුද්ධි වා පරිසුද්ධි වා මුත්ති වා විමුත්ති වා පරිමුත්ති වා, නත්ථෙත්ථ සුජ්ඣන්ති වා, විසුජ්ඣන්ති වා, මුච්චන්ති වා, විමුච්චන්ති වා, පරිමුච්චන්ති වා, හීනා නිහීනා ඔමකා ලාමකා ඡත්තකා පරිත්තාති, එවං පරො විච්ඡින්දති.[3] එවං විච්ඡින්දියමානො සත්ථාරා චවති. ධම්මක්ඛානා චවති. ගණා චවති. දිට්ඨියා චවති. පටිපදාය චවති මග්ගතො චවති. එවං පරවිච්ඡින්දනාය චවති. කථං අනභිසම්භුණන්තො චවති? සීලං අනභිසම්භුණන්තො සීලතො චවති. වතං අනභිසම්භුණන්තො වතතො චවති. සීලබ්බතං අනභිසම්භුණන්තො සීලබ්බතතො චවති. එවං අනභිසම්භුණන්තො චවතීති- සචෙ චුතො සීලබ්බතතො[1] හොති.

**ස වෙධති කම්මං විරාධයිත්වාති** - 'ස වෙධතී'ති සීලං වා වතං වා සීලබ්බතං වා විරද්ධං මයා අපරද්ධං මයා ඛලිතං මයා ගලිතං මයා අඤ්ඤාය අපරද්ධො අහන්ති වෙධති පවෙධති සම්පවෙධතීති - ස වෙධති; **කම්මං විරාධයිත්වාති** පුඤ්ඤාභිසඞ්ඛාරං වා අපුඤ්ඤාභිසඞ්ඛාරං වා ආනෙඤ්ජාභිසඞ්ඛාරං වා විරද්ධං මයා අපරද්ධං මයා ඛලිතං මයා ගලිතං මයා අඤ්ඤාය අපරද්ධො අහන්ති වෙධති පවෙධති සම්පවෙධතීති - ස වෙධති කම්මං විරාධයිත්වා.

**ස ජප්පති පත්ථයතිච්ච සුද්ධින්ති** - 'ස ජප්පතී'ති සීලං වා ජප්පති, වතං වා ජප්පති, සීලබ්බතං වා ජප්පති පජප්පති අභිජප්පතීති-ස ජප්පති; **පත්ථයතිච්ච සුද්ධින්ති** සීලසුද්ධිං වා පත්ථෙති, වතසුද්ධිං වා පත්ථෙති, සීලබ්බතසුද්ධිං වා පත්ථෙති, පිහෙති අභිජප්පතීති - ස ජප්පති පත්ථයතිච්ච සුද්ධිං.

**සත්ථාවහීනො පවසං ඝරම්හාති** - යථා පුරිසො ඝරතො නික්ඛන්තො සත්ථෙන සහ[1] වසන්තො සත්ථා ඔහීනො තං වා සත්ථං අනුබන්ධති, සකං වා ඝරං පච්චාගච්ඡති, එවමෙව සො දිට්ඨිගතිකො තං වා සත්ථාරං ගණ්හාති, අඤ්ඤං වා සත්ථාරං ගණ්හාති, තං වා ධම්මක්ඛානං ගණ්හාති, අඤ්ඤං වා ධම්මක්ඛානං ගණ්හාති, තං වා ගණං ගණ්හාති, අඤ්ඤං වා ගණං ගණ්හාති, තං වා දිට්ඨිං ගණ්හාති, අඤ්ඤං වා දිට්ඨිං ගණ්හාති, තං වා පටිපදං ගණ්හාති, අඤ්ඤං වා පටිපදං ගණ්හාති, තං වා මග්ගං ගණ්හාති, අඤ්ඤං වා මග්ගං ගණ්හාති පරාමසති අභිනිවිසතීති-සත්ථාවහීනො පවසං ඝරම්හා.

1. පවසං - මනුප. මජසං.
2. පරවිච්ඡන්දනාය - ස.
3. විච්ඡෙදෙති - මනුප.

**සචෙ චුතො සීලබ්බතතො හොති** – දෙකරුණෙකින් ශීලව්‍රතයෙන් ච්‍යුත වෙයි (–ගිලිහෙයි): මෙරමා විසින් වෙන් කිරීමෙන් හෝ ච්‍යුත වෙයි. නො පැමිණෙනුයේ හෝ ච්‍යුත වෙයි. කෙසේසිත් පරවිච්ඡින්දනායෙන් ච්‍යුත වේ ද යත්: අනෙකෙක් වියොග කෙරෙයි: 'ඒ ශාස්තෘ තෙම අසර්වඥ යැ, ධර්මය ස්වාඛ්‍යාත නො වෙයි. ගණයා සුප්‍රතිපන්න නො වෙයි. දෘෂ්ටිය භද්‍ර නො වෙයි. ප්‍රතිපදාව සුප්‍රඥප්ත නො වෙයි. මාර්ගය නෛර්යාණික නො වේ. මෙහි ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය හෝ මුක්තිය විමුක්තිය පරිමුක්තිය හෝ නැත. මෙහි (සත්ත්වයෝ) ශුද්ධ විශුද්ධ පරිශුද්ධ හෝ නො වෙති. මුක්ත විමුක්ත පරිමුක්ත හෝ නො වෙත්. හීනයෝ යැ නිහීනයෝ යැ අවමතයෝ යැ ලාමකයෝ යැ ඡතුක්කයෝ යැ පරිත්තයෝ යැ'යි මෙසේ අනෙකෙක් වියොග කෙරෙයි. මෙසේ වියොග කරනු ලබනුයේ ශාස්තෘහු කෙරෙන් ච්‍යුත වෙයි. ධර්මාඛ්‍යාතයෙන් ගිලිහෙයි. ගණයා කෙරෙන් ගිලිහෙයි. දෘෂ්ටියෙන් ගිලිහෙයි. පිළිවෙතින් ගිලිහෙයි. මාර්ගයෙන් ගිලිහෙයි. මෙසේ පරවිච්ඡින්දනායෙන් ච්‍යුත වේ. කෙසේ (ගුණයට) නො පැමිණෙනුයේ ච්‍යුත වේ ද යත්: ශීලය නො පුරනුයේ ශීලයෙන් ච්‍යුත වෙයි. ව්‍රතය නො පුරනුයේ ව්‍රතයෙන් ච්‍යුත වෙයි. ශීලව්‍රතය නො පුරනුයේ ශීලව්‍රතයෙන් ච්‍යුත වෙයි. මෙසේ අසම්පාදනය කරනුයේ ච්‍යුත වේ නුයි 'සචෙ චුතො සීලබ්බතතො හොති' යනු වේ.

**ස වෙධති කම්මං විරාධයිත්වා** – 'ස වෙධති' යනු: ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය හෝ මා විසින් වරදන ලද, මා විසින් අපරාධ කරන ලද, මා විසින් පිරිහෙළන ලද, මා විසින් ගලිත කරන ලද. නො දැනීමෙන් මම පැරැදුණෙමි, වෙවුලයි වෙසෙසින් වෙවුලයි. හාත්පසින් වෙවුලානුයි 'ස වෙධති' යනු වේ. **කම්මං විරාධයිත්වා** – පුණ්‍යාභිසංස්කාරය හෝ අපුණ්‍යාභිසංස්කාරය හෝ ආනෙඤ්ජාභිසංස්කාරය හෝ මා විසින් වරදනා ලද මා විසින් පරදනා ලද, මා විසින් පිරිහෙළන ලද, මා විසින් ගලිත කරන කරන ලද. නො දැනීමෙන් මම පැරැදුණෙමි' වෙවුලයි. වෙසෙසින් වෙවුලයි, හාත්පසින් වෙවුලානුයි 'ස වෙධති කම්මං විරාධයිත්වා' යනු වේ.

**ස ජප්පති පත්ථයතිච්ච සුද්ධිං** – 'ස ජප්පති' යනු: ශීලය හෝ ජල්පනය කෙරෙයි (–ගුණ කියයි) ව්‍රතය හෝ ජල්පනය කෙරෙයි, ශීලව්‍රතය හෝ ජල්පනය කෙරෙයි, වෙසෙසින් ගුණ කියයි, හාත්පසින් ගුණ කියා නුයි 'ස ජප්පති' යනු වේ. **පත්ථයතිච්ච සුද්ධිං** –'ශීලශුද්ධිය පතයි, ව්‍රතශුද්ධිය හෝ පතයි, ශීලව්‍රතශුද්ධිය හෝ පතයි, කැමැති වෙයි, අභිජල්පනය කෙරේ නුයි 'ස ජප්පති පත්ථයතිච්ච සුද්ධිං' යනු වේ.

**සත්ථාවහීනො පවසං ඝරම්හා** – යම් සේ පුරුෂයෙක් ගෙයින් නික්මෙනුයේ සාර්ථ (–සමූහ) යක් සමග වසනුයේ සාර්ථයෙන් වෙන්වැගියේ ඒ සාර්ථය හෝ ලුහුබඳී ද, සිය ගෙට හෝ පෙරළා ඒ ද, එපරිද්දෙන් ඒ දෘෂ්ටිගතික තෙම ඒ ශාස්තෘහු හෝ ගනී, අනිත් ශාස්තෘවරයකු හෝ ගනී, ඒ ධර්මාඛ්‍යානය හෝ ගනී, අනිත් ධර්මාඛ්‍යානයක් හෝ ගනී, ඒ ගණයා හෝ ගනී, අනිත් ගණයක් හෝ ගනී, ඒ දෘෂ්ටිය හෝ ගනී, අන් දෘෂ්ටියක් හෝ ගනී, ඒ ප්‍රතිපදාව හෝ ගනී, අන් ප්‍රතිපදාවක් හෝ ගනී, ඒ මාර්ගය හෝ ගනී, අන් මාර්ගයක් හෝ ගනී, පරාමර්ශනය කෙරෙයි, අභිනිවේශය කෙරේ නුයි 'සත්ථාවහීනො පවසං ඝරම්හා' යනු වේ.

එතනාහ භගවා:

"සචෙ චුතො සීලබ්බතතො හොති
ස වෙධති කම්මං විරාධයිත්වා,
ස ජප්පති පත්ථයතීච සුද්ධිං
සත්ථාව හීනො පවසං ඝරම්හා"ති

**13 - 6**

සීලබ්බතං වාපි පහාය සබ්බං
කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතං,[1]
සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො
විරතො චරෙ සන්තිමනුග්ගහාය.

**සීලබ්බතං වාපි පහාය සබ්බන්ති** – සබ්බා සීලසුද්ධියො පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, සබ්බා වතසුද්ධියො පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා, සබ්බා සීලබ්බතසුද්ධියො පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති – සීලබ්බතං වාපි පහාය සබ්බං.

**කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතන්ති** – සාවජ්ජකම්මං වුච්චති කණ්හං කණ්හවිපාකං; අනවජ්ජකම්මං වුච්චති සුක්කං සුක්කවිපාකං; සාවජ්ජඤ්ච කම්මං අනවජ්ජඤ්ච කම්මං පහාය පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතං.

**සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානොති** – 'අසුද්ධි'න්ති අසුද්ධිං පත්ථෙන්ති අකුසලෙ ධම්මෙ පත්ථෙන්ති; 'සුද්ධි'න්ති සුද්ධිං පත්ථෙන්ති, පඤ්ච කාමගුණෙ පත්ථෙන්ති; අසුද්ධිං පත්ථෙන්ති – අකුසලෙ ධම්මෙ පත්ථෙන්ති, පඤ්ච කාමගුණෙ පත්ථෙන්ති, සුද්ධිං පත්ථෙන්ති – ද්වාසට්ඨි දිට්ඨිගතානි පත්ථෙන්ති, අසුද්ධිං පත්ථෙන්ති – අකුසලෙ ධම්මෙ පත්ථෙන්ති; පඤ්චකාමගුණෙ පත්ථෙන්ති; ද්වාසට්ඨි දිට්ඨිගතානි පත්ථෙන්ති; සුද්ධිං පත්ථෙන්ති – තෙධාතුකෙ කුසලෙ ධම්මෙ පත්ථෙන්ති; අසුද්ධිං පත්ථෙන්ති – අකුසලෙ ධම්මෙ පත්ථෙන්ති, පඤ්ච කාමගුණෙ පත්ථෙන්ති, ද්වාසට්ඨි දිට්ඨිගතානි පත්ථෙන්ති; තෙධාතුකෙ කුසලෙ ධම්මෙ පත්ථෙන්ති, සුද්ධිං පත්ථෙන්ති පුථුජ්ජනකල්‍යාණකා[2] නියාමාවක්කන්තිං පත්ථෙන්ති, සෙඛා අග්ගධම්මං අරහත්තං පත්ථෙන්ති; අරහතො පනෙත අරහං නෙව අකුසලෙ ධම්මෙ පත්ථෙති, නපි පඤ්ච කාමගුණෙ පත්ථෙති. නපි ද්වාසට්ඨි දිට්ඨිගතානි පත්ථෙති. නපි තෙධාතුකෙ කුසලෙ ධම්මෙ පත්ථෙති, නපි නියාමාවක්කන්තිං පත්ථෙති, නපි අග්ගධම්මං අරහත්තං පත්ථෙති. පත්ථනාසමතික්කන්තො අරහා වුද්ධිපරිහානිං[3] වීතිවත්තො සො වුට්ඨවාසො චිණ්ණචරණො උත්තිණ්ණජාතිජරාමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති – සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො.

1. සාවජ්ජානවජ්ජමෙතං - ස  2. කල්‍යාණපුථුජ්ජනා - ස්‍යා. PTS.
3. පාරිහානිං - සීමු II.

එයින් වදාළහ බුදුහු:

"සමෙව චුතො -පෙ- සත්ථාවසිනො පවසං හරන්තා"ති.

## 18 - 6

(ආර්යශ්‍රාවක තෙමේ) සියලු ශීලව්‍රතය ද, යළි සාවද්‍යානවද්‍ය (-සියලු අකුශල හා ලෞකික කුශල) කර්මය ද හැරපියා තෙල (පඤ්චකාමගුණාදි භෙද වූ) ශුද්ධිය ද, (අකුශලාදි භෙද වූ) අශුද්ධිය ද මෙසේ නො පතනුයේ දෘෂ්ටිඥානාදිය දෘෂ්ටිව නො ගෙන (ශුද්ධි අශුද්ධි දෙකින්) වෙන් වූයේ හැසිරෙන්නේ යි.

**සීලබ්බතං වාපි පහාය සබ්බං** - සියලු ශීලශුද්ධීන් හැර බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා, සියලු ව්‍රතශුද්ධීන් හැර බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා සියලු ශීලව්‍රතශුද්ධීන් හැර බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'සීලබ්බතං වාපි පහාය සබ්බං' යනු වේ.

**කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතං** - 'කෘෂ්ණ වූයේ කෘෂ්ණවිපාක ඇතියේ සාවද්‍යකර්ම යයි කියනු ලැබෙයි. ශුක්ල වූයේ ශුක්ලවිපාක ඇතියේ අනවද්‍යකර්ම යයි කියනු ලැබෙයි. සාවද්‍ය (-අකුශල) කර්මය ද, අනවද්‍ය (-ලෞකික කුශල) කර්මය ද, හැර බැහැර කොට දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා නුයි 'කම්මඤ්ච සාවජ්ජ'නවජ්ජමෙතං' යනු වේ.

**සුද්ධිං අසුද්ධිංන්ති අපත්ථයානො** - 'අසුද්ධිං' යනු: අශුද්ධිය පතයි, අකුශලධර්මයන් පතති; 'සුද්ධිං, යනු: ශුද්ධිය පතති, පඤ්චකාමගුණයන් පතයි; 'අසුද්ධිං පත්ථෙන්ති' - අකුශලධර්මයන් පතති, පඤ්චකාමගුණයන් පතති; 'සුද්ධිං පත්ථෙන්ති' - දෙසැටදිට්ඨිගතයන් පතති, 'අසුද්ධිං පත්ථෙන්ති' අකුශලධර්මයන් පතති, පඤ්චකාමගුණයන් පතති, දෙසැටදිට්ඨිගතයන් පතයි 'සුද්ධිං පත්ථෙන්ති-ත්‍රෛභූමක කුශලධර්මයන් පතති; 'අසුද්ධිං පත්ථෙන්ති-අකුසල් දහම් පතති, පස්කම්ගුණ පතති, දෙසැටදිට්ඨිගතයන් පතති, තුන්බිමට අයත් කුසල්දහම් පතත්; 'සුද්ධිං පත්ථෙන්ති' - කල්‍යාණ-පෘථග්ජනයෝ මාර්ගවිදර්ශනාවට බැසගැනීම පතති, ශෛක්ෂයෝ අග්‍රධර්ම වූ අර්හත්වය පතති, රහත්බව පැමිණි කල්හි රහත් තෙම අකුසල්දහම් නො මැ පතයි, නො ද පස්කම්ගුණ පතයි, නො ද දෙසටදිට්ඨිගතයන් පතයි ත්‍රෛභූමක කුශලධර්මයන් නො ද පතයි, නියාමාවක්‍රාන්තිය නො ද පතයි අග්‍රධර්ම වූ අර්හත්වය නො ද පතයි; ප්‍රාර්ථනා ඉක්මවා සිටි රහත් තෙම වෘද්ධිය හා පරිහාණිය ඉක්මවූයේ යැ, හෙතෙම වැස නිමවූ දශ ආර්යවාස ඇත්තේ යැ, සිල් හා අටසමවත්හි චීර්ණවශී යැ; තරණය කළ ජාතිජරා-මරණසංසාරය ඇත්තේ යැ, ඔහුට පුනර්භවය නැත් නුයි 'සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො' යනු වේ.

**විරතො චරෙ සන්තිමනුග්ගහායාති** - 'විරතො'ති සුද්ධිඅසුද්ධියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති විරතො; **චරෙති** චරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති **'විරතො චරෙ සන්තිමනුග්ගහායාති'** සන්තියො වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි; දිට්ඨිසන්තියො අගණ්හන්තො අපරාමසන්තො අනභිනිවිසන්තොති - විරතො චරෙ සන්තිමනුග්ගහාය.

තෙනාහ භගවා:

"සීලබ්බතං වාපි පහාය සබ්බං
කම්මඤ්ච සාවජ්ජනවජ්ජමෙතං,
සුද්ධිං අසුද්ධින්ති අපත්ථයානො
විරතො චරෙ සන්තිමනුග්ගහායා"ති.

**13 - 7**

තමූපනිස්සාය ජිගුච්ඡිතං වා
අථවාපි දිට්ඨංව සුතං මුතං වා,
උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති
අවීතතණ්හාසෙ භවාභවෙසු.

**තමූපනිස්සාය ජිගුච්ඡිතං වාති** - සන්තෙකෙ සමණබ්‍රාහ්මණා තපොජිගුච්ඡාවාදා[1] තපොජිගුච්ඡාසාරා තපොජිගුච්ඡානිස්සිතා ආනිස්සිතා අල්ලීනා උපගතා අජ්ඣොසිතා අධිමුත්තාති - තමූපනිස්සාය ජිගුච්ඡිතං වා.

**අථවාපි දිට්ඨංච[2] සුතං මුතං වාති** - දිට්ඨං වා දිට්ඨසුද්ධිං වා සුතං වා සුතසුද්ධිං වා මුතං වා මුතසුද්ධිං වා නිස්සාය උපනිස්සාය ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති - අථවාපි දිට්ඨං ව සුතං මුතං වා.

**උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්තීති** - සන්තෙකෙ සමණබ්‍රාහ්මණා උද්ධංසරවාදා.[3] කතමෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධංසරවාදා? යෙ තෙ සමණබ්‍රාහ්මණා අච්චන්තසුද්ධිකා සංසාරසුද්ධිකා අක්‍රියදිට්ඨිකා සස්සතවාදා, ඉමෙ තෙ සමණබ්‍රාහ්මණා උද්ධංසරවාදා, තෙ සංසාරෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං ථුනන්ති වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති - උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති.

**අවීතතණ්හාසෙ භවාභවෙසූති** - 'තණ්හා'ති රූපතණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵොට්ඨබ්බතණ්හා ධම්මතණ්හා.

---

1. ජිගුච්ඡවාදා - ස. PTS 2. දිට්ඨඤ්ච - සීමු. II.
3. උද්ධංසරාවාදා - සීමු. II.

**විරතො චරෙ සන්තිමනුග්ගහාය** - 'විරතො' යනු ශුද්ධි අශුද්ධි දෙකින් දුරු වූයේ වෙන්වූයේ වෙසෙසින් වෙන්වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කල සිතින් යුක්ත ව වෙසේ නුයි 'විරතො' යනු වේ. චරෙ - හැසිරෙන්නේය වෙසෙන්නේය ඉරියව් පවත්වන්නේය වැටෙන්නේය රැකෙන්නේය යැපෙන්නේය යපනය වන්නේ නුයි 'විරතො චරෙ' යනු වේ. **සන්තිමනුග්ගහාය** - සන්ති'යි දෙසැට දිට්ඨිගතයෝ කියනු ලැබෙති. දෘෂ්ටීන් තො ගත්තේ පරාමර්ශනය නො කරනුයේ අභිනිවේශය නො කරනුයේ නුයි 'විරතො චරෙ සන්තිමනුග්ගහාය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සීලබ්බතං වාපි -පෙ- විරතො චරෙ සන්තිමනුග්ගහාය"යි.

**13 - 7**

තවද (ඇතැම් මහණබමුණු කෙනෙක් බුද්ධාදීන් විසින්) ජුගුප්සිත වූ ඒ අමරතපස් හෝ දෘෂ්ටශුද්ධිය හෝ ශ්‍රැතශුද්ධිය හෝ මුතශුද්ධිය හෝ ඇසුරු කොට (අක්‍රියදෘෂ්ටියෙන් හෝ) උද්ධංසරවාද ඇති වැ පුනපුනා භවයෙහි නො හළ තෘෂ්ණා ඇත්තාහු ශුද්ධිය කියත්.

**තමූපනිස්සාය ජිගුච්ඡිතං වා** - කායපීඩනාදි තපසින් පාපජුගුප්සාව පවසන්නාවූ තපොජුගුප්සාව සාර කොට ඇති තපොජුගුප්සාව ඇසුරු කළ භාත්පසින් ඇසුරු කළ (එහි) ඇලුණු බැසගත් පිවිසියා වූ ඇතැම් මහණබමුණු කෙනෙක් ඇත් නුයි 'තමූපනිස්සාය ජිගුච්ඡිතං වා' යනු වේ.

**අථවාපි දිට්ඨං ච සුතං මුතං වා** - දෘෂ්ට (-රූපායතන)ය හෝ දෘෂ්ටශුද්ධිය හෝ ශ්‍රැතය හෝ ශ්‍රැතශුද්ධිය හෝ මුතය හෝ මුතශුද්ධිය හෝ නිසා ඇසුරු කොට ගෙන දැහැගෙන පිවිස ගෙන නුයි 'අථවාපි දිට්ඨං ච සුතං මුතං වා' යනු වේ.

**උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති** - උද්ධංසරවාද ඇති (-සංසාරයෙන් ශුද්ධිය පවසන) ඇතැම් මහණ බමුණු කෙනෙක් වෙති, සංසාරයෙන් ශුද්ධිය පවසන ඒ මහණ බමුණෝ කවරහු ද යත්? අත්‍යන්තශුද්ධිය පවසන සංසාරශුද්ධිය පවසන අක්‍රියදෘෂ්ටි ඇති ශාශ්වතදෘෂ්ටි ඇති ඒ මේ මහණබමුණෝ උද්ධංසරවාද ඇත්තාහු වෙත්. ඔව්හු සංසාරයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පසසති පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති' යනු වේ.

**අවීතතණ්හා සෙ භවාභවෙසු** - 'තණ්හා' යනු: රූපතෘෂ්ණා යැ ශබ්ද තෘෂ්ණා යැ ගන්ධතෘෂ්ණා යැ රසතෘෂ්ණා යැ ස්ප්‍රෂ්ටව්‍යතෘෂ්ණා යැ ධර්මතෘෂ්ණා යි.

**භවාභවෙසූති** - භවාභවෙ කම්මභවෙ පුනබ්භවෙ, කාමභවෙ කම්මභවෙ, කාමභවෙ පුනබ්භවෙ, රූපභවෙ කම්මභවෙ, රූපභවෙ පුනබ්භවෙ, අරූපභවෙ කම්මභවෙ, අරූපභවෙ පුනබ්භවෙ, පුනප්පුනභවෙ පුනප්පුනගතියා පුනප්පුන උපපත්තියා පුනප්පුන පටිසන්ධියා පුනප්පුන අත්තභාවාභිනිබ්බත්තියා අවීත තණ්හා අවිගතතණ්හා අචත්තතණ්හා අවන්තතණ්හා අමුත්තතණ්හා අප්පහීනතණ්හා අප්පටිනිස්සට්ඨතණ්හාති - අවීතතණ්හා සෙ භවාභවෙසු.

තෙනාහ භගවා:

"තමූපනිස්සාය ජිගුච්ඡිතං වා
අථවාපි දිට්ඨංව සුතං මුතං වා,
උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති
අවීතතණ්හා සෙ භවාභවෙසූ"ති.

**13 - 8**

පත්ථයමානස්ස හි ජප්පිතානි
පවෙධිතං[1] වාපි පකප්පිතෙසු,
චුතූපපාතො ඉධ යස්ස නත්ථි
ස කෙන වෙධෙය්‍ය කුහිං ච ජප්පෙ.

**පත්ථයමානස්ස හි ජප්පිතානීති** - පත්ථනා වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **පත්ථයමානස්සාති** පත්ථයමානස්ස ඉච්ඡමානස්ස සාදියමානස්ස පිහයමානස්ස අභිජප්පමානස්සාති පත්ථයමානස්ස හි; **ජප්පිතානීති** ජප්පනා වුච්චති තණ්හා යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලන්ති - පත්ථයමානස්ස හි ජප්පිතානි.

**පවෙධිතං වාපි පකප්පිතෙසූති** - පකප්පනාති ද්වෙ පකප්පනා: තණ්හාපකප්පනා ච දිට්ඨිපකප්පනා ච -පෙ- අයං තණ්හාපකප්පනා; -පෙ- අයං දිට්ඨිපකප්පනා; **පවෙධිතං වාපි පකප්පිතෙසූති** - පකප්පිතං වත්ථුං අච්ඡෙදසඞ්කිනොපි වෙධෙන්ති, අච්ඡින්දන්තෙපි[2] වෙධෙන්ති, අච්ඡින්නෙපි වෙධෙන්ති; පකප්පිතං වත්ථුං විපරිණාමසඞ්කිනොපි වෙධෙන්ති, විපරිණාමන්තෙපි වෙධෙන්ති, විපරිණතෙපි වෙධෙන්ති, පවෙධෙන්ති සම්පවෙධෙන්තීති - පවෙධිතං වාපි පකප්පිතෙසු.

**චුතූපපාතො ඉධ යස්ස නත්ථීති** - 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස; යස්ස ගමනං ආගමනං ගමනාගමනං කාලං ගති භවාභවො චුති ච උපපත්ති ච නිබ්බත්ති ච භෙදො ච ජාති ජරා මරණඤ්ච නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නූපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති - චුතූපපාතො ඉධ යස්ස නත්ථි.

---

1. සංවෙධිතං - සු PTS.
2. අච්ඡිජ්ජන්තෙපි - PTS.

**භවාභවෙසු** - කාමභව රූපාරූපභවයෙහි, කර්මවෘත්තයෙහි පුනර්භවික වූ විපාකවෘත්තයෙහි, කාමභවයෙහි කර්මභවයෙහි, කාමභවයෙහි පුනර්භවයෙහි, රූපභවයෙහි කර්මභවයෙහි, රූපභවයෙහි පුනර්භවයෙහි, අරූපභවයෙහි කර්මභවයෙහි, අරූපභවයෙහි පුනර්භවයෙහි, පුනපුනා භවයෙහි පුනපුනා පස්ගතියෙහි පුනපුනා උපතෙහි පුනපුනා පිළිසඳෙහි පුනපුනා ආත්මභාවය පහළවීමෙහි නො පහවූ තෘෂ්ණා ඇත්තාහු අවිගතතෘෂ්ණා ඇත්තාහු නො හළ තෘෂ්ණා ඇත්තාහු නො වමනය කළ තෘෂ්ණා ඇත්තාහු නො මිදූ තෘෂ්ණා ඇත්තාහු නො පුහුත් තෘෂ්ණා ඇත්තාහු නො බැහැර කළ තෘෂ්ණා ඇත්තාහු නුයි 'අවීතතණ්හාසෙ භවාභවෙසු' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"තමුපනිස්සාය -පෙ- අවීතතණ්හාසෙ භවාභවෙසූ"ති

**13 - 8**

(මෙසේ) පතනුවහුට වැලිත් තෘෂ්ණාජල්පිතයෝ වෙති. තවද තෘෂ්ණා දෘෂ්ටීන් ප්‍රකල්පිත වූ වස්තූන් නිමිති කොට අතිශයින් සැලීම ද වෙයි. මෙලොව යම් ක්ෂීණාස්‍රවයක් හට ච්‍යුති - උත්පත්ති නැත් ද, හෙතෙම කිනම් රාගාදියකින් සැලෙන්නේ ද, කොහි ජල්පනය කරන්නේ ද.

**පත්ථයමානස්ස හි ජප්පිතානි** - 'පත්ථනා'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද, එයයි. **පත්ථයමානස්ස** - පතනුවහුට කැමැති වන්නහුට ඉවසනුවහුට රිසිවන්නහුට අභිජල්පනය කරන්නහුට නුයි 'පත්ථයමානස්ස හි' යනු වේ. **ජප්පිතානි** - 'ජප්පනා'යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් නුයි 'පත්ථයමානස්ස හි ජප්පිතානි' යනු වේ.

**පවෙධිතං වාපි පකප්පිතෙසු** - 'පකප්පනා' යනු: තෘෂ්ණාප්‍රකල්පනය ද දෘෂ්ටිප්‍රකල්පනය දැයි ප්‍රකල්පනා දෙකෙකි...මේ දෘෂ්ටිප්‍රකල්පනා යි. **පවෙධිතං වාපි පකප්පිතෙසු** - ප්‍රකල්පිත වූ වස්තුව 'අසිඳගනිතී' සැක ඇත්තාහු ද සැලෙති, අසිඳුනා කල්හි ද සැලෙති, අසිඳගත් කල්හි ද සැලෙත්, ප්‍රකල්පිත වූ වස්තුව 'පරිවර්තිත වෙති' සැක ඇත්තාහු ද සැලෙති, පෙරළෙන කල්හි ද සැලෙති, පෙරළුණු කල්හි ද සැලෙති, වෙවුලති, අතිශයින් වෙවුලත් නුයි 'පවෙධිතං වාපි පකප්පිතෙසු' යනු වේ.

**චුතූපපාතො ඉධ යස්ස නත්ථි** - 'යස්ස' යනු: අර්හත් ක්ෂීණාස්‍රව හට, යමක් හට (මෙලොවින්) යෑම පෙරළා ඊම ගමනාගමනය මරණය ගතිය පුනපුනා භවය ච්‍යුතිය උත්පත්තිය නිපැත්ම බිඳීම ජාතිය හා ජරාමරණයත් නැත් ද නො වෙත් ද විද්‍යමාන නො වෙත් ද නො ලැබෙත් ද, ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුණාහු දුරලන ලද්දාහු උපනව නුපුදුස වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු නුයි 'චුතූපපාතො ඉධ යස්ස නත්ථි' යනු වේ.

**ස කෙන වෙධෙය්‍ය කුහිං ච ජප්පෙති** – සො කෙන රාගෙන වෙධෙය්‍ය, කෙන දොසෙන වෙධෙය්‍ය, කෙන මොහෙන වෙධෙය්‍ය, කෙන මානෙන වෙධෙය්‍ය, කාය දිට්ඨියා වෙධෙය්‍ය, කෙන උද්ධච්චෙන වෙධෙය්‍ය, කාය විචිකිච්ඡාය වෙධෙය්‍ය, කෙහි අනුසයෙහි වෙධෙය්‍ය, රත්තොති වා දුට්ඨොති වා මූළ්හොති වා විනිබද්ධොති වා පරාමට්ඨොති වා වික්ඛෙපගතොති වා අනිට්ඨංගතොති වා ථාමගතොති වා, තෙ අභිසඞ්ඛාරා පහීනා. අභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා කෙන වෙධෙය්‍ය නෙරයිකොති වා, තිරච්ඡානයොනිකොති වා, පෙත්තිවිසයිකොති වා, මනුස්සොති වා, දෙවොති වා, රූපීති වා, අරූපීති වා, සඤ්ඤීති වා, අසඤ්ඤීති වා, නෙවසඤ්ඤීනාසඤ්ඤීති වා, සො හෙතු නත්ථි; පච්චයො නත්ථි; කාරණං නත්ථි; යෙන වෙධෙය්‍ය පවෙධෙය්‍ය සම්පවෙධෙය්‍යාති – ස කෙන වෙධෙය්‍ය. **කුහිං ච ජප්පෙති** කුහිං වා ජප්පෙය්‍ය, කිම්හි ජප්පෙය්‍ය, කත්ථ ජප්පෙය්‍ය, පජප්පෙය්‍ය අභිජප්පෙය්‍යාති- ස කෙන වෙධෙය්‍ය කුහිං ච ජප්පෙ.

තෙනාහ භගවා:

"පත්ථයමානස්ස හි ජප්පිතානි
පවෙධිතං වාපි පකප්පිතෙසු,
චුතූපපාතො ඉධ යස්ස නත්ථි
ස කෙන වෙධෙය්‍ය කුහිං ච ජප්පෙ"ති.

## 13 - 9

යමාහු ධම්මං පරමන්ති එකෙ
තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ,
සච්චො නු වාදො කතමො ඉමෙසං
සබ්බෙව හි'මෙ කුසලාවදානා.

**යමාහු ධම්මං පරමන්ති එකෙති** – යං ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා ඉදං පරමං අග්ගං සෙට්ඨං විසිට්ඨං පාමොක්ඛං උත්තමං පවරන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – යමාහු ධම්මං පරමන්ති එකෙ.

**තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙති** – තමෙව ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා හීනං එතං නිහීනං එතං ඔමකං එතං ලාමකං එතං ඡත්තකං එතං පරිත්තකං එතන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති – තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ.

**සච්චො නු වාදො කතමො ඉමෙසන්ති** – ඉමෙසං සමණබ්‍රාහ්මණානං වාදො කතමො සච්චො තච්ඡො තථො භූතො යාථාවො අවිපරීතොති- සච්චො නු වාදො කතමො ඉමෙසං.

**ස කෙන වෙදෙය්‍ය කුහිං ච ජප්පෙ** - හෙතෙම කවර රාගයෙකින් සැලෙන්නේ ද, කවර ද්වේෂයෙකින්-කවර මෝහයෙකින්-කවර මානයෙකින් කවර දෘෂ්ටියෙකින් - කවර ඖද්ධත්‍යයෙකින් - කවර විචිකිත්සායෙකින්- කවර අනුශයධර්මයෙකින් සැලෙන්නේ ද, (රාගයෙන්) රක්ත යැ හෝ දුෂ්ට යැ හෝ මූඪ යැ හෝ (මානයෙන්) විනිබද්ධ යැ හෝ (දෘෂ්ටියෙන්) පරාමෘෂ්ට යැ හෝ වික්ෂෙපයට පැමිණියේ යැ හෝ නිෂ්ඨාවට නො ගියේ යැ හෝ තදබවට ගියේ යැ හෝ (යත) ඒ කර්මාභිසංස්කාරයෝ ප්‍රහීණයෝ යැ, අභිසංස්කාරයන් ප්‍රහීණ වූ බැවින් ගතිය හෙතු කොට ගෙන කුමකින් සැලෙන්නේ ද, නිරයෙහි උපදනා සත්ත්වයෙකැ හෝ තිරිසන්යොනිහි උපදනෙකැ හෝ ප්‍රෙතවිෂයෙහි උපදනෙකැ හෝ මිනිස් වන්නෙකැ හෝ දෙවි වන්නෙකැ හෝ රූපී යැ හෝ අරූපී යැ හෝ සංඥී යැ හෝ අසංඥී යැ හෝ නෛවසංඥීනාසංඥී යැ හෝ යම් හෙයකින් කම්පා වන්නේ නම් සැලෙන්නේ නම් වෙසෙසින් සැලෙන්නේ නම් ඒ හේතුව නැත, ප්‍රත්‍යය නැති, කාරණය නැත් නුයි 'ස කෙන වෙදෙය්‍ය' යනු වේ. **කුහිං ච ජප්පෙ** - කොහි හෝ (තෘෂ්ණාවශයෙන්) ජල්පනය කරන්නේ ද, කවර කරුණෙක ජල්පනය කරන්නේ ද, කො තැන්හි ජල්පනය ප්‍රජල්පනය අභිජල්පනය කරන්නේ දැයි 'ස කෙන වෙදෙය්‍ය කුහිං ච ජප්පෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"පකප්පයමානස්ස -පෙ- ස කෙන වෙදෙය්‍ය කුහිං ච ජප්පෙ"**යි.

## 13 - 9

ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දහමක් උතුමැයි කියත් නම්, යළි අන්‍යයෝ එ මැ දහම හීන යයි කියති. මේ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය වූයේ ද? මොහු සියල්ලෝ මැ කුශලවාද ඇත්තාහු මැ වෙත් ද?

**යමාහු ධම්මං පරමන්ති එකෙ** - ඇතැම් මහණබමුණු කෙනෙක් යම් දහමක් දෘෂ්ටියක් ප්‍රතිපදාවක් මාර්ගයක් 'මේ පරම යැ අග්‍ර යැ ශ්‍රෙෂ්ඨ යැ විශිෂ්ට යැ පාමොක් යැ උතුම් යැ ප්‍රවර යැයි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'යමාහු ධම්මං පරමන්ති එකෙ' යනු වේ.

**තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ** - ඇතැම් මහණබමුණෝ එ මැ දහම දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය 'තෙල හීන යැ, තෙල නිහීන යැ, තෙල අවමත යැ, තෙල ලාමක යැ, තෙල ඡත්තක යැ, තෙල අල්ප ය'යි මෙසේ පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි 'තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ' යනු වේ.

**සච්චො නු වාදො කතමො ඉමෙසං** - මේ මහණබමුණන්ගේ කවර වාදයෙක් සත්‍ය වූයේ නො සිස් වූයේ තො වෙනස් වූයේ විද්‍යමාන වූයේ යථාස්වභාව වූයේ අවිපරීත වූයේ දැයි 'සච්චො නු වාදො කතමො ඉමෙසං' යනු වේ.

**සබ්බෙව හිමෙ කුසලාවදානාති** - සබ්බෙපිමෙ සමණබ්‍රාහ්මණා කුසලවාදා පණ්ඩිතවාදා ථිරවාදා ඤායවාදා හෙතුවාදා ලක්ඛණවාදා කාරණවාදා ඨානවාදා සකාය ලද්ධියාති - සබ්බෙව හිමෙ කුසලාවදානා.

තෙනාහ සො නිම්මිතො:[1]

"යමාහු ධම්මං පරමන්ති එකෙ
තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ,
සච්චො නු වාදො කතමො ඉමෙසං
සබ්බෙව හීමෙ කුසලාවදානා"ති.

## 18 - 10

සකං හි ධම්මං පරිපුණ්ණමාහු
අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු,
එවම්පි විග්ගය්හ විවාදයන්ති[2]
සකං සකං සම්මුති[3] මාහු සච්චං.

**සකං හි ධම්මං පරිපුණ්ණමාහූති** - සකං හි ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා ඉදං සමත්තං පරිපුණ්ණං අනොමන්ති එවමාහංසු -පෙ- එවං වොහරන්තීති - සකං හි ධම්මං පරිපුණ්ණමාහු.

**අඤ්ඤස්ස ධම්මං පන හීනමාහූති** - අඤ්ඤස්ස ධම්මං දිට්ඨිං පටිපදං මග්ගං එකෙ සමණබ්‍රාහ්මණා හීනං එතං නිහීනං එතං ඔමකං එතං ලාමකං එතං ඡතුක්කං එතං පරිත්තකං එතන්ති එවමාහංසු, එවං කථෙන්ති, එවං භණන්ති, එවං දීපයන්ති, එවං වොහරන්තීති - අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු.

**එවම්පි විග්ගය්හ විවාදයන්තීති** - එවං ගහෙත්වා උග්ගහෙත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වා විවාදයන්ති, කලහං කරොන්ති, භණ්ඩනං කරොන්ති, විග්ගහං කරොන්ති, විවාදං කරොන්ති, මෙධගං කරොන්ති 'න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසී'ති - 'එවම්පි විග්ගය්හ විවාදයන්ති'.

**සකං සකං සම්මුතිමාහු සච්චන්ති** - 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති සකං සකං සම්මුතිමාහු සච්චං; 'අසස්සතො ලොකො -පෙ- නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති - සකං සකං සම්මුතිමාහු සච්චං.

තෙනාහ භගවා:

"සකං හි ධම්මං පරිපුණ්ණමාහු
අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු,
එවම්පි විග්ගය්හ විවාදයන්ති
සකං සකං සම්මුතිමාහු සච්ච"න්ති.

1. භගවා - සයා. PTS. 2. විවාදියන්ති - PTS. 3. සම්මති - සයා.

**සබ්බෙව හි'මෙ කුසලාවදානා** - මේ සියලු මැ මහණබමුණෝ ස්වකීය ලබ්ධියෙහි කුශලවාද ඇත්තාහු පණ්ඩිතවාද ඇත්තාහු ස්ථිරවාද ඇත්තාහු න්‍යායවාද ඇත්තාහු හේතුවාද ඇත්තාහු ලක්‍ෂණවාද ඇත්තාහු කාරණවාද ඇත්තාහු ස්ථානවාද ඇත්තාහු යි 'සබ්බෙව හි' මෙ කුසලාවදානා' යනු වේ.

එයින් කීහ ඒ මැවුණු බුදුහු:

"යමාහු ධම්මං -පෙ- සබ්බෙව හි'මෙ කුසලාවදානා"යි.

## 18 - 10

(ඇතැම් මහණබමුණෝ) තමන් තමන්ගේ මැ ධර්මය පරිපූර්ණ යැයි කියති, යලි අන්‍යයාගේ ධර්මය හීන යැයි කියත්. මෙසේ ත් දැඩි වැ ගෙන විවාද කෙරෙති, තමන් තමන්ගේ මැ දෘෂ්ටිසම්මතිය සැබවැයි කියත්.

**සකං හි ධම්මං පරිපුණ්ණමාහු** - ඇතැම් මහණබමුණු කෙනෙක් තමන් තමන්ගේ මැ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය 'මෙය සමස්තයැ පරිපූර්ණ යැ අලාමක යැ'යි මෙසේ පවසති...මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'සකං හි ධම්මං පරිපුණ්ණමාහු' යනු වේ.

**අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු**-ඇතැම් මහණබමුණෝ අන්‍යයාගේ ධර්මය දෘෂ්ටිය ප්‍රතිපදාව මාර්ගය 'තෙල හීන යැ තෙල නිහීන යැ තෙල අවමන යැ තෙල ලාමක යැ තෙල ඡත්‍තක යැ තෙල අල්ප යැ'යි මෙසේ පවසති, මෙසේ කියති, මෙසේ බෙණෙති, මෙසේ දක්වති, මෙසේ ව්‍යවහාර කෙරෙත් නුයි 'අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු' යනු වේ.

**එවම්පි විග්ගය්හ විවාදයන්ති** - මෙසේ ගෙන දැඩිව ගෙන ග්‍රහණය කොට දැහැගෙන පිවිසගෙන විවාද කෙරෙති, කලහ කෙරෙති, ඩබර කෙරෙති, විග්‍රහ කෙරෙති, විරුද්ධවාද කෙරෙති, අරගල කෙරෙත්: 'තෙපි මේ ධර්මවිනය නො දත්නවූ යැ...ඉදින් පොහොනවූ නම් මුදා ගනුව ය'යි 'එවම්පි විග්ගය්හ විවාදයන්ති' යනු වේ.

**සකං සකං සම්මුතිමාහු සච්චං** - 'ශාශ්වත යැ ලොකය, මේ මැ සැබව අන්‍යය හිස් යැ'යි 'සකං සකං සම්මුතිමාහු සච්චං' යනු වේ. අශාශ්වත යැ ලොකය...සත්ත්ව තෙමේ මරණින් මත්තෙහි නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ මැ සැබවැ අන්‍යය තුච්ඡ යැ'යි 'සකං සකං සම්මුතිමාහු සච්චං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සකං හි ධම්මං -පෙ- සකං සකං සම්මුතිමාහු සච්චං"යි.

## 13 - 11

පරස්ස චෙ වම්භයිතෙන හීනො
න කොචි ධම්මෙසු විසෙසි අස්ස,
පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං
නිහීනතො සම්හි දළ්හං වදානා.

**පරස්ස චෙ වම්භයිතෙන හීනොති** – පරස්ස චෙ වම්භයිතකාරණා නින්දිතකාරණා ගරහිතකාරණා උපවදිතකාරණා පරො බාලො හොති හීනො නිහීනො ඔමකො ලාමකො ඡතුක්කො පරිත්තොති – පරස්ස චෙ වම්භයිතෙන හීනො.

**න කොචි ධම්මෙසු විසෙසි අස්සාති** – ධම්මෙසු න කොචි අග්ගො සෙට්ඨො විසිට්ඨො පාමොක්ඛො උත්තමො පවරො අස්සාති – න කොචි ධම්මෙසු විසෙසි අස්ස.

**පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං නිහීනතොති** – බහුකාපි බහූනං ධම්මං වදන්ති උපවදන්ති නින්දන්ති ගරහන්ති හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො; බහුකාපි එකස්ස ධම්මං වදන්ති උපවදන්ති නින්දන්ති ගරහන්ති හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො; එකොපි බහුන්නං ධම්මං වදති උපවදති නින්දති ගරහති හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතො; එකොපි එකස්ස ධම්මං වදති උපදවති නින්දති ගරහති හීනතො නිහීනතො ඔමකතො ලාමකතො ඡතුක්කතො පරිත්තතොති – පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං නිහීනතො.

**සම්හි දළ්හං වදානාති** – ධම්මො සකායනං, දිට්ඨි සකායනං, පටිපදා සකායනං, මග්ගො සකායනං, සකායනෙන දළ්හවාදා ථිරවාදා බලිකවාදා අවට්ඨිතවාදායි – සම්හි දළ්හං වදානා.

තෙනාහ භගවා:

“පරස්ස චෙ වම්භයිතෙන හීනො
න කොචි ධම්මෙසු විසෙසි අස්ස,
පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං
නිහීනතො සම්හි දළ්හං වදානා”ති.

## 13 - 12

සධම්මපූජා[1] ච පනා තථෙව
යථා පසංසන්ති සකායනානි,
සබ්බෙව වාදා[2] තථියා[3] භවෙය්‍යුං
සුද්ධී හි[4] නෙසං පච්චත්තමෙව.

1. සද්ධම්මපූජා – සීමු. II. ධම්මෙසු පූජා – ස. 2. සබ්බෙ පවාදා – සයා. PTS.
3. තථිවා – සීමු. II. සු. 4. සුද්ධිපි – සීමු. II

## 18 - 11

ඉදින් මෙරමා විසින් අවමත් කළ කරුණෙන් හීන වූයෙක් වන්නේ නම්, ධර්මයන් අතුරෙහි කිසිවෙක් විශිෂ්ට වූයේ නො වන්නේය. යම් හෙයකින් බොහෝ මහණබමුණෝ මෙරමාගේ දහම නිහීන හෙයින් කියත් ද, ස්වකීය ධර්මයෙහි දෘඪව කියන්නාහු වෙත් ද එහෙයිනි.

**පරස්ස චෙ වම්භයිතෙන හීනො** - ඉදින් මෙරමා විසින් අවමත් කළ කරුණෙන් නිගා කළ කරුණෙන් ගැරහූ කරුණෙන් නුගුණ කී කරුණෙන් මෙරමා බාලයෙක් හීනයෙක් නිහීනයෙක් අවමතයෙක් ලාමකයෙක් ඡතුක්කයෙක් පරිත්තයෙක් වේ නම් යි 'පරස්ස චෙ වම්භයිතෙන හීනො' යනු වේ.

**න කොචි ධම්මෙසු විසෙසි අස්ස** - ධර්මයන් අතුරෙහි කිසිවෙක් අග්‍ර වූයේ ශ්‍රේෂ්ඨ වූයේ විශිෂ්ට වූයේ පාමොක් වූයේ උතුම් වූයේ ප්‍රවර වූයේ නො වන්නේ නුයි 'න කොචි ධම්මෙසු විසෙසි අස්ස' යනු වේ.

**පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං නිහීනතො** - බොහෝ දෙනාගේ දහම හීන හෙයින් නිහීන හෙයින් ඔමක හෙයින් ලාමක හෙයින් ඡතුක්ක හෙයින් පරිත්ත හෙයින් කියති උපවාද කෙරෙති නිගා කෙරෙති ගරහත්. බොහෝ දෙනා ද එකක්හුගේ දහම හීන - නිහීන - ඔමක - ලාමක - ඡතුක්ක - පරිත්ත හෙයින් කියති නුගුණ කියති නිගා කෙරෙති ගරහත්. එකෙකු ද බොහෝ දෙනාගේ දහම හීන - නිහීන - ඔමක - ලාමක - ඡතුක්ක - පරිත්ත හෙයින් කියයි නුගුණ කියයි නිගා කෙරෙයි ගරහයි. එකෙකු ද එකක්හුගේ දහම හීන - නිහීන - ඔමක - ලාමක - ඡතුක්ක - පරිත්ත හෙයින් කියයි නුගුණ කියයි නිගා කෙරෙයි ගරහා නුයි 'පුථූ හි අඤ්ඤස්ස වදන්ති ධම්මං නිහීනතො' යනු වේ

**සකඤ්හි දළ්හං වදානා** - ධර්මය ස්වකීය මාර්ගී යැ දෘෂ්ටිය ස්වමාර්ගී යැ ප්‍රතිපදාව ස්වමාර්ගී යැ මාර්ගය ස්වමාර්ගී යයි ස්වකීය මාර්ගය හේතු කොට ගෙන දෘඪවාද ඇත්තාහු ස්ථිර වාද ඇත්තාහු බලවත් වාද ඇත්තාහු අවස්ථිතවාද ඇත්තාහු නුයි 'සකඤ්හි දළ්හං වදානා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පරස්ස චෙ -පෙ- නිහීනතො සකඤ්හි දළ්හං වදානා"යි.

## 18 - 12

තවද (ඒ තීර්ථකයෝ ලබ්ධිමාර්ගයන්ට යම්සේ පසසත් නම් ස්වකීය ශාස්තෘ ආදීන්ට පූජාවත් එසේ ම පවත්තේ ය. ඉදින් (ඔහු එහි ප්‍රමාණ වන්නාහු නම්) සියලු මැ වාදයෝ සත්‍ය වන්නාහුය. යම් හෙයකින් ඔවුන් ගේ ශුද්ධිය තමන් තමන් කෙරෙහි පිහිටියේ ද එහෙයිනි.

**සධම්මපූජා ච පනා තථෙවාති** – කතමා සධම්මපූජා: සත්ථාරං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති 'අයං සත්ථා සබ්බඤ්ඤූ''ති අයං සධම්මපූජා. සකං ධම්මක්ඛානං – සකං ගණං – සකං දිට්ඨිං – සකං පටිපදං – සකං මග්ගං සක්කරොති ගරුකරොති මානෙති පූජෙති "අයං මග්ගො නිය්‍යානිකො''ති අයං සධම්මපූජා. **සධම්මපූජා ච පනා තථෙවාති** – සධම්මපූජා තථා තච්ඡා භූතා යාථාවා අවිපරීතාති – සධම්මපූජා ච පනා තථෙව.

**යථා පසංසන්ති සකායනානීති** – ධම්මො සකායනං, දිට්ඨි සකායනං, පටිපදා සකායනං, මග්ගො සකායනං; සකායනානි පසංසන්ති ථොමෙන්ති කිත්තෙන්ති වණ්ණෙන්තීති - යථා පසංසන්ති සකායනානි.

**සබ්බෙව වාදා තථියා[1] භවෙය්‍යුන්ති** – සබ්බෙව වාදා තථා තච්ඡා භූතා යාථාවා අවිපරීතා භවෙය්‍යුන්ති – සබ්බෙව වාදා තථියා[1] භවෙය්‍යුං.

**සුද්ධී හි[2] තෙසං පච්චත්තමෙවාති** – පච්චත්තමෙව තෙසං සමණබ්‍රාහ්මණානං සුද්ධි විසුද්ධි පරිසුද්ධි මුත්ති විමුත්ති පරිමුත්තීති – සුද්ධී හි[2] තෙසං පච්චත්තමෙව.

තෙනාහ භගවා:

"සධම්මපූජා ච පනා තථෙව
යථා පසංසන්ති සකායනානි,
සබ්බෙව වාදා තථියා භවෙය්‍යුං
සුද්ධී හි[2] තෙසං පච්චත්තමෙවා''ති.

## 13 - 18

න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා විවාදානි උපාතිවත්තො
න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං.

**න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථීති** – 'නා'ති පටික්ඛෙපො; බ්‍රාහ්මණොති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො -පෙ- අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා. **න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථීති** බ්‍රාහ්මණස්ස පරනෙය්‍යතා නත්ථි, බ්‍රාහ්මණො න පරනෙය්‍යො; න පරපත්තියො, න පරපච්චයො, න පරපටිබද්ධගූ; ජානාති පස්සති අසම්මූළ්හො සම්පජානො පතිස්සතො. "සබ්බෙ සඞ්ඛාරා අනිච්චා''ති බ්‍රාහ්මණස්ස පරනෙය්‍යතා නත්ථි. බ්‍රාහ්මණො න පරනෙය්‍යො, න පරපත්තියො, න පරපච්චයො' න පරපටිබද්ධගූ ජානාති පස්සති අසම්මූළ්හො සම්පජානො පතිස්සතො. "සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා''ති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම''න්ති බ්‍රාහ්මණස්ස පරනෙය්‍යතා නත්ථි, බ්‍රාහ්මණො න පරනෙය්‍යො, න පරපත්තියො, න පරපච්චයො; න පරපටිබද්ධගූ ජානාති පස්සති අසම්මූළ්හො සම්පජානො පතිස්සතොති – න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි.

---

1. තථිවා - සිමු. II.  2. සුද්ධිපි - සිමු. II.

**සද්ධම්මපූජා ච පනා තථෙව** – සද්ධම්මපූජා කවරී ද යත්: "මේ ශාස්තෘ තෙම සර්වඥ යැ"යි ස්වකීය ශාස්තෘහට සත්කාර කෙරෙයි ගරු කෙරෙයි බුහුමන් කෙරෙයි පූජා කෙරෙයි; මෝ 'සද්ධම්මපූජා'යැ. ස්වකීය ධර්මාඛ්‍යානයට – ස්වකීය ගණයාට – ස්වකීය දෘෂ්ටියට – ස්වකීය ප්‍රතිපත්තියට 'මේ මාර්ගය නෛර්‍යාණික යැ'යි ස්වකීය මාර්ගයට සත්කාර කෙරෙයි ගරු කෙරෙයි බුහුමන් කෙරෙයි පූජා කෙරෙයි, මෝ සද්ධම්මපූජා යි. **සද්ධම්මපූජා ච පනා තථෙව** – ස්වකීය ශාස්තෘ ආදීන්ට පූජාව අවිපරීත යැ නො සිස් යැ විද්‍යමාන යැ යාථාවත් යැ නො වෙනස් තුයි 'සද්ධම්මපූජා ච පනා තථෙව' යනු වේ.

**යථා පසංසන්ති සකායනානි** – ධර්මය සිය මඟ යැ, දෘෂ්ටිය සිය මඟ යැ, ප්‍රතිපත්තිය සිය මඟ යැ, මාර්ගය සිය මඟැ යි. ස්වකීය මාර්ගයන්ට පසසති තුති කෙරෙති ප්‍රකට කෙරෙති ගුණ කියත් තුයි 'යථා පසංසන්ති සකායනානි' යනු වේ.

**සබ්බෙව වාදා තථියා භවෙය්‍යුං** – සියලු මැ වාදයෝ අවිපරීතයෝ තථ්‍යයෝ විද්‍යමානයෝ යාථාවත් වූවෝ නො වෙනස් වූවෝ වන්නාහු තුයි 'සබ්බෙව වාදා තථියා භවෙය්‍යුං' යනු වේ.

**සුද්ධී හි නෙසං පච්චත්තමෙව** – ඒ මහණබමුණන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය තමන් තමන් කෙරෙහි මැ වේ තුයි 'සුද්ධී හි නෙසං පච්චත්තමෙව' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සද්ධම්මපූජා ච -පෙ- සුද්ධී හි නෙසං පච්චත්තමෙව"**යි.

## 13 – 13

බාහිතපාපී වූ බ්‍රාහ්මණහට මෙරමා විසින් එළැවිය යුතු ඥනයෙක් යම්හෙයකින් නැත් ද, දෙසැටදිටු දහම්හි (මෙය මැ සැබවැයි) නිශ්චය කොට දැඩි වැ ගන්නා ලද්දකුත් නැත් ද, එහෙයින් දෘෂ්ටිවිවාදයන් ඉක්මවූ හෙතෙම අන් දහමක් ශ්‍රේෂ්ඨ වියින් නො මැ දක්නේ යි.

**න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි** – 'න' යනු: ප්‍රතික්ෂෙප යැ; 'බ්‍රාහ්මණ නම්: සත් ධර්ම කෙනකුන් බාහිත හෙයින් 'බ්‍රාහ්මණ යැ,... ගේ බ්‍රාහ්මණ යි. **න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි** – බ්‍රාහ්මණහට මෙරමා විසින් එළැවියැ යුතු බවෙක් නැත; බ්‍රාහ්මණ තෙමේ මෙරමා විසින් අවබොධ කරවියැ යුත්තේ නො වෙයි, මෙරමා විසින් හැඳිනියැ යුත්තේ නො වෙයි, පරප්‍රත්‍යය රහිත වූයේ වෙයි, මෙරමා පිළිබඳ වූ පැමිණීම් ඇත්තේ නො වෙයි: නො මුළා වූයේ සම්‍යක්ප්‍රඥ ඇත්තේ ස්මෘතිමත් වූයේ දැනගනී දක්නේයි. 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි බ්‍රාහ්මණහට මෙරමා විසින් එළවියැ යුතු බවෙක් නැත, බ්‍රාහ්මණ තෙමේ මෙරමා විසින් අවබොධ කරවියැ යුත්තේ නො වෙයි, මෙරමා විසින් හැඳිනියැ යුත්තේ නො වෙයි, පරප්‍රත්‍යය වූයේ නො වෙයි, මෙරමා පිළිබඳ පැමිණීම් ඇත්තේ නො වෙයි, නො මුළා වූයේ සම්‍යක්ප්‍රඥ ඇත්තේ ස්මෘතිමත් වූයේ (තෙමේ) මැ දැනගනී, දක්නේ යි. 'සියලු සංස්කාරයෝ දුඃඛයෝ ය'යි...'යම් කිසිවෙක් සමුදයධර්ම වේ නම් ඒ සියල්ල නැසෙන සුලු ය'යි බ්‍රාහ්මණහට පරු විසින් එළවියැ යුත්තෙක් නැත, බ්‍රාහ්මණ තෙමේ පරනෙය්‍ය වූයේ නො වෙයි, පරු පිළිබඳ හැඳිනීම් ඇත්තේ නො වෙයි, පරප්‍රත්‍යය වූයේ නො වෙයි, පරු අයත් ගමන් ඇත්තේ නො වෙයි. අසම්මූඪ වූයේ සම්‍යක්ප්‍රඥ ඇත්තේ ස්මෘතිමත් වූයේ (තෙමේ ම) දැනගනී දක්නේ තුයි 'න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි' යනු වේ.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතන්ති** – 'ධම්මෙසූ'ති ද්වාසට්ඨි දිට්ඨිගතෙසු; **නිච්ඡෙය්‍යාති** නිච්ඡිනිත්වා විනිච්ඡිනිත්වා විචිනිත්වා පවිචිනිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ඔධිග්ගාහො බිලග්ගාහො වරග්ගාහො කොට්ඨාසග්ගාහො උච්චයග්ගාහො සමුච්චයග්ගාහො, ඉදං සච්චං තථං තච්ඡං භූතං යාථාවං අවිපරීතන්ති ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි න සංවිජ්ජති නුපලබ්භති පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති – ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං.

**තස්මා විවාදානි උපාතිවත්තොති** – 'තස්මා'ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානා දිට්ඨිකලහානි දිට්ඨිභණ්ඩනානි දිට්ඨිවිග්ගහානි දිට්ඨිවිවාදානි දිට්ඨිමෙධගානි උපාතිවත්තො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තොති – තස්මා විවාදානි උපාතිවත්තො.

**න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤන්ති** – අඤ්ඤං සත්ථාරං ධම්මක්ඛාතං ගණං දිට්ඨිං පටිපදං අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා අග්ගං සෙට්ඨං විසෙට්ඨං පාමොක්ඛං උත්තමං පවරං ධම්මං න පස්සති න දක්ඛති න ඔලොකෙති න නිජ්ඣායති න උපපරික්ඛතීති – න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං.

තෙනාහ භගවා:

"න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි
ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං,
තස්මා විවාදානි උපාතිවත්තො
න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤ"න්ති.

**13 – 14**

ජානාමි පස්සාමි තථෙව එතං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං,
අද්දක්ඛි[1] චෙ කිං හි තුමස්ස තෙන
අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං.

**ජානාමි පස්සාමි තථෙව එතන්ති** – "ජානාමී"ති පරචිත්තවිජානනඤාණෙන ජානාමි; පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා ජානාමි; **පස්සාමීති** මංසචක්ඛුනා වා පස්සාමි; දිබ්බෙන චක්ඛුනා වා පස්සාමි; **තථෙව එතන්ති** එතං තච්ඡං භූතං යාථාවං අවිපරීතන්ති – ජානාමි පස්සාමි තථෙව එතං.

1. දක්ඛිති - සු.

**ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං**– 'ධම්මෙසු' යනු: දෙසැට දිට්ඨිගතයන්හි; **නිච්ඡෙය්‍ය** යනු: නිශ්චය කොට විනිශ්චය කොට විමසා වෙසෙසින් විමසා තුලනය කොට තීරණය කොට හෙළි කොට විභූත කොට අවධි කොට ගැනීමෙක් කොටස් වශයෙන් ගැනීමෙක් උත්තමග්‍රහණයෙක් කොට්ඨාසග්‍රහණයෙක් රැශි වශයෙන් ගැනීමෙක් විශෙෂරාශි වශයෙන් ගැනීමෙක් 'මේ සැබව අවිපරිණාම යැ තත්ත්‍ව යැ විද්‍යමාන යැ යථාවත් යැ අවිපරීත යැ'යි ගත්තා ලද්දෙක් දැඩිගත්තා ලද්දෙක් පිහිටාගත්තා ලද්දෙක් ඇතුළු වැ ගත්තා ලද්දෙක් ඇලීගත්තා ලද්දෙක් නැත, විද්‍යමාන නො වෙයි, නො ලැබෙයි, ප්‍රහීණ යැ සමුච්ඡින්න යැ සන්සිඳුවන ලද දුරලන ලද උපතට නො සුදුසු කරන ලද නුවණගින්නෙන් දවන ලද නුයි 'ධම්මෙසු නිච්ඡෙය්‍ය සමුග්ගහීතං' යනු වේ.

**තස්මා විවාදානි උපාතිවත්තො** – 'තස්මා' යනු: එහෙයින් එකරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන් දෘෂ්ටිකලහයෙන් දෘෂ්ටිභණ්ඩනයෙන් දෘෂ්ටිවිග්‍රහයෙන් දෘෂ්ටිවිවාදයෙන් දෘෂ්ටිමෙධගයෙන් පසු කෙළේ ඉක්මැවූයේ මැනවින් ඉක්මැවූයේ වෙසෙසින් ඉක්මැවූයේ නුයි 'තස්මා විවාදානි උපාතිවත්තො' යනු වේ.

**න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං** – සතිපට්ඨානයන් හැර සම්‍යක්ප්‍රධානයන් හැර ඍද්ධිපාදයන් හැර ඉන්ද්‍රියයන් හැර බලයන් හැර බොධ්‍යඞ්ගයන් හැර ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය හැර අන්‍ය ශාස්තෘවක්හු ධර්මාඛ්‍යානයක් ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපත්තියක් මාර්ගයක් අග්‍ර වූ ශ්‍රෙෂ්ඨ වූ විශිෂ්ට වූ පාමොක් වූ උතුම් වූ ප්‍රවර වූ දහමක් නො බලයි නො දකී අවලොකනය නො කෙරෙයි නො සිතයි නො විමසා නුයි 'න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න බ්‍රාහ්මණස්ස -පෙ- න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං"යි

## 13 – 14

ඇතැම් මහණබමුණු කෙනෙක් තෙල එපරිද්දෙන් ම දනිමි දකිමි (කියත්තාහු) දෘෂ්ටියෙන් ශුද්ධිය හදහති. (යම්හෙයකින් ඔවුනතුරෙන් එකෙකු දු) ඉදින් දුටුයේ තමුදු තමාගේ ඒ දර්ශනයෙන් (දුඃඛපරිඥනාදි කුමක් සිදුකරන ලද ද, ඔහු (ආර්‍ය්‍යමාර්ගය) ඉක්මවා අන් මඟෙකින් ශුද්ධිය කියත් ද, නොහොත් (බුද්ධාදීහු) ඔවුන් ඉක්මවා අන් මඟෙකින් ශුද්ධිය කියත් ද, එහෙයිනි.

**ජානාමි පස්සාමි තථෙව එතං** – 'ජානාමි' යනු: පරචිත්තවිජානනඥනයෙන් දනිමි, පූර්වේනිවාසානුස්මෘතිඥනයෙන් හෝ දනිමි; 'පස්සාමි' යනු: මසැසින් හෝ දකිමි, දිවැසින් හෝ දකිමි; **තථෙව එතං** – තෙල සැබව විද්‍යමාන යැ යථාවත් යැ අවිපරීත නුයි 'ජානාමි පස්සාමි තථෙව එතං' යනු වේ.

**දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධින්ති** – දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්ති; අසස්සතො ලොකො –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති – දිට්ඨියා එකෙ සමණබ්‍රාහ්මණා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං පච්චෙන්තීති – දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං.

**අද්දක්ඛි[1] චෙ කිං හි තුමස්ස තෙනාති** – "අද්දක්ඛී"ති පරචිත්තවිජානනඤ්ඤාණෙන වා අද්දක්ඛි, පුබ්බෙනිවාසානුස්සතිඤ්ඤාණෙන වා අද්දක්ඛි; මංසචක්ඛුනා වා අද්දක්ඛි; දිබ්බෙන චක්ඛුනා වා අද්දක්ඛීති – අද්දක්ඛි චෙ; **කිං හි තුමස්ස තෙනාති** – තස්ස තෙන දස්සනෙන කිං කතං? න දුක්ඛපරිඤ්ඤා අත්ථි; න සමුදයස්ස පහානං අත්ථි; න මග්ගභාවනා අත්ථි; න රාගස්ස සමුච්ඡෙදප්පහානං අත්ථි; න දොසස්ස සමුච්ඡෙදප්පහානං අත්ථි; න මොහස්ස සමුච්ඡෙදප්පහානං අත්ථි; න කිලෙසානං සමුච්ඡෙදප්පහානං අත්ථි; න සංසාරවට්ටස්ස උපච්ඡෙදො අත්ථීති – අද්දක්ඛි[1] චෙ කිං හි තුමස්ස තෙන.

**අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධින්ති** – තෙ තිත්ථියා සුද්ධිමග්ගං විසුද්ධිමග්ගං පරිසුද්ධිමග්ගං වොදාතමග්ගං පරියොදාතමග්ගං අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති, එවම්පි, අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං. අථවා බුද්ධා ච බුද්ධසාවකා ච පච්චෙකබුද්ධා ච තෙසං තිත්ථියානං අසුද්ධිමග්ගං අවිසුද්ධිමග්ගං අපරිසුද්ධිමග්ගං අවොදාතමග්ගං අපරියොදාතමග්ගං අතික්කමිත්වා සමතික්කමිත්වා වීතිවත්තිත්වා චතූහි සතිපට්ඨානෙහි චතූහි සම්මප්පධානෙහි චතූහි ඉද්ධිපාදෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි පඤ්චහි බලෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං වදන්ති කථෙන්ති භණන්ති දීපයන්ති වොහරන්තීති එවම්පි –අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං.

තෙනාහ භගවා:

"ජානාමි පස්සාමි තථෙව එතං
දිට්ඨියා එකෙ පච්චෙන්ති සුද්ධිං,
අද්දක්ඛි චෙ කිං හි තුමස්ස තෙන
අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධි"න්ති.

**13 – 15**

පස්සං නරො දක්ඛති[1] නාමරූපං
දිස්වාන වා ඤස්සති[2] තානිමෙව,
කාමං බහුං පස්සතු අප්පකං වා
න හි තෙන සුද්ධිං කුසලා වදන්ති.

---

1. දක්ඛිති - සු.
2. වාඤස්සති - PTS.

**දිට්ඨියා එකෙ පච්චෙනති සුද්ධිං** - ඇතැම් මහණබමුණු කෙනෙක් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය හඳහති; ලෝකය ශාශ්වත යැ මේ මැ සැබව, අන්‍යය මොස යැ යි දෘෂ්ටියෙන් ඇතැම් මහණ බමුණු කෙනෙක් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය හඳහති; 'ලෝකය අශාශ්වත යැ...තථාගතයා මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ මැ සැබව අන්‍යය මොස ය'යි දෘෂ්ටියෙන් ඇතැම් මහණබමුණු කෙනෙක් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය හඳහත් නුයි 'දිට්ඨියා එකෙ පච්චෙනති සුද්ධිං' යනු වේ.

**අද්දක්ඛි චෙ කිං හි තුමස්ස තෙන** - 'අද්දක්ඛි' යනු: පරසිත් දත්නා නුවණින් හෝ, පෙරවිසූ කඳපිළිවෙල සිහි කරන නුවණින් හෝ, මසැසින් හෝ, දිවැසින් හෝ දුටුයේ නුයි 'අද්දක්ඛි චෙ' යනු වේ. **කිං හි තුමස්ස තෙන** - ඔහුගේ ඒ දැක්මෙන් කුමක් කරන ලද ද? දුඃඛපරිඥාවක් නැත, සමුදයප්‍රහාණයෙක් නැත, මාර්ගභාවනායෙක් නැත, ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙක් නැත, රාගයාගේ සමුච්ඡේදප්‍රහාණයෙක් නැත, ද්වේෂයාගේ සමුච්ඡේද-ප්‍රහාණයෙක් නැත, මෝහයාගේ සමුච්ඡේදප්‍රහාණයෙක් නැත, ක්ලේශයන්ගේ සමුච්ඡේදප්‍රහාණයෙක් නැත, සංසාරවෘත්තයාගේ සිඳීමෙක් නැත් නුයි 'අද්දක්ඛි චෙ කිං හි තුමස්ස තෙන' යනු වේ.

**අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං** - ඒ තීර්ථකයෝ ශුද්ධිමාර්ගය විශුද්ධිමාර්ගය පරිශුද්ධිමාර්ගය පාණ්ඩරමාර්ගය ප්‍රභාවත් මාර්ගය ඉක්මවා මොනවට ඉක්මවා වෙසෙසින් ඉක්මවා සතර සිවටන් හැරපියා සම්‍යක්-ප්‍රධානයන් - ඍද්ධිපාදයන් - ඉන්ද්‍රියයන් - බලයන් - බොධ්‍යඞ්ගයන් - ආර්ය-අෂ්ටාඞ්ගිකමාර්ගය හැරපියා ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති, කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි= මෙසේත් 'අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං' යනු වේ. නොහොත් බුදුවරයෝ ද බුදුසව්වෝ ද පසේබුදුහු ද ඒ තීර්ථකයන්ගේ අශුද්ධිමාර්ගය අවිශුද්ධිමාර්ගය අපරිශුද්ධිමාර්ගය අපාණ්ඩරමාර්ගය අප්‍රභාස්වරමාර්ගය ඉක්මවා මොනවට ඉක්මවා වෙසෙසින් ඉක්මවා සතර සතිපට්ඨානයන් ගෙන් සතර සම්‍යක්ප්‍රධානයන්ගෙන් සතර ඍද්ධිපාදයන් ගෙන් පඤ්චෙන්ද්‍රියයන් ගෙන් පඤ්චබලයන් ගෙන් සප්තබොධ්‍යඞ්ගයන්ගෙන් ආර්යඅෂ්ටාඞ්ගික-මාර්ගයෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය පවසති කියති බෙණෙති දක්වති ව්‍යවහාර කෙරෙත් නුයි මෙසේත් 'අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ජානාමි පස්සාමි -පෙ- අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං"**යි.

**13 - 15**

සත්ත්ව තෙමේ (පරචිත්තවිජානනඥානාදියෙන්) බලනුයේ නාමරූපය (නිත්‍යාදි වසින්) දක්නේ ය, දැක ඒ නාමරූපයන් ම (නිත්‍යාදි වසින්) දැනගන්නේය. ඒකාන්තයෙන් (හෙතෙම) බොහෝ කොට හෝ මඳ වශයෙන් හෝ දක්නේ ය. බුද්ධාදි කුශලයෝ ඒ දර්ශනයෙන් සංසාර ශුද්ධිය නො මැ කියත්.

**පස්සං නරො දක්ඛති නාමරූපන්ති** - පස්සං නරො, පරචිත්තවිජානන-ඤාණෙන වා පස්සන්තො පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා පස්සන්තො මංසචක්ඛුනා වා පස්සන්තො දිබ්බෙන චක්ඛුනා වා පස්සන්තො නාම-රූපඤ්ඤෙව දක්ඛති නිච්චතො සුඛතො අත්තතො; න තෙසං ධම්මානං සමුදයං වා අත්ථඞ්ගමං වා අස්සාදං වා ආදීනවං වා නිස්සරණං වා දක්ඛතීති - පස්සං නරො දක්ඛති නාමරූපං.

**දිස්වාන වා ඤස්සති තානිමෙවාති** - 'දිස්වා'ති පරචිත්තඤාණෙන වා දිස්වා පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා දිස්වා මංසචක්ඛුනා වා දිස්වා දිබ්බෙන චක්ඛුනා වා දිස්වා නාමරූපඤ්ඤෙව දිස්වා ඤස්සති නිච්චතො සුඛතො අත්තතො; න තෙසං ධම්මානං සමුදයං වා අත්ථඞ්ගමං වා අස්සාදං වා ආදීනවං වා නිස්සරණං වා ඤස්සතීති - දිස්වාන වා ඤස්සති තානිමෙව.

**කාමං බහුං පස්සතු අප්පකං වාති** - කාමං බහුකං වා පස්සන්තො නාමරූපං අප්පකං වා නිච්චතො සුඛතො අත්තතොති - කාමං බහුං පස්සතු අප්පකං වා.

**න හි තෙන සුද්ධිං කුසලා වදන්තීති** - 'කුසලා'ති යෙ තෙ ඛන්ධකුසලා ධාතුකුසලා ආයතනකුසලා පටිච්චසමුප්පාදකුසලා සතිපට්ඨානකුසලා සම්මප්පධානකුසලා ඉද්ධිපාදකුසලා ඉන්ද්‍රියකුසලා බලකුසලා බොජ්ඣඞ්ග-කුසලා මග්ගකුසලා ඵලකුසලා නිබ්බානකුසලා පරචිත්තඤාණෙන වා පුබ්බෙනිවාසානුස්සතිඤාණෙන වා මංසචක්ඛුනා වා දිබ්බෙන චක්ඛුනා වා නාමරූපදස්සනෙන සුද්ධිං විසුද්ධිං පරිසුද්ධිං මුත්තිං විමුත්තිං පරිමුත්තිං න වදන්ති, න කථෙන්ති, න භණන්ති, න දීපයන්ති, න වොහරන්තීති-නහි තෙන සුද්ධිං කුසලා වදන්ති.

තෙනාහ භගවා:

"පස්සං නරො දක්ඛති නාමරූපං
දිස්වාන වා ඤස්සති තානිමෙව,
කාමං බහුං පස්සතු අප්පකං වා
න හි තෙන සුද්ධිං කුසලා වදන්ති"ති.

**13 - 16**

"නිවිස්සවාදී න හි සුබ්බිනායො
පකප්පිතං දිට්ඨිං පුරෙක්ඛරානො,
යං නිස්සිතො තත්ථ සුභංවදානො
සුද්ධිංවදො තත්ථ තථද්දසා සො.

**පස්සං නරෝ දක්ඛති නාමරූපං** - බලන්නා වූ සත්ත්ව තෙමේ පරසිත් දන්නා නුවණින් හෝ දක්නේ පෙර විසූ කඳපිළිවෙල සිහිකරන නුවණින් හෝ දක්නේ මසැසින් හෝ දක්නේ දිවැසින් හෝ දක්නේ නාමරූපය මැ නිත්‍ය හෙයින් සුබහෙයින් ආත්ම හෙයින් දක්නේ ය. ඒ ධර්මයන්ගේ ඉපදීම හෝ නැසීම හෝ ආස්වාදය හෝ ආදීනවය හෝ නිස්සරණය හෝ නො දක්නේ නුයි 'පස්සං නරෝ දක්ඛති නාමරූපං' යනු වේ.

**දිස්වාන වා ඤස්සති තානිමෙව** - 'දිස්වා' යනු: පරසිත් දන්නා නුවණින් හෝ දැක, පෙර විසූ කඳපිළිවෙල සිහි කරන නුවණින් හෝ දැක මසැසින් හෝ දැක, දිවැසින් හෝ දැක, නාමරූපය ම දැක නිත්‍ය හෙයින් සුබ හෙයින් ආත්මහෙයින් දැනගන්නේය; ඒ ධර්මයන්ගේ ඉපදීම හෝ නැසීම හෝ ආස්වාදය හෝ ආදීනවය හෝ නිස්සරණය හෝ නො දැනගන්නේ නුයි 'දිස්වාන වා ඤස්සති තානිමෙව' යනු වේ.

**කාමං බහුං පස්සතු අප්පකං වා** - ඒකාන්තයෙන් බොහෝ කොට හෝ මඳ කොට හෝ නාමරූපය බලනුයේ නිත්‍ය හෙයින් සුබ හෙයින් ආත්ම හෙයින් දක්නේ නුයි 'කාමං බහුං පස්සතු අප්පකං වා' යනු වේ.

**න හි තෙන සුද්ධිං කුසලා වදන්ති** - 'කුසලා' යනු: බුද්ධාදි යම් කෙනෙක් තුමූ ස්කන්ධයන්හි දක්ෂ වූවාහු ද ධාතූන්හි - ආයතනයන්හි- ප්‍රතීත්‍යසමුත්පාදයෙහි - සතිපට්ඨානයන්හි-සම්‍යක්ප්‍රධානයන්හි - ඍද්ධිපාද- යන්හි - ඉන්ද්‍රියයන්හි - බලයන්හි - බොධ්‍යඞ්ගයන්හි - මාර්ගයෙහි - ඵලයෙහි- නිර්වාණයෙහි දක්ෂ වූවාහු ද ඒ දක්ෂයෝ පරසිත් දන්නා නුවණින් හෝ පෙරවිසූ කඳපිළිවෙල සිහි කරන නුවණින් හෝ මසැසින් හෝ දිවැසින් හෝ නාමරූප දැකීමෙන් ශුද්ධිය විශුද්ධිය පරිශුද්ධිය මුක්තිය විමුක්තිය පරිමුක්තිය නො පවසති නො කියති නො බෙණෙති නො දක්වති නො ව්‍යවහාර කෙරෙත් නුයි 'න හි තෙන සුද්ධිං කුසලා වදන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**පස්සං නරෝ -පෙ- න හි තෙන සුද්ධිං කුසලා වදන්ති**"යි

## 13 - 16

(යමෙක් දෘෂ්ටියෙහි) පිහිටා කියන්නේ වේ ද (හෙතෙම) නො මැ දුවස් හික්මියැ හැකි වෙයි. සිතින් ගන්නා ලද දෘෂ්ටිය පෙරටු කොට හැසිරෙනුයේ යම් ශාස්තෘ ආදියක් ඇසුරු කරනුයේ එහි ශුභවාද ඇතියේ ඒ ස්වකීය දෘෂ්ටියෙහි ශුද්ධිය කියන්නේ වේ ද, හෙතෙම ඒ දෘෂ්ටිය එසේ මැ දුටුයේ වේ.

**නිවිස්සවාදී න හි සුබ්බිනායොති** – ‘සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති නිවිස්සවාදී, අසස්සතො ලොකො –පෙ– නෙව හොති, න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ’න්ති නිවිස්සවාදී; **න හි සුබ්බිනායොති** නිවිස්සවාදී දුබ්බිනයො දුප්පඤ්ඤාපියො[1] දුන්නිජ්ඣාපියො දුප්පෙක්ඛාපියො දුප්පසාදියොති – නිවිස්සවාදී න හි සුබ්බිනායො.

**පකප්පිතං දිට්ඨි පුරෙක්ඛරානොති** – කප්පිතං පකප්පිතං අභිසඞ්ඛතං සණ්ඨපිතං දිට්ඨිං පුරක්ඛතං කත්වා චරති, දිට්ඨිධජො දිට්ඨිකෙතු දිට්ඨාධිපතෙය්‍යො දිට්ඨියා පරිවාරිතො චරතීති – පකප්පිතං දිට්ඨි පුරෙක්ඛරානො.

**යං නිස්සිතො තත්ථ සුභංවදානොති** – ‘යං නිස්සිතො’ති යං සත්ථාරං ධම්මක්ඛානං ගණං දිට්ඨිං පටිපදං මග්ගං නිස්සිතො සන්නිස්සිතො අල්ලීනො උපගතො අජ්ඣොසිතො අධිමුත්තොති යං නිස්සිතො; **තත්ථාති** සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා; **සුභංවදානොති** සුභවාදො සොභනවාදො පණ්ඩිතවාදො ථිරවාදො ඤායවාදො හෙතුවාදො ලක්ඛණවාදො කාරණවාදො ඨානවාදො සකාය ලද්ධියාති – යං නිස්සිතො තත්ථ සුභංවදානො.

**සුද්ධිංවදො තත්ථ තථද්දසා සොති** – සුද්ධිවාදො විසුද්ධිවාදො පරිසුද්ධිවාදො පරියොදාතවාදො, අථ වා සුද්ධිදස්සනො විසුද්ධිදස්සනො පරිසුද්ධිදස්සනො වොදාතදස්සනො පරියොදාතදස්සනොති සුද්ධිංවදො; **තත්ථාති** සකාය දිට්ඨියා සකාය ඛන්තියා සකාය රුචියා සකාය ලද්ධියා තථං තච්ඡං භූතං යාථාවං අවිපරීතන්ති අද්දස අද්දක්ඛි අපස්සි පටිවිජ්ඣීති – සුද්ධිංවදො තත්ථ තථද්දසා සො.

තෙනාහ භගවා:

“නිවිස්සවාදී න හි සුබ්බිනායො
පකප්පිතං දිට්ඨිපුරෙක්ඛරානො,
යං නිස්සිතො තත්ථ සුභංවදානො
සුද්ධිංවදො තත්ථ තථද්දසා සො”ති.

**13 – 17**

න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛා
න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු,
ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා
උපෙක්ඛතී උග්ගහණන්ති මඤ්ඤෙ.

---

1. දුප්පඤ්ඤාපයො – මජ්සං. ස්‍යා.

**නිවිස්සවාදී න හි සුබ්බිනායො** – 'ශාශ්වත යැ ලොකය මේ මැ සැබව අන්‍යය මොස යැ'යි පිහිටා කියනුයේ; 'අශාශ්වත යැ ලොකය...'සත්ත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි නො වන්නේ නො වෙයි, මේ මැ සැබව අන්‍යය මොස යැ'යි පිහිටා කියනුයේ; **න හි සුබ්බිනායො**– පිහිටා කියන පුද්ගල තෙම හික්මවනු දුෂ්කර යැ හඟවනු දුෂ්කර යැ විමසවනු දුෂ්කර යැ .දක්වනු දුෂ්කර යැ පහදවනු දුෂ්කර වේ නුයි 'නිවිස්සවාදී න හි සුබ්බිනායො' යනු වේ.

**පකප්පිතං දිට්ඨී පුරෙක්ඛරානො** – කල්පිත වූ ප්‍රකල්පිත වූ අභිසංස්කෘත වූ මොනොවට පිහිටුවන ලද දෘෂ්ටිය පෙරටු කොට හැසිරෙයි, දෘෂ්ටිය ධ්වජ කොට ඇතියේ දෘෂ්ටිය කෙතෙලි කොට ඇතියේ දෘෂ්ටිය අධිපති කොට ඇතියේ දෘෂ්ටියෙන් පිරිවරන ලදුයේ හැසිරේ නුයි 'පකප්පිතං දිට්ඨී-පුරෙක්ඛරානො' යනු වේ.

**යං නිස්සිතො තත්ථ සුභංවදානො** – 'යං නිස්සිතො' යනු: යම් ශාස්තෘවක්නු ධර්මාඛ්‍යානයක් ගණයක් දෘෂ්ටියක් ප්‍රතිපත්තියක් මාර්ගයක් ඇසුරු කෙළේ මොනවට ඇසුරු කෙළේ ඇලුණේ එළැඹියේ පිවිසියේ බැසගත්තේ නුයි 'යං නිස්සිතො' යනු වේ; **තත්ථ** යනු: ස්වකීය දෘෂ්ටියෙහි සිය කැමැත්තෙහි සිය රුචියෙහි සිය ලබ්ධියෙහි; **සුභංවදානො** යනු: ස්වකීය ලබ්ධියෙහි ශුභවාද ඇතියේ ශොභනවාද – පණ්ඩිතවාද – ස්ථිරවාද– න්‍යායවාද – හෙතුවාද – ලක්ෂණවාද – කාරණවාද – ස්ථානවාද ඇතියේ නුයි 'යං නිස්සිතො තත්ථ සුභංවදානො' යනු වේ.

**සුද්ධිංවදො තත්ථ තථිද්දසා සො** – 'ශුද්ධිවාද ඇතියේ විශුද්ධිවාද– පරිශුද්ධිවාද – පණ්ඩරවාද – ප්‍රභාස්වරවාද ඇතියේ; නොහොත් ශුද්ධිය දක්නේ විශුද්ධිය දක්නේ පරිශුද්ධිය දක්නේ පණ්ඩරදර්ශන ඇතියේ ප්‍රභාස්වරදර්ශන ඇතියේ නුයි – 'සුද්ධිංවදො' යනු වේ; **තත්ථ** යනු: ස්වකීය දෘෂ්ටියෙහි ස්වකීය ක්ෂාන්තියෙහි ස්වකීය රුචියෙහි ස්වකීය ලබ්ධියෙහි සත්‍යය තථ්‍යය භූත යැ යාථාවත් යැ අවිපරීත යැ'යි දුටුයේයැ දක්කේ යැ දර්ශනය කෙළේ යැ ප්‍රතිවෙධ කෙළේ නුයි 'සුද්ධිං වදෙ තත්ථ තථිද්දසා සො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"නිවිස්සවාදී -පෙ- සුද්ධිංවදො තත්ථ තථිද්දසා සො"යි.

## 13 – 17

ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙමේ නුවණින් දත තෘෂ්ණාදෘෂ්ටිකල්පයට නො පැමිණෙයි. දෘෂ්ටියෙහි හැසිරෙනුයේ නො වෙයි. සමාපත්තිඥානාදියෙන් කළ තෘෂ්ණාබන්ධ ඇත්තේ නො ද වෙයි. තවද හෙතෙම පුහුදුනුවන් කෙරෙන් උපන් දෙසැට දෘෂ්ටීන් දැන උපෙක්ෂා කෙරෙයි. අන්‍යයෝ දැඩිව ගනිත්.

**න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛන්ති** – 'නා'ති පටික්ඛෙපො; **බ්‍රාහ්මණො**ති සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො -පෙ- අසිතො තාදී පවුච්චතෙ ස බ්‍රහ්මා; **කප්පා**ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො; **සඞ්ඛා** වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි; **න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛන්ති** බ්‍රාහ්මණො සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති සඞ්ඛාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා නෙති, න උපෙති, න උපගච්ඡති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසතීති – න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං.

**න දිට්ඨිසාරී නපි ඤාණබන්ධූ**ති – තස්ස ද්වාසට්ඨි දිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි; සො දිට්ඨියා න යායති න නීයති න වුය්හති න සංහරීයති; නපි තං දිට්ඨිගතං සාරතො පච්චෙති, න පච්චාගච්ඡතීති 'න දිට්ඨිසාරී;' **නපි ඤාණබන්ධූ**ති අට්ඨසමාපත්තිඤාණෙන වා පඤ්චාභිඤ්ඤාඤාණෙන වා මිච්ඡාඤාණෙන වා තණ්හාබන්ධං වා දිට්ඨිබන්ධං වා න කරොති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතීති – න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු.

**ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා**ති – 'ඤත්වා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා: 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා: 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති – ඤත්වා ච සො; **සම්මුතියො** වුච්චන්ති ද්වාසට්ඨි දිට්ඨිගතානි දිට්ඨිසම්මුතියො; **පුථුජ්ජා**ති පුථුජ්ජනෙහි ජනිතා වා තා සම්මුතියොති පුථුජ්ජා, පුථු නානාජනෙහි ජනිතා වා තා සම්මුතියොති පුථුජ්ජාති – ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා.

**උපෙක්ඛති උග්ගණ්හන්ති මඤ්ඤෙ**ති – අඤ්ඤෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන ගණ්හන්ති පරාමසන්ති අභිනිවිසන්ති, අරහා උපෙක්ඛති, න ගණ්හාති න පරාමසති, නාභිනිවිසතීති – උපෙක්ඛති උග්ගණ්හන්ති මඤ්ඤෙ.

තෙනාහ භගවා:

"න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං
න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු,
ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා
උපෙක්ඛති උග්ගණ්හන්ති මඤ්ඤෙ"ති.

**න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං** – 'න' යනු: ප්‍රතික්ෂේප යැ. **බ්‍රාහ්මණො** – සප්ත ධර්ම කෙනකුන් බැහැර කළ බැවින් බ්‍රාහ්මණ යැ,... හේ බ්‍රාහ්මණ යැයි කියනු ලැබේ. **කප්පා** යනු: තෘෂ්ණාකල්ප යැ දෘෂ්ටිකල්ප යැයි කල්ප දෙකෙකි...මේ දෘෂ්ටිකල්ප යයි. **සඞ්ඛා** යයි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රජානනයක්...අමොහසඞ්ඛ්‍යාත ධර්මවිචයයෙක් සම්‍යග්-දෘෂ්ටියක් වේ ද එයයි **න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං** – ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ නුවණින් දැන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි 'සියලු සංස්කාරයෝ දුඃඛයෝ යැ'යි...යම් කිසිවෙක් සමුදයධර්ම වේ නම් ඒ සියල්ල නැසෙන සුලු යැ'යි නුවණින් දැන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට තෘෂ්ණා කල්පයට හෝ දෘෂ්ටිකල්පයට හෝ නො එයි, නො පැමිණෙයි, නො එළැඹෙයි, නො ගනී, නො දැඩිගනී, නො පිවිසියේ නුයි 'න බ්‍රාහ්මණො කප්පමුපෙති සඞ්ඛං' යනු වේ.

**න දිට්ඨිසාරී නපි ඤාණබන්ධු** – ඔහු විසින් දෙසැට දිට්ඨිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහු ය, සිඳින ලද්දාහු ය, සංසිඳුවන ලද්දාහු ය, දුරලන ලද්දාහු ය, උපනට නො සුදුසු කරන ලද්දාහු ය, නුවණ ගින්නෙන් දවන ලද්දාහු ය; හෙතෙම දෘෂ්ටිය විසින් නො යවනු ලැබෙයි, නො නියනු ලැබෙයි, නො වහනු ලැබෙයි, නො හරිනු ලැබෙයි; ඒ දෘෂ්ටිගතය සාරයෙහියි නො ද දැඩිගනී, නො පැමිණේ නුයි-'න දිට්ඨිසාරී' යනු වේ. **න පි ඤාණබන්ධු**- අෂ්ටසමාපත්තිඥානයෙන් හෝ පඤ්චාභිඥාඥානයෙන් හෝ මිථ්‍යාඥානයෙන් හෝ තෘෂ්ණාබන්ධය හෝ දෘෂ්ටිබන්ධය හෝ නො කෙරෙයි, නො දනවයි, නූපදවයි නො නිපදවයි, අතිශයින් නූපදවා නුයි 'න දිට්ඨිසාරී න'පි ඤාණබන්ධු' යනු වේ.

**ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා** – 'ඤත්වා' යනු: දැන, දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට, සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි දැන දැනගෙන තුලනය – තීරණය-විභාවනය කොට විභූත කොට, 'සියලු සංස්කාරයෝ දුඃඛයෝ යැ'යි...යම් කිසි සමුදයධර්මයෙක් වේ නම් ඒ සියල්ල නැසෙන සුලු යැ'යි දැන දැන ගෙන තුලනය – තීරණය – විභාවනය කොට විභූත කොට නුයි 'ඤත්වා ච සො' යනු වේ; **සම්මුතියො**'යි දෙසැටදිට්ඨිගතයෝ දෘෂ්ටිසම්මතීහු කියනු ලැබෙත්; **පුථුජ්ජා** යනු: ඒ සම්මතීහු පුහුදුනුවන් විසින් උපදවන ලද්දාහු නුයි 'පුථුජ්ජා' යනු වේ, ඒ සම්මතීහු බොහෝ වූ නානා ජනයන් විසින් උපදවන ලද්දාහු නුයි හෝ 'පුථුජ්ජා' නම් වෙත් නුයි 'ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා' යනු වේ.

**උපෙක්ඛති උග්ගණ්හන්ති මඤ්ඤෙ** – අන්‍යයෝ තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් ගනිති, දැඩිගනිති, පිවිසෙත්; රහත් තෙම උපෙක්ෂා කෙරෙයි නො ගනී නො දැඩිගනී නො පිවිසේ නුයි 'උපෙක්ඛති උග්ගණ්හන්ති මඤ්ඤෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"න බ්‍රාහ්මණො -පෙ- උග්ගණ්හන්ති මඤ්ඤෙ"යි.

**13 - 18**

විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ
විවාදජාතෙසු න වග්ගසාරී,
සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො
අනුග්ගහො උග්ගණ්හන්ති මඤ්ඤෙ.

**විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙති** – ‘ගන්ථා’ති චත්තාරො ගන්ථා: අභිජ්ඣා කායගන්ථො, බ්‍යාපාදො කායගන්ථො, සීලබ්බතපරාමාසො කායගන්ථො, ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො, අත්තනො දිට්ඨියා රාගො අභිජ්ඣා කායගන්ථො, පරවාදෙසු ආඝාතො අප්පච්චයො බ්‍යාපාදො කායගන්ථො, අත්තනො සීලං වා වතං වා සීලබ්බතං වා පරාමසති සීලබ්බතපරාමාසො කායගන්ථො, අත්තනො දිට්ඨි ඉදංසච්චාභිනිවෙසො කායගන්ථො, **විසජ්ජාති** ගන්ථෙ වොසජ්ජිත්වා වා විසජ්ජ; අථවා ගන්ථෙ ගථිතෙ ගන්ථිතෙ බන්ධෙ[1] විබන්ධෙ[1] ආබන්ධෙ[1] ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ බන්ධනෙ ඵොටයිත්වා වා විසජ්ජ; යථා වය්හං වා රථං වා සකටං වා සන්දමානිකං වා සජ්ජං විසජ්ජං කරොන්ති විකොපෙන්ති, එවමෙවං ගන්ථෙ වොසජ්ජිත්වා වා විසජ්ජ; අථවා ගන්ථෙ ගථිතෙ ගන්ථිතෙ බන්ධෙ විබන්ධෙ ආබන්ධෙ ලග්ගෙ ලග්ගිතෙ පලිබුද්ධෙ[2] බන්ධනෙ ඵොටයිත්වා වා විසජ්ජ; **මුනීති** මොනං වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනි; **ඉධාති** ඉමිස්සා දිට්ඨියා -පෙ- ඉමස්මිං මනුස්සලොකෙති - විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ.

**විවාදජාතෙසු න වග්ගසාරීති** – විවාදෙ ජාතෙ සඤ්ජාතෙ නිබ්බත්තෙ අභිනිබ්බත්තෙ පාතුභූතෙ[3] ඡන්දාගතිං ගච්ඡන්තෙසු දොසාගතිං ගච්ඡන්තෙසු භයාගතිං ගච්ඡන්තෙසු මොහාගතිං ගච්ඡන්තෙසු න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති සංහරීයතීති – විවාදජාතෙසු න වග්ගසාරී.

**සන්තො අසන්තෙසු උපෙක්ඛකො සොති** – ‘සන්තො’ති රාගස්ස සන්තත්තා සන්තො; දොසස්ස සන්තත්තා සන්තො, මොහස්ස සන්තත්තා සන්තො -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති – සන්තො **අසන්තෙසූති** අසන්තෙසු අනුපසන්තෙසු අවූපසන්තෙසු අනිබ්බුතෙසු අප්පටිප්පස්සද්ධෙසූති – සන්තො අසන්තෙසු; **උපෙක්ඛකො සොති** අරහා ඡළඞ්ගුපෙක්ඛාය සමන්නාගතො: චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති, න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො, සොතෙන සද්දං සුත්වා -පෙ- කාලං කඞ්ඛති භාවිතත්තො[4] සුදන්තොති – සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො.

---

1. බද්ධෙ - මජසං. PTS. 2. පලිබුන්ධෙ - සීමු.II.
3. විවාදජාතෙසු පාතුභූතෙසු - සයා. PTS. 4. භාවිතො - සීමු.II. මනුප. PTS.

## 13 – 18

ඛීණාශ්‍රව මුනි තෙම මෙලොව චතුර්විධ ග්‍රන්ථයන් හැරපියා හටගත් විවාද ඇතියවුන් අතුරෙහි (ඡන්දාදීන්) වශී ව නො හැසිරෙනුයේ අශාන්තයන් අතුරෙහි ශාන්ත වූයේ උපෙක්ෂායෙන් යුක්ත වූයේ වෙයි, හෙතෙම දෘෂ්ටි-ග්‍රහණ රහිත වෙයි, අන්‍යයෝ (තෘෂ්ණා දෘෂ්ටි විසින්) දැඩිව ගනිත්.

**විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ** – 'ගන්ථා' යනු: සතර ග්‍රන්ථ කෙනෙකි. අභිධ්‍යාකායග්‍රන්ථ යැ, ව්‍යාපාදකායග්‍රන්ථ යැ, ශීලව්‍රතපරාමර්ශකායග්‍රන්ථ යැ ඉදම්සත්‍යාභිනිවේශකායග්‍රන්ථ යැයි; තමාගේ දෘෂ්ටියෙහි රාගය අභිධ්‍යාකාය ග්‍රන්ථ යැ, පරවාදයන්හි කෝපය නො සතුට ව්‍යාපාදකායග්‍රන්ථ යැ, තමාගේ ශීලය හෝ ව්‍රතය හෝ ශීලව්‍රතය හෝ දැඩිව ගනී, (මේ) ශීලව්‍රත පරාමර්ශකායග්‍රන්ථ යැ, තමාගේ දෘෂ්ටිය ඉදම්සත්‍යාභිනිවේශකායග්‍රන්ථ යයි. **විසජ්ජ** යනු: ග්‍රන්ථයන් පරිත්‍යාග කොට හෝ 'විසජ්ජ' යනු වේ. නොහොත් ග්‍රන්ථයන් ග්‍රථිත වූවත් ග්‍රන්ථිත වූවත් බඳනා ලදුවත් වෙසෙසින් බඳනා ලදුවත් හාත්පසින් බඳනා ලදුවත් ලග්න වූවත් ලග්නිත වූවත් හාත්පසින් බැඳුණවුන් කෙලෙශබන්ධනයන් පොළාපියා හෝ හැරදමා; යම් සේ ගමනට සැරසූ ඒලාවක් හෝ රියක් හෝ ගැලක් හෝ යානයක් හෝ විසුරුවත් ද, සුණු කෙරෙත් ද, එසෙයින් ම ග්‍රන්ථයන් පරිත්‍යාග කොට හෝ හැරපියා නොහොත් ග්‍රන්ථයන් ග්‍රථිත – ග්‍රන්ථිත – බද්ධ – විබද්ධ – ආබද්ධ – ලග්න-ලග්නිත – පරිබද්ධ වූවත් කෙලෙශබන්ධනයන් පොළාපියා හෝ හැරදමා; මුනි යනු: 'මොන'යි ඥානය කියනු ලැබෙයි; ඉධ යනු: මේ දෘෂ්ටියෙහි... මේ මිනිස්ලොව නුයි 'විසජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ' යනු වේ.

**විවාදජාතෙසු න වග්ගසාරී** – විවාදයක් උපන් කල්හි හටගත් කල්හි නිපන් කල්හි වෙසෙසින් නිපන් කල්හි පහළ වූ කල්හි (අන්‍යයන්) ඡන්දයෙන් අගතියට යන කල්හි ද්වේෂයෙන් අගතියට යන කල්හි භයින් අගතියට යන කල්හි මෝහයෙන් අගතියට යන කල්හි, ඡන්දාගතියට නො යෙයි, ද්වේෂාගතියට නො යෙයි, භයාගතියට නො යෙයි, මෝහාගතියට නො යෙයි, රාගවශයෙන් නො යෙයි, ද්වේෂවශයෙන් – භයවශයෙන් – මෝහවශයෙන් – මානවශයෙන් – දෘෂ්ටිවශයෙන් – ඖද්ධත්‍යවශයෙන් – විචිකිත්සාවශයෙන් – අනුශයවශයෙන් නො යෙයි; වශී වූ ධර්මයන් විසින් නො යවනු ලැබෙයි, නො පමුණුවනු ලැබෙයි, නො වහනු ලැබෙයි , නො හරිනු ලැබේ නුයි 'විවාදජාතෙසු න වග්ගසාරී' යනු වේ.

**සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො** – 'සන්තො' යනු: රාගය සන්හිඳුවන ලද හෙයින් ශාන්ත යැ, ද්වේෂය ශාන්ත වන බැවින් ශාන්ත යැ, මෝහය ශාන්ත වන බැවින් ශාන්ත යැ...සියලු අකුශලාභිසංස්කාරයන් ශාන්ත වන බැවින් ශමිත වන බැවින් ව්‍යුපශමිත වන බැවින් දවන ලද වන බැවින් නිවන ලද වන බැවින් විගත වන බැවින් දුරලන ලද වන බැවින් ශාන්ත යැ උපශාන්ත යැ ව්‍යුපශාන්ත යැ නිර්වෘත යැ දුරලන ලද්දේ නුයි 'සන්තො' යනු වේ. –**අසන්තෙසු** අශාන්තයන් අතුරෙහි අනුපශාන්තයන් – අව්‍යුපශාන්තයන් – නො නිවුණවුන් (කෙලෙස්) නො දුරලන ලදුවන් අතුරෙහි නුයි 'සන්තො අසන්තෙසු' යනු වේ **උපෙක්ඛකො සො**– රහත් තෙමේ ෂඩඞ්ගොපෙක්ෂායෙන් සමන්විත වූයේ යැ; ඇසින් රූපයක් දැක නො මැ සතුටු සිත් ඇතියේ වෙයි, නො සතුටු සිත් ඇතියේ නො වෙයි, උපෙක්ෂා ඇතියේ සිහි ඇතියේ නුවණැතියේ වෙසෙයි; කනින් ශබ්දයක් අසා...භාවිත වූ සිත් ඇතියේ මෙනාවට දැමුණේ මරණකාලය අපේක්ෂා කෙරේ නුයි 'සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො' යනු වේ.

**අනුග්ගහො උග්ගණ්හන්ති මඤ්ඤෙති** – අඤ්ඤෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන ගණ්හන්ති[1] පරාමසන්ති අභිනිවිසන්ති, අරහා උපෙක්ඛති න ගණ්හාති න පරාමසති නාභිනිවිසතීති – අනුග්ගහො උග්ගණ්හන්ති මඤ්ඤෙ.

තෙනාහ භගවා:

“විස්සජ්ජ ගන්ථානි මුනීධ ලොකෙ
විවාදජාතෙසු න වග්ගසාරී,
සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො
අනුග්ගහො උග්ගණ්හන්ති මඤ්ඤෙ”ති

## 18 – 19

පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං
න ඡන්දගූ නොපි නිවිස්සවාදී,
ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො
න ලිප්පති[2] ලොකෙ අනත්තගරහී.

**පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බන්ති** – පුබ්බාසවා වුච්චන්ති අතීතා රූපවෙදනාසඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණා, අතීතෙ සඞ්ඛාරෙ ආරබ්භ යෙ කිලෙසා උප්පජ්ජෙය්‍යුං, තෙ කිලෙසෙ හිත්වා චජිත්වා පරිච්චජිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති – පුබ්බාසවෙ හිත්වා; නවෙ අකුබ්බන්ති 'නවා'' වුච්චන්ති පච්චුප්පන්නා රූපවෙදනාසඤ්ඤාසඞ්ඛාරවිඤ්ඤාණා, පච්චුප්පන්නෙ සඞ්ඛාරෙ ආරබ්භ ඡන්දං අකුබ්බමානො පෙමං අකුබ්බමානො රාගං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානොති – පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං.

**න ඡන්දගූ නොපි නිවිස්සවාදීති** – න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න රාගවසෙන ගච්ඡති, න දොසවසෙන ගච්ඡති, න මොහවසෙන ගච්ඡති, න මානවසෙන ගච්ඡති, න දිට්ඨිවසෙන ගච්ඡති, න උද්ධච්චවසෙන ගච්ඡති, න විචිකිච්ඡාවසෙන ගච්ඡති, න අනුසයවසෙන ගච්ඡති, න වග්ගෙහි ධම්මෙහි යායති නීයති වුය්හති න සංහරීයතීති – න ඡන්දගූ; නොපි නිවිස්සවාදීති 'සස්සතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති න නිවිස්සවාදී –පෙ– නෙව හොති න න හොති තථාගතො පරම්මරණා, ඉදමෙව සච්චං මොඝමඤ්ඤ'න්ති න නිවිස්සවාදීති – න ඡන්දගූ නොපි නිවිස්සවාදී.

**ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරොති** – තස්ස ද්වාසට්ඨිදිට්ඨිගතානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි; සො දිට්ඨිගතෙහි විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති; ධීරොති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවීති – ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො.

---

1. ගණ්හන්තෙ - සීමු. II. 2. ලිම්පති සීමු. II, PTS.

**අනුග්ගහො උග්ගණ්හකායි මෙකෙදෙ** - අන්‍යයෝ තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් ගනිති, දැහැගනිති, පිවිස ගනිත්; රහත් තෙම උපෙක්ෂා කෙරෙයි, නො ගනී නො දැහැගනී නො පිවිසේ නුයි 'අනුග්ගහො උග්ගණ්හකායි මෙකෙදෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"විසජ්ජ ගන්ථානි -පෙ- උග්ගණ්හනායි මෙකෙදෙ"යි.

**18 - 19**

ඉක්මැගිය (රූපාදීන් අරබයා උපන් කාමාදි) ආශ්‍රවයන් හැර වර්තමාන (රූපාදිය අරබයා උපදනා) ආශ්‍රවයන් නො කරන්නාවූ ඡන්දාදි වසයෙන් අගතියට නො යන්නා වූ නො ද දෘෂ්ටියෙහි පිහිටා කියන්නා වූ දෘෂ්ටිගතයන් ගෙන් වෙසෙසින් මිදුණා වූ ධීර වූ ඒ ක්ෂීණාශ්‍රව තෙම (කෘතාකෘතවශයෙන්) තම හට නො ගරහනු යේ ලොවෙ (තෘෂ්ණාදෘෂ්ටි) විසින් නො ඇලෙන්නේ යි.

**පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං** -'පුබ්බාසවා'යි ඉක්මැගිය රූපවෙදනා සංඥාසංස්කාරවිඥානයෝ කියනු ලැබෙති, අතීත සංස්කාරයන් අරබයා යම් කෙලෙස් කෙනෙක් උපදනාහු නම්, ඒ කෙලෙසුන් හැර ත්‍යාග කොට පරිත්‍යාග කොට දුරු කොට බැහැර කොට විගතාභාව කොට අනභාවයට පමුණුවා නුයි 'පුබ්බාසවෙ හිත්වා' යනු වේ. **න වෙ අකුබ්බං** 'නවා'යි වර්තමාන රූපවෙදනාසංඥාසංස්කාරවිඥානයෝ කියනු ලැබෙති; වර්තමාන සංස්කාරයන් ඇරබ ඡන්දය නො කරනුයේ ප්‍රේමය නො කරනුයේ රාගය නො කරනුයේ නො දනවනුයේ මැනවින් නො දනවනුයේ නො නිප දවනුයේ නුපදවනුයේ නුයි 'පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං' යනු වේ.

**න ඡන්දගූ නො'පි නිවිස්සවාදී** - ඡන්දයෙන් අගතියට නො යයි, ද්වේෂයෙන් අගතියට නො යයි, භයින් අගතියට නො යයි, මෝහයෙන් අගතියට නො යයි, රාගවශයෙන් නො පැමිණෙයි, ද්වේෂවශයෙන්- මෝහවශයෙන් - මානවශයෙන් - දෘෂ්ටිවශයෙන් - ඖද්ධත්‍ය - වශයෙන්- විචිකිත්සාවශයෙන් - අනුශයවශයෙන් නො යයි, වර්ග වූ ධර්මයන්ගෙන් නො යවනු ලැබෙයි, නො පමුණුවනු ලැබෙයි, නො වනනු ලැබෙයි, නො ගරිනු ලැබේ නුයි 'න ඡන්දගූ' යනු වේ. **නො පි නිවිස්සවාදී** 'ශාශ්වත යැ ලොකය මේ මැ සැබැව, අන්‍යය මොස යැ'යි නො පිහිටා කියනුයේ... සත්ව තෙමේ මරණින් මතු නො මැ වෙයි, නො වන්නේ නො වෙයි, මේ මැ සැබව, අන්‍යය මොස යැ'යි නො පිහිටා කියනුයේ නුයි 'න ඡන්දගූ නො පි නිවිස්සවාදී' යනු වේ.

**ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො** - ඔහු විසින් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ ප්‍රහීණ කරන ලද්දාහුය, සිඳින ලද්දාහුය, සන්හිඳුවන ලද්දාහුය දුරලන ලද්දාහුය උපතට නුසුදුසු කරන ලද්දාහුය, නුවණගින්නෙන් දවන ලද්දාහුය, හෙතෙම දෘෂ්ටිගතයන් ගෙන් වෙසෙසින් මිදුණේ වෙන් වූයේ විගතමර්‍යාදී කළ සිතින් යුක්ත ව වෙසෙයි. **ධීරො** යනු: ධීර වූයේ පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැතියේ විමංසනප්‍රඥා ඇතියේ තීරණප්‍රඥා ඇතියේ නුයි 'ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො' යනු වේ.

**න ලිප්පති[1] ලොකෙ අනත්තගරහීති** – 'ලෙපා'ති ද්වෙ ලෙපා: තණ්හාලෙපො ච දිට්ඨිලෙපො ච –පෙ– අයං තණ්හාලෙපො –පෙ– අයං දිට්ඨිලෙපො; තස්ස තණ්හා ලෙපො පහීනො දිට්ඨිලෙපො පටිනිස්සට්ඨො; තණ්හාලෙපස්ස පහීනත්තා දිට්ඨිලෙපස්ස පටිනිස්සට්ඨත්තා අනුපලිත්තො අපායලොකෙ න ලිප්පති; මනුස්සලොකෙ න ලිප්පති; දෙවලොකෙ න ලිප්පති; ඛන්ධලොකෙ න ලිප්පති; ධාතුලොකෙ න ලිප්පති; ආයතනලොකෙ න ලිප්පති; න සංලිප්පති, න උපලිප්පති, අලිත්තො අසංලිත්තො අනුපලිත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති – න ලිප්පති ලොකෙ, අනත්තගරහීති ද්වීහි කාරණෙහි අත්තානං ගරහති: කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති? කතං මෙ කායදුච්චරිතං අකතං මෙ කායසුචරිතන්ති අත්තානං ගරහති. කතං මෙ වචීදුච්චරිතං– කතං මෙ මනොදුච්චරිතං – කතො මෙ පාණාතිපාතො –පෙ– කතා මෙ මිච්ඡාදිට්ඨි අකතා මෙ සම්මාදිට්ඨීති අත්තානං ගරහති. එවං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති. අථවා සීලෙසුම්හි න පරිපූරකාරීති අත්තානං ගරහති. ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරොති-භොජනෙම්හි අමත්තඤ්ඤූති ජාගරියම්හි අනනුයුත්තොති – න සතිසම්පජඤ්ඤෙනම්හි සමන්නාගතොති- අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති – අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති – අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති – අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති – අභාවිතානි මෙ පඤ්ච බලානීති – අභාවිතා මෙ සත්ත බොජ්ඣඞ්ගාති – අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති – දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති – දුක්ඛසමුදයො මෙ අප්පහීනොති – මග්ගො මෙ අභාවිතොති – නිරොධො මෙ අසච්ඡිකතොති අත්තානං ගරහති එවං කතත්තා ච අකතත්තා ච අත්තානං ගරහති. එවං අත්තගරහී කතං[2] කම්මං අකුබ්බමානො අජනයමානො අසඤ්ජනයමානො අනිබ්බත්තයමානො අනභිනිබ්බත්තයමානො අනත්තගරහීති – න ලිප්පති[1] ලොකෙ අනත්තගරහී.

තෙනාහ භගවා:

"පුබ්බාසවෙ හිත්වා නවෙ අකුබ්බං
න ඡන්දගූ නොපි නිවිස්සවාදී,
ස විප්පමුත්තො දිට්ඨිගතෙහි ධීරො
න ලිප්පති[1] ලොකෙ අනත්තගරහී"ති.

## 18 – 20

ස සබ්බධම්මෙසු විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨං ච සුතං මුතං වා,
ස පන්නභාරො මුනි විප්පමුත්තො
න කප්පියො නූපරතො න පත්ථියො (ඉති භගවා.)

1. ලිම්පති - සිමු II. PTS. 2. අත්තගරහී තයිදං - සිමු. II. PTS

න ලිප්පති ලොකෙ අනනුතාපී – 'ලේප' නම්: තෘෂ්ණාලේපය ද දෘෂ්ටිලේපය දැයි ලේපයෝ දෙදෙනෙකි:...මේ දෘෂ්ටිලේපයයි; ඔහු විසින් තෘෂ්ණාලේපය ප්‍රහීණ යැ, දෘෂ්ටිලේපය දුරලන ලද, තෘෂ්ණාලේපය ප්‍රහීණ බැවින් දෘෂ්ටිලේපය දුරලූ බැවින් නො ඇලුණේ අපායලොකයෙහි නො ඇලෙයි, මිනිස්ලොව නො ඇලෙයි, දෙව්ලොව නො ඇලෙයි, ස්කන්ධලොක යෙහි නො ඇලෙයි, ධාතුලොකයෙහි නො ඇලෙයි, ආයතනලොකයෙහි නො ඇලෙයි, නො තැවරෙයි, හාත්පසින් නො ඇලෙයි, නො ඇලුණේ නො වැකුණේ නො තැවැරුණේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වෙසේ නුයි 'න ලිප්පති ලොකෙ' යනු වේ. අනනුතාපී – දෙ කරුණෙකින් තම හට ගරහයි: කළ හෙයින් හා නො කළ හෙයින් හා යැ; කිසෙයින් කළ හෙයින් හා නො කළ හෙයින් හා තමහට ගරහා ද යත්? 'මා විසින් කායදුශ්චරිතය කරන ලද, කායසුචරිතය නො කරන ලද'යි තමහට ගරහයි, මා විසින් වාග්දුශ්චරිතය කරන ලද...මා විසින් මනොදුශ්චරිතය කරන ලද... මා විසින් ප්‍රාණවධ කරන ලද...මා විසින් මිථ්‍යාදෘෂ්ටිය කරන ලද... මා විසින් සම්‍යග්දෘෂ්ටිය නො කරන ලද'යි තම හට ගරහයි, මෙසේ කළ හෙයින් හා නො කළ හෙයින් හා තම හට ගරහයි; නොහොත් 'ශීලයෙහි පරිපූර්ණකාරී නො වූයෙමි තම හට ගරහයි, ඉන්ද්‍රියයන්හි පියූ දොර ඇත්තෙමි නො වීමි... බොජුන්හි පමණ දතුයෙම් නො වීමි... නිදි දුරු කිරීමෙහි නො යෙදුනෙම් වීමි... සිහිනුවණින් සමන්විත වූයෙම් නො වීමි... මා විසින් සතර සතිපට්ඨානයෝ නො වඩන ලදහ'යි– සතර සම්‍යක්ප්‍රධානයෝ නො වඩන ලදහ'යි - සතර ඍද්ධිපාදයෝ නො වඩන ලදහ'යි– පඤ්චෙන්ද්‍රියයෝ නො වඩන ලදහ'යි– පඤ්චබලයෝ නො වඩන ලදහයි - සප්තබොධ්‍යඞ්ගයෝ නො වඩන ලදහයි - ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය නො වඩන ලදැයි – දුඃඛසත්‍යය මා විසින් අපරිඥාත යැ යි – දුඃඛසමුදය මා විසින් අප්‍රහීණ යැයි – මාර්ගය මා විසින් අභාවිත යැ යි– නිරොධය මා විසින් ප්‍රත්‍යක්ෂ නො කරන ලදැයි තම හට ගරහයි; මෙසේ කළ හෙයින් ද නො කළ හෙයින් ද තම හට ගරහයි, මෙසේ තම හට ගරහන සුලු වෙයි. ඒ මේබඳු කර්මය නො කරනුයේ නො දනවනුයේ නූපදවනුයේ නො නිපදවනුයේ නො පහළ කරනුයේ තමහට නො ගරහනුයේ 'න ලිප්පති ලොකෙ අනනුතාපී' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"පුබ්බාසවෙ හිත්වා -පෙ-.න ලිප්පති ලොකෙ අනනුතාපී"යි.

18 - 20

ඒ ක්ෂීණාස්‍රව තෙම යම් කිසි රූපාලම්බනයෙක් හෝ ශබ්දාලම්බන යෙක් හෝ ගන්ධරස ස්ප්‍රෂ්ටව්‍යාලම්බනයෙක් හෝ (ධර්මාලම්බනයෙක් හෝ වේ ද) ඒ සර්වධර්මයන්හි මරසෙන් වනසා සිටියේ වෙයි. ඒ රහත් තෙම බහාතැබූ බර ඇත්තේ (කෙලෙසුන් කෙරෙන්) වෙසෙසින් මිදුණේ තෘෂ්ණාදෘෂ්ටි කල්පය නො කෙරෙයි, උපරති සහිත ද නො වෙයි. තෘෂ්ණා රහිත වූයේත් වේ. (බුදුහු මෙසේ වදාළ සේකි.)

ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං-වාති – සෙනා වුච්චති මාරසෙනා, කායදුච්චරිතං මාරසෙනා, වචීදුච්චරිතං මාරසෙනා, මනොදුච්චරිතං මාරසෙනා, රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභි-සඞ්ඛාරා මාරසෙනා.

වුත්තං හෙතං භගවතා:

1. "කාමා තෙ පඨමා සෙනා දුතියාඅරති[1] වුච්චති,
තතියා ඛුප්පිපාසා තෙ චතුත්ථී තණ්හා පවුච්චති.

2. පඤ්චමී[2] ථීනමිද්ධං තෙ ඡට්ඨා භීරූ පවුච්චති,
සත්තමී විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො තෙ අට්ඨමො.[3]

3. ලාභො සිලොකො සක්කාරො මිච්ඡාලද්ධො ච යො යසො,
යො චත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති.

4. එසා නමුචි තෙ සෙනා කණ්හස්සාභිප්පහාරිණී,
න නං අසූරො ජිනාති ජෙත්වා[4] ච ලභතෙ සුඛ"න්ති.[a]

යතො චතූහි අරියමග්ගෙහි සබ්බා ච මාරසෙනා සබ්බෙ ච පටිසෙනිකරා කිලෙසා ජිතා ච පරාජිතා ච භග්ගා විප්පලුග්ගා[5] පරම්මුඛා, සො වුච්චති විසෙනිභූතො, සො දිට්ඨෙ විසෙනිභූතො සුතෙ මුතෙ විඤ්ඤාතෙ විසෙනි-භූතොති – ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා.

ස පන්නභාරො මුනි විප්පමුත්තොති – 'භාරා'ති තයො භාරා ඛන්ධභාරො කිලෙසභාරො අභිසඞ්ඛාරභාරො; කතමො ඛන්ධභාරො? පටිසන්ධියා රූපං වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, අයං ඛන්ධභාරො. කතමො කිලෙසභාරො? රාගො දොසො මොහො -පෙ- සබ්බාකුසලාභි-සඞ්ඛාරා, අයං කිලෙසභාරො. කතමො අභිසඞ්ඛාරභාරො? පුඤ්ඤාභි-සඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො, අයං අභිසඞ්ඛාරභාරො. යතො ඛන්ධභාරො ච කිලෙසභාරො ච අභිසඞ්ඛාරභාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා; සො වුච්චති පන්නභාරො පතිතභාරො ඔරොපිතභාරො සමොරොපිතභාරො නික්ඛිත්තභාරො පටිප්පස්සද්ධභාරො.

1. දුතියා රති - කත්ථචි. පඤ්චමං - සීමු. II, මජසං. PTS.
3. අට්ඨමො - සීමු. II, මජසං. PTS. 4. ජෙත්වා - PTS.
5. විප්පලුග්ගතා - සීමු. II. PTS. a. සුත්තනිපාත - පධානසුත්ත

**ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා** 'සෙනා'යි මාරසෙන් කියනු ලැබෙයි, කායදුශ්චරිතය මාරසෙනා යැ, වාග්දුශ්චරිතය - මනොදුශ්චරිතය මාරසෙනා යැ, රාගය ද්වෙෂය මොහය ක්‍රොධය උපනාහය මකුබව යුගග්‍රාහය ඊර්ෂ්‍යාය මාත්සර්‍ය්‍යය මායාව ශඨතාව තදබව කරණුත්තරියකරණය මානය අතිමානය මදය ප්‍රමාදය සියලු කෙලෙස් සියලු දුසිරිත් සියලු දරථයෝ සියලු පරිදාහයෝ සියලු සන්තාපයෝ සියලු අකුශලාභිසංස්කාරයෝ මාරසෙනා යි.

මේ වදාරන ලද මැය, භාග්‍යවතුන් විසින්:

1. කාමයෝ තාගේ පළමුවැනි සෙනාව යැ, දෙවැන්නී අරති යයි කියනු ලබයි, සාපවස් දෙක තාගේ තෙවැනි සෙනාව යැ, සිවුවැන්නී තෘෂ්ණාව යයි කියනු ලබයි.

2. ථිනමිද්ධය තාගේ පස්වැනි සෙනාව යැ, සවැන්නී බියසුලු බව යයි කියනු ලබයි, විචිකිත්සාව තාගේ සත්වැනි සෙනාව යැ, මකුබව හා තදබව තාගේ අටවැනි සෙනාවයි.

3. ලාභය ප්‍රශංසාවය සත්කාරය හා මිථ්‍යාවෙන් ලද යශස ද (නව වැනි වෙයි) යමෙකු ත් තමා උසස් කරත්තේ පරහට අවඥත් කෙරේ ද, (එය දසවැනි වේ.)

4. අනනකය, කෘෂ්ණධර්මයෙන් සමන්විත වූ තාගේ තෙල (දසවිධ) සෙනා තොමෝ මහණබමුණන් පෙළන්නී වෙයි, අසුර වූ පුරුෂ තෙම ඒ මරසෙනග නො දිනයි, යළි (සූර තෙමේ) ජයග්‍රහණය කොට මගපලසුව ලබා'යයි.

යම් හෙයකින් සතර ආර්‍ය්‍යමාර්ගයෙන් සියලු මරසෙනගත් සියලු ප්‍රතිපක්ෂකර කෙලෙශයෝත් දිනන ලද්දාහු ද පරදවන ලද්දාහු ද බිඳුණාහු සුණුවිසුණු වූවාහු විමුඛබවට පමුණුවන ලද්දාහු ද, හෙතෙම විසෙනිභූත යයි කියනු ලැබෙයි; හේ රූපායතනයෙහි නිකෙලෙශ වූයේ ශබ්දායතන යෙහි නිකෙලෙශ වූයේ ගන්ධරසස්ප්‍රෂ්ටව්‍යායතනයෙහි නිකෙලෙශ වූයේ ධර්මායතනයෙහි නිකෙලෙශ වූයේ නුයි 'ස සබ්බධම්මෙසු විසෙනිභූතො යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා' යනු වේ.

**ස පන්නභාරො මුනි විප්පමුත්තො** - 'භාර' නම් තුන් බරෙකි: සකන්ධභාරය කෙලෙශභාරය අභිසංස්කාරභාරය යි; සකන්ධභාරය කවරු යත්? ප්‍රතිසන්ධියෙහි රූපය වෙදනාව සංඥාව සංස්කාරයෝ විඥානය (යන) මේ සකන්ධභාරය යි; කෙලෙශභාරය කවරු යත්? රාගය ද්වෙෂය මොහ ...සියලු අකුශලාභිසංස්කාරයෝ යැ, මේ කෙලෙශභාරය යි; අභිසංස්කාරභාරය කවරු යත්? පුණ්‍යාභිසංස්කාර යැ අපුණ්‍යාභිසංස්කාර යැ ආනෙඤ්ජාභිසංස්කාර යැ (යන) මේ අභිසංස්කාරභාරය යි. යම් තැනෙක පටන් සකන්ධභාරය ත් කෙලෙශභාරය ත් අභිසංස්කාරභාරයත් ප්‍රහීණ වූවාහු වෙත් ද, උදුන් මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මත්තෙහි නූපදනා පියවි ඇත්තාහු වෙත් ද, හෙතෙම තැබූ බර ඇත්තේ යැ හෙළු බර ඇත්තේ යැ. බහාතැබූ බර ඇත්තේ යැ මොනොවට බහාතැබූ බර ඇත්තේ යැ නික්ෂෙප කළ බර ඇත්තේ යැ සන්හිඳුවන ලද බර ඇත්තේ යැයි කියනු ලැබේ.

මුනීති මොනං වුච්චති ඤාණං, "යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදො පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදො පඤ්ඤාආලොකො පඤ්ඤාඔභාසො පඤ්ඤාපජ්ජොතො පඤ්ඤාරතනං අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි"[a] තෙන ඤාණෙන සමන්නාගතො මුනි මොනප්පත්තො.

තීණි මොනෙය්‍යානි: කායමොනෙය්‍යං, වචීමොනෙය්‍යං, මනොමොනෙය්‍යං කතමං කායමොනෙය්‍යං? තිවිධානං කායදුච්චරිතානං පහානං කායමොනෙය්‍යං. තිවිධං කායසුචරිතං කායමොනෙය්‍යං. කායාරම්මණඤාණං කායමොනෙය්‍යං. කායපරිඤ්ඤා කායමොනෙය්‍යං. පරිඤ්ඤාසහගතො මග්ගො කායමොනෙය්‍යං. කායෙ ඡන්දරාගස්ස පහානං කායමොනෙය්‍යං. කායසඞ්ඛාරනිරොධො චතුත්ථජ්ඣානසමාපත්ති කායමොනෙය්‍යං. ඉදං කායමොනෙය්‍යං.

කතමං වචීමොනෙය්‍යං? චතුබ්බිධානං වචීදුච්චරිතානං පහානං වචීමොනෙය්‍යං. චතුබ්බිධං වචීසුචරිතං වචීමොනෙය්‍යං. වාචාරම්මණං ඤාණං වචීමොනෙය්‍යං. වාචාපරිඤ්ඤා වචීමොනෙය්‍යං. පරිඤ්ඤාසහගතො මග්ගො වචීමොනෙය්‍යං. වාචාය ඡන්දරාගස්ස පහානං වචීමොනෙය්‍යං. වචීසඞ්ඛාරනිරොධො දුතියජ්ඣානසමාපත්ති වචීමොනෙය්‍යං. ඉදං වචීමොනෙය්‍යං.

කතමං මනොමොනෙය්‍යං? තිවිධානං මනොදුච්චරිතානං පහානං මනොමොනෙය්‍යං. තිවිධං මනොසුචරිතං මනොමොනෙය්‍යං. චිත්තාරම්මණං ඤාණං මනොමොනෙය්‍යං. චිත්තපරිඤ්ඤා මනොමොනෙය්‍යං. පරිඤ්ඤාසහගතො මග්ගො මනොමොනෙය්‍යං. චිත්තෙ ඡන්දරාගස්ස පහානං මනොමොනෙය්‍යං. චිත්තසඞ්ඛාරනිරොධො සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති මනොමොනෙය්‍යං. ඉදං මනොමොනෙය්‍යං.

5. "කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු සබ්බප්පහායිනං.[b]

6. කායමුනිං වාචාමුනිං මනොමුනිමනාසවං,
මුනිං මොනෙය්‍යසම්පන්නං ආහු නින්හාතපාපක"න්ති[c]

ඉමෙහි තීහි මොනෙය්‍යෙහි ධම්මෙහි සමන්නාගතා ඡ මුනිනො: අගාරමුනිනො අනගාරමුනිනො සෙඛමුනිනො අසෙඛමුනිනො පච්චෙකමුනිනො මුනිමුනිනො.

---

a. ධම්මසඞ්ගණී නිද්දෙසවාර. b. තිකඞ්ගුත්තර - ආපායිකවග්ග
c. ඉතිවුත්තක - දුතියවග්ග.

මුනි යනු: 'මොන'යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රකෘතියෙන් දැනීමෙක් අනිත්‍යාදිය විමසීමෙක් ප්‍රකෘතියෙන් විමසීමෙක් සිවුසස් දහම් විමසීමෙක් අනිත්‍යාදිය සැලකීමෙක් උපලක්‍ෂණයෙක් ප්‍රත්‍යුපලක්‍ෂණයෙක් පණ්ඩිත බවෙක් කුසල බවෙක් නිපුණ බවෙක් (අනිත්‍යාදීන්ගේ) විභාවනයෙක් සිතීමෙක් පරීක්‍ෂාවක් භූරි සඞ්ඛ්‍යාත ප්‍රඥාවක් කෙලෙස් නසන ප්‍රඥාවක් පරිණායකප්‍රඥාවක් විදර්ශනාවක් සම්ප්‍රජන්‍යයක් පතොදය වැනි ප්‍රඥාවක් ප්‍රඥාවක් ප්‍රඥෙන්ද්‍රියයෙක් ප්‍රඥාබලයෙක් ප්‍රඥාශස්ත්‍රයෙක් ප්‍රඥාප්‍රාසාදයෙක් ප්‍රඥාලොකයෙක් ප්‍රඥාවභාසයෙක් ප්‍රඥාප්‍රද්‍යොතයෙක් ප්‍රඥාරත්නයෙක් අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එයයි. ඒ ඥානයෙන් සමන්විත වූ මුනි තෙම මොනප්‍රාප්ත යැ.

මෞනෙය්‍යයෝ තිදෙනෙකි: කායමොනෙය්‍ය යැ වචීමොනෙය්‍ය යැ මනොමොනෙය්‍ය යැයි; කායමොනෙය්‍ය ය කවරැ යත්: ත්‍රිවිධ කායදුශ්චරිතයන් ගේ ප්‍රහාණය කායමොනෙය්‍ය යැ, ත්‍රිවිධකායසුචරිතය කායමොනෙය්‍ය යැ කය අරමුණු කොට උපන් නුවණ කායමොනෙය්‍ය යැ, කායපරිඥාව කායමොනෙය්‍ය යැ, පරිඥාසහගත වූ මාර්ගය කායමොනෙය්‍ය යැ, කයෙහි ඡන්දරාගය දුරුලීම කායමොනෙය්‍ය යැ, කායසංස්කාර නිරොධය ඇති චතුර්ථධ්‍යානසමාපත්තිය කායමොනෙය්‍ය යැ' මේ කායමොනෙය්‍ය නම්.

වචීමොනෙය්‍යය කවරැ යත්: චතුර්විධ වාග්දුශ්චරිතයන්ගේ ප්‍රහාණය වචීමොනෙය්‍ය යැ, චතුර්විධ වාක්සුචරිතය වචීමොනෙය්‍ය යැ, වාක් අරමුණු කොට උපන් නුවණ වචීමොනෙය්‍ය යැ වාක්පරිඥාව වචීමොනෙය්‍ය පරිඥාසහගත මාර්ගය වචීමොනෙය්‍ය යැ වාක්හි ඡන්දරාගප්‍රහාණය වචීමොනෙය්‍ය යැ, වාක්සංස්කාරනිරොධය ඇති ද්විතීයධ්‍යානසමාපත්තිය වචීමොනෙය්‍ය යැ, මේ වචීමොනෙය්‍ය නම්.

මනොමොනෙය්‍යය කවරැ යත්: ත්‍රිවිධ මනොදුශ්චරිතයන්ගේ ප්‍රහාණය මනොමොනෙය්‍ය යැ, ත්‍රිවිධ මනඃසුචරිතය මනොමොනෙය්‍ය යැ, සිත අරමුණු කොට උපන් නුවණ මනොමොනෙය්‍ය යැ, චිත්තපරිඥාව මනොමොනෙය්‍ය යැ, පරිඥාසහගත මාර්ගය මනොමොනෙය්‍ය යැ, සිතෙහි ඡන්දරාගප්‍රහාණය මනොමොනෙය්‍ය යැ චිත්තසංස්කාරයන්ගේ නිරොධය ඇති සංඥාවෙදයිතනිරොධසමාපත්තිය මනොමොනෙය්‍ය යැ, මේ මනොමොනෙය්‍ය නම්.

5. (කායවාග්මනොදුශ්චරිතය දුරුලීම් වශයෙන්) කායමුනි වූ වාග්මුනි වූ මනොමුනි වූ අනාස්‍රව වූ (ඵලයෙහි සිටි හෙයින් මොනෙය්‍යසම්පන්න වූ මුනිහු සියලු කෙලෙසුන් දුරු කෙළේ යයි කියත්.

6. කායමුනි වූ වාග්මුනි වූ මනොමුනි වූ අනාස්‍රව වූ මොනෙය්‍යසම්පන්න වූ මුනිහු සෝදා හළ පව් ඇත්තෙකැ යි කියත්.

මේ තුන් මොනෙය්‍යධර්මයන්ගෙන් සමන්විත වූ මුනිහු සදෙනෙකි: අගාරමුනිහු යැ අනගාරමුනිහු යැ ශෛක්‍ෂමුනිහු යැ අශෛක්‍ෂමුනිහු යැ ප්‍රත්‍යෙකමුනිහු යැ මුනිමුනිහු යැයි.

කතමෙ **අගාරමුනිනො**? යෙ තෙ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා; ඉමෙ අගාරමුනිනො. කතමෙ **අනගාරමුනිනො**? යෙ තෙ පබ්බජිතා දිට්ඨපදා විඤ්ඤාතසාසනා; ඉමෙ අනගාරමුනිනො. සත්ත සෙඛා **සෙඛමුනිනො අරහන්තො අසෙඛමුනිනො පච්චෙකබුද්ධා පච්චෙකමුනිනො. මුනිමුනිනො** වුච්චන්ති තථාගතා අරහන්තො සම්මාසම්බුද්ධා.

7. "න මොනෙන[1] මුනි හොති මූළ්හරූපො අවිද්දසු,
යො ච තුලංව පග්ගය්හ වරමාදාය පණ්ඩිතො.

8. පාපානි පරිවජ්ජෙති ස මුනී තෙන සො මුනි,
යො මුනාති උභො ලොකෙ මුනි තෙන පවුච්චති[a].

9. අසතඤ්ච සතඤ්ච ඤත්වා ධම්මං අජ්ඣත්තං බහිද්ධා ච සබ්බලොකෙ
දෙවමනුස්සෙහි පූජිතො යො සඞ්ගජාලමතිච්ච සො මුනි.[b]

**විප්පමුත්තොති** – මුනිනො රාගා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; දොසා චිත්තං – මොහා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තන්ති – ස පන්නභාරො මුනි විප්පමුත්තො.

**න කප්පියො නූපරතො න පත්ථියොති** භගවාති – 'කප්පා'ති ද්වෙ කප්පා: තණ්හාකප්පො ච දිට්ඨිකප්පො ච -පෙ- අයං තණ්හාකප්පො -පෙ- අයං දිට්ඨිකප්පො. තස්ස තණ්හාකප්පො පහීනො. දිට්ඨිකප්පො පටිනිස්සට්ඨො. තණ්හාකප්පස්ස පහීනත්තා දිට්ඨිකප්පස්ස පටිනිස්සට්ඨත්තා තණ්හාකප්පං වා දිට්ඨිකප්පං වා, න කප්පෙති න ජනෙති න සඤ්ජනෙති න නිබ්බත්තෙති නාභිනිබ්බත්තෙතීති – න කප්පියො; **නූපරතොති** සබ්බෙ බාලපුථුජ්ජනා රජ්ජන්ති, කල්‍යාණපුථුජ්ජනං උපාදාය සබ්බෙ සෙඛා අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය ආරමන්ති විරමන්ති පටිවිරමන්ති; අරහා ආරතො විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති – න කප්පියො නූපරතො;

---

1. මොනෙය්‍යෙන - ස. [a]. ධම්මපද - ධම්මට්ඨවග්ග
[b]. සුත්තනිපාත - සභියසුත්ත.

අගාරමුනිහු කවරහු ද යත්: දක්නාලද නිවන ඇති දන්නාලද ශික්‍ෂාත්‍රය ශාසනය ඇති යම් ගිහියෝ වැසි කෙනෙක් වෙත් ද, මොහු අගාරමුනිහු යැ; අනගාරමුනිහු කවරහු ද යත්? දුටු නිවන ඇති දත් සසුන් ඇති යම් පැවිදි කෙනෙක් වෙත් ද, මොහු අනගාරමුනිහු යැ; සප්ත ශෛක්‍ෂයෝ සෙඛමුනිහු යැ; රහත්හු අසෙඛමුනිහු යැ; පසේබුදුවරයෝ පච්චෙකමුනිහු යැ; තථාගත වූ අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ මුනිමුනිහු යයි කියනු ලැබෙත්.

7. මුළුප්‍රකෘති ඇති අවිද්‍යා තෙම මෞනභාවය (-නො බැණ සිටීම) හේතු කොටගෙන මුනි වූයේ නො වෙයි. තවද පණ්ඩිත වූ යමෙක් තුලාව ගෙන සිටියක්හු සෙයින් උත්තම වූ ශීලසමාධ්‍යාදිය ගෙන-

8 අකුශලධර්මයන් දුරු කෙරේ ද, හේ මුනි නම් වෙයි. යට කී කාරණෙන් හෙතෙම මුනි වූයේ යැ. යමෙක් ස්කන්ධාදි ලොකයෙහි අධ්‍යාත්ම බාහිරාදි උභයාර්ථයන් දැනගනී ද, එ කාරණෙන් හෙතෙම මුනි යයි කියනු ලැබේ.

9. යමෙක් කුශලාකුශලප්‍රභෙද වූ සදසත් ධර්මය ද සියලු ස්කන්ධාදි ලොකයෙහි අධ්‍යාත්මබාහිරාදි ධර්මය ද දැන රාගාදි සඞ්ගය හා තෘෂ්ණා-දෘෂ්ටිජාලය ඉක්මවා සිටියේ ද ඒ ක්‍ෂීණාස්‍රව මුනි තෙම් දෙවිමිනිසුන් විසින් පුදන ලද්දයේ වේ.

**විප්පමුත්තො** - මුනිහුගේ සිත රාගයෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යැ, ද්වෙෂයෙන්...මොහයෙන් සිත මුක්ත - විමුක්ත - සුවිමුක්ත යැ . සියලු අකුශලාභිසංස්කාරයන් ගෙන් සිත මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත නුයි 'ස පහානභාරො මුනි විප්පමුත්තො' යනු වේ.

**න කප්පියො නූපරතො න පත්ථියො** 'ති භගවා - 'කප්ප' යනු, තෘෂ්ණාකල්පය ද දෘෂ්ටිකල්පය දැයි කල්ප දෙකෙකි. මේ දෘෂ්ටිකල්පය යි. ඔහු විසින් තෘෂ්ණාකල්පය ප්‍රහීණ යැ, දෘෂ්ටිකල්පය දුරලන ලද; තෘෂ්ණාකල්පය ප්‍රහීණ වන බැවින් දෘෂ්ටිකල්පය දුරලූ බැවින් තෘෂ්ණාකල්පය හෝ දෘෂ්ටිකල්පය හෝ නො කෙරෙයි, නො දනවයි නූපදවයි නො නිපදවයි නො පහළ කෙරේ නුයි 'න කප්පියො' යනු වේ. **නූපරතො** - සියලු බාලපෘථග්ජනයෝ ඇලෙති, කල්‍යාණපෘථග්ජනයා පටන් සියලු ශෛක්‍ෂයෝ නො පැමිණි මාර්ගයාගේ පැමිණීම පිණිස අනධිගත වූ ඵලයාගේ අධිගමය පිණිස පසක් නො කළ නිවන ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස නො ඇලෙති; විරාගයට පැමිණෙති, වෙසෙසින් විරාගයට පැමිණෙත්, ක්‍ෂීණාස්‍රව තෙම දුරුවූයේ වෙන්වූයේ සම්‍යකාරයෙන් වෙන්වූයේ නික්මැගියේ පහවගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'න කප්පියො නූපරතො' යනු වේ.

**න පත්ථියොති** - පත්ථනා වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්සෙසා පත්ථනා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති න පත්ථියො; භගවාති ගාරවාධිවචනං; අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා, භජි[1] වා භගවා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා, භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා, භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා, භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා, භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤාඤාණානං[2] ඡන්නං බුද්ධධම්මානන්ති භගවා, භගවාති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවාති - න කප්පියො නූපරතො න පත්ථියොති භගවාති.

තෙනාහ භගවා:

“ස සබ්බධම්මෙසු විසෙනිභූතො
යං කිඤ්චි දිට්ඨං ව සුතං මුතං වා,
ස පන්නභාරො මුනි විප්පමුත්තො
න කප්පියො නූපරතො න පත්ථියොති භගවා”ති.

මහාවියූහසුත්තනිද්දෙසො සමත්තො

තෙරසමො.

---

1. භාගී - සීමු II. 2. අභිඤ්ඤාඤාණානං - සීමු I අභිඤ්ඤානං - මජසං.

න පත්ථියො – යනු: 'පත්ථනා' යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් අධික රාගයෙක්.. අභිධ්‍යාවෙක් ලොභඅකුශලමූලයෙක් වේ ද එය යි. යමෙක්හු විසින් තෙල ප්‍රාර්ථනාව තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සිඳින ලද්දී සන්හිඳුවන ලද්දී උපනට නුසුදුසු වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද, හෙතෙම 'න පත්ථිය'යි කියනු ලැබෙයි. භගවා යනු: ගෞරව නාමයෙකි, තව ද – නැසූ රාග ඇත් නුයි 'භගවත්' යැ, නැසූ ද්වෙෂ ඇත් නුයි 'භගවත්'යැ, නැසූ මොහ ඇත් නුයි 'භගවත්' යැ, නැසූ මාන ඇත් නුයි 'භගවත්'යැ, නැසූ දෘෂ්ටි ඇත් නුයි 'භගවත්'යැ, නැසූ කෙලෙස් කටු ඇත් නුයි 'භගවත්' යැ, නැසූ කෙලෙස් ඇත් නුයි 'භගවත්' යැ, දහම්රුවන් භාග – විභාග – ප්‍රතිවිභාග කොළේ නුයි 'භගවත්'යැ භවයන් අන්ත කෙළේ නුයි 'භගවත්'යැ වැඩූ සිල් වැඩූ සිත වැඩූ නුවණ ඇත් නුයි 'භගවත්'යැ. බුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස් කරුණට සථාන වූ විවෙකයට අනුරූප වූ වනසෙනසුන් වනයෙහි දුර–සෙනසුන් වනසකලවර සෙනසුන් ඇසුරු කළාහු නුයි භගවත්'යැ. බුදුහු සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකරට හිමි වූවාහු නුයි හෝ 'භගවත්'යැ. බුදුහු අර්ථරසයට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු . නුයි හෝ 'භගවත්'යැ. බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රාමාණ්‍යයන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ 'භගවත්'යැ. බුදුහු අෂ්ට විමොක්ෂයන්ට අෂ්ට අභිභායතනයන්ට නව අනුපූර්විහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' යැ. බුදුහු දශ සංඥාභාවනාවන්ට දශ කෘත්ස්නසමාපත්තීන්ට ආනාපානසමෘතිසමාධියට අශුභසමාපත්තියට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' යැ. බුදුහු සතර සමෘතිප්‍රස්ථානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු නුයි හෝ 'භගවත්'යැ. බුදුහු දශ තථාගතබලයන්ට සතර වෛශාරද්‍යයන්ට සතර ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්විධ බුද්ධධර්මයන්ට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' නම් වූහ. 'භගවත්' යන තෙල නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, භ්‍රාතෘහු විසින් නො කරන ලද, භගිනිය විසින් නො කරන ලද, මිත්‍රාමාත්‍යයන් විසින් නො කරන ලද, නෑසහලේනෑයන් විසින් නො කරන ලද, මහණබමුණන් විසින් නො කරන ලද, දෙවතාවන් විසින් නො කරන ලද, යම් මේ 'භගවත්' යන නාමයෙක් වේ ද, භාග්‍යවත් බුදුවරයන්ට අර්හන්මාර්ගඥානයෙහි උපන් තෙල නාමය බොධිමණ්ඩයෙහි සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභය සමඟ අර්හත්ඵලප්‍රත්‍යක්ෂකරණයෙන් හෝ සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වී නුයි 'න කප්පියො නූපරතො න පත්ථියොති භගවා යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ස සබ්බධම්මෙසු -පෙ- න පත්ථියො'ති භගවා"යි.

**තෙළෙස්වැනි මහාවියූහ සුත්‍රනිර්දේශය සමාප්තයි.**

# 14

# තුවටකසුත්තනිද්දෙසො

අථ තුවටකසුත්තනිද්දෙසො වුච්චති:

## 14 - 1

පුච්ඡාමි තං ආදිච්චබන්ධූ[1]
විවෙකං සන්තිපදඤ්ච මහෙසිං,
කථං දිස්වා නිබ්බාති භික්ඛු
අනුපාදියානො ලොකස්මිං කිඤ්චි.

**පුච්ඡාමි තං ආදිච්චබන්ධූ**ති[2] - 'පුච්ඡා'ති තිස්සො පුච්ඡා: අදිට්ඨජොතනා පුච්ඡා, දිට්ඨසංසන්දනා පුච්ඡා, විමතිච්ඡෙදනා පුච්ඡා.

කතමා **අදිට්ඨජොතනා පුච්ඡා**? පකතියා ලක්ඛණං අඤ්ඤාතං හොති අදිට්ඨං අතුලිතං අතීරිතං අවිභූතං අවිභාවිතං, තස්ස ඤාණාය දස්සනාය තුලනාය තීරණාය විභාවනාය පඤ්හං පුච්ඡති. අයං අදිට්ඨජොතනා පුච්ඡා.

කතමා **දිට්ඨසංසන්දනා පුච්ඡා**? පකතියා ලක්ඛණං ඤාතං හොති දිට්ඨං තුලිතං තීරිතං විභූතං විභාවිතං, අඤ්ඤෙහි පණ්ඩිතෙහි සද්ධිං සංසන්දනත්ථාය පඤ්හං පුච්ඡති. අයං දිට්ඨසංසන්දනා පුච්ඡා.

කතමා **විමතිච්ඡෙදනා පුච්ඡා**? පකතියා සංසයපක්ඛන්තො[3] හොති විමතිපක්ඛන්තො ද්වෙළ්හකජාතො 'එවං නු ඛො, න නු ඛො, කිං නු ඛො, කථං නු ඛො'ති සො විමතිච්ඡෙදනත්ථාය පඤ්හං පුච්ඡති. අයං විමතිච්ඡෙදනා පුච්ඡා. ඉමා තිස්සො පුච්ඡා.

අපරාපි තිස්සො පුච්ඡා: මනුස්සපුච්ඡා, අමනුස්සපුච්ඡා, නිම්මිතපුච්ඡා.

කතමා **මනුස්සපුච්ඡා**? මනුස්සා බුද්ධං භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති - භික්ඛූ පුච්ඡන්ති, භික්ඛුනියො පුච්ඡන්ති, උපාසකා පුච්ඡන්ති, උපාසිකායො පුච්ඡන්ති, රාජානො පුච්ඡන්ති, ඛත්තියා පුච්ඡන්ති, බ්‍රාහ්මණා පුච්ඡන්ති, වෙස්සා පුච්ඡන්ති, සුද්දා පුච්ඡන්ති, ගහට්ඨා පුච්ඡන්ති, පබ්බජිතා පුච්ඡන්ති. අයං මනුස්සපුච්ඡා.

කතමා **අමනුස්සපුච්ඡා**? අමනුස්සා බුද්ධං භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්ති - නාගා පුච්ඡන්ති, සුපණ්ණා පුච්ඡන්ති, යක්ඛා පුච්ඡන්ති, අසුරා පුච්ඡන්ති, ගන්ධබ්බා පුච්ඡන්ති, මහාරාජානො පුච්ඡන්ති, ඉන්දා පුච්ඡන්ති, බ්‍රහ්මානො පුච්ඡන්ති, දෙවතායො පුච්ඡන්ති. අයං අමනුස්සපුච්ඡා.

1. ආදිච්චබන්ධු - සීමු II මජසං. 2 ආදිච්චබන්ධුති - සීමු II මජසං.
3 පක්ඛන්තා - PTS.

# 14

# තුවටක සූත්‍රනිර්දේශය.

ඉක්බිති 'තුවටක' සූත්‍රනිර්දේශය කියනු ලැබේ.

## 14 - 1

ආදිත්‍යබන්ධු වූ මහර්ෂි වූ ඔබ පුළුවුස්මි: යොගාවචර මහණ තෙම (කායාදි) ත්‍රිවිධ විවේකය ද (නිවනට කාරණවූ) බොධිපාක්ෂිකධර්මය ද කවර කාරණයකින් දැක (කායාදි) ලොකයෙහි (රූපාදි) කිසි ධර්මයක් උපාදානය නො කෙරෙමින් (රාගාදි කෙලෙසුන්) සංසිඳුවන්නේ ද ?

**පුච්ඡාමි තං ආදිච්චබන්ධුං** - 'පුච්ඡා'යනු පෘච්ඡා තුනෙකි: අදිට්ඨජෝතනා පුච්ඡා යැ, දිට්ඨසංසන්දනා පුච්ඡා යැ, විමතිච්ඡේදනා පුච්ඡා යි.

**අදිට්ඨජෝතනා පුච්ඡා** කවර යත්: ධර්මයන්ගේ තත්වලක්ෂණය පියවින් නො දන්නා ලද නො දක්නා ලද තුලනය නො කරන ලද තීරණය නො කරන ලද ප්‍රකට නො කරන ලද නුවණින් නො වඩන ලද වේ ද, ඒ ධර්මයාගේ ලක්ෂණය දැනීමට තුලනයට තීරණයට ප්‍රකට කිරීමට ප්‍රශ්න විචාරයි. මෝ අදිට්ඨජෝතනා පුච්ඡා යැ.

**දිට්ඨසංසන්දනා පුච්ඡා** කවර යත්: පියවින් තත්වලක්ෂණය දන්නා ලද දක්නා ලද තුලනය කරන ලද තීරණය කරන ලද ප්‍රකට කරන ලද විභාවන කරන ලද වේ ද, අන්‍ය පණ්ඩිතයන් හා සසඳලීම පිණිස ප්‍රශ්න විචාරයි. මෝ දිට්ඨසංසන්දනා පුච්ඡායැ.

**විමතිච්ඡේදනාපුච්ඡා** කවර යත්: 'මෙසේ දෝ හෝ නො වේ දෝ හෝ කිමෙක් දෝ හෝ කෙසේ දෝ හෝ'යි පියවින් සැකයට පැමිණියේ විමතියට පැමිණියේ හටගත් සැක ඇත්තේ වේ ද, හෙතෙම සැක සිඳීම සඳහා ප්‍රශ්න විචාරයි. මෝ 'විමතිච්ඡේදනා පුච්ඡා' යැ; මේ තුන් ප්‍රශ්නයෝ යි.

අන්‍යවූ ද ප්‍රශ්න තුනෙක් වෙයි: මනුෂ්‍යපෘච්ඡා යැ, අමනුෂ්‍යපෘච්ඡා යැ නිර්මිතපෘච්ඡා යැයි.

**මනුෂ්‍යපුච්ඡා** කවර යත්: මනුෂ්‍යයෝ භගවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති- භික්ෂූහු විචාරති, භික්ෂුණීහු විචාරති, උපාසකයෝ විචාරති, උපාසිකාවෝ විචාරති, රජවරු විචාරති, ක්ෂත්‍රියයෝ විචාරති, බමුණෝ විචාරති, වෛශ්‍යයෝ විචාරති, ශූද්‍රයෝ විචාරති, ගැහැවියෝ විචාරති, පැවිද්දෝ විචාරත්; මෝ මනුෂ්‍යපෘච්ඡා යැ.

**අමනුෂ්‍යපුච්ඡා** කවර යත්: අමනුෂ්‍යයෝ භාග්‍යවත් බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති- නාගයෝ විචාරයි, සුපර්ණයෝ විචාරති, යක්ෂයෝ විචාරයි, අසුරයෝ විචාරති, ගන්ධර්වයෝ විචාරයි, මහාරජහු විචාරයි, ඉන්ද්‍රයෝ විචාරයි, බ්‍රහ්මයෝ විචාරති, දෙවතාවෝ විචාරත්. මෝ අමනුෂ්‍ය-පෘච්ඡා යැ.

කතමා **නිම්මිතපුච්ඡා**? යං භගවා රූපං අභිනිම්මිනාති මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියං, තං සො නිම්මිතො බුද්ධං භගවන්තං උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡති. භගවා **විස්සජ්ජෙති**. අයං නිම්මිතපුච්ඡා. ඉමා තිස්සො පුච්ඡා.

අපරාපි තිස්සො පුච්ඡා: අත්තත්ථපුච්ඡා, පරත්ථපුච්ඡා, උභයත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: දිට්ඨධම්මිකත්ථපුච්ඡා, සම්පරායිකත්ථපුච්ඡා, පරමත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අනවජ්ජත්ථපුච්ඡා, නික්කිලෙසත්ථපුච්ඡා, වොදානත්ථපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අතීතපුච්ඡා, අනාගතපුච්ඡා, පච්චුප්පන්නපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: අජ්ඣත්තපුච්ඡා, බහිද්ධාපුච්ඡා, අජ්ඣත්තබහිද්ධාපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: කුසලපුච්ඡා, අකුසලපුච්ඡා, අබ්‍යාකතපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: ඛන්ධපුච්ඡා, ධාතුපුච්ඡා, ආයතනපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: සතිපට්ඨානපුච්ඡා, සම්මප්පධානපුච්ඡා, ඉද්ධිපාදපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: ඉන්ද්‍රියපුච්ඡා, බලපුච්ඡා, බොජ්ඣඞ්ගපුච්ඡා. අපරාපි තිස්සො පුච්ඡා: මග්ගපුච්ඡා, ඵලපුච්ඡා, නිබ්බානපුච්ඡා.

**පුච්ඡාමි තන්ති** – පුච්ඡාමි තං, යාචාමි තං; අජ්ඣෙසාමි තං, පසාදෙමි තං; කථයස්සු මෙති- පුච්ඡාමි තං; **ආදිච්චබන්ධූති** ආදිච්චො වුච්චති සුරියො; සුරියො ගොතමො ගොත්තෙන; භගවාපි ගොතමො ගොත්තෙන. භගවා සුරියස්ස ගොත්තඤාතකො ගොත්තබන්ධු, තස්මා බුද්ධො ආදිච්චබන්ධූති-පුච්ඡාමි තං ආදිච්චබන්ධුං.[1]

**විවෙකං සන්තිපදඤ්ච මහෙසින්ති** – 'විවෙකො'ති තයො විවෙකා: කායවිවෙකො, චිත්තවිවෙකො, උපධිවිවෙකො.

කතමො **කායවිවෙකො**? ඉධ භික්ඛු විවිත්තං සෙනාසනං භජති, අරඤ්ඤං රුක්ඛමූලං පබ්බතං කන්දරං ගිරිගුහං සුසානං වනපත්ථං අබ්භොකාසං පලාලපුඤ්ජං. කායෙන ච විවිත්තො විහරති, සො එකො ගච්ඡති. එකො තිට්ඨති. එකො නිසීදති. එකො සෙය්‍යං කප්පෙති. එකො ගාමං පිණ්ඩාය පවිසති. එකො පටික්කමති. එකො රහො නිසීදති. එකො චඞ්කමං අධිට්ඨාති. එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති' අයං කායවිවෙකො.

1. ආදිච්චබන්ධු - සිමු. II. මජසං.

**නිර්මිතපෘච්ඡා** කවර යත්: බුදුහු මනෝමය වූ සියලු අඟපසඟ ඇති අවිකල ඉඳුරන් ඇති යම් බුදුරුවක් මවත් ද, ඒ නිර්මිත බුදුහු භාග්‍යවත් වූ ඒ බුදුන් කරා එළඹ පැන පුළුවුස්ති, බුදුහු විසඳන සේක. මේ නිර්මිතපෘච්ඡා යැ. මොහු තුන් පෘච්ඡා යි.

අනෙකුදු ප්‍රශ්න තුනෙක් වෙයි: ආත්මාර්ථපෘච්ඡා යැ, පරාර්ථපෘච්ඡා යැ, උභයාර්ථපෘච්ඡා යැයි. අනෙකුදු ප්‍රශ්න තුනෙකි: දෘෂ්ටධාර්මිකාර්ථපෘච්ඡා යැ, සාම්පරායිකාර්ථපෘච්ඡා යැ, පරමාර්ථපෘච්ඡා යැයි. අනෙකුදු ප්‍රශ්න තුනෙකි: අනවද්‍යාර්ථපෘච්ඡා යැ, නිෂ්ක්ලේශාර්ථපෘච්ඡා යැ, ව්‍යවදානාර්ථපෘච්ඡා යැයි අනෙකුදු ප්‍රශ්න තුනෙක් වෙයි: අතීතපෘච්ඡා යැ, අනාගතපෘච්ඡා යැ, වර්තමානපෘච්ඡා යැයි. අනෙකුදු තුන් ප්‍රශ්නයෙකි: අධ්‍යාත්මපෘච්ඡා යැ, බාහ්‍යපෘච්ඡා යැ, අධ්‍යාත්ම බාහ්‍යපෘච්ඡා යැයි. අන්‍ය වූ ද ප්‍රශ්න තුනෙකි: කුශලපෘච්ඡා යැ, අකුශලපෘච්ඡා යැ, අව්‍යාකෘතපෘච්ඡා යැයි. අන්‍යවූ ද ප්‍රශ්න තුනෙකි: ස්කන්ධපෘච්ඡා යැ, ධාතුපෘච්ඡා යැ, ආයතනපෘච්ඡා යැයි. අන්‍යවූ ද තුන් ප්‍රශ්නයෙකි. සතිපට්ඨානපෘච්ඡා යැ, සම්‍යක්ප්‍රධානපෘච්ඡා යැ ඍද්ධිපාදපෘච්ඡා යැයි. අන්‍ය වූ ද තුන් ප්‍රශ්නයෙකි: ඉන්ද්‍රියපෘච්ඡා යැ, බලපෘච්ඡා යැ, බොධ්‍යඞ්ගපෘච්ඡා යැයි. අන්‍ය වූ ද තුන් ප්‍රශ්නයෙකි: මාර්ගපෘච්ඡා යැ, ඵලපෘච්ඡා යැ, නිර්වාණපෘච්ඡා යැයි.

**පුච්ඡාමි තං** – තුඹ පුළුවුස්මි, තුඹ අයැදිමි, තුඹ ආරාධනය කෙරෙමි, තුඹ පහදවමි, මට වදාළ මැනවැයි. 'පුච්ඡාමි තං' යනු වේ. **ආදිච්චබන්ධුං** 'ආදිච්ච'යි හිරු කියනු ලැබෙයි, හිරු ශ්‍රොත්‍රයෙන් ගෞතම යැ. භගවත්හු ද ශ්‍රොත්‍රයෙන් ගෞතම යැ. බුදුහු හිරුට ශ්‍රොත්‍රයෙන් ඥාතීහ, ගොත්‍රයෙන් බන්ධු වූහ. එහෙයින් බුදුහු ආදිත්‍යබන්ධු වූහ'යි 'පුච්ඡාමි තං ආදිච්චබන්ධුං' යනු වේ.

**විවෙකං සන්තිපදං ච මහෙසිං** – 'විවේකො' යනු: විවේක තුනෙකි: කාය විවේක යැ, චිත්තවිවේක යැ, උපධිවිවේක යැයි.

කායවිවේකය කවරේ ද යත්: මේ ශාසනයෙහි මහණ ආරණ්‍ය යැ වෘක්ෂමූල යැ පර්වත යැ කන්දර යැ ගිරිගුහා යැ ශමශාන යැ වනප්‍රස්ථ යැ අභ්‍යවකාශ යැ පලාලපුඤ්ජ යැ යන විවේක සෙනාසනයක් ඇසුරු කෙරෙයි, කයින්ද විවික්ත වැ වෙසෙයි. හෙතෙම එකලා වැ යෙයි, එකලා වැ සිටියි, එකලා වැ හිඳී, එකලා වැ හොවී, එකලා වැ ගමට පිඬුසිඟා යයි, එකලා වැ පෙරළා එයි, එකලා වැ රහසැ හිඳී, එකලා වැ සක්මන් කෙරෙයි, එකලා වැ හැසිරෙයි වෙසෙයි ඉරියව් පවත්වයි වැටෙයි රැකෙයි යැපෙයි යාපනය වේ. මේ කායවිවේක යැ.

**කතමො චිත්තවිවෙකො?** පඨමං ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං විවිත්තං හොති. දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරෙහි චිත්තං විවිත්තං හොති. තතියං ඣානං සමාපන්නස්ස පීතියා චිත්තං විවිත්තං හොති. චතුත්ථං ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං විවිත්තං හොති. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං විවිත්තං හොති. සොතාපන්නස්ස සක්කායදිට්ඨියා විචිකිච්ඡාය සීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. සකදාගාමිස්ස[1] ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා, පටිඝසඤ්ඤොජනා, ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා, තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අනාගාමිස්ස අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා, අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා, තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං විවිත්තං හොති. අරහතො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා, තදෙකට්ඨෙහි ච කිලෙසෙහි, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි චිත්තං විවිත්තං හොති. අයං චිත්තවිවෙකො.

කතමො **උපධිවිවෙකො?** උපධි වුච්චන්ති කිලෙසා ච ඛන්ධා ච අභිසඞ්ඛාරා ච; උපධිවිවෙකො වුච්චති අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. අයං උපධිවිවෙකො.

කායවිවෙකො ච වූපකට්ඨ[2]කායානං නෙක්ඛම්මාභිරතානං, චිත්තවිවෙකො ච පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං, උපධිවිවෙකො ච නිරූපධීනං පුග්ගලානං විසඞ්ඛාරගතානං.

**සන්තීති** එකෙන ආකාරෙන සන්තිපි සන්තිපදම්පි තං යෙව අමතං නිබ්බානං, යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. වුත්තං හෙතං භගවතා: "සන්තමෙතං පදං පණීතමෙතං පදං, යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බාන"න්ති.[a] අථවා අපරෙන ආකාරෙන යෙ ධම්මා සන්තාධිගමාය සන්තිඵුසනාය සන්තිසච්ඡිකිරියාය සංවත්තන්ති සෙය්‍යථීදං: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො. ඉමෙ වුච්චන්ති සන්තිපදං තාණපදං ලෙණපදං සරණපදං අභයපදං අච්චුතපදං අමතපදං නිබ්බානපදං.

1. සකදාගාමිකස්ස - සීමු. II. 2. වචකාධ - ස.

a. මජ්ඣිමනිකාය - අලගද්දසුත්ත.

**චිත්තවිවේකය** කවරැ යත්: පළමුවන ධ්‍යානට සමවත්හුගේ සිත නීවරණයන්ගෙන් වෙන් වෙයි, දෙවැනි ධ්‍යානට සමවත්හුගේ සිත විතර්කවිචාරයන්ගෙන් වෙන් වෙයි, තෙවැනි ධ්‍යානට සමවත්හුගේ සිත ප්‍රීතියෙන් වෙන් වෙයි, සිවුවැනි ධ්‍යානට සමවත්හුගේ සිත සුවදුක් දෙකින් වෙන් වෙයි, ආකාසානඤ්චායතනයට සමවත්හුගේ සිත රූපසංඥාවෙන් ප්‍රතිඝසංඥාවෙන් නානාත්මසංඥාවෙන් වෙන් වෙයි, විඤ්ඤාණඤ්චායතනයට සමවත්හුගේ සිත ආකාසානඤ්චායතන සංඥාවෙන් වෙන් වෙයි, ආකිඤ්චඤ්ඤායතනයට සමවත්හුගේ සිත විඤ්ඤාණඤ්චායතනසංඥාවෙන් වෙන් වෙයි, නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත්හුගේ සිත ආකිඤ්චඤ්ඤායතනසංඥාවෙන් වෙන් වෙයි, සෝවාන්හුගේ සිත සත්කායදෘෂ්ටියෙන් විචිකිත්සායෙන් ශීලව්‍රතපරාමර්ශයෙන් දෘෂ්ට්‍යනුශයෙන් විචිකිත්සානුශයෙන් ඔවුන් හා එක්වැ සිටි කෙලෙසුන්ගෙන් ද වෙන් වෙයි. සකෘදාගැමිහුගේ සිත ඖදාරික වූ කාමරාගසංයෝජනයෙන් ද, ප්‍රතිඝසංයෝජනයෙන් ද, ඖදාරික වූ කාමරාගානුශයෙන් ද, ප්‍රතිඝානුශයෙන් ද, තදෙකස්ථ කෙලශයන්ගෙන් ද වෙන් වෙයි. අනාගැමිහුගේ සිත අණුසහගත වූ කාමරාගසංයෝජනයෙන් හා ප්‍රතිඝසංයෝජනයෙන් ද, අණුසහගත වූ කාමරාගානුශයෙන් හා ප්‍රතිඝානුශයෙන් ද, තදෙකස්ථ කෙලශයන්ගෙන් ද වෙන් වෙයි. රහත්හුගේ සිත රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යාවෙන් ද, මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් ද, තදෙකස්ථ කෙලශයන්ගෙන් ද බාහ්‍ය වූ සියලු සංස්කාරනිමිත්තයන්ගෙන් ද වෙන් වෙයි. මේ චිත්තවිවේක යැ.

**උපධිවිවේකය** කවරැ යත්: කෙලශයෝ ද ස්කන්ධයෝ ද අභිසංස්කාරයෝ ද උපධි යි කියනු ලැබෙයි. සියලු සංස්කාරයන් සන්හිඳුණු සියලු උපධි දුරලූ තෘෂ්ණා ක්ෂය වූ කෙලෙස්රජස් නො ඇලුණු දුක නිරුද්ධ වූ තෘෂ්ණාවෙන් නික්මුණු ඒ අමාමහ නිවන උපධිවිවේක යයි කියනු ලැබේ. මේ උපධි විවෙක යයි.

ගණසඞ්ගණිකායෙන් වෙන් වූ කය ඇති (ප්‍රථමධ්‍යානාදි) නිෂ්කාම්‍යයෙහි ඇලුණවුන්ට කායවිවේකය ද, පිරිසුදු සිත් ඇති පරමපාරිශුද්ධියට පැමිණියවුන්ට චිත්තවිවේකය ද, විසංඛාරයට (-අරමුණු කිරීම් වශයෙන් නිවනට) පැමිණි උපධි රහිත පුද්ගලයන්ට උපධිවිවේකය ද වේ.

**සන්ති** - යනු: එක් අයුරෙකින් ශාන්තිය ද ශාන්තිපදය ද එ මැ අමාමහ නිවන යැ, සියලු සංස්කාරයන් සන්හිඳුණු සියලු උපධීන් දුරුවැ සිටි තෘෂ්ණාක්ෂය වූ විරාග වූ දුඃඛනිරොධ වූ ඒ නිර්වාණය යි. මේ වදාරන ලද මැය භාග්‍යවතුන් විසින්: යම් මේ සර්වසංස්කාරයන්ගේ ශමථයෙක් සර්වොපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාක්ෂයයෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද, එතෙල ශාන්තපද යැ, එතෙල ප්‍රණීතපද යැයි. නොහොත් අන්‍ය වූ ආකාරයෙකින් යම් ධර්ම කෙනෙක් ශාන්ති (-නිර්වාණ) ප්‍රතිලාභය පිණිස ශාන්තිය (ඥානයෙන්) ස්පර්ශ කිරීම පිණිස ශාන්තිය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස පවත්නාහු ද, ඒ කවරහු ද යත්: සතර සතිපට්ඨානයෝ යැ, සතර සම්‍යක්ප්‍රධානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ පඤ්චෙන්ද්‍රියයෝ යැ පඤ්ච බලයෝ යැ සප්තබොධ්‍යඞ්ගයෝ යැ ආර්‍ය අෂ්ටාඞ්ගිකමාර්ග යැ යන මොහු යි. මේ ධර්මයෝ ශාන්තිපද යැ ත්‍රාණපද යැ ලෙනපද යැ සරණපද යැ අභයපද යැ අච්‍යුතපද යැ අමෘතපද යැ නිර්වාණපද යැයි කියනු ලැබෙත්.

**මහෙසීති**, මහෙසී භගවා; මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති මහෙසී. මහන්තං සමාධික්ඛන්ධං - මහන්තං පඤ්ඤාක්ඛන්ධං - මහන්තං විමුත්තික්ඛන්ධං - මහන්තං විමුත්තිඤාණදස්සනක්ඛන්ධං එසි ගවෙසි පරියෙසීති මහෙසී. මහතො තමොකායස්ස පදාලනං, මහතො විපල්ලාසස්ස භෙදං, මහතො තණ්හාසල්ලස්ස අබ්බූහනං, මහතො දිට්ඨිසඞ්ඝාටස්ස විනිවෙඨනං, මහතො මානධජස්ස පපාතනං[1] මහතො අභිසඞ්ඛාරස්ස වූපසමනං, මහතො, ඔඝස්ස නිත්ථරණං,[2] මහතො භාරස්ස නික්ඛෙපනං, මහතො සංසාරවට්ටස්ස උපච්ඡෙදං, මහතො සන්තාපස්ස නිබ්බාපනං, මහතො පරිළාහස්ස පටිප්පස්සද්ධිං, මහතො ධම්මධජස්ස උස්සාපනං එසි ගවෙසි පරියෙසීති මහෙසී මහන්තෙ සතිපට්ඨානෙ - මහන්තෙ සම්මප්පධානෙ - මහන්තෙ ඉද්ධිපාදෙ - මහන්තානි ඉන්ද්‍රියානි - මහන්තානි බලානි - මහන්තෙ බොජ්ඣඞ්ගෙ මහන්තං අරියං අට්ඨඞ්ගිකං මග්ගං - මහන්තං පරමත්ථං අමතං නිබ්බානං එසි ගවෙසි පරියෙසීති මහෙසී. මහෙසක්ඛෙහි වා සත්තෙහි එසිතො ගවෙසිතො පරියෙසිතො ‘කහං බුද්ධො, කහං භගවා, කහං දෙවදෙවො’ කහං නරාසභො’ති මහෙසීති - විවෙකං සන්තිපදඤ්ච මහෙසිං.

**කථං දිස්වා නිබ්බාති භික්ඛූති** - කථං දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා අත්තනො රාගං නිබ්බාපෙති? දොසං නිබ්බාපෙති? මොහං නිබ්බාපෙති? කොධං, උපනාහං මක්ඛං, පළාසං, ඉස්සං, මච්ඡරියං, මායං, සාඨෙය්‍යං, ථම්භං, සාරම්භං, මානං, අතිමානං, මදං, පමාදං, සබ්බෙ කිලෙසෙ, සබ්බෙ දුච්චරිතෙ, සබ්බෙ දරථෙ, සබ්බෙ පරිළාහෙ, සබ්බෙ සන්තාපෙ, සබ්බාකුසලාභිසඞ්ඛාරෙ නිබ්බාපෙති සමෙති උපසමෙති වූපසමෙති පටිප්පස්සම්භෙති? භික්ඛූති පුථුජ්ජනකල්‍යාණකො වා භික්ඛු සෙඛො වා භික්ඛූති - කථං දිස්වා නිබ්බාති භික්ඛු.

**අනුපාදියානො ලොකස්මිං කිඤ්චීති** - චතූහි උපාදානෙහි අනුපාදියමානො අගණ්හමානො අපරාමසමානො අනභිනිවිසමානො; **ලොකස්මින්ති** අපායලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ; **කිඤ්චීති** කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතන්ති - අනුපාදියානො ලොකස්මිං කිඤ්චි.

තෙනාහ භගවා:

“පුච්ඡාමි තං ආදිච්චබන්ධුං
විවෙකං සන්තිපදඤ්ච මහෙසිං,
කථං දිස්වා නිබ්බාති භික්ඛු
අනුපාදියානො ලොකස්මිං කිඤ්චී”ති.

**14 - 2**

මූලං පපඤ්චසඞ්ඛායාති භගවා
මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ,
යා කාචි තණ්හා අජ්ඣත්තං
තාසං විනයා සදා සතො සික්ඛෙ.

1. පවාහනං - සයා.　　2. නිත්ථරණං - සීමු. II, PTS.

**මහෙසි** - යනු: බුදුහු මහර්ෂි යැ, මහත් වූ ශීලස්කන්ධය එෂණ ගවේෂණ පර්‍යෙෂණ කෙළේ නුසි මහර්ෂි යැ: මහත් වූ සමාධිස්කන්ධය මහත් වූ ප්‍රඥාස්කන්ධය - මහත් වූ විමුක්තිස්කන්ධය - මහත් වූ විමුක්ති-ඥානදර්ශනස්කන්ධය එෂණ ගවේෂණ පර්‍යෙෂණ කෙළේ නුසි මහර්ෂි යැ, මහත් වූ තමස්කායයා ගේ ප්‍රදලනය, මහත් වූ විපර්‍යාසයා ගේ බිඳීම, මහත් වූ තෘෂ්ණාශල්‍යය ඉදිරීම, මහත් වූ දෘෂ්ටිසඞ්ඝාටය ලෙහීම, මහත් වූ මානධ්වජය හෙළීම, මහත් වූ අභිසංස්කාරය සන්හිඳුවීම, මහත් වූ ඔඝය තරණය කිරී , මහත් වූ (පස්කඳ) බර බහා තැබීම, මහත් වූ සසරවට සිඳීම, මහත් වූ (කෙලෙස්) තැවුලිය නිවීම, මහත් වූ (කෙලශ) පරිදාහය සන්හිඳුවීම, මහත් වූ ධර්මධ්වජය එසැවීම එෂණ ගවේෂණ පර්‍යෙෂණ කෙළේ නුසි මහර්ෂි යැ. මහත් වූ සතිපට්ඨානයන් - මහත් සම්‍යක්ප්‍රධාන-යන් - මහත් ඍද්ධිපාදයන් - මහත් ඉන්ද්‍රියයන් - මහත් බලයන් - මහත් බොධ්‍යඞ්ගයන් - මහත් වූ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය - මහත් වූ පරමාර්ථ වූ අමාමහනිවන එෂණ ගවේෂණ පර්‍යෙෂණ කෙළේ නුසි මහර්ෂි යැ: නොහොත් මහෙශාඛ්‍ය වූ සත්ත්වයන් විසින් 'කොහි යැ බුදුහු, කොහි යැ භාග්‍යවත්හු, කොහි යැ දෙවියනට දෙවි වූවෝ, කොහි යැ නරශ්‍රෙෂ්ඨයෝ ය'යි එෂිත ගවෙෂිත පර්‍යෙෂිත නුසි මහර්ෂි නම් වෙත් යයි 'විවේකං සන්තිපදඤ්ච මහෙසිං' යනු වේ.

**කථං දිස්වා නිබ්බාති භික්ඛු** - කිසෙසින් දැක බලා තුලනය කොට තීරණය කොට විමසා විභූත කොට තමා ගේ රාගය නිවා ද? ද්වෙෂය නිවා ද? මොහය නිවා ද? ක්‍රොධය - උපනාහය - මක්ඛය - පලාසය-ඊර්ෂ්‍යාව මාත්සර්‍යය - මායාව - ශාඨ්‍යය - ස්තම්භය - සාරම්භය - මානය - අතිමානය මදය - ප්‍රමාදය - සියලු කෙලෙසුන් සියලු දුශ්චරිතයන් - සියලු දරථයන්-සියලු පරිදාහයන් - සියලු සන්තාපයන් - සියලු අකුශලාභිසංස්කාරයන් නිවා ද? ශමනය උපශමනය ව්‍යුපශමනය කෙරේ ද? සන්හිඳුවා ද? **භික්ඛු** යනු: පෘථග්ජනකල්‍යාණ භික්‍ෂු හෝ ශෛක්‍ෂ භික්‍ෂු හෝ නුසි 'කථං දිස්වා නිබ්බාති භික්ඛු' යනු වේ.

**අනුපාදියානො ලොකස්මිං කිඤ්චි** - සතර උපාදානයන්ගෙන් උපාදානය නො කරනුයේ නො ගන්නේ නො දැඩගන්නේ නො පිවිසෙනුයේ; **ලොකස්මිං** යනු: අපායලොකයෙහි මිනිස්ලොවැ දෙව්ලොවැ ස්කන්ධලොක-යෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි; **කිඤ්චි** යනු: කිසි රූපගතයක් වෙදනාගතයක් සංඥාගතයක් සංස්කාරගතයක් විඥානගතයක් නුසි 'අනුපාදියානො ලොකස්මිං කිඤ්චි' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

**"පුච්ඡාමි තං -පෙ- අනුපාදියානො ලොකස්මිං කිඤ්චී"** යි.

**14 - 2**

බුදුහු මෙසේ වදාළ සේක: 'ප්‍රපඤ්ච සඞ්ඛ්‍යාත තෘෂ්ණාදෘෂ්ටීහුගේ (අවිද්‍යාදි කෙලශ) මූලය ද මම වෙමි' පැවැති මානය ද නුවණින් සියල්ල වළහන්නේ යැ, අධ්‍යාත්මයෙහි යම් කිසි තෘෂ්ණාවක් උපදනේ ද ඔවුන්ගේ ප්‍රහාණය පිණිස හැමකල්හි (එළඹ සිටි) සිහි ඇති වැ හික්මෙන්නේ යි.

**මූලං පපඤ්චසඞ්ඛායාති** භගවා **මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙති**- පපඤ්චායෙව පපඤ්චසඞ්ඛා; තණ්හා පපඤ්චසඞ්ඛා, දිට්ඨි පපඤ්චසඞ්ඛා, කතමං තණ්හාපපඤ්චස්ස මූලං? අවිජ්ජා මූලං, අයොනිසො මනසිකාරො මූලං අස්මිමානො මූලං, අහිරිකං මූලං, අනොත්තප්පං මූලං, උද්ධච්චං මූලං, ඉදං තණ්හාපපඤ්චස්ස මූලං, කතමං දිට්ඨිපපඤ්චස්ස මූලං? අවිජ්ජා මූලං අයොනිසො මනසිකාරො මූලං. අස්මිමානො මූලං, අහිරිකං මූලං, අනොත්තප්පං මූලං, උද්ධච්චං මූලං, ඉදං දිට්ඨිපපඤ්චස්ස මූලං.

**භගවා**ති ගාරවාධිවචනං. අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායොති භගවා, භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා. භජි[1] වා භගවා අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා; භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා. භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස, අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා, භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානස්සතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා, භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා. භගවාති නෙතං නාමං මාතරා කතං; න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති - මූලං පපඤ්චසඞ්ඛායාති භගවා.

**මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙති** - 'මන්තා' වුච්චති පඤ්ඤා, යා පඤ්ඤා පජානනා -පෙ- අමොහො ධම්මවිචයො සම්මාදිට්ඨි; අස්මීති රූපෙ අස්මීති මානො, අස්මීති ඡන්දො, අස්මීති අනුසයො; වෙදනාය - සඤ්ඤාය - සඞ්ඛාරෙසු - විඤ්ඤාණෙ අස්මීති මානො, අස්මීති ඡන්දො, අස්මීති අනුසයොති - මූලං පපඤ්චසඞ්ඛායාති භගවා මන්තා අස්මීති.

---

1. භාගී සීමු. II.

**මූලං පපඤ්චසඞ්ඛායාති භගවා මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ-** ප්‍රපඤ්චයෝ මැ 'පපඤ්චසඞ්ඛා' නම්, තෘෂ්ණාව 'පපඤ්චසඞ්ඛා' යැ, දෘෂ්ටිය පපඤ්චසඞ්ඛා යැ, තෘෂ්ණාප්‍රපඤ්චයා ගේ මූලය කවරැ යත් ? අවිද්‍යාව මූල යැ, අයොනිසො මනසිකාරය මූල යැ, අස්මිමානය මූල යැ, අහිරිකය මූල යැ, අනොත්තප්පය මූල යැ, උද්ධච්චය මූල යැ; මේ තෘෂ්ණාප්‍රපඤ්චයාගේ මූලය යි. දෘෂ්ටිප්‍රපඤ්චයාගේ මූලය කවරැ යත් ? අවිද්‍යාව මූල යැ, අයොනිසො මනසිකාරය මූල යැ, අස්මිමානය මූල යැ, අහිරිකය මූල යැ, අනොත්තප්පය මූල යැ, උද්ධච්චය මූල යැ, මේ දෘෂ්ටිප්‍රපඤ්චයා ගේ මූලය යි.

**භගවා** යනු: ගෞරව නාමයෙකි; තවද බිඳහළ රාග ඇත් හුයි භගවත් යැ, නැසූ ද්වේෂ ඇත් හුයි - නැසූ මෝහ ඇත් හුයි - නැසූ මාන ඇත් හුයි- නැසූ දෘෂ්ටි ඇත් හුයි - නැසූ කෙළෙස්කටු ඇත් හුයි - නැසූ කෙලෙස් ඇත් හුයි භගවත් යැ. දහම්රුවන් භාග - විභාග - ප්‍රතිවිභාග කෙළේ හුයි භගවත් යැ භවයන් අන්ත කෙළේ හුයි - භාවිතකාය හුයි - භාවිතශීල- භාවිතචිත්ත- භාවිතප්‍රඥ ඇත් හුයි භගවත් යැ: නොහොත් බුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මනුෂ්‍යයන්ගේ රාහස්‍යයට කාරණ වූ විවේකයට යෝග්‍ය වූ වනසෙනසුන් වෙනෙහි දුර සෙනසුන් වනකෙළවර සෙනසුන් භජනය කළාහු හුයි භගවත් යැ, බුදුහු චීවර - පිණ්ඩපාත- සෙනාසන - ගිලානපච්චයභෙසජ්ජ- පරික්ඛාරයනට හිමි වූවාහු හුයි භගවත් යැ, බුදුහු අර්ථරසයට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු හුයි භගවත් යැ, බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රාමාණ්‍යයන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු හුයි හෝ භගවත් යැ, බුදුහු අෂ්ට- විමොක්ෂයන්ට අෂ්ට අභිභායතනයන්ට නව අනුරූපවිහාරසමාපත්තීන්ට හිමි වූවාහු හුයි - බුදුහු දශ සංඥාභාවනාවන්ට දසකසිණසමාපත්තීන්ට ආනාපානසතිසමාධියට අසුභසමාපත්තියට හිමි වූවාහු හුයි - බුදුහු සතර සතිපට්ඨානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චන්ද්‍රියයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික- මාර්ගයට හිමි වූවාහු හුයි - බුදුහු දස තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍ය- යන්ට සතර ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්බුද්ධධර්මයන්ට හිමි වූවාහු හුයි හෝ 'භගවත්' නම්. තෙල 'භගවත්' යන නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් - බෑයකු විසින්-බූනක විසින්- සගයහළුවන් විසින් - නෑසහලේනෑයන් විසින් - මහණබමුණන් විසින් - දෙවතාවන් විසින් නො කරන ලද, මේ 'භගවත්' යන තෙල නාමය භාග්‍යවත් බුදුවරයන්ට අර්හත්මාර්ගයාගේ අන්තයෙහි බෝමුල දී සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභය සමග රහත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් හෝ සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වී හුයි - 'මූලං පපඤ්ච- සඞ්ඛායා ති භගවා' යනු වේ.

**මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ** - 'මන්තා'යි ප්‍රඥාව කියනු ලබයි; යම් ප්‍රඥාවක්...අමොහයෙක් ධර්මවිචයයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එයයි. අස්මි යනු රූපයෙහි මම් වෙමි යන මාන ය මම් වෙමි යන ඡන්දය, මම් වෙමි යන අනුසය, වෙදනාවෙහි -සංඥාවෙහි -සංස්කාරයන්හි - විඥානයෙහි අස්මි යන මානය අස්මි යන ඡන්දය, අස්මි යන අනුසය හුයි 'මූලං පපඤ්ච- සඞ්ඛායාති භගවා මන්තා අස්මීති' යනු වේ.

**සබ්බමුපරුන්ධෙති** - පපඤ්චසඞ්ඛාය මූලඤ්ච අස්මිමානඤ්ච මන්තාය සබ්බං රුන්ධෙය්‍ය උපරුන්ධෙය්‍ය නිරොධෙය්‍ය වූපසමෙය්‍ය අත්ථඞ්ගමෙය්‍ය පටිප්පස්සම්භෙය්‍යාති - මූලං පපඤ්චසඞ්ඛායාති භගවා මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ.

**යා කාචි තණ්හා අජ්ඣත්තන්ති** - 'යා කාචී'ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියන[1]වචනමෙතං යා කාචීති. **තණ්හාති** රූපතණ්හා -පෙ- ධම්මතණ්හා; **අජ්ඣත්තන්ති** අජ්ඣත්තසමුට්ඨානා වා සා තණ්හාති අජ්ඣත්තං; අථවා අජ්ඣත්තං වුච්චති චිත්තං, යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු; [ක] චිත්තෙන සා තණ්හා සහගතා සහජාතා සංසට්ඨා සම්පයුත්තා එකුප්පාදා එකනිරොධා එකවත්ථුකා එකාරම්මණාතිපි අජ්ඣත්තන්ති - යා කාචි තණ්හා අජ්ඣත්තං.

**තාසං විනයා සදා සතො සික්ඛෙති** - 'සදා'ති සදා සබ්බදා සබ්බකාලං නිච්චකාලං ධුවකාලං සතතං සමිතං අබ්බොකිණ්ණං පොඞ්ඛානුපොඞ්ඛං උදකොම්මිකජාතං[2] අවීචිසන්තතිසහිතං ඵුස්සිතං[3] පුරෙභත්තං පච්ඡාභත්තං, පුරිමං යාමං මජ්ඣිමං යාමං පච්ඡිමං යාමං, කාළෙ ජුණ්හෙ, වස්සෙ හෙමන්තෙ ගිම්හෙ, පුරිමෙ වයොඛන්ධෙ මජ්ඣිමෙ වයොඛන්ධෙ පච්ඡිමෙ වයොඛන්ධෙ; **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; අපරෙහිපි චතූහි කාරණෙහි සතො; අසතිපරිවජ්ජනාය සතො; සතිකරණීයානං ධම්මානං කතත්තා සතො; සතිපටිපක්ඛානං ධම්මානං හතත්තා සතො; සතිනිමිත්තානං ධම්මානං අසම්මුට්ඨත්තා සතො; අපරෙහිපි චතූහි කාරණෙහි සතො: සතියා සමන්නාගතත්තා සතො; සතියා වසිතත්තා සතො; සතියා පාගුඤ්ඤතාය සතො; සතියා අපච්චොරොහණතාය සතො. අපරෙහි චතූහි කාරණෙහි සතො: සතත්තා[4] සතො, සමිතත්තා සතො, සන්තත්තා සතො, සන්තධම්මසමන්නාගතත්තා සතො, බුද්ධානුස්සතියා සතො, ධම්මානුස්සතියා සතො, සඞ්ඝානුස්සතියා සතො, සීලානුස්සතියා සතො, චාගානුස්සතියා සතො, දෙවතානුස්සතියා සතො, ආනාපානසතියා සතො, මරණසතියා සතො, කායගතාසතියා සතො, උපසමානුස්සතියා සතො. යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො, [ක] අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො සමුපෙතො උපගතො[5] සමුපගතො[6] උපපන්නො සමුපපන්නො සමන්නාගතො. සො වුච්චති සතො.

1. පරියාදය - සිමු. II. PSS.
2. උදකුම්මිකජාතං - සිමු. II. PTS.
3. ඵුසිතං - සිමු. II.
4. සත්තත්තා - සිමු. II, PTS.
5. උපාගතො - මජසං.
6. සමුපාගතො - මජසං.

ක. ධම්මසඞ්ගණි - නිද්දෙසවාර

**සබ්බමූපරුන්ධෙ** – තෘෂ්ණාදෘෂ්ටිප්‍රපඤ්චයාගේ මූලය ද අස්මිමානය ද ප්‍රඥාවෙන් සියල්ල වළහන්නේය, වෙසෙසින් වළහන්නේය, නිරුද්ධ කරන්නේය, සන්හිඳුවන්නේය, අස්තයට පමුණුවන්නේය, දුරලන්නේ නුයි 'මූලං පපඤ්චසඞ්ඛායාති භගවා මන්තා අස්මීති සබ්බමූපරුන්ධෙ' යනු වේ.

**යා කාචි තණ්හා අජ්ඣත්තං** – 'යා කාචි' යනු: සියල්ලෙන් සියල්ල සර්වථායෙන් සියල්ල අශේෂ කොට නිශ්ශේෂ කොට ගන්නා වචනයෙකි තෙල 'යා කාචි' යනු. **තණ්හා** යනු: රූපතෘෂ්ණා යැ...ධර්මතෘෂ්ණා යි. **අජ්ඣත්තං** යනු: ඕ තෘෂ්ණාව අධ්‍යාත්මයෙහි උපදනී නුයි හෝ 'අජ්ඣත්තං' යනු වේ; නොහොත් 'අජ්ඣත්තං'සි සිත කියනු ලැබෙයි, යම් සිතෙක් මනසෙක් මානසයෙක් හදයෙක් භවාඞ්ගසිතෙක් මනසෙක් මනායතනයෙක් මනෙන්ද්‍රියයෙක් විඥනයෙක් විඥනස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥන- ධාතුවෙක් වේ ද එය යි: ඕ තෘෂ්ණාව සිත හා සහගත වූවා සහජාත- සංසෘෂ්ට – සම්ප්‍රයුක්ත – එකොත්පාද – එකනිරොධ – එකවස්තුක – එකාලම්බන වූවා නුයි ද 'අජ්ඣත්තා' වේ නුයි 'යා කාචි තණ්හා අජ්ඣත්තං' යනු වේ.

**තාසං විනයා සදා සතා සිඛෙ** – 'සදා' යනු: සැමදා සැමකල සැමවිට දිනපතා නිරතුරු එක්ව අනෙකක් හා අමිශ්‍රව පිළිවෙළින් ගැට දියරළක් මෙන් අවිරලව නො සිඳී එක්ව පැහැසී පෙරබත පසුබත පෙරයම මැදියම පැසුම්යම කෘෂ්ණපක්ෂයෙහි ශුක්ලපක්ෂයෙහි වසන්හි හිමන්හි ගිම්හි පෙරවියෙහි මැදිවියෙහි පසුවියෙහි; **සතා** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ වෙදනායෙහි...චිත්තයෙහි...ධර්මයන්හි ධම්මානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ. අන්‍යත් සතර කරුණෙකින් සිහි ඇතියේ: මුළා සිහිය දුරු කිරීමෙන් සිහි ඇතියේ; සිහියෙන් කටයුතු ධර්මයන් කළ හෙයින් සිහි ඇතියේ; සිහියට ප්‍රතිපක්ෂ වූ ධර්මයන් නැසූ බැවින් සිහි ඇතියේ, සතියට නිමිත්ත වූ ධර්මයන් නො නට බැවින් සිහි ඇතියේ; අන්‍යත් සතර කරුණෙකින් සිහි ඇතියේ: සිහියෙන් සමන්විත වන බැවින් සිහි ඇතියේ, සිහිය වසීභාවයට පැමිණ වූ හෙයින් සිහි ඇතියේ, සිහිය ප්‍රගුණ වන බැවින් සිහි ඇතියේ, සිහිය නො පසුබස්නා බැවින් සිහි ඇතියේ; අන්‍ය වූ ද සතර කරුණෙකින් සිහි ඇතියේ: විද්‍යමාන බැවින් (හෝ වස්තුත්‍රයෙහි ඇලුණු බැවින්) සිහි ඇතියේ, කෙලෙස් සන්හිඳු වූ බැවින් සිහි ඇතියේ, නිවුණු බැවින් සිහි ඇතියේ, සත්පුරුෂධර්මයෙන් සමන්විත බැවින් සිහි ඇතියේ, බුද්ධානුස්මෘතියෙන් – ධර්මානුස්මෘතියෙන් – සඞ්ඝානුස්මෘතියෙන්– ශීලානුස්මෘතියෙන් – ත්‍යාගානුස්මෘතියෙන් – දෙවතානුස්මෘතියෙන් – ආනාපානස්මෘතියෙන් – මරණසතියෙන් – කායගතාසතියෙන් – උපශමානුස්මෘතියෙන් සිහි ඇතියේ, යම් ස්මෘතියක් අනුස්මෘතියක් ප්‍රතිස්මෘතියක් වේ ද, සිහියක් සිහි කරන බවක් ධරන බවක් සිහි කරවන බවක් නො මුළාවන බවක් වේ ද, ස්මෘතියෙක් ස්මෘතීන්ද්‍රියයෙක් ස්මෘතිබලයෙක් සම්‍යක්ස්මෘතියෙක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායනමාර්ගයෙක් වේ ද, මෝ 'සති' යයි කියනු ලබයි. මෙ සතියෙන් යුක්ත වූයේ වෙසෙසින් යුක්ත වූයේ උපගත වූයේ සමුපගත වූයේ සමෘද්ධ වූයේ වෙසෙසින් සමෘද්ධ වූයේ සමන්විත වූයේ ද හෙතෙම 'සිහි ඇතියේ' යයි කියනු ලැබේ.

**සික්ඛෙ**ති – තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා.

කතමා **අධිසීලසික්ඛා?** ඉධ භික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො, අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. ඛුද්දකො සීලක්ඛන්ධො, මහන්තො සීලක්ඛන්ධො, සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො, මුඛං පමුඛං කුසලානං ධම්මානං සමාපත්තියා. අයං අධිසීලසික්ඛා.

කතමා **අධිචිත්තසික්ඛා?** ඉධ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමං ඣානං උපසම්පජ්ජ විහරති, විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියං ඣානං උපසම්පජ්ජ විහරති, පීතියා ච විරාගා උපෙක්ඛකො විහරති සතො ච සම්පජානො, සුඛං ච කායෙන පටිසංවෙදෙති යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තං තතියං ඣානං උපසම්පජ්ජ විහරති, සුඛස්ස ච පහානා දුක්ඛස්ස ච පහානා පුබ්බෙව සොමනස්සදොමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛමසුඛං උපෙක්ඛාසතිපාරිසුද්ධිං චතුත්ථං ඣානං උපසම්පජ්ජ විහරති. අයං අධිචිත්තසික්ඛා.

කතමා **අධිපඤ්ඤාසික්ඛා?** ඉධ භික්ඛු පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මාදුක්ඛක්ඛයගාමිනියා; සො ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති; ඉමෙ ආසවාති යථාභූතං පජානාති, අයං ආසවසමුදයොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධොති යථාභූතං පජානාති, අයං ආසවනිරොධගාමිනි පටිපදාති යථාභූතං පජානාති; අයං අධිපඤ්ඤාසික්ඛා.

**තාසං විනයා සදා සතො සික්ඛෙ**'ති – තාසං තණ්හානං විනයාය පටිවිනයාය පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය. ඉමා තිස්සො සික්ඛායො[1] ආවජ්ජෙන්තො සික්ඛෙය්‍ය, පජානන්තො සික්ඛෙය්‍ය; පස්සන්තො සික්ඛෙය්‍ය; පච්චවෙක්ඛන්තො සික්ඛෙය්‍ය; චිත්තං අධිට්ඨහන්තො සික්ඛෙය්‍ය; සද්ධාය අධිමුච්චන්තො සික්ඛෙය්‍ය; විරියං පග්ගණ්හන්තො සික්ඛෙය්‍ය; සතිං උපට්ඨහන්තො සික්ඛෙය්‍ය, චිත්තං සමාදහන්තො සික්ඛෙය්‍ය; පඤ්ඤාය පජානන්තො සික්ඛෙය්‍ය; අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛෙය්‍ය; පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො සික්ඛෙය්‍ය; පහාතබ්බං පජහන්තො සික්ඛෙය්‍ය; භාවෙතබ්බං භාවෙන්තො සික්ඛෙය්‍ය; සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය; ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති – තාසං විනයා සදා සතො සික්ඛෙ.

තෙනාහ භගවා:

"මූලං පපඤ්චසඞ්ඛායාති භගවා
මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ,
යා කාචි තණ්හා අජ්ඣත්තං
තාසං විනයා සදා සතො සික්ඛෙ"ති.

1. තිස්සො සික්ඛා - PTS.

**සික්ඛ** යනු: ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා අධිචිත්තශික්ෂා අධිප්‍රඥා-ශික්ෂා යයි.

**අධිශීලශික්ෂා** කවරැ යත්: මේ සස්නෙහි මහණ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවර වූයේ ආචාර - ගෝචර දෙකින් යුක්ත වූයේ මඳ පමණ වූ අකුශලයෙහි භය දක්නාසුලු වූයේ වෙසෙයි, ඒ ඒ ශික්ෂාපදය සමාදන් වැ හික්මෙයි. ක්ෂුද්‍රශීලස්කන්ධ යැ මහාශීලස්කන්ධ යැ, ශීලය පිහිට යැ ආදි යැ චරණ (-පාද) යැ සංයම යැ සංවරයැ, කුශලධර්මයන්-ගේ ප්‍රතිලාභයට ද්වාරය වෙයි, උත්තම වේ. මෝ අධිශීලශික්ෂා යැ.

**අධිචිත්තශික්ෂා** කවරැ යත්: මේ සස්නෙහි මහණ කාමච්ඡන්දයෙන් වෙන් ව අකුශලධර්මයන් ගෙන් වෙන් ව සවිතර්ක වූ සවිචාර වූ විවෙකයෙන් උපන් ප්‍රීතිය හා සුව ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසෙයි, විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් අධ්‍යාත්මයෙහි සම්ප්‍රසාදය ඇති චිත්තයාගේ එකොදී-භාවය ඇති අවිතර්ක වූ අවිචාර වූ සමාධියෙන් උපන් ප්‍රීතිය හා සුව ඇති ද්විතීයධ්‍යානයට පැමිණ වෙසෙයි, ප්‍රීතිය ද ඉක්මවීමෙන් උපෙක්ෂා-වෙන් යුක්ත ව වෙසෙයි, සමෘති ඇතියේ සම්‍යක්ප්‍රඥ ඇතියේ කයින් ධ්‍යානසුඛය ද විඳී, උපෙක්ෂා ඇත්තේ ය සමෘතිමත් ය සුඛවිහරණ ඇත්තේ යයි ආර්යයන් ප්‍රකාශ කරන ඒ තෘතීයධ්‍යානයට පැමිණ වෙසෙයි, කායිකසුඛය ද කායිකදුඃඛය ද ප්‍රහාණයෙන් පළමු මැ සොම්නස්දොම්නසුන් අතුරුදහන් වීමෙන් දුක් නැති සුව නැති උපෙක්ෂාව හා සමෘතිපාරිශුද්ධිය ඇති චතුර්ථධ්‍යානයට පැමිණ වෙසෙයි. මෝ අධිචිත්තශික්ෂා යැ.

**අධිප්‍රඥාශික්ෂා** කවරැ යත්: මේ සස්නෙහි මහණ ප්‍රඥවත් වෙයි, නිර්දෝෂ වූ ලොභාදිය සිඳීමට පොහොසත් වූ මනාකොට දුක් ක්ෂය කිරීමට පමුණුවන උදයව්‍යයගාමිනී ප්‍රඥාවෙන් සමන්විත වූයේ වෙයි, හෙතෙම මේ දුකැ'යි තතු සේ දනගනී, 'මේ දුඃඛසමුදයැ'යි තතු සේ දනගනී, 'මේ දුඃඛනිරොධ යැ'යි තතු සේ දනගනී, 'මෝ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාව යැ'යි තතු සේ දනගනී; මොහු ආස්‍රවයෝ යැයි තතු සේ දනගනී, මේ ආස්‍රවසමුදයැයි තතු සේ දනගනී, මේ ආස්‍රවනිරොධ යැයි තතු සේ දනගනී, මෝ ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපදාව යැයි තතු සේ දනගනී. මෝ අධිප්‍රඥාශික්ෂා යි.

**තාසං විනයා සදා සතො සික්ඛෙ** - ඒ තෘෂ්ණාවන්ගේ විනය පිණිස ප්‍රතිවිනය පිණිස ප්‍රහාණය පිණිස සන්හිඳුවීම පිණිස දුරලීම පිණිස නූපදීම පිණිස අධිශීලයෙහි ද හික්මෙන්නේය, අධිචිත්තයෙහි ද හික්මෙන්නේය, අධිප්‍රඥාවෙහි ද හික්මෙන්නේය; මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේය, දනගනිමින් - දක්මින් - ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් හික්මෙන්නේය, සිත පිහිටුවමින් හික්මෙන්නේය, සැදැහැයෙන් සතිටුහන් කෙරෙමින් - වීර්‍ය්‍ය දැඩිව ගනිමින් - සිහි එළවමින් - සිත පිහිටුවමින් - නුවණින් දැන ගනිමින් - වෙසෙසින් දතයුත්ත මනාකොට දනගනිමින් - සමාන්‍යලක්ෂණාවබොධයෙන් දතයුත්ත හාත්පසින් දනගනිමින් - ප්‍රහීණ කළ යුත්ත ප්‍රහීණ කෙරෙමින් - වැඩිය යුතු මාර්ගය වඩමින් - පසක් කළයුතු නිර්වාණ පසක් කෙරෙමින් හික්මෙන්නේය, හැසිරෙන්නේය, මොනොවට හැසිරෙන්නේය සමාදන් ව පවත්නේ නුයි 'තාසං විනයා සදා සතො සික්ඛෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**මූලං පපඤ්චසඞ්ඛාය -පෙ- සදා සතො සික්ඛෙ**"යි.

**14 - 8**

යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා
අජ්ඣත්තං අථවාපි බහිද්ධා,
න තෙන ථාමං [1]කුබ්බෙථ
න හි සා නිබ්බුති සතං වුත්තා.

**යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තන්ති** - යං කිඤ්චි අත්තනො ගුණං ජානෙය්‍ය කුසලෙ වා ධම්මෙ අබ්‍යාකතෙ වා ධම්මෙ. කතමෙ අත්තනො ගුණා? උච්චාකුලා පබ්බජිතො වා අස්සං[2] මහාභොගකුලා පබ්බජිතො වා අස්සං; උළාරභොගකුලා පබ්බජිතො වා අස්සං, ඤාතො යසස්සී සගහට්ඨපබ්බජිතානන්ති වා අස්සං; ලාභිම්හි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති වා අස්සං, සුත්තන්තිකො වා අස්සං, විනයධරො වා අස්සං, ධම්මකථිකො වා අස්සං, ආරඤ්ඤකො වා අස්සං, පිණ්ඩපාතිකො වා අස්සං, පංසුකූලිකො වා අස්සං, තෙචීවරිකො වා අස්සං, සපදානචාරිකො වා අස්සං, ඛලුපච්ඡාභත්තිකො වා අස්සං, නෙසජ්ජිකො වා අස්සං, යථාසන්ථතිකො වා අස්සං, පඨමස්ස ඣානස්ස ලාභීති වා අස්සං, දුතියස්ස ඣානස්ස ලාභීති වා අස්සං; තතියස්ස ඣානස්ස ලාභීති වා අස්සං; චතුත්ථස්ස ඣානස්ස ලාභීති වා අස්සං; ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභීති වා අස්සං; විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා-ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා - නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීති වා අස්සං; ඉමෙ වුච්චන්ති අත්තනො ගුණා. යං කිඤ්චි අත්තනො ගුණං ජානෙය්‍ය ආජානෙය්‍ය විජානෙය්‍ය පටිවිජානෙය්‍ය පටිවිජ්ඣෙය්‍යාති-යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තං.

**අථවාපි බහිද්ධාති** - උපජ්ඣායස්ස වා ආචරියස්ස වා තෙ ගුණා අස්සූති අජ්ඣත්තං අථවාපි බහිද්ධා.

**න තෙන ථාමං කුබ්බෙථාති** - අත්තනො වා ගුණෙන පරෙසං වා ගුණෙන ථාමං න කරෙය්‍ය, ථම්භං න කරෙය්‍ය, මානං න කරෙය්‍ය, උන්නතිං න කරෙය්‍ය, උන්නාමං න කරෙය්‍ය, න තෙන මානං ජනෙය්‍ය, න තෙන ථද්ධො අස්ස පත්ථද්ධො පග්ගහිතසිරොති - න තෙන ථාමං කුබ්බෙථ.

**න හි සා නිබ්බුති සතං වුත්තාති** - සතානං සන්තානං සප්පුරිසානං බුද්ධානං බුද්ධසාවකානං පච්චෙකබුද්ධානං සා නිබ්බුතීති න වුත්තා; න පවුත්තා, න ආචික්ඛිතා, න දෙසිතා, න පඤ්ඤපිතා න පට්ඨපිතා, න විවටා, න විභත්තා, න උත්තානීකතා, නප්පකාසිතාති - න හි සා නිබ්බුති සතං වුත්තා

තෙනාහ භගවා:

"යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා
අජ්ඣත්තං අථවාපි බහිද්ධා,
න තෙන ථාමං කුබ්බෙථ
න හි සා නිබ්බුති සතං වුත්තා"ති.

---

1. මානං - සුස. 2. අස්ස - සං.

14 - 8

තමා කෙරෙහි වූ ද නොහොත් (උපාධ්‍යායාදි) බැහැර වූ ද යම් කිසි (කුලීනත්වාදි) ගුණයක් දන්නේ නම් ඒ හේතුකොටගෙන මානය නො කරන්නේය. ඒ උන්නතිය බුද්ධාදීන් විසින් නිබ්බුති යයි නො කියන ලද්දී ද එහෙයිනි.

**යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තං** - කුශලධර්මයෙහි හෝ අව්‍යාකෘතධර්මයෙහි හෝ යම් කිසි තමාගේ ගුණයක් දන්නේ නම් - තමාගේ ගුණයෝ කවරහු යත්? උසස් කුලයෙන් පැවිදි වූයෙම් හෝ වෙමි, ගැහැවි මහසල් කුලයෙන් පැවිදි වූයෙම් හෝ වෙමි, මහත් භෝග ඇති කුලයෙන් පැවිදි වූයෙම් හෝ වෙමි, ගැහැවියන් සහිත පැවිද්දන් අතුරෙහි ප්‍රකටයෙම් යශස් ඇත්තෙම් හෝ වෙමි, සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙත්පිරිකර ලබන්නෙම් හෝ වෙමි, සූත්‍ර හදාරනුයෙම් හෝ වෙමි, විනයධරයෙම් හෝ වෙමි, ධර්මකථිකයෙම් හෝ වෙමි, ආරණ්‍යකයෙම් හෝ වෙමි, පිණ්ඩපාතිකයෙම් හෝ වෙමි, පාංශුකූලිකයෙම් හෝ වෙමි, ත්‍රෛචීවරිකයෙම් හෝ වෙමි, සපදානචාරිකයෙම් හෝ වෙමි, ඛලුපච්ඡාභත්තිකයෙම් හෝ වෙමි, නෙසජ්ජිකයෙම් හෝ වෙමි, යථාසන්ථතිකාඞ්ග ඇතියෙම් හෝ වෙමි, පූථමධ්‍යානලාභී හෝ වෙමි, ද්විතීයධ්‍යානලාභී හෝ වෙමි, තෘතීයධ්‍යානලාභී හෝ වෙමි, චතුර්ථධ්‍යානලාභී හෝ වෙමි, ආකාසානඤ්චායතනසමාපත්තිලාභී හෝ වෙමි, විඤ්ඤාණඤ්චායතනසමාපත්තිලාභී හෝ වෙමි, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති - නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී හෝ වෙමි. මොහු තමාගේ ගුණයෝ යැයි කියනු ලැබෙති. යම් කිසි තමාගේ ගුණයක් දන්නේ නම් හාත්පසින් දන්නේ නම් වෙසෙසින් දන්නේ නම් මැනැවින් දන්නේ නම් අවබොධ කරන්නේ නම් යි 'යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා අජ්ඣත්තං' යනු වේ.

**අථවාපි බහිද්ධා** - උපාධ්‍යායයන්ගේ හෝ ආචාර්‍ය්‍යයන්ගේ හෝ ඒ ගුණයෝ වන්නාහු නුයි 'අථවාපි බහිද්ධා' යනු වේ.

**න තෙන ථාමං කුබ්බෙථ** - තමාගේ ගුණයෙන් හෝ අනුන්ගේ ගුණයෙන් හෝ ථාමය නො කරන්නේය, තදබව නො කරන්නේය, මානය නො කරන්නේය, උන්නතිය නො කරන්නේය, උඩඟුබව නො කරන්නේය, එයින් මානය නූපදවන්නේය, එයින් තද වූයේ දැඩි වූයේ නැඟූ හිස ඇත්තේ නො වන්නේ යයි 'න තෙන ථාමං කුබ්බෙථ' යනු වේ.

**න හි සා නිබ්බුති සතං වුත්තා** - සාධූන් ශාන්තයන් සත්පුරුෂයන් බුදුවරුන් බුද්ධශ්‍රාවකයන් පසේබුදුවරුන් විසින් ඒ උන්නතිය නිර්වෘතියයි නො කියන ලද්දීය, නො පවසන ලද්දීය, නො දෙසන ලද්දීය, නො පනවන ලද්දීය, නො තබන ලද්දීය, අවිවෘතය, අවිභක්තය, ප්‍රකට නො කරන ලද, ප්‍රකාශ නො කරන ලද්දී නුයි 'න හි සා නිබ්බුති සතං වුත්තා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා -පෙ- න හි සා නිබ්බුති සතං වුත්තා"යි**

**14 - 4**

සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය
නීචෙය්‍යො අථවාපි සරික්ඛො,
ඵුට්ඨො අනෙකරූපෙහි
නාතුමානං විකප්පයං තිට්ඨෙ.

**සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍යාති** - සෙය්‍යො'හමස්මීති අතිමානං න ජනෙය්‍ය ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති - සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය.

**නීචෙය්‍යො[1] අථවාපි සරික්ඛොති** - හීනො'හමස්මීති ඔමානං න ජනෙය්‍ය ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා සදිසො'හමස්මීති මානං න ජනෙය්‍ය ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති - නීචෙය්‍යො අථවාපි සරික්ඛො.

**ඵුට්ඨො අනෙකරූපෙහීති** - අනෙකවිධෙහි ආකාරෙහි ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතොති - ඵුට්ඨො අනෙකරූපෙහි.

**නාතුමානං විකප්පයං තිට්ඨෙති** - 'ආතුමා' වුච්චති අත්තා. අත්තානං කප්පෙන්තො විකප්පෙන්තො විකප්පං ආපජ්ජන්තො න තිට්ඨෙය්‍යාති- නාතුමානං විකප්පයං තිට්ඨෙ.

තෙනාහ භගවා:

"සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය
නීචෙය්‍යො අථවාපි සරික්ඛො,
ඵුට්ඨො අනෙකරූපෙහි
නාතුමානං විකප්පයං තිට්ඨෙ"ති.

**14 - 5**

"අජ්ඣත්තමෙව උපසමෙ[2]
නාඤ්ඤතො[3] භික්ඛු සන්තිමෙසෙය්‍ය,
අජ්ඣත්තං උපසන්තස්ස
නත්ථි අත්තා කුතො නිරත්තා වා."

**අජ්ඣත්තමෙව උපසමෙති** - අජ්ඣත්තං රාගං සමෙය්‍ය, දොසං සමෙය්‍ය, මොහං සමෙය්‍ය, කොධං උපනාහං මක්ඛං පළාසං ඉස්සං මච්ඡරියං මායං සාඨෙය්‍යං ථම්භං සාරම්භං මානං අතිමානං මදං පමාදං සබ්බෙ කිලෙසෙ සබ්බෙ දුච්චරිතෙ සබ්බෙ දරථෙ සබ්බෙ පරිළාහෙ සබ්බෙ සන්තාපෙ සබ්බාකුසලාභිසඞ්ඛාරෙ සමෙය්‍ය උපසමෙය්‍ය වූපසමෙය්‍ය නිබ්බාපෙය්‍ය පටිප්පස්සම්භෙය්‍යාති - අජ්ඣත්තමෙව උපසමෙ.

1. නීචෙය්‍යා - මුපා. 2. අජ්ඣත්තමෙවුපසමෙ - සීමු. II, මජසං.
3. න අඤ්ඤතො - සීමු. II. මජසං.

## 14 - 4

ඒ මානයෙන් මම උතුමැයි ද හීනයෙමි ද නොහොත් සදෘශයෙමි ද නො හඟතේ යැ. (කුලීනත්වාදි) විවිධාකාරයෙන් යුක්ත වූයේ තමා විකල්පනය කෙරෙමින් නො සිටිතේ යි.

**සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය** - ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්ණපොෂ්කලයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යාවෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ 'මම ශ්‍රෙෂ්ඨයෙමි' අතිමානය නූපදවන්නේ නුයි 'සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය' යනු වේ.

**නීචෙය්‍යො අථවාපි සරික්ඛො** - ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ... අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ 'මම හීනයෙමි' අවමානය නූපදවන්නේය. ජාතියෙන් හෝ ගෝත්‍රයෙන් හෝ කුලපුත් බැවින් හෝ වර්ණපොෂ්කලයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙකින් හෝ ශිල්පායතනයෙකින් හෝ විද්‍යාවෙකින් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ 'මම සදෘශයෙමි' මානය නූපදවන්නේ නුයි 'නීචෙය්‍යො අථවා පි සරික්ඛො යනු' වේ.

**ඵුට්ඨො අනෙකරූපෙහි** - අනෙකවිධ වූ ආකාරයන්ගෙන් පහස්නා ලද්දේ යුක්ත වූයේ රැස් වූයේ සමන්විත වූයේ නුයි 'ඵුට්ඨො අනෙකරූපෙහි' යනු වේ.

**නාතුමානං විකප්පයං තිට්ඨෙ** - 'ආතුමා'යි තෙමේ කියනු ලැබෙයි. තමා කල්පන කෙරෙමින් විකල්පන කෙරෙමින් විකල්පයට පැමිණෙමින් නො සිටිතේ නුයි 'නාතුමානං විකප්පයං තිට්ඨෙ' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

**"සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය -පෙ- නාතුමානං විකප්පයං තිට්ඨෙ"**යි.

## 14 - 5

මහණ තෙමේ අධ්‍යාත්මයෙහි ම (රාගාදිය) සන්හිඳුවන්නේය. අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් ශාන්තිය නො සොයන්නේය. අධ්‍යාත්මයෙහි (රාගාදිය) සන්හිඳුණු (ක්ෂීණාස්‍රවහට) ආත්මදෘෂ්ටිය නැත. උච්ඡේදදෘෂ්ටිය හෝ කොයින් ද ?

**අජ්ඣත්තමෙව උපසමෙ** - අධ්‍යාත්මයෙහි රාගය සන්හිඳුවන්නේ ය, ද්වෙෂය සන්හිඳුවන්නේ ය, මොහය සන්හිඳුවන්නේය, ක්‍රොධය - උපනාහය මක්ඛය - පලාසය - ඊර්ෂ්‍යාව - මාත්සර්‍ය්‍යය - මායාව - සාඨ්‍යය - ස්තම්භය - සාරම්භය - මානය - අතිමානය - මදය - ප්‍රමාදය - සියලු කෙලශයන් - සියලු දුශ්චරිතයන් - සියලු දරථයන් - සියලු පරිදාහයන් - සියලු සන්තාපයන් - සියලු අකුශලාභිසංස්කාරයන් ශමනය කරන්නේය, ව්‍යුපශමනය කරන්නේය, නිවන්නේ ය, දුරලන්නේ නුයි 'අජ්ඣත්තමෙව උපසමෙ' යනු වේ.

**නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍යාති** - අඤ්ඤතො අසුද්ධිමග්ගෙන මිච්ඡාපටිපදාය අනිය්‍යානපථෙන අඤ්ඤත්‍ර සතිපට්ඨානෙහි අඤ්ඤත්‍ර සම්මප්පධානෙහි අඤ්ඤත්‍ර ඉද්ධිපාදෙහි අඤ්ඤත්‍ර ඉන්ද්‍රියෙහි අඤ්ඤත්‍ර බලෙහි අඤ්ඤත්‍ර බොජ්ඣඞ්ගෙහි අඤ්ඤත්‍ර අරියා අට්ඨඞ්ගිකා මග්ගා සන්තිං උපසන්තිං වූපසන්තිං නිබ්බුතිං පටිප්පස්සද්ධිං න එසෙය්‍ය න ගවෙසෙය්‍ය න පරියෙසෙය්‍යාති - නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය.

**අජ්ඣත්තං උපසන්තස්සාති** - අජ්ඣත්තං රාගං සන්තස්ස[1] දොසං සන්තස්ස මොහං සන්තස්ස -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරෙ සන්තස්ස උපසන්තස්ස වූපසන්තස්ස නිබ්බුතස්ස පටිප්පස්සද්ධස්සාති - අජ්ඣත්තං උපසන්තස්ස.

**නත්ථි අත්තා කුතො නිරත්තා වාති** - 'නත්ථී'ති පටික්ඛෙපො. **අත්තාති** අත්තදිට්ඨි නත්ථි, **නිරත්තාති** උච්ඡෙදදිට්ඨි නත්ථි, අත්තාති ගහිතං නත්ථි, නිරත්තාති මුඤ්චිතබ්බං නත්ථි. යස්සත්ථි ගහිතං තස්සත්ථි මුඤ්චිතබ්බං, යස්ස නත්ථි මුඤ්චිතබ්බං තස්ස නත්ථි ගහිතං, ගාහමුඤ්චනසමතික්කන්තො අරහා වුද්ධිපරිහානිං වීතිවත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො -පෙ- ජාතිමරණසංසාරො නත්ථි තස්ස පුනබ්භවොති - නත්ථි අත්තා කුතො නිරත්තා වා.

තෙනාහ භගවා:

> "අජ්ඣත්තමෙව උපසමෙ නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය,
> අජ්ඣත්තං උපසන්තස්ස නත්ථි අත්තා කුතො නිරත්තා වා"ති.

## 14 - 6

> මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති,
> එවං ඨිතො අනෙජස්ස උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.

**මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොතීති**-සමුද්දො චතුරාසීතියොජනසහස්සානි උබ්බෙධෙන ගම්භීරො. හෙට්ඨා චත්තාරීසයොජනසහස්සානි උදකං මච්ඡකච්ඡපෙහි කම්පති. උපරි චත්තාරීසයොජනසහස්සානි උදකං වාතෙහි කම්පති. මජ්ඣෙ චත්තාරි[2] යොජනසහස්සානි උදකං න කම්පති න විකම්පති න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධති අනෙරිතො අඝට්ටිතො අචලිතො අලුළිතො අභන්තො වූපසන්තො. තත්‍ර ඌමි නො ජායති ඨිතො හොති සමුද්දොති. එවම්පි- යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති. අථ වා සත්තන්නං පබ්බතානං අන්තරිකාසු සත්ත සීදන්තරා මහාසමුද්දා,[3] තත්‍ර උදකං න කම්පති, න විකම්පති න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධති. අනෙරිතො අඝට්ටිතො අචලිතො අලුළිතො අභන්තො වූපසන්තො. තත්‍ර ඌමි නො ජායති ඨිතො හොති සමුද්දොති. එවම්පි - මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති.

---

1. උපසන්තස්ස - PTS  2. චත්තාරීස - සී, මජසං, චත්තාළීස - PTS.
3. සීදන්තර සමුද්දා - PTS.

**නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය** - (සතිපට්ඨානාදියෙන්) අන්‍ය වූ අශුද්ධිමාර්ගයෙන් මිථ්‍යාප්‍රතිපදායෙන් අනෛර්‍යාණිකපථයෙන්, සතිපට්ඨානයන්ගෙන් වෙන් ව සම්‍යක්ප්‍රධානයන්ගෙන් වෙන් ව ඍද්ධිපාදයන්ගෙන් වෙන් ව ඉන්ද්‍රියයන්ගෙන් වෙන් ව බලයන්ගෙන් වෙන් ව බොධ්‍යඞ්ගයන්ගෙන් වෙන් ව ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් වෙන් ව ශාන්තිය උපශාන්තිය ව්‍යුපශාන්තිය නිවන පටිප්පස්සද්ධිය නො සොයන්නේ ය, ගවෙෂණය නො කරන්නේය, පර්‍ය්‍යෙෂණය නො කරන්නේ යි 'නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය' යනු වේ.

**අජ්ඣත්තං උපසන්තස්ස** - අධ්‍යාත්මයෙහි රාගය සන්හුන්නාහුට ද්වේෂය සන්හුන්නාහුට මෝහය සන්හුන්නාහුට...සියලු අකුශලාභිසංස්කාරයන් සන්හුන්නාහුට උපශාන්ත වූවහුට ව්‍යුපශාන්ත වූවහුට නිවුණහුට දුරලූවහුට නුයි 'අජ්ඣත්තං උපසන්තස්ස' යනු වේ.

**නත්ථි අත්තා කුතො නිරත්තා වා** - 'නත්ථි' යනු ප්‍රතික්ෂෙප යැ; **අත්තා** යනු: ආත්මදෘෂ්ටිය නැත. **නිරත්තා** යනු: උච්ඡේදදෘෂ්ටිය නැත. 'ආත්ම යැ' යි ගන්නා ලද්දක් නැත, 'නිරාත්ම යැ'යි හළ යුත්තක් නැත. යමකුට ගන්නා ලද්දක් ඇත් නම් ඔහුට හළයුත්තකු දු ඇත, යමකුට හළයුත්තක් නැත් නම් ඔහුට ගතයුත්තකු දු නැත. රහත් තෙම ගැනීම ද හැරීම ද ඉක්මවූයේ ය, වෘද්ධිය ද හානිය ද ඉක්මවා සිටියේ ය. හෙතෙම වැස නිම වූ දශ ආර්‍ය්‍යවාස ඇත්තේ ය. වසඟ කළ චරණධර්ම ඇත්තේ ය...ඔහුට ජාතිමරණසංසාරය පුනර්භවය නැත් නුයි 'නත්ථි අත්තා කුතො නිරත්තා වා' යනු වේ.

එයින් වදාළහ බුදුනු:

**“අජ්ඣත්තමෙව උපසමෙ -පෙ- කුතො නිරත්තා වා”යි.**

**14 – 6**

මහාසාගරයාගේ (යොදුන් සාරදහසක් පමණ වූ) මධ්‍යභාගයෙහි යම් සේ රළ නො හටගනී ද, (නිශ්චල ව) සිටියේ වේ ද, එසෙයින් තෘෂ්ණා රහිත වූ ක්ෂීණාස්‍රව තෙම (අටලෝදහමින් නො සැලී) සිටියේ වන්නේ ය. එබඳු මහණ කිසිවෙක්හි (රාගාදි) උස්සදයක් නො කරන්නේ යි.

**මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති** - සමුද්‍රය යට පත්ලෙන් සුවාසූදහසක් යොදුන් ගැඹුරු යැ. යටින් සතළිස්දහසක් යොදුන් ජලය මස්කැස්බන්ගෙන් කම්පා වෙයි. මත්තෙහි සතළිස්දහසක් යොදුන් දිය වාතයෙන් කම්පා වෙයි. මැද සාරදහසක් යොදුන් දිය නො සැලෙයි, ඔබිනොබ නො සැලෙයි, නිශ්චල වෙයි, නො වෙවුලයි, නො පෙරළෙයි, නො කැරකෙයි, කම්පා නො වූයේ නො ගැටුණේ නො සැලුණේ නො කැලැඹුණේ නො කැරකුණේ සන්හිඳුණේ වෙයි. එහි රළ නූපදී, සමුද්‍රය සිටියේ වේ නුයි මෙසේත් 'මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති' යනු වේ. නො හොත් (යුගන්ධරාදි) සත් පර්වතයන් අතර සප්ත සීදන්තර මහාසමුද්‍රයෝ වෙති. එහි දිය කම්පන විකම්පන නො වෙයි, නො සැලෙයි, නො වෙවුලයි, නො පෙරළෙයි, නො කැරකෙයි. කම්පා නො වූයේ නො ගැටුණේ නො සැලුණේ නො කැලැඹුණේ නො බැමුණේ සන්හිඳුණේ වෙයි. එහි රළ නූපදී, සමුද්‍රය සිටියේ වේ නුයි මෙසේත් 'මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායති ඨිතො හොති' යනු වේ.

**එවං ඨිතො අනෙජස්සාති** – 'එව'න්ති ඔපම්මසම්පටිපාදනං; **ඨිතොති** ලාභෙපි න කම්පති, අලාභෙපි න කම්පති, යසෙපි න කම්පති, අයසෙපි න කම්පති, පසංසායපි න කම්පති, නින්දායපි න කම්පති, සුඛෙපි න කම්පති, දුක්ඛෙපි න කම්පති, න විකම්පති, න චලති, න වෙධති, නප්පවෙධති, න සම්පවෙධතීති එවං ඨිතො. **අනෙජස්සාති** 'එජා' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. යස්සෙසා එජා තණ්හා පහීනා උච්ඡින්නා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා, ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අනෙජො. එජාය පහීනත්තා අනෙජො. සො ලාභෙපි න ඉඤ්ජති, අලාභෙපි න ඉඤ්ජති, යසෙපි න ඉඤ්ජති, අයසෙපි න ඉඤ්ජති, පසංසායපි න ඉඤ්ජති, නින්දායපි න ඉඤ්ජති, සුඛෙපි න ඉඤ්ජති, දුක්ඛෙපි න ඉඤ්ජති, න චලති න වෙධති නප්පවෙධති න සම්පවෙධතීති – එවං ඨිතො අනෙජස්ස.

**උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චීති** – 'උස්සදා'ති සත්තුස්සදා: රාගුස්සදං[1] දොසුස්සදං මොහුස්සදං මානුස්සදං දිට්ඨුස්සදං කිලෙසුස්සදං කම්මුස්සදං න කරෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය; **කුහිඤ්චීති** කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති – උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.

තෙනාහ භගවා:

> "මජ්ඣෙ යථා සමුද්දස්ස ඌමි නො ජායතී ඨිතො හොති,
> එවං ඨිතො අනෙජස්ස උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චී"ති.

## 14 - 7

> අකිත්තයී විවටචක්ඛු සක්ඛිධම්මං පරිස්සයවිනයං,
> පටිපදං වදෙහි භද්දන්තෙ පාතිමොක්ඛමථවාපි[2] සමාධිං.

**අකිත්තයී විවටචක්ඛූති** – 'අකිත්තයී'ති කිත්තිතං ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවටං විභත්තං උත්තානීකතං පකාසිතන්ති – අකිත්තයී. **විවටචක්ඛූති** භගවා පඤ්චහි චක්ඛූහි විවටචක්ඛු; මංසචක්ඛුනාපි විවටචක්ඛු, දිබ්බචක්ඛුනාපි විවටචක්ඛු, පඤ්ඤාචක්ඛුනාපි විවටචක්ඛු, බුද්ධචක්ඛුනාපි විවටචක්ඛු, සමන්තචක්ඛුනාපි විවටචක්ඛු.

---

1. රාගස්සදෙ - PTS. 2. පාතිමොක්ඛං අථවාපි - PTS.

**එවං ඨිතො අනෙජස්ස** - 'එවං' යනු: ඖපම්‍යසම්ප්‍රතිපාදන යැ, **ඨිතො** යනු: ලාභයෙහි දු නො සැලෙයි, අලාභයෙහි දු නො සැලෙයි, යශස්හි දු නො සැලෙයි, අයශස්හි දු නො සැලෙයි, ප්‍රශංසායෙහි දු නො සැලෙයි, නින්දායෙහි දු නො සැලෙයි, සුවයෙහි දු නො සැලෙයි, දුකෙහි දු නො සැලෙයි, ඔබිනොබැ නො සැලෙයි, නිශ්චල වෙයි, නො වෙව්ලයි, නො පෙරළෙයි, පරිභ්‍රම නො වේ නුයි මෙසේ සිටිනේ; **අනෙජස්ස** යනු: 'එජා'සී තෘෂ්ණාව කියනු ලබයි. යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එයයි. යමක්හු විසින් තෙල එජාව තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී මුලුසුන් කරන ලද්දී සන්හිඳුවන ලද්දී දුරලන ලද්දී අභව්‍යොත්පත්තික වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද, හේ 'අනෙජ' යයි කියනු ලැබේ. එජාව ප්‍රහීණ බැවින් 'අනෙජ'සී. හේ ලාභයෙහි දු නො සැලෙයි, අලාභයෙහි දු - යශස්හි දු - අයශස්හි දු -ප්‍රශංසායෙහි දු-නින්දායෙහි- දු සුවයෙහි දු - දුකෙහි දු නො සැලෙයි, නිශ්චල වෙයි, නො වෙව්ලයි, ඔබිනොබැ නො වෙව්ලයි, නො පෙරළේ නුයි 'එවං ඨිතො අනෙජස්ස යනු වේ.

**උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි** - 'උස්සද' යනු: උත්සද සතෙකි: රාගොත්සදය ද්වෙෂොත්සදය මොහොත්සදය මානොත්සදය දෘෂ්ට්‍යුත්-සදය ක්ලෙශොත්සදය කර්මොත්සදය නො කරන්නේ ය, නො දනවන්නේ ය, නූපදවන්නේ ය, නො නිපදවන්නේ ය. නො පහළ කරන්නේ ය. **කුහිඤ්චි** යනු: කිසිවක්හි කිසි තැනෙක්හි කවර තැනෙක්හි අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ නුයි 'උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"මජ්ඣෙ යථා සමුද්දස්ස -පෙ- උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චී"යි**

**14 - 7**

අනාවරණ වූ පසැස් ඇතියේ උවදුරු දුරු කරන්නා වූ තමන් අයත් වූ නොහොත් තමන් විසින් ප්‍රත්‍යක්ෂ කළ ධර්මය වදාළේ ය. මුඹට කල්‍යාණ යෙක් වේවා. නොහොත් මුඹගේ භද්‍ර වූ ප්‍රතිපදාව වදාළ මැනවි. ප්‍රාතිමොක්ෂය ද යළි සමාධිය ද වදාළ මැනැවි.

**අකිත්තයි විවටචක්ඛු** - 'අකිත්තයී' යනු: දක්වන ලද පවසන ලද දෙසන ලද පනවන ලද තබන ලද විවෘත කරන ලද විභාග කරනලද ප්‍රකට කරන ලද ප්‍රකාශ කරන ලද නුයි 'අකිත්තයී' යනු වේ. **විවටචක්ඛු** යනු: බුදුහු පසැසකින් විවටචක්ඛු වූහ: මසැසිනු දු විවටචක්ඛු යහ, දිවැසිනු දු විවටචක්ඛු යහ, පැනැසිනු දු විවටචක්ඛු යහ, බුදුඇසිනු දු විවටචක්ඛු යහ, සමතැසිනු දු විවටචක්ඛු වූහ.

කථං භගවා මංසචක්ඛුනාපි විවටචක්ඛු? මංසචක්ඛුම්හි භගවතො පඤ්චවණ්ණා සංවිජ්ජන්ති: නීලො ච වණ්ණො, පීතකො ච වණ්ණො, ලොහිතකො ච වණ්ණො, කණ්හො ච වණ්ණො, ඔදාතො ච වණ්ණො. අක්ඛිලොමානි ච භගවතො - යත්ථ ච අක්ඛිලොමානි පතිට්ඨිතානි තං නීලං හොති සුනීලං පාසාදිකං දස්සනෙය්‍යං, උම්මා[1]පුප්ඵසමානං. තස්ස පරතො පීතං හොති සුපීතකං සුවණ්ණවණ්ණං පාසාදිකං දස්සනෙය්‍යං කණිකාරපුප්ඵසමානං. උභයතො ච අක්ඛිකූටානි භගවතො ලොහිතකානි හොන්ති සුලොහිතකානි පාසාදිකානි දස්සනෙය්‍යානි ඉන්දගොපකසමානානි. මජ්ඣෙ කණ්හං හොති සුකණ්හං අලූඛං සිනිද්ධං පාසාදිකං දස්සනෙය්‍යං අද්දාරිට්ඨකසමානං. තස්ස පරතො ඔදාතං හොති සුඔදාතං සෙතං පණ්ඩරං පාසාදිකං දස්සනෙය්‍යං ඔසධීතාරකාසමානං. තෙන භගවා පාකතිකෙන මංසචක්ඛුනා අත්තභාවපරියාපන්නෙන පුරිමසුචරිතකම්මාභිනිබ්බත්තෙන සමන්තා යොජනං පස්සති දිවා චෙව රත්තිඤ්ච. යදා හි චතුරඞ්ගසමන්නාගතො අන්ධකාරො හොති: සූරියො ච අත්ථඞ්ගතො හොති, කාළපක්ඛො ච උපොසථො හොති, තිබ්බො ච වනසණ්ඩො හොති, මහා ච කාළමෙඝො අබ්භුට්ඨිතො හොති, එවරූපෙපි චතුරඞ්ගසමන්නාගතෙ අන්ධකාරෙ සමන්තා යොජනං පස්සති, යත්ථ සො කුඩ්ඩො[2] වා කවාටං වා පාකාරො වා පබ්බතො වා ගච්ඡං වා ලතා වා ආවරණං රූපානං දස්සනාය. එකං චෙ තිලඵලං නිමිත්තං කත්වා තිලවාහෙ පක්ඛිපෙය්‍ය, තඤ්ඤෙව තිලඵලං උද්ධරෙය්‍ය. එවං පරිසුද්ධං භගවතො පාකතිකං මංසචක්ඛු. එවං භගවා මංසචක්ඛුනාපි විවටචක්ඛු.

කථං භගවා දිබ්බෙන චක්ඛුනාපි විවටචක්ඛු? භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති: 'ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ආකඞ්ඛමානො ච භගවා එකම්පි ලොකධාතුං පස්සෙය්‍ය. ද්වෙපි ලොකධාතුයො පස්සෙය්‍ය. තිස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය. චතස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය. පඤ්චපි ලොකධාතුයො පස්සෙය්‍ය. දසපි ලොකධාතුයො පස්සෙය්‍ය. වීසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. තිංසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. චත්තාලීසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. පඤ්ඤාසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. සතම්පි ලොකධාතුයො පස්සෙය්‍ය. සහස්සිම්පි චූළනිකං ලොකධාතුං පස්සෙය්‍ය. ද්විසහස්සිම්පි[3] මජ්ඣිමිකං ලොකධාතුං පස්සෙය්‍ය. තිසහස්සිං මහාසහස්සිම්පි ලොකධාතුං[4] පස්සෙය්‍ය. යාවතා වා පන ආකඞ්ඛෙය්‍ය තාවතකං පස්සෙය්‍ය. එවං පරිසුද්ධං භගවතො දිබ්බං චක්ඛු. එවං භගවා[5] දිබ්බෙන චක්ඛුනාපි විවටචක්ඛු.

1. උම්මාර - සතා. 2. කුට්ටො - සතා. 3. ද්විසහස්සම්පි - සීමු. II.
4. තිසහස්සිම්පි ලොකධාතුං - සතා 5. භගවතා - සීමු II.

කිසෙසින් බුදුහු මසැසිනුදු 'විවටචක්ඛු' වූහ යත්: භාග්‍යවත්හුගේ මසැස්හි නිල්පැහැය ද රන්වන් පැහැය ද රත්පැහැය ද කළුපැහැය ද සුදුපැහැය ද යන පඤ්චවර්ණයෝ විද්‍යමාන වෙති. තවද බුදුන්ගේ අක්ෂිරෝම යම් තැනෙක්හි පිහිටියේද එතැන දියමෙරළියමල් සදිසි ඝනනිල් පිරිසුදු දුකුම්කලු නිල්පැහැ වෙයි. එ ඉක්බිති කිණිහිරිමල් සදිසි සුකසාවන් රන්වන් පිරිසුදු දුකුම්කලු කසාවන් පැහැ වෙයි. බුදුන්ගේ දෙනෙතග රතිඳුගොව් සදිසි සුරත් පිරිසුදු දුකුම්කලු රත්පැහැ වෙයි. මැද රුක්පෙණල ඇට සදිසි ඉතා කළු මොලොක් සිනිඳු පිරිසුදු දුකුම්කලු කළුපැහැ වෙයි. ඉනික්බිති දවගත්තරු සදිසි ඉතා සුදු සිත පඬර පිරිසුදු දුකුම්කලු සුදුපැහැ වේ. බුදුහු අත්බැව ඇසුරු කල පෙර පින්කමින් උපන් ඒ පියවි මසැසින් දහවල්හි දු රැයි දු හාත්පසින් යොදුනක් දකිති. යම් කලෙක චතුරඞ්ගසමන්නාගත අන්ධකාරය වේ ද: හිරු අස්තයට ගියේත් වේ ද, කෘෂ්ණපක්ෂයෙහි පොහොයත් වේ ද, ඝන වූ වනලැහැබත් වේ ද, මහත් කළු වලාකුළු නැගුණේත් වේ ද, මෙබඳු වූ චතුරඞ්ගසමන්නාගත අන්ධකාරයෙහි පවා හාත්පස යොදුනක් දකිති, එහි ඒ භිත්තියක් හෝ දොරක් පවුරක් ගලක් ගසක් වැලක් හෝ රූපදර්ශනයට ආවරණයෙක් නොවේ. ඉදින් එක් තලඇටයෙක් ලකුණු කොට තලගැලෙක බහාලන්නේ නම්, ඒ තලඇටය මැ නඟාගන්නා සේක. බුදුන්ගේ පියවි මසැස මෙසේ පිරිසිදු වේ. මෙසේ බුදුහු මසැසිනුදු විවටචක්ඛු වන සේක.

කිසෙසින් බුදුහු දිවැසිනුදු 'විවටචක්ඛු' වූහ යත්: බුදුහු විශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටියා වූ දිවැසින් ච්‍යුත වන්නාවූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද සුගතියට ගියා වූ ද දුගතියට ගියා වූ ද සත්ත්වයන් බලන සේක: 'යහභ, මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනොදුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්‍ය්‍යයනට උපවාද කළාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටි වශයෙන් සමාදන් වූ විවිධ කර්ම ඇත්තාහු ය. ඔහු කය බිඳීමෙන් මරණින් මත්තෙහි අය රහිත වූ දුකට ගති වූ විවශව පතිත වන නිරයට පැමිණියාහු ය. යළි මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනසුචරිතයෙන් යුක්ත වූවාහු (බුද්ධාදි) ආර්‍ය්‍යයනට උපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිවශයෙන් සමාදන් වූ කර්ම ඇත්තාහු ය. ඔහු කාබුන් මරණින් මතු සුන්දර ගති ඇති සැපයෙන් අග්‍ර වූ ලොකයට පැමිණියාහ'යි කර්ම වූ පරිද්දෙන් පැමිණි සත්ත්වයන් දැනගන්නා සේක. මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මැ සිටි දිවැසින් ච්‍යුත වන්නාවූ ද උපදනාවූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද සුගතියට ගියා වූ ද දුගතියට ගියා වූ ද සත්ත්වයන් බලනා සේක. කර්ම වූ පරිදි (පරලොව) පැමිණි සත්ත්වයන් දැනගන්නා සේක. තවද බුදුහු කැමැති වන්නාහු නම් එක් ලොකධාතුවකු දු බලන සේක. ලොකධාතු දෙකක් ද – තුන් ලොකධාතුවකුදු – සිවු ලොකධාතුවකු දු–පස් ලොකධාතුවකු දු බලන සේක. දස ලොකධාතුවකු දු – විසි ලොකධාතුවකු දු තිස් ලොකධාතුවකු දු සතලිස් ලොකධාතුවකු දු පනස් ලොකධාතුවකු දු සියක් ලොකධාතුහු ද බලන සේක, සහස්‍රී චූලනීලොකධාතුව ද බලන සේක. ද්විසහස්‍රී මධ්‍යමලොකධාතුව ද බලන සේක, ත්‍රිසහස්‍රීමහාසහස්‍රීලොකධාතුව ද බලන සේක. තවද යම් පමණ කැමැති වන සේක් නම්, එපමණ බලන සේක. බුදුන්ගේ දිවැස මෙසේ පරිශුද්ධ වේ. මෙසේ බුදුහු දිවැසිනු දු 'විවටචක්ඛු' වන සේක.

කථං භගවා පඤ්ඤාචක්ඛුනාපි විවටචක්ඛු? භගවා මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො[1] ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො, චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො[2] අනන්තඤාණො අනන්තතෙජො අනන්තයසො, අඩ්ඪො මහද්ධනො ධනවා, නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතා. සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා. මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො. මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡාසමන්නාගතා. සො හි භගවා ජානං ජානාති, පස්සං පස්සති. චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා, ධම්මස්සාමී තථාගතො. නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං[3] පඤ්ඤාය, අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති. යං කිඤ්චි ඤෙය්‍යං[4] නාම අත්ථි ධම්මං ජානිතබ්බං, අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො[5] වා අත්ථො පරමත්ථො වා අත්ථො, සබ්බං තං අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්තති. සබ්බං වචීකම්මං - සබ්බං මනොකම්මං ඤාණානුපරිවත්තති. අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං අනාගතෙ - පච්චුප්පන්නෙ අප්පටිහතං ඤාණං. යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං. තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵස්සිතානං හෙට්ඨිමං[6] සමුග්ගපටලං උපරිමං[7] නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ, එවමෙවං බුද්ධස්ස භගවතො ඤෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො. යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා.

---

1 හාසපඤ්ඤො - සයා. 2. ධොරෙය්‍යො - සයා. 3 අඵුසිතං - සයා.
4. ඤෙයං - සීමු. II. PTS. 5. වොදානො - සයා.
6. හෙට්ඨිමං ච - සයා 7. උපරිමං ච - සයා

කිසෙයින් බුදුහු පැනැසිනු ද 'විවටච්ඡදු' වූහ යත්? බුදුහු මහත් ප්‍රඥා ඇතියහ. පතල ප්‍රඥා ඇතියහ, ශීඝ්‍ර ප්‍රඥා ඇතියහ, දිවෙන ප්‍රඥා ඇතියහ, තියුණු ප්‍රඥා ඇතියහ, විනිවිද යන ප්‍රඥා ඇතියහ, ප්‍රඥාප්‍රභේදයෙහි නිපුණයහ, ප්‍රභේදයට පැමිණි ඥාන ඇතියහ, අධිගම කළ ප්‍රතිසංවිද් ඇතියහ. චතුර්වෛශාරද්‍යයට පැමිණියහ, දශබලධාරීහ, පුරුෂශ්‍රේෂ්ඨයහ, පුරුෂසිංහයහ, පුරුෂනාගයහ, පුරුෂාජානෙයහ, පුරුෂධෞරෙයහ. අනන්තඥානයහ, අනන්ත තෙජස් ඇතියහ, අනන්ත යශස් ඇතියහ. (ප්‍රඥාධනයෙන්) ආඪ්‍යයහ, මහත් වූ ප්‍රඥාධන ඇතියහ, ප්‍රඥාධනවත්හ. (නිවනට පමුණුවන හෙයින්) නෙතෘ වූහ, (වෛනෙයයන් විනයන කරන හෙයින්) විනෙතෘ වූහ, සැක සිඳුනා හෙයින්) අනුනෙතෘ වූහ. (අර්ථය) පනවනුවහ, නිශ්චය කරවනුවහ, (පිළිවෙත්) දක්වනුවහ, (ප්‍රතිපත්තිඵලයෙන්) පහදනුවහ. තවද ඒ බුදුහු (නූපන් විරූ) ආර්යමාර්ග සිය සන්තන්හි ඉපැදවූහ, (වෛනෙය සන්තානයෙහි) අසඤ්ජාතමාර්ගය උපදවනුවහ, ප්‍රකාශ නො කළ මාර්ගය (විවරණ වශයෙන් ප්‍රකාශ කරනුවහ, (ප්‍රත්‍යවෙක්ෂා වශයෙන්) මාර්ගය දතුවහ, මාර්ගය දත්නා සුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ. තවද මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදි ගුණයෙන්) පසුපස යමින් වෙසෙත්. ඒ බුදුහු දතයුතු ඥෙයධර්මය දනිති. දැක්ක යුතු ඥෙයපථය නුවණැසින් දකිති. (දර්ශන පරිණායක හෙයින්) ඇසක් මෙන් වූහ, ඥානමය වූහ, ධර්මමය වූහ, ශ්‍රෙෂ්ඨ වූහ, (දහම් දෙසන හෙයින්) වක්තෘ වූහ, ප්‍රවක්තෘ වූහ, (අර්ථය දක්වනුයෙන් නින්නෙතෘ වූහ, අමෘතය දෙනුවහ, ධර්මස්වාමීහ, තථාගත වූහ. ඒ බුදුන් විසින් (මඟනැණින්) නො දත්නා ලද්දක් (නුවණැසින්) නො දක්නා ලද්දක් අවිදිත වූවක් නො පසක් කරන ලද්දක් ප්‍රඥාවෙන් ස්පර්ශ නො කරන ලද්දක් නැති. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයෙක් වේ ද, අතීතානාගතප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට සඞ්ඛතාසඞ්ඛත වූ සියලු ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුන් ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙත්. ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද දෘෂ්ටධාර්මිකාර්ථය ද සාම්පරායිකාර්ථය ද උත්තානාර්ථය ද ගම්භීරාර්ථය ද ගූඪාර්ථය ද ප්‍රතිච්ඡන්නාර්ථය ද නෙය්‍යාර්ථය ද නීතාර්ථය ද නිර්දෝෂාර්ථය ද නික්ලේශාර්ථය ද පරිශුද්ධාර්ථය ද පරමාර්ථාර්ථය ද යන ඒ සියල්ල බුද්ධඥානය තුළ පැතිර පවතී. භාග්‍යවත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී, සියලු වාක්කර්මය ඥානය අනුව පවතී, සියලු මනඃකර්මය ඥානය අනුව පවතී. අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (-අනාවරණ) ය, අනාගතයෙහි ඥානය අනාවරණ ය, ප්‍රත්‍යුත්පන්නයෙහි ඥානය අනාවරණ ය. දතයුත්ත යම් පමණ ද ඥානය එ පමණ ය. ඥානය යම් පමණ ද දතයුත්ත එ පමණ ය. ඥානය ඥෙය පර්යන්තික ය, ඥෙයය ඥානපර්යන්තික ය. ඥෙයය ඉක්මැ ඥානයෙක් නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති, ඒ ධර්මයෝ අන්‍යොන්‍යපර්යන්තයෙහි පවත්නා සුල්ලහ. යම්සේ මනාකොට පැහැසූ සමුග්ගපටල (-තැටි) දෙකක්හුගේ යට සමුග්ගපටල උපරිමය නො ඉක්මවා ද, උඩ සමුග්ගපටල හෙට්ඨිමය නො ඉක්මැ සිටී ද, ඔවුහු ඔවුනොවුන්ගේ කෙළවර සිටුනා සුලු වෙත් ද; එසෙයින් භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යොන්‍යපර්යන්තයෙහි පවත්නා සුල්ලහ; යම් තාක් ඥෙයය ද ඒ තාක් ඥාන ය, යම් තාක් ඥානය ද ඒ තාක් ඥෙය ය; ඥානය ඥෙයපර්යන්තික ය, ඥෙයය ඥානපර්යන්තික ය; ඥෙයය ඉක්මැ ඥානය නො පවතී, ඥානය ඉක්මැ ඥෙය්‍ය පථයෙක් නැති, ඒ දහම්හු අන්‍යොන්‍යපර්යන්තයෙහි සිටුනා සුල්ලහ.

සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛපටිබද්ධා මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා. සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙසං සත්තානං භගවා ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං ජානාති, අධිමුත්තිං ජානාති. අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තොමහාසමුද්දෙ පරිවත්තන්ති, එවමෙවං සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි පක්ඛී අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙවං යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය, තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති. බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨති. යෙ ච තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා[1] කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හං අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගූළ්හානි ච පටිච්ඡන්නානි ච. කථිතා විස්සජ්ජිතා ච තෙ පඤ්හා භගවතා[2] හොන්ති නිද්දිට්ඨකාරණා. උපක්ඛිත්තකා ච[3] තෙ භගවතො සම්පජ්ජන්ති. අථඛො භගවා ච තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති. එවං භගවා පඤ්ඤාචක්ඛුනාපි විවටචක්ඛු.

කථං භගවා බුද්ධචක්ඛුනාපි විවටචක්ඛු? භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ, අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ. සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අනුග්ගතානි අන්තොනිමුග්ගපොසීනි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි සමොදකං ඨිතානි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවඩ්ඪානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති අනුපලිත්තානි උදකෙන, එවමෙවං භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ, අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ.

1. නිදූඤ්ඤ - සං. 2. භගවතො - සීමු. II.
3. උපක්ඛිත්තකා ච - සීමු. II.

සියලු දහම් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී. සියලු දහම්හු භාග්‍යවත් බුදුන්ගේ මනොද්වාරාවර්ජිතයට අයත්හු වෙති, රුචිය ප්‍රතිබද්ධයහ, මනසිකාර ප්‍රතිබද්ධයහ, චිත්තොත්පාද ප්‍රතිබද්ධයහ. සියලු සතුන් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී. බුදුහු සියලු සතුන් ගේ ආශය දනිති, අනුශය දනිති, චරිතය දනිති, අධිමුක්තිය දනිති. (නුවණැසෙහි) අල්ප වූ රාගාදි රජස් ඇති මහත් වූ රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති සුන්දර වූ (ශ්‍රද්ධාදි) ආකාර ඇති ගර්හිත වූ (අශ්‍රද්ධාදි) ආකාර ඇති සුවිඥෙය්‍ය වූ දුර්විඥෙය්‍ය වූ භව්‍යාභව්‍ය සත්ත්වයන් දනානිත්. මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත ලෝවැසි තෙම - දෙවිමිනිසුන් සහිත වූ මහණබමුණන් සහිත ප්‍රජාව, ඇතුළු බුදුනුවණෙහි පවතී. තිමි - තිමිඞ්ගල පටන් යම් මස් - කැසුබු කෙනෙක් වෙත් නම්, ඔහු යම්සේ ඇතුළු මහමුහුදෙහි හැසිරෙත් ද, එසේසින් මරුන් බඹුන් සහිත වූ සදෙවක ලොක තෙමේ - ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත සදෙවමනුෂ්‍යප්‍රජාව ඇතුළු බුදුනුවණෙහි පවතී. යම්සේ විනතා පුත් ගුරුළුරජහු පටන් යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම්, ඔහු අහසැ පෙදෙසකැ හැසිරෙත් ද, එසෙයින් මැ යම් කෙනෙක් නුවණින් සැරියුත් තෙරුන් සම වූවාහු නම්, ඔව්හු ද බුද්ධඥානයාගේ පෙදෙසෙක පවත්නාහුය. බුද්ධඥානය දෙව්මිනිසුන්ගේ ප්‍රඥාව පැතිරැ මැඩගෙනැ සිටී. නිපුණ වූ කල පරවාද ඇති වල්විදුනා දුනුවායන් බඳු ප්‍රසිද්ධ වූ යම් ක්‍ෂත්‍රිය-බ්‍රාහ්මණ - ගෘහපති - ශ්‍රමණපණ්ඩිත කෙනෙක් ප්‍රඥාවෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද බොහෝ ප්‍රශ්න රචනා කොට බුදුන් වෙත පැමිණ විචාරත් ද, භාග්‍යවතුන් විසින් ඒ ප්‍රශ්නයෝ සකාරණ ව කියන ලද්දාහු විසදන ලද්දාහු මැ වෙත්. ඔව්හු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක බවට (උපාසක බවට හෝ) පැමිණියාහු මැ වෙත්. යළි බුදුහු මැ එහි ප්‍රඥාවෙන් අතිශයින් ප්‍රකාශ වෙත් නුයි මෙසේ බුදුහු පැනැසිනූ ද 'විවටච්ඡද්‍ද' වූහ.

කිසෙසින් බුදුහු බුදුඇසිනු ද 'විවටච්ඡද්‍ද' වූහ යත්: බුදුහු බුදුඇසින් ලොව බලන සේක් (නුවණැසින්) අල්ප වූ (රාගාදි) කෙලෙස්රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති (ශ්‍රද්ධාදි) සුන්දරාකාර ඇති ගර්හිත වූ (අශ්‍රද්ධාදි) ආකාර ඇති සුවිඥෙය්‍ය වූ දුර්විඥෙය්‍ය වූ සත්ත්වයන්, ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භයවශයෙන් දක්නා සුලු වැ වසනුවන්, ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භයවශයෙන් දක්නා සුලු වැ නො වසනුවන් දුටු සේක. යම්සේ උපුල්විලකැ හෝ පියුම්විලකැ හෝ නෙළුම්විලකැ හෝ ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් නො නැඟුණාහු ඇතුළත ගැලී පොහොනී වූවාහු ද, ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දිය හා සම වැ සිටියාහු ද, ඇතැම් උපුල් හෝ පියුම් හෝ නෙළුම් හෝ දියෙහි හටගත් තාහු දියෙහි වැඩුණාහු දියෙන් උඩට නැඟී දිය හා නො වැකුණාහු සිටිත් ද, එසෙයින් ම බුදුහු බුදුඇසින් ලොව බලන සේක් අල්පරජසක වූ ද මහා-රජස්ක වූ ද තියුණු ඉඳුරන් ඇත්තාවූ ද මෘදු ඉඳුරන් ඇත්තාවූ ද සුන්දරා-කාර වූ ද ගර්හිතාකාර වූ ද සුවිඥෙය්‍ය වූ ද දුර්විඥෙය්‍ය වූ ද සත්ත්වයන්, පර-ලොකයෙහිත් වද්‍යයෙහිත් භය දක්නාසුලු වැ වසනුවන්, ඇතැම් කෙනකුන් පරලොක වද්‍යයෙහි භය දක්නාසුලු වැ නො වසනුවන් දුටු සේක.

ජානාති භගවා අයං පුග්ගලො රාගචරිතො, අයං දොසචරිතො, අයං මොහචරිතො, අයං විතක්කචරිතො, අයං සද්ධාචරිතො, අයං ඤාණචරිතොති. රාගචරිතස්ස භගවා පුග්ගලස්ස අසුභකථං කථෙති. දොසචරිතස්ස භගවා පුග්ගලස්ස මෙත්තාභාවනං ආචික්ඛති. මොහචරිතං භගවා පුග්ගලං උද්දෙසෙ පරිපුච්ඡාය කාලෙන ධම්මස්සවනෙ කාලෙන ධම්මසාකච්ඡාය ගරුසංවාසෙ නිවෙසෙති. විතක්කචරිතස්ස භගවා පුග්ගලස්ස ආනාපානස්සතිං ආචික්ඛති. සද්ධාචරිතස්ස භගවා පුග්ගලස්ස පසාදනීයං නිමිත්තං ආචික්ඛති බුද්ධසුබොධිං ධම්මසුධම්මතං සඞ්ඝසුප්පටිපත්තිං සීලානි ච අත්තනො. ඤාණචරිතස්ස භගවා පුග්ගලස්ස ආචික්ඛති විපස්සනානිමිත්තං අනිච්චාකාරං දුක්ඛාකාරං අනත්තාකාරං.

1. “සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ,
පාසාදමාරුය්හ සමන්තචක්ඛු,
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූත”න්ති.[a]

එවං භගවා බුද්ධචක්ඛුනාපි විවටචක්ඛු.

කථං භගවා සමන්තචක්ඛුනාපි විවටචක්ඛු? සමන්තචක්ඛු වුච්චති සබ්බඤ්ඤුතඤාණං; භගවා සබ්බඤ්ඤුතඤාණෙන උපෙතො සමුපෙතො උපගතො[1] සමුපගතො[2] උපපන්නො සම්පන්නො සමන්නාගතො.

2. “න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං[3]
තථාගතො තෙන සමන්තචක්ඛූ”ති[b].

එවං භගවා සමන්තචක්ඛුනාපි විවටචක්ඛූති – අකිත්තායි විවටචක්ඛු.

සක්ඛිධම්මං පරිස්සයවිනයන්ති – ‘සක්ඛිධම්ම’න්ති න ඉතිහිතිහං න ඉතිකිරාය න පරම්පරාය න පිටකසම්පදාය න තක්කහෙතු න නයහෙතු න ආකාරපරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයමභිඤ්ඤාතං අත්තපච්චක්ඛං ධම්මන්ති සක්ඛිධම්මං.

---

1. උපාගතො - පු. සීමු. II. 2. සමුපාගතො - පු සීමු. II.
3. ඤෙය්‍යං - සීමු. II.

a. දීඝනිකාය - මහාපදානසුත්ත, මජ්ඣිමනිකාය - අරියපරියෙසනසුත්ත, බොධිරාජකුමාර සුත්ත බ්‍රාහ්මසංයුත්ත - පඨමවග්ග, ඉතිවුත්තක - දුතියවග්ග.
b පටිසම්භිදාමග්ග - ඤාණකථා, ඉන්ද්‍රියකථා.

'මේ පුද්ගල තෙම රාගචරිතයෙක, මේ දොෂචරිතයෙක, මේ මොහචරිතයෙක, මේ විතර්කචරිතයෙක, මේ ශ්‍රද්ධාචරිතයෙක, මේ ඥානචරිතයෙකැ'යි බුදුහු දැනගන්නා සේක. බුදුහු රාග බහුල පුද්ගලයාහට අශුභකථාව වදාරති. දොෂබහුල පුද්ගලයාහට බුදුහු මෛත්‍රීභාවනාව පවසති. බුදුහු මොහ බහුල පුද්ගලයා උදෙසීමෙහි ද පරිපෘච්ඡා (-අටුවා) යෙහි කලෙක (-සුදුසු කල්හි) ධර්මශ්‍රවණයෙහි ද කලෙක ධර්මසාකච්ඡාවෙන් ගුරුන් ඇසුරැ කිරීමෙහි ද (ඇදුරන් වෙත) සිටුවන සේක. බුදුහු විතර්ක බහුල පුද්ගලයාහට ආනාපානසතිය දෙසන සේක. ශ්‍රද්ධා බහුල පුද්ගලයාට බුදුහු ප්‍රසාද උපදවන සූත්‍රයක් ද බුදුන්ගේ බුද්ධත්වප්‍රතිවෙධය ද ධර්මය ස්වාඛ්‍යාත බව ද සඞ්ඝයා සුප්‍රතිපන්න බව ද තමා සතු ශීලයන් ද පවසන සේක. ඥානචරිත පුද්ගලයාහට බුදුහු (උදයව්‍යයාදි) විදර්ශනානිමිත්ත වූ අනිත්‍යාකාරය දුඃඛාකාරය අනාත්මාකාරය පවසන සේකි.

1. යම්සේ සෙල්මුවා පව්වක් මත සිටි යේ මැ (ඇස් ඇති පුරුෂයෙක්) හාත්පස ජනතාව බලන්නේ ද, එසෙයින් ඔබ ද සුන්දර ප්‍රඥා ඇති සමන්තචක්ෂුස් වූ භාග්‍යවත්නි, දහම්මුවා පහයට නැඟී (තුමූ) පහවූ ශොක ඇත්තහු ශොකයට බට ජාතිජරායෙන් මඩනා ලද ජනතාව බලනු මැනැවැ'යි.

මෙසේ බුදුහු බුදුඇසිනුදු 'විවටචක්ඛු' වූහ.

කිසෙයින් බුදුහු සමන්තාත් චක්ෂුසිනු දු 'විවටචක්ඛු' වූහ යත්: 'සමන්තචක්ඛු'යි සර්වඥතාඥානය කියනු ලැබෙයි. බුදුහු සර්වඥතාඥානයෙන් උපෙතයහ, සමුපෙතයහ, උපගතයහ, සමුපගතයහ, නො වෙන් වූහ, පරිපූර්ණයහ සමන්විත වූහු.

2. ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුකලොකයෙහි (මෙ කල හෝ) පැනැසින් නුදුටු කිසිවක් නැත, යළි (අතීත වූ) නො දත් කිසිවක් නැත, (අනාගත වූ) නො දනෙන කිසි (ධර්මජාතයෙකු) දු නැත. දතයුතු වූ යම් ධර්මජාතයෙක් වේ නම් ඒ සියල්ල අවබොධ කළහ. එහෙයින් තථාගතයෝ 'සමන්තචක්ඛු' වූහ.

මෙසේ බුදුහු සර්වඥතාඥානයෙනු දු 'විවටචක්ඛු' වූවාහු නුයි 'අභිත්‍යාසී විවටචක්ඛු' යනු වේ.

**සක්ඛිධම්මං පරිස්සයවිනයං** – 'සක්ඛිධම්මං' යනු: 'මෙසේ මෙසේ වී ලැයි නො වැ, 'තෙල මෙසේ ලැ'යි නො වැ, පරම්පරාකථාවෙනු දු නො වැ. 'පිටක සම්ප්‍රදාය හා සම වේ යැ'යි නො වැ, තර්කහෙතුවෙනු දු නො වැ, නයග්‍රහණයෙනු දු නො වැ, ('මේ සොඳුරු යැ'යි) කරුණු සැලකීමෙනු දු නො වැ 'අපට රුචි වූ දෘෂ්ටිය හා සම වේ යැ'යි, නො වැ, තෙමේ මැ තමා විසින් නුවණින් අවබොධ කළ, තමා ඊසින් ප්‍රත්‍යවෙක්ෂා කළ ධර්මය නුයි 'සක්ඛිධම්මං' යනු එවි.

**පරිස්සයවිනයන්ති** 'පරිස්සයා'ති ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච.

කතමෙ පාකටපරිස්සයා? සීහා ව්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා හත්ථී අහි විච්ඡිකා සතපදී චොරා වා අස්සු මාණවා වා කතකම්මා වා අකතකම්මා වා, චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො, දද්දු කණ්ඩු කච්ඡු රඛසා[1] විතච්ඡිකා ලොහිතපිත්තං මධුමෙහො අංසා පිළකා භගන්දලා, පිත්තසමුට්ඨානා ආබාධා, සෙම්හසමුට්ඨානා ආබාධා, වාතසමුට්ඨානා ආබාධා, සන්නිපාතිකා ආබාධා, උතුපරිණාමජා ආබාධා, විසමපරිහාරජා ආබාධා, ඔපක්කමිකා ආබාධා, කම්මවිපාකජා ආබාධා, සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සා ඉති වා, ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා.

කතමෙ පටිච්ඡන්නපරිස්සයා? කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං, කාමච්ඡන්දනීවරණං ව්‍යාපාදනීවරණං ථීනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං, රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතානි සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා. ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා.

**පරිස්සයාති** - කෙනට්ඨෙන පරිස්සයා? පරිසහන්තීති පරිස්සයා, පරිහානාය සංවත්තන්තීති පරිස්සයා, තත්‍රාසයාති පරිස්සයා. කථං පරිසහන්තීති පරිස්සයා? තෙ පරිස්සයා තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති මද්දන්ති. එවං පරිසහන්තීති පරිස්සයා. කථං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා? තෙ පරිස්සයා කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. කතමෙසං කුසලානං ධම්මානං? සම්මාපටිපදාය අනුලොමපටිපදාය අපච්චනීකපටිපදාය අන්වත්ථපටිපදාය ධම්මානුධම්මපටිපදාය සීලෙසු පරිපූරකාරිතාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය භොජනෙ මත්තඤ්ඤුතාය ජාගරියානුයොගස්ස සතිසම්පජඤ්ඤස්ස, චතුන්නං සතිපට්ඨානානං භාවනානුයොගස්ස, චතුන්නං සම්මප්පධානානං - චතුන්නං ඉද්ධිපාදානං - පඤ්චන්නං ඉන්ද්‍රියානං - පඤ්චන්නං බලානං - සත්තන්නං බොජ්ඣඞ්ගානං - අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගස්ස. ඉමෙසං කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. එවම්පි පරිහානාය සංවත්තන්තීති පරිස්සයා.

1. නඛසා - කළුවි.

**පරිස්සයවිනයං** - පරිස්සය යනු: ප්‍රකට උපද්‍රවයෝ ද, ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ දැයි පරිශ්‍රය දෙකෙකි: ප්‍රකට උපද්‍රවයෝ කවරහු යත්: සිහ යැ වග යැ දිවි යැ වලස් යැ තරස් යැ වෘක යැ මහිෂ යැ ඇත් යැ අහි යැ තුහුසු යැ කළ සොරකම් ඇති හෝ නැති හෝ සොරු හෝ සැහැසියෝ හෝ වන්නාහුය. චක්ෂූරෝග යැ ශ්‍රෝත්‍රරෝග යැ ඝ්‍රාණරෝග යැ ජිහ්වාරෝග යැ කායරෝග යැ ශීර්ෂරෝග යැ මුඛරෝග යැ දන්තරෝග යැ කාශ යැ ශ්වාස යැ පීනස යැ දාහ යැ ජ්වර යැ කුක්ෂිරෝග යැ මූර්ඡා යැ ලෝහිතාතිසාර යැ ආමශූල යැ මහාවිරේචන යැ කුෂ්ඨ යැ ගණ්ඩ යැ කාර යැ ක්ෂයරෝග යැ වස්මර යැ දද යැ කණ්ඩුති යැ මහාකුෂ්ඨ යැ නියඟිරි යැ අතුල් පතුල් පැළීම යැ රත්පිත යැ මධුමෙහ යැ අර්ශස් යැ පොළු යැ භගන්දරා යැ පිතින් උපදනා රෝග යැ සෙමින් උපදනා රෝග යැ වසින් උපදනා රෝග යැ තුන්දොසින් උපදනා රෝග යැ, සෘතුවිපර්‍යාසයෙන් උපදනා රෝග යැ විෂම පැවැත්මෙන් උපදනා රෝග යැ උපක්‍රමයෙන් හටගන්නා රෝග යැ කර්මවිපාකයෙන් හටගන්නා රෝග යැ, ශීත - උෂ්ණ - සා - පවස් මල - මූ යැ, මැසි - මදුරු - වා - අව් - දික්දූපහස් යැ යන මොහු හෝ යි. මොහු ප්‍රකට උපද්‍රවයෝ යැයි කියනු ලැබෙත්.

ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ කවරහු යත්: කායදුශ්චරිත යැ වාග්දුශ්චරිත යැ මනෝදුශ්චරිත යැ, කාමච්ඡන්දනීවරණ යැ ව්‍යාපාදනීවරණ යැ ථීනමිද්ධනීවරණ යැ උද්ධච්චකුක්කුච්චනීවරණ යැ විචිකිච්ඡානීවරණ යැ, රාග යැ ද්වේෂ යැ මෝහ යැ ක්‍රෝධ යැ බද්ධවෛර යැ මකුබව යැ යුගග්‍රාහ යැ ඊර්ෂ්‍යා යැ මාත්සර්‍ය යැ මායා යැ ශාඨ්‍ය යැ ස්තම්භ යැ කරණුත්තරියකරණ යැ මාන යැ අතිමාන යැ මද යැ ප්‍රමාද යැ, සියලු ක්ලේශයෝ යැ, සියලු දුශ්චරිතයෝ යැ, සියලු දරථයෝ යැ, සියලු පරිදාහයෝ යැ, සියලු සන්තාපයෝ යැ, සියලු අකුශලාභිසංස්කාරයෝ යැ, යන මොහු ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ යැයි කියනු ලැබෙත්.

**පරිස්සයා** යනු: කවර අරුතෙකින් පරිශ්‍රය වූවාහු ද යත්: පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රයයෝ යැ, පරිහාණියට වැටෙත් නුයි පරිශ්‍රයයෝ යැ එහි වෙසෙත් නුයි පරිශ්‍රයයෝ යි. කිසෙයින් පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රය වූහ යත්? ඒ උපද්‍රවයෝ ඒ පුහුල්හු සහනය කෙරෙති, හාත්පසින් සහනය කෙරෙති, අභිභවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් අල්වාගනිති, මර්දනය කෙරෙත්. මෙසෙයින් පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රය නම් වෙත්. කිසෙයින් පරිහාණියට වැටෙත් නුයි පරිශ්‍රය වූහ යත්? ඒ උපද්‍රවයෝ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවත්නාහුය. කවර කුශලධර්මයන්ගේ ද යත්? සම්‍යක්ප්‍රතිපත්තිය අනුලෝම-ප්‍රතිපත්තිය අවිරුද්ධප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමෝක්ෂශීලයෙහි පරිපූරකාරිත්වය ඉන්ද්‍රියයන්හි ගොපිතද්වාර ඇතිබව භෝජනයෙහි මාත්‍රඥ බව නිදි දුරු කිරීමෙහි යෙදීම ස්මෘතිසම්ප්‍රජන්‍යය, සතර සිවටන් භාවනාවෙහි යෙදීම සතර සම්‍යක්ප්‍රධානය සතර ඍද්ධි-පාදය පඤ්චෙන්ද්‍රියය පඤ්චබලය සප්ත බොධ්‍යඞ්ගය ආර්‍ය අෂ්ටාඞ්ගික-මාර්ගය (යන මොවුන්ගේ) භාවනාවෙහි යෙදීම - (යන) මේ කුශලධර්මයන් ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවතිත්. මෙසේත් පරිහාණියට වැටෙත් නුයි පරිශ්‍රය නම් වෙත්.

කථං තත්‍රාසයාති පරිස්සයා: තස්මිංයෙව පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයා. යථා බිලෙ බිලාසයා පාණා සයන්ති, දකෙ දකාසයා පාණා සයන්ති, වනෙ වනාසයා පාණා සයන්ති, රුක්ඛෙ රුක්ඛාසයා පාණා සයන්ති, එවමෙවං තස්මිංයෙව පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයාති. එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තඤ්හෙතං භගවතා:

“සාන්තෙවාසිකො භික්ඛවෙ, භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු විහරති. කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරති? ඉධ භික්ඛවෙ, භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස[1] අන්තො වසන්ති අන්වාස්සවසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති, තස්මා සාචරියකොති වුච්චති. පුනචපරං භික්ඛවෙ භික්ඛුනො සොතෙන සද්දං සුත්වා - ඝානෙන ගන්ධං ඝායිත්වා - ජිව්හාය රසං සායිත්වා - කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා. ත්‍යාස්ස අන්තො වසන්ති, අන්වාස්ස වසන්ති පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකං අකුසලා ධම්මාති, තස්මා සාචරියකොති වුච්චති. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු විහරතී”ති.[a] එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තඤ්හෙතං භගවතා;

“තයො’මෙ භික්ඛවෙ අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා. කතමෙ තයො? ලොභො භික්ඛවෙ, අන්තරාමලං අන්තරාමිත්තො අන්තරාසපත්තො අන්තරාවධකො අන්තරාපච්චත්ථිකො. දොසො භික්ඛවෙ - මොහො භික්ඛවෙ අන්තරාමලං අන්තරාමිත්තො අන්තරාසපත්තො අන්තරාවධකො අන්තරාපච්චත්ථිකො. ඉමෙ ඛො භික්ඛවෙ, තයො අන්තරා මලා අන්තරා මිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකාති.[b]

3. අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.[b]

1. ත්‍යාස්ස - සිමු. II. මජසං
2. අන්වාස්සවසන්ති - සිමු. II අනුවාස්ස වසන්ති - සං. අන්වාස්ස වසන්ති - ස.
a. සළායතනසංයුත්ත - නවපුරාණවග්ග   b. ඉතිවුත්තක - චතුත්ථවග්ග - මලසුත්ත

කිසෙයින් එහි වෙසෙත් නුයි පරිශ්‍රය වූහ යත්: ඒ ආත්මභාවයෙහි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසුරු කොට උපදිත්. යම්සේ බිලයෙහි බිලාශ්‍රය ප්‍රාණීහු හොවිත් ද, දියෙහි ජලාශ්‍රය ප්‍රාණීහු හොවිත් ද, වෙනෙහි වනාශ්‍රය ප්‍රාණීහු හොවිත් ද, රුකෙහි වෘක්ෂාශ්‍රය ප්‍රාණීහු හොවිත් ද, එසෙයින් ම ඒ අත්බවෙහි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසුරු කොට උපදිත් නුයි මෙසේත් එහි වෙසෙත් නුයි පරිශ්‍රය නම් වෙත්.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

"මහණෙනි, සාන්තෙවාසික වූ (-අන්තෙවාසික කෙලෙස් සමග වසන) සාචාර්යක වූ (-සමුදාචරණ කෙලෙස් සමග වසන) මහණ තෙමේ දුකසේ නො සුවසේ වෙසෙයි. මහණෙනි, කිසෙයින් සාන්තෙවාසික වූ සාචාර්යක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙයි යත්: 'මහණෙනි, මෙහි මහණක් හට ඇසින් රූපයක් දැක, (නොයෙක් අරමුණෙහි හැසිරීම් වශයෙන් උපන්) සඞ්කල්පනා ඇයි සංයොජනයන්ට හිත වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම්, ඒ ලාමක අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති, ඔහුගේ සන්තානය අනුව ගොස් වෙසෙත් නුයි එහෙයින් සාන්තෙවාසික යි කියනු ලැබෙයි. ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු කෙරෙහි නිරතුරු හැසිරෙයි, ඔහු හෝ හසුරුවත් නුයි එහෙයින් 'සාචරියක'යි කියනු ලැබේ. තවද මහණෙනි, මහණක්හට කනින් ශබ්දයක් අසා-නැහැයෙන් ගන්ධයක් ආඝ්‍රාණය කොට - දිවින් රසයක් විඳ - කයින් පහසක් පැහැස - මනසින් දහමක් දැන අරමුණෙහි හැසිරීමෙන් උපන් සඞ්කල්පනා ඇයි සංයොජනයන්ට හිත වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම් ඒ ලාමක අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති, ඔහුගේ සන්තානය අනුව ගොස් වෙසෙත් නුයි එහෙයින් 'සාන්තෙවාසික' යි කියනු ලැබෙයි. ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු කෙරෙහි හැසිරෙති. ඔහු හෝ හසුරුවත් නුයි එහෙයින් 'සාචරියක' යයි කියනු ලැබේ. මෙසේත් මහණෙනි, සාන්තෙවාසික වූ සාචරියක වූ මහණ දුකසේ නො සුවසේ වෙසේ යයි. මෙසේත් එහි වෙසෙත් නුයි පරිශ්‍රය වෙත්.

වදාරන ලද මැය බුදුන් විසින්:

"මහණෙනි, මේ ඇතුළත මලයෝ ඇතුළත අමිත්‍රයෝ ඇතුළත සතුරෝ ඇතුළත වධකයෝ ඇතුළත පසමිතුරෝ තිදෙනෙක් වෙති. කවර තිදෙනෙක් ද යත්: මහණෙනි, ලෝභය ඇතුළත මල යැ ඇතුළත අමිත්‍ර යැ ඇතුළත සතුරු යැ ඇතුළත වධක යැ ඇතුළත පසමිතුරු යි· මහණෙනි, ද්වේෂය - මහණෙනි, මෝහය අභ්‍යන්තර්මල යැ අභ්‍යන්තරමිත්‍ර යැ අභ්‍යන්තර් සපත්න යැ අභ්‍යන්තර් වධක යැ අභ්‍යන්තර් ප්‍රත්‍යනීක යි. මහණෙනි, මොහු තිදෙන අභ්‍යන්තර් මලයෝ යැ අභ්‍යන්තරමිත්‍රයෝ යැ අභ්‍යන්තර් සපත්නයෝ යැ අභ්‍යන්තර් වධකයෝ යැ අභ්‍යන්තර් ප්‍රත්‍යනීකයෝ යැ"යි.

3. ලෝභය අනර්ථ උපදවන්නේ යැ. ලෝභය (කුසල්) සිත චලනන්නේ යැ. අභ්‍යන්තරයෙහි උපන් භයෙකැ. බාලජන තෙමේ එය නොදනී·

4. ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං ලොභො සහතෙ නරං.

5. අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

6. කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං කොධො සහතෙ නරං.

7. අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

8. මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති,
අන්ධන්තමං තදා හොති යං මොහො සහතෙ නර"න්ති.a

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

"තයො ඛො'මෙ මහාරාජ, පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. කතමෙ තයො: ලොභො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. දොසො ඛො මහාරාජ - මොහො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. ඉමෙ ඛො මහාරාජ, තයො පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය.b

9. "ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,
හිංසන්ති අත්තසම්භූතා තචසාරං'ව සම්ඵල"න්තිb

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තඤ්හෙතං භගවතා:

10. "රාගො ච දොසො ච ඉතොනිදානා
අරතී රතී ලොමහංසා ඉතොජා,
ඉතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා ධඞ්කමිවොස්සජන්තී"ති.c

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

**පරිස්සය විනයන්ති** - පරිස්සයවිනයං පරිස්සයපහානං පරිස්සයවූපසමං පරිස්සයපටිනිස්සග්ගං පරිස්සයපටිප්පස්සද්ධිං අමතං නිබ්බානන්ති - සඞ්ඛිධම්මං පරිස්සයවිනයං.

---

a. ඉතිවුත්තක - චතුත්ථවග්ග - මලසුත්ත

b. කොසලසංයුත්ත - පඨමවග්ග.

c. සුත්තනිපාත - සූචිලොමසුත්ත.

4. ලොභී තෙමේ (ලොභී - ලොද්‍රුතුරා) අර්ථය නො දනී. ලුබ්ධ තෙමේ දහම් නො දකී. යම් හෙයකින් ලොභය තෙමේ මිනිසා අභිභවා ද එකල්හි බහලාන්ධකාරය වේ.

5. ද්වේෂය අනර්ථජනක යැ. ද්වේෂය කුසල් සිත චලහන්නේ යැ. ඇතුලත උපන් භයෙකැ. බාලජන තෙමේ එය නො දනගනී.

6. කිපියේ අර්ථය නො මැ දනී. කිපියේ අනර්ථහේතුව නො දකී. යම් හෙයකින් ක්‍රොධය මිනිසා අභිභවා ද එකල්හි බහලාන්ධකාරය වේ.

7. මෝහය අනර්ථජනක යැ. මෝහය කුසල්සිත චලහන්නේ යැ. සිත තුල උපන් භයෙකැ. බාලජන තෙමේ එය අවබොධ නො කෙරේ.

8. මූඪ වූයේ ලෞකික - ලොකොත්තරාර්ථය නො දනී. මූඪ තෙමේ අනර්ථහේතුව නො දකී. යම් හෙයකින් මෝහය තෙමේ මිනිසා අභිභවා ද එකල්හි බහල වූ මෝහාන්ධකාරය වේ යයි.

මෙසේත් තත්‍රාශය නුසි පරිශ්‍රයයෝ යි.

මේ වදාරන ලද මැය බුදුන් විසින්:

"මහරජ, මේ ධර්මයෝ තිදෙනෙක් පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපද-නාහු අහිත පිණිස දුක් පිණිස නො සුවසේ වාසය පිණිස උපද නාහුය. කවර තිදෙනෙක් ද යත්: මහරජ, ලොභය පුරුෂයාගේ සිත තුල උපදනේ අහිතට දුකට නො සුවිහරණයට උපදී. මහරජ, ද්වේෂය... මහරජ, මෝහය පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනේ අහිතට දුකට අඵාසුවිහරණයට උපදී. මහරජ, මේ තුන් ධර්මයෝ පුරුෂයාගේ අධ්‍යාත්-මයෙහි උපදනාහු අහිතට දුකට අඵාසුවිහරණයට උපදනාහු"යි.

9. ලොභය ද ද්වේෂය ද මෝහය ද තම සිත තුල උපන්නාහු සවකීය ඵලය හුණගස සෙයින් පව්සිත් ඇති මිනිසා වනසත්.

මෙසේත් තත්‍රාශය නුසි පරිශ්‍රය නම් වෙත්.

මේ වදාරන ලද මැයි බුදුන් විසින්:

10. රාගයත් ද්වේෂයත් මේ ආත්මභාවය නිදාන කොට ඇත්තාහුය. අරතිය රතිය හා රෝමහර්ෂයෝ මේ අත්බවින් උපන්නාහ. පාපවිතර්කයෝ මේ අත්බවින් ඉපිද කුමරනු හුයින් පා බැඳි කවුඩක්හු සෙයින් හැරපියත්.

මෙසේත් තත්‍රාශය නුසි පරිශ්‍රය නම් වෙත්.

**පරිස්සයවිනයං** - උපද්‍රවප්‍රහාණය උපද්‍රව සන්හිඳීම උපද්‍රව හැරපීම උපද්‍රව දුරලීම වූ අමාමහ නිවන නුයි 'සබ්බධම්මං පරිස්සයවිනයං' යනු වේ.

**පටිපදං වදෙහි භද්දමත්ථූති** - පටිපදං වදෙහි සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං සීලෙසු පරිපූරකාරිතං ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතං භොජනෙ මත්තඤ්ඤුතං ජාගරියානුයොගං සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානෙ චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං; **වදෙහි** ආචික්ඛ දෙසෙහි පඤ්ඤපෙහි පට්ඨපෙහි විවර විභජ උත්තානීකරොහි පකාසෙහීති - පටිපදං වදෙහි; **භද්දමත්ථූති** සො නිම්මිතො බුද්ධං භගවන්තං ආලපති. අථවා, යං ත්වං ධම්මං ආචික්ඛි දෙසෙසි පඤ්ඤපෙසි පට්ඨපෙසි විවරි විභජි උත්තානීඅකාසි පකාසෙසි, සබ්බං තං සුන්දරං භද්දකං කල්‍යාණං අනවජ්ජං සෙවිතබ්බන්ති - පටිපදං වදෙහි භද්දන්තෙ.

**පාතිමොක්ඛමථවාපි සමාධින්ති** - පාතිමොක්ඛන්ති: සීලං පතිට්ඨා ආදි චරණං සංයමො සංවරො මුඛං පමුඛං කුසලානං ධම්මානං සමාපත්තියා.[a] **අථවාපි සමාධින්ති** යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධීති[b] - පාතිමොක්ඛමථවාපි සමාධිං.

තෙනාහ සො නිම්මිතො:

"අකිත්තයී විවටචක්ඛු - සක්ඛිධම්මං පරිස්සයවිනයං,
පටිපදං වදෙහි භද්දන්තෙ - පාතිමොක්ඛමථවාපි සමාධි"න්ති.

## 14 - 8

චක්ඛූහි නෙව ලොලස්ස
ගාමකථාය ආවරයෙ සොතං,
රසෙ ච නානුගිජ්ඣෙය්‍ය
න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං.

**චක්ඛූහි නෙව ලොලස්සාති**- කථං 'චක්ඛුලොලො' හොති ? ඉධෙකච්චො භික්ඛු චක්ඛුලොලො චක්ඛුලොලියෙන සමන්නාගතො හොති: අදිට්ඨං දක්ඛිතබ්බං, දිට්ඨං සමතික්කමිතබ්බන්ති ආරාමෙන ආරාමං, උය්‍යානෙන උය්‍යානං, ගාමෙන ගාමං, නිගමෙන නිගමං, නගරෙන නගරං, රට්ඨෙන රට්ඨං, ජනපදෙන ජනපදං, දීඝචාරිකං අනවත්ථිතචාරිකං[1] අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි චක්ඛුලොලො හොති.

---

a. ඣානවිභඞ්ග. b. ධම්මසඞ්ගණි - චිත්තුප්පාදකණ්ඩ.

1 අනවට්ඨිතචාරිකං - මජසං.

**පටිපදං වදෙහි භද්දමත්‍ථු** - ප්‍රතිපත්තිය වදාළ මැනැව, සම්‍යක් ප්‍රතිපත්තිය අනුලොමප්‍රතිපත්තිය අවිරුද්ධප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමොක්ෂශීලයෙහි පරිපූර්ණකාරීත්වය ඉන්ද්‍රියයන්හි ගොපිතද්වාරතාව භොජනයෙහි මාත්‍රඥතාව ජාගර්‍ය්‍යානුයොගය ස්මෘතිසම්ප්‍රජන්‍යය සතර සතිපට්ඨාන සතර සම්‍යක්ප්‍රධාන සතර ඍද්ධිපාද පඤ්චෙන්ද්‍රිය පඤ්ච බල සප්ත බොධ්‍යඞ්ග ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය හා නිර්වාණය ද නිර්වාණගාමිනීප්‍රතිපත්තිය ද, **වදෙහි** - පැවසුව මැනව, දෙසුව මැනව, පැනවූව මැනව, තැබුව මැනව, විවෘත කළ මැනව, විභාග කළ මැනව, ප්‍රකට කළ මැනව, ප්‍රකාශ කළ මැනවැ යි 'පටිපදං වදෙහි' යනු වේ. **භද්දමත්‍ථු** යනු ඒ නිර්මිත බුදුහු භාග්‍යවත් බුදුන් ආමන්ත්‍රණය කෙරෙති. තොපහොත් නුඹ වහන්සේ යම් දහමක් පැවසූහු ද පැනවූහු ද තැබූහු ද විවෘත කළහු ද විභාග කළහු ද ප්‍රකට කළහු ද දෙසූහු ද, ඒ සියල්ල සුන්දර යැ භද්‍ර යැ කල්‍යාණ යැ අනවද්‍ය යැ සෙවිතව්‍ය නුයි 'පටිපදං වදෙහි භද්දමත්‍ථු' යනු වේ.

**පාතිමොක්ඛමථවාපි සමාධිං** 'පාතිමොක්ඛං' යනු: කුශලධර්මයන්ගේ සමාපත්තියට (-ලැබීමට) ශීලය ප්‍රතිෂ්ඨා යැ ආදි යැ පාද යැ සංයම යැ සංවර යැ ද්වාර යැ ප්‍රමුඛ යි. **අථවාපි සමාධිං** - සිත (අරමුණෙහි නිශ්චලව) යම් සිටීමෙක් මොනවට සිටීමෙක් බැසගෙන සිටීමෙක් (උද්ධච්ච - විචිකිච්ඡා වසයෙන්) චිත්තයාගේ නො පැතිරීමෙක් සිත නො විසිරීමෙක් චිත්තයාගේ නො පැතුරුණු බවෙක් සමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් නුයි 'පාතිමොක්ඛමථවාපි සමාධිං' යනු වේ.

එයින් කීහ ඒ නිර්මිත බුදුහු:

"**අක්ඛාතායි විවටචක්ඛු** -පෙ- **පාතිමොක්ඛමථවාපි සමාධිං**"යි.

## 14 - 8

ඇසින් (රූපදර්ශනයට) ලොල් වූයේ නො මැ වන්නේ යැ. ග්‍රාම්‍ය (තිරශ්චීන) කථාවෙන් කන වළහන්නේ යැ. (මූලරසාදි) රසයෙහි ද්‍ගිජු නො වන්නේ යැ. ලොවැ (රූපාදි) කිසිවක් (තෘෂ්ණා - දෘෂ්ටි) මමත්වයෙන් නො ගන්නේ යි.

**චක්ඛූහි නෙව ලොලස්ස** - කිසෙයින් චක්ඛුලොල වෙයි යත්: මෙහි කිසි මහණෙක් (සක්දෙර උපන් ලොභ විසින්) ඇසින් ලොල්වූයේ චක්ෂුර්ලෞල්‍යයෙන් සමන්විත වෙයි. 'නුදුටු රූපාලම්බනය දක්ක යුතු යැ, දක්නා ලද්ද ඉක්මැවියැ යුතු යැ'යි අරමින් අරමට උයනින් උයනට ගමින් ගමට නිගමයෙන් නිගමයට නුවරින් නුවරට රටින් රටට දනව්වෙන් දනව්වට දීර්ඝ චාරිකාවෙහි නො නිමි චාරිකාවෙහි යෙදුණේ රූපදර්ශනය සඳහා හැසිරෙයි. මෙසේත් චක්ඛුලොල වෙයි.

අථවා, භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො අසංවුතො ගච්ඡති හත්ථිං ඔලොකෙන්තො, අස්සං ඔලොකෙන්තො, රථං ඔලොකෙන්තො, පත්තිං ඔලොකෙන්තො, ඉත්ථියො ඔලොකෙන්තො, පුරිසෙ ඔලොකෙන්තො, කුමාරකෙ ඔලොකෙන්තො, කුමාරිකායො ඔලොකෙන්තො, අන්තරාපණං ඔලොකෙන්තො, ඝරමුඛානි ඔලොකෙන්තො, උද්ධං ඔලොකෙන්තො, අධො ඔලොකෙන්තො, දිසාවිදිසං විපෙක්ඛමානො[1] ගච්ඡති. එවම්පි චක්ඛුලොලො හොති–

අථවා, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. එවම්පි චක්ඛුලොලො හොති. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනගරකං[2] චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිසයුද්ධං උසභයුද්ධං ගොයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං[3] උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අණීකදස්සනං ඉති වා. එවම්පි චක්ඛුලොලො හොති–

කථං න චක්ඛුලොලො හොති? ඉධෙකච්චො භික්ඛු න චක්ඛුලොලො න චක්ඛුලොලියෙන සමන්නාගතො හොති. අදිට්ඨං දක්ඛිතබ්බං දිට්ඨං සමතික්කමිතබ්බන්ති න ආරාමෙන ආරාමං න උය්‍යානෙන උය්‍යානං න ගාමෙන ගාමං න නිගමෙන නිගමං න නගරෙන නගරං න රට්ඨෙන රට්ඨං න ජනපදෙන ජනපදං දීඝචාරිකං අනවත්ථචාරිකං අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි න චක්ඛුලොලො හොති. අථවා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො සංවුතො ගච්ඡති: න හත්ථිං ඔලොකෙන්තො, න අස්සං ඔලොකෙන්තො, න රථං ඔලොකෙන්තො, න පත්තිං ඔලොකෙන්තො, න ඉත්ථියො ඔලොකෙන්තො, න පුරිසෙ ඔලොකෙන්තො, න කුමාරකෙ ඔලොකෙන්තො, න කුමාරිකායො ඔලොකෙන්තො, න අන්තරාපණං ඔලොකෙන්තො, න ඝරමුඛානි ඔලොකෙන්තො, න උද්ධං ඔලොකෙන්තො, න අධො ඔලොකෙන්තො, න දිසාවිදිසං පෙක්ඛමානො ගච්ඡති. එවම්පි න චක්ඛුලොලො හොති–

අථවා, භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති. රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවම්පි න චක්ඛුලොලො හොති. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං –පෙ– අණීකදස්සනං ඉති වා. එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. එවම්පි න චක්ඛුලොලො හොති–

---

1 පෙක්ඛමානො - සීමු. II. 2. සොභනකං - මජසං. 3. නිබ්බුද්ධං - මජසං.

නොහොත් මහණ තෙමේ ඇතුළුගමට පිවිසියේ වීථියට පිළිපන්නේ අසංවර වූයේ යෙයි: ඇතුන් බලමින් අසුන් බලමින් රිය බලමින් පාබල සෙන් බලමින් ස්ත්‍රීන් බලමින් පුරුෂයන් බලමින් කුමරුන් බලමින් කුමරියන් බලමින් ඇතුළු අවුණ (=කඩතුල) බලමින් ගෙදොර බලමින් උඩ බලමින් යට බලමින් දිශාවිදිශා බලමින් යෙයි. මෙසේත් චක්ඛුලොල වෙයි-

නොහොත් මහණ තෙම ඇසින් රූපයක් දැක (කෙලෙසවස්තු වූ) නිමිති ගන්නේ වෙයි, (හස්තපාදාදි) ආකාර වශයෙන් ගන්නේ වෙයි, යම් කරුණෙකින් චක්ඛුරින්ද්‍රියය අසංවෘත වූ වසන මොහු අභිධ්‍යා - දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම් ඒ චක්ඛුරින්ද්‍රියයාගේ සංවරය පිණිස නො පිළිපදී, චක්ඛුරින්ද්‍රියය නො රකී. චක්ඛුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණෙයි; මෙසේත් චක්ඛුලොල වෙයි. තවද යම්සේ ඇතැම් භවත් මහණ බමුණු කෙනෙක් කම්පල අදහා දුන් බොජුන් වළඳා, ඔවුහු මෙබඳු වූ විසුළු දැකීමෙහි යෙදී වෙසෙති: ඒ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම් නළුමුළු භාරතාදිය කියන තැන සක්තාල ඝනතාල (කුළුතාලම් හෝ මලසිරුරු මන්ත්‍රයෙන් නගාලීම) කල පිඹීම (බුඹුමංඩි?) ප්‍රතිභානචිත්‍ර සැඬොලුන්ගේ සණදෙවුන්කෙළි වස්කුලල් ඇට දෙවීම ඇත්පොර අස්පොර මීහිපොර වැහැප්පොර ගවපොර බැටළුපොර එළුපොර කුකුළුපොර වටුපොර දඬුපොර මිටුපොර මල්ලපොර යුද පෙරමුණ බලසෙන් ගණන තැන කඳවුර බලඇණි දැකීම යනු හෝ යැ. මෙසේත් ‘චක්ඛුලොල’ වේ.

කිසෙයින් ‘චක්ඛුලොල’ නො වෙයි යත්: මේ ශාසනයෙහි කිසි මහණෙක් ඇසින් ලොල් නො වූයේ චක්ඛුර්ලෞල්‍යයෙන් යුක්ත නො වූයේ වෙයි: නුදුටු දෙය දැක්ක යුතු යැ, දුටුදෙය ඉක්මැවිය යුතු යැයි අරමින් අරමට නො යෙයි, උයනින් උයනට - ගමින් ගමට - නිගමයෙන් නිගමයට - නුවරින් නුවරට - රටින් රටට - දනව්වෙන් දනව්වට රූපදර්ශනය පිණිස දීර්ඝචාරිකාවෙහි නො නිමි චාරිකාවෙහි නො යෙදුණේ වෙයි. මෙසේත් ‘චක්ඛුලොල’ නො වූයේ වෙයි. නොහොත් මහණ තෙමේ ඇතුළු ගමට පිවිසියේ වීදියට පිළිපන්නේ සංවර වූ යෙයි: ඇතුන් නො බලමින් අසුන් නො බලමින් රිය නො බලමින් පාබලසෙන් නො බලමින් ගෑනුන් නො බලමින් පිරිමිනිත් නො බලමින් කුමරුන් නො බලමින් කුමරියන් නො බලමින් ඇතුළු අවුණු නො බලමින් ගෙදොර නො බලමින් උඩ නො බලමින් යට නො බලමින් දිශාවිදිශා නො බලමින් යෙයි. මෙසේත් ‘චක්ඛුලොල’ නො වූයේ වෙයි-

නොහොත් මහණ තෙමේ ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නො ගන්නේ අනුව්‍යඤ්ජන වශයෙන් නො ගන්නේ වෙයි. යම් කරුණෙකින් චක්ඛුරින්ද්‍රියය අසංවර වූ වසන මොහු අභිධ්‍යා දෞර්මනස් සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම්, ඒ චක්ඛුරින්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී, චක්ඛුරින්ද්‍රියය රකී, චක්ඛුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි: මෙසේත් ‘චක්ඛුලොල’ නො වූයේ වෙයි. තවද යම්සේ ඇතැම් භවත් මහණ බමුණු කෙනෙක් කම්පල අදහා දෙන ලද බොජුන් වළඳා ඔවුහු මෙබඳු වූ විසුළු දැකීමෙහි නො යෙදී වෙසෙති. ඒ මෙසේ යැ; නැටුම් ගැයුම් වැයුම් රඟමඬුලු (භාරතාදිය) පැවසීම...බල ඇණි දැකීම යනාදිය යි. මෙබඳු විසුළු දස්සනෙන් වැළැකුණේ වෙයි. මෙසේත් ‘චක්ඛුලොල’ නො වූයේ වේ.

**චක්ඛූහි නෙව ලොලස්සාති** - චක්ඛුලොලියං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. චක්ඛුලොලියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති - චක්ඛූහි නෙව ලොලස්ස.

**ගාමකථාය ආවරයෙ සොතන්ති** - ගාමකථා වුච්චති බත්තිංස තිරච්ඡානකථා. සෙය්‍යථිදං: රාජකථා චොරකථා මහාමත්තකථා සෙනාකථා භයකථා යුද්ධකථා අන්නකථා පානකථා වත්ථකථා යානකථා සයනකථා මාලාකථා ගන්ධකථා ඤාතිකථා ගාමකථා නිගමකථා නගරකථා ජනපදකථා ඉත්ථිකථා පුරිසකථා සූරකථා විසිඛාකථා කුම්භට්ඨානකථා පුබ්බපෙතකථා නානත්තකථා[1] ලොකක්ඛායිකා සමුද්දක්ඛායිකා ඉතිභවාභවකථා ඉති වා.

**ගාමකථාය ආවරයෙ සොතන්ති** - ගාමකථාය සොතං ආවරෙය්‍ය නිවාරෙය්‍ය සන්නිවාරෙය්‍ය රක්ඛෙය්‍ය ගොපෙය්‍ය පිදහෙය්‍ය පච්ඡින්දෙය්‍යාති - ගාමකථාය ආවරයෙ සොතං.

**රසෙ ච නානුගිජ්ඣෙය්‍යාති** - 'රසො'ති මූලරසො ඛන්ධරසො තචරසො පත්තරසො පුප්ඵරසො ඵලරසො අම්බිලං මධුරං තිත්තකං කටුකං ලොණිකං ඛාරිකං ලම්බිලං[2] කසාවො සාදු අසාදු සීතං උණ්හං. සන්තෙකෙ සමණබ්‍රාහ්මණා රසගිද්ධා. තෙ ජිව්හග්ගෙන රසග්ගානි පරියෙසන්තා ආහිණ්ඩන්ති. තෙ අම්බිලං ලභිත්වා අනම්බිලං පරියෙසන්ති, අනම්බිලං ලභිත්වා අම්බිලං පරියෙසන්ති -පෙ- සීතං ලභිත්වා උණ්හං පරියෙසන්ති, උණ්හං ලභිත්වා සීතං පරියෙසන්ති. තෙ යං යං ලභිත්වා තෙන තෙන න තුස්සන්ති, අපරාපරං පරියෙසන්ති. මනාපිකෙසු රසෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලග්ගිතා පලිබුද්ධා. යස්සෙසා රසතණ්හා පහීනා සමුච්ඡින්නා -පෙ- ඤාණග්ගිනා දඩ්ඪා. සො පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය -පෙ- ඵාසුවිහාරො චා'ති. යථා වණං ආලිම්පෙය්‍ය යාවදෙව ආරුහණත්ථාය, යථා වා අක්ඛං අබ්භඤ්ජෙය්‍ය යාවදෙව භාරස්ස නිත්ථරණත්ථාය, යථා වා පුත්තමංසං ආහාරං ආහාරෙය්‍ය යාවදෙව කන්තාරස්ස නිත්ථරණත්ථාය, එවමෙව භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති: නෙව දවාය -පෙ- අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. රසතණ්හං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, රසතණ්හාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති - රසෙ ච නානුගිජ්ඣෙය්‍ය.

---

1. නානත්තකථා - සීමු. II.

**චක්ඛූහි නෙව ලොලස්ස** - චක්ෂුර්ලෞල්‍යය (ඇසින් රූප දක්මෙහි ලොල් බව) බැහැර කරන්නේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ යැ. චක්ෂුර්ලෞල්‍යයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ වන්නේ යැ, විගතමර්‍යාදා කළ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'චක්ඛූහි නෙව ලොලස්ස යනු' වේ.

**ගාමකථාය ආවරයෙ සොතං** - දෙතිස් තිරශ්චීනකථාව 'ග්‍රාම්කථා යැ'යි කියනු ලැබෙයි. ඒ මෙසේ යැ: රජුන් පිළිබඳ (ගෘහාශ්‍රිත) කථා යැ චොරකථා යැ මහාමාත්‍යකථා යැ සෙනාකථා යැ භයකථා යැ යුද්ධකථා යැ ආහාර පිළිබැඳි කථා යැ පානකථා යැ වස්ත්‍රකථා යැ යානකථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධකථා යැ ඥාතිකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගර කථා යැ ජනපදකථා යැ ස්ත්‍රීකථා යැ පුරුෂකථා යැ ශූරකථා යැ වීථි පිළිබැඳි කථා යැ දියතොට (හෝ කළදෑසින්) පිළිබැඳි කථා යැ පූර්වප්‍රෙත (-පෙර නෑයන්) පිළිබැඳි කථා යැ නන්වැදෑරුම් (නිරර්ථක) කථා යැ ලොකායතනකථා යැ සමුද්‍රාඛ්‍යානකථා යැ වෘද්ධි - හානි පිළිබැඳි කථා යැ යන දිය සි.

**ගාමකථාය ආවරයෙ සොතං** - ගම්වැසියන්ගේ කථාවෙන් ශ්‍රොත්‍රෙන්ද්‍රිය ආවරණය කරන්නේ යැ වළහන්නේ යැ මොනවට වළහන්නේ යැ රක්නේ යැ ගොපනය කරන්නේ යැ වසන්නේ යැ පසිඳින්නේ නුයි 'ගාමකථාය ආවරයෙ සොතං' යනු වේ.

**රසෙ ච නානුගිජ්ඣෙය්‍ය** - 'රස' නම් මූලරස යැ ස්කන්ධරස යැ ත්වක් රස යැ පත්‍රරස යැ පුෂ්පරස යැ ඵලරස යැ, අම්බිල යැ මධුර යැ තික්ත යැ කටුක යැ ලවණ යැ ක්ෂාර යැ ලපිල (-ඇඹුල්මුසු) යැ කසට යැ ඕගිරි යැ අම්ගිරි යැ ශීත යැ උෂ්ණරස යි. රසයෙහි ගිජු වූ ඇතැම් මහණ බමුණු කෙනෙක් වෙයි. ඔවුහු දිවගින් අග්‍රරස සොයමින් ඇවිදිති. ඔවුහු ඇඹුලක් ලැබ නො ඇඹුලක් සොයති. නො ඇඹුලක් ලැබ ඇඹුලක් සොයති... සිහිලක් ලැබ උණුසුමක් සොයති, උණුසුමක් ලැබ සිහිලක් සොයති. ඔවුහු යමක් යමක් ලැබ ඒ ඒ ලද දෙයින් නො සතුටු වෙති: මතුමත්තෙහි සොයත්. මනවඩන රසයන්හි ඇලුණාහු ගිජු වූවාහු ගෙතුණාහු මුසපත් වූවාහු බැසගත්තාහු ලග්න වූවාහු ලග්නිත වූවාහු වෙළුණාහුය. යමක්හු විසින් තෙල රසතෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සිඳින ලද්දී...නුවණගින්නෙන් දවන ලද්දී ද, හෙතෙම නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ආහාරය වළඳයි: ක්‍රීඩා පිණිස නො වෙයි...පහසුවිහරණය ද වේ යයි. යම්සේ ආරූහණය පමණින් ව්‍රණය ආලෙප කරන්නේ ද, තවද යම්සේ බර ඇද ගන්නා පමණින් ගැල්අකුර තෙල් ගල්වන්නේ ද, යම්සේ කාන්තාරය තරණය කරන පමණින් පුත්‍රමාංසාහාරය හෝ අනුභව කරන්නේ ද, එසෙයින් ම මහණ තෙමේ නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ආහාරය වළඳයි: ක්‍රීඩා පිණිස නො මැ වෙයි...අනවද්‍යතාවය ද පහසුවිහරණය ද වන්නේ යැයි. රසතෘෂ්ණාව හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ. රසතෘෂ්ණාවෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ විසංයොග වූයේ වන්නේ යැ, විගතමර්‍යාදා කළ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'රසෙ ච නානුගිජ්ඣෙය්‍ය' යනු වේ.

**න ච මමායෙථ කිඤ්චි ලොකස්මින්ති**– 'මමත්තා'ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච දිට්ඨිමමත්තඤ්ච –පෙ– ඉදං තණ්හාමමත්තං –පෙ– ඉදං දිට්ඨිමමත්තං. තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං න මමායෙය්‍ය, න ගණ්හෙය්‍ය, න පරාමසෙය්‍ය, නාභිනිවිසෙය්‍ය, සොතං, ඝානං, ජිව්හං, කායං, රූපෙ, සද්දෙ, ගන්ධෙ, රසෙ, ඵොට්ඨබ්බෙ, කුලං, ගණං, ආවාසං, ලාභං, යසං, පසංසං, සුඛං, චීවරං, පිණ්ඩපාතං, සෙනාසනං, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං, කාමධාතුං, රූපධාතුං, අරූපධාතුං, කාමභවං, රූපභවං, අරූපභවං, සඤ්ඤාභවං, අසඤ්ඤාභවං, නෙවසඤ්ඤානාසඤ්ඤාභවං, එකවොකාරභවං, චතුවොකාරභවං, පඤ්චවොකාරභවං, අතීතං, අනාගතං, පච්චුප්පන්නං, දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ න මමායෙය්‍ය, න ගණ්හෙය්‍ය, න පරාමසෙය්‍ය, නාභිනිවිසෙය්‍ය. **කිඤ්චීති** කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං; **ලොකස්මින්ති** අපායලොකෙ –පෙ– ආයතනලොකෙති – න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං.

තෙනාහ භගවා:

> "චක්ඛූහි නෙව ලොලස්ස
> ගාමකථාය ආවරයෙ සොතං,
> රසෙ ච නානුගිජ්ඣෙය්‍ය
> න ච මමායෙථ කිඤ්චි ලොකස්මි"න්ති.

## 14 - 9

> ඵස්සෙන යදා ඵුට්ඨස්ස
> පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
> භවඤ්ච නාභිජප්පෙය්‍ය
> භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය.

**ඵස්සෙන යදා ඵුට්ඨස්සාති** – 'ඵස්සො'ති රොගඵස්සො; රොගඵස්සෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස; චක්ඛුරොගෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස; සොතරොගෙන, ඝානරොගෙන ජිව්හාරොගෙන, කායරොගෙන, සීසරොගෙන, කණ්ණරොගෙන, මුඛරොගෙන, දන්තරොගෙන, කාසෙන, සාසෙන, පිනාසෙන, ඩහෙන, ජරෙන, කුච්ඡිරොගෙන, මුච්ඡාය, පක්ඛන්දිකාය, සූලාය විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන, අපමාරෙන, දද්දුයා කණ්ඩුයා කච්ඡුයා රඛසාය විතච්ඡිකාය, ලොහිතෙන පිත්තෙන[1] මධුමෙහෙන, අංසාය පිළකාය භගන්දලෙන, පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන උතුපරිණාමජෙන ආබාධෙන විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන, සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය උච්චාරෙන පස්සාවෙන, ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්සාති – ඵස්සෙන යදා ඵුට්ඨස්ස.

1 දරුනෙන - ස. 2. අලඞ්කමානො - PTS.

**න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං** - 'මමත්ත' යනු: තෘෂ්ණාමමත්වය ද, දෘෂ්ටිමමත්වය දැයි මමත්ව දෙකෙකි...මේ දෘෂ්ටිමමත්වය යි. තෘෂ්ණාමමත්වය හැර දෘෂ්ටිමමත්වය දුරලා ඇස මමායනය නො කරන්නේ යැ, නො ගන්නේ යැ, පරාමර්ශ නො කරන්නේ යැ, අභිනිවේශය නො කරන්නේ යැ, කන - දිව - කය - රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය - කුලය - ගණයා - ආවාසය - ලාභ - යශස් - ප්‍රශංසාව - සුවය - සිවුර - පිණ්ඩපාත - සෙනසුන් - ගිලන්පස බෙහෙසත් පිරිකර - කාමධාතුව - රූපධාතුව - අරූපධාතුව - කාමභවය - රූපභවය - අරූපභවය - සංඥාභවය - අසංඥාභවය - නෛවසංඥානාසංඥාභවය - ඒකවොකාරභවය - චතුවොකාරභවය - පඤ්චවොකාරභවය - අතීතය - අනාගතය - වර්තමානය - දෘෂ්ට - ශ්‍රැත - මුත - විඥාතව්‍යධර්මයන් මමායන නො කරන්නේ යැ, නො ගන්නේ යැ, නො පරාමර්ශ කරන්නේ යැ, අභිනිවේශය නො කරන්නේ යි. **කිඤ්චි** යනු: කිසි රූපගතයක් වේදනාගතයක් සංඥාගතයක් සංස්කාරගතයක් විඥානගතයක්; **ලොකස්මිං** යනු: අපායලොකයෙහි.. ආයතනලොකයෙහි නුයි 'න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"චක්ඛූහි නෙව ලොලස්ස -පෙ- න ච මමායෙථ කිඤ්චි ලොකස්මිං"යි**

## 14 - 9

මහණ තෙම යම් කලෙක රොගස්පර්ශයෙන් මඩනා ලද්දේ වන්නේ නම්, (එකල්හි) පරිදේවනා නො කරන්නේ ය. (කාමභවාදි) භවය ද නො පතන්නේ ය. භය අරමුණු නිමිති කොට ද කම්පා නො වන්නේ යි.

**ඵස්සෙන යදා ඵුට්ඨස්ස** - 'ඵස්ස' නම්: රොගස්පර්ශ යැ, රොග පහසින් ස්පර්ශ කරන ලද්දේ මඩනා ලද්දේ ඇතුළත පිවිසියේ සමන්විත වූයේ වන්නේ නම්, චක්ෂූරොගයෙන් ස්පර්ශ කරන ලද්දේ මඩනා ලද්දේ පිවිසියේ සමන්විත වූයේ වන්නේ නම්, ශ්‍රොත්‍රරොගයෙන් - ඝ්‍රාණරොගයෙන් - ජිහ්වාරොගයෙන් - කායරොගයෙන් - ශීර්ෂරොගයෙන් - කර්ණරොගයෙන් - මුඛරොගයෙන් - දන්තරොගයෙන් - කාසයෙන් - ශ්වාසයෙන් - පීනසින් - දාහයෙන් - ජ්වරයෙන් - කුක්ෂිරොගයෙන් - මූර්ඡාවෙන් - ලොහිතපිත්තයෙන් - ආමශූලයෙන් - මහාවිරෙචනයෙන් - කුෂ්ඨයෙන් - ගණ්ඩයෙන් ශ්වේතකුෂ්ඨ (කබරරොග) යෙන් - ක්ෂයරොගයෙන් - අපස්මාරයෙන් - දදයෙන් කණ්ඩුතියෙන් - මහාකුෂ්ඨයෙන් - නියපහරින් වූ රොගයෙන් - අතුල් පතුල් පැළීමෙන් - රක්තපිත්තයෙන් - මධුමේහයෙන් - අර්ශසින් - පොළයෙන් - භගන්දරයෙන් - පිත්තජ ආබාධයෙන් - ශ්ලේෂ්මජ ආබාධයෙන් - වාතජ ආබාධයෙන් සාන්නිපාතික ආබාධයෙන් - ඍතුජ ආබාධයෙන් - විෂමපරිහරණයෙන් වූ ආබාධයෙන් - ඖපක්‍රමික ආබාධයෙන් - කර්මවිපාකජ ආබාධයෙන් - ශීතයෙන් උෂ්ණයෙන් - ජිඝච්ඡායෙන් - පිපාසායෙන් - උච්චාරයෙන් ප්‍රස්‍රාවයෙන් - මැසි මදුරු - වා අවු - දීඝ ජාතීන්ගේ පහසින් ස්පර්ශ කරන ලද්දේ මඩනා ලද්දේ සමවගීත වූයේ සමන්විත වූයේ නුයි 'ඵස්සෙන යදා ඵුට්ඨස්ස' යනු වේ.

**පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චීති** - ආදෙවං පරිදෙවං ආදෙවනං පරිදෙවනං ආදෙවිතත්තං පරිදෙවිතත්තං වාචා පලපං විප්පලාපං ලාලප්පං ලාලප්පායනං ලාලප්පායිතත්තං න කරෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය. **කුහිඤ්චීති** කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති - පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.

**භවඤ්ච නාභිජප්පෙය්‍යාති** - කාමභවං න ජප්පෙය්‍ය, රූපභවං න ජප්පෙය්‍ය, අරූපභවං න ජප්පෙය්‍ය න පජප්පෙය්‍ය නාභිජප්පෙය්‍යාති - භවඤ්ච නාභිජප්පෙය්‍ය.

**භෙරවෙසු ච න සම්පවෙධෙය්‍යාති** - 'භෙරවා'ති එකෙනාකාරෙන භයම්පි භෙරවම්පි තඤ්ඤෙව. වුත්තං හෙතං භගවතා: "එතං නූන තං භයභෙරවං[1] ආගච්ඡතී"ති[a] බහිද්ධාරම්මණං වුත්තං: සීහා බ්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා[2] අස්සා හත්ථී අහිවිච්ඡිකා සතපදී චොරා වා අස්සු මාණවා කතකම්මා වා අකතකම්මා වා; අථාපරෙන ආකාරෙන භයං වුච්චති අජ්ඣත්තිකං චිත්තසමුට්ඨානං භයං භයානකත්තං[3] ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උබ්බෙගො උත්‍රාසො, ජාතිභයං ජරාභයං ව්‍යාධිභයං මරණභයං රාජභයං චොරභයං අග්ගිභයං උදකභයං අත්තානුවාදභයං පරානුවාදභයං දණ්ඩභයං දුග්ගතිභයං ඌමිභයං කුම්භීලභයං ආවට්ටභයං සුසුකාභයං ආජීවිකභයං[4] අසිලොකභයං පරිසාය සාරජ්ජභයං මදනභයං දුග්ගතිභයං භයානකත්තං[3] ඡම්භිතත්තං ලොමහංසො චෙතසො උබ්බෙගො උත්‍රාසො. **භෙරවෙසු ච න සම්පවෙධෙය්‍යාති** - භෙරවෙ පස්සිත්වා වා සුණිත්වා වා න වෙධෙය්‍ය නප්පවෙධෙය්‍ය න සම්පවෙධෙය්‍ය න තසෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න භායෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය; අභීරු අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති - භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය.

තෙනාහ භගවා:

"එතෙන යදා ඵුට්ඨස්ස
පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
භවඤ්ච නාභිජප්පෙය්‍ය
භෙරවෙසු ච න සම්පවෙධෙය්‍යා"ති.

1. භයං භෙරවං - සීමු II. මජසං. PTS. 2. මහිංසා - මජසං, ගොමහිසා - PTS.
3. භයානකං - PTS. 4. ආජීවකභයං - සීමු II. PTS.
a. මජ්ඣිමනිකාය - භයභෙරවසුත්ත.

**පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි** - නම කියා හැඬීම, ගුණ කියා හැඬීම නම කියා හඬන අයුරු ගුණ කියා හඬන අයුරු නම කියා හඬන බව ගුණ කියා හඬන බව, බස සිස් බස විරූප වූ හිස් බස, පුනපුනා කීම පුනපුනා කියන අයුරු පුනපුනා කියන බව නො කරන්නේ යැ, නො දනවන්නේ යැ, නූපදවන්නේ යැ, නො නිපදවන්නේ යැ, වෙසෙසින් නො නිපදවන්නේ යි. **කුහිඤ්චි** - කොහි වත් කිසිවෙක්හි කිසි තැනෙක්හි අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ නුයි 'පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි' යනු වේ.

**භවඤ්ච නාභිජප්පෙය්‍ය** - කාමභවය නො පතන්නේ යැ, රූපභවය නො පතන්නේ යැ, අරූපභවය නො පතන්නේ යැ, ප්‍රජල්පනය නො කරන්නේ යැ, වෙසෙසින් ජල්පනය නො කරන්නේ යැ'යි 'භවඤ්ච නාභිජප්පෙය්‍ය' යනු වේ.

**භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය** - 'භෙරව' නම්: එක් අයුරෙකින් භයත් භෙරවයත් හේ (එකෙක්) මැ ය. මේ වදාරන ලද මැ ය. බුදුන් විසින්: "නෙල එකාන්තයෙන් ඒ භයඅරමුණ පැමිණේ" යයි බාහ්‍යාලම්බනය වදාරන ලද්දේය: සිංහයෝ යැ ව්‍යාඝ්‍රයෝ යැ දිවියෝ යැ වලස්සු යැ තරස්සු යැ මිහිවෝ යැ අස්හු යැ ඇත්හු යැ සර්පයෝ යැ නුහුසු යැ සියපා යැ කළ සොරකම් ඇති හෝ නැති හෝ සොරු හෝ සැහැසියෝ වන්නාහු ය. යළි අන් අයුරෙකින් අධ්‍යාත්මයෙහි වූ සිත්හි උපදනා බිය භයාකාරය තැතිගන්නා බව ලොමුදැහ ගැන්ම චිත්තයාගේ උද්වෙගය උත්‍රාසය 'භය'යි කියනු ලැබෙයි, ජාතිය නිසා උපදනා බිය ජරාභය ව්‍යාධිභය මරණභය රාජභය චොරභය අග්නිභය උදකභය තමා නුගුණ කීමෙන් උපදනා බිය මෙරමා නුගුණ කීමෙන් උපදනා බිය දඬුවමින් උපදනා බිය දුගතිය නිසා උපදනා බිය මුහුදුරළ නිසා උපදනා බිය මස්කැලන්ගෙන් උපදනා (හෝ කිඹුල්) බිය දියසුළි නිසා උපදනා බිය සැඩමසුන් (සුසුකා) නිසා උපදනා බිය දිවි පැවැතුම් හෙතුවෙන් උපදනා බිය ගර්හාවෙන් උපදනා බිය පිරිස්හි නැති ගැනීමෙන් වන බිය කාමයෙන් වන 'බිය දුගතිබිය (යන) මෙයින් උපදනා බිය, භයාකාරය, තැති ගන්නා බව, ලොමුදැහ ගැන්ම, චිත්තයාගේ උද්වෙගය, උත්‍රාසය යි.

**භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය** - භය අරමුණු දැක හෝ අසා හෝ නො වෙවුලන්නේ යැ වෙසෙසින් නො සැලෙන්නේ යැ පුනපුනා නො සැලෙන්නේ යැ, නො නැවෙන්නේ යැ වෙසෙසින් නො නැවෙන්නේ යැ, පුනපුනා නො නැවෙන්නේ යැ, නො බිය වන්නේ යැ, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ යැ, බියසුලු නො වන්නේ යැ, නො තැති ගන්නා සුලු ත්‍රාසනො වන සුලු - නො පලායන සුලු වන්නේ යැ, ප්‍රහීණ වූ භය අරමුණු ඇති වැ පහවූ රෝමෝද්ගම ඇති වැ වාසය කරන්නේ යැයි 'භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඵස්සෙන යදා ඵුට්ඨස්ස -පෙ- භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය"** යි.

**14 - 10**

අන්නානමථො පානානං
ඛාදනීයානමථොපි වත්ථානං,
ලද්ධා න සන්නිධිං කයිරා
න ච පරිත්තසෙ තානි අලභමානො.[1]

**අන්නානමථො පානානං ඛාදනීයානමථොපි වත්ථානන්ති**– ‘අන්නාන’න්ති ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං; **පානානන්ති** අට්ඨපානානි: අම්බපානං ජම්බුපානං චොචපානං මොචපානං මධුපානං මුද්දිකාපානං සාලුකපානං ඵාරුසකපානං. අපරානිපි අට්ඨ පානානි: කොසම්බපානං කොලපානං බදරපානං ඝතපානං තෙලපානං පයොපානං යාගුපානං රසපානං; **ඛාදනීයානන්ති** පිට්ඨඛජ්ජකං පූවඛජ්ජකං මූලඛජ්ජකං තචඛජ්ජකං පත්තඛජ්ජකං පුප්ඵඛජ්ජකං ඵලඛජ්ජකං; **වත්ථානන්ති** ඡ චීවරානි: ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ගන්ති– අන්නානමථො පානානං ඛාදනීයානමථොපි වත්ථානං.

**ලද්ධා න සන්නිධිං කයිරාති** – ‘ලද්ධා’ති ලද්ධා ලභිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වා න කුහනාය න ලපනාය න නෙමිත්තිකතාය න නිප්පෙසිකතාය න ලාභෙන ලාභං නිජිගිංසනතාය න කට්ඨදානෙන[1] න වෙළුදානෙන න පත්තදානෙන න පුප්ඵදානෙන න ඵලදානෙන න සිනානදානෙන න චුණ්ණදානෙන න මත්තිකාදානෙන න දන්තකට්ඨදානෙන න මුඛොදකදානෙන න චාටුකම්‍යතාය න පාරිභට්ටතාය න පිට්ඨිමංසිකතාය න වත්ථුවිජ්ජාය න තිරච්ඡානවිජ්ජාය න අඞ්ගවිජ්ජාය න නක්ඛත්තවිජ්ජාය න දූතගමනෙන න පහිණගමනෙන න ජඞ්ඝපෙසනියෙන න වෙජ්ජකම්මෙන න නවකම්මෙන න පිණ්ඩපටිපිණ්ඩකෙන න දානානුප්පදානෙන ධම්මෙන සමෙන ලද්ධා ලභිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වායි-ලද්ධා; **න සන්නිධිං කයිරාති** අන්නසන්නිධිං පානසන්නිධිං යානසන්නිධිං සයනසන්නිධිං ගන්ධසන්නිධිං ආමිසසන්නිධිං න කරෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍යාති – ලද්ධා න සන්නිධිං කයිරා.

1. අලබ්භමානො - PTS.

**14 - 10**

නැවත (මහණ තෙම) ආහාර - පානයන් හා ඛාද්‍යයන් සම්බන්ධ වූ ද යළි වස්ත්‍රයන් සම්බන්ධ වූ ද (කිසිවක්) ලැබ සන්නිධිය (රැස් කිරීම) නො කරන්නේ යැ, ඒ ආහාරාදිය නො ලබනුයේ නො ද තැවෙන්නේ යි.

**අන්නානමථො පානානං ඛාදනීයානමථො'පි වත්ථානං** - 'අන්නානං' යනු: (හැල් ආදි) බත් යැ යවකොමු යැ හත්පුණු යැ මාළු යැ මස්; **පානානං** යනු අෂ්ට පානයෝ යැ: අඹපැන දඹපැන ඇටකෙසෙල්පැන මස්කෙසෙල්පැන මීහිපැන මිදිපැන හෝලුපැන බොරළුදම්නුපැන; අන්‍යත් අෂ්ටපානයෙකි: කොසඹපැන ඩෙබරපැන මහඩෙබරපැන ඝෘතපාන යැ තෛලපාන යැ ක්ෂීරපාන යැ යාගු (කැඳ) පාන යැ (ශාකාදි) රසපාන යි; **ඛාදනීයානං** යනු: (හැල් ආදි) පිටියෙන් කළ ඛාද්‍ය යැ පූවඛාද්‍ය යැ මූලඛාද්‍ය යැ ත්වක්ඛාද්‍ය යැ පත්‍රඛාද්‍ය යැ පුෂ්පඛාද්‍ය යැ ඵලඛාද්‍ය යි; **වත්ථානං** යනු ෂට්චීවර යැ: කොමුපිළී කපුපිළී තිසිරිපිළී පළස සණවැහැරි මුසුපිළී යැයි 'අන්නානමථො පානානං ඛාදනීයානමථො'පි වත්ථානං' යනු වේ.

**ලද්ධා න සන්නිධිං කයිරා** - 'ලද්ධා' යනු: ලැබ ලබාගෙන අධිගමය කොට වින්දනය කොට ප්‍රතිලාභ කොට, විසමය කරවීමෙන් නො වැ, ලපනා යෙන් නො වැ, (කායවාක්) නෛමිත්තිකතායෙන් නො වැ, (මෙරමා ගුණ) පිංසනතායෙන් නො වැ, ලාභයෙන් ලාභ සෙවීමෙන් නො වැ, කාෂ්ඨදානයෙන් වේණුදානයෙන් - පත්‍රදානයෙන් - පුෂ්පදානයෙන් - ඵලදානයෙන් - නහනු දීමෙන් - සුණු - මැටි - දැහැටිදඬු - මුව දෝනා දිය දීමෙන් නො වැ, චාටුකාම්‍ය කීමෙන් නො වැ, මුද්ගසූප්‍ය වැනි බොරු මුසු කථායෙන් නො වැ, (දරුවන් නැළැවීමාදි) පාරිභට්ටතායෙන් නො වැ, පිටපිමංසිකතා (-ගෙවලට පිවිස හිඳිනා බැවින්) නො වැ, වාස්තු විද්‍යාවෙන් නො වැ, (අඞ්ගශාස්ත්‍රාදි) තිරශ්චීනවිද්‍යාවෙන් නො වැ, අඞ්ගවිද්‍යාවෙන් - නක්ෂත්‍රවිද්‍යාවෙන් - මෙහෙවර ගමනින් - (ගෙන් ගෙට) හසුන්පත් ගෙන යැමෙන් - (ගමින් ගමැ) හසුන් පිළිහසුන් ගෙන යැමෙන් - වෙදකමින් - නවකමින් - පිඬු පෙරළා පිඬු දීමෙන් - දානානුදානයෙන් නො වැ, දැහැමෙන් සෙමෙන් ලැබ, ලබා ගෙන අධිගමය කොට වින්දනය කොට ප්‍රතිලාභ කොට නුයි 'ලද්ධා' යනු වේ. **න සන්නිධිං කයිරා** - ආහාරසන්නිධි පානසන්නිධි වස්ත්‍රසන්නිධි යානසන්නිධි ශයනසන්නිධි ගන්ධසන්නිධි ආමිසසන්නිධිය නො කරන්නේ යැ, නො දනවන්නේ යැ නූපදවන්නේ යැ නො නිපදවන්නේ යැ වෙසෙසින් නො නිපදවන්නේ නුයි 'ලද්ධා න සන්නිධිං කයිරා' යනු වේ.

**න ච පරිත්තසෙ තානි අලභමානො**[1]ති - අන්නං වා න ලභාමි, පානං වා න ලභාමි, වත්ථං වා න ලභාමි, කුලං වා න ලභාමි, ගණං වා න ලභාමි, ආවාසං වා න ලභාමි, ලාභං වා න ලභාමි, යසං වා න ලභාමි, පසංසං වා න ලභාමි, සුඛං වා න ලභාමි, චීවරං වා න ලභාමි, පිණ්ඩපාතං වා න ලභාමි, සෙනාසනං වා න ලභාමි, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං වා න ලභාමි, ගිලානුපට්ඨාකං වා න ලභාමි, අප්පඤ්ඤාතොම්හීති න තසෙය්‍ය, න උත්තසෙය්‍ය, න පරිත්තසෙය්‍ය, න භායෙය්‍ය, න සන්තාසං ආපජ්ජෙය්‍ය, අභීරූ අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති - න ච පරිත්තසෙ තානි අලභමානො.

තෙනාහ භගවා:

"අන්නානමථො පානානං
ඛාදනීයානමථොපි වත්ථානං,
ලද්ධා න සන්නිධිං කයිරා
න ච පරිත්තසෙ තානි අලභමානො"ති.

## 14 - 11

ඣායී න පාදලොලස්ස
විරමෙ කුක්කුච්චා නප්පමජ්ජෙය්‍ය,
අථාසනෙසු සයනෙසු
අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය.

**ඣායී න පාදලොලස්සාති** - "ඣායී"ති පඨමෙනපි ඣානෙන ඣායී, දුතියෙනපි ඣානෙන ඣායී, තතියෙනපි ඣානෙන ඣායී, චතුත්ථෙනපි ඣානෙන ඣායී, සවිතක්කසවිචාරෙනාපි ඣානෙන ඣායී, අවිතක්ක-විචාරමත්තෙනාපි ඣානෙන ඣායී, අවිතක්කඅවිචාරෙනාපි ඣානෙන ඣායී, සප්පීතිකෙනාපි ඣානෙන ඣායී, නිප්පීතිකෙනාපි ඣානෙන ඣායී, පීතිසහගතෙනාපි ඣානෙන ඣායී, සාතසහගතෙනාපි ඣානෙන ඣායී, සුඛසහගතෙනාපි ඣානෙන ඣායී, උපෙක්ඛාසහගතෙනාපි ඣානෙන ඣායී, සුඤ්ඤතෙනාපි ඣානෙන ඣායී, අනිමිත්තෙනාපි ඣානෙන ඣායී, අප්පණිහිතෙනාපි ඣානෙන ඣායී, ලොකියෙනාපි ඣානෙන ඣායී, ලොකුත්තරෙනාපි ඣානෙන ඣායී, ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථගරුකොති - ඣායී.

**න පාදලොලස්සාති** - කථං 'පාදලොලො' හොති? ඉධෙකච්චො භික්ඛු පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති:

1. අලබ්භමානො - PTS.

**න ච පරිත්තසෙ තානි අලභමානො** – 'ආහාර හෝ නො ලැබෙමි, පාන හෝ නො ලැබෙමි, වස්ත්‍ර හෝ – කුලය හෝ – ගණයා හෝ–ආවාසය හෝ – ලාභ හෝ – යශස් හෝ – පැසැසුම් හෝ – සුව හෝ –සිවුරු හෝ– පිණ්ඩපාත හෝ – සෙනසුන් හෝ – ගිලන්පස බෙහෙසත් පිරිකර හෝ නො ලැබෙමි, ගිලානොපස්ථායකයකු හෝ නො ලැබෙමි, අප්‍රකටයෙම් වෙමි' තො තැතිගත්තේ යැ, උත්‍රාසත තෙ වත්තේ යැ, පරිත්‍රාසත නො වත්තේ යැ, නො බිය වත්තේ යැ, තැයි ගැනුමට නො පැමිණෙත්තේ යැ, නො බියසුලු නො සැලෙනසුලු නො තැතිගන්නාසුලු නොපලායනසුලු වත්තේ යැ, පහවූ බිය අරමුණු ඇතියේ පහවගිය ලොමුදහ ඇතියේ වෙසෙත්තේ නුයි 'න ච පරිත්තසෙ තානි අලභමානො' යනු වේ.

එයින් වදාලහ බුදුහු:

"අනතානමඵෝ -පෙ- න ච පරිත්තසෙ තානි අලභමානො"යි.

## 14 – 11

ධ්‍යාන කරනුයේ පාදලෝලත්‍යයෙක් නො වත්තේ යැ, කුකුසින් දුරු වත්තේ යැ, නො පමා වත්තේ යැ. යති මහණ තෙම අල්පශබ්ද වූ අසුන් සෙනසුන්හි වාසය කරන්නේ යි.

**ඣායී න පාදලොලස්ස** – 'ඣායී' යනු: පළමුවන දුහැතිනු ද ධ්‍යාන කරනුයේ, දෙවැනි දුහැතිනු ද – තෙවැනි දුහැතිනු ද – සිවුවැනි දුහැතිනු ද ධ්‍යාන කරනුයේ, සවිතර්කසවිචාරධ්‍යානයෙනු ද ධ්‍යාන කරනුයේ, අවිතර්ක විචාරමාත්‍රධ්‍යානයෙනු ද–අවිතර්ක අවිචාර ධ්‍යානයෙනු ද – සප්‍රීතික ධ්‍යාන-යෙනු ද - නිෂ්ප්‍රීතික ධ්‍යානයෙනු ද – ප්‍රීතිසහගත ධ්‍යානයෙනු ද – සාතසහගත ධ්‍යානයෙනු ද – සුඛසහගත ධ්‍යානයෙනු ද – උපෙක්ෂාසහගත ධ්‍යානයෙනු ද – ශූන්‍යතධ්‍යානයෙනු ද – අනිමිත්තධ්‍යානයෙනු ද – අප්‍රණිහිත ධ්‍යානයෙනු ද – ලෞකිකධ්‍යානයෙනු ද – ලොකොත්තර ධ්‍යානයෙනු ද ධ්‍යාන කරනුයේ, ධ්‍යානයෙහි ඇලුණේ එකග බවෙහි යෙදුණේ ස්වාර්ථගරුක වූයේ නුයි 'ඣායී' යනු වේ.

**න පාදලොලස්ස** - කිසෙයින් 'පාදලොල' වෙයි යත්: මෙහි කිසි මහණෙක් පාදලොල වූයේ පාදලෝලත්‍යයෙන් යුක්ත වූයේ වෙයි:

ආරාමෙන ආරාමං උය්‍යානෙන උය්‍යානං ගාමෙන ගාමං නිගමෙන නිගමං නගරෙන[1] නගරං රට්ඨෙන රට්ඨං ජනපදෙන ජනපදං දීඝචාරිකං අනවත්ථිතචාරිකං අනුයුත්තො විහරති, එවම්පි පාදලොලො හොති. අථ වා භික්ඛු අන්තොපි සඞ්ඝාරාමෙ පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති, න අත්ථහෙතු න කාරණහෙතු උද්ධතො අවූපසන්තචිත්තො පරිවෙණතො පරිවෙණං ගච්ඡති, විහාරතො විහාරං ගච්ඡති, අඩ්ඪයොගතො අඩ්ඪයොගං ගච්ඡති, පාසාදතො පාසාදං ගච්ඡති, හම්මියතො හම්මියං ගච්ඡති, ගුහාය ගුහං ගච්ඡති, ලෙනතො ලෙනං ගච්ඡති, කුටිතො කුටිං ගච්ඡති, කූටාගාරතො කූටාගාරං ගච්ඡති, අට්ටතො අට්ටං ගච්ඡති, මාලතො මාලං ගච්ඡති, උද්දණ්ඩතො උද්දණ්ඩං ගච්ඡති, උද්දොසිතතො උද්දොසිතං ගච්ඡති, උපට්ඨානසාලතො උපට්ඨානසාලං ගච්ඡති, මණ්ඩලමාලතො මණ්ඩලමාලං ගච්ඡති, රුක්ඛමූලතො රුක්ඛමූලං ගච්ඡති. යත්ථ වා පන භික්ඛූ නිසීදන්ති තහිං ගච්ඡති, තත්ථ එකස්ස වා දුතියො හොති, ද්වින්නං වා තතියො හොති, තිණ්ණං වා චතුත්ථො හොති. තත්ථ බහුං සම්ඵප්පලාපං පලපති. සෙය්‍යථිදං: රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං යානකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා- එවම්පි පාදලොලො හොති.

**න පාදලොලස්සාති** පාදලොලියං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, පාදලොලියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍ය චරෙය්‍ය විචරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍ය, පටිසල්ලානාරාමො අස්ස පටිසල්ලානරතො අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං ඣායී ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථ[2]-ගරුකොති - ඣායී න පාදලොලස්ස.

**විරමෙ කුක්කුච්චං නප්පමජ්ජෙය්‍යාති** - 'කුක්කුච්ච'න්ති හත්ථකුක්කුච්චම්පි කුක්කුච්චං, පාදකුක්කුච්චම්පි කුක්කුච්චං; හත්ථපාදකුක්කුච්චම්පි කුක්කුච්චං; අකප්පියෙ කප්පියසඤ්ඤිතා කප්පියෙ අකප්පියසඤ්ඤිතා අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා, යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං. අපි ච ද්වීහි කාරණෙහි උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො:

---

1. අනවට්ඨිත - මජසං. 2. පරමත්ථ - මජසං.

අරමින් අරමට උයනින් උයනට ගමින් ගමට නිගමින් නිගමට නුවරින් නුවරට රටින් රටට දනව්වෙන් දනව්වට දීඝචාරිකාවෙහි නො නවත්නා චාරිකාවෙහි යෙදුණේ වෙසෙයි. මෙසේත් පාදලොල වෙයි. නොහොත් මහණ ඇතුළු සඟරමෙහි ද පාදලොල වූයේ පාදලොලුභාවයෙන් යුක්ත වූයේ වෙයි. ප්‍රයොජන නැති වැ කාරණ නැති වැ උඩඟු වූයේ නො සන්හුන් සිත් ඇතියේ පිරිවෙනින් පිරිවෙනට වෙහෙරින් වෙහෙරට යෙයි, අඩ්ඩයොගයෙන් අඩ්ඩයොගයට යෙයි, ප්‍රාසාදයෙන් ප්‍රාසාදයට යෙයි, සඳලුහෙයින් සඳලුහෙට යෙයි, ගුහාවෙන් ගුහාවට යෙයි, ලෙනින් ලෙනට - කිළියෙන් කිළියට - කුළුගෙන් කුළුගෙට - අටල්ලෙන් අටල්ලට - මහලින් මහලට - උද්දණ්ඩ (එක් මහලින් යුත් ගෙය) යෙන් උද්දණ්ඩයට - බඹුහලින් බඹුහලට - උවටැන්හලින් උවටැන්හලට - මණ්ඩලයෙන් මණ්ඩලයට - රුක්මුලින් රුක්මුලට යෙයි. තවද යම් තැනෙක භික්ෂූහු හිඳිත් නම්, එහි යෙයි; එහි එකක් හට හෝ දෙවැන්නා වෙයි, දෙදෙනකුන්ට හෝ තෙවැන්නා වෙයි, තිදෙනකුන්ට හෝ සිවුවැන්නා වෙයි. එහි දී බොහෝ නිරර්ථක කථා පවසයි. ඒ මෙසේ යැ: රාජකථා යැ චොරකථා යැ මහාමාත්‍ය-කථා යැ සෙනාකථා යැ භයකථා යැ යුද්ධකථා යැ ආහාරකථා යැ පානකථා යැ වස්ත්‍රකථා යැ යානකථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධකථා යැ ඥාතිකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගරකථා යැ ජනපදකථා යැ ස්ත්‍රීකථා යැ පුරුෂකථා යැ සූරකථා යැ වීථිකථා යැ කුම්භස්ථාන (=පැන් තොට පිළිබැඳි) කථා යැ අතීත ඥාතීන් පිළිබැඳි කථා යැ නන්වැදෑරුම් නිරර්ථකකථා යැ ලොකායතකථා යැ සමුද්‍රාඛ්‍යානකථා යැ - වෘද්ධි - හානි පිළිබැඳි කථා යැ යනාදිය යි. මෙසේ ත් පාදලොල වේ.

**න පාදලොලස්ස** - පාදලොලුභාවය දුරු කරන්නේ යැ, සන්හිඳුවන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනුඅභාවයට පමුණුවන්නේ යැ, පාදලොලුභාව-යෙන් දුරු වූයේ වන්නේ යැ, නො ඇලුණේ වෙසෙසින් වෙන්වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වාසය කරන්නේ යැ හැසිරෙන්නේ යැ වෙසෙසින් හැසිරෙන්නේ යැ ඉරියවු පවත්වන්නේ යැ වැටෙන්නේ යැ රැකෙන්නේ යැ යැපෙන්නේ ය යාපනය වන්නේ යැ, විවෙකය සතුටු වූයේ විවෙකයෙහි ඇලුණේ අධ්‍යාත්මයෙහි වූ චිත්තසමාධියෙහි යෙදුණේ වන්නේ ය, බැහැර නො කළ ධ්‍යාන ඇත්තේ විදර්ශනාවෙන් සමන්විත වූයේ ශුන්‍යාගාරයෙහි කරන ශමථවිදර්ශනා භාවනාව වඩන්නේ යැ ධ්‍යාන කරනුයේ ධ්‍යානයෙහි ඇලුණේ එකාග්‍රතාවෙහි යෙදුණේ ස්වාර්ථය ගරු කරන්නේ නුයි 'ඣායී න පාදලොලස්ස' යනු වේ.

**විරමෙ කුක්කුච්චා නප්පමජ්ජෙය්‍ය** - 'කුක්කුච්ච' නම්: අත්කුකුස ද කුකුස් යැ, පාකුකුස ද කුකුස් යැ, අත්පාකුකුස ද කුකුස් යැ, අකැපයෙහි කැපසංඥ ඇතිබව යැ, කැපයෙහි අකැප සංඥ ඇතිබව යැ, නිවරදෙහි වද්‍යසංඥ ඇතිබව යැ, වරදෙහි අවද්‍යසංඥ ඇතිබව යැ, මෙබඳු වූ යම් කුකුසක් කුකුස් අයුරක් කුකුසට පැමිණි බවක් චිත්තයාගේ විපිළිසර යෙක් මනොවිලෙඛයෙක් වේ නම්, මේ කුකුසැයි කියනු ලැබෙයි. තවද දෙකරුණෙකින් කුකුස සිතැ විපිළිසර මනොවිලෙඛය උපදී:

කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො ? 'කතං මෙ කායදුච්චරිතං අකතං මෙ කායසුචරිත'න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. 'කතං මෙ වචීදුච්චරිතං අකතං මෙ වචීසුචරිත'න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. 'කතං මෙ මනො-දුච්චරිතං අකතං මෙ මනොසුචරිතං -පෙ- කතො මෙ පාණාතිපාතො අකතා මෙ පාණාතිපාතා වෙරමණී'ති උප්පජ්ජති කුක්කුච්චං -පෙ- මනොවිලෙඛො. 'කතං මෙ අදින්නාදානං - කතො මෙ කාමෙසු මිච්ඡාචාරො - කතො මෙ මුසාවාදො - කතා මෙ පිසුණා වාචා - කතා මෙ ඵරුසා වාචා කතො මෙ සම්ඵප්පලාපො - කතා මෙ අභිජ්ඣා - කතො මෙ බ්‍යාපාදො-කතා මෙ මිච්ඡාදිට්ඨි අකතා මෙ සම්මාදිට්ඨි'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. එවං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො.

අථවා, සීලෙසුම්හි න පරිපූරකාරීති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරොති - භොජනෙ අමත්තඤ්ඤුම්හීති - ජාගරියං අනනුයුත්තොම්හීති - න සතිසම්පජඤ්ඤෙන සමන්නාගතොම්හීති - අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති - අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති - අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති-අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති - අභාවිතානි මෙ පඤ්චබලානීති - අභාවිතා මෙ සත්ත බොජ්ඣඞ්ගාති - අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති සමුදයො මෙ අප්පහීනොති මග්ගො මෙ අභාවිතොති නිරොධො මෙ අසච්ඡිකතො'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො.

**විරමෙ කුක්කුච්චන්ති** -කුක්කුච්චා ආරමෙය්‍ය විරමෙය්‍ය පටිවිරමෙය්‍ය, කුක්කුච්චං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, කුක්කුච්චා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති - විරමෙ කුක්කුච්චං.

කළ බැවින් ද නො කළ බැවින් දූයි. කිසෙසින් (අකුශලය) කළ බැවින් හා (කුශලය) නො කළ බැවින් කුකුස සිත්හි විපිළිසර චිත්තවිලේඛය උපදී ද යත්: 'මා විසින් කායදුශ්චරිතය කරන ලද, මා විසින් කායසුචරිතය නොකරන ලද'යි කුකුස සිතේ විපිළිසර මනෝවිලේඛය උපදී; 'මා විසින් වාග්දුශ්චරිතය කරන ලද, මා විසින් වාක්සුචරිතය නො කරන ලද'යි කුකුස සිතේ විපිළිසර මනොවිලේඛය උපදී; 'මා විසින් මනොදුශ්චරිතය කරන ලද, 'මා විසින් මනඃසුචරිතය නො කරන ලද'යි...'මා විසින් ප්‍රාණවධ කරන ලද, 'මා විසින් ප්‍රාණඝාත විරමණය නො කරන ලද'යි කුකුස...උපදී; 'මා විසින් අදත්තාදාන කරන ලද...මා විසින් කාමමිථ්‍යාචාර කරන ලද...මා විසින් මෘෂාවාද කියන ලද...මා විසින් පෛශුන්‍යවාක් කියන ලද...මා විසින් පරුෂවචන කියන ලද...මා විසින් සම්ඵප්‍රලාප කියන ලද...මා විසින් අභිධ්‍යා කරන ලද... මා විසින් ව්‍යාපාද කරන ලද...මා විසින් මිථ්‍යාදෘෂ්ටි ගත්තා ලද, මා විසින් සම්‍යග්දෘෂ්ටි නො ගත්තා ලද'යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලේඛය උපදී. මෙසෙසින් කෘත හෙයින් ද අකෘත හෙයින් ද කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලේඛය උපදී.

නොහොත් 'ප්‍රාතිමොක්ෂශීලයෙහි පරිපූරකාරී නො වූයෙමි' කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලේඛය උපදී; ඉන්ද්‍රියයන්හි අගොපිතද්වාර ඇත්තෙම් වූයෙමි...භොජනයෙහි අමාත්‍රඥයෙම් වීමි...නිදි දුරුකිරීමෙහි නො යෙදුණෙම් වීමි...සමෘතිසම්ප්‍රජන්‍යයෙන් යුක්තයෙම් නො වූයෙමි... මා විසින් සතර සතිපට්ඨානයෝ නො වඩන ලදහයි...මා විසින් සතර සම්‍යක්ප්‍රධානයෝ නො වඩන ලදහයි...මා විසින් සතර සෘද්ධිපාදයෝ නො වඩන ලදහයි...මා විසින් පඤ්චෙන්ද්‍රියයෝ නො වඩන ලදහයි... මා විසින් පඤ්චබලයෝ නො වඩන ලදහයි...මා විසින් සප්තබොධ්‍යඞ්ගයෝ නො වඩන ලදහයි...මා විසින් ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය නො වඩන ලදැයි මා විසින් දුඃඛසත්‍යය අපරිඥාත යැයි...මා විසින් සමුදය අප්‍රහීණ යැයි... මා විසින් මාර්ගය නො වඩන ලදැයි...මා විසින් නිරොධය ප්‍රත්‍යක්ෂ නො කරන ලදැයි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලේඛය උපදී.

විරමෙ කුක්කුච්චා - කෞකෘත්‍යයෙන් හාත්පසින් වෙන් වන්නේ යැ, වෙසෙසින් වෙන් වන්නේ යැ, සර්වප්‍රකාරයෙන් වෙන් වන්නේ යැ, කුකුස දුරු කරන්නේ යැ, බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ; කුකුසින් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් දුරු වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍ය්‍යාද කළ සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'විරමෙ කුක්කුච්චා' යනු වේ.

**නප්පමජ්ජෙය්‍යාති** සක්කච්චකාරී අස්ස සාතච්චකාරී අට්ඨිතකාරී අනොලීනවුත්තිකො අනික්ඛිත්තඡන්දො අනික්ඛිත්තධුරො අප්පමත්තො කුසලෙසු ධම්මෙසු; ‘කදාහං අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙය්‍යං, පරිපූරං වා සීලක්ඛන්ධං තත්ථ තත්ථ පඤ්ඤාය අනුග්ගණ්හෙය්‍ය’න්ති; යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච ථාමො ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච, ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසු; ‘කදාහං අපරිපූරං වා සමාධික්ඛන්ධං පඤ්ඤාක්ඛන්ධං විමුත්තික්ඛන්ධං විමුත්තිඤාණදස්සනක්ඛන්ධං, කදාහං අපරිඤ්ඤාතං වා දුක්ඛං පරිජානෙය්‍යං, අප්පහීනෙ වා කිලෙසෙ පජහෙය්‍යං, අභාවිතං වා මග්ගං භාවෙය්‍යං, අසච්ඡිකතං නිරොධං සච්ඡිකරෙය්‍ය’න්ති යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච ථාමො ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසූති – විරමෙ කුක්කුච්චා නප්පමජ්ජෙය්‍ය.

**අථාසනෙසු සයනෙසු අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍යාති** – ‘අථා’ති පදසන්ධි -පෙ- ආසනං වුච්චති යත්ථ නිසීදති මඤ්චො පීඨං භිසි තට්ටිකා චම්මඛණ්ඩො තිණසන්ථාරො පණ්ණසන්ථාරො පලාලසන්ථාරො; සයනං වුච්චති සෙනාසනං විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහාති– අථාසනෙසු සයනෙසු.

**අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍යාති** අප්පසද්දෙසු අප්පනිග්ඝොසෙසු විජනවාතෙසු මනුස්සරාහසෙය්‍යකෙසු පටිසල්ලානසාරුප්පෙසු සෙනාසනෙසු චරෙය්‍ය විචරෙය්‍ය විහරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති - අථාසනෙසු සයනෙසු අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය.

තෙනාහ භගවා:

“ඣායී න පාදලොලස්ස
විරමෙ කුක්කුච්චා නප්පමජ්ජෙය්‍ය,
අථාසනෙසු සයනෙසු
අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍යා”ති.

**14 – 12**

නිද්දං න බහුලීකරෙය්‍ය
ජාගරියං භජෙය්‍ය ආතාපී,
තන්දිං මායං හස්සං ඛිඩ්ඩං
මෙථුනං විප්පජහෙ සවිභූසං.

**නිද්දං න බහුලීකරෙය්‍යාති** රත්තින්දිවං ඡ කොට්ඨාසෙ කරිත්වා පඤ්ච කොට්ඨාසෙ පටිජග්ගෙය්‍ය[1] එකං කොට්ඨාසං නිපජ්ජෙය්‍යාති – නිද්දං න බහුලීකරෙය්‍ය.

1. ජග්ගෙය්‍ය – ස.

**නප්පමජ්ජෙය්‍ය** - සත්කාර කොට කරන සුලු වන්නේ යැ සතත භාවයෙන් කරන සුලු වන්නේ යැ, නො නැවැතී කරන සුලු වන්නේ යැ, නො හැකුළුණු පැවැතුම් ඇතියේ නො තැබූ වීර්යච්ඡන්දය ඇතියේ නො තැබූ වීර්යධුර ඇතියේ කුශලධර්මයන්හි නො පමා වූයේ වන්නේ යැ; කවර දවසෙක මම් අපරිපූර්ණ වූ ශීලස්කන්ධය හෝ පුරන්නෙම් ද, පරිපූර්ණ වූ ශීලස්කන්ධය හෝ ඒ ඒ තැන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහණය කරන්නෙම් ද'යි, එහි යම් ඡන්දයෙක් ව්‍යායාමෙක් උත්සාහයෙක් අධික උත්සාහයෙක් ස්ථිර බවෙක් නො නැවැත්මෙක් ස්මෘතියක් හා සම්ප්‍රජන්‍යයකුත් වේ ද, (එබඳු වූ) කෙලෙස් තවන වීර්ය උත්තම වීර්ය අධිෂ්ඨානය තැවත තැවත යෙදීම කුශලධර්මයන්හි අප්‍රමාදය වන්නේ යැ; කවර දවසෙක මම් අපරිපූර්ණ වූ සමාධිස්කන්ධය - ප්‍රඥාස්කන්ධය - විමුක්තිස්කන්ධය - විමුක්තිඥානදර්ශනස්කන්ධය - 'කවර දවසෙක මම් අපරිඥාත වූ දුක හෝ අශේෂයෙන් දැන ගන්නෙම් ද, අප්‍රහීණ වූ ක්ලේශයන් හෝ ප්‍රහීණ කරන්නෙම් ද, අභාවිත වූ මාර්ගය හෝ වඩන්නෙම් ද, ප්‍රත්‍යක්ෂ නො කළ නිරෝධය ප්‍රත්‍යක්ෂ කරන්නෙම් ද'යි එහි යම් ඡන්දයෙක් ව්‍යායාමෙක් උත්සාහයෙක් අධික උත්සාහයෙක් ස්ථිර බවෙක් නො නවත්නා බවෙක් ස්මෘතියක් හා සම්ප්‍රජන්‍යයකුත් වේ ද, (එබඳු වූ) කෙලෙස් තවන වීර්ය උත්තම වීර්ය අධිෂ්ඨානය අනුයෝගය කුශලධර්මයන්හි අප්‍රමාදය වන්නේ නුයි 'විරමෙ කුක්කුච්චා නප්පමජ්ජෙය්‍ය' යනු වේ.

**අථාසනෙසු සයනෙසු අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය** - 'අථ' යනු පදසන්ධි යැ...ඇඳ පුටුව බිස්ස තට්ටිකාව සම්කඩ තණඇතිරිය පත් ඇතිරිය පිදුරුඇතිරිය (යන) යම් තැනෙක හිඳී නම් (එය) 'ආසන' යයි කියනු ලැබෙයි; විහාරය අඩ්ඩයෝගය ප්‍රාසාදය සඳලුගෙය ගුහාව (යන මේ) සෙනස්න 'සයන' යයි කියනු ලැබේ නුයි 'අථාසනෙසු සයනෙසු' යනු වේ.

**අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය** - අල්පශබ්ද වූ අල්පනිර්ඝෝෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්‍යකාරණයට යෝග්‍ය වූ විවේකයට සුදුසු වූ සෙනසුන්හි හැසිරෙන්නේ යැ වෙසෙන්නේ යැ වාසය කරන්නේ යැ ඉරියව් පවත්වන්නේ යැ වැටෙන්නේ යැ රැකෙන්නේ යැ යපන යාපනය වන්නේ නුයි 'අථාසනෙසු සයනෙසු අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

"**ඣායී න පාදලොලස්ස** -පෙ- **අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය**"යි.

**14 - 12**

කෙලෙස් තවන වෙර ඇතියේ නිදි බහුල නො කරන්නේ යැ, නිදි වැරීම සෙවුනේ යැ, තන්ද්‍රා (අලස බව) ද මායාව ද හාස්‍යය ද ක්‍රීඩාව ද විභූෂණ සහිත වූ මෙවුන්දම් ද වෙසෙසින් දුරු කරන්නේ යි.

**නිද්දං න බහුලීකරෙය්‍ය** - රෑදවල ස කොටසක් කොට පස් කොටසක් නිදි වරන්නේ යැ, එක් කොටසක් නිදන්නේ නුයි 'නිද්දං න බහුලීකරෙය්‍ය' යනු වේ.

**ජාගරියං භජෙය්‍ය ආතාපීති** – ඉධ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙය්‍ය, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙය්‍ය, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙය්‍ය පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා; රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙය්‍ය. **ජාගරියං භජෙය්‍යාති** ජාගරියං භජෙය්‍ය සම්භජෙය්‍ය සෙවෙය්‍ය නිසෙවෙය්‍ය සංසෙවෙය්‍ය පටිසෙවෙය්‍යාති 'ජාගරියං භජෙය්‍ය. **ආතාපීති** ආතප්පං වුච්චති වීරියං, යො චෙතසිකො වීරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී ථාමො ධිති අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො.[a] ඉමිනා ආතාපෙන උපෙතො සමුපෙතො උපගතො[1] සමුපගතො උපපන්නො[2] සම්පන්නො[3] සමන්නාගතො සො වුච්චති ආතාපීති – ජාගරියං භජෙය්‍ය ආතාපී.

**තන්දිං මායං හස්සං ඛිඩ්ඩං මෙථුනං විප්පජහෙ සවිභූසනන්ති** – 'තන්දි'න්ති 'යා තන්දි තන්දියනා තන්දිමනකතා[4] ආලස්‍යං ආලස්‍යායනා ආලස්‍යායිතත්තං, අයං වුච්චති තන්දි. **මායාති** මායා වුච්චති වඤ්චනිකා චරියා. 'ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය – මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති, මා මං ජඤ්ඤූති ඉච්ඡති, මා මං ජඤ්ඤූති සඞ්කප්පෙති, මා මං ජඤ්ඤූති වාචං භාසති, මා මං ජඤ්ඤූති කායෙන පරක්කමති, යා එවරූපා මායා මායාවිතා අච්චාසරා වඤ්චනා නිකති විකිරණා ගූහනා පරිගූහනා ඡාදනා පටිච්ඡාදනා අනුත්තානීකම්මං අනාවිකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා.[b] '**හස්සන්ති** ඉධෙකච්චො අතිවෙලං දන්තවිදංසකං හසති. වුත්තං හෙතං භගවතා: "කොමාරකමිදං භික්ඛවෙ අරියස්ස විනයෙ යදිදං අතිවෙලං දන්තවිදංසකං හසිත"න්ති.[c] **ඛිඩ්ඩාති** ද්වෙ ඛිඩ්ඩා කායිකා ච ඛිඩ්ඩා වාචසිකා ච ඛිඩ්ඩා. කතමා කායිකා ඛිඩ්ඩා? හත්ථීහිපි කීළන්ති, අස්සෙහිපි කීළන්ති, රථෙහිපි කීළන්ති, ධනූහිපි කීළන්ති, අට්ඨපදෙපි[5] කීළන්ති, දසපදෙපි[5] කීළන්ති, ආකාසෙපි[6] කීළන්ති, පරිහාරපථෙපි කීළන්ති, සන්තිකායපි[7] කීළන්ති, ඛලිකායපි කීළන්ති, ඝටිකායපි කීළන්ති,

1. උපාගතො – පු. 2. උප්පන්නො – ස.
3. සමුප්පන්නො – ස. 4. තන්දියිතත්තං මනත්තං – සීමු. II.
5. පදෙනි – සීමු II. PTS. 6. අකාසෙහිපි – සීමු. II. PTS.
7. සන්තිකායපි – ස.
a. ධම්මසඞ්ගණී – චිත්තුප්පාදකණ්ඩ. b. ඛුද්දකවත්ථුවිභඞ්ග.
c. අඞ්ගුත්තර – සම්බොධිවග්ග.

**ජාගරියං භජෙය්‍ය ආතාපී** - මෙ සස්නෙහි මහණ දහවල සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන්ගෙන් (හෝ සියලු අකුශලයන්ගෙන්) සිත පිරිසුදු කරන්නේ යැ, රෑ පෙරයම චඞ්ක්‍රමණයෙන් හා නිෂද්‍යාවෙන් ආවරණීය ධර්මයන්ගෙන් සිත විශුද්ධ කරන්නේ යැ, රෑ මැදියම දකුණු පයෙහි වම්පය මදක් ඇද තබා සමෘතිසම්‍ප්‍රජන්‍යයෙන් යුක්ත වූයේ උත්‍ථාන සංඥාව මෙනෙහි කොට දකුණැලයෙන් සිංහශය්‍යාව කරන්නේ යැ, රෑ අලුයම නැඟීසිට චඞ්ක්‍රමණයෙන් නිෂද්‍යාවෙන් ආවරණීය ධර්මයන්ගෙන් සිත පරිශුද්ධ කරන්නේ යි. **ජාගරියං භජෙය්‍ය** නිදිවැරීම බජනේ යැ මැනවින් බජනේ යැ, සෙවුනේ යැ නිරතුරු සෙවුනේ යැ වෙසෙසින් සෙවුනේ යැ පිළිසෙවුනේ නුයි 'ජාගරියං භජෙය්‍ය' යනු වේ. **ආතාපී** 'ආතප්ප'යි වීර්‍ය්‍ය කියනු ලැබෙයි. යම් චෛතසික වීර්‍ය්‍යාරම්භයෙක් කුසීතභාවයෙන් නික්මැයැමෙක් පරාක්‍රමයෙක් උද්‍යොගයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අතිමාත්‍ර උත්සාහයෙක් ස්ථිර බවෙක් කුශලසන්තානය බැරීමෙක් නො ලිහිල් වූ පරාක්‍රම ඇති බවෙක් නො නැබූ වීර්‍ය්‍යච්ඡන්‍දය ඇති බවෙක් නො නැබූ වීර්‍ය්‍යධුර ඇතිබවෙක් ධුරය දැඩි කොට ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්‍ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද මේ 'කෙලෙස් තවන වීර්‍ය්‍යයෙන් උපෙත වූ සමුපෙත වූ යුක්ත වූ සංයුක්ත වූ නො වෙන් වූ සම්පූර්ණ වූ සමන්‍වාගත වූ හෙතෙම 'ආතාපී' යයි කියනු ලැබේ නුයි 'ජාගරියං භජෙය්‍ය ආතාපී' යනු වේ.

**තන්‍දිං මායං හස්සං ඛිඩ්ඩං මෙථුනං විප්පජහෙ සවිභූසං** - 'තන්‍දිං' යනු: යම් මැලිබවෙක් මැලි අයුරෙක් මැලියෙන් මඩනා ලද බවෙක් මැලියෙන් මැඩුණු සිත් ඇති බවෙක් අලසබවෙක් අලස අයුරෙක් ආලස්‍යයෙන් මඩනා ලද බවෙක් වේ ද, මෝ 'තන්‍දි'යි කියනු ලබයි; **මායා** නම්: වඤ්චනික ක්‍රියාව යැ, මෙහි කිසිවෙක් කයින් දුශ්චරිත යෙහි හැසිර, බසින්...සිතින් දුශ්චරිතයෙහි හැසිර 'එය ප්‍රතිච්ඡාදන හෙතුයෙන් ලාමක වූ ඉච්ඡාව පිහිටුවයි, 'නහමක් මා දනිව'යි කැමැති වෙයි, 'නහමක් මා දනිව'යි සලකයි, 'නහමක් මා දනිව'යි වචන බෙණෙයි, 'නහමක් මා දනිව'යි කයින් උත්සාහ කෙරෙයි; යම් මෙබඳු වූ මායාවක් මායා ඇතිබවෙක් ඉක්මවා යැමෙක් වඤ්චනාවක් රැවැටීමෙක් පාපයන් යටපත් කිරීමෙක් බැහැර කිරීමෙක් සැඟවීමෙක් හාත්පසින් සැඟවීමෙක් වැසීමෙක් හාත්පසින් වැසීමෙක් ප්‍රකට නො කිරීමෙක් ප්‍රකාශ නො කිරීමෙක් මොනවට වැසීමෙක් පාපක්‍රියාවක් වේ ද, මේ 'මායා'යි කියනු ලබයි; **හස්සං** යනු: මෙහි කිසිවෙක් පමණ ඉක්මවා දත් විවෘත කොට සිනාසෙයි; මේ වදාරන ලද මැයැ, භාග්‍යවතුන් විසින්: "මහණෙනි, පමණ ඉක්මවා දත් විදහා යම් සිනාසීමෙක් වේ ද, මෙය ආර්‍ය්‍යවිනයෙහි කුමරුන් කළයුතු දැය'යි. **ඛිඩ්ඩා** නම්: කායික ක්‍රීඩා ද වාචසික ක්‍රීඩා ද'යි ක්‍රීඩා දෙකෙකි: කායික ක්‍රීඩා කවර යත්: ඇතුන් සමග ද කෙළිති, අසුන් සමග ද කෙළිති, රිය සමග ද කෙළිති, දුනුවලින් ද කෙළිති, අටපදයෙහි ද කෙළිති, දසපදයෙහි ද කෙළිති, අහස්හි ද කෙළිති, පරිහාරපථයෙහි ද කෙළිති, සන්තිකා කෙළි ද කෙළිති, පසැවිනු ද කෙළිති, ඝටිකායෙන් (-කල්ලි) ද කෙළිති,

සලාකහත්ථෙනපි කීළන්ති, අක්ඛෙනපි කීළන්ති, පඞ්ගචීරෙනපි[1] කීළන්ති, වඞ්කකෙනපි කීළන්ති, මොක්ඛචිකායපි කීළන්ති, චිඞ්ගුලකෙනපි කීළන්ති, පත්තාළ්හකෙනපි කීළන්ති, රථකෙනපි කීළන්ති, ධනුකෙනපි කීළන්ති, අක්ඛරිකායපි කීළන්ති, මනෙසිකායපි කීළන්ති, යථාවජ්ජෙනපි කීළන්ති. අයං කායිකඛිඩ්ඩා. කතමා වාචසිකා ඛිඩ්ඩා? මුඛභෙරිකං මුඛාලම්බරං මුඛදෙණ්ඩිමකං මුඛවලිමකං මුඛභෙරුළකං[2] මුඛදද්දරිකං නාටකං ලාසං ගීතං දවකම්මං. අයං වාචසිකා ඛිඩ්ඩා.

**මෙථුනධම්මො** නාම: යො සො අසද්ධම්මො ගාමධම්මො වසලධම්මො දුට්ඨුල්ලො ඔදකන්තිකො රහස්සො ද්වයංද්වයසමාපත්ති. කිං කාරණා වුච්චති මෙථුනධම්මො? උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති තං කාරණා වුච්චති මෙථුනධම්මො; යථා උභො කලහකාරකා මෙථුනකාති වුච්චන්ති, උභො භණ්ඩනකාරකා - උභො භස්සකාරකා - උභො අධිකරණකාරකා - උභො විවාදකාරකා - උභො වාදිනො - උභො සල්ලාපකා මෙථුනකාති වුච්චන්ති, එවමෙවං උභින්නං රත්තානං සාරත්තානං අවස්සුතානං පරියුට්ඨිතානං පරියාදින්නචිත්තානං උභින්නං සදිසානං ධම්මොති තං කාරණා වුච්චති මෙථුනධම්මො.

**විභූසාති** ද්වෙ විභූසා: අත්ථි අගාරියස්ස විභූසා; අත්ථි පබ්බජිතස්ස විභූසා. කතමා අගාරියස්ස විභූසා? කෙසා ච මස්සු ච මාලා ච ගන්ධා ච විලෙපනා ච ආභරණා ච පිළන්ධනා ච වත්ථඤ්ච සාරසාටනඤ්ච[3] වෙඨනඤ්ච උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං ආදාසං අඤ්ජනං මාලාවිලෙපනං මුඛචුණ්ණකං මුඛලෙපං හත්ථබන්ධනං සිඛාබන්ධනං දණ්ඩං නාළිකං ඛග්ගං ඡත්තං චිත්‍රා උපාහනා උණ්හීසං මණිං වාලබීජනී ඔදාතානි වත්ථානි දීඝදසානි ඉති වා, අයං අගාරියස්ස විභූසා. කතමා පබ්බජිතස්ස විභූසා? චීවරමණ්ඩනා පත්තමණ්ඩනා සෙනාසනමණ්ඩනා ඉමස්ස වා පූතිකායස්ස බාහිරානං වා පරික්ඛාරානං මණ්ඩනා විභූසනා කෙළනා පරිකෙළනා ගෙධිතතා[4] ගෙධිතත්තං චපලතා චාපල්‍යං, අයං පබ්බජිතස්ස විභූසා.

**තන්දිං මායං හස්සං ඛිඩ්ඩං මෙථුනං විප්පජහෙ සවිභූසන්ති** - තන්දිං ච මායං ච හස්සං ච ඛිඩ්ඩං ච මෙථුනධම්මං ච සවිභූසං සපරිවාරං සපරිභණ්ඩං සපරික්ඛාරං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති - තන්දිං -පෙ- සවිභූසං.

තෙනාහ භගවා:

“නිද්දං න බහුලීකරෙය්‍ය
ජාගරියං භජෙය්‍ය ආතාපි,
තන්දිං මායං හස්සං ඛිඩ්ඩං
මෙථුනං විප්පජහෙ සවිභූස”න්ති.

---

1. පඞ්කචීරෙනපි - සීමු. II. PTS. 2. මුඛභෙරිලං - සකා. ස.
3. පසාදනඤ්ච - PTS. සයනාසනඤ්ච - සීමු. II. මජසං. හරපනඤ්ච - මචුප. රසනඤ්ච - පු. 4. ගධිතතා - ස.

ලාවටිනු ද කෙළිති, ගුළ (-පත්දු)යෙනු ද කෙළිති, පත්නලයෙනු ද කෙළිති, කුඩා නඟුලිනු ද කෙළිති, පරිවර්තන කෙළි ද කෙළිති, පත්-බමරිනු ද කෙළිති, පත්නැළියෙනු ද කෙළිති, කුඩා රියෙනු ද කෙළිති, කුඩා දුන්නෙනු ද කෙළිති, අකුරුකෙළි ද කෙළිති, සිතැඟිකෙළියෙනු ද කෙළිති, යථාවද්‍යයෙනුදු කෙළිත්. මෝ කායික ක්‍රීඩා යැ. වාචසිකක්‍රීඩා කවර යත්: මුවබෙරය මුවපණාබෙරය මුවපටහය මුඛවාලිකය (-සීරුසන්) මුවබමරුය නාටකය ඔල්වරහඬය ගායනය සිනාකෙළිය යන මේ වාචසික ක්‍රීඩා යි.

මෛථුනධම්ම නම්: යම් ඒ අසද්ධම්මයෙක් ග්‍රාම්‍යධර්මයෙක් වසලධර්මයෙක් දුළුල් දහමෙක් ඕදකාන්තිකධර්මයෙක් රහස්‍යධර්මයෙක් ද්වයංද්වයසමාපත්තියක් වේ ද එයයි. කවර කරුණෙකින් ‘මෙථුනධම්ම’යි කියනු ලැබෙයි යත්: රාගයෙන් රත් වූ වෙසෙසින් රත් වූ කෙලෙසින් තෙත් වූ කුසල් සිත මැඩගෙන සිටියා වූ කුසල්සිත ගෙවාගෙන සිටියා වූ (ස්ත්‍රී-පුරුෂ) දෙදෙනාගේ කෙලෙසුන්ගෙන් සම වූ දෙදෙනාගේ සවභාවය නිසි-එකරුණෙන් ‘මෙථුනධම්ම’යි කියනු ලැබෙයි. යම් සේ කලහකරුවෝ දෙදෙන මෙථුනකයෝ (-සදෘශයෝ) යයි කියනු ලැබෙත් ද, ඩබරකරුවෝ දෙදෙන - බසින් ඝැටෙන කරනුවෝ දෙදෙන - අධිකරණකාරකයෝ (-නඩු කියනුවෝ) දෙදෙනා - විවාදකරුවෝ දෙදෙන - වාදීහු දෙදෙන - කථා කරනුවෝ දෙදෙනා සමානයෝ යැයි කියනු ලැබෙත් ද, එසෙයින් ම රත් වූ වෙසෙසින් රත් වූ කෙලශයෙන් තෙත් වූ කුසල් සිත යටපත් වූ කුසල් සිත ගෙවාගෙන සිටි දෙදෙනාගේ සදෘශ වූ දෙදෙනාගේ සවභාව නිසි-එ කරුණෙන් ‘මෙථුනධම්ම’යි කියනු ලැබේ.

විභූස නම්: සැරසුම් දෙකෙකි: ගිහියේ වැසියාගේ සැරසුමෙක් ඇත. පැවිද්දාගේ සැරසුමෙක් ඇත. ගිහිගේවැසියාගේ සැරසුම කවරු යත්: (කතුරෙන්) හිසකෙස් කැපීම ද (දැළි තබා) රවුළු බෑම ද මල් ගඳ විලෙවුන් ද අබරණ ද පලඳනා ද වස්ත්‍ර ද බඳපට ද (හෝ රසත්දම) හිස්වෙළුම ද, ඇඟ ඉලීම ඇඟ මැඩීම (දරුවන්) නැහැවීම සම්බාහනය කැඩපත අඳුන් මල් විලෙවුන් මුවසුණු මුඛාලේප හස්තබන්ධන සිළුබැඳුම දඬුනල කඩු ඡත්‍රය විසිතුරු වහන් නලල්පට සිළුමිණ විල්විදුනා දික්දවලූ ඇති සුදු වත් යනාදිය යි. මේ ගිහි වැසියාගේ සැරසුමැ. පැවිද්දාගේ සැරසුම් කවරු යත්: චීවරමණ්ඩනය පාත්‍රමණ්ඩනය ශයනාසනමණ්ඩනය මේ කුණු කය හෝ බාහිර පරිෂ්කාරයන් හෝ මණ්ඩනය සැරසීම කෙළෑවීම හාත්පසින් කෙළෑවීම කැමැති බව ගිජු බව චපල බව චාපල්‍යය යන මේ පැවිද්දාගේ සැරසුම්.

**තන්දිං මායං හස්සං ඛිඩ්ඩං මෙථුනං විප්පජහෙ සවිභූසං** - මැලිබව ද මායා (-වංචා) ව ද හාස්‍යය ද ක්‍රීඩාව ද සැරසුම් සහිත වූ පිරිවර සහිත වූ පිරිබඩ සහිත වූ පිරිකර සහිත වූ මෛථුන්දම් ද හරනේ යැ දුරු කරන්නේ යැ විගනාතන කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ නුයි ‘තන්දිං...සවිභූසං’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“නිද්දං න බහුලීකරෙය්‍ය -පෙ- මෙථුනං විප්පජහෙ සවිභූසං”යි.

**14 - 18**

ආථබ්බණං[1] සුපිනං ලක්ඛණං
නො විදහෙ අථොපි නක්ඛත්තං,
විරුතඤ්ච ගබ්භකරණං
තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය.

**ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථොපි නක්ඛත්තන්ති** ආථබ්බණිකා ආථබ්බණං පයොජෙන්ති නගරෙ වා රුද්ධෙ සඞ්ගාමෙ වා පච්චුපට්ඨිතෙ පරසෙනාය පච්චත්ථිකෙසු පච්චාමිත්තෙසු ඊතිං උප්පාදෙන්ති, උපද්දවං උප්පාදෙන්ති, රොගං උප්පාදෙන්ති, පජ්ජරකං කරොන්ති, සූලං කරොන්ති, විසූචිකං කරොන්ති, පක්ඛන්දිකං කරොන්ති. එවං ආථබ්බණිකා ආථබ්බණං පයොජෙන්ති.

සුපිනපාඨකා සුපිනං ආදිසන්ති: 'යො පුබ්බණ්හසමයං සුපිනං පස්සති, එවං විපාකො හොති. යො මජ්ඣන්හිකසමයං සුපිනං පස්සති, එවං විපාකො හොති. යො සායන්හසමයං සුපිනං පස්සති, එවං විපාකො හොති. යො පුරිමෙ යාමෙ - යො මජ්ඣිමෙ යාමෙ - යො පච්ඡිමෙ යාමෙ- යො දක්ඛිණෙන පස්සෙන නිපන්නො - යො වාමෙන පස්සෙන නිපන්නො යො උත්තානං නිපන්නො - යො අවකුජ්ජනිපන්නො - යො චන්දං පස්සති, යො සුරියං පස්සති, යො මහාසමුද්දං පස්සති, යො සිනෙරුං පබ්බතරාජානං පස්සති, යො හත්ථිං පස්සති, යො අස්සං පස්සති, යො රථං පස්සති, යො පත්තිං පස්සති, යො සෙනාබ්‍යූහං පස්සති, යො ආරාමරාමණෙය්‍යකං පස්සති, යො වනරාමණෙය්‍යකං පස්සති, යො භූමිරාමණෙය්‍යකං පස්සති, යො පොක්ඛරණීරාමණෙය්‍යකං පස්සති, එවං විපාකො හොතී'ති එවං සුපිනපාඨකා සුපිනං ආදිසන්ති.

ලක්ඛණපාඨකා ලක්ඛණං ආදිසන්ති: 'මණිලක්ඛණං දණ්ඩලක්ඛණං වත්ථලක්ඛණං අසිලක්ඛණං උසුලක්ඛණං ධනුලක්ඛණං ආවුධලක්ඛණං ඉත්ථිලක්ඛණං පුරිසලක්ඛණං කුමාරිකාලක්ඛණං කුමාරලක්ඛණං දාසිලක්ඛණං දාසලක්ඛණං හත්ථිලක්ඛණං අස්සලක්ඛණං මහිසලක්ඛණං උසභලක්ඛණං ගොණලක්ඛණං අජලක්ඛණං මෙණ්ඩලක්ඛණං කුක්කුටලක්ඛණං වට්ටලක්ඛණං ගොධාලක්ඛණං කණ්ණිකාලක්ඛණං කච්ඡපලක්ඛණං මිගලක්ඛණං ඉතිවා'ති එවං ලක්ඛණපාඨකා ලක්ඛණං ආදිසන්ති.

නක්ඛත්තපාඨකා නක්ඛත්තං ආදිසන්ති: 'අට්ඨවීසති නක්ඛත්තානි; ඉමිනා නක්ඛත්තෙන ඝරප්පවෙසො කත්තබ්බො. ඉමිනා නක්ඛත්තෙන මකුටං බන්ධිතබ්බං. ඉමිනා නක්ඛත්තෙන වාරෙය්‍යං කාරෙතබ්බං. ඉමිනා නක්ඛත්තෙන බීජනීහාරො කත්තබ්බො. ඉමිනා නක්ඛත්තෙන සංවාසො ගන්තබ්බො'ති එවං නක්ඛත්තපාඨකා නක්ඛත්තං ආදිසන්ති.

**ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථොපි නක්ඛත්තන්ති** ආථබ්බණඤ්ච සුපිනඤ්ච ලක්ඛණඤ්ච නක්ඛත්තඤ්ච නො විදහෙය්‍ය, න චරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදාය වත්තෙය්‍ය; අථවා න ගණ්හෙය්‍ය න ධාරෙය්‍ය, න උපධාරෙය්‍ය, න උපලක්ඛෙය්‍ය නප්පයොජෙය්‍ය - ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථොපි නක්ඛත්තං.

1. ආතප්පනං - මජුප.

## 14 - 13

බුද්ධාදී මාමක වූ මහණ තෙමේ අථර්වණමන්ත්‍ර ප්‍රයොගය ද සවප්න ශාස්ත්‍රය ද (මණිලක්ෂණාදි) ලක්ෂණශාස්ත්‍රය ද යළි නකත් කීම ද නො කරන්නේ යෑ. විරුත (මෘගවාක්‍ය) ශාස්ත්‍රය ද ගබ් ගැන්වීම ද චිකිත්සාව ද නො සෙවුනේයි.

**ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථො'පි නක්ඛත්තං**– අථර්වණ (මෙරමා නසන) මන්ත්‍ර දන්නාහු අථර්වණමන්ත්‍ර (සූනියම්) කෙරෙති, නුවර ඇවුරු කල හෝ යුද පැමිණි කල හෝ සතුරු සෙනා-වෙහි විරුද්ධ වූ සතුරන් කෙරෙහි ශරීරකම්පා උපදවති, උවදුරු උපදවති, රොග උපදවති, ජ්වර උපදවති, ආමශූල (හෝ ඉදිමුම්) උපදවති, පාචන උපදවති, රක්තාතිසාර කෙරෙත්. මෙසේ ආථර්වණිකයෝ අථර්වණමන්ත්‍ර යොදත්.

සවප්නපාඨකයෝ සිහින පවසති: 'යමෙක් පෙරවරුයෙහි සිහින දකී නම් මෙබඳු විපාක වෙයි, යමෙක් මධ්‍යාහ්නයෙහි සිහින දකී නම්, මෙසේ විපාක වෙයි, යමෙක් සවස් කලැ සිහින දකී නම්, මෙසේ විපාක වෙයි, යමෙක් පෙරයමැ...මැදියමැ...අලුයමැ...යමෙක් දකුණැලයෙන් හෝනේ...යමෙක් වමැලයෙන් හෝනේ... යමෙක් උඩුබැලි වැ හෝනේ... යමෙක් යටිනුරු වැ හෝනේ...යමෙක් චන්ද්‍රයා දකී නම් යමෙක් සූර්‍ය්‍යයා දකී නම් යමෙක් මහමුහුද දකී නම් යමෙක් මහමෙර දකී නම් යමෙක් ඇතකු දකී නම් යමෙක් අසකු දකී නම් යමෙක් රිය දකී නම් යමෙක් පාබල දකී නම් යමෙක් කඳවුරු දකී නම් යමෙක් රමණී අරම් දකී නම් යමෙක් රමණී උයන් දකී නම් යමෙක් රමණී බිම් පෙදෙස් දකී නම් යමෙක් රමණී පොකුණු දකී නම්, මෙසේ විපාක වේ යැ'යි මෙ පරිද්දෙන් සවප්නපාඨකයෝ සිහින ප්‍රකාශ කෙරෙත්.

ලක්ෂණපාඨකයෝ ලක්ෂණ ප්‍රකාශ කෙරෙති: 'මණිලක්ෂණය දණ්ඩ-ලක්ෂණය වස්ත්‍රලක්ෂණය ඛඩ්ගලක්ෂණය හී ලකුණ දුනු ලකුණ අවි ලකුණ ස්ත්‍රීලක්ෂණ පුරුෂලක්ෂණ කුමාරිකාලක්ෂණ කුමාරලක්ෂණ දාසිලකුණ දස්ලකුණ ඇත්ලකුණ අස්ලකුණ මීහිලකුණ වෘෂභලකුණ ගවලකුණ බැටෙළුලකුණ එළුලකුණ කුකුළුලකුණ වටුලකුණ ගොයලකුණ කණ්ණිකා ලක්ෂණ කච්ඡපලක්ෂණ මෘගලක්ෂණ යනාදිය' යි මෙසේ ලක්ෂණ පාඨකයෝ ලක්ෂණ ප්‍රකාශ කෙරෙත්.

නක්ෂත්‍රපාඨකයෝ නකත් පවසති: නකත් අටවිස්සෙකි; මේ නකතින් ගෙවැදී යැ යුත්තේ යැ මේ නකතින් මුහුළු බැන්ද යුතු යැ, මේ නකතින් ආවාහවිවාහ කරවියැ යුතු යැ, මේ නකතින් බිජු (කොටුවිත්) අළ යුතු යැ, මේ නකතින් සංවාසයට යා යුතු යැ'යි මෙසේ නැකැත්තෝ නකත් පවසති.

**ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථො'පි නක්ඛත්තං**– සිහින ද නිමිති ද නො කරන්නේ යැ නො හැසිරෙන්නේ යැ, වෙසෙසින් නො හැසිරෙන්නේ යැ, මොනවට ගෙන නො පවත්නේ යැ, නොහොත් නො ගන්නේ යැ, නො දරන්නේ යැ, නො විමසන්නේ යැ, නො සලකන්නේ යැ නො යොදන්නේ නුසි 'ආථබ්බණං සුපිනං ලක්ඛණං නො විදහෙ අථො පි නක්ඛත්තං' යනු වේ.

**විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍යාති**- විරුතං වුච්චති මිගවාක්‍යං.[1] මිගවාක්‍යපාඨකා[2] මිගවාක්‍යං ආදිසන්ති: සකුන්තානං වා චතුප්පදානං වා රුතං වස්සිතං ජානන්ති; එවං මිගවාක්‍යපාඨකා මිගවාක්‍යං ආදිසන්ති. ගබ්භකරණීයා ගබ්භං සණ්ඨාපෙන්ති. ද්වීහි කාරණෙහි ගබ්භො න සණ්ඨාති: පාණකෙහි වා වාතකුපෙහි වා. පාණකානං වා වාතකුපානං වා පටිඝාතාය ඔසධං දෙන්තීති එවං ගබ්භකරණීයා ගබ්භං සණ්ඨාපෙන්ති. **තිකිච්ඡාති** පඤ්ච තිකිච්ඡා: සාලාකියං සල්ලකත්තියං කායතිකිච්ඡං භූතියං කොමාරභච්චං[3]. **මාමකොති** බුද්ධමාමකො ධම්මමාමකො සඞ්ඝමාමකො; සො වා භගවන්තං මමායති, භගවා වා තං පුග්ගලං පරිග්ගණ්හාති. වුත්තං හෙතං භගවතා: "යෙ තෙ භික්ඛවෙ භික්ඛූ කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා, න මෙ තෙ භික්ඛවෙ භික්ඛූ මාමකා අපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. න ච තෙ භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. යෙ ච ඛො භික්ඛවෙ භික්ඛූ නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා, තෙ ඛො මෙ භික්ඛවෙ භික්ඛූ මාමකා. අනපගතා ච තෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා. තෙ ච භික්ඛූ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති[a]

1. "කුහා ථද්ධා ලපා සිඞ්ගී උන්නළා අසමාහිතා,
   න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ.

2. නික්කුහා නිල්ලපා ධීරා අත්ථද්ධා සුසමාහිතා,
   තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධදෙසිතෙ"ති.[a]

**විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍යාති**- විරුතඤ්ච ගබ්භකරණඤ්ච තිකිච්ඡඤ්ච මාමකො න සෙවෙය්‍ය, න නිසෙවෙය්‍ය න සංසෙවෙය්‍ය නප්පටිසෙවෙය්‍ය න චරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදාය වත්තෙය්‍ය, අථවා න ගණ්හෙය්‍ය න උග්ගණ්හෙය්‍ය න උපධාරෙය්‍ය න උපලක්ඛෙය්‍ය න පයොජෙය්‍යාති - විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය.

තෙනාහ භගවා:

"ආථබ්බණං සුපිනං ලක්ඛණං
නො විදහෙ අථොපි නක්ඛත්තං,
විරුතඤ්ච ගබ්භකරණං
තිකිච්ඡං මාමකො න සෙවෙය්‍යා"ති.

---

1. මිගවාක්කං - මජසං. මිගචක්කං - සයා. PTS. මිගපක්ඛ - සී.
2. මිගවාක්කපාඨකා - මජසං. මිගචක්කපාඨකා - PTS.
3. කොමාරභච්චං - සයා.

a. චතුක්කඞ්ගුත්තර - උරුවෙලවග්ග.

**විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය** – 'විරුතං' යි මෘගවාක්‍යය කියනු ලැබෙයි; මෘගවාක්‍යපාඨකයෝ සතුන්ගේ හඬ දක්වති: ලිහිණින්ගේ හෝ සිවුපාවුන්ගේ හෝ නාදය හැඬීම දැනගනිති. මෙසේ මෘගවාක්‍යපාඨකයෝ සතුන්ගේ හැඬීම දක්වත්. ගර්භසංස්ථාපකයෝ ගැබ් පිහිටුවති; දෙකරුණෙකින් ගැබ නො පිහිටයි: පණුවන් හෙතු කොට හෝ වාතකොපයන් හෙතු කොට හෝ යැ; පණුවන් හෝ වාතකොපයන් හෝ නැසීම පිණිස බෙහෙත් දෙත් නුයි මෙසේ ගර්භසංස්ථාපකයෝ ගැබ් පිහිටුවත්. **තිකිච්ඡා** නම්: චිකිත්සා පසෙකි: ශාලාක්‍ය යැ ශල්‍යකර්ම යැ කායචිකිත්සා යැ භූතවිද්‍යා යැ කෞමාරභෘත්‍ය යැයි. **මාමකො** යනු: බුද්ධමාමක ධර්මමාමක සඞ්ඝමාමක වූයේ, හෙතෙම හෝ බුදුන් මාමයන කෙරෙයි, බුදුහු හෝ ඒ පුද්ගලයා විමසන සේක; මේ වදාරන ලද මැය බුදුන් විසින්: "මහණෙනි, යම් ඒ මහණ කෙනෙක් කුහක වූවාහු තද වූවාහු ප්‍රත්‍යය පිළිබඳ වචන කියන්නාහු සැරසෙන පියවි ඇත්තාහු උපචාර අර්පණාසමාධි රහිත වූවාහු වෙත් ද, මහණෙනි, ඒ භික්ෂූහු මට මාමක වූවාහු නො වෙති, තවද මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙන් බැහැර වූවාහු වෙති, ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වැඩීමට වැඩුණුබවට විපුල බවට නො ද පැමිණෙත්. තවද මහණෙනි, යම් භික්ෂු කෙනෙක් කුහක නො වූවාහු ලපක නො වූවාහු ධීර වූවාහු නො තද වූවාහු මොනොවට එකඟ සිත් ඇත්තාහු වෙත් ද, මහණෙනි, ඒ භික්ෂූහු මට මාමක වූවාහු වෙති, තවද මහණෙනි, ඒ භික්ෂූහු මේ ශාසනයෙන් නො බැහැර වූවාහු වෙති, ඒ භික්ෂූහු මේ ශාසනයෙහි වෘද්ධියට විරූඪ බවට විපුල බවට ද පැමිණෙත්.

1. කුහක වූ (ක්‍රොධ – මාන වශයෙන්) තද වූ (ප්‍රත්‍යය පිළිබඳ කථා වෙත්) උපලාපක වූ (ප්‍රකට) කෙලෙස්සිඟු ඇති නැඟුණු මානනල ඇති චිත්තෛකාග්‍රතා රහිත වූ ඔවුහු සම්මාසම්බුදුන් වදාළ ශාසනධර්මයෙහි නො වැඩෙත්.

2. කුහක නො වූ ලපක නො වූ ධීර වූ නො තද වූ සුසමාහිත සිත් ඇති ඔවුහු එකාන්තයෙන් සම්මාසම්බුදුන් වදාළ ධර්මයෙහි වෙසෙසින් වැඩෙත්."යි

**විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය** – විරුත ශාස්ත්‍රය ද ගර්භසංස්ථාපනය ද චිකිත්සාව ද බුද්ධාදිමාමක වූ මහණ තෙම නො සෙවුනේ යැ, නිසෙවනය නො කරන්නේ යැ, සංසෙවනය නො කරන්නේ යැ, ප්‍රතිසෙවනය නො කරන්නේ යැ, නො හැසිරෙන්නේ යැ, සමාචරණය නො කරන්නේ යැ, සමාදන් වැ නො පවත්නේ යැ; නොහොත් නො ගන්නේ යැ, නූගන්නේ යැ, සිත්හි නො තබන්නේ යැ, නො විමසන්නේ යැ, (අනුනට කීම් වශයෙන්) නො යොදන්නේ යැයි 'විරුතඤ්ච ගබ්භකරණං තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ආථබ්බණං සුපිනං -පෙ- තිකිච්ඡං මාමකො න සෙවෙය්‍ය"**යි.

14 - 14

නින්දාය නප්පවෙධෙය්‍ය
න උණ්ණමෙය්‍ය පසංසිතො භික්ඛු,
ලොභං සහ මච්ඡරියෙන
කොධං පෙසුනියඤ්ච[1] පනුදෙය්‍ය.

**නින්දාය නප්පවෙධෙය්‍යාති** - ඉධෙකච්චෙ භික්ඛුං නින්දන්ති: ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා නින්දන්ති ගරහන්ති උපවදන්ති. නින්දිතො ගරහිතො උපවදිතො නින්දාය ගරහාය උපවාදෙන අකිත්තියා අවණ්ණහාරිකාය න වෙධෙය්‍ය නප්පවෙධෙය්‍ය න සම්පවෙධෙය්‍ය න තසෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න භායෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය. අභීරු අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති - නින්දාය නප්පවෙධෙය්‍ය.

**න උණ්ණමෙය්‍ය පසංසිතො භික්ඛූති** - ඉධෙකච්චෙ භික්ඛුං පසංසන්ති: ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා පසංසන්ති ථොමෙන්ති කිත්තෙන්ති වණ්ණෙන්ති. පසංසිතො ථොමිතො කිත්තිතො වණ්ණිතො පසංසාය ථොමනෙන කිත්තියා වණ්ණහාරිකාය උණ්ණතිං න කරෙය්‍ය, උණ්ණාමං න කරෙය්‍ය, මානං න කරෙය්‍ය, ථම්භං න කරෙය්‍ය, න තෙන මානං ජනෙය්‍ය, න තෙන ථද්ධො අස්ස පත්ථද්ධො පග්ගහිතසිරොති - න උණ්ණමෙය්‍ය පසංසිතො භික්ඛු.

**ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුනියඤ්ච[1] පනුදෙය්‍යාති** - **ලොභොති** "යො ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං සාරාගො සාරජ්ජනා සාරජ්ජිතත්තං අභිජ්ඣා ලොභො අකුසලමූලං;"[a] **මච්ඡරියන්ති** පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං -පෙ- ගාහො වුච්චති මච්ඡරියං; **කොධොති** "යො චිත්තස්ස ආඝාතො පටිඝාතො පටිඝං පටිවිරොධො කොපො පකොපො සම්පකොපො, දොසො පදොසො සම්පදොසො චිත්තස්ස බ්‍යාපත්ති මනොපදොසො, කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං, දොසො දුස්සනා දුස්සිතත්තං, බ්‍යාපත්ති බ්‍යාපජ්ජනා බ්‍යාපජ්ජිතත්තං, විරොධො පටිවිරොධො චණ්ඩික්කං අසුරොපො අනත්තමනතා චිත්තස්ස."[b]

1. පෙසුණෙය්‍යං ච - ස. 2. අස්සුරොපො - සීමු II.
a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ. b. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ

**14 - 14**

මහණ තෙම නින්දාවචනයෙන් නො කම්පා වන්නේ යැ. පසස්නා ලද්දේ උඩඟු නො වන්නේ යැ. මාත්සර්‍ය්‍ය සමග ලොභය ක්‍රොධය හා පෛශුන්‍යය ද දුරු කරන්නේ යි.

**නින්දාය නප්පවෙධෙය්‍ය** - මෙහි ඇතැම් කෙනෙක් මහණ හට නින්දා කෙරෙති: ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්‍ණසෞන්දර්‍ය්‍යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්‍මායතනයෙන් හෝ ශිල්පයෙන් හෝ විද්‍යාවෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුයෙකින් හෝ නින්දා කෙරෙති, ගරහති නුගුණ කියත්. නින්දා කරන ලද්දේ ගරහන ලද්දේ නුගුණ කියන ලද්දේ නින්දාවෙන් ගර්හාවෙන් උපවාදයෙන් අකීර්ත්තියෙන් නුගුණ එළැවීමෙන් කම්පා නො වන්නේ යැ, ප්‍රකම්පා නො වන්නේ යැ, පුනපුනා කම්පා නො වන්නේ යැ, ත්‍රස්ත - උත්ත්‍රස්ත - පරිත්‍රස්ත නො වන්නේ යැ භය නො වන්නේ යැ, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ යැ. නො බිය-, සුලු වූයේ නො සැලෙනසුලු වූයේ නො තැතිගන්නාසුලු වූයේ නො පලායන සුලු වූයේ වන්නේ යැ. ප්‍රහීණ වූ භය අරමුණු ඇතියේ පහ වූ ලොමුදහ ඇතියේ වාසය කරන්නේ නුයි 'නින්දාය නප්පවෙධෙය්‍ය' යනු වේ.

**න උන්නමෙය්‍ය පසංසිතො භික්ඛු** - මෙහි ඇතැම් කෙනෙක් මහණ හට ප්‍රශංසා කෙරෙති: ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත්‍රභාවයෙන් හෝ වර්‍ණසෞන්දර්‍ය්‍යයෙන් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්‍මායතනයෙන් හෝ ශිල්පයෙන් හෝ විද්‍යාවෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර කාරණයෙකින් හෝ පසසති, තුති කෙරෙති, ප්‍රකට කෙරෙති, ගුණ කියත්. ප්‍රශංසිත - ස්තුත - කීර්ත්තිත- වර්‍ණණිත වූයේ ප්‍රශංසායෙන් ස්තුතියෙන් කීර්ත්තියෙන් ගුණ ප්‍රකාශ කිරීමෙන් උන්නතිය නො කරන්නේ යැ, උන්නාමය නො කරන්නේ යැ, මානය නො කරන්නේ යැ, ස්තම්භය නො කරන්නේ යැ, එයින් මානය නුපදවන්නේ යැ. එයින් තද වූයේ අතිශයින් තද වූයේ නැඟූ හිස ඇත්තේ නො වන්නේ ය යි - 'න උන්නමෙය්‍ය පසංසිතො භික්ඛු' යනු වේ.

**ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුනියඤ්ච පනුදෙය්‍ය** - ලොභ නම්: යම් ලොභයෙක් ලොභාකාරයෙක් ලොභ කළ බවෙක් අභිසරාගයෙක් ඇලෙන අඟුරෙක් ඇලුණු බවෙක් අභිධ්‍යාවෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **මච්ඡරිය** නම් - මාත්සර්‍ය්‍ය පසෙකි: ආවාසමාත්සර්‍ය්‍ය...ග්‍රාහය මාත්සර්‍ය්‍ය යයි කියනු ලැබේ. **කොධ** නම්: චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක් ප්‍රතිඝයෙක් ප්‍රතිවිරොධයෙක් කොපයෙක් සම්ප්‍රකොපයෙක් ද්වෙෂයෙක් ප්‍රද්වෙෂයෙක් සම්ප්‍රද්වෙෂයෙක් වේ ද, සිත පෙරළුණු බවෙක් සිත දූෂ්‍ය වීමෙක් ක්‍රොධයෙක් ක්‍රොධාකාරයෙක් කිපුණු බවෙක් ද්වෙෂයෙක් දූෂ්‍යාකාරයෙක් දූෂිත බවෙක් විපර්‍ය්‍යාසයෙක් විපර්‍ය්‍යාසාකාරයෙක් විපර්‍ය්‍යස්ත බවෙක් විරොධයෙක් ප්‍රතිවිරොධයෙක් සැඩ බවෙක් නො පිරුණු වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද එය යි.

**පෙසුණියන්ති** ඉධෙකච්චො පිසුණවාචො හොති: ඉතො සුත්වා අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය, අමුත්‍ර වා සුත්වා ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති සමග්ගානං වා භෙත්තා භින්නානං වා අනුප්පදාතා වග්ගාරාමො වග්ගරතො වග්ගනන්දී වග්ගකරණිං වාචං භාසිතා හොති. ඉති වුච්චති පෙසුඤ්ඤං.. අපි ච ද්වීහි කාරණෙහි පෙසුඤ්ඤං උපසංහරති: පියකම්‍යතාය වා භෙදාධිප්පායෙන වා. කථං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති ? 'ඉමස්ස පියො භවිස්සාමි, මනාපො භවිස්සාමි, විස්සාසිකො භවිස්සාමි, අබ්භන්තරිකො භවිස්සාමි, සුහදයො භවිස්සාමී'ති එවං පියකම්‍යතාය පෙසුඤ්ඤං උපසංහරති. කථං භෙදාධිප්පායෙන පෙසුඤ්ඤං උපසංහරති ? 'කථං ඉමෙ නානා අස්සු, වග්ගා අස්සු, ද්වීධා අස්සු, ද්වෙජ්ඣා අස්සු, ද්වෙ පක්ඛා අස්සු, භිජ්ජෙය්‍යුං න සමාගච්ඡෙය්‍යුං, දුක්ඛං න ඵාසු විහරෙය්‍යු'න්ති එවං භෙදාධිප්පායෙන පෙසුඤ්ඤං උපසංහරති. **ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍යා**ති ලොභඤ්ච මච්ඡරියඤ්ච කොධඤ්ච පෙසුඤ්ඤඤ්ච නුදෙය්‍ය පනුදෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති – ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය.

තෙනාහ භගවා:

“නින්දාය නප්පවෙධෙය්‍ය
න උණ්ණමෙය්‍ය පසංසිතො භික්ඛු,
ලොභං සහ මච්ඡරියෙන
කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍යා”ති.

## 14 - 15

කයවික්කයෙ න තිට්ඨෙය්‍ය
උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය
ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය.

**කයවික්කයෙ න තිට්ඨෙය්‍යා**ති – යෙ කයවික්කයා විනයෙ පටික්ඛිත්තා, න තෙ ඉමස්මිං අත්ථෙ අධිප්පෙතා. කථං කයවික්කයෙ තිට්ඨති ? පඤ්චන්නං සද්ධිං පත්තං වා චීවරං වා අඤ්ඤං වා කිඤ්චි පරික්ඛාරං වඩ්ඪතියං වා කරොන්තො උදයං වා පත්ථයන්තො පරිවත්තෙති, එවං කයවික්කයෙ තිට්ඨති. කථං කයවික්කයෙ න තිට්ඨති ? පඤ්චන්නං සද්ධිං පත්තං වා චීවරං වා අඤ්ඤං වා කිඤ්චි පරික්ඛාරං න වඩ්ඪතියං වා කරොන්තො න උදයං වා පත්ථයන්තො පරිවත්තෙති. එවං කයවික්කයෙ න තිට්ඨති. **කයවික්කයෙ න තිට්ඨෙය්‍යා**ති කයවික්කයෙ න තිට්ඨෙය්‍ය, න සන්තිට්ඨෙය්‍ය, කයවික්කයං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය, කයවික්කයා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති – කයවික්කයෙ න තිට්ඨෙය්‍ය.

**පෙසුණියං** යනු මෙහි කිසිවෙක් පිසුනුබස් ඇතියේ වෙයි: මෙතැනින් අසා මොවුන්ගේ බිඳීමට එතැන කියන්නේ වෙයි, එතැන හෝ අසා අරුන්ගේ බිඳීමට මුන්ට කියන්නේ වෙයි. මෙසේ සමඟ වූවන් හෝ බිඳිනුයේ භින්න වූවන් හෝ සන්ධානය නො කරනුයේ වගී වීමෙහි සතුටු වූයේ වගී වීමෙහි ඇලුණේ වගීයෙහි සතුටු වූයේ වගී කරන බස් කියන්නේ වෙයි. එහෙයින් පෛශූන්‍ය යැයි කියනු ලැබේ. තවද දෙ කරුණෙකින් පිසුනු එලවා කියයි: ප්‍රියකාම්‍යතායෙන් හෝ භේදාධි-ප්‍රායෙන් හෝ යැ. කිසෙයින් ප්‍රියකාම්‍යතායෙන් පිසුනු කියා ද යත්: 'මොහුට ප්‍රිය වූයෙම් වන්නෙමි, මනාප වූයෙම් වන්නෙමි, විස්වැසියෙම් වන්නෙමි, අභ්‍යන්තරිකයෙම් වන්නෙමි, සුහෘද් වන්නෙමි, මෙ සෙයින් ප්‍රියකාම්‍යතායෙන් පිසුනු කියයි. කිසෙයින් භේදාධිප්‍රායෙන් පිසුනු කියා ද යත්: 'කෙසේ නම් මොහු වෙන් වන්නාහු ද, වගී වන්නාහු ද, දෙ කොටස් වන්නාහු ද, දෙ කඩ වන්නාහු ද, දෙ පක්ෂ වන්නාහු ද, බිඳෙන්නාහු ද, නො සමඟ වන්නාහු ද, දුකසේ නො පහසුවේ වසන්නාහු ද'යි මෙසේ බිඳෙන අදහසින් පෙහෙසුන් බස් කියයි. **ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය** - ලෝභය ද මාත්සර්‍ය්‍යය ද ක්‍රොධය ද පෛශූන්‍යය ද දුරු කරන්නේ යැ වෙසෙසින් දුරු කරන්නේ යැ හරණේ යැ බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභා-වයට පමුණුවන්නේ ය යි 'ලොභං සහ මච්ඡරියෙන කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"නිද්දං න බහුලීකරෙය්‍ය -පෙ- කොධං පෙසුණියඤ්ච පනුදෙය්‍ය"යි

## 14 - 15

මහණ තෙමේ ක්‍රයවික්‍රයයෙහි නො පිහිටන්නේ යැ. (ඇතුළතැ පිටතැ) කිසි තැනෙක්හි (අනුන් ලවා) උපවාද නො කරවන්නේ යැ. ගම්හි දූ නො ඇලෙන්නේ යැ ලාභහෙතුයෙන් ජනයාට ලපනය නො කරන්නේ යි.

**කයවික්කයෙ න තිට්ඨෙය්‍ය** - යම් ක්‍රයවික්‍රය කෙනෙක් විනයෙහි ප්‍රතික්ෂෙප කරන ලද්දාහු නම්, ඔහු මේ අර්ථයෙහි අදහස් නො කරන ලදහ. කිසෙයින් ක්‍රයවික්‍රයයෙහි සිටී ද යත්: පස් සහධැමියන් සමඟ පාත්‍රයක් හෝ සිවුරක් හෝ අන් කිසි පිරිකරක් හෝ වඤ්චා කෙරෙමින් හෝ උදය (-වැඩියක්) පතමින් හෝ පරිවර්තන කෙරේ නම්, මෙසේ ක්‍රයවික්‍රයයෙහි සිටී. කිසෙයින් ක්‍රයවික්‍රයයෙහි නොසිටී ද යත්: පස් සහධැමියන් සමඟ පාත්‍රයක් හෝ සිවුරක් හෝ අන් කිසි පිරිකරක් හෝ වඤ්චා නො කෙරෙමින් හෝ උදය නො පතමින් හෝ පරිවර්තන කෙරේ නම්, මෙසේ ක්‍රයවික්‍රයයෙහි නො සිටී. **කයවික්කයෙ න තිට්ඨෙය්‍ය**- ක්‍රයවික්‍රයයෙහි නො සිටින්නේ යැ, නො පවත්නේ යැ, ක්‍රයවික්‍රය (-ගනුදෙනු) හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනු-අභාවයට පමුණුවන්නේ යැ. ක්‍රයවික්‍රයයෙන් දුරු වූයේ වෙසෙසින් දුරු වූයේ භාත්පසින් දුරු වූයේ වන්නේ යැ, නික්මුණේ නික්මැගියේ වෙසෙ-සින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්‍යාද කළ සිතින් යුක්ත ව වසන්නේ නුයි 'කයවික්කයෙ න තිට්ඨෙය්‍ය' යනු වේ.

**උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චීති** – කතමෙ උපවාදකරා කිලෙසා? අනෙකාකෙ සමණබ්‍රාහ්මණා ඉද්ධිමන්තො දිබ්බචක්ඛුකා පරචිත්තවිදුනො. තෙ දූරතොපි පස්සන්ති, ආසන්නාපි න දිස්සන්ති, චෙතසාපි චිත්තං පජානන්ති. දෙවතාපි ඛො සන්ති ඉද්ධිමන්තිනියො දිබ්බචක්ඛුකා පරචිත්තවිදුනියො. තා දූරතොපි පස්සන්ති, ආසන්නාපි න දිස්සන්ති, චෙතසාපි චිත්තං පජානන්ති. තෙ ඔළාරිකෙහි වා කිලෙසෙහි මජ්ඣිමෙහි වා කිලෙසෙහි සුඛුමෙහි වා කිලෙසෙහි උපවදෙය්‍යුං. කතමෙ ඔළාරිකා කිලෙසා? කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං. ඉමෙ වුච්චන්ති ඔළාරිකා කිලෙසා. කතමෙ මජ්ඣිමා කිලෙසා? කාමවිතක්කො ව්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො. ඉමෙ වුච්චන්ති මජ්ඣිමා කිලෙසා. කතමෙ සුඛුමා කිලෙසා? ඤාතිවිතක්කො ජනපදවිතක්කො අමරවිතක්කො පරානුද්දයතාපටිසඤ්ඤුත්තො විතක්කො ලාභසක්කාරසිලොකපටිසඤ්ඤුත්තො විතක්කො අනවඤ්ඤත්තිපටිසඤ්ඤුත්තො විතක්කො. ඉමෙ වුච්චන්ති සුඛුමා කිලෙසා. තෙහි ඔළාරිකෙහි වා කිලෙසෙහි මජ්ඣිමෙහි වා කිලෙසෙහි සුඛුමෙහි වා කිලෙසෙහි න උපවදෙය්‍ය, උපවාදං න කරෙය්‍ය, උපවාදකරෙ කිලෙසෙ න කරෙය්‍ය, න ජනෙය්‍ය, න සඤ්ජනෙය්‍ය, න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය. උපවාදකරෙ කිලෙසෙ පජහෙය්‍ය විනොදෙය්‍ය ව්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. උපවාදකරෙහි කිලෙසෙහි ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍ය. **කුහිඤ්චීති** කුහිඤ්චි කිම්හිචි කත්ථචි අජ්ඣත්තං වා බහිද්ධා වා අජ්ඣත්තබහිද්ධා වාති 'උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි.'

**ගාමෙ ච නාභිසජ්ජෙය්‍යාති** – කථං ගාමෙ සජ්ජති? ඉධ භික්ඛු ගාමෙ ගිහීහි සංසට්ඨො විහරති සහනන්දී සහසොකී සුඛිතෙසු සුඛිතො දුක්ඛිතෙසු දුක්ඛිතො. උප්පන්නෙසු කිච්චකරණීයෙසු අත්තනා වොයොගං ආපජ්ජති. එවම්පි ගාමෙ සජ්ජති. අථවා භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්‍ර තත්‍ර සජ්ජති. තත්‍ර තත්‍ර ගණ්හාති. තත්‍ර තත්‍ර බජ්ඣති. තත්‍ර තත්‍ර අනයබ්‍යසනං ආපජ්ජති. එවම්පි ගාමෙ සජ්ජති.

**උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි** - උපවාදකර කෙලශයෝ කවරහු ද යත්: සෘද්ධිමත් වූ දිව්‍යස් ඇති පරසිත් දන්නා ඇතැම් මහණ බමුණු කෙනෙක් ඇත්තාහු ය. ඔහු දුර සිටියාහු ද දකිති. ළං වූවාහු ද නො පැනෙති. තමන්ගේ සිතින් අනුන්ගේ සිත දැන ගනිත්. සෘද්ධිමත් වූ දිව්‍යස් ඇති පරසිත් දන්නා වූ දෙවතාවෝ ද ඇත්තාහු යැ. ඔහු දුර සිට ද දකිති. සමීප වූවාහු ද නො පැනෙති. තම සිතින් මෙරමා සිත ද දැන ගනිත්. ඔහු (කායදුශ්චරිතාදි) ඖදරික කෙලශයන්ගෙන් හෝ (කාමවිතර්කාදි) මධ්‍යම කෙලශයන්ගෙන් හෝ (ඥාතිවිතර්කාදි) සූක්‍ෂම කෙලශයන්ගෙන් හෝ උපවාද කරන්නාහු ය. ඖදාරික කෙලශයෝ කවරහු ද යත්: කායදුශ්චරිතය වාග්දුශ්චරිතය මනොදුශ්චරිතය යන මොහු ඖදරික කෙලශයෝ'යි කියනු ලැබෙත්. මධ්‍යම කෙලශයෝ කවරහු ද යත්: කාමවිතර්ක යැ ව්‍යාපාදවිතර්ක යැ විහිංසාවිතර්ක යැ යන මොහු මධ්‍යම කෙලශයෝ යි කියනු ලැබෙත්. සූක්‍ෂම කෙලශයෝ කවරහු ද යත්: ඥාතිවිතර්ක යැ ජනපදවිතර්ක යැ අමරවිතර්ක යැ පරානුද්දයතා-ප්‍රතිසංයුක්ත වූ විතර්ක යැ ලාභසත්කාරකීර්ති ප්‍රතිසංයුක්ත වූ විතර්ක යැ අනවඥත බව ප්‍රතිසංයුක්ත වූ විතර්ක යැ යන මොහු සූක්‍ෂමකෙලශයෝ යි කියනු ලැබෙත්. ඒ ඖදරික කෙලශයන්ගෙන් හෝ මධ්‍යම කෙලශයන්ගෙන් හෝ සූක්‍ෂම කෙලශයන්ගෙන් හෝ 'න උපවදෙය්‍ය, උපවාද නො කරන්නේ යැ, උපවාදකර කෙලශයන් නො කරන්නේ යැ, නො දනවන්නේ යැ, නුපදවන්නේ යැ, නො නිපදවන්නේ යැ, නො පහල කරන්නේ යැ. උපවාදකර කෙලශයන් හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. උපවාදකර කෙලශයන්ගෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍යාද කල සිතින් යුක්ත ව වාසය කරන්නේ යි. **කුහිඤ්චි** යනු: අධ්‍යාත්මයෙහි හෝ බාහ්‍යයෙහි හෝ අධ්‍යාත්මබාහ්‍යයෙහි හෝ කොහි කිසිවෙක්හි කොතැනෙක්හි නුසි 'උපවාදං භිකඛු න කරෙය්‍ය කුහිඤ්චි' යනු වේ.

**ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය** - කිසෙසින් ගම්හි ඇලෙයි යත්: මෙහි මහණ තෙම ගම්හි ගිහීන් සමග සංසෘෂ්ට ව වෙසෙයි, සමග සතුටු වනුයේ සමග ශෝක ඇතියේ (ඔවුන්) සුඛිත කල්හි සුඛිත වූයේ දුඃඛිත කල්හි දුඃඛිත වූයේ වෙයි. උපන් කලයුතු කිසි ඇති කල්හි තමා උපයොගයට (කිස කල යුතු බවට) පැමිණෙයි. මෙසේත් ගම්හි ඇලෙයි. නොහොත් මහණ තෙම පෙරවරුයෙහි හැඳපෙරෙවැ පාසිවුරු ගෙන නො රක්නා ලද කයින් නො රක්නා ලද වචනයෙන් නො රක්නා ලද සිතින් යුක්ත වැ නො එළැඹ සිටි සිහියෙන් අසංවර වූ ඉඳුරන්ගෙන් යුක්ත වැ ගමට හෝ නියම්ගමට හෝ පිඬු සිහා යෙයි. හෙතෙම ඒ ඒ අරමුණෙහි ඇලෙයි. ඒ ඒ අරමුණට පිවිසෙයි, ඒ ඒ අරමුණෙහි බැඳෙයි. ඒ ඒ අරමුණෙහි අනයව්‍යසනයට පැමිණේ. මෙසේත් ගම්හි ඇලෙයි.

කථං ගාමෙ න සජ්ජති? ඉධ භික්ඛු ගාමෙ ගිහිහි අසංසට්ඨො විහරති: න සහනන්දී න සහසොකී න සුඛිතෙසු සුඛිතො, න දුක්ඛිතෙසු දුක්ඛිතො. උප්පන්නෙසු කිච්චකරණීයෙසු න අත්තනා වොයොගං ආපජ්ජති. එවම්පි ගාමෙ න සජ්ජති. අථවා භික්ඛු පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති රක්ඛිතෙනෙව කායෙන රක්ඛිතාය වාචාය රක්ඛිතෙන චිත්තෙන උපට්ඨිතාය සතියා සංවුතෙහි ඉන්ද්‍රියෙහි. සො තත්‍ර තත්‍ර න සජ්ජති. තත්‍ර තත්‍ර න ගණ්හාති. තත්‍ර තත්‍ර න බජ්ඣති. තත්‍ර තත්‍ර න අනයබ්‍යසනං ආපජ්ජති. එවම්පි ගාමෙ න සජ්ජති. ගාමෙ ච නාභිසජ්ජෙය්‍යාති ගාමෙ න සජ්ජෙය්‍ය න ගණ්හෙය්‍ය න බජ්ඣෙය්‍ය න පලිබජ්ඣෙය්‍ය. අගිද්ධො අසත්තො අගථිතො[1] අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො -පෙ- බ්‍රහ්මභූතෙන අත්තනා විහරෙය්‍යාති - ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය.

ලාභකම්‍යා ජනං න ලපයෙය්‍යාති - කතමා ලපනා? ලාභසක්කාරසිලොකසන්නිස්සිතස්ස පාපිච්ඡස්ස ඉච්ඡාපකතස්ස ආමිසචක්ඛුකස්ස ලොකධම්මගරුකස්ස යා පරෙසං ආලපනා ලපනා සල්ලපනා උල්ලපනා සමුල්ලපනා උන්නහනා සමුන්නහනා උක්කාචනා සමුක්කාචනා අනුප්පියභාණිතා චාටුකම්‍යතා මුග්ගසූප්‍යතා[2] පාරිභට්‍යතා පරපිට්ඨිමංසිකතා, යා තත්ථ සණ්හවාචතා සඛිලවාචතා සිථිලවාචතා අඵරුසවාචතා, අයං වුච්චති ලපනා. අපි ච ද්වීහි කාරණෙහි ජනං ලපති: අත්තානං වා නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො ජනං ලපති, අත්තානං වා උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො ජනං ලපති. කථං අත්තානං නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො ජනං ලපති? 'තුම්හෙ මෙ බහූපකාරා, අහං තුම්හෙ නිස්සාය ලභාමි චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං. යෙපිමෙ අඤ්ඤෙ දාතුං වා කාතුං වා මඤ්ඤන්ති, තුම්හෙ නිස්සාය තුම්හෙ සම්පස්සන්තා. යම්පි මෙ පුරාණං මාතාපෙත්තිකං නාමධෙය්‍යං, තම්පි මෙ අන්තරහිතං. තුම්හෙහි අහං ඤායාමි අසුකස්ස කුලූපකො අසුකාය කුලූපකො'ති. එවං අත්තානං නීචං ඨපෙන්තො පරං උච්චං ඨපෙන්තො ජනං ලපති. කථං අත්තානං උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො ජනං ලපති? 'අහං තුම්හාකං බහූපකාරො, තුම්හෙ මං ආගම්ම බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, පාණාතිපාතා පටිවිරතා, අදින්නාදානා පටිවිරතා, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා, මුසාවාදා පටිවිරතා, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතා. අහං තුම්හාකං උද්දෙසං දෙමි, පරිපුච්ඡං දෙමි -

1. අගධිතො - සීමු. II. මජසං. 2. මුග්ගසූපපතා - සීමු. II. මුග්ගසූපතා - PTS.

**කිංසයිත් ගම්හි නො ඇලෙයි** යත්: මේ සස්නෙහි මහණ තෙමේ ගම්හි ගිහීන් හා අසංසෘෂ්ට වූයේ වෙසෙයි: සමග සතුටු නො වනුයේ සමග ශෝකී නො වනුයේ (ඔවුන්) සුවපත් කල්හි සුවපත් නො වනුයේ දුප්පත් කල්හි දුප්පත් නො වනුයේ වෙසි, උපන් කලයුතු කිස ඇති කල්හි එය තමා විසින් කළ යුතු බවට නො පැමිණෙයි. මෙසේත් ගම්හි නො ඇලෙයි. නොහොත් මහණ තෙමේ පෙරවරුයෙහි හැඳපෙරවැ පාසිවුරු ගෙන රක්නා ලද කායද්වාරයෙන් යුක්ත වැ රක්නා ලද වාග්ද්වාරයෙන් යුක්ත වැ රක්නා ලද මනොද්වාරයෙන් යුක්ත වැ එළැඹසිටි සිහියෙන් සංවර කළ ඉඳුරන් ගෙන් යුක්ත වැ ගමට හෝ නියම් ගමට හෝ පිඬු සිඟා යෙයි. හෙතෙම ඒ ඒ අරමුණෙහි නො ඇලෙයි. ඒ ඒ අරමුණෙහි නො පිවිසෙයි. ඒ ඒ අරමුණෙහි නො බැඳෙයි, ඒ ඒ අරමුණෙහි අනයව්‍යසනයට නො පැමිණේ. මෙසේත් ගම්හි නො ඇලේ. **ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය** - ගම්හි නො ඇලෙන්නේ යැ නො ගන්නේ යැ, නො බැඳෙන්නේ යැ, හාත්පසින් නො බැඳෙන්නේ යැ. (රාගයෙන්) නො ගෙතුණේ මුසපත් නො වූයේ නො මඩනා ලදුයේ වන්නේ යැ. පහවූ තෘෂ්ණා ඇතියේ විගත තෘෂ්ණා ඇතියේ වමනය කළ තෘෂ්ණා ඇතියේ...ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය' යනු වේ.

**ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය** - 'ලපනා' කවරී ද යත්: ලාභසත්කාරකීර්ති ඇසුරු කළ ලාමක ඉච්ඡා (-ආශා) ඇති ඉච්ඡායෙන් මඩනා ලද ආමිෂයෙහි ලොල් වූ (රූපාදි) ලොකධර්ම ගරු කොට වසන්නහුගේ අත්‍යයන්ට යම් ආදියෙහි බිණීමෙක් ලපනයෙක් මොනවට බිණීමෙක් උසස් කොට බිණීමෙක් හාත්පසින් උසස් කොට බිණීමෙක් උස් කොට බැඳීමෙක් හාත්පසින් පුනපුනා බැඳීමෙක් උසස් කොට දක්වීමෙක් හාත්පසින් උසස් කොට දක්වීමෙක් පුනපුනා ප්‍රිය වදන් කියන බවෙක් චාටුවචන ඇති බවෙක් මුද්ගසූපය වැනි වචන ඇති බවෙක් පරිභට (-දරුවන් තළවන) බවෙක් මෙරමා පිටුමස් කන බවෙක් වේ ද, එහි යම් මොළොක් වචන ඇති බවෙක් සිලුටු වචන ඇති බවෙක් ලිහිල් වචන ඇති බවෙක් මිහිරි වචන ඇති බවෙක් වේ ද, මෙය 'ලපනා' යයි කියනු ලැබෙයි. තමද දෙ කරුණෙකින් ජනයාට බෙණෙයි: තමා හෝ පහත් කොට තබමින් මෙරමා උස් කොට තබමින් ජනයාට බෙණෙයි, තමා හෝ උස් කොට තබමින් මෙරමා පහත් කොට තබමින් ජනයාට බෙණෙයි. කිසෙයින් තමා නීච කොට තබමින් පරා උච්ච කොට තබමින් ජනලපනය කෙරෙයි යත්: 'තෙපි මට බොහෝ උපකාර ඇතියව, මම තොප නිසා සිවුරු පිණ්ඩපාත සෙනසුන් බෙහෙසත්පිරිකර ලැබෙමි, මේ අන්හු ද දෙන්නට හෝ කරන්නට හෝ සිතත් නම්, තොප නිසා තොප බලමින් (දෙන්නට සිතති) පැරණි මවු පියන් සතු මාගේ යම් නමෙක් වී නම්: මාගේ ඒ නම ද වැසිණි, තොප හෙතු කොටගෙන මම 'අසුවල්හුගේ කුලූපග යැ, අසුවලගේ කුලූපග යැ'යි ප්‍රකට වෙමි. මෙසෙයින් තමා නීච කෙරෙමින් පරා උසස් කෙරෙමින් ජනලපනය කෙරෙයි. කිසෙයින් තමා උසස් කෙරෙමින් පරා පහත් කෙරෙමින් ජනලපනය කෙරෙයි යත්:' මම තොපට බොහෝ උපකාර යෙමි, තෙපි මා කරා අවුත් බුදුන් සරණ ගියව, දහම් සරණ ගියව, සඟුන් සරණ ගියව, ප්‍රාණවධයෙන් වැළැක්කවු යැ, අදත්තාදානයෙන්-කාමමිථ්‍යාචාරයෙන් - මෘෂාවාදයෙන් - මදප්‍රමාදයට කාරණ වූ රහමෙර පිමෙන් වැළැක්කවු යැ, මම තොපට උදෙස් දෙමි, පරිපෘච්ඡා දෙමි-

උපොසථං ආවිකරොමි. නවකම්මං අධිට්ඨාමි. අථ ච පන තුම්හෙ මං උජ්ඣිත්වා අඤ්ඤෙ සක්කරොථ ගරුකරොථ මානෙථ පූජෙථා'ති එවම්පි අත්තානං උච්චං ඨපෙන්තො පරං නීචං ඨපෙන්තො ජනං ලපති. **ලාභකම්‍යා ජනං න ලපයෙය්‍යාති** ලාභහෙතු ලාභපච්චයා ලාභකාරණා ලාභාභිනිබ්බත්තියා ලාභං පරිපාචෙන්තො ජනං න ලපෙය්‍ය ලපනං පජහෙය්‍ය, විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, ලපනා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො, විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය.

තෙනාහ භගවා;

"කයවික්කයෙ න තිට්ඨෙය්‍ය
උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි,
ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය
ලාභකම්‍යා ජනං න ලපයෙය්‍යා"ති.

## 14 - 16

න ච කත්ථිකො සියා භික්ඛු
න ච වාචං පයුත්තං[1] භාසෙය්‍ය,
පාගබ්භියං න සික්ඛෙය්‍ය
කථං විග්ගාහිකං න කථයෙය්‍ය.

**න ච කත්ථිකො සියා භික්ඛූති** – ඉධෙකච්චො කත්ථී හොති විකත්ථී. සො කත්ථති විකත්ථති "අහමස්මි සීලසම්පන්නො'ති වා, වතසම්පන්නො'ති වා, සීලබ්බතසම්පන්නො'ති වා, ජාතියා වා ගොත්තෙන වා කොලපුත්තියෙන වා වණ්ණපොක්ඛරතාය වා, ධනෙන වා අජ්ඣෙනෙන වා කම්මායතනෙන වා සිප්පායතනෙන වා විජ්ජාට්ඨානෙන වා සුතෙන වා පටිභානෙන වා අඤ්ඤ-තරඤ්ඤතරෙන වා වත්ථුනා, උච්චා කුලා පබ්බජිතොති වා මහාභොගකුලා පබ්බජිතොසි වා උළාරභොගකුලා පබ්බජිතොති වා, සුත්තන්තිකො ති වා විනයධරොති වා ධම්මකථිකොති වා ආරඤ්ඤිකොති වා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභීසි වා" කත්ථති විකත්ථති. එවං න කථෙය්‍ය න විකත්ථෙය්‍ය, කත්ථනං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. කත්ථනා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො, විමරියාදී-කතෙන චෙතසා විහරෙය්‍යාති – න ච කත්ථිකො සියා භික්ඛු.

1. සංයුත්තං - ස. පයුතං - සු.

පොහොය පවසති, තවහම්හි පිහිට වෙමි. එනෙකු ද වත් තෙපි මෑ හැර පියා අනුනට සත්කාර කරව, ගරු කරව, බුහුමන් කරව, පුදව'යි මෙසේත් තමා උසස් කෙරෙමින් පරා පහත් කෙරෙමින් ජනලපනය කෙරේ. **ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය** - ලාභ හෙතුයෙන් ලාභප්‍රත්‍යයෙන් ලාභ කාරණයෙන් ලාභ උපදවනු පිණිස ලාභ වඩනුයේ ජනලපනය නො කරන්නේ යැ, ලපනය හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ. ලපනයෙන් දුරු වූයේ වෙන් වූයේ හාත්පසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විගතමර්‍යාදා කළ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"කය විකාකලයෙ න නිවෙඨ්‍යා -පෙ- ලාභකම්‍යා ජනං න ලපයෙය්‍ය"යි**

## 14 - 16

මහණ තෙමේ ආත්මවර්ණිතා කරන්නෙක් නො ද වන්නේ යැ, ප්‍රත්‍යය සඳහා යොදන ලද බසක් නො ද කියන්නේ යැ, (කායාදී) බුහුටිබැව්හි නො හැසිරෙන්නේ යැ, විග්‍රාහික කථාව නො කියන්නේ යි.

**න ච කත්ථිකො සියා භික්ඛු** - මෙහි කිසිවෙක් කත්ථන විකත්ථන (-ආත්මවර්ණිතාව) කරන්නේ වෙයි. හෙතෙම කත්ථනය විකත්ථනය කෙරෙයි: 'මම් ශීලසම්පන්නයෙමි හෝ ව්‍රතසම්පන්නයෙමි හෝ ශීලව්‍රත-සම්පන්නයෙමි හෝ ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ කුලපුත් බැවින් හෝ පැහැපත් සිරුරු ඇති බැවින් හෝ ධනයෙන් හෝ අධ්‍යයනයෙන් හෝ කර්මායතනයෙන් හෝ ශිල්පයෙන් හෝ විද්‍යාවෙන් හෝ ශ්‍රැතයෙන් හෝ ප්‍රතිභානයෙන් හෝ අන්‍යතරාන්‍යතර වස්තුවකින් හෝ උසස් කුලයෙන් පැවිදි වූයෙමි' හෝ ගැහැවිමහසල්කුලයෙන් පැවිදි වූයෙමි හෝ බොහෝ සැපත් ඇති කුලයෙන් පැවිදි වූයෙමි හෝ සෞත්‍රාන්තිකයෙමි හෝ විනයධරයෙමි හෝ ධර්මකථිකයෙමි හෝ ආරණ්‍යකයෙමි හෝ...නෙවසඤ්ඤා-නාසඤ්ඤායතනසමාපත්තිලාභී වෙමි හෝ' තමාගේ ගුණ කියයි, වෙසෙසින් කියයි. මෙසේ සිය ගුණය නො කියන්නේ යැ, වෙසෙසින් නො කියන්නේ යැ, ගුණ කීම හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. ගුණ කථනයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ. නික්මැගියේ ප්‍රහීණ වූයේ වෙසෙසින් මිදුණේ වියොග වූයේ විගතමර්‍යාදා කළ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'න ච කත්ථිකො සියා භික්ඛු' යනු වේ.

**න ච වාචං පයුත්තං භාසෙය්‍යාති** - කතමා පයුත්තවාචා? ඉධෙකච්චො චීවරපයුත්තං වාචං භාසති, පිණ්ඩපාතපයුත්තං වාචං භාසති, සෙනාසනපයුත්තං වාචං භාසති, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරපයුත්තං වාචං භාසති. අයම්පි වුච්චති පයුත්තවාචා. අථ වා චීවරහෙතු පිණ්ඩපාතහෙතු සෙනාසනහෙතු ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සච්චම්පි භණති, මුසාපි භණති, පිසුණම්පි භණති, අපිසුණම්පි භණති, ඵරුසම්පි භණති, අඵරුසම්පි භණති, සම්ඵප්පලාපම්පි භණති, අසම්ඵප්පලාපම්පි භණති, මන්තාපි වාචං භාසති. අයම්පි වුච්චති පයුත්තවාචා. අථ වා, පසන්නචිත්තො පරෙසං ධම්මං දෙසෙති: 'අහො, වත මෙ ධම්මං සුණෙය්‍යුං, සුත්වා ච ධම්මෙ පසීදෙය්‍යුං, පසන්නා ච මෙ පසන්නාකාරං කරෙය්‍යු'න්ති. අයම්පි වුච්චති පයුත්තවාචා. **න ච වාචං පයුත්තං භාසෙය්‍යාති** - අන්තමසො ධම්මදෙසනං වාචං උපාදාය පයුත්තවාචං න භාසෙය්‍ය, න කථෙය්‍ය, න භණෙය්‍ය, න දීපයෙය්‍ය, න වොහරෙය්‍ය, පයුත්තං වාචං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය, පයුත්තවාචාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - න ච වාචං පයුත්තං භාසෙය්‍ය.

**පාගබ්භියං න සික්ඛෙය්‍යාති** - 'පාගබ්භිය'න්ති තීණි පාගබ්භියානි: කායිකං පාගබ්භියං, වාචසිකං පාගබ්භියං, චෙතසිකං පාගබ්භියං. කතමං කායිකං පාගබ්භියං? ඉධෙකච්චො සඞ්ඝගතොපි කායිකං පාගබ්භියං දස්සෙති, ගණගතොපි කායිකං පාගබ්භියං දස්සෙති, භොජනසාලායපි කායිකං පාගබ්භියං දස්සෙති, ජන්තාඝරෙපි කායිකං පාගබ්භියං දස්සෙති, උදකතිත්ථෙපි කායිකං පාගබ්භියං දස්සෙති, අන්තරඝරං පවිසන්තොපි කායිකං පාගබ්භියං දස්සෙති, අන්තරඝරං පවිට්ඨොපි කායිකං පාගබ්භියං දස්සෙති.

කථං සඞ්ඝගතො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො සඞ්ඝගතො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති, ඝට්ටයන්තොපි නිසීදති, පුරතොපි තිට්ඨති, පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති, සසීසං පාරුපිත්වාපි නිසීදති; ඨිතකොපි භණති, බාහාවික්ඛෙපකොපි භණති. එවං සඞ්ඝගතො කායිකං පාගබ්භියං දස්සෙති.

කථං ගණගතො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ගණගතො අචිත්තීකාරකතො ථෙරානං භික්ඛූනං අනුපාහනානං චඞ්කමන්තානං සඋපාහනො චඞ්කමති, නීචෙ චඞ්කමෙ චඞ්කමන්තානං උච්චෙ චඞ්කමෙ චඞ්කමති, ඡමාය චඞ්කමන්තානං චඞ්කමෙ චඞ්කමති, ඝට්ටයන්තොපි තිට්ඨති, ඝට්ටයන්තොපි නිසීදති, පුරතොපි තිට්ඨති පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති. සසීසං පාරුපිත්වාපි නිසීදති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ගණගතො කායිකං පාගබ්භියං දස්සෙති.

**න ච වාචං පයුතං භාසෙය්‍ය** - ප්‍රයුක්තවාචා කවරී ද යත්: මෙහි කිසිවෙක් චීවරප්‍රයුක්ත වූ වචන කියයි, පිණ්ඩපාතප්‍රයුක්ත වචන කියයි, සෙනාසනප්‍රයුක්ත වචන කියයි, ගිලන්පසබෙහෙත්පිරිකර හා යෙදුණු වචන කියයි. මේ ද 'පයුත්තවාචා' යි කියනු ලබයි. නොහොත් සිවුරු හේතුයෙන් පිණ්ඩපාත හේතුයෙන් සෙනසුන් හේතුයෙන් ගිලන්පස බෙහෙ-සත්පිරිකර හේතුයෙන් සැබව ද කියයි, බොරු ද කියයි, පිසුනු ද කියයි, නො පිසුනු ද කියයි, රළුබස් ද කියයි, නො රළුබස් ද කියයි, සිස් වදන් ද කියයි, නො සිස් වදන් ද කියයි, නුවණින් දූන ද වචන කියයි. මෙ ද 'පයුත්තවාචා' යි කියනු ලබයි. නොහොත් පහන් සිතැති ව අනුනට දහම් දෙසයි: 'මා ගේ දහම් අසන්නාහු නම් ඉතා යෙහෙක, අසා දහම්හි පහදනාහු නම් යෙහෙක, පැහැදුණාහු පඬුරු එළවන්නාහු නම් යෙහෙකැ යි. මෙ ද 'පයුත්තවාචා'යි කියනු ලබයි. **න ච වාචං පයුතං භාසෙය්‍ය**-යටත් පිරිසෙයින් දම්දෙසුම් වචනය පටන් ප්‍රයුක්ත වචනය නො පවසන්නේ යැ නො කියන්නේ යැ නො බණන්නේ යැ නො දක්වන්නේ යැ නො වහරන්නේ යැ. ප්‍රයුක්ත වචනය හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ. ප්‍රයුක්ත වචනයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ. නික්මැගියේ පහවැගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ යැ'යි 'න ච වාචං පයුතං භාසෙය්‍ය' යනු වේ.

**පාගබ්භියං න සික්ඛෙය්‍ය** - 'පාගබ්භිය' නම්: ප්‍රාගල්භ්‍ය තුනෙකි: කායික ප්‍රාගල්භ්‍ය යැ වාචසික ප්‍රාගල්භ්‍ය යැ චෛතසික ප්‍රාගල්භ්‍ය යැයි කියායි. කායික ප්‍රාගල්භ්‍යය කවරැ යත්: මෙහි කිසිවෙක් සඟමැදට ගියේ ද කායික ප්‍රාගල්භ්‍ය (-නො සරුප් බව) දක්වයි, ගණමැදට ගියේ ද කායික වූ නො සරුප් බව දක්වයි, බොජුන්හලට ගියේ ද කායික නො සරුප් බව දක්වයි, ගිනිහල්හි දු කායික නො සරුප් බව දක්වයි, දිය තොට ද කායික නො සරුප් බව දක්වයි, ඇතුළුගමට පිවිසෙනුයේ ද කායික නො සරුප් බව දක්වයි, ඇතුළුගමට පිවිසියේ ද කායික නො සරුප් බව දක්වයි.

කිසෙයින් සඟමැදට ගියේ කායික නො සරුප් බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් සඟමැදට ගියේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් ගටමිනු දු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්-තෙහි දු හිඳී, හිස වසා පෙරෙවැගෙන ද හිඳී, සිට ද බෙණෙයි, අත් සලමිනු දු බෙණෙයි. මෙසේ සඟමැදට ගියේ කායික නො සරුප්බව දක්වයි,

කිසෙයින් ගණමැදට ගියේ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ගණමැදට ගියේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් වහන් නැති වැ සක්මන් කරද්දී වහන් ඇති වැ සක්මන් කෙරෙයි, පහත් සක්මනෙහි සක්මන් කරද්දී උසස් සක්මනෙහි සක්මන් කෙරෙයි, පියවි බිමැ සක්මන් කරද්දී සක්මනෙහි සක්මන් කෙරෙයි, ගටමිනිදු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්-තෙහි දු හිඳී, හිස වසා පෙරෙවැ ද හිඳී, සිට ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි, මෙසේ ගණමැදට ගියේ කායික නො සරුප්බව දක්වයි.

කථං භොජනසාලාය කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො භොජනසාලාය අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදති, නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහති, ඝට්ටයන්තොපි තිට්ඨති, ඝට්ටයන්තොපි නිසීදති, පුරතොපි තිට්ඨති, පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති, සසීසං පාරුපිත්වාපි නිසීදති, ඨිතකොපි භණති, බාහාවික්ඛෙපකොපි භණති. එවං භොජනසාලාය කායිකං පාගබ්භියං දස්සෙති.

කථං ජන්තාඝරෙ කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ජන්තාඝරෙ අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති, ඝට්ටයන්තොපි නිසීදති, පුරතොපි තිට්ඨති, පුරතොපි නිසීදති, උච්චෙපි ආසනෙ නිසීදති, අනාපුච්ඡාපි කට්ඨං පක්ඛිපති, අනාපුච්ඡාපි ද්වාරං පිදහති. එවං ජන්තාඝරෙ කායිකං පාගබ්භියං දස්සෙති.

කථං උදකතිත්ථෙ කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො උදකතිත්ථෙ අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ඔතරති, පුරතොපි ඔතරති, ඝට්ටයන්තොපි නහායති[1] පුරතොපි නහායති, උපරිතොපි නහායති, ඝට්ටයන්තොපි උත්තරති, පුරතොපි උත්තරති, උපරිපි උත්තරති. එවං උදකතිත්ථෙ කායිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිසන්තො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිසන්තො අචිත්තීකාරකතො ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි ගච්ඡති, පුරතොපි ගච්ඡති. වොක්කම්මපි ථෙරානං භික්ඛූනං පුරතො පුරතො ගච්ඡති. එවං අන්තරඝරං පවිසන්තො කායිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිට්ඨො කායිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිට්ඨො 'න පවිසථ[2] භන්තෙ'ති වුච්චමානො පවිසති. 'න තිට්ඨථ භන්තෙ'ති වුච්චමානො තිට්ඨති. 'න නිසීදථ භන්තෙ'ති වුච්චමානො නිසීදති. අනොකාසම්පි පවිසති, අනොකාසෙපි[3] තිට්ඨති, අනොකාසෙපි නිසීදති. යානිපි තානි හොන්ති කුලානං ඔවරකානි ගුළ්හානි ච පටිච්ඡන්නානි ච යත්ථ කුලිත්ථියො කුලධීතරො[4] කුලසුණ්හායො කුලකුමාරියො නිසීදන්ති, තත්ථපි සහසා පවිසති. කුමාරකස්සපි සීසං[5] පරාමසති. එවං අන්තරඝරං පවිට්ඨො කායිකං පාගබ්භියං දස්සෙති. ඉදං කායිකං පාගබ්භියං.

කතමං වාචසිකං පාගබ්භියං? ඉධෙකච්චො සඞ්ඝගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති, ගණගතොපි වාචසිකං පාගබ්භියං දස්සෙති, අන්තරඝරං පවිට්ඨොපි වාචසිකං පාගබ්භියං දස්සෙති.

1. නහායති - මජසං. PTS. 2. පවිස - මජසං. සීමු. II PTS.
3. අනොකාසම්පි - සීමු. II. 4. කුලධීතායො - සීමු. II.
5. කුමාරකස්ස සීසම්පි - මජසං. සීමු. II.

කිසෙයින් බොජුන්හලැ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් බොජුන්හලැ බුහුමන් රහිත වූයේ ස්ථවිර භික්ෂූන් මැදට පිවිස හිඳී, නවක භික්ෂූන් ද අසුනෙන් බැහැර කෙරෙයි, ගටමිනු දු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි දු සිටී, ඉදිරියෙහි දු හිඳී, උසස්තෙහි දු හිඳී, හිස වසා පෙරෙවැගෙන ද හිඳී, සිට ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි. මෙසේ බොජුන්හලැ කායික නො සරුප් බව දක්වයි.

කිසෙයින් ගිනිහල්හි කායික ප්‍රාගල්භ්‍යය දක්වා ද යත්: මෙහි කිසි-වෙක් ගිනිහල්හි බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් ගටමිනු දු සිටී, ගටමිනු දු හිඳී, ඉදිරියෙහි ද සිටී, ඉදිරියෙහි ද හිඳී, උසස්තෙහි දු හිඳී, නො පිළිවිසැ දර ඔවයි, නො පිළිවිසැ දොර පියයි. මෙසෙයින් ගිනිහල්හි කායික ප්‍රාගල්භ්‍යය දක්වයි.

කිසෙයින් දියතොටැ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් දියතොටැ බුහුමන් නැති වැ ස්ථවිරභික්ෂූන් ගටමිනු දු (තොටට) බසී, ඉදිරියෙහි දු බසී, ගැටෙමිනු දු නහයි, ඉදිරියෙහි දු නහයි, උඩුගඟ ද නහයි, ගැටෙමිනු දු ගොඩ නගී, ඉදිරියෙනු දු ගොඩ නගී, උඩතොටිනු දු ගොඩ නගී. මෙසෙයින් දියතොටැ කායික නො සරුප්බව දක්වයි.

කිසෙයින් ඇතුළුගමට වදනේ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ඇතුළුගමට පිවිසෙනුයේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් ගටමිනු දු යෙයි, ඉදිරියෙහි දු යෙයි, පසු කොට ද ස්ථවිර භික්ෂූන් ඉදිරි-යෙහි යෙයි. මෙසෙයින් ඇතුළුගමට පිවිසෙනුයේ කායික නො සරුප්බව දක්වයි.

කිසෙයින් ඇතුළුගමට පිවිසියේ කායික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ඇතුළුගමට පිවිසියේ 'නො යව වහන්සැ'යි කියනු ලබනුයේ පිවිසෙයි, 'නො සිටිනු මැනවැ වහන්සැ'යි කියනු ලබනුයේ සිටී, 'නො හිඳිනු මැනවැ වහන්සැ'යි කියනු ලබනුයේ හිඳී, අනවකාශ ව ද පිවිසෙයි, අනවකාශයෙහි දු සිටී, අනවකාශයෙහි දු හිඳී. කුලස්ත්‍රීන් කුලධීතෘන් කුලවධූන් කුලකුමාරිකාවන් හිඳිනා පිළිසත් වූ (අභ්‍යයන් ගෙන්) පිළිසත් කරන ලද කුලයන්ගේ යහන්ගෙවල් වෙත් තමා එයි දු සැහැසි වැ පිවිසෙයි. ළදරුවන්ගේ හිස ද පිරිමදී. මෙසෙයින් ඇතුළු-ගමට පිවිසියේ කායික නො සරුප්බව දක්වයි. මේ කායික ප්‍රාගල්භ්‍ය යයි.

වාචසික ප්‍රාගල්භ්‍යය කවරැ යත්: මෙහි කිසිවෙක් සඟමැදට ගියේ ද වාචසික නො සරුප්බව දක්වයි, ගණමැදට ගියේ ද වාචසික නො සරුප්බව දක්වයි, ඇතුළුගමට ගියේ ද වාචසික නො සරුප්බව දක්වයි.

කථං සඞ්ඝගතො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො සඞ්ඝගතො අචිත්තිකාරකතො ථෙරෙ භික්ඛු අනාපුච්ඡා වා අනජ්ඣිට්ඨො වා ආරාමගතානං භික්ඛූනං ධම්මං භණති. පඤ්හං විසජ්ජෙති. පාතිමොක්ඛං උද්දිසති. ඨිතකොපි භණති බාහාවික්ඛෙපකොපි භණති. එවං සඞ්ඝගතො වාචසිකං පාගබ්භියං දස්සෙති.

කථං ගණගතො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො ගණගතො අචිත්තිකාරකතො ථෙරෙ භික්ඛු අනාපුච්ඡා වා අනජ්ඣිට්ඨො වා ආරාමගතානං භික්ඛූනං ධම්මං භණති. පඤ්හං විසජ්ජෙති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. ආරාමගතානං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං ධම්මං භණති. පඤ්හං විසජ්ජෙති. ඨිතකොපි භණති. බාහාවික්ඛෙපකොපි භණති. එවං ගණගතො වාචසිකං පාගබ්භියං දස්සෙති.

කථං අන්තරඝරං පවිට්ඨො වාචසිකං පාගබ්භියං දස්සෙති? ඉධෙකච්චො අන්තරඝරං පවිට්ඨො ඉත්ථිං වා කුමාරිං වා එවමාහ: ඉත්ථන්නාමෙ, ඉත්ථං ගොත්තෙ, කිං අත්ථි? යාගු අත්ථි? භත්තං අත්ථි? ඛාදනීයං අත්ථි? කිං පිවිස්සාම? කිං භුඤ්ජිස්සාම? කිං ඛාදිස්සාම? කිං වා අත්ථි කිං වා මෙ දස්සථාති විප්පලපති. එවං අන්තරඝරං පවිට්ඨො වාචසිකං පාගබ්භියං දස්සෙති. ඉදං වාචසිකං පාගබ්භියං.

කතමං චෙතසිකං පාගබ්භියං? ඉධෙකච්චො න උච්චාකුලා පබ්බජිතො සමානො උච්චාකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන, න මහාභොගකුලා පබ්බජිතො සමානො මහාභොගකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන, න උළාරභොගකුලා පබ්බජිතො සමානො උළාරභොගකුලා පබ්බජිතෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන. න සුත්තන්තිකො සමානො සුත්තන්තිකෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන, න විනයධරො සමානො, න ධම්මකථිකො සමානො, න ආරඤ්ඤිකො සමානො, න පිණ්ඩපාතිකො සමානො, න පංසුකූලිකො සමානො, න තෙචීවරිකො සමානො, න සපදානචාරිකො සමානො, න ඛලුපච්ඡාභත්තිකො සමානො, න නෙසජ්ජිකො සමානො, න යථාසන්ථතිකො සමානො යථාසන්ථතිකෙන සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන. න පඨමස්ස ඣානස්ස ලාභී සමානො පඨමස්ස ඣානස්ස ලාභිනා සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන. න දුතියස්ස ඣානස්ස – න තතියස්ස ඣානස්ස – න චතුත්ථස්ස ඣානස්ස ලාභී සමානො න ආකාසානඤ්චායතනසමාපත්තියා ලාභී සමානො – න විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා – න ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා – න නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභී සමානො නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ලාභිනා සද්ධිං සදිසං අත්තානං කරොති චිත්තෙන. ඉදං චෙතසිකං පාගබ්භියං.

කිසෙයින් සඟමැදට ගියේ වාචසික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් සඟමැදට ගියේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් නො පිළිවිසැ හෝ නො ඇණවන ලදු වැ හෝ අරමට ගිය භික්ෂූන්ට බණ කියයි, පැන විසඳයි, පාමොක් උදෙසයි, සිටගෙන ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි. මෙසෙයින් සඟමැදට ගියේ වාචසික නො සරුප්බව දක්වයි.

කිසෙයින් ගණමැදට ගියේ වාචසික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ගණමැදට ගියේ බුහුමන් රහිත වැ ස්ථවිර භික්ෂූන් නො පිළිවිසැ හෝ නො ඇණවන ලදු වැ හෝ අරමට ගිය භික්ෂූන්ට බණ කියයි, පැන විසඳයි, සිටගෙන ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි. ...අරමට ගිය මෙහෙණනට -උවසුවන්ට- උවැසියනට බණ කියයි, පැන විසඳයි, සිට ගෙන ද බෙණෙයි, අත් සලසලා ද බෙණෙයි. මෙසෙයින් ගණමැදට ගියේ වාචසික නො සරුප්බව දක්වයි.

කිසෙයින් ඇතුළුගමට පිවිසියේ වාචසික නො සරුප්බව දක්වා ද යත්: මෙහි කිසිවෙක් ඇතුළුගමට පිවිසියේ ගැහැනියකට හෝ කුමරියකට හෝ මෙසේ කියයි: 'මේ නම් ඇත්තිය, මේ ගොත් ඇත්තිය, කුමක් ඇද් ද? කැද ඇද් ද? බත් ඇත් ද? කැවුතු ඇත් ද? කුමක් බොත්තමෝ ද? කුමක් වළඳත්තමෝ ද? කුමක් කත්තමෝ ද? කුමක් හෝ ඇත් ද? කුමක් හෝ මට දෙවු ද'යි නත් දොඩයි. මෙසේ ඇතුළුගමට පිවිසියේ වාචසික නො සරුප්බව දක්වයි. මේ වාචසික ප්‍රාගල්භ්‍යය යි.

චෛතසික ප්‍රාගල්භ්‍යය කවරේ යත්: මෙහි කිසිවෙක් උසස් කුලයෙන් නො පැවිදි වූයේ උසස් කුලයෙන් පැවිදි වූවහු සමග සිතින් තමා සදෘශයකු කෙරෙයි. ගැහැවිමහසල්කුලයෙන් නො පැවිදි වූයේ ගැහැවිමහසල්කුලයෙන් පැවිදි වූවකු සමග සිතින් තමා සමාන කෙරෙයි. බොහෝ සැපත් ඇති කුලයෙන් නො පැවිදි වූයේ බොහෝ සැපත් ඇති කුලයෙන් පැවිදි වූවකු හා සිතින් තමා සමාන කෙරෙයි. සෞත්‍රාන්තික නො වූයේ සූත්‍රාන්තයෙහි සෙදුණහු හා සිතින් තමා සමාන කෙරෙයි. විනයධර නොවූයේ - ධර්මකථික නො වූයේ -ආරණ්‍යක නො වූයේ-පිණ්ඩපාතික නො වූයේ-පාංශුකූලික නො වූයේ-ත්‍රෛචීවරික නො වූයේ-සපදානචාරික නො වූයේ-ඛලුපච්ඡාභත්තික නො වූයේ - නෛසජ්ජික නො වූයේ - යථාසන්තතිකාංගික නො වූයේ - යථාසන්තතිකාංගික ඇත්තහු හා සිතින් තමා සමාන කෙරෙයි. ප්‍රථමධ්‍යානලාභී නො වූයේ ප්‍රථමධ්‍යානලාභී වූවහු හා සිතින් තමා සමාන කෙරෙයි. ද්විතීයධ්‍යානලාභී නො වූයේ - තෘතීයධ්‍යානලාභී නො වූයේ - චතුර්ථධ්‍යානලාභී නො වූයේ - ආකාසානඤ්චායතනසමාපත්තිලාභී නො වූයේ- විඤ්ඤාණඤ්චායතනසමාපත්තිලාභී නො වූයේ - ආකිඤ්චඤ්ඤායතනසමාපත්තිලාභී නො වූයේ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී නො වූයේ නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිලාභී වූවනු හා සිතින් තමා සමාන කෙරෙයි. මේ චෛතසික ප්‍රාගල්භ්‍යය යි.

**පාගබ්භියං න සික්ඛෙය්‍යාති** - පාගබ්භියං න සික්ඛෙය්‍ය න චරෙය්‍ය න ආචරෙය්‍ය න සමාචරෙය්‍ය න සමාදාය වත්තෙය්‍ය, පාගබ්භියං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, පාගබ්භියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - පාගබ්භියං න සික්ඛෙය්‍ය.

**කථං විග්ගාහිකං න කථෙය්‍යාති** - කතමා විග්ගාහිකා කථා? ඉධෙකච්චො එවරූපිං කථං කත්තා හොති: න ත්වං ඉමං ධම්මවිනයං ආජානාසි -පෙ- නිබ්බෙඨෙහි වා සචෙ පහොසීති වුත්තං හෙතං භගවතා: "විග්ගාහිකාය ඛො මොග්ගල්ලාන කථාය සති කථාබාහුල්ලං පාටිකඞ්ඛං, කථාබාහුල්ලෙ සති උද්ධච්චං, උද්ධතස්ස අසංවරො, අසංවුතස්ස ආරා චිත්තං සමාධිම්හා"ති.a

**කථං විග්ගාහිකං න කථයෙය්‍යාති** විග්ගාහිකං කථං න කථෙය්‍ය න භණෙය්‍ය න දීපෙය්‍ය න වොහරෙය්‍ය; විග්ගාහිකං කථං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය; විග්ගාහිකකථාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - කථං විග්ගාහිකං න කථෙය්‍ය.

තෙනාහ භගවා:

"න ච කත්ථිකො සියා භික්ඛු
න ච වාචං පයුත්තං භාසෙය්‍ය,
පාගබ්භියං න සික්ඛෙය්‍ය
කථං විග්ගාහිකං න කථයෙය්‍යා"ති.

**14 - 17**

මොසවජ්ජෙ න නීයෙථ
සම්පජානො සඨානි න කයිරා,
අථ ජීවිතෙන පඤ්ඤාය
සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ.

**මොසවජ්ජෙ න නීයෙථාති** - මොසවජ්ජං වුච්චති මුසාවාදො; ඉධෙකච්චො සභග්ගතො වා පරිසග්ගතො වා -පෙ- ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසිතා හොති.b ඉදං වුච්චති මොසවජ්ජං. අපි ච තීහාකාරෙහි මුසාවාදො හොති: පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති; භණන්තස්ස හොති 'මුසා භණාමී'ති; භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති. ඉමෙහි තීහාකාරෙහි මුසාවාදො හොති. අපි ච චතූහාකාරෙහි පඤ්චහාකාරෙහි - ඡහාකාරෙහි - සත්තහාකාරෙහි - අට්ඨහාකාරෙහි මුසාවාදො හොති; පුබ්බෙවස්ස හොති 'මුසා භණිස්ස'න්ති; භණන්තස්ස හොති 'මුසා භණාමී'ති: භණිතස්ස හොති 'මුසා මයා භණිත'න්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය සඤ්ඤං, විනිධාය භාවං, ඉමෙහි අට්ඨහාකාරෙහි මුසාවාදො හොති.

---

a. සත්තකඞ්ගුත්තර - අබ්‍යාකතවග්ග

b. මජ්ඣිමනිකාය - සාලෙය්‍යකසුත්ත, තිකඞ්ගුත්තර - පුග්ගලවග්ග.

**පාගබ්භියං න සික්ඛෙය්‍ය** - ප්‍රගල්භ බවෙහි නො හික්මෙන්නේ යැ, නො හැසිරෙන්නේ යැ, හාත්පසින් නො හැසිරෙන්නේ යැ, මොනවට නො හැසිරෙන්නේ යැ, සමාදන් වැ නො පවත්නේ යැ. ප්‍රගල්භ බව හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. ප්‍රාගල්භ්‍යයෙන් දුරු වූයේ වෙන්වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, බැහැර වූයේ පහව ගියේ විප්‍රමුක්ත - විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වසන්නේ නුයි 'පාගබ්භියං න සික්ඛෙය්‍ය' යනු වේ.

**කථං විග්ගාහිකං න කථෙය්‍ය** - විග්‍රාහිකකථාව කවර යත්: මෙහි කිසිවෙක් මෙබඳු කථාව කරන්නේ වෙයි: 'තෙපි මේ ධම්මවිනය නො දනිවු... ඉදින් පොහොනවු නම් මුදාගනිවු' යැයි. මේ වදාරන ලද මැය බුදුන් විසින්: "මුගලන, විග්‍රාහික කථාව ඇති කල්හි කථාබාහුල්‍යය කැමැති විය යුතු යැ. කථාබාහුල්‍යය ඇති කල්හි ඖද්ධත්‍යය වෙයි. උද්ධතයා හට අසංවරය වේ. සංවර රහිත වූවහු ගේ සිත සමාධියෙන් දුරු වේ යැ"යි.

**කථං විග්ගාහිකං න කථෙය්‍ය** - විග්‍රාහික කථාව නො කියන්නේ යැ, නොබණන්නේ යැ, නො දක්වන්නේ යැ, නො වහරන්නේ යැ, විග්‍රාහික කථාව හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. විග්‍රාහික කථාවෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ; නික්මැගියේ පහවැගියේ වෙසෙසින් මිදුණේ වන්නේ යැ. විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'කථං විග්ගාහිකං න කථෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"න ච කත්ථිකො සියා භික්ඛු -පෙ- කථං විග්ගාහිකං න කථෙය්‍ය"**යි

## 14 - 17

සම්‍යක් ප්‍රඥා ඇති මහණ තෙම මුසවා කිණිමෙහි නො යෙදෙන්නේ යැ. කපටිකම් නො කරන්නේ යැ. යළි දිවි පැවැත්මෙන් ප්‍රඥාවෙන් හා ශීලව්‍රතයෙන් අන්‍යයන් ඉක්මවා නො සිතන්නේ යි.

**මොසවජ්ජෙ න නියෙථ** - 'මොසවජ්ජ'යි මෘෂාවාදය කියනු ලැබෙයි. මෙහි කිසිවෙක් සභාවට ගියේ හෝ පිරිස් වෙත ගියේ හෝ...අල්පමාත්‍ර ලාභයක් හෙතු කොට හෝ දැන දැනැ බොරු කියන්නේ වෙයි. මේ 'මොසවජ්ජ'යි කියනු ලැබේ. තවද තුන් අයුරෙකින් මෘෂාවාදය වෙයි: පළමු මැ ඔහුට 'මෘෂා කියන්නෙමි' සිත වෙයි, කියන්නහුට 'මෘෂා කියමි' සිත වෙයි, කීවහුට 'මා විසින් මෘෂා කියන ලද'යි සිත වේ යයි. මේ තුන් අයුරෙන් මෘෂාවාදය වේ. තවද සතර අයුරෙකින් - පස් අයුරෙකින් - ෂඩාකාරයෙකින් - සත් අයුරෙකින් - අට අයුරෙකින් මෘෂාවාදය වෙයි: පළමු මැ ඔහුට 'මුසවා කියන්නෙමි' සිත වෙයි. කියන්නහුට 'මුසවා කියමි' සිත වෙයි. කීවහුට 'මා විසින් මුසවා කියන ලද'යි සිත වෙයි. ලබ්ධිය සඟවා, කැමැත්ත සඟවා, රුචිය සඟවා, සංඥාව සඟවා, භාවය සඟවා; මේ අෂ්ටාකාරයෙන් මෘෂාවාදය වේ.

**මොසවජ්ජෙ න නීයෙථාති** - මොසවජ්ජෙන න යායෙය්‍ය න නිය්‍යායෙය්‍ය න වුය්හෙය්‍ය න සංහරෙය්‍ය, මොසවජ්ජං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය; මොසවජ්ජා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - මොසවජ්ජෙ න නීයෙථ.

**සම්පජානො සඨානි න කයිරාති** - කතමං සාඨෙය්‍යං? ඉධෙකච්චො සඨො හොති පරිසඨො. යං තත්ථ සඨං සඨතා සාඨෙය්‍යං කක්කරතා කක්කරියං පරික්ඛත්තතා පාරික්ඛත්තියං, ඉදං වුච්චති සාඨෙය්‍යං.[ක]

**සම්පජානො සඨානි න කයිරාති** - සම්පජානො හුත්වා සාඨෙය්‍යං න කරෙය්‍ය න ජනෙය්‍ය න සඤ්ජනෙය්‍ය න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍ය, සාඨෙය්‍යං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය; සාඨෙය්‍යා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - සම්පජානො සඨානි න කයිරා.

**අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙති** - 'අථා'ති පදසන්ධි -පෙ- පදානුපුබ්බතා එතං අථාති. ඉධෙකච්චො ලූඛජීවිකං ජීවන්තො පරං පණීතජීවිකං ජීවන්තං අතිමඤ්ඤති: කිං පනායං බහුලාජීවො සබ්බං සම්භක්ඛෙති, සෙය්‍යථිදං: මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං[1] අග්ගබීජං බීජබීජමෙව පඤ්චමං, අසනිවිචක්ක[2] දන්තකූටං සමණප්පවාදෙනාති[3]. සො තාය ලූඛජීවිකාය පරං පණීතජීවිකං ජීවන්තං අතිමඤ්ඤති. ඉධෙකච්චො පණීතජීවිකං ජීවන්තො පරං ලූඛජීවිකං ජීවන්තං අතිමඤ්ඤති: "කිං පනායං අප්පපුඤ්ඤො අප්පෙසක්ඛො න ලාභී චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති." සො තාය පණීතජීවිකාය පරං ලූඛජීවිකං ජීවන්තං අතිමඤ්ඤති. ඉධෙකච්චො පඤ්ඤාසම්පන්නො හොති, සො පුට්ඨො පඤ්හං විස්සජ්ජෙති. තස්ස එවං හොති: අහමස්මි පඤ්ඤාසම්පන්නො; ඉමෙ පනඤ්ඤෙ න පඤ්ඤාසම්පන්නාති. සො තාය පඤ්ඤාසම්පදාය පරං අතිමඤ්ඤති. ඉධෙකච්චො සීලසම්පන්නො හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. තස්ස එවං හොති: 'අහමස්මි සීලසම්පන්නො ඉමෙ පනඤ්ඤෙ භික්ඛූ දුස්සීලා පාපධම්මා'ති. සො තාය සීලසම්පදාය පරං අතිමඤ්ඤති. ඉධෙකච්චො වතසම්පන්නො හොති: ආරඤ්ඤිකො වා පිණ්ඩපාතිකො වා පංසුකූලිකො වා තෙචීවරිකො වා සපදානචාරිකො වා ඛලුපච්ඡාභත්තිකො වා නෙසජ්ජිකො වා යථාසන්ථතිකො වා. තස්ස එවං හොති: 'අහමස්මි වතසම්පන්නො, ඉමෙ පනඤ්ඤෙ න වතසම්පන්නා'ති. සො තාය වතසම්පදාය පරං අතිමඤ්ඤති.

---

1. ඵලුබීජං - සිමු. II. 2. අසනිව චක්කං - සිමු. II.
3. සමණප්පවාදෙනාති - සිමු. II අසනිවිචක්කදන්තකූටසමණප්පවාදෙනෙනාති - මජසං. අසනිවිචක්කදන්තකූටසමණප්පවාදෙනාතිමඤ්ඤති - PTS.

ක. ඛුද්දකවත්ථුවිභඞ්ග.

**මොසවජ්ජෙ න නියෙථ** – මෘෂාවාදයෙහි නො යවනු ලබන්නේ යැ නො කියනු ලබන්නේ යැ නො වහනු ලබන්නේ යැ නො හරිනු ලබන්නේ යැ මෘෂාවාදය හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ, මෘෂාවාදයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ බැහැර වූයේ විප්‍රමුක්ත වූයේ විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වෙසෙන්නේ නුසී 'මොසවජ්ජෙ න නියෙථ' යනු මෙයි.

**සම්පජානො සඨානි න කයිරා** – 'සාඨෙය්‍ය' කවරැ යත්: මෙහි කිසිවෙක් ශඨ වූයේ හාත්පසින් ශඨ වූයේ වෙයි. එහි යම් (අසද්ගුණ දක්වන) කෙරාටික බවෙක් ශඨබවෙක් ශාඨ්‍යයෙක් කර්කශබවෙක් ඉතා කර්කශ බවෙක් දැඩි කර්කශ බවෙක් ඉතා දැඩි කර්කශ බවෙක් වේ ද, මේ 'සාඨෙය්‍ය'යි කියනු ලැබෙයි.

**සම්පජානො සඨානි න කයිරා** – දැනගෙන ශඨබව නො කරන්නේ යැ නො දනවන්නේ යැ නූපදවන්නේ යැ වෙසෙසින් නූපදවන්නේ යැ, ශාඨ්‍යය හරනේ යැ දුරු කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ යැ; ශාඨ්‍යයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ පහවැගියේ විප්‍රමුක්ත විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුසී 'සම්පජානො සඨානි න කයිරා' යනු මේ.

**අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ** – 'අථ' යනු පදසන්ධි යැ...පදානුපූර්වතා යැ තෙල 'අථ' යනු. මෙහි කිසිවෙක් රූක්ෂ ජීවිකාවෙන් ජීවත්වනුයේ මෙරමා ප්‍රණීතජීවිකාවෙන් ජීවත්වන්නහුට අවමන් කෙරෙයි: 'මේ කවරෙක් ද ? බහුලාජීව ඇතියේ සියල්ල කාදමයි. ඒ මෙසේයැ: මූලබීජ යැ ස්කන්ධබීජ යැ පර්වබීජ යැ අග්‍රබීජ යැ බීජබීජය මැ පස්වැනි වෙයි. මොහුගේ දත්කුල සෙනවලල්ලෙකි. එනෙත් ප්‍රවාද-යෙන් ශ්‍රමණ ය'යි. හෙතෙම ඒ රූක්ෂජීවිකාව හෙතු කොට ගෙන ප්‍රණීතජීවිකාවෙන් ජීවත්වන මෙරමා ඉක්මවා සිතයි. මෙහි කිසිවෙක් ප්‍රණීතජීවිකාවෙන් ජීවත්වනුයේ රළුදිවියෙන් ජීවත්වන මෙරමා ඉක්මවා සිතයි: 'මේ කවරෙක් ද ? මදපිනැත්තෙක අල්පයශසකයෙක චීවර-පිණ්ඩපාත - සෙනාසන – ගිලන්පසබෙහෙසත්පිරිකර නො ලබන සුල්ලෙකැ යි. හෙතෙම ඒ ප්‍රණීතජීවිකාව හෙතු කොටගෙන රළුදිවියෙන් ජීවත්වන මෙරමා ඉක්මවා සිතයි. මෙහි කිසිවෙක් නුවණැත්තේ වෙයි. හෙතෙම විචාරණා ලදුයේ පැන විසදයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මම් ප්‍රඥා-සම්පන්නයෙම් වෙමි. මේ අන්‍යයෝ වැලින් ප්‍රඥාසම්පන්නයෝ නො වෙති' යි. හේ ඒ ප්‍රඥාසම්පත්තියෙන් මෙරමා ඉක්මවා සිතයි. මෙහි කිසිවෙක් ශීල-සම්පන්න වෙයි: ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් සංවර වූයේ ආචාරගෝචර දෙකින් යුක්ත වූයේ අණුමාත්‍ර දොෂයෙහි භයදක්නා සුලු වැ වෙසෙයි. ශික්‍ෂාකොට්ඨා-සයන් සමාදන් වැ හික්මෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: 'මම් ශීල-සම්පන්නයෙම් වෙමි. මේ අන්‍යයෝ දුශ්ශීලයෝ යැ, පාපධර්මී ඇත්තාහ'යි. හේ ඒ ශීලසම්පත්තියෙන් මෙරමා ඉක්මවා සිතයි. මෙහි කිසිවෙක් ව්‍රතසම්පන්න වෙයි: ආරණ්‍යක හෝ පිණ්ඩපාතික හෝ පාංශුකූලික හෝ තෛචීවරික හෝ සපදානචාරික හෝ ඛලුපච්ඡාභත්තික හෝ නෛසජ්ජික හෝ යථාසන්ථතික හෝ වෙයි. ඔහුට මෙබඳු සිතෙක් වෙයි: මම් ව්‍රතසම්පන්නයෙම් වෙමි, මේ අන්‍යයෝ ව්‍රතසම්පන්නයෝ නො වෙති' යි. හේ ඒ ව්‍රතසම්පත්තියෙන් මෙරමා ඉක්මවා සිතයි.

**අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙය්‍යාති** – ලූඛජීවිකාය වා පණීතජීවිකාය වා පඤ්ඤාසම්පදාය වා සීලසම්පදාය වා වතසම්පදාය වා පරං **නාතිමඤ්ඤෙය්‍ය** නාවජානෙය්‍ය, න තෙන මානං ජනෙය්‍ය, න තෙන ථද්ධො අස්ස පත්ථද්ධො පග්ගහිතසිරොති – අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙය්‍ය.

තෙනාහ භගවා:

"මොසවජ්ජෙ න නියෙථ
සම්පජානො සඨානි න කයිරා,
අථ ජීවිතෙන පඤ්ඤාය
සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙ"ති.

**14 - 18**

සුත්වා දූසිතො[1] බහුං වාචං
සමණානං වා පුථුජ්ජනානං,
ඵරුසෙන නෙ න පටිවජ්ජා
න හි සන්තො පටිසෙනිං[2] කරොන්ති.

**සුත්වා දූසිතො බහුං වාචං සමණානං වා පුථුජ්ජනානන්ති** – 'දූසිතො' ති දූසිතො ඛුංසිතො ඝට්ටිතො වම්භිතො ගරහිතො උපවදිතො; **සමණා**ති යෙ කෙචි ඉතො බහිද්ධා පරිබ්බාජූපගතා පරිබ්බාජසමාපන්නා; **පුථුජ්ජනානන්ති** ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච තෙ බහුකාහි වාචාහි අනිට්ඨාහි අකන්තාහි අමනාපාහි අක්කොසෙය්‍යුං පරිභාසෙය්‍යුං රොසෙය්‍යුං විරොසෙය්‍යුං හිංසෙය්‍යුං විහිංසෙය්‍යුං හෙඨෙය්‍යුං විහෙඨෙය්‍යුං ඝාතෙය්‍යුං උපඝාතෙය්‍යුං උපඝාතං කරෙය්‍යුං; තෙසං බහුවාචං අනිට්ඨං අකන්තං අමනාපං සුත්වා සුණිත්වා උග්ගහිත්වා උපධාරයිත්වා උපලක්ඛයිත්වාති – සුත්වා දූසිතො[1] බහුං වාචං සමණානං වා පුථුජ්ජනානං.

**ඵරුසෙන නෙ න පටිවජ්ජාති** – 'ඵරුසෙනා'ති ඵරුසෙන කක්ඛළෙන; **න පටිවජ්ජා** න පටිභණෙය්‍ය, අක්කොසන්තං න පච්චක්කොසෙය්‍ය, රොසන්තං නප්පටිරොසෙය්‍ය, භණ්ඩන්තං න පටිභණ්ඩෙය්‍ය, න කලහං කරෙය්‍ය, න භණ්ඩනං කරෙය්‍ය, න විග්ගහං කරෙය්‍ය, න විවාදං කරෙය්‍ය, න මෙධගං කරෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය, කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති – ඵරුසෙන නෙ න පටිවජ්ජා.

1. රුසිතො - සු. 2. පටිසෙනි - සු

**අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙය්‍ය** - රූක්ෂ ජීවිකාවෙන් හෝ ප්‍රණීතජීවිකාවෙන් හෝ ප්‍රඥාසම්පත්තියෙන් හෝ ශීලසම්පත්තියෙන් හෝ ව්‍රතසම්පත්තියෙන් හෝ මෙරමා ඉක්මවා නො සිතන්නේ යැ, අවමන් නො කරන්නේ යැ, ඒ රූක්ෂජීවිකාදිය හේතු කොටගෙන මානය නූපදවන්නේ යැ, එයින් තද වූයේ වෙසෙසින් තද වූයේ නැඟූ හිස ඇතියේ නො වන්නේ යැයි - 'අථ ජීවිතෙන පඤ්ඤාය සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"මොසවජ්ජෙ න නියෙථ -පෙ- සීලබ්බතෙන නාඤ්ඤමතිමඤ්ඤෙය්‍යා"ති.**

## 14 - 18

බැහැරි ශ්‍රමණුන්ගේ හෝ බොහෝ ක්ෂත්‍රියාදීන්ගේ හෝ අනිටු වූ බොහෝ බස් අසා ගැටුණේ රළු බසින් ඔවුන්ට පෙරළා නො කියන්නේ යැ. යම් හෙයකින් සත්හුත් රාගාදි කෙලෙස් ඇත්තාහු ප්‍රතිපක්ෂ බව නො කෙරෙත් ද, එහෙයිනි.

**සුත්වා දූසිතො බහුං වාචං සමණානං වා පුථුවචනානං** - 'දූසිතො' යනු: දූෂ්‍ය වූයේ ආක්‍රොශ කරන ලදුයේ ගටන ලදුයේ අවඥා කරනු ලදුයේ ගර්හා කරන ලදුයේ නුගුණ කියන ලදුයේ; **සමණ** නම්: මේ සස්නෙන් බැහැර පැවිද්දට පැමිණියාහු පරිව්‍රාජ බවට පැමිණියාහු; **පුථුවචනානං** - ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණ - වෛශ්‍ය - ශුද්‍ර - ගෘහස්ථ - ප්‍රව්‍රජිත- දෙව - මනුෂ්‍යයෝ ද; ඔහු අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ බොහෝ වචනයන්ගෙන් ආක්‍රොශ කරන්නාහු ය, පරිභව කරන්නාහු ය, කොප කරන්නාහු ය, වෙසෙසින් කොප කරන්නාහු ය, හිංසා කරන්නාහු ය, වෙහෙසන්නාහු ය, පෙළන්නාහු ය, වෙසෙසින් පෙළන්නාහු ය, නසන්නාහු ය, වෙසෙසින් නසන්නාහු ය, උපඝාත කරන්නාහු ය. ඔවුන්ගේ අනිෂ්ට වූ අකාන්ත වූ අමනාප වූ බොහෝ බස් අසා, ශ්‍රවණය කොට, දැන, විමසා සලකා නුයි - 'සුත්වා දූසිතො බහුං වාචං සමණානං වා පුථුවචනානං' යනු වේ.

**ඵරුසෙන නෙ න පටිවජ්ජා** - 'ඵරුසෙන' යනු: පරුෂ වූ කර්කශ වූ බසින්; **න පටිවජ්ජා** - පෙරළා නො කියන්නේ යැ, ආක්‍රොශ කරන්නහුට පෙරළා ආක්‍රොශ නො කරන්නේ යැ, කොප කරන්නහුට පෙරළා කොප නො කරන්නේ යැ, ඩබර කරන්නහුට පෙරළා ඩබර නො කරන්නේ යැ, කලහ නො කරන්නේ යැ, භණ්ඩන - විග්‍රහ - විවාද - මෙධග නො කරන්නේ යැ, කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධග හරනේ යැ, දුරු කරන්නේ යැ, විනාශ කරන්නේ යැ, අභාවයට පමුණුවන්නේ යැ, කලහභණ්ඩනවිග්‍රහවිවාදමෙධගයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ නික්මැගියේ විප්‍රමුක්ත විසංයුක්ත වූයේ විමර්යාදීකෘත සිතින් වෙසෙන්නේ නුයි 'ඵරුසෙන නෙ න පටිවජ්ජා' යනු වේ.

**න හි සන්තා පටිසෙනිං කරොන්තීති** – 'සන්තා'ති රාගස්ස සන්තත්තා සන්තා, දොසස්ස – මොහස්ස – කොධස්ස – උපනාහස්ස -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තා, උපසන්තා වූපසන්තා නිබ්බුතා පටිප්පස්සද්ධාති 'සන්තා'.

**න හි සන්තා පටිසෙනිං කරොන්තීති** සන්තා පටිසෙනිං පටිමල්ලං පටිකණ්ටකං පටිපක්ඛං න කරොන්ති න ජනෙන්ති න සඤ්ජනෙන්ති න නිබ්බත්තෙන්ති නාභිනිබ්බත්තෙන්තීති – න හි සන්තා පටිසෙනිං කරොන්ති.

තෙනාහ භගවා:

"සුත්වා දූසිතො බහුං වාචං[1]
සමණානං පුථුවචනානං,
ඵරුසෙන නෙ න පටිවජ්ජා
න හි සන්තා පටිසෙනිං කරොන්තී"ති.

**14 – 19**

එතඤ්ච ධම්මමඤ්ඤාය
විචිනං භික්ඛු සදා සතො සික්ඛෙ,
සන්තීති නිබ්බුතිං ඤත්වා
සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය.

**එතඤ්ච ධම්මමඤ්ඤායාති** – 'එත'න්ති ආචික්ඛිතං දෙසිතං පඤ්ඤපිතං පට්ඨපිතං විවටං විභත්තං උත්තානීකතං පකාසිතං. **ධම්මමඤ්ඤායාති** ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති එවම්පි – එතඤ්ච ධම්මමඤ්ඤාය. අථවා, සමඤ්ච විසමඤ්ච පථඤ්ච විපථඤ්ච සාවජ්ජඤ්ච අනවජ්ජඤ්ච හීනඤ්ච පණීතඤ්ච කණ්හඤ්ච සුක්කඤ්ච විඤ්ඤූගරහිතඤ්ච විඤ්ඤූප්පසත්ථඤ්ච ධම්මං අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති එවම්පි එතඤ්ච ධම්මමඤ්ඤාය. අථවා සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං ධම්මානුධම්මපටිපදං සීලෙසු පරිපූරකාරිතං ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතං භොජනෙ මත්තඤ්ඤුතං ජාගරියානුයොගං සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානෙ චත්තාරො සම්මප්පධානෙ චත්තාරො ඉද්ධිපාදෙ පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං ධම්මං අඤ්ඤාය ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති එවම්පි – එතඤ්ච ධම්මමඤ්ඤාය.

**විචිනං භික්ඛු සදා සතො සික්ඛෙති** – 'විචින'න්ති විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො විභූතං කරොන්තො සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති විචිනන්තො පවිචිනන්තො තුලයන්තො තීරයන්තො විභාවයන්තො. විභූතං කරොන්තොති විචිනං භික්ඛු; සදාති සදා සබ්බදා සබ්බකාලං -පෙ- පච්ඡිමෙ වයොඛන්ධෙ; සතොති චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො -පෙ- සො වුච්චති සතො.

1. බහුවාචං - සීමු. II.

**න හි සන්තා පටිසෙනිං කරොන්ති** – 'සන්තො' යනු: රාගය ශාන්ත වන බැවින් ශාන්ත යැ, ද්වේෂය - මෝහය - උපනාහය... සියලු අකුශලාභි-සංස්කාරයන් ශාන්ත - ශමිත - ව්‍යුපශමිත වන බැවින් දවන ලද - නිවන ලද - විගත කළ - උරලන ලද බැවින් ශාන්ත - උපශාන්ත - ව්‍යුපශාන්ත - නිර්වෘත -පටිප්පස්සද්ධ නුයි ශාන්ත යැ.

**න හි සන්තා පටිසෙනිං කරොන්ති** - ශාන්ත වූවාහු ප්‍රතිවිරුද්ධය ප්‍රතිමල්ල බව ප්‍රතිභණ්ඩකය ප්‍රතිපක්‍ෂ බව නො කෙරෙති, නො දනවති, නුපදවති, නො නිපදවති, නො පහළ කෙරෙත් නුයි 'න හි සන්තා පටිසෙනිං කරොන්ති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සුඤ්ඤා දුසිතො බහුං වාචං -පෙ- න හි සන්තා පටිසෙනිං කරොන්ති"**යි

## 14 - 19

මහණ තෙමේ මෙසෙල (යථොක්ත) ධර්මය දැන (අනිත්‍යාදිය) විමසනුයේ සියලු කල්හි සමෘතිමත් වූයේ (ත්‍රිවිධ ශික්‍ෂාවෙහි) හික්මෙත්තේ යැ. (රාගාදීන් ගේ) නිවීම ශාන්තිය යි දැන ගෞතමබුද්ධශාසනයෙහි නො පමා වන්නේ යි.

**එතඤ්ච ධම්මමඤ්ඤාය** – 'එතං' යනු: කියන ලද දෙසන ලද පන-වන ලද පිහිටුවන ලද විවෘත කළ විභාග කළ ප්‍රකට කළ ප්‍රකාශ කළ; **ධම්මමඤ්ඤාය** – දැන තුලනය කොට තීරණය කොට විභාවනය කොට ප්‍රකාශ කොට නුයි මෙසේත් 'එතඤ්ච ධම්මමඤ්ඤාය' යනු වේ. නොහොත් (කායසුචරිතාදි) සමය ද (කායදුශ්චරිතාදි) විසමය ද දශකුශලකර්මපථය ද දශ අකුශලකර්මපථය ද සාවද්‍ය (අකුශල) අනවද්‍ය (කුශල) හීන-ප්‍රණීත – කෘෂ්ණ-ශුක්ල -විඥයන් විසින් ගර්හිත වූ ද විඥප්‍රශස්ත වූ ද ධර්මය දැන, දැනගෙන, තුල-නය කොට, තීරණය කොට, විභාවනය කොට විභූත කොට නුයි මෙසේත් 'එතඤ්ච ධම්මමඤ්ඤාය' යනු වේ. නොහොත් සම්‍යක්ප්‍රතිපත්තිය අනුලොම ප්‍රතිපත්තිය අවිරුද්ධප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමොක්‍ෂශීලයෙහි පරිපූරකාරීත්වය ඉන්ද්‍රියයන්හි ගොපිතද්වාරතාව භොජන-යෙහි මාත්‍රාඥතාව ජාගරියානුයොගය ස්මෘතිසම්ප්‍රජන්‍යය සතර සතිපට්ඨාන සතර සම්‍යක්ප්‍රධාන සතර ඍද්ධිපාද පඤ්චෙන්ද්‍රිය පඤ්ච බල සප්ත බොධ්‍යඞ්ග ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය නිර්වාණය ද නිර්වාණගාමිනී ප්‍රතිපත්තිය ද යන ධර්මය දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට නුයි මෙසේත් 'එතඤ්ච ධම්මමඤ්ඤාය' යනු වේ.

**විචිනං භික්ඛු සදා සතො සික්ඛෙ** – 'විචිනං' යනු: (සිවුසස්) සොය-නුයේ වෙන වෙන ම සොයනුයේ (වඩනුයේ) තුලනය කරනුයේ තීරණය කරනුයේ විභාවන කරනුයේ විභූත කරනුයේ සියලු සංස්කාරයෝ අනිත්‍ය-යහ'යි...යම් කිසිවක් සමුදයධර්ම නම්, ඒ සියල්ල නැසෙන සුලු යයි වඩනුයේ වෙන වෙනම වඩනුයේ තුලනය කරනුයේ තීරණය කරනුයේ විභාවනය කරනුයේ විභූත කරනුයේ නුයි 'විචිනං භික්ඛු' යනු වේ. **සදා** යනු: සැමදා සියලු කල...පශ්චිම වයස්හි; **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ කයෙහි කායානුපස්සනා සතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ...හෙතෙම 'සිහි ඇතියේ' යයි කියනු ලැබේ.

**සික්ඛෙති** තිස්සො සික්ඛායො: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා -පෙ- අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය -පෙ- සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'විවිත්තං භික්ඛු සදා සතො සික්ඛෙ'.

**සන්තීති නිබ්බුතිං ඤත්වාති** - රාගස්ස නිබ්බුතිං සන්තීති ඤත්වා, දොසස්ස - මොහස්ස -පෙ- සබ්බාකුසලාභිසඞ්ඛාරානං නිබ්බුතිං සන්තීති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති - සන්තීති නිබ්බුතිං ඤත්වා.

**සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍යාති** - ගොතමස්ස සාසනෙ බුද්ධසාසනෙ ජිනසාසනෙ තථාගතසාසනෙ දෙවදෙවසාසනෙ[1] අරහන්තසාසනෙ; **නප්පමජ්ජෙය්‍යාති** සක්කච්චකාරී අස්ස සාතච්චකාරී අට්ඨිතකාරී අනොලීනවුත්තිකො අනික්ඛිත්තච්ඡන්දො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු 'කදාහං අපරිපූරං වා සීලක්ඛන්ධං පරිපූරෙය්‍යං -පෙ- අපරිපූරං වා සමාධික්ඛන්ධං - පඤ්ඤාක්ඛන්ධං විමුත්තික්ඛන්ධං - විමුත්තිඤාණදස්සනක්ඛන්ධං - කදාහං අපරිඤ්ඤාතං වා දුක්ඛං පරිජානෙය්‍යං, අප්පහීනෙ වා කිලෙසෙ පජහෙය්‍යං, අභාවිතං වා මග්ගං භාවෙය්‍යං, අසච්ඡිකතං නිරොධං සච්ඡිකරෙය්‍ය'න්ති. යො තත්ථ ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හී ච ථාමො ච අප්පටිවානී ච සති ච සම්පජඤ්ඤඤ්ච ආතප්පං පධානං අධිට්ඨානං අනුයොගො අප්පමාදො කුසලෙසු ධම්මෙසූති - සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය.

තෙනාහ භගවා:

“එතඤ්ච ධම්මමඤ්ඤාය
විවිත්තං භික්ඛු සදා සතො සික්ඛෙ,
සන්තීති නිබ්බුතිං ඤත්වා
සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍යා”ති.

## 14 - 20

අභිභූ හි සො අනභිභූතො
සක්ඛිධම්මමනීතිහමද්දසී,
තස්මා හි තස්ස භගවතො සාසනෙ
අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති. (භගවා)

---

1. දෙවසාසනෙ - සිමු. II. PTS. මජ්ස.

**සික්ඛෙ** යනු: ශික්‍ෂා තුනෙකි: අධිශීලශික්‍ෂා යැ, අධිචිත්තශික්‍ෂා යැ, අධිප්‍රඥාශික්‍ෂා යැයි. මේ අධිප්‍රඥාශික්‍ෂා නමි. මේ ත්‍රිවිධ ශික්‍ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේ යැ,...හික්මෙන්නේ යැ හැසිරෙන්නේ යැ මැනැවින් හැසිරෙන්නේ යැ සමාදන් වැ පවත්නේ නුසි 'විවිත්තං භික්ඛු සදා සතො සික්ඛෙ' යනු වේ.

**සන්තීති නිබ්බුතිං ඤත්වා**-රාගයාගේ නිවීම ශාන්තිය සි දැන ද්වේෂයාගේ මෝහයාගේ...සියලු අකුශලාභිසංස්කාරයන්ගේ නිවීම 'ශාන්තිය'යි දැන දැනගෙන තුලනය - තීරණය - විභාවනය - විභූත කොට නුසි 'සන්තීති නිබ්බුතිං ඤත්වා' යනු වේ.

**සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය** - ගෞතමයන්ගේ ශාසනයෙහි බුද්ධශාසනයෙහි ජිනශාසනයෙහි තථාගතශාසනයෙහි දෙවදෙවයන්ගේ ශාසනයෙහි අර්හත්ශාසනයෙහි; **නප්පමජ්ජෙය්‍ය** - සකස් කොට කරන සුළු වන්නේ යැ, සතතභාවයෙන් කරන සුලු වූයේ නො නැවත කරන සුලු වූයේ නො හැකුළුණු පැවතුම් ඇතියේ කුශලධර්මයන්හි නො නැබූ වීර්‍යච්ඡන්ද ඇතියේ නො නැබූ වීර්‍යධුර ඇතියේ 'කවදා මම නො පිරිපුන් ශීලස්කන්ධය හෝ පුරම් ද...නො පිරිපුන් සමාධිස්කන්ධය හෝ- ප්‍රඥාස්කන්ධය - විමුක්තිස්කන්ධය - විමුක්තිඥානදර්ශනස්කන්ධය - කවදා මම (මගනැණින්) නො දැනගත් දුක හෝ දැනගනිම් ද, නොපුහුණු කෙලෙසුන් හෝ දුරු කෙරෙම් ද, නො වැඩූ මග හෝ වඩම් ද, නො පසක් කළ නිවන හෝ පසක් කෙරෙම් දැ'යි එහි යම් ඡන්දයකුත් වෑයමකුත් උත්සාහයකුත් දැඩි උත්සාහයකුත් නො නැවැත්මකුත් සිහියකුත් නුවණකුත් වේ ද, (එබඳු වූ) කෙලෙස් තවන වීර්‍යය උත්තමවීර්‍යය අභියෝගය නැවත නැවත යෙදීම කුශලධර්මයන්හි අප්‍රමාදය නුසි 'සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"එතදඤ්ඤාය ධම්මමඤ්ඤාය-පෙ- සාසනෙ ගොතමස්ස නප්පමජ්ජෙය්‍ය"යි

**14 - 20**

රූපාදිය අභිභවනය කළා වූ ඒ බුදුහු (කෙලෙසුන් විසින්) නො මැඩුණේ 'මෙසේ වී ලැ'යි නො තකන ලද ආත්මප්‍රත්‍යක්‍ෂ වූ ධර්මය යම් හෙයකින් දුටු සේක් ද, එහෙයින් මැ ඒ භාග්‍යවතුන්ගේ ශාසනයෙහි නො පමා වූයේ සියලු කල්හි (ඒ බුදුනට නිදෙරින්) නමස්කාර කෙරෙමින් (ත්‍රිවිධ ශික්‍ෂායෙහි) හික්මෙන්නේ යැයි (බුදුහු වදාළ සේකි.)

**අභිභූ හි සො අනභිභූතොති** – ‘අභිභූ’ති රූපාභිභූ සද්දාභිභූ ගන්ධාභිභූ රසාභිභූ ඵොට්ඨබ්බාභිභූ ධම්මාභිභූ, අනභිභූතො කෙහිචි කිලෙසෙහි; අභිභොසි[1] නෙ එතෙ පාපකෙ අකුසලෙ ධම්මෙ සඞ්කිලෙසිකෙ පොනොභවිකෙ සදරෙ දුක්ඛවිපාකෙ ආයතිං ජාතිජරාමරණියෙති – අභිභූ හි සො අනභිභූතො.

**සක්ඛිධම්මමනීතිහමද්දසීති** – ‘සක්ඛිධම්ම’න්ති න ඉතිහිතිහං න ඉතිකිරාය න පරම්පරාය න පිටකසම්පදාය න තක්කහෙතු න නයහෙතු න ආකාරපරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයමභිඤ්ඤාතං අත්තපච්චක්ඛධම්මං අද්දසි අද්දක්ඛි අපස්සි පටිවිජ්ඣීති–සක්ඛිධම්මමනීතිහමද්දසී.

**තස්මා හි තස්ස භගවතො සාසනෙති** – ‘තස්මා’ති තස්මා තංකාරණා තංහෙතු තප්පච්චයා තන්නිදානං. **තස්ස භගවතො සාසනෙති** තස්ස භගවතො සාසනෙ ගොතමසාසනෙ බුද්ධසාසනෙ ජිනසාසනෙ තථාගතසාසනෙ දෙවදෙවසාසනෙ අරහන්තසාසනෙති – තස්මා හි තස්ස භගවතො සාසනෙ.

**අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති** භගවාති – ‘අප්පමත්තො’ති සක්කච්චකාරී -පෙ- අප්පමාදො කුසලෙසු ධම්මෙසු, **සදා**ති සදා සබ්බදා සබ්බකාලං -පෙ- පච්ඡිමෙ වයොඛන්ධෙ; **නමස්ස**න්ති කායෙන වා නමස්සමානො වාචාය වා නමස්සමානො චිත්තෙන වා නමස්සමානො අන්වත්ථපටිපත්තියා වා නමස්සමානො ධම්මානුධම්මපටිපත්තියා වා නමස්සමානො සක්කරමානො ගරුකරමානො මානයමානො පූජයමානො අපචයමානො. **අනුසික්ඛෙ**ති තිස්සො සික්ඛායො: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා -පෙ- අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය චරෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍ය; **භගවා**ති ගාරවාධිවචනං -පෙ- සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති – අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති භගවා.

තෙනාහ භගවා:

“අභිභූ හි සො අනභිභූතො
සක්ඛිධම්මමනීතිහමද්දසී,
තස්මා හි තස්ස භගවතො සාසනෙ
අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙති. (භගවා”ති.)

**තුවටකසුත්තනිද්දෙසො සමත්තො**
**චුද්දසමො.**

1. අභිභූ හි - සීමු II. මජසං. PTS. අභිභොසි - ස.

අභිභූ හි සො අනභිභූතො - 'අභිභූ' යනු: රූපයන් අභිභවනය කෙළේ ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍ය - ධර්මයන් අභිභවනය කෙළේ, කිසි කෙලෙස් කෙනෙකුන් විසින් අනභිභූත වූයේ (-නො මැඩුණේ) කෙලශ-ප්‍රත්‍යය වූ පුනර්භවය දෙන්නා වූ දුක් සහිත වූ දුඃඛවිපාක වූ මත්තෙහි ජාතිජරාමරණයට කාරණ වූ ඒ හීන වූ ලාමක වූ අකුශලධර්මයන් අභිභවනය කෙළේ නුයි 'අභිභූ හි සො අනභිභූතො' යනු වේ.

සක්ඛිධම්මමනීතිහමද්දසී - 'සක්ඛිධම්මං' යනු: 'මෙසේ මෙසේ වීලු'යි නො වැ, මේ 'මෙසේ ලු'යි නො වැ, පරම්පරාකථාවෙන් නො වැ, පිටකසම්පදායෙන් නො වැ, තර්කහෙතුවෙන් නො වැ, න්‍යායහෙතුවෙන් නො වැ, (මෙම් මැනැවැයි) ආකාර සැලැකීමෙන් නො වැ, අප විසින් විමසා ගන්නා ලද දෘෂ්ටිය හා සම යයි නො වැ, තුමූ මැ තමන් විසින් අවබොධ කළ තම හට ප්‍රත්‍යක්ෂ වූ ධර්මය දුටුවහ, දර්ශනය කළහ, අවලොකනය කළහ, ප්‍රතිවෙධ කළහ'යි 'සක්ඛිධම්මමනීතිහමද්දසී' යනු වේ.

තස්මා හි තස්ස භගවතො සාසනෙ - 'තස්මා' යනු: එහෙයින් එ කරුණෙන් ඒ හෙතුයෙන් ඒ ප්‍රත්‍යයෙන් ඒ නිදානයෙන්; තස්ස භගවතො සාසනෙ - ඒ භාග්‍යවත්හුගේ ශාසනයෙහි ගෞතමශාසනයෙහි බුද්ධ-ශාසනයෙහි ජිනශාසනයෙහි තථාගතශාසනයෙහි දෙවදෙවයන්ගේ ශාසන-යෙහි අර්හත්ශාසනයෙහි නුයි 'තස්මා හි තස්ස භගවතො සාසනෙ' යනු වේ.

අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙ'ති භගවා - 'අප්පමත්තො' යනු: සකස් කොට කරන සුලු වූයේ...කුශලධර්මයන්හි අප්‍රමාද වූයේ, සදා යනු: සැමදා සියලුදා සියලු කල...පශ්චිම වයස් කොටසෙහි; නමස්සං යනු: කයින් හෝ නමස්කාර කරනුයේ වචනයෙන් හෝ නමස්කාර කරනුයේ සිතින් හෝ නමස්කාර කරනුයේ අර්ථානුගතප්‍රතිපත්තියෙන් හෝ නමස්කාර කරනුයේ ධර්මානුධර්ම (-නවලොවුතුරු දහම් හා විදසුන් ඈ) ප්‍රතිපත්තියෙන් නමස්කාර කරනුයේ සත්කාර කරනුයේ ගරු කරනුයේ බුහුමන් කරනුයේ පුදනුයේ අපචායන කරනුයේ. අනුසික්ඛෙ- ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා අධිචිත්තශික්ෂා අධිප්‍රඥාශික්ෂා...මේ අධිප්‍රඥා-ශික්ෂා යි: මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේ යැ... ප්‍රත්‍යක්ෂ කළ යුතු නිවන ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙන්නේ යැ, හැසිරෙන්නේ යැ මැනැවින් හැසිරෙන්නේ යැ සමාදන් වැ පවත්නේ යි. භගවා යනු: ගෞරවාධිවචන යැ...මේ 'භගවා' යනු: අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් හෝ සර්වධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකැ'යි 'අප්පමත්තො සදා නමස්සමනුසික්ඛෙ'ති භගවා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"අභිභූ හි සො අනභිභූතො -පෙ- සදා නමස්සමනුසික්ඛෙ'ති භගවා"යි

තුදුස්වැනි තුවටක සූත්‍ර නිද්දේශය සමාප්ත යි.

# 15

# අත්තදණ්ඩසුත්තනිද්දෙසො.

අථ අත්තදණ්ඩසුත්තනිද්දෙසො වුච්චතෙ:

## 15 - 1

අත්තදණ්ඩා භයං ජාතං
ජනං පස්සථ මෙධගං,
සංවෙගං කිත්තයිස්සාමි
යථා සංවිජිතං මයා.

**අත්තදණ්ඩා භයං ජාතන්ති** – 'දණ්ඩා'ති තයො දණ්ඩා: කායදණ්ඩො වචීදණ්ඩො මනොදණ්ඩො. තිවිධං කායදුච්චරිතං කායදණ්ඩො, චතුබ්බිධං වචීදුච්චරිතං වචීදණ්ඩො, තිවිධං මනොදුච්චරිතං මනොදණ්ඩො. භයන්ති ද්වෙ භයානි: දිට්ඨධම්මිකඤ්ච භයං සම්පරායිකඤ්ච භයං. කතමං දිට්ඨධම්මිකං භයං? ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති. තමෙතං ගහෙත්වා රඤ්ඤො දස්සෙන්ති: 'අයං දෙව' චොරො ආගුචාරී. ඉමස්ස යං ඉච්ඡති, තං දණ්ඩං පණෙහීති. තමෙතං රාජා පරිභාසති. සො පරිභාසපච්චයා භයං උප්පාදෙති, දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. එත්තකෙනපි රාජා න තුස්සති. තමෙතං රාජා බන්ධාපෙති අන්දුබන්ධනෙන වා රජ්ජුබන්ධනෙන වා සඞ්ඛලිකබන්ධනෙන වා වෙත්තබන්ධනෙන වා ලතාබන්ධනෙන වා පක්ඛෙපබන්ධනෙන වා පරික්ඛෙපබන්ධනෙන වා ගාමබන්ධනෙන වා නිගමබන්ධනෙන වා නගරබන්ධනෙන වා රට්ඨබන්ධනෙන වා ජනපදබන්ධනෙන වා, අන්තමසො සවචනීයම්පි කරොති 'න තෙ ලබ්භා ඉතො පක්කමිතු'න්ති. සො බන්ධනපච්චයාපි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. එත්තකෙනපි රාජා න තුස්සති. රාජා තස්ස ධනං ආහරාපෙති: සතං වා සහස්සං වා සතසහස්සං වා. සො ධනජානිපච්චයාපි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. එත්තකෙනපි රාජා න තුස්සති. තමෙතං රාජා විවිධා කම්මකරණා කාරාපෙති:

# 15

## අත්තදණ්ඩසුත්තනිද්දේශය

ඉක්බිති අත්තදණ්ඩසුත්ත නිද්දේශය කියනු ලැබේ.

### 15 - 1

ආත්මදණ්ඩය (-තමාගේ කායාදි දුශ්චරිතය) හේතු කොටගෙන දෘෂ්ට-ධාර්මිකාදි) භය උපන. (එසේ කල්හි) ප්‍රතිවිරුද්ධ වූ ජනයා බලවු. මා විසින් යම්සේ (තමා මැ තම හට) සංවේග උපදවන ලද ද, (එපරිද්දෙන්) සංවේගය ප්‍රකාශ කරන්නෙමි.

**අත්තදණ්ඩා භයං ජාතං** - 'දණ්ඩා' යනු: දණ්ඩයෝ තිදෙනෙකි: කාය-දණ්ඩ යැ, වාග්දණ්ඩ යැ, මනොදණ්ඩ යැයි. ත්‍රිවිධ කායදුශ්චරිතය කායදණ්ඩ යැ, චතුර්විධ වාග්දුශ්චරිතය වාග්දණ්ඩ යැ, ත්‍රිවිධ මනොදුශ්චරිතය මනො-දණ්ඩ යි. භයං යනු; භය දෙකෙකි: දෘෂ්ටධාර්මිකභය යැ, සාම්පරායිකභය යි. දෘෂ්ටධාර්මිකභය කවරැ යත්: මෙලොවැ කිසිවෙක් කයින් දුශ්චරිත-යෙහි හැසිරෙයි, වචනයෙන් දුශ්චරිතයෙහි හැසිරෙයි, සිතින් දුශ්චරිත-යෙහි හැසිරෙයි, ප්‍රාණවධ දු කෙරෙයි, නුදුන් දෙය ද ගනී, ගෘහසන්ධි දු සිඳී, ගම් පැහැරීම ද ගෙවල් පැහැරීම ද මං පැහැරීම ද කෙරෙයි, පරඹුන් කරා ද යෙයි, මුසාවා ද බෙණේ. ඒ තුලුහු අල්වාගෙන 'දෙවයිනි, මේ අපරාධකාරී සොරෙක, මොහුට යමක් කැමැති නම් ඒ දඬුවම් පැණවුව මැනවැ'යි රජුට දක්වති. රජ ඔහුට පරිභව බෙණෙයි. හෙතෙම පරිභව හේතුවෙන් බිය උපදවයි, දුක් දොම්නස් විඳී. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයිනැ යත්: ආත්මදණ්ඩයෙන් (-තම පවින්) උපන හටගත තිපත වෙසෙසින් තිපන පහළ වී. මෙතෙකිනුදු රජ නො සතුටු වෙයි. රජ ඒ තුලුහු සිරබැඳුමෙන් හෝ රැහැන් බැඳුමෙන් හෝ හැකිලි බැඳුමෙන් හෝ වේවැල් බැඳුමෙන් හෝ ලතාබන්ධනයෙන් හෝ ප්‍රක්ෂෙ-පබන්ධනයෙන් හෝ පරික්ෂෙපබන්ධනයෙන් හෝ ග්‍රාමබන්ධනයෙන් හෝ නිගමබන්ධනයෙන් හෝ නගරබන්ධනයෙන් හෝ රාෂ්ට්‍රබන්ධනයෙන් හෝ ජනපදබන්ධනයෙන් හෝ බන්දවයි, යටත් පිරිසෙයින් 'තට මෙයින් බැහැර යන්නට නො ලැබේ'යයි (පළිබොධ සඳහා) කියැයුතු ද කෙරෙයි. හෙතෙම බන්ධන හේතුවෙන් ද දුක් දොම්නස් විඳී. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයිනැ යත්: ආත්මදණ්ඩයෙන් උපන හටගත තිපත වෙසෙසින් තිපන පහළ විය. තෙල පමණෙකිනු දු රජ නො සතුටු වෙයි. රජ ඔහුගේ ධනය සියයක් හෝ දහසක් හෝ සියදහසක් හෝ ගෙන්වා ගනී. හෙතෙම ධනහානිය හේතු කොටගෙන ද දුක් දොම්නස් විඳී. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයිනැ යත්: ආත්මදණ්ඩයෙන් උපන, හටගත තිපත වෙසෙසින් තිපත පහළ විය. මෙතෙකිනු දු රජ නො සතුටු වෙයි. රජ ඔහුට විවිධ කම්කටොලු කරවයි:

කසාහිපි තාළෙන්ති. වෙත්තෙහිපි තාළෙන්ති. අඩ්ඪදණ්ඩකෙහිපි තාළෙන්ති. හත්ථම්පි ඡින්දන්ති. පාදම්පි ඡින්දන්ති. හත්ථපාදම්පි ඡින්දන්ති. කණ්ණම්පි ඡින්දන්ති. නාසම්පි ඡින්දන්ති. කණ්ණනාසම්පි ඡින්දන්ති. බිළඞ්ගථාලිකම්පි කරොන්ති. සඞ්ඛමුණ්ඩිකම්පි කරොන්ති. රාහුමුඛම්පි කරොන්ති. ජොතිමාලිකම්පි කරොන්ති හත්ථපජ්ජොතිකම්පි කරොන්ති. එරකවත්තිකම්පි කරොන්ති. චීරකවාසිකම්පි කරොන්ති. එණෙය්‍යකම්පි කරොන්ති. බළිසමංසිකම්පි කරොන්ති. කහාපණිකම්පි කරොන්ති. ඛාරාපතච්ඡිකම්පි කරොන්ති. පලිඝපරිවත්තිකම්පි කරොන්ති. පලාලපීඨකම්පි කරොන්ති. තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති. සුනඛෙහිපි ඛාදාපෙන්ති. ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති. අසිනාපි සීසං ඡින්දන්ති. සො කම්මකාරණපච්චයාපි. දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස ? අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. රාජා ඉමෙසං චතුන්නං දණ්ඩානං ඉස්සරො.

සො සකෙන කම්මෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. තමෙනං නිරයපාලා පඤ්චවිධබන්ධනං නාම කාරණං කාරෙන්ති. තත්තං අයොඛිලං හත්ථෙ ගමෙන්ති. තත්තං අයොඛිලං දුතියෙ හත්ථෙ ගමෙන්ති. තත්තං අයොඛිලං පාදෙ ගමෙන්ති. තත්තං අයොඛිලං දුතියෙ පාදෙ ගමෙන්ති, තත්තං අයොඛිලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති. සො තත්ථ දුක්ඛා කටුකා තිප්පා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති.[a] එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. තමෙනං නිරයපාලා සංවෙසෙත්වා කුඨාරීහි තච්ඡන්ති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති, යාව න තං පාපං කම්මං බ්‍යන්තී හොති. තමෙනං නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා වාසීහි තච්ඡන්ති. තමෙනං නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය පථවියා සම්පජ්ජලිතාය සජොතිභූතාය සාරෙන්තිපි පච්චාසාරෙන්තිපි[2] -පෙ- තමෙනං නිරයපාලා මහන්තං අඞ්ගාරපබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි -පෙ- තමෙනං නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චති. සො තත්ථ ඵෙණුද්දෙහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති. සකිම්පි අධො ගච්ඡති. සකිම්පි තිරියං ගච්ඡති. සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති. න ච තාව කාලං කරොති. යාව න තං පාපං කම්මං බ්‍යන්තීහොති. එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. තමෙනං නිරයපාලා මහානිරයෙ පක්ඛිපන්ති. සො ඛො පන මහානිරයො:

1. කරණපච්චයාපි - සීමු. II  2 භාරෙන්තිපි පච්චාභාරෙන්තිපි - සීමු. II.

a. මජ්ඣිමනිකාය - දෙවදූතසුත්ත

කසයෙනු ද තලවසි, වේවැලිනු ද තලවසි, අඩදඬියෙනු ද තලවසි, අත ද සිඳී, පය ද සිඳී, අත්පා ද සිඳී, කන ද සිඳී, නැහැය ද සිඳී, කන්නාසා ද සිඳී, බිලඞ්ගථාලික කම්කටොලු ද කෙරෙයි, සක්මුඹු ද කෙරෙයි, රාහුමුඛ කම්කටොලු ද කෙරෙයි, ජෝතිමාලික කම්කටොලු ද කෙරෙයි, හත්ථපජ්ජෝතික කම්කටොලු ද කෙරෙයි, එරැවතු කම්කටොලු ද කෙරෙයි, තිහිරිවත් කම්කටොලු ද කෙරෙයි, එණෙය්‍යක කම්කටොලු ද කෙරෙයි, බිලියෙන් සම්මස්නහර ද උපුටයි, කහවණුවම් ද කෙරෙයි, කාරමු ද ගල්වයි, පරිඝපරිවර්තන කම්කටොලු ද කෙරෙයි පලාලපීඨක කම්කටොලු ද කෙරෙයි, රත්කල තෙලු ද ඉසී, ශුනකයන් ලවා ද කවයි, දිවස්හුල ද හිඳුවයි, කඩුවෙනු ද හිස සිඳී; හෙතෙම කම්කටොලු හෙතුයෙනු ද දුක් දොම්නස් විඳී. තෙල බියදුක් දොම්නස් ඔහුට කොයින් උපනැ යත්: ආත්මදණ්ඩයෙන් උපන, හටගත නිපන වෙසෙසින් නිපන පහළ වූයේ වන. රජ මේ සතර දඬුවමට පොහොසත් (-සමර්ථ) වේ.

හෙතෙම සිය පව්කැමින් කාබුත් මරණින් මතු සැප නැති දුකට ගති වූ විවසව පතිත වන නිරයට පැමිණෙයි; ඔහුට නිරයපාලයෝ පඤ්චවිධ බන්ධන නම් කම්කටොලු කරවති: රත් වූ යහුලක් අතෙහි ගසති, රත් යවුලක් දෙවැනි අතෙහි ගසති, රත් යවුලක් පයෙහි ගසති, රත් යවුලක් දෙවැනි පයෙහි ගසති, රත් යවුලක් ලමැද ගසත්. හේ එහි තියුණු වූ කටුක වූ දුක් වෙදනා විඳී. යම් තාක් ඒ පව්කම් නො ගෙවේ නම්, ඒ තාක් නො ද මියෙයි. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයින් උපනැ යත්: ආත්මදණ්ඩ හෙතුවෙන් ජාත යැ සඤ්ජාත යැ නිර්වෘත යැ අභිනිර්වෘත යැ ප්‍රාදුර්භූත යි. යමපල්හු ඒ පව්කම් කළහු බිමැ හොවා කෙටේරියෙන් සස්ති; හේ එහි තියුණු කටුක දුක් වෙදනා විඳී. යම් තාක් ඒ පව්කම් නො ගෙවේ නම්, ඒ තාක් නො ද මියෙයි. යමපල්හු ඒ පව්කම් කළහු ඌර්ධ්වපාද කොට අධඃශීර්ෂ කොට ගෙන වෑයෙන් සස්ති. ඒ පව්කම් කළහු නිරයපාලයෝ (ගින්නෙන් දිලියෙන) රියෙහි යොදා හාත්පසින් දල්වෙන අතිශයින් දිලියෙන ගිනිදල් සහිත වූ පොළොවෙහි ඉදිරියට ඇවිදුවන්නාහු ද නවතන්නාහු ද වෙති, පව්කම් කළ ඔහු යමපල්හු ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ජ්වාලා සහිත වූ මහත් අඞ්ගාරපර්වතයට නංවති. බස්වන්නාහු ද වෙත්...යමපල්හු පව්කම් කළ ඔහු ඌර්ධ්වපාද අධඃශීර්ෂ කොට ගෙන තප්ත වූ ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ ජ්වාලා සහිත වූ ලොහකුම්භියෙහි ප්‍රක්ෂෙප කෙරෙත්. හේ එහි පෙණපිඬක් බඳු දෙහ ඇති වැ පැසෙයි. හේ එහි පෙණපිඬක් බඳු දෙහ ඇති වැ පස්නේ වරක් උඩට ද නැගෙයි, වරක් යටට ද බසී, වරක් සරස ද ඇවිදී. හේ එහි තීව්‍ර වූ කටුක වූ දුක් වෙදනා විඳී. යම් තාක් ඒ පව්කම් නො ගෙවේ නම්, ඒ තාක් නො ද මියෙයි. තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයින් උපනැ යත්: ආත්මදණ්ඩයෙන් (සිය කැමින්) උපන, සඤ්ජාත යැ නිර්වෘත යැ ප්‍රාදුර්භූත යි. ඒ පව්කම් කළ ඔහු යමපල්හු මහානිරයෙහි ප්‍රක්ෂෙප කෙරෙත්. ඒ මහානිරය වූ කලී:

1. චතුක්කණ්ණො චතුද්වාරෙ
විභත්තො භාගසො මිතො,
අයොපාකාරපරියන්තො
අයසා පටිකුජ්ජිතො.

2. තස්ස අයොමයා භූමි
ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං
ඵරිත්වා තිට්ඨති සබ්බදා.[a]

3. කදරියා තපනා[1] ඝොරා අච්චිමන්තො දුරසදා,
ලොමහංසනරූපා ච භිස්මා පටිභයා දුඛා.[b]

4. පුරත්ථිමාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො,
දහන්තො පාපකම්මන්තෙ පච්ඡිමාය පටිහඤ්ඤති.

5. පච්ඡිමාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො,
දහන්තො පාපකම්මන්තෙ පුරත්ථිමාය පටිහඤ්ඤති.

6. උත්තරාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො,
දහන්තො පාපකම්මන්තෙ දක්ඛිණාය පටිහඤ්ඤති.

7. දක්ඛිණාය ච භිත්තියා අච්චික්ඛන්ධො සමුට්ඨිතො,
දහන්තො පාපකම්මන්තෙ උත්තරාය පටිහඤ්ඤති.

8. හෙට්ඨතො ච සමුට්ඨාය අච්චික්ඛන්ධො භයානකො,
දහන්තො පාපකම්මන්තෙ ඡදනස්මිං පටිහඤ්ඤති.

9. ඡදනම්හා සමුට්ඨාය අච්චික්ඛන්ධො භයානකො,
දහන්තො පාපකම්මන්තෙ භූමියං පටිහඤ්ඤති.

10. අයොකපාලමාදිත්තං සන්තත්තං ජලිතං යථා,
එවං අවීචිනිරයො හෙට්ඨා උපරි පස්සතො.

11. තත්ථ සත්තා මහාලුද්දා මහාකිබ්බිසකාරිනො,
අච්චන්තපාපකම්මන්තා පච්චන්ති න ච මීයරෙ.

12. ජාතවෙදසමො කායො තෙසං නිරයවාසිනං,
පස්ස කම්මානං දළ්හත්තං න භස්මා හොති න මසි.

13. පුරත්ථිමෙනපි ධාවන්ති තතො ධාවන්ති පච්ඡිමං,
උත්තරෙනපි ධාවන්ති තතො ධාවන්ති දක්ඛිණං.

14. යං යං දිසං පධාවන්ති තං තං ද්වාරං පිධීයති,
අභිනික්ඛමිතාසා තෙ සත්තා මොක්ඛගවෙසිනො.

15. න තෙ තතො නික්ඛමිතුං ලභන්ති කම්මපච්චයා,
තෙසං ච පාපකම්මන්තං අවිපක්කං කතං බහු"න්ති.

1. ඛාදරියා තපනා - සීමු II.
a. මජ්ඣිමනිකාය - උපරිපණ්ණාසක - දෙවදූතසුත්ත
b. සඞ්කිච්චජාතක.

1. (ඒ මහානිරය) සතර කන් ඇත්තේ යැ, සතර දොර යැ, වෙන වෙන මැ කොටස් වශයෙන් බෙදන ලද, යපවුරෙන් පරික්ඛිත්ත යැ, යපියනින් වසන ලද.

2. ඒ මහානරකයාගේ යපොළොව ජ්වලිත වූ යං තෙජසින් යුක්ත යැ. හාත්පස සියක් යොදුන් තැනැ සියලු කල්හි පැතිරැ සිටී.

3. (ඒ අෂ්ට මහානරකයෝ) නිරතුරු තවන්නාහු ඝොර වූවාහු (කල්පස්ථායී) ගිනිසිළු ඇත්තාහු ලංවියැ නො හැක්කාහු ලොමුදහන පියවි ඇත්තාහු බිහිසුණු වූවාහු බිය උපදවන්නාහු දුක් වූවාහු ද වෙත්.

4. පෙරදිග බිතින් නැඟුණු ගිනිකඳ පව්කම් කළ සත්ත්වයන් දවමින් (ගොස්) පැසුළු බිතැ වැදෙයි.

5. පශ්චිම භිත්තියෙන් නැඟුණු ගිනිකඳ පව්කම් කළ සත්ත්වයන් දවමින් ගොස් පූර්වභිත්තියෙහි වැදෙයි.

6. උතුරු බිතින් නැඟුණු ගිනිකඳ පව්කම් කළවුන් දවමින් ගොස් දකුණු බිතැ වැදෙයි.

7. දකුණු බිතින් නැඟුණු ගිනිකඳ පව්කම් කළවුන් දවමින් ගොස් උතුරු බිතැ වැදෙයි.

8. යට පොළොවිනු දු බිය එළවන ගිනිකඳ නැඟී පව්කම් කළවුන් දවමින් ගොස් ඡදනයෙහි (-සියන්හි) පැහැරැ සිටී.

9. ඡදනයෙන් බිය එළවන ගිනිකඳ නැඟී පාපකම් කළ සත්ත්වයන් දවමින් ගොස් බිමැ පැහැරැ සිටී.

10. අවීචිනරකය උඩ යට බලනුවහුට හාත්පසින් දිලියෙන අතිශයින් තැවුණු දල්වුණු යකඩලක් මෙනි.

11. එහි මහද්රෞද්‍ර වූ මහදරුණුකම් කරන සුලු වූ අතිශයින් පව්කම් ඇති සත්ත්වයෝ පැසෙති, නො ද මියෙත්.

12. ඒ නිරැවැසියන්ගේ කය ගිනි වැන්න. කම්යන්ගේ දැඩි සේ බල. හළු නො වෙයි, දූලි නො වේ.

13. (කිසි කාලෙක පූර්වද්වාරය විවෘත වූ කල්හි) ඒ දිගට ද දිවෙති, යළි පශ්චිමද්වාරයට දිවෙති, උත්තරද්වාරයට දිවෙති, යළි දක්ෂිණද්වාරයට දිවෙත්.

14. යම් යම් දිශාවකට වේගයෙන් දිවෙත් නම්, (සම්ප්‍රාප්ත කල්හි) ඒ ඒ ද්වාරය වැසෙයි. නික්මැ යන ආශා ඇති ඒ නිරිසත්හු මිදෙන උපාය සොයන්නාහු වෙත්.

15. කම්හෙතුයෙන් ඔහු එයින් නික්මෙන්නට නො ලැබෙති. යම් හෙයකින් ඔවුන් විසින් නො පැසුණු විපාක ඇති පාපකම්ය බොහෝ කොට කරන ලද ද ඒහෙයිනි.

එතං භයං දුක්ඛං දොමනස්සං කුතො තස්ස: අත්තදණ්ඩතො ජාතං සඤ්ජාතං නිබ්බත්තං අභිනිබ්බත්තං පාතුභූතං. යානි ච නෙරයිකානි දුක්ඛානි යානි ච තිරච්ඡානයොනිකානි දුක්ඛානි යානි ච පෙත්තිවිසයිකානි දුක්ඛානි යානි ච මානුසිකානි දුක්ඛානි, තානි කුතො ජාතානි, කුතො සඤ්ජාතානි, කුතො නිබ්බත්තානි, කුතො අභිනිබ්බත්තානි, කුතො පාතුභූතානි: අත්තදණ්ඩතො ජාතානි සඤ්ජාතානි නිබ්බත්තානි අභිනිබ්බත්තානි පාතුභූතානි.

**අත්තදණ්ඩා භයං ජාතං ජනං පස්සථ මෙධගන්ති** ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවතා ච මනුස්සා ච මෙධගං ජනං කලහං ජනං විරුද්ධං ජනං පටිවිරුද්ධං ජනං ආහතං ජනං පච්චාහතං ජනං ආඝාතිතං[1] ජනං පච්චාඝාතිතං ජනං පස්සථ දක්ඛථ ඔලොකෙථ නිජ්ඣායෙථ උපපරික්ඛථාති - ජනං පස්සථ මෙධගං.

**සංවෙගං කිත්තයිස්සාමීති** - සංවෙගං උබ්බෙගං උත්‍රාසං භයං පීළනං ඝට්ටනං උපද්දවං උපස්සග්ගං; කිත්තයිස්සාමි පකිත්තයිස්සාමි ආචික්ඛිස්සාමි දෙසිස්සාමි පඤ්ඤපිස්සාමි පට්ඨපිස්සාමි විවරිස්සාමි විභජිස්සාමි උත්තානීකරිස්සාමි පකාසිස්සාමීති - සංවෙගං කිත්තයිස්සාමි.

**යථා සංවිජිතං මයාති** - යථා මයා අත්තනායෙව අත්තා[2] සංවෙජිතො උබ්බෙජිතො සංවෙගමාපාදිතොති - යථා සංවිජිතං මයා.

තෙනාහ භගවා:

"අත්තදණ්ඩා භයං ජාතං
ජනං පස්සථ මෙධගං,
සංවෙගං කිත්තයිස්සාමි
යථා සංවිජිතං මයා"ති.

## 15 - 2

**ඵන්දමානං පජං දිස්වා මච්ඡෙ අප්පොදකෙ යථා,**
**අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙ දිස්වා මං භයමාවිසි.**

**ඵන්දමානං පජං දිස්වාති** - 'පජා'ති සත්තාධිවචනං; පජං තණ්හාඵන්දනාය ඵන්දමානං, දිට්ඨිඵන්දනාය ඵන්දමානං, කිලෙසඵන්දනාය ඵන්දමානං, දුච්චරිතඵන්දනාය ඵන්දමානං, පයොගඵන්දනාය ඵන්දමානං, විපාකඵන්දනාය ඵන්දමානං, රත්තං රාගෙන ඵන්දමානං, දුට්ඨං දොසෙන ඵන්දමානං, මූළ්හං මොහෙන ඵන්දමානං, විනිබද්ධං මානෙන ඵන්දමානං, වික්ඛෙපගතං උද්ධච්චෙන ඵන්දමානං, අනිට්ඨාගතං විචිකිච්ඡාය ඵන්දමානං, ථාමගතං අනුසයෙහි ඵන්දමානං, ලාභෙන ඵන්දමානං, අලාභෙන ඵන්දමානං, යසෙන ඵන්දමානං, අයසෙන ඵන්දමානං, පසංසාය ඵන්දමානං, නින්දාය ඵන්දමානං, සුඛෙන ඵන්දමානං, දුක්ඛෙන ඵන්දමානං, ජාතියා ඵන්දමානං, ජරාය ඵන්දමානං, බ්‍යාධිනා ඵන්දමානං, මරණෙන ඵන්දමානං, සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසෙහි ඵන්දමානං, නෙරයිකෙන දුක්ඛෙන ඵන්දමානං, තිරච්ඡානයොනිකෙන දුක්ඛෙන ඵන්දමානං, පෙත්තිවිසයිකෙන දුක්ඛෙන ඵන්දමානං, -

1. ආඝාටිතං, සත.  2. අද්ද - සිමු. II.

තෙල බිය දුක් දොම්නස් ඔහුට කොයින් උපනැ යත්: ආත්මදණ්ඩය හෙතු කොට ජාත යැ සඤ්ජාත යැ නිර්වෘත යැ අභිනිර්වෘත යැ ප්‍රාදුර්භූත යි. යම් නිරයදුකෙක් තිරිසන්යොනිහි යම් දුකෙක් ප්‍රෙතවිෂයෙහි යම් දුකෙක් මානුෂ වූ යම් දුකෙකුත් වෙත් නම්, එ දුක් කොයින් උපන්නාහු ද, කොයින් හටගත්තාහු ද, කොයින් නිපන්නාහු ද, කොයින් වෙසෙසින් නිපන්නාහු ද, කොයින් පහළ වූවාහු ද යත්: ආත්මදණ්ඩයෙන් ජාත - සඤ්ජාත - නිර්වෘත - අභිනිර්වෘත - ප්‍රාදුර්භූත වූවාහුය.

**අත්තදණ්ඩා භයං ජාතං ජනං පස්සථ මෙධගං** - ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශූද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවතාවෝ ද මනුෂ්‍යයෝ ද යන හිංසාවට පැමිණි ජනයා කලහ කරන - විරුද්ධ වූ - ප්‍රතිවිරුද්ධ වූ - ආහත වූ - ප්‍රත්‍යාහත වූ - පීඩිත වූ - ප්‍රතිපීඩිත වූ ජනයා බලවු, දකිවු, අවලෝකනය කරවු, නැවත නැවත සිතවු, නැවත නැවත පරීක්ෂා කරවු යයි 'ජනං පස්සථ මෙධගං' යනු වේ.

**සංවෙගං කිත්තයිස්සාමි** - සංවේගය උද්වේගය තැතිගැනීම භය ලෙළීම ගැටීම උපද්‍රවය උපසර්ගය (-ඇවිරීම) කීර්තනය කරන්නෙමි, ප්‍රකීර්තනය කරන්නෙමි, පවසන්නෙමි දෙසන්නෙමි පනවන්නෙමි පිහිටුවන්නෙමි විවරණය කරන්නෙමි විභාග කරන්නෙමි ප්‍රකට කරන්නෙමි ප්‍රකාශ කරන්නෙමි නුයි 'සංවෙගං කිත්තයිස්සාමි' යනු වේ.

**යථා සංවිජිතං මයා** - යම්සේ මා විසින් තමා මැ තෙමේ සංවේගයට පත් කරන ලදුයේ උද්වේග කරන ලදුයේ සංවේගයට පමුණුවන ලදුයේ නුයි 'යථා සංවිජිතං මයා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අත්තදණ්ඩා භයං ජාතං -පෙ- යථා සංවිජිතං මයා"යි.**

## 15 - 2

දියත්තෙක මසුන් මෙන් (තෘෂ්ණාදියෙන්) සැලෙන සත්ත්වවර්ගයා දැක, ඔවුනොවුන් හා සමග විරුද්ධ වූවන් දැක, බිය මා කරා පැමිණියේ ය. (-මට බිය උපන.)

**ඵන්දමානං පජං දිස්වා** - 'පජා' යනු: සත්ත්වයනට නමෙකි. තෘෂ්ණාස්පන්දනයෙන් සැලෙන ප්‍රජාව දෘෂ්ටිස්පන්දනයෙන් සැලෙන කෙලශස්පන්දනයෙන් සැලෙන දුශ්චරිතස්පන්දනයෙන් සැලෙන කායාදි ප්‍රයොගස්පන්දනයෙන් සැලෙන විපාකස්පන්දනයෙන් සැලෙන ප්‍රජාව, රාගයෙන් රත් වැ සැලෙන, ද්වේෂයෙන් දුෂ්ට වැ සැලෙන, මෝහයෙන් මූඪ වැ සැලෙන, මානයෙන් විනිබද්ධ වැ සැලෙන, ඖද්ධත්‍යයෙන් වික්ෂෙපයට පැමිණැ සැලෙන, විචිකිත්සාවෙන් නිෂ්ඨාවට නො පැමිණැ සැලෙන, අනුශයෙන් තදබවට පැමිණැ සැලෙන, ලාභයෙන් සැලෙන, අලාභයෙන් සැලෙන, යශසින් සැලෙන, අයශසින් සැලෙන, ප්‍රශංසායෙන් සැලෙන, නින්දායෙන් සැලෙන, සුවයෙන් සැලෙන, දුකින් සැලෙන, ජාතියෙන් සැලෙන, ජරායෙන් සැලෙන, ව්‍යාධියෙන් සැලෙන, මරණයෙන් සැලෙන, ශොකයෙන් පරිදෙවයෙන් දුකින් දොම්නසින් උපායාසයෙන් සැලෙන, නිරදුකින් සැලෙන, තිරිසන්යොනිහි වූ දුකින් සැලෙන, ප්‍රෙතවිෂයෙහි වූ දුකින් සැලෙන, -

මානුසිකෙන දුක්ඛෙන ඵන්දමානං, ගබ්භොක්කන්තිමූලකෙන දුක්ඛෙන-ගබ්භට්ඨිතිමූලකෙන දුක්ඛෙන - ගබ්භවුට්ඨානමූලකෙන දුක්ඛෙන - ජාතස්සූපනිබන්ධකෙන දුක්ඛෙන - ජාතස්ස පරාධෙය්‍යකෙන දුක්ඛෙන- අත්තූපක්කමෙන දුක්ඛෙන - පරූපක්කමෙන දුක්ඛෙන - දුක්ඛදුක්ඛෙන-සඞ්ඛාරදුක්ඛෙන -විපරිණාමදුක්ඛෙන - චක්ඛුරොගෙන දුක්ඛෙන-සොතරොගෙන- ඝානරොගෙන-ජිව්හාරොගෙන- සීසරොගෙන -කායරොගෙන -කණ්ණරොගෙන - මුඛරොගෙන - දන්තරොගෙන - කාසෙන - සාසෙන - පිනාසෙන ඩහෙන - ජරෙන - කුච්ඡිරොගෙන - මුච්ඡාය - පක්ඛන්දිකාය - සූලාය-විසූචිකාය - කුට්ඨෙන - ගණ්ඩෙන - කිලාසෙන - සොසෙන - අපමාරෙන-දද්දුයා - කණ්ඩුයා - කච්ඡුයා - නඛසාය[1] - විතච්ඡිකාය - ලොහිතපිත්තෙන[2]-මධුමෙහෙන -අංසාය - පිළකාය - භගන්දලෙන -පිත්තසමුට්ඨානෙන ආබාධෙන-සෙම්හසමුට්ඨානෙන ආබාධෙන - වාතසමුට්ඨානෙන ආබාධෙන - සන්නිපාතිකෙන ආබාධෙන - උතුපරිණාමජෙන ආබාධෙන - විසමපරිහාරජෙන ආබාධෙන - ඔපක්කමිකෙන ආබාධෙන - කම්මවිපාකජෙන ආබාධෙන-සීතෙන - උණ්හෙන - ජිඝච්ඡාය - පිපාසාය - උච්චාරෙන - පස්සාවෙන-ඩංසමකසවාතාතපසිරිංසප[3] සම්ඵස්සෙන දුක්ඛෙන-මාතුමරණෙන දුක්ඛෙන-පිතුමරණෙන දුක්ඛෙන -භාතුමරණෙන දුක්ඛෙන-භගිනිමරණෙන දුක්ඛෙන-පුත්තමරණෙන දුක්ඛෙන - ධීතුමරණෙන දුක්ඛෙන - ඤාතිමරණෙන දුක්ඛෙන - භොගව්‍යසනෙන දුක්ඛෙන - රොගව්‍යසනෙන දුක්ඛෙන - සීලව්‍යසනෙන දුක්ඛෙන - දිට්ඨිව්‍යසනෙන දුක්ඛෙන ඵන්දමානං සම්ඵන්දමානං විප්ඵන්දමානං වෙධමානං පවෙධමානං සම්පවෙධමානං; දිස්වාති දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති - ඵන්දමානං පජං දිස්වා.

**මච්ඡෙ අප්පොදකෙ යථාති** - යථා මච්ඡා අප්පොදකෙ උදකපරියාදානෙ කාකෙහි වා කුලලෙහි වා බලාකාහි වා පරිපාතියමානා[4] උක්ඛිපියමානා ඛජ්ජමානා ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්ති; එවමෙවං පජා තණ්හාඵන්දනාය ඵන්දන්ති -පෙ- දිට්ඨිබ්‍යසනෙන දුක්ඛෙන ඵන්දන්ති සම්ඵන්දන්ති විප්ඵන්දන්ති වෙධන්ති පවෙධන්ති සම්පවෙධන්තීති - මච්ඡෙ අප්පොදකෙ යථා.

**අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙති** - අඤ්ඤමඤ්ඤා සත්තා විරුද්ධා පටිවිරුද්ධා ආහතා[5] පච්චාහතා ආඝාතිතා[6] පච්චාඝාතිතා රාජානොපි රාජූහි විවදන්ති, ඛත්තියාපි ඛත්තියෙහි විවදන්ති, බ්‍රාහ්මණාපි බ්‍රාහ්මණෙහි විවදන්ති, ගහපතීපි ගහපතීහි විවදන්ති, මාතාපි පුත්තෙන විවදති, පුත්තොපි මාතරා විවදති, පිතාපි පුත්තෙන විවදති, පුත්තොපි පිතරා විවදති, භාතාපි භාතරා විවදති, භගිනීපි භගිනියා විවදති, භාතාපි භගිනියා විවදති.

1. රඛසාය - ස, රක්ඛසාය - පු. PTS.
2. ලොහිතෙන පිත්තෙන - සීමු. II PTS.
3. සරීසප - මජසං.
4. පරිපාචියමානා - සීමු. II, මජසං.
5. ආහතා - සීමු II.
6. ආඝාපිතා සතා.

මිනිස්ලොව වූ දුකින් සැලෙන, ගර්භාවක්‍රාන්තිමූලක දුකින් සැලෙන, ගර්භස්ථිතිමූලක දුකින් - ගර්භව්‍යුත්‍ථානමූලක දුකින් - උපන්නහු පිළිදග්නා දුකින් - උපන්නහු පරා අයත් දුකින් - ආත්මොපක්‍රම දුකින් - පරොපක්‍රම දුකින් - දුඃඛදුඃඛයෙන් - සංස්කාරදුඃඛයෙන් - විපරිණාම - දුඃඛයෙන් - චක්ෂූරොගයෙන් වූ දුකින් - ශ්‍රොත්‍රරොගයෙන් - ඝ්‍රාණරොගයෙන් - ජිහ්වාරොගයෙන් - කායරොගයෙන් - ශීර්ෂරොගයෙන් - කර්ණරොග-යෙන් - මුඛරොගයෙන් - දන්තරොගයෙන් - කාසයෙන් - ශ්වාසයෙන් - පීන-සින් - දාහයෙන් - ජ්වරයෙන් - කුක්ෂිරොගයෙන් - මූර්ඡායෙන් - ලොහිතාතී-සාරයෙන් ආමශූලයෙන් - විරේචනයෙන් - කුෂ්ඨරොගයෙන් - ගණ්ඩරොග යෙන් - කබරයෙන් - ක්ෂයරොගයෙන් - අපස්මාරයෙන් - දදපොළින් - කුඩා පොළින් - මහපොළින් - නියඟිරින් - අතුල් පතුල් පැළීමෙන් - රත්පිතින් මධුමෙහයෙන් - අශීසින් - ළේපොළින් - භගන්දරයෙන් - පිතින් උපදනා රොගයෙන් - සෙමින් උපදනා රොගයෙන් - වයින් උපදනා රොගයෙන් - සාන්නිපාතික රොගයෙන් - ඍතුවිපර්‍යාසයෙන් උපදනා රොගයෙන් - විෂම විහරණයෙන් උපදනා රොගයෙන් - උපක්‍රමයෙන් හටගත්තා රොගයෙන් කර්මවිපාකයෙන් උපදනා රොගයෙන් - ශීතයෙන් - උෂ්ණයෙන් - ජිඝත්සා-යෙන් - පිපාසායෙන් - උච්චාරයෙන් - ප්‍රස්‍රාවයෙන් - මැසි මදුරු වා අව් දික්දළ පහසින් වූ දුකින් - මවගේ මරණයෙන් වූ දුකින් - පියාගේ මරණයෙන් වූ දුකින් - බෑයාගේ මරණයෙන් වූ දුකින් - බූනගේ මරණයෙන් වූ දුකින් - පුතා මළ දුකින් - දූ මළ දුකින් - නෑයන් මළ දුකින් - භොග-විපත්ති දුකින් - රොගවිපත්ති දුකින් - ශීලවිපත්ති දුකින් - දෘෂ්ටිවිපත්ති දුකින් සැලෙන මොනොවට සැලෙන වෙසෙසින් සැලෙන වෙවුලන වෙසෙසින් වෙවුලන අතිශයින් වෙවුලන ප්‍රජාව; දිස්වා - දැක පෙනී තුලනය-කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට නුයි 'ඵන්දමානං පජං දිස්වා' යනු වේ.

**මච්ඡෙ අප්පොදකෙ යථා** - මද දියෙහි දිය සිඳුණු කල්හි කවුඩන් විසින් හෝ උකුස්සන් විසින් හෝ කොකුන් විසින් හෝ තසනු ලබන්නාවූ තහනු ලබන්නා වූ කනු ලබන්නා වූ මත්ස්‍යයෝ යම් සේ සැලෙත් ද සම්භාර-යෙන් සැලෙත් ද විවිධ වැ සැලෙත් ද, වෙවුලත් ද, වෙසෙසින් වෙවුලත් ද අතිශයින් වෙවුලත් ද, එපරිද්දෙන් ම ප්‍රජාව තෘෂ්ණාස්පන්දනයෙන් සැලෙති... දෘෂ්ටිව්‍යසන දුකින් සැලෙති සම්භාරයෙන් සැලෙති විවිධ වැ සැලෙති, වෙවුලති වෙසෙසින් වෙවුලති අතිශයින් වෙවුලත් නුයි 'මච්ඡෙ අප්පොදකෙ යථා' යනු වේ.

**අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙ** - සත්ත්වයෝ ඔවුනොවුන් විරුද්ධ වූවාහු ප්‍රතිවිරුද්ධ වූවාහු කොපයෙන් පහළාහු වෙසෙසින් පහළාහු ගැටුණාහු වෙසෙසින් ගැටුණාහු රජ්ජුරුවෝ රජුන් සමග විවාද කෙරෙති, ක්ෂත්‍රියයෝත් ක්ෂත්‍රියයන් සමග විවාද කෙරෙති, බමුණෝත් බමුණන් සමග විවාද කෙරෙති, ගැහැවියෝත් ගැහැවියන් සමග විවාද කෙරෙති, මවු ද පුතා සමග විවාද කෙරෙයි, පුතාත් මව සමග විවාද කෙරෙයි, පියාත් පුතු සමග විවාද කෙරෙයි, පුතාත් පියා සමග විවාද කෙරෙයි, බෑයාත් බෑයා සමග විවාද කෙරෙයි, භගනිය (-බූන) ද භගිනිය සමග විවාද කෙරෙයි, බෑයාත් බූන සමග විවාද කෙරෙයි,-

භගිනීපි භාතරා විවදති, සහායොපි සහායෙන විවදති. තෙ තත්ථ කලහවිග්ගහවිවාදාපන්නා අඤ්ඤමඤ්ඤං පාණීහිපි උපක්කමන්ති, ලෙඩ්ඩූහිපි උපක්කමන්ති, දණ්ඩෙහිපි උපක්කමන්ති, සත්ථෙහිපි උපක්කමන්ති. තෙ තත්ථ මරණම්පි නිගච්ඡන්ති. මරණමත්තම්පි දුක්ඛන්ති – අඤ්ඤමඤ්ඤෙහි ව්‍යාරුද්ධෙ.

දිස්වා මං භයමාවිසීති – 'දිස්වා'ති දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා භයං පීළනං ඝට්ටනං උපද්දවො උපස්සග්ගො ආවිසීති – දිස්වා මං භයමාවිසි.

තෙනාහ භගවා:

"ඵන්දමානං පජං දිස්වා
මච්ඡෙ අප්පොදකෙ යථා,
අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙ
දිස්වා මං භයමාවිසී"ති.

**15 - 8**

සමන්තමසාරො ලොකො
දිසා සබ්බා සමෙරිතා,
ඉච්ඡං භවනමත්තනො
නාද්දසාසිං[1] අනොසිතං.

**සමන්තමසාරො ලොකොති** – 'ලොකො'ති නිරයලොකො තිරච්ඡානයොනිලොකො පෙත්තිවිසයලොකො මනුස්සලොකො දෙවලොකො ඛන්ධලොකො ධාතුලොකො ආයතනලොකො අයං ලොකො පරො ලොකො බ්‍රහ්මලොකො දෙවලොකො; අයං වුච්චති ලොකො. නිරයලොකො අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. තිරච්ඡානයොනිලොකො – පෙත්තිවිසයලොකො – මනුස්සලොකො – දෙවලොකො – ඛන්ධලොකො – ධාතුලොකො – ආයතනලොකො – අයං ලොකො – පරො ලොකො – බ්‍රහ්මලොකො – දෙවලොකො[2] අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා දුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. යථා පන නළො අසාරො නිස්සාරො සාරාපගතො, යථා එරණ්ඩො අසාරො නිස්සාරො සාරාපගතො, යථා උදුම්බරො අසාරො නිස්සාරො සාරාපගතො, යථා සෙතවච්ඡො[3] අසාරො නිස්සාරො සාරාපගතො, යථා පාරිභද්දකො අසාරො නිස්සාරො සාරාපගතො, යථා ඵෙණපිණ්ඩො අසාරො නිස්සාරො සාරාපගතො, යථා උදකබුබ්බුළකං අසාරං නිස්සාරං සාරාපගතං, යථා මරීචි අසාරො නිස්සාරො සාරාපගතො, යථා කදලික්ඛන්ධො[4] අසාරො නිස්සාරො සාරාපගතො, යථා මායා අසාරා නිස්සාරා සාරාපගතා, එවමෙව නිරයලොකො අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා; –

1. නාද්දසාමි - සීමු. II. 2. සදෙවලොකො - සො. PTS.
3. සෙත කාචො - මනුප. සෙතගච්ඡො - PTS. 4. කදලික්ඛන්ධො - සීමු II.

ඥාති ද බෑයා සමග විවාද කෙරෙයි, යහළුවාත් යහළුවා සමග විවාද කෙරෙයි. ඔවුහු එහි කලහ - විග්‍රහ - විවාදයට පැමිණියාහු ඔවුනොවුන්ට අතින් ද පහර දෙති, කැටින් ද පහර දෙති, දඬුයෙන් ද පහර දෙති, අවියෙන් ද පහර දෙත්. ඔවුහු එහි මරණයට ද මරණමාත්‍රවූ දුකට ද පැමිණෙත් නුයි 'අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධෙ' යනු වේ.

**දිස්වා මං භයමාවිසි** - 'දිස්වා' යනු: දැක පෙනී තුලනය - තීරණය - විභාවනය - විභූත කොට, බිය පෙළුම ගැටුම උපද්‍රවය උපසර්ගය පැමිණියේ නුයි 'දිස්වා මං භයමාවිසි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ඵන්දමානං පජං දිස්වා -පෙ- දිස්වා මං භයමාවිසී"ති.

## 15 - 8

නිරයාදි ලෝකය හාත්පසින් නිසරු යැ. සියලු දෙස අනිත්‍යතායෙන් කම්පිත යැ. (එයින්) තමහට ත්‍රාණය කැමැති වත්හෙම් ජරාදීන් නො මැඩුණු තැනක් නුදුටිමි.

**සමන්තමසාරො ලොකො** - 'ලොක' නම්: නිරයලෝක යැ තිරශ්චීන-ලෝක යැ ප්‍රෙතවිෂයලෝක යැ මනුෂ්‍යලෝක යැ දේවලෝක යැ ස්කන්ධ-ලෝක යැ ධාතුලෝක යැ ආයතනලෝක යැ මෙලොව යැ පරලොව යැ බඹලොව යැ දෙව්ලොව යැ. (යන) මේ 'ලොක'යි කියනු ලැබේ. නිරයලොකය නිත්‍යසාර සාරයෙන් හෝ ධ්‍රුවසාර (සඞ්ඛ්‍යාත) සාරයෙන් හෝ ආත්මසාර (සඞ්ඛ්‍යාත) සාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමස්වභාවයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරයෙන් අපගත යි. තිරශ්චීනයොනිලෝකය -ප්‍රේතවිෂයලෝකය -මනුෂ්‍යලෝකය- දේවලෝකය- ස්කන්ධලෝකය - ධාතුලෝකය - ආයතනලෝකය - මෙලොව - පරලොව- බඹලොව - දෙව්ලොව නිත්‍යසාර (සඞ්ඛ්‍යාත) සාරයෙන් හෝ ධ්‍රුවසාරසාර-යෙන් හෝ ආත්මසාරසාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමස්වභාවයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරයෙන් අපගත යි. තවද බටගස යම්සේ හර රහිත වූයේ නිසරු වූයේ හරයෙන් අපගත වූයේ ද, යම්සේ එරඬු ගස අසාර වූයේ නිසරු වූයේ සාරයෙන් අපගත ද, යම්සේ දිඹුල්ගස අසාර ද නිස්සාර ද සාරාපගත ද, යම්සේ වරණගස අසාර ද නිස්සාර ද සාරාපගත ද, යම්සේ එරබදුගස අසරු වූයේ නිසරු වූයේ හරයෙන් අපගත වූයේ ද, යම්සේ පෙණපිඩ අසරු ද නිසරු ද හර නැත් ද, යම්සේ දියබුබුළ අසරු ද, නිසරු ද හර නැත් ද, යම්සේ මිරිඟුව අසරු ද නිසරු ද සාරාපගත ද, යම්සේ කෙසෙල්කඳ අසරු ද නිසරු ද සාරාපගත ද, යම්සේ මායාව අසරු ද නිසරු ද සාරාපගත ද, එසෙයින් මැ නිරයලොකය නිත්‍යසාර (සඞ්ඛ්‍යාත) සාරයෙන් හෝ ධ්‍රුවසාරසාරයෙන් හෝ ආත්මසාරසාරයෙන් හෝ නිත්‍ය යෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමස්වභාවයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරයෙන් අපගත වූයේ යි. -

තිරච්ඡානයොනිලොකො - පෙත්තිවිසයලොකො මනුස්සලොකො - දෙවලොකො අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. ඛන්ධලොකො - ධාතුලොකො ආයතනලොකො - අයං ලොකො - පරො ලොකො - බ්‍රහ්මලොකො - දෙවලොකො අසාරො නිස්සාරො සාරාපගතො නිච්චසාරසාරෙන වා සුඛසාරසාරෙන වා අත්තසාරසාරෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වාති - සමන්තමසාරො ලොකො.

**දිසා සබ්බා සමෙරිතාති** - යෙ පුරත්ථිමාය දිසාය සඞ්ඛාරා තෙපි එරිතා සමෙරිතා චලිතා ඝට්ටිතා අනිච්චතාය, ජාතියා අනුගතා, ජරාය අනුසටා, බ්‍යාධිනා අභිභූතා, මරණෙන අබ්භාහතා, දුක්ඛෙ පතිට්ඨිතා, අතාණා අලෙණා අසරණා අසරණීභූතා. යෙ පච්ඡිමාය දිසාය සඞ්ඛාරා - යෙ උත්තරාය දිසාය සඞ්ඛාරා - යෙ දක්ඛිණාය දිසාය සඞ්ඛාරා - යෙ පුරත්ථිමාය අනුදිසාය[1] සඞ්ඛාරා - යෙ පච්ඡිමාය අනුදිසාය සඞ්ඛාරා - යෙ උත්තරාය අනුදිසාය සඞ්ඛාරා - යෙ දක්ඛිණාය අනුදිසාය සඞ්ඛාරා - යෙ හෙට්ඨිමාය දිසාය සඞ්ඛාරා - යෙ උපරිමාය දිසාය සඞ්ඛාරා - යෙ දසසු දිසාසු සඞ්ඛාරා, තෙපි එරිතා සමෙරිතා චලිතා ඝට්ටිතා අනිච්චතාය, ජාතියා අනුගතා, ජරාය අනුසටා, බ්‍යාධිනා අභිභූතා, මරණෙන අබ්භාහතා දුක්ඛෙ පතිට්ඨිතා, අතාණා අලෙණා අසරණා අසරණීභූතා.

භාසිතම්පි චෙතං:

1. "කිඤ්චාපි තෙ'තං[2] ජලතෙ[3] විමානං
ඕභාසයං උත්තරස්සං දිසායං,[4]
රූපෙ රණං දිස්වා සදා පවෙධිතං
තස්මා න රූපෙ රමතී සුමෙධො"[a]

2. "මච්චුනාබ්භාහතො ලොකො ජරාය පරිවාරිතො,
තණ්හාසල්ලෙන ඔතිණ්ණො ඉච්ඡාධූමායිතො සදා"[b]

3. "සබ්බො ආදීපිතො ලොකො සබ්බො ලොකො පධූපිතො,
සබ්බො පජ්ජලිතො ලොකො සබ්බො ලොකො පකම්පිතො"ති.[c]

දිසා සබ්බා සමෙරිතා.

---

1. දිසාය - සිමු. II. 2. චෙතං - සිමු. II. 3. ජලති - සිමු. II.
4. උත්තරියං දිසායං - සිමු. II. මජසං. PTS

a. භික්ඛුනිසංයුත්ත - පඨමවග්ග. b. දෙවතාසංයුත්ත - අද්ධවග්ග
c. භික්ඛුනීසංයුත්ත.

තිරශ්චීනයොනිලොකය - ප්‍රෙතවිෂයලොකය - මනුෂ්‍යලොකය - දෙවලොකය නිත්‍යසාරසාරයෙන් හෝ සුඛසාරසාරයෙන් හෝ ආත්මසාරසාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමධර්මයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරාපගත යි. ස්කන්ධලොකය - ධාතුලොකය - ආයතනලොකය - මෙලොව - පරලොව - බඹලොව - දෙව්ලොව නිත්‍යසාරසාරයෙන් හෝ සුඛසාරසාරයෙන් හෝ ආත්මසාරසාරයෙන් හෝ නිත්‍යයෙන් හෝ ධ්‍රැවයෙන් හෝ ශාශ්වතයෙන් හෝ අවිපරිණාමධර්මයෙන් හෝ අසාර යැ නිස්සාර යැ සාරාපගත නුයි 'සමන්තමසාරො ලොකො' යනු වේ.

දිසා සබ්බා සමේරිතා - පෙර දිග යම් සංස්කාර කෙනෙක් වෙත් නම්, ඔවුහු ද අනිත්‍යතායෙන් කම්පිත වූවාහුය මොනොවට කම්පිත වූවාහුය සැලුණාහුය ගැටුණාහුය, ජාතියෙන් අනුව ගියාහුය, ජරාවෙන් යුක්ත වූවාහුය, ව්‍යාධියෙන් මඩනා ලද්දාහුය, මරණයෙන් පහළාහුය දුකෙහි පිහිටියාහුය, ත්‍රාණ (-ආරක්‍ෂා) රහිත වූවාහුය, රැකවරණ රහිත වූවාහුය, පිහිට නැත්තාහුය, (තුමූ) පිහිට නො වත්තාහුය. පැලදෙස යම් සංස්කාර කෙනෙක් - උතුරු දෙස යම් සංස්කාර කෙනෙක් - දකුණු දෙස යම් සංස්කාර කෙනෙක් - පූර්ව අනුදිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - පශ්චිම අනුදිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - උත්තර අනුදිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - දක්‍ෂිණ අනුදිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - යට දිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - උඩ දිශාවෙහි යම් සංස්කාර කෙනෙක් - දශදිශාවන්හි යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔවුහු ද අනිත්‍යතායෙන් කම්පිත වූවාහුය, සඞ්කම්පිත වූවාහුය, සැලුණාහුය, ගැටුණාහුය; ජාතියෙන් අනුව ගියාහුය, ජරාවෙන් යුක්ත වූවාහුය, ව්‍යාධියෙන් මඩනා ලද්දාහුය, මරණයෙන් පහළාහුය, දුකෙහි පිහිටියාහුය, පාලන රහිත වූවාහුය, රැකවරණ රහිත වූවාහුය, අසරණ වූවාහුය, සරණ නො වත්තාහු යි.

මේ කියන ලද මැ යැ:

1. "තවද තාගේ තෙල විමන උතුරු දෙස බබුළුවමින් දිලියේ නමුදු (ජාතිජරාභඞ්ග සඞ්ඛ්‍යාත) වූ රූපයෙහි දෝෂය දැක සියලු කල්හි ශීතාදියෙන් කම්පිත වූ රූපය දැක, එ කරුණෙන් සොඳුරු නුවණැති ශාස්තෘ තෙම රූපයෙහි නො ඇලෙ."

2. "ලෝවැසි තෙම මරණයෙන් මඩනා ලද, ජරාවෙන් පිරිවරන ලද, තෘෂ්ණා නැමැති ශල්‍යයෙන් අවතීර්ණ යැ. සියලු කල්හි ඉච්ඡා (-ආශාවෙන්) දුමන ලද්දේ යි."

3. "සියලු සත්ත්ව ලොක තෙමේ භාත්පසින් දැල්වෙන ලද. සියලු ලොකය දුමන ලද. සියලු ලොකය ප්‍රජ්වලිත යැ. සියලු ලොකය ප්‍රකම්පිත වූයේ ය යි."

'දිසා සබ්බා සමේරිතා' යනු වේ.

**ඉච්ඡං භවනමත්තනොති** - අත්තනො භවනං තාණං ලෙණං සරණං ගතිං පරායනං ඉච්ඡන්තො සාදියන්තො පත්ථයන්තො පිහයන්තො අභිජප්පන්තොති - ඉච්ඡං භවනමත්තනො.

**නාද්දසාසිං අනොසිතන්ති** - අජ්ඣොසිතංයෙව අද්දසං; අනජ්ඣොසිතං නාද්දසං. සබ්බං යොබ්බඤ්ඤං ජරාය ඔසිතං. සබ්බං ආරොග්‍යං ව්‍යාධිනා ඔසිතං. සබ්බං ජීවිතං මරණෙන ඔසිතං. සබ්බං ලාභං අලාභෙන ඔසිතං. සබ්බං යසං අයසෙන ඔසිතං. සබ්බං පසංසං නින්දාය ඔසිතං. සබ්බං සුඛං දුක්ඛෙන ඔසිතං.

4. "ලාභො අලාභො අයසො යසො ච නින්දා පසංසා ච සුඛං දුක්ඛඤ්ච,
එතෙ අනිච්චා මනුජෙසු ධම්මා අසස්සතා විපරිණාමධම්මා"ති[a]

'නාද්දසාසිං අනොසිතං'.

තෙනාහ භගවා:

"සමන්තමසාරො ලොකො දිසා සබ්බා සමෙරිතා,
ඉච්ඡං භවනමත්තනො නාද්දසාසිං අනොසිත"න්ති.

## 15 - 4

ඔසානෙ ත්වෙව ව්‍යාරුද්ධෙ දිස්වා මෙ අරතී අහු,
අථෙත්ථ සල්ලමද්දක්ඛිං දුද්දසං හදයස්සිතං.

**ඔසානෙ ත්වෙව ව්‍යාරුද්ධෙති** - 'ඔසානෙත්වෙව'ති සබ්බං යොබ්බඤ්ඤං ජරා ඔසාපෙති; සබ්බං ආරොග්‍යං ව්‍යාධි ඔසාපෙති; සබ්බං ජීවිතං මරණං ඔසාපෙති; සබ්බං ලාභං අලාභො ඔසාපෙති; සබ්බං යසං අයසො ඔසාපෙති; සබ්බං පසංසං නින්දා ඔසාපෙති; සබ්බං සුඛං දුක්ඛං ඔසාපෙතීති **'ඔසානෙත්වෙව;' ව්‍යාරුද්ධෙති** යොබ්බඤ්ඤකාමා සත්තා ජරාය පටිවිරුද්ධා; ආරොග්‍යකාමා සත්තා ව්‍යාධිනා පටිවිරුද්ධා; ජීවිතුකාමා සත්තා මරණෙන පටිවිරුද්ධා; ලාභකාමා සත්තා අලාභෙන පටිවිරුද්ධා; යසකාමා සත්තා අයසෙන පටිවිරුද්ධා; පසංසාකාමා සත්තා නින්දාය පටිවිරුද්ධා; සුඛකාමා සත්තා දුක්ඛෙන පටිවිරුද්ධා ආහතා පච්චාහතා ආඝාතිතා පච්චාඝාතිතාති **'ඔසානෙත්වෙව ව්‍යාරුද්ධෙ.'**

---

a. අට්ඨකඞ්ගුත්තර - මෙත්තාවග්ග

**ඉච්ඡං භවනමත්තනො** – තමාගේ භවනය පාලනය රැකවරණය දුක් නැසීම ප්‍රතිෂ්ඨාව උතුම් පැවැත්ම ඉස්තෙම් ඉවසනුයෙම් පතනුයෙම් කැමැති වනුයෙම් අභිජල්පනය කරනුයෙම් නුයි 'ඉච්ඡං භවනමත්තනො' යනු වේ.

**නාද්දසාසිං අනොසිතං** – (ජරාදිය විසින්) මඩනා ලදුවක් ම දිටිමි, නො මඩනා ලද්දක් නුදුටිමි. සියලු යොවුන් බව ජරාවෙන් මඩනා ලද. සියලු අරොග බව ව්‍යාධියෙන් මඩනා ලද. සියලු ජීවිතය මරණයෙන් මඩනා ලද. සියලු ලාභය අලාභයෙන් මඩනා ලද. සියලු යශස අයශසින් මඩනා ලද. සියලු පැසැසුම් නින්දාවෙන් මඩනා ලද. සියලු සැපය දුකින් මඩනා ලදි.

4. "ලාභය ද අලාභය ද අයශස් ද යශස් ද නින්දාව ද ප්‍රශංසාව ද සුවය ද දුක ද යන මිනිසුන් කෙරෙහි වූ මෙල ධර්මයෝ අනිත්‍යයෝ ය, අශාශ්වතයෝ ය, පෙරළෙන ස්වභාව ඇත්තාහු ය'යි.

'නාද්දසාසිං අනොසිතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සමන්තමසාරො ලොකො -පෙ- නාද්දසාසිං අනොසිතං"යි.

## 15 - 4

යළි (යෞවනාදීන්ගේ) අවසානයෙහි මැ ('ජරාදිය සමග) ප්‍රතිවිරුද්ධ වූ සත්ත්වයන් දැක මට අනභිරතිය උපන. අනතුරුව මෙල සත්ත්වයන් විෂයෙහි වූ නො දක්ක හැකි සිත ඇසුරු කළ රාගාදි (සප්ත විධ) ශල්‍යය දිටිමි.

**ඔසානෙ ත්වෙව ව්‍යාරුද්ධෙ** – 'ඔසානෙ ත්වෙව' යනු: ජරාව සියලු යොවුන් බව අවසාන කෙරෙයි, ව්‍යාධිය සියලු අරොග බව අවසාන කෙරෙයි, මරණය සියලු ජීවිතය අවසාන කෙරෙයි, සියලු ලාභය අලාභය තෙමේ අවසාන කෙරෙයි, සියලු යශස් අපකීර්තිය අවසාන කෙරෙයි, නින්දාව සියලු පැසැසුම් අවසාන කෙරෙයි, දුක සියලු සුවය අවසාන කෙරේ නුයි 'ඔසානෙ ත්වෙව' යනු වේ. **ව්‍යාරුද්ධෙ** – යොවුන් බව කැමැති සත්ත්වයෝ ජරාව හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, ආරොග්‍යය කැමැති සත්ත්වයෝ ව්‍යාධිය හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, ජීවත්වනු කැමැති සත්ත්වයෝ මරණය සමග ප්‍රතිවිරුද්ධ වූවාහුය, ලාභ කැමැති සත්ත්වයෝ අලාභය හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, යශස් කැමැති සත්ත්වයෝ අයශස් හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, ප්‍රශංසා කැමැති සත්ත්වයෝ නින්දාව හා ප්‍රතිවිරුද්ධ වූවාහුය, සුව කැමැති සත්ත්වයෝ දුක හා ප්‍රතිවිරුද්ධ වූවාහුය (කොපයෙන්) පහළාහු පිළිමල් වැ පහළාහු යැවුණාහු අවශේෂයෙන් ගැටුණාහු නුයි 'ඔසානෙ ත්වෙව ව්‍යාරුද්ධෙ' යනු වේ.

දිස්වා මෙ අරති අහුති - 'දිස්වා'ති දිස්වා පස්සිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වාති දිස්වා; මෙ අරතීති යා අරති යා අනභිරති යා අනභිරමණා යා උක්කණ්ඨිතතා යා පරිතස්සිතා අහුති- දිස්වා මෙ අරති අහු.

අථෙත්ථ සල්ලමද්දක්ඛින්ති - 'අථා'ති පදසන්ධි -පෙ- පදානුපුබ්බතා මෙතං 'අථා'ති; එත්ථාති සත්තෙසු; සල්ලන්ති සත්ත සල්ලානි: රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං සොකසල්ලං කථංකථා- සල්ලං; අද්දක්ඛින්ති අද්දසං අදක්ඛිං අපස්සිං පටිවිජ්ඣින්ති - අථෙත්ථ සල්ලමද්දක්ඛිං.

දුද්දසං හදයස්සිතන්ති - 'දුද්දස'න්ති දුද්දසං දුද්දක්ඛං දුප්පස්සං දුබ්බුජ්ඣං දුරනුබුජ්ඣං දුප්පටිවිජ්ඣන්ති දුද්දසං; හදයස්සිතන්ති හදයං වුච්චති චිත්තං; "යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජා මනොවිඤ්ඤාණධාතු;[2] හදයස්සිතං හදයනිස්සිතං චිත්තනිස්සිතං චිත්තනිස්සිතං චිත්තෙන සහජාතං සහගතං සංසට්ඨං සම්පයුත්තං එකුප්පාදං එකනිරොධං එකවත්ථුකං එකාරම්මණන්ති- "දුද්දසං හදයස්සිතං".

තෙනාහ භගවා:

"ඔකාසෙ තෙව ව්‍යාරුද්ධෙ දිස්වා මෙ අරතී අහු,
අථෙත්ථ සල්ලමද්දක්ඛිං දුද්දසං හදයස්සිත"න්ති.

## 15 - 5

යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති,
තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදති.

යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවතීති - 'සල්ල'න්ති සත්ත සල්ලානි: රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨි- සල්ලං සොකසල්ලං කථංකථාසල්ලං.

කතමං රාගසල්ලං? යො රාගො සාරාගො අනුනයො අනුරොධො නන්දිරාගො චිත්තස්ස සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං ඉදං රාගසල්ලං.

කතමං දොසසල්ලං? අනත්ථං මෙ අචරීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරතීති ආඝාතො ජායති, අනත්ථං මෙ චරිස්සතී'ති ආඝාතො ජායති -පෙ- චණ්ඩික්කං අසුරොපො[1] අනත්තමනතා චිත්තස්ස, ඉදං දොසසල්ලං.

---

1. අස්සුරොපො - සු සිමු. II PTS.
2. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

**දිස්වා මෙ අරති අහු** - 'දිස්වා' යනු: දැක පෙනී තුලනය කොට තීරණය කොට වෙසෙසින් සලකා විභූත කොට නුයි 'දිස්වා' යනු වේ. **මෙ අරති** යනු: යම් නො ඇල්මෙක් යම් නො ඇලුණු බවෙක් යම් නො ඇලුණු අහුමරක් යම් උකටලිබවෙක් යම් හාත්පසින් කියවන බවෙක් වී නුයි 'දිස්වා මේ අරති අහු' යනු වේ.

**අථෙත්ථ සල්ලමද්දක්ඛිං** - 'අථ' යනු: පදසන්ධියැ...පදානුපූර්විතා යැ තෙල 'අථ' යනු. **එත්ථ** යනු: සත්ත්වයන් විෂයෙහි; **සල්ල** නම්: සත් ශල්‍ය කෙනෙකි: රාගශල්‍ය යැ ද්වේෂශල්‍ය යැ මෝහශල්‍ය යැ මානශල්‍ය යැ දෘෂ්ටිශල්‍ය යැ ශෝකශල්‍ය යැ කථංකථාශල්‍ය යැ'යි; **අද්දක්ඛිං** යනු: දිටිමි අවබොධ කෙළෙමි නුයි 'අථෙත්ථ සල්ලමද්දක්ඛිං' යනු වේ.

**දුද්දසං හදයනිස්සිතං** - 'දුද්දසං' යනු: දුර්දර්ශ යැ නො දක්ක හැකි යැ නො බැලිය හැකි යැ නො දත හැකි යැ අවබොධ කළ නො හැකි යැ ප්‍රතිවේධ කළ නො හැක්කැයි 'දුද්දසං' යනු වේ. **හදයනිස්සිතං** යනු: 'හදය' යි සිත කියනු ලැබෙයි; යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් භවාඞ්ගසිතෙක් මනසක් මනඃසඞ්ඛ්‍යාත ආයතනයෙක් මනෙන්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනොවිඥානධාතුයෙක් වේ ද එය යි. හෘදය (-සිත) ඇසුරු කළ හෘදයනිඃශ්‍රිත වූ සිත ඇසුරු කළ චිත්තනිඃශ්‍රිත වූ සිත හා සහගත (-නො වෙන්) වූ සමග උපන් සංසෘෂ්ට වූ සම්ප්‍රයුක්ත වූ එක් වැ උපදනා එක් වැ නිරුද්ධ වන (හෘදයවස්තු වශයෙන්) එකවස්තුක වූ (රූපාදි වශයෙන්) එකාලම්බන වූයේ නුයි 'දුද්දසං හදයනිස්සිතං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ඔසානෙ ත්වෙව බ්‍යාරුද්ධෙ -පෙ- දුද්දසං හදයනිස්සිතං"යි

**15 - 5**

යම් රාගාදි ශල්‍යයෙකින් අවතීර්ණ වූ (-විදුනා ලද) සත්ත්ව තෙමේ සියලු දිගට දිවෙන්නේ ද, (එහෙයින්) ඒ ශල්‍යය මැ උදුරාපියා (සියලු දිගට සියලු ගති ආදීයෙහි) නො දිවෙයි. (චතුරෞඝයෙහි) නො ගැළේ.

**යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති** - 'සල්ල' නම්: සත් ශල්‍ය කෙනෙකි: රාගශල්‍ය යැ ද්වේෂශල්‍ය යැ මෝහශල්‍ය යැ මානශල්‍ය යැ දෘෂ්ටිශල්‍ය යැ ශෝකශල්‍ය යැ කථංකථාශල්‍ය යි.

රාගශල්‍යය කවරැ යත්: යම් රාගයෙක් බලවත් රාගයෙක් නැවත නැවත පැමිණෑවීමෙක් කැමැති වීමෙක් නන්දි සඞ්ඛ්‍යාත රාගයෙක් චිත්තයාගේ බලවද්රාගයෙක්...අභිධ්‍යාවෙක් ලොභ අකුශලමූලයෙක් වේ ද මේ රාගශල්‍ය යි.

ද්වේෂශල්‍යය කවරැ යත්: 'මට අනර්ථ කළැ'යි ආඝාත උපදී, මට අනර්ථ කෙරෙයි' ආඝාත උපදී, 'මට අනර්ථ කරන්නේ වනැ'යි ආඝාත උපදී...සැඩබවෙක් නො පිරුණු වචන ඇතිබවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද, මේ ද්වේෂශල්‍ය යි.

කතමං මොහසල්ලං? දුක්ඛෙ අඤ්ඤාණං -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අඤ්ඤාණං, පුබ්බන්තෙ -පෙ- අපරන්තෙ - පුබ්බන්තාපරන්තෙ අඤ්ඤාණං, ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු අඤ්ඤාණං, යං එවරූපං අදස්සනං අනභිසමයො අනනුබොධො අසම්බොධො අප්පටිවෙධො අසඞ්ගාහනා[1] අපරියොගාහනා අසමපෙක්ඛනා අපච්චවෙක්ඛනා අපච්චක්ඛකම්මං දුම්මෙජ්ඣං බාල්‍යං මොහො පමොහො සම්මොහො අවිජ්ජා අවිජ්ජොඝො අවිජ්ජායොගො අවිජ්ජානුසයො අවිජ්ජාපරියුට්ඨානං අවිජ්ජාලඞ්ගී[2] මොහො අකුසලමූලං, ඉදං මොහසල්ලං.

කතමං මානසල්ලං? සෙය්‍යොහමස්මීති මානො, සදිසොහමස්මීති මානො, හීනොහමස්මීති මානො; යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, ඉදං මානසල්ලං

කතමං දිට්ඨිසල්ලං? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි; යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පතිට්ඨාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසග්ගාහො විපරීතග්ගාහො විපල්ලාසග්ගාහො මිච්ඡාගාහො අයාථාවතස්මිං[3] යාථාවතන්ති ගාහො යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි, ඉදං දිට්ඨිසල්ලං.

කතමං සොකසල්ලං? ඤාතිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස භොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස රොගබ්‍යසනෙන වා ඵුට්ඨස්ස සීලබ්‍යසනෙන වා ඵුට්ඨස්ස දිට්ඨිබ්‍යසනෙන වා ඵුට්ඨස්ස අඤ්ඤතරඤ්ඤතරෙන බ්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තොසොකො අන්තොපරිසොකො අන්තොදාහො අන්තොපරිදාහො චෙතසො පරිජ්ඣායනා දොමනස්සං, ඉදං සොකසල්ලං.

1 අසඞ්ගහනා - සිමු II    2. ලඞ්ගි - සිමු II.
3 අයාථාවකස්මිං - සිමු. II

මෝහශල්‍යය කවරේ යත්: දුඃඛසත්‍යයෙහි නො දැනීම...දුඃඛනිරොධගාමිනී ප්‍රතිපදාර්‍යසත්‍යයෙහි නො දැනීම, පූර්වාන්තයෙහි ..අපරාන්තයෙහි... පූර්වාපරාන්තයෙහි නො දැනීම, ඉදම්ප්‍රත්‍යයතා සඞ්ඛ්‍යාත ප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි නො දැනීම (යන) මෙබඳු වූ යම් නො දැක්මෙක් (දනුම්) නො දැනීමෙක් (අනුරූප වශයෙන්) නො දැනීමෙක් අවබෝධ නො කිරීමෙක් ප්‍රතිවේධ නො කිරීමෙක් (අනිත්‍යාදි සාමාන්‍ය හෙයින්) නො ගැනීමෙක් හාත්පසින් බැස නො ගැනීමෙක් සමව නො බැලීමෙක් ප්‍රත්‍යවෙක්ෂා නො කිරීමෙක් ප්‍රත්‍යක්ෂ නො කිරීමෙක් (චිත්තසන්තානයාගේ) අපවිත්‍ර බවෙක් බාලබවෙක් මෝහයෙක් බලවත් මෝහයෙක් සම්මෝහයෙක් අවිද්‍යාවෙක් අවිද්‍යෞඝයෙක් අවිද්‍යායෝගයෙක් අවිද්‍යානුශයයෙක් අවිද්‍යාපර්‍යුත්ථානයෙ (-සිත මැඩගැනීමෙ)ක් අවිද්‍යා නමැති කතයමක් මෝහ අකුශලමූලයෙක් වේ ද, මේ මෝහශල්‍ය යි.

මානශල්‍යය කවරේ යත්: 'මම ශ්‍රේෂ්ඨ වෙමි' මානය වෙයි, 'මම සදෘශ වෙමි' මානය වෙයි, 'මම හීන වෙමි' මානය වෙයි. මෙබඳු වූ යම් මානයෙක් මානාකාරයෙක් මාන කළ බවෙක් උන්නතියෙක් ඔසවා තැබීමෙක් මානධ්වජයෙක් දැඩිව ගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතාවක් වේ ද, මේ මානශල්‍ය යි.

දෘෂ්ටිශල්‍යය කවරේ යත්: විංශතිවස්තුක සත්කායදෘෂ්ටිය දශවස්තුකමිථ්‍යාදෘෂ්ටිය දශවස්තුක අන්තග්‍රාහිකා දෘෂ්ටිය (යන) මෙබඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටිගහනයෙක් දෘෂ්ටිකාන්තාරයෙක් (සම්‍යග්දෘෂ්ටිය විනිවිදින හෙයින්) දෘෂ්ටිවිසූකායිකයෙක් දෘෂ්ටිවිෂ්පන්දිතයෙක් දෘෂ්ටිසංයෝජනයෙක් (අරමුණ දැඩිව) ගැනීමෙක් පිහිටාගැනීමෙක් (නිත්‍යාදි වශයෙන්) අභිනිවේශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් මිථ්‍යාපථයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසයෙන් ගැනීමෙක් විපරීත ව ගැනීමෙක් (නිත්‍යාදි වශයෙන්) පරිවර්තන කොට ගැනීමෙක් මිථ්‍යාග්‍රාහයෙක් අස්වභාවයෙහි ස්වභාව යයි ගැනීමෙක් වේ ද, යම් පමණ ද්වාෂෂ්ටි දෘෂ්ටිගතයෝ වෙත් ද, මේ දෘෂ්ටිශල්‍ය යි.

ශෝකශල්‍යය කවරේ යත්: ඥාතිව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ භොගව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ රෝගව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ ශීලව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ දෘෂ්ටිව්‍යසනයෙන් හෝ මඩනා ලදහුගේ අන්‍යතරාන්‍යතර ව්‍යසනයෙකින් සමන්විත වූවහුගේ අන්‍යතරාන්‍යතර දුඃඛධර්මයෙකින් මඩනා ලදහුගේ ශෝකයෙක් ශෝකාකාරයෙක් ශෝක කළ බවෙක් අන්තර්ශෝකයෙක් ඇතුළත හාත්පසින් ශෝක කිරීමෙක් අන්තර්දාහයෙක් ඇතුළත හාත්පසින් දැවීමෙක් සිත දැවෙන අසුරෙක් දෙම්නසෙක් වේ ද, මේ ශෝකශල්‍ය යි.

කතමං කථංකථාසල්ලං? දුක්ඛෙ කඞ්ඛා දුක්ඛසමුදයෙ කඞ්ඛා දුක්ඛනිරොධෙ කඞ්ඛා දුක්ඛනිරොධගාමිනියා පටිපදාය කඞ්ඛා පුබ්බන්තෙ කඞ්ඛා අපරන්තෙ කඞ්ඛා පුබ්බන්තාපරන්තෙ කඞ්ඛා ඉදප්පච්චයතාපටිච්චසමුප්පන්නෙසු ධම්මෙසු කඞ්ඛා, යා එවරූපා කඞ්ඛා කඞ්ඛායනා කඞ්ඛායිතත්තං විමති විචිකිච්ඡා ද්වෙළ්හකං ද්වෙධාපථො සංසයො අනෙකංසගාහො ආසප්පනා පරිසප්පනා අපරියොගාහනා ඡම්භිතත්තං චිත්තස්ස මනොවිලෙඛො; ඉදං කථංකථාසල්ලං.

**යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවතීති** – රාගසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති, පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති. එකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති, එවම්පි රාගසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති. අථවා රාගසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො භොගෙ පරියෙසන්තො නාවාය මහාසමුද්දං පක්ඛන්දති: සීතස්ස පුරක්ඛතො උණ්හස්ස පුරක්ඛතො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙහි රිස්සමානො ඛුප්පිපාසාහි[1] මීයමානො[2] තිගුම්බං ගච්ඡති, තක්කොලං ගච්ඡති, තක්කසිලං ගච්ඡති, කාලමුඛං ගච්ඡති, පරමුඛං[3] ගච්ඡති, වෙසුඞ්ගං ගච්ඡති, වෙරාපථං ගච්ඡති, ජවං ගච්ඡති, තාමලිං[4] ගච්ඡති, වඞ්ගං[5] ගච්ඡති, එළවද්ධනං[6] ගච්ඡති, සුවණ්ණකූටං ගච්ඡති, සුවණ්ණභූමිං ගච්ඡති, තම්බපණ්ණිං ගච්ඡති, සුප්පාරකං[7] ගච්ඡති, භරුකච්ඡං[8] ගච්ඡති, සුරට්ඨං[9] ගච්ඡති, අඞ්ගලොකං[10] ගච්ඡති, ගඞ්ගණං[11] ගච්ඡති, පරමගඞ්ගණං[12] ගච්ඡති, යොනං ගච්ඡති, පරමයොනං ගච්ඡති, තවකං[13] ගච්ඡති, මූලපදං ගච්ඡති, මරුකන්තාරං ගච්ඡති, ජණ්ණුපථං ගච්ඡති, අජපථං ගච්ඡති, මෙණ්ඩපථං ගච්ඡති, සඞ්කුපථං ගච්ඡති, ඡත්තපථං ගච්ඡති, වංසපථං[14] ගච්ඡති, සකුණපථං ගච්ඡති, මූසිකපථං ගච්ඡති, දරිපථං ගච්ඡති, වෙත්තාධාරං[15] ගච්ඡති. පරියෙසන්තො න ලභති. අලාභමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. පරියෙසන්තො ලභති, ලද්ධා ආරක්ඛමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති: කින්ති මෙ භොගෙ නෙව රාජානො හරෙය්‍යුං, න චොරා හරෙය්‍යුං, න අග්ගි දහෙය්‍ය, න උදකං වහෙය්‍ය, න අප්පියා දායාදා හරෙය්‍යුන්ති. තස්ස එවං ආරක්ඛතො ගොපයතො තෙ භොගා විප්පලුජ්ජන්ති. සො විප්පයොගමූලකම්පි දුක්ඛං දොමනස්සං පටිසංවෙදෙති. එවම්පි රාගසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

1. ඛුප්පිපාසාය - සීමු. II. මජසං. PTS. 2. පිළියමානො - සීමු. II.
3. මරණපාරං - සීමු. II. පුරපුරං - මජසං.
4. තමසිං - සීමු II. තම්බලිඞ්ගං - සිඞ්ගං - සී. 5. වඞ්කං - සී.
6. එළබන්ධනං - සීමු. II. මජසං. ජලවනං - මජ්ඣප.
7. සුප්පාදකං - මජසං. සුප්පාරං - සීමු. I.
8 භාරුකච්ඡං - සීමු II. භරුකච්ඡිං - භරුකං - සී. 9 සුරද්ධං - සුරරට්ඨං - සී.
10 භඞ්ගලොකං - මජසං. භඞ්ගලොකං - සී
11. භඞ්ගණං - මජසං. සඞ්ගණං - තඞ්ගණං - සී.
12. සුරම්තඞ්ගණං. මජසං. පදපනඞ්ගං. - සී. පදපතඞ්ගණං - සී.
13. විතකං - මජසං. වීතකං - මුසි. I. 14. අංසපථං - සී 15. වෙත්තාචාරං - සී.

කථංකථාශල්‍යය කවරේ යත්: දුඃඛයෙහි සැකය දුඃඛසමුදයෙහි සැකය දුඃඛනිරොධයෙහි සැකය දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත්තියෙහි සැකය පූර්වාන්තයෙහි සැකය අපරාන්තයෙහි සැකය පූර්වාපරාන්තයෙහි සැකය ඉදම්ප්‍රත්‍යයතාප්‍රතීත්‍යසමුත්පන්නධර්මයන්හි සැකය (යන) මෙබඳු වූ යම් සැකයෙක් සැක අයුරෙක් සැකයට පැමිණෑවූ බවෙක් විමතියෙක් විචිකිත්සාවෙක් දෙපරිද්දෙන් පැවැත්මෙක් ද්විධාපථයෙක් සැකයෙක් අනෙකාන්තග්‍රාහයෙක් (අරමුණෙන්) බැහැර යෑමෙක් හාත්පසින් බැහැර යෑමෙක් (අරමුණට) නො බැසගැනීමෙක් සිතෙහි තදබවෙක් චිත්තවිලෙඛයෙක් වේ ද, මේ කථංකථාශල්‍ය යි

**යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති** - රාගශල්‍යයෙන් මඩනා ලද්දේ විදුනා ලද්දේ පහස්නා ලද්දේ පෙළෙණ බැසගත්තා ලද්දේ සමන්විත වූයේ කයින් දුසිරිතෙහි හැසිරෙයි, බසින් දුසිරිතෙහි හැසිරෙයි, සිතින් දුසිරිතෙහි හැසිරෙයි, ප්‍රාණවධ දු කෙරෙයි, නො දුන් දෑය ද හැරගනී, ගෘහසන්ධි දු සිඳී, ගම් පැහැරීම ද ගෙවල් පැහැරීම ද මං පැහැරීම ද කෙරෙයි, පරඹුත් කරා ද යෙයි, මෘෂා ද බෙණෙයි. මෙසේත් රාගශල්‍යයෙන් මඩනා ලද්දේ විදුනා ලද්දේ පහස්නා ලද්දේ පීඩිත වූයේ බැසගත්තා ලද්දේ සමන්විත වූයේ දිවෙයි, වෙසෙසින් දිවෙයි, වේගයෙන් දිවෙයි, ඔබිනොබ හැසිරෙයි. නොහොත් රාගශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ - ස්පෘෂ්ට - පරෙත - සමවහිත - සමන්වාගත වූයේ ධනය සොයමින් සීත පෙරටු කොට, උෂ්ණ පෙරටු කොට, මැසි මදුරු වා අව් දික්දූපහසින් වෙහෙසෙමින් සාපවසින් මැරෙමින් නැවින් මහමුහුදට පිවිසෙයි: ත්‍රිගුල්ම ජනපදයට යෙයි, තක්කෝලයට යෙයි, තක්ෂශිලාවට යෙයි, කාලමුඛයට යෙයි, පරාඩමුඛයට යෙයි, වෙසුඞ්ගයට යෙයි, වෙරාපථයට යෙයි, ජාවරටට යෙයි, තාමලීජනපදයට යෙයි, වඟුරටට යෙයි, එළවර්ධනයට යෙයි, සුවර්ණකූටයට යෙයි, සුවර්ණභූමියට යෙයි, තාම්‍රපර්ණියට යෙයි, සුප්පාරකජනපදයට යෙයි, භරුකච්ඡජනපදයට යෙයි, සෞරාෂ්ට්‍රයට යෙයි, අඞ්ගලොකයට යෙයි, ගඞ්ගණයට යෙයි, පරමගඞ්ගණයට යෙයි, යවනරටට යෙයි, පරමයවනයට යෙයි, තවකරමට යෙයි, මූලපදරටට යෙයි, මරුකාන්තාරයට යෙයි, ජණ්ණුපථයට යෙයි, අජපථයට යෙයි, මෙණ්ඩපථයට යෙයි, ශඞ්කුපථයට යෙයි, ඡත්‍රපථයට යෙයි, වංශපථයට යෙයි, සකුණපථයට යෙයි, මූෂිකපථයට යෙයි, දරීපථයට යෙයි, වෙත්‍රාධාරයට යෙයි. සොයනුයේ (භොගයන්) නො ලැබෙයි එකල්හි නො ලැබීම හේතු කොට ද දුක් දොම්නස් විඳී. සොයනුයේ ලැබේ නම්, ලැබ ආරක්‍ෂාමූලක වූ ද දුක් දොම්නස් විඳී: 'කවර උපායෙකින් මාගේ භොගයන් රජවරු නො මැ හැරගන්නාහු ද සොරු නො පැහැරගන්නාහු ද ගිනි නො දවා ද වතුරු නො ගලා ද අප්‍රියදායාදයෝ නො හරනාහු දැ'යි. මෙසේ රක්නා වූ පාලනය කරන්නා වූ ඔහුගේ ඒ භොගයෝ වැනැසෙති, හෙතෙම විප්‍රයොගමූලක වූ ද දුක් දොම්නස් විඳී. මෙසේත් රාගශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා ලද්දේ පහස්නා ලද්දේ පීඩිත වූයේ පිවිසියේ සමන්විත වූයේ දිවෙයි, වෙසෙසින් දිවෙයි, වේගයෙන් දිවෙයි, ඔබිනොබ හැසිරේ,

දොසසල්ලෙන - මොහසල්ලෙන - මානසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති, පාණම්පි හනති, අදින්නම්පි ආදියති, සන්ධිම්පි ඡින්දති, නිල්ලොපම්පි හරති, ඒකාගාරිකම්පි කරොති, පරිපන්ථෙපි තිට්ඨති, පරදාරම්පි ගච්ඡති, මුසාපි භණති. එවං මානසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

දිට්ඨිසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අචෙලකො හොති මුත්තාචාරො හත්ථාපලෙඛනො, න එහිභදන්තිකො, න තිට්ඨභදන්තිකො, නාභිහටං න උද්දිස්ස කතං න නිමන්තනං සාදියති. සො න කුම්භිමුඛා පටිග්ගණ්හාති. න කළොපිමුඛා පටිග්ගණ්හාති න එළකමන්තරං න දණ්ඩමන්තරං න මුසලමන්තරං න ද්වින්නං භුඤ්ජමානානං න ගබ්භිනියා න පායමානාය න පුරිසන්තරගතාය න සංකිත්තීසු, න යත්ථ සා උපට්ඨිතො හොති, න යත්ථ මක්ඛිකා සණ්ඩසණ්ඩචාරිණී, න මච්ඡං, න මංසං, න සුරං, න මෙරයං, න ථුසොදකං පිවති. සො ඒකාගාරිකො වා හොති. ඒකාලොපිකො වා. ද්වාගාරිකො වා හොති ද්වාලොපිකො -පෙ- සත්තාගාරිකො වා හොති. සත්තාලොපිකො. ඒකිස්සාපි දත්තියා යාපෙති. ද්වීහිපි දත්තීහි යාපෙති -පෙ- සත්තහිපි දත්තීහි යාපෙති. ඒකාහිකම්පි ආහාරං ආහාරෙති. ද්වාහිකම්පි ආහාරං ආහාරෙති -පෙ- සත්තාහිකම්පි ආහාරං ආහාරෙති. ඉති එවරූපං අඩ්ඪමාසිකම්පි පරියායභත්තභොජනානුයොගමනුයුත්තො විහරති. එවම්පි දිට්ඨිසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

අථවා දිට්ඨිසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො සො සාකභක්ඛො වා හොති, සාමාකභක්ඛො වා හොති, නීවාරභක්ඛො වා හොති, දද්දුලභක්ඛො වා හොති, හටභක්ඛො වා හොති, කණභක්ඛො වා හොති, ආචාමභක්ඛො වා හොති, පිඤ්ඤාකභක්ඛො වා හොති, තිලභක්ඛො වා හොති, තිණභක්ඛො වා හොති, ගොමයභක්ඛො වා හොති, වනමූලඵලාහාරො වා යාපෙති පවත්තඵලභොජනො. සො සාණානිපි ධාරෙති, මසාණානිපි ධාරෙති, ඡවදුස්සානිපි ධාරෙති, පංසුකූලානිපි ධාරෙති, -

ද්වේෂශල්‍යයෙන් - මෝහශල්‍යයෙන් - මානශල්‍යයෙන් අවතීර්ණ විද්ධ ස්පෘෂ්ට පරේත සමවහිත සමන්වාගත වූයේ කයින් දුසිරිතෙහි හැසිරෙයි, බසින් දුසිරිතෙහි හැසිරෙයි, සිතින් දුසිරිතෙහි හැසිරෙයි, ප්‍රාණවධ ද කෙරෙයි, නුදුන් දෑය ද ගනී, ගෘහසන්ධි ද සිඳී, ගම් පැහැරීම ද කෙරෙයි, ගෙවල් පැහැරීම ද කෙරෙයි, මං පැහැරීම ද කෙරෙයි, පරඹුත් වෙත ද යෙයි, මුසාවා ද බණෙයි. මෙසේසයින් මානශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා ලදුයේ පහස්නා ලදුයේ මඩනා ලදුයේ ඇතුළත පිවිසියේ සමන්විත වූයේ ඉදිරියෙහි දිවෙයි, වෙසෙසින් දිවෙයි, වෙගයෙන් දිවෙයි, ඔබිනොබැ හැසිරේ.

දෘෂ්ටිශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ වූයේ ස්පෘෂ්ට වූයේ පීඩිත වූයේ ප්‍රවිෂ්ට වූයේ සමන්විත වූයේ අචේලක (-නග්නශ්‍රමණ) වෙයි, හරන ලද ආචාර ඇත්තේ වෙයි, අත ලෙව්නේ වෙයි, (භික්‍ෂා ගැනීම සඳහා) 'එව වහන්සැ'යි කියන ලදුයේ නො එයි, 'සිට වහන්සැ'යි කියන ලදුයේ නො සිටී, පළමු එළවූ භික්‍ෂාව නො ගනී, උදෙසා කළ භික්‍ෂාව නො ගනී, නිමන්ත්‍රණය නො ඉවසයි. හෙතෙම කළඹුවින් නගා දුන් භික්‍ෂාව නො ගනී, සැළඹුවින් නගා දෙන ලද්ද නො පිළිගනී, එළිපත අතර කොට දුන් භික්‍ෂාව නො ගනී, දඬු අතර කොට දුන් භික්‍ෂා - මෝල් අතර කොට දුන් භික්‍ෂාව නො පිළිගනී, වළඳන දෙදෙනකු ගෙන් එකකු නැගිසිට දුන් භික්‍ෂාව නො පිළිගනී, ගැබිනියක දුන් භික්‍ෂාව - කිරිපොවන තෙනැත්තියක දුන් භික්‍ෂාව - පුරුෂයන් අතරට ගිය තෙනැත්තිය දුන් භික්‍ෂාව - සංකීර්ත්තනය කොට දුන් කල්හි නො ගනී. ශුනකයකු එළඹසිටි තැන භික්‍ෂාව- මැස්සන් මුළුමුළු වැ හුන් තැන දුන් භික්‍ෂාව නො පිළිගනී. මත්ස්‍යමාංස රහමේර නො පිළිගනී, තුසෝදය (-සෞවීරකරසය) පානය නො කෙරෙයි. හෙතෙම පිණ්ඩඝාත එක ගෙයක් ඇත්තේ හෝ එක ආලෝපයකින් යැපෙන්නේ හෝ වෙයි, දෙ ගෙයක් ඇත්තේ හෝ දෙ ආලෝපයකින් යැපෙන්නේ හෝ වෙයි...සප්තාගාරික හෝ සප්තාලෝපික වූයේ වෙයි, එක් දත්තිය (කුඩා බත් තලිය) කින් ද යැපෙන්නේ වෙයි, බත්තලි දෙකකින් ද..බත්තලි සතකින් ද යැපෙන්නේ වෙයි; එකාහික (-එක දවසක් අතුරු කල) ආහාරය ද වළඳයි, දෙ දවසක් අතුරු කළ ආහාරය ද වළඳයි... සප්තාහික ආහාරය ද වළඳයි. මෙසේ මෙබඳු අර්ධමාසික වූ ද වාරබත වැළඳීමෙහි යෙදී වෙසෙයි. මෙසේත් දෘෂ්ටිශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ වූයේ ස්පෘෂ්ට වූයේ පීඩිත වූයේ ප්‍රවිෂ්ට වූයේ සමන්වාගත වූයේ ධාවන-විධාවන - සන්ධාවනය කෙරෙයි, සංසරණය කෙරේ.

නොහොත් දෘෂ්ටිශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා - පහස්නා - මඩනා ලදුයේ පිවිසියේ සමන්විත වූයේ හෙතෙම අමුපලා කන්නේ හෝ වෙයි, බොඩනමුසනල් බුදින්නේ හෝ වෙයි, ස්වයංජාත වී (හුරුහැල්) බුදින්නේ හෝ වෙයි, සම්කැබැලි බුදින්නේ හෝ වෙයි, රුක්ලාටු බුදින්නේ හෝ වෙයි, කුඩු බුදින්නේ හෝ වෙයි, දමුබත් බුදින්නේ හෝ වෙයි, මූරුවට බුදින්නේ හෝ වෙයි, තල බුදින්නේ හෝ වෙයි, තණකොළ බුදින්නේ හෝ වෙයි, ගොම බුදින්නේ හෝ වෙයි, වනමුල්ඵල ආහාර කොට ඇත්තේ හෝ වැටුණු ඵල බුදිනුයේ යැපෙයි. හේ සණවැහැරි ද දරයි, මිශ්‍රක-වස්ත්‍ර ද දරයි, මළසිරුරින් බැහැර කළ වස්ත්‍ර ද දරයි, පාංශුකූල ද දරයි-

තිරීටානිපි ධාරෙති, අජිනානිපි ධාරෙති, අජිනක්ඛිපම්පි ධාරෙති, කුසචීරම්පි ධාරෙති, වාකචීරම්පි ධාරෙති, ඵලකචීරම්පි ධාරෙති, කෙසකම්බලම්පි ධාරෙති, වාලකම්බලම්පි ධාරෙති, උලූකපක්ඛම්පි ධාරෙති. කෙසමස්සුලොචකොපි හොති, කෙසමස්සුලොචනානුයොගමනුයුත්තො විහරති. උබ්භට්ඨකොපි හොති ආසනපටික්ඛිත්තො, උක්කුටිකොපි හොති උක්කුටිකප්පධානමනුයුත්තො. කණ්ටකාපස්සයිකොපි හොති කණ්ටකාපස්සයෙ සෙය්‍යං කප්පෙති, ඵලකසෙය්‍යම්පි කප්පෙති, ථණ්ඩිලසෙය්‍යම්පි කප්පෙති, එකාපස්සයිකො හොති රජොජල්ලධරො, අබ්භොකාසිකො හොති යථාසන්ථතිකො, වෙකටිකොපි හොති විකටභොජනානුයොගමනුයුත්තො, අපානකොපි හොති අපානකත්තමනුයුත්තො, සායතතියකම්පි උදකොරොහනානුයොගමනුයුත්තො විහරති. ඉති එවරූපං අනෙකවිහිතං කායස්ස ආතාපනපරිතාපනානුයොගමනුයුත්තො විහරති. එවම්පි දිට්ඨිසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

සොකසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො සොචති, කිලමති, පරිදෙවති, උරත්තාළිං කන්දති සම්මොහං ආපජ්ජති. වුත්තං හෙතං භගවතා: "භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරිස්සා ඉත්ථියා මාතා කාලමකාසි. සා තස්සා කාලකිරියාය උම්මත්තිකා ඛිත්තචිත්තා රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: 'අපි මෙ මාතරං අද්දසථ? අපි මෙ මාතරං අද්දසථා'ති.[a] භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරිස්සා ඉත්ථියා පිතා කාලමකාසි - භාතා කාලමකාසි - භගිනී කාලමකාසි පුත්තො කාලමකාසි - ධීතා කාලමකාසි - සාමිකො කාලමකාසි. සා තස්ස කාලකිරියාය උම්මත්තිකා ඛිත්තචිත්තා රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: 'අපි මෙ සාමිකං අද්දසථ? අපි මෙ සාමිකං අද්දසථා'ති.[a] භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරස්ස පුරිසස්ස මාතා කාලමකාසි. සො තස්සා කාලකිරියාය උම්මත්තකො ඛිත්තචිත්තො රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: 'අපි මෙ මාතරං අද්දසථ? අපි මෙ මාතරං අද්දසථා'ති.[a] භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරස්ස පුරිසස්ස පිතා කාලමකාසි -භාතා කාලමකාසි - භගිනී කාලමකාසි- පුත්තො කාලමකාසි - ධීතා කාලමකාසි - පජාපති කාලමකාසි. සො තස්සා කාලකිරියාය උම්මත්තකො ඛිත්තචිත්තො රථියාය රථියං සිඞ්ඝාටකෙන සිඞ්ඝාටකං උපසඞ්කමිත්වා එවමාහ: 'අපි මෙ පජාපතිං අද්දසථ? අපි මෙ පජාපතිං අද්දසථා'ති [a] භූතපුබ්බං බ්‍රාහ්මණ, ඉමිස්සායෙව සාවත්ථියා අඤ්ඤතරා ඉත්ථී ඤාතිකුලං අගමාසි. තස්සා තෙ ඤාතකා සාමිකං අච්ඡින්දිත්වා අඤ්ඤස්ස දාතුකාමා. සා ච තං න ඉච්ඡති. අථ ඛො සා ඉත්ථී සාමිකං එතදවොච: 'ඉමෙ මං අය්‍යපුත්ත, ඤාතකා තව අච්ඡින්දිත්වා අඤ්ඤස්ස දාතුකාමා. උභො මයං මරිස්සාමා'ති. අථ ඛො සො පුරිසො තං ඉත්ථිං ද්විධා ඡෙත්වා අත්තානං ඔපාතෙසි[1] උභො පෙච්ච භවිස්සාමා'ති.[a] එවං සොකසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති.

---

1. ඔපාතෙති - සීමු. II.

a. මජ්ඣිමනිකාය - මජ්ඣිමපණ්ණාසක - පියජාතිකසුත්ත.

රුක්පුඹුළු වස්ත්‍ර ද දරයි, අඳුන්මුවසම් ද දරයි, මැදින් පැළූ අඳුන්මුවසම් ද දරයි, කුසවැහැරි ද දරයි, පුඹුලු වැහැරි ද දරයි, පුවරුවැහැරිද දරයි, මිනිස් කෙසින් කළ කම්බිලි ද දරයි, අස්වලින් කළ කම්බිලි දරයි, බකමුහුණුපියාපතින් කළ වස්ත්‍ර දරයි. කෙස් රවුළු උදුරන්නේ ද වෙයි, කෙස් රවුළු ඉදිරීමෙහි යෙදී වාසය කෙරෙයි. ආසන ප්‍රතික්ෂෙප කෙළේ උඩුකුරුව සිටින්නේ ද වෙයි, උක්කුටික වීර්‍ය්‍යයෙහි යෙදුණේ උක්කුටික වූයේ ද වෙයි, කටුඇතිරියෙහි නියුක්ත වූයේ ද වෙයි, කටුඇතිරියෙහි ශයනය කෙරෙයි. පුවරුයෙහි ශයනය ද කෙරෙයි, උස්බිම ශයනය ද කෙරෙයි, රජස් දූලි දරනුයේ එක් ඇලයකින් හොවන්නේ වෙයි, අතුල සේ හිඳිනා සුළු වූයේ අභ්‍යවකාශයෙහි යෙදුණේ වෙයි. විකෘත (ගූථ) භෝජනයෙහි යෙදුණේ විකෘතය බුදිනසුලු වූයේ ද වෙයි, දිය නුබොනසු බත් බිදීමෙහි යෙදුණේ ප්‍රතික්ෂෙප කළ සිසිල් දිය ඇත්තේ ද වෙයි. සවස තුන්වැනි කොට උදකාවරොහණයෙහි යෙදුණේ වාසය කෙරෙයි. මෙසේ මොහු අනෙකප්‍රකාර වූ කය තවන හාත්පසින් තවන යොගයෙහි යෙදුණේ වාසය කෙරෙයි. මෙසේත් දෘෂ්ටිශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා ලදුයේ පහස්නා ලදුයේ මඩනා ලදුයේ ඇතුලත පිවිසියේ සමන්විත වූයේ ධාවනය විධාවනය සන්ධාවනය කෙරෙයි, සංසරණය කෙරේ.

ශොකශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ - ස්පෘෂ්ට - පරෙත - සමවහිත- සමන්වාගත වූයේ ශොක කෙරෙයි, වෙහෙසෙයි, විලාප කියයි, ළෙහි පැහැර හඬයි, සම්මොහයට පැමිණේ. මේ වදාරණ ලද මැ ය, භාග්‍යවතුන් විසින්: "බමුණ, පෙර වූවක් කියමි: මේ සැවැත්නුවර මැ එක්තරා ගැහැනියකගේ මව මළා යැ. ඕ තොමෝ ඇගේ මරණයෙන් උමතු වූවා නට සිත් ඇත්තී වීදියෙන් වීදියට සන්ධියෙන් සන්ධියට පැමිණ මෙසේ කියයි: 'මාගේ මව දුටුවහු ද ? මාගේ මව දුටුවහු ද'යි. බමුණ, පෙර වූවක් කියමි: මේ සැවැතෙහි එක්තරා ගැහැනියකගේ පියා මළේ ය - බෑයා මළේ ය - බූන මළා යැ - පුත් මළේ ය - දුව මළා යැ - සැමියා මළේ ය. ඕ තොමෝ ඔහුගේ මරණයෙන් උමතු වූවා නට සිත් ඇත්තී වීදියෙන් වීදියට සන්ධියෙන් සන්ධියට පැමිණ මෙසේ කියයි: 'මාගේ සැමියා දුටුවහු ද ? මාගේ සැමියා දුටුවහු ද'යි. බමුණ පෙර වූවකි: මේ සැවැතෙහි එක්තරා මිනිසකුගේ මව මළා ය. හෙතෙම ඇගේ මරණයෙන් උමතු වූයේ නට සිත් ඇත්තේ වීදියෙන් වීදියට සන්ධියෙන් සන්ධියට පැමිණ මෙසේ කියයි: 'මාගේ මව දුටුවහු ද ? මාගේ මව දුටුවහු ද'යි. බමුණ, පෙර වූවකි: මේ සැවැතෙහි මැ එක්තරා මිනිසකුගේ පියා මළේ ය -බෑයා මළේ ය- හගිනිය මළා ය- පුතා මළේ ය- දුව මළා ය-භාර්‍ය්‍යාව මළා ය. හෙතෙම ඇගේ මරණයෙන් උමතු වූයේ නට සිත් ඇතියේ වීදියෙන් වීදියට සන්ධියෙන් සන්ධියට පැමිණ මෙසේ කියයි: 'මාගේ භාර්‍ය්‍යාව දුටුවහු ද ? මාගේ භාර්‍ය්‍යාව දුටුවහු ද'යි. බමුණ, පෙර වූවකි: මේ සැවැතෙහි මැ එක්තරා ගැහැනියක් ඥාතිකුලයට ගියා යැ. ඇගේ ඒ නෑයෝ සැමියාගෙන් අසිදගෙන අන් මිනිසකුට දෙනු කැමැති වූහ. එහෙත් ඕ ඒ මිනිසා නො කැමැති වෙයි. ඉක්බිති ඕ ස්ත්‍රිය සැමියාට කිව: 'සාමිදරුවාණෙනි, මේ නෑයෝ මා තොපගෙන් අසිදගෙන අනෙකක් හට දෙනු කැමැත්තාහ. ඇපි දෙදෙන මැරෙම්හ'යි. එකල ඒ මිනිසා ඒ ගැහැනිය දෙකඩ කොට සිඳ තමා නැසීය. "දෙදෙන පරලොව ගොස් එක්වම්හ"යි. මෙසේ ශොකශල්‍යයෙන් අවතීර්ණ වූයේ විද්ධ-ස්පෘෂ්ට පරෙත - සමවහිත සමන්වාගත වූයේ ධාවන- විධාවන -සන්ධාවන කෙරෙයි, සංසරණය කෙරේ.

කථංකථාසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො සංසයපක්ඛන්තො හොති විමතිපක්ඛන්තො ද්වෙළ්හකජාතො: 'අහොසිං නු ඛො අහං අතීතමද්ධානං? න නු ඛො අහොසිං අතීතමද්ධානං? කිං නු ඛො අහොසිං අතීතමද්ධානං? කථං නු ඛො අහොසිං අතීතමද්ධානං? කිං හුත්වා කිං අහොසිං නු ඛො අතීතමද්ධානං? භවිස්සාමි නු ඛො අහං අනාගතමද්ධානං? න නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං? කිං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං? කථං නු ඛො භවිස්සාමි අනාගතමද්ධානං? කිං හුත්වා කිං භවිස්සාමි නු ඛො අනාගතමද්ධානං? එතරහි වා පච්චුප්පන්නං අද්ධානං ආරබ්භ කථංකථී හොති: අහං නු ඛොස්මි? නො නු ඛොස්මි? කිං නු ඛොස්මි? කථං නු ඛොස්මි? අයං නු ඛො සත්තො කුතො ආගතො? සො කුහිං ගාමී භවිස්සතී'ති. එවං කථංකථාසල්ලෙන ඔතිණ්ණො විද්ධො ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො ධාවති විධාවති සන්ධාවති සංසරති. තෙ සල්ලෙ අභිසඞ්ඛරොති. තෙ සල්ලෙ අභිසඞ්ඛරොන්තො සල්ලාභිසඞ්ඛාරවසෙන පුරත්ථිමං දිසං ධාවති. පච්ඡිමං දිසං ධාවති. උත්තරං දිසං ධාවති. දක්ඛිණං දිසං ධාවති. තෙ සල්ලාභිසඞ්ඛාරා අප්පහීනා. සල්ලාභිසඞ්ඛාරානං අප්පහීනත්තා ගතියා ධාවති නිරයෙ ධාවති. තිරච්ඡානයොනියා ධාවති. පෙත්තිවිසයෙ ධාවති. මනුස්සලොකෙ ධාවති. දෙවලොකෙ ධාවති. ගතියා ගතිං උපපත්තියා උපපත්තිං පටිසන්ධියා පටිසන්ධිං භවෙන භවං සංසාරෙන සංසාරං වට්ටෙන වට්ටං ධාවති විධාවති සන්ධාවති සංසරතීති - යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති.

**තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදතීති** - තමෙව රාගසල්ලං දොසසල්ලං මොහසල්ලං මානසල්ලං දිට්ඨිසල්ලං සොකසල්ලං කථංකථාසල්ලං අබ්බුය්හ අබ්බුහිත්වා උද්ධරිත්වා සමුද්ධරිත්වා උප්පාටයිත්වා සමුප්පාටයිත්වා[1] පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා නෙව පුරත්ථිමං දිසං ධාවති. න පච්ඡිමං දිසං ධාවති. න උත්තරං දිසං ධාවති. න දක්ඛිණං දිසං ධාවති. තෙ සල්ලාභිසඞ්ඛාරා පහීනා. සල්ලාභිසඞ්ඛාරානං පහීනත්තා ගතියා න ධාවති. නිරයෙ න ධාවති. තිරච්ඡානයොනියා න ධාවති. පෙත්තිවිසයෙ න ධාවති. මනුස්සලොකෙ න ධාවති. දෙවලොකෙ න ධාවති. න ගතියා ගතිං - න උපපත්තියා උපපත්තිං - න පටිසන්ධියා පටිසන්ධිං - න භවෙන භවං - න සංසාරෙන සංසාරං - න වට්ටෙන වට්ටං ධාවති විධාවති සන්ධාවති සංසරතීති - තමෙව සල්ලමබ්බුය්හ. න ධාවති න සීදතීති කාමොඝෙ න සීදති. භවොඝෙ න සීදති. දිට්ඨොඝෙ න සීදති. අවිජ්ජොඝෙ න සීදති. න සංසීදති න අවසීදති න ගච්ඡති න අවගච්ඡතීති - තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදති.

තෙනාහ භගවා:

"යෙන සල්ලෙන ඔතිණ්ණො
දිසා සබ්බා විධාවති,
තමෙව සල්ලමබ්බුය්හ
න ධාවති න සීදතී"ති

1. උප්පාදයිත්වා සමුප්පාදයිත්වා - සෳා. මජසං. PTS.

කථංකථාශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා ලදුයේ පහස්නා ලදුයේ පිහිත වූයේ පිවිසියේ සමප්පිත වූයේ සැකයට පැමිණියේ වෙයි. විමතියට පැමිණියේ දෙසිත් වූයේ වෙයි: 'මම් අතීතකාලයෙහි වූයෙම් දෝ හෝ අතීතයෙහි නො වූයෙම් දෝ හෝ (ජාත්‍යාදිය නිසා) අතීතයෙහි කුමක් වූයෙම් දෝ හෝ අතීතයෙහි කෙසේ වූයෙම් දෝ හෝ අතීතයෙහි (ජාත්‍යාදිය අතුරෙන්) කුමක් ව කුමක් වූයෙම් දෝ හෝ, මම් අනාගතකාලයෙහි වන්නෙම් දෝ හෝ අනාගතයෙහි නො වන්නෙම් දෝ හෝ (ජාත්‍යාදිය නිසා) අනාගතයෙහි කුමක් වන්නෙම් දෝ හෝ අනාගතයෙහි කෙසේ වන්නෙම් දෝ හෝ අනාගතයෙහි (ජාත්‍යාදිය අතුරෙන්) කුමක් ව කුමක් වන්නෙම් දෝ හෝ. මේ වර්තමානකාලය අරබයා හෝ සැක ඇත්තේ වෙයි: මම වෙම් දෝ හෝ නො වෙම් දෝ හෝ කුමක් වෙම් දෝ හෝ කෙසේ වෙම් දෝ හෝ මේ සත්ත්වයා කොයිත් ආයේ දෝ හෝ කොහි යනසුලු වන්නේ දෝ'යි. මෙසේ කථංකථාශල්‍යයෙන් අවතීර්ණ වූයේ විදුනා ලද්දේ පහස්නා ලද්දේ මැඩුණේ පිවිසියේ සමප්පිත වූයේ ධාවන විධාවන - සන්ධාවන කෙරෙයි, සංසරණය කෙරේ; ඒ රාගාදි ශල්‍යයන් උපදවයි. ඒ ශල්‍යයන් උපදවනුයේ ශල්‍යයන් ඉපදවීම් වශයෙන් පෙරදිගට දිවෙයි, පැලදෙසට දිවෙයි, උතුරු දෙසට දිවෙයි, දකුණු දෙසට දිවේ. ඒ රාගාදි ශල්‍යප්‍රයෝගයෝ අප්‍රහීණ වූවාහු ය. ශල්‍යාභිසංස්කාරයන් අප්‍රහීණ වන බැවින් ගතියෙහි දිවෙයි, නිරයෙහි දිවෙයි, තිරිසන්යොන්හි දිවෙයි, ප්‍රෙතවිෂයයෙහි දිවෙයි, මිනිස්ලොව දිවෙයි, දෙව්ලොව දිවෙයි, ගතියෙන් ගතියට උපතින් උපතට පිළිසඳින් පිළිසඳට භවයෙන් භවයට සසරින් සසරට වටින් වටට ධාවන - විධාවන - සන්ධාවනය කෙරෙයි. සංසරණය කෙරේ නුයි 'යෙන සල්ලෙන ඔතිණ්ණො දිසා සබ්බා විධාවති' යනු වේ.

තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදති - එ මැ රාගශල්‍යය ද්වේෂශල්‍යය මෝහශල්‍යය මානශල්‍යය දෘෂ්ටිශල්‍යය ශෝකශල්‍යය කථංකථා ශල්‍යය බැහැර කොට බැහැර පියා උදුරා මොනොවට උදුරා උපුටා මොනොවට උපුටා හැර දුරු කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා පෙරදිගට නො මැ දිවෙයි, පැලදෙසට නො දිවෙයි, උතුරුදෙසට නො දිවෙයි, දකුණුදෙසට නො දිවෙයි. ඒ රාගාදිශල්‍යප්‍රයෝගයෝ ප්‍රහීණ වූවාහු ය. ශල්‍යාභිසංස්කාරයන් ප්‍රහීණවන බැවින් ගතියෙහි නො දිවෙයි, නිරයෙහි නො දිවෙයි, තිරිසන්යොන්හි නො දිවෙයි, ප්‍රෙතවිෂයෙහි නො දිවෙයි, මිනිස්ලොව නො දිවෙයි, දෙව්ලොව නො දිවෙයි, ගතියෙන් ගතියට - උපතින් උපතට - පිළිසඳින් පිළිසඳට - භවයෙන් භවයට- සසරින් සසරට - වටින් වටට නො දිවෙයි, වෙසෙසින් නො දිවෙයි, වෙගයෙන් නො දිවෙයි, ඔබිනොබ නො හැසිරේ නුයි 'තමෙව සල්ල-මබ්බුය්හ' යනු වේ. න ධාවති න සීදති - කාමෞඝයෙහි නො ගැලෙයි, භවෞඝයෙහි නො ගැලෙයි, දෘෂ්ට්‍යෞඝයෙහි නො ගැලෙයි, අවිද්‍යෞඝයෙහි නො ගැලෙයි, හාත්පසින් නො ගැලෙයි, ඇතුලත නො ගැලෙයි, නො පිවිසෙයි, නො යෙයි, නො බැසගනී නුයි 'තමෙව සල්ලමබ්බුය්හ න ධාවති න සීදති' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

"යෙන සල්ලෙන ඔතිණ්ණො -පෙ- න ධාවති න සීදති"යි.

15 - 6

තත්ථ සික්ඛානුගීයන්ති
යානි ලොකෙ ගථිතානි,[1]
න තෙසු පසුතො සියා
නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ,
සික්ඛෙ නිබ්බානමත්තනො.

**තත්ථ සික්ඛානුගීයන්ති යානි ලොකෙ ගථිතානීති** – 'සික්ඛා'ති හත්ථිසික්ඛා අස්සසික්ඛා රථසික්ඛා සාලාකියං සල්ලකත්තියං කායතිකිච්ඡං භූතියං කොමාරභච්චං.[2] **ගීයන්තීති** නිගීයන්ති කථීයන්ති භණීයන්ති දීපීයන්ති වොහරීයන්ති. අථවා **ගීයන්ති** – ගණ්හීයන්ති උග්ගණ්හීයන්ති ධාරීයන්ති උපධාරීයන්ති උපලක්ඛීයන්ති ගථිතපටිලාභාය. ගථිතා වුච්චන්ති පඤ්ච කාමගුණා: චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. කිං කාරණා ගථිතා වුච්චන්ති පඤ්ච කාමගුණා? යෙභුය්‍යෙන දෙවමනුස්සා පඤ්ච කාමගුණෙ ඉච්ඡන්ති සාදියන්ති පත්ථයන්ති පිහයන්ති අභිජප්පන්ති; තඞ්කාරණා ගථිතා වුච්චන්ති පඤ්ච කාමගුණා. **ලොකෙති** මනුස්ස –පෙ– ලොකෙති – තත්ථ සික්ඛානුගීයන්ති යානි ලොකෙ ගථිතානි.

**න තෙසු පසුතො සියාති** – තාසු වා සික්ඛාසු තෙසු වා පඤ්චසු කාමගුණෙසු න පසුතො සියා, න තන්නින්නො අස්ස, න තප්පොණො න තප්පබ්භාරො න තදධිමුත්තො න තදධිපතෙය්‍යොති – න තෙසු පසුතො සියා.

**නිබ්බිජ්ඣ සබ්බසො කාමෙති** – 'නිබ්බිජ්ඣා'ති පටිවිජ්ඣිත්වා; සබ්බෙසඞ්ඛාරා අනිච්චා'ති පටිවිජ්ඣිත්වා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති පටිවිජ්ඣිත්වා –පෙ– 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති පටිවිජ්ඣිත්වා; **සබ්බසොති** සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං සබ්බසොති; **කාමාති** උද්දානතො ද්වෙ කාමා: වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමාති – නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ.

**සික්ඛෙ නිබ්බානමත්තනොති** –'සික්ඛා'ති තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා –පෙ– අයං අධිපඤ්ඤාසික්ඛා. **නිබ්බානමත්තනොති** අත්තනො රාගස්ස නිබ්බාපනාය දොසස්ස නිබ්බාපනාය මොහස්ස නිබ්බාපනාය –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරානං සමාය උපසමාය වූපසමාය නිබ්බාපනාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය.

---

1. ගථිතානි - සීමු. II. 2. කොමාරතිකිච්ඡං - ස්‍යා

15 - 6

සත්ත්වලොකයෙහි යම් පඤ්චකාමගුණ කෙනෙක් වෙත් නම්, ඒ නිමිති කොට (හස්තිශික්ෂාදි) අනෙක ශික්ෂා උගන්නා ලැබෙත්. (නුවණැති කුලපුත්‍ර තෙමේ) ඒ පඤ්චකාමගුණයන්හි හෝ හස්තිශික්ෂාදියෙහි ප්‍රයුක්ත වූයේ නො වන්නේ ය. (එහෙයින්) වස්තුකාමක්ලේශකාමයන් සම්‍යකාරයෙන් (අනිත්‍යාදි දර්ශනයෙන්) ප්‍රතිවෙධ කොට තමාගේ (රාගාදිය) නිවීමට හික්මෙන්නේ යි.

**තපඤ සිකඛානුගීයන්ති යානි ලොකෙ ගධිතානි** - 'සිකඛා' යනු: හස්තිශික්ෂා යැ අශ්වශික්ෂා යැ රථශික්ෂා යැ ධනුශ්ශික්ෂා යැ ශාලාක්‍යතන්ත්‍ර යැ ශල්‍යකර්ම යැ කායචිකිත්සා යැ භෞතිකවිද්‍යා යැ කෞමාරභෘත්‍ය යි. **ගීයන්ති** යනු: ගයනු ලැබෙති, කියනු ලැබෙති, බණනු ලැබෙති, දක්වනු ලැබෙති, ව්‍යවහාර කරනු ලැබෙත්. නොහොත් **ගීයන්ති** - පඤ්චකාමගුණ ප්‍රතිලාභය සඳහා ගන්නා ලැබෙති, උගන්නා ලැබෙති, දරනු ලැබෙති, විමසනු ලැබෙති, සලකනු ලැබෙත්. 'ගධිත'සී පඤ්චකාමගුණයෝ කියනු ලැබෙත්: ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව වූ කාමාස්වාදයෙන් යුත් ඇලුම් කටයුතු වූ චක්ෂුර්විඥානයෙන් දක්කයුතු රූපයෝ යි. කවර කරුණෙකින් පඤ්චකාමගුණයෝ 'ගධිත'සී කියනු ලැබෙති යත්: බොහෝසෙයින් දිව්‍යමනුෂ්‍යයෝ පඤ්චකාමගුණයන් කැමැති වෙයි, ඉවසති, පතති, රුචි කෙරෙති, අභිජල්පනය කෙරෙත්; එකරුණෙන් පඤ්චකාමගුණයෝ 'ගධිත' සී කියනු ලැබෙත්. **ලොකෙ** යනු: මිනිස්ලොවැ...ආයතනලොකයෙහි නුයි 'තපඤ සිකඛානුගීයන්ති යානි ලොකෙ ගධිතානි' යනු වේ.

**න තෙසු පසුතො සියා** - ඒ ශික්ෂාවන්හි හෝ ඒ පඤ්චකාමගුණයන්හි හෝ නො ඇලුණේ වන්නේ යැ, ඊට නැමුණේ නො වන්නේ යැ, ඊට නැබුරු වූයේ නො වන්නේ යැ, ඊට බර වූයේ නො වන්නේ යැ, එහි මුසපත් වූයේ නො වන්නේ යැ, එය අධිපති කොට ඇත්තේ නො වන්නේ නුයි 'න තෙසු පසුතො සියා' යනු වේ.

**නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ** - 'නිබ්බිජ්ඣ, යනු: ප්‍රතිවෙධ කොට 'සියලු සංස්කාරයෝ අනිත්‍යයහ'යි ප්‍රතිවෙධ කොට 'සියලු සංස්කාරයෝ දුක්හ'යි ප්‍රතිවෙධ කොට...'යම් කිසිවක් සමුදයධර්ම නම්, ඒ සියල්ල නිරුද්ධ වන සවභාව ඇතැ'යි ප්‍රතිවෙධ කොට; **සබ්බසො** යනු: සියල්ලෙන් සියල්ල සියලු ලෙසින් සියල්ල අශෙෂ කොට නිශෙෂ කොට හාත්පසින් ගන්නා වචනයෙකි මේ 'සබබසො' යනු. **කාමා** යනු: විස්තර වසයෙන් කාමයෝ දෙදෙනෙකි: වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ ද'යි...මොහු ක්ලේශකාමයෝ යි කියනු ලැබෙත් නුයි 'නිබ්බිජ්ඣ සබබසො කාමෙ' යනු වේ.

**සිකෙඛ නිබ්බානමත්තනො** - 'සිකඛා' නම්: ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා යැ අධිචිත්තශික්ෂා යැ අධිප්‍රඥශික්ෂා යැයි...මේ අධිප්‍රඥශික්ෂා යි. **නිබ්බානමත්තනො** යනු තමාගේ රාගය නිවීමට ද්වේෂය නිවීමට මොහය නිවීමට...සියලු අකුශලාභිසංස්කාරයන් ශමනයට මතු මත්තෙහි ශමනයට සන්සිඳුවීමට නිර්වාපණයට (මාර්ගයෙන්) දුරලීමට (ඵලයෙන්) අප්‍රතරුත්පත්තියට අධිශීලයෙහි ද හික්මෙන්නේ යැ, අධිචිත්තයෙහි ද හික්මෙන්නේ යැ අධිප්‍රඥවෙහි ද හික්මෙන්නේ ය.

ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය ජානන්තො සික්ඛෙය්‍ය -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති 'සික්ඛෙ නිබ්බානමත්තනො'.

තෙනාහ භගවා:

"තත්‍ථ සික්ඛානුගීයන්ති
යානි ලොකෙ ගධිතානි,
න තෙසු පසුතො සියා
නිබ්බිජ්ඣ සබ්බසො කාමෙ,
සික්ඛෙ නිබ්බානමත්තනො"ති.

## 15 - 7

සච්චො සියා අප්පගබ්භො අමායො රිත්තපෙසුණො,
අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි.

**සච්චො සියා අප්පගබ්භොති** - 'සච්චො සියා'ති සච්චවාචාය සමන්නාගතො සියා, සම්මාදිට්ඨියා සමන්නාගතො සියා, අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සමන්නාගතො සියාති සච්චො සියා; **අප්පගබ්භොති** තීණි පාගබ්භියානි: කායිකං පාගබ්භියං වාචසිකං පාගබ්භියං චෙතසිකං පාගබ්භියං -පෙ- ඉදං චෙතසිකං පාගබ්භියං. යස්සිමානි තීණි පාගබ්භියානි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිප්පස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි, සො වුච්චති අප්පගබ්භොති - සච්චො සියා අප්පගබ්භො.

**අමායො රිත්තපෙසුණොති** - මායා වුච්චති වඤ්චනිකා චරියා. ඉධෙකච්චො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා තස්ස පටිච්ඡාදනහෙතු පාපිකං ඉච්ඡං පණිදහති: මා මං ජඤ්ඤා'ති ඉච්ඡති, 'මා මං ජඤ්ඤා'ති සඞ්කප්පෙති, 'මා මං ජඤ්ඤා'ති වාචං භාසති, 'මා මං ජඤ්ඤා'ති කායෙන පරක්කමති. යා එවරූපා මායා මායාවිතා අච්චසරා වඤ්චනා නිකති නිකරණා පරිහරණා ගූහනා පරිගූහනා ඡාදනා පටිච්ඡාදනා[1] අනුත්තානීකම්මං අනාවිකම්මං වොච්ඡාදනා පාපකිරියා, අයං වුච්චති මායා. යස්සෙසා මායා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අමායො. **රිත්තපෙසුණොති** 'පෙසුඤ්ඤ'න්ති: ඉධෙකච්චො පිසුණවාචො හොති -පෙ- එවං භෙදාධිප්පායො පෙසුඤ්ඤං උපසංහරති; යස්සෙතං පෙසුඤ්ඤං පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪං, සො වුච්චති රිත්තපෙසුණො විවිත්තපෙසුණො පවිවිත්තපෙසුණොති - අමායො රිත්තපෙසුණො.

---

1 පරිච්ඡාදනා - ස.

මේ ත්‍රිවිධ ශික්‍ෂාවන් ආවර්ජනා කෙරෙමින් හික්මෙත්තේ යැ, දනිමින් හික්මෙත්තේ යැ... ප්‍රත්‍යක්‍ෂ කටයුතු නිවන ප්‍රත්‍යක්‍ෂ කෙරෙමින් හික්මෙත්තේ යැ, හැසිරෙත්තේ යැ, මොනොවට හැසිරෙත්තේ යැ, සමාදන් වැ පවත්තේ නුයි 'සික්ඛෙ නිබ්බානමත්තනො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"තත්ථ සික්ඛානුගීයන්ති -පෙ- සික්ඛෙ නිබ්බානමත්තනො"යි.

## 15 - 7

(නිවනට හික්මෙන) මුනි තෙම සත්‍යයෙන් යුක්ත වූයේ වන්නේ යැ ප්‍රාගල්භ්‍ය රහිත වන්නේ ය, මායාවෙන් වෙන් වූයේ වන්නේ යැ, ප්‍රහීණ කළ පෛශුන්‍ය ඇත්තේ වන්නේ යැ, ක්‍රොධ නො කරනුයේ ලොභපාපය ද මාත්සර්‍ය්‍ය ද ඉක්මවන්නේ යි.

**සච්චො සියා අප්පගබ්භො** - 'සච්චො සියා' යනු: සත්‍යවචනයෙන් සමන්විත වූයේ වන්නේ යැ, සම්‍යග්දෘෂ්ටියෙන් සමන්විත වූයේ වන්නේ යැ, ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සමන්විත වූයේ වන්නේ නුයි, 'සච්චො සියා' යනු වේ. **අප්පගබ්භො** යනු: ප්‍රාගල්භ්‍ය තුනෙකි: කායිකප්‍රාගල්භ්‍ය යැ වාචසිකප්‍රාගල්භ්‍ය යැ චෛතසිකප්‍රාගල්භ්‍ය යැයි...මේ චෛතසිකප්‍රාගල්භ්‍ය යයි. යමක්හු විසින් මේ තුන් ප්‍රාගල්භ්‍යයෝ ප්‍රහීණ කරන ලද්දාහු මුලුසුන් කරන ලද්දාහු සන්සිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යොත්පත්තික වූවාහු නුවණගින්නෙන් දවන ලද්දාහු ද, හේ 'අප්පගබ්භ'යි කියනු ලැබේ නුයි 'සච්චො සියා අප්පගබ්භො' යනු වේ.

**අමායො රිත්තපෙසුණො** - 'මායා'යි වාඤ්චනික හැසිරීම කියනු ලැබෙයි. මෙහි කිසිවෙක් කයින් දුසිරිතෙහි හැසිර, බසින් දුසිරිතෙහි හැසිර, සිතින් දුසිරිතෙහි හැසිර, එය වසනු නිසා ලාමක ආශාව පිහිටුවයි; 'තගමක් මා දනිව'යි කැමැති වෙයි; 'තගමක් මා දනිව'යි සලකයි; 'තගමක් මා දනිව'යි වචන කියයි; 'තගමක් මා දනිව'යි කයින් වෑයම් කෙරෙයි; මෙබඳු වූ යම් මායාවක් මායා ඇතිබවක් ඉක්මැයැමක් වඤ්චාවක් (ප්‍රතිරූපයෙන් රවටන) නිකෘතියක් (පාපය) යටපත් කිරීමක් බැහැර කිරීමක් සැඟවීමක් හාත්පසින් සැඟවීමක් වැසීමක් හාත්පසින් වැසීමක් ප්‍රකාශ නො කිරීමක් ප්‍රකට නො කිරීමක් මොනොවට වැසීමක් පාපක්‍රියාවක් වේ ද, මේ මායා යි කියනු ලැබෙයි. යමක්හු විසින් මේ මායාව ප්‍රහීණ කරන ලද්දී මුලුසුන් කරන ලද්දී සන්සිඳුවන ලද්දී දුරලන ලද්දී අභව්‍යොත්පත්තික වූවා නුවණගින්නෙන් දවන ලද්දී ද, හෙතෙම 'අමාය' යි කියනු ලැබෙයි. **රිත්තපෙසුණො** 'පෙසුඤ්ඤ' නම්: මෙහි කිසිවෙක් පිසුනුබස් කියන්නේ වෙයි... මෙසේ බිඳුවන අදහස් ඇතියේ පිසුනුබස් එළවා කියයි. යමකු විසින් මෙ පෛශුන්‍යය ප්‍රහීණ කරන ලද ද මුල් සිඳින ලද ද සන්සිඳුවන ලද ද දුරලන ලද ද උපතට නුසුදුසු කරන ලද ද නුවණගින්නෙන් දවන ලද ද, හෙතෙම 'රිත්තපෙසුන'යැ විවිත්තපෙසුන යැ පවිවිත්තපෙසුන යැයි කියනු ලැබේනුයි- 'අමායො රිත්තපෙසුණො' යනු වේ.

**අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනීති** - අක්කොධනොති හි වුත්තං. අපි ච කොධො තාව වත්තබ්බො. දසහාකාරෙහි කොධො ජායති: අනත්ථං මෙ අචරීති කොධො ජායති -පෙ- යස්සෙසො කොධො පහීනො සමුච්ඡින්නො වූපසන්තො පටිප්පස්සද්ධො අභබ්බුප්පත්තිකො ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති අක්කොධනො. කොධස්ස පහීනත්තා අක්කොධනො, කොධවත්ථුස්ස පරිඤ්ඤාතත්තා අක්කොධනො, කොධහෙතුස්ස උපච්ඡින්නත්තා අක්කොධනො. **ලොභොති** යො ලොභො ලුබ්භනා ලුබ්භිතත්තං -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **වෙවිච්ඡං** වුච්චති පඤ්ච මච්ඡරියානි ආවාසමච්ඡරියං -පෙ- ගාහො වුච්චති මච්ඡරියං. **මුනීති** මොනං වුච්චති ඤාණං -පෙ- "සඞ්ගජාලමතිච්ච සො මුනි". **අක්කොධනො. ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනීති** - මුනි ලොභපාපඤ්ච වෙවිච්ඡඤ්ච අතරි උත්තරි පතරි සමතික්කමි වීතික්කමි වීතිවත්තයීති - අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි.

තෙනාහ භගවා:

"සච්චො සියා අප්පගබ්භො අමායො රිත්තපෙසුණො,
අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනී"ති.

**15 - 8**

**නිද්දං තන්දිං සහෙ ථීනං පමාදෙන න සංවසෙ,**
**අතිමානෙ න තිට්ඨෙය්‍ය නිබ්බානමනසො නරො.**

**නිද්දං තන්දිං සහෙ ථීනන්ති** - 'නිද්දා'ති යා කායස්ස අකල්‍යතා අකම්මඤ්ඤතා ඔනාහො පරියොනාහො අන්තොසමොරොධො මිද්ධං සොප්පං[1] පචලායිකා[2] සොප්පනා සුපනා සුපිතත්තං[3] **තන්දීති** යා තන්දි තන්දියනා තන්දිමනකතා ආලස්සං ආලසියං ආලස්සායනා ආලස්සායිතත්තං[ග]; **ථීනන්ති** යා චිත්තස්ස අකල්‍යතා අකම්මඤ්ඤතා ඔලීයනා සල්ලීයනා ලීනං ලීයනා ලීයිතත්තං ථීනං ථීයනා ථීයිතත්තං චිත්තස්ස;[ග] **නිද්දං තන්දිං සහෙ ථීනන්ති** නිද්දඤ්ච තන්දිඤ්ච ථීනඤ්ච. **සහෙ** - සහෙය්‍ය පරිසහෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති- නිද්දං තන්දිං සහෙ ථීනං.

---

1. සුප්පං - සීමු. II. මජසං 2. චපලායිකා - PTS පචලායිකා - සීමු. II.
3 සුප්පනා සුප්පනත්තං - සීමු. I. ග. ධාතුවිභඞ්ග.

**අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි** – ‘අක්කොධනො’ යි මැ වදාරන ලදි. තවද ක්‍රොධය පළමු කොට කියනුත්තේ යැ; දශ අයුරකින් ක්‍රොධය උපදී: ‘මට අවැඩ කළැ’යි ක්‍රොධය උපදී...යමක් විසින් තෙල ක්‍රොධය ප්‍රහීණ කරන ලද ද මුල්සිඳින ලද ද සන්හිඳුවන ලද ද දුරලන ලද ද උපතට නුසුදුසු කරන ලද ද නුවණගින්නෙන් දවන ලද ද, හෙතෙම ‘අක්කොධන’යි කියනු ලැබේ. ක්‍රොධවස්තුව පරිඥනය කළ බැවින් ‘අක්කොධන’ යැ. ක්‍රොධහේතුව සිඳින ලද බැවින් ‘අක්කොධන’යි. ලොභ නම්: යම් ලොභයෙක් ලොභාකාරයෙක් ලොභ කළ බවක්...දැඩි ලොභයක් ලොභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එයයි: වෙවිච්ඡ යි පසුව මාත්සර්යයෝ යයනු ලැබෙත්. ආවාසමාත්සර්යය... ග්‍රාහය (–දැඩිව ගැනීම) ‘මාත්සර්ය යයි කියනු ලැබේ. මුනි යනු: ‘මොන’යි ඥනය කියනු ලැබෙයි...‘සඞ්ගජාලමතිච්ච සො මුනි’. **අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි** - මුනි තෙම ලොභ සඞ්ඛ්‍යාත පාපය ද මාත්සර්යය ද තරණය කෙළේ ය, උත්තරණය කෙළේ ය, ප්‍රතරණය කෙළේ ය, ඉක්ම වූයේ ය, වෙසෙසින් ඉක්මවූයේ ය, ව්‍යතික්‍රමණය කෙළේ නුයි ‘අක්කොධනො ලොභපාපං වෙවිච්ඡං විතරෙ මුනි’ යනු වේ.

එයින් වදාළහ බුදුහු:

“සච්චා සියා අප්පගබ්භො -පෙ- වෙවිච්ඡං විතරෙ මුනි”යි.

**15 - 8**

නිවනෙහි නැමුණු සිත් ඇති සත්ත්ව තෙමේ (වේදනාදි ස්කන්ධත්‍රය සඞ්ඛ්‍යාත) නාමකායයාගේ අකර්මණ්‍ය බව (–මිද්ධය) ද කායාලස්‍යය ද චිත්තයාගේ අකර්මණ්‍ය බව ද මැඩපවත්වන්නේ යැ, සමාතිප්‍රවාසය සඞ්ඛ්‍යාත) ප්‍රමාදයෙන් නො වසන්නේ යැ, අතිමානයෙහි නො පවත්නේ යි.

**නිද්දං තන්දිං සහෙ ථීනං** – ‘නිද්‍රා’ නම්: ස්කන්ධත්‍රය සඞ්ඛ්‍යාත නාමකායයාගේ අකල්‍ය (–ගිලන්) බවෙක් අකර්මණ්‍ය බවෙක් (මේඝය අහස මෙන්) කය පහත් කොට බැඳීමෙක් හාත්පසින් බැඳීමෙක් ඇතුළත ඇවිරීමෙක් (අකර්මණ්‍යභාවයෙන්) පෙළීමෙක් නිදීමෙක් කපිනිද්‍රාවෙක් නිදීමෙක් නිදන අයුරෙක් නිදිගත් බවෙක් වේ ද එයයි. තන්දිං යනු: තන්ද්‍රාවක් තන්ද්‍රාකාරයෙක් තන්ද්‍රාවෙන් මඩනා ලද සිත් ඇති බවෙක් ආලස්‍යයක් අලසබවක් ආලස්‍යාකාරයක් ආලස්‍යයෙන් මඩනා ලද සිත් ඇති බවක් වේ ද එය යි. ථීනං යනු: චිත්තයාගේ යම් ගිලන්බවෙක් අකර්මණ්‍ය බවෙක් එලෙන අයුරෙක් මැනවින් එලෙන අයුරෙක් හැකිළීමෙක් හැකිළෙන අයුරෙක් හැකුළුණු බවක් චිත්තයාගේ නො පැතිරීමෙක් නො පැතිරෙන අයුරෙක් නො පැතුරුණු බවෙක් වේ ද එයයි. **නිද්දං තන්දිං සහෙ ථීනං** - ගිලන් බව ද ආලස්‍යය ද නිදබව ද; සහෙ – සහනය කරන්නේ යැ, හාත්පසින් සහනය කරන්නේ යැ, මඩනේ යැ, යටපත් කරන්නේ යැ, අල්වාගන්නේ යැ, හාත්පසින් ගන්නේ යැ, මර්දනය කරන්නේ නුයි ‘නිද්දං තන්දිං සහෙ ථීනං’ යනු වේ.

**පමාදෙන න සංවසෙති** - පමාදො වත්තබ්බො: කායදුච්චරිතෙ වා වචීදුච්චරිතෙ වා මනොදුච්චරිතෙ වා පඤ්චසු වා කාමගුණෙසු චිත්තස්ස වොස්සග්ගො වොස්සග්ගානුප්පදානං[1] වා, කුසලානං වා ධම්මානං භාවනාය අසක්කච්චකිරියතා අසාතච්චකිරියතා අනවට්ඨිතකිරියතා[2] ඔලීනවුත්තිතා නික්ඛිත්තච්ඡන්දතා නික්ඛිත්තධුරතා අනාසෙවනා අභාවනා අබහුලීකම්මං අනධිට්ඨානං අනනුයොගො පමාදො, යො එවරූපො පමාදො පමජ්ජනා පමජ්ජිතත්තං, අයං වුච්චති පමාදො. **පමාදෙන න සංවසෙති** පමාදෙන න වසෙය්‍ය න සංවසෙය්‍ය න ආවසෙය්‍ය න පරිවසෙය්‍ය, පමාදං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, පමාදා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - පමාදෙන න සංවසෙ.

**අතිමානෙ න නිවෙසයා'ති** - අතිමානොති ඉධෙකච්චො පරං අතිමඤ්ඤති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස. අයං වුච්චති අතිමානො. **අතිමානෙ න නිවෙසයා'ති.** අතිමානෙ න නිවෙසෙය්‍ය, න සන්නිවෙසෙය්‍ය, අතිමානං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය, අතිමානා ආරතො අස්ස, විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති - අතිමානෙ න නිවෙසයෙ.

**නිබ්බානමානසො නරොති** - ඉධෙකච්චො දානං දෙන්තො සීලං සමාදියන්තො උපොසථකම්මං කරොන්තො පානීයං පරිභොජනීයං උපට්ඨපෙන්තො පරිවෙණං සම්මජ්ජන්තො චෙතියං වන්දන්තො චෙතියෙ ගන්ධමාලං ආරොපෙන්තො චෙතියං පදක්ඛිණං කරොන්තො යං කිඤ්චි තෙධාතුකං කුසලාභිසඞ්ඛාරං අභිසඞ්ඛරොන්තො න ගතිහෙතු න උපපත්තිහෙතු න පටිසන්ධිහෙතු න භවහෙතු න සංසාරහෙතු න වට්ටහෙතු සබ්බං තං විසංයොගාධිප්පායො නිබ්බානනින්නො නිබ්බානපොණො නිබ්බානපබ්භාරො අභිසඞ්ඛරොතීති එවම්පි නිබ්බානමානසො නරො; අථවා සබ්බසඞ්ඛාරධාතුයා චිත්තං පටිවාපෙත්වා[3] අමතාය ධාතුයා චිත්තං උපසංහරති: එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානන්ති එවම්පි 'නිබ්බානමානසො නරො.'

---

1. වොස්සග්ගානුප්පාදනං - මජ්ඣප; වොස්සග්ගානුප්පදානං - සීමු. II.
2. අනිට්ඨිතකිරියතා - සීමු II. මජසං.
3. පටිවාසෙත්වා - මජසං.

**පමාදෙන න සංවසෙ** - ප්‍රමාදය කියැයුත්තේ යැ: කායදුශ්චරිතයෙහි හෝ වාග්දුශ්චරිතයෙහි හෝ මනොදුශ්චරිතයෙහි හෝ පඤ්චකාමගුණයන්හි හෝ චිත්තයාගේ දුරලීම (-සමාධි විරහය) නැවත නැවත දුරලීම හෝ, කුශලධර්මයන්ගේ හෝ වැඩීමෙහි නො සකස් ව කරන බව සතතභාවයෙන් නො කරන බව තිරතුරු නො කරන බව හැකුළුණු පැවතුම් ඇති බව වියසීවජ්ඣදය හළ බව වියසීධුරය බහාතැබූ බව නො සෙවුණා බව නො වැඩීම බහුල නො කිරීම නො පිහිටීම නො යෙදීම ප්‍රමාද වීම, (යන) මෙබඳු වූ යම් ප්‍රමාදයෙක් ප්‍රමාදවන අයුරක් ප්‍රමාදවන බවක් වේ ද, මේ 'ප්‍රමාද'යයි කියනු ලැබේ. **පාමදෙන න සංවසෙ** ප්‍රමාදයෙන් නො වසන්නේ යැ, නො වෙසෙසින් වසන්නේ යැ, නො පැමිණ වසන්නේ යැ, හාත්පසින් නො වසන්නේ යැ; ප්‍රමාදය දුරුකරන්නේ යැ බැහැර කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ යැ; ප්‍රමාදයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැගියේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ විමයසීදීකෘත සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'පමාදෙන න සංවසෙ' යනු වේ.

**අතිමානෙ න තිට්ඨෙය්‍ය** - 'අතිමාන' නම්: මෙහි කිසිවෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...යම් කිසි වස්තුවකින් හෝ මෙරමා පහත් කොට සිතයි. මෙබඳු වූ යම් මානයෙක් මානාකාරයෙක් මාන කරන බවක් උන්නතියක් උඩගුබවක් මානධ්වජයක් සිත දැඩි කොට ගැනීමක් චිත්තයාගේ කෙතුකම්‍යතාවක් වේ ද, මේ 'අතිමානය'යයි කියනු ලැබේ. **අතිමානෙ න තිට්ඨෙය්‍ය** අතිමානයෙහි නො සිටින්නේ යැ, වෙසෙසින් නො සිටින්නේ යැ, අතිමානය දුරු කරන්නේ යැ, බැහැර කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ: අතිමානයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ නික්මැගියේ විප්‍රමුක්ත විසංයුක්ත වූයේ විමයසීදීකෘත සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'අතිමානෙ න තිට්ඨෙය්‍ය' යනු වේ.

**නිබ්බානමානසො නරෙ** - මෙහි කිසිවෙක් දන් දෙනුයේ සිල් සමාදන් වනුයේ පෙහෙවස්කම් කරනුයේ පියයුතු පරිභොග කළයුතු පැන් එළවා තබනුයේ පිරිවෙන හමදිනුයේ සෑය වඳිනුයේ සෑයෙහි සුවඳමල්දම් තබනුයේ සෑය පැදකුණු කරනුයේ තුන්බිමට අයත් යම් කිසි කුශලාභිසංස්කාරයක් රැස් කරනුයේ (දිව්‍යාදි) ගතිහෙතුයෙන් නො කෙරෙයි. උත්පත්තිය හෙතුකොට - ප්‍රතිසන්ධිය හෙතුකොට - භවය හෙතු කොට - සංසාරය හෙතු කොට - වෘත්තය හෙතු කොට නො කෙරෙයි. ඒ සියල්ල විසංයොගයෙහි ප්‍රාර්ථනා ඇතියේ නිවනට නැමුණේ නිවනට නැඹුරු වූයේ නිවනට අභිමුඛව නැමුණේ රැස් කෙරේ නුයි- මෙසේත් 'නිබ්බානමානසො නරො' යනු වේ. නොහොත් සියලු ත්‍රෛභූමක සංස්කාරධාතුයෙන් සිත නවත්වා, නිර්වාණධාතුවට සිත එළවයි: යම් මේ සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය වීමෙක් කෙලෙස්රජසුන්ගේ නො ඇලීමෙක් දුකතිරොධයෙක් නිර්වාණයෙක් වේ ද, තෙල ශාන්ත යැ, තෙල ප්‍රණීත යැයි මෙසේත් 'නිබ්බානමානසො නරො' යනු වේ

1. "න පණ්ඩිතා උපධිසුඛස්ස හෙතු
දදන්ති දානානි පුනබ්භවාය,
කාමඤ්ච තෙ උපධිපරික්ඛයාය
දදන්ති දානං අපුනබ්භවාය.

2. න පණ්ඩිතා උපධිසුඛස්ස හෙතු
භාවෙන්ති ඣානානි පුනබ්භවාය,
කාමඤ්ච තෙ උපධිපරික්ඛයාය
භාවෙන්ති ඣානං අපුනබ්භවාය.

3. තෙ නිබ්බුතිං ආසිංසමානා දදන්ති
තන්නින්නචිත්තා තදධිමුත්තා,
නජ්ජො යථා සාගරමජ්ඣුපෙතා
භවන්ති නිබ්බානපරායණා තෙ"ති

'නිබ්බානමානසො නරො.'

තෙනාහ භගවා:

"නිද්දං තන්දිං සහෙ ථීනං
පමාදෙන න සංවසෙ,
අතිමානෙ න තිට්ඨෙය්‍ය
නිබ්බානමානසො නරො"ති.

15 – 9

මොසවජ්ජෙ න නිය්‍යෙථ රූපෙ ස්නෙහං න කුබ්බයෙ,
මානඤ්ච පරිජානෙය්‍ය සාහසා විරතො චරෙ.

**මොසවජ්ජෙ න නිය්‍යෙථාති** – 'මොසවජ්ජං' වුච්චති මුසාවාදො. ඉධෙකච්චො සභග්ගතො[1] වා පරිසග්ගතො[2] වා ඤාතිමජ්ඣගතො වා පූගමජ්ඣගතො වා රාජකුලමජ්ඣගතො වා අභිනීතො සක්ඛිපුට්ඨො 'එහම්භො පුරිස, යං ජානාසි තං වදෙහී'ති. සො අජානං වා ආහ[3] 'ජානාමී'ති, ජානං වා ආහ[3] න ජානාමී'ති, අපස්සං වා ආහ[3] 'පස්සාමී'ති පස්සං වා ආහ 'න පස්සාමී'ති. ඉති අත්තහෙතු වා පරහෙතු වා ආමිසකිඤ්චික්ඛහෙතු වා සම්පජානමුසා භාසති. ඉදං වුච්චති මොසවජ්ජං. අපි ච තීහාකාරෙහි – චතූ – පඤ්ච – ඡ–සත්ත – අට්ඨහාකාරෙහි –පෙ– ඉමෙහි අට්ඨහාකාරෙහි මුසාවාදො හොති. **මොසවජ්ජෙ න නිය්‍යෙථාති** – මොසවජ්ජෙ න යායෙය්‍ය න නිය්‍යායෙය්‍ය න වුය්හෙය්‍ය න සංහරෙය්‍ය, මොසවජ්ජං පජහෙය්‍ය, විනොදෙය්‍ය, බ්‍යන්තීකරෙය්‍ය, අනභාවං ගමෙය්‍ය. මොසවජ්ජා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති – මොසවජ්ජෙ න නිය්‍යෙථ.

1. සභාගතො – සීමු II. 2. පරිසගතො – සීමු. II. 3. අහං – සීමු. II.

1. පණ්ඩිත වූ මනුෂ්‍යයෝ කාමසුඛයට හෙතු වූ පුනර්භවය සඳහා දන් නො දෙති. වැලි ඔහු එකාන්තයෙන් (කාමාදි) උපධි ක්ෂය වීම පිණිස (අපුනර්භව සඞ්ඛ්‍යාත) නිර්වාණය සඳහා දන් දෙත්.

2. පණ්ඩිතයෝ උපධිසුඛය හෙතු කොට පුනර්භවය සඳහා ධ්‍යානයන් නො වඩති. වැලි ඔහු උපධීන්ගේ ක්ෂය වීම පිණිස නිර්වාණය සඳහා ධ්‍යාන වඩත්.

3. ඔහු නිවන පතමින් ඊට නැමුණු සිත් ඇත්තාහු එහි ඇලුණාහු දන් දෙති. සයුර කරා පැමිණි ගඞ්ගාවන් මෙන් ඔහු නිවන පිහිට කොට ඇත්තාහු වෙත් නුයි-

'නිබ්බානමානසො නරො' යනු වේ.

එයින් වදාළහ බුදුනු:

"නිද්දං තන්දිං සහෙ ථිනං -පෙ- නිබ්බානමානසො නරො"යි.

## 15 - 9

මුසාවාදයෙහි නො යෙදෙන්නේ යැ. (භූතොපඝාතයහෙද වූ) රූපයෙහි සෙනහය නො කරන්නේ යැ. මානය ද (ත්‍රිවිධපරිඥායෙන්) පිරිසිඳ දැන ගන්නේ යැ. සාහසචරියාවෙන් වෙන් ව හැසිරෙන්නේ යි.

**මොසවජ්ජෙ න නීයෙථ** - 'මොසවජ්ජ'යි මෘෂාවාදය කියනු ලැබෙයි. මෙහි කිසිවෙක් සභාවට ගියේ හෝ පිරිස්මැදට ගියේ හෝ නෑයන් මැදට ගියේ හෝ සෙනාමැදට ගියේ හෝ රාජකුලයා මැද මහාවිනිශ්චයෙහි සිටියේ හෝ 'එව එම්බා පුරුෂය, යමක් දන්නෙහි නම් එය කියව'යි අභිමුඛයට පමුණුවන ලද්දේ සාක්ෂි කොට විචාරන ලද්දේ හෙතෙම නො දන්නේ හෝ 'දනිමි' කියයි. දන්නේ හෝ 'නො දනිමි' කියයි. නො දක්නේ හෝ 'දක්මි' කියයි. දක්නේ හෝ 'නො දක්මි' කියයි. මෙසේ තමා හෙතු කොට හෝ මෙරමා හෙතු කොට හෝ අල්පමාත්‍ර ආමිෂයක් හෙතු කොට හෝ දැන දැන මුසාවා බෙණෙයි. මේ 'මොසවජ්ජ' යි කියනු ලැබෙයි. තවද තුන් අයුරකින් - සතර - පස් - ස - සත් - අට අයුරකින්...මේ අට අයුරින් මෘෂාවාදය වේ. **මොසවජ්ජෙ න නීයෙථ** මෘෂාවාදයෙහි නො යවනු ලබන්නේ යැ, නො කියනු ලබන්නේ යැ, නො වහනු ලබන්නේ යැ, නො හරිනු ලබන්නේ යැ, මෘෂාවාදය හරනේ යැ, දුරු කරන්නේ යැ, විනාශාන්ත කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ යැ. මෘෂාවාදයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ; නික්මුණේ බැහැර වූයේ විප්‍රමුක්ත - විසංයුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'මොසවජ්ජෙ න නීයෙථ' යනු වේ.

**රූපෙ ස්නෙහං න කුබ්බයෙති** –'රූප'න්ති: චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදායරූපං. **රූපෙ ස්නෙහං න කුබ්බයෙති** රූපෙ ස්නෙහං න කරෙය්‍ය, ඡන්දං න කරෙය්‍ය, පෙමං න කරෙය්‍ය, රාගං න කරෙය්‍ය, න ජනෙය්‍ය, න සඤ්ජනෙය්‍ය, න නිබ්බත්තෙය්‍ය නාභිනිබ්බත්තෙය්‍යාති –රූපෙ ස්නෙහං න කුබ්බයෙ.

**මානඤ්ච පරිජානෙය්‍යාති** – 'මානො'ති එකවිධෙන මානො: යා චිත්තස්ස උන්නති. දුවිධෙන මානො: අත්තුක්කංසනමානො, පරවම්භනමානො. තිවිධෙන මානො: සෙය්‍යොහමස්මීති මානො, සදිසොහමස්මීති මානො, හීනොහමස්මීති මානො. චතුබ්බිධෙන මානො: ලාභෙන මානං ජනෙති, යසෙන මානං ජනෙති, පසංසාය මානං ජනෙති, සුඛෙන මානං ජනෙති. පඤ්චවිධෙන මානො: ලාභිම්හි මනාපිකානං රූපානන්ති මානං ජනෙති, ලාභිම්හි මනාපිකානං සද්දානං – ගන්ධානං – රසානං – ඵොට්ඨබ්බානන්ති මානං ජනෙති. ඡබ්බිධෙන මානො: චක්ඛුසම්පදාය මානං ජනෙති, සොතසම්පදාය – ඝානසම්පදාය – ජිව්හාසම්පදාය – කායසම්පදාය – මනොසම්පදාය මානං ජනෙති. සත්තවිධෙන මානො: අතිමානො, මානාතිමානො, ඔමානො, සදිසමානො, අධිමානො, අස්මිමානො, මිච්ඡාමානො. අට්ඨවිධෙන මානො: ලාභෙන මානං ජනෙති, අලාභෙන ඔමානං ජනෙති, යසෙන මානං ජනෙති, අයසෙන ඔමානං ජනෙති, පසංසාය මානං ජනෙති, නින්දාය ඔමානං ජනෙති, සුඛෙන මානං ජනෙති, දුක්ඛෙන ඔමානං ජනෙති. නවවිධෙන මානො: සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානො, සෙය්‍යස්ස සදිසොහමස්මීති මානො, සෙය්‍යස්ස හීනොහමස්මීති මානො, සදිසස්ස සෙය්‍යොහමස්මීති මානො, සදිසස්ස සදිසොහමස්මීති මානො, සදිසස්ස හීනොහමස්මීති මානො, හීනස්ස සෙය්‍යොහමස්මීති මානො, හීනස්ස සදිසොහමස්මීති මානො, හීනස්ස හීනොහමස්මීති මානො. දසවිධෙන මානො: ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා –පෙ-* අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා. යො එවරූපො මානො මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස, අයං වුච්චති මානො.

**මානඤ්ච පරිජානෙය්‍යාති** – මානං තීහි පරිඤ්ඤාහි පරිජානෙය්‍ය: ඤාතපරිඤ්ඤාය තීරණපරිඤ්ඤාය පහානපරිඤ්ඤාය.

කතමා ඤාතපරිඤ්ඤා? මානං ජානාති: අයං එකවිධෙන මානො, යා චිත්තස්ස උන්නති; අයං දුවිධෙන මානො: අත්තුක්කංසනමානො පරවම්භනමානො –පෙ– අයං දසවිධෙන මානො: ඉධෙකච්චො මානං ජනෙති ජාතියා වා ගොත්තෙන වා –පෙ– අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනාති ජානාති පස්සති. අයං ඤාතපරිඤ්ඤා.

---

* 110 - ඔලොකෙතබ්බං.

**රූපෙ සෙනහං න කුබ්බයෙ** - 'රූප' නම්: සතර මහාභූතයන් හා සතර මහාභූතයන් නිසා පවත්නා රූපයෝ යි. **රූපෙ සෙනහං න කුබ්බයෙ** රූපයෙහි සෙනහය නො කරන්නේ යැ, ඡන්දය නො කරන්නේ යැ, ප්‍රේමය නො කරන්නේ යැ, රාගය නො කරන්නේ යැ, නො දනවන්නේ යැ, නුපදවන්නේ යැ, නො නිපදවන්නේ යැ, වෙසෙසින් නුපදවන්නේ නුයි 'රූපෙ සෙනහං න කුබ්බයෙ' යනු වේ.

**මානඤ්ච පරිජානෙය්‍ය** - 'මාන' නම්: එක් පරිද්දෙකින් මානය වෙයි: චිත්තයාගේ යම් උන්නතියක් වේ ද එයයි. දෙ පරිද්දෙකින් මානය වෙයි: ආත්මොත්කර්ෂණමානයැ, පරවම්භනමාන යැයි. තුන් පරිද්දෙකින් මානය වෙයි: 'මම ශ්‍රේෂ්ඨ වෙමි' මානය වෙයි, 'මම සදෘශයෙමි' මානය වෙයි, 'මම හීනයෙමි' මානය වේ. සතර පරිද්දෙකින් මානය වෙයි: ලාභයෙන් මානය උපදවයි, යශසින් මානය උපදවයි, ප්‍රශංසායෙන් මානය උපදවයි, සුවයෙන් මානය උපදවයි. පස්පරිද්දෙකින් මානය වෙයි: 'මනවඩන රූපයන් ලබන සුල්ලෙමි' මානය උපදවයි, 'මනවඩන ශබ්දයන් ලබනසුල්ලෙමි' - ගන්ධයන් - රසයන් - ස්ප්‍රෂ්ටව්‍යයන් ලබනසුල්ලෙමි' මානය උපදවයි. ස පරිද්දෙකින් මානය වෙයි: චක්ෂුඃසම්පත්තියෙන් මානය උපදවයි, ශ්‍රොත්‍රසම්පත්තියෙන් - ඝ්‍රාණසම්පත්තියෙන් - ජිහ්වාසම්පත්තියෙන්- කායසම්පත්තියෙන් - මනස්සම්පත්තියෙන් මානය උපදවයි. සත් පරිද්දෙකින් මානය වෙයි: අතිමාන යැ මානාතිමාන යැ අවමාන යැ සදෘශමාන යැ අධිමාන යැ අස්මිමාන යැ, මිථ්‍යාමාන යැයි. අට පරිද්දෙකින් මානය වෙයි: ලාභයෙන් මානය උපදවයි, අලාභයෙන් අවමානය උපදවයි, යශසින් මානය උපදවයි, අයශසින් අවමානය උපදවයි, ප්‍රශංසායෙන් මානය උපදවයි, නින්දාවෙන් අවමානය උපදවයි, සුවයෙන් මානය උපද වයි, දුකින් අවමානය උපදවයි. නව පරිද්දෙකින් මානය වෙයි: ශ්‍රේෂ්ඨයාට ශ්‍රේෂ්ඨ වෙමි' මානය වෙයි, ශ්‍රේෂ්ඨයාට සදෘශ වෙමි' මානය වෙයි 'ශ්‍රේෂ්ඨයාට හීන වෙමි' මානය වෙයි, 'සදෘශයාට ශ්‍රේෂ්ඨවෙමි' මානය වෙයි, සදෘශයාට සදෘශ වෙමි' මානය වෙයි, සදෘශයාට හීන වෙමි' මානය වෙයි, 'හීනයාට ශ්‍රේෂ්ඨ වෙමි' මානය වෙයි, හීනයාට සදෘශ වෙමි' මානය වෙයි, 'හීනයාට හීන වෙමි' මානය වේ. දස පරිද්දෙකින් මානය වෙයි: මෙහි කිසිවෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ*...අන්‍යතරාන්‍යතර වස්තුවකින් හෝ මානය උපදවයි. මෙබඳු වූ යම් මානයෙක් මානය කරන අයුරෙක් මානය කරන බවෙක් උන්නතියක් නගා තැබීමෙක් මාන නමැති ධ්වජයෙක් සිත දැඩි කොට ගැනීමෙක් චිත්තයාගේ කෙතුකම්‍යතාවක් වේ ද, මේ මාන යයි කියනු ලැබේ.

**මානඤ්ච පරිජානෙය්‍ය** - මානය ඥාතපරිඥා තීරණපරිඥා ප්‍රහාණපරිඥා යන ත්‍රිවිධ පරිඥාවෙන් පිරිසිඳ දැනගන්නේ යැ.

**ඤාතපරිඤ්ඤා** කවර යත්: මානය ඥාතපරිඥායෙන් දැනගනී: චිත්තයාගේ යම් උන්නතියක් වී නම්, මේ එක් පරිද්දෙකින් මාන යැ. ආත්මොත්කර්ෂණමාන යැ පරවම්භනමාන යැ යන මේ දෙ පරිද්දෙකින් මාන යැ,...මේ දස පරිද්දෙකින් මාන යැ මෙහි කිසිවෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ... අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ මානය උපදවා යයි දැනගනී, බලයි. මෙ තොමෝ 'ඤාතපරිඤ්ඤා'යැ.

---
* 111 වන පිටුව බලන්න.

කතමා තීරණපරිඤ්ඤා? එවං ඤාතං කත්වා මානං තීරෙති: අනිච්චතො දුක්ඛතො -පෙ- අනිස්සරණතො තීරෙති. අයං තීරණපරිඤ්ඤා.

කතමා පහානපරිඤ්ඤා? එවං තීරයිත්වා මානං පජහති, විනොදෙති, බ්‍යන්තීකරොති, අනභාවං ගමෙති. අයං පහානපරිඤ්ඤා. **මානඤ්ච පරිජානෙය්‍යාති** - මානං ඉමාහි තීහි පරිඤ්ඤාහි පරිජානෙය්‍යාති - මානඤ්ච පරිජානෙය්‍ය.

**සාහසා විරතො චරෙති** - කතමං සාහසා චරියා? රත්තස්ස රාගචරියා සාහසා චරියා, දුට්ඨස්ස දොසචරියා සාහසා චරියා, මූළ්හස්ස මොහචරියා සාහසා චරියා; විනිබද්ධස්ස මානචරියා සාහසා චරියා, පරාමට්ඨස්ස දිට්ඨිචරියා සාහසා චරියා, වික්ඛෙපගතස්ස උද්ධච්චචරියා සාහසා චරියා, අනිට්ඨාගතස්ස විචිකිච්ඡා චරියා සාහසා චරියා, ථාමගතස්ස අනුසයචරියා සාහසා චරියා, අයං සාහසා චරියා. **සාහසා විරතො චරෙති** සාහසාචරියා ආරතො අස්ස, විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍ය චරෙය්‍ය විචරෙය්‍ය ඉරියෙය්‍ය වත්තෙය්‍ය පාලෙය්‍ය යපෙය්‍ය යාපෙය්‍යාති - සාහසා විරතො චරෙ.

තෙනාහ භගවා:

"මොසවජ්ජෙ න නියෙථ රූපෙ ස්නෙහං න කුබ්බයෙ,
මානඤ්ච පරිජානෙය්‍ය සාහසා විරතො චරෙ"ති.

## 15 - 10

පුරාණං නාභිනන්දෙය්‍ය නවෙ ඛන්තිං න කුබ්බයෙ,
හීයමානෙ න සොචෙය්‍ය ආකාසං[1] න සිතො සියා.

**පුරාණං නාභිනන්දෙය්‍යාති** - 'පුරාණං' වුච්චති අතීතා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං. අතීතෙ සඞ්ඛාරෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන නාභිනන්දෙය්‍ය, නාභිවදෙය්‍ය, න අජ්ඣොසෙය්‍ය, අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති - පුරාණං නාභිනන්දෙය්‍ය.

1. ආකයසං - ස්‍යා.

**තීරණපරිඤ්ඤා** කවර යත්: තෙල මානය ප්‍රකට කොට අනිත්‍ය හෙයින් තීරණය කෙරෙයි, දුඃඛ හෙයින්...අනිශ්ශරණ හෙයින් තීරණය කෙරෙයි. මෝ තොමෝ 'තීරණපරිඤ්ඤා' යෑ.

**පහානපරිඤ්ඤා** කවර යත්: මෙසේ තීරණය කොට මානය දුරු කෙරෙයි, බැහැර කෙරෙයි, විගතාන්ත කෙරෙයි, අනුඅභාවයට පමුණුවයි. මෝ තොමෝ 'පහානපරිඤ්ඤා'යි. **මානං ච පරිජානෙය්‍ය** යනු: මානය මේ ත්‍රිවිධපරිඥායෙන් පිරිසිද දැනගන්නේ නුයි 'මානඤ්ච පරිජානෙය්‍ය' යනු වේ.

**සාහසා විරතො චරෙ** - සාහසචර්‍ය්‍යාව කවර යත්: රාගයෙන් රත් වූවහුගේ රාගචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, ද්වෙෂයෙන් දුෂ්ට වූවහුගේ ද්වෙෂචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, මොහයෙන් මූඪ වූවහුගේ මොහචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, මානයෙන් විනිබද්ධයාගේ මානචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, දෘෂ්ටියෙන් පරාමෘෂ්ට වූවහුගේ දෘෂ්ටිචර්‍ය්‍යාව සැහැසි කරුණෙක්, විපුරුණු සිතැත්තහුගේ ඖද්ධත්‍යචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, නිෂ්ඨාවට නො ගියහුගේ විචිකිත්සාචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි, අනුශයයෙන් තද වූවහුගේ අනුශයචර්‍ය්‍යාව සැහැසි කරුණෙකි. **සාහසා විරතො චරෙ**- සැහැසි කරුණෙන් (-හැසිරීමෙන්) දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යෑ, **නික්මුණේ** බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්‍ය්‍යාද කළ සිතින් යුක්ත ව වාසය කරන්නේ යෑ, හැසිරෙන්නේ යෑ, වෙසෙසින් හැසිරෙන්නේ යෑ, ඉරියව් පවත්වන්නේ යෑ, වැටෙන්නේ යෑ, රැකෙන්නේ යෑ, යැපෙන්නේ යෑ, යාපනය වන්නේ නුයි 'සාහසා විරතො චරෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"මොසවජ්ජෙ න නියෙථ -පෙ- සාහසා විරතො චරෙ"යි**

## 15 - 10

අතීත වූ රූපාදිඅරමුණට (තෘෂ්ණාදි විසින්) නො සතුටු වන්නේ යෑ. වර්‍තමාන රූපාදියෙහි රුචිය නො කරන්නේ යෑ. (රූපාදිය) නැසෙන කල්හි ශොක නො කරන්නේ යෑ, තෘෂ්ණාව ඇසුරු කළේ නො වන්නේ යි.

**පුරාණං නාභිනන්දෙය්‍ය** - 'පුරාණ'යි ඉක්මැගිය රූප - වෙදනා-සංඥා-සංස්කාර - විඥානය කියනු ලැබෙයි. අතීත වූ සංස්කාරයන් තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් නො සතුටු වන්නේ යෑ, සතුටුබස් නො කියන්නේ යෑ, නො බැසගන්නේ යෑ; අභිනන්දනය අභිවදනය බැසගැනීම ග්‍රාහය දැඩගැනීම පිවිසසිටීම හරන්නේ යෑ, දුරු කරන්නේ යෑ, විගතාන්ත කරන්නේ යෑ, අනුඅභාවයට පමුණුවන්නේ නුයි 'පුරාණං නාභිනන්දෙය්‍ය' යනු වේ.

**නවෙ ඛන්තිං න කුබ්බයෙති** - 'නවා' වුච්චන්ති පච්චුප්පන්නා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං. පච්චුප්පන්නෙ සඞ්ඛාරෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන ඛන්තිං න කරෙය්‍ය, ඡන්දං න කරෙය්‍ය, පෙමං න කරෙය්‍ය, රාගං න කරෙය්‍ය, න ජනෙය්‍ය, න සඤ්ජනෙය්‍ය, න නිබ්බත්තෙය්‍ය, නාභිනිබ්බත්තෙය්‍යාති - නවෙ ඛන්තිං න කුබ්බයෙ.

**හීයමානෙ න සොචෙය්‍යාති** - හීයමානෙ හායමානෙ පරිහායමානෙ වෙමානෙ විගච්ඡමානෙ අන්තරධායමානෙ න සොචෙය්‍ය, න කිලමෙය්‍ය, න පරාමසෙය්‍ය, න පරිදෙවෙය්‍ය, න උරත්තාළිං කන්දෙය්‍ය, න සම්මොහං ආපජ්ජෙය්‍ය. චක්ඛුස්මිං හීයමානෙ හායමානෙ පරිහායමානෙ වෙමානෙ විගච්ඡමානෙ අන්තරධායමානෙ - සොතස්මිං ඝානස්මිං - ජිව්හාය - කායස්මිං - රූපස්මිං - සද්දස්මිං - ගන්ධස්මිං - රසස්මිං - ඵොට්ඨබ්බස්මිං - කුලස්මිං - ගණස්මිං - ආවාසස්මිං - ලාභස්මිං - යසස්මිං - පසංසාය - සුඛස්මිං චීවරස්මිං - පිණ්ඩපාතස්මිං - සෙනාසනස්මිං - ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරස්මිං හීයමානෙ හායමානෙ පරිහායමානෙ වෙමානෙ විගච්ඡමානෙ අන්තරධායමානෙ න සොචෙය්‍ය, න කිලමෙය්‍ය, න පරාමසෙය්‍ය, න පරිදෙවෙය්‍ය, න උරත්තාළිං කන්දෙය්‍ය, න සම්මොහං ආපජ්ජෙය්‍යාති-හීයමානෙ න සොචෙය්‍ය.

**ආකාසං න සිතො සියාති** - 'ආකාසං' වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං. කිංකාරණා ආකාසං වුච්චති තණ්හා: යාය තණ්හාය රූපං ආකස්සති සමාකස්සති ගණ්හාති පරාමසති අභිනිවිසති, වෙදනං - සඤ්ඤං - සඞ්ඛාරෙ - විඤ්ඤාණං - ගතිං - උපපත්තිං - පටිසන්ධිං - භවං - සංසාරං - වට්ටං ආකස්සති සමාකස්සති ගණ්හාති පරාමසති අභිනිවිසති. තංකාරණා 'ආකාසං' වුච්චති තණ්හා.

**ආකාසං න සිතො සියාති** - තණ්හානිස්සිතො න සියා, තණ්හං පජහෙය්‍ය, විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය, තණ්හාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරෙය්‍යාති - ආකාසං න සිතො සියා.

තෙනාහ භගවා:

> **"පුරාණං නාභිනන්දෙය්‍ය නවෙ ඛන්තිං න කුබ්බයෙ,**
> **හීයමානෙ න සොචෙය්‍ය ආකාසං න සිතො සියා"ති.**

## 15 - 11

> **ගෙධං බ්‍රූමි මහොඝොති ආජවං[1] බ්‍රූමි ජප්පනං,**
> **ආරම්මණං පකම්පනං[2] කාමපඞ්කො දුරච්චයො.**

---

1. ආචමං - PTS.  2. පකප්පනං - PTS.

**නවෙ ඛන්තිං න කුබ්බයෙ** – 'නව'යි වර්තමාන රූප - වේදනා-සංඥා-සංස්කාර - විඥානය කියනු ලැබෙයි. වර්තමානසංස්කාරයන් තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් රුචි නො කරන්නේ යැ, ඡන්දය නො කරන්නේ යැ, ප්‍රේමය නො කරන්නේ යැ, රාගය නො කරන්නේ යැ, නො දනවන්නේ යැ, නූපදවන්නේ යැ, නො නිපදවන්නේ යැ, වෙසෙසින් නූපදවන්නේ නුයි 'නවෙ ඛන්තිං න කුබ්බයෙ' යනු වේ.

**හීයමානෙ න සොචෙය්‍ය** – නැසෙන කල්හි හෙන කල්හි පිරිහෙන කල්හි නො වන කල්හි පහව යන කල්හි අතුරුදහන් වන කල්හි ශෝක නො කරන්නේ යැ, නො වෙහෙසෙන්නේ යැ, නො දුහැගන්නේ යැ, නො හඬන්නේ යැ. ළෙහි පැහැර නො හඬන්නේ යැ, සම්මෝහයට නො පැමිණෙන්නේ යැ; ඇස නැසෙන කල්හි හෙන කල්හි පිරිහෙන කල්හි නො වන කල්හි විගත වන කල්හි අතුරුදහන් වන කල්හි කන-නැහැය දිව – කය – රූපය-ශබ්දය – ගන්ධය – රසය – ස්ප්‍රෂ්ටව්‍යය – කුලය – ගණයා-ආවාසය – ලාභය – යශස – ප්‍රශංසාව – සුවය – චීවරය – පිණ්ඩපාතය-සෙනස්න – ගිලන්පසබෙහෙත් පිරිකර නැසෙන කල්හි හෙන කල්හි පිරිහෙන කල්හි නො වන කල්හි විගත වන කල්හි අතුරුදහන් වන කල්හි ශෝක නො කරන්නේ යැ, නො වෙහෙසෙන්නේ යැ, නො දුහැගන්නේ යැ, නො හඬන්නේ යැ, ළෙහි පැහැර නො හඬන්නේ යැ, සම්මෝහයට නො පැමිණෙන්නේ නුයි 'හීයමානෙ න සොචෙය්‍ය' යනු වේ.

**ආකාසං න සිතො සියා** – තෘෂ්ණාව 'ආකාස'යි කියනු ලැබෙයි: යම් රාගයෙක් බලවත් රාගයෙක්...අභිධ්‍යාවක් ලෝභ අකුශලමූලයෙක් වේ ද එය යි. කවර කරුණෙකින් තෘෂ්ණාව 'ආකාස'යි කියනු ලැබෙයි යත්: යම් තෘෂ්ණාවකින් රූපය ආකර්ෂණය කෙරේ ද, සමාකර්ෂණය කෙරේ ද, ගනී ද, දුහැගනී ද, අභිනිවේශය කෙරේ ද, වේදනාව – සංඥාව – සංස්කාර යන් – විඥානය – ගතිය – උත්පත්තිය – ප්‍රතිසන්ධිය – භවය – සංසාරය-වෘත්තය ආකර්ෂණ – සමාකර්ෂණ – ග්‍රහණ පරාමර්ශණ – අභිනිවේශ කෙරේද; එකරුණෙන් තෘෂ්ණාව 'ආකාස'යි කියනු ලැබේ.

**ආකාසං න සිතො සියා** – තෘෂ්ණාව ඇසුරු කළේ නො වන්නේ යැ, තෘෂ්ණාව දුරු කරන්නේ යැ, බැහැර කරන්නේ යැ' විගතාන්ත කරන්නේ යැ, අනුඅභාවයට පමුණුවන්නේ යැ; තෘෂ්ණාවෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ වන්නේ යැ, නික්මුණේ බැහැර වූයේ විමුක්ත වූයේ විමර්‍යාදීකෘත සිතින් යුක්ත ව වාසය කරන්නේ නුයි 'ආකාසං න සිතො සියා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"පුරාණං නාභිනන්දෙය්‍ය -පෙ- ආකාසං න සිතො සියා"යි**

## 15 – 11

(මම් වූ කලී තෘෂ්ණාව රූපාදියෙහි ගිජුවන බැවින්) ගෙධ යැයි කියමි. මහවතුරෙකැයි ද, (දිවෙන හෙයින්) ආජවයෙකැයි ද ජල්පනයෙකැයි ද ආලම්බනයෙකැයි ද ප්‍රකම්පනයෙකැයි ද කියමි. තෙල කාමපඞ්කය තෙමෙ ඉක්මැවිය නො හැක්කේ යි.

**ගෙධං බ්‍රෑමි මහොඝොති** – 'ගෙධො' වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; 'මහොඝො' වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **ගෙධං බ්‍රෑමි මහොඝොති**'ති ගෙධං මහොඝොති බ්‍රෑමි ආචික්ඛාමි දෙසෙමි පඤ්ඤපෙමි පට්ඨපෙමි විවරාමි විභජාමි උත්තානීකරෙමි පකාසෙමීති – ගෙධං බ්‍රෑමි මහොඝොති.

**ආජවං බ්‍රෑමි ජප්පනන්ති** – 'ආජවා' වුච්චති තණ්හා: යො රාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං, 'ජප්පනා'පි වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; **ආජවං බ්‍රෑමි ජප්පනන්ති** ආජවං ජප්පනාති බ්‍රෑමි, ආචික්ඛාමි -පෙ- උත්තානීකරොමි, පකාසෙමීති – ආජවං බ්‍රෑමි ජප්පනං.

**ආරම්මණං පකම්පනන්ති** – ආරම්මණම්පි වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; පකම්පිතම්පි වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලන්ති – ආරම්මණං පකම්පනං.

**කාමපඞ්කො දුරච්චයොති** – කාමපඞ්කො කාමකද්දමො කාමකිලෙසො කාමපලිපො කාමපලිබොධො දුරච්චයො දුරතිවත්තො දුත්තරො දුප්පතරො දුස්සමතික්කමො දුබ්බීතිවත්තොති – කාමපඞ්කො දුරච්චයො.

තෙනාහ භගවා:

"ගෙධං බ්‍රෑමි මහොඝොති ආජවං බ්‍රෑමි ජප්පනං,
ආරම්මණං පකම්පනං කාමපඞ්කො දුරච්චයො"ති.

## 15 – 12

සච්චා අවොක්කම්ම[1] මුනි ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො,
සබ්බං සො[2] පටිනිස්සජ්ජ ස වෙ සන්තො'ති වුච්චති.

**සච්චා අවොක්කම්ම මුනීති** – සච්චවාචාය අවොක්කමන්තො සම්මාදිට්ඨියා අවොක්කමන්තො අරියා අට්ඨඞ්ගිකා මග්ගා අවොක්කමන්තො මුනී'ති 'මොනං' වුච්චති ඤාණං -පෙ- සඞ්ගජාලමතිච්ච සො මුනී'ති – සච්චා අවොක්කම්ම මුනි.

**ථලෙ තිට්ඨති බ්‍රාහ්මණොති** – 'ථලං' වුච්චති අමතං නිබ්බානං: යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. **බ්‍රාහ්මණොති** සත්තන්නං ධම්මානං බාහිතත්තා බ්‍රාහ්මණො -පෙ- අසිතො තාදි පවුච්චතෙ ස බ්‍රහ්මා. **ථලෙ තිට්ඨති බ්‍රාහ්මණොති** ථලෙ තිට්ඨති, දීපෙ තිට්ඨති, තාණෙ තිට්ඨති, ලෙණෙ තිට්ඨති, සරණෙ තිට්ඨති, අභයෙ තිට්ඨති, අච්චුතෙ තිට්ඨති, අමතෙ තිට්ඨති, නිබ්බානෙ තිට්ඨතීති – ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො.

---

1. අවොක්කම්ම – සු, ස. 2. සබ්බසො – මජ්ඣ.

**ගෙධං බ්‍රෑමි මහොඝොති** – 'ගෙධ'යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් අධික රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. 'මහොඝ' යි තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුසලමූලයෙක් වේ ද එය යි. **ගෙධං බ්‍රෑමි මහොඝොති**– ගෙධය මහෞඝ යැයි කියමි, පවසමි, දෙසමි, පනවමි, පිහිටුවමි, විවරණය කරමි, විභාග කරමි, ප්‍රකට කරමි, ප්‍රකාශ කෙරෙමි නුයි 'ගෙධං බ්‍රෑමි මහොඝොති' යනු වේ.

**ආජවං බ්‍රෑමි ජප්පනං** – 'ආජවා'යි තෘෂ්ණාව කියනු ලබයි: යම් රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුසශලමූලයෙක් වේ ද එය යි. 'ජප්පනා'යි තෘෂ්ණාව කියනු ලබයි: යම් රාගයෙක්. අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. **ආජවං බ්‍රෑමි ජප්පනං** – ආජවය 'ජප්පනා' යැයි කියමි, පවසමි...ප්‍රකට කරමි, ප්‍රකාශ කෙරෙමි නුයි 'ආජවං බ්‍රෑමි ජප්පනං' යනු වේ.

**ආරම්මණං පකම්පනං** – 'ආරම්මණ'යි ද තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. 'පකම්පන' යි ද තෘෂ්ණාව කියනු ලැබෙයි: යම් රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශල මූලයෙක් වේ ද එය නුයි 'ආරම්මණං පකම්පනං' යනු වේ.

**කාමපඞ්කො දුරච්චයො** – කාම නැමති මඩ කාමකද්දමය කාමක්ලේශය කාමලෙපය කාමපරිරොධය පසු කල නො හැක්ක, ඉක්මැවිය නො හැක්ක, තරණය – ප්‍රතරණය – සමතික්‍රමණය ව්‍යතික්‍රමණය කල නො හැක්කේ නුයි 'කාමපඞ්කො දුරච්චයො' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**"ගෙධං බ්‍රෑමි මහොඝොති** –පෙ– **කාමපඞ්කො දුරච්චයො"**යි

## 15 – 12

සත්‍යයෙන් නො ඉක් මැ සිටිනා වූ මුනි වූ ඒ ක්ෂීණාස්‍රව බ්‍රාහ්මණ තෙම නිර්වාණස්ථලයෙහි සිටී. හෙතෙම එකාන්තයෙන් සියලු ආයතනයන් දුරලා (සිටියේ) ශාන්ත වූයේ යයි කියනු ලැබේ.

**සච්චා අවොක්කම්ම මුනි** – සත්‍යවචනයෙන් නො ඉක්මෙනුයේ සම්‍යග්දෘෂ්ටියෙන් නො ඉක්මෙනුයේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයෙන් නො ඉක්මෙනුයේ; මුනි යනු: 'මොන'යි ඥානය කියනු ලැබෙයි...සඞ්ගජාලය ඉක්මවා හෝ මුනි වූයේ නුයි 'සච්චා අවොක්කම්ම මුනි' යනු වේ.

**ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො** – 'ථල'යි අමාමහනිවන කියනු ලැබෙයි: යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරලීමෙක් තෘෂ්ණාව ක්ෂය වීමෙක් විරාගයෙක් නිරොධයෙක් නිර්වාණයෙක් වේ ද එය යි. **බ්‍රාහ්මණො** යනු: සප්ත ධර්ම කෙනකුන් බාහිත වන බැවින් බ්‍රාහ්මණ යැ...නාදී වූ හෙතෙම බ්‍රාහ්මණ යයි කියනු ලැබේ. **ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො** යනු: ස්ථලයෙහි සිටී, ද්වීපයෙහි සිටී, ත්‍රාණයෙහි සිටී, ලෙණයෙහි සිටී, සරණයෙහි සිටී; අභයයෙහි සිටී, අච්‍යුතයෙහි සිටී, අමෘතයෙහි සිටී, නිර්වාණයෙහි සිටී නුයි 'ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො' යනු වේ.

**සබ්බං සො පටිනිස්සජ්ජාති** – 'සබ්බං' වුච්චති ද්වාදසායතනානි: චක්ඛුඤ්චෙව රූපා ච –පෙ– මනො චෙව ධම්මා ච; යතො අජ්ඣත්තික බාහිරෙසු ආයතනෙසු ඡන්දරාගො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො; එත්තාවතාපි සබ්බං චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං. යතො තණ්හා ච දිට්ඨි ච මානො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතාපි සබ්බං චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨං, යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභි-සඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලා-වත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා. එත්තාවතාපි සබ්බං චත්තං හොති වන්තං මුත්තං පහීනං පටිනිස්සට්ඨන්ති – සබ්බං සො පටිනිස්සජ්ජ.

**ස වෙ සන්තොති වුච්චතීති** – සො සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති වුච්චති කථීයති භණීයති දීපීයති වොහරී-යතීති – ස වෙ සන්තොති වුච්චති.

තෙනාහ භගවා:

"සච්චා අවොක්කම්ම මුනි ථලෙ තිට්ඨති බ්‍රාහ්මණො,
සබ්බං සො පටිනිස්සජ්ජ ස වෙ සන්තොති වුච්චතී"ති.

## 15 – 18

ස වෙ විද්වා ස වෙදගූ ඤත්වා ධම්මං අනිස්සිතො,
සම්මා සො ලොකෙ ඉරියානො න පිහෙතීධ කස්සචි.

**ස වෙ විද්වා ස වෙදගූති** – 'විද්වා'ති විද්වා විජ්ජාගතො ඤාණී විභාවී මෙධාවී; 'වෙදගූ'ති වෙදා වුච්චන්ති චතූසු මග්ගෙසු ඤාණං –පෙ– සබ්බවෙදනාසු වීතරාගො සබ්බං වෙදමතිච්ච වෙදගූ සොති – ස වෙ විද්වා ස වෙදගූ.

**ඤත්වා ධම්මං අනිස්සිතොති** – 'ඤත්වා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා: 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා, 'සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති –පෙ– යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්ම'න්ති ඤත්වා ජානිත්වා තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා; අනිස්සිතොති ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච –පෙ– අයං තණ්හා-නිස්සයො –පෙ– අයං දිට්ඨිනිස්සයො. තණ්හානිස්සයං පහාය දිට්ඨිනිස්සයං පටිනිස්සජ්ජිත්වා චක්ඛුං අනිස්සිතො සොතං අනිස්සිතො – ඝානං අනිස්සිතො –පෙ– දිට්ඨ – සුත – මුත – විඤ්ඤාතබ්බෙ ධම්මෙ අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො විප්ප-මුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතීති – ඤත්වා ධම්මං අනිස්සිතො.

**සබ්බං සො පටිනිස්සජ්ජ** – 'සබ්බං'යි ද්වාදශායතන කියනු ලැබෙයි: ඇස ද රූපයෝ ද...මනස ද ධර්මයෝ දැයි. යම් තැනෙක සිට ආධ්‍යාත්මික බාහ්‍යායතනයන්හි ඡන්දරාගය ප්‍රහීණ වූයේ උපුත් මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරන ලද්දේ අනුඅභාවය කරන ලද්දේ අනාගතයෙහි නූපදනා සැහැවි ඇතියේ වෙයි; මෙතෙකින් දු සියල්ල ත්‍යාග කරන ලද්දේ වමනය කරන ලද්දේ මුදන ලද්දේ ප්‍රහීණ කරන ලද්දේ දුරලන ලද්දේ වෙයි. යම් තැනෙක සිට තෘෂ්ණාව ද දෘෂ්ටිය ද මානය ද ප්‍රහීණ වූවාහු උපුත් මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මතු නූපදනා සැහැවි ඇත්තාහු වෙත් ද, මෙතෙකින් දු සියල්ල ත්‍යක්ත – වාන්ත – මුක්ත – ප්‍රහීණ – ප්‍රතිනිසෘෂ්ට වේ ද. යම් තැනෙක සිට පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද ප්‍රහීණ වූවාහු උපුත් මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු අනභාවය කරන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින් දු සියල්ල ත්‍යක්ත වූයේ වාන්ත වූයේ මුක්ත වූයේ ප්‍රහීණ වූයේ දුරලන ලද්දේ වේ නුයි 'සබ්බං සො පටිනිස්සජ්ජ' යනු වේ.

**ස වෙ සන්තො ති වුච්චති** – හෙතෙම ශාන්ත යැ උපශාන්ත යැ වෙසෙසින් සන්හිඳුණේ යැ නිවුණේ යැ (ඵලයෙන්) පටිපස්සම්භිත වූයේ යයි කියනු ලැබෙයි, පවසනු ලැබෙයි, බණනු ලැබෙයි, දක්වනු ලැබෙයි, වහරනු ලැබේ නුයි 'ස වෙ සන්තො'ති වුච්චති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"සච්චා අවොක්කම්ම මුනි -පෙ- ස වෙ සන්තොති වුච්චති"යි**

## 15 – 13

අනිත්‍යාදිවශයෙන් සංස්කෘත ධර්මයන් දැන තෘෂ්ණා – දෘෂ්ටිනිඃශ්‍රය රහිත වූ හෙතෙම ඒකාන්තයෙන් පණ්ඩිත වූයේ වෙයි. හෙතෙම සතර මාර්ගඥානවෙදයට පැමිණියේ වෙයි. හෙතෙම සත්ත්වලොකයෙහි මැනැවින් ඉරියවු පවත්වනුයේ මෙලොව, කිසිවකුට ත් තෘෂ්ණා නො කෙරේ.

**ස වෙ විද්වා ස වෙදගූ** – 'විද්වා' යනු: විද්වත් වූයේ විඥවට පැමිණියේ නුවණැත්තේ විමංසන ප්‍රඥ ඇත්තේ ධාරණ ප්‍රඥ ඇත්තේ; **වෙදගූ** යනු: යැයි සතර මාර්ගඥානය වෙදයෝ කියනු ලැබෙති,...සියලු ශාස්ත්‍රවෙදය ඉක්මවා සියලු වෙදනාවන්හි පහවූ ඡන්දරාග ඇති හෙතෙම වෙදගූ වේ යයි 'ස වේ විද්වා ස වෙදගූ' යනු වේ.

**ඤත්වා ධම්මං අනිස්සිතො** – 'ඤත්වා' යනු: දැන දැනැගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට: 'සියලු සංස්කාරයෝ අනිත්‍යයෝ යැ'යි දැන දැනැගෙන තුලනය – තීරණය – විභාවනය – විභූත කොට, 'සියලු සංස්කාරයෝ දුක් වූහ'යි...යම් කිසිවක් සමුදයධර්ම නම් ඒ සියල්ල නැසෙන සුලු යැ යි දැන දැනගෙන තුලනය කොට තීරණය කොට විභාවන කොට විභූත කොට, **අනිස්සිතො** යනු: නිඃශ්‍රය දෙකෙකි: තෘෂ්ණානිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය ද'යි,.. මේ දෘෂ්ටිනිඃශ්‍රය යි, තෘෂ්ණානිශ්‍රය හැරදමා, දෘෂ්ටිනිශ්‍රය දුරලා, ඇස ඇසුරු නො කෙළේ – කන ඇසුරු නො කෙළේ – නැහැය ඇසුරු නො කෙළේ...දෘෂ්ට – ශ්‍රැත – මුත – විඥාතව්‍යධර්මයන් (තෘෂ්ණා දෘෂ්ටි විසින්) අනිඃශ්‍රිත වූයේ නො ඇලුණේ නො පැමිණියේ නො පිවිසියේ නො බැසගත්තේ (එයින්) නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ විගතමර්යාදා කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'ඤත්වා ධම්මං අනිස්සිතො' යනු වේ.

**සම්මා සො ලොකෙ ඉරීයානොති** – යතො අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු ඡන්දරාගො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො අනභාවකතො ආයතිං අනුප්පාදධම්මො, එත්තාවතාපි සම්මා ලොකෙ චරති ඉරීයති වත්තති පාලෙති යපෙති යාපෙති; යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්න-මූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතාපි සම්මා ලොකෙ චරති විහරති ඉරීයති වත්තති පාලෙති යපෙති යාපෙතීති– සම්මා සො ලොකෙ ඉරීයානො,

**න පිහෙතීධ කස්සචීති** – 'පිහා' වුච්චති තණ්හා: යො රාගො සාරාගො –පෙ– අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්සෙසා පිහා තණ්හා පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා; සො කස්සචි න පිහෙති ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සස්ස වා සුද්දස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා දෙවස්ස වා මනුස්සස්ස වාති– න පිහෙතීධ කස්සචි.

තෙනාහ භගවා:

"ස වෙ වීද්වා ස වෙදගූ ඤත්වා ධම්මං අනිස්සිතො,
සම්මා සො ලොකෙ ඉරීයානො න පිහෙතීධ කස්සචී"ති.

## 15 – 14

යො ධ[1] කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං,
න සො සොචති නාජ්ඣෙති ඡින්නසොතො අබන්ධනො.

**යො ධ කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයන්ති** – 'යො'ති යො යාදිසො යථා යුත්තො[2] යථා විහිතො යථාපකාරො යංඨානප්පත්තො[3] යංධම්මසමන්නාගතො ඛත්තියො වා බ්‍රාහ්මණො වා වෙස්සො වා සුද්දො වා ගහට්ඨො වා පබ්බජිතො වා දෙවො වා මනුස්සො වා; **කාමාති** උද්දානතො[4] ද්වෙ කාමා වත්ථුකාමා ච කිලෙසකාමා ච –පෙ– ඉමෙ වුච්චන්ති වත්ථුකාමා –පෙ– ඉමෙ වුච්චන්ති කිලෙසකාමා. **සඞ්ගාති** සත්ත සඞ්ගා: රාගසඞ්ගො දොසසඞ්ගො මොහසඞ්ගො මානසඞ්ගො දිට්ඨිසඞ්ගො කිලෙසසඞ්ගො දුච්චරිතසඞ්ගො. **ලොකෙති** අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙ; **සඞ්ගං ලොකෙ දුරච්චයන්ති** යො[5] කාමෙ ච සඞ්ගෙ ච ලොකෙ දුරච්චයෙ දුරතිවත්තෙ දුත්තරෙ දුප්පතරෙ දුස්සමතික්කමෙ දුබ්බීතිවත්තෙ[6] අතරි උත්තරි පතරි සමතික්කමි වීතිවත්තයීති – යො ච කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං.

---

1. යො ච - මුසි. II. 2. යථා වුත්තො - සීමු. II. 3. යණ්ඨානප්පත්තො - සීමු II.
4. උද්දානතො - සීමු. II. 5 සො - සීමු. II.
6. දුබ්බීතිවත්තො - සීමු II. PTS.

**සම්මා සො ලොකෙ ඉරියානො** – යම් තැනෙක සිට ආධ්‍යාත්මික බාහ්‍යායතනයන්හි ඡන්දරාගය ප්‍රහීණ වූයේ වේ ද, උපුත් මුල් ඇත්තේ තාලවස්තුවක් මෙන් කරන ලද්දේ අභාවය කරන ලද්දේ මතු නූපදනා සැහැවි ඇත්තේ වේ ද, මෙතෙකිනු දු මනාකොට ලොකයෙහි හැසිරෙයි, ඉරියව් පවත්වයි, වැටෙයි, රැකෙයි යැපෙයි යාපනය වේ. යම් තැනෙක සිට පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද ප්‍රහීණ වෙත් ද, උපුත් මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කළාහු අභාවය කළාහු මතු නූපදනා සැහැවි ඇත්තාහු වෙත් ද, මෙතෙකිනු දු ලොවැ මැනැවින් හැසිරෙයි, වෙසෙයි, ඉරියව් පවත්වයි, වැටෙයි, රැකෙයි යැපෙයි යාපනය වේ නුයි 'සම්මා සො ලොකෙ ඉරියානො' යනු වේ.

**න පිහෙතීධ කඤ්චි** – 'පිහා'යි තෘෂ්ණාව කියනු ලබයි: යම් රාගයෙක් අභිකරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශල මූලයෙක් වේ ද එය යි; යමක්හු විසින් තෙල පිහා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී නසන ලද්දී සන්හිඳුවන ලද්දී දුරලන ලද්දී අභව්‍යෝත්පත්තික වූවා ඥානාග්නීන් දවන ලද්දී ද, හෙතෙම ක්ෂත්‍රියයකුට හෝ බමුණකුට හෝ වෛශ්‍යයකුට හෝ ශූද්‍රයකුට හෝ ගිහියකුට හෝ පැවිද්දකුට හෝ දෙවියකුට හෝ මිනිසකුට හෝ කිසිවකුට ත් තෘෂ්ණා නො කෙරේ නුයි 'න පිහෙතීධ කඤ්චි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ස වෙ විද්වා ස වෙදගූ -පෙ- න පිහෙතීධ කඤ්චී"යි

## 15 – 14

මේ සත්ත්වලොකයෙහි යමෙක් වස්තුකාමක්ලේශකාමයන් ද ඉක්මැවීමට දුෂ්කර වූ රාගාදි සඞ්ගය ද ඉක්මැවී නම්, සිඳින ලද තෘෂ්ණා ඇති රාගාදි බන්ධන රහිත වූ හෙතෙම ශොක නො කෙරෙයි, නො සිතයි.

**යො ච කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං** – 'යො' යනු යම්බඳු යම් යොග ඇති (නවකම් ආදියෙන්) යථාවිහිත වූ යම් ප්‍රකාර ඇති යම් තනතුරකට පැමිණි යම් ධර්මයකින් යුක්ත වූ ක්ෂත්‍රියයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ වෛශ්‍යයෙක් හෝ ශූද්‍රයෙක් හෝ ගිහියෙක් හෝ පැවිද්දෙක් හෝ දෙවියෙක් හෝ මිනිසෙක් හෝ; **කාම** නම්: විස්තර හෙයින් වස්තුකාමයෝ ද ක්ලේශකාමයෝ දැ'යි කාමයෝ දෙදෙනෙකි:... මොහු ක්ලේශකාමයෝ යයි කියනු ලැබෙත්. **සඞ්ග** නම්: සඞ්ගයෝ සතෙකි: රාගසඞ්ග යැ ද්වේෂ - මෝහ - මාන - දෘෂ්ටි - ක්ලේශ - දුශ්චරිතසඞ්ග යැයි. **ලොකෙ** යනු: අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි; දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි; **සඞ්ගං ලොකෙ දුරච්චයං** යමෙක් ලොවැ පසු කළ නො හැකි, ඉක්මැවියැ නො හැකි, තරණය කළ නො හැකි වෙසෙසින් තරණය කළ නො හැකි, දුකසේ ඉක්මැවියැ යුතු, දුකසේ නැවැත්වියැ යුතු කාමයන් ද සඞ්ගයන් ද තරණය කෙළේ උත්තරණය කෙළේ ඉක්මැ වූයේ වෙසෙසින් නැවැත්වී නුයි 'යො ච කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං' යනු වේ.

**න සො සොචති නාජ්ඣෙතීති** - විපරිණතං වත්ථුං න සොචති; විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති; 'චක්ඛුං මෙ[1] - විපරිණත'න්ති න සොචති; සොතං මෙ - ඝානං මෙ - ජිව්හා මෙ - කායො මෙ - රූපා මෙ - සද්දා මෙ - ගන්ධා මෙ - රසා මෙ - ඵොට්ඨබ්බා මෙ - කුලං - මෙ ගණො මෙ - ආවාසො මෙ - ලාභො මෙ - යසො මෙ - පසංසා මෙ - සුඛං මෙ - චීවරං මෙ - පිණ්ඩපාතො මෙ - සෙනාසනං මෙ - ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරා මෙ - මාතා මෙ - පිතා මෙ - භාතා මෙ - භගිනී මෙ - පුත්තො මෙ - ධීතා මෙ - මිත්තා මෙ - අමච්චා මෙ - ඤාතී මෙ - සාලොහිතා මෙ විපරිණතා'ති 'න සොචති,' න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති න සොචති; **නාජ්ඣෙතීති** - නාජ්ඣෙති න අජ්ඣෙති න උපනිජ්ඣායති, න නිජ්ඣායති, න පජ්ඣායති, අථවා න ජායති න ජීයති න මීයති න චවති න උපපජ්ජතීති නාජ්ඣෙතීති - 'න සො සොචති නාජ්ඣෙති.

**ඡින්නසොතො අබන්ධනොති** - 'සොතා' වුච්චති තණ්හා: යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්සෙසා සොතා තණ්හා පහීනා සමුච්ඡින්නා -පෙ- ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති ඡින්නසොතො; **අබන්ධනොති** රාගබන්ධනං දොසබන්ධනං මොහබන්ධනං මානබන්ධනං දිට්ඨිබන්ධනං කිලෙසබන්ධනං දුච්චරිතබන්ධනං, යස්සෙතෙ බන්ධනා පහීනා සමුච්ඡින්නා -පෙ- ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අබන්ධනොති - ඡින්නසොතො අබන්ධනො.

තෙනාහ භගවා:

> "යො 'ධ කාමෙ අච්චතරි සඞ්ගං ලොකෙ දුරච්චයං,
> න සො සොචති නාජ්ඣෙති ඡින්නසොතො අබන්ධනො"ති.

## 15 - 15

> යං පුබ්බෙ තං විසොසෙහි පච්ඡා තෙ මාහු කිඤ්චනං
> මජ්ඣෙ චෙ නො ගහෙස්සසි උපසන්තො චරිස්සසි.

**යං පුබ්බෙ තං විසොසෙහීති** - අතීතෙ සඞ්ඛාරෙ ආරබ්භ යෙ කිලෙසා උප්පජ්ජෙය්‍යුං, තෙ කිලෙසෙ සොසෙහි, විසොසෙහි, සුක්ඛාපෙහි, විසුක්ඛාපෙහි, අබීජං කරොහි, පජහ, විනොදෙහි, බ්‍යන්තීකරොහි, අනභාවං ගමෙහීති එවම්පි - යං පුබ්බෙ තං විසොසෙහි. අථවා යෙ අතීතා කම්මාභිසඞ්ඛාරා අවිපක්කවිපාකා, තෙ කම්මාභිසඞ්ඛාරෙ සොසෙහි, විසොසෙහි, සුක්ඛාපෙහි, විසුක්ඛාපෙහි, අබීජං කරොහි, පජහ, විනොදෙහි, බ්‍යන්තීකරොහි, අනභාවං ගමෙහීති එවම්පි - යං පුබ්බෙ තං විසොසෙහි.

---

1 චක්ඛු මෙ - සීමු. II. මජසං.

**න සො සොචති නාජ්ඣෙති** - විපරිණත (-පෙරළුණු) වස්තුවට ශෝක නො කෙරෙයි, වස්තුව විපරිණත කල්හි හෝ ශෝක නො කෙරෙයි, 'මාගේ ඇස පෙරළුණු'යි ශෝක නො කෙරෙයි, මාගේ කන - මාගේ නැහැය - මාගේ දිව - මාගේ කය - මාගේ රූපයෝ - මාගේ ශබ්දයෝ - මාගේ ගන්ධයෝ - මාගේ රසයෝ - මාගේ ස්ප්‍රෂ්ටව්‍යයෝ - මාගේ කුලය මාගේ ගණයා - ආවාසය - ලාභය - යශස - ප්‍රශංසාව - සුවය - සිවුරු-පිණ්ඩපාතය - සෙනසුන - ගිලන්පසබෙහෙත්පිරිකර - මාගේ මව-පියා - බෑයා - බූනැණියා - පුත්‍රයා - දියණිය - - මිත්‍රයෝ - සගයෝ - නෑයෝ මාගේ සහලේනෑයෝ නැසුණාහ'යි ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මෝහයට නො පැමිණේ නුයි 'න සොචති' යනු වේ. **නාජ්ඣෙති** යනු: නො සිතයි, 'සම්පව නො සිතයි, අනෙකප්‍රකාරයෙන් නො සිතයි, අතිශයින් නො සිතයි; නොහොත් නූපදී, නො දිරයි, නො මැරෙයි, ච්‍යුත නො වෙයි, ප්‍රතිසන්ධියට නො පැමිණේ යයි නො සිතා නුයි 'න සො සොචති නාජ්ඣෙති' යනු වේ.

**ඡින්නසොතො අබන්ධනො** - 'සොතා'යි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාගයෙක් බලවත් රාගයෙක්...අභිධ්‍යාවක් ලෝභ සඞ්ඛ්‍යාත අකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල 'සොත' නම් වූ තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී ද; හෙතෙම 'ඡින්නසොත'යි කියනු ලැබෙයි. **අබන්ධනො** යනු: රාගබන්ධන යැ ද්වේෂබන්ධන යැ මෝහබන්ධන යැ මානබන්ධන යැ දෘෂ්ටිබන්ධන යැ කෙලශබන්ධන යැ දුශ්චරිතබන්ධන යැ යන තෙල බන්ධනයෝ යමක්හු විසින් ප්‍රහීණ කරන ලද්දාහු ද සමුච්ඡින්න වූවාහු ද... ඥානාග්නීන් දවන ලද්දාහු ද; හෙතෙම 'අබන්ධන' යයි කියනු ලැබේ නුයි 'ඡින්නසොතො අබන්ධනො' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"යො ච කාමෙ අච්චතරි -පෙ- ඡින්නසොතො අබන්ධනො"යි.

**15 - 15**

අතීත සංස්කාරයන් ඇරැබැ උපදනා යම් කෙලශජාතයෙක් වේ නම් එය වියළව. අනාගත සංස්කාරයන් අරැබැ උපදනා රාගාදි කිඤ්චනය නගමක් තට නොවේවා. ඉදින් වර්තමානයෙහි රූපාදි සංස්කාරයන් තෘෂ්ණා දෘෂ්ටිවශයෙන් නො ගන්නෙහි නම්, උපශාන්ත වැ හැසිරෙන්නෙහි ය.

**යං පුබ්බෙ තං විසොසෙහි** - අතීත සංස්කාරයන් අරබයා යම් කෙලෙස් කෙනෙක් උපදනාහු නම්, ඒ කෙලෙසුන් වියළව, මෙසෙසින් වියළව, නීරස කරව වෙසෙසින් නීරස කරව, බොල් කරව, දුරු කරව, බැහැර කරව, විනාශාන්ත කරව, අනුඅභාවයට පමුණුව'යි මෙසේ ත් - 'යං පුබ්බෙ තං විසොසෙහි' යනු වේ. නොහොත් අතීත වූ නො මුකල විපාක ඇති යම් කර්මාභිසංස්කාර කෙනෙක් වෙත් නම්, ඒ කර්මාභිසංස්කාරයන් ශෝෂණ විශෝෂණ කර, ශුෂ්ක විශුෂ්ක කර, බොල් කර, දුරු කර, බැහැර කර විශාන්ත කර, අනාභාවයට පමුණුවාල'යි; මෙසේත් - යං 'පුබ්බෙ තං විසොසෙහි' යනු වේ.

**පච්ඡා තෙ මාහු කිඤ්චනන්ති** – ‘පච්ඡා’ වුච්චති අනාගතං; අනාගතෙ සඞ්ඛාරෙ ආරබ්භ යානි උප්පජ්ජෙය්‍යුං රාගකිඤ්චනං දොසකිඤ්චනං මොහකිඤ්චනං මානකිඤ්චනං දිට්ඨිකිඤ්චනං කිලෙසකිඤ්චනං දුච්චරිතකිඤ්චනං, ඉමානි කිඤ්චනානි තුය්හං මා අහු, මා පාතුරකාසි, මා ජනෙහි, මා සඤ්ජනෙහි, මා නිබ්බත්තෙහි, මා අභිනිබ්බත්තෙහි, පජහ, විනොදෙහි, බ්‍යන්තීකරෙහි, අනභාවං ගමෙහීති – පච්ඡා තෙ මාහු කිඤ්චනං.

**මජ්ඣෙ චෙ නො ගහෙස්සසීති** – ‘මජ්ඣං’ වුච්චති පච්චුප්පන්නා රූපා වෙදනා සඤ්ඤා සඞ්ඛාරා විඤ්ඤාණං, පච්චුප්පන්නෙ සඞ්ඛාරෙ තණ්හාවසෙන දිට්ඨිවසෙන න ගහෙස්සසි, න උග්ගහෙස්සසි, න ගණ්හිස්සසි, න පරාමසිස්සසි, නාභිවදිස්සසි, න අජ්ඣොසිස්සසි, අභිනන්දනං අභිවදනං අජ්ඣොසානං ගාහං පරාමාසං අභිනිවෙසං පජහිස්සසි, විනොදෙස්සසි, බ්‍යන්තීකරිස්සසි, අනභාවං ගමෙස්සසීති – මජ්ඣෙ චෙ නො ගහෙස්සසි.

**උපසන්තො චරිස්සසීති** – රාගස්ස සන්තත්තා සමිතත්තා උපසමිතත්තා දොසස්ස සන්තත්තා සමිතත්තා උපසමිතත්තා –පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා උපසමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධො චරිස්සසි විහරිස්සසි ඉරියිස්සසි වත්තිස්සසි පාලෙස්සසි යපිස්සසි යාපෙස්සසීති – උපසන්තො චරිස්සසි.

තෙනාහ භගවා:

“යං පුබ්බෙ තං විසොසෙහි පච්ඡා තෙ මා’හු කිඤ්චනං,
මජ්ඣෙ චෙ නො ගහෙස්සසි උපසන්තො චරිස්සසී”ති.

## 15 – 16

සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං,
අසතා ච න සොචති ස වෙ ලොකෙ න ජීයති.

**සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතන්ති** – ‘සබ්බසො’ති සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අසෙසං නිස්සෙසං පරියාදියනවචනමෙතං ‘සබ්බසො’ති. **නාමන්ති** චත්තාරො අරූපිනො ඛන්ධා; **රූපන්ති** චත්තාරො ච මහාභූතා චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං; **යස්සාති** අරහතො ඛීණාසවස්ස; **මමායිතන්ති** ද්වෙ මමත්තා: තණ්හාමමත්තඤ්ච දිට්ඨිමමත්තඤ්ච –පෙ– ඉදං තණ්හාමමත්තං –පෙ– ඉදං දිට්ඨිමමත්තං. **සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතන්ති** – සබ්බසො නාමරූපස්මිං මමත්තා යස්ස නත්ථි න සන්ති න සංවිජ්ජන්ති නුපලබ්භන්ති පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති – සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං.

**පච්ඡා තෙ මාහු කිඤ්චනං** – 'පච්ඡා'යි අනාගතය කියනු ලැබෙයි. අනාගත සංස්කාරයන් අරබයා රාගකිඤ්චනය ද්වේෂ – මෝහ – මාන – දෘෂ්ටි – ක්ලේශ – දුශ්චරිතකිඤ්චනය යන යම් ධර්ම කෙනෙක් උපදනාහු නම්, මේ කිඤ්චනයෝ තට නහමක් වෙත්වා, නහමක් පහළ කර, නූපදව, නො හටගත්වව, නො නිපදව, වෙසෙසින් නො නිපදව, දුරු කර, බැහැර කර, විගතාන්ත කර, අනභාවයට පමුණුවාල'යි 'පච්ඡා තෙ මාහු කිඤ්චනං' යනු වේ.

**මජ්ඣෙ චෙ නො ගහෙස්සසි** – 'ප්‍රත්‍යුත්පන්න වූ රූප – වේදනා – සංඥා සංස්කාර – විඥානයෝ 'මජ්ඣ'යි කියනු ලැබෙති. වර්තමාන සංස්කාරයන් තෘෂ්ණාවශයෙන් දෘෂ්ටිවශයෙන් නො ගන්නෙහි, දැඩිව නො ගන්නෙහි, ග්‍රහණය නො කරන්නෙහි, නො දැහැගන්නෙහි, නො සතුටු වන්නෙහි, නො කියන්නෙහි, නො සිතන්නෙහි, අභිනන්දනය අභිවදනය අධ්‍යවසානය ග්‍රාහය පරාමර්ශය අභිනිවේශය දුරු කරන්නෙහි, බැහැර කරන්නෙහි, විගතාන්ත කරන්නෙහි, අනභාවයට පමුණුවන්නෙහි යයි 'මජ්ඣෙ චෙ නො ගහෙස්සසි' යනු වේ.

**උපසන්තො චරිස්සසි** – රාගය නිවුණු බැවින් සන්හිඳුණු බැවින් වෙසෙසින් සන්හිඳුණු බැවින්, ද්වේෂය ශාන්ත බැවින් ශමිත බැවින් උපශමිත බැවින්... සියලු අකුශලාභිසංස්කාරයන් නිවුණු බැවින් සන්හිඳුණු බැවින් උපශමිත බැවින් ව්‍යුපශමිත බැවින් දවන ලද බැවින් නිවන ලද බැවින් විගත බැවින් දුරලන ලද බැවින් ශාන්ත වැ උපශාන්ත වැ ව්‍යුපශාන්ත වැ නිවුණේ සැහැල්ලු වැ හැසිරෙන්නෙහි වෙසෙන්නෙහි ඉරියවු පවත්වන්නෙහි වැටෙන්නෙහි රකෙන්නෙහි යැපෙන්නෙහි යාපනය වන්නෙහි නුයි 'උපසන්තො චරිස්සසි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යං පුබ්බෙ තං විසොසෙහි** -පෙ- **උපසන්තො චරිස්සසී"**ති

## 15 – 16

යම් රහතක් හට නම්රූ දෙකෙහි මාගේ යයි ගන්නා ලද්දෙක් හැම්ලෙසින් නැද් ද, මමායිතයක් නැති බැවින් ශෝක නො කෙරේ ද, හෙතෙම එකාන්තයෙන් ලොවැ පිරිහීමට නො පැමිණේ.

**සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං** – 'සබ්බසො' යනු: සියල්ලෙන් සියල්ල සර්වථායෙන් සියල්ල අශේෂ කොට නිශ්ශේෂ කොට ගන්නා වචනයෙකි මෙල 'සබ්බසො' යනු. නාම නම්: සතර අරූපීස්කන්ධයෝ යැ; රූප නම්: සතර මහාභූතයෝ ද සතර මහාභූතයන් නිසා පවත්නා රූපය ද (යන අටවිසි රූපය යැ); යස්ස යනු: රහත් ක්ෂීණාස්‍රව හට, මමායිතං යනු: මමත්ව දෙකෙකි: තෘෂ්ණාමමත්වය ද, දෘෂ්ටිමමත්වය ද'යි... මේ දෘෂ්ටිමමත්වය යි. සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං– සර්වප්‍රකාරයෙන් නාමරූපයෙහි මමත්වයෝ යමක් හට නැද්ද, නො වෙත් ද, අවිද්‍යමාන වෙත් ද, නො ලැබෙත් ද, ප්‍රහීණ වූවාහු නසන ලද්දාහු සන්හිඳුණාහු දුරලන ලද්දාහු අභව්‍යෝත්පත්තික වූවාහු ඥානාග්නීන් දවන ලද්දාහු නුයි 'සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං' යනු වේ.

**අසතා ච න සොචතීති** – විපරිණතං වා වත්ථුං න සොචති, විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති: 'චක්ඛුං මෙ විපරිණත'න්ති න සොචති, සොතං මෙ – ඝානං මෙ – ජිව්හා මෙ – කායො මෙ – රූපා මෙ – සද්දා මෙ – ගන්ධා මෙ – රසා මෙ – ඵොට්ඨබ්බා මෙ – කුලං මෙ – ගණො මෙ – ආවාසො මෙ – ලාභො මෙ -පෙ- ඤාතිසාලොහිතා මෙ විපරිණතා'ති න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති එවම්පි අසතා ච න සොචති. අථවා අසතාය දුක්ඛාය වෙදනාය ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති එවම්පි අසතා ච න සොචති. අථවා චක්ඛුරොගෙන ඵුට්ඨො පරෙතො -පෙ- ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති එවම්පි අසතා ච න සොචති. අථවා, අසන්තෙ අසංවිජ්ජමානෙ අනුපලබ්භමානෙ 'අහු වත මෙ, තං වත මෙ නත්ථි, සියා වත මෙ, තං වතාහං න ලභාමී'ති න සොචති, න කිලමති, න පරිදෙවති, න උරත්තාළිං කන්දති, න සම්මොහං ආපජ්ජතීති එවම්පි අසතා ච න සොචති.

**ස වෙ ලොකෙ න ජීයතීති** – යස්ස 'මයිහං වා ඉදං, පරෙසං වා ඉද'න්ති කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං අත්ථි, තස්ස ජානි අත්ථි. භාසිතම්පි හෙතං:

1. "ජිණ්ණෙ රථස්සෙ[1] මණිකුණ්ඩලෙ ච
පුත්තෙ ච දාරෙ ච තථෙව ජිණ්ණෙ,[2]
සබ්බෙසු භොගෙසු අසෙවිතෙසු
කස්මා න සන්තප්පසි සොකකාලෙ?

2. පුබ්බෙ'ව මච්චං විජහන්ති භොගා
මච්චො ච තෙ පුබ්බතරං ජහාති,
අසස්සතා භොගිනො[3] කාමකාමී
තස්මා න සොචාමහං සොකකාලෙ.

3. උදෙති ආපූරති වෙති චන්දො
අත්ථං ගමිත්වාන[4] පලෙති සූරියො,
විදිතා මයා සත්තුක[5] ලොකධම්මා
තස්මා න සොචාමහං සොකකාලෙ"ති.

---

1. ජිණ්ණො රථස්සං - මජසං. ජිණ්ණො රථස්සං - PTS. 2. ජිණ්ණො - මජසං.
a. ජාතක-පඤ්චකනිපාත - මණිකුණ්ඩලජාතක.
3. අසස්සතා භාවිනො - සිමු. II. අසස්සතා භාගිනො - PTS.
4. අත්ථං තපෙත්වාන - මජසං. 5. අට්ඨක - සිමු II

**අසතා ච න සොචති** - නැසුණු වස්තුවට හෝ ශෝක නො කෙරෙයි, වස්තුව නැසුණු කල්හි හෝ ශෝක නො කෙරෙයි; 'මාගේ ඇස නැසිණැයි ශෝක නො කෙරෙයි, මාගේ කන - නැහැය - දිව - කය - රූපයෝ ශබ්දයෝ - ගන්ධයෝ - රසයෝ - ස්ප්‍රෂ්ටව්‍යයෝ - මාගේ කුලය - ගණයා- ආවාසය - මාගේ ලාභය... මාගේ නෑසහලේනෑයෝ නැසුණාහ'යි ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, මුළාවට නො පැමිණේ නුයි මෙසේත් 'අසතා ච න සොචති' යනු වේ. නොහොත් අමිහිර වූ දුඃඛවේදනාවෙන් පහස්නා ලදුයේ මඩනා ලදුයේ බැසගත්නා ලදුයේ සමන්විත වූයේ ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මෝහයට නො පැමිණේ නුයි මෙසේත් 'අසතා ච න සොචති' යනු වේ. නොහොත් චක්ෂුරෝගයෙන් පහස්නා ලදුයේ මඩනා ලදුයේ...මැසි මදුරු අව් සුළං දිග්ද පහසින් පහස්නා ලදුයේ මඩනා ලදුයේ බැසගත්නා ලදුයේ සමන්විත වූයේ ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මෝහයට නො පැමිණේ නුයි මෙසේ ත් 'අසතා ච න සොචති' යනු වේ. නොහොත් නැති කල්හි අවිද්‍යමාන කල්හි නො ලැබෙන කල්හි 'මට එකාන්තයෙන් වූයේ නම්, එය එකාන්තයෙන් මට නැත, මට එකාන්ත- යෙන් වන්නේ යැ, එය මම් නො ලබමි' ශෝක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, බලවත් මෝහයට නො පැමිණේ නුයි මෙසේ ත් 'අසතා ච න සොචති' යනු වේ.

**ස වෙ ලොකෙ න ජීයති** - යමක් හට 'මෙය මාගේ හෝ යැ, මෙය පරගේ හෝ යැ'යි ගන්නා ලද දැඩිගන්නා ලද පිවිසැගත් බැසගත් ඇතුළු වැ ගත් කිසි රූපගතයෙක් වේදනා - සංඥා - සංස්කාර - විඥානගතයෙක් ඇත් නම්, ඔහුට ජානිය ඇත. මේ කියන ලද මැ යැ:

1. රිය හා අසුන් ද මිණිකොඩොල් ද පිරිහුණු කල්හි, අඹුදරුවන් ද එසේ ම පිරිහුණු කල්හි, සියලු භෝගයන් නො සෙවුණා කල්හි, (මෙසේ) ශෝකකාලයෙහි කුමක් හෙයින් නො තැවෙහි ද?

2. භෝගයෝ හෝ මිනිසා පලමු වැ හරිති. මිනිසා හෝ ඒ භෝගයන් ඉතා පලමු වැ දුරු කෙරෙයි, එම්බා කාමකාමිය, (-කාමයන් කැමැතිවන තෙනැත්ත) කාමභෝගීහු (යම් හෙයකින්) අශාශ්වත වූවාහු ද, එහෙයින් මම (මහාජනයා) ශෝක කරන කල්හි ශෝක නො කෙරෙමි.

3. (යම් සේ) සඳ උදා වේ ද හාත්පසින් පිරේ ද යළි ගෙවේ ද, හිර (අඳුරු නසා) උදයට පැමිණ යළි අස්තයට යේ ද, එපරිද්දෙන් සතුරුකය මා විසින් ලොකධම්යෝ දන්නා ලද්දාහු ද, එහෙයින් (මහාජනයා) ශෝක කරන කල්හි මම ශෝක නො කෙරෙම් යයි.

යස්ස 'මය්හං වා ඉදං, පරෙසං වා ඉද'න්ති කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි, තස්ස ජාති නත්ථි. භාසිතම්පි හෙතං: "නන්දසි සමණාති? කිං ලද්ධා ආවුසොති? තෙන හි සමණ සොචසීති? කිං ජීයිත්ථ ආවුසොති? තෙනහි සමණ නෙව නන්දසි, න සොචසීති? එවමාවුසොති.a

4\. චිරස්සං වත පස්සාමි බ්‍රාහ්මණං පරිනිබ්බුතං,
අනන්දිං අනීඝං භික්ඛුං තිණ්ණං ලොකෙ විසත්තික"න්ති.a

'ස වෙ ලොකෙ න ජීයති.'

තෙනාහ භගවා:

"සබ්බසො නාමරූපස්මිං යස්ස නත්ථි මමායිතං,
අසතා ච න සොචති ස වෙ ලොකෙ න ජීයතී"ති.

## 15 - 17

යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං,
මමත්තං සො අසංවින්දං නත්ථි මෙති න සොචති.

**යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනන්ති** - 'යස්සා'ති අරහතො ඛීණාසවස්ස, යස්ස මය්හං වා ඉදං පරෙසං වා ඉදන්ති කිඤ්චි රූපගතං වෙදනාගතං සඤ්ඤාගතං සඞ්ඛාරගතං විඤ්ඤාණගතං ගහිතං පරාමට්ඨං අභිනිවිට්ඨං අජ්ඣොසිතං අධිමුත්තං නත්ථි, න සන්ති, න සංවිජ්ජති, නුපලබ්භති, පහීනං සමුච්ඡින්නං වූපසන්තං පටිප්පස්සද්ධං අභබ්බුප්පත්තිකං ඤාණග්ගිනා දඩ්ඪන්ති එවම්පි - යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. වුත්තං හෙතං භගවතා: "නායං භික්ඛවෙ කායො තුම්හාකං, නපි අඤ්ඤෙසං. පුරාණමිදං භික්ඛවෙ කම්මං අභිසඞ්ඛතං අභිසංචෙතයිතං වෙදනීයං දට්ඨබ්බං. තත්‍ර භික්ඛවෙ සුතවා අරියසාවකො පටිච්චසමුප්පාදං යෙව සාධුකං යොනිසො මනසි කරොති: ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති. ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති. යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා; සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො -පෙ- එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී"තිb එවම්පි යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං.

---

a. දෙවපුත්තසංයුත්ත - දුතියවග්ග. b. සංයුත්තනිකාය - කළාරඛත්තියවග්ග.

යමෙක් හට 'මේය මාගේ හෝ යැ. මේය පරාගේ හෝ යැ'යි ගන්නා ලද දෘෂ්ටිව ගන්නා ලද පිරිසැ ගන්නා ලද බැසගත්තා ලද ඇතුළු වැ ගන්නා ලද කිසි රූපගතයෙක් වේදනා - සංඥා - සංස්කාර - විඥානගතයෙක් නැත් නම්, ඔහුට ජානිය නැත. මේ කියන ලද මැ යෑ: "මහණ, සතුටු වෙහි දැ'යි, කුමක් ලැබ ද ඇවැත්නි; එසේ නම් මහණ, ශෝක කෙරෙහි දැ'යි, ඇවැත්නි; කුමක් නැසිණි දැයි; එසේ නම් මහණ නො මැ සතුටු වෙහි ශෝක නො කෙරෙහි දැයි; එසේ යැ ඇවැත්නි.

4. එකාන්තයෙන් බාහිතපාපි වූ ක්ලේශපරිනිර්වාණයෙන් පිරිනිවි තෘෂ්ණාවශයෙන් සතුටු නොවන සුලු නිදුක් වූ ලොවැ තෘෂ්ණා සඞ්ඛ්‍යාත විසත්තිකාව තරණය කළ මහණක්හු බොහෝ කලකින් දකුම්හ"යි.

'ස වෙ ලොකෙ න ජීයති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"සබ්බසො නාමරූපස්මිං -පෙ- ස වෙ ලොකෙ න ජීයතී"ති

## 15 - 17

යම් ක්ෂීණාශ්‍රවයක් හට 'මේය මාගේ යැ'යි හෝ, යම් අනුන්ගේ යැයි හෝ රූපාදි කිඤ්චනයෙක් නැත් ද, හෙතෙම තෘෂ්ණා - දෘෂ්ටි-මමත්වය නො ලබනුයේ මට මේය නැතැයි ශෝක නො කෙරේ.

යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වා'පි කිඤ්චනං - 'යස්ස' යනු: අහිත් ක්ෂීණාශ්‍රව හට; යමක් හට 'මේය මාගේ හෝ යැ, මේය පරාගේ හෝ යැයි ගන්නා ලද දෘෂ්ටිව ගන්නා ලද පිවිසැගත් බැසගත්තා ලද ඇතුළු වැ ගන්නා ලද කිසි රූපගතයෙක් වේදනා - සංඥා - සංස්කාර-විඥානගත-යෙක් නැත් ද, නො වේ ද, විද්‍යමාන නො වේ ද, නො ලැබේ ද, ප්‍රහීණ වූයේ සමුච්ඡින්න වූයේ සන්හිඳුණේ දුරලන ලද්දේ උපතට නුසුදුසු වූයේ නුවණ ගින්නෙන් දවන ලද්දේ නුයි මෙසේත් 'යස්ස නත්ථි ඉදං මෙ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ. තෙල වදාරන ලද මැ ය බුදුන් විසින්: "මහණෙනි, මේ කය තොපගේ නො වෙයි, අනුන්ගේ නො ද වෙයි. මහණෙනි, මේ කර්මයෙන් සකස් කළ සිතින් රැස් කළ වේදනීය වූ පුරාණ කර්මය'යි දතයුතු යැ. මහණෙනි, එහි ලා ශ්‍රුතවත් ආර්යශ්‍රාවක තෙමේ ප්‍රතීත්‍යසමුත්පාදය මැ මනා කොට නුවණින් මෙනෙහි කෙරෙයි: "මෙසේ මේ ධර්මය ඇති කල්හි මේය වෙයි, මොහුගේ ඉපදීමෙන් මේය උපදී, මේ ධර්මය නැති කල්හි මේය නො වෙයි, මොහුගේ නිරෝධයෙන් මේය නිරුද්ධ වෙයි; ඒ මෙසේ යැ: 'අවිද්‍යාව හෙතු කොට (එකුන් තිස් ත්‍රෛභූමක කුශලාකුශලචේතනා සඞ්ඛ්‍යාත) සංස්කාරයෝ පහළ වෙති, සංස්කාරයන් හෙතු කොට දෙතිස් ලෞකික විපාක විඥානය පහළ වෙයි... මෙසේ මේ හුදු දුක්රැස පහළ වෙයි. යම් අවිද්‍යාවගේ මැ අශේෂ-විරාගනිරෝධයෙන් කුශලාකුශලසංස්කාරයන්ගේ නිරෝධය වෙයි,... මෙසේ මේ හුදු දුක්රැස නිරුද්ධ වේ යැ"යි. මෙසේත් 'යස්ස නත්ථි ඉදං මෙ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ.

වුත්තම්පි හෙතං භගවතා:

1. "සුඤ්ඤතො ලොකං අවෙක්ඛස්සු
මොඝරාජ සදා සතො,
අත්තානුදිට්ඨිං ඌහච්ච
එවං මච්චුතරො සියා.
එවං ලොකං අවෙක්ඛන්තං
මච්චුරාජා න පස්සතී"ති[a]

එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. වුත්තම්පි හෙතං භගවතා: "යං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති[1] කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? රූපං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ, තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. වෙදනා – සඤ්ඤා – සඞ්ඛාරා – විඤ්ඤාණං න තුම්හාකං, තං පජහථ, තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. තං කිං මඤ්ඤථ භික්ඛවෙ යං ඉමස්මිං ජෙතවනෙ තිණකට්ඨසාඛාපලාසං තං ජනො හරෙය්‍ය වා, දහෙය්‍ය වා, යථා පච්චයං වා කරෙය්‍ය; අපි නු තුම්හාකං එවමස්ස: 'අම්හෙ ජනො හරති වා, දහති වා, යථා පච්චයං වා කරොතී'ති? නො හෙතං භන්තෙ. තං කිස්ස හෙතු? න හි නො එතං භන්තෙ අත්තා වා අත්තනියං වා'ති. එවමෙව ඛො භික්ඛවෙ යං න තුම්හාකං, තං පජහථ. තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති[1]. කිඤ්ච භික්ඛවෙ න තුම්හාකං? රූපං භික්ඛවෙ න තුම්හාකං, තං පජහථ; තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සති. වෙදනා සඤ්ඤා – සඞ්ඛාරා – විඤ්ඤාණං න තුම්හාකං, තං පජහථ; තං වො පහීනං දීඝරත්තං හිතාය සුඛාය භවිස්සතී"ති[b] එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං.

භාසිතම්පි හෙතං:

2. "සුද්ධධම්ම[2] සමුප්පාදං සුද්ධසඞ්ඛාරසන්තතිං,
පස්සන්තස්ස යථාභූතං න භයං හොති ගාමණි.

3. තිණකට්ඨසමං ලොකං යදා පඤ්ඤාය පස්සති,
නාඤ්ඤං පත්ථයතෙ කිඤ්චි අඤ්ඤත්‍ර[3] පටිසන්ධියා"ති[c]

එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. වජිරා භික්ඛුනී මාරං පාපිමන්තං එතදවොච:

4. "කින්නු[4] සත්තො'ති පච්චෙසි මාර දිට්ඨිගතං නු තෙ,
සුද්ධසඞ්ඛාරපුඤ්ජො'යං නයිධ සත්තූපලබ්භති.[5]

5. යථාපි අඞ්ගසම්භාරා හොති සද්දො රථො ඉති,
එවං ඛන්ධෙසු සන්තෙසු හොති සත්තොති සම්මුති.

---

1. භවිස්සතීති - සිමු. II. 2. සුද්ධාගමෙ - ස්‍යා. PTS.
3. න අඤ්ඤත්‍ර - ස. පු 4. කං නු - සිමු. II.
5. සත්තුපලබ්භති - සං PTS a සුත්තනිපාත - මොඝරාජසුත්ත.
b ඛන්ධසංයුත්ත - නතුම්හාකවග්ග. c. අධිමුත්තථෙරගාථා.

මේ වදාරන ලද මැය, බුදුන් විසින්:

1. මොඝරාජය, සියලු කල්හි සමාසිහිමත් වූයෙහි ලෝකය ශූන්‍ය හෙයින් බලව, සත්කායදෘෂ්ටිය උදුරාපියා, මෙපරිද්දෙන් මරණය තරණය කරනුයේ වන්නෙහි. මෙසේ ස්කන්ධලෝකය දක්නහු මෘත්‍යුරාජ තෙමේ නො දක්නේ ය'යි.

මෙසේත් 'යස්ස නත්ථි ඉදං මේ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ. මේ වදාරන ලද මැ ය, භාග්‍යවතුන් විසින්: "මහණෙනි, යමක් තොප ගේ නො වේ නම්, එය දුරු කරවු; එය තොප විසින් ප්‍රහීණ කරන ලද්දේ බොහෝ කලක් හිත පිණිස සුව පිණිස වන්නේ ය. මහණෙනි, කුමක් තොප ගේ නො වේද යත් ? මහණෙනි, රූපය තොපගේ නො වෙයි, එය දුරු කරවු, එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ ය. වේදනාව-සංඥව-සංස්කාරයෝ-විඥනය තොපගේ නො වෙයි, එය හැරපියවු; එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ යැ. මහණෙනි, ඒ කිමැයි සිතවු ද ? මේ දෙව්රම්හි යම් තණ - දර - අතු - කොළ වේ නම්, එය ජනයා ගෙනයන්නේ හෝ දවන්නේ හෝ රිසි සේ කරන්නේ හෝ නම්; කිමැ තොපට මෙබඳු සිතෙක් වන්නේ ද: 'ජනයා අප ගෙන යයි හෝ රිසි සේ කෙරෙයි හෝ දැ'යි ? 'නෙල නො වේ මැය, ස්වාමීනි, ඊට කරුණු කිමැ යත් ? ස්වාමීනි, නෙල අපගේ ආත්ම හෝ ආත්මනීය හෝ නො මැ වේ යැ'යි, එසෙයින් මහණෙනි, යමක් තොපගේ නො වේ නම්, එය හැරපියවු, එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ යැ. මහණෙනි, කුමක් තොපගේ නො වේ ද යත්? මහණෙනි, රූපය තොපගේ නො වෙයි' එය හැරපියවු; එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ යැ. වේදනාව-සංඥව - සංස්කාරයෝ - විඥනය තොපගේ නො වෙයි, එය හැරපියවු; එය තොප විසින් හැරපියන ලද්දේ බොහෝ කලක් හිතයට සුවයට වන්නේ ය''යි. මෙසේත් 'යස්ස නත්ථි ඉදං මේ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ. මේ කියන ලද මැය:

2. "බ්‍රාහ්මණිය, කෙවල වූ ප්‍රත්‍යයප්‍රත්‍යයොත්පන්න ධර්මමාත්‍රයාගේ සමුත්පාදය ද, (ධ්‍රැවභාවාදියෙන්) අමිශ්‍ර වූ සංස්කාරසන්තතිය ද, තතු සේ දක්නහුට භයෙක් නො වේ.

3. යම් සලෙක ලෝකය තෘණ කාෂ්ට හා සම කොට විදර්ශනා-ප්‍රඥවෙන් දකී නම්, එකල්හි අන් කිසිවක් නො පතයි, පිළිසඳ පිණිස අන් තැනෙක්හි ප්‍රාර්ථනා නො කරයි.

මෙසේත් - 'යස්ස නත්ථි ඉදං මේ'ති පරෙසං වා'පි කිඤ්චනං' යනු වේ. 'වජිරා' භික්ෂුණිය වසවත් මරුට මෙසේ කීව:

4. මාරය, (තෝ) සත්ත්වයෙකැ'යි කුමක් සලකයි ද ? තාගේ දෘෂ්ටි-ගතයෙක් නො වේ ද ? මේ කෙවල වූ සංස්කාරපුඤ්ජයෙකි, මෙහි සත්ත්ව-යෙක් නො ලැබේ.

5. යම්සේ අවයව සමූහය හෙතු කොට ගෙන 'රථ' යන වාචක ශබ්දය වේ ද, එසෙයින් ස්කන්ධසමූහය ඇති කල්හි 'සත්ත්වයෙක' යන සම්මතය වේ.

6. දුක්ඛමෙව හි සම්භොති දුක්ඛං තිට්ඨති වෙති ච,
නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති නාඤ්ඤං දුක්ඛං නිරුජ්ඣතී"ති[a].

එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. "එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු රූපං සමන්නෙසති, යාවතා රූපස්ස ගති. වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං සමන්නෙසති, යාවතා විඤ්ඤාණස්ස ගති. තස්ස රූපං සමන්නෙසතො යාවතා රූපස්ස ගති, වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං සමන්නෙසතො යාවතා විඤ්ඤාණස්ස ගති, යම්පිස්ස හොති අහන්ති වා මමන්ති වා අස්මීති වා, තම්පි තස්ස න හොතී"ති[b]. එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං. ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච: "සුඤ්ඤො ලොකො සුඤ්ඤො ලොකොති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ සුඤ්ඤො ලොකො'ති වුච්චතී'ති? යස්මා ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකො'ති වුච්චති. කිඤ්චානන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා? චක්ඛුං ඛො ආනන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා. රූපා සුඤ්ඤා – චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤං – චක්ඛුසම්ඵස්සො සුඤ්ඤො – යදිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං – සොතං සුඤ්ඤං – සද්දා සුඤ්ඤා – ඝානං සුඤ්ඤං – ගන්ධා සුඤ්ඤා – ජිව්හා සුඤ්ඤා – රසා සුඤ්ඤා–කායො සුඤ්ඤො – ඵොට්ඨබ්බා සුඤ්ඤා – මනො සුඤ්ඤො – ධම්මා සුඤ්ඤා – මනොවිඤ්ඤාණං සුඤ්ඤං – මනොසම්ඵස්සො සුඤ්ඤො – යදිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා. යස්මා ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකො'ති වුච්චතී"ති[c] එවම්පි – යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං.

මමත්තං සො අසංවින්දන්ති – 'මමත්තා'ති ද්වෙ මමත්තා: තණ්හාමමත්තං දිට්ඨිමමත්තඤ්ච –පෙ– ඉදං තණ්හාමමත්තං –පෙ– ඉදං දිට්ඨිමමත්තං. තණ්හාමමත්තං පහාය දිට්ඨිමමත්තං පටිනිස්සජ්ජිත්වා මමත්තං අවින්දන්තො අසංවින්දන්තො අනධිගච්ඡන්තො අප්පටිලභන්තොති–මමත්තං සො අසංවින්දං.

නත්ථි මෙති න සොචතීති – විපරිණතං වා වත්ථුං න සොචති; විපරිණතස්මිං වා වත්ථුස්මිං න සොචති. චක්ඛු මෙ විපරිණතන්ති න සොචති. සොතං මෙ –පෙ– සාලොහිතා මෙ විපරිණතාති න සොචති; න කිලමති; න පරිදෙවති; න උරත්තාළිං කන්දති; න සම්මොහං ආපජ්ජතීති – නත්ථි මෙති න සොචති.

තෙනාහ භගවා:

"යස්ස නත්ථි ඉදං මෙති පරෙසං වාපි කිඤ්චනං,
මමත්තං සො අසංවින්දං නත්ථි මෙති න සොචතී"ති.

---

a. භික්ඛුනීසංයුත්ත. b. සංයුත්තනිකාය – ආසීවිසවග්ග.
c. සංයුත්තනිකාය – ඡන්නවග්ග.

6. දුක මැ උපදී. දුක මැ පවතී, විදී. දුක හැර අනෙකක් නො ලැබෙයි. දුකින් අන්‍ය වූවක් නිරුද්ධ නො වේ.

මෙසේත් – 'යස්ස නත්ථි ඉදං මේ'ති පරේසං වා'පි කිඤ්චනං' යනු වේ. "මහණෙනි, එසෙයින් මැ මහණ රූපයාගේ පැවැත්ම ඇති තාක් රූපය ආවර්ජනා කෙරෙයි, වේදනාව – සංඥාව – සංස්කාරයන් – විඥානයාගේ පැවැත්ම ඇති තාක් විඥානය ආවර්ජනා කෙරෙයි. රූපයාගේ පැවැත්ම පමණින් රූපය ආවර්ජනා කරන්නා වූ ඔහුට වේදනාව – සංඥාව– සංස්කාරයන් – විඥානයාගේ පැවැත්ම පමණින් විඥානය ආවර්ජනා කරන්නා වූ ඔහුට 'මම යැ හෝ මාගේ යැ හෝ මම් වෙමි හෝ' ඔහුට යම් දෘෂ්ටියකුත් වේ නම්, හෙ ද ඔහුට නො වේ යැ"යි. මෙසේත් – 'යස්ස නත්ථි ඉදං මේ'ති පරේසං වා'පි කිඤ්චනං' යනු වේ. "ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මේ කීහ: 'ස්වාමීනි, ලොකය ශූන්‍ය යැ, ලොකය ශූන්‍ය යැ'යි කියනු ලැබෙයි. ස්වාමීනි, කිපමණෙකින් ලොකය ශූන්‍යය'යි කියනු ලැබේ. දැයි ? 'අනඳයැ, යම් හෙයකින් ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් හෝ ශූන්‍ය වේ ද, එහෙයින් ලොකය ශූන්‍ය යැ'යි කියනු ලැබෙයි. ආනන්දය, ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් කුමක් ශූන්‍ය වේ ද යත් ? ආනන්දය, චක්‍ෂුස ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් හෝ ශූන්‍ය යැ, රූපයෝ ශූන්‍යයෝ යැ – චක්‍ෂුර්විඥානය ශූන්‍ය යැ – චක්‍ෂුස්සංස්පර්ශය ශූන්‍යය– චක්‍ෂුස්සංස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වේදනාවක් උපදී නම්, හෙ ද ශූන්‍ය යැ – ශ්‍රොත්‍රය ශූන්‍ය යැ – ශබ්දයෝ ශූන්‍යයෝ යැ – ඝ්‍රාණය ශූන්‍ය යැ – ගන්ධයෝ ශූන්‍යයෝ යැ – දිව ශූන්‍ය යැ– රසයෝ ශූන්‍යයෝ යැ – කය ශූන්‍ය යැ – ස්ප්‍රෂ්ටව්‍යයෝ ශූන්‍යයෝ යැ– මනස ශූන්‍ය යැ – ධර්මයෝ ශූන්‍යයෝ යැ – මනොවිඥානය ශූන්‍ය යැ– මනස්සංස්පර්ශය ශූන්‍ය යැ – මනස්සංස්පර්ශප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වේදනාවක් උපදී නම්, හෙ ද ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් හෝ ශූන්‍ය යි. ආනන්දය, යම් හෙයකින් ආත්මයෙන් හෝ ආත්මනීයයෙන් හෝ ශූන්‍ය වේ ද, එහෙයින් ලොකය ශූන්‍ය යැ'යි කියනු ලැබේ යැ"යි මෙසේත් – 'යස්ස නත්ථි ඉදං මේති පරේසං වාපි කිඤ්චනං' යනු වේ

**මමත්තං සො අසංවින්දං** – 'මමත්ත' නම්: තෘෂ්ණාමමත්වය ද දෘෂ්ටිමමත්වය ද'යි මමත්වයෝ දෙදෙනෙකි...,...මේ දෘෂ්ටිමමත්වය යි. තෘෂ්ණාමමත්වය හැර දෘෂ්ටිමමත්වය දුරලා මමත්වය නො ලබනුයේ වෙසෙසින් නො ලබනුයේ නො පැමිණෙනුයේ ප්‍රතිලාභ නො කරනුයේ නුයි 'මමත්තං සො අසංවින්දං' යනු වේ.

**නත්ථි මේ'ති න සොචති** – විනාශ වූ වස්තුවට හෝ ශොක නො කෙරෙයි, වස්තුව නැසෙන කල්හි හෝ ශොක නො කෙරෙයි, 'මාගේ ඇස නැසිණැ'යි ශොක නො කෙරෙයි, මාගේ කන...මාගේ නෑ සහලේනැයෝ නැසුණාහ'යි ශොක නො කෙරෙයි, නො වෙහෙසෙයි, නො වැලැපෙයි, ළෙහි පැහැර නො හඬයි, සම්මොහයට නො පැමිණේ නුයි 'නත්ථි මේති න සොචති' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"යස්ස නත්ථි ඉදං මේ'ති –පෙ– නත්ථි මේ'ති න සොචති"යි.**

## 15 - 18

අනිට්ඨුරී[1] අනනුගිද්ධො අනෙජො සබ්බධි සමො,
තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පිතං.

**අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධි සමොති** - කතමං නිට්ඨුරියං? ඉධෙකච්චො නිට්ඨුරියො හොති පරලාභසක්කාර ගරුකාරමානනවන්දනපූජනාසු, ඉස්සති උසූයති ඉස්සං බන්ධති; යං එවරූපං නිට්ඨුරියං නිට්ඨුරියකම්මං ඉස්සා ඉස්සායනා ඉස්සායිතත්තං උසූයා උසූයනා උසූයායිතත්තං, ඉදං වුච්චති නිට්ඨුරියං. යස්සෙතං නිට්ඨුරියං පහීනං සමුච්ඡින්නං -පෙ- ඤාණග්ගිනා දඩ්ඪං; සො වුච්චති අනිට්ඨුරීති. **අනනුගිද්ධොති** 'ගෙධො' වුච්චති තණ්හා, යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං' යස්සෙසො ගෙධො පහීනො සමුච්ඡින්නො -පෙ- ඤාණග්ගිනා දඩ්ඪො, සො වුච්චති අනනුගිද්ධො. සො රූපෙ අගිද්ධො සද්දෙ -පෙ- දිට්ඨ සුත මුත විඤ්ඤාතබ්බෙසු ධම්මෙසු අගිද්ධො අගධිතො[2] අමුච්ඡිතො අනජ්ඣොපන්නො වීතගෙධො විගතගෙධො චත්තගෙධො වන්තගෙධො මුත්තගෙධො පහීනගෙධො පටිනිස්සට්ඨගෙධො වීතරාගො විගතරාගො චත්තරාගො වන්තරාගො මුත්තරාගො පහීනරාගො පටිනිස්සට්ඨරාගො නිච්ඡාතො නිබ්බුතො සීතිභූතො සුඛපටිසංවෙදී බ්‍රහ්මභූතෙන අත්තනා විහරතීති- අනිට්ඨුරී අනනුගිද්ධො.

**අනෙජො සබ්බධි සමොති** - 'එජා' වුච්චති තණ්හා; යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං; යස්සෙ'සා එජා තණ්හා පහීනා සමුච්ඡින්නා -පෙ- ඤාණග්ගිනා දඩ්ඪා, සො වුච්චති අනෙජො. එජාය පහීනත්තා අනෙජො. සො ලාභෙ'පි න ඉඤ්ජති, අලාභෙපි න ඉඤ්ජති යසෙපි න ඉඤ්ජති, අයසෙපි න ඉඤ්ජති, පසංසායපි න ඉඤ්ජති, නින්දායපි න ඉඤ්ජති, සුඛෙපි න ඉඤ්ජති, දුක්ඛෙපි න ඉඤ්ජති, න චලති, න වෙධති, නප්පවෙධති, න සම්පවෙධතීති - අනෙජො. **සබ්බධි සමොති** සබ්බං වුච්චති ද්වාදසායතනානි: චක්ඛු චෙව[3] රූපා ච -පෙ- මනො චෙව ධම්මා ච. යතො අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු ඡන්දරාගො පහීනො හොති උච්ඡින්නමූලො තාලාවත්ථුකතො ආයතිං අනුප්පාදධම්මො, සො වුච්චති සබ්බධි සමො. සො සබ්බත්ථ තාදී සබ්බත්ථ මජ්ඣත්තො සබ්බත්ථ උපෙක්ඛකොති - අනෙජො සබ්බධි සමො.

---

1. අනුද්ධරී - පු. 2. අගධිතො - සිමු II. මජසං. 3. චක්ඛුඤ්චෙව - සිමු.

**15 - 18**

ඒ කම්පා නො වනසුලු පුද්ගලයා පුළුවුස්නා ලද මම ‘(හේ) ඊර්ෂ්‍යා නැත්තෙක, (රූපාදීයෙහි) නො ගිජු වූයෙක, තෘෂ්ණා රහිතයෙක, සියලු තැන්හි සම පැවැතුම් ඇත්තෙක’ යන (ඔහු කෙරෙහි) මේ සතර අනුසස කියමි.

**අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධි සමො** -නෛෂ්ඨුර්‍ය්‍යය කවරැ යත්: මෙහි කිසිවෙක් අන්‍යයාගේ ලාභ - සත්කාර - ගරු - බුහුමන්- වැඳුම් - පිදුම්හි ඊර්ෂ්‍යා ඇත්තේ වෙයි, ඊර්ෂ්‍යා කෙරෙයි, දෙස් පහළ කෙරෙයි, ඊර්ෂ්‍යාව බඳී. මෙබඳු වූ යම් නිෂ්ඨුර බවෙක් ඊර්ෂ්‍යාවක් ඊර්ෂ්‍යා- කාරයෙක් ඊර්ෂ්‍යා කරන බවක්, අසූයාවක් (-දෙස් පහළකිරීමක්) අසූයා- කාරයක් දෙස් පහළ කරන බවෙක් වේ ද, මේ නෛෂ්ඨුර්‍ය්‍ය යි. යමක්හු විසින් තෙල නිෂ්ඨුරබව ප්‍රහීණ කරන ලද ද, සමුච්ඡින්න ද...ඥානාග්නීන් දග්ධ ද, හේ ‘අනිට්ඨුරී’ යයි කියනු ලැබේ. **අනනුගිද්ධො** යනු: ‘ගෙධ’යි තෘෂ්ණාව කියනු ලැබෙයි. යම් රාගයෙක් අධික රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද, එය යි. යමක්හු විසින් තෙල ගෙධය දුරු කරන ලද ද නසන ලද ද...නුවණ ගිත්තෙන් දවන ලද ද, හෙතෙම ‘අනනුගිද්ධ’ යයි කියනු ලැබේ, හෙතෙම රූපයෙහි නො ගිජු වූයේ ශබ්ද යෙහි...දෘෂ්ටශ්‍රැතමුතවිඥෙතව්‍යධර්මයන්හි නො ගිජු වූයේ නො බැඳුණේ මුසු- පත් නො වූයේ නො වැතුරුණේ පහවූ ගෙධ (-තෘෂ්ණා) ඇත්තේ පහවැ ගිය තෘෂ්ණා ඇත්තේ හළ තෘෂ්ණා ඇත්තේ වමනය කළ තෘෂ්ණා ඇත්තේ මුදන ලද තෘෂ්ණා ඇත්තේ ප්‍රහීණ කළ තෘෂ්ණා ඇත්තේ දුරලූ තෘෂ්ණා ඇත්තේ වීතරාග වූයේ විගත රාග - ත්‍යක්තරාග- වාන්ත රාග - මුක්තරාග - ප්‍රහීණරාග වූයේ දුරුලූ රාග ඇත්තේ තෘෂ්ණා රහිත වූයේ නිවුණේ සිහිල් වූයේ සුව විඳිනසුලු වූයේ ශ්‍රෙෂ්ඨ වූ සිතින් යුක්ත වැ වෙසේ නුයි ‘අනිට්ඨුරී අනනුගිද්ධො’ යනු වේ.

**අනෙජො සබ්බධි සමො** - ‘එජා’යි තෘෂ්ණාව කියනු ලබයි, යම් රාගයෙක් සංරාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එය යි. යමක්හු විසින් තෙල එජා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සිඳිනා ලද්දී...නුවණ ගිත්තෙන් දවනා ලද්දී ද, හේ ‘අනෙජ’ යයි කියනු ලැබෙයි. එජාව ප්‍රහීණ වන බැවින් ‘අනෙජ’ යැ. හේ ලාභයෙහි ද නො සැලෙයි, අලාභයෙහි ද නො සැලෙයි, යශස්හි ද නො සැලෙයි, අයශස්හි ද නො සැලෙයි, ප්‍රශංසායෙහි ද නො සැලෙයි, නින්දායෙහි ද නො සැලෙයි, සුඛයෙහි ද නො සැලෙයි, දුඃඛයෙහි ද නො සැලෙයි; චඤ්චල නො වෙයි, නො වෙවුලයි, වෙසෙසින් නො වෙවුලයි, හාත්පසින් නො වෙවුලා නුයි ‘අනෙජ’යැ. **සබ්බධි සමො** යනු ‘සබ්බධි’යි දෙලොස් ආයතනය කියනු ලැබෙයි: ඇස ද රූපයෝ ද ..මනස ද ධර්මයෝ ද’යි. යම් තැනෙක සිට ආධ්‍යාත්මික බාහ්‍යායතනයන්හි ඡන්දරාගය ප්‍රහීණ වූයේ ද උපුත් මුල් ඇත්තේ ද තාලවස්තුවක් මෙන් කරන ලද්දේ ද, අනුඅභාවය කරන ලද්දේ ද මතු නූපදනා සැහැවි ඇත්තේ ද, හෙතෙම ‘සබ්බධි සම’ යයි කියනු ලැබේ. හේ සියලු තැන තාදී යැ, සියලු තැන මධ්‍යස්ථ යැ සියලු තැන උපෙක්ෂා සහිත වූයේ නුයි ‘අනෙජො සබ්බධි සමො’ යනු වේ.

**තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පිනන්ති** - අවිකම්පිනං පුග්ගලං පුට්ඨො පුච්ඡිතො යාචිතො අජ්ඣෙසිතො පසාදිතො ඉමෙ චත්තාරො ආනිසංසෙ පබ්‍රූමි: සො අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධි සමොති බ්‍රෑමි ආචික්ඛාමි -පෙ- පකාසෙමීති - තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පිනං.

තෙනාහ භගවා:

“අනිට්ඨුරී අනනුගිද්ධො අනෙජො සබ්බධි සමො,
තමානිසංසං පබ්‍රූමි පුච්ඡිතො අවිකම්පින”න්ති.

**15 - 19**

අනෙජස්ස විජානතො නත්ථි කාචි නිසඞ්ඛිති,[1]
විරතො සො වියාරම්භා[2] ඛෙමං පස්සති සබ්බධි.

**අනෙජස්ස විජානතොති** - ‘එජා’ වුච්චති තණ්හා; යො රාගො සාරාගො -පෙ- අභිජ්ඣා ලොභො අකුසලමූලං.[a] යස්සෙසා එජා තණ්හා පහීනා සමුච්ඡින්නා -පෙ- ඤාණග්ගිනා දඩ්ඪා; සො වුච්චති අනෙජො. එජාය පහීනත්තා අනෙජො. සො ලාභෙපි න ඉඤ්ජති. අලාභෙපි න ඉඤ්ජති. යසෙපි න ඉඤ්ජති. අයසෙපි න ඉඤ්ජති. පසංසායපි න ඉඤ්ජති. නින්දායපි න ඉඤ්ජති. සුඛෙපි න ඉඤ්ජති. දුක්ඛෙපි න ඉඤ්ජති. න චලති න වෙධති. න සම්පවෙධති. **අනෙජස්ස විජානතොති** - විජානතො පටිවිජානතො පටිවිජ්ඣතො, ‘සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා’ති -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති ජානතො ආජානතො විජානතො පටිවිජානතො පටිවිජ්ඣතොති - අනෙජස්ස විජානතො.

**නත්ථි කාචි නිසඞ්ඛිතීති** - ‘නිසඞ්ඛිතියො’ වුච්චන්ති පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො; යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවඞ්ගතා ආයතිං අනුප්පාදධම්මා, එත්තාවතා නිසඞ්ඛිතියො නත්ථි, න සන්ති, න සංවිජ්ජන්ති, නූපලබ්භන්ති; පහීනා සමුච්ඡින්නා වූපසන්තා පටිප්පස්සද්ධා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪාති - නත්ථි කාචි නිසඞ්ඛිති.

---

1. විසඞ්ඛිති - සං. නිසඞ්ඛති - මජසං. 2. විරියාරම්භා - මජසං.

a. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ, ඛුද්දකවත්ථුවිභඞ්ග.

**තමාහිසංසං පබ්‍රෑමි පුච්ඡිතො අවිකම්පිනං** - කම්පා නො වනසුලු පුද්ගලයා පුළුවුස්නා ලද්දෙම් විචාරන ලද්දෙම් අයදන ලද්දෙම් අධ්‍යෙෂිත වූයෙම් පහදවන ලද්දෙම් මේ සතර අනුසසුත් කියමි: හෙතෙම ඊෂ්‍යා නැත්තේ යැ, හිජු නො වූයේ යැ, තෘෂ්ණා රහිත යැ, සියලු තන්හි සමයැයි කියමි, පවසමි...ප්‍රකාශ කෙරෙම් නුයි 'තමාහිසංසං පබ්‍රෑමි පුච්ඡිතො අවිකම්පිනං' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

"අනිට්ඨුරී අනනුගිද්ධො -පෙ- පුච්ඡිතො අවිකම්පිනං"යි.

**15 – 19**

තෘෂ්ණා රහිත වූ (සංස්කාරයන් දුඃඛාදි වශයෙන්) දකුවහුට (පුණ්‍යාභි-සංස්කාරාදි) කිසි සංස්කාරයක් නැත. හෙතෙම සංස්කාරයෙන් වෙන් වූයේ සියලු තැන්හි ක්ෂෙමය (-අභය) දක්තේ යි.

**අනෙජස්ස විජානතො** - 'එජා'යි තෘෂ්ණාව කියනු ලබයි; යම් රාග-යෙක් බලවත් රාගයෙක්...අභිධ්‍යාවක් ලොභ අකුශලමූලයෙක් වේ ද එයයි. යමක්හු විසින් තෙල එජා සඞ්ඛ්‍යාත තෘෂ්ණාව ප්‍රහීණ කරන ලද්දී සමුච්ඡින්න වූවා...ඥානාග්නීන් දවන ලද්දි ද; හෙතෙම 'අනෙජ'යි කියනු ලැබෙයි, එජාව ප්‍රහීණ වන බැවින් 'අනෙජ' යැ. හෙතෙම ලාභයෙහි දු කම්පා නො වෙයි. අලාභයෙහි දු කම්පා නො වෙයි, යශස්හි දු කම්පා නො වෙයි, අයශස්හි දු කම්පා නො වෙයි, ප්‍රශංසායෙහි දු කම්පා නො වෙයි, නින්දායෙහි දු කම්පා නො වෙයි, සුඛයෙහි දු කම්පා නො වෙයි, දුඃඛයෙහි දු කම්පා නො වෙයි. නො සැලෙයි, නො වෙව්ලයි, අතිශයින් නො වෙව්ලයි. **අනෙජස්ස විජානතො** - දකුවහුට වෙසෙසින් දකුවහුට ප්‍රතිවෙධ කරන්න-හුට; 'සියලු සංස්කාරයෝ දුක් වූහ'යි...යම් කිසිවක් සමුදයධර්ම නම්, ඒ සියල්ල නැසෙනසුලු යැ'යි දන්නහුට හාත්පසින් දන්නහුට වෙසෙසින් දන්නහුට ප්‍රකර්ෂයෙන් දන්නහුට ප්‍රතිවෙධ කරන්නහුට නුයි 'අනෙජස්ස විජානතො' යනු වේ.

**නත්ථි කාචි නිසංඛිති** -'නිසංඛිති' යැයි පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යා-භිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද කියනු ලැබෙති. යම් තැනෙක පටන් පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද ප්‍රහීණ වූවාහු උපුත් මුල් ඇත්තාහු තාලාවස්තුවක් මෙන් කරන ලද්දාහු අනුඅභාවය කරන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, මෙතෙකින් 'නිසංඛිතීහු' නැත, නො වෙති, විද්‍යමාන නො වෙති, නො ලැබෙත්, ප්‍රහීණ වූවාහු සමුච්ඡින්න වූවාහු සන්හිඳුවන ලද්දාහු දුරලන ලද්දාහු අභව්‍යොත්පත්තික වූවාහු ඤාණගින්නෙන් දවන ලද්දාහු නුයි 'නත්ථි කාචි නිසංඛිති' යනු වේ.

**විරතො සො වියාරම්භාති** – ‘වියාරම්භො’ වුච්චති පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො; යතො පුඤ්ඤාභිසඞ්ඛාරො ච අපුඤ්ඤාභිසඞ්ඛාරො ච ආනෙඤ්ජාභිසඞ්ඛාරො ච පහීනා හොන්ති උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවංකතා ආයතිං අනුප්පාදධම්මා; එත්තාවතා ආරම්භා වියාරම්භා ආරතො අස්ස. විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරතීති– විරතො සො වියාරම්භා.

**ඛෙමං පස්සති සබ්බධීති** – රාගො භයකරො, දොසො භයකරො, මොහො භයකරො –පෙ– භයකරා කිලෙසා, භයකරස්ස රාගස්ස පහීනත්තා –පෙ– භයකරානං කිලෙසානං පහීනත්තා සබ්බත්ථ ඛෙමං පස්සති, සබ්බත්ථ අභයං පස්සති, සබ්බත්ථ අනීතිකං පස්සති, සබ්බත්ථ අනුපද්දවං පස්සති, සබ්බත්ථ අනුපසග්ගතං[1] පස්සතීති – ඛෙමං පස්සති සබ්බධි.

තෙනාහ භගවා:

“අනෙජස්ස විජානතො නත්ථි කාචි නිසංඛිති,
විරතො සො වියාරම්භා ඛෙමං පස්සති සබ්බධී”ති.

## 15 - 20

න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ[2] මුනි,
සන්තො සො වීතමච්ඡෙරො නාදෙති න නිරස්සතී’ති (භගවා).

**න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනීති** – ‘මොනං’ වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා –පෙ– සඞ්ගජාලමතිච්ච සො මුනීති. මුනි සෙය්‍යොහමස්මීති වා, සදිසොහමස්මීති වා, හීනොහමස්මීති වා න වදති, න කථෙති, න භණති, න දීපයති, න වොහරතීති – න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි.

**සන්තො සො වීතමච්ඡරොති** – ‘සන්තො’ති රාගස්ස සන්තත්තා සමිතත්තා සන්තො, දොසස්ස – මොහස්ස – පෙ– සබ්බාකුසලාභිසඞ්ඛාරානං සන්තත්තා සමිතත්තා වූපසමිතත්තා විජ්ඣාතත්තා නිබ්බුතත්තා විගතත්තා පටිප්පස්සද්ධත්තා සන්තො උපසන්තො වූපසන්තො නිබ්බුතො පටිප්පස්සද්ධොති – සන්තො සො; **වීතමච්ඡරොති** පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං –පෙ– ගාහො, ඉදං වුච්චති මච්ඡරියං; යස්සෙතං මච්ඡරියං පහීනං සමුච්ඡින්නං –පෙ– ඤාණග්ගිනා දඩ්ඪං; සො වුච්චති වීතමච්ඡරො විගතමච්ඡරො චත්තමච්ඡරො වන්තමච්ඡරො මුත්තමච්ඡරො පහීනමච්ඡරො පටිනිස්සට්ඨමච්ඡරොති – සන්තො සො වීතමච්ඡරො.

1. ඛෙමඤ්ඤුස්සරො – ස්‍යා. 2 වදත – සීමු. II.

**විරතො සො වියාරම්භා** – 'වියාරම්භ' යි පුණ්‍යාභිසංස්කාරය අපුණ්‍යාභිසංස්කාරය ආනෙඤ්ජාභිසංස්කාරය කියනු ලැබෙයි. යම් තැනෙක පටන් පුණ්‍යාභිසංස්කාරය ද අපුණ්‍යාභිසංස්කාරය ද ආනෙඤ්ජාභිසංස්කාරය ද ප්‍රහීණ වූවාහු උපුටා හළ මුල් ඇත්තාහු තාලවස්තුවක් මෙන් කරන ලද්දාහු මතු නූපදනා සවභාව ඇත්තාහු වෙත් ද, එ තැන් සිට (පුණ්‍යාභිසංස්කාරාදි) ආරම්භයෙන් විවිධාරම්භයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ. වෙන් වැ ගියේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ වන්නේ ය, විගතමර්යාදා කළ සිතින් යුක්ත ව වෙසේ නුයි 'විරතො සො වියාරම්භා' යනු වේ.

**ඛෙමං පස්සති සබ්බධි** – රාගය බියකරු යැ ද්වෙෂය බියකරු යැ මොහය බියකරු යැ...කෙලශයෝ බියකරුහු යැ, බියකරු රාගය ප්‍රහීණ කළ බැවින් සියලු තැන්හි ක්ෂෙමය දකී, සියලු තැන්හි අභය දකී, සියලු තැන්හි පීඩා රහිත බව දකී, සියලු තැන්හි අනුපද්‍රවය දකී, සියලු තැන්හි නො ගැටුණු බව දකී නුයි 'ඛෙමං පස්සති සබ්බධි' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අනෙජස්ස විජානතො -පෙ- ඛෙමං පස්සති සබ්බධී"යි**

## 15 – 20

ක්ෂීණාස්‍රව මුනි තෙම (මාන විසින් තමා) සම වූවන් කෙරෙහි ලා නො කියයි, හීනයන් කෙරෙහි ලා නො කියයි, ශ්‍රෙෂ්ඨයන් කෙරෙහි ලා නො කියයි. සන්හුන් කෙලෙස් ඇති පහවැගිය මාත්සර්ය ඇති හෙතෙම (රූපාදි කිසි ධර්මයක්) නො ගනී, (එහෙයින් ම) නො බැහැර කෙරෙයි. බුදුහු මෙසේ වදාළ සේක.

**න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි** – 'මොන'යි ඥානය කියනු ලැබෙයි, යම් ප්‍රඥාවක් ප්‍රකෘෂ්ඨජානනයක්...සඞ්ගජාලය ඉක්මවා සිටි හෙතෙම 'මුනි' වේ යයි. මුනි තෙම 'මම ශ්‍රෙෂ්ඨ වෙමි' හෝ 'මම සදෘශයෙමි' හෝ 'මම හීනයෙමි' හෝ නො පවසයි, නො කියයි, නො බෙණෙයි, නො දක්වයි, ව්‍යවහාර නො කෙරේ නුයි 'න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි' යනු වේ.

**සන්තො සො වීතමච්ඡරො** – 'සන්තො' යනු: රාගය ශාන්ත හෙයින් ශමිත හෙයින් 'ශාන්ත යැ, ද්වෙෂය - මොහය...සියලු අකුශලාභිසංස්කාරයන් ශාන්ත වන බැවින් ශමිත වන බැවින් ව්‍යුපශමිත වන බැවින් දවන ලද බැවින් නිවුණු බැවින් විගත වන බැවින් දුරලන ලද බැවින් ශාන්ත යැ උපශාන්ත යැ ව්‍යුපශාන්ත යැ නිවුණේ යැ දුරලූ කෙලෙස් ඇත්තේ නුයි 'සන්තො සො' යනු වේ. **වීතමච්ඡරො** – මාත්සර්ය පසෙකි: ආවාසමාත්සර්ය යැ...ග්‍රාහ යැ; මේ මාත්සර්ය යැයි කියනු ලැබේ. යමක්හු විසින් තෙල මාත්සර්යය ප්‍රහීණ කරන ලද ද, හෙතෙම වීතමාත්සර්ය යැ, විගතමාත්සර්ය යැ, ත්‍යක්තමාත්සර්ය යැ, වාන්තමාත්සර්ය යැ, මුක්තමාත්සර්ය යැ, ප්‍රහීණ කළ මාත්සර්ය ඇත්තේ යැ, දුරලූ මාත්සර්ය ඇත්තේ යැයි කියනු ලැබේ නුයි 'සන්තො සො වීතමච්ඡරො' යනු වේ.

**නාදෙති න නිරස්සතීති භගවාති** – 'නාදෙතී'ති රූපං නාදියති, න උපාදියති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසති. වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං – ගතිං – උපපත්තිං පටිසන්ධිං – භවං – සංසාරං – වට්ටං නාදියති, න උපාදියති, න ගණ්හාති, න පරාමසති, නාභිනිවිසතීති – නාදෙති; **න නිරස්සතීති** රූපං න පජහති, න විනොදෙති, න බ්‍යන්තීකරොති, න අනභාවං ගමෙති, වෙදනං – සඤ්ඤං – සඞ්ඛාරෙ – විඤ්ඤාණං – ගතිං – උපපත්තිං – පටිසන්ධිං – භවං – සංසාරං – වට්ටං න පජහති, න විනොදෙති න බ්‍යන්තීකරොති, න අනභාවං ගමෙති; **භගවාති** ගාරවාධිවචනං – පෙ – සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති – නාදෙති න නිරස්සතීති භගවා'ති.

තෙනාහ භගවා:

"න සමෙසු න ඔමෙසු න උස්සෙසු වදතෙ මුනි,
සන්තො සො වීතමච්ඡරො නාදෙති න නිරස්සතී'ති භගවා"ති.

**අත්තදණ්ඩසුත්තනිද්දෙසො සමත්තො පණ්ණරසමො.**

## 16

## සාරිපුත්තසුත්තනිද්දෙසො

අථ සාරිපුත්තසුත්තනිද්දෙසො වුච්චති:

### 16 – 1

න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ
(ඉච්චායස්මා සාරිපුත්තො)
න සුතො උද කස්සචි,
එවං වග්ගුවදො සත්ථා
තුසිතා ගණිමාගතො.

**න මෙ දිට්ඨො ඉතො පුබ්බෙති** ඉතො පුබ්බෙ මෙ මයා න දිට්ඨපුබ්බො සො භගවා ඉමිනා චක්ඛුනා ඉමිනා අත්තභාවෙන; යදා භගවා තාවතිංසභවනෙ පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං වස්සං වුත්ථො දෙවගණපරිවුතො මජ්ඣෙ මණිමයෙන සොපානෙන සඞ්කස්සනගරං ඔතිණ්ණො, ඉමං දස්සනං පුබ්බෙ න දිට්ඨොති 'න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ'.

**ඉච්චායස්මා සාරිපුත්තොති** – 'ඉච්චා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං 'ඉච්චා'ති. **ආයස්මාති** පියවචනං ගරුවචනං සගාරවසප්පතිස්සවචනමෙතං 'ආයස්මා'ති. **සාරිපුත්තොති** තස්ස ථෙරස්ස නාමං සඞ්ඛා සමඤ්ඤා පඤ්ඤත්ති වොහාරො නාමං නාමකම්මං නාමධෙය්‍යං නිරුත්ති බ්‍යඤ්ජනං අභිලාපොති – ඉච්චායස්මා සාරිපුත්තො.

**නාදෙති න නිරස්සතීති භගවා** - 'නාදෙති' යනු: රූපය නො ගනී, දුඃඛය නො ගනී, ග්‍රහණය නො කෙරෙයි, පරාමර්ශනය නො කෙරෙයි, අභිනිවේශය නො කෙරෙයි; වේදනාව - සංඥාව - සංස්කාරයන් - විඥානය - ගතිය - උත්පත්තිය - ප්‍රතිසන්ධිය - භවය - සංසාරය - වෘත්තය ආදානය නො කෙරෙයි, උපාදාන - ග්‍රහණ - පරාමර්ශ - අභිනිවේශ නො කෙරේ නුයි 'නාදෙති' යනු වේ. **න නිරස්සති** යනු: රූපය නො දුරු කෙරෙයි, නො බැහැර කෙරෙයි, විගතාන්ත නො කෙරෙයි, අනභාවයට නො පමුණුවයි; වේදනාව - සංඥාව - සංස්කාරයන් - විඥානය - ගතිය - උත්පත්තිය ප්‍රතිසන්ධිය - භවය - සංසාරය - වෘත්තය නො හැරපියයි, නො බැහැර කෙරෙයි, විගතාන්ත නො කෙරෙයි, අනභාවයට නො පමුණුවයි; භගවා යනු: ගෞරවාධිවචන යැ... මේ 'භගවා' යනු අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකැ'යි 'නාදෙති න නිරස්සතීති භගවා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"න සමෙසු න ඔමෙසු -පෙ- නාදෙති න නිරස්සතීති භගවා"**යි.

**පසළොස්වැනි 'අත්තදණ්ඩ'සූත්‍ර නිර්දේශය සමාප්ත යි.**

# 16

# සාරිපුත්තසුත්තනිද්දේසය

ඉක්බිති සාරිපුත්තසූත්‍රනිර්දේශය කියනු ලැබේ.

## 16 - 1

(ආයුෂ්මත් ශාරිපුත්‍රයෝ මෙසේ වදාළහ:) මෙසේ මිහිරි වදන් ඇති තුෂිත දෙව්ලොවින් සැව මවුකුසට පැමිණි, නොහොත් දෙව්ලොවින් ගණ මැදට පැමිණි, හෝ රහත්ගණයා මැදට පැමිණි, නොහොත් රහතුන්ගේ ගණාචාර්ය බවට පැමිණි ශාස්තෘහු මෙයින් පෙර මා විසින් නො දක්නා ලදහු වෙති (පෙර මේ දර්ශනය නො වී යැයි සේ යැ.) නොහොත් කිසිවෙක්හු ගේ බසින් නො අසන ලදහු වෙත්.

**න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ** - මෙයින් (මේ සංකාශ්‍ය නගරයට බැසීමෙන්) පෙර මෙ - මා විසින් ඒ බුදුහු මේ ඇසින් මේ අත්බවින් නො දුටුවිරූහ. යම් දවසෙක බුදුහු තව්තිසාවෙහි පරසතුමුල පඬුඇඹුල් සලෙයෙහි වස් විසූ සේක් දෙව්ගණා විසින් පිරිවරන ලද්දහු මැද මිණිමුවා හිණින් සංකස්සපුරට බටුවාහු ද, මේ දර්ශනය මිස පෙර නො දුටුවිරූහු නුයි 'න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ' යනු වේ.

**ඉච්චායස්මා සාරිපුත්තො** - 'ඉච්ච' යනු: පදසන්ධි යැ, පදසංසර්ග යැ, පදපරිපූරීතා යැ, අක්ෂරසමවාය යැ, ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ, පදානුපූර්වතා යැ, තෙල 'ඉච්ච' යනු. **ආයස්මා** යනු: ප්‍රියවචන යැ, ගරුවචන යැ, සගෞරව සප්‍රතිශ්‍රයවචනයෙකි, තෙල 'ආයස්මා' යනු. **සාරිපුත්තො** යනු: ඒ තෙරණුවන්ගේ නම යැ, සඞ්ඛ්‍යා යැ, සංඥා යැ, ප්‍රඥප්ති යැ, ව්‍යවහාර යැ, නාම යැ, නාමකර්ම යැ, නාමධෙය යැ, නිරුක්ති යැ, ව්‍යඤ්ජන යැ, අභිලාප නුයි 'ඉච්චායස්මා සාරිපුත්තො' යනු වේ.

න සුතො උද කස්සචීති – ‘නා’ති පටික්ඛෙපො; උදාති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං උදාති; කස්සචීති කස්සචි ඛත්තියස්ස වා බ්‍රාහ්මණස්ස වා වෙස්සස්ස වා සුද්දස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා දෙවස්ස වා මනුස්සස්ස වාති – න සුතො උද කස්සචි.

එවං වග්ගුවදො සත්ථාති – එවං වග්ගුවදො මධුරවදො පෙමනීයවදො හදයඞ්ගමවදො කරවීකරුතමඤ්ජුස්සරො.[1] අට්ඨඞ්ගසමන්නාගතො ඛො පන තස්ස භගවතො මුඛතො ඝොසො නිච්ඡරති: විස්සට්ඨො ච විඤ්ඤෙය්‍යො ච මඤ්ජු ච සවනීයො ච බින්දු ච අවිසාරී ච ගම්භීරො ච නින්නාදී ච. යථාපරිසං ඛො පන සො භගවා සරෙන විඤ්ඤාපෙති. න අස්ස බහිද්ධා පරිසාය ඝොසො නිච්ඡරති. බ්‍රහ්මස්සරො ඛො පන සො භගවා කරවීකභාණීති– එවං වග්ගුවදො. සත්ථාති සත්ථා භගවා සත්ථවාහො; යථා සත්ථවාහො සත්තෙ කන්තාරං තාරෙති, දුබ්භික්ඛකන්තාරං තාරෙති, නිරුදකකන්තාරං තාරෙති, උත්තාරෙති, නිත්තාරෙති, පතාරෙති, ඛෙමන්තභූමිං සම්පාපෙති, එවමෙවං භගවා සත්ථවාහො සත්තෙ කන්තාරං තාරෙති; ජාතිකන්තාරං තාරෙති, ජරාකන්තාරං තාරෙති, බ්‍යාධි -පෙ- මරණ – සොක – පරිදෙව- දුක්ඛ – දොමනස්සුපායාසකන්තාරං තාරෙති, රාගකන්තාරං තාරෙති, දොස- මොහ – මාන – දිට්ඨි – කිලෙස – දුච්චරිතකන්තාරං තාරෙති, රාගගහනං තාරෙති, දොස – මොහ – මාන – දිට්ඨිගහනං – කිලෙසගහනං– දුච්චරිතගහනං තාරෙති, උත්තාරෙති, නිත්තාරෙති, පතාරෙති; ඛෙමන්තං අමතං නිබ්බානං සම්පාපෙතීති එවම්පි භගවා සත්ථවාහො. අථවා භගවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතාති එවම්පි භගවා සත්ථවාහො. අථවා භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො; මග්ගානුගා ච පනස්ස[2] එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතාති එවම්පි භගවා සත්ථවාහොති – එවං වග්ගුවදො සත්ථා.

1. මඤ්ජුස්සරො - සං. 2. පන - සිමු II

**න සුතො උද කස්සචි** - 'න' යනු: ප්‍රතික්ෂෙප යැ; **උද** යනු: පදසන්ධි යැ, පදසංසග්ගී යැ, පදපාරිපූරි යැ, අක්ෂරසමවාය යැ, ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ, පදනුපූර්තා යැ, මෙල 'උද' යනු; **කස්සචි** - කිසිවක්හුගේ (බසින්) ක්ෂත්‍රියයකුගේ හෝ බ්‍රාහ්මණයකුගේ හෝ වෛශ්‍යයකුගේ හෝ ශුද්‍රයකුගේ හෝ ගෘහස්ථයකුගේ හෝ ප්‍රව්‍රජිතයකුගේ හෝ දෙවියකුගේ හෝ මනුෂ්‍යයකුගේ හෝ නුසි 'න සුතො උද කස්සචි' යනු වේ.

**එවං වග්ගුවදො සත්ථා** - මෙසේ මනහර වදන් ඇති මිහිරි වදන් ඇති පෙම් වඩන වදන් ඇති සිත් ගන්නා වදන් ඇති කුරවිකද සෙයින් මනහර ඝොස ඇතියේ; ඒ බුදුන්ගේ මුවින් අෂ්ටාඞ්ගසමන්වාගත වූ ඝොෂය නික්මෙයි: නො පැකිළෙනුයේ ද, මැනවින් දත හැක්කේ ද, මධුර වූයේ ද, කනට සුව වූයේ ද, හැසුණේ ද, නො පැතුරුණේ ද, ගැඹුරු වූයේ ද, නිනද ඇත්තේ ද වේ. තවද ඒ බුදුහු පිරිස් පමණින් ස්වරයෙන් හඟවාලන සේක. ඒ බුදුන්ගේ ඝොෂය පිරිසෙන් බැහැර නො නික්මේ. තවද ඒ බුදුහු බඹඝොෂ ඇත්තාහු කුරවිකොවුල්හඬ මෙන් මිහිරි වදන් ඇති සේක් නුසි 'එවං වග්ගුවදො' යනු වේ. **සත්ථා** යනු: බුදුහු ශාස්තෘ වූහ, සාත්තුනායකයකු වැන්නහ. යම්සේ සාත්තුනායක සත්ත්වයන් කාන්තාරය තරණය කරවා ද, දුර්භික්ෂකාන්තාරය තරණය කරවා ද, නිරුදකකාන්තාරය තරණය කරවා ද, එතෙර කරවා ද, නිස්තරණය කරවා ද, ප්‍රතරණය කරවා ද, නිර්භය භූමියට පමුණුවා ද; එලෙසින් මැ බුදුහු සාර්ථවාහ වූ සේක් වෛනෙයසත්ත්වයන් කතරින් තරවන සේක්, ජාතිකාන්තාරය තරණය කරවන සේක, ජරාකාන්තාරය තරණය කරවන සේක, ව්‍යාධිකාන්තාරය... මරණ- ශොක - පරිදෙව - දුඃඛ - දෞර්මනස්‍ය - උපායාස කාන්තාරය තරවන සේක, රාගකාන්තාරය තරවන සේක, ද්වෙෂ-මොහ-මාන-දෘෂ්ටි - ක්ලෙශ - දුශ්චරිතකාන්තාරය තරවන සේක, රාග නමැති ගහනය තරවන සේක, ද්වෙෂ - මොහ - මාන - දෘෂ්ටි නමැති ගහනය තරවන සේක, ක්ලෙශගහනය දුශ්චරිතගහනය තරවන සේක, උත්තරණය නිස්තරණය ප්‍රතරණය කරවන සේක, නිර්භය වූ අමෘමහනිර්වානට පමුණුවන සේක් නුසි මෙසේත් 'බුදුහු සාර්ථවාහ' යැ. නොහොත් බුදුහු (නිවනට පමුණුවනුයෙන්) නෙතෘ වන සේක, (දර්ශනකාලයෙහි සංවර - ප්‍රහාණ විනය වශයෙන් වෛනෙයයනට) විනෙතෘ වන සේක, දෙශනාකාලයෙහි සැක සිඳින හෙයින්) අනුනෙතෘ වන සේක, (සැක සිඳ අර්ථය) පනවන සේක, (පැනවූ අර්ථයන්) නිශ්චය කරවන සේක, (පිළිවෙත්) දක්වන සේක, (ප්‍රතිපත්තිඵලයෙන්) පහදවන සේක් නුසි මෙසේත් බුදුහු 'සාර්ථවාහ' යැ. නොහොත් බුදුහු (පෙර ස්වසන්තානයෙහි) නූපන්විරූ ආර්යමාර්ගය ඉපදවූ සේක, (වෛනෙයසන්තානයෙහි) අසඤ්ජාතමාර්ගය උපදවන සේක, ප්‍රකාශ නො කළ මාර්ගය (විවරණ දීම් වශයෙන්) ප්‍රකාශ කරන සේක, (ප්‍රත්‍යවෙක්ෂා වශයෙන්) මාර්ගය දන්නා සේක, (වෛනෙයසන්තාන යෙහි ඉපැදවියයුතු ආර්යමාර්ගය) දන්නාසුලු සේක, (බෝසත්නට පැවැසිය යුතු) මාර්ගයෙහි විචක්ෂණ වූ සේක. තවද ඒ බුදුන් විසින් හෙළිකළ මාර්ගය හේතු කොට මේ කල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදිගුණයෙන්) පසුපස යෙමින් වෙසෙත් නුසි මෙසේත් බුදුහු 'සාර්ථවාහ' වූහ'යි 'එවං වග්ගුවදො සත්ථා' යනු වේ.

**තුසිතා ගණිමාගතොති** – භගවා තුසිතා කායා චවිත්වා සතො සම්පජානො මාතුකුච්ඡිං ඔක්කන්තොති එවම්පි තුසිතා ගණිමාගතො; අථවා දෙවා වුච්චන්ති තුසිතා; තෙ තුට්ඨා සන්තුට්ඨා අත්තමනා පමුදිතා පීති-සොමනස්සජාතා; දෙවලොකතො ගණිං ආගතොති එවම්පි තුසිතා ගණිමා-ගතො; අථ වා අරහන්තා වුච්චන්ති තුසිතා. තෙ තුට්ඨා සන්තුට්ඨා අත්තමනා පරිපුණ්ණසඞ්කප්පා. අරහන්තානං ගණිං ආගතොති එවම්පි තුසිතා ගණිමාගතො; 'ගණී'ති ගණී භගවා; ගණාචරියොති ගණී; ගණස්ස සත්ථාති ගණී; ගණං පරිහරතීති ගණී; ගණං ඔවදතීති ගණී; ගණ-මනුසාසතීති ගණී; විසාරදො ගණං උපසඞ්කමතීති ගණී; ගණොස්ස[1] සුස්සූසති සොතං ඔදහති අඤ්ඤා චිත්තං උපට්ඨපෙතීති ගණී; ගණං අකුසලා උට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතීති ගණී; භික්ඛුගණස්ස ගණී, භික්ඛුනීගණස්ස ගණී, උපාසකගණස්ස ගණී, උපාසිකාගණස්ස ගණී, රාජගණස්ස ගණී, ඛත්තියගණස්ස – බ්‍රාහ්මණගණස්ස – වෙස්සගණස්ස-සුද්දගණස්ස – දෙවගණස්ස –බ්‍රහ්මගණස්ස[2] ගණී, සඞ්ඝී, ගණී, ගණාචරියො; ආගතොති ආගතො උපාගතො සමුපාගතො සම්පත්තො[3] සඞ්කස්ස-නගරන්ති – තුසිතා ගණිමාගතො.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ
(ඉච්චායස්මා සාරිපුත්තො)
න සුතො උද කස්සචි,
එවං වග්ගුවදො සත්ථා
තුසිතා ගණිමාගතො"ති.

**16 – 2**

සදෙවකස්ස ලොකස්ස
යථා දිස්සති චක්ඛුමා,
සබ්බං තමං විනොදෙත්වා
එකොව රතිමජ්ඣගා.

**සදෙවකස්ස ලොකස්සාති** – සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සායාති – සදෙවකස්ස ලොකස්ස.

**යථා දිස්සති චක්ඛුමාති** – යථා භගවන්තං තාවතිංසභවනෙ පාරිච්ඡත්තක-මූලෙ පණ්ඩුකම්බලසිලායං නිසින්නං ධම්මං දෙසෙන්තං දෙවතා පස්සන්ති; තථා මනුස්සා පස්සන්ති; යථා මනුස්සා පස්සන්ති, තථා දෙවතා පස්සන්ති; යථා දෙවානං දිස්සති, තථා මනුස්සානං දිස්සති; යථා මනුස්සානං දිස්සති, තථා දෙවානං දිස්සතීති එවම්පි යථා දිස්සති චක්ඛුමා. යථා වා පනෙ'කෙ භොන්තො සමණබ්‍රාහ්මණා අදන්තා දන්තවණ්ණෙන දිස්සන්ති, අසන්තා සන්තවණ්ණෙන දිස්සන්ති, අනුපසන්තා උපසන්තවණ්ණෙන දිස්සන්ති, අනිබ්බුතා නිබ්බුතවණ්ණෙන දිස්සන්ති.

1. ගණස්ස - ස. 2. බ්‍රාහ්මණගණස්ස - සිමු. II. 3. සමුපපන්නො සිමු. මජසං.

**තුසිතා ගණිමාගතො** - බුදුහු තුසිපුරයෙන් සැව, සිහි නුවණ ඇති ව, මවුකුස පිළිසඳ ගත්තාහු නුයි මෙසේත් 'තුසිතා ගණිමාගතො' යනු වේ. නොහොත් දෙවියෝ තුසිතයෝ යැයි කියනු ලැබෙති, ඔවුහු තුටු වූවාහු සතුටු වූවාහු සියමන වූවාහු ප්‍රමුදිත වූවාහු උපන් සතුටු සොම්නස් ඇත්තාහු ය; එ දෙව්ලොවින් ගණ මැදට ආවාහු නුයි. මෙසේත් 'තුසිතා ගණිමාගතො' යනු වේ. නොහොත් රහත්හු තුසිතයෝ යැයි කියනු ලැබෙති, ඔවුහු තුෂ්ටයෝ යැ, සන්තුෂ්ටයෝ යැ, තුටුසිත් ඇත්තෝ යැ, පරිපූර්ණ සංකල්ප ඇත්තෝ සි; රහතුන්ගේ ගණමැදට ආවාහු නුයි මෙසේත් 'තුසිතා ගණිමාගතො' යනු වේ. **ගණී** යනු: බුදුහු ගණී වූහ, ගණාචාර්ය නුයි-ගණී ය, ගණයට ශාස්තෘ වූවාහු නුයි - ගණී යැ, ගණයා පරිහරණය කෙරෙත් නුයි - ගණී යැ, ගණයාට අවවාද දෙත් නුයි - ගණී යැ, ගණයාට අනුශාසනා කෙරෙත් නුයි - ගණී යැ, විශාරද වැ ගණයා වෙත එළැඹෙත් නුයි-ගණී යැ, ගණ තෙමේ ඔබගේ බස අසනු කැමැති වෙයි, (ඇසීමට) කන තමයි, දැනැගැනීමට සිත එළවා නුයි - ගණී යැ; ගණයා අකුශලයෙන් නඟා කුශලයෙහි පිහිටිවාලන සේක් නුයි - ගණී යැ, භික්ෂුගණයා සම්බන්ධ ගණ ඇති සේක, (-භික්ෂුගණයට ගණී යැ) භික්ෂුණීගණයට ගණී යැ, උපාසක ගණයට ගණී යැ, උපාසිකාගණයට ගණී යැ, රාජගණයට ගණී යැ, ක්ෂත්‍රියගණයට - බ්‍රාහ්මණගණයට - වෛශ්‍යගණයට - ශූද්‍රගණයට - දෙව ගණයට - බ්‍රහ්මගණයට ගණී යැ; සමූහ ඇති සේක, ගණ ඇති සේක, ගණාචාර්ය වූ සේකි; **ආගතො** යනු: සකස් නුවරට එළැඹියහ, පැමිණි සේක් නුයි 'තුසිතා ගණිමාගතො' යනු වේ.

එයින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

**"න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ -පෙ- තුසිතා ගණිමාගතො"**සි.

## 16 - 2

පසැස් ඇති බුදුහු සදෙවක ලෝකයාට යම්සේ පැනෙන සේක් නම්, (මිනිසුන්ට ද එසේ පැනෙති) නොහොත් සදෙවක ලෝකයාට අවිපරීත වැ පැනෙන සේක. එකලා වූවාහු මැ (රාගාදි) සියලු අඳුරු දුරු කොට (නෛෂ්ක්‍රම්‍යාදි)රතියට පැමිණි සේකි.

**සදෙවකස්ස ලොකස්ස** - දෙවියන් සහිත වූ මරුන් සහිත වූ බඹුන් සහිත වූ ලොවට මහණබමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත වූ ප්‍රජාවට නුයි 'සදෙවකස්ස ලොකස්ස' යනු වේ.

**යථා දිස්සති චක්ඛුමා** - තව්තිසාබවනෙහි පරසතුමුල පඬුඇඹුල් සලයෙහි වැඩහිඳ දහම් දෙසන බුදුන් දෙවියෝ යම්සේ දකිත් නම් එසෙසින් මිනිස්සු දකිති; මිනිස්සු යම්සේ දකිත් නම්, දෙවියෝ එසේ දකිත්; යම්සේ දෙවියනට පැනෙන සේක් නම්, එසේ මිනිස්නට පැනෙන සේක. යම්සේ මිනිසුන්ට පැනෙන සේක් නම්, එසෙසින් දෙවියනට පැනෙන සේක් නුයි මෙසේත් යථා දිස්සති චක්ඛුමා' යනු වේ. තවද යම්සේ ඇතැම් මහණබමුණු කෙනෙක් නො දැමුණාහු දැමුණු ලෙසින් දක්නා ලැබෙත් ද, නො සන්හිඳුණාහු සන්හුන් ලෙසින් දක්නා ලැබෙත් ද, අනුපශාන්ත වූවාහු උපශාන්ත ලෙසින් දක්නා ලැබෙත් ද, නො නිවුණාහු නිවුණු ලෙසින් දක්නා ලැබෙත් ද,

1. "පතිරූපකො මත්තිකාකුණ්ඩලොව
ලොහඩ්ඪමාසොව සුවණ්ණඡන්නා,
චරන්ති ලොකෙ පරිවාරඡන්නා
අන්තො අසුද්ධා බහි සොභමානා"ති[a].

න භගවා එවං දිස්සති. භගවා භූතෙන තච්ඡෙන තථෙන යාථාවෙන අවිපරීතෙන සභාවෙන දන්තො දන්තවණ්ණෙන දිස්සති, සන්තො සන්තවණ්ණෙන දිස්සති, උපසන්තො උපසන්තවණ්ණෙන දිස්සති, නිබ්බුතො නිබ්බුතවණ්ණෙන දිස්සති; අකප්පිතඉරියාපථා ච බුද්ධා භගවන්තො පණිධිසම්පන්නාති එවම්පි - යථා දිස්සති චක්ඛුමා. අථවා භගවා විසුද්ධසද්දො ගතකිත්තිසද්දසිලොකො නාගභවනෙ ච සුපණ්ණභවනෙ ච යක්ඛභවනෙ ච අසුරභවනෙ ච ගන්ධබ්බභවනෙ ච මහාරාජභවනෙ ච ඉන්දභවනෙ ච බ්‍රහ්මභවනෙ ච දෙවභවනෙ ච එදිසො ච තාදිසො ච තතො ච භිය්‍යොති එවම්පි - යථා දිස්සති චක්ඛුමා. අථවා භගවා දසහි බලෙහි සමන්නාගතො චතූහි වෙසාරජ්ජෙහි චතූහි පටිසම්භිදාහි ඡහි අභිඤ්ඤාහි ඡහි බුද්ධධම්මෙහි තෙජෙන ච බලෙන ච ගුණෙන ච විරියෙන ච පඤ්ඤාය ච දිස්සති ඤායති පඤ්ඤායති.

2. "දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තොව පබ්බතො,
අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිඛිත්තා යථා සරා"ති[b]

එවම්පි යථා දිස්සති චක්ඛුමා. චක්ඛුමාති භගවා පඤ්චහි චක්ඛූහි චක්ඛුමා: මංසචක්ඛුනාපි චක්ඛුමා, දිබ්බචක්ඛුනාපි චක්ඛුමා, පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා, බුද්ධචක්ඛුනාපි චක්ඛුමා, සමන්තචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා මංසචක්ඛුනාපි චක්ඛුමා? මංසචක්ඛුම්හි භගවතො පඤ්ච වණ්ණා සංවිජ්ජන්ති: නීලො ච වණ්ණො පීතකො ච වණ්ණො ලොහිතකො ච වණ්ණො කණ්හො ච වණ්ණො ඔදාතො ච වණ්ණො. අක්ඛිලොමානි ච භගවතො - යත්ථ ච අක්ඛිලොමානි පතිට්ඨිතානි තං නීලං හොති සුනීලං පාසාදිකං දස්සනෙය්‍යං උම්මාපුප්ඵසමානං. තස්ස පරතො පීතකං හොති සුපීතකං සුවණ්ණවණ්ණං පාසාදිකං දස්සනෙය්‍යං කණිකාරපුප්ඵසමානං. උභතො අක්ඛිකූටානි භගවතො ලොහිතකානි හොන්ති සුලොහිතකානි, පාසාදිකානි දස්සනෙය්‍යානි ඉන්දගොපකසමානානි. මජ්ඣෙ කණ්හං හොති සුකණ්හං අලූඛං සිනිද්ධං[1] පාසාදිකං දස්සනෙය්‍යං අද්දාරිට්ඨකසමානං.[2] තස්ස පරතො ඔදාතං හොති සුඔදාතං සෙතං පණ්ඩරං පාසාදිකං දස්සනෙය්‍යං ඔසධීතාරකාසමානං. තෙන භගවා පාකතිකෙන මංසචක්ඛුනා අත්තභාවපරියාපන්නෙන පුරිමසුචරිතකම්මාභිනිබ්බත්තෙන සමන්තා යොජනං පස්සති දිවා චෙව රත්තිඤ්ච.

---

a. කොසලසංයුත්ත - දුතියවග්ග. b. ධම්මපද - පකිණ්ණකවග්ග.
1. සුද්ධං - මජසං. සිමු. II. 2. භද්දාරිට්ඨකසමානං - ස.

1. "සුවර්ණප්‍රතිරූප වූ මැණිකෙන් කළ කුණ්ඩලාභරණයක් සෙයින් ද, රතින් වැසූ ලෝහොමස්සක් සෙයින් ද, ලොව්‍ පිරිවරින් වැසුණාහු ඇතුළත රාගාදියෙන් අශුද්ධ වූවාහු පිටත චීවරාදියෙන් ශෝභමාන වූවාහු හැසිරෙත්" යයි.

බුදුහු එසේ නො දක්නා ලැබෙත්. බුදුහු විද්‍යමාන වූ සැබෑ වූ තතු වූ යාථාවත් වූ අවිපරීත වූ ස්වභාවයෙන් දැමුණාහු දැමුණු වර්ණීන් දක්නා ලැබෙති, සත්හුන් සේක් ශාන්තවර්ණයෙන් දක්නා ලැබෙති, උපශාන්ත වූ සේක් උපශාන්තවර්ණයෙන් දක්නා ලැබෙති, (ක්ලේශපරිනිර්වාණයෙන්) නිවුණාහු නිවුණු වර්ණීන් දක්නා ලැබෙත්. තවද භාග්‍යවත් බුදුවරයෝ අකල්පිත (-නො සැරසූ) ඉරියව් ඇත්තාහු පරිපූර්ණ ප්‍රාර්ථනා ඇත්තාහු නුයි මෙසේත් 'යථා දිස්සති චක්ඛුමා' යනු වේ. නොහොත් බුදුහු පවිත්‍ර වූ කීර්තිඝෝෂ ඇති සේක් පැතිරගිය කීර්තිඝෝෂ හා ප්‍රශංසා ඇත්තාහු නාවිමන්හි ද ගුරුළුවිමන්හි ද යක්විමන්හි ද අසුරවිමන්හි ද ගඳබ්බවිමන්හි ද සිවුවරමුන්ගේ විමන්හි ද දෙව්රදළිමන්හි ද බඹවිමන්හි ද දෙව්විමන්හි ද එබඳු වූවාහු ද එයින් අතිරේක වූවාහු ද දක්නා ලැබෙත් නුයි මෙසේත් 'යථා දිස්සති චක්ඛුමා' යනු වේ. නොහොත් බුදුහු දශබලයෙන් චතුර්වෛශාරද්‍යයෙන් සිවුපිළිසිඹියාවෙන් ෂඩභිඥාවෙන් ෂඩ්විධ බුද්ධධර්මයෙන් ද තේජසින් ද බලයෙන් ද ගුණයෙන් ද වීර්‍යයෙන් ද ප්‍රඥාවෙන් ද සමන්විත වූවාහු දක්නා ලැබෙති, දන්නා ලැබෙති, පැනෙන සේකි.

2. (උත්සන්න කුශලමූල ඇති) සත්පුරුෂයෝ දුර සිටියාහු නමුදු හිමවත් පර්වතය සෙයින් ප්‍රකාශ වෙති. මේ ලොව්‍ (ආමිෂගරුක වූ) අසත්පුරුෂයෝ රෑ විදි හී සෙයින් නො පැනෙන්නාහු යි.

මෙසේත් 'යථා යථා දිස්සති චක්ඛුමා' යනු වේ. චක්ඛුමා යනු බුදුහු පසැසකින් චක්ෂුර්මත් වූහ: මසැසිනු ද චක්ෂුර්මත්හ, දිවැසිනු ද චක්ෂුර්මත්හ, පැනැසිනු ද චක්ෂුර්මත්හ, බුදුඇසිනු ද චක්ෂුර්මත්හ, සමතැසිනු ද චක්ෂුර්මත්හු යි.

කිසෙයින් බුදුහු මසැසිනු ද චක්ෂුර්මත් වූහ යත්: බුදුන්ගේ මසැස්හි නිල් පැහැය ද රන්වන් පැහැය ද රත් පැහැය ද කළු පැහැය ද සුදු පැහැය ද යන පස්වැ වර්ණයෝ විද්‍යමාන වෙති. තව ද බුදුන්ගේ අක්ෂිරෝම වෙයි, යම් තැනෙක්හි අක්ෂිරෝම පිහිටියේ ද එතැන දියමෙරළියමල් සුදුසු සුනිල් පිරිසුදු දැකුම්කලු නිල් පැහැ වෙයි. එ ඉක්බිති කිණිහිරිමල් සුදුසු සුකසාවන් රන්වන් පිරිසුදු දැකුම්කලු කසාවන් පැහැ වෙයි. බුදුන්ගේ දෙනෙතග රතිඳුගොව් සුදුසු සුරත් පිරිසුදු දැකුම්කලු රත්පැහැ වෙයි, මැද රුක්පෙණලඇට සුදුසු ඉතා කළු මෙලෙක් සිනිඳු පිරිසුදු දැකුම්කලු කළු-පැහැ වෙයි, එ ඉක්බිති දවහන්තරැ සුදුසු ඉතා සුදු හෙළ පඬර පිරිසුදු දැකුම්කලු සුදුපැහැ වේ. බුදුහු අත්බැව ඇසුරු කළ පෙර පින්කමින් උපන් ඒ පස්පැ දිස්නා පියවි මසැසින් ඇවල්හි ද රැසිඳු හාත්පස සියක් යොදුන් දකිති.

යදා හි චතුරඞ්ගසමන්නාගතො අන්ධකාරො හොති: සුරියො ච අත්ථඞ්ගතො හොති, කාළපක්ඛො ච උපොසථො හොති, තිබ්බො ච වනසණ්ඩො හොති, මහා ච කාළමෙඝො අබ්භුට්ඨිතො හොති, එවරූපෙපි චතුරඞ්ගසමන්නාගතෙ අන්ධකාරෙ සමන්තා යොජනං පස්සති. නත්ථි සො කුට්ටො වා කවාටං වා පාකාරො වා පබ්බතො වා ගච්ඡො වා ලතා වා ආවරණං රූපානං දස්සනාය, එකඤ්චෙ තිලඵලං නිමිත්තං කත්වා තිලවාහෙ පක්ඛිපෙය්‍ය, තඤ්ඤෙව තිලඵලං උද්ධරෙය්‍ය. එවං පරිසුද්ධං භගවතො පාකතිකං මංසචක්ඛු. එවං භගවා මංසචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා දිබ්බෙන චක්ඛුනාපි[2] චක්ඛුමා? භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති: ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා, වචීදුච්චරිතෙන සමන්නාගතා, මනොදුච්චරිතෙන සමන්නාගතා, අරියානං උපවාදකා, මිච්ඡාදිට්ඨිකා, මිච්ඡාදිට්ඨිකම්මසමාදානා; තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා. ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා, වචීසුචරිතෙන සමන්නාගතා, මනොසුචරිතෙන සමන්නාගතා, අරියානං අනුපවාදකා, සම්මාදිට්ඨිකා, සම්මාදිට්ඨිකම්මසමාදානා; තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නා'ති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ, යථාකම්මූපගෙ සත්තෙ පජානාති. ආකඞ්ඛමානො ච භගවා එකම්පි ලොකධාතුං පස්සෙය්‍ය, ද්වෙපි ලොකධාතුයො පස්සෙය්‍ය, තිස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය, චතස්සොපි ලොකධාතුයො පස්සෙය්‍ය, පඤ්චපි ලොකධාතුයො පස්සෙය්‍ය, දසපි ලොකධාතුයො පස්සෙය්‍ය, වීසතිම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, තිංසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, චත්තාලීසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, පඤ්ඤාසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, සහස්සිම්පි චූළනිකං ලොකධාතුං පස්සෙය්‍ය, ද්විසහස්සිම්පි මජ්ඣිමිකං ලොකධාතුං පස්සෙය්‍ය, තිසහස්සිම්පි මහාසහස්සිං ලොකධාතුං පස්සෙය්‍ය. යාවතකං පන ආකඞ්ඛෙය්‍ය, තාවතකං පස්සෙය්‍ය. එවං පරිසුද්ධං භගවතො දිබ්බචක්ඛු. එවං භගවා දිබ්බෙන චක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා? භගවා මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්තඤාණො අනන්තතෙජො

1. යදපි - මජසං. සීමු. II 2. චක්ඛුනා - සීමු. II.

යම් කාලයක චතුරඞ්ගසමන්වාගත අන්ධකාරය වේ නම්: හිරු අස්තයට ගියේත් වේ ද; කෘෂ්ණපක්ෂයෙහි පොහොයත් වේ ද, ගහන වූ වනලැහැබත් වේ ද, මහත් කළු වලාකුළු නැගුණේත් වේ ද, මෙබඳු වූ චතුරඞ්ගසමන්වාගත අන්ධකාරයෙහි පවා හාත්පස යොදුනක් දක්නා සේක, භිත්තියක් වේවයි දොරෙක් වේවයි පවුරෙක් වේවයි ගලෙක් වේවයි ගසෙක් වේවයි වැලෙක් වේවයි රූප දැකීමට එබඳු ආවරණයෙක් නැති, ඉදින් එක් තලඇටයෙක් ලකුණු කොට තලගැලෙක බහාලත්තේ නම්, ඒ තලඇටය මැනහාගන්නා සේක. බුදුන්ගේ පියවි මසැස මෙසේ පිරිසුදු වේ. මෙසේ බුදුහු මසැසිනුදු චක්ෂුර්මත් වූ සේක.

කිසෙයින් බුදුහු දිවැසිනු දු චක්ෂුර්මත් වූහ යත්: බුදුහු විශුද්ධ වූ මිනිසැස ඉක්මවා සිටි දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද සුගතියට ගියා වූ ද සත්ත්වයන් බලන සේක: ‘අහෝ මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනෝදුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්‍යයන්ට උපවාද කළාහු, මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටිවශයෙන් සමාදන් වූ විවිධ කර්ම ඇත්තාහු ය, ඔහු කය බිඳීමෙන් මරණින් මත්තෙහි සුව රහිත වූ දුකට ගති වූ විවශ වැ පතිත වන නිරයට පැමිණියාහු ය; යළි මේ භවත් සත්ත්වයෝ කායසුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනස්සුචරිතයෙන් යුක්ත වූවාහු ආර්‍යයන්ට උපවාද නො කළාහු සම්‍යග්දෘෂ්ටි ඇත්තාහු සම්‍යග්දෘෂ්ටිවශයෙන් සමාදන් වූ කර්ම ඇත්තාහු ය, ඔහු කාබුන් මරණින් මතු සුන්දර ගති ඇති සැපයෙන් අග්‍ර වූ ලොකයට පැමිණියාහ’යි කර්මවූ පරිද්දෙන් පැමිණි සත්ත්වයන් දැනගන්නා සේක, මෙසේ විශුද්ධ වූ මිනිසැස ඉක්මවා සිටි දිවැසින් ච්‍යුත වන්නා වූ ද උපදනා වූ ද හීන වූ ද ප්‍රණීත වූ ද අභිරූප වූ ද විරූප වූ ද සුගතියට ගියා වූ ද දුගතියට ගියා වූ ද සත්ත්වයන් බලන සේක, කර්ම වූ පරිදි පරලොව පැමිණි සත්ත්වයන් දැනගන්නා සේක. තවද බුදුහු කැමැති වන්නාහු නම්, එක් ලොකධාතුවකු දු බලන සේක, ලොකධාතු දෙකකු දු බලන්නාහ, තුන් ලොකධාතුවකු දු බලන්නාහ, සතර ලොකධාතුවකු දු බලන්නාහ, පස් ලොකධාතුවකු දු බලන්නාහ, දස ලොකධාතුවකු දු බලන්නාහ, විසි ලොකධාතුවකු දු බලන්නාහ, තිස් ලොකධාතුවකු දු බලන්නාහ, සතලිස් ලොකධාතුවකු දු බලන්නාහ, පනස් ලොකධාතුවකු දු බලන්නාහ, සහස්‍රී චූලනීලොකධාතුව ද බලන්නාහ, ද්විසහස්‍රී මධ්‍යම ලොකධාතුව ද බලන්නාහ, ත්‍රිසහස්‍රී මහාසහස්‍රීලොකධාතුව ද බලන්නාහ, තවද යම් පමණ කැමැතිවන සේක් නම්, ඒ තාක් බලන සේක, මෙසේ බුදුන් ගේ දිවැස පරිශුද්ධ වේ. මෙසේ බුදුහු දිවැසිනු දු චක්ෂුර්මත් වන සේක.

කිසෙයින් බුදුහු පැනැසිනුදු චක්ෂුර්මත් වූහ යත්: බුදුහු මහත් ප්‍රඥා ඇති සේක, පතල ප්‍රඥා ඇති සේක, ශීඝ්‍රප්‍රඥා ඇති සේක, දිවෙන ප්‍රඥා ඇති සේක, තියුණු ප්‍රඥා ඇති සේක, විනිවිද යන ප්‍රඥා ඇති සේක, ප්‍රඥාප්‍රභෙදයෙහි නිපුණ වූහ, ප්‍රභෙදයට පැමිණි ප්‍රඥා ඇත්තාහ, අධිගම කළ ප්‍රතිසංවිද් ඇති සේක, චතුර්වෛශාරද්‍යයට පැමිණි සේක, දශබලධාරීහ, පුරුෂශ්‍රෙෂ්ඨයහ, පුරුෂසිංහයහ, පුරුෂනාගයහ, පුරුෂාජානෙයයහ, පුරුෂධෞරෙයයහ, අනන්තඥාන ඇති සේක, අනන්ත තෙජස් ඇති සේක,

අනන්තයසො අඩ්ඪො මහද්ධනො ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතා. සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො. මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා. සො හි භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො[1] බ්‍රහ්මභූතො, වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො.

නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය. අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති, යං කිඤ්චි ඤෙය්‍යං නාම අත්ථි ජානිතබ්බං අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා අත්ථො, සබ්බං තං අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති, සබ්බං වචීකම්මං – සබ්බං මනොකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති. අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, අනාගතෙ අප්පටිහතං ඤාණං, පච්චුප්පන්නෙ අප්පටිහතං ඤාණං. යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං. ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති. ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵුසිතානං හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමං නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො හොන්ති; එවමෙවං බුද්ධස්ස භගවතො ඤෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො: යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං. ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං. ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි. අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා.

සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා, ආකඞ්ඛාපටිබද්ධා, මනසිකාරපටිබද්ධා, චිත්තුප්පාදපටිබද්ධා.

1. මෙත්තභූතො - සිමු. II.

අනන්ත යශස් ඇති සේක, ප්‍රඥාධනයෙන් ආඪ්‍ය වූහ, මහත් වූ ප්‍රඥාධන ඇති සේක, ප්‍රඥාධනයෙන් ධනවත් සේක, (නිවනට පමුණුවන හෙයින්) නෙතෘ වූහ, (වෛනෙයයන් හික්මවන හෙයින්) විනෙතෘ වූහ, (සැක සිඳින හෙයින්) අනුනෙතෘ වූහ, අර්ථය පනවන සේක, නිශ්චය කරවන සේක, පිළිවෙත් දක්වන සේක, ප්‍රතිපත්තිඵලයෙන් පහදවන සේක; තවද ඒ බුදුහු (සිය සතන්හි) නූපන් ආර්‍යමාර්ගය ඉපද වූ සේක, (වෛනෙය සන්තානයෙහි) අසඤ්ජාත මාර්ගය උපදවන සේක, ප්‍රකාශ නො කළ මාර්ගය (විවරණ දීම් වශයෙන්) ප්‍රකාශ කරන සේක, ප්‍රත්‍යවෙක්ෂා වශයෙන් මාර්ගය දන්නා සේක, මාර්ගය දන්නාසුළු වූහ, මාර්ගයෙහි විචක්ෂණ වූ සේක. තවද මෙ කල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදි ගුණයෙන්) පසුපස යමින් වෙසෙත්. ඒ බුදුහු දතයුතු ඥෙයධර්මය දන්නා සේක, දක්ක යුතු ඥෙය පථය නුවණැසින් දක්නා සේක, (දර්ශනපරිනායක හෙයින්) ඇසක් මෙන් වූහ, ඥානමය වූහ, ධර්මමය වූහ, ශ්‍රේෂ්ඨ වූහ, (දහම් දෙසන හෙයින්) වක්තෘ වූහ, ප්‍රවක්තෘ වූහ, (අර්ථය දක්වන හෙයින්) නිනෙතෘ වූහ, අමෘතය දෙන සේක, ධර්මස්වාමී සේක, තථාගත වූ සේක.

ඒ බුදුන් විසින් මහනුවණින් නොදන්නා ලද්දක් නුවණැසින් නො දක්නා ලද්දක් නුවණින් අවිදිත වූවක් ප්‍රත්‍යක්ෂ නො කරන ලද්දක් ප්‍රඥාවෙන් ස්පර්ශ නො කරන ලද්දක් නම් නැත. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයක් වේ නම්, අතීතානාගතප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට (සඞ්ඛතාසඞ්ඛත වූ) සියලු ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුන්ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙත්. ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද දෘෂ්ටධාර්මිකාර්ථය ද සාම්පරායිකාර්ථය ද උත්තාන (-ප්‍රකට) අර්ථය ද ගම්භීරාර්ථය ද ගූඪාර්ථය ද ප්‍රතිච්ඡන්නාර්ථය ද නෙය්‍යාර්ථය ද නීතාර්ථය ද නිර්දෝෂාර්ථය ද නිෂ්ක්ලේශාර්ථය ද පරිශුද්ධාර්ථය ද පරමාර්ථාර්ථය ද යන ඒ සියල්ල බුද්ධඥානය තුළ පැතිර පවතී. භාග්‍යවත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී, සියලු වාක්කර්මය - භාග්‍යවත් බුදුන්ගේ සියලු මනඃකර්මය ඥානය අනුව පවතී. අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (-අනාවරණ) යැ, අනාගතයෙහි ඥානය අනාවරණ යැ, වර්තමානයෙහි ඥානය අනාවරණ යි. දත්යුත්ත යම් පමණ ද, ඥානය එ පමණ යැ, ඥානය යම් පමණ ද, දතයුත්ත එ පමණ යි. ඥානය ඥෙය කෙළවර කොට ඇත්තේ යැ, ඥෙය (-දතයුත්ත) ඥානය කෙළවර කොට ඇත්තේ යැ. ඥෙය ඉක්මැ ඥානයෙක් නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති ඒ ධර්මයෝ අන්‍යොන්‍යපර්‍යන්තයෙහි පවත්නාසුළුහ. යම්සේ මනා කොට පැහැසූ සුමුගුපටල දෙකක්හුගේ යට සුමුගුපටල උපරිමය නො ඉක්මවා ද, උඩ සුමුගුපටල හෙට්ඨිමය නො ඉක්මැ සිටී ද, ඔවුහු ඔවුනොවුන්ගේ පර්‍යන්තයෙහි සිටිනාසුළු වෙත් ද; එසෙයින් මැ භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යොන්‍යපර්‍යන්තයෙහි සිටිනාසුළුහ; යම්තාක් ඥෙය ද, ඒතාක් ඥාන යැ; යම්තාක් ඥානය ද ඒතාක් ඥෙය යැ; ඥානය ඥෙයපර්‍යන්තික යැ, ඥෙයය ඥානපර්‍යන්තික යි. ඥෙය ඉක්මැ ඥානයෙක් නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති. ඒ දහම්හු අන්‍යොන්‍යපර්‍යන්තයෙහි සිටුනාසුළුහ.

සියලු දහම් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවත්තේ යැ, සියලු දහම්හු භාග්‍යවත් බුදුන්ගේ මනොද්වාරාවර්ජනයට අයත්හු වෙති, රුචියට අයත්හු වෙති, මනසිකාරය ප්‍රතිබද්ධ වෙති, චිත්තොත්පාද ප්‍රතිබද්ධ වෙත්.

සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙසං සත්තානං භගවා ආසයං ජානාති අනුසයං ජානාති. චරිතං ජානාති. අධිමුත්තිං ජානාති. අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ ජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තො බුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තො මහාසමුද්දෙ පරිවත්තන්ති, එවමෙව සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි පක්ඛී අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙව යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය, තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අභිභවිත්වා තිට්ඨති. යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා, සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හං අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති: ගුළ්හානි ච පටිච්ඡන්නානි ච. කථිතා විසජ්ජිතාව තෙ පඤ්හා භගවතා හොන්ති නිද්දිට්ඨකාරණා. උපක්ඛිත්තකාව තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවා'ව තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති. එවං භගවා පඤ්ඤාචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා බුද්ධචක්ඛුනාපි චක්ඛුමා ? භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ. සෙය්‍යථාපි නාම උප්පලිනියං වා පදුමිනියං වා පුණ්ඩරීකිනියං වා අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකානුග්ගතානි අන්තො නිමුග්ගපොසීනි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි සමොදකං ඨිතානි, අප්පෙකච්චානි උප්පලානි වා පදුමානි වා පුණ්ඩරීකානි වා උදකෙ ජාතානි උදකෙ සංවද්ධානි උදකා අච්චුග්ගම්ම තිට්ඨන්ති අනුපලිත්තානි උදකෙන, එවමෙවං භගවා බුද්ධචක්ඛුනා ලොකං ඔලොකෙන්තො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ, අප්පෙකච්චෙ න පරලොකවජ්ජභයදස්සාවිනො විහරන්තෙ.

සියලු සතුන් විෂයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී, බුදුහු සියලු සත්ත්වයන් ගේ ආශය (අදහස්) දනිති, අනුශය දනිති, චරිතය දනිති, අධිමුක්තිය දනිති, (නුවණැසෙහි) අල්ප වූ රාගාදි රජස් ඇති මහත් වූ රජස් ඇති, තියුණු (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති, මෘදු වූ ඉඳුරන් ඇති, සුන්දර වූ (ශ්‍රද්ධාදි) ආකාර ඇති, ගර්හිත වූ (අශ්‍රද්ධාදි) ආකාර ඇති, සුවිඥෙය්‍ය වූ දුර්විඥෙය්‍ය වූ භව්‍යාභව්‍ය සත්ත්වයන් දැනගන්නා සේක. මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත ලෝවැසි තෙම දෙව්මිනිසුන් සහිත වූ මහණ බමුණන් සහිත ප්‍රජා තොමෝ ඇතුළුබුදුනුවණෙහි පිරිවැටෙයි. තිමි - තිමිංගල පටන් කොට යම් මස්කැසුබු කෙනෙක් වෙත් නම්, ඔහු යම්සේ මහමුහුදෙහි හැසිරෙත් ද, එසෙයින් මරුන් බඹුන් සහිත සදෙවක ලොක තෙමේ මහණබමුණන් සහිත සදෙවමනුෂ්‍යප්‍රජාව ඇතුළුබුදුනුවණෙහි පවතී; යම්සේ විනතා පුත් ගුරුළු රජු පටන් කොට යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම්, ඔහු අහසැ පෙදෙසෙකැ හැසිරෙත් ද, එසෙයින් ම යම් කෙනෙක් නුවණින් සැරියුත් තෙරුන් සම වූවාහු නම්, ඔහු ද බුද්ධඥානයාගේ පෙදෙසෙක පවත්නාහු ය; බුද්ධඥානය දෙව්මිනිසුන් ගේ ප්‍රඥාව පැතිරැ මැඩගෙනැ සිටී. නිපුණ වූ කල පරවාද ඇති වල් විදුනා දුනුවායන් බඳු ප්‍රසිද්ධ වූ යම් ක්ෂත්‍රියපණ්ඩිත කෙනෙක් බ්‍රාහ්මණපණ්ඩිත කෙනෙක් ගෘහපතිපණ්ඩිත කෙනෙක් ශ්‍රමණපණ්ඩිත කෙනෙක් ප්‍රඥාවෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම්, ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද, බොහෝ ප්‍රශ්න රචනා කොට බුදුන් කරා පැමිණ විචාරත්, බුදුන් විසින් ඒ ප්‍රශ්නයෝ සකාරණ වැ විදරණ ලද්දාහු විසඳන ලද්දාහු මැ වෙත්. ඔවුහු බුදුන්ගේ ශ්‍රාවක බවට (උපාසක බවට හෝ) පැමිණියාහු මැ වෙත්. යළි බුදුහු මැ එහි ප්‍රඥාවෙන් අතිශයින් ප්‍රකාශ වෙත් නුසි මෙසේ බුදුහු පැනැසිනු දු චක්ෂුර්මත් වන සේක.

කිසෙයින් බුදුහු බුදුඇසිනු දු චක්ෂුර්මත් වූහ යත්: බුදුහු බුදුඇසින් ලොව බලන සේක් (නුවණැස්හි) අල්ප වූ (රාගාදි) කෙලෙස්රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති (ශ්‍රද්ධාදි) සුන්දරාකාර ඇති (අශ්‍රද්ධාදි) ගර්හිතාකාර ඇති සුවිඥෙය්‍ය වූ දුර්විඥෙය්‍ය වූ සත්ත්වයන් ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භයවශයෙන් දක්නාසුලු වැ වසනුවන් ඇතැම් කෙනකුන් පරලොව හා වද්‍යයන් භයවශයෙන් දක්නාසුලු වැ නො වසනුවන් දුටු සේක; යම්සේ උපුල්විලෙකැ හෝ පියුම්විලෙකැ හෝ නෙළුම්විලෙකැ හෝ ඇතැම් උපුල් හෝ පියුම් හෝ නෙළුම් හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් නො නැඟුණාහු දියතුල ගැලී පොහොනී වූවාහු ද, ඇතැම් උපුල් පියුම් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දිය හා සම වැ සිටියාහු ද, ඇතැම් පියුම් උපුල් හෝ නෙළුම් දියෙහි හටගත්තාහු දියෙහි වැඩුණාහු දියෙන් උඩට නැඟී දිය හා නො වැකුණාහු සිටිත් ද; එසෙයින් මැ බුදුහු බුදුඇසින් ලොව බලන සේක් අල්පරජසක වූ ද මහාරජසක වූ ද තියුණු ඉඳුරන් ඇත්තාවූ ද මෘදු ඉඳුරන් ඇත්තාවූ ද සුන්දරාකාර වූ ද ගර්හිතාකාර වූ ද සුවිඥෙය්‍ය වූ ද දුර්විඥෙය්‍ය වූ ද සත්ත්වයන් පරලොව හා වද්‍යයෙහි භය දක්නාසුලු වැ වසනුවන් ඇතැම් කෙනකුන් පරලොක වද්‍යයෙහි භය දක්නාසුලු වැ නො වසනුවන් දුටු සේක;

ජානාති භගවා අයං පුග්ගලො රාගචරිතො, අයං දොසචරිතො, අයං මොහචරිතො අයං විතක්කචරිතො, අයං සද්ධාචරිතො, අයං ඤාණචරිතො'ති. රාගචරිතස්ස භගවා පුග්ගලස්ස අසුභකථං කථෙති. දොසචරිතස්ස භගවා පුග්ගලස්ස මෙත්තාභාවනං ආචික්ඛති. මොහචරිතං භගවා පුග්ගලං[1] උද්දෙසෙ පරිපුච්ඡාය කාලෙන ධම්මසවනෙ කාලෙන ධම්මසාකච්ඡාය ගරුසංවාසෙ[2] නිවෙසෙති. විතක්කචරිතස්ස භගවා පුග්ගලස්ස ආනාපානසතිං ආචික්ඛති. සද්ධාචරිතස්ස භගවා පුග්ගලස්ස පසාදනීයං නිමිත්තං ආචික්ඛති: බුද්ධසුබොධිං ධම්මසුධම්මතං සඞ්ඝසුප්පටිපත්තිං සීලානි ච අත්තනො. ඤාණචරිතස්ස භගවා පුග්ගලස්ස විපස්සනානිමිත්තං ආචික්ඛති: අනිච්චාකාරං දුක්ඛාකාරං අනත්තාකාරං.

3. "සෙලෙ යථා පබ්බතමුද්ධනිට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො,
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාදමාරුය්හ සමන්තචක්ඛු.
සොකාවතිණ්ණං ජනතමපෙතසොකො,
අවෙක්ඛස්සු ජාතිජරාභිභූත"න්ති a

එවං භගවා බුද්ධචක්ඛුනාපි චක්ඛුමා.

කථං භගවා සමන්තචක්ඛුනාපි චක්ඛුමා? 'සමන්තචක්ඛු' වුච්චති සබ්බඤ්ඤුතඤ්ඤාණං. භගවා සබ්බඤ්ඤුතඤ්ඤාණෙන උපෙතො සමුපෙතො උපගතො[3] සමුපගතො[4] උපපන්නො සමුපපන්නො[5] සමන්නාගතො.

4. "න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං,
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං[6]
තථාගතො තෙන සමන්තචක්ඛූ"ති b

එවං භගවා සමන්තචක්ඛුනාපි චක්ඛුමාති - යථා දිස්සති චක්ඛුමා.

සබ්බං තමං විනොදෙත්වාති - සබ්බං රාගතමං දොසතමං මොහතමං දිට්ඨිතමං කිලෙසතමං දුච්චරිතතමං අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධිකං විඝාතපක්ඛිකං අනිබ්බානසංවත්තනිකං නුදිත්වා පනුදිත්වා ජහිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වාති - සබ්බං තමං විනොදෙත්වා.

එකොව රතිමජ්ඣගාති - එකො භගවා: පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො, අදුතියට්ඨෙන එකො, තණ්හාය පහානට්ඨෙන එකො, එකන්තවීතරාගොති එකො, එකන්තවීතදොසොති එකො, එකන්තවීතමොහොති එකො, එකන්තනික්කිලෙසොති එකො, එකායනමග්ගං ගතොති එකො, අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති එකො.

1. මොහචරිතස්ස භගවා පුග්ගලස්ස - මජසං. 2. ගරු සංවෙසෙ - සීමු. II.
3. උපාගතො - සීමු II. 4. සමුපාගතො - සීමු II.
6. ඤෙය්‍යං - සීමු. II. 5 සමුපපන්නො - මජසං.
a. දීඝනිකාය - මහාපදානසුත්ත, මජ්ඣිමනිකාය - අරියපරියෙසනසුත්ත, බොධිරාජකුමාරසුත්ත, බ්‍රහ්මසංයුත්ත, පඨමවග්ග, ඉතිවුත්තක - දුතියවග්ග.
b පටිසම්භිදාමග්ග - ඤාණකථා, ඉන්ද්‍රියකථා.

'මේ පුද්ගල තෙමේ රාගචරිත ඇත්තෙක, මේ තෙමේ ද්වේෂචරිතයෙක, මේ මෝහචරිතයෙක, මේ විතර්කචරිතයෙක, මේ ශ්‍රද්ධාචරිතයෙක, මේ ඥානචරිත ඇත්තෙකැ'යි බුදුහු දැනගත්තාහ සේක. බුදුහු රාගබහුල පුද්ගලයාට අශුභකථාව වදාරන සේක. ද්වේෂබහුල පුද්ගලයාහට බුදුහු මෛත්‍රීභාවනාව ප්‍රකාශ කරන සේක මෝහබහුල පුද්ගලයා බුදුහු (පෙළ) උදෙසීමෙහි ද (අටුවා) පිළිවිසීමෙහි ද සුදුසු කල ධර්මශ්‍රවණයෙහි ද කලෙක ධර්මසාකච්ඡාවෙහි ගුරුන් ඇසුරු කිරීමෙහි ද සිටුවන සේක. බුදුහු විතර්ක බහුල පුද්ගලයාහට ආනාපානසමාධිය පවසන සේක. ශ්‍රද්ධාබහුල පුද්ගලයාට බුදුහු ප්‍රසාද උපදවන (චූලවේදල්ලාදි) සූත්‍රයක් ද බුදුන්ගේ බුද්ධත්වප්‍රතිවේධය ද ධර්මය ස්වාඛ්‍යාත බව ද සඞ්ඝයා සුප්‍රතිපන්න බව ද තමා සතු සිල් ද පවසන සේක. ඥානචරිත. පුද්ගලයාහට විදර්ශනා නිමිත්ත වූ අනිත්‍යාකාරය දුඃඛාකාරය අනාත්මාකාරය පවසන සේකි.

3. "යම්සේ සෙල්මුවා පව්වක් මත සිටි යේ මැ (ඇස් ඇති පුරුෂයෙක්) හාත්පස ජනතාව බලන්නේ ද, එසෙයින්, සොඳුරු නුවණැති සමතැස් ඇති බුදුරජාණෙනි, නුබ වහන්සේ ද දහම්මුවා පහයට නැඟී, (තුමූ) ශෝක ඇත්තාහු, ශෝකයට බට ජාතිජරායෙන් මඩනා ලද ජනතාව බලනු මැනවැ"යි.

මෙසේ බුදුහු බුදුඇසිනු දු චක්ෂුර්මත් වූ සේක.

කිසෙයින් බුදුහු සමතැසිනු දු චක්ෂුර්මත් වූහ යත්: සර්වඥතාඥානය 'සමන්තචක්ඛු' යයි කියනු ලැබේ. බුදුහු සර්වඥතාඥානයෙන් උපෙතයහ, සමුපෙතයහ, උපගතයහ, සමුපගතයහ, තො වෙත් වූහ, පරිපූර්ණ වූහ, සමන්විත වූ සේක.

4. ඒ තථාගතයන් විසින් මේ ත්‍රෛධාතුකලෝකයෙහි (මෙ කල හෝ) පැනැසින් නුදුටු කිසිවක් නැත, යළි (අතීත වූ) නො දත් කිසිවක් නැත. (අනාගත වූ) නො දැනෙන කිසි (ධර්මජාතයකු) දු නැත. දතයුතු වූ යම් ධර්මජාතයෙක් වී නම්, ඒ සියල්ල අවබෝධ කළහ. එහෙයින් තථාගතයෝ සමන්තචක්ඛු වූ සේකි.

මෙසේ බුදුහු සමතැසිනු දු (-සර්වඥතාඥානයෙන්) චක්ෂුර්මත් වූවාහු නුයි 'යථා දිස්සති චක්ඛුමා' යනු වේ.

**සබ්බං තමං විනොදෙත්වා** – ප්‍රඥාලෝකය අඳුරු කරන, නුවණැස ඇති නො කරන, නො දැනීම ඇති කරන, පැනැස නසන, පීඩාකොටසෙහි වූ, නිවන පිණිස නො පවත්නා වූ, සියලු රාගාන්ධකාරය ද්වේෂාන්ධකාරය මෝහාන්ධකාරය දෘෂ්ට්‍යන්ධකාරය කෙලෙසාන්ධකාරය දුශ්චරිතාන්ධකාරය දුරු කොට ත්‍යාග කොට පරිත්‍යාග කොට බැහැර කොට විගතාන්ත කොට අනුඅභාවයට පමුණුවා නුයි 'සබ්බං තමං විනොදෙත්වා' යනු වේ.

**එකොව රතිමජ්ඣගා** – බුදුහු අතුල්‍යයහ: ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාතාර්ථයෙන් අතුල්‍යයහ, අද්විතීයාර්ථයෙන් අතුල්‍යයහ, තෘෂ්ණාප්‍රහාණාර්ථයෙන් අසහායයහ, ඒකාන්තවීතරාග නුයි අසහායයහ, ඒකාන්තවීතද්වේෂ නුයි අසහායයහ, ඒකාන්තවීතමෝහ නුයි අසහායයහ, ඒකාන්තයෙන් නිකෙලෙශ නුයි අසහායයහ, ඒකායනමාර්ගයට ගියාහු නුයි ඒකයහ, නිරුත්තර වූ සම්‍යක්සම්බෝධිය අවබෝධ කළාහු නුයි ඒකයන.

කථං භගවා පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො? භගවා දහරෙව සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අකාමකානං මාතාපිතුන්නං[1] අස්සුමුඛානං රුදන්තානං විලපන්තානං ඤාතිසඞ්ඝං පහාය සබ්බං ඝරවාසපළිබොධං ඡින්දිත්වා පුත්තදාරපළිබොධං ඡින්දිත්වා ඤාතිපළිබොධං ඡින්දිත්වා සන්නිධිපළිබොධං ඡින්දිත්වා කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිත්වා අකිඤ්චනභාවං උපගන්ත්වා එකො චරති විහරති ඉරියති වත්තති පාලෙති යපෙති යාපෙති, එවං භගවා පබ්බජ්ජාසඞ්ඛාතෙන එකො.

කථං භගවා අදුතියට්ඨෙන එකො? සො එවං පබ්බජිතො සමානො එකො අරඤ්ඤෙ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවති අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානි. සො එකො චරති, එකො ගච්ඡති, එකො තිට්ඨති, එකො සෙය්‍යං කප්පෙති, එකො ගාමං පිණ්ඩාය පවිසති, එකො පටික්කමති, එකො රහො නිසීදති, එකො චඞ්කමං අධිට්ඨාති, එකො චරති, විහරති ඉරියති වත්තෙති පාලෙති යපෙති යාපෙති. එවං භගවා අදුතියට්ඨෙන එකො.

කථං භගවා තණ්හාය පහානට්ඨෙන එකො? සො එවං එකො අදුතියො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො නජ්ජානෙරඤ්ජරාය තීරෙ බොධිරුක්ඛමූලෙ මහාපධානං පදහන්තො මාරං සසෙනං කණ්හං නමුචිං පමත්තබන්ධුං විධමිත්වා තණ්හාජාලිනිං විසත්තිකං පජහි, විනොදෙසි, බ්‍යන්තිං අකාසි, අනභාවං ගමෙසීති.

5. "තණ්හාදුතියො පුරිසො දීඝමද්ධානසංසරං,
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං[2] නාතිවත්තති.

6. එවමාදීනවං[3] ඤත්වා තණ්හා[4] දුක්ඛස්ස සම්භවං,
වීතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ"ති[a].

එවං භගවා තණ්හාය පහානට්ඨෙන එකො.

කථං භගවා එකන්තවීතරාගොති එකො? රාගස්ස පහීනත්තා එකන්තවීතරාගොති එකො, දොසස්ස පහීනත්තා එකන්තවීතදොසොති එකො, මොහස්ස පහීනත්තා එකන්තවීතමොහොති එකො, කිලෙසානං පහීනත්තා එකන්තනික්කිලෙසොති එකො.

කථං භගවා එකායනමග්ගං ගතොති එකො? එකායනමග්ගො වුච්චති චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්ච බලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො.

---

1. මාතාපිතූනං - මජසං PTS.
2. සංසරං - සීමු. II.
3. එතමාදීනවං - සීමු II. PTS. මජසං.
4. තණ්හං - සීමු. PTS. මජසං.
a. චතුක්කඞ්ගුත්තර - භණ්ඩගාමවග්ග, සුත්තනිපාත - ද්වයතානුපස්සනාසුත්ත.

කිසෙයින් බුදුහු ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාත අර්ථයෙන් 'එක' වූහ යත්: බුදුහු තරුණ වූවාහු මැ අඳුන්වන් කෙස් ඇත්තාහු සොඳුරු යෞවනයෙන් යුත් පළමු වයසින් යුක්ත වූවාහු නො කැමැති වූ කඳුලින් තෙමුණු මුහුණු ඇති හඬන්නා වූ වැලැපෙන්නා වූ මවුපියනට අනාදර කොට ඥාතිසමූහයා හැරපියා සියලු ගෘහාවාසපරිරොධ (-දුර්ග)ය සිඳපියා අඹුදරු ආවරණය සිඳ ඥාතිපරිරොධය සිඳ සන්නිධිපරිරොධය සිඳ කෙස්රවුල් බහා කහවත් හැඳැ පෙරෙවැ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවැ අකිඤ්චන (-කිසිවක් නැති) බවට පැමිණ එකලා වැ හැසිරෙති, වෙසෙති ඉරියවු පවත්වති වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්. මෙසේ බුදුහු ප්‍රව්‍රජ්‍යාසඞ්ඛ්‍යාතයෙන් 'එක' යහ.

කිසෙයින් බුදුහු අද්විතීයාර්ථයෙන් 'එක' වූහ යත්: උන්වහන්සේ මෙසේ පැවිදි වූවාහු එකලා වැ අල්පශබ්ද වූ අල්පනිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රාහස්‍යයට සෘාත වූ විවේකයට අනුරූප වූ වනයෙහි දුර සෙනසුන් වනපර්‍යන්ත සෙනසුන් ඇසුරු කෙරෙති. උන්වහන්සේ එකලා වැ හැසිරෙති, එකලා වැ යෙති, එකලා වැ සිටිති, එකලා වැ හොවිති. එකලා වැ ගමට පිඬු සිගා පිවිසෙති, එකලා වැ රහසැ හිඳිති, එකලා වැ සක්මන් කෙරෙති, එකලා වැ හැසිරෙති, වෙසෙති, ඉරියවු පවත්වති, වැටෙති රැකෙති යැපෙති යාපනය වෙත්. මෙසේ බුදුහු අද්විතීයාර්ථයෙන් 'එක' යහ.

කිසෙයින් බුදුහු තෘෂ්ණාප්‍රහාණාර්ථයෙන් 'එක' වූහ යත්: උන් වහන්සේ මෙසේ එකලා වූවාහු අද්විතීය වූවාහු අප්‍රමත්ත වූවාහු කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති වැ නිවනට මෙහෙයූ සිත් ඇති වැ වසන්නාහු නෙරඤ්ජරා නදීතීරයෙහි බෝරුක්මුල මහා ප්‍රධන්වීර්‍ය්‍ය කරන සේක් කෘෂ්ණ කම් ඇති (නො මිදියැ දෙන හෙයින්) නමුචි නම් වූ ප්‍රමත්තයනට බන්ධු වූ සෙන් සහිත මරු විධ්වංසන කොට විසත්තිකා නම් වූ තෘෂ්ණාජාලිනිය දුරු කළහ, බැහැර කළහ, විගතාන්ත කළහ, අනභාවයට පැමිණවූ සේක.

5. 'තෘෂ්ණාව දෙවැනි කොට ඇති පුරුෂ තෙමේ දීර්ඝකාලයක් මුළුල්ලෙහි සැරිසරනුයේ ඉහාත්මභාව අනාගතාත්මභාව නොහොත් ඉත්ථම්භාව අන්‍යථාභාව සඞ්ඛ්‍යාත වූ සංසාරය නො ඉක්මවයි.

6. (අතීතාදි ස්කන්ධයන්හි) මෙසේ ආදීනව දැන, තෘෂ්ණාව දුකට කාරණ යයි දැන, පහවූ තෘෂ්ණා ඇති ආදාන (-ග්‍රහණ) රහිත වූ සමෘති මත් වූ ක්ෂීණාස්‍රව මහණ තෙම හැසිරෙන්නේ යැ'යි.

මෙසේ බුදුහු තෘෂ්ණා ප්‍රහීණාර්ථයෙන් 'එක' යහ.

කිසෙයින් බුදුහු එකාන්තවීතරාග නුයි 'එක' වූහ යත්: රාගය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් වීතරාග නුයි 'එක' යහ. ද්වෙෂය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් වීතද්වෙෂ නුයි 'එක' යහ. මොහය ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් පහවූ මොහ ඇත්තාහු නුයි 'එක' යහ. ක්ලෙශයන් ප්‍රහීණ වන බැවින් එකාන්තයෙන් නික්ලෙශ වූවාහු නුයි 'එක' යහ.

කිසෙයින් බුදුහු එකායනමාර්ගයට ගියාහු නුයි 'එක' වූහ යත්: සතර සතිපට්ඨානයෝ යැ, සතර සම්‍යක් ප්‍රධානයෝ යැ, සතර ඍද්ධිපාදයෝ යැ, පඤ්චෙන්ද්‍රියයෝ යැ, පඤ්ච බලයෝ යැ, සප්ත බොධ්‍යඞ්ගයෝ යැ, ආර්‍ය්‍ය-අෂ්ටාඞ්ගිකමාර්ගී යැ, යන මේ 'එකායනමාර්ගය'යි කියනු ලැබේ.

7. "එකායනං ජාතිඛයන්තදස්සී
මග්ගං පජානාති හිතානුකම්පී,
එතෙන මග්ගෙන තරිංසු පුබ්බෙ
තරිස්සන්ති යෙ ච තරන්ති ඔඝ"න්ති a.

එවං භගවා එකායනමග්ගං ගතො'ති එකො.

කථං භගවා එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති එකො? 'බොධි' වුච්චති චතූසු මග්ගෙසු ඤාණං පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි. භගවා තෙන බොධිඤාණෙන සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති බුජ්ඣි. සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති බුජ්ඣි. සබ්බෙ ධම්මා අනත්තාති බුජ්ඣි. අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති බුජ්ඣි -පෙ- ජාතිපච්චයා ජරාමරණන්ති බුජ්ඣි. අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති බුජ්ඣි. -පෙ- ජාතිනිරොධා ජරාමරණනිරොධොති බුජ්ඣි. ඉදං දුක්ඛන්ති බුජ්ඣි. අයං දුක්ඛසමුදයොති බුජ්ඣි. අයං දුක්ඛනිරොධොති බුජ්ඣි. අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති බුජ්ඣි. ඉමෙ ආසවාති බුජ්ඣි -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදාති බුජ්ඣි. ඉමෙ ධම්මා පරිඤ්ඤෙය්‍යාති බුජ්ඣි. පහාතබ්බාති - භාවෙතබ්බාති - සච්ඡිකාතබ්බාති බුජ්ඣි. ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච බුජ්ඣි. පඤ්චන්නං උපාදානක්ඛන්ධානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච බුජ්ඣි. චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච බුජ්ඣි. යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති බුජ්ඣි. අථවා යං කිඤ්චි බුජ්ඣිතබ්බං අනුබුජ්ඣිතබ්බං පටිබුජ්ඣිතබ්බං සම්බුජ්ඣිතබ්බං අධිගන්තබ්බං ඵස්සිතබ්බං සච්ඡිකාතබ්බං, සබ්බං තං තෙන බොධිඤාණෙන බුජ්ඣි, අනුබුජ්ඣි, පටිබුජ්ඣි, සම්බුජ්ඣි, සම්මා බුජ්ඣි, අධිගච්ඡි, ඵස්සෙසි, සච්ඡාකාසි. එවං භගවා එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති එකො.

රතිමජ්ඣගා'ති 'රති'න්ති නෙක්ඛම්මරතිං විවෙකරතිං උපසමරතිං සම්බොධිරතිං; අජ්ඣගා - අධිගච්ඡි ඵස්සෙසි සච්ඡාකාසීති - එකොව රතිමජ්ඣගා.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"සදෙවකස්ස ලොකස්ස
යථා දිස්සති චක්ඛුමා,
සබ්බං තමං විනොදෙත්වා
එකොව රතිමජ්ඣගා"ති.

16 - 8

තං බුද්ධං අසිතං තාදිං
අකුහං ගණිමාගතං,
බහුන්නමිධ[1] බද්ධානං
අත්ථි පඤ්හෙන ආගමං.

a. සතිපට්ඨානසංයුත්ත - නාලන්දවග්ග. 1. බහූනමිධ - සීමු. II. මජසං.

7. ජාතික්ෂය සඞ්ඛ්‍යාත නිර්වාණය දක්නාසුලු වූ හිතයෙන් අනුකම්පා කරනසුලු වූ බුදුහු එකායනමාර්ගය දන්නා සේක. පෙර යම් කෙනෙක් චතුරෞඝය තරණය කළාහු නම් මෙල මාර්ගයෙන් තරණය කළාහු ය. තවද යම් කෙනෙක් (මතු) තරණය කරන්නාහු නම්, දැන් තරණය කෙරෙත් නම්, මේ මගින් තරණය කෙරෙත්.

මෙසේ බුදුහු ඒකායනමාර්ගයට ගියාහු නුයි 'එක' යහ.

කිසෙයින් බුදුහු එකලා වැ අනුත්තර වූ සම්‍යක්සම්බෝධිය අවබෝධ කළාහු නුයි 'එක' වූහ යත්: සතර මාර්ගඥානය ප්‍රඥෙන්ද්‍රියය ප්‍රඥාබලය ධර්ම-විචයසම්බොධ්‍යඞ්ගය විමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය 'බෝධි' යයි කියනු ලැබේ. බුදුහු ඒ බෝධිඥානයෙන් සියලු සංස්කාරයෝ අනිත්‍යයහ'යි අවබෝධ කළහ (-දත්හ). 'සියලු සංස්කාරයෝ දුක්හ'යි දත්හ. 'සියලු ධර්මයෝ අනාත්මයහ'යි දත්හ. 'අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති' දත්හ... 'ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණ වේ යැ'යි දත්හ. 'අවිද්‍යාවගේ අශෙෂනිරෝධ-යෙන් සංස්කාරනිරොධය වේ යැ'යි දත්හ...'ජාතිනිරොධයෙන් ජරාමරණ-නිරොධය වේ යැ'යි දත්හ. 'මේ දුකැ'යි දත්හ. 'මේ දුක්හෙතුව යැ'යි දත්හ. 'මේ දුක් නැසීම යැ'යි දත්හ. 'මේ දුක් නැසීමට පමුණුවන පිළිවෙතැ'යි දත්හ. 'මොහු ආස්‍රවයෝ යැ'යි දත්හ...මේ ආස්‍රවනිරොධයට පමුණුවන පිළිවෙතැ'යි දත්හ. 'මේ ධර්මයෝ දතයුත්තාහ'යි දත්හ. හළයුත්තාහ'යි-වැඩිය යුත්තාහ'යි – ප්‍රත්‍යක්ෂ කළ යුත්තාහ'යි දත්හ. සවැදෑරුම් ස්පර්ශායතන-යන්ගේ පහළවීම ද නැසීම ද ආස්වාදය ද ආදීනවය ද නිස්සරණය ද දත්හ. යම් කිසිවක් සමුදයධර්ම නම් ඒ සියල්ල නැසෙන පියවි ඇතැ'යි අවබෝධ කළහ. නොහොත් යම් කිසිවක් දතයුතු නම්, නැවත නැවත දතයුතු නම්, වෙසෙසින් දතයුතු නම්, මැනැවින් දතයුතු නම්, අධිගම කළයුතු නම්, නුවණින් ස්පර්ශ කළයුතු නම්, ප්‍රත්‍යක්ෂ කළයුතු නම්, ඒ සියල්ල ඒ බෝධිඥානයෙන් දත්හ. අනුබෝධ කළහ. ප්‍රතිබෝධ කළහ. වෙසෙසින් දත්හ. මැනැවින් දත්හ. ස්පර්ශ කළහ. ප්‍රත්‍යක්ෂ කළහ. මෙසේ බුදුහු එකලා වැ අනුත්තර වූ සම්‍යක්සම්බෝධිය අභිසම්බුද්ධ කළාහු නුයි 'එක' නම් වූහ.

රතිමජ්ඣගා – 'රතිං' යනු: නෛෂ්ක්‍රම්‍යරතියට විවෙකරතියට උපශමරතියට සම්බෝධිරතියට පැමිණියහ – අධිගම කළහ; ස්පර්ශ කළහ, ප්‍රත්‍යක්ෂ කළාහු නුයි 'එකො'ව රතිමජ්ඣගා' යනු වේ.

එයින් වදාළහ සැරියුත් මහතෙරණුවෝ:

''සදෙවකස්ස ලොකස්ස -පෙ- එකොව රතිමජ්ඣගා''යි.

16 – 8

මෙහි (–මේ ශාසනයෙහි) ක්ෂත්‍රියාදි බොහෝ ශිෂ්‍යයන් අතුරෙන් අර්ථි වූ මම තෘෂ්ණා– දෘෂ්ටිනිඃශ්‍රය රහිත වූ ලාභාදියෙහි තාදී වූ කුහනවස්තු රහිත වූ ගණාචාර්ය වූ සංකස්සපුරයට පැමිණි ඒ බුදුන් කරා ප්‍රශ්නහෙතු-යෙන් පැමිණියෙමි.

තං බුද්ධං අසිතං තාදින්ති – ‘බුද්ධො’ති යො සො භගවා සයම්භූ අනාචරියකො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි. තත්ථ ච සබ්බඤ්ඤුතං පාපුණි[1]. බලෙසු ච වසීභාවං පාපුණි. ‘බුද්ධො’ති කෙනට්ඨෙන බුද්ධො? බුජ්ඣිතා සච්චානීති බුද්ධො. බොධෙතා පජායාති බුද්ධො. සබ්බඤ්ඤුතාය බුද්ධො. සබ්බදස්සාවිතාය බුද්ධො. අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො. විසවිතාය බුද්ධො. ඛීණාසවසඞ්ඛාතෙන බුද්ධො. නිරුපක්කිලෙසසඞ්ඛාතෙන බුද්ධො. එකන්තවීතරාගොති බුද්ධො. එකන්තවීතදොසොති බුද්ධො. එකන්තවීතමොහොති බුද්ධො. එකන්තනික්කිලෙසොති බුද්ධො. එකායනමග්ගං ගතොති බුද්ධො. එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො. අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභා[2] බුද්ධො. ‘බුද්ධො’ති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං බුද්ධොති – තං බුද්ධං.

අසිතන්ති – ද්වෙ නිස්සයා: තණ්හානිස්සයො ච දිට්ඨිනිස්සයො ච. කතමො තණ්හානිස්සයො? යාවතා තණ්හාසඞ්ඛාතෙන සීමාකතං ඔධිකතං පරියන්තකතං පරිග්ගහිතං මමායිතං: ‘ඉදං මම, එතං මම, එත්තකං මම, එත්තාවතා මම, මම රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා අත්ථරණා පාපුරණා දාසිදාසා අජෙලකා කුක්කුටසූකරා හත්ථිගවාස්සවලවා ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං සුවණ්ණං ගාමනිගමරාජධානියො රට්ඨඤ්ච ජනපදො ච කොසො ච කොට්ඨාගාරඤ්ච – කෙවලම්පි මහාපථවිං තණ්හාවසෙන මමායති, යාවතා අට්ඨසතං තණ්හාවිචරිතං, අයං තණ්හානිස්සයො.

කතමො දිට්ඨිනිස්සයො? වීසතිවත්ථුකා සක්කායදිට්ඨි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා අන්තග්ගාහිකා දිට්ඨි; යා එවරූපා දිට්ඨි දිට්ඨිගතං දිට්ඨිගහනං දිට්ඨිකන්තාරො දිට්ඨිවිසූකායිකං දිට්ඨිවිප්ඵන්දිතං දිට්ඨිසඤ්ඤොජනං ගාහො පටිග්ගාහො අභිනිවෙසො පරාමාසො කුම්මග්ගො මිච්ඡාපථො මිච්ඡත්තං තිත්ථායතනං විපරියෙසගාහො විපරීතගාහො විපල්ලාසගාහො මිච්ඡාගාහො අයාථාවතස්මිං[3] යාථාවතන්ති ගාහො, යාවතා ද්වාසට්ඨි දිට්ඨිගතානි, අයං දිට්ඨිනිස්සයො.

1. පත්තො - ස්‍යා. PTS. 2. පටිලාභත්තා - සීමු. PTS.
3. අයාථාවකස්මිං - සීමු. II. PTS. මජසං.

**තං බුද්ධං අසිතං තාදිං** – 'බුද්ධ' නම්: යම් ඒ භාග්‍යවත් කෙනෙක් තුමූ මැ සර්වඥ වූවාහු ආචාර්යයකු රහිත වැ පෙර නො ඇසූවිරූ දහම් විෂයෙහි තුමූ මැ සිවුසස් අවබොධ කළාහු ද, ඒ සත්‍යයන්හි දු සර්වඥ බවට පැමිණියාහු ද, බලයන්හි දු වශී බවට පැමිණියාහු ද, (ඔහු යැ) බුද්ධ යනු. කවර අර්ථයෙකින් 'බුද්ධ' නම් වී ද යත්? සිවුසස් අවබොධ කෙළේ නුයි 'බුද්ධ'යැ, ප්‍රජාවට අවබොධ කරවනුයේ නුයි 'බුද්ධ' යැ, සර්වඥ බැවින් 'බුද්ධ'යැ, සියල්ල දක්නා හෙයින් 'බුද්ධ'යැ, අනෙකක්හු විසින් අවබොධ නො කැරවිය යුතු හෙයින් 'බුද්ධ'යැ, විවිධගුණ පහළ කරන හෙයින් 'බුද්ධ' යැ, ක්ෂීණාස්‍රව සඞ්ඛ්‍යාවෙන් 'බුද්ධ'යැ, නිරුපක්ලෙශ සඞ්ඛ්‍යාවෙන් 'බුද්ධ' යැ, එකාන්තයෙන් වීතරාග නුයි 'බුද්ධ'යැ, එකාන්තයෙන් වීතද්වෙෂ නුයි 'බුද්ධ'යැ, එකාන්තයෙන් වීතමොහ නුයි 'බුද්ධ'යැ එකාන්තයෙන් කෙලෙස් රහිත නුයි 'බුද්ධ'යැ, එකායනමාර්ගයට ගියේ නුයි 'බුද්ධ'යැ, එකලා වැ අනුත්තර වූ සම්‍යක්සම්බොධිය අවබොධ කෙළේ නුයි 'බුද්ධ'යැ, අබුද්ධිය නැසූ හෙයින් බුද්ධිප්‍රතිලාභය හෙතු කොට ගෙන බුද්ධ යැ. 'බුද්ධ' යන මෙල නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑයකු විසින් නො කරන ලද, බූනක විසින් නො කරන ලද, සගයහළුවන් විසින් නො කරන ලද, නෑසහලේනෑයන් විසින් නො කරන ලද, මහණබමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරන ලද. භාග්‍යවත් බුදුවරයනට යම් 'බුද්ධ' යන නාමයෙක් වේ නම්, අර්හත්ඵලයාගේ අන්තයෙහි උපන් මෙල නාමය මහබෝමැඩ දී සර්වඥතාඥානයාගේ ප්‍රතිලාභය සමග අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියකැ'යි 'තං බුද්ධං' යනු වේ.

**අසිතං** – යනු: තෘෂ්ණානිඃශ්‍රය ද දෘෂ්ටිනිඃශ්‍රය ද'යි නිඃශ්‍රය දෙකකි. තෘෂ්ණානිඃශ්‍රය කවර යත්: යම්තාක් තෘෂ්ණා කොටසින් සීමා කරන ලද ද අවධි කරන ලද ද හිම් කරන ලද ද අයත් කරන ලද ද මමායන කරන ලද ද: 'මේ මාගේ යැ, මෙල මාගේ යැ, මෙතෙක් මාගේ යැ, මාගේ රූපයෝ යැ, ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ, අතුරුණු යැ පොරෝණා යැ දැසිදස්හු යැ එළුබැටළු යැ කුකුළුහූරු යැ ඇත්අස්ගවවෙළඹුහු යැ, කෙත් යැ වතු යැ අමුරන් රන්රන් ගම්නියම්ගම්රජදහන්හු යැ රට දනව් කොටු හා කොටුගුළු ද – සියලු මැ මහපොළොව තෘෂ්ණාවශයෙන් මමායන කෙරෙයි, යම්තාක් අටතුරාසියක් තෘෂ්ණාවිචරිතය වේ ද, මේ තෘෂ්ණානිඃශ්‍රය යි.

දෘෂ්ටිනිඃශ්‍රය කවර යත්: විංශතිවස්තුක සත්කායදෘෂ්ටි යැ, දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි යැ, දශවස්තුක අන්තග්‍රාහිකාදෘෂ්ටි යැ, යන මෙබඳු වූ යම් දෘෂ්ටියක් දෘෂ්ටිගතයෙක් දෘෂ්ටි නමැති ගහනයෙක් දෘෂ්ටි නමැති කාන්තාරයෙක් දෘෂ්ටි නමැති විසූකායිකයෙක් (-විලොමදෘෂ්ටියක්) දෘෂ්ටිචලනයෙක් දෘෂ්ටිසංයොජනයෙක් දැඩිව ගැනීමෙක් පිහිටා ගැනීමෙක් (නිත්‍යාදිවශයෙන්) අභිනිවෙශයෙක් පරාමර්ශයෙක් කුත්සිතමාර්ගයෙක් අයථාමාර්ගයෙක් මිථ්‍යාස්වභාවයෙක් තීර්ථායතනයෙක් විපර්‍යාසයෙන් ගැනීමෙක් අස්වභාවයෙන් ගැනීමෙක් පරිවර්තන කොට ගැනීමෙක් මිථ්‍යාග්‍රාහයෙක් අස්වභාවයෙහි 'ස්වභාවයැ'යි ගැනීමක් වේ ද, යම්තාක් ද්වාෂෂ්ටිදෘෂ්ටිගතයෝ වෙත් ද, මේ දෘෂ්ටිනිඃශ්‍රය යි.

බුද්ධස්ස භගවතො තණ්හානිස්සයො පහීනො; දිට්ඨිනිස්සයො පටිනිස්සට්ඨො; තණ්හානිස්සයස්ස පහීනත්තා දිට්ඨිනිස්සයස්ස පටිනිස්සට්ඨත්තා භගවා චක්ඛුං අසිතො, සොතං - ඝානං - ජිව්හං - කායං - මනං - අසිතො, රූපෙ සද්දෙ ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ කුලං ගණං ආවාසං ලාභං යසං පසංසං සුඛං චීවරං පිණ්ඩපාතං සෙනාසනං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං කාමධාතුං රූපධාතුං අරූපධාතුං කාමභවං රූපභවං අරූපභවං සඤ්ඤාභවං අසඤ්ඤාභවං නෙවසඤ්ඤානාසඤ්ඤාභවං එකවොකාරභවං චතුවොකාරභවං පඤ්චවොකාරභවං අතීතං අනාගතං පච්චුප්පන්නං දිට්ඨසුතමුතවිඤ්ඤාතබ්බෙ ධම්මෙ අසිතො අනිස්සිතො අනල්ලීනො අනුපගතො අනජ්ඣොසිතො අනධිමුත්තො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදිකතෙන චෙතසා විහරතී'ති - තං බුද්ධං අසිතං.

තාදීති - භගවා පඤ්චහාකාරෙහි තාදී: ඉට්ඨානිට්ඨෙ තාදී, චත්තාවීති තාදී, තිණ්ණාවී'ති තාදී, මුත්තාවීති තාදී, තන්නිද්දෙසා තාදී.

කථං භගවා ඉට්ඨානිට්ඨෙ තාදී? භගවා ලාභෙපි තාදී, අලාභෙපි තාදී, යසෙපි තාදී, අයසෙපි තාදී, පසංසායපි තාදී, නින්දායපි තාදී, සුඛෙපි තාදී, දුක්ඛෙපි තාදී. එකං චෙ[1] බාහං ගන්ධෙන ලිම්පෙය්‍යුං, එකං චෙ බාහං වාසියා තච්ඡෙය්‍යුං, අමුස්මිං[2] නත්ථි රාගො, අමුස්මිං[2] නත්ථි පටිඝං. අනුනයපටිඝවිප්පහීනො උග්ඝාතිනිග්ඝාති වීතිවත්තො අනුරොධවිරොධං සමතික්කන්තො. එවං භගවා ඉට්ඨානිට්ඨෙ තාදී.

කථං භගවා චත්තාවීති තාදී? භගවතා රාගො චත්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො. දොසො - මොහො - කොධො - උපනාහො - මක්ඛො - පළාසො - ඉස්සා - මච්ඡරියං - මායා - සාඨෙය්‍යං - ථම්භො - සාරම්භො - මානො - අතිමානො - මදො - පමාදො - සබ්බෙ කිලෙසා - සබ්බෙ දුච්චරිතා - සබ්බෙ දරථා - සබ්බෙ පරිළාහා - සබ්බෙ සන්තාපා - සබ්බාකුසලාභිසඞ්ඛාරා චත්තා වන්තා මුත්තා පහීනා පටිනිස්සට්ඨා. එවං භගවා 'චත්තාවී'ති තාදී.

කථං භගවා තිණ්ණාවීති තාදී? භගවා කාමොඝං තිණ්ණො, භවොඝං තිණ්ණො, දිට්ඨොඝං තිණ්ණො, අවිජ්ජොඝං තිණ්ණො, සබ්බං සංසාරපථං තිණ්ණො, උත්තිණ්ණො නිත්තිණ්ණො අතික්කන්තො සමතික්කන්තො වීතිවත්තො. සො වුට්ඨවාසො චිණ්ණචරණො ගතද්ධො ගතදිසො ගතකොටිකො[3] පාලිතබ්‍රහ්මචරියො උත්තමදිට්ඨිප්පත්තො භාවිතමග්ගො පහීනකිලෙසො පටිවිද්ධාකුප්පො සච්ඡිකතනිරොධො.

1. එකඤ්චෙ - සීමු. II. මජසං.
2. අමුකස්මිං - සීමු. II. මජසං., PTS.
3. ගතකොටියො - සීමු. II. මජසං.

භාග්‍යවත් බුදුන් විසින් තෘෂ්ණානිඃශ්‍රය ප්‍රහීණ කරන ලද, දෘෂ්ටිනිඃශ්‍රය දුරු කරන ලද; තෘෂ්ණානිඃශ්‍රය ප්‍රහීණ කල බැවින් දෘෂ්ටිනිඃශ්‍රය දුරලූ බැවින් බුදුහු ඇස අශ්‍රිතයහ (-ඇසිරි නො කළහ,) කන - නැහැය - දිව - කය- මනස අශ්‍රිතයහ, රූප - ශබ්ද - ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන් - කුලය - ගණයා- ආවාසය - ලාභය - යශස - ප්‍රශංසාව - සුඛය - චීවර - පිණ්ඩපාත - ශයනාසන- ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර - කාමධාතුව රූපධාතුව අරූපධාතුව කාම- භවය රූපභවය අරූපභවය සංඥාභවය අසංඥාභවය නෛවසංඥානාසංඥා- භවය එකවෝකාරභවය චතුවෝකාරභවය පඤ්චවෝකාරභවය අතීතය අනාගතය වර්තමානය - දෘෂ්ටශ්‍රැතමුත විඥාතව්‍යධර්මයන්හි අශ්‍රිතයහ, අනිඃශ්‍රිත- යහ, නො ඇලුණාහ, නො පැමිණියහ, නො මැඩුණාහ, නො බැසගත්හ. බැහැර වූවාහු නික්මගියාහු වෙසෙසින් මිදුණාහු විසංයුක්ත වූවාහු විගත- මර්‍යාදා කල සිතින් යුක්ත ව වෙසෙත් නුයි 'තං බුද්ධං අසිතං' යනු වේ.

තාදිං - යනුː බුදුහු පස් අයුරෙකින් තාදීහː ඉෂ්ටානිෂ්ටයෙහි තාදීහ, කෙලෙස් දුරුකලාහු නුයි තාදීහ, සසර තරණය කලාහු නුයි තාදීහ, රාගාදීන්ගෙන් මිදුණාහු නුයි තාදීහ, ශීලාදීන්ගෙන් නිර්දේශ කොට කියයුතු හෙයින් තාදීහ.

කිසෙයින් බුදුහු ඉෂ්ටානිෂ්ටයෙහි තාදී වූහ යත්ː බුදුහු ලාභයෙහි ද තාදී වූහ, අලාභයෙහි ද - යශස්හි ද - අයශස්හි ද - ප්‍රශංසායෙහි ද-නින්දා- යෙහි ද - සුඛයෙහි ද - දුඃඛයෙහි ද තාදී (-සදෘශ) වූහ. ඉදින් එක් බාහුවක් සුවඳින් ගල්වන්නාහු නම්, ඉදින් එක් බාහුවක් වෑයෙන් සස්නාහු නම්, අර සුවඳ ගල්වන්නහු කෙරෙහි ස්නේහයෙක් නැත, අර වෑයෙන් සස්නහු කෙරෙහි කොපයකු ත් නැත; ස්නේහය හා කෝපය දුරු කළහ, අනුග්‍රහ නිග්‍රහ ඉක්මවූහ, ස්නේහකෝප වෙසෙසින් ඉක්මවූහ. මෙසේ බුදුහු ඉෂ්ටා- නිෂ්ට ආලම්බනයෙහි තාදී (-සමාන) වූ සේක.

කිසෙයින් බුදුහු ත්‍යක්තවත් නුයි තාදී වූහ යත්ː භාග්‍යවත්හු විසින් රාගය ත්‍යක්ත යැ වාන්ත යැ මුක්ත යැ ප්‍රහීණ කරන ලද, දුරලන ලද්දේ ය, ද්වේෂය - මෝහය - ක්‍රෝධය - බද්ධවෛරය - මක්‍ෂබව - යුගග්‍රාහය - ඊර්ෂ්‍යාව- මාත්සර්‍යය - මායාව - ශඨබව - තදබව - කරණ්ඩුත්තරියකරණය - මානය- අතිමානය - මදය - ප්‍රමාදය - සියලු කෙලශයෝ - සියලු දුශ්චරිතයෝ - සියලු දරථයෝ - සියලු පරිදාහයෝ - සියලු සන්තාපයෝ - සියලු අකුශලාභි- සංස්කාරයෝ හරන ලද්දාහු ය, වමනය කරන ලද්දාහු ය, මුදන ලද්දාහු ය, ප්‍රහීණ කරන ලද්දාහු ය, හාත්පසින් දුරලන ලද්දාහු යි. මෙසේ බුදුහු ත්‍යක්තවත් (-කෙලෙස් දුරුකලාහු)නුයි තාදී වූ සේක.

කිසෙයින් බුදුහු තීර්ණවත් නුයි තාදී වූහ යත්ː බුදුහු කාමෞඝය තරණය කළහ, භවෞඝය තරණය කළහ, දිට්ඨෞඝය තරණය කළහ, අවිද්‍යෞඝය තරණය කළහ, සියලු සසරමග තරණය කළහ, උත්තීර්ණ වූහ, නිස්තීර්ණ වූහ, ඉක්මවූහ, මැනැවින් ඉක්මවූහ, වෙසෙසින් ඉක්මවූහ. ඒ බුදුහු වුසූ මගබඹසර ඇතියහ, පසලොස් චරණධර්මයෙහි චීර්ණවශී වූහ, ඉක්මවූ සසරමග ඇතියහ, නිවන්දෙසට ගියහ, නිවන්කෙළ පැමිණියහ, රැකි බඹසර ඇතියහ; උත්තම සම්‍යග්දෘෂ්ටියට පැමිණියහ, වැඩූ මාර්ග ඇතියහ, පුහුත් කෙලෙස් ඇතියහ, පිළිවිදි රහත්ඵල ඇතියහ, පසක්කල නිවන ඇතියහ.

දුක්ඛං තස්ස පරිඤ්ඤාතං, සමුදයො පහීනො, මග්ගො භාවිතො, නිරොධො සච්ඡිකතො. අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං, පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං, පහාතබ්බං පහීනං, භාවෙතබ්බං භාවිතං, සච්ඡිකාතබ්බං සච්ඡිකතං. සො උක්ඛිත්තපළිඝො සංකිණ්ණපරිඛො අබ්බූළ්හෙසිකො නිරග්ගළො අරියො පන්නද්ධජො පන්නභාරො විසඤ්ඤුත්තො පඤ්චඞ්ගවිප්පහීනො ඡළඞ්ගසමන්නාගතො එකාරක්ඛො චතුරපස්සෙනො[1] පනුන්නපච්චෙක-සච්චො සමවයසට්ඨෙසනො අනාවිලසඞ්කප්පො පස්සද්ධකායසඞ්ඛාරො සුවිමුත්තචිත්තො සුවිමුත්තපඤ්ඤො කෙවලී වුසිතවා උත්තමපුරිසො පරමපුරිසො පරමපත්තිපත්තො. සො නෙවාචිනාති, න අපචිනාති[2] අපචිනිත්වා ඨිතො. නෙව පජහති, න උපාදියති, පජහිත්වා ඨිතො. නෙව සංසිබ්බති, න විසිනෙති[3], විසිනෙත්වා[4] ඨිතො. නෙව විධූපෙති, න සන්ධූපෙති, විධූපෙත්වා ඨිතො. අසෙඛෙන[5] සීලක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතත්තා ඨිතො, අසෙඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නා-ගතත්තා ඨිතො. සච්චං සම්පටිපාදියිත්වා ඨිතො, එජං සමතික්කමිත්වා ඨිතො, කිලෙසග්ගිං පරියාදියිත්වා ඨිතො, අපරිගමනතාය ඨිතො, කථං[6] සමාදාය ඨිතො, මුත්තපටිසෙවනතාය ඨිතො, මෙත්තාය පාරිසුද්ධියා ඨිතො, කරුණාය පාරිසුද්ධියා ඨිතො, මුදිතාය පාරිසුද්ධියා ඨිතො, උපෙක්ඛාය පාරිසුද්ධියා ඨිතො, අච්චන්තපාරිසුද්ධියා ඨිතො, අතම්මයතාය පාරිසුද්ධියා ඨිතො, විමුත්තත්තා ඨිතො, සන්තුසිතත්තා[7] ඨිතො, ඛන්ධපරියන්තෙ ඨිතො, ධාතුපරියන්තෙ ඨිතො, ආයතනපරියන්තෙ ඨිතො, ගතිපරියන්තෙ ඨිතො, උපපත්තිපරියන්තෙ ඨිතො, පටිසන්ධිපරියන්තෙ ඨිතො, භවපරි-යන්තෙ ඨිතො, සංසාරපරියන්තෙ ඨිතො, වට්ටපරියන්තෙ ඨිතො, අන්තිමෙ භවෙ ඨිතො, අන්තිමෙ සමුස්සයෙ ඨිතො. අන්තිමදෙහධරො භගවා.

1. "තස්සා'යං පච්ඡිමකොටි[8]
චරිමො'යං සමුස්සයො,
ජාතිමරණසංසාරො
නත්ථි තස්ස පුනබ්භවො"ති.

එවං භගවා තිණ්ණාවීති තාදී.

---

1. චතුරාපස්සෙනො - සීමු. PTS.
2. අපචිනති - මජසං.
3. උසිනෙති - මජසං. උස්සිනෙති - ස, PTS.
4. විසිබ්බෙත්වා - ස.
5. අසෙක්ඛෙන - ස. PTS
6. කථං - මජසං, PTS
7. සන්තුස්සිතත්තා - සීමු. II
8. පච්ඡිමකො - සීමු. II. PTS. පච්ඡිමකො භවො - මජසං.

ඔවුන් විසින් දුක පිරිසිඳිනු ලද, සමුදය ප්‍රහීණ කරන ලද, මාර්ගය වඩන ලද, නිරෝධය ප්‍රත්‍යක්ෂ කරන ලද; (ස්වභාවලක්ෂණාවබෝධයෙන්) දතයුත්ත විශෙෂයෙන් දැනගන්නා ලද, (සාමාන්‍යලක්ෂණාවබෝධයෙන්) දතයුත්ත හාත්පසින් දැනගන්නා ලද, හලයුත්ත හරනා ලද, වැඩිය යුත්ත වඩනා ලද, පසක්කලයුත්ත පසක්කරන ලද. ඒ බුදුහු තගාපී අවිද්‍යාපරිඝය ඇතියහ, විසුරුවාලූ (කර්මාභිසංස්කාර නමැති) පරිඛාව ඇතියහ, උදුරාපී (තෘෂ්ණා නමැති) එසිකාව ඇතියහ, (ඔරම්භාගිය සංයෝජන නමැති) අගුළු රහිතයහ, ආර්‍ය (-පරිශුද්ධ) යහ, හෙළූ මානධ්වජ ඇතියහ, බහාතැබූ (ස්කන්ධාදි) බර ඇතියහ, සතර යොගයෙන් විසංයුක්තයහ, (කාමච්ඡන්දාදි) පසග උපායෙන් ප්‍රහීණ කළහ, ෂඩංගෝපෙක්ෂාවෙන් සමන්විතයහ, ස්මෘති සඞ්ඛ්‍යාත උත්තම ආරක්ෂා ඇතියහ, (පටිසෙවනාදි) චතුර්විධ අපාශ්‍රය ඇතියහ, ප්‍රහීණ කළ ප්‍රත්‍යෙකසත්‍ය ඇතියහ, මැනැවින් දුරුකළ සියලු එසනා ඇතියහ, නො කැලැඹුණු සඞ්කල්ප ඇතියහ, දුරුලූ කායසංස්කාර ඇතියහ, මොනොවට මිදුණු සිත් ඇතියහ, මොනොවට මිදුණු ප්‍රඥා ඇතියහ, පරිපූර්ණයහ, වුසූ බඹසරවස් ඇතියහ, උත්තමපුරුෂයහ, පරමපුරුෂයහ, පරමප්‍රාප්තියට පැමිණියහ. ඒ බුදුහු (කුශලාකුශලවිපාකය) නො මැ රැස් කෙරෙති, නො වනසති, (කෙලෙස්) වනසා සිටියහ; (ප්‍රහාතව්‍යයක් නැති හෙයින්) නො මැ දුරු කෙරෙති, (තෘෂ්ණාදි විසින්) දැඩි වැ නො ගනිති, දුරලා සිටියහ; (තෘෂ්ණාවශයෙන්) නො මැ සීවනය කෙරෙති, (මානවශයෙන්) උත්කංසනය නො කෙරෙති, විගතබන්ධන වැ සිටියහ; (කෙලෙස්ගිනි) නො මැ නිවති, නො දල්වති, නිවා සිටියහ; අශෛක්ෂ වූ ශීලස්කන්ධයෙන් සමන්විත වන බැවින් (නො පිරහී) සිටියහ, අශෛක්ෂ වූ සමාධිස්කන්ධයෙන් සමන්විත වන හෙයින් සිටියහ, අශෛක්ෂ වූ ප්‍රඥාස්කන්ධයෙන් සමන්විත වන හෙයින් සිටියහ, අශෛක්ෂ විමුක්තිස්කන්ධයෙන් සමන්විත වන හෙයින් සිටියහ, අශෛක්ෂ විමුක්තිඥානදර්ශනස්කන්ධයෙන් සමන්විත වන හෙයින් සිටියහ, චතුරාර්‍යසත්‍යය (සිය සතන්හි) සම්පාදනය කොට සිටියහ, තෘෂ්ණාව ඉක්මවා සිටියහ, කෙලෙස්ගිනි ගෙවා සිටියහ, සසර යළි නො යන බැවින් සිටියහ, (නයග්‍රාහික) කථාව ගෙන සිටියහ, (කෙලෙසුන් කෙරෙන්) මිදුණු ඵලසමවත් සෙවුණා බැවින් සිටියහ, මෛත්‍රීපාරිශුද්ධියෙහි සිටියහ, කරුණාපාරිශුද්ධියෙහි සිටියහ, මුදිතාපාරිශුද්ධියෙහි සිටියහ, උපෙක්ෂාපාරිශුද්ධියෙහි සිටියහ. අත්‍යන්තපාරිශුද්ධියෙහි සිටියහ, තෘෂ්ණාදි අතම්මයභාවයෙන් පාරිශුද්ධියෙහි සිටියහ, කෙලෙසුන් කෙරෙන් මිදුණු බැවින් සිටියහ, (යථාලාභාදියෙන්) සන්තුෂ්ට වන බැවින් සිටියහ, ස්කන්ධයන්ගේ පර්‍යන්තයෙහි සිටියහ, ධාතුපර්‍යන්තයෙහි සිටියහ, ආයතනපර්‍යන්තයෙහි සිටියහ, ගතිපර්‍යන්තයෙහි සිටියහ, උත්පත්තිපර්‍යන්තයෙහි සිටියහ, ප්‍රතිසන්ධිපර්‍යන්තයෙහි සිටියහ, භවපර්‍යන්තයෙහි සිටියහ, සංසාරපර්‍යන්තයෙහි සිටියහ, වෘත්තපර්‍යන්තයෙහි සිටියහ, අන්තිමභවයෙහි සිටියහ, අන්තිමශරීරයෙහි සිටියහ, බුදුහු අන්තිමදෙහය ධරන සේක.

1. "මේ ඒ භාග්‍යවත්හුගේ පශ්චිම කෙලවර යැ. මේ අවසාන ශරීරය වෙයි. උන් වහන්සේට ජාතිය මරණය හා පුනර්භව සඞ්ඛ්‍යාත සංසාරප්‍රවෘත්තිය ද නැතැ"යි.

මෙසේ බුදුහු නිශ්‍රිතවූහු නුයි 'තාදී' වූ සේක.

කථං භගවා මුත්තාවීති තාදී? භගවතො රාගා චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං; දොසා චිත්තං - මොහා චිත්තං - කොධා - උපනාහා - මක්ඛා - පළාසා - ඉස්සාය - මච්ඡරියා - මායාය - සාඨෙය්‍යා - ථම්භා - සාරම්භා - මානා - අතිමානා - මදා - පමාදා - සබ්බකිලෙසෙහි - සබ්බදුච්චරිතෙහි - සබ්බදරථෙහි - සබ්බපරිළාහෙහි - සබ්බසන්තාපෙහි - සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. එවං භගවා මුත්තාවීති තාදී.

කථං භගවා තන්නිද්දෙසා තාදී? භගවා සීලෙ සති සීලවාති තන්නිද්දෙසා තාදී, සද්ධාය සති සද්ධොති තන්නිද්දෙසා තාදී, විරියෙ සති විරියවාති තන්නිද්දෙසා තාදී, සතියා සති සතිමාති තන්නිද්දෙසා තාදී, සමාධිස්මිං සති සමාහිතො'ති තන්නිද්දෙසා තාදී, පඤ්ඤාය සති පඤ්ඤවාති තන්නිද්දෙසා තාදී, විජ්ජාය සති තෙවිජ්ජොති තන්නිද්දෙසා තාදී, අභිඤ්ඤාය සති ඡළභිඤ්ඤොති තන්නිද්දෙසා තාදී, දසබලෙ සති දසබලො'ති තන්නිද්දෙසා තාදී. එවං භගවා තන්නිද්දෙසා තාදී'ති - තං බුද්ධං අසිතං තාදිං.

**අකුහං ගණිමාගතන්ති** - 'අකුහො'ති තීණි කුහනවත්ථූනි; පච්චයපටිසෙධන[1]සඞ්ඛාතං කුහනවත්ථු, ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු, සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං පච්චයපටිසෙධනසඞ්ඛාතං[1] කුහනවත්ථු: ඉධ ගහපතිකා භික්ඛුං නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. සො පාපිච්ඡො ඉච්ඡාපකතො අත්ථිකො[2] චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං භිය්‍යොකම්‍යතං උපාදාය චීවරං පච්චක්ඛාති, පිණ්ඩපාතං පච්චක්ඛාති, සෙනාසනං පච්චක්ඛාති, ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පච්චක්ඛාති. සො එවමාහ: 'කිං සමණස්ස මහග්ඝෙන චීවරෙන? එතං සාරුප්පං: යං සමණො සුසානා වා සඞ්කාරකූටා වා පාපණිකා වා නන්තකානි උච්චිනිත්වා සඞ්ඝාටිං කරිත්වා ධාරෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන පිණ්ඩපාතෙන? එතං සාරුප්පං: යං සමණො උඤ්ඡාචරියාය පිණ්ඩියාලොපෙන ජීවිකං කප්පෙය්‍ය. කිං සමණස්ස මහග්ඝෙන සෙනාසනෙන? එතං සාරුප්පං: යං සමණො රුක්ඛමූලිකො වා අස්ස අබ්භොකාසිකො වා. කිං සමණස්ස මහග්ඝෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන? එතං සාරුප්පං: යං සමණො පූතිමුත්තෙන හරිතකීඛණ්ඩෙන ඔසධං කරෙය්‍යා'ති. තදුපාදාය ලූඛං චීවරං ධාරෙති, ලූඛං පිණ්ඩපාතං පරිභුඤ්ජති, ලූඛං සෙනාසනං පටිසෙවති, ලූඛං ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති. තමෙනං ගහපතිකා එවං ජානන්ති:

1. පටිසෙවන - සීමු. II, මජසං. PTS. 2. අභිනතිකො - සීමු. II

කිසෙයින් බුදුහු මුක්තවූහු තුසි 'තාදී' වූහ යත්: භාග්‍යවත්හුගේ සිත රාගයෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි, ද්වේෂයෙන් - මෝහයෙන් - ක්‍රෝධයෙන් - බද්ධවෛරයෙන් - මකු බැවින් - යුගග්‍රාහයෙන්-ඊර්ෂ්‍යායෙන් - මාත්සර්‍ය්‍යයෙන් - මායාවෙන් - ශාඨ්‍යයෙන්- ස්තම්භයෙන්-සාරම්භයෙන් - මානයෙන් - අතිමානයෙන් - මදයෙන් - ප්‍රමාදයෙන් - සියලු කෙලෙසුන් ගෙන් -සියලු දුශ්චරිතයන් ගෙන්- සියලු දරථයන් ගෙන්- සියලු පරිදාහයන් ගෙන් - සියලු සන්තාපයන් ගෙන් - සියලු අකුශලාභිසංස්කාරයන් ගෙන් සිත මුක්ත යැ, විමුක්ත යැ, සුවිමුක්ත යි. මෙසේ බුදුහු මුක්තවත් තුසි - 'තාදී' වූ සේක.

කිසෙයින් බුදුහු තන්නිර්දේශ්‍ය හෙයින් තාදී වූහ යත්: බුදුහු ශීලය ඇති කල්හි සිල්වත්හ'යි තන්නිර්දේශ්‍ය හෙයින් තාදීහ, ශ්‍රද්ධාව ඇති කල්හි ශ්‍රද්ධාවත්හ'යි එයින් දැක්වියයුතු හෙයින් තාදීහ, වීර්‍ය්‍යය ඇති කල්හි වීර්‍ය්‍යවත්හ'යි එයින් දැක්වියයුතු හෙයින් තාදීහ, සමාධිය ඇති කල්හි සමාධිමත්හ'යි එයින් දැක්වියයුතු හෙයින් තාදීහ, සමාධිය ඇති කල්හි සමාහිතයහ'යි තන්නිර්දේශ්‍ය හෙයින් තාදීහ, ප්‍රඥාව ඇති කල්හි ප්‍රඥාවත්හ'යි තන්නිර්දේශ්‍ය හෙයින් තාදීහ, විද්‍යාව ඇති කල්හි ත්‍රෛවිද්‍යහ'යි තන්නිර්දේශ්‍ය හෙයින් තාදීහ, අභිඥාව ඇති කල්හි ෂඩභිඥ වූහ'යි තන්නිර්දේශ්‍ය හෙයින් තාදීහ, දශබලය ඇති කල්හි දශබලධාරීහ'යි තන්නිර්දේශ්‍ය හෙයින් තාදී වූහ. මෙසේ බුදුහු තන්නිර්දේශ්‍ය හෙයින් තාදී වූ සේකැයි 'තං බුද්ධං අසිතං තාදිං' යනු වේ.

අකුහං ගණිමාගතං - 'අකුහ' නම්: කුහනවස්තු තුනෙකි: ප්‍රත්‍යය-ප්‍රතිෂේධන සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ, ඊර්‍ය්‍යාපථ සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ, සාමන්තජල්පන සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැයි.

ප්‍රත්‍යයප්‍රතිෂේධන සඞ්ඛ්‍යාත කුහනවස්තුව කවරැ යත්: මෙහි ගෘහපතියෝ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙසත්පිරිකරින් මහණක්හු පවරති. හෙතෙම ලාමක ආශා ඇතියේ ආශායෙන් මඩනා ලදුයේ සිවුරු පිණ්ඩපාත සෙනසුන් ගිලන්පස බෙහෙසත්පිරිකර කැමැති වූයේ වැඩියක් කැමැතිබව නිසා සිවුර ප්‍රතික්ෂේප කෙරෙයි, පිණ්ඩපාතය ප්‍රතික්ෂේප කෙරෙයි, සෙනසුන ප්‍රතික්ෂේප කෙරෙයි, ගිලන්පස බෙහෙසත් පිරිකර ප්‍රතික්ෂේප කෙරෙයි. හෙතෙම මෙසේ කියයි: මහණ හට මාහැඟි සිවුරෙන් කිම ? ඉදින් මහණ තෙම සොහොනින් හෝ කසලගොඩින් හෝ අවුණුදෙරින් හෝ කඩරෙදි අවුලා සඟල කොට දරන්නේ නම්, තෙල සරුප් යැ. මහණහට මාහැඟි පිණ්ඩපාතයෙන් කිම ? ඉදින් මහණ සිහා හැසිරීමෙන් ලද පිඬුඅනරින් දිවි පවත්වන්නේ නම්, තෙල සරුප් යැ. මහණ හට මාහැඟි සෙනසුනෙන් කිම ? ඉදින් මහණ රුක්ඛමූලික හෝ අබ්භොකාසික හෝ වන්නේ නම්, තෙල සරුප් යැ, මහණ හට මාහැඟි වූ ගිලන්පස බෙහෙසත්පිරිකරින් කිම ? ඉදින් මහණ පූතිමූත්‍රයෙන් අරළු-කඩෙකින් බෙහෙත් කරන්නේ නම්, තෙල සරුප් යැයි. එතැන් පටන් රළු සිවුරු දරයි, රළු පිණ්ඩපාතය වළඳයි, රළු සෙනසුන් ඇසුරු කෙරෙයි, රළු වූ ගිලන්පස බෙහෙසත්පිරිකර සෙවනය කෙරෙයි. ගෘහපතියෝ ඔහු මෙසේ දනගනිති:

අයං සමණො අප්පිච්ඡො සන්තුට්ඨො පවිවිත්තො අසංසට්ඨො ආරද්ධවීරියො ධුතවාදොති භිය්‍යො නිමන්තෙන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙහි. සො එවමාහ: "තිණ්ණං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති: සද්ධාය සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දෙය්‍යධම්මස්ස සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. දක්ඛිණෙය්‍යානං සම්මුඛීභාවා සද්ධො කුලපුත්තො බහුං පුඤ්ඤං පසවති. තුම්හාකඤ්චෙවායං සද්ධා අත්ථි. දෙය්‍යධම්මො ච සංවිජ්ජති. අහඤ්ච පටිග්ගාහකො. සචෙ අහං න පටිග්ගහෙස්සාමි, එවං තුම්හෙ පුඤ්ඤෙන පරිබාහිරා භවිස්සථ. න මය්හං ඉමිනා අත්ථො. අපි ච තුම්හාකං යෙව අනුකම්පාය පටිග්ගණ්හාමී'ති". තදුපාදාය බහුම්පි චීවරං පටිග්ගණ්හාති, බහුම්පි පිණ්ඩපාතං පටිග්ගණ්හාති, බහුම්පි සෙනාසනං පටිග්ගණ්හාති, බහුම්පි ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිග්ගණ්හාති. යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං; ඉදං පච්චයපටිසෙධන[1] සඞ්ඛාතං කුහනවත්ථු.

කතමං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො 'එවං මං ජනො සම්භාවෙස්සතී'ති ගමනං සණ්ඨපෙති, ඨානං සණ්ඨපෙති, නිසජ්ජං සණ්ඨපෙති, සයනං සණ්ඨපෙති, පණිධාය ගච්ඡති, පණිධාය තිට්ඨති, පණිධාය නිසීදති, පණිධාය සෙය්‍යං කප්පෙති, සමාහිතො විය ගච්ඡති, සමාහිතො විය තිට්ඨති, සමාහිතො විය නිසීදති, සමාහිතො විය සෙය්‍යං කප්පෙති, ආපාථකජ්ඣායීව හොති. යා එවරූපා ඉරියාපථස්ස අට්ඨපනා[2] ඨපනා සණ්ඨපනා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං ඉරියාපථසඞ්ඛාතං කුහනවත්ථු.

කතමං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු? ඉධෙකච්චො පාපිච්ඡො ඉච්ඡාපකතො සම්භාවනාධිප්පායො 'එවං මං ජනො සම්භාවෙස්සතී'ති අරියධම්මසන්නිස්සිතං වාචං භාසති. යො එවරූපං චීවරං ධාරෙති, සො සමණො මහෙසක්ඛොති භණති. යො එවරූපං පත්තං ධාරෙති, ලොහථාලකං ධාරෙති, ධම්මකරකං[3] ධාරෙති, පරිස්සාවනං ධාරෙති, කුඤ්චිකං ධාරෙති, උපාහනං ධාරෙති, කායබන්ධනං ධාරෙති, ආයොගං ධාරෙති, සො සමණො මහෙසක්ඛොති භණති. යස්ස එවරූපො උපජ්ඣායො, සො සමණො මහෙසක්ඛොති භණති. යස්ස එවරූපො ආචරියො – සමානුපජ්ඣායකා – සමානාචරියකා – මිත්තා – සන්දිට්ඨා – සම්භත්තා – සහායා, සො සමණො මහෙසක්ඛොති භණති. යො එවරූපෙ විහාරෙ වසති, සො සමණො මහෙසක්ඛොති භණති. යො එවරූපෙ අඩ්ඪයොගෙ වසති – පාසාදෙ වසති – හම්මියෙ වසති – ගුහාය වසති – ලෙණෙ වසති – කුටියා වසති – කූටාගාරෙ වසති – අට්ටෙ[4] වසති – මාලෙ වසති – උද්දණ්ඩෙ වසති – උපට්ඨානසාලාය වසති – මණ්ඩපෙ වසති – රුක්ඛමූලෙ වසති, සො සමණො මහෙසක්ඛොති භණති.

1. පටිසෙවන - සීමු. II. මජසං. PTS. 2. ආඨපනා - සීමු. II. මජසං.
3. ධම්මකරණං - මජසං 4 අඩ්ඩ - සීමු. II. මජසං.

'මේ මහණ අල්පෙච්ඡ යැ සන්තුෂ්ට යැ උතුම් විවේක ඇත්තෙකැ කුලයා හා සසඟ නැත්තෙකැ පටන්ගත් වීර්‍ය්‍ය ඇත්තෙකැ ධූතාඞ්ගගුණ කියන්නෙකැ'යි මතුමත්තෙහි චීවර පිණ්ඩපාත සේනාසන ගිලන්පස බෙහෙසත්පිරිකරින් පවරත්. හෙතෙම මෙසේ කියයි: තිදෙනකුන්ගේ හමුවීමෙන් සැදැහැති කුලපුත් තෙම බොහෝ කුසල් රැස් කෙරෙයි: ශ්‍රද්ධාව හමුවීමෙන් (-ඇතිබැවින්) සැදැහැති කුලපුත් තෙම බොහෝ කුසල් රැස් කෙරෙයි. දෙය්‍යධර්මය ඇතිබැවින් සැදැහැති කුලපුත් තෙම බොහෝ කුසල් රැස් කෙරෙයි. දක්ෂිණාර්හයන් ඇතිබැවින් සැදැහැති කුලපුත් තෙම බොහෝ කුසල් රැස් කෙරෙයි. තවද තොපට මැ මේ ශ්‍රද්ධාව ඇත. දෙය්‍යධර්මය ද විද්‍යමාන වෙයි. මම ද ප්‍රතිග්‍රාහකයෙමි. ඉදින් මම් නො පිළිගනිම් නම්, මෙසේ තෙපි පිනින් පරිබාහිර වන්නහු යැ. මට මෙයින් ප්‍රයොජන නැත. එහෙත් තොපට මැ අනුකම්පා සඳහා පිළිගනිමි'. එතැන් පටන් බොහෝ සිවුරු ද පිළිගනී, බොහෝ පිණ්ඩපාතය ද පිළිගනී, බොහෝ සෙනසුන් ද පිළිගනී, බොහෝ ගිලන්පස බෙහෙසත්පිරිකර ද පිළිගනී. මෙබඳු වූ යම් බැම බිඳීමෙක් බැම බිඳින බවෙක් කුහනයෙක් කොහොන් බවෙක් විස්මාපිත බවෙක් වේ ද. මේ 'ප්‍රත්‍යයප්‍රතිසෙධන සඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ.

ඊර්‍ය්‍යාපථ සඞ්ඛ්‍යාත කොහොන් වස්තුව කවරැ යත්: මෙහි කිසිවෙක් පාපෙච්ඡ වූයේ ඉච්ඡාවෙන් මඩනා ලදුයේ බුහුමන් කැමැති වූයේ 'ජනයා මෙසේ මට බුහුමන් කරන්නේ යැ'යි ගමන සකස් කෙරෙයි, සිටීම- හිඳීම- ශයනය සකස් කෙරෙයි, පනාගෙන යයි, පනාගෙන සිටී, පනාගෙන හිඳී, පනාගෙන ශයනය කෙරෙයි. සමාධියට පැමිණියකු සෙයින් යෙයි, සමාහිතයකු සෙයින් හිඳී, සමාහිතයකු සෙයින් ශයනය කෙරෙයි; ජනයා හමුයෙහි ධ්‍යාන කරනුයේ මැ වෙයි. මෙබඳු වූ ඊර්‍ය්‍යාපථයාගේ යම් ආදි කොට තැබීමෙක් තබන අයුරෙක් සකස් කොට තැබීමෙක් මුහුණු හකුළුවන බවෙක් මුහුණු හකුළුවන සුලු බවෙක් විස්මාපනයෙක් විස්මාපනාකාරයෙක් විස්මාපිත බවෙක් වේ ද; මේ ඊර්‍ය්‍යාපථසඞ්ඛ්‍යාත කුහනවස්තුව යැ.

සාමන්තජල්පනසඞ්ඛ්‍යාත කොහොන්වන කවරැ යත්: මෙහි කිසිවෙක් පාපෙච්ඡ වූයේ ඉච්ඡාවෙන් මඩනා ලදුයේ බුහුමන් කැමැති වූයේ 'ජනයා මට මෙසේ බුහුමන් කරන්නේය'යි ලොවුතුරු දහම් පිළිබඳ වූ වදන් බෙණෙයි: යමෙක් මෙබඳු සිවුරු ධරා නම්, ඒ මහණ මහෙශාක්‍ය (මහායශස්ක) යෙකැ'යි බෙණෙයි. යමෙක් මෙබඳු පාත්‍රයක් ධරා නම්-ලෝහලියක් ධරා නම්-දියඬරුවක් ධරා නම් - පෙරහනක් ධරා නම් - කෙස්සක් ධරා නම් - වහන්සඟලක් ධරා නම් - කාබන්ධනක් ධරා නම් - ආයොගපට ධරා නම්, ඒ මහණ මහත් අනුභාව ඇත්තෙකැ'යි, බෙණෙයි. යමක් හට මෙබඳු උපාධ්‍යාය කෙනෙක් වෙත් නම්, ඒ මහණ අනුභාව ඇත්තෙකැයි බෙණෙයි, යමකුට මෙබඳු ආචාර්‍ය්‍ය කෙනෙක් වෙත් නම් - සමානොපාධ්‍යායයෝ - සමානාචාර්‍ය්‍යයෝ- මිත්‍රයෝ- සංදෘෂ්ටයෝ- සම්භක්තයෝ - සහායයෝ වෙත් නම්, ඒ මහණ අනුභාව ඇත්තෙකැයි බෙණෙයි, යමෙක් මෙබඳු විහාරයෙක වෙසේ නම්, ඒ මහණ අනුභාව ඇත්තෙකැ'යි බෙණෙයි, යමෙක් මෙබඳු ගුරුළුවක්ගෙයෙක වෙසේ නම්- පහයෙක වෙසේ නම් - සඳලුපහණයෙක වෙසේ නම් - ගුහායෙක වෙසේ නම්- ලෙනක වෙසේ නම් - කිළියෙක වෙසේ නම් - කුළුගෙයෙක වෙසේ නම්- අටල්ලෙක වෙසේ නම් - මළියෙක වෙසේ නම් - උද්දණ්ඩයෙක වෙසේ නම් - උවටැන්හලෙක වෙසේ නම් - මඩුයෙක වෙසේ නම් - රුක්මුලෙක වෙසේ නම්, ඒ මහණ අනුභාව ඇතියෙකැයි බෙණෙයි.

අථවා කොරඤ්ජිකකොරඤ්ජිකො භාකුටිකභාකුටිකො කුහකකුහකො ලපකලපකො මුඛසම්භාවිතො – අයං සමණො ඉමාසං එවරූපානං සන්තානං විහාරසමාපත්තීනං ලාභී’ති තාදිසං ගම්භීරං ගූළ්හං නිපුණං පටිච්ඡන්නං ලොකුත්තරං සුඤ්ඤතාපටිසඤ්ඤුත්තං කථං කථෙති. යා එවරූපා භාකුටිකා භාකුටියං කුහනා කුහායනා කුහිතත්තං, ඉදං සාමන්තජප්පනසඞ්ඛාතං කුහනවත්ථු.

බුද්ධස්ස භගවතො ඉමානි තීණි කුහනවත්ථූනි පහීනානි සමුච්ඡින්නානි වූපසන්තානි පටිපස්සද්ධානි අභබ්බුප්පත්තිකානි ඤාණග්ගිනා දඩ්ඪානි. තස්මා බුද්ධො අකුහොති – අකුහං.

**ගණිමාගතන්ති**–‘ගණී’ති ගණී භගවා; ගණාචරියොති ගණී, ගණස්ස සත්ථාති ගණී; ගණං පරිහරතීති ගණී, ගණං ඔවදතීති ගණී, ගණං අනුසාසතීති ගණී, විසාරදො ගණං උපසංකමතීති ගණී, ගණො’ස්ස සුස්සූසති සොතං ඔදහති අඤ්ඤාය චිත්තං උපට්ඨපෙතීති ගණී, ගණං අකුසලා වුට්ඨාපෙත්වා කුසලෙ පතිට්ඨාපෙතීති ගණී, භික්ඛුගණස්ස ගණී, භික්ඛුනීගණස්ස ගණී, උපාසකගණස්ස ගණී, උපාසිකාගණස්ස ගණී, රාජගණස්ස ගණී, ඛත්තියගණස්ස ගණී, බ්‍රාහ්මණගණස්ස ගණී, වෙස්සගණස්ස ගණී, සුද්දගණස්ස ගණී, දෙවගණස්ස ගණී, බ්‍රහ්මගණස්ස ගණී, සඞ්ඝී,[1] ගණී, ගණාචරියො[2]. **ආගතන්ති**[3] ආගතං උපාගතං සමුපාගතං[4] සම්පත්තං[5] සඞ්කස්සනගරන්ති – අකුහං ගණිමාගතං.

**බහුන්නමිධ[6] බද්ධානන්ති** – ‘බහුන්න’න්ති බහුන්නං ඛත්තියානං බ්‍රාහ්මණානං වෙස්සානං සුද්දානං ගහට්ඨානං පබ්බජිතානං දෙවානං මනුස්සානං; **බද්ධානන්ති** බද්ධානං බද්ධචරානං පරිචාරකානං සිස්සානන්ති – බහුන්නමිධ බද්ධානං.

**අත්ථි පඤ්හෙන ආගමන්ති** – පඤ්හෙන අත්ථිකාම්හ ආගතා[7] පඤ්හං පුච්ඡිතුකාමම්හ ආගතා; පඤ්හං සොතුකාමම්හ ආගතම්හාති එවම්පි අත්ථි පඤ්හෙන ආගමං. අථවා පඤ්හත්ථිකානං පඤ්හං පුච්ඡිතුකාමානං පඤ්හං සොතුකාමානං ආගමනං අභික්කමනං උපසඞ්කමනං පයිරුපාසනං[8] අත්ථීති එවම්පි අත්ථි පඤ්හෙන ආගගමං. අථවා පඤ්හාගමො තුය්හං අත්ථි, ත්වම්පි පහු, ත්වමසි අලමත්තො මයා පුච්ඡිතං කථෙතුං විස්සජ්ජෙතුං; වහස්සෙතං භාරන්ති එවම්පි – අත්ථි පඤ්හෙන ආගමං.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

“තං බුද්ධං අසිතං තාදිං
අකුහං ගණිමාගතං,
බහුන්නමිධ[6] බද්ධානං
අත්ථි පඤ්හෙන ආගම”න්ති.

---

1. සඞ්ඝගණස්ස ගණී – සීමු II. 2. ගණාචරියං – සීමු. II.
3. ආගතං – සීමු. II. ආගතො – PTS.
4. උපගතං සමුපගතං – මජ්සං. උපාගතො සමුපගතො – PTS
5. සමුපපත්තං – මජ්සං. 6. බහුනාමිධ – මජ්සං – සීමු. II.
7. අත්ථිකො ආගතොම්හි – මජ්සං. 8 පයිරුපාසනා – සතා.

නොහොත් අතිශයින් හැකුළුණේ අතිශයින් මුහුණ හකුළුවනසුලු වූයේ අතිශයින් විස්මය කරවනුයේ අතිශයින් ප්‍රලාප කථා කරනුයේ තමාගේ මුඛමාත්‍රයෙන් ම අනුන් විසින් බුහුමන් කරන ලදුයේ 'මේ මහණ තෙම මේ මෙබඳු වූ ශාන්ත වූ විහාරසමාපත්තිලාභී'යයි එබඳු ගැඹුරු වූ ගූඪ වූ සියුම් වූ ප්‍රතිච්ඡන්න වූ ලෝකෝත්තර වූ ශූන්‍යතාප්‍රතිසංයුක්ත වූ කථාව කෙරෙයි. මෙබඳු වූ යම් බැම බිඳීමෙක් කුහනයෙක් කොහොත් අයුරෙක් කොහොත්-බවෙක් වේ ද, මේ සාමන්තජල්පන සඞ්ඛ්‍යාත කොහොත්වන යි.

භාග්‍යවත් බුදුන් විසින් මේ තුන් කොහොත්වත් ප්‍රහීණ කරන ලද්දාහු ය, සිඳින ලද්දාහු ය, සන්සිඳුවන ලද්දාහු ය, දුරලන ලද්දාහු ය, (ඔහු) උපනට නුසුදුසු වූවාහු ය, නුවණගින්නෙන් දවන ලද්දාහු ය. එහෙයින් බුදුහු අකුහ නුයි 'අකුහං' යනු වේ.

ගණිමාගතං – 'ගණී' යනු: බුදුහු ගණී වූහ; ගණාචාර්‍ය්‍ය නුයි ගණී යැ, ගණයා හට ශාස්තෘ නුයි 'ගණී'යැ ගණයා පරිහරණය කෙරෙත් නුයි 'ගණී'යැ, ගණයා හට අවවාද කෙරෙත් නුයි 'ගණී'යැ, ගණයා හට අනුශාසනා කෙරෙත් නුයි – 'ගණී'යැ, විශාරද වැ ගණයා වෙත එළැඹෙත් නුයි 'ගණී'යැ. ගණ තෙමේ ඔවුන්ගේ බස් අසනු රිසි වෙයි, (ඇසීමට) කන තබයි, දැනගැනීමට සිත එළවා නුයි 'ගණී'යැ. ගණයා අකුශලයෙන් නගා කුශලයෙහි පිහිටුවාලන සේක් නුයි 'ගණී'යැ, භික්ෂුගණයට 'ගණී'යැ, භික්ෂුණීගණයට ගණී යැ, උපාසකගණයට ගණී යැ, උපාසිකාගණයට ගණී යැ, රාජගණයට ගණී යැ, ක්ෂත්‍රියගණයට ගණී යැ, බ්‍රාහ්මණගණයට ගණී, යැ, වෛශ්‍යගණයට ගණී යැ, ශූද්‍රගණයට ගණී යැ, දෙවගණයට ගණී යැ. බ්‍රහ්මගණයට ගණී වූ සේක. සමූහ ඇතියහ, ගණයා ඇතියහ, ගණාචාර්‍ය්‍ය වූහ. ආගතං යනු සකස්පුරයට ආගත උපාගත සමුපාගත සම්ප්‍රාප්ත වූවාහු නුයි 'අකුහං ගණිමාගතං' යනු වේ.

බහුන්නමිධ බද්ධානං – බොහෝ වූ ක්ෂත්‍රියයන් අතුරෙන් බ්‍රාහ්මණ-වෛශ්‍ය – ශූද්‍ර – ගෘහස්ථ – ප්‍රව්‍රජිත – දෙව – මනුෂ්‍යයන් අතුරෙන්; බද්ධානං-බද්ධ වූ (-බැඳුණු) බැඳී හැසිරෙන පරිචාරක වූ ශිෂ්‍යයන් අතුරෙන් නුයි 'බහුන්නමිධ බද්ධානං' යනු වේ.

අත්ථි පඤ්හෙන ආගමං – ප්‍රශ්නයෙන් අර්ත්‍ථි වැ (-ප්‍රයොජන ඇති වැ) පැමිණියම්හ, පැන පුළුවුස්නා කැමැති වැ පැමිණියම්හ, පැන අසනු කැමැති වැ පැමිණියම්හ'යි – මෙසේ ත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. නොහොත් ප්‍රශ්නාර්ත්‍ථි වූ පැන පුළුවුස්නා වූ පැන අසනු කැමැතියන්ගේ ඊම අභිමුඛයට පැමිණීම එළැඹීම පයිරුපාසනය වන්නේ ය, ඇත් නුයි-මෙසේත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. නොහොත් ප්‍රශ්නයාගේ පැමි-ණීම නුඹ වහන්සේට ඇත, නුඹ වහන්සේත් ප්‍රභූ වූහු යැ, නුඹ වහන්සේ මා විසින් පුළුවුස්නා ලද්ද කියන්නට විසඳන්නට සමර්ථ වූවහු ය, තෙල භාරය උසුලනු මැනවැ'යි මෙසේත් 'අත්ථි පඤ්හෙන ආගමං' යනු වේ. එයින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

"තං බුද්ධං අසිතං තාදිං -පෙ- අත්ථි පඤ්හෙන ආගමං"යි.

### 16 - 4

භික්ඛුනො විජිගුච්ඡතො
භජතො රිත්තමාසනං,
රුක්ඛමූලං සුසානං වා
පබ්බතානං ගුහාසු වා.

**භික්ඛුනො විජිගුච්ඡතොති** – 'භික්ඛුනො'ති පුථුජ්ජනකල්‍යාණකස්ස වා භික්ඛුනො, සෙඛස්ස වා භික්ඛුනො; විජිගුච්ඡතොති ජාතියා විජිගුච්ඡතො, ජරාය – බ්‍යාධිනා – මරණෙන – සොකෙහි – පරිදෙවෙහි – දුක්ඛෙහි – දොමනස්සෙහි – උපායාසෙහි විජිගුච්ඡතො, නෙරයිකෙන දුක්ඛෙන තිරච්ඡානයොනිකෙන දුක්ඛෙන පෙත්තිවිසයිකෙන දුක්ඛෙන මානුසිකෙන දුක්ඛෙන ගබ්භොක්කන්තිමූලකෙන දුක්ඛෙන ජාතස්සූපනිබන්ධකෙන දුක්ඛෙන ජාතස්ස පරාධෙය්‍යකෙන දුක්ඛෙන අත්තූපක්කමෙන දුක්ඛෙන පරූපක්කමෙන දුක්ඛෙන දුක්ඛදුක්ඛෙන සඞ්ඛාරදුක්ඛෙන විපරිණාමදුක්ඛෙන චක්ඛුරොගෙන දුක්ඛෙන සොතරොගෙන දුක්ඛෙන ඝානරොගෙන දුක්ඛෙන ජිව්හාරොගෙන දුක්ඛෙන කායරොගෙන දුක්ඛෙන සීසරොගෙන දුක්ඛෙන කණ්ණරොගෙන දුක්ඛෙන මුඛරොගෙන දුක්ඛෙන දන්තරොගෙන දුක්ඛෙන කාසෙන සාසෙන පිනාසෙන ඩහෙන ජරෙන කුච්ඡිරොගෙන මුච්ඡාය පක්ඛන්දිකාය සූලාය විසූචිකාය කුට්ඨෙන ගණ්ඩෙන කිලාසෙන සොසෙන අපමාරෙන දද්දුයා කණ්ඩුයා කච්ඡුයා රඛසාය විතච්ඡිකාය ලොහිතෙන පිත්තෙන මධුමෙහෙන අංසාය පිළකාය භගන්දලෙන[1] පිත්තසමුට්ඨානෙන ආබාධෙන සෙම්හසමුට්ඨානෙන ආබාධෙන වාතසමුට්ඨානෙන ආබාධෙන සන්නිපාතිකෙන ආබාධෙන උතුපරිණාමජෙන ආබාධෙන විසමපරිහාරජෙන ආබාධෙන ඔපක්කමිකෙන ආබාධෙන කම්මවිපාකජෙන ආබාධෙන සීතෙන උණ්හෙන ජිඝච්ඡාය පිපාසාය උච්චාරෙන පස්සාවෙන ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන දුක්ඛෙන – මාතුමරණෙන දුක්ඛෙන පිතුමරණෙන දුක්ඛෙන භාතුමරණෙන – භගිනිමරණෙන – පුත්තමරණෙන – ධීතුමරණෙන – ඤාතිමරණෙන – භොගබ්‍යසනෙන – රොගබ්‍යසනෙන – සීලබ්‍යසනෙන – දිට්ඨිබ්‍යසනෙන දුක්ඛෙන විජිගුච්ඡතො අට්ටීයතො හරායතො ජිගුච්ඡතොති – භික්ඛුනො විජිගුච්ඡතො.

**භජතො රිත්තමාසනන්ති** – 'ආසනං' වුච්චති යත්ථ නිසීදති, මඤ්චො පීඨං භිසි තට්ටිකා චම්මඛණ්ඩො තිණසන්ථාරො පණ්ණසන්ථාරො පලාසසන්ථාරො; තං ආසනං අසප්පායරූපදස්සනෙන රිත්තං විවිත්තං පවිවිත්තං; අසප්පායසද්දසවණෙන රිත්තං විවිත්තං පවිවිත්තං; අසප්පායෙහි පඤ්චහි කාමගුණෙහි රිත්තං විවිත්තං පවිවිත්තං; තං පවිවිත්තං ආසනං භජතො සම්භජතො සෙවතො නිසෙවතො සංසෙවතො පටිසෙවතොති – භජතො රිත්තමාසනං.

**රුක්ඛමූලං සුසානං වාති** – රුක්ඛමූලං යෙව රුක්ඛමූලං; සුසානං යෙව 'සුසාන'න්ති – රුක්ඛමූලං සුසානං වා.

---

1 භගන්දලාය – ස්‍යා

## 16 - 4

ජාති ආදියෙන් ජුගුප්සා කරන රුක්මුල හෝ සොහොන හෝ පර්වතයන් සම්බන්ධ ගුහාවන්හි හෝ (පස්කම්ගුණයෙන්) විවික්ත (ඇඳ පුටු ආදි) ආසනයා සෙවුනා මහණ හට -

**භික්ඛුනො විජිගුච්ඡතො** - 'භික්ඛුනො' යනු: පෘථග්ජනකල්‍යාණ භික්ෂුහට හෝ ශෛක්ෂ භික්ෂුහට හෝ; **විජිගුච්ඡතො** - ජාතියෙන් ජුගුප්සා කරන්නහුට, ජරාවෙන් - ව්‍යාධියෙන් - මරණයෙන් - ශෝකයෙන් - පරිදේවයෙන් - දුකින් - දොම්නසින් - උපායාසයෙන් ජුගුප්සා කරන්නහුට, නිරයදුකින් - තිරිසන්යොන්හි දුකින් - ප්‍රෙතවිෂයෙහි වූ දුකින් - මිනිස්ලොව (වධබන්ධනාදි) දුකින් - ගර්භාවක්‍රාන්තිමූලක දුකින් - ගර්භස්ථිතිමූලක දුකින් - ගර්භව්‍යුත්ථානමූලක දුකින් - උපන්නහු පිළිජග්නා දුකින් - උපන්නහු පරා අයත් කොට ඇති දුකින් - පරෝපක්‍රමයෙන් වූ දුකින් - දුඃඛදුඃඛයෙන් - සංස්කාරදුඃඛයෙන් - විපරිණාමදුඃඛයෙන් - චක්ෂුරෝගයෙන් වූ දුකින් - ශ්‍රොත්‍රරෝගයෙන් වූ දුකින් - ඝ්‍රාණරෝගයෙන් වූ දුකින් - ජිහ්වාරෝගයෙන් වූ දුකින් - කායරෝගයෙන් වූ දුකින් - ශීර්ෂරෝගයෙන් වූ දුකින් - කර්ණරෝගයෙන් වූ දුකින් - මුඛරෝගයෙන් වූ දුකින් - දන්තරෝගයෙන් වූ දුකින් - කාසයෙන් ශ්වාසයෙන් පීනසින් දාහයෙන් ජ්වරයෙන් කුක්ෂිරෝගයෙන් මූර්ඡායෙන් ලොහිතාතීසාරයෙන් ආම්ශූලයෙන් මහාවිරේචනයෙන් කුෂ්ඨයෙන් ගණ්ඩයෙන් කබරරෝගයෙන් ක්ෂයරෝගයෙන් අපස්මාරයෙන් දද්‍රුයෙන් කණ්ඩූතියෙන් කුෂ්ඨයෙන් නියහිරිත් අතුල්පතුල් පැළීමෙන් රත්පිතින් මධුමෙහයෙන් අර්ශසින් පිළිකායෙන් භගන්දරායෙන් පිතින් උපදනා ආබාධයෙන් සෙමින් උපදනා ආබාධයෙන් වයින් උපදනා ආබාධයෙන් සාන්නිපාතික ආබාධයෙන් ඍතුවිපර්යාසයෙන් උපදනා ආබාධයෙන් විෂමපරිහරණයෙන් උපදනා ආබාධයෙන් උපක්‍රමයෙන් උපදනා ආබාධයෙන් කර්මවිපාකජ ආබාධයෙන් සිහිලෙන් උණුසුමින් සයින් පවසින් මලයෙන් මූයෙන් මැසි මදුරු වා අව් දිග්දපහසින් වූ දුකින්, මවගේ මරණයෙන් වූ දුකින් පියාගේ මරණයෙන් වූ දුකින් බෑයා ගේ මරණයෙන් - බූනගේ මරණයෙන් - පුතා ගේ මරණයෙන් - දුව ගේ මරණයෙන් - නෑයන්ගේ විපතින් - භොගයන් ගේ විපතින් - රෝගව්‍යසනයෙන් - ශීලව්‍යසනයෙන් - දෘෂ්ටිව්‍යසනයෙන් වූ දුකින් ජුගුප්සා කරන්නහුට දුක්වන්නහුට පිළිකුල් වන්නහුට තුසි 'භික්ඛුනො විජිගුච්ඡතො' යනු වේ.

**භජතො රිත්තමාසනං** - යම් තැනෙක හිඳී නම්, ඇඳ පුටුව බිස්ස තට්ටිකාව සම්කඩ තණඇතිරිය පත්ඇතිරිය කොළඇතිරිය යන මෙය 'ආසන'යි කියනු ලැබේ. ඒ ආසනය අසත්ප්‍රාය (-ඉෂ්ට) වූ රූප දැකීමෙන් තුච්ඡ යැ ශූන්‍ය යැ අතිශයින් ශූන්‍ය යි; අසත්ප්‍රාය වූ ශබ්දශ්‍රවණයෙන් රික්ත යැ විවික්ත යැ අතිශයින් විවික්ත යි; අසත්ප්‍රාය වූ පඤ්චකාමගුණයන් ගෙන් රික්ත යැ විවික්ත යැ ප්‍රවිවික්ත යි. ඒ අතිශයින් විවික්ත (-වෙන්) වූ ආසනය භජනය කරන්නහුට මැනැවින් භජනය කරන්නහුට සෙවුනහුට වෙසෙසින් සෙවුනහුට පුනපුනා සෙවුනහුට එළැඹ සෙවුනහුට තුයි 'භජතො රිත්තමාසනං' යනු වේ.

**රුක්ඛමූලං සුසානං වා** - රුක්මුල මැ 'රුක්ඛමූල'යැ, සොහොන මැ 'සුසානය' තුයි 'රුක්ඛමූලං සුසානං වා' යනු වේ.

පබ්බතානං ගුහාසු වාති - පබ්බතායෙව පබ්බතා; කන්දරායෙව කන්දරා; ගිරිගුහායෙව ගිරිගුහා; පබ්බතන්තරිකායො වුච්චන්ති පබ්බතපබ්භාරාති- පබ්බතානං ගුහාසු වා.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"භික්ඛුනො විජිගුච්ඡතො
භජතො රිත්තමාසනං,
රුක්ඛමූලං සුසානං වා
පබ්බතානං ගුහාසු වා"ති.

16 - 5

උච්චාවචෙසු සයනෙසු කුවන්තා[1] තත්ථ භෙරවා,
යෙහි භික්ඛු න වෙධෙය්‍ය නිග්ඝොසෙ සයනාසනෙ.

උච්චාවචෙසු සයනෙසූති - 'උච්චාවචෙසූ'ති උච්චාවචෙසු හීනප්පණීතෙසු ඡෙකපාපකෙසු; 'සයනං' වුච්චති විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහාති - උච්චාවචෙසු සයනෙසු.

කුවන්තා තත්ථ භෙරවාති - 'කුවන්තා'ති කුවන්තා කූජන්තා නදන්තා සද්දං කරොන්තා; අථවා කිංවන්තාති කති කිත්තකා කීවතකා කිංවබහුකා. තෙ භෙරවාති? සීහා බ්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා හත්ථී අහී විච්ඡිකා සතපදී චොරා වා අස්සු මානවා වා කතකම්මා වා අකතකම්මා වාති - කුවන්තා තත්ථ භෙරවා.

යෙහි භික්ඛු න වෙධෙය්‍යාති - 'යෙහී'ති යෙහි භෙරවෙහි; භෙරවෙ පස්සිත්වා වා සුණිත්වා වා න වෙධෙය්‍ය නප්පවෙධෙය්‍ය න සම්පවෙධෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න භායෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය, අභීරු අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති - යෙහි භික්ඛු න වෙධෙය්‍ය.

නිග්ඝොසෙ සයනාසනෙති - අප්පසද්දෙ අප්පනිග්ඝොසෙ විජනවාතෙ මනුස්සරාහසෙය්‍යකෙ පටිසල්ලානසාරුප්පෙ සෙනාසනෙති - නිග්ඝොසෙ සයනාසනෙ.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"උච්චාවචෙසු සයනෙසු
කුවන්තා තත්ථ භෙරවා,
යෙහි භික්ඛු න වෙධෙය්‍ය
නිග්ඝොසෙ සයනාසනෙ"ති.

---

1. ගීවන්තා - සයා. PTS කිවන්තා - සීමු. II කීවන්තා - සු පු.

**පබ්බතානං ගුහාසු වා** - පර්වතයෝ මැ, ‘පබ්බත’ යැ, කඳුරැළි මැ ‘කන්දර’, යැ ගල්ගුහා මැ ‘ගිරිගුහා’යැ, පර්වතකුසීහු ‘පබ්බතන්තරිකා’යි කියනු ලැබෙත් නුයි ‘පබ්බතානං ගුහාසු වා’ යනු වේ.

එයින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

“**භික්ඛුනො විජිගුච්ඡතො -පෙ- පබ්බතානං ගුහාසු වා**”යි.

**16 - 5**

මහණ තෙමෙ නිඝෝෂ වූ සෙනස්නෙහි යම් භෛරවයෙකින් නො සැලෙන්නේ නම්, ඒ කුදුමහත් (-හීනප්‍රණීත වූ) සෙනසුන්හි කිපමණ භෛරවයෝ වෙත් ද, නොහොත් එහි (**කූවන්තා** -) නාද කරන- භයානක අරමුණු වෙත්.

**උච්චාවචෙසු සයනෙසු** - ‘උච්චාවචෙසු’ යනු: උස් - මිටි වූ හීනප්‍රණීත වූ උත්තමාධම වූ විහාර යැ අඩ්ඪයොග යැ ප්‍රාසාද යැ, හර්ම්‍ය යැ ගුහා යැ යන මේ ‘සයන’යි කියනු ලැබේ නුයි ‘උච්චාවචෙසු සයනෙසු’ යනු වේ.

**කූවන්තා තත්‍ථ භෙරවා** - ‘කූවන්තා’ යනු: හඬගසන කූජනය කරන නාද කරන ශබ්ද කරන; නොහොත් **කීවන්තා** යනු: ඒ භෛරවයෝ කෙතෙක් ද? කිපමණ ද? කෙබඳු ද? කිපමණ බොහෝ ද යත්? සිංහයෝ යැ ව්‍යාඝ්‍රයෝ යැ දිවියෝ යැ වලස්සු යැ තරක්හු යැ වෘකයෝ යැ මීවෝ යැ ඇත්තු යැ සර්පයෝ යැ වුහුසුහු යැ සියපාහු යැ, කළ සොරකම් ඇති හෝ නැති හෝ සොරු හෝ නැහැසි මිනිස්සු හෝ වන්නාහු නුයි ‘කූවන්තා තත්‍ථ භෙරවා’ යනු වේ.

**යෙහි භික්ඛු න වෙධෙය්‍ය** - ‘යෙහි’ යනු: යම් භෛරවයන්ගෙන්, භෛරවයන් දැක හෝ අසා හෝ නො වෙවුලා නම්, අතිශයින් නො වෙවුලා නම්, හාත්පසින් නො වෙවුලා නම්, නො තැතිගනී නම්, හාත්පසින් නො තැතිනනී නම්, නො බිය වේ නම්, සන්ත්‍රාසයට නො පැමිණේ නම්, බියසුලු නො වූයේ නො තැතිගන්නා සුලු වූයේ ත්‍රස්ත නො වන සුලු වූයේ නො පලායනසුලු වූයේ වන්නේ නම්, ප්‍රහීණ වූ බියඅරමුණු ඇත්තේ පහවූ ලොමුදහ ඇති වැ වෙසෙන්නේ නම් යි ‘යෙහි භික්ඛු න වෙධෙය්‍ය’ යනු වේ.

**නිග්ඝොසෙ සයනාසනෙ** - අල්පශබ්ද වූ අල්පනිඝෝෂ වූ ජනවාත රහිත වූ මිනිසුන්ගේ රහස්‍ය ක්‍රියාවන්ට යොග්‍ය වූ විත්තසමාධියට අනුරූප වූ සෙනසුන්හි නුයි ‘නිග්ඝොසෙ සයනාසනෙ’ යනු වේ.

එයින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

“**උච්චාවචෙසු සයනෙසු -පෙ- නිග්ඝොසෙ සයනාසනෙ**”යි.

**16 - 6**

කති පරිස්සයා ලොකෙ
ගච්ඡතො අගතං දිසං,
යෙ භික්ඛු අභිසම්භවෙ
පන්තම්හි සයනාසනෙ.

**කති පරිස්සයා ලොකෙති** – 'කතී'ති කති කිත්තකා කීවතකා කීවබහුකා තෙ පරිස්සයාති? ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච, පටිච්ඡන්නපරිස්සයා ච.

කතමෙ පාකටපරිස්සයා? සීහා බ්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා හත්ථී අහී විච්ඡිකා සතපදී චොරා වා අස්සු මානවා වා කතකම්මා වා අකතකම්මා වා, චක්ඛුරොගො සොතරොගො ඝානරොගො ජිව්හාරොගො කායරොගො සීසරොගො කණ්ණරොගො මුඛරොගො දන්තරොගො කාසො සාසො පිනාසො ඩහො ජරො කුච්ඡිරොගො මුච්ඡා පක්ඛන්දිකා සූලා විසූචිකා කුට්ඨං ගණ්ඩො කිලාසො සොසො අපමාරො දද්දු කණ්ඩු කච්ඡු රඛසා විතච්ඡිකා ලොහිතපිත්තං[1] මධුමෙහො අංසා පිළකා භගන්දලා පිත්තසමුට්ඨානා ආබාධා -පෙ- සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සා. ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා.

කතමෙ පටිච්ඡන්නපරිස්සයා? කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං කාමච්ඡන්දනීවරණං බ්‍යාපාදනීවරණං ථීනමිද්ධනීවරණං උද්ධච්චකුක්කුච්චනීවරණං විචිකිච්ඡානීවරණං, රාගො දොසො මොහො කොධො උපනාහො මක්ඛො පළාසො ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භො සාරම්භො මානො අතිමානො මදො පමාදො, සබ්බෙ කිලෙසා සබ්බෙ දුච්චරිතා සබ්බෙ දරථා සබ්බෙ පරිළාහා සබ්බෙ සන්තාපා සබ්බාකුසලාභිසඞ්ඛාරා. ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා.

**පරිස්සයාති** – කෙනට්ඨෙන පරිස්සයා? පරිසහන්තීති පරිස්සයා, පරිහානාය සංවත්තන්තීති පරිස්සයා, තත්‍රාසයාති පරිස්සයා. කථං පරිසහන්තීති පරිස්සයා? තෙ පරිස්සයා, තං පුග්ගලං සහන්ති පරිසහන්ති අභිභවන්ති අජ්ඣොත්ථරන්ති පරියාදියන්ති මද්දන්ති, එවං පරිසහන්තීති පරිස්සයා. කථං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා? තෙ පරිස්සයා කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. කතමෙසං කුසලානං ධම්මානං? සම්මාපටිපදාය අනුලොමපටිපදාය අපච්චනීකපටිපදාය අන්වත්ථපටිපදාය ධම්මානුධම්මපටිපදාය සීලෙසු පරිපූරකාරිතාය ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතාය භොජනෙ මත්තඤ්ඤුතාය ජාගරියානුයොගස්ස සතිසම්පජඤ්ඤස්ස චතුන්නං සතිපට්ඨානානං භාවනානුයොගස්ස චතුන්නං සම්මප්පධානානං-චතුන්නං ඉද්ධිපාදානං-පඤ්චන්නං ඉන්ද්‍රියානං-පඤ්චන්නං බලානං –සත්තන්නං බොජ්ඣඞ්ගානං –අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස භාවනානුයොගස්ස, ඉමෙසං කුසලානං ධම්මානං අන්තරායාය පරිහානාය සංවත්තන්ති. එවං පරිහානාය සංවත්තන්තීති පරිස්සයා.

1. ලොහිතං පිත්තං - සී.

## 16 - 6

මහණ තෙම වනකෙලවර සෙනසුන්හි යම් උපද්‍රව කෙනකුත් මැඩ-පවත්වන්නේ නම්, තො භියවිරු අමාමහනිවන්දෙසට යනුවහුට ලොවැ කෙතෙක් උපද්‍රවයෝ වෙත් ද ?

**කති පරිස්සයා ලොකෙ** – 'කති'යනු ඒ උවදුරු කීයක් ද ? කෙතෙක් ද ? කිපමණ ද ? කිපමණ බොහෝ ද යත්: උපද්‍රවයෝ දෙදෙනෙකි: ප්‍රකට උපද්‍රවයෝ ද ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ දැයි.

ප්‍රකට උපද්‍රවයෝ කවරහ යත්: සිහ යැ වග යැ දිවි යැ වලස් යැ තරස් යැ වෘක යැ මීහි යැ ඇත් යැ නාග යැ තුහුසු යැ සියපා යැ කළු සොරකම් ඇයි හෝ නැති හෝ සොරු හෝ සැහැසි මිනිස්සු වන්නාහු ය, චක්ෂුරෝග යැ ශ්‍රෝත්‍රරෝග යැ ඝ්‍රාණරෝග යැ ජිහ්වාරෝග යැ කායරෝග යැ ශීර්ෂරෝග යැ කර්ණරෝග යැ මුඛරෝග යැ දන්තරෝග යැ කාස යැ ශ්වාස යැ පීනස යැ දැහ යැ ජ්වර යැ කුක්ෂිරෝග යැ මූර්ඡා යැ රක්තාතීසාර යැ ආමශූල යැ මහාවිරෙචන යැ කුෂ්ට යැ ගණ්ඩ යැ කිලාස යැ ක්ෂයරෝග යැ අපස්මාර යැ දද්‍රු යැ කණ්ඩූති යැ කුෂට යැ නියහිරි යැ අතුල්පතුල් පැළීම යැ රක්තපිත්ත යැ මධුමෙහ යැ අර්ශස් යැ පොළ යැ භගන්දරා යැ පිත්තසමුත්ථාන ආබාධ යැ...ශීත යැ උෂ්ණ යැ ජිඝච්ඡා යැ පිපාසා යැ උච්චාර යැ ප්‍රස්‍රාව යැ මැසිමදුරු – වා අව් දික්දූපහස්හු සි; මොහු ප්‍රකට උපද්‍රවයෝ යයි කියනු ලැබෙත්.

ප්‍රතිච්ඡන්න උපද්‍රවයෝ කවරහ යත්: කායදුශ්චරිත යැ වාග්දුශ්චරිත යැ මනොදුශ්චරිත යැ, කාමච්ඡන්දනීවරණ යැ, ව්‍යාපාදනීවරණ යැ, ථීන-මිද්ධනීවරණ යැ උද්ධච්චකුක්කුච්චනීවරණ යැ විචිකිච්ඡානීවරණ යැ රාග යැ ද්වෙෂ යැ මොහ යැ ක්‍රොධ යැ බද්ධවෛර යැ මකුබව යැ යුගග්‍රාහ යැ ඊර්ෂ්‍යා යැ මාත්සර්‍ය්‍ය යැ මායා යැ ශඨබව යැ ස්තම්භ යැ සාරම්භ යැ මාන යැ අතිමාන යැ මද යැ ප්‍රමාද යැ සියලු කෙලශයෝ යැ, සියලු දුශ්චරිතයෝ යැ, සියලු දරථයෝ යැ, සියලු පරිදාහයෝ යැ, සියලු සන්තාපයෝ යැ, සියලු අකුශලාභිසංස්කාරයෝ යි. මොහු ප්‍රසිච්ඡන්න උපද්‍රවයෝ යයි කියනු ලැබෙත්.

**පරිස්සයා** – යනු: කවර අර්ථයෙකින් 'පරිස්සය' වූහ යත්: පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රයයෝ යැ පරිහාණියට වැටෙත් නුයි පරිශ්‍රයයෝ යැ එහි වෙසෙත් නුයි පරිශ්‍රයයෝ යැ. කිසෙසින් පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රය වූහ යත්: ඒ උපද්‍රවයෝ ඒ පුඟුල්හු සහනය කෙරෙති, හාත්පසින් සහනය කෙරෙයි, අභිනවනය කෙරෙති, යටපත් කෙරෙති, හාත්පසින් ගනිති, මර්දනය කෙරෙත්; මෙසේ පරිසහනය කෙරෙත් නුයි පරිශ්‍රය වෙත්. කිසෙසින් පරිහාණියට වැටෙත් නුයි 'පරිශ්‍රය' වූහ යත්: ඒ උපද්‍රවයෝ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පිරිහීම පිණිස පවත්නාහුය; කවර කුශලධර්මයන් ගේ ද යත්: සම්‍යක්ප්‍රතිපත්තිය අනුලොම ප්‍රතිපත්තිය අවිරුද්ධ ප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමොක්ෂ ශීලයෙහි පරිපූරකාරිත්වය ඉන්ද්‍රියයන්හි පිහු දොර ඇති බව භොජනයෙහි පමණ දන්නා බව නිදි දුරු කිරීමෙහි යෙදීම ස්මෘතිසම්ප්‍රජන්‍යය සතර සතිපට්ඨානභාවනාවෙහි යෙදීම සතර සම්‍යක්ප්‍රධානය සතර ඍද්ධිපාදය පඤ්චෙන්ද්‍රියය පඤ්ච බලය සප්ත බොධ්‍යඞ්ගය ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගභාවනානුයොගය යන මේ කුශලධර්මයන්ගේ අන්තරාය පිණිස පරිහාණිය පිණිස පවත්නාහු ය. මෙසේ පරිහාණියට වැටෙත් නුයි 'පරිශ්‍රය' නම් වෙත්.

කථං තත්‍රාසයාති පරිස්සයා? තත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයා. යථා බිලෙ බිලාසයා පාණා සයන්ති, දකෙ දකාසයා පාණා සයන්ති, වනෙ වනාසයා පාණා සයන්ති, රුක්ඛෙ රුක්ඛාසයා පාණා සයන්ති, එවමෙවං තත්ථෙතෙ පාපකා අකුසලා ධම්මා උප්පජ්ජන්ති අත්තභාවසන්නිස්සයාති. එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

“සාන්තෙවාසිකො භික්ඛවෙ භික්ඛු සාචරියකො දුක්ඛං න ඵාසු[1] විහරති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු[1] විහරති?

ඉධ භික්ඛවෙ භික්ඛුනො චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසංකප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස අන්තො වසන්ති, අන්වාස්ස වසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති තස්මා සාචරියකොති වුච්චති. පුනචපරං භික්ඛවෙ භික්ඛුනො සොතෙන සද්දං සුත්වා – ඝානෙන ගන්ධං ඝායිත්වා – ජිව්හාය රසං සායිත්වා – කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා – මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස අන්තො වසන්ති අන්වාස්ස වසන්ති[2] පාපකා අකුසලා ධම්මාති, තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මාති තස්මා සාචරියකොති වුච්චති. පුනචපරං භික්ඛවෙ, භික්ඛුනො සොතෙන සද්දං සුත්වා – ඝානෙන ගන්ධං ඝායිත්වා – ජිව්හාය – රසං සායිත්වා – කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා – මනසා ධම්මං විඤ්ඤාය උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා සරසඞ්කප්පා සඤ්ඤොජනියා, ත්‍යාස්ස අන්තො වසන්ති, අන්වාස්ස වසන්ති පාපකා අකුසලා ධම්මා’ති තස්මා සාන්තෙවාසිකොති වුච්චති. තෙ නං සමුදාචරන්ති, සමුදාචරන්ති නං පාපකා අකුසලා ධම්මා’ති තස්මා සාචරියකොති වුච්චති. එවං ඛො භික්ඛවෙ භික්ඛු සාන්තෙවාසිකො සාචරියකො දුක්ඛං න ඵාසු[1] විහරතී”ති[a] එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

“තයො’මෙ භික්ඛවෙ අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා. කතමෙ තයො? ලොභො භික්ඛවෙ අන්තරා මලං[3] අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. දොසො භික්ඛවෙ –පෙ– මොහො භික්ඛවෙ අන්තරා මලං අන්තරා අමිත්තො අන්තරා සපත්තො අන්තරා වධකො අන්තරා පච්චත්ථිකො. ඉමෙ ඛො භික්ඛවෙ තයො අන්තරා මලා අන්තරා අමිත්තා අන්තරා සපත්තා අන්තරා වධකා අන්තරා පච්චත්ථිකා”.[b]

1. අනත්ථජනනො ලොභො ලොභො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

---

1. ඵාසුං - සං. 2. අන්වාස්සවන්ති - සිමු II. මජ්සං. අන්තාස්සවසන්ති - සං
3. මලො - සහං. a. සංයුත්තනිකාය - නවපුරාණවග්ග.
b. ඉතිවුත්තක - 3. 4. 9. මලසුත්ත.

කිසෙයින් තත්‍රාසය (-එහි වෙසෙත්) නුයි පරිශ්‍රය වූහ යත්: එ ආත්මභාවයෙහි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසුරු කොට උපදිත්: යම්සේ බිලාශ්‍රය ප්‍රාණීහු බිලයෙහි වෙසෙත් ද, දිය ඇසුරු කරන ප්‍රාණීහු දියෙහි හොවිත් ද, වනය ඇසුරු කරන ප්‍රාණීහු වෙනෙහි හොවිත් ද, රුක ඇසුරු කරන ප්‍රාණීහු රුකෙහි හොවිත් ද, එ පරිද්දෙන් ම ඒ ආත්මභාවයෙහි තෙල ලාමක අකුශලධර්මයෝ ආත්මභාවය ඇසුරු කොට උපදනාහු වෙත් නුයි මෙසේත් තත්‍රාසය නුයි ‘පරිශ්‍රය’ නම් වෙත්.

මේ වදාරන ලද මැ යැ භාග්‍යවත්හු විසින්:

“මහණෙනි, සාන්තෙවාසික වූ (-අතැවැසි කෙලෙසුන් සමග වසන) මහණ තෙමේ දුකසේ නො සුවසේ වෙසෙසි. මහණෙනි, කිසෙයින් සාන්තෙවාසික වූ සාචාර්‍ය්‍යක වූ මහණ දුකසේ නො සුවසේ වෙසෙසි යත්:

මහණෙනි, මෙහි මහණක් හට ඇසින් රූපයක් දැක (නොයෙක් අරමු-ණෙහි හැසිරීම් වශයෙන් උපන්) සඞ්කල්පනා ඇති සංයෝජනයන්ට හිත වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම්, ඒ ලාමක අකුශලධර්මයෝ ඔහුගේ සිත තුළ වෙසෙති, ඔහුගේ සන්තානය අනුව ගොස් වෙසෙත් නුයි එහෙයින් ‘සාන්තෙවාසික’යි කියනු ලැබෙයි. ඒ ලාමක අකුශලධර්මයෝ ඒ පුද්ගලයා හසුරුවති, ඔහු කෙරෙහි පවතිත් නුයි එහෙයින් ‘සාචාරියක’ යි කියනු ලැබේ. තැවත ද මහණෙනි, මහණ හට කනින් ශබ්දයක් අසා-නැහැයෙන් ගඳක් ආඝ්‍රාණය කොට - දිවින් රසයක් විඳ - කයින් පහසක් පැහැස - මනසින් දහමක් දැන අරමුණෙහි හැසිරීමෙන් උපන් සඞ්කල්පනා ඇති සංයෝජනයන්ට හිත වූ ලාමක අකුශලධර්ම කෙනෙක් උපදනාහු නම්, ඒ ලාමක අකුශලධර්මයෝ ඔහු ගේ සිත තුළ වෙසෙති, ඔහු ගේ සන්තා-නය අනුව ගොස් වෙසෙත් නුයි එහෙයින් ‘සාන්තෙවාසික’යි කියනු ලැබෙයි. ඒ ලාමක අකුශලධර්මයෝ ඒ පුද්ගලයා හසුරුවති, ඔහු කෙරෙහි පවසිත් නුයි එහෙයින් ‘සාචරියක’යි කියනු ලැබේ. මහණෙනි, මෙ පරිද්දෙන් මහණ තෙමේ සාන්තෙවාසික වූයේ සාචරියක වූයේ දුකසේ නො සුවසේ වෙසේ”යයි. මෙසේත් තත්‍රාසය නුයි ‘පරිශ්‍රය’ නම් වෙත්.

මේ වදාරන ලද මැයැ බුදුන් විසින්:

“මහණෙනි, මේ ඇතුළත මලයෝ ඇතුළත අමිත්‍රයෝ ඇතුළත සතුරෝ ඇතුළත වධකයෝ ඇතුළත පසමිතුරෝ තිදෙනෙක් වෙති: කවර තිදෙනෙක යත් ? මහණෙනි, ලෝභය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍ර-යෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතුරෙකි, මහණෙනි, ද්වේෂය...මහණෙනි, මෝහය ඇතුළත මලයෙක, ඇතුළත අමිත්‍රයෙක, ඇතුළත සතුරෙක, ඇතුළත වධකයෙක, ඇතුළත පසමිතු-රෙකි. මහණෙනි, මොහු තිදෙනා ඇතුළත මලයෝ යැ, ඇතුළත අමි-ත්‍රයෝ යැ, ඇතුළත සතුරෝ යැ, ඇතුළත වධකයෝ යැ, ඇතුළත පස-මිතුරෝ” යි.

1. ලෝභය අනර්ථජනක යැ, ලෝභය කුසල්සිත චලනත්තේ යැ, ඇතුළත උපන් භයෙකැ, බාලජන තෙමෙ එය අවබොධ නො කෙරෙයි.

2. ලුද්ධො අත්ථං න ජානාති ලුද්ධො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං ලොභො සහතෙ නරං.

3. අනත්ථජනනො දොසො දොසො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

4. කුද්ධො අත්ථං න ජානාති කුද්ධො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං කොධො[1] සහතෙ නරං.

5. අනත්ථජනනො මොහො මොහො චිත්තප්පකොපනො,
භයමන්තරතො ජාතං තං ජනො නාවබුජ්ඣති.

6. මූළ්හො අත්ථං න ජානාති මූළ්හො ධම්මං න පස්සති,
අන්ධතමං තදා හොති යං මොහො සහතෙ නර''න්ති.a

එවම්පි තත්‍රාසයාති පරිස්සයා. වුත්තං හෙතං භගවතා:

''තයො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. කතමෙ තයො? ලොභො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. දොසො ඛො මහාරාජ -පෙ- මොහො ඛො මහාරාජ, පුරිසස්ස ධම්මො අජ්ඣත්තං උප්පජ්ජමානො උප්පජ්ජති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරාය. ඉමෙ ඛො මහාරාජ, තයො පුරිසස්ස ධම්මා අජ්ඣත්තං උප්පජ්ජමානා උප්පජ්ජන්ති අහිතාය දුක්ඛාය අඵාසුවිහාරායා''ති.b

7. ''ලොභො දොසො ච මොහො ච පුරිසං පාපචෙතසං,
හිංසන්ති අත්තසම්භූතා තචසාරංව සම්ඵල''න්ති.b

එවම්පි තත්‍රාසයාති පරිස්සයා.

වුත්තං හෙතං භගවතා:

8. ''රාගො ච දොසො ච ඉතොනිදානා
අරතී රතී ලොමහංසො ඉතොජා,[2]
ඉතො සමුට්ඨාය මනොවිතක්කා
කුමාරකා ධඞ්කමිවොස්සජන්තී''ති.c

එවම්පි තත්‍රාසයාති පරිස්සයා. ලොකෙති මනුස්සලොකෙ -පෙ- ආයතනලොකෙ'ති - කති පරිස්සයා ලොකෙ?

---

1. දොසො - සිමු II. 2. ලොමහංසො ඉතොජාතො - සක.
a. ඉතිවුත්තක - 3. 4. 9 මලසුත්ත. b. කොසලසංයුත්ත.
c. සුත්තනිපාත - සූචිලොමසුත්ත.

2. ලොභී තෙමේ (ලොභි - ලොවුතුරු) අර්ථය නො දනී. ලොභී තෙමේ දහම් නො දකී. යම් හෙයකින් ලොභය තෙමේ මිනිසා මැඩගනී ද එකල්හි බහල වූ අන්ධකාරය වේ.

3. ද්වේෂය අනර්ථජනක යැ. ද්වේෂය කුසල්සිත චලනන්නේ යැ. ඇතුළත උපන් භයයකැ. බාලජන තෙමේ එය අවබොධ නො කෙරෙයි.

4. කිපියේ අර්ථය නො දනගනී. කිපියේ දහම් නො දකී. යම් කලෙක ක්‍රොධය මිනිසා අභිභවා ද, එකල්හි බහලාන්ධකාරය වේ.

5. මොහය අනර්ථ උපදවන්නේ යැ. මොහය කුසල්සිත චලනන්නේ යැ. සිත තුළ උපන් භයෙකැ. බාලජන තෙමේ එය අවබොධ නො කෙරේ.

6. මූඪ වූයේ ලොවි - ලොවුතුරු අර්ථය නො දනී. මූඪ තෙමේ දහම් (-අනර්ථහෙතුව) නො දකී. යම් කලෙක මොහය තෙමේ මිනිසා අභිභවා ද එකල්හි බහල වූ මොහාන්ධකාරය වේ යයි.

මෙසේ ත් තත්‍රාසය නුයි 'පරිස්සය' නම් වෙත්.

මේ වදාරන ලද මැය බුදුන් විසින්:

"මහරජ, මේ ධර්මයෝ තිදෙනෙක් පුරුෂයාගේ අධ්‍යාත්මයෙහි උපදනාහු අහිත පිණිස දුක් පිණිස නො සුවසේ වාසය පිණිස උපදිත්. කවර තිදෙනෙක් ද යත්: මහරජ, ලොභය පුරුෂයාගේ සිත තුළ උපදනේ අහිතට දුකට අඵාසුවිහරණයට උපදී, මහරජ, ද්වේෂය...මහරජ, මොහය පුරුෂයාගේ සිත තුළ උපදනේ අහිතට දුකට අඵාසුවිහරණයට උපදී. මහරජ, මේ ධර්මයෝ තිදෙන පුරුෂයාගේ සිත තුළ උපදනාහු අහිතයට දුකට අඵාසුවිහරණයට උපදනාහුය"යි.

7. ලොභය ද ද්වේෂය ද මොහය ද තම සිත තුළ උපන්නාහු සවකීය ඵලය හුණගස සෙයින් පව්සිත් ඇති මිනිසා වනසත්'යයි.

මෙසේත් තත්‍රාසය නුයි 'පරිස්සය' නම් වෙත්.

තෙල බුදුන් විසින් වදාරන ලද මැය:

8. රාගය ත් ද්වේෂය ත් මේ ආත්මභාවය නිදාන කොට ඇත්තාහු ය. අරතිය රතිය හා රොමහර්ෂයෝ මේ අත්බවින් උපන්නාහ. පාපවිතර්කයෝ මේ අත්බවින් ඉපද කුමරහු හුයින් පය බැඳි කවුඩක්හු සෙයින් හැර-පියත්.

මෙසේත් තත්‍රාසය නුයි 'පරිස්සය නම් වෙත්. ලොකෙ යනු: මිනිස්-ලොවැ...ආයතනලොකයෙහි නුයි 'කති පරිස්සයා ලොකෙ' යනු වේ.

**ගච්ඡතො අගතං දිසන්ති** – 'අගතා දිසා' වුච්චති අමතං නිබ්බානං, "යො සො සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං" අගතපුබ්බා සා දිසා, න සා දිසා ගතපුබ්බා ඉමිනා දීඝෙන අද්ධුනා.

9. "සමතිත්තිකං අනවසෙසකං[1]
තෙලපත්තං යථා පරිහරෙය්‍ය,
එවං සචිත්තමනුරක්ඛෙ
පත්ථයානො දිසං අගතපුබ්බ"න්ති.[a]

අගතපුබ්බං දිසං වජතො ගච්ඡතො අභික්කමතොති ගච්ඡතො අගතං දිසං.

**යෙ භික්ඛු අභිසම්භවෙති** – 'යෙ'ති යෙ පරිස්සයෙ අභිසම්භවෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති – යෙ භික්ඛු අභිසම්භවෙ.

**පන්තම්හි සයනාසනෙති** – අන්තෙ පන්තෙ පරියන්තෙ සෙලන්තෙ වා වනන්තෙ වා නදන්තෙ වා උදකන්තෙ වා යත්ථ න කසීයති න වපීයති, ජනන්තං[2] අතික්කමිත්වා මනුස්සානං අනුපචාරෙ සෙනාසනෙති – පන්තම්හි සයනාසනෙ.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"කති පරිස්සයා ලොකෙ ගච්ඡතො අගතං දිසං,
යෙ භික්ඛු අභිසම්භවෙ පන්තම්හි සයනාසනෙ"ති.

## 16 - 7

ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු ක්‍යාස්සස්සු ඉධ ගොචරා,
කානි සීලබ්බතාන'ස්සු පහිතත්තස්ස භික්ඛුනො.

**ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සූති** – කිදිසෙන බ්‍යප්පථෙන සමන්නාගතො අස්ස, කිංසණ්ඨිතෙන කිංපකාරෙන කිංපටිභාගෙනාති වචීපාරිසුද්ධිං පුච්ඡති; කතමා වචීපාරිසුද්ධි? ඉධ භික්ඛු මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො හොති: සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්ස; පිසුනං වාචං පහාය පිසුනාය වාචාය පටිවිරතො හොති: ඉතො සුත්වා න අමුත්‍ර අක්ඛාතා ඉමෙසං භෙදාය; අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමො සමග්ගරතො සමග්ගනන්දී සමග්ගකරණිං වාචං භාසිතා හොති. ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො හොති: යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමනීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජනමනාපා, තථාරූපිං වාචං භාසිතා හොති. සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතො හොති:

1 ජනන්තං - සීමු. II. 1. අනවසෙසං - මජසං. සසා. සීමු. II.
a. ජාතක - එකකනිපාත, තෙලපත්තජාතක.

**ගච්ඡතො අගතං දිසං** – අමාමහ නිවන 'අගතදිසා'යි කියනු ලැබෙයි. යම් සියලු සංස්කාරයන්ගේ සන්හිඳීමෙක් සියලු උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාව ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරෝධයෙක් නිර්වාණයෙක් වේ ද, ඒ දිග (සිහිනෙත් පවා)නො ගියවිරූ යෑ. මේ දීඝකාලයෙහි ඒ දිශාව ගියවිරූ නො වෙයි.

9. "මුවවිට යසා පිරුණු තෙල් පාත්‍රයක් නො වැගිරෙනු කොට ගෙන යන්නාක් මෙන් නො ගිය විරූ නිවන්දෙස පතනුයේ ස්වකීය චිත්තය රක්නේයෑ" යි.

අගතපූර්ව වූ නිර්වාණදිශාවට යනුවහුට ගමන් කරනුවහුට අභිමුඛයට යනුවහුට තුයි 'ගච්ඡතො අගතං දිසං' යනු වේ.

**යෙ භික්ඛු අභිසම්භවෙ** – 'යෙ' යනු: යම් පරිශ්‍රය කෙනකුන් මැඩපවත්වන්නේ නම්, අභිභවනය කරන්නේ නම්, වතුරුවන්නේ නම්' හාත්පසින් ගන්නේ නම්, මඩින්නේ නම් යි 'යෙ භික්ඛු අභිසම්භවෙ, යනු වේ.

**පන්තම්හි සයනාසනෙ** – අන්තයෙහි ප්‍රාන්තයෙහි පර්යන්තයෙහි පර්වතයන්ගේ අන්තයෙහි හෝ වනාන්තයෙහි හෝ නදීඅන්තයෙහි හෝ උදකාන්තයෙහි හෝ යම් තැනෙක නො සානු ලැබේ ද, නො වපුරනු ලැබේ ද, (එබඳු) වනාන්තය ඉක්මවා සිටි, මිනිසුන්ගේ හැසිරීම් රහිත වූ සෙනස්නෙහි තුයි 'පන්තම්හි සයනාසනෙ' යනු වේ.

එසින් වදාළහ ශාරීපුත්‍රස්ථවිරයන් වහන්සේ:

"**කති පරිස්සයා ලොකෙ** -පෙ- **පන්තම්හි සයනාසනෙ**"යි.

## 16 – 7

ආරබ්ධවීර්‍ය්‍ය ඇති ඒ මහණ හට කෙබඳු වචනයෝ වන්නාහු ද? මෙහි ඔහුට කෙබඳු ගොචරයෝ වන්නාහු ද? ඔහුට කීදෘශ වූ ශීලව්‍රත කෙනෙක් වන්නාහු ද?

**ක්‍යාස්ස ව්‍යප්පථයො අස්සු** – කෙබඳු වූ ලෙසසේ සිටි කවර ප්‍රකාර ඇති කවර ආකාර ඇති වචනයෙන් සමන්විත වූයේ වන්නේ දැ'යි වාක්පාරිශුද්ධිය විචාරයි. වාක්පාරිශුද්ධිය කවර යත්: මෙහි මහණ තෙමේ මෘෂාවාදය හැරපියා මුසවායෙන් වැළැකුණේ සැබෑ බස කියනුයේ සැබවින් සැබව ගලපනුයේ තිර වූයේ හැදැහිය යුතු බස් ඇතියේ ලොව නො රවටනුයේ වෙයි, පිසුනු බස් හැරපියා පිසුනු බසින් වැළැකුණේ වෙයි: මෙතැනින් අසා මුන් ලග් බිඳුමට අතැන නො කියනුයේ, අතැනින් හෝ අසා අරුන්ගේ බිඳුමට මුන්ට නො කියනුයේ වෙයි. මෙසේ භින්න වූවන් හෝ සමඟ කරනුයේ සමඟ වූවන් හෝ දැඩි කරනුයේ සමඟියෙහි ඇලුම් ඇතියේ සමඟ වූවන් කෙරෙහි ඇලුණේ සමඟ වූවනට සතුටු වූයේ සමඟ කරන බස් කියනුයේ වෙයි, රළුබස් හැරපියා රළුබසින් වැළැකුණේ වෙයි. යම් වචනයක් නිදෙස් නම් කනට සුව නම් පෙම් උපදවා නම් සිතට වදී නම්, පුරෙහි වූපා නම් බොහෝ දෙනාට කැමැති නම් බොහෝ දෙනාගේ මන වඩා නම් එබඳු වචන කියන්නේ වෙයි.

කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්මවාදී විනයවාදී නිධානවතිං වාචං භාසිතා හොති කාලෙන සාපදෙසං පරියන්තවතිං අත්ථසංහිතං. චතූහි වචීසුචරිතෙහි සමන්නාගතො චතුද්දොසාපගතං වාචං භාසති. බත්තිංසාය තිරච්ඡානකථාය ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරති. දස කථාවත්ථූනි කථෙති. සෙය්‍යථිදං: අප්පිච්ඡකථං සන්තුට්ඨිකථං පවිවෙකකථං අසංසග්ගකථං විරියාරම්භකථං සීලකථං සමාධිකථං පඤ්ඤාකථං විමුත්තිකථං විමුත්තිඤාණදස්සනකථං, සතිපට්ඨානකථං සම්මප්පධානකථං ඉද්ධිපාදකථං ඉන්ද්‍රියකථං බලකථං බොජ්ඣඞ්ගකථං මග්ගකථං ඵලකථං නිබ්බානකථං කථෙති. වාචාය යතො යත්තො පටියත්තො ගුත්තො ගොපිතො රක්ඛිතො සංවුතො. අයං වචීපාරිසුද්ධි. එදිසාය[1] වචීපාරිසුද්ධියා සමන්නාගතො අස්සාති - ත්‍යාස්ස බ්‍යප්පථයො අස්සු.

ත්‍යාස්සස්සු ඉධ ගොචරාති - කීදිසෙන ගොචරෙන සමන්නාගතො අස්ස, කිංසණ්ඨිතෙන කිංපකාරෙන කිංපටිභාගෙනාති ගොචරං පුච්ඡති. අත්ථි ගොචරො, අත්ථි අගොචරො:

කතමො අගොචරො ? ඉධෙකච්චො වෙසියගොචරො වා හොති, විධවාගොචරො වා හොති, ථුල්ලකුමාරිගොචරො වා හොති, පණ්ඩකගොචරො වා හොති, භික්ඛුනීගොචරො වා හොති, පානාගාරගොචරො වා හොති. සංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන. යානි වා පන තානි කුලානි අස්සද්ධානි අප්පසන්නානි අනොපානභූතානි අක්කොසකපරිභාසකානි අනත්ථකාමානි අහිතකාමානි අඵාසුකාමානි අයොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං, තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති. අයං වුච්චති අගොචරො.

අථවා අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො අසංවුතො ගච්ඡති: හත්ථිං ඔලොකෙන්තො අස්සං ඔලොකෙන්තො රථං ඔලොකෙන්තො පත්තිං ඔලොකෙන්තො ඉත්ථියො ඔලොකෙන්තො පුරිසෙ ඔලොකෙන්තො කුමාරිකායො ඔලොකෙන්තො කුමාරකෙ ඔලොකෙන්තො අන්තරාපණං ඔලොකෙන්තො ඝරමුඛානි ඔලොකෙන්තො උද්ධං ඔලොකෙන්තො[2] අධො ඔලොකෙන්තො දිසාවිදිසං පෙක්ඛමානො[3] ගච්ඡති. අයම්පි වුච්චති අගොචරො.[ක]

1. කීදිසාය - සිමු. II.
2. උල්ලොකෙන්තො - සිමු. II.
3. විපෙක්ඛමානො - සිමු. II
ක. ඣානවිභඞ්ග.

නිසරු (-ප්‍රලාප) බස් හැරපියා නිසරු බසින් වැළැකුණේ වෙයි. කල් බලා කියනුයේ සැබවක් ම කියනුයේ වැඩදායක තෙපුල් කියනුයේ ධර්මවාදී වූයේ විනයවාදී වූයේ සුදුසු කල කරුණු සහිත වූ පිරිසිඳුම් ඇති වැඩ සහිත වූ ලෙහි ලා දැරිය යුතු වූ තෙපුලක් මැ කියන්නේ වෙයි. චතුර්විධ වාක්සුචරිතයෙන් යුක්ත වූයේ සතර දෙසින් වෙන් වූ තෙපුලක් මැ කියයි. දෙතිස් තිරිසන් කථාවෙන් දුරු වූයේ වන්නේ යැ, වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විමර්යාදීකෘත සිතින් යුක්ත වැ වෙසෙයි. දශ කථාවස්තූන් කියයි. ඒ මෙසේ යැ: අල්පේච්ඡ කථාව කියයි, ඉතරේතරප්‍රත්‍යයසන්තෝෂ කථාව - විවේකනිඃශ්‍රිත කථාව - අසංසර්ගකථාව - වීර්‍ය්‍යාරම්භකථාව - ශීලකථාව - සමාධිකථාව - ප්‍රඥකථාව - විමුක්තිකථාව - විමුක්තිඥානදර්ශනකථාව - සතිපට්ඨානකථාව - සම්‍යක්ප්‍රධානකථාව - ඍද්ධිපාදකථාව - ඉන්ද්‍රියකථාව - බලකථාව - බොධ්‍යඞ්ගකථාව - මාර්ගකථාව - ඵලකථාව - නිර්වාණකථාව කියයි. වචනයෙන් සංයම වූයේ දමුණේ වෙසෙසින් දමුණේ ගොපනය වූයේ ගොපිත වූයේ රැකුණේ සංවර වූයේ වේ. මේ තොමෝ වචීපාරිශුද්ධිය යි. මෙබඳු වාක්පාරිශුද්ධියෙන් සමන්විත වූයේ වන්නේ නුයි 'ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු' යනු වේ.

ක්‍යාස්සස්සු ඉධ ගොචරා - කෙබඳු වූ කවර පැවැතුම් ඇති, කවර ප්‍රකාර වූ කවර ආකාර ඇති, ගොචරයෙන් සමන්විත වූයේ වන්නේදැ'යි ගොචරය විචාරයි. ගොචරයෙක් ඇත, අගොචරයෙක් ඇත.

අගොචරය කවරැ යත්: මෙහි එකෙක් වෙශ්‍යාවන් ගොචර (-යායුතු තැන්) කොට ඇත්තේ හෝ වේ ද, වැන්දඹුවන් ගොචර කොට ඇත්තේ හෝ වේ ද, මැහැලි කුමාරිකාවන් ගොචර කොට ඇත්තේ හෝ වේ ද, නපුංසකයන් ගොචර කොට ඇත්තේ හෝ වේ ද, මෙහෙණන් ගොචර කොට ඇත්තේ හෝ වේ ද, සුරාගෘහ ගොචර කොට ඇත්තේ හෝ වේද, රජුන් හා ද රජමහඇමැතියන් හා ද තීර්ථකයන් හා ද තීර්ථකශ්‍රාවකයන් හා ද අනනුලොමික වූ සංසර්ගයෙන් සංසෘෂ්ට වැ (-හැනී) වෙසේ ද, යළි යම් කුල කෙනෙක් (බුද්ධාදීන් කෙරෙහි) හැදැහිලි නැත්තාහු ද (එහෙයින් මැ) නො පහන් වූවාහු ද ඕපාන (-සතරමංසල කැණි ළිඳක්) මෙන් නො වූවාහු ද මහණුන්ට මෙහෙණන්ට උවසුවන්ට උවැසියන්ට ආක්‍රොශ හා පරිභව කරන්නාහු ද අනර්ථ කැමැති වෙත් ද අහිත කැමැති වෙත් ද නො සුව කැමැති වෙත් ද අයොගක්ෂෙමය (භය) කැමැත්තාහු වෙත් ද, එබඳු වූ කුලයන් සෙවනය කෙරේ ද එළැඹේ ද නැවත නැවත එළැඹේ ද, මේ 'ආගොචරය' යි කියනු ලැබේ.

නොනොග් ඇතුළුගමට පිවිසියේ වීදියට පිළිපන්නේ අසංවර වැ යේ ද, ඇතුන් බලමින් අසුන් බලමින් රිය බලමින් පාබලසෙන් බලමින් ගැහැනුන් බලමින් පිරිමින් බලමින් කුමරියන් බලමින් කුමරුන් බලමින් ඇතුළුසල්පිල් බලමින් ගෙදෙර බලමින් උඩ බලමින් යට බලමින් දසානුදස බලමින් යේ ද, මෙ ද 'අගොචර' යයි කියනු ලැබේ.

අථ වා චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං -පෙ- මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං; තස්ස අසංවරාය පටිපජ්ජති. න රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ අසංවරං ආපජ්ජති. අයම්පි වුච්චති අගොචරො.

යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛානං පාණිස්සරං වෙතාළං කුම්භථූනං සොභනගරං[1] චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිංසයුද්ධං උසභයුද්ධං ගොයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අනීකදස්සනං ඉති වා. ඉති එවරූපං විසූකදස්සනං අනුයුත්තො හොති. අයම්පි වුච්චති අගොචරො. පඤ්චපි කාමගුණා අගොචරො.

වුත්තං හෙතං භගවතා:

"මා භික්ඛවෙ අගොචරෙ චරථ පරවිසයෙ. අගොචරෙ භික්ඛවෙ චරතං පරවිසයෙ ලච්ඡති මාරො ඔතාරං, ලච්ඡති මාරො ආරම්මණං. කො ච භික්ඛවෙ භික්ඛුනො අගොචරො පරවිසයො? යදිදං පඤ්ච කාමගුණා. කතමෙ පඤ්ච? චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා; සොතවිඤ්ඤෙය්‍යා සද්දා - ඝානවිඤ්ඤෙය්‍යා ගන්ධා- ජිව්හාවිඤ්ඤෙය්‍යා රසා - කායවිඤ්ඤෙය්‍යා ඵොට්ඨබ්බා ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූපසංහිතා රජනීයා. අයං වුච්චති භික්ඛවෙ භික්ඛුනො අගොචරො පරවිසයො".[a] අයම්පි වුච්චති අගොචරො.

කතමො ගොචරො? "ඉධෙකච්චො[2] න වෙසියගොචරො හොති, න විධවාගොචරො හොති, න ථුල්ලකුමාරිගොචරො හොති, න පණ්ඩකගොචරො හොති, න භික්ඛුනීගොචරො හොති, න පානාගාරගොචරො හොති, අසංසට්ඨො විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථියසාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන, යානි වා පන තානි කුලානි සද්ධානි පසන්නානි ඔපානභූතානි කාසාවපජ්ජොතානි ඉසිවාතපටිවාතානි අත්ථකාමානි හිතකාමානි ඵාසුකාමානි යොගක්ඛෙමකාමානි භික්ඛූනං භික්ඛුනීනං උපාසකානං උපාසිකානං, තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති."[b] අයම්පි වුච්චති ගොචරො

1. සොභනකරණං - සීමු II. සොභනකං - සීමු II. සොභනගරකං - PTS.
2. ඉධ භික්ඛු - සීමු. II.
a. සතිපට්ඨානසංයුත්ත - අම්බපාලිවග්ග. b ඣානවිභඞ්ග.

නොහොත් ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් ගන්නා සුලු වූයේ (හස්පාදාදී) අනුව්‍යඤ්ජන වශයෙන් ගන්නාසුලු වූයේ වෙයි. යම් හෙයකින් මොහු...මනෙන්ද්‍රියය අසංවෘත වැ වාසය කරන්නහු අභිධ්‍යා - දෞර්මනස්‍ය-සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ ලුහුබඳනාහු ද, ඒ මනෙන්ද්‍රියයාගේ අසංවරයට පිළිපදී ද, මනෙන්ද්‍රියය නො රකී ද, මනෙන්ද්‍රියයෙහි අසංවරයට පැමිණේ ද, මෙ ද 'අගොචරය'යි කියනු ලැබේ.

තවද යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් කම්පල හැදහා දුන් බොජුන් වළඳා ඔහු මෙබඳු වූ විසූළ දැකීමෙහි යෙදී වෙසෙති; ඒ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම් නළුමුළු භාරතරාමායණාදිය කියන තැන කස්තාලම් කුළුතාලම් (හෝ මන්ත්‍රයෙන් මළ සිරුර නැඟුටුවීම) කල පිඹීම ප්‍රතිභානචිත්‍රය සැඬලුන්ගේ සණදෙවුන් කෙළි වස්කුලල් ඇවදෙවීම ඇත්පොර අස්පොර මියුපොර වැහැප්පොර ගවපොර බැටළුපොර එළුපොර කුකුළුපොර වටුපොර දඬුපොර මිටුපොර මල්ලපොර යුද්පෙරමුණ බලසෙන් ගණන තැන කඳවුර බලඇණි දැකීම යනු හෝ යැ. මෙසේ මෙබඳු විසූළ දැකීමෙහි යෙදුණේ වෙයි. මෙ ද 'අගොචර'යයි කියනු ලැබේ. පස්කම් ගුණයෝ ද අගොචරයෝ යැ.

තෙල වදාරන ලද මැය බුදුන් විසින්:

''මහණෙනි, අගොචරයෙහි (-නො හැසිරියැ යුතු තැන) සතුරන් විෂයෙහි නනමක් හැසිරෙවු. මහණෙනි, අගොචරයෙහි පරවිෂයෙහි හැසිරෙනුවන්ට (කෙලශ) මාර තෙමේ අවකාශ (සිදුරු) ලබන්නේ යැ. මාර තෙමෙ අරමුණු ලබන්නේ ය. මහණෙනි, මහණහට අගොචරය පරවිෂය කවරේ ද? යම් පස්කම්ගුණ කෙනෙක් වෙත් ද, (ඔහු යැ.) කවර පසෙක් ද යත්: ඉෂ්ට වූ කමනීය වූ මනවඩන්නාවූ ප්‍රියස්වභාව ඇති කාමය හා යෙදුණු රාගොත්පත්තියට කාරණ වූ චක්ෂුර්විඥානයෙන් දක්කයුතු රූපයෝ යැ, ශ්‍රොත්‍රවිඥානයෙන් ඇසියයුතු ශබ්දයෝ යැ- ඝ්‍රාණවිඥානයෙන් ඇගි යැ යුතු ගන්ධයෝ යැ - ජිහ්වාවිඥානයෙන් වින්දයුතු රසයෝ යැ - කායවිඥානයෙන් ස්පර්ශ කළ යුතු ඉෂ්ට වූ කාන්ත වූ මනාප වූ ප්‍රියස්වභාව ඇති කාමූපසංහිත වූ රජනීය වූ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි. මහණෙනි, මේ මහණහට 'අගොචර යැ පරවිෂය'යි කියනු ලැබේ. මෙ ද 'අගොචර'යයි කියනු ලැබේ.

ගොචරය කවරැ යත්: මෙ සස්නෙහි මහණ තෙමෙ වේශ්‍යාවන් ගොචර (=යායුතු තැන්) කොට නැත්තේ වේ ද, වැන්දඹුවන් ගොචර කොට නැත්තේ වේ ද, මැහැලි කුමාරිකාවන් ගොචර කොට නැත්තේ වේ ද, නපුංසකයන් ගොචර කොට නැත්තේ වේ ද, භික්ෂුණීන් ගොචර කොට නැත්තේ වේ ද, සුරාගාරය ගොචර කොට නැත්තේ වේ ද, රජුන් හා රජමහමැතියන් හා තීර්ථකයන් හා තීර්ථකශ්‍රාවකයන් හා අනනුලොමික වූ සංසර්ගියෙන් අසංසෘෂ්ට වැ වෙසේ ද, යළි යම් ඒ කුල කෙනෙක් (බුද්ධාදීන් කෙරෙහි) හැදැහිලි ඇත්තාහු ද ප්‍රසන්න වූවාහු ද (සතර මංසල කැණි) ළිඳක් වැනි වෙත් ද, (මහණ මෙහෙණන් හන් පෙරැවි) කහවත්හි ප්‍රභායෙන් එකාලොක වේද්ද, ගෙට වදනා නික්මෙන මහණ මෙහෙණ සඞ්ඛ්‍යාත ඍෂීන්ගේ චීවරවාතයෙන් පරිවාත වේද්ද, මහණ මෙහෙණ උවසු උවැසියනට වැඩ කැමැත්තාහු හිත කැමැත්තාහු සුව කැමැත්තාහු නිර්භය කැමැත්තාහු වේද්ද, එබඳු කුලයන් සෙවනා භජනා පයිරුපාසනා කෙරේ ද මෙ ද 'ගොචර' යයි කියනු ලැබේ.

අථ වා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො සංවුතො ගච්ඡති: න හත්ථිං ඔලොකෙන්තො න අස්සං ඔලොකෙන්තො න රථං ඔලොකෙන්තො න පත්තිං ඔලොකෙන්තො -පෙ- න දිසාවිදිසං විපෙක්ඛමානො ගච්ඡති, අයම්පි වුච්චති ගොචරො. අථවා භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති -පෙ- මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති; අයම්පි වුච්චති ගොචරො. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං? නච්චං ගීතං වාදිතං -පෙ- අනීකදස්සනං ඉති වා; ඉති එවරූපා විසූකදස්සනා පටිවිරතො හොති. අයම්පි වුච්චති ගොචරො. චත්තාරොපි සතිපට්ඨානා ගොචරො.

වුත්තං හෙතං භගවතා:

“ගොචරෙ භික්ඛවෙ චරථ සකෙ පෙත්තිකෙ විසයෙ. ගොචරෙ භික්ඛවෙ චරතං සකෙ පෙත්තිකෙ විසයෙ න ලච්ඡති මාරො ඔතාරං, න ලච්ඡති මාරො ආරම්මණං. කො ච භික්ඛවෙ භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො: යදිදං චත්තාරො සතිපට්ඨානං. කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ භික්ඛු කායෙ කායානුපස්සී විහරති, වෙදනාසු -පෙ- චිත්තෙ - ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදොමනස්සං. අයං වුච්චති භික්ඛවෙ භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො.[ක] අයම්පි වුච්චති ගොචරො. එදිසෙන ගොචරෙන සමන්නාගතො අස්සාති - ක්‍යාස්සස්සු ඉධ ගොචරා.

කානි සීලබ්බතානස්සූති - කිදිසෙන සීලබ්බතෙන සමන්නාගතො අස්ස, කිංසණ්ඨිතෙන කිංපකාරෙන කිංපටිභාගෙනාති සීලබ්බතපාරිසුද්ධිං පුච්ඡති; කතමා සීලබ්බතපාරිසුද්ධි: අත්ථි සීලඤ්චෙව වතඤ්ච, අත්ථි වතං න සීලං. කතමං සීලඤ්චෙව වතඤ්ච: ඉධ භික්ඛු සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. යො තත්ථ සඤ්ඤමො සංවරො අවීතික්කමො ඉදං සීලං. යං සමාදානං, තං වතං. සංවරට්ඨෙන සීලං, සමාදානට්ඨෙන වතං, ඉදං වුච්චති සීලඤ්චෙව වතඤ්ච. කතමං වතං න සීලං: අට්ඨ ධුතඞ්ගානි: ආරඤ්ඤිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පංසුකූලිකඞ්ගං තෙචීවරිකඞ්ගං සපදානචාරිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං යථාසන්ථතිකඞ්ගං. ඉදං වුච්චති වතං, න සීලං. විරියසමාදානම්පි වුච්චති වතං, න සීලං. ‘කාමං තචො ච න්හාරු ච අට්ඨි ච අවසිස්සතු, උපසුස්සතු සරීරෙ මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිසබලෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං, න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතී'ති චිත්තං පග්ගණ්හාති පදහති. එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං, න සීලං.

---

ක. සතිපට්ඨානසංයුත්ත - අම්බපාලිවග්ග.

නොහොත් මහණ තෙමේ ඇතුළුගමට පිවිසියේ වීදියට පිළිපන්නේ සංවර වූයේ ද: ඇතුත් නො බලමින්, අසුත් නො බලමින්, පාබලසෙන් නො බලමින්...දසනුදස නො බලමින් යේ ද; මේ ද 'ගොචර'යයි කියනු ලැබේ. නොහොත් මහණ තෙමේ ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් නො ගන්නේ වේ ද...මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ ද; මේ ද 'ගොචර'යයි කියනු ලැබේ. තව්ද යම්සේ ඇතැම් භවත් මහණ බමුණු කෙනෙක් සැදැහැයෙන් දුන් බොජුන් වළඳා ඔහු මෙබඳු වූ විසුළු දස්නෙහි යෙදී වාසය කෙරෙද්ද, එ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම්...බලඇණි දැකීම ආදිය හෝ යැ; මෙසේ මෙබඳු වූ විසුළු දස්නෙන් වැළැකුණේ වේ ද; මේ ද 'ගොචර'යයි කියනු ලැබේ. සතර සිව්වන්හු ද 'ගොචරයැ'.

තෙල වදාරන ලද මැය, භාග්‍යවත්හු විසින්:

"මහණෙනි, ගොචර (=හැසිරීමට යුක්තස්ථාන වූ ස්වකීය පෛතෘක (-පියාගෙන් පැමිණි) විෂයෙහි හැසිරෙව්, මහණෙනි, ගොචර වූ තමා සතු පියාගෙන් පැමිණි විෂයෙහි හැසිරෙනුවන්ට මාර තෙමේ සිදුරු නො ලබන්නේ යැ, මාර තෙමේ අරමුණු නො ලබන්නේ යැ. මහණෙනි, ගොචර වූ ස්වකීය පෛතෘකවිෂය කවරේ යත්: යම් මේ සතර සිව්වන් කෙනෙක් වෙත් ද, කවර සතරෙක් ද යත්: මහණෙනි, මේ සස්නෙහි මහණ තෙමේ රූපකයෙහි කය නැවත නැවත බලමින් වෙසෙයි, වේදනාවන්හි... චිත්තයෙහි... ස්කන්ධාදි ධර්මයන්හි ධර්මයන් නැවත නැවත බලමින් කෙලෙස් තවන වීර්‍ය ඇති වැ සම්‍යක්ප්‍රඥා ඇති වැ සමෘතිමත් වූයේ ස්කන්ධාදි ලොකයෙහි අභිධ්‍යාව හා දෞර්මනස්‍ය දුරු කොට වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණහට ගොචර වූ තමා සතු වූ පියා කෙරෙන් පැමිණි විෂය යයි කියනු ලැබේ. මේ ද ගොචරය යි කියනු ලැබේ. මෙබඳු වූ ගොචරයෙන් සමන්විත වූයේ වන්නේ නුයි 'ක්‍යාස්සස්සු ඉධ ගොචරා' යනු වේ.

**ක්‍යානි සීලබ්බතානස්සු** - කෙබඳු වූ කවර පැවැතුම් ඇති කවර ප්‍රකාර වූ කවර ආකාර ඇති ශීලව්‍රතයෙකින් යුක්ත වූයේ වන්නේ දැ'යි ශීලව්‍රත-පාරිශුද්ධිය විචාරයි. ශීලව්‍රතපාරිශුද්ධිය කවරැ යත්: ශීලය මැ වූ ව්‍රතයකුත් ඇත, ශීල නො වූ ව්‍රතයකුත් ඇත; ශීලය මැ වූ ව්‍රතය කවරැ යත්: මේ සස්නෙහි මහණ තෙමේ සිල්වත් වේ ද, ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවර වූයේ ආචාරයෙන් හා ගොචරයෙන් සමන්විත වූයේ මඳ පමණ දොසෙහි දු බිය දක්නාසුලු වූයේ වාසය කෙරේ ද, ශික්ෂාකොට්ඨාසයන්හි සමාදන් වැ හික්මේ ද, එහි යම් සංයමයෙක් සංවරයෙක් නො ඉක්මැවීමෙක් වේ නම්, මේ ශීල යැ; යම් සමාදානයෙක් වී නම්, එය ව්‍රත යැ. සංවරාර්ථයෙන් ශීල යැ, සමාදානාර්ථයෙන් ව්‍රත යි. මේ ශීලය ද ව්‍රතය දැ'යි කියනු ලැබේ. ශීල නො වූ ව්‍රතය කවරැ යත්: අෂ්ට ධූතාඞ්ගයෝ යැ: ආරණ්‍යකාඞ්ග යැ පිණ්ඩපාතිකාඞ්ග යැ පංසුකූලිකාඞ්ග යැ තෙචීවරිකාඞ්ග යැ සපදානචාරිකාඞ්ග යැ ඛලුපච්ඡාභත්තිකාඞ්ග යැ නෙසජ්ජිකාඞ්ග යැ යථාසන්ථතිකාඞ්ගය යි. මේ ශීල නො වූ ව්‍රත යැයි කියනු ලැබේ. වීර්‍යසමාදානයත් ශීල නො වූ ව්‍රත යැයි කියනු ලැබේ: 'එකාන්තයෙන් සම ත් නහරත් ඇටත් ඉතිරි-වන්නේ නමුදු සිරුරෙහි මස් ලේ වියැලෙන්නේ නමුදු පුරුෂශක්තියෙන් පුරුෂබලයෙන් පුරුෂවීර්‍යයෙන් පුරුෂපරාක්‍රමයෙන් පැමිණියැ යුතු ඒ උත්තමාර්ථයට නො පැමිණැ වීර්‍යයා ගේ ලිහිල්බවෙක් නො වන්නේ යැ'යි සිත උත්සාහ ගන්වයි, පිහිටුවයි; මෙබඳු වූ වීර්‍යසමාදානය ද ශීල නො වූ ව්‍රතය'යි කියනු ලැබේ.

1. "නාසිස්සං න පිවිස්සාමි විහාරතො න නික්ඛමෙ[1]
නපි පස්සං නිපාතෙස්සං තණ්හාසල්ලෙ අනූහතෙ"ති[a]

චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. 'න තාවාහං ඉමං පල්ලඞ්කං භින්දිස්සාමි යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී'ති චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. 'න තාවාහං ඉමම්හා ආසනා වුට්ඨහිස්සාමි, න තාවාහං ඉමම්හා චඞ්කමා ඔරොහිස්සාමි, විහාරා නික්ඛමිස්සාමි අඩ්ඪයොගා නික්ඛමිස්සාමි, පාසාදා නික්ඛමිස්සාමි, හම්මියා - ගුහාය - ලෙණා - කුටියා -කූටාගාරා - අට්ටා - මාළා -උද්දණ්ඩා - උපට්ඨානසාලාය - මණ්ඩපා - රුක්ඛමූලා නික්ඛමිස්සාමි, යාව මෙ න අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිස්සතී'ති චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. 'ඉමස්මිංයෙව පුබ්බණ්හසමයං අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි ඵස්සයිස්සාමි සච්ඡිකරිස්සාමී'ති චිත්තං පග්ගණ්හාති පදහති, එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං. ඉමස්මිංයෙව මජ්ඣන්හිකසමයං - සායන්හසමයං - පුරෙභත්තං - පච්ඡාභත්තං - පුරිමයාමං - පච්ඡිමයාමං - කාළෙ -- ජුණ්හෙ - වස්සෙ - හෙමන්තෙ - ගිම්හෙ - පුරිමෙ වයොඛන්ධෙ - මජ්ඣිමෙ වයොඛන්ධෙ - පච්ඡිමෙ වයොඛන්ධෙ අරියධම්මං ආහරිස්සාමි සමාහරිස්සාමි අධිගච්ඡිස්සාමි සච්ඡිකරිස්සාමි ඵස්සයිස්සාමීති චිත්තං පග්ගණ්හාති පදහති; එවරූපම්පි විරියසමාදානං වුච්චති වතං න සීලං.

අයං සීලබ්බතපාරිසුද්ධි; එදිසාය[2] සීලබ්බතපාරිසුද්ධියා සමන්නාගතො අස්සාති - කානි සීලබ්බතානස්සු.

**පහිතත්තස්ස භික්ඛුනොති** -'පහිතත්තස්සා'ති ආරද්ධවිරියස්ස; ථාමවතො[3] දළ්හපරක්කමස්ස අනික්ඛිත්තඡන්දස්ස අනික්ඛිත්තධුරස්ස කුසලෙසු ධම්මෙසු; අථවා පෙසිතත්තස්ස, යස්සත්ථාය පෙසිතො අත්තනො අත්ථෙ ච ඤායෙ ච ලක්ඛණෙ ච කාරණෙ ච ඨානාඨානෙ ච සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති පෙසිතත්තස්ස; සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති පෙසිතත්තස්ස; සබ්බෙ ධම්මා අනත්තාති පෙසිතත්තස්ස; අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති පෙසිතත්තස්ස; -පෙ- ජාතිපච්චයා ජරාමරණන්ති පෙසිතත්තස්ස; අවිජ්ජානිරොධා සඞ්ඛාරනිරොධොති පෙසිතත්තස්ස -පෙ- ජාතිනිරොධා ජරාමරණනිරොධොති පෙසිතත්තස්ස; ඉදං දුක්ඛන්ති පෙසිතත්තස්ස -පෙ- අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති පෙසිතත්තස්ස; ඉමෙ ආසවාති පෙසිතත්තස්ස -පෙ- අයං ආසවනිරොධගාමිනී පටිපදාති පෙසිතත්තස්ස; ඉමෙ ධම්මා අභිඤ්ඤෙය්‍යාති පෙසිතත්තස්ස -පෙ- ඉමෙ ධම්මා සච්ඡිකාතබ්බාති පෙසිතත්තස්ස; ඡන්නං ඵස්සායතනානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච පෙසිතත්තස්ස;

---

1. නික්ඛමිං - ස්‍යා. PTS. a. පච්චයත්ථෙරගාථා - 3. 1. 2 මුදිතත්ථෙරගාථා - 4. 1. 12
2. ඊදිසාය - සීමු. I මජසං. 3. ථාමගත - සීමු. II.

1. "තෘෂ්ණාශල්‍යය උපුටා නො ලූ කල්හි (මේ ඛාද්‍යාදිය) නො කමි, (යාගු ආදිය) නො බොමි, වෙහෙරින් නො නික්මෙමි, (ඇඳපුටු ආදියෙහි) ඇලය නො තබමි".

සිත උත්සාහ ගන්වයි, පිහිටුවයි. මෙබඳු වීර්‍යසමාදානය ද 'ශීල නො වූ ව්‍රතය'යි කියනු ලැබේ. 'යම් තාක් මාගේ සිත උපාදාන රහිත ව (කාමාදි) ආස්‍රවයන් කෙරෙන් සමුච්ඡෙදවිමුක්තියෙන් නො මිදේ නම්, ඒ තාක් මේ පලග නො බිඳින්නෙමි' සිත දැඩි ව ගනී ද, පිහිටුවා ද; මෙබඳු වීර්‍යසමාදානයත් ශීල නො වූ ව්‍රතයයි කියනු ලැබේ. (සිත කෙලෙසුන් කෙරෙන් මිදෙන) තාක් මම මේ ආසනයෙන් නො නැඟීසිටින්නෙමි, 'ඒ තාක් මම මේ සක්මනින් නො බස්නෙමි – විහාරයෙන් නො නික්මෙමි – අඩ්ඩයොග (ගුරුළුවක් ගෙයින්) නො නික්මෙමි – පහයෙන් නො නික්මෙමි – සඳලුතලයින්-ගුහායෙන් – උදුණ්ඩයෙන් – උවටැන්හලින් – මණ්ඩපයෙන් – යම්තාක් මාගේ සිත උපාදාන රහිත ව ආස්‍රවයන් කෙරෙන් නො මිදෙන්නේ නම්, ඒතාක් මේ රුක්මුලින් නො නික්මෙමි' සිතට වැරගන්වා නම් සිත පිහිටුවා නම්, මෙබඳු වීර්‍යසමාදානයත් ශීල නො වූ ව්‍රතයැ'යි කියනු ලැබේ. 'මේ පෙරවරුයෙහි මැ ආර්‍යධර්මය (මාගේ සිතට) එළවමි, මොනවට එළවමි, අධිගමය කෙරෙමි, ස්පර්ශ කෙරෙමි, ප්‍රත්‍යක්ෂ කෙරෙමි'යි සිතට වැර ගන්වා ද, පිහිටුවා ද, මෙබඳු වීර්‍යසමාදානය ත් ශීල නො වූ ව්‍රතය'යි කියනු ලැබේ. මේ මැදිදහවල්හි මැ – පස්වරුයෙහි – පෙරබත්හි – පසුබත්හි – පෙරයමැ – මැදියමැ – අලුයමැ – අවපසැ – පුරපසැ – වැසිකලැ – හිමත්කලැ – ගිම්කලැ – ප්‍රථමවයස්හි – මධ්‍යමවයස්හි – පශ්චිමවයස්හි ආර්‍යධර්මය එළවමි, මොනොවට එළවමි, අධිගමය කෙරෙමි, ස්පර්ශ කෙරෙමි, ප්‍රත්‍යක්ෂ කරන්නෙමි' සිත දැඩිව ගනී ද, පිහිටුවා ද, මෙබඳු වීර්‍යසමාදානයත් 'ශීල නො වූ ව්‍රතය'යි කියනු ලැබේ.

මෝ තොමෝ ශීලව්‍රතපාරිශුද්ධිය යි. මෙබඳු වූ ශීලව්‍රතපාරිශුද්ධියෙන් සමන්විත වූයේ වන්නේ නුයි 'සාති සීලබ්බතාන'ස්සු' යනු වේ.

**පහිතත්තස්ස භික්ඛුනො** – 'පහිතත්තස්ස' යනු: රුකුළු වැර ඇත්තහුට කුසල්දහම්හි ශක්ති ඇත්තහුට දැඩි පරාක්‍රම ඇත්තහුට තැබූ වීර්‍යච්ඡන්ද ඇත්තහුට නො තැබූ වීර්‍යධුර ඇත්තහුට; නොහොත් මෙහෙයූ සිත් ඇත්තහුට, යම් රහත් බවක් සඳහා ආත්මභාවය පරිත්‍යාග කරන ලද ද, අභීත් ඵල සඞ්ඛ්‍යාත ආත්මාර්ථයෙහි ද න්‍යාය (ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග) යෙහි ද අනිත්‍යාදි ලක්ෂණප්‍රතිවේධයෙහි ද හෙතුයෙහි ද ස්ථානාස්ථානයෙහි ද (–කාරණයෙහි ද අකාරණයෙහි ද;) 'සියලු සංස්කාරයෝ අනිත්‍ය වූහ'යි මෙහෙයූ සිත් ඇත්තහුට, 'සියලු සංස්කාරයෝ දුක් වූහ'යි මෙහෙයූ සිත් ඇත්තහුට, 'සියලු ධර්මයෝ අනාත්ම වූහ'යි මෙහෙයූ සිත් ඇත්තහුට, 'අවිද්‍යාප්‍රත්‍යයෙන් සංස්කාරයෝ වෙති' මෙහෙයූ සිත් ඇත්තහුට,...'ජාතිප්‍රත්‍යයෙන් ජරමරණය වේ' යයි මෙහෙයූ සිත් ඇත්තහුට; අවිද්‍යාවගේ නිරොධයෙන් සංස්කාරනිරොධය වේ යයි මෙහෙයූ සිතැත්තහුට,...ජාතිනිරොධයෙන් ජරමරණනිරොධය වේ යයි මෙහෙයූ සිතැත්තහුට; 'මේ දුඃඛසත්‍ය යැ'යි මෙහෙයූ සිතැත්තහුට,...'මෝ දුඃඛනිරොධගාමිනී ප්‍රතිපත්තිය'යි මෙහෙයූ සිතැත්තහුට; 'මොහු ආස්‍රවයෝ ය'යි මෙහෙයූ සිතැත්තහුට; ..'මෝ ආස්‍රවනිරොධගාමිනී ප්‍රතිපත්තිය යි මෙහෙයූ සිතැත්තහුට, 'මේ ධර්මයෝ දතයුත්තාහ'යි මෙහෙයූ සිතැත්තහුට...'මේ ධර්මයෝ ප්‍රත්‍යක්ෂ කළයුත්තාහ'යි මෙහෙයූ සිතැත්තහුට; සවැදෑරුම් ස්පර්ශායතනයන්ගේ පහළවීමට ද නැසීමට ද ආස්වාදයට ද ආදීනවයට ද නිස්සරණයට ද මෙහෙයූ සිතැත්තහුට,

පඤ්චන්නං උපාදානක්ඛන්ධානං - චතුන්නං මහාභූතානං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච පෙසිතත්තස්ස; යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති පෙසිතත්තස්ස. භික්ඛුනොති පුථුජ්ජනකල්‍යාණකස්ස වා භික්ඛුනො සෙඛස්ස වා භික්ඛුනොති-පහිතත්තස්ස භික්ඛුනො.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

"ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු ක්‍යාස්සස්සු ඉධ ගොචරා,
කානි සීලබ්බතානාස්සු පහිතත්තස්ස භික්ඛුනො"ති.

16 - 8

කං සො සික්ඛං සමාදාය එකොදි[1] නිපකො සතො,
කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො.

**කං සො සික්ඛං සමාදායාති** - කං සො සික්ඛං ආදාය සමාදාය ආදියිත්වා සමාදියිත්වා ගණ්හිත්වා පරාමසිත්වා අභිනිවිසිත්වාති - කං සො සික්ඛං සමාදාය.

**එකොදි[1] නිපකො සතොති** - 'එකොදී'ති එකග්ගචිත්තො අවික්ඛිත්තචිත්තො අවිසාහටමානසො, සමථො සමාධින්ද්‍රියං සමාධිබලං -පෙ- සම්මාසමාධි; **නිපකොති** නිපකො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී; **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; වෙදනාසු - චිත්තෙ - ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො; සො වුච්චති සතොති - සතො.

**කං සො සික්ඛං සමාදායාති** - අධිසීලසික්ඛං පුච්ඡති. **නිපකොති** අධිපඤ්ඤාසික්ඛං පුච්ඡති. **සතොති** පාරිසුද්ධිං පුච්ඡතීති - කං සො සික්ඛං සමාදාය එකොදි නිපකො සතො.

**කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනොති** - 'කම්මාරො' වුච්චති සුවණ්ණකාරො; 'රජතං' වුච්චති ජාතරූපං. යථා සුවණ්ණකාරො ජාතරූපස්ස ඔළාරිකම්පි මලං ධමති සන්ධමති නිද්ධමති; මජ්ඣිමකම්පි මලං ධමති සන්ධමති නිද්ධමති; සුඛුමකම්පි මලං ධමති සන්ධමති නිද්ධමති; එවමෙවං භික්ඛු අත්තනො ඔළාරිකෙපි කිලෙසෙ ධමති සන්ධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති.

1. එකොදි - සිමු. II.

පඤ්චුපාදානක්ඛන්ධයන්ගේ - සතර මහාභූතයන්ගේ සමුදයට ද අස්තඞ්ගමයට ද ආස්වාදයට ද ආදීනවයට ද නිස්සරණයට ද මෙසේහු සිතැත්තහුට, 'යම් කිසිවක් සමුදයධර්ම නම්, ඒ සියල්ල නැසෙන පියවි ඇතැ'යි මෙසේහු සිතැත්තහුට. **භික්ඛුනො** යනු: පෘථග්ජනකල්‍යාණක භික්ෂුහුගේ හෝ, ශෛක්ෂභික්ෂුහුගේ හෝ නුයි 'පහිතත්තස්ස භික්ඛුනො' යනු වේ.

එයින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

**"ක්‍යාස්ස බ්‍යප්පථයො අස්සු -පෙ- පහිතත්තස්ස භික්ඛුනො"**යි.

## 16 - 8

ඒ මහණ තෙමේ එකඟ වූ සිත් ඇතියේ (පාරිහාරියප්‍රඥාවෙන්) ප්‍රඥාවත් වූයේ සමෘතිමත් වූයේ කවර ශික්ෂාවක් සමාදන් වැ, කඹුරු තෙමෙ ජාතරූපයාගේ මලය මෙන් තමාගේ කෙලෙස් මලය පිඹැ හරනේ ද?

**කං සො සික්ඛං සමාදාය** - ඒ මහණ තෙමෙ කවර ශික්ෂාවක් ගෙන සමාදන් වැ ආදානය කොට සමාදානය කොට ග්‍රහණය කොට පරාමර්ශ කොට අභිනිවෙශ කොට නුයි 'කං සො සික්ඛං සමාදාය' යනු වේ.

**එකොදි නිපකො සතො** - 'එකොදි'යනු: එකඟ වූ සිත් ඇතියේ නො විසුරුණු සිත් ඇතියේ උඩඟු නො වූ සිත් ඇතියේ, ශමථය සමාධීන්ද්‍රිය සමාධිබලය...සම්‍යක්සමාධිය ඇතියේ; **නිපකො** යනු: නිපක වූයේ පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැතියේ තීරණප්‍රඥා ඇතියේ ධාරණප්‍රඥා ඇතියේ; **සතො** යනු: සතර කරුණෙකින් සිහි ඇතියේ රූපකායයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ, වෙදනාවන්හි - චිත්තයෙහි - පඤ්චස්කන්ධාදි ධර්මයන්හි ධම්මානුපස්සනාසතිපට්ඨානය වඩමින් සමෘතිමත් වූයේ; හෙ තෙමේ සිහි ඇතියේ යයි කියනු ලැබේ නුයි 'සතො'යනු වේ.

**කං සො සික්ඛං සමාදාය** යි - අධිශීලශික්ෂාව විචාරයි. **නිපකො**යි අධිප්‍රඥාශික්ෂාව විචාරයි, **සතො**යි පාරිශුද්ධිය විචාරා නුයි 'කං සො සික්ඛං සමාදාය එකොදි නිපකො සතො' යනු වේ.

**කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො** - රන්කරු තෙමෙ 'කම්මාර'යි කියනු ලැබෙයි. ජාතරූපය 'රජත'යි කියනු ලැබේ. යම්සේ රන්කරුවෙක් ජාතරූපයාගේ ඖදාරික වූ මලය බැහැර කෙරේ ද, මැනැවින් බැහැර කෙරේ ද, නිරවශෙෂයෙන් බැහැර කෙරේ ද; මධ්‍යම වූ මලයත් ධමනය සන්ධමනය නිද්ධමනය කෙරේ ද, සියුම් වූ මලයත් බැහැර කෙරේ ද, මැනැවින් බැහැර කෙරේ ද, නිරවශෙෂයෙන් බැහැර කෙරේ ද, එසෙයින් ම මහණ තෙමෙ තමාගේ ඖදාරික වූ කෙලශයන් ද බැහැර කෙරෙයි, මැනැවින් බැහැර කෙරෙයි, නිරවශෙෂයෙන් බැහැර කෙරෙයි; දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනුඅභාවයට පමුණුවයි.

මජ්ඣිමකෙපි කිලෙසෙ - සුඛුමකෙපි කිලෙසෙ ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. අථ වා භික්ඛු අත්තනො රාගමලං දොසමලං මොහමලං මානමලං දිට්ඨිමලං කිලෙසමලං දුච්චරිතමලං අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධිකං විඝාතපක්ඛිකං අනිබ්බානසංවත්තනිකං ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති; අථ වා සම්මාදිට්ඨියා මිච්ඡාදිට්ඨිං ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති; සම්මාසඞ්කප්පෙන මිච්ඡාසඞ්කප්පං - සම්මාවාචාය මිච්ඡාවාචං - සම්මාකම්මන්තෙන මිච්ඡාකම්මන්තං - සම්මාආජීවෙන මිච්ඡාආජීවං - සම්මාවායාමෙන මිච්ඡාවායාමං - සම්මාසතියා මිච්ඡාසතිං - සම්මාසමාධිනා මිච්ඡාසමාධිං-සම්මාඤාණෙන මිච්ඡාඤාණං - සම්මාවිමුත්තියා මිච්ඡාවිමුත්තිං ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙති. අථවා අරියෙන අට්ඨඞ්ගිකෙන මග්ගෙන සබ්බෙ කිලෙසෙ සබ්බෙ දුච්චරිතෙ සබ්බෙ දරථෙ සබ්බෙ පරිළාහෙ සබ්බෙ සන්තාපෙ සබ්බාකුසලාභිසඞ්ඛාරෙ ධමති සංධමති නිද්ධමති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති - කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො.

තෙනාහ ථෙරො සාරිපුත්තො:

> "කං සො සික්ඛං සමාදාය එකොදි නිපකො සතො,
> කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො"ති.

**16 - 9**

> විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු
> (සාරිපුත්තාති භගවා)
> රිත්තාසනං සයනං සෙවතො චෙ,
> සම්බොධිකාමස්ස යථානුධම්මං
> තං තෙ පවක්ඛාමි යථා පජානං.

**විජිගුච්ඡමානස්ස යදිදං ඵාසූති** - 'විජිගුච්ඡමානස්සා'ති ජාතියා විජිගුච්ඡමානස්ස, ජරාය - බ්‍යාධිනා - මරණෙන - සොකෙහි - පරිදෙවෙහි - දුක්ඛෙහි - දොමනස්සෙහි - උපායාසෙහි -පෙ- දිට්ඨිබ්‍යසනෙන දුක්ඛෙන විජිගුච්ඡමානස්ස අට්ටීයමානස්ස හරායමානස්සාති - විජිගුච්ඡමානස්ස; යදිදං ඵාසූති යං ඵාසු ඵාසුවිහාරං තං කථයිස්සාමි; කතමො ඵාසුවිහාරො? සම්මාපටිපදා අනුලොමපටිපදා අපච්චනීකපටිපදා අන්වත්ථපටිපදා ධම්මානුධම්මපටිපදා සීලෙසු පරිපූරකාරිතා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙ මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සතිසම්පජඤ්ඤං චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාදා පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො නිබ්බානඤ්ච නිබ්බානගාමිනී ච පටිපදා; අයං ඵාසුවිහාරොති - විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු.

මධ්‍යම වූ කෙලශයන් ද...සියුම් වූ කෙලශයන් ද ධමනය සන්ධමනය නිද්ධමනය කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි. නොහොත් මහණ තෙමේ තමාගේ ප්‍රඥාලෝකය නසන ප්‍රඥාචක්ෂුස නො කරන නො දැනීම කරන පැනැස නසන පිඬුකොටසෙහි වූ අමාමහනිවන පිණිස නො පවත්නා වූ රාගමලය ද්වෙෂමලය මොහමලය මානමලය දෘෂ්ටිමලය කෙලශමලය දුශ්චරිතමලය බැහැර කෙරෙයි, වෙසෙසින් බැහැර කෙරෙයි, නිරවශෙෂයෙන් බැහැර කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි. නොහොත් (විදර්ශනා සහිත මාර්ගසම්ප්‍රයුක්ත) සම්‍යග්දෘෂ්ටියෙන් මිථ්‍යාදෘෂ්ටිය ධමනය සන්ධමනය නිද්ධමනය කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි. සම්‍යක්සංකල්පයෙන් මිථ්‍යාසංකල්පය-සම්‍යග්වචනයෙන් මිථ්‍යාවචනය - සම්‍යක්කර්මාන්තයෙන් මිථ්‍යාකර්මාන්තය-සම්‍යගාජීවයෙන් මිථ්‍යාජීවය - සම්‍යග්ව්‍යායාමයෙන් මිථ්‍යාව්‍යායාමය-සම්‍යක්ස්මෘතියෙන් මිථ්‍යාස්මෘතිය - සම්‍යක්සමාධියෙන් මිථ්‍යාසමාධිය-සම්‍යග්ඥානයෙන් මිථ්‍යාඥානය - සම්‍යග්විමුක්තියෙන් මිථ්‍යාවිමුක්තිය ධමනය සන්ධමනය නිද්ධමනය කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවයි. නොහොත් ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයෙන් සියලු කෙලශයන් සියලු දුශ්චරිතයන් සියලු දරථයන් සියලු පරිදාහයන් සියලු සන්තාපයන් සියලු අකුශලාභිසංස්කාරයන් බැහැර කෙරෙයි, වෙසෙසින් බැහැර කෙරෙයි, නිරවශෙෂයෙන් බැහැර කෙරෙයි, දුරු කෙරෙයි, හැරපියයි, විගතාන්ත කෙරෙයි, අනභාවයට පමුණුවා නුයි 'කම්මාරො රජතස්සෙව නිද්ධමෙ මලමත්තනො' යනු වේ.

එසින් වදාළහ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ:

**"සො සෙසු සික්ඛං සමාදාය -පෙ- නිද්ධමෙ මලමත්තනො"සි.**

## 16 - 9

(ශාරිපුත්‍රය සී බුදුහු මෙසේ වදාළහ.) ජාත්‍යාදියෙන් පිළිකුල් කරන්නා වූ එකාන්තයෙන් විවික්තාසනය ශයනය සෙවුණා වූ (සතර මාර්ගඥාන සඞ්ඛ්‍යාත) සම්බොධිය කැමැත්තා වූ මහණ හට යම් ඒ ඵාසුවිහරණයෙක් වේ ද, යම් අනුධර්මයකුත් වේ ද, එය තොපට (ප්‍රත්‍යක්ෂ කොට) දතුවකු සෙයින් ප්‍රකාශ කරන්නෙමි.

**විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු** - 'විජිගුච්ඡමානස්ස' යනු: ජාතියෙන් ජුගුප්සා කරන්නහුට, ජරාවෙන් - ව්‍යාධියෙන් - මරණයෙන් - ශොකයෙන්-පරිදෙවයෙන් - දුකින් - දොම්නසින් - උපායාසයෙන්...දෘෂ්ටිව්‍යසනයෙන් වූ දුකින් ජුගුප්සා කරන්නහුට දුක් වන්නහුට ලජ්ජා වන්නහුට නුයි 'විජිගුච්ඡමානස්ස' යනු වේ. **යදිදං ඵාසු** යනු: යම් ඵාසුවිහරණයෙක් වේ නම්, එය කියන්නෙමි. ඵාසුවිහරණය කවරු යත්: සම්‍යක්ප්‍රතිපත්ති යැ අනුලොමප්‍රතිපත්ති යැ අවිරුද්ධප්‍රතිපත්ති යැ අන්වර්ථප්‍රතිපත්ති යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ ප්‍රාතිමොක්ෂශීලයෙහි පරිපූර්ණකාරී බව යැ ඉන්ද්‍රියයන්හි පියූ දොර ඇති බව යැ භොජනයෙහි පමණ දන්නා බව යැ නිදි දුරු කිරීමෙහි යෙදීම යැ ස්මෘතිසම්ප්‍රඥානය යැ සතර සතිපට්ඨානයෝ යැ සතර ඍද්ධිපාදයෝ යැ පඤ්චෙන්ද්‍රියයෝ යැ පඤ්ච බලයෝ යැ සප්ත බොධ්‍යඞ්ගයෝ යැ ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ග යැ නිර්වාණය ද නිර්වාණගාමිනී ප්‍රතිපත්තිය ද යන මේ ඵාසුවිහරණය නුයි 'විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු' යනු වේ.

**සාරිපුත්තාති** - භගවා තං ථෙරං නාමෙනාලපති; භගවාති ගාරවාධිවචනං; අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා, භජි වා භගවා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානී'ති භගවා, භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා, භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා, භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං ආරුප්පසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං චතුන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා, භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානස්සතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා; භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා, භගවාති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවාති - සාරිපුත්තාති භගවා.

**රිත්තාසනං සයනං සෙවතො චෙති** - 'ආසනං' වුච්චති යත්ථ නිසීදති මඤ්චො පීඨං භිසි තට්ටිකා චම්මඛණ්ඩො තිණසන්ථාරො පණ්ණසන්ථාරො පලාල[1] සන්ථාරො; 'සයනං' වුච්චති සෙනාසනං: විහාරො අඩ්ඪයොගො පාසාදො හම්මියං ගුහා, තං සයනාසනං අසප්පායරූපදස්සනෙන රිත්තං විවිත්තං පවිවිත්තං, අසප්පායසද්දසවණෙන -පෙ- අසප්පායෙහි පඤ්චහි කාමගුණෙහි රිත්තං විවිත්තං පවිවිත්තං; රිත්තං සයනාසනං සෙවතො නිසෙවතො සංසෙවතො පටිසෙවතොති - රිත්තාසනං සයනං සෙවතො චෙ.

1. පලාස - ස්‍යා.

**සාරිපුත්ත** - යනු: බුදුහු ඒ තෙරුන් නමින් අමතන සේක. භගවා යනු: ගෞරවාධිවචන යැ; තවද, බිත් රාග ඇත් නුයි භගවත් යැ, බිත් ද්වෙෂ ඇත් නුයි භගවත් යැ, බිත් මොහ ඇත් නුයි භගවත් යැ, බිත් මාන ඇත් නුයි භගවත් යැ, බිත් දෘෂ්ටි ඇත් නුයි භගවත් යැ, බිත් කෙලෙස් කටු ඇත් නුයි භගවත් යැ, බිත් කෙලෙස් ඇත් නුයි භගවත් යැ, දහම්-රුවන් භාග - විභාග - ප්‍රවිභාග කළාහු නුයි භගවත් යැ, භවයන් කෙළ-වර කළාහු නුයි භගවත් යැ, භාවිත (-වඩන ලද) කය ඇත් නුයි, භාවිත ශීල - භාවිතචිත්ත - භාවිතප්‍රඥ ඇත්තාහු නුයි භගවත් යැ; නොහොත් බුදුහු අල්පශබ්ද වූ අල්පනිර්ඝොෂ වූ ජනවාත රහිත වූ මිනිසුන් ගේ රහස් කරුණුවලට තැන් වූ විවේකයට අනුරූප වූ වනයෙහි දුර සෙනසුන් ඉතා දුර සෙනසුන් වනප්‍රස්ථ සෙනසුන් භජනය කළාහු නුයි භගවත් යැ, නොහොත් බුදුහු චීවර පිණ්ඩපාතසේනාසන ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍ය-පරිෂ්කාරයනට හිමි වූවාහු නුයි භගවත් යැ, නොහොත් බුදුහු අර්ථරසයට ධර්මරසයට විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු නුයි භගවත් යැ, නොහොත් බුදුහු සතර ධ්‍යානයන්ට සතර අප්‍රමාණ්‍ය-යන්ට සතර අරූපසමාපත්තීන්ට හිමි වූවාහු නුයි භගවත් යැ, නොහොත් බුදුහු අෂ්ට විමොක්ෂයන්ට සතර අභිභායතනයන්ට නව අනුපූර්වවිහාර-සමාපත්තීන්ට හිමි වූවාහු නුයි භගවත් යැ, නොහොත් බුදුහු දශ සංඥා-භාවනාවන්ට දශ කෘත්ස්නසමාපත්තීන්ට ආනාපානස්මෘතිසමාධියට අශුභ සමාපත්තියට හිමි වූවාහු නුයි භගවත් යැ, නොහොත් බුදුහු සතර සති-පට්ඨානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු නුයි භගවත් යැ, නොහොත් බුදුහු දශ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍ය-යන්ට සතර ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්බුද්ධධර්මයන්ට හිමි වූවාහු නුයි භගවත් නම් වූහ. 'භගවත්' යන තෙල නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑයකු විසින් නො කරන ලද, බූනකු විසින් නො කරන ලද, සගයහළුවන් විසින් නො කරන ලද, නෑයන් විසින් නො කරන ලද, මහණබමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරන ලද, යම් මේ 'භගවත්' යන නාම යෙක් වී නම්, තෙල භාග්‍යවත් වූ බුදුවරයන්ට අර්හත්මාර්ගයාගේ අන්ත-යෙහි බෝමුල දී සර්වඥතාඥානය ලැබීම සමග රහත්ඵලය (හෝ සර්වධර්ම-යන්) ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වී නුයි 'සාරිපුත්තාති භගවා' යනු වේ.

**රිත්තාසනං සයනං සෙවතො වෙ** - යම් තැනෙක හිඳී නම්, එය 'ආසන' යි කියනු ලැබෙයි: ඇඳ පුටු බිසි තට්ටිකා සම්කඩ තණඇතිරිය පත්ඇතිරිය පිදුරුඇතිරිය යි, සේනාසනය 'සයන'යි කියනු ලැබෙයි: විහාර යැ ගුරුළුවක් ගෙයැ ප්‍රාසාදය යැ හර්ම්‍ය යැ ගුහා යි; ඒ ශයනාසනය අසත්ප්‍රායරූපදර්ශනයෙන් රික්ත යැ විවික්ත යැ ප්‍රවිවික්ත යි; අසත්ප්‍රාය ශබ්ද-ශ්‍රවණයෙන්...අසත්ප්‍රාය වූ පඤ්චකාමගුණයන් ගෙන් සිස් යැ විවේක යැ අතිශයින් විවේක යි. විවේක වූ ශයනාසනය සෙවුණාහට තිති සෙවුණා-හට මැනැවින් සෙවුණාහට වෙසෙසින් සෙවුණාහට නුයි 'රිත්තාසනං සයනං සෙවතො වෙ' යනු වේ.

**සම්බොධිකාමස්ස යථානුධම්මන්ති** - 'සම්බොධි' වුච්චති චතූසු මග්ගෙසු ඤාණං පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං -පෙ- ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො වීමංසා විපස්සනා සම්මාදිට්ඨි; තං සම්බොධිං බුජ්ඣිතුකාමස්ස අනුබුජ්ඣිතුකාමස්ස පටිවිජ්ඣිතුකාමස්ස සම්බුජ්ඣිතුකාමස්ස අධිගන්තුකාමස්ස ඵස්සිතුකාමස්ස සච්ඡිකාතුකාමස්සාති - සම්බොධිකාමස්ස; යථානුධම්මන්ති කතමෙ බොධියා අනුධම්මා? සම්මාපටිපදා අනුලොමපටිපදා අපච්චනීකපටිපදා අන්වත්ථපටිපදා ධම්මානුධම්මපටිපදා සීලෙසු පරපූරකාරිතා ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා භොජනෙසු මත්තඤ්ඤුතා ජාගරියානුයොගො සතිසම්පජඤ්ඤං; ඉමෙ වුච්චන්ති බොධියා අනුධම්මා; අථ වා චතුන්නං මග්ගානං පුබ්බභාගෙ විපස්සනා, ඉමෙ වුච්චන්ති බොධියා අනුධම්මාති - සම්බොධිකාමස්ස යථානුධම්මං.

**තං තෙ පවක්ඛාමි යථා පජානන්ති** - 'තන්'ති බොධියා අනුධම්මං **පවක්ඛාමීති** පවක්ඛාමි ආචික්ඛිස්සාමි දෙසෙස්සාමි පඤ්ඤපෙස්සාමි පට්ඨපෙස්සාමි විවරිස්සාමි විභජිස්සාමි උත්තානීකරිස්සාමි පකාසිස්සාමි; **යථා පජානන්ති** යථා පජානං යථා පජානන්තො ආජානන්තො විජානන්තො පටිවිජානන්තො පටිවිජ්ඣන්තො, න ඉතිහිතිහං න ඉතිකිරාය න පරම්පරාය න පිටකසම්පදාය න තක්කහෙතු න නයහෙතු න ආකාරපරිවිතක්කෙන න දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා සාමං සයං අභිඤ්ඤාතං අත්තපච්චක්ඛං ධම්මං තං කථයිස්සාමීති - තං තෙ පවක්ඛාමි යථා පජානං.

තෙනාහ භගවා:

''විජිගුච්ඡමානස්ස යදිදං ඵාසු
(සාරිපුත්තාති භගවා)
රිත්තාසනං සයනං සෙවතො චෙ,
සම්බොධිකාමස්ස යථානුධම්මං
තං තෙ පවක්ඛාමි යථා පජාන''න්ති.

## 16 - 10

පඤ්චන්න ධීරො භයානං න භායෙ
භික්ඛු සතො සපරියන්තචාරී,[1]
ඩංසාධිපාතාන සිරිංසපානං[2]
මනුස්සඵස්සාන[3] චතුප්පදානං.

---

1. සපරියන්තචාරී - මජසං 2. සරීසපානං - මජසං
3. මනුස්සඵස්සානං - මජසං.

**සම්බොධිකාමස්ස යථානුධම්මං** – සතර මාර්ගඥානය ප්‍රඥාව ප්‍රඥෙන්ද්‍රිය ප්‍රඥාබලය...ධම්මවිචයසම්බොජ්ඣඞ්ගය විමංසාව විදර්ශනාව සම්‍යග්දෘෂ්ටිය 'සම්බොධි'යි කියනු ලැබෙයි. ඒ සම්බොධිය අවබොධ කරනු කැමැත්තහුට අනුරූපප්‍රතිපත්තියෙන් අවබොධ කරනු කැමැත්තහුට ප්‍රතිවෙධ කරනු කැමැත්තහුට මැනැවින් අවබොධ කරනු කැමැත්තහුට අධිගමය කරනු කැමැත්තහුට ස්පර්ශ කරනු කැමැත්තහුට ප්‍රත්‍යක්ෂ කරනු කැමැත්තහුට නුසි 'සම්බොධිකාමස්ස' යනු වේ. **යථානුධම්මං** යන (මෙහි) බොධියට අනුධර්මයෝ කවරහ යත්: සම්‍යක්ප්‍රතිපත්තිය අනුලොමප්‍රතිපත්තිය අප්‍රත්‍යනීක-ප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය ධර්මානුධර්මප්‍රතිපත්තිය ප්‍රාතිමොක්ෂශීලයෙහි සම්පූර්ණ කරන සුලු බව ඉන්ද්‍රියයන්හි ගොපිතද්වාර ඇති බව භොජන-යෙහි පමණ දන්නා බව නිදි දුරු කිරීමෙහි යෙදීම සමෘතිය හා සම්‍යක් ප්‍රඥාව යන මොහු මාර්ගඥාන සඞ්ඛ්‍යාත බොධියට අනුධර්මයෝ යයි කියනු ලැබෙත්; නොහොත් සතර ආර්යමාර්ගයන්ගේ පූර්වභාගයෙහි උපන් විදර්ශනාව යි. මොහු මාර්ගඥාන බොධියට අනුධර්මයෝ යයි කියනු ලැබෙත් නුසි 'සම්බොධිකාමස්ස යථානුධම්මං' යනු වේ.

**තං තෙ පවක්ඛාමි යථා පජානං** – 'තං' යනු: බොධියට අනුධර්මය; **පවක්ඛාමි** යනු: කියන්නෙමි දක්වන්නෙමි දෙසන්නෙමි පනවන්නෙමි පිහිටුවන්නෙමි විවෘත කරන්නෙමි විභාග කරන්නෙමි ප්‍රකට කරන්නෙමි ප්‍රකාශ කරන්නෙමි. **යථා පජානං** දතුවකු සෙයින් දැනගත්තකු හාත්-පසින් දැනගත්තකු වෙසෙසින් දැනගත්තකු සර්වප්‍රකාරයෙන් දැනගත්තකු ප්‍රතිවෙධ කල එකක්හු යම්සේ ද එපරිද්දෙන්, මෙසේ මෙසේ වී ලැ'යි නො වැ, තෙල මේසේ ලැ'යි නො වැ, පරම්පරාකථාවෙන් නො වැ, පිටකසම්ප්‍රදාය හා සම වේ ලැ'යි නො වැ, තර්කහෙතුවෙන් නො වැ, නයග්‍රාහ හෙතුයෙන් නො වැ, (මේ සොඳුරු යැයි) කරුණු සැලැකීමෙන් නො වැ, අපට රුචි වූ දෘෂ්ටිය හා සම වේ යැයි නො වැ, තෙමේ මැ තමා විසින් නුවණින් අවබොධ කල තමහට ප්‍රත්‍යක්ෂ වූ ඒ ධර්මය කියන්නෙමි නුසි 'තං තෙ පවක්ඛාමි යථා පජානං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"**විජිගුච්ඡමානස්ස** -පෙ- **තං තෙ පවක්ඛාමි යථා පජානං**"යි.

**16 – 10**

ධීර වූ සමෘතිමත් වූ (ශීලාදි සතර) පර්යන්තයෙහි හැසිරෙනසුලු ඒ මහණ තෙමෙ (මතු දක්වන) පඤ්ච භීතීන්ට නො බියවන්නේ යැ: ඇට මැස්සන් හා සෙසු මැස්සන්ට ද, දීර්ඝජාතීන්ට ද, චෞරාදි මනුෂ්‍යස්පර්ශයන්ට ද, සිංහාදි සිවුපාවුන්ට ද-

**පඤ්ඤවන්ත ධීරො භයානං න භායෙති** – ‘ධීරො’ති ධීරො පණ්ඩිතො පඤ්ඤවා බුද්ධිමා ඤාණී විභාවී මෙධාවී ධීරො පඤ්ඤවන්තං භයානං න භායෙය්‍ය න තසෙය්‍ය න සන්තසෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය, අභීරූ අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති – පඤ්ඤවන්ත ධීරො භයානං න භායෙ.

**භික්ඛු සතො සපරියන්තචාරීති** – ‘භික්ඛූ’ති පුථුජ්ජනකල්‍යාණකො වා භික්ඛු, සෙඛො වා භික්ඛු; **සතොති** චතූහි කාරණෙහි සතො: කායෙ කායානුපස්සනාසතිපට්ඨානං භාවෙන්තො සතො, **වෙදනාසු** – **චිත්ත**– ධම්මෙසු ධම්මානුපස්සනා සතිපට්ඨානං භාවෙන්තො සතො; සො වුච්චති සතො; **සපරියන්තචාරීති** චත්තාරො පරියන්තා: සීලසංවරපරියන්තො, ඉන්ද්‍රියසංවරපරියන්තො, භොජනෙ මත්තඤ්ඤුතාපරියන්තො, ජාගරියානුයොගපරියන්තො; කතමො සීලසංවරපරියන්තො? ඉධ භික්ඛු සීලවා හොති. පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, අන්තොපූතිභාවං පච්චවෙක්ඛමානො, අන්තො සීලසංවරපරියන්ත චරති; මරියාදං න භින්දති, අයං සීලසංවරපරියන්තො. කතමො ඉන්ද්‍රියසංවරපරියන්තො? ඉධ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං -පෙ- චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති, සොතෙන සද්දං සුත්වා – ඝානෙන ගන්ධං ඝායිත්වා – ජිව්හාය රසං සායිත්වා – කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා – මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජති; රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. ආදිත්තපරියායං පච්චවෙක්ඛමානො අන්තො ඉන්ද්‍රියසංවරපරියන්ත චරති, මරියාදං න භින්දති, අයං ඉන්ද්‍රියසංවරපරියන්තො. කතමො භොජනෙ මත්තඤ්ඤුතාපරියන්තො? ඉධ භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති, නෙව දවාය, න මදාය, න මණ්ඩනාය, න විභූසනාය; යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති. අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. අක්ඛබ්භඤ්ජන – වණපටිච්ඡාදන – පුත්තමංසූපමං පච්චවෙක්ඛමානො අන්තො භොජනෙ මත්තඤ්ඤුතාපරියන්ත චරති, මරියාදං න භින්දති; අයං භොජනෙ මත්තඤ්ඤුතාපරියන්තො.

**පඤ්චන්න ධීරෝ භයානං න භායෙ** - 'ධීරෝ' යනු ධීර වූයේ පණ්ඩිත වූයේ ප්‍රඥාවත් වූයේ බුද්ධිමත් වූයේ නුවණැතියේ නීරණප්‍රඥා ඇතියේ ධාරණප්‍රඥා ඇතියේ වීර වූයේ පඤ්ච භීතීන්ට නො බිය වන්නේ යෑ, නො තැති ගන්නේ යෑ, සන්ත්‍රස්ත නො වන්නේ යෑ, උත්‍රස්ත නො වන්නේ යෑ, හාත්පසින් නො තැති ගන්නේ යෑ, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ යෑ, නො බියසුලු නො සැලෙනසුලු නො තැතිගන්නාසුලු නො පලායනසුලු වන්නේ යෑ, ප්‍රහීණ වූ බිය අරමුණු ඇතියේ පහවූ ලොමුදහ ඇතියේ වෙසෙන්නේ නුයි 'පඤ්චන්න ධීරෝ භයානං න භායෙ' යනු වේ.

**භික්ඛු සතො සපරියන්තචාරී** - 'භික්ඛු' යනු: පෘථග්ජනකල්‍යාණක මහණ හෝ ශෛක්‍ෂ මහණ හෝ යෑ; **සතො** යනු: කරුණු සතරෙකින් සිහි ඇතියේ: කයෙහි කායානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ, වේදනාවන්හි - චිත්තයෙහි - ධර්මයන්හි ධම්මානුපස්සනාසතිපට්ඨානය වඩමින් සිහි ඇතියේ, හෙ තෙමේ සිහි ඇතියේ යයි කියනු ලැබේ. **සපරියන්තචාරී** පර්‍යන්තයෝ සතර දෙනෙකි: ශීලසංවරපර්‍යන්තය යෑ, ඉන්ද්‍රියසංවරපර්‍යන්තය යෑ, භොජනයෙහි මාත්‍රඥතාපර්‍යන්තය යෑ, ජාගර්‍යානුයොගපර්‍යන්තය යෑයි. ශීලසංවරපර්‍යන්තය කවරේ යත්: මේ සස්නෙහි මහණ තෙමේ සිල්වත් වෙයි, ප්‍රාතිමොක්‍ෂසංවරයෙන් සංවර වැ වෙසෙයි, ආචාරයෙන් හා ගොචරයෙන් සම්පූර්ණ වූයේ මදපමණ වරදෙහි බිය දක්නාසුලු වූයේ සමාදන් වැ ශික්‍ෂාපදයන්හි හික්මෙයි, අභ්‍යන්තරයෙහි පූර්තිභාවය (-සිල් රකිත බව) ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙමින්, ශීලසංවරපරිච්ඡේදයාගේ ඇතුළත හැසිරෙයි; ශීලමර්‍යාදාව නො බිඳී. මේ තෙමේ ශීලසංවරපර්‍යන්තය යි. ඉන්ද්‍රියසංවරපර්‍යන්තය කවරේ යත්? මේ සස්නෙහි මහණ තෙමේ ඇසින් රූපයක් දැක (කෙලෙශවස්තු වූ) නිමිති නො ගන්නේ වෙයි. (හස්තපාදාදී ආකාර සඞ්ඛ්‍යාත) අනුව්‍යඤ්ජන නො ගන්නේ වෙයි, යම් කරුණෙකින් මොහු... චක්‍ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි, කනින් ශබ්දයක් අසා - නැහැයෙන් ගඳක් අගා - දිවින් රසයක් විඳ - කයින් පහසක් පැහැස - මනසින් දහමක් දැන නිමිති නො ගන්නේ වෙයි, අනුව්‍යඤ්ජන නො ගන්නේ වෙයි, යම් කරුණෙකින් මනෙන්ද්‍රියය අසංවෘත වැ වාසය කරන මොහු අභිධ්‍යා දෙම්නස් සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබඳනාහු නම්, ඒ මනෙන්ද්‍රියයාගේ සංවරය පිණිස පිළිපදී, මනෙන්ද්‍රියය රකී, මනෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ. ආදීප්තපර්‍යාය දෙශනාව ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙමින් ඉන්ද්‍රියසංවරපරිච්ඡේදය අභ්‍යන්තරයෙහි හැසිරෙයි, ඉන්ද්‍රියසංවරමර්‍යාදාව නො බිඳී. මේ තෙමේ ඉන්ද්‍රියසංවරපර්‍යන්තය යි භොජනයෙහි මාත්‍රඥතාපර්‍යන්තය කවරේ යත්? මේ ශාසනයෙහි මහණ තෙමේ නුවණින් ප්‍රත්‍යවෙක්‍ෂා කොට අහර වළඳයි, කෙළි පිණිස නො වළඳයි, මද පිණිස - අලඞ්කාර පිණිස - සැරැසුම් පිණිස නො වළඳයි, යම්තාක් මේ කයෙහි පැවැත්ම පිණිස යැපීම පිණිස බඩගිනි වේදනා නැසීම පිණිස බඹසරට අනුග්‍රහ පිණිස වළඳයි, මෙසේ 'පැරණි බඩගිනි වේදනාව නසමි, අලුත් වේදනාත් නූපදවමි, මාගේ යැපීම ද වන්නේය, නිවරද බව ද සුඛවිහරණය ද වන්නේ ය'යි අක්‍ෂාභ්‍යඤ්ජනොපමාව ද ව්‍රණප්‍රතිච්ඡාදනොපමාව ද පුත්‍රමාංසොපමාව ද ප්‍රත්‍යවෙක්‍ෂා කෙරෙමින් භොජනයෙහි මාත්‍රඥතාපරිච්ඡේදය අභ්‍යන්තරයෙහි හැසිරෙයි, මර්‍යාදාව නො බිඳී. මේ තෙමේ භොජනයෙහි මාත්‍රඥතාපර්‍යන්තය යි.

කතමො ජාගරියානුයොගපරියන්තො? ඉධ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. භද්දෙකරත්තවිහාරං පච්චවෙක්ඛමානො අනන්තාජාගරියානුයොගපරියන්ත චරති, මරියාදං න භින්දති; අයං ජාගරියානුයොගපරියන්තොති – භික්ඛු සතො සපරියන්තචාරී.

**ඩංසාධිපාතානං සිරිංසපානන්ති** – '**ඩංසා**' වුච්චන්ති පිඞ්ගලමක්ඛිකායො; '**අධිපාතකා**' වුච්චන්ති සබ්බාපි මක්ඛිකායො; කිං කාරණා අධිපාතකා වුච්චන්ති සබ්බාපි මක්ඛිකායො? තා උප්පතිත්වා උප්පතිත්වා ඛාදන්ති; තංකාරණා අධිපාතකා වුච්චන්ති සබ්බාපි මක්ඛිකායො. '**සිරිංසපා**' වුච්චන්ති අහීති – ඩංසාධිපාතානං සිරිංසපානං.

**මනුස්සඵස්සාන චතුප්පදානන්ති** – 'මනුස්සඵස්සා' වුච්චන්ති චොරා වා අස්සු මානවා වා කතකම්මා වා අකතකම්මා වා; තෙ භික්ඛුං පඤ්හං වා පුච්ඡෙය්‍යුං, වාදං වා ආරොපෙය්‍යුං, අක්කොසෙය්‍යුං පරිභාසෙය්‍යුං රොසෙය්‍යුං විරොසෙය්‍යුං හිංසෙය්‍යුං විහිංසෙය්‍යුං හෙඨෙය්‍යුං විහෙඨෙය්‍යුං ඝාතෙය්‍යුං උපඝාතෙය්‍යුං උපඝාතං වා කරෙය්‍යුං. යො කොචි මනුස්සතො උපඝාතො මනුස්සඵස්සො; **චතුප්පදානන්ති** සීහා බ්‍යග්ඝා දීපී අච්ඡා තරච්ඡා කොකා මහිසා හත්ථී; තෙ භික්ඛුං මද්දෙය්‍යුං ඛාදෙය්‍යුං හිංසෙය්‍යුං විහිංසෙය්‍යුං හෙඨෙය්‍යුං විහෙඨෙය්‍යුං ඝාතෙය්‍යුං උපඝාතෙය්‍යුං උපඝාතං වා කරෙය්‍යුං, චතුප්පදතො උපඝාතො යං කිඤ්චි චතුප්පදභයන්ති – මනුස්සඵස්සාන චතුප්පදානං.

තෙනාහ භගවා:

"පඤ්චන්න ධීරො භයානං න භායෙ භික්ඛු සතො සපරියන්තචාරී,
ඩංසාධිපාතානං සිරිංසපානං[1] මනුස්සඵස්සාන[2] චතුප්පදාන"න්ති.

## 16 – 11

පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වාපි තෙසං බහුභෙරවානි,
අථාපරානි අභිසම්භවෙය්‍ය[3] පරිස්සයානි කුසලානුඑසී.

1. ඩංසාධිපාතානං සරිසපානං - මජ්ඣං. 2. මනුස්සඵස්සානං - මජ්ඣං.
3. අභිසම්භවෙය්‍යුං - සයා.

ජාගරියානුයෝගානුපයුක්තතාව කවරේ යත්: මේ ශාසනයෙහි මහණ තෙමේ දහවල සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන් කෙරෙන් (හෝ සියලු අකුශලධර්මයන්ගෙන්) සිත පිරිසුදු කරන්නේ යැ. රෑ පෙරයම සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන් කෙරෙන් සිත පිරිසුදු කරන්නේ යැ. රෑ මැදියම දකුණු පයෙහි වම්පය මදක් ඇඳතබා සිහි නුවණින් 'නැඟීසිටිමි' යන සංඥාව මෙනෙහි කොට දකුණුපසින් සිංහශය්‍යාව කෙරෙයි. රෑ අලුයම නැඟීසිට සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන්ගෙන් සිත පිරිසුදු කෙරෙයි. භද්‍රෙකරාත්‍රවිහරණය ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙමින් ජාගරියානුයෝග පරිච්ඡේදය අභ්‍යන්තරයෙහි හැසිරෙයි. මයකීදුව නො බිදී. මේ තෙමේ ජාගරියානුයෝගපයුක්තතාව වේ යයි 'භික්ඛු සතතං සප්පරියන්තචාරී' යනු වේ.

**ඩංසාධිපාතානං සිරිංසපානං** - පිඹගල මැස්සෝ 'ඩංස'යි කියනු ලැබෙත්: සියලු මැ මැස්සෝ 'අධිපාතක'යි කියනු ලැබෙත්. කවර කරුණෙකින් සියලු මැ මැස්සෝ 'අධිපාතකයෝ' යැයි කියනු ලැබෙත් ද යත්: ඔහු නැඟී නැඟී කති. එ කරුණෙන් සියලුමැ මැස්සෝ 'අධිපාතකයෝ' යැයි කියනු ලැබෙත්. සර්පයෝ 'සිරිංසප'යි කියනු ලැබෙත් නුයි 'ඩංසාධිපාතාන සිරිංසපානං' යනු වේ.

**මනුස්සඵස්සාන චතුප්පදානං** - කල සොරකම් ඇති හෝ නො කල සොරකම් ඇති හෝ සොරු හෝ සැහැසි මනුෂ්‍යයෝ වන්නාහුය. (ඔහු) 'මනුස්සඵස්ස' යි කියනු ලැබෙත්. ඔහු මහණහු පැන හෝ පුළුවුස්නාහු ය, වාදාරෝපණය හෝ කරන්නාහු ය, ආක්‍රොශ කරන්නාහු ය, පරිභව කරන්නාහු ය, කොප කරන්නාහු ය, වෙසෙසින් කොප කරන්නාහු ය, හිංසා කරන්නාහු ය, විහිංසා කරන්නාහු ය, පෙලන්නාහු ය, වෙසෙසින් පෙලන්නාහු ය, නසන්නාහු ය, වෙහෙසන්නාහු ය, උපඝාත හෝ කරන්නාහු ය. මිනිසුන් කෙරෙන් යම් කිසි උපඝාතයෙක් වේ නම් එය 'මනුස්සඵස්ස' නම්. **චතුප්පදානං** යනු සිංහයෝ යැ ව්‍යාඝ්‍රයෝ යැ දිවියෝ යැ වලස්සු යැ තරස්හු යැ වෘකයෝ යැ මිහිවෝ යැ හස්තීහු යි. ඔහු භික්‍ෂූහු මඩනාහු ය, කන්නාහු ය, හිංසා කරන්නාහු ය, විහිංසා කරන්නාහු ය, පෙලන්නාහු ය, වෙසෙසින් පෙලන්නාහු ය, නසන්නාහු ය, වෙහෙසන්නාහු ය, උපඝාත හෝ කරන්නාහු ය. සිවුපාවුන් කෙරෙන් උපඝාතයෙක් යම් කිසි සිවුපාබියෙක් නුයි 'මනුස්සඵස්සාන චතුප්පදානං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"පඤ්චන්න ධීරෝ භයානං -පෙ- මනුස්සඵස්සාන චතුප්පදානං"යි.**

## 16 - 11

නො සහදම්යන්ට ද නො බිය වන්නේ යැ. ඔවුන්ගේ බොහෝ බිය උපදවන අරමුණු දැක ද නො තැතිගන්නේ යැ. තවද කුසල් දහම් සොයනුයේ අන් උවදුරු ද මැඩපවත්වන්නේ යි.

**පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වාපි තෙසං බහුභෙරවානීති** - 'පරධම්මිකා' වුච්චන්ති සත්ත සහධම්මිකෙ ඨපෙත්වා යෙ කෙචි බුද්ධෙ ධම්මෙ සඞ්ඝෙ අප්පසන්නා. තෙ භික්ඛුං පඤ්හං වා පුච්ඡෙය්‍යුං වාදං වා ආරොපෙය්‍යුං, අක්කොසෙය්‍යුං පරිභාසෙය්‍යුං රොසෙය්‍යුං විරොසෙය්‍යුං හිංසෙය්‍යුං විහිංසෙය්‍යුං හෙඨෙය්‍යුං විහෙඨෙය්‍යුං ඝාතෙය්‍යුං උපඝාතෙය්‍යුං උපඝාතං වා කරෙය්‍යුං. තෙසං බහුභෙරවෙ පස්සිත්වා වා සුණිත්වා වා න වෙධෙය්‍ය නප්පවෙධෙය්‍ය න සම්පවෙධෙය්‍ය, න තසෙය්‍ය න සන්තසෙය්‍ය න උත්තසෙය්‍ය න පරිත්තසෙය්‍ය න භායෙය්‍ය න සන්තාසං ආපජ්ජෙය්‍ය, අභීරු අස්ස අච්ඡම්භී අනුත්‍රාසී අපලායී, පහීනභයභෙරවො විගතලොමහංසො විහරෙය්‍යාති - පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වාපි තෙසං බහුභෙරවානි.

**අථාපරානි අභිසම්භවෙය්‍ය[1] පරිස්සයානි කුසලානුඑසීති** - අථාපරානිපි අත්ථි අභිසම්භොතබ්බානි අභිභවිතබ්බානි අජ්ඣොත්ථරිතබ්බානි පරියාදියිතබ්බානි මද්දිතබ්බානි. **පරිස්සයාති** ද්වෙ පරිස්සයා: පාකටපරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච -පෙ- එවම්පි තත්‍රාසයාති පරිස්සයා. **කුසලානුඑසීති** සම්මාපටිපදං අනුලොමපටිපදං අපච්චනීකපටිපදං අන්වත්ථපටිපදං -පෙ- අරියං අට්ඨඞ්ගිකං මග්ගං නිබ්බානඤ්ච නිබ්බානගාමිනිඤ්ච පටිපදං එසන්තෙන ගවෙසන්තෙන පරියෙසන්තෙන පරිස්සයා අභිසම්භොතබ්බා අභිභවිතබ්බා අජ්ඣොත්ථරිතබ්බා පරියාදියිතබ්බා මද්දිතබ්බාති - අථාපරානි අභිසම්භවෙය්‍ය පරිස්සයානි කුසලානුඑසී.

**තෙනාහ භගවා:**

"පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය
දිස්වාපි තෙසං බහුභෙරවානි,
අථාපරානි අභිසම්භවෙය්‍ය
පරිස්සයානි කුසලානුඑසී"ති.

**16 - 12**

ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො
සීතං අච්චුණ්හං[2] අධිවාසයෙය්‍ය,
සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො
විරියපරක්කමං දළ්හං කරෙය්‍ය.

**ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨොති** - 'ආතඞ්කඵස්සො' වුච්චති රොගඵස්සො. රොගඵස්සෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස; චක්ඛුරොගෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස; සොතරොගෙන - ඝානරොගෙන - ජිව්හාරොගෙන - කායරොගෙන -පෙ- ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්ස. 'ඛුදා' වුච්චති ඡාතකො. ඡාතකෙන ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්සාති - ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො.

---

1. අභිසම්භවෙය්‍යුං - PTS.
2. අතුණ්හං - සීමු. II

**පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වාපි තෙසං බහුභෙරවානි**- සත් සද්ධර්මයත් තබා බුදුන් දහම් සඟුන් කෙරෙහි නො පහන් වූ යම් කිසි කෙනෙක් 'පරධම්මිකයෝ' යැයි කියනු ලැබෙත්. ඔහු භික්ෂුහුගෙන් පැන හෝ පුළුවුස්නාහු ය, වාදාරෝපණය හෝ කරන්නාහු ය, ආක්‍රොශ කරන්නාහු ය, පරිභව බණන්නාහු ය, කොප කරන්නාහු ය, වෙසෙසින් කොප කරන්නාහු ය, හිංසා කරන්නාහු ය, විහිංසා කරන්නාහු ය, පෙලන්නාහු ය, වෙසෙසින් පෙළන්නාහු ය, නසන්නාහු ය, වෙහෙසන්නාහු ය, උපඝාත හෝ කරන්නාහු ය. ඔවුන්ගේ බොහෝ වූ බිය උපදවන අරමුණු දැක හෝ අසා හෝ නො සැලෙන්නේ යැ, වෙසෙසින් නො සැලෙන්නේ යැ, හාත්පසින් නො සැලෙන්නේ යැ, නො තැතිගන්නේ යැ, සන්ත්‍රස්ත- උත්‍රස්ත - පරිත්‍රස්ත නො වන්නේ යැ, නො බියවන්නේ යැ, සන්ත්‍රාසයට නො පැමිණෙන්නේ යැ; නො බියසුලු නො සැලෙනසුලු නො තැතිගන්නා සුලු නො පලායනසුලු වන්නේ යැ, ප්‍රහීණ වූ බියඅරමුණු ඇතියේ පහවූ ලොමුදහ ඇතිව වාසය කරන්නේ නුයි 'පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය දිස්වා පි තෙසං බහුභෙරවානි' යනු වේ.

**අථාපරානි අභිසම්භවෙය්‍ය පරිස්සයානි කුසලානුඑසී** - තවද අන්‍ය වූත් මැඩියැ යුතු අභිභවනය කළ යුතු යටපත් කළයුතු හාත්පසින් ගත යුතු මර්දනය කල යුත්තාහු ඇති. **පරිස්සය** නම්: ප්‍රකට පරිශ්‍රයෝ ද ප්‍රතිච්ඡන්න පරිශ්‍රයෝ දැයි පරිශ්‍රය (-උපද්‍රව) දෙකෙකි...මෙසේත් 'තත්‍රාසය'නුයි පරිශ්‍රය නම් වෙත්. **කුසලානුඑසී** යනු: සම්‍යක් ප්‍රතිපත්තිය අනුලෝම- ප්‍රතිපත්තිය අවිරුද්ධප්‍රතිපත්තිය අන්වර්ථප්‍රතිපත්තිය...ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය නිර්වාණය ද නිර්වාණගාමිනීප්‍රතිපත්තිය ද සොයන්නහු විසින් ගවෙෂණය කරන්නහු විසින් පර්‍ය්‍යෙෂණය කරන්නහු විසින් උපද්‍රවයෝ මැඩිය යුත්තාහු ය, අභිභවනය කල යුත්තාහු ය, යටපත් කල යුත්තාහු ය, හාත්පසින් ගත යුත්තාහු ය, මර්දනය කල යුත්තාහු නුයි 'අථාපරානි අභිසම්භවෙය්‍ය පරිස්සයානි කුසලානුඑසී' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"පරධම්මිකානම්පි -පෙ- පරිස්සයානි කුසලානුඑසී"**යි.

## 16 - 12

රොගස්පර්ශයෙන් ද ක්ෂුධායෙන් ද ස්පර්ශ කරන ලදුයේ ශීතය ද ගැලි උෂ්ණය ද ඉවසන්නේ යැ. හෙ තෙමෙ ඒ රොගස්පර්ශාදියෙන් බොහෝ සෙයින් පහස්නා ලදුයේ අභිසංස්කාර සහගතවිඥානයට හෝ දුශ්චරිතයට අවකාශ නො කරනුයේ චෛතසික වීර්‍ය්‍යාරම්භය දැඩි ව කරන්නේ යි.

**ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො** - රොගස්පර්ශය 'ආතඞ්කඵස්ස'යි කියනු ලැබෙයි. රොගස්පර්ශයෙන් පහස්නා ලදුයේ මඩනා ලදුයේ බැසගන්නා ලදුයේ සමන්විත වූයේ වන්නේ ය; චක්ෂුරොගයෙන් පහස්නා ලදුයේ පෙළුණේ බැසගන්නා ලදුයේ සමන්විත වූයේ වන්නේ ය, ශ්‍රොත්‍ර- රොගයෙන් - ඝ්‍රාණරොගයෙන් - ජිහ්වාරොගයෙන් - කායරොගයෙන්... මැසි-මදුරු-වා-අව්-දිග්ඝපහසින් පහස්නා ලදුයේ මඩනා ලදුයේ යුක්ත වූයේ සමන්විත වූයේ වන්නේ ය. සාදුක 'ඛුදා'යි කියනු ලැබෙයි. සාදුකින් පහස්නා ලදුයේ මඩනා ලදුයේ යුක්ත වූයේ සමන්විත වූයේ වන්නේ නුයි 'ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො' යනු වේ.

**සීතං අච්චුණ්හං[1] අධිවාසයෙය්‍යාති** – ‘සීත’න්ති ද්වීහි කාරණෙහි සීතං හොති: අබ්භන්තරධාතුපකොප[2]වසෙන වා සීතං හොති. බහිද්ධා උතුවසෙන වා සීතං හොති. උණ්හන්ති ද්වීහි කාරණෙහි උණ්හං හොති. අබ්භන්තරධාතුපකොප[2]වසෙන වා උණ්හං හොති. බහිද්ධා උතුවසෙන වා උණ්හං හොතීති – සීතං අච්චුණ්හං. **අධිවාසයෙය්‍යාති** ඛමො අස්ස සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං, දුරුත්තානං දුරාගතානං වචනපථානං, උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිප්පානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අධිවාසකජාතිකො අස්සාති – සීතං අච්චුණ්හං[1] අධිවාසයෙය්‍ය.

**සො තෙහි ඵුට්ඨො බහුධා. අනොකොති** – ‘සො තෙහී’ති ආතඞ්කඵස්සෙන ච ඛුදාය ච සීතෙන ච උණ්හෙන ච ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්සාති – සො තෙහි ඵුට්ඨො. බහුධාති අනෙකවිධෙහි ආකාරෙහි ඵුට්ඨො පරෙතො සමොහිතො සමන්නාගතො අස්සාති – සො තෙහි ඵුට්ඨො බහුධා. **අනොකොති** අභිසඞ්ඛාරසහගතවිඤ්ඤාණස්ස ඔකාසං න කරොතීතිපි – අනොකො. අථවා, කායදුච්චරිතස්ස වචීදුච්චරිතස්ස මනොදුච්චරිතස්ස ඔකාසං න කරොතීතිපි අනොකොති – සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො.

**විරියපරක්කමං දළ්හං කරෙය්‍යාති** – ‘විරියපරක්කමො’ වුච්චති: “යො චෙතසිකො විරියාරම්භො නික්කමො පරක්කමො උය්‍යාමො වායාමො උස්සාහො උස්සොළ්හී අප්පටිවානී ථාමො ධිති[3] අසිථිලපරක්කමතා අනික්ඛිත්තඡන්දතා අනික්ඛිත්තධුරතා ධුරසම්පග්ගාහො විරියං විරියින්ද්‍රියං විරියබලං සම්මාවායාමො”ති. **විරියපරක්කමං දළ්හං කරෙය්‍යාති** – විරියපරක්කමං දළ්හං කරෙය්‍ය, ථිරං කරෙය්‍ය, දළ්හසමාදානො අස්ස අවට්ඨිතසමාදානොති – විරියපරක්කමං දළ්හං කරෙය්‍ය.

තෙනාහ භගවා:

“ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො
සීතං අච්චුණ්හං අධිවාසයෙය්‍ය,
සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො
විරියපරක්කමං දළ්හං කරෙය්‍යා”ති.

**16 - 13**

ථෙය්‍යං න කරෙය්‍ය[4] න මුසා භණෙය්‍ය
මෙත්තාය ඵස්සෙ තසථාවරානි,
යදාවිලත්තං මනසො විජඤ්ඤා
කණ්හස්ස පක්ඛොති විනොදයෙය්‍ය.

---

1. අතුණ්හං, සිමු. 2. ධාතුසංඛොභ - ස.
3 ඨිති - සිමු. II. 4. කරෙ - සිමු II මජසං.

**සීතං අච්චුණ්හං අධිවාසයෙය්‍ය** – 'සීතං' යනු: දෙකරුණෙකින් ශීතය වෙයි: අභ්‍යන්තරධාතුකෝපවශයෙන් හෝ ශීතය වෙයි. බාහිර සෘතුවශයෙන් හෝ ශීතය වේ. **උණ්හං** යනු: දෙකරුණෙකින් උෂ්ණය වෙයි: අභ්‍යන්තරධාතුකෝපවශයෙන් හෝ උෂ්ණය වෙයි. බාහිර සෘතුවශයෙන් හෝ උෂ්ණය වේ නුයි 'සීතං අච්චුණ්හං' යනු වේ. **අධිවාසයෙය්‍ය** යනු: ශීත උෂ්ණ සා පවස් මැසිමදුරුවාඅව්දිග්ධපහස් ඉවසනුයේ වන්නේ ය, නපුරු කොට කියන ලද දුක් උපදවන අයුරින් පැමිණි වචනයන් ද දුක් වූ තීව්‍ර වූ රළු වූ කටුක වූ අමධුර වූ අමනාප වූ දිවි පැහැරගන්නා වූ උපන් ශාරීරික වේදනාවන් ඉවසන සවභාව ඇත්තේ වන්නේ නුයි 'සීතං අච්චුණ්හං අධිවාසයෙය්‍ය' යනු වේ.

**සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො** – 'සො තෙහි' යනු: රෝගස්පර්ශයෙන් ද ක්ෂුධායෙන් ද ශීතයෙන් ද උෂ්ණයෙන් ද පහස්නා ලද්දේ මඩනා ලද්දේ යුක්ත වූයේ සමන්විත වූයේ වන්නේ නුයි 'සො තෙහි ඵුට්ඨො' යනු වේ. **බහුධා** යනු: නන්වැදෑරුම් අයුරින් පහස්නා ලද්දේ මඩනා ලද්දේ යුක්ත වූයේ සමන්විත වූයේ වන්නේ නුයි 'සො තෙහි ඵුට්ඨො බහුධා' යනු වේ. **අනොකො** යනු: කුශලාකුශල චේතනාසම්ප්‍රයුක්ත විඥානයට අවකාශ නො කෙරේ නුයි ද 'අනොක'යැ. නොහොත් කායදුශ්චරිතයට වාග්දුශ්චරිතයට මනොදුශ්චරිතයට අවකාශ නො කෙරේ නුයි ද 'අනොක' නුයි 'සො තෙහි ඵුට්ඨො බහුධා අනොකො' යනු වේ.

**විරියපරක්කමං දළ්හං කරෙය්‍ය** – යම් චෛතසිකවීර්‍ය්‍යාරම්භයෙක් කෞසීද්‍යයෙන් නික්මැ යැමෙක් පරාක්‍රමයෙක් උද්‍යමයෙක් ව්‍යායාමයෙක් උත්සාහයෙක් අධික උත්සාහයෙක් නො පසුබස්නා බවෙක් ස්ථිර බවෙක් කුශලසන්තානය ධරා සිටීමෙක් නො ලිහිල් පරාක්‍රම ඇති බවෙක් නො තැබූ වීර්‍ය්‍යච්ඡන්ද ඇති බවෙක් නො තැබූ වීර්‍ය්‍යධුර ඇති බවෙක් වීර්‍ය්‍යධුරය දැඩිව ගැනීමෙක් වීර්‍ය්‍යයෙක් වීර්‍ය්‍යෙන්ද්‍රියයෙක් වීර්‍ය්‍යබලයෙක් සම්‍යග්ව්‍යායාමයෙක් වේ ද, එය 'විරියපරක්කම'යි කියනු ලැබේ. **විරියපරක්කමං දළ්හං කරෙය්‍ය** – චෛතසිකවීර්‍ය්‍යාරම්භය දැඩි කරන්නේ ය, ස්ථිර කරන්නේ ය, දෘඪසමාදාන ඇත්තේ බැසගන්නා ලද සමාදාන ඇත්තේ වන්නේ නුයි 'විරියපරක්කමං දළ්හං කරෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ආතඞ්කඵස්සෙන -පෙ- විරියපරක්කමං දළ්හං කරෙය්‍ය"යි.**

**16 - 18**

සොරකම් නො කරන්නේ යැ. මුසාවා නො කියන්නේ යැ. තෘෂ්ණා සහිත වූ ද ස්ථාවර වූ ද (-පෘථග්ජන ක්ෂීණාශ්‍රව) පුද්ගලයන් මෛත්‍රියෙන් පතුරුවන්නේ යැ. යම් චිත්තයාගේ කැලැඹුණු බවක් දන්නේ නම්, එය මාරයාගේ පක්ෂයෙහි වතැයි දුරු කරන්නේ යි.

**ථෙය්‍යං න කරෙය්‍ය න මුසා භණෙය්‍යාති** – 'ථෙය්‍යං න කරෙය්‍යා'ති ඉධ භික්ඛු අදින්නාදානං පහාය අදින්නාදානා පටිවිරතො අස්ස, දින්නාදායී දින්නපාටිකඞ්ඛී අථෙනෙන සුචිභූතෙන අත්තනා විහරෙය්‍යාති – ථෙය්‍යං න කරෙය්‍ය. න මුසා භණෙය්‍යාති ඉධ භික්ඛු මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතො අස්ස, සච්චවාදී සච්චසන්ධො ථෙතො පච්චයිකො අවිසංවාදකො ලොකස්සාති – ථෙය්‍යං න කරෙය්‍ය න මුසා භණෙය්‍ය.

**මෙත්තාය ඵස්සෙ තසථාවරානීති** – 'මෙත්තා'ති "යා සත්තෙසු මෙත්ති මෙත්තායනා මෙත්තායිතත්තං අනුද්දයා අනුද්දයනා[1] අනුද්දයිතත්තං හිතෙසිතා අනුකම්පා අබ්‍යාපාදො අබ්‍යාපජ්ජො අදොසො කුසලමූලං[2]. තසාති යෙසං තසිතා තණ්හා අප්පහීනා, යෙසඤ්ච භයභෙරවා අප්පහීනා. කිං කාරණා වුච්චන්ති තසා? තෙ තසන්ති උත්තසන්ති පරිතසන්ති භායන්ති සන්තාසං ආපජ්ජන්ති. තංකාරණා වුච්චන්ති තසා. ථාවරාති යෙසං තසිතා තණ්හා පහීනා, යෙසඤ්ච භයභෙරවා පහීනා. කිංකාරණා වුච්චන්ති ථාවරා? තෙ න තසන්ති න උත්තසන්ති න පරිතසන්ති න භායන්ති, සන්තාසං න ආපජ්ජන්ති, තංකාරණා වුච්චන්ති ථාවරා.

**මෙත්තාය ඵස්සෙ තසථාවරානීති** – තසෙ ච ථාවරෙ ච මෙත්තාය ඵස්සෙය්‍ය ඵරෙය්‍ය, මෙත්තාසහගතෙන චෙතසා විපුලෙන මහග්ගතෙන අප්පමාණෙන අවෙරෙන අබ්‍යාපජ්ජෙන ඵරිත්වා විහරෙය්‍යාති – මෙත්තාය ඵස්සෙ තසථාවරානි.

**යදාවිලත්තං මනසො විජඤ්ඤාති**–'යදා'ති යං[2] **මනසොති** "යං චිත්තං මනො මානසං හදයං පණ්ඩරං මනො මනායතනං මනින්ද්‍රියං විඤ්ඤාණං විඤ්ඤාණක්ඛන්ධො තජ්ජාමනොවිඤ්ඤාණධාතු"[2] කායදුච්චරිතෙන චිත්තං ආවිලං හොති ලුළිතං එරිතං ඝට්ටිතං චලිතං භන්තං අවූපසන්තං, වචීදුච්චරිතෙන – මනොදුච්චරිතෙන – රාගෙන – දොසෙන – මොහෙන– කොධෙන – උපනාහෙන – මක්ඛෙන – පළාසෙන – ඉස්සාය – මච්ඡරියෙන– මායාය – සාඨෙය්‍යෙන – ථම්භෙන – සාරම්භෙන – මානෙන – අතිමානෙන– මදෙන – පමාදෙන – සබ්බකිලෙසෙහි – සබ්බදුච්චරිතෙහි – සබ්බදරථෙහි– සබ්බපරිළාහෙහි – සබ්බසන්තාපෙහි –සබ්බාකුසලාභිසඞ්ඛාරෙහි චිත්තං ආවිලං හොති ලුළිතං එරිතං ඝට්ටිතං චලිතං භන්තං අවූපසන්තං. **යදාවිලත්තං මනසො විජඤ්ඤාති** – චිත්තස්ස ආවිලභාවං ජානෙය්‍ය ආජානෙය්‍ය විජානෙය්‍ය පටිවිජානෙය්‍ය පටිවිජ්ඣෙය්‍යාති – යදාවිලත්තං මනසො විජඤ්ඤා.

---

1 අනුද්දයනා - සිමු. II. [2] ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ.
2. යදා - සිමු II

**ථෙය්‍යං න කරෙය්‍ය න මුසා භණෙය්‍ය** – 'ථෙය්‍යං න කරෙය්‍ය' යනු මෙහි මහණ තෙමේ අසිනාදන් හැරපියා අසිනාදනින් වෙන් වූයේ වන්නේ ය, දුන් දෙය ගන්නේ දුන් දෙය කැමැති වනුයේ සොර නො වූ පිවිතුරු වූ සිතින් යුතු ව වාසය කරන්නේ නුසි 'ථෙය්‍යං න කරෙය්‍ය' යනු වේ. **න මුසා භණෙය්‍ය** යනු: මෙහි මහණ තෙමේ මුසාවා හැරපියා මුසාවාදයෙන් වෙන් වූයේ වන්නේ ය, සබවස කියනුයේ සැබැවින් සැබැව ගලපනුයේ තිර වූයේ නැදැහිය යුතු බස් ඇත්තේ ලොව නො රවටනුයේ වන්නේ නුසි 'ථෙය්‍යං න කරෙය්‍ය න මුසා භණෙය්‍ය' යනු වේ.

**මෙත්තාය ඵස්සෙ තසථාවරානි** – 'මෙත්තා' නම්: සත්ත්වයන් කෙරෙහි යම් මෛත්‍රියෙක් මෛත්‍රී ආකාරයෙක් මෛත්‍රීසහගත සිත් ඇති බවෙක් අනුදයාවක් අනුදයාකාරයෙක් අනුදයා ඇති බවෙක් හිතෛෂී බවෙක් අනුකම්පාවක් අව්‍යාපාදයෙක් අව්‍යාපාද බවෙක් අද්වේෂකුශලමූලයෙක් වේ ද එය යි. **තස** නම්: යම් කෙනකුන්ගේ තසිනාව තෘෂ්ණාව අප්‍රහීණ වූවා ද, තවද යම් කෙනකුන්ගේ බිය හා බියඅරමුණු අප්‍රහීණ වූවාහු ද, (ඔහු යැ.) කවර කරුණෙකින් 'තසයෝ' යැයි කියනු ලැබෙත් ද ? ඔහු ත්‍රස්ත වෙති, උත්‍රස්ත වෙති, පරිත්‍රස්ත වෙති, බිය වෙති, සන්ත්‍රාසයට පැමිණෙත්; එකරුණෙන් 'තස'යි කියනු ලැබෙත්. **ථාවරා** යනු: යම් කෙනකුන්ගේ තසිනාව තෘෂ්ණාව ප්‍රහීණ වූවා ද, තවද යම් කෙනකුන්ගේ බිය හා බියඅරමුණු ප්‍රහීණ වූවාහු ද, (ඔහු යැ.) කවර කරුණෙකින් 'ථාවරයෝ' යැයි කියනු ලැබෙත් ද, ඔහු ත්‍රස්ත නො වෙති, උත්‍රස්ත නො වෙති, පරිත්‍රස්ත නො වෙති, බිය නො වෙති, සන්ත්‍රාසයට නො පැමිණෙත්; එ කරුණෙන් 'ථාවරයෝ' යැයි කියනු ලැබෙත්. **මෙත්තාය ඵස්සෙ තසථාවරානි**– ත්‍රස්තයන් ද ස්ථාවරයන් ද මෙත්සිතින් ස්පර්ශ කරන්නේ ය, පතුරුවන්නේ ය, විපුල වූ මහද්ගත වූ අප්‍රමාණ වූ අවෛර වූ ව්‍යාපාද රහිත වූ මෛත්‍රීසහගත සිතින් පතුරුවා වාසය කරන්නේ නුසි 'මෙත්තාය ඵස්සෙ තසථාවරානි' යනු වේ.

**යදාවිලත්තං මනසො විජඤ්ඤා**–'යදා' යනු: යම්; **මනසො** යනු: යම් සිතෙක් මනසෙක් මානසයෙක් හෘදයයෙක් පණ්ඩර වූ භවාංගසිතෙක් මනසෙක් මනසඞ්ඛ්‍යාත ආයතනයෙක් මනෝන්ද්‍රියයෙක් විඥානයෙක් විඥානස්කන්ධයෙක් තදනුරූප වූ මනෝවිඥානධාතුයෙක් වේ ද, එය යි. කායදුශ්චරිතයෙන් සිත කැලැඹුණේ ක්ෂෝභ වූයේ කම්පිත වූයේ ගැටුණේ සැලුණේ භ්‍රාන්ත වූයේ නො සන්හිඳුණේ වෙයි; වාග්දුශ්චරිතයෙන් – මනෝදුශ්චරිතයෙන් – රාගයෙන් – ද්වේෂයෙන් – මෝහයෙන් – ක්‍රෝධයෙන් – උපනාහයෙන් – මකුබැවින් – පලාසයෙන් – ඊර්ෂ්‍යායෙන් – මාත්සර්යයෙන් – මායායෙන් – ශාඨ්‍යයෙන් – ස්තම්භයෙන් – සාරම්භයෙන් – මානයෙන් – අතිමානයෙන් – මදයෙන් – ප්‍රමාදයෙන් – සියලු ක්ලේශයන් ගෙන් – සියලු දුශ්චරිතයන් ගෙන් සියලු දරථයන් ගෙන් – සියලු පරිදාහයන් ගෙන් – සියලු සන්තාපයන් ගෙන් සියලු අකුශලාභිසංස්කාරයන් ගෙන් සිත ආවිල වූයේ ලුලිත වූයේ කම්පිත වූයේ ඝට්ටිත වූයේ චලිත වූයේ භ්‍රාන්ත වූයේ අව්‍යුපශාන්ත වූයේ වෙයි; **යදාවිලත්තං මනසො විජඤ්ඤා** – චිත්තයාගේ කැලැඹුණු බව දන්නේ නම් හාත්පසින් දන්නේ නම්, වෙසෙසින් දන්නේ නම්, සර්වප්‍රකාරයෙන් දන්නේ නම්, ප්‍රතිවෙධ කරන්නේ නම් යි 'යදාවිලත්තං මනසො විජඤ්ඤා' යනු වේ.

**කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍යාති** - 'කණ්හො'ති යො සො මාරො කණ්හො අධිපති අන්තගූ නමුචි පමත්තබන්ධු. **කණ්හස්ස පක්ඛා** මාරපක්ඛා මාරපාසො මාරබළිසං මාරාමිසං මාරවිසයො මාරනිවාපො[1] මාරගොචරො මාරබන්ධනන්ති පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති - එවම්පි කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍ය. අථවා **කණ්හස්ස පක්ඛා** - මාරපක්ඛා අකුසලපක්ඛා දුක්ඛුද්‍රයො[2] දුක්ඛ-විපාකො නිරයසංවත්තනිකො තිරච්ඡානයොනිසංවත්තනිකො පෙත්ති-විසයසංවත්තනිකොති පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති - එවම්පි කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍ය.

තෙනාහ භගවා:

"ථෙය්‍යං න කරෙය්‍ය න මුසා භණෙය්‍ය
මෙත්තාය ඵස්සෙ තසථාවරානි,
යදාවිලත්තං මනසො විජඤ්ඤා
කණ්හස්ස පක්ඛාති විනොදයෙය්‍යා"ති.

**16 - 14**

කොධාතිමානස්ස වසං න ගච්ඡෙ
මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ,
අථප්පියං වා පන අප්පියං වා
අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය.

**කොධාතිමානස්ස වසං න ගච්ඡෙති** - 'කොධො'ති "යො චිත්තස්ස ආඝාතො පටිඝාතො-පෙ-චණ්ඩික්කං අසුරොපො[3] අනත්තමනතා චිත්තස්ස"[b] **අතිමානොති** "ඉධෙකච්චො පරං අතිමඤ්ඤති ජාතියා වා ගොත්තෙන වා -පෙ- අඤ්ඤතරඤ්ඤතරෙන වා වත්ථුනා"[c]. **කොධාතිමානස්ස වසං න ගච්ඡෙති** කොධස්ස ච අතිමානස්ස ච වසං න ගච්ඡෙය්‍ය, කොධඤ්ච අති-මානඤ්ච පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති-කොධාතිමානස්ස වසං න ගච්ඡෙ.

**මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙති** - කතමං කොධස්ස මූලං: අවිජ්ජා මූලං, අයොනිසොමනසිකාරො මූලං, අස්මිමානො මූලං, අහිරිකං මූලං, අනොත්තප්පං මූලං, උද්ධච්චං මූලං. ඉදං කොධස්ස මූලං. කතමං අතිමානස්ස මූලං: අවිජ්ජා මූලං, අයොනිසොමනසිකාරො මූලං, අස්මි-මානො මූලං, අහිරිකං මූලං, අනොත්තප්පං මූලං, උද්ධච්චං මූලං. ඉදං අතිමානස්ස මූලං. **මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙති** කොධස්ස ච අති-මානස්ස ච මූලං පලිඛණිත්වා උද්ධරිත්වා සමුද්ධරිත්වා උප්පාටයිත්වා සමුප්පා-ටයිත්වා පජහිත්වා විනොදෙත්වා බ්‍යන්තීකරිත්වා අනභාවං ගමෙත්වා තිට්ඨෙය්‍ය සන්තිට්ඨෙය්‍යාති - මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ.

---

1. මාරත්තාතපො - ස්‍යා, PTS. මාරනිවාසො - සිමු II. මජසං.
2. දුක්ඛුද්‍රයො - සිමු. II. මජසං. දුක්ඛද්‍රයො. - ස. දුක්ඛුද්‍රයො - PTS.

a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

3. අසුරොපො - සිමු. II.

b. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ. c. ඛුද්දකවත්ථුවිභඞ්ග.

**කණ්හස්ස පක්ඛොති විනොදයෙය්‍ය** - 'කණ්හ' නම්: යම් ඒ මාරයෙක් කෘෂ්ණයෙක් අධිපතියෙක් අන්ත (-මරණ) යට පමුණුවන්නෙක් නමුචි (-අකුසල් නොහරින්නා) යෙක් ප්‍රමත්තබන්ධුයෙක් වේ ද, හේ යැ. **කණ්හස්ස පක්ඛො** - මාරපාක්ෂයෙක මාරපාශයෙක මාරබලිශයෙක මාරයාගේ ආමිෂයෙක මාරවිෂයෙක මාරනිවාපයෙක මාරයාගේ ගොචරයෙක මාරබන්ධනයෙකැ'යි හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ නුයි මෙසේත් 'කණ්හස්ස පක්ඛොති විනොදයෙය්‍ය' යනු වේ. නොහොත් **කණ්හස්ස පක්ඛො** - මාරපක්ෂයෙහි වූයේ යැ, අකුශලපක්ෂයෙහි වූයේ යැ, දුක් උපදවන්නේ යැ, දුඃඛවිපාක යැ, නිරයෙහි ඉපදීම පිණිස පවත්නේ යැ, තිරිසන්යෝනිහි ඉපදීම පිණිස පවත්නේ යැ, ප්‍රෙතවිෂයෙහි ඉපදීම පිණිස පවත්නේ යැයි හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ නුයි මෙසේත් 'කණ්හස්ස පක්ඛොති විනොදයෙය්‍ය' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**"ථෙය්‍යං න කරෙය්‍ය -පෙ- කණ්හස්ස පක්ඛොති විනොදයෙය්‍ය"යි**

## 16 - 14

ක්‍රොධයාගේ හා අතිමානයාගේ වශයට නො යන්නේ යැ. ඒ ක්‍රොධාතිමානයන්ගේ අවිද්‍යාදි මූලය ද උදුරාපියා සිටිනේ යැ. තවද (සත්ත්ව-සංස්කාර සඞ්ඛ්‍යාත) ප්‍රියවස්තුව ද යළි අප්‍රිය වස්තුව ද මඩිනුයේ ඒකාන්තයෙන් අභිභවනය කරන්නේ යි.

**කොධාතිමානස්ස වසං න ගච්ඡෙ** - 'කොධ' නම්: චිත්තයාගේ යම් ආඝාතයෙක් ප්‍රතිඝාතයෙක්...සැඩබවෙක් නො පිරුණු වචන ඇති බවෙක් චිත්තයාගේ නො සතුටු බවෙක් වේ ද එය යි. **අතිමාන** නම්: මෙහි එකෙක් ජාතියෙන් හෝ ගොත්‍රයෙන් හෝ...අන්‍යතරාන්‍යතර වස්තුවෙකින් හෝ මෙරමා ඉක්මවා සිතයි. **කොධාතිමානස්ස වසං න ගච්ඡෙ** -ක්‍රොධයාගේ ද අතිමානයාගේ ද වශයට නො යන්නේ යැ; ක්‍රොධය ද අතිමානය ද හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ නුයි 'කොධාතිමානස්ස වසං න ගච්ඡෙ' යනු වේ.

**මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ** - ක්‍රොධයාගේ මූලය කවරැ යත්: අවිද්‍යාව මූල යැ, අයොනිසො මනසිකාරය මූල යැ, අස්මිමානය මූල යැ, අහිරිකය මූල යැ, අනොත්තප්පය මූල යැ, ඖද්ධත්‍යය මූල යි. මේ ක්‍රොධයාගේ මූලය යි. අතිමානයාගේ මූලය කවරැ යත්: අවිද්‍යාව මූල යැ, අයොනිසො මනසිකාරය මූල යැ, 'මම වෙමියි' යන මානය මූල යැ, අහිරිකය මූල යැ, අනොත්තප්පය මූල යැ, ඖද්ධත්‍යය මූල යි. මේ අතිමානයාගේ මූලය යි. **මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ** - ක්‍රොධයාගේ ද අතිමානයාගේ ද මුල සාරා උදුරා මොනොවට උදුරා උපුටා මොනොවට උපුටා හැරපියා දුරු කොට විගතාන්ත කොට අනභාවයට පමුණුවා සිටින්නේ යැ, මොනොවට සිටින්නේ නුයි 'මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ' යනු වේ.

**අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍යාති** – 'අථා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරී අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං 'අථා'ති. **පියාති** ද්වෙ පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා පියා: ඉධ යා'ස්ස තෙ හොන්ති අත්ථකාමා හිතකාමා ඵාසුකාමා යොගක්ඛෙමකාමා මාතා වා පිතා වා භාතා වා භගිනී වා පුත්තා වා ධීතා වා මිත්තා වා අමච්චා වා ඤාතී වා සාලොහිතා වා, ඉමෙ සත්තා පියා. කතමෙ සඞ්ඛාරා පියා: මනාපිකා රූපා මනාපිකා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා පියා. **අප්පියාති** ද්වෙ අප්පියා: සත්තා වා සඞ්ඛාරා වා. කතමෙ සත්තා අප්පියා: ඉධ යා'ස්ස තෙ හොන්ති අනත්ථකාමා, අහිතකාමා අඵාසුකාමා අයොගක්ඛෙමකාමා ජීවිතා වොරොපෙතුකාමා. ඉමෙ සත්තා අප්පියා. කතමෙ සඞ්ඛාරා අප්පියා: අමනාපිකා රූපා අමනාපිකා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා, ඉමෙ සඞ්ඛාරා අප්පියා. **අද්ධාති** එකංසවචනං නික්කඞ්ඛවචනං අද්වෙජ්ඣවචනං අද්වෙළ්හකවචනං නියොගවචනං[1] අපණ්ණකවචනං අවත්ථාපනවචනමෙතං 'අද්ධා'ති; **අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍යාති** පියාප්පියං සාතාසාතං සුඛදුක්ඛං සොමනස්සදොමනස්සං ඉට්ඨානිට්ඨං අභිසම්භවන්තො වා අභිභවෙය්‍ය අධිභවන්තො වා අභිභවෙය්‍යාති – අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය.

තෙනාහ භගවා:

"කොධාතිමානස්ස වසං න ගච්ඡෙ
මූලම්පි තෙසං පලිඛඤ්ඤ තිට්ඨෙ,
අථප්පියං වා පන අප්පියං වා
අද්ධා භවන්තො අභිසම්භවෙය්‍යා"ති.

**16 - 15**

පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති
වික්ඛම්භයෙ තානි පරිස්සයානි,
අරතිං සහෙථ සයනම්හි පන්තෙ
චතුරො සහෙථ පරිදෙවධම්මෙ.

**පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීතීති** – 'පඤ්ඤා'ති "යා පඤ්ඤා පජානනා විචයො පවිචයො ධම්මවිචයො –පෙ– අමොහො සම්මාදිට්ඨි.[a] **පඤ්ඤං පුරක්ඛත්වාති** ඉධෙකච්චො පඤ්ඤං පුරතො කත්වා චරති පඤ්ඤාධජො පඤ්ඤාකෙතු පඤ්ඤාධිපතෙය්‍යො විචයබහුලො පවිචයබහුලො පෙක්ඛායන[2] බහුලො සමෙක්ඛායන[3] බහුලො විභූතවිහාරී තච්චරිතො තබ්බහුලො තග්ගරුකො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යොති – එවම්පි පඤ්ඤං පුරක්ඛත්වා.

---

1. නියාණිකවචනං - සීමු II. මජසං.
2. ඔක්ඛායන - සීමු. II. සමොක්ඛායන - සීමු. II. PTS. 3. සමෙපක්ඛායන - මජසං.
a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ.

**අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය** - 'අථ' යනු: පදසන්ධි යැ පදසංසග්ගි යැ පදපාරිපූරි යැ අක්ෂරයන්ගේ සමවාය යැ ව්‍යඤ්ජනයන්ගේ සිලුටුබව යැ පදානුපූර්විතා යැ, මෙල 'අථ' යනු. **පියා** යනු: ප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ. ප්‍රිය සත්ත්වයෝ කවරහ යත්: මෙහි යම් සත්ත්ව කෙනෙක් ඔහුට වැඩ කැමැත්තාහු හිත කැමැත්තාහු සුව කැමැත්තාහු නිර්භය කැමැත්තාහු වෙත් ද, මව හෝ පියා හෝ බෑයා හෝ බූන හෝ පුතා හෝ දුව හෝ යහළුවෝ හෝ සගයෝ හෝ නෑයෝ හෝ සහලේනෑයෝ හෝ යන මේ සත්ත්වයෝ ප්‍රියයෝ යි. ප්‍රියසංස්කාරයෝ කවරහ යත්: මනවඩන රූපයෝ යැ මන වඩන ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යි; මේ සංස්කාරයෝ ප්‍රියයෝ යි. **අප්පියා** යනු: අප්‍රියයෝ දෙදෙනෙකි: සත්ත්වයෝ හෝ සංස්කාරයෝ හෝ යැ. අප්‍රිය සත්ත්වයෝ කවරහ යත්: මෙහි යම් සත්ත්ව කෙනෙක් ඔහුට අවැඩ කැමැත්තාහු අහිත කැමැත්තාහු නොසුව කැමැත්තාහු අයොගක්ෂේමය කැමැත්තාහු දිවි තොර කරනු කැමැත්තාහු වෙද් ද, මේ සත්ත්වයෝ අප්‍රියයෝ යි. අප්‍රිය සංස්කාරයෝ කවරහ යත්: අමනාප වූ රූපයෝ යැ අමනාප වූ ශබ්දයෝ යැ ගන්ධයෝ යැ රසයෝ යැ ස්ප්‍රෂ්ටව්‍යයෝ යැ යන මේ සංස්කාරයෝ අප්‍රියයෝ යි. **අද්ධා** යනු: ඒකාන්ත වචන යැ නිස්සංශය වචන යැ නිසැක වචන යැ අද්වෛධ වචන යැ නිස්සන්දෙහ වචන යැ නියොග වචන යැ අවිරුද්ධ වචන යැ සනාහිටාපන (-නිමවන) වචනයෙකි, මෙල 'අද්ධා' යනු. **අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය** - ප්‍රියාප්‍රියය මධුරාමධුරය සුඛදුඃඛය සොම්නස්දොම්නස ඉෂ්ටානිෂ්ටය මොනොවට මඩිමින් හෝ අභිභවනය කරන්නේ යැ, අතිශයින් මඩිමින් හෝ අභිභවනය කරන්නේ නුයි 'අථප්පියං වා පන අප්පියං වා අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"ක්‍රොධාතිමානස්ස -පෙ- අද්ධා භවන්තො අභිසම්භවෙය්‍ය"යි.

## 16 - 15

(බුද්ධානුස්මෘති ආදීන් ගේ වශයෙන්) කල්‍යාණප්‍රීතියෙන් යුක්ත වූයේ ප්‍රඥව පෙරටු කොට ඒ (ප්‍රකට - ප්‍රතිච්ඡන්න) උපද්‍රවයන් යටපත් කරන්නේ යැ, ප්‍රාන්තශයනාසනයෙහි අරතිය (-නො ඇලීම) මැඩපවත්වන්නේ යැ. චතුර්විධ පරිදෙවධර්මයන් අභිභවනය කරන්නේ යි.

**පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති** - 'පඤ්ඤා' යනු: යම් ප්‍රඥවක් ප්‍රකර්ෂයෙන් දැනීමෙක් විමසීමෙක් ප්‍රකර්ෂයෙන් විමසීමෙක් දහම් විමසීමෙක්... අමොහයෙක් සම්‍යග්දෘෂ්ටියක් වේ ද එය යි. **පඤ්ඤං පුරක්ඛත්වා** - මෙහි කිසිවෙක් ප්‍රඥව පෙරටු කොට හැසිරෙයි, ප්‍රඥව ධ්වජ කොට ඇත්තේ ප්‍රඥව කෙහෙළි කොට ඇත්තේ ප්‍රඥව අධිපති කොට ඇත්තේ විමසීම බහුල කොට ඇත්තේ වෙසෙසින් විමසීම බහුල කොට ඇත්තේ නුවණින් දැකීම බහුල කොට ඇත්තේ සෙවීම බහුල කොට ඇතියේ ප්‍රකට වූ විහරණ ඇතියේ ඒ ප්‍රඥව චරිතය කොට ඇතියේ එය බහුල කොට ඇතියේ එය ගරු කොට ඇතියේ ඊට නැමුණේ ඊට නතු වූයේ ඊට බරවූයේ එහි ඇලුණේ එය අධිපති කොට ඇත්තේ නුයි මෙසේ ද 'පඤ්ඤං පුරක්ඛත්වා' යනු වේ.

අථ වා ගච්ඡන්තො වා ‘ගච්ඡාමී’ති පජානාති; ඨිතො වා ‘ඨිතොම්හී’ති පජානාති, නිසින්නො වා ‘නිසින්නොම්හී’ති පජානාති, සයානො වා ‘සයානොම්හී’ති පජානාති, යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති, තථා තථා නං පජානාතීති එවම්පි පඤ්ඤං පුරක්ඛත්වා. අථවා අභික්කන්තෙ පටික්කන්තෙ සම්පජානකාරී හොති, ආලොකිතෙ විලොකිතෙ සම්පජානකාරී හොති, සමිඤ්ජිතෙ පසාරිතෙ සම්පජානකාරී හොති, සඞ්ඝාටිපත්ත-චීවරධාරණෙ සම්පජානකාරී හොති, අසිතෙ පීතෙ ඛායිතෙ සායිතෙ සම්පජානකාරී හොති, උච්චාරපස්සාවකම්මෙ සම්පජානකාරී හොති, ගතෙ ඨිතෙ නිසින්නෙ සුත්තෙ ජාගරිතෙ භාසිතෙ තුණ්හීභාවෙ සම්පජානකාරී හොතී’ති එවම්පි පඤ්ඤං පුරක්ඛත්වා. කල්‍යාණපීතී’ති බුද්ධානුස්සතිවසෙන උප්පජ්ජති පීතිපාමුජ්ජං කල්‍යාණපීති, ධම්මානුස්සතිවසෙන - සඞ්ඝානුස්සති - සීලානුස්සති - චාගානුස්සති - දෙවතානුස්සති - වෙදනානුස්සති - ආනාපානසති - මරණසති - කායගතාසති - උපසමානුස්සතිවසෙන උප්පජ්ජති පීතිපාමුජ්ජං කල්‍යාණපීතීති - පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති.

**වික්ඛම්භයෙ තානි පරිස්සයානීති** - ‘පරිස්සයා’ති ද්වෙ පරිස්සයා: පාකට-පරිස්සයා ච පටිච්ඡන්නපරිස්සයා ච -පෙ- ඉමෙ වුච්චන්ති පාකටපරිස්සයා. -පෙ- ඉමෙ වුච්චන්ති පටිච්ඡන්නපරිස්සයා -පෙ- එවම්පි තත්‍රාසයාති පරිස්සයා. **වික්ඛම්භයෙ තානි පරිස්සයානීති** තානි පරිස්සයානි වික්ඛම්භෙය්‍ය අභි-භවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති - වික්ඛම්භයෙ තානි පරිස්සයානි.

**අරතිං සහෙථ සයනම්හි පන්තෙති** - ‘අරතී’ති ‘යා අරති අරතිකා අනභිරති අනභිරමණා උක්කණ්ඨිතා[1] පරිතස්සිකා’.[2] **සයනම්හි පන්තෙති** පන්තෙසු වා සෙනාසනෙසු අඤ්ඤතරඤ්ඤතරෙසු ධම්මෙසු අරතිං සහෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති - අරතිං සහෙථ සයනම්හි පන්තෙ.

**චතුරො සහෙථ පරිදෙවධම්මෙති** - චතුරො පරිදෙවනීයෙ ධම්මෙ සහෙය්‍ය පරිසහෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති -චතුරො සහෙථ පරිදෙවධම්මෙ.

තෙනාහ භගවා:

“පඤ්ඤං පුරක්ඛත්වා කල්‍යාණපීති
වික්ඛම්භයෙ තානි පරිස්සයානි,
අරතිං සහෙථ සයනම්හි පන්තෙ
චතුරො සහෙථ පරිදෙවධම්මෙ”ති.

### 16 - 16

කිංසූ අසිස්සං[3] කුවං[4] වා අසිස්සං
දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං,
එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යෙ[5]
විනයෙථ සෙඛො අනිකෙතචාරී.

1 උක්කණ්ඨිකා - PTS උක්කණ්ඨිතත්තා - සිමු. II.
2. පරිතස්සනා - සිමු. II. PTS 3. අසිස්සාමි - සු. ස. PTS.
4. කුහිං - සිමු. II. 5. පරිදෙවනීයෙ - ස. a. බුද්ධකවණ්ණගන්ධෘ.

නොහොත් ඉදිරියට යෙමින් හෝ 'ඉදිරියට යෙමි' දැනගනී, සිටියේ හෝ 'සිටියෙමි .වෙමි' දැනගනී, හුන්නේ හෝ 'හුන්නෙමි වෙමි' දැනගනී, හෝනේ හෝ 'හෝනෙමි වෙමි' දැනගනී, යළි යම් යම් පරිද්දෙකින් හෝ ඔහුගේ කය පිහිටියේ වී නම්, ඒ ඒ පරිද්දෙන් එය දැනගනී නුයි මෙසේත් 'පරිමුඛං පුරක්ඛත්වා' යනු වේ. නොහොත් ඉදිරියට යෑමෙහි ද නැවැත්මෙහි ද නුවණින් දැන කරන්නේ වෙයි, ඉදිරිය බැලීමෙහි හා අවට බැලීමෙහි ද සම්පජානකාරී වෙයි, අතපය දිගුකිරීමෙහි ද හැකිළීමෙහි ද සම්පජානකාරී වෙයි, සඟළ -පා- සිවුරු දැරීමෙහි සම්පජානකාරී වෙයි, වැළැඳීමෙහි පීමෙහි කෑමෙහි රසවිඳීමෙහි සම්පජානකාරී වෙයි, උච්චාර - ප්‍රස්‍රාවකර්මයෙහි සම්පජානකාරී වෙයි, යෑමෙහි සිටීමෙහි හිඳීමෙහි නිදීමෙහි නිදිවැරීමෙහි කිණීමෙහි නො කිණීමෙහි නුවණින් දැන කරන්නේ වේ නුයි මෙසේත් 'පරිමුඛං පුරක්ඛත්වා' යනු වේ. **කල්‍යාණපීති** යනු: බුද්ධානුස්මෘතිවශයෙන් ප්‍රීතිප්‍රාමොද්‍යය, කල්‍යාණපීතිය උපදී. ධර්මානුස්මෘතිවශයෙන් - සංඝානුස්මෘති - ශීලානුස්මෘති - ත්‍යාගානුස්මෘති - දෙවතානුස්මෘති - වෙදනානුස්මෘති - ආනාපානස්මෘති - මරණානුස්මෘති - කායගතස්මෘති උපශමානුස්මෘති වශයෙන් ප්‍රීතිප්‍රාමොද්‍යය කල්‍යාණප්‍රීතිය උපදී නුයි 'පරිමුඛං පුරක්ඛත්වා කල්‍යාණපීති' යනු වේ.

**වික්ඛම්භයෙ තානි පරිස්සයානි** - 'පරිස්සය' නම්: ප්‍රකට පරිශ්‍රයයෝ ද, ප්‍රතිච්ඡන්නපරිශ්‍රයයෝ ද'යි පරිශ්‍රයයෝ දෙදෙනෙකි...මොහු ප්‍රතිච්ඡන්න පරිශ්‍රයයෝ යැයි කියනු ලැබෙත්...මෙසේත් 'තත්‍රාසය' නුයි - පරිශ්‍රය නම් වෙත්. **වික්ඛම්භයෙ තානි පරිස්සයානි** -ඒ උපද්‍රවයන් විෂ්කම්භණය කරන්නේ යැ, මැඩ පවත්වන්නේ යැ, යටපත් කරන්නේ යැ, හාත්පසින් ගන්නේ යැ, මර්දනය කරන්නේ නුයි 'වික්ඛම්භයෙ තානි පරිස්සයානි' යනු වේ.

**අරතිං සහෙථ සයනම්හි පන්තෙ** - 'අරති' යනු: යම් අරතිය (-නො ඇලීමෙ)ක් නො ඇලෙන අයුරෙක් අනභිරතියෙක් අනභිරත්‍යාකාරයෙක් උකටලි බවෙක් තැවෙන අයුරෙක් වේ ද එය යි. **සයනම්හි පන්තෙ** වනසෙනසුන්හි හෝ අන්‍යතරාන්‍යතර කුශලධර්මයන්හි නො ඇලීම නසන්නේ ය, අභිභවනය කරන්නේය, යටපත් කරන්නේය, හාත්පසින් ගන්නේ ය. මඩින්නේ නුයි 'අරතිං සහෙථ සයනම්හි පන්තෙ' යනු වේ.

**චතුරො සහෙථ පරිදෙවධම්මෙ** - චතුර්විධ පරිදෙවනීයධර්මයන් සහනය කරන්නේ යැ, හාත්පසින් සහනය කරන්නේ යැ මැඩපවත්වන්නේ යැ, යටපත් කරන්නේ යැ, හාත්පසින් ගන්නේ යැ, මර්දනය කරන්නේ නුයි 'චතුරො සහෙථ පරිදෙවධම්මෙ' යනු වේ.

එසින් වදාළහ බුදුහු:

**"පන්තම්හි පුරක්ඛත්වා -පෙ- චතුරො සහෙථ පරිදෙවධම්මෙ"යි**

**16 - 16**

කුමක් වළඳම් ද, කොහි හෝ වළඳම් ද, මේ රෑ එකාන්තයෙන් දුකසේ ශයනය කෙළෙමි, අද රෑ කොහි හොවිම් ද, යන වැළැපියයුතු වූ මේ සතර විතර්කයන් අප්‍රතිබාධ වැ හැසිරෙනසුලු ශෛක්‍ෂ තෙමේ දුරුකරන්නේ යි.

**කිං සු අසිස්සං කුවං වා අසිස්සන්ති** - 'කිංසු අසිස්ස'න්ති[1] කිං භුඤ්ජිස්සාමි ඔදනං වා කුම්මාසං වා සත්තුං වා මච්ඡං වා මංසං වාති - කිං සු අසිස්සං. **කුවං වා අසිස්සන්ති** කත්ථ භුඤ්ජිස්සාමි ඛත්තියකුලෙ වා බ්‍රාහ්මණකුලෙ වා වෙස්සකුලෙ වා සුද්දකුලෙ වාති - කිං සු අසිස්සං කුවං වා අසිස්සං.

**දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සන්ති** - ඉමං රත්තිං දුක්ඛං සයිත්ථ ඵලකෙ වා තට්ටිකාය වා චම්මඛණ්ඩෙ වා තිණසන්ථාරෙ වා පණ්ණසන්ථාරෙ වා පලාලසන්ථාරෙ වා, ආගාමිරත්තිං[2] කත්ථ සුඛං සයිස්සාමි මඤ්චෙ වා පීඨෙ වා භිසියා වා බිම්බොහනෙ වා විහාරෙ වා අඩ්ඪයොගෙ වා පාසාදෙ වා හම්මියෙ වා ගුහාය වාති - දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං.

**එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යාති** - 'එතෙ විතක්කෙ'ති ද්වෙ පිණ්ඩපාතපටිසඤ්ඤුත්තෙ විතක්කෙ, ද්වෙ සෙනාසනපටිසඤ්ඤුත්තෙ විතක්කෙ; **පරිදෙවනෙය්‍යාති** ආදෙවනෙය්‍ය පරිදෙවනෙය්‍යාති - එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍ය.

**විනයෙථ සෙඛො අනිකෙතචාරීති** - 'සෙඛො'ති කිං කාරණා වුච්චති සෙඛො? සික්ඛතීති සෙඛො; කිඤ්ච සික්ඛති: අධිසීලම්පි සික්ඛති, අධිචිත්තම්පි සික්ඛති, අධිපඤ්ඤම්පි සික්ඛති. කතමා අධිසීලසික්ඛා? -පෙ- අයං අධිපඤ්ඤාසික්ඛා. ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛති, ජානන්තො - පස්සන්තො - පච්චවෙක්ඛන්තො - චිත්තං අධිට්ඨහන්තො සික්ඛති, සද්ධාය අධිමුච්චන්තො සික්ඛති, විරියං පග්ගණ්හන්තො - සතිං උපට්ඨපෙන්තො - චිත්තං සමාදහන්තො - පඤ්ඤාය පජානන්තො සික්ඛති. අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො සික්ඛති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො - පහාතබ්බං පජහන්තො - භාවෙතබ්බං භාවෙන්තො - සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛති, ආචරති සමාචරති සමාදාය සික්ඛති. තං කාරණා වුච්චති සෙඛො. සෙඛො විනයාය පටිවිනයාය පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිප්පස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය, ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය, ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති - විනයෙථ සෙඛො. **අනිකෙතචාරීති** කථං නිකෙතචාරී හොති: ඉධෙකච්චො කුලපලිබොධෙන සමන්නාගතො හොති, ගණපලිබොධෙන - ආවාසපලිබොධෙන - චීවරපලිබොධෙන - පිණ්ඩපාතපලිබොධෙන - සෙනාසනපලිබොධෙන - ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරපලිබොධෙන සමන්නාගතො හොති. එවං නිකෙතචාරී හොති. කථං අනිකෙතචාරී හොති: ඉධ භික්ඛු න කුලපලිබොධෙන සමන්නාගතො න ගණ- න ආවාස - න චීවර - න පිණ්ඩපාත - න සෙනාසන - න ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරපලිබොධෙන සමන්නාගතො හොති. එවං අනිකෙතචාරී හොති.

1. අසිස්සාමීති - සීමු. II. 2 ආගමිකරත්තිං - සයා PTS.

**කිං සු අසිස්සං කුවං වා අසිස්සං** – 'කිං සු අසිස්සං' යනු: කුමක් වළඳම් ද, බත් හෝ කොමු හෝ හත්වට හෝ මාළු හෝ මස් හෝ යැයි 'කිං සු අසිස්සං' යනු වේ. **කුවං වා අසිස්සං** යනු: කොහි වළඳම් ද ක්ෂත්‍රියකුලයෙහි හෝ බ්‍රාහ්මණකුලයෙහි හෝ වෛශ්‍යකුලයෙහි හෝ ශුද්‍රකුලයෙහි හෝ යැයි 'කිං සු අසිස්සං කුවං වා අසිස්සං' යනු වේ.

**දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං** – මේ රෑ දුකසේ ශයනය කෙළෙම්, පුවරුයෙහි හෝ තට්ටිකාවෙහි හෝ සම්කඩෙහි හෝ තණඇතිරියෙහි හෝ පත්ඇතිරියෙහි හෝ පිදුරුඇතිරියෙහි හෝ යෑ; අද පැමිණෙන රෑ කොහි සුවසේ හොවිම් ද; ඇඳෙක හෝ පුටුවෙක හෝ බිස්සෙක හෝ බිම්බෝහනයෙක හෝ විහාරයෙක හෝ ගුරුළුවක්ගෙයෙක හෝ පහයෙක හෝ සඳලුගෙයෙක හෝ ගුහාවෙක හෝ යැයි 'දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං' යනු වේ.

**එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යො** – 'එතෙ විතක්කෙ' යනු: පිණ්ඩපාත ප්‍රතිසංයුක්ත වූ විතර්ක දෙක යෑ, සේනාසනප්‍රතිසංයුක්ත වූ විතර්ක දෙක යි. **පරිදෙවනෙය්‍යො** යනු: වැලැපියයුතු හාත්පසින් වැලැපියයුත්තේ නුයි 'එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යො' යනු වේ.

**විනයෙථ සෙඛො අනිකෙතචාරී** – 'සෙඛො' යනු: කවර කරුණෙකින් 'සෙඛ'යි කියනු ලැබේ ද යත්: හික්මේ නුයි 'සෙඛ' යෑ. කුමක් හික්මෙයි යත්: අධිශීලයෙහි ද හික්මෙයි, අධිචිත්තයෙහි ද හික්මෙයි, අධිප්‍රඥාවෙහි ද හික්මෙයි. අධිශීලශික්ෂා කවර යත්...මේ අධිප්‍රඥාශික්ෂා යි. මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙයි, දැනගනිමින් – නුවණින් දකිමින් – ප්‍රත්‍යවේක්ෂා කෙරෙමින් – සිත්හි පිහිටුවමින් හික්මෙයි, සැදැහැයෙන් නිශ්චයට පැමිණෙමින් හික්මෙයි, වීර්‍ය්‍ය දැඩි ව ගනිමින් – සිහි එළවමින් – සිත පිහිටුවමින් – ප්‍රඥාවෙන් දැනගනිමින් හික්මෙයි, ස්වභාවලක්ෂණවශයෙන් වෙසෙසින් දතයුත්ත දැනගනිමින් හික්මෙයි, සාමාන්‍යලක්ෂණවශයෙන් ව්‍යාප්ත කොට දතයුත්ත හාත්පසින් දැනගනිමින් – ප්‍රහීණ කළයුත්ත ප්‍රහීණ කෙරෙමින්–වැඩියැ යුත්ත වඩමින්–ප්‍රත්‍යක්ෂ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙයි, හැසිරෙයි මොනොවට හැසිරෙයි සමාදන් වැ හික්මෙයි. එකරුණෙන් 'සෙඛ'යි කියනු ලැබේ. ශෛක්ෂ තෙමේ (කෙලෙසුන්ගේ) විනය පිණිස දුරුකිරීම පිණිස ප්‍රහාණය පිණිස සන්සිඳීම පිණිස දුරුළීම පිණිස පරිත්‍යාගය පිණිස අධිශීලයෙහි ද හික්මෙන්නේ යෑ, අධිචිත්තයෙහි ද හික්මෙන්නේ ය, අධිප්‍රඥාවෙහි ද හික්මෙන්නේ ය; මේ ත්‍රිවිධශික්ෂාවන් ආවර්ජන කෙරෙමින් හික්මෙන්නේ යෑ, දැනගනිමින්...ප්‍රත්‍යක්ෂ කළයුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙන්නේ යෑ, හැසිරෙන්නේ යෑ, මොනොවට හැසිරෙන්නේ යෑ, සමාදන් වැ පවත්නේ නුයි 'විනයෙථ සෙඛො' යනු වේ. **අනිකෙතචාරී** යනු: කිසෙසින් නිකේතචාරී වේ ද යත්: මෙහි කිසිවෙක් කුලපලිබොධයෙන් යුක්ත වූයේ වේ ද; ගණපලිබොධයෙන් – ආවාසපලිබොධයෙන් – චීවරපලිබොධයෙන් – පිණ්ඩපාතපලිබොධයෙන් – සේනාසනපලිබොධයෙන් – ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාර පලිබොධයෙන් යුක්ත වූයේ වේ ද, මෙ පරිද්දෙන් 'නිකේතචාරී' වේ. කිසෙසින් 'අනිකේතචාරී' වේ ද යත්: මෙ සස්නෙහි මහණ තෙමේ කුලපලිබොධයෙන් යුක්ත වූයේ නො වේ ද, ගණ – ආවාස – චීවර – පිණ්ඩපාත – සේනාසන – ගිලන්පස බෙහෙත්පිරිකර පිළිබඳ පලිබොධයෙන් යුක්ත වූයේ නො වේ ද, මෙසේ 'අනිකේතචාරී' වේ.

1. "මගධං ගතා කොසලං ගතා
එකච්චියා පන වජ්ජිභූමියා[1],
මිගා විය[2] අසඞ්ගචාරිනො[3]
අනිකෙතා විහරන්ති භික්ඛවො.[a]

2. සාධු චරිතකං[4] සාධු සුචරිතං
සාධු සදා අනිකෙතවිහාරො,
අත්ථපුච්ඡනං පදක්ඛිණකම්මං
එතං සාමඤ්ඤං අකිඤ්චනස්සා"ති[b]

විනයෙථ සෙඛො අනිකෙතචාරී.

තෙනාහ භගවා:

"කිං සු අසිස්සං කුවං වා අසිස්සං
දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ සෙස්සං,
එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යෙ
විනයෙථ සෙඛො අනිකෙතචාරී"ති.

## 16 - 17

අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ
මත්තං සො ජඤ්ඤා ඉධ තොසනත්ථං,
සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ
රුසිතොපි වාචං ඵරුසං න වජ්ජා.

**අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙති** – 'අන්න'න්ති ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං; **වසනන්ති** – ඡ චීවරානි: ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භඞ්ගං; **අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙති** – චීවරං ලභිත්වා පිණ්ඩපාතං ලභිත්වා, න කුහනාය න ලපනාය න නෙමිත්තිකතාය න නිප්පෙසිකතාය න ලාභෙන ලාභං නිජිගිංසනතාය න දාරුදානෙන න වෙළුදානෙන න පත්තදානෙන න පුප්ඵදානෙන න ඵලදානෙන න සිනානදානෙන න චුණ්ණදානෙන න මත්තිකාදානෙන න දන්තකට්ඨදානෙන න මුඛොදකදානෙන න චාටුකම්‍යතාය න මුග්ගසූපතාය න පාරිභට්ටතාය න පීඨමද්දිකතාය න වත්ථුවිජ්ජාය න තිරච්ඡානවිජ්ජාය න අඞ්ගවිජ්ජාය න නක්ඛත්තවිජ්ජාය න දූතගමනෙන න පහිණගමනෙන න ජඞ්ඝපෙසනියෙන න වෙජ්ජකම්මෙන න පිණ්ඩපටිපිණ්ඩකෙන න දානානුප්පදානෙන ධම්මෙන සමෙන ලද්ධා ලභිත්වා අධිගන්ත්වා වින්දිත්වා පටිලභිත්වාති – අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ.

**මත්තං සො ජඤ්ඤා ඉධ තොසනත්ථන්ති** – 'මත්තං සො ජඤ්ඤා'ති ද්වීහි කාරණෙහි මත්තං ජානෙය්‍ය; පටිග්ගහණතො වා පරිභොගතො වා. කථං පටිග්ගහණතො මත්තං ජානාති? ථොකෙපි දිය්‍යමානෙ කුලානුද්දයාය කුලානුරක්ඛාය කුලානුකම්පාය පටිග්ගණ්හාති. බහුකෙපි දිය්‍යමානෙ කායපරිහාරිකං චීවරං පටිග්ගණ්හාති, කුච්ඡිපරිහාරිකං පිණ්ඩපාතං පටිග්ගණ්හාති. එවං පටිග්ගහණතො මත්තං ජානාති.

---

1. වජ්ජභූමියා - සීමු. II. 2. මගකා විය - සයා.
3. සඞ්ගචාරිනො - සයා මාගධාවිසඞ්ගචාරිනො - PTS.
4. චරිතං - සයා, PTS. a. විනයසංයුත්ත. b. කුමාපුත්තථෙරගාථා.

1. (ඒ භික්ෂූහු) කිසිකෙනෙක් මගධරටට ගියාහු ය, කොසොල්රටට ගියාහු ය. යළි කිසි කෙනෙක් වැදූරටට අභිමුඛ ව ගියාහු ය. කිසිකෙනෙක් ගුම් මැ තැනෙකැ නො ඇලී හැසිරෙන මුවන් මෙන් ගෘහපරිරොධ රහිත වැ වෙසෙත්.

2. අලොපවඡ්ජතාදි චරිතය මැනැව. සුචරිතය මැනැව. හියලු කල්හි පඤ්චකාමගුණනිකෙත රහිත වූ විහරණය මැනැව. අඩී විචාරීම ද අවවාදය ආදර කොට ගැනීම ද මැනව. තෙල කියාවන රහිත වූවහුගේ ශ්‍රමණ බව වේ.

'විනයෙථ සෙබො අනිකෙතචාරී' යනු වේ.

එහින් වදාළහ බුදුහු:

**"කිං සු අසියං -පෙ- විනයෙථ සෙබො අනිකෙතචාරී"** යි.

**16 – 17**

මේ ශාසනයෙහි ඒ මහණ තෙමෙ (සිහායන) කාලයෙහි පිණ්ඩපාත සඞ්ඛ්‍යාත ආහාරය ද චීවර සඞ්ඛ්‍යාත වස්ත්‍රය ද ලැබ ඉතරෙතරප්‍රත්‍යය-සන්තොෂය සඳහා (පටිග්ගහනපරිභොගයෙහි) පමණ දන්නේ යැ. හෙ තෙමේ ඒ ප්‍රත්‍යයන්හි සංවර වූයේ ගම්හි සංවර වැ හැසිරෙනුයේ මෙරමා විසින් ගටන ලදුයේ නමුදු පරුෂවචන නො කියන්නේ යි.

**අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ** – 'අන්නං' යනු: බත් කොමුපිඩු හත්වට මාළු මස් යන මේ යි. **වසනං** යනු: ෂට් චීවරයෝ යැ: කොමුපිළී කපු-පිළී තිහිරිපිළී කම්බලපිළී සණපිළී මුසුපිළී යැ. **අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ** – සිවුරු ලැබ පිණ්ඩපාතය ලැබ, විසමය කරවීමෙන් නො වැ උසස් කොට කීණීමෙන් නො වැ නිමිති කරන බැවින් නො වැ මෙරමා ගුණ නසන බැවින් නො වැ ලාභයෙන් ලාභ සොයන බැවින් නො වැ දුව දීමෙන් නො වැ හුණුදඬු දීමෙන් නො වැ (තල් ආදි) පත්‍රදානයෙන් නො වැ පුෂ්ප දානයෙන් නො වැ ඵලදානයෙන් නො වැ නහනු දීමෙන් නො වැ සුණු දීමෙන් නො වැ මැටි දීමෙන් නො වැ දැහැටිදඬු දීමෙන් නො වැ මුව දෝනා දිය දීමෙන් නො වැ චාටුබස් කියන බැවින් නො වැ මුද්ග-සූපයක් වැනි වීමෙන් නො වැ (දරුවන් වැඩීමාදි) පරිභටභාවයෙන් නො වැ මෙරමා පිටුමස් කනබැවින් නො වැ වාස්තුවිද්‍යායෙන් නො වැ තිරශ්චීන-විද්‍යාවෙන් නො වැ අඞ්ගවිද්‍යාවෙන් නො වැ නක්ෂත්‍රවිද්‍යාවෙන් නො වැ දූතමෙහෙවරින් නො වැ පතිවුඩ ගෙනයෑමෙන් නො වැ පාමෙහෙවරින් නො වැ වෙදකමින් නො වැ පිණ්ඩප්‍රතිපිණ්ඩකයෙන් නො වැ දානානු-ප්‍රදානයෙන් නො වැ දැහැමින් සෙමෙන් ලැබ, ලබා, පැමිණ, විඳ, ප්‍රතිලාභ කොට තුයි 'අන්නඤ්චලද්ධා වසනඤ්ච කාලෙ' යනු වේ.

**මත්තං ස ජඤ්ඤා ඉධ තොසනත්ථං** – 'මත්තං ස ජඤ්ඤා' යනු: දෙ කරුණෙකින් පමණ දන්නේ යැ: ප්‍රතිග්‍රහණ හෙයින් හෝ පරිභොග හෙයින් හෝ යැ. කිසෙයින් ප්‍රතිග්‍රහණ හෙයින් මාත්‍රඥ වේ ද යත්: මඳක් නමුදු දෙනු ලබන කල්හි කුලයන්ට කරුණා සඳහා කුලයන් රක්නා සඳහා කුලයන්ට අනුකම්පා සඳහා පිළිගනී ද, බොහෝවකුදු දෙනු ලබන කල්හි කයට ගෙහෙන පමණ සිවුරු පිළිගනී ද, කුසට යැපෙන පමණ පිණ්ඩපාතය පිළිගනී ද, මෙසේ ප්‍රතිග්‍රහණ හෙයින් මාත්‍රඥ වේ.

කථං පරිභොගතො මත්තං ජානාති? පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවති: යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව හිරිකොපීනපටිච්ඡාදනත්ථං. පටිසඞ්ඛා යොනිසො පිණ්ඩපාතං පටිසෙවති: නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො ච. පටිසඞ්ඛා යොනිසො සෙනාසනං පටිසෙවති: යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසිරිංසපසම්ඵස්සානං පටිඝාතාය, යාවදෙව උතුපරිස්සයවිනොදනං පටිසල්ලානාරාමත්ථං. පටිසඞ්ඛා යොනිසො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවති: යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතාය. එවං පරිභොගතො මත්තං ජානාති. මත්තං ස ජඤ්ඤාති – ඉමෙහි ද්වීහි කාරණෙහි මත්තං ජානෙය්‍ය ආජානෙය්‍ය පටිවිජානෙය්‍ය පටිවිජ්ඣෙය්‍යාති – මත්තං ස ජඤ්ඤා.

**ඉධ තොසනම්පීති** "ඉධ භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච චීවරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච චීවරං න පරිතස්සති, ලද්ධා ච චීවරං අගථිතො[1] අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති, තාය ච පන ඉතරීතරචීවරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං[2] වම්භෙති. යො[3] හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො,[4] අයං වුච්චති භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො. පුන ච පරං භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන පිණ්ඩපාතෙන, ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච පිණ්ඩපාතහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච පිණ්ඩපාතං න පරිතස්සති, ලද්ධා ච පිණ්ඩපාතං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති; තාය ච පන ඉතරීතරපිණ්ඩපාතසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො,[4] අයං වුච්චති භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො. පුන ච පරං භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන සෙනාසනෙන, ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච සෙනාසනහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච සෙනාසනං න පරිතස්සති, ලද්ධා ච සෙනාසනං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තාය ච පන ඉතරීතරසෙනාසනසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති.

---

1. අගධිතො - සිමු II මජසං. 2. න පරං - සිමු. II.
3. සො - අභි. 4. පටිස්සතො, සිමු. II. මජසං.

කිසෙයිත් පරිභොග හෙයින් මාත්‍රඥ වේ ද යත්: නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට සිවුරු පරිභොග කෙරෙයි: ශීත නසනු පිණිස උෂ්ණ නසනු පිණිස මැසි මදුරු වා අව් දිග්දූපහස් නසනු පිණිස මැ යැ, ලජ්ජාකොපනය මුවහ කරනු පිණිස මැ යි. නුවණින් විමසා පිණ්ඩපාතය වළඳයි: කෙළි පිණිස නො වළඳයි, මද පිණිස නො වළඳයි, අලඞ්කාර පිණිස නො වළඳයි, සැරැසුම් පිණිස නො වළඳයි, මේ සිරුර පවත්නා සඳහා යැපීම පිණිස බඩගිනිවේදනා නසනු පිණිස බඹසරට අනුග්‍රහ පිණිස මැ යැ. මෙසේ පැරණි බඩගිනි වේදනා ත් නසමි, අලුත් වේදනා ත් නූපදවමි, මාගේ ජීවිතයාත්‍රාව ද අනවද්‍යභාව ද එයසුවිහරණය ද වන්නේ යයි. නුවණින් විමසා සෙනසුන් සෙවන කෙරෙයි: ශීත නසනු පිණිස උෂ්ණ නසනු පිණිස මැසි මදුරු වා අව් දිග්දූපහස් නසනු පිණිස මැ යැ, ඍතුපීඩා නසනු පිණිස හා විවෙකසුව පිණිස මැයි. නුවණින් ප්‍රත්‍යවෙක්ෂා කොට ගිලන්පස බෙහෙසත් පිරිකර වළඳ කරයි: රොගපීඩාවෙන් උපන් වේදනා වන් නසනු පිණිස නිදුක් පරමබව පිණිස මැයි. මෙසේ පරිභොග හෙයින් මාත්‍රඥ වේ. **මත්තං ස ජඤ්ඤා** – මේ දෙ කරුණෙන් පමණ දන්නේ යැ, හාත්පසින් දන්නේ යැ වෙසෙසින් දන්නේ යැ අවබොධ කරන්නේ නුයි 'මත්තං ස ජඤ්ඤා' යනු වේ.

**තුට්ඨ සොසන්තෝ** යනු: මෙහි මහණ තෙමේ ඉතරේතර චීවරයෙන් සතුටු වූයේ වෙයි, ඉතරෙතර චීවරසන්තොෂයාගේ ගුණ කියනසුලු වූයේත් වේ, චීවරහෙතුයෙන් අයුතු වූ අනෙසනයට නො ද පැමිණෙයි, සිවුරු නො ලැබ ද පීඩාවට නො පැමිණෙයි, සිවුරු දැහැමින් සෙමෙන් ලැබ ද (ලොභයෙන්) නො ගෙතුණේ නො මුසපත් වූයේ තෘෂ්ණායෙන් නො වැතුරුණේ ආදීනව දක්නාසුලු වූයේ නිස්සරණප්‍රඥාවෙන් යුක්ත වැ පරිභොග කෙරෙයි. තවද ඒ ඉතරෙතරචීවරසන්තොෂය හෙතු කොටගෙන නො මැ ආත්මොත්කර්ෂණ කෙරෙයි, පරවම්භනය නො කෙරේ. තවද යම් මහණෙක් ඒ චීවරසන්තොෂයෙහි දක්ෂ වූයේ අනලස වූයේ සම්‍යක්ප්‍රඥාවෙන් යුක්ත වූයේ සිහි ඇතියේ වේ ද, මේ මහණ තෙමෙ පැරණි වූ ද අග්‍ර යයි දතයුතු වූ ද ආර්‍යවංශයෙහි සිටියේ වේ. නැවැත ද මහණ තෙමේ ඉතරෙතර පිණ්ඩපාතයෙන් සතුටු වූයේ වෙයි, ඉතරෙතර පිණ්ඩපාතසන්තොෂයෙහි ගුණ කියනසුලු වූයේ ත් වෙයි, පිණ්ඩපාතය නිසා අයුතු වූ අනෙසනයට නො ද පැමිණෙයි, පිණ්ඩපාතය නො ලැබ ද නො තැවෙයි, පිණ්ඩපාතය ලැබ ද නො ගෙතුණේ නො මුසපත් වූයේ නො මඩනා ලදුයේ ආදීනව දක්නාසුලු වූයේ නිස්සරණප්‍රඥාවෙන් යුක්ත වැ පරිභොග කෙරෙයි. තවද ඒ ඉතරෙතරපිණ්ඩපාතසන්තොෂය හෙතු කොටගෙන නො මැ ආත්මොත්කර්ෂණය කෙරෙයි, පරවම්භනය නො කෙරේ. තවද යමෙක් ඒ පිණ්ඩපාතසන්තොෂයෙහි දක්ෂ වූයේ අලස නො වූයේ නුවණැතියේ සිහි ඇතියේ වේ ද, මේ මහණ තෙමේ පෞරාණික වූ අග්‍රගණ්‍ය වූ ආර්‍යවංශයෙහි සිටියේ යයි කියනු ලැබේ. නැවැත ද මහණ තෙමේ ඉතරෙතර සෙනාසනයෙන් සතුටු වූයේ වෙයි, ඉතරෙතර සෙනාසනසන්තොෂයෙහි ගුණ කියනසුලු වූයේත් වෙයි, සෙනාසනය නිසා අයුතු වූ අනෙසනයට නො ද පැමිණෙයි, සෙනසුන් නො ලැබ ද නො තැවෙයි, යළි සෙනසුන් ලබා නො ගෙතුණේ නො මුසපත් වූයේ නො මඩනා ලදුයේ ආදීනව දක්නාසුලු වූයේ නිස්සරණප්‍රඥාවෙන් යුක්ත වැ පරිභොග කෙරෙයි, තවද ඒ ඉතරෙතර සෙනාසනසන්තොෂය හෙතු කොටගෙන නො මැ ආත්මොත්කර්ෂණය කෙරෙයි, පරවම්භනය නො කෙරේ.

යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො,[1] අයං වුච්චති භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො. පුන ච පරං භික්ඛු සන්තුට්ඨො හොති ඉතරීතරෙන ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙන ඉතරීතරගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං න පරිතස්සති, ලද්ධා ච ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නො ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤො පරිභුඤ්ජති. තාය ච පන ඉතරීතරගිලාන-පච්චයභෙසජ්ජපරික්ඛාරසන්තුට්ඨියා නෙවත්තානුක්කංසෙති, නො පරං වම්භෙති. යො හි තත්ථ දක්ඛො අනලසො සම්පජානො පතිස්සතො[1] අයං වුච්චති භික්ඛු පොරාණෙ අග්ගඤ්ඤෙ අරියවංසෙ ඨිතො"[a]ති – මත්තං ස ජඤ්ඤා ඉධ තොසනත්ථං.

**සො තෙසු ගුත්තො යතචාරි ගාමෙති** – 'සො තෙසු ගුත්තො'ති චීවරෙ පිණ්ඩපාතෙ සෙනාසනෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරෙ ගුත්තො ගොපිතො රක්ඛිතො සංවුතොති එවම්පි සො තෙසු ගුත්තො. අථවා ආයතනෙසු ගුත්තො ගොපිතො රක්ඛිතො සංවුතොති එවම්පි සො තෙසු ගුත්තො. යතචාරි ගාමෙති – ගාමෙ යත්තො යතත්තො[2] පටියත්තො[3] ගුත්තො ගොපිතො රක්ඛිතො සංවුතොති – සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ.

**රුසිතොපි වාචං ඵරුසං න වජ්ජාති** – රුසිතො ඛුංසිතො වම්භිතො ඝට්ටිතො ගරහිතො උපවදිතො ඵරුසෙන කක්ඛළෙන නප්පටිවජ්ජා, නප්පටිභණෙය්‍ය, අක්කොසන්තං න පච්චක්කොසෙය්‍ය, රොසන්තං නප්පටි-රොසෙය්‍ය, භණ්ඩන්තං නප්පටිභණ්ඩෙය්‍ය, න කලහං කරෙය්‍ය, න භණ්ඩනං කරෙය්‍ය, න විග්ගහං කරෙය්‍ය, න විවාදං කරෙය්‍ය, න මෙධගං කරෙය්‍ය, කලහං භණ්ඩනං විග්ගහං විවාදං මෙධගං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තී-කරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. කලහභණ්ඩනවිග්ගහවිවාදමෙධගා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍යාති – රුසිතොපි වාචං ඵරුසං න වජ්ජා.

තෙනාහ භගවා:

"අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ
මත්තං ස ජඤ්ඤා ඉධ තොසනත්ථං,
සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ
රුසිතොපි වාචං ඵරුසං න වජ්ජා"ති.

---

1. පටිස්සතො - සීමු II මජසං  2. යතො - සීමු II මජසං PTS.
3. පටියතො - සීමු II මජසං. PTS.
a. චතුක්කඅඞ්ගුත්තර - උරුවෙලවග්ග; දීඝනිකාය - සඞ්ගීතිසුත්ත

යමෙක් එ මැ සේනාසනසන්තොෂයෙහි දක්‍ෂ වූයේ නො ලස් වූයේ නුවණැතියේ සිහි ඇතියේ වේ ද, මේ මහණ තෙමේ පෞරාණික වූ අග්‍රගණ්‍ය වූ ආර්‍යවංශයෙහි සිටියේ යයි කියනු ලැබේ. නැවැත ද මහණ තෙමේ ඉතරීතර ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරයෙන් සතුටු වූයේ වෙයි. ඉතරෙතර ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යසන්තොෂයෙහි ගුණ කියනසුලු වූයේත් වෙයි. ගිලන්පස බෙහෙසත් පිරිකරහෙතුයෙන් අයුතු වූ අනෙසනයට නො ද පැමිණෙයි. ගිලන්පස බෙහෙසත්පිරිකර නො ලැබ ද නො තැවෙයි. ගිලන්පස බෙහෙසත් පිරිකර ලැබ ද නො ගෙතුණේ නො මුසපත් වූයේ නො මඩනා ලදූයේ ආදීනව දක්නාසුලු වූයේ නිස්සරණප්‍රඥා ඇති ව වළඳයි. තව ද ඒ ඉතරෙතරග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරසන්තො-ෂය හෙතු කොටගෙන නො මැ ආත්මොත්කර්‍ෂණය කෙරෙයි, පරම්භනය නො කෙරේ. යමෙක් එමැ ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරසන්තොෂයෙහි දක්‍ෂ වූයේ අනලස් වූයේ නුවණැතියේ සිහි ඇතියේ වේ ද, මේ මහණ තෙමේ පෞරාණික වූ අග්‍ර යයි දත්නා ලද ආර්‍යවංශයෙහි සිටියේ යයි කියනු ලැබේ නුයි 'මත්තං ස ජඤ්ඤා ඉධ තොසනත්ථං' යනු වේ.

**සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ** – 'සො තෙසු ගුත්තො' යනු: සිවුරු පිඬුවා සෙනසුන් ගිලන්පස බෙහෙසත්පිරිකරෙහි පිහිත වූයේ ගොපිත වූයේ රැකුණේ සංවර වූයේ නුයි මෙසේත් 'සො තෙසු ගුත්තො' යනු වේ. නොහොත් ආයතනයන්හි පිහිත වූයේ ගොපිත වූයේ රක්‍ෂිත වූයේ සංවර වූයේ නුයි මෙසේත් 'සො තෙසු ගුත්තො' යනු වේ. යතචාරි ගාමෙ යනු: ගම්හි සංයත වූයේ සංයත වූ සිත් ඇතියේ අතිශයින් සංයත වූ සිත් ඇතියේ පිහිත වූයේ ගොපිත වූයේ රක්‍ෂිත වූයේ සංවර වූයේ නුයි 'සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ' යනු වේ.

**රුසිතො පි වාචං ඵරුසං න වජ්ජා** – කොප කරන ලදූයේ ආක්‍රොශ කරන ලදූයේ අවමන් කරන ලදූයේ ගටන ලදූයේ ගරහන ලදූයේ නුගුණ කියන ලදූයේ පරුෂ වූ කර්කශ වූ වචනයෙන් පෙරළා නො කියන්නේ යැ, පෙරළා නො බණන්නේ යැ, ආක්‍රොශ කරන්නහුට ප්‍රත්‍යාක්‍රොශ නො කරන්නේ යැ, කොප කරන්නහුට ප්‍රතිකොප නො කරන්නේ යැ, ඩබර කරන්නහුට පෙරළා ඩබර නො කරන්නේ යැ, කලහ නො කරන්නේ යැ, ඩබර නො කරන්නේ යැ, විග්‍රහ නො කරන්නේ යැ, විවාද නො කරන්නේ යැ, හිංසා නො කරන්නේ යැ, කලහ භණ්ඩන විග්‍රහ විවාද මේධගය හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරන්නේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ. කලහ – භණ්ඩන – විග්‍රහ – විවාද – මේධගයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ නො යෙදුණේ වන්නේ යැ, විගතමර්‍යාදා කළ සිතින් යුක්ත වැ වාසය කරන්නේ නුයි 'රුසිතො පි වාචං ඵරුසං වජ්ජා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අන්නානඤ්ච ලද්ධා -පෙ- රුසිතො පි වාචං ඵරුසං න වජ්ජා"යි.**

## 16 - 18

ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො
ඣානානුයුත්තො බහුජාගරස්ස,
උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො
තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙ[1].

**ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලොති** - කථං ඛිත්තචක්ඛු හොති: "ඉධෙකච්චො භික්ඛු චක්ඛුලොලො චක්ඛුලොලියෙන සමන්නාගතො හොති: 'අදිට්ඨං දක්ඛිතබ්බං දිට්ඨං සමතික්කමිතබ්බ'න්ති ආරාමෙන ආරාමං උය්‍යානෙන උය්‍යානං ගාමෙන ගාමං නිගමෙන නිගමං නගරෙන නගරං රට්ඨෙන රට්ඨං ජනපදෙන ජනපදං දීඝචාරිකං අනිවත්තචාරිකං අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි ඛිත්තචක්ඛු හොති. අථවා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො අසංවුතො ගච්ඡති: හත්ථිං ඔලොකෙන්තො අස්සං ඔලොකෙන්තො රථං ඔලොකෙන්තො පත්තිං ඔලොකෙන්තො ඉත්ථියො ඔලොකෙන්තො පුරිසෙ ඔලොකෙන්තො කුමාරකෙ ඔලොකෙන්තො කුමාරිකායො ඔලොකෙන්තො අන්තරාපණං ඔලොකෙන්තො ඝරමුඛානි ඔලොකෙන්තො උද්ධං ඔලොකෙන්තො අධො ඔලොකෙන්තො දිසාවිදිසං පෙක්ඛමානො ගච්ඡති, එවම්පි 'ඛිත්තචක්ඛු' හොති. අථවා භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහී හොති අනුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය න පටිපජ්ජති, න රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ න සංවරං ආපජ්ජති. එවම්පි ඛිත්තචක්ඛු හොති. යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා තෙ එවරූපං විසූකදස්සනං අනුයුත්තා විහරන්ති. සෙය්‍යථීදං: නච්චං ගීතං වාදිතං පෙක්ඛං අක්ඛාතං පාණිස්සරං වෙතාලං කුම්භථූනං සොභනගරකං[2] චණ්ඩාලං වංසං ධොවනං හත්ථියුද්ධං අස්සයුද්ධං මහිංසයුද්ධං උසභයුද්ධං ගොයුද්ධං අජයුද්ධං මෙණ්ඩයුද්ධං කුක්කුටයුද්ධං වට්ටකයුද්ධං දණ්ඩයුද්ධං මුට්ඨියුද්ධං නිබ්බුද්ධං උය්‍යොධිකං බලග්ගං සෙනාබ්‍යූහං අණීකදස්සනං ඉති වා. එවම්පි ඛිත්තචක්ඛු හොති.

කථං න ඛිත්තචක්ඛු හොති: "ඉධෙකච්චො භික්ඛු න චක්ඛුලොලො න චක්ඛුලොලියෙන සමන්නාගතො හොති. 'අදිට්ඨං දක්ඛිතබ්බං දිට්ඨං සමතික්කමිතබ්බ'න්ති න ආරාමෙන ආරාමං න උය්‍යානෙන උය්‍යානං න ගාමෙන ගාමං න නිගමෙන නිගමං න නගරෙන නගරං න රට්ඨෙන රට්ඨං න ජනපදෙන ජනපදං දීඝචාරිකං අනිවත්තචාරිකං අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි න ඛිත්තචක්ඛු හොති. අථවා භික්ඛු අන්තරඝරං පවිට්ඨො වීථිං පටිපන්නො සංවුතො ගච්ඡති: න හත්ථිං ඔලොකෙන්තො -පෙ- න දිසාවිදිසං පෙක්ඛමානො ගච්ඡති. එවම්පි න ඛිත්තචක්ඛු හොති. අථවා භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති -පෙ- චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවම්පි න ඛිත්තචක්ඛු හොති.

---

1. කුක්කුච්චිඤ්චුපච්ඡින්දෙ - සෑ, PTS. 2. සොභනකං - මජසං,

## 16 - 18

යට බලා හෙළූ ඇස් ඇතියේ නො ද පාදලෞල්‍යයෙන් යුක්ත වූයේ ධ්‍යානයෙහි යෙදුණේ බොහෝ කොට නිදිමැරීමෙන් යුක්ත වූයේ වන්නේ යැ. චතුර්ථධ්‍යානොපෙක්‍ෂාව උපදවා එකඟ වූ සිත් ඇතියේ කාමාදි විතර්කය හා විතර්කාශ්‍රය ද කෞකෘත්‍යය ද සිඳින්නේ යි.

ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො - කිසෙසින් 'ඛිත්තචක්ඛු' වේ ද යත්: මෙහි කිසි මහණෙක් (සක්දෙර උපන් ලොභ විසින්) ඇසින් ලොල් වූයේ චක්‍ෂුර්ලෞල්‍යයෙන් සමන්විත වූයේ වෙයි. 'නුදුටු දෙය දක්ක යුතු යැ, දුටුදෙය ඉක්මැවියැ යුතු යැ'යි අරමින් අරමට උයනින් උයනට ගමින් ගමට නිගමින් නිගමට නුවරින් නුවරට රටින් රටට දනව්වෙන් දනව්වට දීර්ඝචාරිකාවෙහි නො නිමි චාරිකාවෙහි රූපදර්ශනය සඳහා යෙදුණේ වෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' වේ. නොහොත් මහණ තෙමේ ඇතුළුගමට පිවිසියේ වීදියට පිළිපන්නේ අසංවර වැ යෙයි: ඇතුන් බලමින් අසුන් බලමින් රිය බලමින් පාබලසෙන් බලමින් ගැහැනුන් බලමින් පිරිමින් බලමින් කුමරුන් බලමින් කුමරියන් බලමින් අවුණුතුල බලමින් ගෙදොර බලමින් උඩ බලමින් යට බලමින් දිශානුදිශා බලමින් යෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු වෙයි. නොහොත් මහණ තෙමේ ඇසින් රූපයක් දැක නිමිති ගන්නේ වෙයි, අනුව්‍යඤ්ජන ගන්නේ වෙයි. යම් අසංවරයක් හේතු කොට අසංවර වූ චක්‍ෂුරින්ද්‍රිය ඇති වැ වාසය කරන තෙල පුද්ගලයා අභිධ්‍යා දෞර්මනස්‍ය සඞ්ඛ්‍යාත ලාමක අකුශලධර්මයෝ අනුබද්ධනාහු නම් ඒ චක්‍ෂුරින්ද්‍රියයාගේ සංවරයට නො පැමිණෙයි, චක්‍ෂුරින්ද්‍රිය නො රක්නේ යැ, චක්‍ෂුරින්ද්‍රියයෙහි සංවරයට නො පැමිණේ. මෙසේත් 'ඛිත්තචක්ඛු' වේ. නවද යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් කම්පල හදහා සැදැහැයෙන් දුන් බොජුන් වළඳා ඔවුහු මෙබඳු වූ විපුළ දස්නෙහි යෙදී වාසය කරන්නාහු ද, ඒ මෙසේ යැ: නැටුම් ගැයුම් වැයුම් නළුමුළු හාරතාදිය කියන තැන කස්තල කුළුතාලම් කල පිඹිම ප්‍රතිහානචිත්‍ර සැඬොලුන්ගේ සණදෙවුන්කෙළි වස්කුලල් ඇට දෙවීම ඇත්පොර අස්පොර මිහිපොර වැහැප්පොර ගවපොර බැටළුපොර එළුපොර කුකුළුපොර වටුපොර දඹුපොර මිටුපොර මල්ලපොර යුදපෙරමුණ බලසෙන් ගණන තැන කඳවුර බලඇණි දැකීම යනු නෝ යැ. මෙසේත් 'ඛිත්තචක්ඛු' නම් වේ.

කිසෙසින් 'ඛිත්තචක්ඛු' නො වේ ද යත්: මෙ සස්නෙහි ඇතැම් මහණෙක් ඇසින් ලොල් නො වූයේ චක්‍ෂුර්ලෞල්‍යයෙන් යුක්ත නො වූයේ වෙයි. 'නුදුටු දෙය දක්ක යුතු යැ, දුටු දෙය ඉක්මැවියයුතු යැ'යි අරමින් අරමට නො යෙයි, උයනින් උයනට - ගමින් ගමට - නිගමයෙන් නිගමයට - නුවරින් නුවරට - රටින් රටට - දනව්වෙන් දනව්වට රූපදර්ශනය පිණිස දීර්ඝචාරිකාවෙහි නො නිමි චාරිකාවෙහි නො යෙදුණේ වෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' නො වූයේ වේ. නොහොත් මහණ තෙමේ ගොදුරුගමට පිවිසියේ වීදියට පිළිපන්නේ සංවර වැ යෙයි: ඇතුන් නො බලමින්...දිශානුදිශා නො බලමින් යෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' නො වූයේ වේ. නොහොත් මහණ තෙමේ ඇසින් රූපයක් දැක නිමිත්තග්‍රාහී නො වූයේ වෙයි... චක්‍ෂුරින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. මෙසේත් 'ඛිත්තචක්ඛු' නො වූයේ වෙයි.

යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා සද්ධාදෙය්‍යානි භොජනානි භුඤ්ජිත්වා -පෙ- අණ්ඩිකදස්සනං ඉති වා. එවරූපා විසූකදස්සනානුයොගා පටිවිරතො හොති. එවම්පි න චිත්තචක්ඛු හොතීතිඔක්ඛිත්තචක්ඛු.

න ච පාදලොලොති - කථං පාදලොලො හොති: ඉධෙකච්චො භික්ඛු පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති: ආරාමෙන ආරාමං -පෙ- දීඝචාරිකං අනිවත්තචාරිකං අනුයුත්තො හොති රූපදස්සනාය. එවම්පි පාදලොලො හොති. අථවා භික්ඛු අන්තොපි සඞ්ඝාරාමෙ පාදලොලො පාදලොලියෙන සමන්නාගතො හොති: න අත්ථහෙතු[1] න කාරණහෙතු උද්ධතො අවූපසන්තචිත්තො පරිවෙණතො පරිවෙණං ගච්ඡති. විහාරතො -පෙ- ඉති භවාභවකථං ඉති වා[2] එවම්පි පාදලොලො හොති. න ච පාදලොලොති පාදලොලියං පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය. පාදලොලියා ආරතො අස්ස විරතො පටිවිරතො නික්ඛන්තො නිස්සටො විප්පමුත්තො විසඤ්ඤුත්තො විමරියාදීකතෙන චෙතසා විහරෙය්‍ය. පටිසල්ලානාරාමො අස්ස පටිසල්ලානරතො අජ්ඣත්තං චෙතොසමථමනුයුත්තො අනිරාකතජ්ඣානො විපස්සනාය සමන්නාගතො බ්‍රූහෙතා සුඤ්ඤාගාරානං, ඣායී ඣානරතො එකත්තමනුයුත්තො සදත්ථගරුකොති - ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො.

ඣානානුයුත්තො බහුජාගරස්සාති - 'ඣානානුයුත්තො'ති ද්වීහි කාරණෙහි ඣානානුයුත්තො: අනුප්පන්නස්ස වා පඨමස්ස ඣානස්ස උප්පාදාය යුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තො; අනුප්පන්නස්ස වා දුතියස්ස ඣානස්ස - තතියස්ස ඣානස්ස - චතුත්ථස්ස ඣානස්ස උප්පාදාය යුත්තො පයුත්තො ආයුත්තො සමායුත්තොති එවම්පි ඣානානුයුත්තො. අථවා උප්පන්නං වා පඨමං ඣානං ආසෙවති භාවෙති බහුලීකරොති; උප්පන්නං වා දුතියං ඣානං - තතියං ඣානං - චතුත්ථං ඣානං ආසෙවති භාවෙති බහුලීකරොතීති එවම්පි ඣානානුයුත්තො. බහුජාගරස්සාති ඉධ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි 'චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙතීති -ඣානානුයුත්තො බහුජාගරස්ස.

උපෙක්ඛමාරබ්භ සමාහිතත්තොති - 'උපෙක්ඛා'ති යා චතුත්ථෙ ඣානෙ උපෙක්ඛා උපෙක්ඛනා අජ්ඣුපෙක්ඛනා චිත්තසමතා චිත්තප්පස්සද්ධතා මජ්ඣත්තතා චිත්තස්ස,

---

1. අත්තහෙතු - PTS. 2. කථං කථෙති - සීමු. II.

තවද යම්සේ ඇතැම් භවත් මහණබමුණු කෙනෙක් කම්පල හදනා දුත් බොජුන් වළඳ...බලඇණි දැකීම යනාදිය හෝ යි. මේ බඳු වූ විසුළු දස්නෙහි යෙදීමෙන් වැළැකුණේ වේ. මෙසේත් 'ඛිත්තචක්ඛු' නො වේ නුයි 'ඔක්ඛිත්තචක්ඛු' යනු වේ.

න ච පාදලොලො - යනුඃ කිසෙයිත් 'පාදලොල' වේ ද යත්ඃ මෙහි කිසි මහණෙක් පාදලොල වූයේ පාදලෞල්‍යයෙන් යුක්ත වූයේ වෙයිඃ අරමින් අරමට...රූපදර්ශනය පිණිස දීඝචාරිකාවෙහි නො නිමි චාරිකාවෙහි යෙදුණේ වෙයි. මෙසේත් 'පාදලොල' වේ. නොහොත් මහණ තෙමේ ඇතුළු සඟරමෙහි ද පාදලොල වූයේ පාදලෞල්‍යයෙන් යුක්ත වූයේ වෙයිඃ ප්‍රයොජන නැති ව, කාරණ නැති ව, උඩඟු වූයේ නො සන්හුන් සිත් ඇතියේ පිරිවෙනින් පිරිවෙනට යෙයි, වෙහෙරින් වෙහෙරට...වෘද්ධි හානි පිළිබැඳි කථා යැ යනාදිය හෝ යි. මෙසේත් 'පාදලොල' වූයේ වෙයි. න ච පාදලොලො යනුඃ පාදලෞල්‍යය හරනේ යැ, දුරු කරන්නේ යැ, විගතාන්ත කරනේ යැ, අනභාවයට පමුණුවන්නේ යැ, පාදලෞල්‍යයෙන් දුරු වූයේ වෙන් වූයේ වෙසෙසින් වෙන් වූයේ නික්මුණේ බැහැර වූයේ වෙසෙසින් මිදුණේ විසංයුක්ත වූයේ වත්නේ යැ, විමර්‍ය්‍යාදීකෘත සිතින් යුක්ත ව වාසය කරන්නේ යැ, විවේකයෙහි ඇලුම් ඇතියේ විවේකයෙහි නිරත වූයේ සවකීය චිත්තසමාධියෙහි යෙදුණේ බැහැර නො කළ ධ්‍යාන ඇතියේ (සප්තවිධ) අනුපස්සනායෙන් යුක්ත වූයේ ශූන්‍යාගාරභාවනාව වඩන්නේ වත්නේ යැ, ධ්‍යාන කරනසුලු වූයේ ධ්‍යානයෙහි ඇලුණේ එකීභාවයෙහි යෙදුණේ උත්තමාර්ථ (-හෝ සවාර්ථ) ගරුක වූයේ වත්නේ නුයි 'ඔක්ඛිත්ත චක්ඛු න ච පාදලොලො' යනු වේ.

ඣානානුයුත්තො බහුජාගරස්ස - 'ඣානානුයුත්තො' යනුඃ දෙ කරුණෙකින් ධ්‍යානයෙහි යෙදුණේ වෙයිඃ නුපන් ප්‍රථමධ්‍යානයාගේ ඉපදීම පිණිස යෙදුණේ වෙසෙසින් යෙදුණේ හාත්පසින් යෙදුණේ මොනොවට යෙදුණේ වෙයි; නුපන් ද්විතීයධ්‍යානයාගේ-තෘතීයධ්‍යානයාගේ- චතුර්ථධ්‍යානයාගේ ඉපදීම පිණිස යුක්ත - ප්‍රයුක්ත - ආයුක්ත - සමායුක්ත වූයේ වේ නුයි මෙසේත් 'ඣානානුයුත්තො' යනු වේ. නොහොත් උපන් ප්‍රථමධ්‍යානය හෝ ඇසුරු කෙරෙයි වඩයි බහුල කෙරෙයි, උපන් ද්විතීයධ්‍යානය හෝ... තෘතීයධ්‍යානය හෝ ... චතුර්ථධ්‍යානය හෝ ආසෙවනය කෙරෙයි වඩයි බහුල කෙරේ නුයි මෙසේත් 'ඣානානුයුත්තො' යනු වේ. බහුජාගරස්ස යනුඃ මේ සස්නෙහි මහණ තෙමේ දහවල සක්මනින් හා හිඳීමෙන් නීවරණධර්මයන්ගෙන් සිත පිරිසුදු කෙරෙයි, රෑ පෙරයම සක්මනින් හිඳීමෙන් නීවරණධර්මයන්ගෙන් සිත පිරිසිදු කෙරෙයි, රෑ මැදියම දකුණුපයෙහි වම්පය මඳක් ඇද තබා සිහි ඇතියේ නුවණැතියේ උත්ථානසංඥාව මෙනෙහි කොට දකුණැලයෙන් ශයන කෙරෙයි; රෑ අලුයම නැඟිසිට සක්මන් කිරීමෙන් හා හිඳීමෙන් නීවරණධර්මයන්ගෙන් සිත පිරිසුදු කෙරේ නුයි 'ඣානානුයුත්තො බහුජාගරස්ස' යනු වේ.

උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො - 'උපෙක්ඛා' යනුඃ චතුර්ථධ්‍යානයෙහි යම් උපෙක්ෂාවක් උපෙක්ෂාකාරයෙක් අධික වූ උපෙක්ෂාකාරයෙක් චිත්තයාගේ සම බවෙක් චිත්තයාගේ සැහැල්ලු බවෙක් චිත්තයාගේ මධ්‍යස්ථ බවෙක් වේද එය යි.

සමාහිතත්තොති "යා චිත්තස්ස ඨිති සණ්ඨිති අවට්ඨිති අවිසාහාරො අවික්ඛෙපො අවිසාහටමානසතා සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධි". උපෙක්ඛමාරබ්භ සමාහිතත්තොති චතුත්ථෙ ඣානෙ උපෙක්ඛං ආරබ්භ එකග්ගචිත්තො අවික්ඛිත්තචිත්තො අවිසාහටමානසොති උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො.

තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙති - 'තක්කා'ති "නව විතක්කා: කාමවිතක්කො බ්‍යාපාදවිතක්කො විහිංසාවිතක්කො ඤාතිවිතක්කො ජනපදවිතක්කො අමරවිතක්කො පරානුද්දයතාපටිසඤ්ඤුත්තො විතක්කො ලාභසක්කාරසිලොකපටිසඤ්ඤුත්තො විතක්කො අනවඤ්ඤත්තිපටිසඤ්ඤුත්තො විතක්කො. ඉමෙ වුච්චන්ති නව විතක්කා." කාමවිතක්කානං කාමසඤ්ඤාසයො, බ්‍යාපාදවිතක්කානං බ්‍යාපාදසඤ්ඤාසයො, විහිංසාවිතක්කානං වීහිංසාසඤ්ඤාසයො; අථවා තක්කානං විතක්කානං සඞ්කප්පානං අවිජ්ජාසයො, අයොනිසො මනසිකාරො ආසයො, අස්මිමානො ආසයො, අනොත්තප්පං ආසයො, උද්ධච්චං ආසයො. කුක්කුච්චන්ති හත්ථකුක්කුච්චම්පි කුක්කුච්චං පාදකුක්කුච්චම්පි කුක්කුච්චං, හත්ථපාදකුක්කුච්චම්පි කුක්කුච්චං, අකප්පියෙ කප්පියසඤ්ඤිතා කප්පියෙ අකප්පියසඤ්ඤිතා අවජ්ජෙ වජ්ජසඤ්ඤිතා වජ්ජෙ අවජ්ජසඤ්ඤිතා, යං එවරූපං කුක්කුච්චං කුක්කුච්චායනා කුක්කුච්චායිතත්තං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො, ඉදං වුච්චති කුක්කුච්චං."[2]

අපි ච ද්වීහි කාරණෙහි උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො: කතත්තා ච අකතත්තා ච. කථං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො? 'කතං මෙ කායදුච්චරිතං අකතං මෙ කායදූචරිත'න්ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. 'කතං මෙ වචීදුච්චරිතං - කතං මෙ මනොදුච්චරිතං - කතො මෙ පාණාතිපාතො, අකතා මෙ පාණාතිපාතා වෙරමණී'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. 'කතං මෙ අදින්නාදානං - කතො මෙ කාමෙසු මිච්ඡාචාරො - කතො මෙ මුසාවාදො - කතා මෙ පිසුනා වාචා - කතා මෙ ඵරුසා වාචා - කතො මෙ සම්ඵප්පලාපො - කතා මෙ අභිජ්ඣා - කතො මෙ බ්‍යාපාදො - කතා මෙ මිච්ඡාදිට්ඨි- අකතා මෙ සම්මාදිට්ඨී'ති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. එවං කතත්තා ච අකතත්තා ච උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො.

1. කථෙති - සීමු. II. මජ්ඣං. කථෙසි - PTS.
2. ධම්මසඞ්ගණී - නික්ඛෙපකණ්ඩ.

**සමාහිතත්තො** යනු: චිත්තයාගේ යම් ස්ථිතියක් සංස්ථිතියක් අවස්ථිතියක් නො කැලැඹීමෙක් නො විසිරීමෙක් නො කැලැඹුණු සිත් ඇති බවෙක් ශමථයෙක් සමාධීන්ද්‍රියයෙක් සමාධිබලයෙක් සම්‍යක්සමාධියෙක් වේ ද එය යි. **උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො** – චතුර්ථධ්‍යානයෙහි තත්‍රමධ්‍යස්ථෝපෙක්ෂාව නිසා එකඟ වූ සිත් ඇතියේ නො විසුරුණු සිත් ඇතියේ නො කැලැඹුණු සිත් ඇතියේ තුයි 'උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො' යනු වේ.

**තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙ** – 'තක්ක' නම්: නව විතර්කයෝ යැ: කාමවිතර්ක යැ ව්‍යාපාදවිතර්ක යැ විහිංසාවිතර්ක යැ ඥාතිවිතර්ක යැ ජනපදවිතර්ක යැ අමරවිතර්ක යැ පරානුද්දයතාප්‍රතිරූප වූ ගෘහනිඃශ්‍රිතප්‍රේමයෙන් ප්‍රතිසංයුක්ත විතර්ක යැ ලාභසත්කාරකීර්තිප්‍රතිසංයුක්ත වූ විතර්ක යැ අනවඥතාප්‍රතිසංයුක්ත විතර්ක යැ යන මොහු නව විතර්කයෝ යයි කියනු ලැබෙත්. කාමවිතර්කයන්ට කාමසංඥාව ආශය (-වාසස්ථාන) වෙයි. ව්‍යාපාදවිතර්කයන්ට ව්‍යාපාදසංඥාව ආශය යැ, විහිංසාවිතර්කයන්ට විහිංසාසංඥාව ආශය යැ, නොහොත් තර්කයන්ට විතර්කයන්ට සංකල්පයන්ට අවිද්‍යාව ආශය යැ, අයොනිසොමනසිකාරය ආශය යැ, අස්මිමානය ආශය යැ, අනපත්‍රපාව ආශය යැ, ඖද්ධත්‍යය ආශය – වාසස්ථාන යි. **කුක්කුච්චං** යනු: අත්කුකුස ද කුකුසැ, පාකුකුස ද කුකුසැ, අත්පාකුකුස ද කුකුසැ, අකප්‍යයෙහි කප්‍යසංඥ ඇති බව යැ, කප්‍යයෙහි අකප්‍යසංඥ ඇති බව යැ, අවද්‍යයෙහි වද්‍යසංඥ ඇති බව යැ, වද්‍යයෙහි අවද්‍යසංඥ ඇති බව යැ යන මෙබඳු වූ යම් කුකුසෙක් කුකුස්අයුරෙක් කුකුස් කරන බවෙක් සිතෙහි විපිළිසරයෙක් මනොවිලෙඛයෙක් වේ ද, මේ 'කුක්කුච්ච' යයි කියනු ලැබේ.

තවද දෙ කරුණෙකින් කෞකෘත්‍ය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. කල බැවින් හා නො කල බැවිනි. කිසෙයින් කල බැවින් හා නො කල බැවින් කුකුස සිතෙහි විපිළිසර මනොවිලෙඛය උපදී ද යත්: "මා විසින් කායදුශ්චරිතය කරන ලද, මා විසින් කායසුචරිතය නො කරන ලද'යි කුකුස සිතෙහි විපිළිසර මනොවිලෙඛය උපදී, මා විසින් වාග්දුශ්චරිතය කරන ලද – මා විසින් මනොදුශ්චරිතය කරන ලද – මා විසින් ප්‍රාණවධ කරන ලද, මා විසින් ප්‍රාණඝාතවිරමණය නො කරන ලද"යි කුකුස චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. "මා විසින් අදත්තාදානය කරන ලද – මා විසින් කාමමිථ්‍යාචාරය කරන ලද – මා විසින් මුසවා කියන ලද – මා විසින් පිසුනුබස් කියන ලද – මා විසින් පරුෂවාක් කියන ලද – මා විසින් ප්‍රලාප කියන ලද – මා විසින් අභිධ්‍යාව කරන ලද – මා විසින් ව්‍යාපාදය කරන ලද – මා විසින් මිථ්‍යාදෘෂ්ටි ගන්නා ලද, – සම්‍යග්දෘෂ්ටි නො ගන්නා ලද"යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. මෙසේ කල බැවින් ද නො කල බැවින් ද කුකුස සිතෙහි විපිළිසර මනොවිලෙඛය උපදී.

අථවා සීලෙසුම්හි න පරිපූරකාරීති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. ඉන්ද්‍රියෙසුම්හි අගුත්තද්වාරොති – භොජනෙ අමත්තඤ්ඤුම්හීති – ජාගරියං අනනුයුත්තොම්හීති – න සතිසම්පජඤ්ඤෙන සමන්නාගතොම්හීති – අභාවිතා මෙ චත්තාරො සතිපට්ඨානාති – අභාවිතා මෙ චත්තාරො සම්මප්පධානාති – අභාවිතා මෙ චත්තාරො ඉද්ධිපාදාති – අභාවිතානි මෙ පඤ්චින්ද්‍රියානීති – අභාවිතානි මෙ පඤ්ච බලානීති – අභාවිතා මෙ සත්තබොජ්ඣඞ්ගාති – අභාවිතො මෙ අරියො අට්ඨඞ්ගිකො මග්ගොති – දුක්ඛං මෙ අපරිඤ්ඤාතන්ති – දුක්ඛසමුදයො මෙ අප්පහීනොති – මග්ගො මෙ අභාවිතොති – නිරොධො මෙ අසච්ඡිකතොති උප්පජ්ජති කුක්කුච්චං චෙතසො විප්පටිසාරො මනොවිලෙඛො. තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙති තක්කං ච තක්කාසයඤ්ච කුක්කුච්චඤ්චුපච්ඡින්දෙය්‍ය ඡින්දෙය්‍ය උච්ඡින්දෙය්‍ය සමුච්ඡින්දෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙ.

තෙනාහ භගවා:

"ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො
ඣානානුයුත්තො බහුජාගරස්ස,
උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො
තක්කාසයං කුක්කුච්චඤ්චුපච්ඡින්දෙ"ති.

**16 – 19**

චුදිතො වචීහි සතිමාභිනන්දෙ
සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ,
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං
ජනවාදධම්මාය න චෙතයෙය්‍ය.

**චුදිතො වචීහි සතිමාභිනන්දෙති** – 'චුදිතො'ති උපජ්ඣායා වා ආචරියා වා සමානුපජ්ඣායකා වා සමානාචරියකා වා මිත්තා වා සන්දිට්ඨා වා සම්භත්තා වා සහායා වා චොදෙන්ති "ඉදං තෙ ආවුසො අයුත්තං, ඉදං තෙ අප්පත්තං, ඉදං තෙ අසාරුප්පං, ඉදං තෙ අසීලට්ඨ[1]න්ති සතිං උපට්ඨාපෙත්වා තං චොදනං නන්දෙය්‍ය අභිනන්දෙය්‍ය මොදෙය්‍ය අනුමොදෙය්‍ය ඉච්ඡෙය්‍ය සාදියෙය්‍ය පත්ථෙය්‍ය පිහයෙය්‍ය අභිජප්පෙය්‍ය. යථා ඉත්ථී වා පුරිසො වා දහරො යුවා මණ්ඩනකජාතිකො සීසං නහාතො උප්පලමාලං වා වස්සිකමාලං වා අධිමුත්තකමාලං වා ලභිත්වා උභොහි හත්ථෙහි පටිග්ගහෙත්වා උත්තමඞ්ගෙ සිරස්මිං පතිට්ඨාපෙත්වා නන්දෙය්‍ය අභිනන්දෙය්‍ය මොදෙය්‍ය අනුමොදෙය්‍ය ඉච්ඡෙය්‍ය සාදියෙය්‍ය පත්ථෙය්‍ය පිහයෙය්‍ය අභිජප්පෙය්‍ය, එවමෙවං සතිං උපට්ඨාපෙත්වා තං චොදනං නන්දෙය්‍ය අභිනන්දෙය්‍ය මොදෙය්‍ය අනුමොදෙය්‍ය ඉච්ඡෙය්‍ය සාදියෙය්‍ය පත්ථෙය්‍ය පිහයෙය්‍ය අභිජප්පෙය්‍ය.

1. අසිලිට්ඨං – පු. PTS.

නොහොත් 'ශීලයෙහි පරිපූරකාරී නො වූයෙමි' කුකුස චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. ඉන්ද්‍රියයන්හි අපිහිතද්වාර වූයෙමි - භොජනයෙහි අමාත්‍රඥ වූයෙමි - ජාගර්‍ය්‍යාවෙහි නො යෙදුණෙමි - සමෘතිසම්ප්‍රඥතයෙන් සමන්විත නො වූයෙමි-මා විසින් සතර සතිපට්ඨානයෝ නො වඩනා ලදහ'යි- සතර සම්‍යක්ප්‍රධානයෝ නො වඩනා ලදහ'යි - සතර ඍද්ධිපාදයෝ නො වඩනා ලදහ'යි - පඤ්චෙන්ද්‍රියයෝ නො වඩනා ලදහ'යි - පඤ්ච බලයෝ නො වඩනා ලදහ'යි - සප්ත බොධ්‍යඞ්ගයෝ නො වඩනා ලදහ'යි - මා විසින් ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය නො වඩනා ලද්'යි - මා විසින් දුඃඛසත්‍යය අපරිඥත යැ'යි - මා විසින් දුඃඛසමුදය අප්‍රහීණ යැ'යි - මා විසින් මාර්ගය නො වඩනා ලද්'යි - මා විසින් නිරොධය ප්‍රත්‍යක්ෂ නො කරන ලද්'යි කෞකෘත්‍යය චිත්තවිප්‍රතිසාරය මනොවිලෙඛය උපදී. **තක්කාසයං කුක්කුච්චඤ්චූපච්ඡින්දෙ-** විතර්කය ද විතර්කයන්ගේ ආශය ද කෞකෘත්‍යය ද පසිඳින්නේ යැ සිඳින්නේ යැ වෙසෙසින් සිඳින්නේ යැ මොනොවට සිඳින්නේ යැ දුරු කරන්නේ යැ බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනුඅභාවයට පමුණුවන්නේ නුයි 'තක්කාසයං කුක්කුච්චඤ්චූපච්ඡින්දෙ' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"ඛන්තිත්‍යාවකුබු -පෙ- තක්කාසයං කුක්කුච්චඤ්චූපච්ඡින්දෙ"යි.**

## 16 - 19

උපාධ්‍යායාදීන් විසින් වචනයෙන් චෝදනා කරන ලදුයේ සමෘතිමත් වැ සතුටු වන්නේ යැ. සබ්‍රහ්මචාරීන් කෙරෙහි ගැටුණු සිත් ඇති බව බිඳපියන්නේ යැ. නුවණින් උපදවන ලද තෙපුල් බණන්නේ යැ. කාලවේලා සීල-වේලා ඉක්මැ නො බණන්නේ යැ. ජනයාගේ උපවාදකථාවෙහි සිතිවිලි නුපදවන්නේ යි.

**චුදිතො වචීහි සතිමාභිනන්දෙ** - 'චුදිතො' යනු: උපාධ්‍යායයෝ හෝ ආචාර්‍ය්‍යයෝ හෝ සමානොපාධ්‍යායයෝ හෝ සමානාචාර්‍ය්‍යයෝ හෝ මිත්‍රයෝ හෝ සංදෘෂ්ටයෝ හෝ සම්භක්තයෝ හෝ සහායයෝ හෝ 'ඇවැත්නි, මේ තට අයුතු යැ, මේ තට නො පැමිණියේ යැ, මේ තට නො සරුප් යැ, තාගේ මෙය ශීලයෙහි නො සිටියේ වතැ'යි චෝදනා කෙරෙත් නම්, සිහි එළවා ඒ චෝදනාවට සතුටු වන්නේ යැ, වෙසෙසින් සතුටු වන්නේ යැ, හටුවන්නේ යැ පහටුවන්නේ යැ කැමැති වන්නේ යැ ඉවසන්නේ යැ පතන්නේ යැ රුචි කරන්නේ යැ අභිජල්පනය කරන්නේ යැ. යම්සේ ස්ත්‍රියක් හෝ පුරු-ෂයෙක් හෝ තරුණ වූයේ සැරැසෙන පියවි ඇතියේ සනාතය කොට සිටියේ උපුල්මාලයක් හෝ දෑසමන්මාලයක් හෝ යොහොඹුමාලයක් හෝ ලැබ දෑතින් පිළිගෙන උතුමඟ හිසෙහි පිහිටුවා තුටුවන්නේ ද සතුටු-වන්නේ ද හටුවන්නේ ද පහටුවන්නේ ද රිසිවන්නේ ද ඉවසන්නේ ද පතන්නේ ද කැමැතිවන්නේ ද අභිජල්පනය කරන්නේ ද එපරිද්දෙන් ම සිහි එළවා ඒ චෝදනාවට තුටුවන්නේ ය සතුටුවන්නේ ය හටුවන්නේ ය පහටුවන්නේ ය රිසිවන්නේ ය ඉවසන්නේය පතන්නේ ය කැමැතිවන්නේ ය අභිජල්පනය කරන්නේ යැ.

1. "නිධීනංව පවත්තාරං යං පස්සෙ වජ්ජදස්සිනං,
නිග්ගය්හවාදිං මෙධාවිං තාදිසං පණ්ඩිතං භජෙ.
තාදිසං භජමානස්ස සෙය්‍යො හොති න පාපියො"තිa.

2. "ඔවදෙය්‍යානුසාසෙය්‍ය අසබ්භා ච නිවාරයෙ,
සතඤ්හි සො පියො හොති අසතං හොති අප්පියො"තිa.

චුදිතො වචීහි සතිමාභිනන්දෙ.

සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙති – 'සබ්‍රහ්මචාරී'ති එකකම්මා එකුද්දෙසා සමසික්ඛතා. සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙති සබ්‍රහ්මචාරීසු ආහතචිත්තතං ඛිලජාතතං පභින්දෙය්‍ය; පඤ්චපි චෙතො ඛිලෙ පභින්දෙය්‍ය; තයොපි චෙතොඛිලෙ පභින්දෙය්‍ය; රාගඛිලං දොසඛිලං මොහඛිලං භින්දෙය්‍ය පභින්දෙය්‍ය සම්භින්දෙය්‍යාති – සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ.

වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලන්ති – ඤාණසමුට්ඨිතං වාචං මුඤ්චෙය්‍ය. අත්ථූපසංහිතං ධම්මූපසංහිතං කාලෙන සාපදෙසං පරියන්තවතිං වාචං මුඤ්චෙය්‍ය පමුඤ්චෙය්‍යාති – වාචං පමුඤ්චෙ කුසලං; නාතිවෙලන්ති 'වෙලා'ති ද්වෙ වෙලා: කාලවෙලා ච සීලවෙලා ච. කතමා කාලවෙලා? කාලාතික්කන්තං වාචං න භාසෙය්‍ය, වෙලාතික්කන්තං වාචං න භාසෙය්‍ය, කාලවෙලාතික්කන්තං වාචං න භාසෙය්‍ය, කාලං අසම්පත්තං වාචං න භාසෙය්‍ය, වෙලං අසම්පත්තං වාචං න භාසෙය්‍ය, කාලවෙලං අසම්පත්තං වාචං න භාසෙය්‍ය.

3. "යො වෙ කාලෙ අසම්පත්තෙ අතිවෙලං පභාසති,
එවං සො නිහතො සෙති කොකිලායෙව අත්‍රජො"තිb

අයං කාලවෙලා.

කතමා සීලවෙලා? රත්තො වාචං න භාසෙය්‍ය, දුට්ඨො වාචං න භාසෙය්‍ය, මූළ්හො වාචං න භාසෙය්‍ය, මුසාවාදං න භාසෙය්‍ය, පිසුණං වාචං න භාසෙය්‍ය, ඵරුසං වාචං න භාසෙය්‍ය, සම්ඵප්පලාපං න භාසෙය්‍ය න කථෙය්‍ය න භණෙය්‍ය න දීපයෙය්‍ය න වොහරෙය්‍ය. අයං සීලවෙලාති – වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං.

a. ධම්මපද - පණ්ඩිතවග්ග. b කොකාලික ජාතක.

1. "වරද දක්නාසුලු වූ නිග්‍රහ කොට බණන්නා වූ ප්‍රාඥ වූ යම් කල්‍යාණ මිත්‍රයකු නිදන්සැල තුබූ තැන් දක්වන්නකු වැනි කොට දක්නේ වේ ද, එබඳු ප්‍රාඥයා සෙවුණේ යැ. එබඳු නුවණැත්තහු සෙවුණාහට ශ්‍රෙයස් (-වැඩෙක්) ම වන්නේ ය. අවැඩෙක් නො වන්නේ" යි.

2. "(කල්‍යාණමිත්‍ර වූ යමෙක් අනැවැසි ආදි කිසිවක් හට) අවවාද කරන්නේ ද, අනුශාසනා කරන්නේ ද, අකුශලයෙන් වළහන්නේ ද, ඒ එබඳු පුද්ගල තෙමේ බුද්ධාදි සත්පුරුෂයන්ට මැ ප්‍රිය වෙයි. අසත්පුරුෂයන්ට අප්‍රිය වේ."

එයින් 'චුදිතො වචීහි සතිමාභිනන්දෙ' යනු වේ.

**සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ** – 'සබ්‍රහමචාරී' යනු: එකකම් එකොද්දෙශ්‍ය සමානශික්‍ෂා ඇත්තාහු යැ. **සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ** – සබ්‍රම්සරුන් කෙරෙහි ගැටුණු සිත් ඇති බව, හටගත් හුල් ඇති බව (-තද බව) බිඳපියන්නේ ය, පඤ්ච චෙතොඛිලයන් ද සිඳින්නේ ය, ත්‍රිවිධ චෙතොඛිලයන් ද සිඳින්නේ ය, රාගඛිලය ද්වෙෂඛිලය මොහඛිලය බිඳින්නේය, වෙසෙසින් බිඳින්නේ ය, මොනොවට බිඳින්නේ නුයි 'සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ' යනු වේ.

**වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං** – ඥානසම්ප්‍රයුක්ත සිතින් උපදවන ලද වචනය නිකුත් කරන්නේ ය, අර්ථයෙන් යුක්ත වූ ධර්මයෙන් යුක්ත වූ කරුණු සහිත වූ පර්‍ය්‍යන්තවත් වූ වචනය සුදුසු කාලයෙහි නිකුත් කරන්නේ ය, වෙසෙසින් නිකුත් කරන්නේ නුයි 'වාචං පමුඤ්චෙ කුසලං' යනු වේ. **නාතිවෙලං** යනු: කාලවේලාව ද සීලවේලාව දැයි 'වේලා' දෙකෙකි. කාලවේලා කවරැ යත්: කල් ඉක්මැගිය වචනය නො කියන්නේ යැ හිම් ඉක්මැගිය වචනය නො කියන්නේ යැ, කල්හිම් ඉක්මැගිය වචනය නො කියන්නේ යැ, කල් නො පැමිණි වචනය නො කියන්නේ යැ, හිම් නො පැමිණි වචනය නො කියන්නේ යැ, කල්හිම් නො පත් වචනය නො කියන්නේ ය.

3. "යමෙක් නියමයෙන් තමහට බණන කාලය නො පැමිණි කල්හි හිම් ඉක්මවා බෙහෙවින් බෙණේ ද, මෙසේ හෙතෙම (කැවිඩියගේ කැදැල්ලෙහි වැඩුණු) කොවුලියගේ පැටියා සෙයින් නසන ලදුයේ හෝනේ" යි. මේ තෙමේ කාලවේලා යැ.

සීලවේලා කවරැ යත්: රාගයෙන් රත් වූයේ නෙපුල් නො බණන්නේ යැ, ද්වෙෂයෙන් දුෂ්ට වූයේ වචන නො බණන්නේ යැ, මොහයෙන් මූළ වූයේ වචන නො බණන්නේ යැ, මුසවා නො බණන්නේ යැ, පිසුනු බස් නො බණන්නේ යැ, රළුබස් නො බණන්නේ යැ, ප්‍රලාප නො බණන්නේ යැ, නො කියන්නේ යැ නො පවසන්නේ යැ නො දක්වන්නේ යැ ව්‍යවහාර නො කරන්නේ යි. මේ තොමෝ සීලවේලා වූ යැයි 'වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං' යනු වේ.

ජනවාදධම්මාය න චෙතයෙය්‍යාති - 'ජනා'ති ඛත්තියා ච බ්‍රාහ්මණා ච වෙස්සා ච සුද්දා ච ගහට්ඨා ච පබ්බජිතා ච දෙවා ච මනුස්සා ච, ජනස්ස වාදය උපවාදය නින්දාය ගරහාය අකිත්තියා අවණ්ණහාරිකාය සීලවිපත්තියා වා ආචාරවිපත්තියා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා න චෙතයෙය්‍ය චෙතනං න උප්පාදෙය්‍ය චිත්තං[1] න උප්පාදෙය්‍ය සඞ්කප්පං න උප්පාදෙය්‍ය මනසිකාරං න උප්පාදෙය්‍යාති - ජනවාදධම්මාය න චෙතයෙය්‍ය.

තෙනාහ භගවා:

"චුදිතො වචීහි සතිමාභිනන්දෙ
සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ,
වාචං පමුඤ්චෙ කුසලං නාතිවෙලං
ජනවාදධම්මාය න චෙතයෙය්‍යා"ති.

16 - 20

අථාපරං පඤ්ච රජානි ලොකෙ
යෙසං සතීමා විනයාය සික්ඛෙ,
රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං.

අථාපරං පඤ්ච රජානි ලොකෙති - 'අථා'ති පදසන්ධි පදසංසග්ගො පදපාරිපූරි අක්ඛරසමවායො බ්‍යඤ්ජනසිලිට්ඨතා පදානුපුබ්බතාමෙතං අථාති. පඤ්ච රජානී'ති රූපරජො[2] සද්දරජො[2] ගන්ධරජො රසරජො ඵොට්ඨබ්බරජො.

1. රාගො රජො න ච පන රෙණු වුච්චති
රාගස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා[3] පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ.

2. දොසො රජො න ච පන රෙණු වුච්චති
දොසස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා පණ්ඩිතා
විහරන්ති තෙ විගත රජස්ස සාසනෙ.

3. මොහො රජො න ච පන රෙණු වුච්චති
මොහස්සෙතං අධිවචනං රජොති,
එතං රජං විප්පජහිත්වා පණ්ඩිතා
විහරන්ති තෙ විගතරජස්ස සාසනෙ"ති[a].

ලොකෙති - අපායලොකෙ මනුස්සලොකෙ දෙවලොකෙ ඛන්ධලොකෙ ධාතුලොකෙ ආයතනලොකෙති - අථාපරං පඤ්ච රජානි ලොකෙ.

---

1. චිත්තසඞ්කප්පං න උප්පාදෙය්‍ය - සෑ PTS  2 රජො - සෑ PTS
3. විප්පජහිත්වා - සිමු. II.  a. චූලපන්ථකජාතක

**ජනවාදධම්මාය න චේතයෙය්‍ය**-'ජන' නම්: ක්ෂත්‍රියයෝ ද බ්‍රාහ්මණයෝ ද වෛශ්‍යයෝ ද ශුද්‍රයෝ ද ගෘහස්ථයෝ ද ප්‍රව්‍රජිතයෝ ද දෙවියෝ ද මනුෂ්‍යයෝ ද වෙත්. ශීලවිපත්තියෙන් හෝ ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටිවිපත්තියෙන් හෝ ආජීවවිපත්තියෙන් හෝ ජනයාගේ වචනයට උපවාදයට නින්දාවට ගර්හාවට අකීර්තියට නුගුණ එළැව්මට නො සිතන්නේ යැ සිතිවිලි නූපදවන්නේ යැ සිත් නූපදවන්නේ යැ කල්පනා නූපදවන්නේ යැ මෙනෙහි කිරීම් නූපදවන්නේ නුසි 'ජනවාදධම්මාය න චේතයෙය්‍ය' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"මුදිතෝ වමින් -පෙ- ජනවාදධම්මාය න චේතයෙය්‍ය"යි

## 16 - 20

නැවත මෙයින් අනෙකක් ද කියමි: සමෘතිමත් වූයේ රූපරාගාදි යම් කෙනකුන්ගේ ප්‍රහාණවිනය පිණිස හික්මෙන්නේ නම්, ලොවැ එබඳු වූ පඤ්ච රජස් කෙනෙක් වෙති. රූපාලම්බනයෙහි ද ශබ්දාලම්බනයෙහි ද යළි රසාලම්බනයෙහි ද ගන්ධාලම්බනයෙහි ද ස්පර්ශාලම්බනයෙහි ද ඡන්දරාගය මඩනේ සි.

**අථාපරං පඤ්ච රජානි ලොකෙ** - 'අථ' යනු: පදසන්ධි යැ පදසංසර්ග යැ පදපාරිපූරි යැ අක්ෂරසමවාය යැ ව්‍යඤ්ජනශ්ලිෂ්ටතා යැ පදානුපූර්වතා සි. මෙහි 'අථ' යනු. **පඤ්ච රජානි** යනු: රූපාලම්බනය නිසා උපන් රාගාදි රජස් යැ ශබ්දරජස් යැ ගන්ධරජස් යැ රසරජස් යැ ස්ප්‍රෂ්ටව්‍යරජසි.

1. රාගය රජස් යැ. රේණු වැලිත් රජස් සි නො ද කියනු ලැබෙයි. මෙහි 'රජස්' යනු රාගයට නමෙකි. ඒ පණ්ඩිත වූ භික්ෂූහු මෙහි රාග නමැති රජස් වෙසෙසින් දුරු කොට විගත වූ රාගරජස් ඇති බුදුන්ගේ ශාසනයෙහි වාසය කෙරෙත්.

2. ද්වේෂය රජස් යැ...

3. මෝහය රජසෙකි. රේණු වැලිත් රජස් යයි නො ද කියනු ලැබෙයි. මෙහි 'රජස්' යනු මෝහයට නමෙකි. ඒ පණ්ඩිත වූ භික්ෂූහු මෙහි මෝහ නමැති රජස වෙසෙසින් දුරු කොට විගත වූ මෝහරජස් ඇති බුදුන්ගේ ශාසනයෙහි වාසය කෙරෙත්.

**ලොකෙ** - යනු: අපායලොකයෙහි මනුෂ්‍යලොකයෙහි දෙවලොකයෙහි ස්කන්ධලොකයෙහි ධාතුලොකයෙහි ආයතනලොකයෙහි නුසි 'අථාපරං පඤ්ච රජානි ලොකෙ' යනු වේ.

**යෙසං සතිමා විනයාය සික්ඛෙ**ති - 'යෙස'න්ති රූපරාගස්ස සද්දරාගස්ස ගන්ධරාගස්ස රසරාගස්ස ඵොට්ඨබ්බරාගස්ස; **සතිමා**ති "යා සති අනුස්සති පටිස්සති සති සරණතා ධාරණතා අපිලාපනතා අසම්මුස්සනතා සති සතින්ද්‍රියං සතිබලං සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො; අයං වුච්චති සති.[a] ඉමාය සතියා උපෙතො සමුපෙතො උපගතො සමුපගතො උපපන්නො සම්පන්නො සමන්නාගතො, සො වුච්චති සතිමා. **සික්ඛෙ**ති තිස්සො සික්ඛා: අධිසීලසික්ඛා අධිචිත්තසික්ඛා අධිපඤ්ඤාසික්ඛා. කතමා අධිසීලසික්ඛා -පෙ- අයං අධිපඤ්ඤාසික්ඛා. **යෙසං සතිමා විනයාය සික්ඛෙ**ති - සතිමා පුග්ගලො යෙසං රූපරාගස්ස සද්දරාගස්ස ගන්ධරාගස්ස රසරාගස්ස ඵොට්ඨබ්බරාගස්ස විනයාය පටිවිනයාය පහානාය වූපසමාය පටිනිස්සග්ගාය පටිපස්සද්ධියා අධිසීලම්පි සික්ඛෙය්‍ය, අධිචිත්තම්පි සික්ඛෙය්‍ය, අධිපඤ්ඤම්පි සික්ඛෙය්‍ය, ඉමා තිස්සො සික්ඛායො ආවජ්ජන්තො සික්ඛෙය්‍ය, ජානන්තො සික්ඛෙය්‍ය, -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො සික්ඛෙය්‍ය ආචරෙය්‍ය සමාචරෙය්‍ය සමාදාය වත්තෙය්‍යාති - යෙසං සතිමා විනයාය සික්ඛෙ.

**රූපෙසු සද්දෙසු අථො රසෙසු ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාග**න්ති - රූපෙසු සද්දෙසු ගන්ධෙසු රසෙසු ඵොට්ඨබ්බෙසු රාගං සහෙය්‍ය පරිසහෙය්‍ය අභිභවෙය්‍ය අජ්ඣොත්ථරෙය්‍ය පරියාදියෙය්‍ය මද්දෙය්‍යාති - රූපෙසු සද්දෙසු අථො රසෙසු ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං.

තෙනාහ භගවා:

"අථාපරං පඤ්ච රජානි ලොකෙ
යෙසං සතිමා විනයාය සික්ඛෙ,
රූපෙසු සද්දෙසු අථො රසෙසු
ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාග"න්ති.

## 16 - 21

එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො,
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහනෙ තමං සො (ඉති භගවා).

**එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්ද**න්ති - 'එතෙසූ'ති රූපෙසු සද්දෙසු ගන්ධෙසු රසෙසු ඵොට්ඨබ්බෙසු; **ඡන්දො**ති "යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො කාමනන්දි කාමතණ්හා කාමසිනෙහො කාමපරිළාහො කාමමුච්ඡා කාමජ්ඣොසානං කාමොඝො කාමයොගො කාමුපාදානං -පෙ- කාමච්ඡන්දනීවරණං[a]" **එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්ද**න්ති එතෙසු ධම්මෙසු ඡන්දං විනෙය්‍ය පටිවිනෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍යාති - එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං.

---

a. ධම්මසඞ්ගණී - චිත්තුප්පාදකණ්ඩ

**යෙසං සතිමා විනයාය සික්ඛෙ** -'යෙසං' යනු: රූපරාගයාගේ ශබ්දරාගයාගේ ගන්ධරාගයාගේ රසරාගයාගේ ස්ප්‍රෂ්ටව්‍යරාගයාගේ; **සතිමා**: යම් සමෘතියක් අනුසමෘතියක් ප්‍රතිසමෘතියක් සිහියක් සිහි කරන බවෙක් දරන බවෙක් සිහි කරවනබවෙක් නො මුළා වන බවෙක් සමෘයියක් සමෘතීන්ද්‍රියයෙක් සමෘතිබලයෙක් සම්‍යක්සමෘතියෙක් සමෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායනමාර්ගයෙක් වේ ද මේ තෙමේ 'සති' යයි කියනු ලබයි. මේ සතියෙන් යුක්ත වූයේ සමුපෙත වූයේ උපගත වූයේ සමුපගත වූයේ සිද්ධියට පැමිණියේ සමෘද්ධ වූයේ සමන්නාගත වූයේ හෙතෙම 'සතිමා' යයි කියනු ලැබේ. **සික්ඛෙ** යනු: ශික්ෂා තුනෙකි: අධිශීලශික්ෂා යැ අධිචිත්තශික්ෂා යැ අධිප්‍රඥ ශික්ෂා යැයි. අධිශීලශික්ෂා කවරැ...මේ අධිප්‍රඥශික්ෂා යි. **යෙසං සතිමා විනයාය සික්ඛෙ** සමෘතිමත් පුද්ගල තෙමේ යම් රාග කෙනකුන්ගේ රූපරාගයාගේ ශබ්දරාගයාගේ ගන්ධරාගයාගේ රසරාගයාගේ ස්ප්‍රෂ්ටව්‍යරාගයාගේ විනය පිණිස දුරලීම පිණිස ප්‍රහාණය පිණිස සන්සිඳුවීම පිණිස බැහැරලීම පිණිස විගතභාවය පිණිස අධිශීලයෙහි ද හික්මෙන්නේ යැ අධිචිත්තයෙහි ද හික්මෙන්නේ යැ අධිප්‍රඥවෙහි ද හික්මෙන්නේ යැ. මේ ත්‍රිවිධ ශික්ෂාවන් ආවර්ජිත කෙරෙමින් හික්මෙන්නේ යැ, දැනගනිමින් හික්මෙන්නේ යැ...ප්‍රත්‍යක්ෂ කළයුතු තිවන ප්‍රත්‍යක්ෂ කෙරෙමින් හික්මෙන්නේ යැ, හැසිරෙන්නේ යැ මොනොවට හැසිරෙන්නේ යැ සමාදන් වැ පවත්නේ නුයි 'යෙසං සතිමා විනයාය සික්ඛෙ' යනු වේ.

**රූපෙසු සද්දෙසු අථො රසෙසු ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං**- රූපයන්හි ශබ්දයන්හි ගන්ධයන්හි රසයන්හි ස්ප්‍රෂ්ටව්‍යයන්හි රාගය මඩනේ යැ හාත්පසින් මඩනේ යැ අභිභවනය කරන්නේ යැ චතුරුවන්නේ යැ හාත්පසින් ගන්නේ යැ මර්දනය කරන්නේ නුයි 'රූපෙසු සද්දෙසු අථො රසෙසු ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

**"අථාපරං පඤ්ච රජානි ලොකෙ -පෙ- ගන්ධෙසු ඵස්සෙසු සහෙථ රාගං"**යි

## 16 - 21

එලැඹ සිටි සිහි ඇති කෙලෙසුන් කෙරෙන් මොනොවට මිදුණු සිත් ඇති මහණ තෙමේ තෙල රූපාදි ධර්මයන් කෙරෙහි කාමච්ඡන්දය දුරු කරන්නේ යැ. හෙතෙම සුදුසු කාලයෙහි සියලු සංස්කාරධර්මය මනා කොට අනිත්‍යාදිවශයෙන් විමසනුයේ එකඟ වූ සිත් ඇතියේ සියලු මොහාදි අන්ධකාරය නසන්නේ යි. (බුදුහු මෙසේ වදාල සේක.)

**එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං** - 'එතෙසු' යනු: රූපයන්හි ශබ්ද-ගන්ධ - රස - ස්ප්‍රෂ්ටව්‍යයන්හි; **ඡන්ද** නම්: කාමවස්තූන් විෂයෙහි යම් කාමච්ඡන්දයෙක් කාමරාගයෙක් කාමනන්දියෙක් කාමතෘෂ්ණාවෙක් කාමස්නෙහයෙක් කාමපරිදාහයෙක් කාමමූර්ඡායෙක් කාමාධ්‍යවසානයෙක් කාමෞඝයෙක් කාමයොගයෙක් කාමූපාදානයෙක්... කාමච්ඡන්දනීවරණයෙක් වේ ද එය යි. **එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං** -තෙල රූපාදි ධර්මයන්හි කාමච්ඡන්දය දුරු කරන්නේ යැ වෙසෙසින් දුරු කරන්නේ යැ හැරපියන්නේ යැ බැහැර කරන්නේ යැ විගතාන්ත කරන්නේ යැ අනභාවයට පමුණුවන්නේ නුයි 'එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං' යනු වේ.

**භික්ඛු සතිමා සුවිමුත්තචිත්තොති** – 'භික්ඛූ'ති පුථුජ්ජනකල්‍යාණකො වා භික්ඛු සෙඛො වා භික්ඛු; සතිමාති "යා සති අනුස්සති – පෙ – සම්මාසති සතිසම්බොජ්ඣඞ්ගො එකායනමග්ගො," අයං වුච්චති සති. ඉමාය සතියා උපෙතො සමුපෙතො – පෙ – සො වුච්චති සතිමා; **භික්ඛු සතිමා සුවිමුත්තචිත්තොති** පඨමං ඣානං සමාපන්නස්ස නීවරණෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං, දුතියං ඣානං සමාපන්නස්ස විතක්කවිචාරෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. තතියං ඣානං සමාපන්නස්ස පීතියා ච චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. චතුත්ථං ඣානං සමාපන්නස්ස සුඛදුක්ඛෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. ආකාසානඤ්චායතනං සමාපන්නස්ස රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. විඤ්ඤාණඤ්චායතනං සමාපන්නස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං – පෙ – ආකිඤ්චඤ්ඤායතනං සමාපන්නස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං – පෙ – නෙවසඤ්ඤානාසඤ්ඤායතනං සමාපන්නස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. සොතාපන්නස්ස සක්කායදිට්ඨියා විචිකිච්ඡාය සීලබ්බතපරාමාසා දිට්ඨානුසයා විචිකිච්ඡානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. සකදාගාමිස්ස ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. අනාගාමිස්ස අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තං. අරහතො රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා තදෙකට්ඨෙහි ච කිලෙසෙහි බහිද්ධා ච සබ්බනිමිත්තෙහි චිත්තං මුත්තං විමුත්තං සුවිමුත්තන්ති – භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො.

**කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානොති** – 'කාලෙනා'ති උද්ධතෙ චිත්තෙ සමථස්ස කාලො. සමාහිතෙ චිත්තෙ විපස්සනාය කාලො.

1. කාලෙ පග්ගණ්හති චිත්තං නිග්ගණ්හාති පුනාපරෙ,[1]
සම්පහංසති කාලෙන කාලෙ චිත්තං සමාදහෙ,[2]
අජ්ඣුපෙක්ඛති කාලෙන සො යොගී කාලකොවිදො.

2. කිම්හි කාලම්හි පග්ගාහො කිම්හි කාලෙ විනිග්ගහො,
කිම්හි පහංසනා කාලො සමථකාලො ච කීදිසො,
උපෙක්ඛාකාලං චිත්තස්ස කථං දස්සෙති යොගිනො?

---

1. අථාපරෙ - PTS. 2. සමාදහති - PTS.

**භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො**-'භික්ඛු' යනු: පෘථග්ජනකල්‍යාණ භික්ෂු හෝ ශෛක්ෂ භික්ෂු හෝ යැ. **සතිමා** යනු: යම් ස්මෘතියක් අනුස්මෘතියක්... සම්‍යක්ස්මෘතියක් ස්මෘතිසම්බොධ්‍යඞ්ගයෙක් එකායනමාර්ගයෙක් වේ ද, මෝ 'සති' යයි කියනු ලබයි. මේ සතියෙන් උපෙත වූයේ සමුපෙත වූයේ... හෙතෙම 'සතිමා' යයි කියනු ලැබේ. **භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො** - ප්‍රථමධ්‍යානයට සමාපන්නයාගේ සිත නීවරණයන් ගෙන් මිදුණේ යැ, වෙසෙසින් මිදුණේ යැ, මොනොවට මිදුණේ යැ; දෙවැනි දහැනට සමවත්හුගේ සිත විතර්කවිචාරයන්ගෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි; තුන්වැනි දහැනට සමවත්හුගේ සිත ප්‍රීතියෙන් ද මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි; චතුර්ථ ධ්‍යානයට සමවත්හුගේ සිත සුඛදුඃඛයන්ගෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි. ආකාසානඤ්චායතන සමාපත්තියට සමවත්හුගේ සිත රූපසංඥාවෙන් ද ප්‍රතිඝසංඥාවෙන් ද නානාත්වසංඥාවෙන් ද මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි. විඤ්ඤාණඤ්චායතනයට සමවත්හුගේ සිත ආකාසානඤ්චායතන සංඥාවෙන්...ආකිඤ්චඤ්ඤායතනයට සමවත්හුගේ සිත විඤ්ඤාණඤ්චායතන සංඥාවෙන්...නෙවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවත්හුගේ සිත අකිඤ්චඤ්ඤායතනසංඥාවෙන් මුක්ත යැ විමුක්ත යැ සුවිමුක්ත යි. ස්‍රොතාපන්නයාගේ සිත සත්කායදෘෂ්ටියෙන් විචිකිත්සායෙන් ශීලව්‍රතපරාමර්ශයෙන් දෘෂ්ට්‍යනුශයෙන් විචිකිත්සානුශයෙන් හා තදෙකස්ථක්ලේශයන්ගෙන් ද මුක්ත විමුක්ත සුවිමුක්ත වෙයි. සකෘදාගාමීහුගේ සිත ඖදාරික වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් හා තදෙකස්ථක්ලේශයන්ගෙන් ද මුක්ත විමුක්ත සුවිමුක්ත වෙයි. අනාගාමීහුගේ සිත අණුසහගත වූ කාමරාගසංයොජනයෙන් ප්‍රතිඝසංයොජනයෙන් අණුසහගත වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් හා තදෙකස්ථ වූ ක්ලේශයන්ගෙන් ද මුක්ත විමුක්ත සුවිමුක්ත වෙයි. රහත්හුගේ සිත රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යාවෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් හා තදෙකස්ථ වූ ක්ලේශයන්ගෙන් ද බාහ්‍ය වූ සියලු ක්ලේශනිමිත්තයන්ගෙන් ද මුක්ත වූයේ විමුක්ත වූයේ සුවිමුක්ත වූයේ වේ නුයි 'භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො' යනු වේ.

**කාලෙන සො ධම්මං පරිවීමංසමානො** - 'කාලෙන' යනු: සිත උද්ධත වූ කල්හි සමාධියට කාල යැ. සිත සමාහිත වූ කල්හි විදර්ශනාවට කාලය යි.

1. අතිශිථිලවීර්‍යතාදියෙන් ලීන සිත ඇති කල්හි ධර්මවිචය වීර්‍ය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග උපදවීමෙන් සිතට අනුග්‍රහ කෙරෙයි. යළි අත්‍යාරබ්ධවීර්‍යතාදියෙන් උද්ධත සිත ඇති කල්හි ප්‍රශ්‍රබ්ධි සමාධි උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයන් උපදවීමෙන් සිතට නිග්‍රහ කෙරෙයි. සිත නිරාස්වාද වූ කල්හි අෂ්ට සංවෙගවස්තු ප්‍රත්‍යවෙක්ෂාවෙන් සංවෙග කෙරෙයි. ශ්‍රද්ධාප්‍රඥාවන් හා සමාධිවීර්‍යයන් සම ව ඇති කල්හි සිත අර්පණාවට පමුණුවන්නේ ය. සිත සමාධිවීථියට පිළිපන් කල්හි මධ්‍යස්ථ වෙයි. මෙබඳු වූ ඒ යොගී තෙමේ කාලඥ වූයේ වේ.

2. කවර කලෙක චිත්තයාගේ ප්‍රග්‍රහය වේ ද, කවර කලෙක නිග්‍රහය වේ ද, කවර කලෙක ප්‍රහර්ෂණය වේ ද, යළි ශමථකාලය කෙබඳු වූයේ ද, යොගීහුගේ සිත පිළිබඳ උපෙක්ෂාකාලය කෙසේ දක්වා ද යත්:

3. ලීනෙ චිත්තම්හි පග්ගාහො උද්ධතස්මිං හි නිග්ගහො,
නිරස්සාදගතං චිත්තං සම්පහංසෙය්‍ය තාවදෙ.

4. සම්පහට්ඨං යදා චිත්තං අලීනං භවතනුද්ධතං,
සමථනිමිත්තස්ස සො[1] කාලො අජ්ඣත්තං රමයෙ මනො.

5. එතෙන මේවුපායෙන[2] යදා හොති සමාහිතං,
සමාහිතං චිත්තමඤ්ඤාය අජ්ඣුපෙක්ඛෙය්‍ය තාවදෙ.

6. එවං කාලවිදූ ධීරො කාලඤ්ඤූ කාලකොවිදො,
කාලෙන කාලං චිත්තස්ස නිමිත්තමුපලක්ඛයෙ”ති.

කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානොති – ‘සබ්බෙ සඞ්ඛාරා අනිච්චා’ති සම්මා ධම්මං පරිවීමංසමානො, සබ්බෙ සඞ්ඛාරා දුක්ඛාති සම්මා ධම්මං පරිවීමංසමානො, සබ්බෙ ධම්මා අනත්තාති සම්මා ධම්මං පරිවීමංසමානො -පෙ- යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්ති සම්මා ධම්මං පරිවීමංසමානොති – කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො.

එකොදිභූතො විහනෙ තමං සොති භගවාති – ‘එකොදී’ති එකග්ගචිත්තො අවික්ඛිත්තචිත්තො අවිසාහටමානසො සමථො සමාධින්ද්‍රියං සමාධිබලං සම්මාසමාධීති එකොදිභූතො. විහනෙ තමං සොති රාගතමං දොසතමං මොහතමං දිට්ඨිතමං මානතමං කිලෙසතමං දුච්චරිතතමං අන්ධකරණං අචක්ඛුකරණං අඤ්ඤාණකරණං පඤ්ඤානිරොධිකං විඝාතපක්ඛිකං අනිබ්බානසංවත්තනිකං හනෙය්‍ය විහනෙය්‍ය පජහෙය්‍ය විනොදෙය්‍ය බ්‍යන්තීකරෙය්‍ය අනභාවං ගමෙය්‍ය.

---

1. සමථස්සච - සසා. PTS.
2. එතෙනෙව උපායෙන - සිමු. II. එතෙන යෙවුපායෙන - PTS.

3. අතිශිථිල වීර්‍යතාදියෙන් සිත ලීන වූ (-හැකුළුණු) කල්හි අනුග්‍රහය වෙයි. අත්‍යාරබ්ධවීර්‍යතාදියෙන් සිත වික්ෂිප්ත වූ කල්හි නිග්‍රහය වෙයි. යම් විටෙක සිත (ප්‍රඥාප්‍රයෝගය මඳ බැවින් හෝ උපශමසුඛය නැතිවීමෙන් හෝ) නිරාස්වාදයට පැමිණියේ ද එ කෙණෙහි සංවේගවස්තු සිහි කිරීමෙන් සංප්‍රහර්ෂණය කරන්නේ ය.

4. යම් කලෙක සිත සංවේගවස්තු ප්‍රත්‍යවේක්ෂාවෙන් හෝ රත්නත්‍රයගුණානුස්මරණයෙන් හෝ සම්ප්‍රහර්ෂිත වේ ද, වීර්‍යය හා යෙදුණු හෙයින් අලීන වේ ද, සමාධිය හා යෙදුණු හෙයින් අනුද්ධත වේ ද, ශමථයට හා ශමථනිමිත්තට ඒ කල් වෙයි. (එකල්හි ධ්‍යානසම්ප්‍රයුක්ත වූ) සිත කසිණාදි ගෝචරාධ්‍යාත්මයෙහි අභිරමණය කරවන්නේ ය.

5. මේ යට කියන ලද උපායෙන් ම යම් කලෙක සිත උපචාර අර්පණාවන්ගෙන් සමාහිත වේ ද, එකල්හි සිත සමාහිත වී යයි දැන එකෙණෙහි අධ්‍යුපේක්ෂණය කරන්නේ ය.

6. මෙසේ කාලය දන්නා වූ කාලඥ වූ කාලයෙහි ඡේක වූ ප්‍රාඥ තෙමේ කලින් කල සමාධිසම්ප්‍රයුක්ත වූ චිත්තයාගේ නිමිත්ත (අරමුණ) සලකන්නේ යි.

**කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො** - සියලු සප්‍රත්‍යය ධර්ම සංඛ්‍යාත ත්‍රෛභූමක සංස්කාරයෝ ඇති වැ නැති වන හෙයින් අනිත්‍ය වූවාහු යයි මනා කොට සියලු සංස්කෘතධර්මය නුවණින් විමසනුයේ, භවත්‍රයපර්‍යාපන්න සියලු සංස්කාරයෝ ප්‍රතිපීඩනාර්ථයෙන් දුක් වූවාහුය යි මනා කොට සියලු ප්‍රත්‍යයොත්පන්නධර්මය නුවණින් විමසනුයේ, සංඛතාසංඛත වූ සියලු ධර්මයෝ අවශයෙන් පවත්නා හෙයින් අනාත්ම වූවාහු යයි මනා කොට සියලු ධර්මය නුවණින් විමසනුයේ...යම් කිසිවෙක් සමුදයධර්ම වූයේ නම් ඒ සියල්ල නිරුද්ධ වන (-නැසෙන) ස්වභාව ඇත්තේ යයි මනා කොට දහම් නුවණින් විමසනුයේ නුයි 'කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො' යනු වේ.

**එකොදිභූතො විහනෙ තමං සො**'ති භගවා - 'එකොදි' යනු: එකාග්‍ර වූ (එක අරමුණෙහි පැවැති) සිත් ඇතියේ, ඖද්ධත්‍යවිරහිත හෙයින් නො විසුරුණු සිත් ඇතියේ, (ඖද්ධත්‍යවිචිකිත්සා වශයෙන්) නො කැලැඹුණු සිත් ඇතියේ ශමථය සමාධීන්ද්‍රිය සමාධිබලය සම්‍යක්සමාධිය ඇත් නුයි 'එකොදිභූතො' යනු වේ. **විහනෙ තමං සො** යනු: ප්‍රඥාලෝකය වළහන හෙයින් අන්ධ කරන ප්‍රඥාචක්ෂුස නො කරන අඥානයෙන් නො දැනීම කරන, ප්‍රඥා නමැති ඇස නිරුද්ධ කරන, පිඩා කොට්ඨාසයෙහි වූ, අප්‍රත්‍යය අමෘතමහානිර්වාණය පිණිස නො පවත්නා වූ රාග නමැති තමස (-අන්ධකාරය) ද්වේෂ නමැති තමස මෝහ නමැති තමස දෘෂ්ටි නමැති තමස මාන නමැති තමස ක්ලේශ නැමති තමස දුශ්චරිත නමැති තමස නසන්නේ යැ, වෙසෙසින් නසන්නේ යැ ස්වකීය සන්තානයෙන් දුරු කරන්නේ යැ නසාපියන්නේ යැ විගතාන්ත වූවක් කරන්නේ යැ අනුඅභාවයට පමුණුවන්නේ යි.

භගවාති ගාරවාධිවචනං. අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ගමානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙසොති භගවා, භජි විභජි පවිභජි ධම්මරතනන්ති භගවා. භවානං අන්තකරොති භගවා. භාවිතකායොති භගවා, භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා. භජි වා භගවා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්පනිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහස්සෙය්‍යකානි පටිසල්ලානසාරුප්පානීති භගවා. භාගී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානන්ති භගවා. භාගී වා භගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා. භාගී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං අරූපසමාපත්තීනන්ති භගවා. භාගී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බවිහාරසමාපත්තීනන්ති භගවා. භාගී වා භගවා දසන්නං සඤ්ඤාභාවනානං දසන්නං කසිණසමාපත්තීනං ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා. භාගී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්සාති භගවා. භාගී වා භගවා දසන්නං තථාගතබලානං චතුන්නං වෙසාරජ්ජානං චතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා. –

භගවා යනු: ගුණවිශිෂ්ට වූ සත්ත්වෝත්තමයා කෙරෙහි ගරුභාවවාචක වූ වචනයෙකි. තවද භග්න කළ (-බිඳින ලද) රාග ඇත්තේ නුයි භගවත් යෑ, භග්න කළ ද්වේෂ ඇත්තේ නුයි භගවත් යෑ, භග්න කළ මෝහ ඇත්තේ නුයි භගවත් යෑ, භග්න කළ නවවිධ මානය ඇත්තේ නුයි භගවත් යෑ, භග්න කළ දෘෂ්ටි ඇත්තේ නුයි භගවත් යෑ, භග්න කළ (විනිවිදින අර්ථයෙන්) කෙලෙස් නමැති කණ්ටක ඇත්තේ නුයි භගවත් යෑ, භග්න කළ (රාගාදි) කෙලෙස් ඇත්තේ නුයි භගවත් යෑ. චින්තාමණ්‍යාදි අර්ථයෙන් රත්න සඞ්ඛ්‍යාත ධර්මය උද්දේශවශයෙන් භාග කෙළේ යෑ, නිර්දේශ වශයෙන් විවිධ වැ විභාග කෙළේ යෑ, ප්‍රතිනිර්දේශවශයෙන් ප්‍රවිභාග කෙළේ නුයි භගවත් යෑ. (නොහොත් ධර්මරත්නය උද්ඝටිතඥයන්ගේ වශයෙන් භාග කෙළේ යෑ, විපඤ්චිතඥයන්ගේ වශයෙන් විභාග කෙළේ යෑ, නෙයපුද්ගලයන්ගේ වශයෙන් ප්‍රවිභාග කෙළේ නුයි භගවත් යෑ.) කාමභවාදි නවවිධ භවයන්ගේ පරිච්ඡේදය (අන්තය) කෙළේ නුයි භගවත් යෑ. භාවිත වූ (-වඩනා ලද) කය ඇත්තේ නුයි භගවත් යෑ, වඩනා ලද (සංවරාදි ප්‍රභෙද වූ) ශීල ඇත්තේ නුයි භගවත් යෑ. වඩනා ලද ලෞකික ලොකොත්තර ප්‍රඥා ඇත්තේ නුයි භගවත් යෑ, බුදුහු වනයෙහි (වාක්ශබ්දයෙන්) අල්පශබ්ද වූ (ග්‍රාම නගරයන් පිළිබඳ නිර්ඝොෂාදි ශබ්දයෙන්) අල්ප නිර්ඝොෂ වූ (ඇතුළත හැසිරෙන ජනයාගේ ශරීරවාතයෙන්) ජනවාත විරහිත වූ මිනිසුන්ගේ රහස්‍යකාරණයන්ට සුදුසු වූ විවෙකයට අනුරූප වූ මනුෂ්‍යොපචාරය ඉක්මවා සිටි ප්‍රාන්තප්‍රසන (-වනයෙහි දුරු) සෙනාසනයන් ද මිනිසුන්ගේ කෘෂි වප්නාදිය රහිත වූ වනප්‍රස්ථ (-වනයෙහි ඉතා දුර) සෙනාසනයන් ද සෙවනය කළාහු නුයි 'භගවත්' යෑ. නොහොත් බුදුහු චීවර පිණ්ඩපාත ශයනාසන ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර සඞ්ඛ්‍යාත සිවුපසයට හිමි වූවාහු නුයි 'භගවත්' යෑ. නොහොත් බුදුහු හෙතුඵලසම්පත්ති සඞ්ඛ්‍යාත අර්ථරසයට හෙතුසම්පත්ති සඞ්ඛ්‍යාත ධර්මරසයට අග්‍රඵලසඞ්ඛ්‍යාත විමුක්තිරසයට අධිශීලයට අධිචිත්තයට අධිප්‍රඥාවට හිමි වූවාහු නුයි 'භගවත්' යෑ. බුදුහු (ප්‍රථමධ්‍යානාදි) චතුර්විධ ධ්‍යානයන්ට (මෛත්‍ර්‍යාදි ස්ඵරණප්‍රමාණ විරහිත වූ) සතර බ්‍රහ්මවිහාරයන්ට (ආකාසානඤ්චායතනාදි) චතුර්විධ අරූපධ්‍යානයන්ට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' යෑ. නොහොත් බුදුහු (රූපී රූපානි පස්සති' යනාදීන් වදාළ ආලම්බන විමුක්ත වූ) අෂ්ට විමොක්ෂයට (අභිභවනය කළ කසිණාරම්මණ ඇති) අෂ්ට අභිභ්වායතනයට (අනුපරිපාටියෙන් සමවැදිය යුතු) නව අනුපූර්විහාරසමාපත්තීන්ට හිමි වූවාහු නුයි 'භගවත්' යෑ. බුදුහු (අනිත්‍යසංඥාදි) දශ සංඥාභාවනාවන්ට දශ කෘත්ස්නසමාපත්තීන්ට ආනාපානසමෘති සම්ප්‍රයුක්ත සමාධියට අශුභධ්‍යානසමාපත්තියට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' යෑ. බුදුහු සතර සතිපට්ඨානයන්ට සතර සම්‍යක්ප්‍රධානයන්ට සතර ඍද්ධිපාදයන්ට පඤ්චෙන්ද්‍රියයන්ට පඤ්ච බලයන්ට සප්ත බොධ්‍යඞ්ගයන්ට ආර්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගයට හිමි වූවාහු නුයි හෝ 'භගවත්' යෑ. බුදුහු දශ තථාගතබලයන්ට චතුර්වෛශාරද්‍යයන්ට සතර ප්‍රතිසංවිද්ධර්මයන්ට ෂඩභිඥාවන්ට ෂඩ්බුද්ධධර්මයන්ට හිමි වූවාහු නුයි හෝ භගවත් යෑ. -

'භගවා'ති නෙතං නාමං මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං. න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං. විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකාපඤ්ඤත්ති යදිදං භගවාති - එකොදිභූතො විහරෙ තමං සොති භගවා.

තෙනාහ භගවා:

"එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො,
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහරෙ තමං සො (ති භගවා"ති.)

සොළසමො
සාරිපුත්තසුත්තනිද්දෙසො
සමත්තො.

## මහානිද්දෙසපාළි නිට්ඨිතා.

'භගවත්' යන මේ නාමය මෑණියන් විසින් නො කරන ලද, පියාණන් විසින් නො කරන ලද, බෑණන් විසින් නො කරන ලද, බූණන් විසින් නො කරන ලද, සගයහළුවන් විසින් නො කරන ලද, නෑසහලේනෑයන් විසින් නො කරන ලද, මහණ බමුණන් විසින් නො කරන ලද, දෙවියන් විසින් නො කරන ලද. මේ 'භගවත්' යන යම් නාමයෙක් වී නම්, මේ භාග්‍යවත් බුදුවරයන්ට අර්හත්මාර්ගයාගේ අන්තයෙහි බොධිමණ්ඩයෙහි දී සර්වඥතාඥාන ප්‍රතිලාභය සමග අර්හත්ඵලය (හෝ සර්වධර්මයන්) ප්‍රත්‍යක්ෂ කිරීමෙන් උපන් ප්‍රඥප්තියක් වී නුයි 'එකොදි භූතො විහරෙ තමං සො'ති භගවා' යනු වේ.

එයින් වදාළහ බුදුහු:

"එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො,
කාලෙන සො සම්මා ධම්මං පරිවීමංසමානො
එකොදිභූතො විහරෙ තමං සො (ඉති භගවා"ති.)

සොළොස් වැනි වූ සාරිපුත්ත සූත්‍රනිර්දේශය
සමාප්ත යි.

## මහනිද්දෙස්පෙළ නිමි.

# මහානිද්දෙසපාළි

## ගාථාදිපාදසූචි


අකිත්තයී විවටචක්ඛු 486, 502
අක්කොධනො අසන්තාසී 292, 298
අච්චයන්ති අහොරත්තා 62, 116
අජ්ඣත්තමෙව උපසමෙ 482, 484
අඤ්ඤං ඉතො යාභිවදන්ති ධම්මං 410
අතිසාරදිට්ඨියා සො සමත්තො 406, 408
අත්තදණ්ඩා භයං ජාතං 558, 564
අත්තනාව කතං පාපං 46
අත්තං පහාය අනුපාදියානො 148, 150
අථ ත්වං පවිතක්කමාගමා 248
අථ සත්ථානි කුරුතෙ 208, 210
අථාපරං පඤ්ච රජානි ලොකෙ 720, 722
අදස්සනාතො ආයන්ති 60, 146
අද්දසං කාම තෙ මූලං 4, 42
අනත්ථජනනො දොසො 22, 500, 666
අනත්ථජනනො මොහො 22. 500, 666
අනත්ථජනනො ලොභො 22, 498, 664
අනන්තරා ච යෙ භග්ගා 60, 162
අනිට්ඨුරී අනනුගිද්ධො 620, 622
අනිධානගතා භග්ගා 60, 162
අනිබ්බත්තෙන න ජාතො 60, 162
අනෙජස්ස විජානතො 622, 624
අන්නඤ්ච ලද්ධා වසනඤ්ච කාලෙ 704, 708
අන්නානමථො පානානං 512, 514
අප්පමායු මනුස්සානං 62, 166
අප්පං වත ජීවිතං ඉදං 162, 168
අප්පං හි එතං න අලං සමාය 418, 420
අබලානං බලීයන්ති 16, 24
අභිභූ හි සො අනභිභූතො 554, 556
අයොකපාලමාදිත්තං 562
අසන්තඤ්ච සන්තඤ්ච ඤත්වා ධම්මං 84, 462
අස්සද්ධො අකතඤ්ඤූ ච 322
ආගුං න කරොති කිඤ්චි ලොකෙ 276
ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො 690, 692
ආථබ්බණං සුපිනං ලක්ඛණං 526, 528
ආමාය දාසාපි භවන්ති එකෙ 16
ආසාය කසතෙ ඛෙත්තං 356
ඉච්ඡානිදානා භවසාතබද්ධා 42, 50
ඉදං වදාමීති න තස්ස හොති 250, 254
ඉධෙව සුද්ධිං ඉති වාදයන්ති 220, 222, 410, 412
උච්චාවචෙසු සයනෙසු 660
උත්තරිය ච භිත්තියා 562
උදබින්දු යථාපි පොක්ඛරෙ 186
උදෙති ආපූරති වෙති චන්දො 172, 612
උපයො හි ධම්මෙසු උපෙති වාදං 112, 114
උපෙක්ඛකො සදා සතො 326, 330
උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං 72, 80
එකං හි සච්චං න දුතියමත්ථි 398, 400
එකායනං ජාතිඛයන්තදස්සී 644
එකො පුබ්බෙ චරිත්වාන 200, 202
එතදඤ්ඤාය මෙධාවී 8
එතමාදීනවං ඤත්වා 214, 216
එතං ච ධම්මමඤ්ඤාය 552, 554
එතාදිසං චෙ රතනං න ඉච්ඡසි 250
එතෙ ච ඤත්වා උපනිස්සිතාති 386, 388

එතෙන මෙවුපායෙන 726
එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං
722, 730
එත්තාවතග්ගම්පි වදන්ති
හෙකෙ 384, 386
එවමාදීනවං ඤත්වා 642
එවං කාලවිදූ සියා 726
එවං පි විග්ගය්හ
විවාදයන්ති 390, 392
එසා නමුචි තෙ සෙනා 132, 458
ඔකං පහාය
අනිකෙතසාරී 268, 270, 274
ඔක්ඛිත්තචක්ඛු න ච
පාදලොලො 710, 716
ඔවදෙය්‍යානුසාසෙය්‍ය 718
ඔසානෙ ත්වෙව බ්‍යාරුද්ධෙ 572, 574
කති පරිස්සයා ලොකෙ 662, 668
කථං දස්සී කථං සීලො 284, 286
කථං සමෙතස්ස විභොති
රූපං 378, 380
කදරියා තපනා ඝොරා 562
කයවික්කයෙ න තිට්ඨෙය්‍ය 532, 538
කස්මා නු සච්චානි වදන්ති
නානා 400, 402
කං සො සික්ඛං සමාදාය 678, 680
කාමං කාමයමානස්ස 1, 6
කාමා තෙ පඨමා
සෙනා 132, 240, 458
කාමෙසු ගිද්ධා පසුතා
පමූළ්හා 50, 54
කායමුනිං වාචාමුනිං 82, 460
කාලෙ පග්ගණ්හති චිත්තං
කිඤ්චාපි තෙ තං ජලතෙ 724
විමානං 570
කින්නු සන්තොති පවෙච්චසි 616
කිම්හි කාලම්හි පග්ගාහො 724
කිං සු අසිස්සං කුහිං වා
අසිස්සං 700, 704
කුතො නිදානා කලහා
විවාදා 344, 348
කුද්ධො අත්ථං න
ජානාති 22, 500, 666
කුහා ථද්ධා ලපා සිඞ්ගී 172
කොධාතිමානස්ස වසං න
ගච්ඡෙ 696, 698
කොධං මොසවජ්ජඤ්ච 362, 368
ඛ්‍යාස්ස බ්‍යප්පථයො අස්සු 668, 678
ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං වා 14, 16
ගෙධං බ්‍රූමි මහොඝොති 600, 602
චක්ඛූහි නෙව ලොලස්ස 502, 508
චතුක්කණ්ණො චතුද්වාරො 562
චිරස්සං වත පස්සාම 614
චුදිතො වචීභි
සතිමාභිනන්දෙ 716, 720
චුල්ලාසීතිසහස්සානි 60, 162
චොරා හරන්ති රාජානො 8
ඡදනම්හා සමුට්ඨාය 562
ඡන්දානිදානානි පියානි
ලොකෙ 354, 358
ඡන්දො නු ලොකස්මිං කුතො
නිදානො 358, 360
ජාතවෙදසමො කායො 562
ජානාමි පස්සාමි තථෙව
එතං 442, 444
ජිණ්ණෙ රථස්ස
මණිකුණ්ඩලෙ ච 612
ජීවිතං අත්තභාවො ච 60, 162
ඣායී න පාදලොලස්ස 514, 520
තඤ්චාපි ගන්ථං කුසලා වදන්ති 146
තණ්හා දුතියො පුරිසො 642
තත්ථ සත්තා මහාලුද්දා 562
තත්ථ සික්ඛානුගීයන්ති 586, 588
තමූපනිස්සාය ජිගුච්ඡිතං
වා 430, 432
තං බුද්ධං අසිතං තාදිං 644, 656
තං බ්‍රූමි උපසන්තොති 334
තස්මා ජන්තු සදා සතො 24, 30
තස්මා හි සික්ඛෙථ ඉධෙව
ජන්තු 54 64
තස්ස අයොමයා භූමි 562
තස්ස චෙ කාමයානස්ස 6, 8
තස්සායං පච්ඡිමකොටි 30, 650
තස්සීධ දිට්ඨෙ ච සුතෙ මුතෙ වා 154
තිණකට්ඨසමං ලොකං 616
තෙ නිබ්බුතිං ආසිංසමානා
දදන්ති 594
තෙ වාදකාමා පරිසං විගය්හ 224
තෙසං මච්චුපරෙතානං 168
ථෙය්‍යං න කාරෙය්‍ය න මුසා
භණෙය්‍ය 692, 696

දක්ඛිණාය ච භිත්තියා 562
දන්තං නයන්ති සමිතිං 330
දහරා ච මහන්තා ච 166
දිට්ඨාපි සුතාපි යෙ ජනා 174, 176
දිට්ඨිඤ්ච නිස්සාය
අනුපුච්ඡමානො 264
දිට්ඨිනිවෙසා න හි
ස්වාතිවත්තා 104, 106
දිට්ඨිම්පි ලොකස්මිං න
කප්පයෙය්‍ය 146, 148
දිට්ඨෙන වෙ සුද්ධි නරස්ස
හොති 118
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ වා 404
දිස්වාන තණ්හං අරතිං රගඤ්ච 248
දුක්ඛමෙව හි සම්භොති 618
දූරෙ සන්තො පකාසෙන්ති 630
දෙසො රජො න ච පන රෙණු
වුච්චති 720
ධොනස්ස හි නත්ථි කුහිඤ්චි
ලොකෙ 106, 112
ධොනො න හි තෙන
මඤ්ඤති 186, 190
න කප්පයන්ති න
පුරෙක්ඛරොන්ති 156, 160,
134, 138
න ච කත්ථිකො සියා
භික්ඛු 538, 546
න ච කෙනචි කොචි හායති 62, 164
න චාහමෙතං තථියන්ති බ්‍රෑමි 396
න තස්ස අද්දිට්ඨමිධත්ථි
කිඤ්චි 494, 640
න තස්ස පුත්තා පසවො 336
න තෙ තතො නික්ඛමිතුං 562
න දිට්ඨියා න සුතියා න
ඤාණෙන 256, 260
න පණ්ඩිතා උපධිසුඛස්ස
හෙතු 594
න බ්‍රාහ්මණො අඤ්ඤතො
සුද්ධිමාහ 120, 124
න බ්‍රාහ්මණො කප්පමුපෙති
සඞ්ඛං 448, 450
න මෙ දිට්ඨො ඉතො
පුබ්බෙ 626, 630
න මොනෙන මුනි හොති 82, 462
න වෙදගූ දිට්ඨියා න
සුතියා 280, 282
න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤ-
සඤ්ඤී 380, 382
න සමෙසු න ඔමෙසු 624, 626
න හි එතෙහි යානෙහි 330
න හෙව සච්චානි බහූනි
නානා 402, 404
නාමඤ්ච රූපඤ්ච පටිච්ච
ඵස්සා 374, 378
නාසිස්සං න පිවිස්සාමි 94, 676
නාහං සහිස්සාමි පමොචනාය 46
නික්කුහා නිල්ලපා ධීරා 172
නිද්දං තන්දිං සහෙ ථිනං 590, 594
නිද්දං න බහුලීකරෙය්‍ය 520, 524
නිධීනංව පවත්තාරං 718
නිඤ්ඤය තප්පවෙධෙය්‍ය 530, 532
නිබ්බත්තානං ච ධම්මානං 60, 164
නිරාසත්ති අනාගතෙ 300, 302
නිවිස්සවාදී න හි
සුබ්බිනායො 446, 448
නො චෙ කිර දිට්ඨියා න
සුතියා 260, 262
පකප්පිතා සඞ්ඛතා යස්ස
ධම්මා 100, 104
පච්ඡිමාය ච භිත්තියා 562
පජ්ජෙන කතෙන අත්තනා 98
පඤ්චන්නධීරො භයානං න
භායෙ 684, 688
පඤ්චමී පීනමිද්ධං තෙ 132, 458
පඤ්ඤං පුරක්ඛත්වා
කල්‍යාණපීති 698, 700
පණ්ඩිතොති සමඤ්ඤාතො 210
පතිරූපකො මත්තිකා
කුණ්ඩලොව 632
පතිලීනචරස්ස භික්ඛුනො 178, 182
පතිලීනො අකුහකො 302, 316
පත්ථයමානස්ස හි
ජප්පිතානි 432, 434
පරධම්මිකානම්පි න
සන්තසෙය්‍ය 688, 690

පරමන්ති දිට්ඨීසු
පරිබ්බසානො 140, 142
පරස්ස චෙ
ධම්මමනානුජානං 392, 394
පරස්ස චෙ වම්භයිතෙන හීනො 438
පරස්ස චෙ හි වචසා
නිහීනො 408, 410
පස්සං නරො දක්ඛති
නාමරූපං 444, 446
පස්සාමි ලොකෙ
පරිඵන්දමානං 64, 68
පස්සාමි සුද්ධං පරමං අරොගං 116
පාපානි පරිවජ්ජයී 82, 462
පියප්පහූතා කලහා විවාදා 348, 352
පියා සු ලොකස්මිං කුතො
නිදානා 352, 354
පුච්ඡාමි තං ආදිච්චබන්ධුං 466, 472
පුබ්බාසවෙ හිත්වා නවෙ
අකුබ්බං 454, 456
පුබ්බෙව මච්චං විජහන්ති
භොගා 170, 612
පුරත්ථිමාය ච හිතත්ථා 562
පුරත්ථිමෙන ච ධාවන්ති 562
පුරාණං නාභිනන්දෙය්‍ය 598, 600
පුරිමං පහාය අපරං
සිතාසෙ 124, 126
පෙක්ඛතං යෙව ඤාතීනං 168
ඵන්දමානං පජං දිස්වා 564, 568
ඵලානමිව පක්කානං 166
ඵස්සනිදානං සාතං අසාතං 370, 372
ඵස්සෙන යදා ඵුට්ඨස්ස 508, 510
ඵස්සො නු ලොකස්මිං කුතො
නිදානො 372, 374
බාහෙත්වා සබ්බපාපානි 120
භික්ඛුනො විජිගුච්ඡතො 658, 660
මගධං ගතා කොසලං ගතා 704
මච්චුනාබ්භාහතො ලොකො 570
මජ්ඣෙ යථා සමුද්දස්ස 484, 486
මමායිතෙ පස්සථ ඵන්දමානෙ 70, 72
මරණෙනපි තං පහීයති 170, 174
මූලං පපඤ්චසඞ්ඛාය 472, 478
මූළ්හා අත්ථං න
ජානාති 22, 500, 666
මෙථුනමනුයුත්තස්ස
මුස්සතෙ 196, 198
මෙථුනමනුයුත්තස්ස
විඝාතං 190, 194
මොසවජ්ජෙ න නීයෙථ 546, 550
594, 598
මොඝො රජො න ච පන
රෙණූ වුච්චති 720
යඞ්කිඤ්චි ධම්මමභිජඤ්ඤා 480
යථා නින්නා පවත්තන්ති 60, 162
යථාපි අඞ්ගසම්භාරා 616
යථාපි කුම්භකාරස්ස 166
යදත්තනී පස්සති
ආනිසංසං 142, 144
යන්නං අපුච්ඡිම්හ අකිත්තයී
නො 382, 384
යමාහු ධම්මං පරමන්ති
එකෙ 434, 436
යමාහු සච්චං තථියන්ති
එකෙ 396, 398
යසො කිත්ති ච යං
පුබ්බෙ 202, 206
යස්ස නත්ථි ඉදං මෙති 616, 618
යස්ස නිස්සයතා නත්ථි 332
යස්ස ලොකෙ හයං නත්ථි 342, 344
යස්සින්ද්‍රියානි භාවිතානි 330
යස්සූභයන්තෙ පණිධීධ
නත්ථි 150, 152
යං පුබ්බෙ තං
විසොසෙහි 608, 610
යං යං දිසං පධාවනායි 562
යං කාචිමා සම්මුතියො
පුථුජ්ජා 420, 422
යුත්තා කථායං පරිසාය
මජ්ඣෙ 224
යෙ කෙචිමෙ දිට්ඨී
පරිබ්බසානා 416, 418
යෙන නං වජ්ජුං
පුථුජ්ජනං 336, 340
යෙන සල්ලෙන
ඔතිණ්ණො 574, 584
යෙ නිරුද්ධා මරන්තස්ස 60, 162
යෙනෙව බාලොති පරං
දහාති 404, 406

යෙහි විවිත්තො විචරෙය්‍ය
ලොකෙ 247, 278
යො අත්තනො සීලවතානි
ජන්තු 92, 96
යො කාමෙ පරිවජ්ජෙති 8, 14
යො ච කාමෙ අච්චතරි 606, 608
යො වෙ කාලෙ අසම්පත්තෙ 718
රාගො ච දොසො ච ඉතො
නිදානා 22, 500, 666
රාගො රජො න ච පන රෙණු
වුච්චති 720
රිත්තස්ස මුනිනො
චරතො 218, 220
ලාභකම්‍යා න සික්ඛති 322, 326
ලාභො අලාභො අයසො
යසො ච 572
ලාභො සිලොකො
සක්කාරො 132, 458
ලීනෙ චිත්තම්හි පග්ගාහො 726
ලුද්ධො අත්ථං න
ජානාති 22, 500, 666
ලොභො දොසො ච
මොහො ච 22, 500, 666
වදන්ති තං දුට්ඨමනාපි
එකෙ 86, 88
වරමස්සතරා දන්තා 330
විජිගුච්ඡමානස්ස යදිදං
ඵාසු 680, 684
විධාසු න විකම්පති 330
විනිච්ඡයානි පකප්පිතානි 254, 256
විනිච්ඡයෙ ඨත්වා සයං
පමාය 414, 416
විවෙකඤ්ඤෙව සික්ඛෙථ 216, 218
විසජ්ජගන්ථානි මුනීධ
ලොකෙ 45, 454
වීතගෙධො අමච්ඡරී 340, 342
වීතතණ්හො පුරාභෙදා 286, 290
වෙදානි විචෙය්‍ය
කෙවලානි 128, 280
සකං සකං දිට්ඨි
පරිබ්බසානා 388, 390
සකං හි දිට්ඨිං
කථමච්චයෙය්‍ය 88, 92
සකං හි ධම්මං පරිපුණ්ණමාහු 436
සකායනෙ වාපි දළ්හං
වදානො 412, 414
සඞ්කප්පෙහි පරෙතො
සො 206, 208
සචෙ චුතො
සීලබ්බතතො 424, 428
සච්චන්ති සො බ්‍රාහ්මණො
කිං වදෙය්‍ය 266, 268
සච්චා අවොක්කම්ම
මුනි 602, 604
සච්චො සියා
අප්පගබ්භො 588, 590
සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය
ඔඝං 80, 86
සඤ්ඤාවිරත්තස්ස න සන්ති
ගන්ථා 282, 284
සත්තො ගුහායං බහුනාභි
ඡන්නො 32, 42
සදෙවකස්ස ලොකස්ස 630, 644
සද්ධම්මපූජා ච පනා
තථෙව 438, 440
සන්තො ච භික්ඛු
අභිනිබ්බුතත්තො 96, 100
සන්දිට්ඨියා චෙව න
වෙවදාතා 394
සබ්බත්ථ මුනී
අනිස්සිතො 182, 186
සබ්බසො නාමරූපස්මිං 610, 614
සබ්බො ආදීපිතො ලොකො 570
සමන්තමසාරො ලොකො 568, 572
සමො විසෙසී උද වා නිහීනො 266
සම්පහට්ඨං යදා චිත්තං 728
සයං සමාදාය වතානි
ජන්තු 126, 132
ස වෙ විද්වා ස වෙදගූ 604, 606
ස සබ්බධම්මෙසු විසෙනි-
භූතො 132, 134, 456, 464
සාතං අසාතඤ්ච කුතො
නිදානා 368, 370
සාතං අසාතන්ති
යමාහු ලොකෙ 360, 362

සාතියෙසු අනස්සාවී 316, 322
සාධුචරිතකං සාධුසුචරිතං 704
සීමාතිගො බ්‍රාහ්මණො
තස්ස නත්‍ථි 138, 140
සීලබ්බතං වාපි පහාය
සබ්බං 428, 430
සීලුත්තමා සඤ්ඤමෙනාහු
සුද්ධිං 422, 424
සුඤ්ඤතො ලොකං
අවෙක්ඛස්සු 616
සුත්වා දූසිතො බහුං
වාචං 550, 552
සුද්ධධම්මසමුප්පාදං 616
සුපිනෙන යථාපි සඞ්ගතං 174
සෙය්‍යො න තෙන
මඤ්ඤෙය්‍ය 482
සෙලෙ යථා පබ්බත-
මුද්ධනිට්ඨිතො 494, 640
සොකපරිදෙවමච්ඡරං 176, 178
සොචන්ති ජනා
මමායිතෙ 138, 170
හෙට්ඨතො ච සමුට්ඨාය 562

# මහානිද්දෙසපාළි

## නිද්දිට්ඨපදසූචි


අකප්පියො 340
අකිත්තයී නො 382
අකිත්තයී විවටචක්ඛු 486
අකුක්කුච්චො 296
අකුබ්බමානො 72, 78
අකුහකො 304
අකුහං ගණිමාගතං 652
අකුහො 652
අකෙවලී තෙ 410
අකෙවලී සො 390
අක්කුසලො 392
අක්කොධනො අසන්තාසී 292
අක්කොධනො ලොභපාපං 590
අක්ඛාය වාදං පරිසාය මජ්ඣෙ 232
අක්ඛෙය්‍යං 176
අගතා දිසා 666
අගාරමුනිනො 462
අගිද්ධො 278
අග්ගාවරෙ 670
අග්ගිවෙස්සන 416
අඝලොකං 212, 578
අච්චතරි 606
අච්චන්තසුද්ධීති න තෙ වදන්ති 136
අච්චයෙය්‍ය 90
අජපථං 214, 578
අජෙගුච්ඡා 308, 314
අජ්ඣත්තමෙව උපසමෙ 482
අජ්ඣත්තං 476
අජ්ඣත්තං උපසන්තස්ස 484
අඤ්ඤං ඉතො යාභිවදන්ති 410
අඤ්ඤං තං පුච්ඡාම 384
අඤ්ඤත්‍ර සඤ්ඤාය නිච්චානි 402
අඤ්ඤමඤ්ඤං 224
අඤ්ඤමඤ්ඤෙහි බ්‍යාරුද්ධො 566
අඤ්ඤසිතා 224
අඤ්ඤස්ස ධම්මං පන හීනමාහු 436
අඤ්ඤෙන සො සුජ්ඣති 118
අණුම්පි 264
අතරි සො විසත්තිකං 334
අතිව 166
අතිමානෙ ච නො යුතො 318
අතිමානෙ න තිට්ඨෙය්‍ය 592
අතිමානතො 346, 592
අතිවෙලං 718
අතිසාරදිට්ඨියා සො සමත්තො 406
අතිසිත්වා අඤ්ඤෙන වදන්ති සුද්ධිං 444
අතීතං නානුසොචති 300
අත්තගරහී 78
අත්තඤ්ජහො නයිධ පකුබ්බමානො 124
අත්තදණ්ඩා භයං ජාතං 558
අත්තං නිරත්තං න හි තස්ස අත්ථි 114
අත්තං පහාය අනුපාදියානො 148
අත්තා 102, 114, 144, 336, 484
අත්තාපි නිරත්තා වා 336
අත්ථි පඤ්හෙන ආගමං 656
අථ 208, 242, 520, 574, 698, 720
අථ ඛො සො ජරසාපි මීයති 166
අථ වෙ සයං වෙදගූ හොති ධීරො 408
අථ ජීවිතෙන පඤ්ඤාය 548, 550
අථ ත්වං පවිතක්කමාගමා 242
අථප්පියං වා පන අප්පියං වා 698
අථවාපි දිට්ඨංව සුතං මුතං වා 430
අථවාපි බහිද්ධා 480
අථවාපි සමාධිං 502
අථ සත්ථානි කුරුතෙ 208
අථස්ස සුද්ධිං 424
අථාපරං පඤ්ච රජානි ලොකෙ 720
අථාපරානි අභිසම්භවෙය්‍ය 690
අ[illegible], සහෙතු සයහෙතු 520

අථෙත්ථ සල්ලමද්දක්ඛිං 574
අථො පසංසම්පි ලභන්ති
තත්ථ 418
අථොපි වෙ සච්චමනා වදන්ති 86
අදක්ඛි 444
අදස්සං 254
අදිට්ඨජෝතනා පුච්ඡා 466
අදිට්ඨීනතා 212
අදිට්ඨියා අස්සුතියා
අඤ්ඤාණා 258, 262
අද්දක්ඛිං 574
අද්ධා 4
අද්ධා පීතිමනො හොති 4
අධිචිත්තසික්ඛං 56, 478
අධිපඤ්ඤාසික්ඛා 56, 478
අධිපාතකා 688
අධිවාසයෙය්‍ය 692
අධිසීලසික්ඛා 56, 478
අධොසි සො දිට්ඨිනිබද්ධ 114
අනගාරමුනිනා 462
අනත්තගරහී 456
අනනුගිද්ධා 620
අනභිභූතො 556
අනරියධම්මං කුසලා තමාහු 96
අනාදියානං 154
අනානුගිද්ධා 76
අනානුජාතං 312
අනානුපුට්ඨො 94
අනාරියං 198
අනිකෙතචාරී 702
අනිකෙතසාරී 272
අනිච්ඡුපි අනනුගිද්ධො 620
අනිස්සාය 260
අනිස්සිතො 183, 332
අනුගිජ්ඣති 16
අනුග්ගහාය 254, 258
අනුග්ගහො උග්ගණ්හන්ති
මෙධගා 434
අනුඩහාති 230
අනුද්ධතො 298
අනුපලිත්තො 1:4
අනුපයං තෙන කථං වදෙය්‍ය 114
අනූපයො සො උපයං කිමෙය්‍ය 442
අනුපාදියානො 148, 472
අනුපුච්ඡමානො 264
අනුසික්ඛෙ 556
අනූපනීතො ස නිවෙසනෙසු 282
අනෙකරූපෙහි 482
අනෙජස්ස 486, 622
අනෙජො 620
අනොකසාරී 270
අනොකො 692
අනොසිතං 572
අත්තං 288
අත්තා 74
අනෙත්තා 152
අන්තං 704
අත්තඤ්ච ලද්ධා වසනඤ්ච
කාලෙ 704
අත්තානම්හො පාතානං 512
අපරද්ධා 410
අපාසදං පඤ්ඤාවීමංසකා සෙ 228
අපාසදස්මිං පන මඛකු හොති 226
අපිහාලු අමච්ඡරී 308
අපුඤ්ඤං 124
අපුරෙක්ඛතං 338
අපුරෙක්ඛරානො 274
අප්පගබ්භො 588
අප්පගබ්භො අජෙගුච්ඡො 308
අප්පඤ්හි එතං න අලං සමාය 418
අප්පඤ්හි ජීවිතං ආහු ධීරා 60, 64
අප්පමත්තො 84, 555
අප්පසද්දෙසු භික්ඛු විහරෙය්‍ය 520
අප්පං වත ජීවිතං ඉදං 162, 166
අප්පියා 184, 698
අප්පොදකෙ 72, 566
අබන්ධනො 608
අබලා නං බලීයන්ති 18
අබ්බූළ්හසල්ලො 84
අභිජප්පමෙති පටිපූරමිච්ඡං 236
අභිජප්පා 480
අභිනිබ්බුතත්තො 98
අභිනීතො 210
අභිභූ හි සො අනභිභූතො 556
අභිවදන්ති 410

අභිසම්භවෙය්‍ය 690
අභිසම්භවෙ 668
අමච්ඡරී 308, 340
අමනුස්සපුච්ඡා 466
අමමො චරෙය්‍ය 72
අමායො රිත්තපෙසුණො 588
අම්බුජං 276
අරති 574, 709
අරතිං සහෙථ 700
අරිත්තො 272
අලාභෙ ච න කුප්පති 324
අවදානියා තෙ විසමෙ නිවිට්ඨා 52
අවිකත්ථී අකුක්කුච්චො 294
අවිරුද්ධො ච තණ්හාය 324
අවිවාදභූමිං 420
අවීතතණ්හා සෙ 68, 430
අවිනිවත්තතං 142
අවෙච්චදතා 100
අසංසුද්ධි 392
අසතා ච න සොචති 342, 612
අසන්තාසී 294
අසන්තෙසු 452
අසංවිදං 618
අසාතං 360, 372
අසිතං 646
අසිස්සං 702
අසුද්ධිං 428
අසෙඛමුනිනො 462
අස්මි 474
අස්සා 16
අස්සුතියා 258
ආකාසං 600
ආකාසං න සිතො සියා 600
ආගතං 656
ආගතො 630
ආගමිං 656
ආජවං බ්‍රූමි ජප්පනං 602
ආතඞ්කඵස්සෙන ඛුදාය ඵුට්ඨො 690
ආතඞ්කඵස්සො 690
ආතාපී 522
ආතුමා 96, 404, 482
ආථබ්බණං සුපිනං 526
ආදුතගන්ධං ගවිතං විසජ්ජ 136
ආදිච්චබන්ධුං 468
ආදියතිච්ච ධම්මං 106
ආදීනවං 214
ආනෙඤ්ජ 618
ආනිසංසං 102, 144
ආයස්මා 192, 626
ආරම්මණං පකම්පනං 602
ආසත්ති 72, 300
ආසං න කුබ්බන්ති 138
ආසනං 180, 520, 658, 682
ආසා 138, 356
ආසා ච නිට්ඨා ච ඉතො 356, 358
ආසා ච නිට්ඨා ච කුතො 154
ඉච්ච 192, 626
ඉච්චායස්මා තිස්සො
මෙත්තෙය්‍යො 192
ඉච්චායස්මා සාරිපුත්තො 626
ඉච්ඡං භවනම්තන්තනො 572
ඉච්ඡා 42, 376
ඉච්ඡානිදානා 42, 44
ඉච්ඡානිදානානි 376
ඉච්ඡායසන්තියා 376
ඉති 170, 254, 262
ඉති දිස්වා 170
ඉති මාගන්දියො 254, 262
ඉති මෙ මතො අහු 380
ඉතිහන්ති 98
ඉතො ච නාද්දක්ඛිං අඤ්ඤම්පි
සකුදං 264
ඉතොනිදානං 372
ඉදමෙව සච්චන්ති ච
වාදයන්ති 238, 418
ඉදං පරිකෙකාසමකෙවලී සො 390
ඉදං වදාමීති න තස්ස හොති 250
ඉධ 58, 152, 214, 424, 452
ඉධ තොසනත්ථං 706
ඉධ පණ්ඩිතා සෙ 384
ඉධෙව සිකඛම් අථස්ස සුද්ධිං 424
ඉධෙව සුද්ධිං ඉති
වාදයන්ති 222, 412
ඉමෙව කායෙ පුරිමෙව ජප්පං 50
ඉරියානො 606

උග්ගණ්හන්ති 450, 454
උග්ගය්හ 236
උග්ගහාති 230
උච්චාවචං ගච්ඡති සඤ්ඤසත්තො 128
උච්චාවචෙසු සයනෙසු 660
උණ්හං 692
උත්තමං නරං 286
උත්තරිං කුරුතෙ 142
උදබින්දු යථාපි පොක්ඛරෙ 186
උද 628
උදවං 266
උදාහු අඤ්ඤම්පි වදන්ති එත්තො 384
උදාහු තෙ තක්කමනුස්සරන්ති 402
උද්ධංසරා සුද්ධිමනුත්ථුනන්ති 430
උද්ධං ස ලොකස්මිං විවාදමෙති 416
උන්නමතිච්ච තෙන 232
උපච්චගා මන්ති අනුත්ථුනාති 230
උපට්ඨිතා 424
උපධිවිවෙකො 38, 476
උපනිස්සිතා 382
උපයං 440
උපයා 112, 114, 282
උපයො 112, 422
උපයො හි ධම්මෙසු උපෙති වාදං 112
උපවාදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි 534
උපසන්තස්ස 484
උපසන්තොති වුච්චති 286
උපසන්තො චරිස්සසි 610
උපසමෙ 482
උපාතිවත්තො 442
උපෙක්ඛා 712
උපෙක්ඛකො 452
උපෙක්ඛකො සදා සතො 326, 330
උපෙක්ඛති උග්ගණ්හන්ති මඤ්ඤෙ 450
උපෙක්ඛමාරබ්භ සමාහිතත්තො 712
උභොසු අන්තෙසු විනෙය්‍ය ඡන්දං 74
උස්සදං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි 486
උස්සදා 100, 330, 486
එකචරියං අධිට්ඨිතො 212
එකචරියං දළ්හං කයිරා 216
එකං හි සච්චං න දුතියමත්ථි 398
එකො 200, 640
එකොදි නිපකො සතො 678
එකොදි භූතො විහනෙ තමං සො 716
එකො පුබ්බෙ චරිත්වාන 200
එකොව රතිමජ්ඣගා 640
එජා 126, 486, 620, 622
එජානුගා 126
එජානුගා තෙ න තරන්ති සඞ්ගං 126
එතඤ්ච ධම්මමඤ්ඤාය 552
එතදරියානමුත්තමං 218
එතම්භයං 370
එතමාදීනවං ඤත්වා 214
එතම්පි දිස්වා අමමො චරෙය්‍ය 72
එතම්පි දිස්වා න විවාදයෙථ 234, 420
එතම්පි දිස්වා විරමෙ කථොජ්ජං 230
එතම්පි දිස්වා සික්ඛෙථ 204, 206
එතං 204, 214, 370, 372, 380, 396, 552
එතං තස්මිං අනාරියං 198
එතං තෙ පබ්‍රූමි 372
එතං දිස්වාන පණ්ඩිතො 172
එතං මෙ පබ්‍රූහි යතො නිදානං 370
එතං මෙ පබ්‍රූහි යථා විභොති 380
එතෙ ච ඤත්වා උපනිස්සිතා 386
එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය 258
එතෙ ච නිස්සාය විමානදස්සී 404
එතෙපි ධම්මා ද්වයමෙව සන්ති 366
එතෙ විතක්කෙ පරිදෙවනෙය්‍යෙ 702
එතෙ විවාදා සමණෙසු ජාතා 230
එතෙසු උග්ඝාති නිඝාති හොති 230
එතෙසු ධම්මෙසු විනෙය්‍ය ඡන්දං 722
එත්තාවතග්ගන්තු වදන්ති හෙකෙ 384
එත්තාවතග්ගම්පි වදන්ති හෙකෙ 384

එත්ථ 574
එලං 276
එලම්බුජං කණ්ටකං වාරිජං යථා 276
එවමාහු 182
එවම්පි තිත්ථ්‍යා පුථුසො නිවිට්ඨා 412
එවම්පි තිත්ථ්‍යා පුථුසො වදන්ති 410
එවම්පි විග්ගය්හ විවාදයන්ති 390, 398, 436
එවං 174, 186, 278, 486
එවං ඨිතො අනෙජස්ස 486
එවං පජානාති ස වෙදි ධම්මං 390
එවං පියායිතං ජනං 174
එවං මුනි නොපලිප්පති 186
එවං මුනී සන්තිවාදො අගිද්ධො 278
එවං විග්ගය්හවදෙ සප්පා 628
එවං සමෙතස්ස විභොති රූපං 382
එවාභිජානං පරමන්ති ඤත්වා 116
එස භවස්ස මහාගෙධො 210
එලවද්ධනං 212, 578
ඔකො 270
ඔක්ඛිත්තචක්ඛු න ච පාදලොලො 710
ඔඝං 80
ඔඝතිණ්ණස්ස පිහයන්ති 220
ඔතිණ්ණො 574, 578
ඔසානෙ ත්වෙව බ්‍යාරුද්ධෙ 572
කණ්ටකො 276
කණ්හස්ස පක්ඛොති 696
කණ්හා 696
කති පරිස්සයා ලොකෙ 662
කප්පිකො 538
කථංකථා 358
කථංකථාසල්ලං 572
කථංකථී ඤාණපථාය සික්ඛෙ 366
කථං දසී 286
කථං දිස්වා නිබ්බාති භික්ඛු 472
කථං නු 256
කථං විග්ගාහිකං න කථෙය්‍ය 546
කථං සමෙතස්ස විභොති රූපං 380
කථංසීලො 286
කථොජ්ජං 224, 230
කන්දරා 660
කපණා විය 206
කපීව සාඛං පමුඤ්චගහාය 126
කප්පං නෙති අකප්පියො 350
කප්පා 134, 136, 154, 156, 340, 440, 462
කම්මඤ්ච සාවජ්ජ නවජ්ජමෙතං 428
කම්මං විරාධයිත්වා 426
කම්මාරෙ රජතස්සෙව නිද්ධමෙ 678
කයවික්කයෙ න තිට්ඨෙය්‍ය 532
කලහො 344
කල්‍යාණපීති 700
කස්මා 398, 400
කස්මා න එකං සමණා වදන්ති 398
කස්මා නු සච්චානි වදන්ති නානා 400
කස්සචි 628
කං තස්ස බාලොති පරං දහෙය්‍ය 414
කං සො සික්ඛං සමාදාය 678
කානි සීලබ්බතානස්සු 674
කාමපඞ්කො දුරච්චයො 602
කාමයමානස්ස 4
කාමයානස්ස 6
කාමං කාමයමානස්ස 2
කාමං බහුං පස්සතු අප්පකං වා 446
කාමා 2, 40, 50, 218, 278, 586, 606
කාමානි පරිවජ්ජෙය 26
කාමා හි ලොකෙ න හි සුප්පහායා 40, 42
කාමෙ ච ලොකෙ ච අනූපලිත්තො 278
කාමෙ පරිවජ්ජෙති 8
කාමෙසු අනපෙක්ඛිනො 218
කාමෙසු අපෙක්ඛිතං 334

කාමෙසු ගථිතා පජා 220
කාමෙසු ගිද්ධා පසුතා පමූළ්හා 50
කායවිවෙකො 38, 468
කාලකතං 174
කාලමුඛං 212, 578
කාලෙන සො සම්මා ධම්මං 724, 726
කිඤ්චනං 610
කිඤ්චි 508
කිත්තයිස්සාමි 564
කිත්ති 204
කිමෙවිදං මුත්තකරීසපුණ්ණං 248
කිස්මිං අසන්තෙ න භවන්ති හෙතෙ 370
කිස්මිං අසන්තෙ න මමත්තමත්ථි 374
කිස්මිං විභූතෙ න ඵුසන්ති ඵස්සා 274
කිං සු අසිස්සං කුහිං වා අසිස්සං 702
කිං හි තුමස්ස තෙන 444
කීවන්තො 660
කුක්කුච්චං 516, 714
කුතො පහූතා කලහා විවාදා 344, 346
කුතො පහූතා තෙ තදිඞ්ඝ බ්‍රෑහි 348
කුප්පපටිච්චසන්තිං 102
කුරුතෙ 142
කුචන්තො තත්ථ භෙරවා 660
කුවං වා අසිස්සං 702
කුසලං 718
කුසලා 96, 98, 146, 224, 234 390 394
කුසලා නු එකී 690
කුසලාවදානා 224, 386, 392, 400 424
කුහිඤ්චි 88, 100, 108, 138, 486 510, 534
කුහිං ච ජප්පෙ 434
කෙනිධ ලොකස්මිං 134, 154
කොධාතිමානස්ස වසං න ගච්ඡෙ 696
කොධො 358, 362, 530, 590, 696
ඛ්‍යාසස්ස බ්‍යප්පථයො අස්සු 668
ඛ්‍යාසස්සු චුධ ගොචරා 670
ඛාදනීයානං 512
ඛිඩ්ඩා 522
ඛීණසොතෙ 721
ඛිලා 88
ඛුදා 690
ඛෙත්තං 16, 336
ඛෙමදස්සිනො 178
ඛෙමං පස්සති සබ්බධි 624
ඛෙමාභිපස්සං අවිවාදභූමිං 420
ගඩගණං 212
ගච්ඡතො අගතං දිසං 668
ගණිමාගතං 656
ගණී 630, 656
ගථිතං 136
ගථිතා 586
ගන්ථා 136, 334, 452
ගන්ථා තස්ස න විජ්ජන්ති 334
ගබ්භකරණං 528
ගවාස්සං දාසපොරිසං 16
ගාමකථාය ආවරයෙ සොතං 506
ගාමෙ ච නාභිසජ්ජෙය්‍ය 534, 536
ගිරිගුහා 660
ගීයන්ති 586
ගුහා 32
ගෙධං බ්‍රෑමි මහොඝොති 602
ගෙධො 50, 178, 602
ගොචරෙ 670, 672, 674
ගොතම 286
ඝටමානා 284
චක්ඛුමා 632
චක්ඛුලොලො 502
චක්ඛූහි නෙව ලොලස්ස 502, 506
චතුප්පදානං 688
චතුරෙ සහෙථ පරිදෙවධම්මෙ 700
චරතො 218
චරං 84
චරන්තං 134
චරන්ති 240
චරෙ 430
චිත්තවිවෙකො 38, 470

චින්තයන්තො 242
චුතූපපාතො ඉධ යස්ස නත්ථි 432
චුදිතො වචීහි සතිමාභිනන්දෙ 716
ඡත්තපථං 214, 578
ඡන්දගූ 454
ඡන්දජාතස්ස ජන්තුනො 6
ඡන්දනිදානානි පියානි ලොකෙ 354, 356
ඡන්දානුනීතො රුචියා නිවිට්ඨො 90
ඡන්දො 74, 354, 722
ඡන්දො නු ලොකස්මිං කුතොනිදානො 358
ඡින්නසොතො අබන්ධනො 608
ජටා 58
ජණ්ණුපථං 214, 578
ජනවාදධම්මාය න චෙතයෙය්‍ය 720
ජනං පස්සථ මෙධගං 564
ජනා 168, 720
ජන්තු 26, 58, 94, 128, 142, 366, 412
ජන්තුනො 6, 176
ජප්පනා 602
ජප්පං 50
ජප්පිතානි 432
ජප්පෙ 434
ජරසා 166
ජලං 276
ජවං 212, 578
ජාගරියං භජෙය්‍ය 522
ජානාමි පස්සාමි තථෙව එතං 442
ජීවිතං 60, 64, 162, 166
ජීවිතෙන 550
ඣානානුයුත්තො බහුජාගරස්ස 712
ඣායී න පාදලොලස්ස 514
ඤත්වා 138, 332, 368, 450, 604
ඤත්වා ච සො සම්මුතියො පුථුජ්ජා 450
ඤත්වා ධම්මං අනිස්සිතො 332, 604
ඤත්වා පවුත්තා සමණෙන ධම්මා 368
ඤත්වා මුනී නිස්සයෙ සො විමංසී 386
ඤත්වා විමුත්තො න විවාදමෙති 388
ඤාණපථාය 366
ඤාණබන්ධු 450
ඤාණෙනපි සො නිස්සයං කරොති 150
ඤාණෙන වා සීලවතෙන වාපි 148
ඤාණෙන වා සො පජහාති දුක්ඛං 118
ඤාතපරිඤ්ඤා 80, 596
ඨිතො 486
ඩංසාධිපාතාන සිරිංසපානං 658
තක්කඤ්ච දිට්ඨීසු පකප්පයිත්වා 402
තක්කසිලං 212, 578
තක්කාසයං 714
තක්කොලං 212, 578
තඤ්චාපි ගන්ථං 146
තණ්හා 68, 332, 476
තතො තං දුක්ඛමන්වෙති 24
තණ්හාමමත්තං 70
තත්ථ 144, 222, 232, 414, 448
තත්ථ සික්ඛානුගීයන්ති 586
තථද්දසා 448
තථාවදානං 118
තථාවිධො 40, 218
තථියං 396, 398
තථෙව එතං 442
තදිඞ්ඝ බ්‍රෑහි 384
තදෙව 144
තදෙව පාවා 406
තන්දිං 590
තන්දිං මායං හස්සං ඛිඩ්ඩං 522, 524
තමරියධම්මං 98
තමං 640, 726
තමාතිසංසං පබ්‍රෑමි 622
තමාහු අඤ්ඤෙ තුච්ඡං මුසාති 398
තමූපනිස්සාය ජිගුච්ඡිතං වා 430
තමූපනිස්සාය පහොති ඡන්දො 360
තමෙව දස්සිං විවටං චරන්තං 134
තමෙව සල්ලමබ්බුහෙ 584
තමෙව හීනන්ති පනාහු අඤ්ඤෙ 434
තම්බපණ්ණිං 212, 578
තම්මයො 280
තසථාවරානි 694

තසා 694
තස්මා 26, 54, 88, 104, 146, 178, 264, 396, 400, 442, 556
තස්මා ජන්තු සදා සතො 26
තස්මා තුවං මොඝහතො දහාසි 264
තස්මා න එකං සමණා වදන්ති 400
තස්මා නරො තෙසු නිවෙසනෙසු 104
තස්මා මුනයො පරිග්ගහං හිත්වා 178
තස්මා මුනී නත්ථි ඛිලො කුහිඤ්චි 88
තස්මා වාදෙසු නෙජති 338
තස්මා විවාදානි අවීතිවත්තො 142
තස්මා විවාදානි උපාතිවත්තො 442
තස්මා හි තස්ස භගවතො සාසනෙ 556
තස්මා හි දිට්ඨං ව සුතං මුතං වා 144
තස්මා හි බාලොති පරං දහන්ති 396
තස්මා හි සික්ඛෙථ ඉධෙව ජන්තු 54
තස්මිං පරිදෙවමච්ඡරං 184
තස්ස 6, 138, 140, 152, 154, 290
තස්ස චෙ කාමයානස්ස 6
තස්ස චෙ තං සමිජ්ඣති 4
තස්ස නත්ථි පුරෙක්ඛතං 290
තස්ස නො සන්ති උස්සදා 330
තස්ස භගවතො සාසනෙ 556
තස්සීධ නත්ථි පරමුග්ගහීතං 140
තස්සීධ දිට්ඨෙව සුතෙ මුතෙ වා 154
තං ජානිස්සාම ඉති මෙ මනො අහු 380
තං තස්ස අපුරෙක්ඛතං 338
තං තෙ පවක්ඛාමි යථා පජානං 684
තං නිස්සිතො කුප්පපටිච්චසන්තිං 102
තං බුද්ධං අසිතං තාදිං 646
තං බ්‍රාහ්මණං දිට්ඨිමනා-දියානං 154
තං බ්‍රෑමි උපසන්තො 334
තං මෙ ගොතම පබ්‍රෑහි 286
තාදිං 646
තාදි 160, 646
තාමලිං 212, 578
තාසං විනයා සදා සතො සික්ඛෙ 476, 478
තිකිච්ඡා 528
තිගුම්බං 212, 578
තිට්ඨං නරො මොහනස්මිං පගාළ්හො 34
තිත්තියා 410
තිස්සො 192
තීරණපරිඤ්ඤා 76, 80, 598
තීසු විධාසු අවිකම්පමානො 266
තුම්හස්ස 444
තුමො සහා හොති නිහීනපඤ්ඤො 408
තුසිතා ගණිමාගතො 630
තෙ උග්ගහායන්ති නිරස්සජන්ති 126
තෙ කාමා පරිහායන්ති 6, 8
තෙ ජනා 174
තෙ ත්වං වදස්සු න හි තෙධ අත්ථි 238
තෙ දුප්පමුඤ්චා නහි අඤ්ඤමොක්ඛා 44
තෙ න තරන්ති සඞ්ගං 126
තෙන සෙට්ඨං න මඤ්ඤෙථ 218
තෙනාතුමානං කුසලොති චාහ 404
තෙ පහාය තරෙ ඔඝං 26
තෙ වාදකාමා 224
තෙ විසමෙ නිවිට්ඨා 54
තෙ වෙ මුනී බ්‍රෑසි අනුග්ගහාය 254
තෙසං න කොචි පරිහීන-පඤ්ඤො 394
තෙසං පනෙකො සමයං වදන්ති 386
තෙසු ත්වං කිං ලභෙථො පසූර 240
තෙසු නිවෙසනෙසු 104
ථලෙ තිට්ඨන්ති බ්‍රාහ්මණා 602
ථාවරා 694
ථියො බන්ධූ පුථු කාමෙ 16
ථිනං 590
ථුනන්ති 400
ථෙය්‍යං න කරෙය්‍ය 694
දණ්ඩං 558
දහාසි 264

දජ්ජෙය්‍ය 414
දරිපථං 214, 578
දූසා 16
දිට්ඨසංසන්දනාපුච්ඡා 466
දිට්ඨං 430
දිට්ඨා 174
දිට්ඨාපි සුතාපි තෙ ජනා 174
දිට්ඨිගතානි 242
දිට්ඨිඤ්ච නිස්සාය
අනුපුච්ඡමානො 264
දිට්ඨිනිවෙසා න හි
ස්වාතිවත්තා 104
දිට්ඨිපරිබ්බසානා 418
දිට්ඨිමමත්තං 70
දිට්ඨිම්පි ලොකස්මිං න
කප්පයෙය්‍ය 148
දිට්ඨිම්පි සො න පච්චෙති
කිඤ්චි 150
දිට්ඨියා එකෙ පච්චෙන්ති
සුද්ධිං 264, 444
දිට්ඨිසල්ලං 576
දිට්ඨිසාරී 450
දිට්ඨිං 114
දිට්ඨීසල්ලං 576
දිට්ඨීසු ච න නීයති 302
දිට්ඨී හි තෙසම්පි තථා සමත්තා 394
දිට්ඨීහි දිට්ඨිං අවිරුජ්ඣමානා 240
දිට්ඨීහි නං පාව තථා වදානං 118
දිට්ඨී හි සා තස්ස තථා සමත්තා 408
දිට්ඨෙන චෙ සුද්ධි නරස්ස
හොති 118
දිට්ඨෙන සංසුද්ධි නරස්ස හොති 116
දිට්ඨෙ සුතෙ ඛන්තිමකුබ්බ-
මානො 422
දිට්ඨෙ සුතෙ සීලවතෙ මුතෙ
වා 404
දිබ්බෙන චක්ඛුනා 488
දිසා සබ්බා සමෙරිතා 570
දිස්වා 138, 204, 566, 568, 574
දිස්වාන තණ්හං අරතිං රගඤ්ච 248
දිස්වාන වා ඤස්සති නාතිමෙව 446
දිස්වා මං භයමාවිසි 568
දිස්වා මෙ අරති අහු 574
දුක්ඛමනෙති 24
දුක්ඛං වත සෙත්ථ කුවජ්ජ
සෙඨසං 702
දුක්ඛූපනීතා පරිදෙවයන්ති 54
දුද්දසං හදයනිස්සිතං 574
දුප්පමුඤ්චා 44
දුම්මොචයා 44
දුරච්චයං 606
දුවෙ විවාදස්ස ඵලානි බ්‍රූමි 420
දූරෙ විවෙකා හි තථාවිධො
සො 38, 40
දූසිතො 550
දෙසසල්ලං 574
ධම්මමඤ්ඤාය 552
ධම්මං 390, 410, 434, 436, 106
ධම්මා 100, 158
ධම්මාපි තෙසං න පටිච්ඡිතා සෙ 158
ධම්මෙසු ච න ගච්ඡති 344
ධම්මෙසු නිච්ඡෙය්‍ය
සමුග්ගහීතං 104, 152, 250, 442
ධීරා 60, 64
ධීරෙහි 256
ධීරො 78, 388, 408, 686
ධොනස්ස හි නත්ථි කුහිඤ්චි
ලොකෙ 106
ධොනා 106, 188, 242
ධොනෙන යුගං සමාගම 242, 244
ධොනො 110, 188
ධොනො න හි තෙන මඤ්ඤති 188
න 120, 158, 280, 336, 396, 450
628
න අඤ්ඤතො භික්ඛු සන්ති-
මෙසෙය්‍ය 484
න අලං සමාය 418
න උච්චාවචං ගච්ඡති
භූරිපඤ්ඤො 130
න උන්නමෙය්‍ය පසංසිතො
භික්ඛු 530
න උස්සෙසු වදතෙ මුනි 340
නක්ඛත්තං 526
න කප්පයන්ති න
පුරෙක්ඛරොන්ති 136, 156
න කප්පියො නූපරතො 462
න කම්මුනා නොපි සුතෙන
නෙය්‍යො 282

න කොචි ධම්මෙසු විසෙසි අස්ස 438
න කොචි බාලො සමණෙසු
අත්ථි 408
න ච කත්ථිකො සියා භික්ඛු 588
න ච පරිත්තසෙ තානි
අලභමානො 514
න ච පාදලොලො 712
න ච මමායෙථ කිඤ්චි
ලොකස්මිං 508
න ච වාචං පයුතං භාසෙය්‍ය 540
න චාහමෙතං තථියන්ති බ්‍රූමි 396
න ජප්පගූ නොපි නිවිස්සවාදී 434
න තස්ස පුත්තා පසවො 336
න තස්ස හෙතු විසමං
චරෙය්‍ය 58
න තස්ස හොති 250, 266
න තානි උග්ගය්හ වදෙය්‍ය
නාගො 276
න තෙන ථාමං කුබ්බෙථ 480
න තෙසු පසුතො සියා 586
නත්ථි 484
නත්ථි අත්තා කුතො නිරත්තං
වා 484
නත්ථි කාචි නිසඞ්ඛිති 622
නත්ථි මෙති න සොචති 618
න දිට්ඨියා 280
න දිට්ඨියා න සුතියා 256
න දිට්ඨිසාරී න පි ඤාණබන්ධු 450
න ධාවති න සීදති 584
න නිරස්සති 626
න නිසෙවෙථ මෙථුනං 216
න පවෙධති 158
න පටිච්චසිතා සෙ 158
න පජ්ජියෙථ 464
න පාදලොලස්ස 514, 516
නපි ඤාණබන්ධු 450
න පියං කුබ්බති නොපි
අප්පියං 184
න පිහෙති කස්සචි 606
න පුරෙක්ඛරොන්ති 136, 156
නප්පමජ්ජෙය්‍ය 520, 554
න බ්‍රාහ්මණස්ස පරනෙය්‍යමත්ථි 440
න බ්‍රාහ්මණො අඤ්ඤතො 120
න බ්‍රාහ්මණො කප්පමුපෙති
සඞ්ඛං 450
න බ්‍රාහ්මණො සීලවතෙන
නෙය්‍යො 158
න මමත්තාය නමෙථ
මාමකො 172, 174
නමස්සං 556
න මුතියා 280
න මුසා භණෙය්‍ය 694
න මෙ දිට්ඨො ඉතො පුබ්බෙ 626
න මෙධගං කුරුතෙ ජන්තු
ලොකෙ 416
නයිධ පකුබ්බමානො 124
න රාගරාගී න විරාගරත්තො 140
නරෙ 16, 104
න ලිප්පති දිට්ඨසුතෙසු ධීරෙ 78
න ලිප්පති ලොකෙ අනත්ත-
ගරහී 456
න ලොකෙ මඤ්ඤතෙ සමං 330
නවකං 212, 578
නවා 454, 600
න විරජ්ජති 322
න විවාදමෙති 388
න විවාදයෙථ 234, 420
න විසෙසී න නීචෙය්‍යො 330
න වෙ ධනත්ථං න කුබ්බයෙ 600
න වෙදගූ දිට්ඨියා න මුතියා 280
න සඤ්ඤසඤ්ඤී න විසඤ්ඤ-
සඤ්ඤී 380
න සද්ධො න විරජ්ජති 320
න සන්නිධිං කයිරා 512
න සමෙසු න ඔමෙසු 624
න සුතො උද කස්සචි 628
න සො සොචති නාජ්ඣෙති 608
න හඤ්ඤදත්ථත්ථි පසංසලාභා 232
න හි අඤ්ඤමොක්ඛා 44
න හි තෙධ අත්ථි වාදම්හි ජාතෙ 238
න හි තෙන මඤ්ඤති යදිදං 188
න හි තෙන සුද්ධිං කුසලා
වදන්ති 234, 446
න හි සන්ති නිච්චා පරිග්ගහා 168
න හි සන්තො පටිසෙනිං
කරොන්ති 552
න හි සා නිබ්බුති සතං වුත්තා 480
න හි සුබ්බිනායං 448

න හි සෙට්ඨතො පස්සති ධම්මමඤ්ඤං 442
න හි සො රජ්ජති නො විරජ්ජති 190
න හි ස්වාතිවත්තා 104
න හෙව සච්චානි බහූනි නානා 402
න ගාරමාවසෙ 170
නාගො 276
නාජ්ඣෙති 608
නාඤ්ඤතො භික්ඛු සන්තිමෙසෙය්‍ය 484
නාඤ්ඤෙන විසුද්ධිං වදන්ති 190
නාඤ්ඤස්ස ධම්මස්ස විසුද්ධිමාහු 222, 412
නාතිමඤ්ඤෙය්‍ය 550
නාතිවෙලං 718
නාතුමානං විකප්පයං තිට්ඨෙ 482
නාදෙති න නිරස්සතීති 626
නාද්දසාසිං අතොසිතා 572
නානා තෙ සච්චානි සයං ථුනන්ති 400
නානා වදන්ති 390
නානු සොචති 300
නාමං 176, 610
නාමඤ්ච රූපඤ්ච පටිච්ච ඵස්සා 374
නාමමෙවාවසිස්සති 176
නාවං භින්නමිවොදකං 24
නාවං සිත්වාව පාරගූ 28
නාසිංසති ලොකමිමං පරඤ්ච 86
නාහං 256, 262
නිකෙතසාරී 270
නිග්ඝොසෙ සයනාසනෙ 660
නිච්ඡාති 230
නිච්ඡෙය්‍ය 104, 152, 250, 442
නිච්ඡාතො 154, 356
නිද්දං න බහුලීකරෙය්‍ය 520
නිද්දං තන්දිං සහෙ ථීනං 590
නිද්දා 590
නිද්ධූය තප්පෙච්ඡවධය්‍ය 530
නිද්ධූය සො කුප්පති රක්ඛමෙසී 226
නිපකො 678
නිබ්බාති 472
නිබ්බානමනතතො 586
නිබ්බානමානසො නරො 592
නිබ්බිජ්ජ සබ්බසො කාමෙ 586
නිම්මිත පුච්ඡා 468
නිරත්තා 114, 336, 484
නිරස්සජන්ති 126
නිරස්සති 106, 626
නිරස්සති ආදියතිච්ච ධම්මං 106
නිරාසත්ති අනාගතෙ 300
නිවිට්ඨා 52, 222
නිවිට්ඨො 90
නිවිස්සවාදී න හි සුබ්බිනායො 448
නිවෙසනා 152
නිවෙසනා තස්ස න සන්ති කෙචි 152
නිවෙසනෙසු ·282
නිසංඛිතියො 622
නිසෙවෙථ 216
නිස්සයතා 332
නිස්සාය 646
නිහීනතො පස්සති සබ්බමඤ්ඤං 144
නීචෙය්‍යො අථවාපි සරික්ඛො 482
නූපරතො 462
නෙජති 338
නො වෙ කිර දිට්ඨියා නස්සුතියා 262
නොපි අසඤ්ඤී න විභූතසඤ්ඤී 382
නොපි තෙන 258
නොපි නිවිස්සවාදී 454
නොපි සුතෙන නෙය්‍යො 282
පකප්පනා 100
පකප්පිතං දිට්ඨිපුරෙක්ඛරානො 448
පකප්පිතා 104
පකප්පිතාති 258
පකප්පිතා සඞ්ඛතා යස්ස ධම්මා 100
පකම්පතං 602
පකුබ්බමානො 124
පකෙඛා 696
පගාළ්හා 36
පගාහති 210
පඤ්ඤා 276
පචිතං 254
පච්චෙකමුනිනො 462
පච්චෙකසච්චෙසු පුථූ නිවිට්ඨා 222

පවෙධති 158
පවෙධති ඤාණං 116
පච්ඡා තෙ මාහු කිඤ්චනං 610
පච්ඡා පුරෙ වාපි අපෙක්ඛමානො 48
පජං ඉමං තණ්හාගතං භවෙසු 68
පජා 68, 220, 400, 564
පජානං 400
පඤ්ඤාචක්ඛු 486, 632
පඤ්චන්නං ධීරො භයානං න භායෙ 686
පඤ්ච රජානි 720
පඤ්ඤං පුරෙක්ඛත්වා 698
පඤ්ඤා 698
පඤ්ඤාචක්ඛුනා 490
පඤ්ඤා විමුත්තස්ස න සන්ති මොහා 282
පඤ්ඤාවීමංසකා 228
පඤ්ඤත 656
පටික්කොසං 390
පටිපත්තිසාසනං 198
පටිපදං වදෙහි භද්දන්තෙ 502
පටිබුද්ධො පුරිසො න පස්සති 146
පටිභානවා 318
පටිසංයුජෙය්‍ය 268
පටිසූරං 336
පටිසෙනිකත්තා 238
පණිධි 152
පණිහිතො 172
පණිහිතොති සමඤ්ඤාතො 210
පණ්ණෙ වාරි යථා න ලිප්පති 184
පතිලීනචරස්ස භික්ඛුනො 180
පතිලීනො අකුහකො 304
පත්ථයතිච්ච සුද්ධිං 426
පත්ථයමානස්ස 432
පන්තම්හි සයනාසනෙ 668
පත්තහාරො 458
පපඤ්චසඞ්ඛා 382
පප්පුය්‍ය තමත්ථං යථාමතො අහු 232
පබ්බතානං ගුහාසු වා 660
පබ්‍රූහි 372
පබ්‍රූමි 286, 370, 380
පමාදෙන න සංවසෙ 592
පමාදො 592
පමාය 414
පමූළ්හා 52
පරධම්මිකානම්පි න සන්තසෙය්‍ය 690
පරනෙය්‍යං 440
පරමග්ගණං 212, 578
පරමයොතං 212, 578
පරමං 434
පරමං අරොගං 116
පරමන්ති දිට්ඨීසු පරිබ්බසානො 140
පරමුඛං 212, 578
පරවාදෙහි චොදිතො 208
පරස්ස චෙ ධම්මමනානුජානං 392
පරස්ස චෙ වම්භයිතෙන හීනො 438
පරස්ස චෙ හි වචසා නිහීනො 408
පරිකිස්සති 212
පරිග්ගහා 86, 168, 376
පරිග්ගහා චාපි කුතො පහූතා 374
පරිග්ගහෙසු මුනි නොපලිත්තො 80
පරිග්ගහො 178
පරිජානෙය්‍ය 596, 598
පරිඤ්ඤා 80
පරිත්තසෙ 514
පරිදෙවති 228
පරිදෙවනෙය්‍ය 702
පරිදෙවං භික්ඛු න කරෙය්‍ය කුහිඤ්චි 510
පරිදෙවයන්ති 54
පරිදෙවසොකා සහමච්ඡරා ච 346
පරිදෙවො 176, 184, 316
පරිපුණ්ණමානී 408
පරිඵන්දමානං 66
පරිබ්බසානො 140
පරියත්තිසාසනං 198
පරියන්තා 686
පරිසං විගය්හ 224
පරිසාය 232
පරිස්සයවිනයං 496
පරිස්සයා 18, 20, 496, 662, 690, 700
පරිහීනං 228
පරෙතො 206
පලිබද්ධ 696

පලෙහි 236
පවක්ඛාමි 684
පවාදියාසෙ කුසලාවදානා 400
පවිතක්කමාගමා 242
පවුච්චති 176
පවෙදිතං 256
පවෙධිතං වාපි පකප්පිතෙසු 432
පසවො 336
පසංසකාමා කුසලාවදානා 224
පසංසමිච්ඡං 226
පසංසං 418
පසංසිතො වා පන තත්ථ හොති 232
පසූතා 50
පස්සඤ්ච දිට්ඨීසු අනුග්ගහාය 252
පස්සති හීනමඤ්ඤං 146
පස්සං නරො දක්ඛති නාම-
රූපං 446
පස්සාමි 64, 442
පස්සාමි ලොකෙ පරිඵන්දමානං 64
පස්සාමි සුද්ධං පරමං අරොගං 116
පහස්සමානො 404
පහානපරිඤ්ඤා 80, 598
පහාය 148
පහිතත්තස්ස භික්ඛුනො 676
පහීයති 170
පහූතා 358, 374
පාගබ්භියං 540
පාගබ්භියං න සික්ඛෙය්‍ය 540, 546
පාතිමොක්ඛමථවාපි සමාධිං 502
පාදලොලො 514
පානානං 542
පාරගූ 28
පාරං ගතො න පවෙධති තාදී 158
පාවා 94, 96, 406
පියප්පහූතා කලහා විවාදා 350
පියා 184, 350, 698
පියානි 356
පියායිතං ජනං 174
පියා සු ලොකස්මිං කුතො-
නිදානා 352
පිහයන්ති 220
පිහා 606
පීති 4
පීතිමනො හොති 4
පුච්ඡා 466, 468
පුච්ඡාම 384
පුච්ඡාමි තං 466, 468
පුච්ඡිතො 286
පුඤ්ඤං 124
පුඤ්ඤෙ ච පාපෙ ච
අනූපලිත්තො 124
පුත්තා 336
පුථු 222
පුථුකාමෙ 16
පුථුජ්ජනා 202, 238
පුථුජ්ජං 420, 450
පුථුවචනානං 550
පුථූ හි අඤ්ඤස්ස වදන්ති
ධම්මං 438
පුබ්බන්තා 288
පුබ්බමන්තමනිස්සිතො 288
පුබ්බාසවෙ හිත්වා 454
පුබ්බෙව නත්ථි යදිදං පුධාය 236
පුරා 286
පුරාණං නාභිනන්දෙය්‍ය 598
පුරිමං පහාය අපරං සිතා සෙ 126
පුරිමෙව ජප්පං 50
පුරිසා 16
පුරිසො 172
පුරෙක්ඛතං 290
පුරෙක්ඛතා සන්ති අවෙවදාතා 100
පුරෙක්ඛරානො 272
පුරෙක්ඛාරා 100, 136, 156, 338
පුරෙක්ඛාරො 290
පෙතං කාලකතං න පස්සති 174
පෙතස්ස ජන්තුනො 176
පෙසුඤ්ඤං 348, 350, 588
පෙසුනා 346, 350
පෙසුනියං 532
පෙසුනෙය්‍ය ච නො යුතො 314
පොක්ඛරං 186
ඵන්දමානං ජනං දිස්වා 564
ඵන්දමානෙ 70
ඵරුසං 708
ඵරුසෙන නෙ න පටිවජ්ජා 550
ඵස්සනිදානං සාතං අසාතං 372
ඵස්සං පරිඤ්ඤාය 74, 76
ඵස්සො 376, 378

එසෙස අසන්තෙ න භවන්ති
හෙතෙ 372
එසොන යද ධුවස්ස 508
එසො 74, 302, 508
එසො නු ලොකස්මිං කුතො-
නිදනො 374
ධුවෙසා 482, 690
ධුවෙසා අනනකරුණෙපහි 482
බද්ධානං 656
බන්ධු 16
බලීයන්ති 18
බහුන්නං 656
බහුනාහි ජනෙනා 34
බහිද්ධා 480
බහුජාගරස්ස 712
බහුධා 692
බහුන්නම්බ බද්ධානං 656
බාලං දහන්ති මිථු අඤ්ඤමඤ්ඤං 224
බාලො පරො අක්කු-
සලොති 392, 404
බාලො මගො හොති 392
බුද්ධචක්ඛුනා 490
බුද්ධො 646
බොධි 644
බ්‍යප්පථයො 668
බ්‍යාරුද්ධෙ 566, 572
බ්‍රාහ්මණා 338
බ්‍රාහ්මණො 120, 138, 154, 158, 268, 440, 450, 602, 728
බ්‍රූහි 192
භගවා 196, 250, 256, 264, 288, 474, 626, 682, 728
භජතො රිත්තමාසනං 658
භජමානස්ස විවිත්තමාසනං 180
භද්දන්ත 502
භන්තං 200
භයං 558
භරුකච්ඡං 212, 578
භවඤ්ච නාභිජප්පෙය්‍ය 510
භවන්තං 572
භවනෙ 182
භවසාතබද්ධා 44
භවං 360
භවං න ජප්පෙ 260
භවාභවාය 152, 388
භවාභවෙසු 68, 108, 432
භවාය විභවාය වා 332
භවූපනීතා කුසලාවදනා 424
භවෙසු 68, 72
භවෙසු ආසත්තිමකුබ්බමානො 72
භාරො 438
භායෙය්‍ය 540
භික්ඛු 96, 686, 724
භික්ඛුනො 180, 658, 678
භික්ඛුනො විජිගුච්ඡතො 658
භික්ඛු සතිමා සුවිමුත්තචිත්තො 724
භික්ඛු සතො සප්පරියන්තචාරී 686
භූරිපඤ්ඤ 150
භෙද 286
භෙරවා 510
භෙරවෙසු ච න සම්පවෙධෙය්‍ය 510
මගො 392
මඞ්කු හොති 208, 226
මච්චුමුඛෙ ලපන්ති 68
මච්චො 6
මච්ඡරං 346
මච්ඡරියං 176, 184, 530
මච්ඡෙ අප්පොදකෙ යථා 566
මච්ඡෙරයුත්තා කලහා විවාදා 350
මච්ඡෙව අප්පොදකෙ
ඛීණසොතෙ 72
මජ්ඣං 610
මජ්ඣෙ චෙ නො
ගණ්හස්සසි 610
මජ්ඣෙ යථා සමුද්දස්ස 484
මඤ්ඤති 172
මඤ්ඤෙහං මොමුහමෙව
ධම්මං 262
මත්තං ස ජඤ්ඤා ඉධ තොස-
නත්ථං 704, 706
මන්තා 408
මද්දන්තෙ තං පරිස්සයා 18, 24
මනසා දිට්ඨිගතානි
චින්තයන්තො 242
මනසො 694
මනුස්සපුච්ඡා 66
මනුස්සඵස්සානං චතුප්පදානං 688
මනො 4, 242, 380

මන්තභාණී අනුද්ධතො 298
මන්තා 298
මන්තා අස්මීති සබ්බමුපරුන්ධෙ 474
මන්තේව පරික්ඛති 212
මමත්තං සො අසංවින්දං 618
මමත්තා 70, 72, 168, 172, 376
618
මමායිතං 610
මමායිතෙ පස්සථ ඵන්දමානෙ 70
මමිදන්ති මඤ්ඤති 172
මරණෙනපි තං පහීයති 170
මරුකන්තාරං 214
මංසචක්ඛුම්හි 488
මහාකච්චානං 270
මහාමගෙධා 210
මහෙසී 472
මහොඝො 602
මාගන්දිය 250, 256, 264
මාගන්දියාති භගවා 256
මාගන්දියො 254, 262
මානඤ්ච පරිජානෙය්‍ය 596, 598
මානසල්ලං 576
මානාතිමානං වදතෙ පනෙසො 236
මානාතිමානා සහ පෙසුනා ච
346, 350
මානෙන මත්තො පරිපුණ්ණ-
මානී 408
මානො 110, 346 596
මාමකො 172, 528
මායඤ්ච මානඤ්ච පහාය
ධොනො 110
මායා 110, 522, 588
මාරසෙනා 132
මාරිස 192
මිච්ඡා ච පටිපජ්ජති 198
මිදු 224, 396
මීයති 166
මුතං 430
මුතිමා 394
මුතියා 280
මුතයො 178
මුති 80, 88, 182, 186, 214, 278
298, 340, 386, 452, 460
602
මුතිතො 218
මුති නො උපෙති 88
මුතිමුතිනො 462
මුසාති වා සො විවදෙථ
කෙන 268
මුසාවාදෙ 210, 546
මුස්සතෙ වාපි සාසනං 198
මූලපදං 212
මූලං පපඤ්චසඞ්ඛායාති 474
මූලම්පි තෙසං පලිඛඤ්ඤ
තිට්ඨෙ 696
මූසිකපථං 214 578,
මෙ අරති 574
මෙණ්ඩපථං 214, 578
මෙත්තා 694
මෙත්තාය ඵස්ස තසථාවරානි 694
මෙත්තෙය්‍ය 196
මෙත්තෙය්‍යො 192
මෙථුනධම්මො 192, 200, 206, 524
මෙථුනමනුයුත්තස්ස 192, 196
මෙථුනං 522
මෙථුනං යො නිසෙවති 200
මෙධගං 416
මෙ පබ්‍රෑහි 380
මොනං 602, 624
මොමූහමෙව 262
මොසවජ්ජං 210, 358
මොසවජ්ජං පගාහති 210
මොසවජ්ජෙ න
නීයෙථ 546, 548, 594
මොහනස්මිං පගාළ්හා 36
මොහනා 36
මොහසල්ලං 576
යක්ඛස්ස 384
යතචාරි ගාමෙ 708
යතොනිදානං 370
යථා දිස්සති චක්ඛුමා 630
යථානුධම්මං 684
යථාපජානං 684
යථාපසංසන්ති සකායනානි 440
යථාමනො අහු 232
යථා විහොති 380
යථා සංවිජිතං මයා 564
යථා හි ජානෙය්‍ය තථා වදෙය්‍ය 92

යදත්තගරහි තදකුබ්බමානො 78
යදත්තනි පස්සති
ආනිසංසං 102, 144
යදාවිලත්තං මනසො විජඤ්ඤා 694
යදිච්ඡති 6
යදිදං ඵාපු 680
යදිදං සුධාය 236
යදුත්තරිං කුරුතෙ ජන්තු
ලොකෙ 142
යන්තං අපුච්ඡිමහ අකිත්තයි
නො 383
යන්නිස්සිතා 222
යන්නිස්සිතො තත්ථ සුභං-
වදානො 448
යමස්ස වාදං පරිහිතමාහු 228
යමාහු ධම්මං පරමන්ති එකෙ 434
යමාහු බාලා මිථු අඤ්ඤමඤ්ඤං 396
යමාහු ලොකෙ 360
යමාහු සච්චං තථියන්ති
එකෙ 398
යමෙතමත්ථං 254
යසො කිත්තිඤ්ච යා පුබ්බෙ 202
යස්මිං 268, 400
යස්මිං පජානො විවදෙ
පජානං 400
යස්මිං සමං විසමං වාපි නත්ථි 268
යස්ස 100, 152, 332, 342, 432, 610
614
යස්ස නත්ථි ඉදං මෙති 614
යස්ස නිස්සයතා නත්ථි 382
යස්ස ලොකෙ සකං නත්ථි 342
යස්සුස්සදා නත්ථි කුහිඤ්චි
ලොකෙ 100
යස්සූභයන්තෙ පණිධීධ නත්ථි 152
යං කිඤ්චි 58
යං කිඤ්චි ජඤ්ඤා විසමන්ති 58
යං කිඤ්චි ධම්මමභිජඤ්ඤා 480
යං පුබ්බෙ තං විසොසෙහි 608
යං පුරිසො මමිදන්ති මඤ්ඤති 172
යා 234
යා උන්නතී සාස්ස විඝාතභූමි 234
යා කාචි 420, 476
යා කාචි තණ්හා අජ්ඣත්තං 476
යා කාචිමා සම්මුතියො පුථුජ්ජා 420
යාතං භණන්තංච තං ලොකෙ 200
යුත්තො කථායං පරිසාය
මජ්ඣෙ 226
යෙ 240, 668
යෙ කෙචි 418
යෙ චාපි 354, 356, 360
යෙ චාපි ධම්මා සමණෙන
වුත්තා 360
යෙ චාපි ලොභා විචරන්ති
ලොකෙ 354, 356
යෙ දිට්ඨිමුග්ගය්හ විවාදයන්ති 236
යෙන තං වජ්ජුං පුථුජ්ජනා 338
යෙන සල්ලෙන
ඔතිණ්ණො 574, 578
යෙනෙව බාලොති පරං දහාති 406
යෙනෙව සො තෙන පලෙති සූර 236
යෙ භික්ඛු අභිසම්භවෙ 668
යෙසං 176, 722
යෙසං නාමමිදං පවුච්චති 176
යෙසං යතීමා විනයෙ සික්ඛෙ 722
යෙ සම්පරායාය නරස්ස
හොන්ති 354, 358
යෙසීධ නත්ථි පරමුග්ගහීතං 240
යෙහි භික්ඛු න වෙධෙය්‍ය 660
යෙහි විවිත්තො විචරෙය්‍ය
ලොකෙ 274
යො 8, 16, 92
යො අත්තනො සීලවතානි
ජන්තු 92
යො අත්තානං භවෙතෙ න
දස්සයෙ 182
යො ආතුමානං සයමෙව පාව 96
යො කාමෙ පරිවජ්ජෙති 8, 10
යො චෙපි අතිච්ච ජීවති 166
යොධ කාමෙ අච්චතරි 606
යො නරො අනුගිජ්ඣති 16
යොනං 212
රජතං 678
රජානි 720
රතිමජ්ඣගා 640
රඣගවෙසී 226
රසෙ ච නානුගිජ්ඣෙය්‍ය 506
රසො 506

රාගරත්තා 140
රාගසල්ලං 574
රජමාදාය පුරෙට්ඨා 236
රාහුමුඛං 212
රිත්තං 658
රිත්තාසනං සයනං සෙවතො 682
රිත්තපෙසුණතා 588
රිත්තස්ස මුනිනො චරතො 218
රිතෙත්තා 272
රිස්සමානො 212, 578
රුක්ඛමූලං සුඤ්ඤාගාරං වා 658
රුචියා නිවිට්ඨා 90
රුසිතොපි වාචං ඵරුසං න
වජ්ජා 708
රූපං 596, 610
රූපෙ 376
රූපෙ විභූතෙ න ඵුසන්ති
ඵස්සා 376, 378
රූපෙසු 360
රූපෙසු දිස්වා විභවං භවඤ්ච 360
රූපෙසු සද්දෙසු අථො රසෙසු 722
රූපෙ ස්නෙහං න කුබ්බයෙ 596
ලක්ඛණං 526
ලද්ධා 6, 512
ලද්ධා න සන්නිධිං කයිරා 512
ලද්ධා මුධෙවා යදිච්ඡති 6
ලපන්ති 68
ලාභකම්‍යා ජනං න
ලපයෙය්‍ය 536, 538
ලාභකම්‍යා න සික්ඛති 322
ලිප්පති 78
ලෙපා 84, 186, 278, 436
ලෙපො 78
ලොකස්මිං 134, 148, 508
ලොකෙ 12, 42, 58, 64, 100, 108
138, 202, 274, 278, 284, 354
356, 362, 586, 606, 666,
720
ලොමසො 568
ලොභං සහ මච්ඡරියෙන 530, 532
ලොභා 354, 356
ලොභෙහා 530, 590
වග්ගසාරී 452
වග්ගුවදො 628
වඞ්කං 212, 578
වත 162, 166
වතං 424
වතං සමාදාය උපට්ඨිතා සෙ 424
වතානි 128
වණ්ණනං 512
වඞ්කු 16
වඞ්කුං 16, 336
වදන්ති තෙ අඤ්ඤසිතා
කථොජ්ජං 224
වදන්ති වෙ දුට්ඨමනාපි එකෙ 86
වදෙහි 502
වසනං 704
වම්භයිතෙන 438
වංසපථං 214, 578
වාචං පමුඤ්චෙ කුසලං නාති-
වෙලං 718
වාදං 88, 112, 282
වාදං ච ජාතං මුනි නො උපෙති 58
වාදයන්ති 22, 418
වාරිං 184, 186, 276
වාරිජං 276
වික්ඛම්භයෙ තානි පරිස්සයානි 700
විග්ගය්හ 390
විග්ගය්හ නානා කුසලා වදන්ති 390
විග්ගාහිකා කථා 546
විඝාතභූමි 234
විඝාතං බ්‍රූහි මාරිස 192
විචරන්ති 354, 356
විචරෙය්‍ය 274
විවිත්තං භික්ඛු සදා සතො
සික්ඛෙ 552
විජඤ්ඤා 694
විජානතො 622
විජිගුච්ඡතො 658
විජිගුච්ඡමානස්ස 680
විතක්කෙ 702
විතරෙ 590
විතරෙය්‍ය ඔඝං 80
විද්වා 128, 604
විද්වා ච වෙදෙහි සමෙච්ච
128, 130
විනයෙථ සෙඛො
අනිකෙතචාරී 702

විනාභාවං සන්තමෙවිදං 170
විනිඝාති හොති 226
විනිච්ඡයං කුරුතෙ ජන්තු
ලොකෙ 362
විනිච්ඡයා 254, 362
විනිච්ඡයා යානි පකප්පිතානි 254
විනිච්ඡයා වාපි කුතො පහූතා 358
විනිච්ඡයෙ ඨත්වා පහස්සමානො 404
විනිච්ඡයෙ ඨත්වා සයං පමාය 414
විපරිණතා 342
විප්පමුත්තා 462
විභවං 360
විභවං භවඤ්චාපි යමෙත-
මත්ථං 370, 372
විභවාය 332
විභූතසඤ්ඤි 382
විභූසා 524
විභොති 380
විමතිච්ඡෙදනා පුච්ඡා 466
විමානදස්සී 404
විමුත්තො 388
වියාරභෙථ 624
විරතො චරෙ සන්ති-
මනුග්ගහාය 430
විරතො සො වියාරභෙ 624
විරමෙ කථොජ්ජං 230
විරමෙ කුක්කුච්චා 516, 518
විරියපරක්කමං දළ්හං
කරෙය්‍ය 692
විරුතඤ්ච ගබ්භකරණං 528
විවටචක්ඛු 486
විවටං 134
විවදෙථ 268
විවාදජාතෙසු ච පෙසුණානි 352
විවාදජාතෙසු න වග්ගසාරී 452
විවාදමෙති 388
විවාදයෙථ 234, 420
විවාදා 230, 350
විවාදෙන්ති 142
විවාදෙ 344
විවිත්තං 180
විවිත්තො 274
විවෙකඤ්ඤෙව සික්ඛෙථ 216
විවෙකදස්සී ඵස්සෙසු 302
විවෙකං සන්තිපදං ච මහෙසිං 468
විවෙකා 38, 216
විවෙකෙ සික්ඛිස්සාමසෙ 194
විවෙකො 194
විසජ්ජ 136, 452
විසත්තිකා 12, 334
විසමන්ති ජඤ්ඤා 58
විසමං 58, 268
විසමෙ 54
විසෙනි කත්වා පන යෙ චරන්ති 238
විසෙනිභූතො 458
විසොසෙහි 608
විහනෙ තමං සො 726
වීතගෙධො අමච්ඡරී 340
වීතතණ්හො පුරා භෙදා 286
වීතමච්ඡරො 624
වෙතනාධාරං 214
වෙදගූ 280, 408
වෙදෙති 128
වෙධෙය්‍ය 434
වෙමජ්ඣෙනුපසඞ්ඛෙය්‍යො 290
වෙරාපථං 212, 578
වෙවිච්ඡං විතරෙ මුනි 590
වෙසුඛගං 212, 578
සකං නත්ථි 342
සකං සකං දිට්ඨි පරිබ්බසානා 390
සකං සකං දිට්ඨිමකංසු සච්චං 396
සකං සකං සම්මුතිමාහු සච්චං 436
සකං හි දිට්ඨිං කථමච්චයෙය්‍ය 90
සකං හි ධම්මං පරිපුණ්ණමාහු 436
සකායනෙ 412, 440
සකායනෙ නත්ථි දළ්හං වදානො 412
සකායනෙ වාපි දළ්හං වදානො 414
ස කෙන ගච්ඡෙය්‍ය අනුපයො
සො 112
ස කෙන වාදං පටිසංයුජෙය්‍ය 268
ස කෙන වෙධෙය්‍ය කුහිං ච
ජප්පෙ 434
සක්ඛි ධම්මමනීතිහමදස්සී 556
සක්ඛිධම්මං පරිස්සයවිනයං 494
සඞ්කප්පෙහි පරෙතො සො 206
සඞ්කුපථං 212

සඞ්ඛතා 100
සඞ්ඛං 450
සඞ්ඛා 450
සඞ්ගං 126
සඞ්ගං ලොකෙ දුරච්චයං 606
සඞ්ගා 606
ස චාපි මෙථුනෙ යුත්තො 212
සචෙ චුතො සීලබ්බතතො 426
සච්චනාති සො බ්‍රාහ්මණො 268
සච්චමතා 89
සච්චං 398
සච්චා අවොක්කම්ම මුනි 602
සච්චානි 402
සච්චානි සුතානි බහූනි නානා 402
සච්චො නු වාදො කතමො ඉමෙසං 392, 434
සච්චො සියා අප්පගබ්භො 588
ස ජප්පති පත්ථයතීච සුද්ධිං 426
සඤ්ඤසත්තා 128
සඤ්ඤං ච දිට්ඨිං ච 284
සඤ්ඤං පරිඤ්ඤා විතරෙය්‍ය 80
සඤ්ඤානිදානා හි පපඤ්චසඞ්ඛා 382
සඤ්ඤාය 402
සඤ්ඤාවිරත්තස්ස න සන්ති ගන්ථා 280
සණ්හා ච පටිභානවා 318
සතං 480
සතිමා 722, 724
සතො 14, 26, 330, 476, 552, 678, 686
සත්තො ගුහායං බහුනාභිඡන්නො 32, 34
සත්ථා 628
සත්ථානි 208
සත්ථාවකිණ්ණො පවසං ඝරම්හා 426
සද 26, 476, 552, 556
සදෙවකස්ස ලොකස්ස 630
සද්ධම්මපූජා ච පනා තථෙව 440
සන්තං 170
සන්ති 100, 470
සන්තිපදං 468
සන්තිමනුග්ගහාය 430
සන්තිවාදෙ 278
සන්තිං 102, 430
සන්තීති නිබ්බුතිං ඤත්වා 554
සන්තො 96, 260, 452, 552, 624
සන්තො අනිස්සාය භවං න ජප්ප 260
සන්තො අසන්තෙසු උපෙක්ඛකො සො 452
සන්තො ච භික්ඛු අභිනිබ්බුතත්තො 96
සන්තො සො වීතමච්ඡරො 624
සන්ථවජාතො 272
සන්දිට්ඨියා චෙව න වෙවදාතා 394
සන්දිට්ඨිරාගෙන හි තෙභිරත්තා 410
සන්නිධිං 512
සපත්තභාරො මුනි විප්පමුත්තො 458
සපරියන්තචාරී 686
සප්පස්සෙව පදා සිරො 10
සප්පො 10
සබ්බත්ථ මුනී අනිස්සිතො 182
සබ්බධි සමො 620
සබ්බමුපරුද්ධෙ 476
සබ්බසො 586, 610
සබ්බසො නාමරූපස්මිං 610
සබ්බං 182, 604
සබ්බං තමං විනොදෙත්වා 640
සබ්බං සො පටිනිස්සජ්ජ 604
සබ්බාව එතා න උපෙති විද්වා 422
සබ්බෙව තෙ නින්දමන්වානයන්ති 418
සබ්බෙව බාලා සුනිහීනපඤ්ඤා 392
සබ්බෙව වාදා තථියා භවෙය්‍යුං 440
සබ්බෙව හිමෙ කුසලාවදානා 392, 436
සබ්බෙවිමෙ දිට්ඨිපරිබ්බසානා 394
සබ්‍රහ්මචාරීසු ඛිලං පභින්දෙ 718
සමණමණ්ඩිකාපුත්තො 422
සමණං 230, 550
සමණෙන වුත්තං 360
සමත්තා 406
සමන්තචක්ඛු 494
සමන්තමසාරො ලොකො 568
සමං 268

සමාධිං 502
සමානමෙති නහි තම්මයො සො 280
සමාය 418
සමූහතත්තා 712, 714
සමිජ්ඣති 4
සමුග්ගහාය 144
සමුග්ගහීතං 104, 138, 152
සමුග්ගහීතෙසු පමොහමාගතො 264
සමුද්දස්ස 484
සමෙච්චධම්මං 130
සමෙතස්ස 380, 382
සමො විසෙසී උදවා නිහීනො 266
සම්පජානො සඨානි න කයිරා 548
සම්පවෙධෙය්‍ය 510
සම්බොධිකාමස්ස යථානුධම්මං 684
සම්මා සො ලොකෙ ඉරියානො 606
සම්මුතියො 420, 450
සම්මුතිං 436
සම්හි දළ්හං වදානා 438
සයනම්හි පන්තෙ 700
සයනං 660
සයමත්තනා සො කුසලා-
වදානො 406
සයමෙව පාවා 96
සයමෙව සාමං මනසා -
ගිසිතෙතා 408
සයං 408
සයං පමාය 414
සයංව සො මෙධගමාවහෙය්‍ය 414
සයං සමත්තානි 92
සයං සමාදාය වතානි ජන්තු 128
සල්ලං 84, 574
ස විප්පමුත්තො දිට්ඨිගතෙහි
ධීරො 454
ස වෙධති කම්මං විරාධයිත්වා 426
ස වෙ නිබ්බානසන්තිකෙ 218
ස වෙ ලොකෙ න ජීයති 612
ස වෙ වාචායතො මුනි 298
ස වෙ විද්වා ස වෙදගු 604
ස වෙ වියත්තෙසු න වග්ගසාරී 150
ස වෙ සන්තොති වුච්චති 394, 604
ස සබ්බධම්මෙසු විසෙනි-
භූතො 132, 458,
සහෙථ 700
සංවෙගං කිත්තයිස්සාමි 564
සං සුද්ධිපඤ්ඤා කුසලා 394
සාඨෙය්‍යං 548
සාතං 360, 372
සාතං අසාතඤ්ච කුතො
නිදානා 370
සාතං අසාතන්ති යමාහු
ලොකෙ 360
සාතියා 316
සාතියෙසු අනස්සාවී 316
සාමග්ගී 180
සාමග්ගියමාහු තස්ස නං 180
සාරිපුත්ත 682
සාරිපුත්තො 626
සාසනං 198
සාසනෙ ගොතමස්ස නප්ප-
මජ්ජෙය්‍ය 554
සාස්ස විසාතභූමි 234
සාහසා විරතො චරෙ 598
සික්ඛා 54, 216, 586
සික්ඛිස්සාම සෙ 195
සික්ඛෙ 366, 478, 554
සික්ඛෙථ 54, 204, 216
සික්ඛෙ නිබ්බානමත්තනො 586
සික්ඛෙම 424
සික්ඛෙය්‍ය 546
සිතො 600
සිත්වා 28
සිරිංසපා 688
සීතං අච්චුණ්හං අධිවාසයෙය්‍ය 692
සීමා 138
සීමාතිගො බ්‍රාහ්මණො 138
සීලබ්බතං වාපි පහාය සබ්බං 428
සීලබ්බතානි 92
සීලබ්බතෙන 426, 550
සීලබ්බතෙනාපි න
සුද්ධිමාහ 256, 262
සීලවතන 148
සීලුත්තමා සඤ්ඤමෙනාහු
සුද්ධිං 422
සීලෙසු අකථමාතො 98
සුඛං දුඛං වාපි කථං විභොති 380
සුජ්ඣති 118

සුතං 430
සුතා 174
සුත්වා 208
සුත්වා දූසිතො බහුං වාචං 550
සුත්වාන තව සාසනං 192
සුත්වා පරෙසං නිග්ඝොසං 208
සුද්ධානුපස්සී පච්චෙති ඤාණං 116
සුද්ධිං 222, 384, 412, 424, 428, 444
සුද්ධිං අසුද්ධින්ති අපච්චමානො 428
සුද්ධිං වදං තත්ථ තථද්දසා සො 448
සුද්ධී හි නෙසං පච්චත්තමෙව 440
සුපිනං 526
සුපිනෙන යථාපි සඞ්ගතං 174
සුප්පාරකං 212, 578
සුභංවදන්තා 222
සුභංවදානො 448
සුවණ්ණකූටං 212, 578
සුවණ්ණභූමිං 212, 578
සුවිමුත්තචිත්තො 724
සුසානං 658
සුරට්ඨං 212
සූරො යථා රාජඛාදාය පුට්ඨො 236
සෙනා 130, 298
සෙඛා 702
සෙඛමූතිතො 462
සෙය්‍යො න තෙන මඤ්ඤෙය්‍ය 482
සො 12
සොකපරිදෙවමච්ඡරං 176
සොකසල්ලං 576
සොකො 176, 346
සොචති 228, 612
සොචන්ති ජනා මමායිතෙ 168
සොතං 376
සො තං හසති උන්නමතීච 232
සොතා 608
සො තෙසු ගුත්තො යතචාරි ගාමෙ 708
සො තෙහි පුට්ඨො බහුධා අනොකො 692
සොපධිකො 118
සොමං විසත්තිකං ලොකෙ 12, 14
සො වීමංසී 386
සෙනාසං 596
ස්වාතිවත්තො 104
හදයස්සිතං 574
හලිද්දකානි 270
හස්සං 522
හායතෙ වාපි තස්ස සා 204
හිත්වාන සබ්බානි විනිච්ඡයානි 416
හිරඤ්ඤං 16
හීනමාහු 202, 436
හීනමාහු පුථුජ්ජනං 202
හීනවාදෙ 228
හීනාති අඤ්ඤෙ තතො සබ්බමාහ 142
හීනා නරා මච්චුමුඛෙ ලපන්ති 68
හීනො න මඤ්ඤෙථ විසෙසි වාපි 148
හීයමානෙ න සොචෙය්‍ය 600
හුරං 153
හෙතුවාදා 224

**සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය**

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාලි | |
| 2 | පාචිත්තිය පාලි | I |
| 3 | පාචිත්තිය පාලි | II |
| 4 | මහාවග්ග පාලි | I |
| 5 | මහාවග්ග පාලි | II |
| 6 | චුල්ලවග්ග පාලි | I |
| 7 | චුල්ලවග්ග පාලි | II |
| 8 | පරිවාර පාලි | I |
| 9 | පරිවාර පාලි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාළි - ථෙරීගාථා පාළි

32 ඛුද්දක නිකාය - ජාතක පාළි I

33 ඛුද්දක නිකාය - ජාතක පාළි II

34 ඛුද්දක නිකාය - ජාතක පාළි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාළි

36 ඛුද්දක නිකාය - චුල්ල නිද්දේස පාළි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමග්ගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමග්ගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාළි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාළි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාළි - චරියා පිටක පාළි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධම්මසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුග්ගලපඤ්ඤත්තිප්පකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රදැවුන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටුන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

~THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL~

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# NAME OF SPONSOR

## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES,**
**Volume 29～Volume 44**

**書名：斯里蘭卡巴利文大藏經，第二十九冊～第四十四冊**
**Book Serial No., 書號：SR229～SR244**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,213,398：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,534,498；Print 1,000 sets**
**以上合計，新台幣 1,534,498 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**

《斯里蘭卡巴利文大藏經 第三十五冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

1,000 copies; October 2013

SR235 - 11588